බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 27

සූත්‍රාන්ත පිටකයෙහි

17 වන ග්‍රන්ථය

# අඞ්ගුත්තරනිකාය

ෂෂ්ඨ භාගය

## දසක - එකාදසක නිපාත

ලඞ්කා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්

ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක සභාවේ

අඞ්ගුත්තරනිකාය ශෝධක මණ්ඩලය

විසින් කරන ලද

සිංහල පරිවර්තනය

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ සංස්කරණයෙන් යුක්ත යි.

බු: ව: 2557

ක්‍රි: ව: 2013

Buddha Jayanti Tripitaka Series, Volume 27

The Seventeenth Book in the

**Suttanta-Pitaka**

**17**

# ANGUTTARANIKĀYA (VI)

With the Sinhala translation by

**The Anguttaranikāya Editorial Board**
**of**
**The Tripitaka Translation Committee**

**Published by**
**Dharma Chakkra Child Foundation**
Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka
Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /
**Co-published, printed and donated by**
**The Corporate Body of the Buddha Educational Foundation**
11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.
Tel: +886 2 23951198, Fax: +886 2 23913415
Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**
**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කුඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතං කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චර්යාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා එලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
වීදාගම,
බණ්ඩාරගම.

2557
2013

**බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ**

**බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක**

**වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක**

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මගින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදී.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- පූජ්‍ය අත්තුඩාවේ ඥාණානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහැල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බඹරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලිනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහළවේවායි ප්‍රාර්ථනා කරමු.*

# සුත්තන්තපිටකෙ

# අඞ්ගුත්තරනිකායො

ඡට්ඨො භාගො

# සූත්‍රාන්තපිටකයෙහි

# අඞ්ගුත්තරනිකාය

ෂෂ්ඨ භාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන

# CONTENTS


| | | | | |
|---|---|---|---|---|
| සංස්කාරක නිවේදනය | ... | ... | ... | ix |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය | ... | ... | ... | xi |
| සංඥාපනය | ... | ... | ... | xiii |
| පාළි හෝඩිය | ... | ... | ... | xix |
| සංකේත නිරූපණය | ... | ... | ... | xxi |
| විසයසූචි | ... | ... | ... | xxiii |
| ශුද්ධාශුද්ධ දර්ශනය | ... | ... | ... | xxxiii |
| සිංහල පරිවර්තනය | ... | ... | ... | 2-683 |
| දසකනිපාතය | ... | ... | ... | 2-583 |
| එකාදසකනිපාතය | ... | ... | ... | 584-683 |
| ගාථාදිපාද සූචි | ... | ... | ... | 685 |
| සඤ්ඤානාම සූචි | ... | ... | ... | 686-688 |
| විසෙසපදානුක්කමණිකා | ... | ... | ... | 689-697 |

## සංස්කාරක නිවෙදනය

සූත්‍රාන්තපිටකයට අයත් චතුරාගමයන් අතුරෙහි අඞ්ගුත්තරනිකායෙහි 'දසක එකාදසක' නිපාතයන්ගෙන් සමන්විත වූ මේ සවන භාගය බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි තෙවිසිවන (23) ග්‍රන්ථය වෙයි. මෙයින් අඞ්ගුත්තර සඟියද සමාප්ත වේ.

ලඞ්කාබෞද්ධමණ්ඩලයේ ආරාධනය පරිදි මෙහි සිංහල පරිවර්තනය භාර ගෙන සිටි පණ්ඩිත ස්ථවිරයන් වහන්සේ යථාකාලයෙහි එම පරිවර්තනය ත්‍රිපිටකමණ්ඩලය වෙත පත් නො කළ හෙයින් ත්‍රිපිටක පරිවර්තන සංස්කාරකමණ්ඩලයේ සම්මතය පරිදි, වර්තමාන බුද්ධශ්‍රාවකධර්මපීඨාධිපති කොදගොඩ සිරි ඥාණාලොකාභිධාන දක්ෂිණලඞ්කායේ ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ යැ, දෙමටගොඩ පධානඝරවිහාරාධිපති පරවාහැර සිරි පඤ්ඤානන්ද කොළඹ නවකෝර්ළයේ ප්‍රධාන නායකස්ථවිරයන් වහන්සේ යැ, කොළඹ කුප්පියාවත්තේ ජයශෙඛරාරාමාධිපති තලල්ලේ සිරි ධම්මානන්ද නායකස්ථවිරයන්වහන්සේ යැ යන අඞ්ගුත්තරනිකාය සංශොධක මණ්ඩලය විසින් මෙහි සිංහල පරිවර්තනය ද කරන ලද්දේ ය. මුද්‍රණ අවස්ථාවට පැමිණ වර්තමාන ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයේ ශාස්ත්‍රාගමධර මහතෙරවරුන්ගේ මහත් පරිශ්‍රමයෙන් ශොධ්‍යස්ථාන හා බොහෝ තැන්හි පරිවර්තන ද සංස්කරණය කරනලද වෙයි. එහෙත් ප්‍රමාණය ඉක්මවාගිය මුද්‍රණවේගය නිසා නො වළහාලියැ හෙන යම් ඌනතායෙක් වියයුතු නම් එයිනුදු අපරිමුක්ත බව කියැ යුතුව ඇත. ශොධ්‍යපත්‍රයෙන් එයට පිළියම් යෙදේ.

පුස්කොළ පොත්වල මතු නොවැ මුද්‍රිත අඞ්ගුත්තරනිකායග්‍රන්ථයන්හි පවා පද-වාක්‍ය සංකලනයෙන් ව්‍යාකුල වැ පැවැති පාළිප්‍රදෙශයන් අර්ථාවබොධයට පහසුවන සේ පද බෙදීම හා වාක්‍යවිච්ඡෙදය ද කොට අස්ථාන පතිත පෙය්‍යාලයන් ද මේ සංස්කරණයෙහි ලා නිසිසේ තබන ලද්දේ ය. කිසිතැනෙක පෙය්‍යාලය සඳහා "–" මෙබඳු රෙඛා ද යොද ඇත. තවද ඒ ඒ සූත්‍රයන්හි වදළ දසකාදි අඞ්ගයනුදු වෙන් කොට ගත හැකි වන සේ අවශ්‍යයෙන් දක්වාලියැ යුතු තැන්හි ඡෙදයක් පාසා අඞ්ක යොද ඇත. ජකකනිපාතාදියෙහිදු එසේ අංක යොද ඇති සැටි සලකනු මැනැවි.

තවද ඉතා අල්පකාලයක් තුළ ත්‍රිපිටක ග්‍රන්ථ බොහෝ ගණනක් පළකරවාලීමට අවස්ථාව ලැබීමෙන් මේ වන විට 'දීඝනිකාය, මජ්ඣිමනිකාය, හා අඞ්ගුත්තරනිකාය' ද අවසාන කරන්නට ලැබීම ත්‍රිපිටක

සම්පාදකමණ්ඩලයේ අමන්‍දනන්‍දයට හෙතු වෙයි. ධර්මකාමී සජ්ජනයන්ගේ ද ප්‍රමොදයට හෙතු වනු නියත යැ. මෙසේ බුද්ධජයන්‍තී ත්‍රිපිටක ග්‍රන්ථමාලාව අප්‍රමාදව පළ කරවාලීම සඳහා ආවශ්‍යක විධිවිධාන සලසාලූ ගරු අග්‍රාමාත්‍ය තන්පත් සිරිමාවෝ බණ්ඩාරනායක උත්තමාවට ද, මෙහි ලා ක්‍රියාකාරී ප්‍රයත්නයක යෙදෙන ගරු සංස්කෘතික අමාත්‍යවර ඊ. බී. තෙන්නකෝන් මැතිතුමාණන්ට ද, සංස්කෘතික ලේකම් එච්. ඇම්. සුමතිපාල මහතාණන්ට හා පී. ඒ. අභයවික්‍රම අධ්‍යක්ෂ තුමාට ද විශෙෂයෙන් ස්වකීය විවෙකය ද නොතකා මේ අධිකාරයෙහි නතු ව ක්‍රියාකරන සහකාර අධ්‍යක්ෂ සෝමපාල ජයවර්ධන මහතාණන්ට ද බෞද්ධලොකයාගේ ආශිර්වාදය හිමිවිය යුතුය.

දෙහිවල තිසර මුද්‍රණාලයාධිකාරී තුමා ඇතුළු තත් සේවක මණ්ඩලය ද මහානායක චාරිකාරාමයේ භාරකාර ඒ. ඇම්. පී. සමරසිංහ මහතා ද ආශීර්වාදමුඛයෙන් සඳහන් කරම්හ. ශාසනායු වර්ධනයට කාරණ වූ මේ සත්ක්‍රියාඵලයෙන් හැමදෙන ම සුඛභාගී වෙත්වයි ආශංසනය කරම්හ.

මේ වගට

**ලබුගම ලඞ්කානන්‍ද ස්ථවිර**

ත්‍රිපිටක මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

10. 7. 1977 ත්‍රිපිටක කාර්‍යාලය,
115, විජේරාම මාවත,
කොළඹ 7.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

මහරගම වටයවත්තපාර-ශ්‍රී චන්ද්‍රශේඛරාරාමාධිපති අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂු විශ්වවිද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය, රාජකීය පණ්ඩිත කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ, ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය, ත්‍රිපිටක වාගීශ්වර, විමලකීර්ති ශ්‍රී රාජකීය පණ්ඩිත, ලබුගම ලඞ්කානන්ද ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

කිරුළපන පූර්වාරාම, නාරාහේන්පිට අභයාරාම යන විහාරද්වයාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ සිරි පඤ්ඤාලෝක ශ්‍රී කල්‍යාණිසාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල, සුදර්ශනාරාමාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ සිරි අනෝමදස්සී බටහිර දිශායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ – මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති රාජකීය පණ්ඩිත කරදන සිරි පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

කොළඹ, බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල – කොළඹ පළාතේ ප්‍රධානසඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

# සංඥාපනය

අප බුදුරදුන් 'සුමෙධ' නම් මහතවුස් වැ දිවකුරු බුදුන් පා මුලැ දිවි පුද හෙව නියතවිවරණසිරි ලත් තැන් පටන් වෙසතුරු අත්බැව දක්වා සියලු බුදුකුරු දහම් සපුරා තුසීපුර ඉපද එහි ආපමණින් සිට අවසන් පිළිසඳ විසින් මිනිස් ලොවැ ඉපද මහබිනික්මන් කොටින් සාවුරුද්දක් දවස් මහාප්‍රධන්වීර්‍ය කොට බෝමුලැ විදුරසුන් අරා වැඩහිඳ සවාසන සකල ක්ලෙශයන් බිඳැ බුදුවැ සෘෂීන්ට පතනක්ෂෙත්‍ර වූ බරණැස මුවළැව්හි දහම්සක් පැවැත් වූ තැන් පටන් කොට සුභද්‍ර පිරිවැජියා විනයනය කළ තැන් හිම් කොට පන්සාලිස් හවුරුද්දක් දවස් මුළුල්ලෙහි කෘතයුග මහාමෙඝයක් සෙයින් දහම් අමාවැසි වස්වා පිරිනිවන් පැවදළ කල්හි ආදහනොත්සව පූජායෙහි මුළුදුන් සත්ලක්ෂයක් භික්ෂූන්ට සඞ්ඝ ස්ථවිර වූ බුදුරදුන් පාංසුකූල මහාචීවරයෙහි සාධාරණ පරිභොගයෙන් අනුග්‍රහ කළ අනුබුදු මහසුප් මහරහතුන් වහන්සේ ප්‍රමුඛ පන්සියක් මහරහතුන් විසින් පිටක නිකායාදී විසින් සංගීත වැ දෙවැනි තෙවැනි සංගීතීන්හි දී අනුසංගීත වැ පවත්නා ධර්මවිනය සංඛ්‍යාත නවාංග ශාස්තෘශාසනය සදෙව සබ්‍රහ්මක ලොකයට නිවන්මහවත් හෙළිකරමින් මෙ දවස පවා නිර්මල වැ පවත්නේයැ.

බුදුන් පිරිනිවි මුල් සියවස ඉක්මැ යත් ම නිකායාන්තරවාසීහු පෙළ දහම් ගෙන විවිධ දුර්මත උපදවාලූහ. ඒ හැම දුර්වාද ඛණ්ඩනය කරමින් **මොගගලි පුතත තිසස** මහරහතුන් වහන්සේ කථාවස්තු දෙශනා කළ පවත ශාසනයෙහි පළට වැ ඇත. පෙළ පොත් හා අටුවා හා සංගීති කථාදිය ද ගෙන මෙ දවස දක්වා පරවාදීන් හා විතණ්ඩවාදීන් විසිනුදු පවසාලන නිසරු වාදයනට නිසි පිළිතුරු සපයමින් ත්‍රිපිටක මණ්ඩලයෙහි ප්‍රධාන සම්පාදක ධුරය ධැරූ තෙවළා දහම්හි කළ පරිචය ඇති දර්ශන විසාරද පරවාහැර සිරි වජිරඥාණ නාහිමිපාණන් වහන්සේ බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි මහාවග්ග පාළියට ලියූ සංඥාපනය බලන්නේ මැනැවි.

අඞ්ගුත්තර මහා නිකාය පිළිබඳ කොට එහි ධර්මතාව සඳහා දතයුතු දැය අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති කෝදාගොඩ සිරි ඥාණාලොක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ අඞ්ගුත්තර නිකාය ප්‍රථම භාගයට ලියූ සංඥාපනයෙහි පළව ඇත.

**භාණකසම්ප්‍රදය**

යළි ධර්මකථික පුඞ්ගවයනට විචිත්‍ර ප්‍රතිභාන දනවන ආගමග්‍රන්ථය සේ බුද්ධඝොෂාචාරීන් විසින් පසස්නා ලද අඞ්ගුත්තර සභිය පරිශීලනය කරනුවන් විසින් විමසුවමනා කතිපයස්ථානයක් ගෙන මෙහි ලා පවසම්හ: අඞ්ගුත්තර නිකාය සංගීතියට නඟැලූ අවස්ථායෙහි "මෙය ඔබගේ ආශ්‍රිතයනට උගන්වාලුව මැනැවැ''යි දිවැස් ලදුවන් කෙරෙහි අගතැන් පැමිණි අනුරුද්ධ තෙරණුවනට දක්වා දුන්හ. එයින් ඔබ ඇසිරි කළෝ 'අඞ්ගුත්තර භාණක' නම් වූහ. යමෙක් අඞ්ගුත්තර භාණක වී නම් ඔහුට අඞ්ගුත්තර නිකාය පෙළ විසින් අටුවා විසින් සපුරා ග්‍රහණ ධාරණයෙන් එහි ප්‍රතිෂ්ඨිත නොවන තාක් දීඝාගමාදී අන්‍යත් ග්‍රන්ථයක් පුහුණු කිරීමට අවසර නැතිවිය. ශක්ති ඇතියනට අනුක්‍රමයෙන් තෙවළාධර වීමට ද බාධායෙක් නො තිබිණ. ග්‍රන්ථලේඛන සංගීතිය තෙක් නිර්මල වැ පැවැති මේ භාණක සම්ප්‍රදය එයින් පසුව ද කාලාන්තරයක් පැවැති සේ සිතියැ හෙයි.

ඒ ඒ භාණකයන්ගේ වාචනාමාර්ගයෙහි කිසි තැනෙක පද වර්ණයන්ගේ නානාත්වය ද දක්නට ලැබේ. මේ විමසන්න: අඞ්ගුත්තරනිකාය – තික නිපාත සාරිපුත්ත සූත්‍රයෙහි අර්හත් ඵල සමාධිය වැරණ තැන බුදුරදුන් විසින් "ඉදං ච පන මෙතං සාරිපුත්ත, සන්ධාය භාසිතං පාරායනෙ උදය පඤ්හෙ''යි පාරායන උදය සූත්‍රයෙහි එන පළමුවන විස්සජ්ජන ගාථා දෙක වදරණ ලද්දේය. එය අලුවිහාර – ග්‍රන්ථලේඛන සඞ්ගායනාවේ දී අඞ්ගුත්තර භාණකයෝ–

"පහානං කාම සඤ්ඤානං – දොමනස්සාන චූ භයං
ථීනස්ස ච පනූදනං – කුක්කුච්චානං නිවාරණං''

(අඞ්ගුත්තර – ප්‍රථම භාග 246 පිට)

යනාදි විසින් ලේඛන ගත කළහ. එහෙත් සුත්තනිපාත (340 පිට) හා නිද්දෙස (334 පිට) පරිහරණය කළ ආචාර්‍යවරයෝ "පහානං කාමච්ඡන්දානං-'' යනාදි විසින් ඒ ගය හදළහ. අටුවා ඇදුරෝ "උදය පඤ්හෙ ච පන එතං පදං පහානං කාමච්ඡන්දානන්ති ආගතං, ඉධ පන අඞ්ගුත්තර භාණකෙහි කාමසඤ්ඤානන්ති ආරොපිතං තත්‍ථ ව්‍යඤ්ජනමෙව නානං, අත්‍ථො පන එකො යෙ ව''යි 'කාමච්ඡන්ද, කාම සඤ්ඤා' යන පදයන්ගේ ව්‍යඤ්ජනයෙහි විනා අර්ථයෙහි නානාත්වයෙක් නැති සේ දක්වාලූහ. අද පවා භාණක සම්ප්‍රදය ඒලෙසින් ම දක්නා ලැබෙන කරුණෙන් ථෙරීය වංසයෙහි ඇදුරුවරයෝ ජිනවචන පාළිය කෙතරම් සුරක්ෂිත ව ගෙන ආවාහු ද'යි නිශ්චය කළ හැකිය.

තවද, බුදුරදුන් විසින් තිකඞ්ගුත්තර ආනන්ද සූත්‍රයෙහි චෙතොවිමුත්ති පඤ්ඤාවිමුත්ති වදාළ තැන "ඉදං ච පන මෙතං ආනන්ද සන්ධාය භාසිතං පාරායනෙ පුණ්ණකපඤ්හෙ" යි (අං: නි: 346 පිට) සුත්තනිපාත-පුණ්ණක සූත්‍රයෙහි වදාළ "සඞ්ඛාය ලොකස්මිං පරොවරානි" (සු. නි. 320 පිට) යනාදි ගාථාව මැ වදරණ ලද්දේය. දශක නිපාත – කාළී සූත්‍රයෙහි (අ: ජටඨභාග 86 පිට) කුරරඝරවාසි කාළී උවැසිය මහකසයින් තෙරුන් කරා එළැඹ "වුත්තමිදං භන්තෙ භගවතා කුමාරී පඤ්හෙසු: 'අත්ථස්ස පත්තිං හදයස්ස සන්තිං – පෙ – කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො" යි විචාරන ලදුව සංයුත්සඟියැ මාරසංයුත්තයෙහි එන මාරධීතු සූත්‍රයෙහි යට කී ගාථාව මහකසයින් තෙරණුවෝ කාළී සූත්‍රයෙහි විස්තර කොට වදාළහ. එය අඞ්ගුත්තරභාණකයන් කුමාරීපඤ්හ යයි හඳුරන ලද්දේය. මෙපරිදි සඟිපොත්වල එන භාණකයන්ගේ වාචනාමාර්ගය විමසන්නේ මැනැවි.

### අඞ්ගුත්තර සූත්‍ර සංඛ්‍යා

අඞ්ගුත්තරාගමයෙහි සූත්‍ර නව දහස් පන්සිය සත්පණසක් (9557) ඇතැයි සඞ්ගීති කථායෙහි ලා පවසන ලද්දේය. සර්වපරිශ්‍රමයෙන් බලත් මැ අපට හමුවූ සූත්‍ර සංඛ්‍යා මෙසේය:

| | | | | |
|---|---|---|---|---|
| 1. | එකක නිපාතයෙහි සූත්‍ර | | | 1000 |
| 2. | දුක | ,, | ,, | 753 |
| 3. | තික | ,, | ,, | 359 |
| 4. | චතුක්ක | ,, | ,, | 752 |
| 5. | පඤ්චක | ,, | ,, | 1167 |
| 6. | ඡක්ක | ,, | ,, | 662 |
| 7. | සත්තක | ,, | ,, | 1124 |
| 8. | අට්ඨක | ,, | ,, | 627 |
| 9. | නවක | ,, | ,, | 432 |
| 10. | දසක | ,, | ,, | 756 |
| 11. | එකාදසක | | ,, | 1151 |
| | | | | 8777 |

මෙහි සූත්‍ර 780, ඌනත්වයක් ඇතිබව පෙනේ. මෙසේ සූත්‍ර බොහෝ ගණනක් ම ගිලිහී යෑමට හේතු කිමැ යි විමසත් හොත්: දුක තිකාදි නිපාතාවසානයෙහි පෙය්‍යාල මුඛයෙන් සිය ගණන් සූත්‍ර සංග්‍රහ කොට ඇත. යම් හෙයෙකින් කිසියම් නිපාතයෙක පෙය්‍යාල කීපයක් ලේඛක-යන් අතින් ගිලිහී ගියානම් මේ ඌනත්වය සිදුවිය හැක්කේ මැ ය. මෙ ද විමසනු මැනවි:

චතුක්ක නිපාතයේ තුන්වැනි පණ්ණාසකයේ පළමුවැනි වලාහක වග්ගයේ සවැනි සූත්‍රය කිසිදු පිටපතෙක මෙතාක් හමු නොවීය. අට්ඨ කථායෙහි ''ඡට්ඨං උත්තානත්ථමෙව'' යී සවැනි සූත්‍රය නොගැඹුරු අරුත් ඇතැයි පවසමින් එක පදයකුදු උදාහරණය කොට නැත. එහෙයින් මේ සූත්‍රයෙහි කෙබඳු දහමෙක් තිබිණි දැයි සිතනු පවා නො හැකිය. වර්‍ගාවසානයෙහි උදදන ගාථාවකුදු නො වූයෙන් ගිලිහී ගිය සූත්‍රය කිනම් වී දැයි සිතනු ද නො හැකිය. මෙසේ ලෙඛකයන්ගේ ප්‍රමාදයෙන් යට දැක්වූ සූත්‍ර සඞ්ඛ්‍යාව නො පෙනී ගිය බව සිතිය යුතු ය.

**සමාන සූත්‍ර :**

අඞ්ගුත්තර නිකායෙහි බුදුරදුන්ගේ දෙශනා කෞශල්‍යය නිසා අත්තජ්ඣාසය වශයෙන් ද ශ්‍රොතෘජනයන්ගේ අධ්‍යාශයානුරූප කොට පරජ්ඣාසය වසයෙන් ද වදරනලද එක දෙශයකින් සමානකම් ඇති බොහෝ සූත්‍ර දැක්ක හැකි ය. නිපාතාවසානයෙහි සංගෘහිත වූ රාගපෙය්‍යාලාදියෙහි එන සිය ගණන් සූත්‍රයන් තබා අට්ඨකනිපාතයෙහි ද එකාදසකනිපාතයෙහි ද වදළ මෙත්තා සූත්‍ර වැනි සූත්‍රයන් විමසුව මැනැවි. විශෙෂයෙන් ඡක්කනිපාතයෙහි ද (6. 1. 5. 2) දසකනිපාතයෙහි ද (10. 2. 3. 5) 'මිගසාලා' නමින් සූත්‍ර දෙකක් ඇත. ඒ සූත්‍රදෙක ම මිගසාලා උවැසිය විසින් බුදුරදුන්ගේ ඉන්ද්‍රියපරාවරතාඥනයෙහි ගටා අනඳතෙරණුවන්ගෙන් විචාළ ප්‍රශ්නයක් සඳහා එක් මැ අවස්ථාවක වදළ දෙශනාවක් බව සිතිය යුතුය. එයින් ඡක්කනිපාතයෙහි හානගාමී පුඟුලන් තිදෙනකු හා විසෙසගාමී පුඟුලන් තිදෙනකු ද, දසකනිපාතයෙහි හානගාමී පුඟුලන් පස්දෙනකු හා විසෙසගාමී පුඟුලන් පස්දෙනකු ද වදළහ. මෙබඳු සූත්‍ර ද මැනැවින් අවබොධ කළ යුතු ය.

**ධර්‍මකථිකයෝ:**

ප්‍රශස්ත වූ ධර්‍මකථිකයනට විචිත්‍ර වූ ප්‍රතිභාන ජනනය කරන ආගම් වරය ලෙස පසස්නාලද අඞ්ගුත්තරනිකාය ගිහි පැවිදි දෙපක්ෂයෙහි මැ වූවනට උභය ලොකාර්‍ථසිද්ධියට ඉවහල් වූ විමුක්ති පරිපාචනීය මර්‍ගොපදේශක වූ ලෞකික ලොකොත්තරාර්‍ථප්‍රකාශක අනෙකසත සූත්‍රයෙන් ප්‍රතිමණ්ඩිත වූයේ ය. එහෙයින් ධර්‍මදේශකයනට විචිත්‍ර ප්‍රතිභාන දනවන සේ අඞ්ගුත්තර සඟිය පසස්නා ලද වෙයි. දහම් දෙසනුවන් ඇත ද පරහට දහම් දෙසනු පහසු කරුණෙක් නොවේ යයි බුදුරදුන් විසින් ම වදරන ලද්දේය: ''න ඛො ආනන්‍ද සුකරං පරෙසං ධම්මං දෙසෙතුං පරෙසං ආනන්‍ද ධම්මං දෙසෙන්තෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරෙසං ධම්මො දෙසෙතබ්බො'' (පඤ්චකඞ්ගුත්තර – 5. 4. 1. 9) දෙශකයා විසින් අනුපූර්‍වී කථාව – මාතෘකා කළ සූත්‍ර පදයට හෝ ගාථාවට අනුරූප කථාව කියයුතු වෙයි. ඒ ඒ අර්‍ථය පැහැදිලි කිරීමට කරුණු දැක්විය යුතුය. අනුකම්පා

පෙරදැරි ව ආමිෂාපෙක්ෂා නැතිව ආත්මොත්කර්ෂණ පරවම්භන නො කොට දහම් දෙසිය යුතු වේ. සූත්‍රාන්තාදියෙහි නිදාන වස්තු පුද්ගලාදිය නොවිමසා අර්ථ විපරීත කොට දහම් දෙසීම ලොවට අවැඩ සිදුකරනුයේ මැ ශාසන විලොපයට ද හෙතු වන්නේ මැ නු.

තිකනිපාතයෙහි (3. 2. 2. 5) කාලාම සූත්‍රය ගෙන 'අනුශ්‍රවයෙන් හෝ පරම්පරා කථායෙන් හෝ ඉතිහාසයෙන් තර්කයෙන් හෝ භය හේතුයෙන් හෝ තමන්ගේ දහමට ගැළැපෙන නිසා හෝ ගුරුවරයා කී නිසා හෝ කිසිවක් නො පිළිගෙන, මැනැවැයි කියා තමහට වැටහේ නම් එය පිළිගත යුතු' යයි බුදුරදුන් විසින් වදරන ලද යි කියති. කවුරුන් විසින් හෝ නොපැහැදිලි කොට මුලදී ප්‍රකාශ කළ මේ සූත්‍රාර්ථය දුන් බුදුන් වදළ දෙය පවා තමා විසින් නො විමසා නො පිළිගතයුතු' යයි කියන තත්වයට අතිධාවනය කොට ඇත. දහම් පාසැල් ශිෂ්‍යයාට ද එසේ උගන්වති. මේ සූත්‍රයෙහි වස්තුව හෝ නිගමනය නො පවසා ලෙශමාත්‍රයක් දැක්වීමෙන් සිදුවන අනර්ථය ගැන දෙශකයා මදකුදු නො සිතූ බව පෙනේ.

කාලාමයන්ගේ කෙසපුත්ත නිගමය පිහිටියේ බොහෝ දෙන යන එන මාර්ගයක් සමීපයෙහි ය. එහි පැමිණෙන ඇතැම් මහණ බමුණු කෙනෙක් සවකීය ලබ්ධිය (ශාශ්වත හෝ උච්ඡෙද) ප්‍රකාශ කොට එය ම සැබව ය, අන්‍යයන්ගේ ලබ්ධිය මුසා යැ හළ යුතු යයි උගන්වා යෙති. අනතුරුව පැමිණෙන මහණ බමුණු කෙනෙක් පළමු කී ලබ්ධිය මුසා යැ හළ යුතු යැ අපගේ ලබ්ධිය සැබැවයි විරුද්ධවාදයක් උගන්වා යෙති. මෙසේ ඇති අවස්ථායෙක කාලාමයෝ බුදුන් කරා එළඹ මෙ කරුණ දන්වා මේ දෙපක්ෂයෙන් කවුරුන්ගේ වාදය සැබෑද කවුරුන්ගේ වාදය බොරු ද යි විචාළහ. බුදුහු ඒ වාද දෙකින් එකකුත් සැබෑය යි හෝ බොරු යැයි හෝ නොවදරා, 'අනුශ්‍රවාදි විසින් ඒ වාද එකකුදු නොගෙන යමක් අකුසල් නම් සාවද්‍ය නම් අවැඩ පිණිස පවතී නම් එය දුරුකොට, කුසල් වූ නිදෙස් වූ හිත පිණිස පවත්නා දැය විමසා පිළිපදනා ලෙස වදළහ. මෙසේ හෙයින් සූත්‍රාර්ථ නො පිරිහෙළා අනුද්දයතා පෙරදැරි කොටගෙන දහම් දෙසීම ප්‍රතිභාසම්පන්න ධර්මකථිකයාගේ ලක්ෂණය වේ. මේ අර්ථය සඳහා අඞ්ගුත්තරනිකායෙන් ලැබෙන පිටුවහල් අටුවා ඇදුරන් විසින් පවසන ලද්දේ යි.

මේ වගට:

ලබුගම ලඞ්කානන්ද
අනුනායක ස්ථවිර

1977 ජුලි 10 දින
ප්‍රවචනොදය පිරිවෙන,
මොල්ලිගොඩ,
වාද්දුව.

# පාළි හෝඩිය

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

අ a  ආ ā  ඉ i  ඊ ī  උ u  ඌ ū  එ e  ඔ o

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

ය ya  ර ra  ල la  ව va  ස sa  හ ha  ළ ḷa  ං ṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUNCT - CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ñja | ද්ව, ද්ව dva | ම්භ mbha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර grâ | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ñkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ñga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

ා ā  ි i  ී ī  ු u  ූ ū  ෙ e  ො o

## සංකේත නිරූපණය

සී.–සීහළක්ඛර–තාලපණ්ණ පොත්ථක

සීමු.–සීහළක්ඛර–මුද්දිත–පොත්ථක

මජසං.–මරම්ම ඡට්ඨසංගීති–සොධිත පොත්ථක

ස්‍යා–ස්‍යාම–තාය්‍යක්ඛර–මුද්දිත පොත්ථක

කත්ථචි–ගන්ථන්තරානි

අට්ඨකථා–මනොරථපූරණී

PTS – Pali Text Society, Anguttara Nikaya

# අඞ්ගුත්තරනිකාය - ඡට්ඨභාග

## විසයසූචි

**දසකනිපාතො 2 - 581**

### 1 - 1. ආනිසංසවග්ගො 2 - 27


| විසයානි | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 1. කිමත්ථිය | සුත්තං | ... | ... | 2— 5 |
| 2. චෙතනාකරණීය | ,, | ... | ... | 6— 7 |
| 3. පඨම උපනිස | ,, | ... | ... | 8— 9 |
| 4. දුතිය උපනිස | ,, | ... | ... | 10— 11 |
| 5. තතිය උපනිස | ,, | ... | ... | 10— 13 |
| 6. සමාධි | ,, | ... | ... | 14— 17 |
| 7. සාරිපුත්ත | ,, | ... | ... | 16— 19 |
| 8. සද්ධ | ,, | ... | ... | 20— 23 |
| 9. සන්තවිමොක්ඛ | ,, | ... | ... | 22— 25 |
| 10. විජ්ජා | ,, | ... | ... | 24— 27 |


### 1 - 2. නාථවග්ගො 28 - 61


| | | | | |
|---|---|---|---|---|
| 1. සෙනාසන | සුත්තං | ... | ... | 28— 31 |
| 2. පඤ්චඞ්ග | ,, | ... | ... | 30— 33 |
| 3. සංයොජන | ,, | ... | ... | 32— 33 |
| 4. චෙතොඛීල | ,, | ... | ... | 34— 41 |
| 5. අප්පමාද | ,, | ... | ... | 40— 43 |
| 6. ආහුනෙය්‍ය | ,, | ... | ... | 42— 43 |
| 7. පඨම නාථ | ,, | ... | ... | 44— 49 |
| 8. දුතිය නාථකරණ | ,, | ... | ... | 48— 55 |
| 9. පඨම අරියවාස | ,, | ... | ... | 54— 55 |
| 10. දුතිය අරියවාස | ,, | ... | ... | 56— 61 |


### 1 - 3. මහාවග්ගො 62 - 123


| | | | | |
|---|---|---|---|---|
| 1. සීහනාද | සුත්තං | ... | ... | 62— 69 |
| 2. අධිවුත්තිපද | ,, | ... | ... | 68— 73 |
| 3. කාය | ,, | ... | ... | 72— 77 |
| 4. මහාචුන්ද | ,, | ... | ... | 78— 85 |

| විසයානි | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 5. | කසිණ | ,, | ... | ... | 84— 85 |
| 6. | කාලි | ,, | ... | ... | 86— 89 |
| 7. | පඨම මහාපඤ්හ | ,, | ... | ... | 88— 99 |
| 8. | දුතිය මහාපඤ්හ | ,, | ... | ... | 100—107 |
| 9. | පඨම කොසල | ,, | ... | ... | 106—115 |
| 10. | දුතිය කොසල | ,, | ... | ... | 116—123 |

## 1 – 4. උපාලිවග්ගො 124 – 137

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | උපාලි | සුත්තං | ... | ... | 124—125 |
| 2. | පාතිමොක්ඛට්ඨපන | ,, | ... | ... | 124—125 |
| 3. | උබ්බාහිකා | ,, | ... | ... | 126—127 |
| 4. | උපසම්පද | ,, | ... | ... | 126—129 |
| 5. | නිස්සය | ,, | ... | ... | 128—129 |
| 6. | සාමණෙර | ,, | ... | ... | 130—131 |
| 7. | සඞ්ඝභෙද | ,, | ... | ... | 130—131 |
| 8. | සඞ්ඝසාමග්ගි | ,, | ... | ... | 132—133 |
| 9. | පඨමානන්ද | ,, | ... | ... | 134—135 |
| 10. | දුතියානන්ද | ,, | ... | ... | 136—137 |

## 1 – 5. අක්කොසවග්ගො 138 –165

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | විවාද | සුත්තං | ... | ... | 138—139 |
| 2. | පඨම විවාදමූල | ,, | ... | ... | 140—141 |
| 3. | දුතිය විවාදමූල | ,, | ... | ... | 140—141 |
| 4. | කුසිනාරා | ,, | ... | ... | 142—145 |
| 5. | රාජන්තෙපුරප්පවෙසන | ,, | ... | ... | 146—149 |
| 6. | සක්ක | ,, | ... | ... | 148—155 |
| 7. | මහාලි | ,, | ... | ... | 154—157 |
| 8. | දසධම්ම | ,, | ... | ... | 156—159 |
| 9. | සරීරට්ඨධම්ම | ,, | ... | ... | 158—159 |
| 10. | භණ්ඩන | ,, | ... | ... | 160—165 |

## දුතියපණ්ණාසකෙ

### 2 – 1. සචිත්තවග්ගො 166 – 203


| විසයානි | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 1. සචිත්ත | සුත්තං | ... | ... | 166—169 |
| 2. සාරිපුත්ත | ,, | ... | ... | 168—171 |
| 3. ඨිති | ,, | ... | ... | 172—177 |
| 4. සමථ | ,, | ... | ... | 176—183 |
| 5. පරිහාන | ,, | ... | ... | 184—189 |
| 6. පඨමසඤ්ඤා | ,, | ... | ... | 188—189 |
| 7. දුතියසඤ්ඤා | ,, | ... | ... | 190—191 |
| 8. මූලක | ,, | ... | ... | 190—193 |
| 9. පබ්බජ්ජා | ,, | ... | ... | 192—195 |
| 10. ගිරිමානන්ද | ,, | ... | ... | 194—203 |


### 2 – 2. යමකවග්ගො 204 – 235


| | | | | |
|---|---|---|---|---|
| 1. අවිජ්ජා | සුත්තං | ... | ... | 204—209 |
| 2. තණ්හා | ,, | ... | ... | 210—215 |
| 3. නිට්ඨඞ්ගත | ,, | ... | ... | 216—217 |
| 4. අවෙච්චප්පසන්න | ,, | ... | ... | 216—217 |
| 5. පඨම සුඛ | ,, | ... | ... | 218—219 |
| 6. දුතිය සුඛ | ,, | ... | ... | 218—221 |
| 7. පඨම නළකපාන | ,, | ... | ... | 220—227 |
| 8. දුතිය නළකපාන | ,, | ... | ... | 226—231 |
| 9. පඨම කථාවත්ථු | ,, | ... | ... | 230—233 |
| 10. දුතිය කථාවත්ථු | ,, | ... | ... | 232—235 |


### 2 – 3. ආකඞ්ඛවග්ගො 236 – 267


| | | | | |
|---|---|---|---|---|
| 1. ආකඞ්ඛෙය්‍යා | සුත්තං | ... | ... | 236—239 |
| 2. කණ්ටක | ,, | ... | ... | 240—243 |
| 3. ඉට්ඨධම්ම | ,, | ... | ... | 242—245 |
| 4. වඩ්ඪී | ,, | ... | ... | 244—247 |
| 5. මිගසාලා | ,, | ... | ... | 246—257 |
| 6. තයොධම්ම | ,, | ... | ... | 256—265 |
| 7. කාක | ,, | ... | ... | 264—265 |
| 8. නිගණ්ඨ | ,, | ... | ... | 266—267 |
| 9. ආඝාතවත්ථු | ,, | ... | ... | 266—267 |
| 10. ආඝාතපටිවිනය | ,, | ... | ... | 266—267 |

## අඞ්ගුත්තරනිකායෙ ඡට්ඨභාග විසයසූචි


### 2 - 4. ථෙරවග්ගො 268—315

| විසයානි | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|
| 1. බාහුන | සුත්තං | ... | ... | 268—269 |
| 2. ආනන්ද | ,, | ... | ... | 268—275 |
| 3. පුණ්ණිය | ,, | ... | ... | 274—277 |
| 4. බ්‍යාකරණ | ,, | ... | ... | 276—281 |
| 5. කත්ථී | ,, | ... | ... | 280—289 |
| 6. අධිමාන | ,, | ... | ... | 288—295 |
| 7. අධිකරණික | ,, | ... | ... | 294—303 |
| 8. අක්කොසක | ,, | ... | ... | 302—305 |
| 9. කොකාලික | ,, | ... | ... | 304—313 |
| 10. ඛීණාසවබල | ,, | ... | ... | 312—315 |

### 2-5. උපාලිවග්ගො 316—377

| | | | | |
|---|---|---|---|---|
| 1. කාමභොගී | සුත්තං | ... | ... | 316—327 |
| 2. භය | ,, | ... | ... | 326—333 |
| 3. කිංදිට්ඨික | ,, | ... | ... | 332—339 |
| 4. වජ්ජියමාහිත | ,, | ... | ... | 340—347 |
| 5. උත්තිය | ,, | ... | ... | 346—351 |
| 6. කොකනද | ,, | ... | ... | 350—357 |
| 7. ආහුනෙය්‍ය | ,, | ... | ... | 356—361 |
| 8. ථෙර | ,, | ... | ... | 360—363 |
| 9. උපාලි | ,, | ... | ... | 362—377 |
| 10. භබ්බාභබ්බ | ,, | ... | ... | 376—377 |

## තතිය පණ්ණාසකො

### 3 - 1. සමණසඤ්ඤාවග්ගො 378—451

| | | | | |
|---|---|---|---|---|
| 1. සමණසඤ්ඤා | සුත්තං | ... | ... | 378—379 |
| 2. බොජ්ඣඞ්ග | ,, | ... | ... | 378—381 |
| 3. මිච්ඡත්ත | ,, | ... | ... | 380—381 |
| 4. බීජ | ,, | ... | ... | 382—385 |
| 5. විජ්ජා | ,, | ... | ... | 384—387 |
| 6. නිජ්ජර | ,, | ... | ... | 386—389 |
| 7. ධොවන | ,, | ... | ... | 388—393 |
| 8. තිකිච්ඡක | ,, | ... | ... | 392—395 |
| 9. වමන | ,, | ... | ... | 394—397 |

| විසයානි | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 10. | නිද්ධමනීය | සුත්තං | ... | ... | 396– 399 |
| 11. | අසෙඛ | ,, | ... | ... | 398—399 |
| 12. | අසෙඛියධම්ම | ,, | ... | ... | 400—401 |

### 3-2. පච්චොරොහණීවග්ගො 402—423

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පඨම අධම්ම | සුත්තං | ... | ... | 402—403 |
| 2. | දුතිය අධම්ම | ,, | ... | ... | 402—407 |
| 3. | තතිය අධම්ම | ,, | ... | ... | 406—415 |
| 4. | අජිත | ,, | ... | ... | 416—421 |
| 5. | සඞ්ගාරව | ,, | ... | ... | 420—423 |
| 6. | ඔරිමතීර | ,, | ... | ... | 422—425 |
| 7. | පඨම පච්චොරොහණී | ,, | ... | ... | 424—429 |
| 8. | දුතිය පච්චොරොහණී | ,, | ... | ... | 430—431 |
| 9. | පුබ්බඞ්ගම | ,, | ... | ... | 430—431 |
| 10. | ආසවක්ඛය | ,, | ... | ... | 432—433 |

### 3-3. පරිසුද්ධවග්ගො 434-439

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පඨම | සුත්තං | ... | ... | 434—435 |
| 2. | දුතිය | ,, | ... | ... | ,, ,, |
| 3. | තතිය | ,, | ... | ... | ,, ,, |
| 4. | චතුත්ථ | ,, | ... | ... | ,, ,, |
| 5. | පඤ්චම | ,, | ... | ... | 436—437 |
| 6. | ඡට්ඨම | ,, | ... | ... | ,, ,, |
| 7. | සත්තම | ,, | ... | ... | ,, ,, |
| 8. | අට්ඨම | ,, | ... | ... | ,, ,, |
| 9. | නවම | ,, | ... | ... | 438—439 |
| 10. | දසම | ,, | ... | ... | ,, ,, |
| 11. | එකාදසම | ,, | ... | ... | ,, ,, |

### 3 – 4. සාධුවග්ගො 440 – 445

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සාධු | සුත්තං | ... | ... | 440—441 |
| 2. | අරියධම්ම | ,, | ... | ... | ,, ,, |
| 3. | කුසල | ,, | ... | ... | ,, ,, |
| 4. | අත්ථ | ,, | ... | ... | 442—443 |
| 5. | ධම්ම | ,, | ... | ... | ,, ,, |
| 6. | සාසව | ,, | ... | ... | ,, ,, |
| 7. | සාවජ්ජ | ,, | ... | ... | ,, ,, |

| විසයානි | | | | පිටඨඞ්කා |
|---|---|---|---|---|
| 8. තපනීය | සුත්තං | ... | ... | 444—445 |
| 9. ආවයගාමී | ,, | ... | ... | ,, ,, |
| 10. දුක්ඛුද්‍රය | ,, | ... | ... | ,, ,, |
| 11. දුක්ඛවිපාක | ,, | ... | ... | ,, ,, |

## 3 - 5. අරියවග්ගො 446 - 451

| | | | | |
|---|---|---|---|---|
| 1. අරියමග්ග | සුත්තං | ... | ... | 446—447 |
| 2. සුක්කමග්ග | ,, | ... | ... | ,, ,, |
| 3. සද්ධම්ම | ,, | ... | ... | ,, ,, |
| 4. සප්පුරිසධම්ම | ,, | ... | ... | 448—449 |
| 5. උප්පාදෙතබ්බ | ,, | ... | ... | ,, ,, |
| 6. ආසෙවිතබ්බ | ,, | ... | ... | ,, ,, |
| 7. භාවෙතබ්බ | ,, | ... | ... | ,, ,, |
| 8. බහුලීකත්තබ්බ | ,, | ... | ... | 450—451 |
| 9. අනුස්සරිතබ්බ | ,, | ... | ... | ,, ,, |
| 10. සච්ඡිකාතබ්බ | ,, | ... | ... | ,, ,, |

## චතුත්ථපණ්ණාසකො

## 4 - 1. පුග්ගලවග්ගො 452-455

| | | | | |
|---|---|---|---|---|
| 1. සෙවිතබ්බ | සුත්තං | ... | ... | 452—453 |
| 2 12 භජිතබ්බාදිඑකාදස සුත්තානි | | ... | ... | 452—455 |

## 4 - 2. ජාණුස්සොණිවග්ගො 456-499

| | | | | |
|---|---|---|---|---|
| 1. බ්‍රාහ්මණපච්චොරොහණී සුත්තං | | ... | ... | 456—459 |
| 2. අරියපච්චොරොහණී | ,, | ... | ... | 460—461 |
| 3. සඞ්ගාරව | ,, | ... | ... | 460—463 |
| 4. ඔරිමතීර | ,, | ... | ... | 462—465 |
| 5. පඨම අධම්ම | ,, | ... | ... | 464—465 |
| 6. දුතිය අධම්ම | ,, | ... | ... | 466—477 |
| 7. තතිය අධම්ම | ,, | ... | ... | 476—477 |
| 8. කම්මනිදාන | ,, | ... | ... | 478—479 |
| 9. සපරික්කමන | ,, | ... | ... | 478—481 |
| 10. චුන්ද | ,, | ... | ... | 480—491 |
| 11. ජාණුස්සොණි | ,, | ... | ... | 490—499 |

## 4 – 3. සාධුවග්ගො 500 – 507


| විසයානි | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 1. | සාධු | සුත්තං | ... | ... | 500—501 |
| 2. | අරියධම්ම | ,, | ... | ... | ,, ,, |
| 3. | කුසල | ,, | ... | ... | 502—503 |
| 4. | අත්ථ | ,, | ... | ... | ,, ,, |
| 5. | ධම්ම | ,, | ... | ... | ,, ,, |
| 6. | සාසවධම්ම | ,, | ... | ... | 504—505 |
| 7. | සාවජ්ජ | ,, | ... | ... | ,, ,, |
| 8. | තපනීය | ,, | ... | ... | ,, ,, |
| 9. | ආචයගාමී | ,, | ... | ... | 506—507 |
| 10. | දුක්ඛුද්‍රය | ,, | ... | ... | ,, ,, |
| 11. | දුක්ඛවිපාක | ,, | ... | ... | ,, ,, |


## 4–4. අරියමග්ගවග්ගො 508 – 515


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අරියමග්ග | සුත්තං | ... | ... | 508—509 |
| 2. | කණ්හමග්ග | ,, | ... | ... | ,, ,, |
| 3. | සද්ධම්ම | ,, | ... | ... | ,, ,, |
| 4. | සප්පුරිසධම්ම | ,, | ... | ... | 510—511 |
| 5. | උප්පාදෙතබ්බධම්ම | ,, | ... | ... | ,, ,, |
| 6. | ආසෙවිතබ්බධම්ම | ,, | ... | ... | ,, ,, |
| 7. | භාවෙතබ්බධම්ම | ,, | ... | ... | 512—513 |
| 8. | බහුලීකාතබ්බධම්ම | ,, | ... | ... | ,, ,, |
| 9. | අනුස්සරිතබ්බධම්ම | ,, | ... | ... | ,, ,, |
| 10. | සච්ඡිකාතබ්බධම්ම | ,, | ... | ... | 514—515 |


## 4–5 (අපර) පුග්ගලවග්ගො 516–519


1–12 සෙවිතබ්බාදිද්වාදසසුත්තානි ... ... 516—519


# පණ්ණාසාතිරෙකසුත්තානි

## 1. කරජකායවග්ග 520–563


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පඨම නිරය | සුත්තං | ... | ... | 520—527 |
| 2. | දුතිය නිරය | ,, | ... | ... | 526—529 |
| 3. | මාතුගාම | ,, | ... | ... | 528—531 |

| විසයානි | | සුත්තං | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 4. | උපාසිකා | ,, | ... | ... | 530—531 |
| 5. | විසාරද | ,, | ... | ... | 532—533 |
| 6. | සංසප්පනියපරියාය | ,, | ... | ... | 532—539 |
| 7. | පඨම සඤ්චෙතනික | ,, | ... | ... | 538—551 |
| 8. | දුතිය සඤ්චෙතනික | ,, | ... | ... | 550—555 |
| 9. | කරජකාය | ,, | ... | ... | 554—559 |
| 10. | අධම්මචරියා | ,, | ... | ... | 558—563 |

**2. සාමඤ්ඤවග්ගො 564-577**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පඨම | සුත්තං | ... | ... | 564—565 |
| 2. | දුතිය | ,, | ... | ... | 564—567 |
| 3. | තතිය | ,, | ... | ... | 568—571 |
| 4. | චතුත්ථ | ,, | ... | ... | 570—575 |
| 5-16 | පඤ්චමාදිසුත්තානි | | ... | ... | 574—577 |

**රාගාදිපෙය්‍යාලං 578—581**

| | | | | |
|---|---|---|---|---|
| 1-510. | රාගාදි-පමාදන්තසුත්තානි | ... | ... | 578—583 |


## එකාදසකනිපාතො 584-683

### 1. නිස්සයවග්ගො 584-617


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | කිමත්ථිය | සුත්තං | ... | ... | 584—587 |
| 2. | නචෙතනාකරණීය | ,, | ... | ... | 586—591 |
| 3. | පඨම උපනිස | ,, | ... | ... | 590—593 |
| 4. | දුතිය උපනිස | ,, | ... | ... | 592—595 |
| 5. | තතිය උපනිස | ,, | ... | ... | 594—597 |
| 6. | ව්‍යසන | ,, | ... | ... | 596—599 |
| 7. | පඨමසඤ්ඤා | ,, | ... | ... | 598—605 |
| 8. | මනසිකාර | ,, | ... | ... | 604—607 |
| 9. | සද්ධ | ,, | ... | ... | 608—613 |
| 10. | මොරනිවාප | ,, | ... | ... | 614—617 |

## 2. අනුස්සතිවග්ගො 618-675


| විසයානි | | | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|---|---|
| 1. | පඨම මහානාම | සුත්තං | ... | ... | 618—625 |
| 2. | දුතිය මහානාම | ,, | ... | ... | 626—629 |
| 3. | නන්දිය | ,, | ... | ... | 630—635 |
| 4. | සුභූති | ,, | ... | ... | 634—645 |
| 5. | මෙත්තානිසංස | ,, | ... | ... | 644—645 |
| 6. | අට්ඨකනාගර | ,, | ... | ... | 646—656 |
| 7. | ගොපාලක | ,, | ... | ... | 652—665 |
| 8. | පඨම සමාධි | ,, | ... | ... | 664—667 |
| 9. | දුතිය සමාධි | ,, | ... | ... | 668—671 |
| 10. | තතිය සමාධි | ,, | ... | ... | 670—673 |
| 11. | චතුත්ථ සමාධි | ,, | ... | ... | 672—675 |


## 3. සාමඤ්ඤවග්ගො 676-678


1-960 අනිච්චානුපස්සනාදිසුත්තානි 676—678


## 4. රාගාදිපෙය්‍යාලො 682-683


1-170 රාගාදි සුත්තානි 682—683


**රාගාදිපෙය්‍යාලො නිට්ඨිතො.**

**අඞ්ගුත්තරනිකායො සමත්තො.**

සුත්තන්තපිටකෙ අඞ්ගුත්තරනිකායෙ

# දසකනිපාතො

# අඞ්ගුත්තරනිකායෙ

## දසකනිපාතො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

## 1. ආනිසංසවග්ගො

### 10. 1. 1. 1

### කිමත්ථියසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

කිමත්ථියානි භන්තෙ කුසලානි සීලානි, කිමානිසංසානීති?

අවිප්පටිසාරත්ථානි ඛො ආනන්ද කුසලානි සීලානි, අවිප්පටිසාරානි-සංසානීති.

අවිප්පටිසාරො පන භන්තෙ කිමත්ථියො, කිමානිසංසොති?

අවිප්පටිසාරො ඛො ආනන්ද පාමොජ්ජත්ථො, පාමොජ්ජානිසංසො[1]ති.

පාමොජ්ජං පන භන්තෙ කිමත්ථියං, කිමානිසංසන්ති?

පාමොජ්ජං ඛො ආනන්ද පීතත්ථං, පීතානිසංසන්ති.

පීති පන භන්තෙ කිමත්ථියා, කිමානිසංසාති?

පීති ඛො ආනන්ද පස්සද්ධත්ථා, පස්සද්ධානිසංසාති.

---

1. පාමුජ්ජත්ථො-පාමුජ්ජානිසංසොති-සිමු. සයා. PTS.

# අඞ්ගුත්තරනිකායෙහි

## දසකනිපාතය

**ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!**

## 1. ආනිසංසවග්ගය

### 10. 1. 1. 1

### කිමත්ථිය සූත්‍රය

මා විසින් මෙසේ අසනලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ:

වහන්ස, කුශල ශීලයෝ කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත්තාහු ද?

ආනන්දය, කුශලශීලයෝ අවිප්‍රතිසාරය (නො විපිළිසරබව) අර්ථ කොට අවිප්‍රතිසාරය අනුසස් කොට ඇත්තාහ යි.

වහන්ස, අවිප්‍රතිසාරය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇද්ද?

ආනන්දයෙනි, අවිප්‍රතිසාරය ප්‍රාමොද්‍යය අර්ථ කොට ප්‍රාමොද්‍යය අනුසස් කොට ඇත.

වහන්ස, ප්‍රාමොද්‍යය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇද්ද?

ආනන්දයෙනි, ප්‍රාමොද්‍යය ප්‍රීතිය අර්ථ කොට ප්‍රීතිය අනුසස් කොට ඇත.

වහන්ස, ප්‍රීතිය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇද්ද?

ආනන්දයෙනි, ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිය අර්ථ කොට ප්‍රශ්‍රබ්ධිය අනුසස් කොට ඇත.

පස්සද්ධි පන භන්තෙ කිමත්ථියා, කිමානිසංසාති?

පස්සද්ධි ඛො ආනන්ද සුඛත්ථා, සුඛානිසංසාති.

සුඛං පන භන්තෙ කිමත්ථියං, කිමානිසංසන්ති?

සුඛං ඛො ආනන්ද සමාධත්ථං, සමාධානිසංසන්ති.

සමාධි පන භන්තෙ කිමත්ථියො, කිමානිසංසොති?

සමාධි ඛො ආනන්ද යථාභූතඤාණදස්සනත්ථො, යථාභූතඤාණදස්සනානිසංසොති.

යථාභූතඤාණදස්සනං පන භන්තෙ කිමත්ථියං, කිමානිසංසන්ති?

යථාභූතඤාණදස්සනං ඛො ආනන්ද නිබ්බිදාවිරාගත්ථං, නිබ්බිදාවිරාගානිසංසන්ති.

නිබ්බිදාවිරාගො පන භන්තෙ කිමත්ථියො, කිමානිසංසොති?

නිබ්බිදාවිරාගො ඛො ආනන්ද විමුත්තිඤාණදස්සනත්ථො, විමුත්තිඤාණදස්සනානිසංසොති.

ඉති ඛො ආනන්ද කුසලානි සීලානි අවිප්පටිසාරත්ථානි අවිප්පටිසාරානිසංසානි. අවිප්පටිසාරො පාමොජ්ජත්ථො, පාමොජ්ජානිසංසො. පාමොජ්ජං පීතත්ථං පීතානිසංසං. පීති පස්සද්ධත්ථා, පස්සද්ධානිසංසා. පස්සද්ධි සුඛත්ථා සුඛානිසංසා. සුඛං සමාධත්ථං සමාධානිසංසං. සමාධි යථාභූතඤාණදස්සනත්ථො යථාභූතඤාණදස්සනානිසංසො. යථාභූතඤාණදස්සනං නිබ්බිදාවිරාගත්ථං නිබ්බිදාවිරාගානිසංසං. නිබ්බිදාවිරාගො විමුත්තිඤාණදස්සනත්ථො විමුත්තිඤාණදස්සනානිසංසො. ඉති ඛො ආනන්ද කුසලානි සීලානි අනුපුබ්බෙන අග්ගාය පරෙන්ති[1]ති.

1. අරහත්තාය පූරෙන්ති ති-ස්‍යා

වහන්ස, ප්‍රශ්‍රබ්ධිය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇද්ද?

ආනන්දයෙනි, ප්‍රශ්‍රබ්ධිය සුඛය අර්ථ කොට සුඛය අනුසස් කොට ඇත.

වහන්ස, සුඛය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇද්ද?

ආනන්දයෙනි, සුඛය සමාධිය අර්ථ කොට සමාධිය අනුසස් කොට ඇත.

වහන්ස, සමාධිය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇද්ද?

ආනන්දයෙනි, සමාධිය යථාභූතඥානදර්ශනය අර්ථ කොට යථාභූතඥානදර්ශනය අනුසස් කොට ඇත.

වහන්ස, යථාභූතඥානදර්ශනය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇද්ද?

ආනන්දයෙනි, යථාභූතඥානදර්ශනය නිබ්බිදවිරාගය අර්ථ කොට නිබ්බිදවිරාගය අනුසස් කොට ඇත.

වහන්ස, නිබ්බිදවිරාගය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇද්ද?

ආනන්දයෙනි, නිබ්බිදවිරාගය විමුක්තිඥානදර්ශනය අර්ථ කොට විමුක්තිඥානදර්ශනය අනුසස් කොට ඇතැ යි.

ආනන්දයෙනි, මෙසේ කුශලශීලයෝ අවිප්‍රතිසාරය අර්ථ කොට අවිප්‍රතිසාරය අනුසස් කොට ඇතියහ. අවිප්‍රතිසාරය ප්‍රාමොද්‍යය අර්ථ කොට ප්‍රාමොද්‍යය අනුසස් කොට ඇත. ප්‍රාමොද්‍යය ප්‍රීතිය අර්ථ කොට ප්‍රීතිය අනුසස් කොට ඇත. ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිය අර්ථ කොට ප්‍රශ්‍රබ්ධිය අනුසස් කොට ඇත. ප්‍රශ්‍රබ්ධිය සුඛය අර්ථ කොට සුඛය අනුසස් කොට ඇත. සුඛය සමාධිය අර්ථ කොට සමාධිය අනුසස් කොට ඇත. සමාධිය යථාභූතඥානදර්ශනය අර්ථ කොට යථාභූතඥානදර්ශනය අනුසස් කොට ඇත. යථාභූතඥානදර්ශනය නිබ්බිදවිරාගය අර්ථ කොට නිබ්බිදවිරාගය අනුසස් කොට ඇත. නිබ්බිදවිරාගය විමුක්තිඥානදර්ශනය අර්ථ කොට විමුක්තිඥානදර්ශනය අනුසස් කොට ඇත. ආනන්දයෙනි, මෙසේ කුශලශීලයෝ අනුපිළිවෙළින් අර්හත්ත්‍ව සඞ්ඛ්‍යාත අග්‍රයට පැමිණෙන්නාහයි.

# 10. 1. 1. 2

## චෙතනාකරණීය සුත්තං

**[සාවත්ථිනිදානං]**

සීලවතො භික්ඛවෙ සීලසම්පන්නස්ස න චෙතනාය කරණීයං "අවිප්පටිසාරො මෙ උප්පජ්ජතූ"ති. ධම්මතා එසා භික්ඛවෙ යං සීලවතො සීලසම්පන්නස්ස අවිප්පටිසාරො උප්පජ්ජති. අවිප්පටිසාරිස්ස[1] භික්ඛවෙ න චෙතනාය කරණීයං "පාමොජ්ජං මෙ උප්පජ්ජතූ"ති. ධම්මතා එසා භික්ඛවෙ යං අවිප්පටිසාරිස්ස පාමොජ්ජං උප්පජ්ජති. පමුදිතස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං "පීති මෙ උප්පජ්ජතූ"ති. ධම්මතා එසා භික්ඛවෙ යං පමුදිතස්ස පීති උප්පජ්ජති. පීතිමනස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං 'කායො මෙ පස්සම්භතූ'ති. ධම්මතා එසා භික්ඛවෙ යං පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං 'සුඛං වෙදියාමී'ති. ධම්මතා එසා භික්ඛවෙ යං පස්සද්ධකායො සුඛං වෙදියති. සුඛිනො භික්ඛවෙ න චෙතනාය කරණීයං 'චිත්තං මෙ සමාධියතූ'ති. ධම්මතා එසා භික්ඛවෙ යං සුඛිනො චිත්තං සමාධියති. සමාහිතස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං 'යථාභූතං ජානාමි පස්සාමී'ති. ධම්මතා එසා භික්ඛවෙ යං සමාහිතො යථාභූතං ජානාති පස්සති. යථාභූතං භික්ඛවෙ ජානතො පස්සතො න චෙතනාය කරණීයං, 'නිබ්බින්දාමි විරජ්ජාමී'ති. ධම්මතා එසා භික්ඛවෙ යං යථාභූතං ජානං පස්සං නිබ්බින්දති විරජ්ජති. නිබ්බින්නස්ස භික්ඛවෙ විරජ්ජන්තස්ස න චෙතනාය කරණීයං 'විමුත්තිඤාණදස්සනං සච්ඡිකරොමී'ති. ධම්මතා එසා භික්ඛවෙ යං නිබ්බිණ්ණො[2] විරත්තො විමුත්තිඤාණදස්සනං සච්ඡිකරොති.

ඉති ඛො භික්ඛවෙ නිබ්බිදාවිරාගො විමුත්තිඤාණදස්සනත්ථො විමුත්තිඤාණදස්සනානිසංසො. යථාභූතඤාණදස්සනං නිබ්බිදාවිරාගත්ථං නිබ්බිදාවිරාගානිසංසං. සමාධි යථාභූතඤාණදස්සනත්ථො යථාභූතඤාණදස්සනානිසංසො. සුඛං සමාධත්ථං සමාධානිසංසං. පස්සද්ධි සුඛත්ථා සුඛානිසංසා. පීති පස්සද්ධත්ථා පස්සද්ධානිසංසා. පාමොජ්ජං පීතත්ථං පීතානිසංසං. අවිප්පටිසාරො පාමොජ්ජත්ථො පාමොජ්ජානිසංසො. කුසලානි සීලානි අවිප්පටිසාරත්ථානි අවිප්පටිසාරානිසංසානි.

ඉති ඛො භික්ඛවෙ ධම්මාවධම්මා අභිසන්දෙන්ති, ධම්මාවධම්මා පරිපූරෙන්ති අපාරාපාරං ගමනායාති.

---

1. අවිප්පටිසාරස්ස-මජ්ඣං
2. නිබ්බින්නො-සිමු

## 10. 1. 1. 2
## චේතනාකරණීය සූත්‍රය

**[සැවැත්නිදාන යි]**

මහණෙනි, සිල්සපන් සිල්වත් හට 'මට අවිප්‍රතිසාරය උපදීවා'යි චේතනායෙන් කරණී නැත. මහණෙනි, යම්හෙයෙකින් සිල්සපන් සිල්වත්හට අවිප්‍රතිසාරය උපදනේය යන මෙල ධර්මතා යි. මහණෙනි, 'මට ප්‍රාමොද්‍යය උපදීවා'යි අවිප්‍රතිසාරීහට චේතනායෙන් කරණී නැත. මහණෙනි අවිප්‍රතිසාරීහට ප්‍රාමොද්‍යය උපදනේය යන මෙල ධර්මතා යි. මහණෙනි, ප්‍රමුදිත වූවහුට 'මට ප්‍රීතිය උපදීවා'යි චේතනායෙන් කරණී නැත. මහණෙනි, ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේය යන මෙල ධර්මතා යි. මහණෙනි, ප්‍රීතිමනස්කයාට 'මාගේ කය සන්හිඳේවා'යි චේතනායෙන් කරණී නැත. මහණෙනි, ප්‍රීතිමනස්කයාගේ කය සන්හිඳේය යන මෙල ධර්මතා යි. මහණෙනි, සන්හුන් කය ඇතියහට 'සුව විඳිනෙම්වා'යි චේතනායෙන් කරණී නැත. මහණෙනි, සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ය යන මෙල ධර්මතා යි. මහණෙනි, 'මාගේ සිත සමාහිත වේවා'යි සුව ඇතියහට චේතනායෙන් කරණී නැත. මහණෙනි, සුව ඇතියහුගේ සිත සමාහිත වන්නේය යන මෙල ධර්මතා යි. මහණෙනි, සමාහිතයාහට 'යථාභූතය දන්නෙම්වයි දක්නෙම්වා'යි චේතනායෙන් කරණී නැත. මහණෙනි, සමාහිත වූයේ යථාභූතය දන්නේය, දක්නේය යන මෙල ධර්මතා යි. මහණෙනි, යථාභූතය දන්නහුට දක්නහුට 'නිර්වේද කරම්වයි විරාග කරම්වා'යි චේතනායෙන් කරණී නැත. මහණෙනි, යථාභූතය දන්නේ දක්නේ නිර්වේදය කෙරේය, නො ඇලේය යන මෙල ධර්මතා යි. මහණෙනි, නිර්වේදකරනුවහට විරාග කරනුවහට 'විමුක්තිඥානදර්ශනය පසක් කරනෙම්වා'යි චේතනායෙන්කරණී නැත. මහණෙනි, නිර්විණ්න වූයේ විරක්ත වූයේ විමුක්තිඥානදර්ශනය පසක් කරණේය යන මෙල ධර්මතා යි.

මහණෙනි, මෙසෙයින් නිබ්බිදාවිරාගය විමුක්තිඥානදර්ශනය අර්ථ කොට විමුක්තිඥානදර්ශනය අනුසස් කොට ඇත්තේ ය. යථාභූතඥාන-දර්ශනය නිබ්බිදාවිරාගය අර්ථ කොට නිබ්බිදාවිරාගය අනුසස් කොට ඇත. සමාධිය යථාභූතඥානදර්ශනය අර්ථ කොට යථාභූතඥානදර්ශනය අනුසස් කොට ඇත. සුඛය සමාධිය අර්ථ කොට සමාධිය අනුසස් කොට ඇත. ප්‍රශ්‍රබ්ධිය සුඛය අර්ථ කොට සුඛය අනුසස් කොට ඇත. ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිය අර්ථ කොට ප්‍රශ්‍රබ්ධිය අනුසස් කොට ඇත. ප්‍රාමොද්‍යය ප්‍රීතිය අර්ථ කොට ප්‍රීතිය අනුසස් කොට ඇත. අවිප්‍රතිසාරය ප්‍රාමොද්‍යය අර්ථ කොට ප්‍රාමොද්‍යය අනුසස් කොට ඇත. කුශලශීලයෝ අවිප්‍රතිසාරය අර්ථ කොට අවිප්‍රතිසාරය අනුසස් කොට ඇතියහ.

මහණෙනි, මෙසෙයින් (ත්‍රෛභූමකවර්ත සඞ්ඛ්‍යාත) ඔරිමතීරයෙන් නිර්වාණපාර සඞ්ඛ්‍යාත පාරිමතීරයට යාම සඳහා ධර්මයෝ ම ධර්මයන් පවත්වන්නාහ, ධර්මයෝ ම ධර්මයන් පුරන්නාහයි.

## 10. 1. 1. 3

## පඨම උපනිස සුත්තං

**[සාවත්ථියං]**

දුස්සීලස්ස භික්ඛවෙ සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ අසති පාමොජ්ජවිපන්නස්ස හතූපනිසා හොති පීති. පීතියා අසති පීතිවිපන්නස්ස හතූපනිසා හොති පස්සද්ධි. පස්සද්ධියා අසති පස්සද්ධිවිපන්නස්ස හතූපනිසං හොති සුඛං. සුඛෙ අසති සුඛවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ අසති නිබ්බිදාවිරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ රුක්ඛො සාඛාපලාසවිපන්නො. තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි න පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ දුස්සීලස්ස සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො, අවිප්පටිසාරෙ අසති හතූපනිසං හොති –පෙ- විමුත්තිඤාණදස්සනං.

සීලවතො භික්ඛවෙ සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ සති පාමොජ්ජසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති පීති. පීතියා සති පීතිසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති පස්සද්ධි. පස්සද්ධියා සති පස්සද්ධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති සුඛං. සුඛෙ සති සුඛසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ සති නිබ්බිදාවිරාගසම්පන්නස්ස උපනිස සම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ රුක්ඛො සාඛාපලාසසම්පන්නො තස්ස පපටිකා පි පාරිපූරිං ගච්ඡති තචොපි ඵෙග්ගුපි සාරොපි පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ සීලවතො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො, අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති –පෙ– විමුත්තිඤාණදස්සනන්ති.

## 10. 1. 1. 3

## ප්‍රථම උපනිස සූත්‍රය

**[සැවැත්නුවර]**

මහණෙනි, ශීලවිපන්න වූ දුශ්ශීලහට අවිප්‍රතිසාරය නටහෙතු ඇතියේ වෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම අවිප්‍රතිසාර විපන්නහට ප්‍රාමොද්‍යය නටහෙතු ඇතියේ වෙයි. ප්‍රාමොද්‍යය නැතිවත් ම ප්‍රාමොද්‍යවිපන්නහට ප්‍රීතිය නටහෙතු ඇති වෙයි. ප්‍රීතිය නැතිවත් ම ප්‍රීතිවිපන්නහට ප්‍රශ්‍රබ්ධිය නටඋපනිඃශ්‍රය ඇත්තේ වෙයි. ප්‍රශ්‍රබ්ධිය නැතිවත් ම ප්‍රශ්‍රබ්ධිවිපන්නහට සුඛය නටඋපනිඃශ්‍රය ඇතියේ වෙයි. සුඛය නැතිවත් ම සුඛවිපන්නහට සම්‍යක්සමාධිය නටඋපනිඃශ්‍රය ඇතියේ වෙයි. සම්මාසමාධිය නැතිවත් ම සම්මාසමාධිවිපන්නහට යථාභූත ඥානදර්ශනය නටඋපනිඃශ්‍රය ඇතියේ වෙයි. යථාභූත ඥානදර්ශනය නැතිවත් ම යථාභූත ඥානදර්ශනවිපන්නහට නිබ්බිදවිරාගය නටඋපනිඃශ්‍රය ඇති වෙයි. නිබ්බිදවිරාගය නැතිවත් ම නිබ්බිදවිරාගවිපන්නහට විමුක්ති ඥානදර්ශනය නටඋපනිඃශ්‍රය ඇත්තේ වේ.

මහණෙනි, යම් සේ රුකෙක් අතුකොළින් ගිලිහුනේ නම් එහි පිට පොතුදු පිරිපුන්බවට නොයෙයි. ඇතුළුපොතුදු, ඵලදු හරදු පිරිපුන්බවට නොයේ, මහණෙනි, එසෙයින් ම ශීලවිපන්න දුශ්ශීලහට අවිප්‍රතිසාරය නටඋපනිඃශ්‍රය ඇත්තේය. අවිප්‍රතිසාරය නැතිවත් ම...විමුක්ති ඥානදර්ශනය නටඋපනිඃශ්‍රය ඇත්තේ යි.

මහණෙනි, සිල්සපන් සිල්වත්හට අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නහට ප්‍රාමොද්‍යය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රාමොද්‍ය ඇතිවත් ම ප්‍රාමොද්‍යසම්පන්නහට ප්‍රීතිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රීතිය ඇතිවත් ම ප්‍රීතිසම්පන්නහට ප්‍රශ්‍රබ්ධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රශ්‍රබ්ධිය ඇතිවත් ම ප්‍රශ්‍රබ්ධිසම්පන්නහට සුඛය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සුඛය ඇතිවත් ම සුඛසම්පන්නහට සම්මාසමාධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සම්මාසමාධිය ඇතිවත් ම සම්මාසමාධිසම්පන්නහට යථාභූත ඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. යථාභූත ඥානදර්ශනය ඇතිවත් ම යථාභූත ඥානදර්ශනසම්පන්නහට නිබ්බිදවිරාගය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිබ්බිදවිරාගය ඇතිවත් ම නිබ්බිදවිරාගසම්පන්නහට විමුක්ති ඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වේ.

මහණෙනි, යම්සේ ශාඛාපලාස සමෘද්ධ වෘක්ෂයෙක් වේ ද, එහි පිට පොතුදු පිරිපුන්බවට යෙයි. ඇතුළුපොතුදු බොරුදු හරදු පිරිපුන් බවට යෙයි. මහණෙනි, එසෙයින්ම සිල්සපන් සිල්වත්හට අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නහට ... විමුක්ති ඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වේ යි.

## 10. 1. 1. 4

## දුතිය උපනිස සුත්තං

**[සාවත්ථියං]**

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි: දුස්සීලස්ස ආවුසො සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති -පෙ- විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි ආවුසො රුක්ඛො සාඛාපලාස විපන්නො, තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි න පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො ආවුසො දුස්සීලස්ස සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති -පෙ- විමුත්තිඤාණදස්සනං.

සීලවතො ආවුසො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිස-සම්පන්නං හොති -පෙ- විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි ආවුසො රුක්ඛො සාඛා පලාසසම්පන්නො, තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො ආවුසො සීලවතො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති -පෙ- විමුත්තිඤාණදස්සනන්ති.

## 10. 1. 1. 5

## තතිය උපනිස සුත්තං

**[සාවත්ථි]**

තත්‍ර ඛො ආයස්මා ආනන්දො භික්ඛූ ආමන්තෙසි: දුස්සීලස්ස ආවුසො සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ අසති පාමොජ්ජවිපන්නස්ස හතූපනිසා හොති පීති. පීතියා අසති පීතිවිපන්නස්ස හතූපනිසා හොති පස්සද්ධි. පස්සද්ධියා අසති පස්සද්ධිවිපන්නස්ස හතූපනිසං හොති සුඛං. සුඛෙ අසති සුඛවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි.

## 10. 1. 1. 4

## දුතිය උපනිස සූත්‍රය

**[සැවැත්නුවර]**

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මහණුන් ඇමතූහ: ඇවැත්නි, ශීලවිපන්නියට පැමිණි දුසිල්හට අවිප්‍රතිසාරය නටඋපනිඃශ්‍රය ඇති වෙයි, අවිප්‍රතිසාරය නැතිවත් ම අවිප්‍රතිසාරවිපන්නහට ... විමුක්තිඥානදර්ශනය නටඋපනිඃශ්‍රය ඇති වේ.

ඇවැත්නි, යම්සේ රුකෙක් නට අතුකොළ ඇත්තේ වේ ද, එහි පිට පොතුද පිරිපුන්බවට නොයෙයි. ඇතුළු පොතුද, බොරුද, හරද පිරිපුන් බවට නො යේ, ඇවැත්නි, එපරිදි ම ශීලවිපන්නියට පැමිණි දුසිල්හට අවිප්‍රතිසාරය නටඋපනිඃශ්‍රය ඇත්තේ වෙයි, අවිප්‍රතිසාරය නැතිවත් ම... විමුක්ති ඥානදර්ශනය නටඋපනිඃශ්‍රය ඇත්තේ වේ.

ඇවැත්නි, සිල්සපන් සිල්වත්හට අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නහට ... විමුක්තිඥාන-දර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වේ.

ඇවැත්නි, යම්සේ රුකෙක් ශාඛාපලාශසම්පන්න වේ ද, එහි පිට පොතුද පිරිපුන් බවට යෙයි. ඇතුළු පොතුද බොරුද හරද පිරිපුන් බවට යේ, ඇවැත්නි, එසෙයින් ම සිල්සපන් සිල්වත්හට අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇති වත් ම අවිප්‍රතිසාරසම්පන්නහට ... විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වේ යි.

## 10. 1. 1. 5

## තතිය උපනිස සූත්‍රය

**[සැවැත්]**

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මහණුන් ඇමතූහ: 'ඇවැත්නි, ශීලවිපන්නියට පැමිණි දුසිල්හට අවිප්‍රතිසාරය නටඋපනිඃශ්‍රය-සම්පන්න වෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම අවිප්‍රතිසාරවිපන්නහට ප්‍රාමොද්‍යය නටඋපනිඃශ්‍රය ඇති වෙයි. ප්‍රාමොද්‍යය නැතිවත් ම ප්‍රාමොද්‍යවිපන්නහට ප්‍රීතිය නටඋපනිඃශ්‍රය ඇති වෙයි. ප්‍රීතිය නැතිවත් ම ප්‍රීතිවිපන්නහට ප්‍රශ්‍රබ්ධිය නටඋපනිඃශ්‍රය ඇති වෙයි. ප්‍රශ්‍රබ්ධිය නැතිවත් ම ප්‍රශ්‍රබ්ධිවිපන්නහට සුඛය නටඋපනිඃශ්‍රය ඇති වෙයි. සුඛය නැතිවත් ම සුඛවිපන්නහට සම්මාසමාධිය නටඋපනිඃශ්‍රය ඇති වෙයි.

සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසො හොති. නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ අසති නිබ්බිදාවිරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි ආවුසො රුක්ඛො සාඛාපලාසවිපන්නො තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි න පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො ආවුසො දුස්සීලස්ස සීලවිපන්නස්ස හතූපනිසො හොති. අවිප්පටිසාරො, අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති -පෙ- විමුත්තිඤාණදස්සනං.

සීලවතො ආවුසො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති පාමොජ්ජං. පාමුජ්ජෙ සති පාමුජ්ජසම්පන්නස්ස උපනිසා සම්පන්නා හොති පීති. පීතියා සති පීතිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති පස්සද්ධි. පස්සද්ධියා සති පස්සද්ධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති සුඛං. සුඛෙ සති සුඛසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මා සමාධි. සම්මා සමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති නිබ්බිදාවිරාගො. නිබ්බිදාවිරාගෙ සති නිබ්බිදාවිරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි ආවුසො රුක්ඛො සාඛාපලාසසම්පන්නො තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති, තචොපි ඵෙග්ගුපි සාරොපි පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො ආවුසො සීලවතො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති -පෙ- විමුත්තිඤාණදස්සනන්ති.

සම්මාසමාධිය නැතිවත් ම සම්මාසමාධිවිපන්නහට යථාභූතඥානදර්ශනය නටඋපනිඃශ්‍රය ඇති වෙයි. යථාභූතඥානදර්ශනය නැතිවත් ම යථාභූත-ඥානදර්ශනවිපන්නහට නිබ්බිදවිරාගය නටඋපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිබ්බිදවිරාගය නැතිවත් ම නිබ්බිදවිරාගවිපන්නහට විමුක්තිඥානදර්ශනය නටඋපනිඃශ්‍රය ඇති වේ.

ඇවැත්නි, යම්සේ ශාඛාපලාශවිපන්න වෘක්ෂයෙක් වේද, එහි පිට පොතුදු පිරිපුන්බවට නොයෙයි, ඇතුළුපොතුදු බොරුදු හරදු පිරිපුන්බවට නොයේ, ඇවැත්නි, එසෙයින් ම ශීලවිපත්තියට පැමිණි දුසිල්හට අවිප්‍රතිසාරය නටඋපනිඃශ්‍රය ඇති වෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම ... විමුක්තිඥානදර්ශනය නටඋපනිඃශ්‍රය ඇතියේ වේ.

ඇවැත්නි, සිල්සපන් සිල්වත්හට අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි, අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නහට ප්‍රාමොද්‍යය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රාමොද්‍යය ඇතිවත් ම, ප්‍රාමොද්‍යසම්පන්නහට ප්‍රීතිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රීතිය ඇතිවත් ම ප්‍රීතිසම්පන්නහට ප්‍රශ්‍රබ්ධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රශ්‍රබ්ධිය ඇතිවත් ම ප්‍රශ්‍රබ්ධිසම්පන්න-හට සුඛය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සුඛය ඇතිවත් ම සුඛසම්පන්නහට සම්මාසමාධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සම්මාසමාධිය ඇතිවත් ම සම්මාසමාධිසම්පන්නහට යථාභූතඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. යථාභූතඥානදර්ශනය ඇතිවත් ම යථාභූතඥානදර්ශනසම්පන්නහට නිබ්බිදවිරාගය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිබ්බිදවිරාගය ඇතිවත් ම නිබ්බිදවිරාගසම්පන්නහට විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වේ.

ඇවැත්නි, යම්සේ ශාඛාපලාශයෙන් යුක්ත වෘක්ෂයෙක් වේ නම්, එහි පිටපොතුදු පිරිපුන්බවට යෙයි. ඇතුළුපොතුදු බොරුදු හරදු පිරිපුන්බවට යෙයි. ඇවැත්නි, එසෙයින් ම සිල්සපන්සිල්වත්හට අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරයඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නහට ...විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වේ යි.

## 10. 1. 1. 6

## සමාධි සුත්තං

**[සාවත්ථියං]**

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

සියා නු ඛො භන්තෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධ ලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස. න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සා ති?

සියා ආනන්ද භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවී සඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධ ලොකෙ ඉධ ලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස. සඤ්ඤී ච පන අස්සාති.

යථා කථම්පන භන්තෙ සියා භික්ඛුනො තථාරූපො සමාධි පටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස. සඤ්ඤී ච පන අස්සාති?

## 10. 1. 1. 6
## සමාධි සූත්‍රය

**[සැවැත්නුවර]**

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියහ, පැමිණ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ, එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ:

වහන්ස, යම්සේ පඨවිකසිණයෙහි පෘථවිසංඥා ඇති නො ම වේ නම්, මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ ද? ආපොකසිණයෙහි අප්සංඥා ඇති නො වේ නම්, තෙජොකසිණයෙහි තෙජඃසංඥා ඇති නො වේ නම්, වායොකසිණයෙහි වායුසංඥා ඇති නො වේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥා ඇති නො වේ නම්, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා ඇති නො වේ නම්, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතන සංඥා ඇති නො වේ නම්, නෙවසඤ්ඤානා සඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥා ඇති නො වේ නම් මෙ ලොව්හි මෙලෝ යන සංඥා ඇති නො වේ නම්, පරලොව්හි පරලෝ යන සංඥා ඇති නො වේ නම්, එබඳු සමාධි ප්‍රතිලාභයෙක් මහණහට වන්නේ ද?' යළි සංඥා ඇතියේත් වන්නේද යි?

ආනන්දයෙනි, යම්සේ පඨවිකසිණයෙහි පෘථිවිසංඥා නොවේ නම් මහණහට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වන්නේ යැ ආපො කසිණයෙහි ආපොසංඥා ඇති නො වේ නම්, තෙජො කසිණයෙහි තෙජඃසංඥා ඇති නො වේ නම්, වායො කසිණ සමාපත්තියෙහි වායුසංඥා ඇති නො වේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥා ඇති නො වේ නම් විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා ඇති නො වේ නම්, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා ඇති නො වේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා ඇති නො වේ නම්, මෙලොව්හි මෙලෝ යන සංඥා ඇති නො වේ නම්, පරලොව්හි පරලෝ යන සංඥා ඇති නො වේ නම්, මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ යැ. යළි සංඥා ඇතියේත් වන්නේ යි.

වහන්ස, කිසෙයින් පඨවිකසිණයෙහි පෘථවිසංඥා නො ම ඇති වෙ නම් ආපොකසිණයෙහි අප්සංඥා ඇති නො වේ නම්, තෙජොකසිණයෙහි තෙජස්සංඥා ඇති නො වේ නම් වායොකසිණයෙහි වායුසංඥා ඇති නො වේ නම් ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥා ඇති නො වේ නම් විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා ඇති නො වේ නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා ඇති නො වේ නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤා-යතන සංඥා ඇති නො වේ නම් මෙ ලොව්හි මෙ ලෝ යන සංඥා ඇති නො වේ නම් පරලොව්හි පරලෝ යන සංඥා ඇති නො වේ නම් මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ ද? යළි සංඥා ඇතියේත් වන්නේ ද?යි.

ඉධානන්ද භික්ඛු එවං සඤ්ඤී හොති: එතං සන්තං, එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති. එවං ඛො ආනන්ද සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

## 10. 1. 1. 7

## සාරිපුත්ත සුත්තං

[සාවත්ථියං]

අථ ඛො ආයස්මා ආනන්දො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසංකමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

සියානු ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස. සඤ්ඤී ච පන අස්සාති?

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ මෙ බඳු සංඥ ඇතියේ වෙයි; "යම් සර්වසංස්කාරයන්ගේ සමථයෙක් සර්වෝපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ නම් තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැ''යි. ආනන්දයෙනි, මෙසෙයින් යම් සේ පඨවිකසිණයෙහි පෘථිවිසංඥ ඇතියේ නො ම වේ නම් ආපොකසිණයෙහි අප්සංඥ නැතියේ වේ නම් තෙජොකසිණයෙහි තෙජස් සංඥ නැතියේ වේ නම් වායොකසිණයෙහි වායුසංඥ නැතියේ වේ නම් ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥ නැතියේ වේ නම් විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥ නැතියේ වේ නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥ නැතියේ වේ නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥ නැතියේ වේ නම් මෙ ලොව්හි මෙ ලෝ යන සංඥ නැතියේ වේ නම් පරලොව්හි පරලෝ යන සංඥ නැතියේ වේ නම් එතෙකුදුවත් සංඥීත් වේ නම් මෙසේ මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ යි.

## 10. 1. 1. 7

## සාරිපුත්ත සූත්‍රය

**[සැවැත්නුවර]**

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා පැමිණියහ. පැමිණ ආයුෂ්මත් සැරියුත් තෙරුන් හා සතුටු වූහ. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට තෙල කීහ;

ඇවැත් සාරිපුත්‍රයෙනි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥ නැතියේ වේ නම් ආපයෙහි අප්සංඥ නැතියේ වේ නම් තෙජස්හි තෙජස් සංඥ නැතියේ වේ නම් වායුයෙහි වායුසංඥ නැතියේ වේ නම් ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥ නැතියේ වේ නම් විඤ්ඤාණඤ්ඤායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥ නැතියේ වේ නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතන සංඥා නැතියේ වේ නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤා නැතියේ වේ නම් මෙලෝහි මෙලෝ සංඥ නැතියේ වේ නම් පරලොව්හි පරලෝ සංඥ නැතියේ වේ නම් එතෙකුදුවත් සංඥීත් වේ නම් මෙසේ මහණහට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වේ ද යි.

සියා ආවුසො ආනන්ද භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

යථා කථං පනාවුසො සාරිපුත්ත සියා භික්ඛුනො තථාරූපො සමාධි-පටිලාභො, යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, -පෙ- න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස. සඤ්ඤී ච පන අස්සාති?

එකමිදහං ආවුසො ආනන්ද සමයං ඉධෙව සාවත්ථියං විහරාමි අන්ධවනස්මිං තත්ථාහං තථාරූපං සමාධිං සමාපජ්ජිං යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අහොසිං, න ආපස්මිං ආපොසඤ්ඤී අහොසිං, න තෙජස්මිං තෙජොසඤ්ඤී අහොසිං, න වායස්මිං වායොසඤ්ඤී අහොසිං. න ආකාසා-නඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අහොසිං, න විඤ්ඤාණඤ්චා-යතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අහොසිං, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අහොසිං, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අහොසිං, න ඉධලොකෙ ඉධලොක-සඤ්ඤී අහොසිං, න පරලොකෙ පරලොකසඤ්ඤී අහොසින්ති.

කිං සඤ්ඤී පනායස්මා සාරිපුත්තො තස්මිං සමයෙ අහොසීති?

භවනිරොධො නිබ්බානං, භවනිරොධො නිබ්බානන්ති ඛො මෙ ආවුසො අඤ්ඤාව සඤ්ඤා උප්පජ්ජති, අඤ්ඤාව සඤ්ඤා නිරුජ්ඣති, සෙය්‍යථාපි ආවුසො සකලිකග්ගිස්ස ඣායමානස්ස අඤ්ඤාව අච්චි උප්පජ්ජති, අඤ්ඤාව අච්චි නිරුජ්ඣති, එවමෙව ඛො මෙ ආවුසො භවනිරොධො නිබ්බානං භවනිරොධො නිබ්බානන්ති අඤ්ඤාව සඤ්ඤා උප්පජ්ජති, අඤ්ඤාව සඤ්ඤා නිරුජ්ඣති. භවනිරොධො නිබ්බානන්ති සඤ්ඤී ච පනාහං ආවුසො තස්මිං සමයෙ අහොසින්ති.

ඇවැත් ආනන්දයෙනි, යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥ ඇතියේ නො වේ නම් ... පරලොකයෙහි පරලෝසංඥ නැතියේ වේ නම් සංඥීත් වේ නම් මහණහට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වේ යයි.

ඇවැත් ශාරිපුත්‍රයිනි, යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥ ඇතියේ නො ම වේ නම් ... පරලොකයෙහි පරලොකසංඥා ඇතියේ නො වේ නම් සංඥීත් වේ නම් මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් කිසෙයින් වේ ද?

ඇවැත් ආනන්දයෙනි, එක්කලෙක මම් මෙ සැවැත්හි ම අන්ධවනයෙහි වාසය කරමි. එහි දී මම් යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥී නො වීම් නම් අප්හි අප්සංඥී නො වීම් නම් තෙජස්හි තෙජස්සංඥී නො වීම් නම් වායුවෙහි වායුසංඥී නො වීම් නම් ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥී නො වීම් නම් විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥී නො වීම් නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥී නො වීම් නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥී නො වීම් නම්, ඉධලොකයෙහි ඉධලොකසංඥී නො වීම් නම් පරලොකයෙහි පරලොකසංඥී නො වීම් නම් එබඳු සමාධියකට සමවන්මි.

ඇවැත්නි, එකල ශාරිපුත්‍ර තෙමේ කවර සංඥ ඇතියෙක් වූයේ ද යි.

ඇවැත්නි, භවනිරොධය නිර්වාණය, භවනිරොධය නිර්වාණය යි අන් ම සංඥාවෙක් උපදනේ ය. අන් ම සංඥායෙක් නිරුද්ධ වන්නේ ය. එ කෙසේ යැ: ඇවැත්නි, ගිනිගත් රුක්පොතු ගින්නක්හුගේ අන් ම ගිනිසිළෙක් උපදනේ ය, අන් ම ගිනිසිළෙක් නිරුද්ධ වන්නේ ය. ඇවැත්නි, එපරිදි ම භවනිරොධය නිර්වාණය, භවනිරොධය නිර්වාණය යි අන් ම සංඥායෙක් උපදනේ ය, අන් ම සංඥායෙක් නිරුද්ධ වන්නේ ය. ඇවැත්නි, එසමයෙහි මම භවනිරොධය නිර්වාණය යි යන සංඥා ඇතියෙම් ම වීමි යි.

## 10. 1. 1. 8

## සද්ධ සුත්තං

[සාවත්ථියං]

සද්ධො ච භික්ඛවෙ භික්ඛු හොති නො ච සීලවා. එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති. තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං, ''කින්තාහං සද්ධො ච අස්සං සීලවා චා''ති. යතො ච ඛො භික්ඛවෙ භික්ඛු සද්ධො ච හොති සීලවා ච, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

සද්ධො ච භික්ඛවෙ භික්ඛු හොති, සීලවා ච, නො ච බහුස්සුතො -පෙ- බහුස්සුතො ච නො ච ධම්මකථිකො- ධම්මකථිකො ච නො ච පරිසාවචරො- පරිසාවචරො ච නො ච විසාරදො පරිසාය ධම්මං දෙසෙති- විසාරදො ච පරිසාය ධම්මං දෙසෙති නො ච විනයධරො- විනයධරො ච නො ච ආරඤ්ඤකො පන්තසෙනාසනො-ආරඤ්ඤකො ච පන්තසෙනාසනො නො ච චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී- චතුන්නඤ්ච ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී- නො ච ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති, තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං. 'කින්තාහං සද්ධො ච අස්සං සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදො ච පරිසාය ධම්මං දෙසෙය්‍යං, විනයධරො ච ආරඤ්ඤකො ච පන්තසෙනාසනො ච චතුන්නඤ්ච ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය'න්ති.

## 10. 1. 1. 8

## සද්ධ සූත්‍රය

මහණෙනි, භික්ෂු සැදැහැතියේත් වෙයි සිල්වත් නො ද වෙයි, මෙසේ හේ එ අංගයෙන් අපරිපූර්ණ වෙයි. උහු විසින් ඒ අංගය පිරිය යුතු. "කිසෙයින් මම සැදැහැතියෙම් ද, සිල් ඇතියෙම් ද වන්නෙම් දැ"යි, මහණෙනි, යම් කලෙක මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් වේ ද මෙසේ හේ ඒ අංගයෙන් පරිපූර්ණ වෙයි.

මහණෙනි, භික්ෂු සැදැහැතියේත් සිල් ඇතියේත් වෙයි. නො ද බහුශ්‍රැත වෙයි ... බහුශ්‍රැත ද වෙයි. ධර්මකථික නො ද වෙයි... ධර්මකථික වෙයි. පරිසාවචර නො ද වෙයි... පරිසාවචර වූයේත් විසාරද ව පිරිස්හි නො ද දහම් දෙසයි... විසාරද වූයේත් පිරිස්හි දහම් දෙසයි...නො ද විනයධර වෙයි... විනයධර ද වෙයි ප්‍රාන්තසෙනසුන් ඇති ආරණ්‍යක නො වෙයි... ප්‍රාන්තසෙනසුන්හි යෙදුණු ආරණ්‍යක වූයේත් ආභිචෙතසික වූ දිට්ඨධම්ම-සුඛවිහාර වූ සිවුදැහැන් නිකාමලාභියෙක් අකිච්ඡලාභියෙක් අකසිර-ලාභියෙක් නො ද වෙයි... ආභිචෙතසික, දිට්ඨධම්මසුඛවිහාර වූ සිවුදැහැන් නිකාමලාභියෙක් අකිච්ඡලාභියෙක් අකසිරලාභියෙක් ද වෙයි ආස්‍රවක්ෂය-යෙන් අනාස්‍රව චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය දිටුදැමියෙහි ම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට එයට එළඹ නො වෙසෙයි.

මෙසේ හේ ඒ අංගයෙන් අපරිපූර්ණ වෙයි. ඔහු විසින් ඒ අංගය පිරිය යුතු වෙයි. "කිසෙයින් මම සැදැහැතියෙම් ද සිල් ඇතියෙම් ද බහුශ්‍රැතයෙම් ද ධර්මකථිකයෙම් ද වන්නෙම් ද, පරිසාවචරයෙම් ද විසාරද ව පිරිස් හි දහම් දෙසන්නෙම් ද විනයධර වූයෙම් ප්‍රාන්තසෙනසුන් ඇතියෙම් ආරණ්‍යක ද වූයෙම් ආභිචෙතසික වන දිට්ඨධම්මසුඛවිහාර වන සිවුදැහැන් නිකාමලාභියෙම් අකිච්ඡලාභියෙම් අකසිරලාභියෙම් වන්නෙම් ද ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව චිත්තවිමුක්ති ප්‍රඥාවිමුක්ති දිටුදැමියෙහි ම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට එයට පැමිණ වාසය කරන්නෙම් දැ යි.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛු සද්ධො ච හොති සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදෙ ච පරිසාය ධම්මං දෙසෙති, විනයධරො ච ආරඤ්ඤකො ච පන්තසෙනාසනො, චතුන්නඤ්ච ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සමන්තපාසාදිකො ච හොති සබ්බාකාර පරිපූරොචාති.

## 10. 1. 1. 9

## සන්තවිමොක්ඛ සුත්තං

[සාවත්ථියං]

සද්ධො ච භික්ඛවෙ භික්ඛු හොති, නො ච සීලවා -පෙ- සීලවා ච නො ච බහුස්සුතො- බහුස්සුතො ච නො ච ධම්මකථිකො- ධම්මකථිකො ච නො ච පරිසාවචරො- පරිසාවචරො ච නො ච විසාරදෙ- පරිසාය ධම්මං දෙසෙති- විසාරදෙ ච පරිසාය ධම්මං දෙසෙති නො ච විනයධරො- විනයධරො ච නො ච ආරඤ්ඤකො පන්තසෙනාසනො- ආරඤ්ඤකො ච පන්තසෙනාසනො නො ච යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ කායෙන ඵුසිත්වා විහරති- යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ ච කායෙන ඵුසිත්වා විහරති නො ච ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති.

තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං "කින්තාහං සද්ධො ච අස්සං සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදෙ ච පරිසාය ධම්මං දෙසෙය්‍යං, විනයධරො ච ආරඤ්ඤකො ච පන්තසෙනාසනො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ ච කායෙන ඵුසිත්වා විහරෙය්‍යං ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති.

මහණෙනි, යම් කලෙක පටන් මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් බහුශ්‍රැත වූයේත් ධර්මකථික වූයේත් පරිසාවචර වූයේත් විසාරද වූයේත් පිරිස්හි දහම් දෙසා ද විනයධර වූයේත් ආරණ්‍යක වූයේ ප්‍රාන්තසෙනාසන ඇතියේත් ආභිචෙතසික දිට්ඨධම්මසුඛවිහාර සතර ධ්‍යානයන්ගේ නිකාමලාභියෙක් අකිච්ඡලාභියෙක් අකසිරලාභියෙක් වේ ද, ආස්‍රවයන්ගේ ක්ෂයයෙනුදු අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය දිටුදැමියෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට පැමිණ වාසය කෙරේද, මෙසේ හේ එඅඟින් පරිපූර්ණ වේය යි.

මහණෙනි, මේ දසදහමින් සමන්වාගත මහණ සමන්තපාසාදික ද වෙයි. සර්වාකාර පරිපූර්ණ ද වෙයි.

## 10. 1. 1. 9

## සන්තවිමොක්ඛ සූත්‍රය

[සැවැත්නුවර]

මහණෙනි, භික්ෂු සැදැහැතියේත් වෙයි, නො ද සිල් ඇතියේ වෙයි... සිල් ඇතියේත් නො ද බහුශ්‍රැත වෙයි... බහුශ්‍රැත වූයේත් නො ද ධර්මකථික වෙයි... ධර්මකථික වූයේත් නො ද පරිසාවචර වෙයි... පරිසාවචර වූයේත් නො ද විසාරද වූයේ පිරිස්හි දහම් දෙසයි... විසාරද වූයේත් පිරිස්හි දහම් දෙසයි... නො ද විනයධර වෙයි... විනයධර වූයේත් ප්‍රාන්ත සෙනසුන් ඇති ආරණ්‍යක නො ද වෙයි... ප්‍රාන්ත සෙනසුන් ඇති ආරණ්‍යක වූයේත් රූපයන් ඉක්ම ආරූප්‍ය වූ යම් ඒ ශාන්ත විමොක්ෂ කෙනෙක් වෙත් නම් උන් කයින් පැහැස නො ද වෙසෙයි... රූපයන් ඉක්ම සිටුනා ආරූප්‍ය වූ යම් ඒ ශාන්ත විමොක්ෂ කෙනෙක් වෙත් නම් උනුදු නාමකයින් පැහැස වෙසෙයි. ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්ති ප්‍රඥාවිමුක්ති දිටුදැමියෙහි තෙමේ විශිෂ්ටඥාන-යෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වාසය නො කෙරෙයි. මෙසේ හේ එඅඟින් අපරිපූර්ණ වෙයි.

ඔහු විසින් එ අංගය පිරිය යුතු, කිසෙයින් මම් සැදැහැතියෙම් සිල් ඇතියෙම් බහුශ්‍රැත වූයෙම් ධර්මකථික ද වූයෙම් පරිසාවචර ද වූයෙම් විසාරද ව පිරිස්හි දහම් දෙසනුයෙම් විනයධර ද වූයෙම් ප්‍රාන්ත-සෙනසුන් ඇති ආරණ්‍යක ද වූයෙම් රූපාවචර ධ්‍යානයන් ඉක්ම සිටුනා ආරූප්‍ය වූ යම් ඒ ශාන්ත විමොක්ෂ කෙනෙක් වෙත් නම් උනුදු කයින් පැහැස වසනුයෙම් ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට එයට පැමිණ වාසය කරන්නෙම් දැ'යි.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛු සද්ධො ච හොති සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදො ච පරිසාය ධම්මං දෙසෙති, විනයධරො ච ආරඤ්ඤකො ච පන්තසෙනාසනො යෙ තෙ සන්තා විමොක්ඛා අතික්කම්ම රූපෙ ආරුප්පා තෙ ච කායෙන ඵස්සිත්වා විහරති ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු සමන්තපාසාදිකො ච හොති, සබ්බාකාර පරිපූරො චාති.

සන්තවිමොක්ඛසුත්තං නවමං.

## 10. 1. 1. 10

## විජ්ජා සුත්තං

[සාවත්ථියං]

සද්ධො ච භික්ඛවෙ භික්ඛු හොති නො ච සීලවා එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති, තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං:''කින්තාහං සද්ධො ච අස්සං සීලවා චා''ති.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛු සද්ධො ච හොති සීලවා ච එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

සද්ධො ච භික්ඛවෙ භික්ඛු හොති සීලවා ච නො ච බහුස්සුතො-පෙ-බහුස්සුතො ච නො ච ධම්මකථිකො-ධම්මකථිකො ච නො ච පරිසාවචරො-පරිසාවචරො ච නො ච විසාරදො පරිසාය ධම්මං දෙසෙති- විසාරදො ච පරිසාය ධම්මං දෙසෙති නො ච විනයධරො- විනයධරො ච නො ච අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති -පෙ- අනෙකවිහිතඤ්ච පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, නො ච දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන-පෙ-යථාකම්මූපගෙ සත්තෙ පජානාති- දිබ්බෙන ච චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති, නො ච ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, එවං සො තෙනඞ්ගෙන අපරිපූරො හොති.

මහණෙනි, මහණ යම් කලෙක සැදැහැතියේත්, සිල් ඇතියේත් වේ ද, බහුශ්‍රැත වූයේත්, ධර්මකථිකත් වේ ද, පරිසාවචර වූයේත්, විසාරද වූයේත් පිරිස්හි දහම් දෙසා ද, විනයධර වූයේත්, ප්‍රාන්තසෙනසුන් ඇති ආරණ්‍යක වූයේත්, රූපධ්‍යානයන් ඉක්ම සිටුනා අරූපධ්‍යාන වූ යම් ඒ ශාන්ත විමොක්ෂ කෙනෙක් වෙත් නම් ඕවුනුදු නාමකයින් පැහැස වාසය කෙරේ ද, ආශ්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාශ්‍රව චිත්තවිමුක්ති ප්‍රඥාවිමුක්ති ඉහාත්මයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කෙරේ ද, මෙසේ හේ ඒ අඟින් පරිපූර්ණ වෙයි. මහණෙනි, මේ දශධර්මයෙන් සමන්වාගත මහණ සමන්තපාසාදික ද වේ යයි.

## 10. 1. 1. 10
## විජ්ජා සූත්‍රය

**[සැවැත්නුවර]**

මහණෙනි, මහණ සැදැහැතියේත් වෙයි. නො ද සිල්වත් වෙයි. මෙසේ හේ ඒ අංගයෙන් අපරිපූර්ණ වෙයි. ඔහු විසින් ඒ අංගය පිරියයුතු. කිසෙයින් මම සැදැහැතියෙම් ද සිල් ඇතියෙම් ද වන්නෙම් දැ'යි.

මහණෙනි, යම් කලෙක මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් වේ ද මෙසේ හේ ඒ අඟින් පරිපූර්ණ වෙයි.

මහණෙනි, මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් වෙයි. නො ද බහුශ්‍රැත වෙයි... බහුශ්‍රැත වූයේත් නො ද ධර්මකථික වෙයි... ධර්මකථික ද වෙයි පරිසාවචර නො වෙයි... පරිසාවචර ද වෙයි, විසාරද වූයේ පිරිස්හි දහම් නො ද දෙසයි... විසාරද වූයේ පිරිස්හි දහම් ද දෙසයි, නො ද විනයධර වෙයි... විනයධර වූයේත් අනෙකවිහිත පූර්වනිවාසයන් නො ද සිහිකෙරෙයි. එනම් එක් දැයකුදු දෙදැයකුදු ... මෙසේ ආකාර සහිත උද්දෙස සහිත අනෙකවිහිත පූර්වනිවාසයන් සිහි කරයි ... අනෙකවිහිත පූර්වනිවාසයන් ද සිහි කරයි. එනම්: එක් දැයකුදු දෙදැයකුදු ... මෙසේ ආකාර සහිත උද්දෙස සහිත අනෙකවිහිත පූර්වනිවාසයන් සිහිකරයි. විශුද්ධ වූ මිනිසැස ඉක්ම ගිය දිවැසින්... කම් වූ පරිදි යන සත්ත්වයන් නො ද දක්නේ යි... විශුද්ධ වූ මිනිසැස ඉක්ම ගිය දිවැසින් ... කම් වූ පරිදි යන සත්ත්වයන් දක්නේ ය. ආශ්‍රවක්ෂයයෙන් ... සාක්ෂාත් කොට එයට පැමිණ නො ද වාසය කරයි. මෙසේ ඒඅඟින් අපරිපූර්ණ වෙයි.

තෙන තං අඞ්ගං පරිපූරෙතබ්බං: "කින්තාහං සද්ධො ච අස්සං සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදො ච පරිසාය ධම්මං දෙසෙය්‍යං, විනයධරො ච අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යං, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරෙය්‍යං, දිබ්බෙන ච චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍යං, ආසවානඤ්ච ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති.

යතො ච ඛො භික්ඛවෙ භික්ඛු සද්ධො ච හොති සීලවා ච බහුස්සුතො ච ධම්මකථිකො ච පරිසාවචරො ච විසාරදො ච පරිසාය ධම්මං දෙසෙති, විනයධරො ච අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො-පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. දිබ්බෙන ච චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ-යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, එවං සො තෙනඞ්ගෙන පරිපූරො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු හොති සමන්තපාසාදිකො ච හොති සබ්බාකාරපරිපූරොචාති.

## ආනිසංසවග්ගො පඨමො.

තස්සුද්දානං

කිමත්ථියං චෙතනා සීලං උපනිසා ආනන්ද පඤ්චමං,
සමාධි සාරිපුත්තො ච සද්ධො සන්තෙන විජ්ජයාති,[1]

1. කිමත්ථියං චෙතනා ච තයො උපනිසා පිච
සමාධිසාරිපුත්තො ච ඣානං සන්තෙන විජ්ජයාති-මජසං

ඔහු විසින් එ අඟ පිරියයුතු: කිසෙයින් මම සැදැහැතියෙම් ද බහුශ්‍රැත වූයෙම් ද ධර්මකථිකයෙම් ද පරිසාවචරයෙම් ද විසාරදව පිරිස්හි දම් දෙසන්නෙම් විනයධර වූයෙම් අනෙකවිහිත පූර්වනිවාසයන් අනුස්මරණ කරන්නෙම් එනම්: එක් දැයකුදු දෙදැයකුදු ... මෙසේ සාකාර වූ සඋද්දෙස වූ අනෙකවිහිත වූ පූර්වනිවාසය අනුස්මරණ කරන්නෙම් විශුද්ධ වූ මිනිසැස ඉක්ම ගිය දිවැසින්... කම් වූ පරිදි පරලොව ගිය සතුන් දක්නෙම් ද. ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ... සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කෙරෙම් දැයි.

මහණෙනි, යම් කලෙක මහණ සැදැහැතියේත් සිල් ඇතියේත් බහුශ්‍රැත වූයේත් ධර්මකථික වූයේත් පරිසාවචර වූයේත් වේ ද විසාරද වූයේ පිරිස්හි දම් දෙසා ද විනයධර වූයේත් අනෙකවිහිත පූර්වනිවාසය අනුස්මරණ කෙරෙයි. එනම්: එක් දැයකුදු දෙදැයකුදු ... මෙසේ ආකාර සහිත උද්දෙස සහිත අනෙකවිහිත පූර්වනිවාසය අනුස්මරණ කෙරේ ද, විසුද්ධ වූ මිනිසැස ඉක්ම ගිය දිවැසින් ... කම් වූ පරිදි පරලොව ගිය සත්ත්වයන් දක්නේ ද ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්ති ප්‍රඥාවිමුක්ති දිටුදැමියෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කෙරේ ද මෙසේ හේ එ අඟින් පරිපූර්ණ වෙයි.

මහණෙනි, මෙ දසදහමින් සමන්වාගත මහණ සමන්තපාසාදික ද වෙයි. සර්වාකාර පරිපූර්ණ ද වේ යයි.

## ප්‍රථම ආනිසංසවර්ග යි.

**එහි උද්දානය:**

කිමත්ථිය සූත්‍රය, චෙතනා සූත්‍රය, සීල සූත්‍රය, උපනිස සූත්‍රය, ආනන්ද සූත්‍රය, සමාධි සූත්‍රය, සාරිපුත්ත සූත්‍රය, සද්ධ සූත්‍රය, සන්ත සූත්‍රය, විජ්ජා සූත්‍රය දැයි දසයෙක.

# 2. නාථවග්ගෝ

## 10. 1. 2. 1

### සෙනාසන සුත්තං

[සාවත්ථියං]

පඤ්චඞ්ගසමන්නාගතො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගසමන්නාගතං සෙනාසනං සෙවමානො භජමානො න චිරස්සෙව ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය,

කථඤ්ච භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගසමන්නාගතො හොති:

1. ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං: "ඉති පි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

2. අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය.

3. අසඨො හොති අමායාවී, යථාභූතං අත්තානං ආවිකත්තා සත්ථරි වා විඤ්ඤූසු වා සබ්‍රහ්මචාරිසු.

4. ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු.

5. පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා.

එවං ඛො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගසමන්නාගතො හොති.

6. කථඤ්ච භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ගසමන්නාගතං හොති?

ඉධ භික්ඛවෙ සෙනාසනං නාතිදූරං හොති නාච්චාසන්නං ගමනාගමනසම්පන්නං

7. දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං.

8. අප්පඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සං.

# 2. නාථවර්ගය

## 10. 1. 2. 1

## සෙනාසන සූත්‍රය

[සැවැත්නුවර]

මහණෙනි, අඞ්ග පසෙකින් සමන්වාගත මහණ පසඟෙකින් සමන්වාගත සෙනසුන් සෙවුනේ බජනුයේ නොබෝ කලෙකින් ම ආස්‍රවක්ෂයයෙන් ඉහාත්මයෙහි ම චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය තෙමේ පසක් කොට එයට පැමිණ වාස කරනේ ය.

මහණෙනි, කෙසේ මහණ පසඟෙකින් සමන්වාගත වේ ද:

1. මහණෙනි, මෙ සස්නෙහි මහණ සැදැහැතියේ වෙයි. තථාගතයන් වහන්සේගේ සම්බොධිය හදහනේ ය: ''මෙසේ ද ඒ භගවත්හු අර්හත්හ. සම්‍යක්සම්බුද්ධයහ. විද්‍යාචරණසම්පන්නයහ. සුගතයහ. ලොකවිද්හ. අනුත්තරයහ. පුරුෂදම්‍යසාරථිහ. දෙව්මිනිස්නට ශාස්තෘ හ. බුද්ධයහ. භගවත්හ''යි.

2. අල්පාබාධ වූයේ අල්පාතඞ්ක වූයේ අතිශීත නො වූ අත්‍යුෂ්ණ නො වූ ප්‍රධන්වීර්‍ය්‍යයට ක්ෂම වූ මධ්‍යම වූ සමව පැසවන කර්මජතෙජොධාතු යෙන් සමන්වාගත වෙයි.

3. සඨ නොවූයේ මායා නැතියේ ඇති සැටිය තමා ශාස්තෘන් කෙරෙහි චේවයි නුවණැති සබ්‍රම්සරුන් කෙරෙහි චේවයි පාළ කරනුයේ වෙයි.

4. අකුශලධර්මයන්ගේ ප්‍රහාණය සඳහා කුශලධර්මයන්ගේ උපසම්පත් සඳහා ස්ථාම ඇතියේ දළපැරකුම් ඇතියේ කුසල්දහම්හි නො බහා තැබූ වීර්‍ය්‍යධුර ඇතියේ ඇරඹූ වැර ඇතියේ වාසය කෙරෙයි.

5. ආර්‍ය්‍ය වූ ලොභස්කන්ධාදිය බිඳීමට සමත් මොනොවට දුඃඛක්ෂයට පමුණුවන උදයාස්තංගාමිනිප්‍රඥායෙන් සමන්වාගත වූයේ ප්‍රඥාවත් වෙයි.

මහණෙනි, මෙසේ මහණ පඤ්චාඞ්ගසමන්වාගත වෙයි.

මහණෙනි, කෙසේ සෙනසුන පඤ්චාඞ්ගසමන්වාගත වේ ද:

6. මහණෙනි, මෙ සස්නෙහි සෙනස්න අතිදූර නො වූයේ අත්‍යාසන්න නො වූයේ ගමනාගමනින් සපන් වූයේ වෙයි.

7. දහවල් (මිනිසුන්) නො ගැවසුණේ රාත්‍රි අල්පශබ්ද වූයේ අල්ප-නිර්ඝොෂ වූයේ වෙයි.

8. මැසිමදුරු වා අවු දිගුදැ පහස් නැතියේ වෙයි.

9. තස්මිං ඛො පන සෙනාසනෙ විහරන්තස්ස අප්පකසිරෙනෙව උප්පජ්ජන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා.

10. තස්මිං ඛො පන සෙනාසනෙ ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති පරිපඤ්හති: "ඉදම්භන්තෙ කථං ඉමස්ස කො අත්ථො"ති. තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව විවරන්ති, අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති. අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති.

එවං ඛො භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ගසමන්නාගතං හොති. පඤ්චඞ්ගසමන්නාගතො ඛො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගසමන්නාගතං සෙනාසනං සෙවමානො භජමානො න චිරස්සෙව ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යාති.

## 10. 1. 2. 2

## පඤ්චඞ්ග සුත්තං

[සාවත්ථියං]

පඤ්චඞ්ගවිප්පහීනො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගසමන්නාගතො ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තමපුරිසොති වුච්චති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛුනො කාමච්ඡන්දො පහීනො හොති, ව්‍යාපාදො පහීනො හොති, ථීනමිද්ධං පහීනං හොති, උද්ධච්චකුක්කුච්චං පහීනං හොති, විචිකිච්ඡා පහීනා හොති, එවං ඛො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගසමන්නාගතො හොති:

ඉධ භික්ඛවෙ භික්ඛු අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති, එවං ඛො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගසමන්නාගතො හොති.

9. එ සෙනස්නෙහි වසන්නහුට නිදුකින් ම සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර උපදනේ ය:

10. එ සෙනස්නෙහි බොහෝ ඇසූ පිරූ තැන් ඇති හසළ ආගම ඇති සූත්‍රපිටකධර විනයධර (ප්‍රාතිමොක්ෂද්වය සඞ්ඛ්‍යාත) මාතෘකාධර තෙර මහණහු වෙසෙත්. කලින් කල උන් කරා එළඹ පුළුවුස්නේ ය, පිරිසිඳුනේ ය: "වහන්ස, මේ කිසේ ය, මෙහි කවර අරුත් දැ"යි. ඔහට එ ඇවත්හු අවිවෘත වූත් අර්ථය විවර කෙරෙත්. නො පාළ වූවා පාළ කෙරෙත්. නන් වැදෑරුම් සැකයට කරුණු වූ දහම්හි සැක දුරලත්.

මහණෙනි, මෙසේ සෙනස්න පසඟින් සමන්වාගත වෙයි; මහණෙනි පඤ්චාඞ්ගයෙන් සමන්වාගත මහණ පඤ්චාඞ්ගසමන්වාගත සෙනස්න සෙවුනේ බෙජෙනුයේ නො බෝ කලෙකින් ම ආසුවක්ෂයයෙන් දිටුදැමියෙහි ම ආසුව රහිත වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය විශිෂ්ට-ඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනේ ය.

## 10. 1. 2. 2

## පඤ්චඞ්ග සූත්‍රය

[සැවැත්නුවර]

මහණෙනි, පඤ්චාඞ්ගවිප්‍රහීණ වූ පඤ්චාඞ්ගසමන්වාගත මහණ මේ ධර්මවිනයෙහි සකලගුණසමන්වාගත වුසුබඹසර ඇති උත්තමපුරුෂ යි කියනු ලැබේ.

මහණෙනි, මහණ කෙසේ පඤ්චාඞ්ගවිප්‍රහීණ වේ ද යත්;

මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි. ව්‍යාපාදය ප්‍රහීණ වෙයි. ථිනමිද්ධය ප්‍රහීණ වෙයි. උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණ වෙයි. විචිකිච්ඡා ප්‍රහීණ වෙයි. මහණෙනි, මෙසේ මහණ පඤ්චාඞ්ගවිප්‍රහීණ වෙයි.

මහණෙනි, කෙසේ මහණ පඤ්චාඞ්ගසමන්වාගත වේ ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ අශෛක්ෂ්‍ය ශීලස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සමාධිස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය ප්‍රඥාස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය විමුක්ති ස්කන්ධයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය විමුක්තිඥනදර්ශනස්කන්ධ-යෙන් සමන්වාගත වෙයි. මහණෙනි, මහණ මෙසේ පඤ්චාඞ්ග-සමන්වාගත වෙයි.

පඤ්චඞ්ගවිප්පහීනො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගසමන්නාගතො ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තමපුරිසොති වුච්චතීති.

1. කාමච්ඡන්දො ච ව්‍යාපාදෙ ථීනමිද්ධඤ්ච භික්ඛුනො,
උද්ධච්චං විචිකිච්ඡා ච සබ්බසොව න විජ්ජති.

2. අසෙඛෙන ච සීලෙන අසෙඛෙන සමාධිනා
විමුත්තියා ච සම්පන්නො ඤාණෙන ච තථාවිධො.

3. ස වෙ පඤ්චඞ්ගසම්පන්නො පඤ්චඞ්ගානිවිවජ්ජයං[1]
ඉමස්මිං ධම්මවිනයෙ කෙවලීති පවුච්චතීති.

## 10. 1. 2. 3

### සංයොජන සුත්තං

[සාවත්ථියං]

දසයිමානි භික්ඛවෙ සංයොජනානි, කතමානි දස: පඤ්චොරම්භාගියානි සංයොජනානි, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි.

කතමානි පඤ්චොරම්භාගියානි සංයොජනානි: සක්කායදිට්ඨි, විචිකිච්ඡා සීලබ්බතපරාමාසො, කාමච්ඡන්දො, බ්‍යාපාදෙති. ඉමානි පඤ්චොරම්භාගිය සංයොජනානි.

කතමානි පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි: රූපරාගො, අරූපරාගො, මානො, උද්ධච්චං, අවිජ්ජා. ඉමානි ඛො පඤ්චුද්ධම්භාගියානි, සංයොජනානි. ඉමානි ඛො භික්ඛවෙ දසසංයොජනානීති.

1. පඤ්චඅඞ්ග විවජ්ජයං - මජසං.

මහණෙනි, පඤ්චාඞ්ගවිප්‍රහීණ පඤ්චාඞ්ගසමන්වාගත මහණ තෙම මෙ සස්නෙහි සකලගුණ සමන්වාගත වුසූ බඹසර ඇති උත්තමපුරුෂ යයි කියනු ලැබේ.

1. කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීනමිද්ධය, උද්ධච්චකුක්කුච්චය, විචිකිච්ඡාය යන මේ මහණහට සර්වප්‍රකාරයෙන් අවිද්‍යමාන වේ ද

2. අශෛක්ෂ්‍යශීලයෙනුදු අශෛක්ෂ්‍යසමාධියෙනුදු විමුක්තියෙනුදු අශෛක්ෂ්‍ය විමුක්තිඥානදර්ශනයෙනුදු සමන්වාගත එබඳු වූ –

3. පඤ්චාඞ්ගසම්පන්න වූ හේ පඤ්චාඞ්ගයන් හරනේ මේ ධර්ම විනයෙහි කෙවලී යි කියනු ලැබේ.

## 10. 1. 2. 3
## සංයොජන සූත්‍රය

**[සැවැත්නුවර]**

මහණෙනි, මේ දශ සංයොජනයෙකි. කවර දශයෙක යත්; ඔරම්භාගිය සංයොජන පසෙක, උද්ධම්භාගිය සංයොජන පසෙකැයි.

පඤ්චොරම්භාගිය සංයොජන කවර; සක්කායදිට්ඨිය, විචිකිච්ඡාය, සීලබ්බතපරාමාසය, කාමච්ඡන්දය, ව්‍යාපාද යි. මොහු පඤ්චොරම්භාගිය සංයොජන යි.

උද්ධම්භාගිය සංයොජන පස කවර; රූපරාග ය, අරූපරාග ය, මාන ය, උද්ධච්චය, අවිජ්ජා යි. මොහු පඤ්චුද්ධම්භාගිය සංයොජන යි. මහණෙනි, මොහු දශසංයොජන වෙති යි.

## 10. 1. 2. 4

## චෙතොඛිල සුත්තං

[සාවත්ථියං]

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා පඤ්ච චෙතොඛිලා අප්පහීනා පඤ්ච චෙතසො විනිබන්ධා අසමුච්ඡින්නා, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො වුද්ධි.

කතමස්ස පඤ්චචෙතොඛිලා අප්පහීනා හොන්ති:

ඉධ භික්ඛවෙ භික්ඛු සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරිකඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය එවමස්සායං පඨමො චෙතොඛිලො අප්පහීනො හොති.

පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙ කඞ්ඛති -පෙ- සඞ්ඝෙ කඞ්ඛති -පෙ- සික්ඛාය කඞ්ඛති -පෙ- සබ්‍රහ්මචාරීසු කුපිතො හොති අනත්තමනො ආහතචිත්තො ඛිලජාතො. තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. එවමස්සායං පඤ්චමො චෙතොඛිලො අප්පහීනො හොති. ඉමස්ස පඤ්ච චෙතොඛිලා අප්පහීනා හොන්ති.

කතමස්ස පඤ්චචෙතසො විනිබන්ධා අසමුච්ඡින්නා හොන්ති:

ඉධ භික්ඛවෙ භික්ඛු කාමෙසු අවීතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු කාමෙසු අවීතරාගො හොති, අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො, තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඨමො චෙතසො විනිබන්ධො අසමුච්ඡින්නො හොති.

# 10. 1. 2. 4

## චෙතොඛිල සූත්‍රය

**[සැවැත්නුවර]**

මහණෙනි, යම් කිසි මහණක්හුගේ වේවයි මෙහෙණකගේ වේවයි පඤ්ච චෙතොඛිලයෝ අප්‍රහීණ වෙත් ද පඤ්ච චෙතොවිනිබන්ධයෝ නුසුන්හු ද, ඔහට යම් රැයක් වේවයි දිනක් වේවයි පැමිණේ නම් කුසල ධර්මයන්හි හානියෙක් ම කැමැති විය යුතු, වෘද්ධියෙක් නො වේ.

ඔහුගේ කවර පඤ්ච චෙතොඛිලයො අප්‍රහීණ වෙත් ද යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කරනේය, විචිකිච්ඡා කරනේය, නිශ්චයට නො යෙයි. නො පහදනේ ය. මහණෙනි, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක කෙරේ ද, විචිකිච්ඡා කෙරේ ද නිශ්චයට නො යේ ද නො පහදී ද, ඔහු සිත ආතපයට අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නො නැමෙයි. යමක්හුගේ සිත ආතපයට අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නො නැමේ නම් මෙසේ ඔහුගේ මේ ප්‍රථම චෙතොඛිලය අප්‍රහීණ වෙයි.

තවද මහණෙනි, මහණ ධර්මය කෙරෙහි සැක කෙරෙයි, ... සඞ්ඝයා කෙරෙහි සැක කෙරෙයි, ... ශික්ෂායෙහි සැක කෙරෙයි. ... සබ්‍රම්සරුන් කෙරෙහි කිපියේ නො සතුටු සිතැතියේ සැටුණු සිතැත්තේ හටගත් හුල් ඇතියේ වෙයි. ඔහු සිත ආතාපයට අනුයොගයට සතතභාවයට ප්‍රධන්වීර්‍ය්‍යයට නො නැමෙයි. යමක්හුගේ සිත ආතාපයට අනුයොගයට සතතභාවයට ප්‍රධන්වීර්‍ය්‍යයට නො නැමේ නම් මෙසේ ඔහුගේ මේ පඤ්චම චෙතොඛිලය අප්‍රහීණ වෙයි. මේ පඤ්ච චෙතොඛිලයෝ අප්‍රහීණ වෙත්.

ඔහුගේ කවර කවර පඤ්ච චෙතොවිනිබන්ධ කෙනෙක් නුසුන් වෙත් ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්හි පහ නොවූ රාග ඇතියේ පහ නොවූ ඡන්ද ඇතියේ පහ නොවූ ප්‍රෙම ඇතියේ පහ නොවූ පිපාසා ඇතියේ පහ නොවූ පරිදහ ඇතියේ පහ නොවූ තෘෂ්ණා ඇතියේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් කාමයන්හි අවීතරාග වේ ද, අවිගතඡන්ද වේ ද අවිගත පෙම වේ ද අවිගත පිපාසා වේ ද අවිගත පරිදහ වේ ද අවිගත තණ්හා වේ ද, ඔහු සිත ආතප්පයට අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නො නැමෙයි. යමක්හුගේ සිත ආතාපයට අනුයොගයට, සාතත්‍යයට ප්‍රධානයට නො නැමේ නම්, මෙසේ මේ ඔහුගේ ප්‍රථම චෙතො විනිබන්ධය නුසුන් වෙයි.

පුනචපරං භික්ඛවෙ භික්ඛු කායෙ අවීතරාගො හොති -පෙ- රූපෙ අවීතරාගො හොති -පෙ- උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං ඵස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරති. අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති "ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා"ති. යො සො භික්ඛවෙ භික්ඛු අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති. තස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං න නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය, එවමස්සායං පඤ්චමො චෙතසො විනිබන්ධො අසමුච්ඡින්නො හොති. ඉමස්ස පඤ්චචෙතසො විනිබන්ධා අසමුච්ඡින්නා හොන්ති.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා ඉමෙ පඤ්චචෙතොඛිලා අප්පහීනා ඉමෙ පඤ්ච චෙතසො විනිබන්ධා අසමුච්ඡින්නා, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො වුද්ධි.

සෙය්‍යථාපි භික්ඛවෙ කාලපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති. හායතෙව වණ්ණෙන, හායති මණ්ඩලෙන, හායති ආභාය, හායති ආරොහපරිනාහෙන, එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා ඉමෙ පඤ්ච චෙතොඛිලා අප්පහීනා, ඉමෙ පඤ්ච චෙතසො විනිබන්ධා අසමුච්ඡින්නා, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො වුද්ධි.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා පඤ්ච චෙතොඛිලා පහීනා පඤ්ච චෙතසො විනිබන්ධා සමුච්ඡින්නා[1] තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො පරිහානි.

කතමස්ස පඤ්ච චෙතොඛිලා පහීනා හොන්ති,

ඉධ භික්ඛවෙ භික්ඛු සත්ථරි න කඞ්ඛති න විචිකිච්ඡති, අධිමුච්චති සම්පසීදති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි න කඞ්ඛති න විචිකිච්ඡති අධිමුච්චති සම්පසීදති, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. එවමස්සායං පඨමො චෙතොඛිලො පහීනො හොති.

1. සුසමුච්ඡින්නා-මජ්ඣං.

තවද මහණෙනි, මහණ කයෙහි අවීතරාග වෙයි. ... රූපයෙහි අවීතරාග වෙයි. ... කුසපුරා වළඳා ශය්‍යා සුඛයෙහි ස්පර්ශ සුඛයෙහි මිද්ධ සුඛයෙහි යෙදුනේ වාසය කරයි. එක්තරා දෙවනිකායක් පතා බඹසර සෙරෙයි: “මම මේ සිලින් හෝ වතින් හෝ තෙවෙන් හෝ බඹසෙරෙන් හෝ දෙවියෙක් හෝ අන්‍යතර දෙවියෙක් හෝ වෙම්ව” යි. මහණෙනි, යම් මහණෙක් එක්තරා දෙවනිකායක් පතා බඹසර සෙරේ නම්: “මම මේ සිලින් හෝ වතින් හෝ තෙවෙන් හෝ බඹ-සරින් හෝ දෙවියෙක් හෝ අන්‍යතර දෙවියෙක් හෝ වෙම්ව” යි. ඔහු සිත ආතාපයට අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නො නැමේ. යමකුගේ සිත ආතාපයට අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නො නැමේ නම්, මෙසේ ඔහුගේ මේ පඤ්චම චෙතොවිනිබන්ධය නුසුන් වෙයි, ඔහුගේ මේ පඤ්ච චෙතොවිනිබන්ධයෝ නුසුන් වෙත්.

මහණෙනි, යම් කිසි මහණකුගේ වේවා යි, මෙහෙණකගේ වේවායි මේ පඤ්ච චෙතොඛිලයෝ අප්‍රහීණ වෙත් ද, මේ පඤ්ච චෙතො විනි-බන්ධයෝ නුසුන් වෙත් ද ඔහුගේ යම් රැයක් හෝ දවසක් හෝ ඒ නම් කුසල් දහම්හි හානියෙක් ම කැමැති විය යුතු, වෘද්ධියෙක් නො වේ.

මහණෙනි, යම් පරිදි පසඩමස්හි චන්ද්‍රයාගේ යම් බඳු රැයෙක් වේවායි දිනයෙක් වේවායි ඒ නම්, එය වර්ණයෙනුදු පිරිහේ මැයි. මණ්ඩල-යෙනුදු පිරිහෙයි, ආභායෙනුදු පිරිහෙයි, ආරොහ පරිණාහයෙනුදු පිරිහේ. මහණෙනි, යම් කිසි මහණක්හුගේ හෝ මෙහෙණකගේ මේ පඤ්ච චෙතොඛිලයෝ අප්‍රහීණ වෙත් නම්, මේ පඤ්ච චෙතොවිනිබන්ධයෝ නුසුන් වෙත් නම් ඔහට යම් රැයෙක් වේවායි දවසෙක් වේවායි ඒ නම් කුශල ධර්මයන්හි හානියෙක් ම කැමැති විය යුතු. වෘද්ධියෙක් නො වේ.

මහණෙනි, යම් කිසි මහණක්හුගේ වේවායි මෙහෙණක්හුගේ වේවායි පඤ්ච චෙතොඛිලයෝ ප්‍රහීණ වෙත් නම්, පඤ්ච චෙතොවිනිබන්ධයෝ සමුච්ඡින්න වෙත් නම්, ඔහට යම් රැයෙක් හෝ දවසෙක් හෝ ඒ නම් කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානියෙක් නො වේ.

ඔහුගේ කවර පඤ්ච චෙතොඛිලයෝ ප්‍රහීණ වෙත් ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක නො කරයි. විචිකිච්ඡා නො කරයි. නිශ්චයට යයි. පහදියි. මහණෙනි, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි සැක නො කෙරේ ද, විචිකිච්ඡා නො කෙරේ ද විනිශ්චයට යේ ද, පහදී ද ඔහු සිත ආතාපයට අනුයොගයට සෘතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නැමෙයි. මෙසේ ඔහුගේ මේ ප්‍රථම චෙතොඛිලය ප්‍රහීණ වෙයි.

පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙ න කඞ්ඛති -පෙ- සඞ්ඝෙ න කඞ්ඛති -පෙ- සික්ඛාය න කඞ්ඛති -පෙ- සබ්‍රහ්මචාරීසු න කුපිතො හොති අත්තමනො න ආහතචිත්තො න ඛිලජාතො, යො සො භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීසු න කුපිතො හොති අත්තමනො න ආහතචිත්තො න ඛිලජාතො තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. එවමස්සායං පඤ්චමො චෙතොඛිලො පහීනො හොති. එවමස්ස පඤ්ච-චෙතොඛිලා පහීනා හොන්ති.

කතමස්ස පඤ්ච චෙතසො විනිබන්ධා සුසමුච්ඡින්නා හොන්ති:

ඉධ භික්ඛවෙ භික්ඛු කාමෙසු වීතරාගො හොති විගතච්ඡන්දො විගත-පෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. යො සො භික්ඛවෙ භික්ඛු කාමෙසු වීතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො, තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. එවමස්සායං පඨමො චෙතසො විනිබන්ධො සුසමුච්ඡින්නො හොති.

පුනචපරං භික්ඛවෙ භික්ඛු කායෙ වීතරාගො හොති -පෙ- රූපෙ වීතරාගො හොති -පෙ- න යාවදත්ථං, උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්සසුඛං මිද්ධසුඛං අනුයුත්තො විහරති. න අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: "ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි, දෙවඤ්ඤතරො වා"ති.

යො සො භික්ඛවෙ භික්ඛු න අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති 'ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති. තස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය. යස්ස චිත්තං නමති ආතප්පාය අනුයොගාය සාතච්චාය පධානාය එවමස්සායං පඤ්චමො චෙතසො විනිබන්ධො සුසමුච්ඡින්නො හොති. ඉමස්ස පඤ්ච චෙතසො විනිබන්ධා සුසමුච්ඡින්නා හොන්ති.

තවද මහණෙනි, මහණ ධර්මයෙහි සැක නො කරයි .. සඞ්ඝයා කෙරෙහි සැක නො කරයි. ශික්ෂායෙහි සැක නො කරයි සබ්‍රම්සරුන් කෙරෙහි නො කිපියේ සතුටු සිතැත්තේ නො සැටුණු සිතැත්තේ හටගත් හුල් නැතියේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් සබ්‍රම්සරුන් කෙරෙහි නො කිපියේ සතුටු සිතැතියේ නො සැටුණු සිතැතියේ හටගත් හුල් නැතියේ වේ ද, ඔහුගේ සිත ආතාපයට අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නැමෙයි. මෙසේ ඔහුගේ මේ පස්වන චෙතොඛිලය ප්‍රහීණ වෙයි. මෙසේ ඔහුගේ පඤ්ච චෙතො-ඛිලයෝ ප්‍රහීණ වෙත්:

ඔහුගේ කවර පඤ්චචෙතොවිනිබන්ධ කෙනෙක් සුසමුච්ඡින්න වෙත් ද යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්හි වීතරාග වූයේ විගතච්ඡන්ද වූයේ විගතපෙම වූයේ විගතපිපාස වූයේ විගතපරිළාහ වූයේ විගතතණ්හ වූයේ වෙයි. මහණෙනි, යම් ඒ මහණෙක් කාමයන්හි වීතරාග වූයේ විගතච්ඡන්ද වූයේ විගතපෙම වූයේ විගතපිපාස වූයේ විගතපරිළාහ වූයේ විගතතණ්හ වූයේ වේ නම් ඔහුගේ සිත ආතාපයට අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නැමෙයි. මෙසේ ඔහුගේ මේ ප්‍රථම චෙතොවිනිබන්ධය සුසමුච්ඡින්න වෙයි.

තවද මහණෙනි, මහණ කයෙහි වීතරාග වෙයි. ... රූපයෙහි වීතරාග ... වෙයි, කැමති තාක් කුසපුරා වළඳා සෙය්‍යසුඛයෙහි ඵස්සසුඛයෙහි මිද්ධසුඛයෙහි යෙදුනේ වාසය නො කරයි. එක්තරා දෙවනිකායක් පතා බඹසර නො සරයි. “මම මේ සිලින් හෝ වතින් හෝ තෙවෙන් හෝ බඹසරින් හෝ දෙවියෙක් හෝ එක්තරා දෙවියෙක් හෝ වෙම්වම්ව” යි.

මහණෙනි, යම් මහණෙක් එක්තරා දෙවනිකායක් පතා බඹසර නො සරා නම්, “මම මේ සිලින් හෝ වතින් හෝ තෙවෙන් හෝ බ්‍රම්සරින් හෝ දෙවියෙක් හෝ එක්තරා දෙවියෙක් වෙම්ව”යි. ඔහුගේ සිත ආතාපයට අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නැමෙයි. යමකුගේ සිත ආතාපයට, අනුයොගයට සාතත්‍යයට ප්‍රධන්වීර්‍ය්‍යයට නැමේ නම්, මෙසේ ඔහුගේ මේ පස්වන චෙතොවිනිබන්ධය සුසමුච්ඡින්න වෙයි. මෙසේ ඔහුගේ පඤ්ච චෙතොවිනිබන්ධයෝ සුසමුච්ඡින්න වෙත්.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා ඉමෙ පඤ්චචෙතොඛිලා පහීනා ඉමෙ පඤ්චචෙතසො විනිබන්ධා සුසමුච්ඡින්නා තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො පරිහානි.

සෙය්‍යථාපි භික්ඛවෙ ජුණ්හපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වඩ්ඪතෙව වණ්ණෙන වඩ්ඪති මණ්ඩලෙන වඩ්ඪති ආභාය වඩ්ඪති ආරොහපරිණාහෙන. එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා ඉමෙ පඤ්චචෙතොඛිලා පහීනා ඉමෙ පඤ්චචෙතසො විනිබන්ධා සුසමුච්ඡින්නා, තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො පරිහානීති.

## 10. 1. 2. 5

## අප්පමාද සුත්තං

1. යාවතා භික්ඛවෙ සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා, තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා, අප්පමාදො තෙසං ධම්මානං[1] අග්ගමක්ඛායති.

2. සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි ජඞ්ගමානං[2] පාණානං පදජාතානි, සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති, හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති; යදිදං මහන්තත්තෙන, එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති.

3. සෙය්‍යථාපි භික්ඛවෙ කූටාගාරස්ස යා කාචි ගොපානසියො සබ්බා තා කූටඞ්ගමා කූටනින්නා කූටසමොසරණා, කූටං තාසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා, අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති.

1. තෙසං – මජසං.
2. ජඞ්ගලානං–මජසං.

මහණෙනි, යම් කිසි මහණකුගේ වේවයි මෙහෙණකගේ වේවයි මේ පඤ්ච චෙතොඛිලයෝ ප්‍රහීණ ද, මේ පඤ්ච චෙතොවිනිබන්ධයෝ සුසමුච්ඡින්න ද ඔහට යම් රැයක් වේවයි දවසෙක් වේවයි පැමිණේ නම් කුසල ධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානියෙක් නො වේ.

මහණෙනි, යම් පරිදි පෙරඩමස සඳුගේ යම් රැයෙක් වේවයි, දවසෙක් වේවයි. පැමිණේ නම්, එය වර්ණයෙනුදු වඩනේ ම ය, මඬුලුයෙනුදු වඩනේ ම ය, ආභායෙනුදු වඩනේය. ආරෝහපරිණාහයෙනුදු වඩනේ ය. මහණෙනි, එපරිදි ම යම් කිසි මහණක්හුගේ හෝ මෙහෙණකගේ මේ පඤ්ච චෙතොඛිලයෝ ප්‍රහීණ ද, මේ පඤ්ච චෙතොවිනිබන්ධයෝ සුසමුච්ඡින්න ද, ඔහට යම් රැයෙක් හෝ දවසෙක් හෝ පැමිණේ නම් කුශලධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහාණියෙක් නො වේ.

## 10. 1. 2. 5

## අප්‍රමාද සූත්‍රය

1. මහණෙනි, අපාද වෙත්වයි ද්විපාද වෙත්වයි චතුෂ්පාද වෙත්වයි බහුපාද වෙත් වයි රූපී වෙත් වයි අරූපී වෙත් වයි සංඥී වෙත් වයි අසංඥී වෙත් වයි නෛවසංඥීනාසංඥී වෙත් වයි යම් තාක් සත්ත්වයෝ වෙත් නම්, තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයෝ උනට අග්‍රහයි කියනු ලබත්. මහණෙනි, එපරිදි ම යම් කිසි කුශල ධර්ම කෙනෙක් වෙත් නම් උහු හැම අප්‍රමාදය මුල් කොට ඇතියාහු අප්‍රමාදයෙහි වැද ගන්නාහු වෙත්. ඒ දහමුනට අප්‍රමාදය අග්‍රයි කියනු ලැබේ.

2. මහණෙනි, ජඞගම ප්‍රාණයන්ගේ යම්බඳු පද ජාතයෙක් ඇත් ද එ හැම ඇත් පියෙහි සමවධානයට යෙත්. ඇත් පිය උනට අග්‍රයි කියනු ලැබේ. මහත් බැවින. මහණෙනි, එ පරිදි ම යම් කිසි කුසල් දම්හු වෙත් නම්, එ හැම අප්‍රමාද මූලක වූවාහු අප්‍රමාදයෙහි බැසගන්නාහු වෙත්. ඒ ධර්මයනට අප්‍රමාදය අග්‍ර යයි කියනු ලැබේ.

3. මහණෙනි, යම් පරිදි කුළාරගෙහි යම් බඳු ගොනැස්හු වෙත් නම් එ හැම කූටඞගම වූවාහු කූටනිම්න වූවාහු කූටයෙහි බැසගන්නාහු වෙත්. ඔවුනට කූටය අග්‍රය යි කියනු ලැබේ. මහණෙනි, එ පරිදි ම යම් කිසි කුශල ධර්මයෝ වෙත් නම් ඔහු හැම අප්‍රමාද මූලකවූවාහු අප්‍රමාදයෙහි බැසගන්නාහු වෙත්. අප්‍රමාදය ඔවුනට අග්‍ර යි කියනු ලැබේ.

4. සෙය්‍යථාපි භික්ඛවෙ යෙ කෙචි මූලගන්ධා, කාළානුසාරියං තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ -පෙ-

5. සෙය්‍යථාපි භික්ඛවෙ යෙ කෙචි සාරගන්ධා ලොහිතචන්දනං තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ -පෙ-

6. සෙය්‍යථාපි භික්ඛවෙ යෙ කෙචි පුප්ඵගන්ධා, වස්සිකං තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ -පෙ-

7. සෙය්‍යථාපි භික්ඛවෙ යෙ කෙචි කුඩ්ඩරාජානො,[1] සබ්බෙ තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයන්තා භවන්ති, රාජා තෙසං චක්කවත්ති අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ -පෙ-

8. සෙය්‍යථාපි භික්ඛවෙ යා කාචි තාරකරූපානං පභා, සබ්බා තා චන්දප්පභාය කලං නාග්ඝන්ති සොළසිං. චන්දප්පභා තාසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ -පෙ-

9. සෙය්‍යථාපි භික්ඛවෙ සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සුක්කමානො සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙව ඛො භික්ඛවෙ -පෙ-

10. සෙය්‍යථාපි භික්ඛවෙ යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා, යමුනා අචිරවතී, සරභූ, මහී, සබ්බා තා සමුද්දඞ්ගමා සමුද්දනින්නා සමුද්දපොනා සමුද්දපබ්භාරා, මහාසමුද්දො තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා, අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායතීති.

## 10. 1. 2. 6

## ආහුනෙය්‍ය සුත්තං

දස ඉමෙ භික්ඛවෙ පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙ දස:

තථාගතො අරහං සම්මාසම්බුද්ධො, පච්චෙකබුද්ධො, උභතොභාගවිමුත්තො, පඤ්ඤාවිමුත්තො, කායසක්ඛී, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො, ධම්මානුසාරී, සද්ධානුසාරී, ගොත්‍රභූ.

ඉමෙ ඛො භික්ඛවෙ දස පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා, දක්ඛිණෙය්‍යා, අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

---

1. ඛුද්දරාජානො, මජසං.

4. මහණෙනි, යම් පරිදි කිසි මූලගන්ධ කෙනෙක් වෙත් නම්, කළු අගිල් උනට අග්‍ර යි කියනු ලැබේ. මහණෙනි, එපරිදි ම ...

5. මහණෙනි, යම් පරිදි යම් කිසි සාර (හර) ගන්ධ කෙනෙක් වෙත් ද, රත්සඳුන් ඕවුනට අග්‍ර යයි කියනු ලැබේ. එසෙයින් මැ මහණෙනි ...

6. මහණෙනි, යම් පරිදි යම් කිසි පුෂ්පගන්ධ කෙනෙක් වෙත් නම්, දෑසමන් ඔවුනට අග්‍ර යි කියනු ලැබේ. මහණෙනි, එපරිදි ම ...

7. මහණෙනි, යම් පරිදි කිසි කුඩා රජකෙනෙක් වෙත් නම්, ඔහු හැම සක්විති මහරජු අනුයන්නෝහු වෙත්. සක්විති රජ ඔවුනට අග්‍ර යි කියනු ලැබේ. මහණෙනි, එපරිදි ම ...

8. මහණෙනි, තාරක රූපයන්ගේ යම් බඳු ප්‍රභායෙක් වේ නම් එ හැම චන්ද්‍ර ප්‍රභාවගේ සොළොස් වන කලාවට නොා අගී. චන්ද්‍ර ප්‍රභාව ඔවුනට අග්‍ර යි කියනු ලැබේ. මහණෙනි, එපරිදි ම ...

9. මහණෙනි, යම් පරිදි සරාකල්හි පහවූ වලාකුළු ඇති පහන් අහස්හි අහසට නගනා හිරු ආකාශගත හැම අඳුරු නසා බබළා ද තවා ද රස් විහිදුවා ද මහණෙනි, එපරිදි ම ..

10. මහණෙනි, යම් පරිදි ගඞ්ගා ය, යමුනා ය, අචිරවතී ය, සරභූ ය, මහී ය යන යම් කිසි මහානදීහු වෙත් නම්, ඔහු හැම මුහුදට යන්නාහු සමුද්‍රනිම්න වූවාහු සමුද්‍ර ද්‍රවණ වූවාහු සමුද්‍ර ප්‍රාග්භාර වූවාහු වෙත්. මහ සමුදුර ඔවුනට අග්‍ර යි කියනු ලැබේ. මහණෙනි, එපරිදි ම යම් කිසි කුශලධර්ම කෙනෙක් වෙත් නම් ඔහු හැම අප්‍රමාද මූලක වූහු අප්‍රමාද-යෙහි බැසගන්නාහු වෙත්. අප්‍රමාදය ඒ ධර්මයනට අග්‍රය යි කියනු ලැබේ යි.

## 10. 1. 2. 6

## ආහුනෙය්‍ය සූත්‍රය

මහණෙනි, මේ පුද්ගලයෝ දස දෙන ආහුනාර්හ ද ප්‍රාහුණාර්හ ද දක්ෂිණාර්හ ද අඤ්ජලිකරණාර්හ ද ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර ද වෙත්. කවර දස දෙනෙක යත්:

තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධියහ, ප්‍රත්‍යෙක බුද්ධයහ, උභතො භාග විමුක්ත ය, ප්‍රඥා විමුක්ත ය, කායසාක්ෂී ය, දෘෂ්ටිප්‍රාප්ත ය, ශ්‍රද්ධා විමුක්ත ය, ධර්මානුසාරී ය, ශ්‍රද්ධානුසාරී ය, ගොත්‍රභූ යි.

මහණෙනි, මේ දස පුහුල්හු ආහුනාර්යහ. ප්‍රාහුණාර්යහ. දක්ෂි-ණාර්හයහ, අඤ්ජලිකරණීයහ, ලොකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර යි.

## 10. 1. 2. 7

## පඨම නාථකරණ සුත්තං

සනාථා භික්ඛවෙ විහරථ, මා අනාථා. දුක්ඛං භික්ඛවෙ අනාථො විහරති. දස ඉමෙ භික්ඛවෙ නාථකරණා ධම්මා. කතමෙ දස:

1. ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු. යම්පි භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදය සික්ඛති සික්ඛාපදෙසු, අයම්පි ධම්මො නාථකරණො.

2. පුනචපරං භික්ඛවෙ භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා, සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, යම්පි භික්ඛවෙ භික්ඛු බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා, අයම්පි ධම්මො නාථකරණො.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො, යම්පි භික්ඛවෙ භික්ඛු කල්‍යාණමිත්තො හොති, කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො, අයම්පි ධම්මො නාථකරණො.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං. යම්පි භික්ඛවෙ භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං, අයම්පි ධම්මො නාථකරණො.

## 10. 1. 2. 7

## ප්‍රථම නාථකරණ සූත්‍රය

මහණෙනි, සනාථ වූවාහු වසවූ, නහමක් අනාථ වූවූ, මහණෙනි අනාථ වූයේ දුකසේ වසනේය. මහණෙනි, මේ නාථකරණධර්ම දශයෙක; කවර දසයෙක යත්:

1. මහණෙනි, මෙසස්නෙහි භික්ෂු සිල්වත් වෙයි. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවෘත වූයේ ආචාර ගොචර සම්පන්න වූයේ වාසය කරයි. අණුමාත්‍ර වරදෙහිදු බිය දක්නා සුල්ලේ සමාදන් කොට ගෙන සික පෙදෙහි හික්මෙයි. මහණෙනි, යම් හෙයකින් මහණ සිල්වත් වේ ද ... සමාදන් කොටගෙන ශික්ෂාපදයන්හි හික්මේ නම්, මෙ ද නාථකරණ ධර්මයෙකි.

2. තවද මහණෙනි, මහණ ශ්‍රැතධර වූයේ මුළු කොටගත් ශ්‍රැත ඇතියේ බහුශ්‍රැත වෙයි. ආදියෙහි කලණ වූ මධ්‍යයෙහි කලණ වූ පර්යාවසාන– යෙහි කලණ වූ සාර්ථ වූ සව්‍යඤ්ජන වූ යම් ඒ දහම් කෙනෙක් කෙවල පරිපූර්ණ පරිසුද්ධ බ්‍රහ්මචර්ය්‍යය කියත් නම්, ඔහු විසින් එබඳු ධර්මයෝ බහුශ්‍රැත වෙත්, වචනයෙන් ධෘත වෙත්, පරිචිත වෙත්, මනසින් අනුප්‍රෙක්ෂිත වෙත්, ප්‍රඥ දෘෂ්ටියෙන් සුප්‍රතිවිද්ධ වෙත්, මහණෙනි, යම් හෙයෙකින් මහණ, බහුශ්‍රැත වේ නම් ... දෘෂ්ටියෙන් සුප්‍රතිවිද්ධ වෙත් නම්, මෙ දහම ද නාථකරණ වෙයි.

3. තවද මහණෙනි, මහණ කලණ මිතුරන් ඇතියේ කලණ යහළුවන් ඇතියේ කල්‍යාණ සම්ප්‍රවඞ්ක වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කල්‍යාණ සම්ප්‍ර– වඞ්කයෙක් වේ නම් මෙ ද නාථකරණ ධර්මයෙකි.

4. තවද මහණෙනි, මහණ සුවච බව කරන ධර්මයන්ගෙන් සමන්වාගත වූයේ සැහිය හැකියේ පැදකුණෙන් අනුශාසනය පිළිගන්නා සුල්ලේ සුවච වේ. මහණෙනි, යම් හෙයෙකින් මහණ සොවචස්ස කරණ ධර්ම- යෙන් සමන්වාගත වූයේ සැහිය හැකිසේ අනුසස්න පැදකුණින් ගන්නා සුල්ලේ සුවච වේ නම්, මෙ ද නාථකරණ ධර්මයෙකි.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිඞ්කරණීයානි, තත්‍ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං. යම්පි භික්ඛවෙ භික්ඛු යානි-තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්‍ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලංසං-විධාතුං. අයම්පි ධම්මො නාථකරණො.

6. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො, යම්පි භික්ඛවෙ භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපා-මොජ්ජො, අයම්පි ධම්මො නාථකරණො.

7. පුනචපරං භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හ-පරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු, යම්පි භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු, අයම්පි ධම්මො නාථකරණො.

8. පුනචපරං භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරචීවර පිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරෙන, යම්පි භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසන ගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරෙන, අයම්පි ධම්මො නාථකරණො.

9. පුනචපරං භික්ඛවෙ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා, යම්පි භික්ඛවෙ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරක-තම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා, අයම්පි ධම්මො නාථකරණො.

5. තවද මහණෙනි, මහණ සබ්‍රම්සරුන්ගේ යම් කුදුමහත් කම්කරණීහු වෙත් නම් එහි අනලස වූයේ තත්‍රොපායඥනයෙන් සමන්වාගත වූයේ කරනට සමත් වූයේ සංවිධානයට සුදුසු වූයේ දක්ෂ වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ සබ්‍රම්සරුන්ගේ කුදුමහත් යම් කම්කරණීහු වෙත් නම්, එහි අනලස වූයේ තත්‍රොපායඥනයෙන් සමන්වාගත වූයේ කිරීමට සමත් වූයේ සංවිධානයට සුදුසු වූයේ දක්ෂවේ නම්, මෙ ද නාථ-කරණ ධර්මයෙක.

6. තවද මහණෙනි, මහණ තෙවළා දහම් කැමැතියේ පරහට දහම් දෙසනු කැමැතියේ අභිධර්මයෙහි අභිවිනයෙහි මහත් ප්‍රාමොද්‍යය ඇතියේ වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ දහම් කැමැතියේ පරහට ප්‍රිය දෙශනා ඇතියේ අභිධර්මයෙහි අභිවිනයෙහි මහත් ප්‍රාමොද්‍යය ඇතියේ වේ නම්, මෙ ද නාථකරණ ධර්මයෙකි.

7. තවද මහණෙනි, මහණ අකුසල් දහමුන්ගේ ප්‍රහාණය සඳහා කුසල් දහමුන්ගේ උපසම්පත් සඳහා ඇරඹූ වැර ඇතියේ ස්ථාමවත් වූයේ දළ පැරකුම් ඇතියේ කුශලධර්මයන්හි නො බහා තැබූ වීර්‍ය්‍යධුර ඇතියේ වාසය කරයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ අකුසල් දහමුන්ගේ ප්‍රහාණය සඳහා කුසල් දහමුන්ගේ උපසම්පත් සඳහා ඇරඹූ වැර ඇතියේ ස්ථාමවත් වූයේ දළ පැරකුම් ඇතියේ කුසල් දම්හි නො බහා තැබූ වැර ඇතියේ වාසය කෙරේ නම් මෙ ද නාථ කරණ ධර්මයෙක.

8. තවද මහණෙනි, මහණ ඉතරෙතර චීවර පිණ්ඩපාත සෙනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් සතුටු වූයේ වෙයි. මහණෙනි, යම්හෙයෙකින් මහණ ඉතරෙතර චීවර පිණ්ඩපාත ශයනාසන ගලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් සතුටු වූයේ වේ නම් මෙ ද නාථකරණ ධර්මයෙකි.

9. තවද මහණෙනි, මහණ සිහි ඇතියේ පරම ස්මෘති සම්ප්‍රජන්‍ය-යෙන් සමන්වාගත වූයේ චිරකෘතයත් චිරභාෂිතයත් සමරනුයේ අනුස්-මරණ කරනුයේ වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ සිහි ඇතියේ පරම ස්මෘති සම්ප්‍රජන්‍යයෙන් සමන්වාගත වූයේ චිරකෘතයත් චිරභාෂිතයත් සමරනුයේ අනුස්මරණ කරනුයේ වේ නම්, මෙ ද නාථකරණ ධර්මයෙකි.

10. පුනචපරං භික්ඛවෙ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමි-නියා. යම්පි භික්ඛවෙ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. අයම්පි ධම්මො නාථකරණො.

සනාථා භික්ඛවෙ විහරථ, මා අනාථා. දුක්ඛං භික්ඛවෙ අනාථො විහරති, ඉමෙ ඛො භික්ඛවෙ දස නාථකරණා ධම්මාති.

## 10. 1. 2. 8

## දුතියනාථකරණ සුත්තං

[සාවත්ථිනිදානං]

සනාථා භික්ඛවෙ විහරථ, මා අනාථා, දුක්ඛං භික්ඛවෙ අනාථො විහරති. දස ඉමෙ භික්ඛවෙ නාථකරණා ධම්මා. කතමෙ දස:

1. ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදය සික්ඛති සික්ඛාපදෙසු. 'සීලවා වතායං භික්ඛු හොති පාතිමොක්ඛ සංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසූ'ති. ථෙරාපි නං භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. මජ්ඣිමාපි භික්ඛු -පෙ- නවාපි භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස ... මජ්ඣිමානුකම්පිතස්ස ... නවානුකම්පිතස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථකරණො.

2. පුනචපරං භික්ඛවෙ භික්ඛු බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා. 'බහුස්සුතො වතායං භික්ඛු සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා -පෙ- සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා'ති. ථෙරාපි නං භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. මජ්ඣිමාපි භික්ඛු -පෙ- නවාපි භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පි-තස්ස ... මජ්ඣිමානුකම්පිතස්ස ... නවානුකම්පිතස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථ කරණො.

10. තවද මහණෙනි, මහණ ප්‍රඥාවත් වූයේ ආර්‍ය්‍ය වූ ක්ලෙශ නිර්වෙධයට හිත වූ මොනොවට දුඃඛක්ෂයයට යන උදයාස්තගාමිනී ප්‍රඥායෙන් සමන්වාගත වූයේ වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ ප්‍රඥාවත් වූයේ ආර්‍ය්‍ය වූ නිර්වේධයට හිත වූ මැනැවින් දුක් නැසුමට යන උදයාස්තගාමිනී ප්‍රඥායෙන් සමන්වාගත වේ නම්, මෙ ද නාථකරණ ධර්මයෙකි.

මහණෙනි, සනාථ වූවෝ වසවු, නහමක් අනාථ වවු, මහණෙනි, අනාථ වූයේ දුකසේ වාසය කරයි. මහණෙනි, මේ දස නාථකරණ ධර්මයෝ යි.

## 10. 1. 2. 8
## දුතිය නාථකරණ සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, සනාථ වූවෝ වාසය කරවු, නහමක් අනාථ වවු. මහණෙනි, අනාථ වූයේ දුකසේ වාසය කරයි. මහණෙනි, මේ නාථකරණ ධර්ම දශයෙක, කවර දශයෙක යත්:

1. මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. ... සමාදන් කොට ගෙන සික පෙදෙහි හික්මෙයි. "මෙ මහණ එකැතින් සිල්වත් වෙයි. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවෘත වූයේ ආචාරගොචර සම්පන්න වූයේ වාසය කරයි. අණුමාත්‍රවද්‍යයෙහිදු භය දක්නා සුල්ලේ සමාදන් කොට ගෙන සික පෙදෙහි හික්මේ ය"යි තෙර මහණහු ද ඔහු කිවයුතු කොට අනුසැසිය යුතු කොට හඟිත්. මැදි මහණ හුද ... සඟමහණහුද ඔහු කිවයුතු කොට අනුසැසිය යුතු කොට හඟිත්. තෙරුන් විසින් අනුකම්පිත - මැදි මහණුන් විසින් අනුකම්පිත - සඟ මහණුන් විසින් අනුකම්පිත ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානියෙක් නොවේ. මෙ ද නාථකරණ ධර්මයෙකි.

2. තවද මහණෙනි, මහණ බහුශ්‍රැත වෙයි. ... දෘෂ්ටියෙන් සුප්‍රතිවිද්ධ වෙත්. "එකැතින් මේ මහණ බහුශ්‍රැත ය, ශ්‍රැතධර ය, ශ්‍රැතසන්නිචයෙක, ආදිකල්‍යාණ ... සාර්ථ, සව්‍යඤ්ජන වූ යම් ධර්ම කෙනෙක් කෙවල පරිපූර්ණ, පරිශුද්ධ, බ්‍රහ්මචර්‍ය්‍යය පවසත් නම් එබඳු ධර්මයෝ මොහු විසින් බහුශ්‍රැතයහ, ධෘතයහ, වචනයෙන් පරිචිතයහ, සිතින් අනුප්‍රෙක්ෂිතයහ. දිටුහයෙන් මොනොවට පිළිවිදුනහ"යි ස්ථවිර භික්ෂූහු ද ඔහු කියයුතු කොට අනුසැසිය යුතු කොට හඟිත්. මධ්‍යම භික්ෂුහු ද ... නවක භික්ෂූහු ද ඔහු වක්තව්‍යයකු කොට අනුශාසිතව්‍ය කොට හඟිත්. ස්ථවිරානුකම්පිත - මධ්‍යමානුකම්පිත - නවානුකම්පිත ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානියෙක් නොවේ. මෙ ද නාථකරණ ධර්මයෙකි.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො. 'කල්‍යාණමිත්තො වතායං භික්ඛු කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො'ති ථෙරාපි නං වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. මජ්ඣිමා පි භික්ඛු -පෙ- නවාපි භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස මජ්ඣිමානුකම්පිතස්ස නවානුකම්පිතස්ස වුඩ්ඪියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි, අයම්පි ධම්මො නාථකරණො.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං. සුවචො වතායං භික්ඛු සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනින්ති ථෙරාපි නං වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති මජ්ඣිමාපි -පෙ- නවාපි භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස මජ්ඣිමානුකම්පිතස්ස නවානුකම්පිතස්ස වුඩ්ඪියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථකරණො.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්‍ථ දක්ඛො හොති අනලසො, තත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං, යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්‍ථ දක්ඛො වතායං භික්ඛු අනලසො තත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලංකාතුං අලංසංවිධාතුන්ති. ථෙරාපි නං වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. මජ්ඣිමාපි භික්ඛු -පෙ- නවාපි භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස මජ්ඣිමානුකම්පිතස්ස නවානුකම්පිතස්ස වුඩ්ඪියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථකරණො.

3. තවද මහණෙනි, මහණ කලණ මිතුරන් ඇතියේ කලණ යහළුවන් ඇතියේ කල්‍යාණ සම්ප්‍රවඞ්කයෙක් වෙයි. ''මේ මහණ එකැතින් කලණ මිතුරන් ඇතියෙක, කලණ යහළුවන් ඇතියෙක, කල්‍යාණ සම්ප්‍රවඞ්ක-යෙකැ''යි ස්ථවිර භික්ෂූහු ද ඔහු වක්තව්‍යයකු කොට අනුශාස්‍යයකු කොට හඟිත්. මධ්‍යම භික්ෂූහුද ... නවක භික්ෂූහුද ඔහු වක්තව්‍යයකු අනුශාස්‍යයකු කොට හඟිත්. ස්ථවිරානුකම්පිත – මධ්‍යමානුකම්පිත– නවකානුකම්පිත ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම වෙයි. පරිහානි-යෙක් නොවේ. මෙ ද නාථකරණ ධර්මයෙකි.

4. තවද මහණෙනි, මහණ සෞවචස්සකාර ධර්මයෙන් සමන්වාගත වූයේ සැහිය හැකියේ අනුශාසනාව පැදකුණින් ගන්නා සුල්ලේ සුවච වෙයි.'එකැතින් මෙ මහණ සුවචය, සොවචස්සකාරධර්මයෙන් සමන්වාගත-යෙක. සැහිය හැකියෙක, පැදකුණින් අනුසස්න ගන්නා සුල්ලෙකැ''යි ස්ථවිර භික්ෂූහුද ඔහු වක්තව්‍යයකු අනුශාස්‍යයකු කොට හඟිත්. මධ්‍යම භික්ෂූහු ද ... නවක භික්ෂූහුද ඔහු වක්තව්‍යයකු අනුශාස්‍යයකු කොට හඟිත්. ස්ථවිරානුකම්පිත – මධ්‍යමානුකම්පිත – නවකානුකම්පිත ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු, පරිහානියෙක් නො වේ. මෙ ද නාථකරණ ධර්මයෙක.

5. තවද මහණෙනි, මහණ සබ්‍රම්සරුන්ගේ යම් කුදු මහත් කුම්-කරණී වෙත් නම් එහි දක්ෂ වූයේ අනලස් වෙයි. තත්‍රොපාය වීමංසා-යෙන් සමන්වාගත වූයේ කිරීමට සුදුසු වෙයි. සංවිධානයට සුදුසු වෙයි, ''එකැතින් මේ මහණ සබ්‍රම්සරුන්ගේ යම් ඒ කුදු මහත් කුම්කරණීහු වෙත් නම් එහි දක්ෂ වූයේ අනලස් වෙයි. තත්‍රොපාය වීමංසායෙන් සමන්වාගත වූයේ කිරීමට සමත් වෙයි. සංවිධාන කිරීමට සමත් වේ යයි ස්ථවිර භික්ෂූහුද ඔහු. වක්තව්‍යයකු කොට අනුශාස්‍යයකු කොට හඟිත්. මධ්‍යම භික්ෂූහු ද... නවක භික්ෂූහු ද ඔහු වක්තව්‍යයකු කොට අනුශාස්‍යයකු කොට හඟිත්. ස්ථවිරානුකම්පිත වූ – මධ්‍යමානුකම්පිත වූ – නවානුකම්පිත වූ ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානියෙක් නො වේ. මෙ ද නාථකරණ ධර්මයෙකි.

6. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො, අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො. 'ධම්මකාමො ඛ්වායං භික්ඛු පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො'ති ථෙරාපි නං භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. මජ්ඣිමාපි -පෙ- නවාපි භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස මජ්ඣිමානුකම්පිතස්ස නවානුකම්පිතස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථකරණො.

7. පුනචපරං භික්ඛවෙ භික්ඛු ආරද්ධවීරියො විහරති අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු 'ආරද්ධවීරියො ඛ්වායං භික්ඛු විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසූ'ති ථෙරාපි නං භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. මජ්ඣිමාපි භික්ඛු -පෙ- නවාපි භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස මජ්ඣිමානුකම්පිතස්ස නවානුකම්පිතස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථකරණො.

8. පුනචපරං භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන 'සන්තුට්ඨො ඛ්වායං භික්ඛු ඉතරීතරචීවර පිණ්ඩපාතසෙනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙනා'ති ථෙරාපි නං භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති, මජ්ඣිමාපි භික්ඛු -පෙ- නවාපි භික්ඛු වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස මජ්ඣිමානුකම්පිතස්ස නවානුකම්පිතස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථකරණො.

6. තවද මහණෙනි, මහණ තෙවළා දම් කැමැතියේ ප්‍රිය කථා ඇතියේ අභිධර්මයෙහි අභිවිනයෙහි මහත් ප්‍රාමොද්‍ය ඇතියේ වෙයි. ''එකැතින් මෙ මහණ ධර්මකාම වූයේ ප්‍රිය කථා ඇතියේ අභිධර්ම-යෙහි අභිවිනයෙහි මහත් ප්‍රාමොද්‍ය ඇත්තෙකැ''යි ස්ථවිර භික්ෂුහු ද ඔහු වක්තව්‍යයකු කොට අනුශාසිතව්‍යයකු කොට හඟිත්. මධ්‍යම භික්ෂු-හු ද ... නවක භික්ෂුහු ද ඔහු වක්තව්‍යයකු – අනුශාසිතව්‍යයකු කොට හඟිත්. ස්ථවිරානුකම්පිත වූ – මධ්‍යමානුකම්පිත වූ – නවකානුකම්පිත වූ ඔහට කුසලධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානියෙක් නො වෙයි. මෙ ද නාථකරණ ධර්මයෙක.

7. තවද මහණෙනි, මහණ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශල ධර්මයන්ගේ උපසම්පත් පිණිස ඇරඹූ වැර ඇතියේ ස්ථාමවත් වූයේ දළපැරකුම් ඇතියේ කුශල් දහම් හි බහා නො තැබූ වැර ඇතියේ වෙසෙයි, ''එකැතින් මෙ මහණ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ උපසම්පත් පිණිස, ඇරඹූ වැර ඇතියේ ස්ථාමවක් වූයේ දළ පැරකුම් ඇතියේ කුශලධර්මයන්හි නො බහා තැබූ වීර්‍ය්‍යධුර ඇතියෙකැ''යි. ස්ථවිර භික්ෂුහු ද ඔහු වක්තව්‍යයකු කොට අනුශාස්‍යයකු කොට හඟිත්. මධ්‍යම භික්ෂුහු ද ... නවක භික්ෂුහු ද ඔහු වක්තව්‍යයකු කොට අනුශාසිතව්‍යයකු කොට හඟිත්. ස්ථවිරානුකම්පිත –, මධ්‍යමානුකම්පිත - නවකානුකම්පිත ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු. පරිහානියෙක් නො වෙයි. මෙ ද නාථකරණ ධර්මයෙක.

8. තවද මහණෙනි, මහණ ඉතරෙතර චීවර පිණ්ඩපාතශයනාසන ග්ලාන ප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් සතුටු වෙයි. ''එකැතින් මෙ මහණ ඉතරෙතර චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් සතුටු වෙ''යි. ස්ථවිර භික්ෂුහු ද ඔහු වක්තව්‍යයකු අනුශාසි-තව්‍යයකු කොට හඟිත්, මධ්‍යම භික්ෂුහු ද ... නවක භික්ෂුහු ද ඔහු වක්තව්‍යයකු කොට අනුශාසිතව්‍යයකු කොට හඟිත්. ස්ථවිරානුකම්පිත මධ්‍යමානුකම්පිත – නවකානුකම්පිත ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම වෙයි. පරිහානියෙක් නො වෙයි. මෙ ද නාථකරණ ධර්මයෙකි.

9. පුනචපරං භික්ඛවෙ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. 'සතිමා වතායං භික්ඛු පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා'ති ථෙරාපි නං භික්ඛූ වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. මජ්ඣිමා පි -පෙ- නවා පි භික්ඛූ වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස මජ්ඣිමානුකම්පිතස්ස නවානුකම්පිතස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථකරණො.

10. පුනචපරං භික්ඛවෙ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා පඤ්ඤවා වතායං භික්ඛු උදයත්ථගාමිනියා 'පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා'ති ථෙරාපි නං භික්ඛූ වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති, මජ්ඣිමා පි භික්ඛූ -පෙ- නවා පි භික්ඛූ වත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤන්ති. තස්ස ථෙරානුකම්පිතස්ස-මජ්ඣිමානුකම්පිතස්ස-නවානුකම්පිතස්ස වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. අයම්පි ධම්මො නාථකරණො.

සනාථා භික්ඛවෙ විහරථ, මා අනාථා, දුක්ඛං භික්ඛවෙ අනාථො විහරති. ඉමෙ ඛො භික්ඛවෙ දසනාථකරණා ධම්මාති.

## 10. 1. 2. 9

## පඨමාරියවාස සුත්තං

**[සාවත්ථිනිදානං]**

දස ඉමෙ භික්ඛවෙ අරියවාසා යදරියා ආවසිංසු වා ආවසන්ති වා ආවසිස්සන්ති වා. කතමෙ දස:

ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති ඡළඞ්ගසමන්නාගතො එකාරක්ඛො චතුරාපස්සෙනො පනුණ්ණපච්චෙකසච්චො සමවයසට්ඨෙසනො අනාවිලසඞ්කප්පො පස්සද්ධකායසඞ්ඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො. ඉමෙ ඛො භික්ඛවෙ දස අරියවාසා යදරියා ආවසිංසු වා ආවසන්ති වා ආවසිස්සන්ති වා ති.

9. තවද මහණෙනි, මහණ සමෘතිමත් වූයේ පරමසමෘතිසම්ප්‍රජන්‍ය යෙන් යුක්ත වූයේ චිරකෘතය ද චිරභාෂිතය ද සමරනුයේ අනුස්මරණය කරනුයේ වෙයි: "එකැතින් මේ මහණ සමෘතිමත් වූයේ පරම සමෘතිසම්ප්‍ර-ජන්‍යයෙන් සමන්වාගත වූයේ චිරකෘතය ද චිරභාෂිතය ද සමරනුයේ අනුස්මරණය කරනුයේ වෙයි, ස්ථවිර භික්ෂූහු ද ඔහු වක්තව්‍ය අනුශාසිතව්‍ය කොට හඟිත්. මධ්‍යම භික්ෂූහු ද ... නවක භික්ෂූහු ද ඔහු වක්තව්‍යයකු අනුශාසිතව්‍යයකු කොට හඟිත්. ස්ථවිරානුකම්පිත – මධ්‍යමානුකම්පිත – නව-කානුකම්පිත ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම වෙයි. පරිහානියෙක් නො වෙයි. මෙ ද නාථකරණ ධර්මයෙකි.

10. තවද මහණෙනි, මහණ ප්‍රඥවත් වූයේ ආර්‍ය වූ ක්ලෙශනිර්වේධය පිණිස පවත්නා මැනැවින් දුක් කෙළවරට යන උදයාස්‍තගාමිනී ප්‍රඥවෙන් සමන්වාගත වූයේ වෙයි: "එකැතින් මෙ මහණ ප්‍රඥවත් වූයේ ආර්‍ය වූ නිර්වේධයට හිත වූ මැනැවින් දුක් කෙළවරට පමුණුවන උදයාස්‍තගාමිනී ප්‍රඥයෙන් සමන්වාගත යයි ස්ථවිර භික්ෂූහු ද ඔහු වක්තව්‍යයකු අනුශා-සිතව්‍යයකු කොට හඟිත්. මධ්‍යම භික්ෂූහු ද ... නවක භික්ෂූහු ද ඔහු වක්තව්‍යයකු අනුශාසිතව්‍යයකු කොට හඟිත්. ස්ථවිරානුකම්පිත – මධ්‍යමානුකම්පිත නවානුකම්පිත ඔහට කුශල ධර්මයන්හි වෘද්ධියෙක් ම වෙයි. පරිහානියෙක් නො වෙයි. මෙ ද නාථකරණ ධර්මයෙකි.

මහණෙනි, සනාථ වූවෝ වසවු, නහමක් අනාථ වවු, මහණෙනි, අනාථ වූයේ දුකසේ වෙසෙයි. මහණෙනි, මොහු දශ නාථකරණ ධර්ම යි.

## 10. 1. 2. 9

## පඨමාරියවාස සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, යම් ආර්‍යවාසයෙකැ ආර්‍යයෝ වුසූහු හෝ වසත් හෝ වසන්නාහු හෝ නම් මේ දස ආර්‍යවාස කෙනෙක කවර දශයෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ පඤ්චාඞ්ග විප්‍රහීණ වූයේ ෂඩඞ්ග-සමන්වාගත වූයේ එකාරක්ෂා ඇතියේ සතර අපසෙනයන් ඇතියේ බැහැර කළ ප්‍රත්‍යෙක සත්‍ය ඇතියේ වුහුටු හැම එසනා ඇතියේ නො කැලඹුණු සංකල්පනා ඇතියේ සන්හුන් කායසංස්කාර ඇතියේ මොනොවට මිදුණු සිත් ඇතියේ මොනොවට මුත් පැන ඇතියේ වෙයි. මහණෙනි, යම් ආර්‍යවාසයන් ආර්‍යයෝ වුසූහු නම් වසත් නම් වසන්නාහු නම් මේ ඒ දශ ආර්‍යවාස යි.

## 10. 1. 2. 10

## දුතිය අරියවාස සුත්තං

එකං සමයං භගවා කුරූසු විහරති කම්මාසදම්මං නාම කුරූනං නිගමො, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -පෙ- භගවා එතදවොච: දස ඉමෙ භික්ඛවෙ අරියවාසා යදරියා ආවසිංසු වා ආවසන්ති වා ආවසිස්සන්ති වා, කතමෙ දස:

ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති ඡළඞ්ගසමන්නාගතො එකාරක්ඛො චතුරාපස්සෙනො, පනුණ්ණපච්චෙකසච්චො සමවයසට්ඨෙසනො අනාවිලසඞ්කප්පො පස්සද්ධකායසඞ්ඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො.

1. කථඤ්ච භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති: ඉධ භික්ඛවෙ භික්ඛුනො කාමච්ඡන්දො පහීනො හොති, බ්‍යාපාදො පහීනො හොති, ථීනමිද්ධං පහීනං හොති, උද්ධච්චකුක්කුච්චං පහීනං හොති, විචිකිච්ඡා පහීනා හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො හොති.

2. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඡළඞ්ගසමන්නාගතො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති, න දුම්මනො. උපෙක්ඛකො විහරති සතො සම්පජානො. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො උපෙක්ඛකො විහරති සතො සම්පජානො. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඡළඞ්ගසමන්නාගතො හොති.

3. කථඤ්ච භික්ඛවෙ භික්ඛු එකාරක්ඛො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු සතාරක්ඛෙන චෙතසා සමන්නාගතො හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු එකාරක්ඛො හොති.

1. යෙ අරියා - මජසං.

## 10. 1. 2. 10

## දෙවෙනි අරියවාස සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරුජනපදයෙහි කම්මාසදම්ම නම් කුරුන්ගේ නියම්ගම්හි වාසය කෙරෙත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූහ. ... භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මහණෙනි, ආර්‍ය්‍යයෝ යම් වාසයෙකැ වුසූහු ද වෙසෙත් ද වසන්නාහු ද මේ ඒ ආර්‍ය්‍යවාසයෝ දශයෙක. කවර දශයෙක යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ පඤ්චඞ්ගවිප්පහීන වෙයි. ඡළඞ්ගසමන්නාගත වෙයි. එකාරක්ඛ වෙයි; චතුරාපස්සෙන වෙයි. පනුණ්ණපච්චෙකසච්ච වෙයි. සමවයසට්ඨෙසන වෙයි. අනාවිල සඞ්කප්ප වෙයි. පස්සද්ධකායසඞ්ඛාර වෙයි. සුවිමුත්තචිත්ත වෙයි, සුවිමුත්තපඤ්ඤ වෙයි.

1. මහණෙනි, කෙසේ නම් මහණ පඤ්චඞ්ගවිප්පහීන වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ කාමච්ඡන්දය ප්‍රහීණ වෙයි, ව්‍යාපාදය ප්‍රහීණ වෙයි. ථීනමිද්ධය ප්‍රහීණ වෙයි. උද්ධච්චකුක්කුච්චය ප්‍රහීණය වෙයි. විචිකිච්ඡා ප්‍රහීණ වෙයි. මහණෙනි, මෙසේ මහණ පඤ්චඞ්ගවිප්පහීන වෙයි.

2. මහණෙනි, කිසෙයින් මහණ ඡළඞ්ගසමන්නාගත වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ චක්ෂුස්ප්‍රසාදයෙන් රූපාලම්බනයක් දැක නො ම සුමන වෙයි. නො ම දුම්මන වෙයි. උපෙක්ෂායෙන් යුක්ත වූයේ ස්මෘති ඇතියේ සම්‍යක්ප්‍රඥ ඇතියේ වාසය කරයි. ශ්‍රොත්‍රප්‍රසාදයෙන් ශබ්දලම්බනය අසා–ඝ්‍රාණප්‍රසාදයෙන් ගන්ධාලම්බනය ආඝ්‍රාණ කොට ජිහ්වාප්‍රසාදයෙන් රසාලම්බනය විඳ – කායප්‍රසාදයෙන් ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය පැහැස – මනසින් ධර්මාලම්බනය දැන නො ම සුමන වෙයි. නො ම දුම්මන වෙයි. උපෙක්ෂා ඇතියේ සිහි ඇතියේ සම්‍යක්ප්‍රඥ ඇතියේ වසයි. මහණෙනි, මෙසේ මහණ ඡළඞ්ගසමන්නාගත වෙයි.

3. මහණෙනි, කිසෙයින් මහණ එකාරක්ඛ වේ ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ ස්මෘතිය ආරක්ෂා කොට ඇති සිතින් සමන්වාගත වෙයි. මහණෙනි, මෙසේ මහණ එකාරක්ඛ වෙයි.

4. කථඤ්ච භික්ඛවෙ භික්ඛු චතුරාපස්සෙනො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු සඞ්ඛායෙකං පටිසෙවති. සඞ්ඛායෙකං අධිවාසෙති, සඞ්ඛායෙකං පරිවජ්ජෙති. සඞ්ඛායෙකං විනොදෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු චතුරාපස්සෙනො හොති.

5. කථඤ්ච භික්ඛවෙ භික්ඛු පනුණ්ණපච්චෙකසච්චො හොති: ඉධ භික්ඛවෙ භික්ඛුනො යානි තානි පුථුසමණබ්‍රාහ්මණානං පුථුපච්චෙකසච්චානි සෙය්‍යථීදං: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න හොති ච තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා, සබ්බානි තානි නුණ්ණානි හොන්ති පනුණ්ණානි, චත්තානි වන්තානි මුත්තානි පහීනානි පටිනිස්සට්ඨානි, එවං ඛො භික්ඛවෙ භික්ඛු පනුණ්ණපච්චෙකසච්චො හොති.

6. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සමවයසට්ඨෙසනො හොති: ඉධ භික්ඛවෙ භික්ඛුනො කාමෙසනා පහීනා හොති, භවෙසනා පහීනා හොති, බ්‍රහ්මචරියෙසනා පටිප්පස්සද්ධා. එවං ඛො භික්ඛවෙ භික්ඛු සමවයසට්ඨෙසනො හොති.

7. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අනාවිලසඞ්කප්පො හොති: ඉධ භික්ඛවෙ භික්ඛුනො කාමසඞ්කප්පො පහීනො හොති, බ්‍යාපාදසඞ්කප්පො පහීනො හොති, විහිංසාසඞ්කප්පො පහීනො හොති, එවං ඛො භික්ඛවෙ භික්ඛු අනාවිලසඞ්කප්පො හොති.

8. කථඤ්ච භික්ඛවෙ භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. එවං ඛො භික්ඛවෙ භික්ඛු පස්සද්ධකායසඞ්ඛාරො හොති.

4. මහණෙනි, කිසෙයින් මහණ චතුරාපස්සේන වෙයි ද? මහණෙනි, මෙ සස්නෙහි මහණ නුවණින් සලකා එකක් සෙවුනේ ය. නුවණින් සලකා එකක් ඉවසන්නේ ය. නුවණින් සලකා එකක් හරණේ ය. නුවණින් සලකා එකක් දුරලන්නේ ය. මහණෙනි, මෙසේ මහණ චතුරාපස්සේන වෙයි.

5. මහණෙනි, කිසෙයින් මහණ පනුණ්ණපච්චේකසච්ච වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට බොහෝ මහණ බමුණන්ගේ යම් ඒ බොහෝ ප්‍රත්‍යෙකසත්‍යයෝ වෙත් ද, ඒ කිසේ ය: ලොකය ශාශ්වතය කියා වේවයි, ලොකය අශාශ්වතය කියා වේවයි, ලොකය අන්‍තවත්ය කියා වේවයි, ලොකය අනන්‍තවත්ය කියා වේවයි, එය ම ජීවය එය ම ශරීරය වෙයි කියා වේවයි, ජීවය අනෙකෙක ශරීරය අනෙකෙක කියා වේවයි, සත්ත්‍ව තෙමේ මරණින් මතු (පුනර්භව විසින්) වේය කියා වේවයි, සත්ත්‍ව තෙමේ මරණින් මතු නො වේ ය කියා වේවයි සත්ත්‍ව තෙමේ මරණින් මතු වේ ය නො වේ ය කියා වේවයි, සත්ත්‍ව තෙමේ මරණින් මතු නොම වෙයි නොවන්නේ නොම වෙයි කියා වේවයි, එ හැම බැහැර ලූවාහු මොනොවට බැහැර ලූවාහු ත්‍යක්ත වූවාහු වාන්‍ත වූවාහු මුක්ත වූවාහු ප්‍රහීණ වූවාහු ප්‍රතිනිස්සෘෂ්ට වූවාහු වෙති. මහණෙනි, මෙසේ මහණ පනුණ්ණ පච්චේකසච්ච වෙයි.

6. මහණෙනි, කිසෙයින් මහණ සමවයසට්ඨෙසන වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහුට කාමෙසනා ප්‍රහීණ වෙයි. භවෙසනා ප්‍රහීණ වෙයි, බ්‍රහ්මචර්‍යෙසනා ප්‍රතිප්‍රශ්‍රබ්ධ ය, මහණෙනි, මෙසේ මහණ සමවයසට්ඨෙසන වෙයි.

7. මහණෙනි, මහණ කිසෙයින් අනාවිල සඞ්කප්ප වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ කාමසඞ්කල්පය ප්‍රහීණ වෙයි, ව්‍යාපාදසඞ්කල්පය ප්‍රහීණ වෙයි, විහිංසා සංකල්පය ප්‍රහීණ වෙයි, මහණෙනි, මෙසේ මහණ අනාවිල සඞ්කප්ප වෙයි.

8. මහණෙනි, කිසෙයින් මහණ පස්සද්ධකාය සඞ්ඛාර වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පළමු වැ සොම්නස් දොම්නසුන්ගේ අස්තගමයෙන් අදුඃඛ වූ අසුඛ වූ උපෙක්ෂා පාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ පස්සද්ධකායසඞ්ඛාර වෙයි.

9. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සුවිමුත්තචිත්තො හොති: ඉධ භික්ඛවෙ භික්ඛුනො රාගා චිත්තං විමුත්තං හොති, දොසා චිත්තං විමුත්තං හොති, මොහා චිත්තං විමුත්තං හොති, එවං ඛො භික්ඛවෙ භික්ඛු සුවිමුත්ත-චිත්තො හොති.

10. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සුවිමුත්තපඤ්ඤො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු රාගො මෙ පහීනො, උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො. ආයතිං අනුප්පාදධම්මොති පජානාති. දොසො මෙ -පෙ- මොහො මෙ පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාව-කතො ආයතිං අනුප්පාදධම්මොති පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු සුවිමුත්තපඤ්ඤො හොති.

යෙ හි කෙචි භික්ඛවෙ අතීතමද්ධානං අරියා අරියවාසෙ ආවසිංසු, සබ්බෙ තෙ ඉමෙව දස අරියවාසෙ ආවසිංසු. යෙ හි කෙචි භික්ඛවෙ අනාගතමද්ධානං අරියා අරියවාසෙ ආවසිස්සන්ති, සබ්බෙ තෙ ඉමෙව දසඅරියවාසෙ ආවසිස්සන්ති. යෙ හි කෙචි භික්ඛවෙ එතරහි අරියා අරියවාසෙ ආවසන්ති සබ්බෙ තෙ ඉමෙව දසඅරියවාසෙ ආවසන්ති. ඉමෙ ඛො භික්ඛවෙ දසඅරියවාසා යෙ අරියා ආවසිංසු වා ආවසන්ති වා ආවසිස්සන්ති වාති.

## නාථවග්ගො දුතියො.

**තස්සුද්දානං:**

සෙනාසනඤ්ච අඞ්ගානි සංයොජන
කිලෙන ච අප්පමාදෙ ආහුනෙය්‍යො ද්වෙනාථා ද්වෙඅරියවාසා වා'ති.[1]

1. සෙනාසනඤ්ච පඤ්චඞ්ගං සංයොජනා කිලෙන ච
අප්පමාදෙ ආහුනෙය්‍යො ද්වෙ නාථා ද්වෙ අරියවාසාති. – මජසං.

9. මහණෙනි, කිසෙයින් මහණ සුවිමුත්තචිත්ත වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහුගේ සිත රාගයෙන් විමුක්ත වෙයි, දෙෂයෙන් සිත විමුක්ත වෙයි, මොහයෙන් සිත විමුක්ත වෙයි, මහණෙනි, මෙසේ මහණ සුවිමුක්තචිත්ත වෙයි.

10. මහණෙනි, කෙසේ මහණ සුවිමුක්තපඤ්ඤ වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ මාගේ රාගය ප්‍රහීණ ය, උදුන්මුල් ඇතියේ ය, තාලාවස්තුකෘතය, අනභාවකෘත ය, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ යි දන්නේ ය. මාගේ දෙෂය ... මාගේ මොහය ප්‍රහීණ ය, උච්ඡින්නමූල ය, තාලාවස්තුකෘත ය, අනභාවකෘත ය, මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ යි දන්නේ ය. මහණෙනි, මෙසේ මහණ සුවිමුත්තචිත්ත වෙයි.

මහණෙනි, අතීතකාලයෙහි යම් කිසි ආර්‍ය්‍යයෝ ආර්‍ය්‍යවාසයෙකැ වුසූහු නම් ඒ හැම මේ දශ ආර්‍ය්‍යවාසයෙහි ම වුසූහ. මහණෙනි අනාගතයෙහි යම් කිසි ආර්‍ය්‍යයෝ ආර්‍ය්‍යවාසයෙකැ වසන්නාහු නම් ඒ හැම මේ දශ ආර්‍ය්‍යවාස-යෙහි ම වසන්නාහ. මහණෙනි, මෙ කල්හි යම් ආර්‍ය්‍යයෝ ආර්‍ය්‍යවාසයෙකැ වසත් නම් ඒ හැම මේ දශ ආර්‍ය්‍යවාසයෙහි ම වසත්. මහණෙනි, යම් ආර්‍ය්‍යවාසයෙකැ ආර්‍ය්‍යයෝ වුසූහු නම්, වසත් නම්, වසන්නාහු නම් මොහු ඒ දශාර්‍ය්‍යවාස යෝ යි.

## දෙවන නාථ වර්ග යි.

**එහි උද්දානය :**

සෙනාසන සූත්‍රය ද අඞ්ග සූත්‍ර ද සංයෝජන සූත්‍රය ද ඛිල සූත්‍රය ද අප්පමාද සූත්‍රය ද ආහුනෙය්‍ය සූත්‍රය ද නාථ සූත්‍ර දෙක ද අරියවාස සූත්‍ර දෙක දැයි දශයෙකි.

# 3. මහාවග්ගො

## 10. 1. 3. 1

### සීහනාද සුත්තං

[සාවත්ථිනිදානං]

සීහො භික්ඛවෙ මිගරාජා සායනහසමයං ආසයා නික්ඛමති. ආසයා නික්ඛමිත්වා විජම්භති; විජම්භිත්වා සමන්තා චතුද්දිසං[1] අනුවිලොකෙති. සමන්තා චතුද්දිසං අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදති. තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමති. තං කිස්ස හෙතු; "මාහං ඛුද්දකෙ-පාණෙ විසමගතෙ සඞ්ඝාතං ආපාදෙසින්ති".

සීහොති ඛො භික්ඛවෙ තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මා සම්බුද්ධස්ස; යං ඛො භික්ඛවෙ තථාගතො පරිසාය ධම්මං දෙසෙති, ඉදමස්ස හොති සීහනාදස්මිං.

දස ඉමානි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලානි යෙහි බලෙහි සමන්නා-ගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති. කතමානි දස:

1. ඉධ භික්ඛවෙ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨා-නතො යථාභූතං පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති. යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

2. පුනචපරං භික්ඛවෙ තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

3. පුනචපරං භික්ඛවෙ තථාගතො සබ්බත්ථගාමිනිපටිපදං යථාභූතං පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො සබ්බත්ථගාමිනිපටිපදං යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

1. චතුද්දිසා – සයා කං:

# 3. මහාවර්ගය

## 10. 1. 3. 1

## සිංහනාද සූත්‍රය

**[සැවැත්නිදන යි]**

මහණෙනි, මෘගරාජන් වන සිංහ සවස් වේලෙහි ලැග්මෙන් නික්මෙයි. ලැග්මෙන් නික්ම වජඹනේය. වජඹා වටා සිවු දිගුන් නාහමයි. වටා සිවුදිගුන් නහමා තෙවරක් සිංහ නාද කරයි. තෙවරක් සිංහ නාද කොට ගොදුරට නික්ම යයි. එ කවර හෙයින යත්: ''විෂම ස්ථානගත ක්ෂුද්‍ර ප්‍රාණීන් නහමක් වධයට පමුණුව මැ''යි.

මහණෙනි සිහ යන තෙල අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයනට නමෙකි. මහණෙනි, යම් හෙයෙකින් තථාගතයෝ (සිවුවණක්) පර්ෂද්හි දහම් දෙසත් ද මේ උන්වහන්සේගේ සිංහනාද යයි.

මහණෙනි, යම්බඳු බලයෙකින් සමන්වාගත තථාගතයෝ ශ්‍රෙෂ්ඨ-ස්ථානය පිළින කෙරෙත් ද අට පිරිස්හි සිංහනාද කෙරෙත් ද විශිෂ්ට ධර්මචක්‍රය පවත්වත් ද තථාගතයන්ගේ එබඳු වූ මේ බලයෝ දශ දෙනෙක. කවර, දශ කෙනෙක යත්:

1. මහණෙනි, මෙලොව්හි තථාගතයෝ කාරණය කාරණ වශයෙන් ද අස්ථානය අස්ථානය විසින් ද යථාභූත ව දන්නාහ: මහණෙනි, යම් කරුණෙකින් තථාගතයෝ ස්ථානය ස්ථාන වශයෙන් ද අස්ථානය අස්ථාන වශයෙන් ද යථාභූතයෙන් දන්නාහු ද මහණෙනි, යම්බඳු බලයෙකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨ ස්ථානය ප්‍රතිඥ කෙරෙත් ද අට පිරිස්හි සිංහ නාද කරත් ද බ්‍රහ්ම චක්‍රය පවත්වත් ද තථාගතයන්ගේ මේ ද තථාගතබලයි.

2. තවද මහණෙනි, තථාගතයෝ අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න කර්ම සමාදනයන්ගේ විපාකය යථාභූත ප්‍රත්‍යය විසින් හෙතු විසින් දන්නාහ. මහණෙනි, යම් කරුණෙකින් තථාගතයෝ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න කර්මසමාදනයන්ගේ විපාකය යථාභූත ව ප්‍රත්‍යය විසින් හෙතු විසින් දන්නාහු ද මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨ ස්ථානය පිළින කරත් ද පිරිස්හි සිංහනාද කරත් ද බ්‍රහ්මචක්‍රය පවත්වත් ද තථාගතයන්ගේ මෙ ද තථාගතබල යි.

3. තවද මහණෙනි, යථාභූත වූ සර්වත්‍රගාමිනීප්‍රතිපද් දන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් තථාගතයෝ යථාභූතයෙන් සර්වත්‍රගාමිනීප්‍රතිපද් දන්නාහු ද මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථාන පිළින කරත් ද පර්ෂද්හි සිංහනාද කරත් ද බ්‍රහ්මචක්‍රය පවත්වත් ද තථාගතයන්ගේ මෙ ද තථාගතබල යි.

4. පුනවපරං භික්ඛවෙ තථාගතො අනෙකධාතු[1]නානාධාතු[1]ලොකං යථාභූතං පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො අනෙකධාතු නානාධාතු ලොකං යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති. යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

5. පුනවපරං භික්ඛවෙ තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, යම්පි භික්ඛවෙ තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

6. පුනවපරං භික්ඛවෙ තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රිය පරොපරියත්තං යථාභූතං පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

7. පුනවපරං භික්ඛවෙ තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති, යම්පි භික්ඛවෙ තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තෙති.

8. පුනවපරං භික්ඛවෙ තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො, පඤ්චපි ජාතියො - පෙ - දසපි ජාතියො - වීසම්පි ජාතියො, තිංසම්පි ජාතියො, චත්තාරීසම්පි ජාතියො, පඤ්ඤාසම්පි ජාතියො, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ, අනෙකෙපි විවට්ටකප්පෙ, අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, අමුත්‍රාසිං එවන්නාමො, එවංගොත්තො, එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛ පටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං,

1. අනෙකධාතුං නානාධාතුං - මජසං

4. තවද මහණෙනි, තථාගතයෝ යථාභූත වූ (කාමධාතු ඈ) බහුධාතුක (විලක්ෂණ විසින්) නානාධාතුක ස්කන්ධලොකය දන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් තථාගතයෝ අනෙකධාතු නානාධාතු ලොකය ඇති සැටියෙන් දන්නාහු ද, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිනකරත් ද, පර්ෂද්හි සිංහනාද කරත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගත බල යි.

5. තවද මහණෙනි, තථාගතයෝ සත්ත්වයන්ගේ (හීනාදි) නානාධිමුක්තික භාවය වූ යථාභූතය දන්නාහ. මහණෙනි, යම්හෙයෙකින් තථාගතයෝ සත්ත්වයන්ගේ යථාභූත කොට නානාධිමුක්තිකභාවය දනිත්ද, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය පිළින කරත්ද පර්ෂද්හි සිංහනාද කරත් ද බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, තථාගතයන්ගේ මෙ ද තථාගත බල යි.

6. තවද මහණෙනි, තථාගතයෝ ප්‍රධාන සත්ත්වයන්ගේ හා හීනසත්ත්ව යන්ගේ ඉන්ද්‍රියපරාවරභාවය යථාභූත කොට දන්නාහ, මහණෙනි, යම් කරුණෙකින් තථාගතයෝ ප්‍රධානාප්‍රධාන සත්ත්වයන්ගේ ඉන්ද්‍රිය පරාවරතාව යථාභූත කොට දනිත් ද, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ඍෂභස්ථානය පිළින කරත් ද, පිරිස්හි සිංහනාද කරත් ද බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, තථාගතයන්ගේ මෙ ද තථාගත බල යි.

7. තවද මහණෙනි, තථාගතයෝ ධ්‍යාන, විමොක්ෂ, සමාධි සමාපත්තීන්ගේ (හානභාගිය ධර්මසඞ්ඛ්‍යාත) සංක්ලෙශයත් (විශෙෂ භාගිය ධර්ම සඞ්ඛ්‍යාත) ව්‍යවදනයත් ප්‍රගුණධ්‍යාන හා භවාඞ්ග ඵලසමාපත්ති සඞ්ඛ්‍යාත) ව්‍යුත්ථානයත් යථාභූතයෙන් දන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් තථාගතයෝ ධ්‍යානවිමොක්ෂ සමාධිසමාපත්තීන්ගේ සංක්ලෙශව්‍යවදන ව්‍යුත්ථාන යථාභූතයෙන් දන්නාහු ද, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ඍෂභස්ථානය ප්‍රතිඥකරත් ද, පර්ෂද්හි සිංහනාද කරත් ද, ධර්මචක්‍රය පවත්වත් ද, තථාගතයන්ගේ මෙ ද තථාගත බල යි.

8. තවද මහණෙනි, තථාගතයෝ අනෙකවිධ පූර්වනිවාසානු සමෘතිය, එනම් එක් ජාතියකුදු ජාති දෙකකුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දශයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතලිසකුදු ජාති පනසකුදු ජාති සියයකුදු ජාති දහසකුදු ජාති සියදහසකුදු නොයෙක් සංවර්ත කල්පයනුදු නොයෙක් විවර්ත කල්පයනුදු නොයෙක් සංවර්ත විවර්ත කල්පයනුදු සිහි කරත්: "මෙසේ නම් ඇතියෙම්, මෙසේ ගොත්‍ර ඇතියෙම්, මෙසේ වර්ණ ඇතියෙම්, මෙසේ ආහාර ඇතියෙම්, මෙසේ සුවදුක් විඳුනා සුල්ලෙම්, මෙසේ ආයුපරියන්ත ඇතියෙම් අසෝතන්හි වීමි. හෙ මම් එයින් සැව අසෝ තැන්හි උපන් මි.

තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. යම්පි භික්ඛවෙ තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්ම චක්කං පවත්තෙති.

9. පුනචපරං භික්ඛවෙ තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: "ඉමෙ වත භොන්තො සත්තා කාය දුච්චරිතෙන සමන්නාගතා - වචී - පෙ - මනො දුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්ම සමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචී -පෙ- මනො සුචරිතෙන සමන්නාගතා. අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන. සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. යම්පි භික්ඛවෙ තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති. යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

එහිදු මෙසේ නමැතියෙම් මෙසේ ගොත්‍ර ඇතියෙම් මෙසේ වර්ණ ඇතියෙම් මෙසේ ආහාර ඇතියෙම් මෙසේ සුවදුක් විඳුනෙම් මෙසේ ආපිරියත් ඇතියෙම් වීමි. හෙ මම ඉන් ච්‍යුතවූයෙම් මෙහි උපන්මි''යි. මෙසේ ආකාර සහිත, උද්දෙශ සහිත අනෙකවිධ පූර්වනිවාසානු සමෘතිය සිහිකරත්. මහණෙනි, යම් හෙයෙකින් අනෙකවිධ පූර්වනිවාසය එ නම් එක්ජාතියකුදු, ජාති දෙකකුදු, ... සිහිකරත්, ... මෙසේ ආකාර සහිත උද්දෙශ සහිත අනෙකවිහිත පූර්වනිවාසය සිහිකරත් ද, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ඍෂභස්ථානය ප්‍රතිඥ කරත් ද, පර්ෂද්හි සිංහනාද කරත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වන්නාහු ද, තථාගතයන්ගේ මෙ ද තථාගත බල යි.

9. තවද මහණෙනි, තථාගතයෝ විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිව්‍යචක්ෂුසින් ච්‍යුතවන්නා වූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද සුගත වූ ද දුගීත වූ ද සත්ත්‍වයන් දක්නාහ. කම් වූ පරිදි යන සත්ත්‍වයන් දක්නාහ: එකතින් මේ භවත් සත්ත්‍වයෝ කායදුශ්චරිතයෙන් සමන්වාගතහ. වාක්දුශ්චරිතයෙන් සමන්වාගතහ, මනො දුශ්චරිතයෙන් සමන්වාගතයහ. ආයර්‍යයනට උපවාද කරන්නාහ. මිසදිටු ඇතියහ, මිථ්‍යාදෘෂ්ටික කර්මසමාදන ඇතියහ. උහු කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති වූ විනිපාත නම් වූ නිරයට (ප්‍රතිසන්ධි විසින්) පැමිණියාහු වෙති. මේ භවත්සත්ත්‍වයෝ ද කායසුචරිතයෙන් සමන්වාගත වූවාහු වාක් සුචරිතයෙන් සමන්වාගතවූවා මනස්සුචරිතයෙන් සමන්වාගත වූවාහු වෙති. ආයර්‍යයනට උපවාද නො කරන්නාහ, සම්දිටු ඇතියහ, සම්‍යක් දෘෂ්ටිකකර්මසමාදන ඇතියහ. උහු කාබුන් මරණින් සුගති නම් වූ ස්වර්ග ලොකයට (ප්‍රතිසන්ධි විසින්) පැමිණියහ. මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මැ පවත්නා දිවැසින් ච්‍යුතවන්නා වූත් උපදනාවූත් හීනවූත් ප්‍රණීත වූත් සුවර්ණ වූත් දුර්වර්ණ වූත් සුගත වූත් දුර්ගත වූත් සත්ත්‍වයන් දක්නාහ. යථා කර්මොපග සත්ත්‍වයන් දක්නාහ. මහණෙනි, යම්හෙයෙකින් තථාගතයෝ විශුද්ධ වූ මිනිසැස ඉක්මගිය දිවැසින් ච්‍යුතවන උපදනා, හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ සත්ත්‍වයන් දක්නාහු ද, යථාකර්මොපග සත්ත්‍වයන් දක්නාහු ද, මහණෙනි, යම්හෙයෙකිනුදු තථාගතයෝ විශුද්ධ වූ මිනිසැස ඉක්මගියා වූ දිවැසින් ... යථාකර්මොපග සත්ත්‍වයන් දක්නාහු නම්, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ඍෂභස්ථානය ප්‍රතිඥ කරත් ද පර්ෂද්හි සිංහනාද කරත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගත බල යි.

10. පුනචපරං භික්ඛවෙ තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උප සම්පජ්ජ විහරති යම්පි භික්ඛවෙ තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උප සම්පජ්ජ විහරති, ඉදම්පි භික්ඛවෙ තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්ම චක්කං පවත්තෙති.

ඉමානි ඛො භික්ඛවෙ දස තථාගතස්ස තථාගතබලානි, යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති. බ්‍රහ්මචක්කං පවත්තෙති.

**සීහනාද සුත්තං පඨමං.**

## 10. 1. 3. 2

## අධිවුත්තිපද සුත්තං

**[සාවත්ථිනිදානං]**

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසංකමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

යෙ තෙ ආනන්ද, ධම්මා තෙසං තෙසං අධිවුත්තිපදානං[1] අභිඤ්ඤා සච්ඡිකිරියාය සංවත්තන්ති. විසාරදො අහං ආනන්ද තත්‍ර පටිජානාමි තෙසං තෙසං තථා තථා ධම්මං දෙසෙතුං, යථා යථා පටිපන්නො සන්තං වා අත්ථීති ඤස්සති, අසන්තං වා නත්ථීති ඤස්සති, හීනං වා හීනන්ති ඤස්සති, පණීතං වා පණීතන්ති ඤස්සති. ස උත්තරං වා ස උත්තරන්ති ඤස්සති, අනුත්තරං වා අනුත්තරන්ති ඤස්සති, යථා යථා වා පන තං ඤාතෙය්‍යං වා දට්ඨෙය්‍යං වා සච්ඡිකාතය්‍යං වා තථා තථා ඤස්සති වා දක්ඛිති වා සච්ඡිකරිස්සතීති වා ඨාන මෙතං විජ්ජති. එතදනුත්තරියං[2] ආනන්ද ඤාණානං යදිදං තත්ථ තත්ථ යථාභූතඤාණං, එතස්මා චාහං ආනන්ද ඤාණා අඤ්ඤං ඤාණං උත්තරිතරං වා පණීතතරං වා නත්ථීති වදාමි.

---

1. අධිමුත්තිපදානං – අධිමුත්තිපධානං – කත්ථචි.
2. එතදනුත්තරියං – මජ්සං

10. නැවද මහණෙනි, තථාගතයෝ ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව චිත්ත විමුක්තිය ප්‍රඥා විමුක්තිය ඉහාත්මයෙහි ම තුමූ විශිෂ්ට ඥානයෙන් දැන සාක්ෂාත් කොට පැමිණ වෙසෙත්. මහණෙනි, යම් හෙයෙකින් තථාගතයෝ ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව චිත්ත විමුක්තිය ප්‍රඥා විමුක්තිය ඉහාත්මයෙහි ම තුමූ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වෙසෙත් ද, මහණෙනි, යම් බලයකට පැමිණ තථාගතයෝ ඍෂභ ස්ථානය ප්‍රතිඥා කරත් ද, පර්ෂද්හි ශ්‍රේෂ්ඨ නාදකරත් ද බ්‍රහ්මචක්‍රය පවත්වත් ද මෙ ද තථාගතයන්ගේ තථාගතබල යි.

මහණෙනි, යම් බඳු බලයන්ගෙන් සමන්විත වූවාහු තථාගතයෝ ශ්‍රේෂ්ඨ ස්ථානය ප්‍රතිඥා කරත් ද පර්ෂද්හි සිංහනාද කරත් ද (ධර්ම) බ්‍රහ්මචක්‍රය පවත්වත් ද මේ ඒ දශ බල යි.

## 10. 1. 3. 2

## අධිවුත්තිපද සූත්‍රය

[සැවැත්නිදාන යි]

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පස්ව හුන්හ. එකත් පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවනට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

ආනන්දයෙනි, ඒ ඒ (ස්කන්ධධාත්වායතන ධර්ම හා දෘෂ්ටිව්‍යවහාර සඞ්ඛ්‍යාත) අධිවචනපදයන් දැන පසක් කිරීම සඳහා යම් ඒ (දශබලඥාන සර්වඥතාඥානසඞ්ඛ්‍යාත) ධර්මයෝ වෙත් නම්, ආනන්දයෙනි, එහිලා ඒ ඒ දෘෂ්ටිගතයනට ඒ ඒ පරිදි ධර්මය දෙසනුවට මම විශාරද වූයෙම් (ඥාන-සෞමනස්‍යප්‍රාප්ත වූයෙම්) පිළින කරමි. යම් යම් පරිදි පිළිපන්නේ විද්‍යමාන වූ ධර්මය 'ඇතැ'යි දන්නේ හෝ වේද, අවිද්‍යමාන ධර්මය 'නැතැ'යි දන්නේ හෝ වේ ද, හීන ධර්මය හීන ධර්ම යයි දන්නේ හෝ වේ ද, ප්‍රණීත වූ ධර්මය ප්‍රණීතධර්ම යයි දන්නේ හෝ වේ ද, සොත්තර ධර්මය සොත්තර ධර්ම යයි දන්නේ හෝ වේ ද, අනුත්තර ධර්මය අනුත්තරධර්ම යයි දන්නේ හෝ වේද, ඥාතව්‍යය වේවයි. දෘෂ්ටව්‍යය වේවයි. සාක්ෂාත් කර්තව්‍යය වේවයි යම් යම් පරිදි වේ නම්, එය ඒ ඒ පරිදි දැනගන්නේ වේවයි දක්නේ වේවයි සාක්ෂාත් කරන්නේ වේවයි යන තෙල කාරණය ඇත. ආනන්දයෙනි, ඥානයන් අතුරෙහි ඒ ඒ ධර්මයන් විෂයයෙහි යම්බඳු යථාභූත (යථාස්වභාව) ඥානයෙක් වේ නම් තෙල අනුත්තරිය වෙයි ආනන්දයෙනි, තෙල (යථාභූත) ඥානයෙන් උත්තරීතර වූ හෝ ප්‍රණීතතර අන්‍යඥානයෙක් නැතැයි මම කියමි.

දස ඉමානි ආනන්ද, තථාගතස්ස තථාගතබලානි යෙහි, බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති, කතමානි දස:

1. ඉධානන්ද, තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, යම්පනානන්ද තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති ඉදං පනානන්ද තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

2. පුනචපරං ආනන්ද, තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති. යම්පනානන්ද – පෙ – ඉදම්පනානන්ද – පෙ –

3. පුනචපරං ආනන්ද, තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති – පෙ – යම්පනානන්ද – පෙ – ඉදම්පනානන්ද – පෙ –

4. පුනචපරං ආනන්ද, තථාගතො අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං පජානාති. යම්පනානන්ද – පෙ – ඉදම්පනානන්ද – පෙ –

5. පුනචපරං ආනන්ද, තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති. යම්පනානන්ද – පෙ – ඉදම්පනානන්ද – පෙ –

6. පුනචපරං ආනන්ද, තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති. යම්පනානන්ද – පෙ – ඉදම්පනානන්ද – පෙ –

7. පුනචපරං ආනන්ද, තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති. යම්පනානන්ද – පෙ – ඉදම්පනානන්ද – පෙ –

8. පුනචපරං ආනන්ද, තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො – පෙ – ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. යම්පනානන්ද – පෙ – ඉදම්පනානන්ද – පෙ –

ආනන්දයෙනි, යම් බල කෙනෙකුන්ගෙන් සමන්වාගත තථාගත තෙම ශ්‍රේෂ්ඨස්ථානය ප්‍රතිඥා කරනුයේ ද, පර්ෂද්හි සිංහනාද කෙරෙයි ද බ්‍රහ්මචක්‍රය පවත්වා ද, තථාගතයන්ගේ මෙ එබඳු බල දශයෙක: කවර දශයෙක යත්:

1. ආනන්දය, මෙලොව්හි තථාගත ස්ථානය ස්ථාන වීසිනුත් අස්ථානය අස්ථාන විසිනුත් දන්නේය. ආනන්දයෙනි, යම්හෙයෙකින් තථාගත ස්ථානය ස්ථාන විසින්ද අස්ථානය අස්ථාන විසින් ද යථාභූතකොට ප්‍රතිඥා කෙරේ ද, ආනන්දයෙනි, තථාගත යම් බලයකට පැමිණ ශ්‍රේෂ්ඨස්ථානය පිළින කෙරේ ද, පිරිස්හි සිංහනාද කෙරෙයි ද බ්‍රහ්මචක්‍රය පවත්වා ද තථාගත යන්ගේ මේ ඒ තථාගත බලයයි.

2. තවද ආනන්දයෙනි, තථාගත අතීතානාගත ප්‍රත්‍යුත්පන්න කර්මසමාදාන යන්ගේ විපාකය යථාභූත කොට ප්‍රත්‍යය විසින් හෙතු විසින් පිළින කරයි ආනන්දයෙනි, යම් හෙයෙකින් ... ආනන්දයෙනි, මේ වනාහි ...

3. තවද ආනන්දයෙනි, තථාගත සර්වත්‍රගාමිනී ප්‍රතිපද් සඞ්ඛ්‍යාත යථාභූතව, දන්නේය. ... ආනන්දයෙනි, යම් හෙයෙකින් ... ආනන්දයෙනි, මේ වනාහි ...

4. තවද ආනන්දයෙනි, තථාගත අනෙකධාතු නානාධාතු ලොක-සඞ්ඛ්‍යාත යථාභූතය දන්නේය, ආනන්දයෙනි, යම් හෙයෙකින් ... ආනන්ද-යෙනි මේ වනාහි ...

5. තවද ආනන්දයෙනි, තථාගත සත්ත්වයන්ගේ නානාධිමුක්තිකතා සඞ්ඛ්‍යාත යථාභූතය දන්නේය. ආනන්දයෙනි, යම් හෙයෙකින් ... ආනන්දයෙනි, මේ වනාහි ...

6. තවද ආනන්දයෙනි, තථාගත පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාවරතා සඞ්ඛ්‍යාත යථාභූතය දන්නේය. ආනන්දයෙනි, යම් හෙයෙකින් ... ආනන්දයෙනි, මේ වනාහි ...

7. තවද ආනන්දයෙනි, තථාගත ධ්‍යානවිමොක්ෂ සමාධි සමාපත්-තීන්ගේ සංකිලෙස, වොදන, වුට්ඨාන සඞ්ඛ්‍යාත යථාභූතය දන්නේය. ආනන්දයෙනි,' යම් හෙයෙකින් ... ආනන්දයෙනි, මේ වනාහි...

8. තවද ආනන්දයෙනි, තථාගත අනෙකවිධ පූර්වනිවාසය එනම් එක් ජාතියකුදු ජාතිදෙකකුදු ... සිහිකරනේය, ... මෙසේ සාකාර සොද්දෙශ වූ අනෙකවිධ පූර්වනිවාසය සිහිකරනේය. ආනන්දයෙනි, යම්හෙයෙකින් ... ආනන්දයෙනි, මේ වනාහි ...

9. පුනචපරං ආනන්ද තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන – පෙ – යථාකම්මූපගෙ සත්තෙ පජානාති – පෙ – යම්පනානන්ද තථාගතො – පෙ – ඉදම්පනානන්ද – පෙ –

10. පුනචපරං ආනන්ද තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. යම්පනානන්ද තථාගතො ආසවානං ඛයා – පෙ – සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉදම්පනානන්ද තථාගතස්ස තථාගත බලං හොති. යම්බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්ම චක්කං පවත්තෙති.

ඉමානි බො ආනන්ද දස තථාගතස්ස තථාගතබලානි, යෙහි බලෙහි සමන්නාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්ම චක්කං පවත්තෙතීති.

## 10. 1. 3. 3

### කාය සුත්තං

[සාවත්ථිනිදානං]

අත්ථි භික්ඛවෙ ධම්මා කායෙන පහාතබ්බා නො වාචාය. අත්ථි භික්ඛවෙ ධම්මා වාචාය පහාතබ්බා නො කායෙන. අත්ථි භික්ඛවෙ ධම්මා නෙව කායෙන පහාතබ්බා නො වාචාය, පඤ්ඤාය දිස්වා දිස්වා පහාතබ්බා.

කතමෙ ච භික්ඛවෙ ධම්මා කායෙන පහාතබ්බා නො වාචාය:

ඉධ භික්ඛවෙ භික්ඛු අකුසලං ආපන්නො හොති කඤ්චිදෙව දෙසං[1] කායෙන. තමෙනං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී එවමාහංසු: ''ආයස්මා බො අකුසලං ආපන්නො කඤ්චිදෙව දෙසං කායෙන, සාධු වතායස්මා කාය– දුච්චරිතං පහාය කායසුචරිතං භාවෙතූ''ති. සො අනුවිච්ච විඤ්ඤූහි සබ්‍රහ්මචාරීහි වුච්චමානො කාය දුච්චරිතං පහාය කාය සුචරිතං භාවෙති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ධම්මා කායෙන පහාතබ්බා නො වාචාය.

1. කිංචි දෙසං – මජසං

9. තවද ආනන්දයෙනි, තථාගත විශුද්ධ වූ මිනිසැස ඉක්ම පවත්නා දිවැසින් ... යථා කර්මෝපග සත්ත්වයන් දන්නේය. ආනන්දයෙනි, යම්හෙයෙකින් ... ආනන්දයෙනි, මේ වනාහි ...

10. තවද ආනන්දයෙනි, තථාගත ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය තෙමේ දැන පසක් කොට එයට එළඹ වාස කරයි. ආනන්දයෙනි, යම්හෙයෙකින් තථාගත ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව චිත්ත විමුක්තිය, ප්‍රඥා විමුක්තිය ... පසක් කොට එළඹ වෙසේද, ආනන්දයෙනි, යම්බලයකට පැමිණ තථාගත ශ්‍රේෂ්ඨ ස්ථානය ප්‍රතිඥා කෙරේද පර්ෂද්හි සිංහනාද කෙරේ ද බ්‍රහ්මසක් පවත්වා ද, මේ තථාගතයන්ගේ තථාගත බල යි.

ආනන්දයෙනි, යම්බල කෙනකුන්ගෙන් සමන්වාගත තථාගත ශ්‍රේෂ්ඨ ස්ථානය පිළිත කෙරේද, පර්ෂද්හි සිංහනාද කරයි ද බ්‍රහ්මචක්‍රය පවත්වාද, තථාගතයන්ගේ මේ තථාගත බල යි.

## 10. 1. 3. 3

## කාය සූත්‍රය

[සැවැත්නිදන යි]

මහණෙනි, වාග්ද්වාරය තබා කායද්වාරයෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ ඇත. මහණෙනි, කායද්වාරය තබා වාග්ද්වාරයෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ ඇත. මහණෙනි, කායද්වාරය ද තබා වාග්ද්වාරය ද තබා ප්‍රඥායෙන් දැක දැක ප්‍රහාතව්‍ය ධර්මයෝ ඇති.

මහණෙනි, වාග්ද්වාරය තබා කායද්වාරයෙන් ප්‍රහාතව්‍ය ධර්ම කවර යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කයින් කිසි ලෙශමාත්‍ර වූ අකුශලාපත්තියක් අවන්නේ වෙයි විඥ සබ්‍රම්සරහු එයට බැස ගෙන ඔහට මෙසේ කියත්: ''ඇවැත් කයින් කිසි ලෙශමාත්‍ර වූ අකුශලයක් අවන්නේ වෙයි, ඇවැත් කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩා නම් මැනැවැ''යි. හේ විඥ සබ්‍රම්සරුන් විසින් බැස ගෙන දැන කියනු ලබන්නේ කායදුශ්චරිතය හැරපියා කායසුචරිතය වඩනේය. මහණෙනි, මොහු වාග්ද්වාරය තබා කායද්වාරයෙන් ප්‍රහාතව්‍ය ධර්මයහයි කියනු ලැබෙත්.

කතමෙ ච භික්ඛවෙ ධම්මා වාචාය පහාතබ්බා නො කායෙන:

ඉධ භික්ඛවෙ භික්ඛු අකුසලං ආපන්නො හොති කඤ්චිදෙව දෙසං වාචාය. තමෙනං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී එවමාහංසු: ආයස්මා ඛො අකුසලං ආපන්නො කඤ්චිදෙව දෙසං වාචාය, සාධුවතායස්මා වචී දුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙතූ''ති. සො අනුවිච්ච විඤ්ඤූහි සබ්‍රහ්මචාරීහි වුච්චමානො වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ධම්මා වාචාය පහාතබ්බා, නො කායෙන.

කතමෙ ච භික්ඛවෙ ධම්මා නෙව කායෙන පහාතබ්බා නො වාචාය, පඤ්ඤාය දිස්වා දිස්වා පහාතබ්බා:

ලොභො භික්ඛවෙ නෙව කායෙන පහාතබ්බො, නො වාචාය. පඤ්ඤාය දිස්වා දිස්වා පහාතබ්බො. දොසො භික්ඛවෙ –පෙ– මොහො භික්ඛවෙ –පෙ– කොධො භික්ඛවෙ –පෙ– උපනාහො භික්ඛවෙ –පෙ– මක්ඛො භික්ඛවෙ –පෙ– පළාසො භික්ඛවෙ –පෙ– මච්ඡරියං භික්ඛවෙ නෙව කායෙන පහාතබ්බං නො වාචාය, පඤ්ඤාය දිස්වා දිස්වා පහාතබ්බං. පාපිකා භික්ඛවෙ ඉස්සා නෙව කායෙන පහාතබ්බා නො වාචාය, පඤ්ඤාය දිස්වා දිස්වා පහාතබ්බා.

කතමා ච භික්ඛවෙ පාපිකා ඉස්සා:

ඉධ භික්ඛවෙ ඉජ්ඣති ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා. තත්‍රඤ්ඤතරස්ස දාසස්ස වා උපවාසස්ස වා එවං හොති: ''අහො වතිමස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා න ඉජ්ඣෙය්‍ය ධනෙන වා ධඤ්ඤෙන වා රජතෙන වා ජාතරූපෙන වා''ති. සමණො වා පන බ්‍රාහ්මණො වා ලාභී හොති චීවරපිණ්ඩපාතසෙනාසන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං තත්‍රඤ්ඤතරස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා එවං හොති: ''අහො වත අයමායස්මා න ලාභී අස්ස චීවරපිණ්ඩපාත සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන''න්ති. අයං වුච්චති භික්ඛවෙ පාපිකා ඉස්සා, පාපිකා භික්ඛවෙ ඉස්සා නෙව කායෙන පහාතබ්බා නො වාචාය, පඤ්ඤාය දිස්වා දිස්වා පහාතබ්බා.

මහණෙනි, කායද්වාරය තබා වාග්ද්වාරයෙන් ප්‍රහාතව්‍ය ධර්ම කවරහ යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ කිසි දෙශමාත්‍ර අකුශලාපත්තියක් වාග්ද්වාරයෙන් අවන්නේ වෙයි. විඥ සබ්‍රම්සරහු එයට බැස ගෙන දැන ඔහට මෙසේ කියත්: ආයුෂ්මත් වනාහි වාග්ද්වාරයෙන් කිසි දෙශමාත්‍ර අකුශලයක් අවන්නේය, ඇවැත් වාග්දුශ්චරිතය හැරපියා වාග්සුචරිතය වඩා නම් මැනැවැ''යි හේ විඥ සබ්‍රම් සරුන් විසින් බැස ගෙන දැන කියනු ලබනුයේ වාග්දුශ්චරිතය හැරපියා වාග්සුචරිතය වඩනේය. මහණෙනි, මොහු කායද්වාරය තබා වාග්ද්වාරයෙන් ප්‍රහාතව්‍ය ධර්ම යි කියනු ලබත්.

මහණෙනි, කායද්වාරය හා වාග්ද්වාරය තබා ප්‍රඥායෙන් දැක දැක ප්‍රහාතව්‍ය ධර්ම කවර යත්:

මහණෙනි, ලොභය නොද කායද්වාරයෙන් නො ද වාග්ද්වාරයෙන් ප්‍රහාතව්‍ය වෙයි. ප්‍රඥායෙන් දැක දැක ප්‍රහාතව්‍ය වෙයි. මහණෙනි, දෙවෂය ... මහණෙනි, මොහය ... මහණෙනි, ක්‍රොධය ... මහණෙනි, උපනාහය .. මහණෙනි, මක්ඛය ... මහණෙනි, පලාසය ... මහණෙනි, මච්ඡරියය නො ද කයින් නොද වචසින් ප්‍රහාත්‍ය වෙයි. ප්‍රඥායෙන් දැක දැක ප්‍රහාතව්‍ය වෙයි. මහණෙනි, ලමු ඊර්ෂ්‍යාව නො ම කයින් නො ම වචසින් ප්‍රහාතව්‍ය යි ප්‍රඥායෙන් දැක දැක ප්‍රහාතව්‍ය යි.

මහණෙනි, ලාමක ඊර්ෂ්‍යා කවර යත්:

මහණෙනි, මෙ ලොව්හි ගැහැවියකුහට වේවයි, ගැහැවිපුතක්හට වේවයි ධනයෙන් හෝ ධාන්‍යයෙන් හෝ රිදියෙන් හෝ රනින් හෝ සමෘද්ධියෙක් වෙයි. එහිලා අන්‍යතර දසයකුහට වේවයි වෙත වානුවකුහට වේවයි මෙ බඳු සිතෙක් වෙයි: ''එකැතින් මේ ගැහැවි හට හෝ ගැහැවි පුත්හට හෝ ධනයෙන් වේවයි, ධාන්‍යයෙන් වේවයි, රිදියෙන් වේවයි, රනින් වේවයි සමෘධියෙක් නොවේ නම් යෙහෙකැ''යි, මහණෙක් වේවයි බමුණෙක් වේවයි සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලබන සුලු වෙයි. එහිලා අන්‍යතර මහණක්හට හෝ බමුණකු හට හෝ මෙ බඳු සිතෙක් වෙයි: ''එකැතින් මේ ඇවැත් සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර නොලබන සුලු නම්, අහෝ යෙහෙකැ''යි. මහණෙනි, මෙ ලාමක ඊර්ෂ්‍යා යි කියනු ලැබේ. මහණෙනි, ලාමක ඊර්ෂ්‍යාව නො ද කයින් නො ද වචසින් ප්‍රහාතව්‍ය වෙයි, (විදර්ශනා මාර්ග) ප්‍රඥායෙන් දැක දැක ප්‍රහාතව්‍ය වෙයි.

පාපිකා භික්ඛවෙ ඉච්ඡා නෙව කායෙන පහාතබ්බා නො වාචාය, පඤ්ඤාය දිස්වා දිස්වා පහාතබ්බා.

කතමා ච භික්ඛවෙ පාපිකා ඉච්ඡා:

ඉධ භික්ඛවෙ එකච්චො අස්සද්ධො සමානො 'සද්ධො'ති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති, දුස්සීලො සමානො 'සීලවා'ති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති, අප්පස්සුතො සමානො 'බහුස්සුතො' ති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති, සඞ්ගණිකාරාමො සමානො පවිවිත්තොති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති, කුසීතො සමානො ආරද්ධවිරියොති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති, මුට්ඨස්සති-සමානො උපට්ඨිතසතීති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති අසමාහිතො සමානො සමාහිතොති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති, දුප්පඤ්ඤො සමානො පඤ්ඤවාති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති, අඛීණාසවොසමානො ඛීණාසවොති මං ජානෙය්‍යුන්ති ඉච්ඡති, අයං වුච්චති භික්ඛවෙ පාපිකා ඉච්ඡා, පාපිකා භික්ඛවෙ ඉච්ඡා නෙව කායෙන පහාතබ්බා නො වාචාය, පඤ්ඤාය දිස්වා දිස්වා පහාතබ්බා.

තං චෙ භික්ඛවෙ භික්ඛුං ලොභො අභිභුය්‍ය ඉරියති. දොසො – පෙ – මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා අභිභුය්‍ය ඉරියති, සො එවමස්ස වෙදිතබ්බො: න අයමායස්මා තථා පජානාති, යථා පජානතො ලොභො න හොති, තථාහිමං ආයස්මන්තං ලොභො අභිභුය්‍ය ඉරියති, න අයමායස්මා තථා පජානාති, යථා පජානතො දොසො න හොති – පෙ – මොහො – කොධො – උපනාහො–මක්ඛො – පළාසො – මච්ඡරියං– පාපිකා ඉස්සා – පාපිකා ඉච්ඡා න හොති තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා අභිභුය්‍ය ඉරියති. තඤ්චෙ භික්ඛවෙ භික්ඛුං ලොභො නාභිභුය්‍ය ඉරියති. දොසො – මොහො – කොධො – උපනාහො – මක්ඛො – පළාසො මච්ඡරියං – පාපිකා ඉස්සා – පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය ඉරියති. සො එවමස්ස වෙදිතබ්බො: – පෙ – තථා අයමායස්මා පජානාති යථා පජානතො ලොභො න හොති, තථා හිමං ආයස්මන්තං ලොභො නාභිභුය්‍ය ඉරියති, තථා යමායස්මා පජානාති යථා පජානතො දොසො න හොති. මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා න හොති. තථා හි මං ආයස්මන්තං පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය ඉරියතීති.

මහණෙනි, ලාමක ඉච්ඡාව නො ද කයින් නො ද වචසින් ප්‍රහාතව්‍යයයි. ප්‍රඥායෙන් දැක දැක ප්‍රහාතව්‍ය යි.

**මහණෙනි, පාපිකා ඉච්ඡා කවර යත්:**

මහණෙනි, මෙසස්නෙහි කිසිවෙක් ශ්‍රද්ධා නැතියේ ම මා සැදැහැතියේයි දනිත්වයි කැමැති වෙයි. දුස්සීල වූයේ ම මා "සිල්වතැයි දනිත්ව' යි කැමැති වෙයි. අල්පශ්‍රැත වූයේ ම "මා බහුශ්‍රැතයි දනිත්ව"යි කැමැති වෙයි. ගණාහි ඇලුනේ ම "මා ප්‍රවිවික්තයි දනිත්ව"යි කැමැති වෙයි. කුසීද වූයේ ම "මා ප්‍රාරබ්ධවීර්‍ය්‍යයි දනිත්ව"යි කැමැති වෙයි. නටසිහි ඇතියේ ම "මා එළඹ සිටි සිහි ඇතියේ දනිත්ව"යි කැමැති වෙයි. අසමාහිත වූයේ ම "මා සමාහිතැයි දනිත්ව"යි කැමැති වෙයි. දුෂ්ප්‍රාඥ වූයේ ම "මා ප්‍රාඥයයි දනිත්ව"යි කැමැති වෙයි. ක්ෂීණාශ්‍රව නො වූයේ ම "මා ක්ෂීණාශ්‍රවයි දනිත්ව"යි කැමැති වෙයි. මහණෙනි, මේ පාපික ඉච්ඡායි කියනු ලැබේ. මහණෙනි පාපික ඉච්ඡාව නො ද කයින් නො ද වචසින් ප්‍රහාතව්‍යයි. ප්‍රඥායෙන් දැක දැක ප්‍රහාතව්‍ය යි.

මහණෙනි ඉදින් ලොභය ඒ මහණ මැඩ ගෙන වැටේ නම් ... දොෂය ... මොහය ... ක්‍රොධය ... උපනාහය ... මක්‍ඛය ... පලාසය ... මාත්සර්‍ය්‍ය ... ලාමක ඊර්ෂ්‍යාව ... ලාමක ඉච්ඡාව මැඩගෙන වැටේ නම්, හෙ මෙසේ දතයුතු වෙයි: "යම් පරිදි දන්නහුට ලොභය නො වේද, මේ ඇවැත් එපරිදි නොදන්නේය. එහෙයින් ම ලොභය මේ ඇවැත් මැඩගෙන සිටුනේය. යම් පරිදි දන්නහුගේ දොෂය නො වේ ද, මේ ආයුෂ්මත් එපරිදි නොදන්නේය. ... මොහය ... ක්‍රොධය ... උපනාහය ... මක්‍ඛය ... පලාසය ... මාත්සර්‍ය්‍යය ... ලාමක ඉච්ඡාව ... ලාමක ඉච්ඡාව නොවේද .. එහෙයින් ම පාපික ඉච්ඡාව මේ ආයුෂ්මත් මැඩගෙන සිටුනේය"යි. මහණෙනි, ඉදින් ලොභය ඒ මහණ මැඩගෙන නො වැටේ නම්, දොෂය ... මොහය ... ක්‍රොධය ... උපනාහය ... මක්‍ඛය ... පලාසය ... මච්ඡරිය ... ලමු ඉස්සාව ... ලමු ඉච්ඡාව ඒ මහණ මැඩගෙන නො වැටේ නම්, හෙ මෙසේ දතයුතු වෙයි: ... යම් පරිදි දන්නාහුගේ ලොභය නොවේ නම්, මේ ආයුෂ්මත් එපරිදි දන්නේය. එහෙයින් ම ලොභය මේ ආයුෂ්මත් මැඩ ගෙන නො වැටෙයි. යම් පරිදි දන්නහුගේ දොෂය නොවේ නම්, එපරිදි මේ ආයුෂ්මත් දන්නේය. මොහය ... ක්‍රොධය ... උපනාහය ..මක්‍ඛය ... පලාසය ... මච්ඡරිය ... ලාමක ඉස්සාව .. ලාමක ඉච්ඡාව නො වේ නම්, එහෙයින් ම ලාමක ඉච්ඡාව මේ ආයුෂ්මත් මැඩගෙන නො වැටෙයයි.

## 10. 1. 3. 4

## මහාචුන්ද සුත්තං

එකං සමයං ආයස්මා මහාචුන්දො චෙතීසු විහරති සහජාතියං. තත්‍ර ඛො ආයස්මා මහාචුන්දො භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවෙති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාචුන්දස්ස පච්චස්සොසුං. ආයස්මා මහාචුන්දො එතදවොච:

ඤාණවාදං ආවුසො භික්ඛු වදමානො ජානාමිමං ධම්මං පස්සාමිමං ධම්ම''න්ති. තඤ්චෙ ආවුසො භික්ඛුං ලොභො අභිභුය්‍ය තිට්ඨති. දොසො – පෙ – මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා අභිභුය්‍ය තිට්ඨති. සො එවමස්ස වෙදිතබ්බො: න අයමායස්මා තථා පජානාති යථා පජානතො ලොභො න හොති. තථා හිමං ආයස්මන්තං ලොභො අභිභුය්‍ය තිට්ඨති. න අයමායස්මා තථා පජානාති යථා පජානතො දොසො න හොති. මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා න හොති. තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා අභිභුය්‍ය තිට්ඨති.

භාවනාවාදං ආවුසො භික්ඛු වදමානො භාවිතකායොම්හි භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති. තඤ්චෙ ආවුසො භික්ඛුං ලොභො අභිභුය්‍ය තිට්ඨති. දොසො – පෙ – මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා අභිභුය්‍ය තිට්ඨති. සො එවමස්ස වෙදිතබ්බො: න අයමායස්මා තථා පජානාති, යථා පජානතො ලොභො න හොති. තථා හිමං ආයස්මන්තං ලොභො අභිභුය්‍ය තිට්ඨති. න අයමායස්මා තථා පජානාති, යථා පජානතො දොසො න හොති. මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා න හොති. තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා අභිභුය්‍ය තිට්ඨති.

## 10. 1. 3. 4

## මහාචුන්‍ද සූත්‍රය

එක් සමයෙක්හි ආයුෂ්මත් මහාචුන්‍ද තෙරණුවෝ චෙති ජනපදයෙහි වූ සහජාති යෙහි වාස කරන්නාහ. එකල්හි ආයුෂ්මත් මහාචුන්‍ද තෙරණුවෝ 'ඇවැත් මහණෙනි' යි භික්‍ෂූන් ඇමතූහ. 'ඇවැත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාචුන්‍ද තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහාචුන්‍ද තෙරණුවෝ තෙල කීහ.

ඇවැත්නි, මහණ ''මේ දහම් දනිමි, මේ දහම් දක්මියි ඥානවාදය කියන්නේ වේ ද, ඇවැත්නි, ඉදින් ලොභය එ මහණ මැඩ ගෙන සිටුනේ නම්, ද්වෙෂය ... මොහය ... ක්‍රොධය ... උපනාහය ... මක්‍ඛය ... පළාසය ... මච්ඡරිය ... පාපෙඉර්ෂ්‍යාය ... පාපෙච්ඡාය මැඩ ගෙන සිටුනේ නම්, ඒ මහණ මෙසේ දතයුතු වෙයි: මේ ආයුෂ්මත් යම් පරිද්දෙකින් දන්නාහට ලොභයෙක් නොවේ ද, එ පරිදි නො දන්නේ ය. එසේ මැයි ලොභය මේ ආයුෂ්මත්හු මැඩ ගෙන සිටුනේය. මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාහට ද්වෙෂය නො වේ ද එපරිදි නො දන්නේ ය. මොහය ... ක්‍රොධය ... උපනාහය ... මක්‍ඛය ... පළාසය ... මච්ඡරිය ... පාපෙඉර්ෂ්‍යාය ... පාපෙච්ඡාය නො වේ ද, එ පරිදි නො දන්නේය. එසේමය, පාපෙච්ඡාව මේ ආයුෂ්මත්හු මැඩ ගෙන සිටුනේය.

ඇවැත්නි, මහණ ''භාවිතකාය ඇතියෙමි, භාවිතශීල ඇතියෙමි, භාවිත චිත්ත ඇතියෙමි, භාවිත ප්‍රඥා ඇතියෙමි''යි භාවනා වාදය කියන්නේ වේ ද, ඇවැත්නි, ඉදින් ලොභය ඒ මහණ මැඩ ගෙන සිටුනේ නම්, ද්වෙෂය ... මොහය ...ක්‍රොධය ... උපනාහය ... මක්‍ඛය ... පළාසය ... මච්ඡරිය ... පාපෙඉර්ෂ්‍යාය ... පාපෙච්ඡාය මැඩ ගෙන සිටුනේ නම්, ඒ මහණ මෙසේ දතයුතු වෙයි: ''මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාහට ලොභය නො වේ ද, එ පරිදි නො දන්නේ ය. එසේ මැයි, ලොභය මේ ආයුෂ්මත්හු මැඩ ගෙන සිටුනේ ය. මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාක්හට ද්වෙෂය නො වේ ද, එ පරිදි නොදන්නේය. මොහය ... ක්‍රොධය ... උපනාහය ... මක්‍ඛය ... පලාසය ... මච්ඡරිය ... පාපෙඉර්ෂ්‍යාය, ... පාපෙච්ඡාය නො වේ ද, එ පරිදි නො දන්නේ ය. එසේ ම ය. පාපෙච්ඡාව මේ ආයුෂ්මත්හු මැඩ ගෙන සිටුනේ ය.

ඤාණවාදඤ්ච ආවුසො භික්ඛු වදමානො භාවනාවාදඤ්ච ජානාමිමං ධම්මං පස්සාමිමං ධම්මං. භාවිතකායොමහි භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති. තඤ්ච ආවුසො භික්ඛුං ලොභො අභිභුය්‍ය තිට්ඨති. දොසො – පෙ – මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා අභිභුය්‍ය තිට්ඨති. සො එවමස්ස වෙදිතබ්බො: "න අයමායස්මා තථා පජානාති යථා පජානතො ලොභො න හොති. තථා හිමං ආයස්මන්තං ලොභො අභිභුය්‍ය තිට්ඨති. න අයමායස්මා තථා පජානාති යථා පජානතො දොසො න හොති – මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා න හොති. තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා අභිභුය්‍ය තිට්ඨති.

සෙය්‍යථාපි ආවුසො පුරිසො දළිද්දොව සමානො අඩ්ඪවාදං වදෙය්‍ය, අධනොව සමානො ධනවාදං වදෙය්‍ය, අභොගවාව සමානො භොගවාදං වදෙය්‍ය. සො කිස්මිඤ්චිදෙව ධන කරණීයෙ සමුප්පන්නෙ න සක්කුණෙය්‍ය උපනිහත්තුං[1] ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා. තමෙනං එවං ජානෙය්‍ය: දළිද්දොව අයමායස්මා සමානො අඩ්ඪවාදං වදෙති, අධනොව අයමායස්මා සමානො ධනවාදං වදෙති, අභොගවාව අයමායස්මා සමානො භොගවාදං වදෙති. තං කිස්ස හෙතු: තථා හි අයමායස්මා කිස්මිඤ්චිදෙව ධනකරණීයෙ සමුප්පන්නෙ න සක්කොති උපනිහත්තුං ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වාති.

එවමෙව ඛො ආවුසො ඤාණවාදඤ්ච භික්ඛු වදමානො භාවනාවාදඤ්ච ජානාමිමං ධම්මං පස්සාමිමං ධම්මං, භාවිතකායොමහි භාවිතසීලො භාවිත චිත්තො භාවිතපඤ්ඤොති. තඤ්ච ආවුසො භික්ඛුං ලොභො අභිභුය්‍ය තිට්ඨති, දොසො – පෙ – මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා අභිභුය්‍ය තිට්ඨති. සො එවමස්ස වෙදිතබ්බො: "න අයමායස්මා තථා පජානාති යථා පජානතො ලොභො න හොති. තථා හිමං ආයස්මන්තං ලොභො අභිභුය්‍ය තිට්ඨති. න අයමායස්මා තථා පජානාති යථා පජානතො දොසො න හොති – මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා න හොති. තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා අභිභුය්‍ය තිට්ඨති.

1. උපනිහත්තුං – සීමු. උපනිහාතුං – මජසං

ඇවැත්නි, මහණ "මේ දහම් දනිමි, මේ දහම් දකිමි, භාවිතකාය ඇතියෙමි භාවිතශීල ඇතියෙමි භාවිතචිත්ත ඇතියෙමි භාවිතප්‍රඥා ඇතියෙමි"යි ඥානවාදය හා භාවනා වාදය හා කියන්නේ වේ ද, ඇවැත්නි, ඉදින් ලොභය ඒ මහණ මැඩ ගෙන සිටුනේ නම් දෙවෂය ... මොහය ... ක්‍රොධය ... උපනාහය ... මක්ඛය ... පළාසය ... මච්ඡරිය ... පාපෙෂ්ඨාය ... පාපෙච්ඡාය මැඩ ගෙන සිටුනේ නම්, ඒ මහණ මෙසේ දත යුතු වෙයි: මේ ආයුෂ්මත් යම් පරිදි දක්නාහට ලොභය නො වේ ද, එ පරිදි නො දන්නේ ය. එසේමය, ලොභය මේ ආයුෂ්මත්හු මැඩ ගෙන සිටුනේය, මේ ආයුෂ්මත් යම් පරිදි දක්නාහට දෙවෂය නො වේ ද එ පරිදි නො දන්නේ ය. මොහය ... ක්‍රොධය ... උපනාහය... මක්ඛය... පළාසය... මච්ඡරිය ... පාපෙෂ්ඨාය ... පාපෙච්ඡාය නො වේ ද, එ පරිදි නො දන්නේ ය, එසේමය පාපෙච්ඡාව මේ ආයුෂ්මත්හු මැඩ ගෙන සිටුනේ ය.

ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් දිළිඳු වූයේ ම ආඪ්‍යවාදය කියන්නේ වේ ද, නිර්ධන වූයේ ම ධනවාදය කියන්නේ වේ ද, භොග රහිත වූයේ ම භොගවාදය කියන්නේ වේ ද, හේ යම් ධනකරණී ඇතිවත් ම ධනය වේවයි, ධාන්‍යය වේවයි, රජත වේවයි, කනක වේවයි, එළවන්නට නො හැකි වන්නේ ය. "මේ ආයුෂ්මත් දිළිඳු වූයේ ම ආඪ්‍යවාදය කියයී, මේ ආයුෂ්මත් නිර්ධන වූයේ ම ධනවාදය කියයි, මේ ආයුෂ්මත් භොග නැතියේ ම භොගවාදය කියා ය"යි තුලුන් මෙසේ හඳුනා ගන්නේ ය. එ කවර හෙයින යත්: මේ ආයුෂ්මත් යම් ම ධනකරණී ඇතිවත් ධන වේවයි ධාන්‍ය වේවයි රජත වේවයි කනක වේවයි එළවන්නට නො හැකි වන්නේ ය. ද එහෙයිනි.

ඇවැත්නි, එසෙයින් ම "මේ දහම් දන්මි, මේ දහම් දක්මි, භාවිතකාය යෙමි, භාවිතශීලයෙමි, භාවිතචිත්තයෙමි, භාවිතප්‍රඥයෙමි" යි මහණ ඥනවාදය හා භාවනා වාදය හා කියන්නේ වේ ද, ඇවැත්නි, ඉදින් ලොභය ඒ මහණ මැඩගෙන සිටුනේ නම්, දෙවෂය–මොහය–ක්‍රොධය–උපනාහය – මක්ඛය – පළාසය – මච්ඡරිය – පාපෙෂ්ඨාය – පාපෙච්ඡාය මැඩ ගෙන සිටුනේ නම්, ඒ මහණ මෙසේ දතයුතු වෙයි. "මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාහට ලොභය නො වේ ද, එපරිදි නො දන්නේ ය"යි. එසේ ම ය, ලොභය මේ ආයුෂ්මත්හු මැඩ ගෙන සිටුනේ ය, මේ ආයුෂ්මත් යම්පරිදි දන්නාහට දෙවෂය නො වේ ද, එපරිදි නො දන්නේ ය. මොහය–ක්‍රොධය–උපනාහය–මක්ඛය–පළාසය –මච්ඡරිය – පාපෙෂ්ඨාය – පාපෙච්ඡාය නො වේ ද එපරිදි නො දන්නේය. එසේ ම පාපෙච්ඡාව මේ ආයුෂ්මත්හු මැඩ ගෙන සිටුනේ ය.

ඤාණවාදං ආවුසො භික්ඛු වදමානො ජානාමිමං ධම්මං පස්සාමිමං ධම්මන්ති. තඤ්චෙ ආවුසො භික්ඛුං ලොභො නාභිභුය්‍ය තිට්ඨති - දොසො - පෙ - මොහො - පෙ - කොධො - පෙ - උපනාහො - පෙ - මක්ඛො - පෙ - පළාසො - පෙ - මච්ඡරියං - පෙ - පාපිකා ඉස්සා - පෙ - පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය තිට්ඨති. සො එවමස්ස වෙදිතබ්බො: තථා අයමායස්මා පජානාති යථා පජානතො ලොභො න හොති. තථා හිමං ආයස්මන්තං ලොභො නාභිභුය්‍ය තිට්ඨති. තථා ආයමායස්මා පජානාති යථා පජානතො දොසො න හොති. මොහො - පෙ - කොධො - පෙ - උපනාහො - පෙ - මක්ඛො - පෙ - පළාසො - පෙ - මච්ඡරියං - පෙ - පාපිකා ඉස්සා - පෙ - පාපිකා ඉච්ඡා න හොති. තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය තිට්ඨති.

භාවනාවාදං ආවුසො භික්ඛු වදමානො භාවිතකායොමහි භාවිත සීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති, තඤ්චෙ ආවුසො භික්ඛුං ලොභො නාභිභුය්‍ය තිට්ඨති. දොසො - පෙ - මොහො - පෙ - කොධො - පෙ - උපනාහො - පෙ - මක්ඛො - පෙ - පළාසො - පෙ - මච්ඡරියං - පෙ - පාපිකා ඉස්සා - පෙ - පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය තිට්ඨති. සො එවමස්ස වෙදිතබ්බො: තථා අයමායස්මා පජානාති යථා පජානතො ලොභො න හොති. තථා හිමං ආයස්මන්තං ලොභො නාභිභුය්‍ය තිට්ඨති. තථා අයමායස්මා පජානාති යථා පජානතො දොසො න හොති - මොහො - පෙ - කොධො - පෙ - උපනාහො - පෙ - මක්ඛො - පෙ - පළාසො - පෙ - මච්ඡරියං - පෙ - පාපිකා ඉස්සා - පෙ - පාපිකා ඉච්ඡා න හොති. තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය තිට්ඨති.

ඤාණවාදඤ්ච ආවුසො භික්ඛු වදමානො භාවනාවාදඤ්ච ජානාමිමං ධම්මං පස්සාමිමං ධම්මං, භාවිතකායොමහි භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති. තඤ්චෙ ආවුසො භික්ඛුං ලොභො නාභිභුය්‍ය තිට්ඨති. දොසො - පෙ - මොහො - පෙ - කොධො - පෙ - උපනාහො - මක්ඛො - පෙ - පළාසො - පෙ - මච්ඡරියං - පෙ - පාපිකා ඉස්සා - පෙ - පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය තිට්ඨති. සො එවමස්ස වෙදිතබ්බො: තථා අයමායස්මා පජානාති යථා පජානතො ලොභො න හොති. තථා හිමං ආයස්මන්තං ලොභො නාභිභුය්‍ය තිට්ඨති. තථා අයමායස්මා පජානාති යථා පජානතො දොසො න හොති. මොහො - පෙ - කොධො - පෙ - උපනාහො - පෙ - මක්ඛො - පෙ - පළාසො - පෙ - මච්ඡරියං - පෙ - පාපිකා ඉස්සා - පෙ - පාපිකා ඉච්ඡා න හොති. තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය තිට්ඨති.

ඇවැත්නි, මහණ "මේ දහම් දන්මි, මේ දහම් දක්මි"යි ඥානවාදය කියන්නේ වේ ද, ඇවැත්නි, ඉදින් ලොභය ඒ මහණ මැඩ ගෙන නො සිටුනේ නම්, –පෙ– දොෂය – මොහය – ක්‍රොධය – උපනාහය – මක්‍ඛය– පළාසය–මච්ඡරිය–පාපෙෂ්‍යාය–පාපෙච්ඡාය මැඩ ගෙන නො සිටුනේ නම්, ඒ මහණ මෙසේ දතයුතු වෙයි: මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාක්හට ලොභය නො වේ නම්, එපරිදි දන්නේ ය, එසේ ම ය, ලොභය මේ ආයුෂ්මත්හු මැඩ ගෙන නො සිටුනේ ය, මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාක්හට එපරිදි දන්නේ ය. මොහය – ක්‍රොධය – උපනාහය – මක්‍ඛය – පළාසය – මච්ඡරිය– පාපෙෂ්‍යාය – පාපෙච්ඡාය නො වේ නම් එපරිදි දන්නේ ය, එසේ ම ය, පාපෙච්ඡාව මේ ආයුෂ්මත්හු මැඩ ගෙන නො සිටුනේ ය.

ඇවැත්නි, මහණ භාවිතකායයෙමි, භාවිතශීලයෙමි, භාවිතප්‍රඥයෙමි'යි භාවනාවාදය කියන්නේ වේ ද, ඇවැත්නි, ඉදින් ලොභය එ මහණ මැඩ ගෙන නො සිටුනේ නම්, දොෂය – මොහය – ක්‍රොධය – උපනාහය– මක්‍ඛය–පළාසය–මච්ඡරිය–පාපෙෂ්‍යාය–පාපෙච්ඡාය මැඩගෙන නො සිටුනේ නම්, ඒ මහණ මෙසේ දතයුතු වෙයි. "මේ ආයුෂ්මත් යම් පරිදි දක්නාක්හට ලොභය නො වේ නම් එපරිදි දන්නේ ය. එසේ ම ය ලොභය මේ ආයුෂ්මත්හු මැඩගෙන නො සිටුනේ ය, මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාක්හට දොෂය නො වේ නම් එපරිදි දන්නේ ය, මොහය–ක්‍රොධය–උපනාහය– මක්‍ඛය–පළාසය–මච්ඡරිය–පාපෙෂ්‍යාය–පාපෙච්ඡාය නො වේ නම් එපරිදි දන්නේ ය. එසේ ම ය, පාපෙච්ඡාව මේ ආයුෂ්මත්හු මැඩගෙන නො සිටුනේ ය.

ඇවැත්නි, මහණ "මේ දහම් දන්මි, මේ දහම් දක්මි භාවිතකායයෙමි, භාවිතසීලයෙමි, භාවිතචිත්තයෙමි, භාවිතප්‍රඥායෙමි'යි ඥානවාදය හා භාවනාවාදය හා කියන්නේ වේ ද, ඇවැත්නි, ඉදින් ලොභය එ මහණ මැඩ ගෙන නො සිටුනේ නම්, දොෂය–මොහය–ක්‍රොධය–උපනාහය– මක්‍ඛය–පළාසය–මච්ඡරිය–පාපෙෂ්‍යාය–පාපෙච්ඡාය මැඩ ගෙන නො සිටුනේ නම් ඒ මහණ මෙසේ දතයුතු වෙයි: "මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාක්හට ලොභය නො වේ නම් එපරිදි දන්නේ ය. එසේ ම ය, ලොභය මේ ආයුෂ්මත්හු මැඩ ගෙන නො සිටුනේ ය. මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාක්හට දොෂය නො වේ නම් එපරිදි දන්නේ ය. මොහය–ක්‍රොධය–උපනාහය– මක්‍ඛය–පළාසය–මච්ඡරිය–පාපෙෂ්‍යාය–පාපෙච්ඡාය නො වේ නම්, එපරිදි දන්නේ ය. එසේ ම ය, පාපෙච්ඡාව මේ ආයුෂ්මත්හු මැඩ ගෙන නො සිටුනේ ය.

සෙය්‍යථාපි ආවුසො පුරිසො අඩ්ඪො ව සමානො අඩ්ඪවාදං වදෙය්‍ය, ධනවාව සමානො ධනවාදං වදෙය්‍ය, භොගවාව සමානො භොගවාදං වදෙය්‍ය, සො කිඤ්චි කිඤ්චිදෙව ධනකරණීයෙ සමුප්පන්නෙ න සක්කුණෙය්‍ය උපනිහන්තුං ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා. තමෙනං එවං ජානෙය්‍යුං: "අඩ්ඪොව අයමායස්මා සමානො අඩ්ඪවාදං වදෙති, ධනවාව අයමායස්මා සමානො ධනවාදං වදෙති, භොගවාව අයමායස්මා සමානො භොගවාදං වදෙති. තං කිස්ස හෙතු: තථාහි අයමායස්මා කිඤ්චිකිඤ්චි දෙව ධනකරණීයෙ සමුප්පන්නෙ න සක්කොති උපනිහන්තුං ධනං වා ධඤ්ඤං වා රජතං වා ජාතරූපං වා"ති.

එවමෙව ඛො ආවුසො ඤාණවාදඤ්ච භික්ඛු වදමානො භාවනාවාදඤ්ච ජානාමිමං ධම්මං පස්සාමිමං ධම්මං, භාවිතකායොම්හි භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති. තඤ්ච ආවුසො භික්ඛුං ලොභො නාභිභුය්‍ය තිට්ඨති - දොසො – පෙ – මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා –පෙ– පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය තිට්ඨති. සො එවමස්ස වෙදිතබ්බො: තථා අයමායස්මා පජානාති යථා පජානතො ලොභො න හොති, තථාහි මං ආයස්මන්තං ලොභො නාභිභුය්‍ය තිට්ඨති. තථා යමායස්මා පජානාති යථා පජානතො දොසො න හොති. මොහො – පෙ – කොධො – පෙ – උපනාහො – පෙ – මක්ඛො – පෙ – පළාසො – පෙ – මච්ඡරියං – පෙ – පාපිකා ඉස්සා – පෙ – පාපිකා ඉච්ඡා න හොති. තථා හිමං ආයස්මන්තං පාපිකා ඉච්ඡා නාභිභුය්‍ය තිට්ඨතීති.

## 10. 1. 3. 5
## කසිණ සුත්තං

දස ඉමානි භික්ඛවෙ කසිණායතනානි, කතමානි දස: පඨවිකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං. ආපොකසිණමෙකො සඤ්ජානාති – පෙ – තෙජොකසිණ මෙකො සඤ්ජානාති – පෙ – වායොකසිණ මෙකො සඤ්ජානාති – පෙ – නීලකසිණ මෙකො සඤ්ජානාති – පෙ – පීතකසිණමෙකො සඤ්ජානාති – පෙ – ලොහිතකසිණ මෙකො සඤ්ජානාති - පෙ – ඔදාතකසිණමෙකො සඤ්ජානාති – පෙ – ආකාසකසිණ මෙකො සඤ්ජානාති – පෙ – විඤ්ඤාණ කසිණ මෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං. ඉමානි ඛො භික්ඛවෙ දස කසිණායතනානීති.

ඇවැත්නි, යම් පරිදි පුරුෂයෙක් ආඪ්‍ය වූයේ ම ආඪ්‍යවාදය කියන්නේ වේ ද, ධනවත් වූයේ ම ධනවාදය කියන්නේ වේ ද, භොගවත් වූයේ ම භොගවාදය කියන්නේ වේ ද, හේ යම් ම ධනකරණී ඇතිවත් ධන වේවයි, ධාන්‍ය වේවයි, රජත වේවයි, කනක වේවයි එළවන්නට හැකි වන්නේ වේ ද, ''මේ ආයුෂ්මත් ආඪ්‍ය වූයේ ම ආඪ්‍යවාද කියන්නේ ය, මේ ආයුෂ්මත් ධනවත් වූයේම ධනවාද කියන්නේ ය, මේ ආයුෂ්මත් භොගවත් වූයේ ම භොගවාද කියන්නේ යයි මෙසේ තුලුන් හඳුනා ගන්නේ ය. එ කවර හෙයින යත්: එසේ ම ය, මේ ආයුෂ්මත් යම් ම ධන කරණී ඇතිවත්ම ධන වේවයි ධාන්‍ය වේවයි රජත වේවයි, කනක වේවයි එළවන්නට හැකිවන්නේ ය.

ඇවැත්නි, එසෙයින් ම මහණ 'මේ දහම් දන්මි. මේ දහම් දක්මි, භාවිතකායයෙමි, භාවිතශීලයෙමි, භාවිතචිත්තයෙමි, භාවිත-ප්‍රාඥයෙමි''යි ඥනවාද හා භාවනාවාද හා කියන්නේ වේ ද, ඇවැත්නි, ඉදින් ලොභය ඒ මහණ මැඩගෙන නො සිටුනේ නම්, ද්‍වෙෂය–මොහය–ක්‍රොධය–උපනාහය–මක්‍ඛය–පළාසය–මච්ඡරිය–පාපෙඡාය – පාපෙච්ඡාය මැඩගෙන නො සිටුනේ නම් හේ මෙසේ දතයුතු වෙයි: මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාක්හට ලොභය නො වේ ද එසේ දන්නේය, එසේ ම ය, ලොභය මේ ආයුෂ්මත්හු මැඩගෙන නො සිටුනේ ය. මේ ආයුෂ්මත් යම් පරිදි දන්නාක්හට ද්‍වෙෂය නො වේ ද එසේ දන්නේ ය මොහය–ක්‍රොධය–උපනාහය–මක්‍ඛය–පළාසය–මච්ඡරිය – පාපෙඡාය – පාපෙච්ඡාය නො වේ නම්, එසේ දන්නේ ය. එසේ ම ය, පාපෙච්ඡාව මේ ආයුෂ්මත්හු මැඩ ගෙන නො සිටුනේ යයි.

## 10. 1. 3. 5

## කසිණ සූත්‍රය

මහණෙනි, මේ කසිණායතනයෝ දස දෙනෙකි, කවර දස දෙනෙක යත්: කිසිවෙක් ගගනතලාභිමුඛ වූ, භූමිතලාභිමුඛ වූ තියර්‍ය්‍යග්ගත වූ අනන්‍ය වූ ප්‍රමාණ රහිත වූ පඨවිකසිණායතනය දන්නේ ය. කිසිවෙක් ආපොකසිණායතනය දන්නේ ය, ... කිසිවෙක් තෙජොකසිණායතනය දන්නේ ය ... කිසිවෙක් වායොකසිණායතන ය දන්නේ ය ... කිසිවෙක් නීලකසිණායතනය දන්නේ ය ... කිසිවෙක් පීතකසිණායතනය දන්නේ ය ... කිසිවෙක් ලොහිත කසිණායතනය දන්නේ ය ... කිසිවෙක් ඔදත කසිණායතනය දන්නේ ය ... කිසිවෙක් ගගනතලගත වූ භූමි තලගත වූ තියර්‍ය්‍යග්ගත වූ අනන්‍ය වූ ප්‍රමාණ රහිත වූ විඤ්ඤාණ කසිණායතනය දන්නේ යි. මහණෙනි, මේ දසකසිණායතන යි.

## 10. 1. 3. 6

## කාලී සුත්තං

එකං සමයං ආයස්මා මහාකච්චානො අවන්තීසු විහරති කුරරඝරෙ පවත්තෙ පබ්බතෙ. අථ ඛො කාලී උපාසිකා කුරරඝරිකා යෙනායස්මා මහාකච්චානො තෙනුපසංකමි. උපසංකමිත්වා ආයස්මන්තං මහාකච්චානං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො කාලී උපාසිකා කුරරඝරිකා ආයස්මන්තං මහාකච්චානං එතදවොච:

වුත්තමිදං භන්තෙ භගවතා කුමාරි පඤ්හෙසු:

1. ''අත්ථස්ස පත්තිං හදයස්ස සන්තිං
ජෙත්වාන සෙනං පියසාතරූපං
එකොහං ඣායං සුඛමනුබොධිං
තස්මා ජනෙන[1] කරොමි සක්ඛිං[2]
සක්ඛී[3] න සම්පජ්ජති කෙනචි මෙ''ති.

ඉමස්ස නු ඛො භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති?

පඨවිකසිණසමාපත්තිපරමා ඛො භගිනි එකෙ සමණබ්‍රාහ්මණා අත්ථාභිනිබ්බත්තෙසුං[4]. යාවතා ඛො භගිනි පඨවි කසිණසමාපත්ති පරමතා, තදභිඤ්ඤාසි භගවා. තදභිඤ්ඤාය භගවා ආදිමද්දස,[5] ආදීනවමද්දස, නිස්සරණමද්දස, මග්ගාමග්ගඤාණදස්සනමද්දස, තස්ස ආදි දස්සනහෙතු[6] ආදීනව දස්සනහෙතු නිස්සරණදස්සනහෙතු මග්ගාමග්ගඤාණදස්සනහෙතු අත්ථස්ස පත්ති, හදයස්ස සන්ති විදිතා හොති.

ආපොකසිණසමාපත්ති පරමා ඛො භගිනි – පෙ – තෙජොකසිණ සමාපත්ති පරමා ඛො භගිනි – පෙ – වායොකසිණසමාපත්ති පරමා ඛො භගිනි – පෙ – නීලකසිණසමාපත්ති පරමා ඛො භගිනි – පෙ – පීතකසිණ සමාපත්ති පරමා ඛො භගිනි – පෙ –

---

1. තස්මා ජනෙන – මජසං.
2. සඛිං මජසං.
3. සඛි මජසං.
4. අත්ථොඨි අභි නිබ්බත්තෙසුං මජසං.
5. අස්සාදමද්දස – මජසං.
6. අස්සාද දස්සනහෙතු – මජසං.

# 10. 1. 3. 6
## කාලී සූත්‍රය

එක් සමයෙක්හි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවෝ අවන්ති ජනපදයෙහි කුරරඝර සමීපයෙහි වූ පවත්ත පව්වෙහි වාසය කරත්. එකල්හි කුරරඝර වැසි කාලී උපාසිකා ආයුෂ්මත් මහාකච්චාන තෙරුන් වෙත එළඹියා. එළඹ ආයුෂ්මත් මහාකච්චාන තෙරුන් වැඳ එකත්පස් ව හුනු. එකත්පස් ව හුන් කුරරඝර වැසි කාලී උපාසිකා ආයුෂ්මත් මහාකච්චාන තෙරුන්ට මෙතෙල සැලකළා:

වහන්ස, (මාරදූහිතෘ) කුමාරි ප්‍රශ්නයන්හිදී භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී:

1. "ප්‍රිය ස්වභාව ඇත්තාවූද සාත ස්වරූප ඇත්තාවූද කෙලෙස් මරසෙන් දිනා මම එකාකී වූයෙම් ධ්‍යාන කරමින් (අර්හත්ව නැමැති) අර්ථ ප්‍රාප්තිය ඇති හෘදයාගේ ශාන්තිය වූ සුඛය සාක්ෂාත් කෙළෙමි. එහෙයින් ජනයා සමග ධර්මසාක්ෂිභාවයක් නො කරමි, කිසිවකු හා මාගේ සාක්ෂි ධර්මයක් නො සැපයේ"යි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දෙසන ලද මෙතෙල භාෂිතයාගේ අර්ථය කිසෙයින් විතර විසින් දක්ක යුතුද? යි.

බුහුන, ඇතැම් මහණබමුණෝ "අර්ථයෝ පෘථිවීකෘත්සනය පරම කොට ඇතියහ" යි (එදැහැන) නිපදවූහ. බුහුන, පෘථිවි කසිණසමාපත්ති-යගේ යම් පමණ වූ උත්තමත්‍වයෙක් වේ නම් භාග්‍යවත්හු එය අභිඥ ප්‍රඥයෙන් දත්හ, එය අභිඥ ප්‍රඥයෙන් දන භාග්‍යවත්හු එහි ආදිය (සමුදය සත්‍යය) දුටහ, එහි ආදීනව (දුඃඛසත්‍යය) දුටහ, එහි නිඃසරණය (නිරොධ සත්‍යය) දුටහ. මාර්ගාමාර්ගඥානදර්ශනය (මාර්ගසත්‍යය) දුටහ. ඔහුගේ ආදිදර්ශනහෙතුයෙන් ආදීනවදර්ශන හෙතුයෙන් නිඃසරණ දර්ශන හෙතුයෙන් මාර්ගාමාර්ගඥානදර්ශන හෙතුයෙන් (අර්හත්ව සඞ්ඛ්‍යාත) අර්ථ ප්‍රාප්තිය, හෘදය ශාන්තිය දන්නාලද වෙයි.

බුහුන, ඇතැම් මහණබමුණෝ අර්ථයෝ ආපොකසිණසමාපත්තිය පරම කොට ඇතියහයි ... බුහුණ, තෙජොකසිණසමාපත්තිය පරම කොට ඇතියහ යි ... බුහුන, වායොකසිණසමාපත්තිය පරම කොට ඇතියහයි ... බුහුන, නීලකසිණසමාපත්තිය පරම කොට ඇතියහයි ... බුහුන, පීතකසිණ සමාපත්තිය පරම කොට ඇතියහයි ...

ලොහිතකසිණසමාපත්තිපරමා ඛො භගිනී – පෙ – ඔදාතකසිණ සමාපත්ති පරමා ඛො භගිනි – පෙ – ආකාසකසිණසමාපත්තිපරමා ඛො භගිනි – පෙ – විඤ්ඤාණකසිණසමාපත්තිපරමා ඛො භගිනි, එකෙ සමණබ්‍රාහ්මණා අත්ථාභිනිබ්බත්තෙසුං. යාවතා ඛො භගිනි, විඤ්ඤාණ කසිණසමාපත්තිපරමතා, තදභිඤ්ඤාසි භගවා. තදභිඤ්ඤාය භගවා ආදිමද්දස, ආදීනවමද්දස, නිස්සරණමද්දස, මග්ගාමග්ගඤාණදස්ස නමද්දස, තස්ස ආදිදස්සනහෙතු ආදීනවදස්සනහෙතු නිස්සරණදස්සන හෙතු මග්ගාමග්ගඤාණදස්සනහෙතු අත්ථස්ස පත්ති හදයස්ස සන්ති විදිතා හොති.

ඉති ඛො භගිනි යන්තං වුත්තං භගවතා කුමාරි පඤ්හෙසු:

2. අත්ථස්ස පත්තිං හදයස්ස සන්තිං
ජෙත්වාන සෙනං පිය සාතරූපං
එකොහං ඣායං සුඛමනුබොධිං
තස්මා ජනෙන න කරොමි සක්ඛිං
සක්ඛී න සම්පජ්ජති කෙනචී මෙති.

ඉමස්ස ඛො භගිනි, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

## 10. 1. 3. 7

## පඨම මහාපඤ්හ සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හ සමයං නිවාසෙත්වා පත්තචීවර-මාදාය සාවත්ථියං පිණ්ඩාය පවිසිංසු. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි:

"අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්ක-මෙය්‍යාමා"ති.

අථ ඛො තෙ භික්ඛූ යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසංකමිංසු. උපසංකමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං.

බුහුන, ලෝහිතකසිණ සමාපත්තිය පරම කොට ඇතියහයි ... බුහුන, ඔදාතකසිණසමාපත්තිය පරම කොට ඇතියහයි ... බුහුන, ආකාසකසිණ සමාපත්තිය පරම කොට ඇතියහයි ... බුහුන, විඤ්ඤාණකසිණ-සමාපත්තිය පරම කොට ඇතියහ යි එය නිපද වූහ. බුහුන, විඤ්ඤාණකසිණ සමාපත්තිහුගේ යම් පමණ වූ පරමතායෙක් වේ නම් භගවත්හු එය විශිෂ්ට ඥානයෙන් දත්හ, භගවත්හු එය විශිෂ්ටඥානයෙන් දැන ආදිය දුටහ, ආදීනවය දුටහ, නිස්සරණය දුටහ, මග්ගාමග්ගඤාණදස්සනය දුටුහු. ඔබ විසින් ආදිදර්ශනය හෙතුයෙන් ආදීනවදර්ශන හෙතුයෙන් නිස්සරණදර්ශන හෙතුයෙන් මාර්ගාමාර්ගඥානදර්ශන හෙතුයෙන් හෘදයයාගේ ශාන්තිය වූ අර්හත්වාර්ථප්‍රාප්තිය විදිත වෙයි.

බුහුන, භාග්‍යවතුන් වහන්සේ කුමාරි ප්‍රශ්නයෙහි:

2. "ප්‍රිය ස්වභාව හා සාතස්වරූප ඇති ක්ලෙශසෙනාව දිනා එකලා වූයෙම් ධ්‍යාන කරනෙම් මම හෘදයාගේ ශාන්තිය වූ අර්හත්ව සඞ්ඛ්‍යාත අර්ථප්‍රාප්තිය නම් වූ සුඛය ලදිමි, එහෙයින් ජනයා කෙරෙහි සාක්ෂි නො කරමි. කිසිවකු හා මාගේ සාක්ෂියෙක් නො යෙදේ ය"යි. මෙසේ යමක් දෙසන ලද නම්:

බුහුන, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දෙසන ලද මේ භාෂිතයාගේ අර්ථය විස්තර විසින් මෙසේ දතයුතුයි.

## 10. 1. 3. 7
## ප්‍රථම මහාපඤ්හ සූත්‍රය

එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජෙතවන නම් වූ අනාථපිණ්ඩික සිටුහුගේ ආරාමයෙහි වාසය කරන සේක. එකල්හි සම්බහුල භික්ෂුහු පෙරවරුයෙහි හැඳ පෙරව පා සිවුරු ගෙන සැවැත්හි පිඩුපිණිස පිවිසගත්හ. එකල්හි මහණුන්ට මෙසේ සිත වීය:

"සැවැත්හි පිඩු පිණිස සරනට දැන් ඉතා අලුයම ය. අපි අන්තොටු පිරිවැජියන්ගේ අසපුව කරා එළඹෙමෝ නම් යෙහෙකැ"යි.

ඉක්බිති ඒ මහණහු අන්තොටු පිරිවැජියන්ගේ අසපුවට එළඹියහ. එළඹ ඒ අන්තොටු පිරිවැජියන් හා සතුටු වූහ. සම්මොදනාවට හිත වූ සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ භික්ෂූන්ට ඒ අන්තොටු පිරිවැජියෝ මෙසේ කීහ:

"සමණො ආවුසො ගොතමො සාවකානං එවං ධම්මං දෙසෙති: "එථ තුම්හෙ භික්ඛවෙ සබ්බං ධම්මං අභිජානාථ; සබ්බං ධම්මං අභිඤ්ඤාය අභිඤ්ඤාය විහරථා"ති. මයම්පි ඛො ආවුසො සාවකානං එවං ධම්මං දෙසෙම: "එථ තුම්හෙ ආවුසො සබ්බං ධම්මං අභිජානාථ: සබ්බං ධම්මං අභිඤ්ඤාය අභිඤ්ඤාය විහරථා"ති.

ඉධ නො ආවුසො කො විසෙසො, කො අධිප්පායො, කිං නානා කරණං සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං, අනුසාසනියා වා අනුසාසනින්ති"?

අථ ඛො තෙ භික්ඛු තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං නෙව අභිනන්දිංසු න පටික්කොසිංසු, අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිංසු භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමාති.

අථ ඛො තෙ භික්ඛු සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡා භත්තං පිණ්ඩපාත පටික්කන්තා යෙන භගවා තෙනුපසංකමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛු භගවන්තං එතදවොචුං:

ඉධ මයං භන්තෙ, පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්ත චීවරමාදාය සාවත්ථියං පිණ්ඩාය පවිසිම්හ. තෙසං නො භන්තෙ, අම්හාකං එතදහොසි: "අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසංකමෙය්‍යාමා"ති. අථ ඛො මයං භන්තෙ යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො, තෙනුපසංකමිම්හ. උපසංකමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිම්හ. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිම්හ. එකමන්තං නිසින්නෙ ඛො භන්තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අම්හෙ එතදවොචුං: "සමණො ආවුසො ගොතමො සාවකානං එවං ධම්මං දෙසෙති: 'එථ තුම්හෙ භික්ඛවෙ සබ්බං ධම්මං අභිජානාථ, සබ්බං ධම්මං අභිඤ්ඤාය අභිඤ්ඤාය විහරථා'ති. මයම්පි ඛො ආවුසො සාවකානං එවං ධම්මං දෙසෙම: "එථ තුම්හෙ ආවුසො සබ්බං ධම්මං අභිජානාථ, සබ්බං ධම්මං අභිඤ්ඤාය අභිඤ්ඤාය විහරථා'ති. ඉධ නො ආවුසො කො විසෙසො, කො අධිප්පායො කිංනානා කරණං, සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං අනුසාසනියා වා අනුසාසනින්ති",

ඇවැත්නි, මහණ ගොයුම්හු සව්වනට මෙසේ දම් දෙසත්: එව, මහණෙනි, හැම දහම් දැන පසක්කොට වාසය කරව, හැම දහම් පසක් කොට කොට වසව''යි, ඇවැත්නි, අපිදු සව්වනට මෙසේ දම් දෙසමු: ''ඇවැත්නි, එව, තෙපි මෙ දහම් හැම දැන පසක් කරව, හැම දහම් දැන පසක්කොට වාසය කරව''යි.

ඇවැත්නි, ශ්‍රමණ ගෞතමයන් ගේ මේ ධර්ම දෙශනාව හෝ අනුශාසනාව සමග අපගේ ධර්ම දෙශනාව හෝ අනුශාසනාව අරභයා අපගේ කවර වෙසෙසෙක ? කවර අධිප්‍රායයෙක ? කවර වෙනසෙකැ ?''යි.

එකල්හි එ මහ ණහු ඒ අන්තොටු පිරිවැජියනගේ වචනය නො ම පිළිගත්හ, පරිත්‍යාග නො ද කළහ, නො ද පිළිගෙන පරිත්‍යාග නො ද කොට හුනස්නෙන් නැගී ''භගවත්හු වෙතින් තෙල භාෂිතයාගේ අර්ථය දැනගනුම්හ''යි ගියහ.

ඉක්බිති එ මහණෝ සැවැත්හි පිඩු පිණිස සැර පිඩුවායෙන් වැළකියාහු පසුබත්හි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් ව හුන්හ, එකත්පස් ව හුන්නා වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ:

වහන්ස, මෙ සැවැත්හි අපි පෙරවරුයෙහි හැඳපෙරෙව පා සිවුරු ගෙන පිඩු පිණිස බැස ගතුම්හ. වහන්ස, එ අපහට තෙල සිත විය: ''සැවැත්හි පිඩු පිණිස සරනට තව බොහෝ කල් ඇත් මැයි. අපි අන්තොටු පිරිවැජියන්ගේ අරමට එළඹමෝ නම් මැනැවැ''යි. වහන්ස, ඉක්බිති අපි අන්තොටු පිරිවැජියන්ගේ අරමට එළඹියෙමු. එළඹ ඒ අන්තොටු පිරිවැජියන් හා සතුටු වීම්හ, සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් ව හුනුම්හ. වහන්ස, එකත්පස් ව හුන් අපට අන්තොටු පිරිවැජියෝ තෙල කීහ:

''ඇවැත්නි, මහණ ගොයුම්හු සව්වනට මෙසේ දම් දෙසන්නාහ: ''මහණෙනි, එව, තෙපි හැම දහම් මොනොවට දනුව, හැම දහම් මොනොවට දැන පසක් කොට වාසය කරව''යි. ඇවැත්නි, අපිදු සව්වනට මෙසේ දහම් දෙසමු: 'ඇවැත්නි, එව, තෙපි සියලු දහම මොනොවට දනිවූ. සියලු දහම් මොනොවට දැන දැන වාසය කරවූ''යි. ඇවැත්නි, මෙ කරුණෙහි ලා අප අතර කවර වෙසෙසෙක ? කවර අධිප්‍රායයෙක ? මහණ ගොයුම් හුගේ ධර්ම දෙශනාව හෝ අනුශාසනාව සමග අපගේ ධර්ම දෙශනාව ඇරබ කවර නානා කරණයෙක්ද ?

අථ ඛො මයං භන්තෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිම්හ, න පටික්කොසිම්හ. අනභිනන්දිත්වා අපටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිම්හ. "භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමා"ති.

එවං වාදිනො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: "එකො ආවුසො පඤ්හො, එකො උද්දෙසො, එකං වෙය්‍යාකරණං, ද්වෙ පඤ්හා, ද්වෙ උද්දෙසා, ද්වෙ වෙය්‍යාකරණානි, තයො පඤ්හා, තයො උද්දෙසා තීණි වෙය්‍යාකරණානි, චත්තාරො පඤ්හා, චත්තාරො උද්දෙසා, චත්තාරි වෙය්‍යාකරණානි, පඤ්ච පඤ්හා, පඤ්චුද්දෙසා, පඤ්ච වෙය්‍යා කරණානි, ඡ පඤ්හා, ඡ උද්දෙසා, ඡ වෙය්‍යාකරණානි, සත්ත පඤ්හා, සත්ත උද්දෙසා සත්ත වෙය්‍යාකරණානි, අට්ඨ පඤ්හා, අට්ඨ උද්දෙසා, අට්ඨ වෙය්‍යාකරණානි, නව පඤ්හා, නව උද්දෙසා, නව වෙය්‍යාකරණානි, දස පඤ්හා දසුද්දෙසා, දස වෙය්‍යාකරණානී"ති. එවං පුට්ඨා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා න චෙව සම්පායිස්සන්ති, උත්තරිඤ්ච විඝාතං ආපජ්ජිස්සන්ති. තං කිස්ස හෙතු: යථා තං භික්ඛවෙ අවිසයස්මිං. නාහන්තං භික්ඛවෙ පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය, යො ඉමෙසං පඤ්හානං වෙය්‍යා කරණෙන චිත්තං ආරාධෙය්‍ය, අඤ්ඤත්‍ර තථාගතෙන වා තථාගතසාව-කෙන වා, ඉතො වා පන සුත්වා.

1. එකො පඤ්හො, එකො උද්දෙසො, එකං වෙය්‍යාකරණන්ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: එකධම්මෙ භික්ඛවෙ භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච[1] දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, කතමස්මිං එක ධම්මෙ: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා. ඉමස්මිං ඛො භික්ඛවෙ එකධම්මෙ භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. එකො පඤ්හො, එකො උද්දෙසො, එකං වෙය්‍යාකරණන්ති ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

1. සම්මදත්ථං අභිසමෙච්ච – මජසං.

වහන්ස, එකල්හි අපි ඒ අන්තොටු පිරිවැජියනගේ භාසිතය නො ද පිළිගතුම්හ, නො ද බැහැරලූම්හ, නො පිළිගෙන බැහැර නොලා හුනස්නෙන් නැඟී ගියම්හ, තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි දනුම්හ''යි.

මහණෙනි, මෙසේ කියන සුළු අන්තොටු පිරිවැජියෝ මෙසේ කියයුතුවහ. ඇවැත්නි, එක් ප්‍රශ්නයෙක, එක් උද්දේසයෙක, එක් ව්‍යාකරණයෙක, ප්‍රශ්න දෙකෙක, උද්දෙස දෙකෙක, ව්‍යාකරණ දෙකෙක, ප්‍රශ්න තුනෙක උද්දෙස තුනෙක, ව්‍යාකරණ තුනෙක, පැන සතරෙක, උදෙස් සතරෙක, විසඳුම් සතරෙකැයි, පැන පසෙක, උදෙසුම් පසෙක, විසඳුම් පසෙකැයි, පැනසයෙක, උදෙසුම් සයෙක, විසඳුම් සයෙකැයි, පැන සතෙක, උදෙසුම් සතෙක, විසඳුම් සතෙකැයි, පැන අටෙක, උදෙසුම් අටෙක, විසඳුම් අටෙකැයි, පැන නවයෙක, උදෙසුම් නවයෙක, විසඳුම් නවයෙකැයි, පැන දසයෙක, උදෙසුම් දසයෙක, විසඳුම් දසයෙකැයි, මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජියෝ සපයා කියනට ද නො හැකි වෙත්, මතුයෙහිදු විඝාතයට යෙත්: ඒ කවර හෙයින යත්: මහණෙනි, යම් හෙයෙකින් අවිෂයෙහි පැන පුළුවුස්නා ලද්හු ද එහෙයිනි, මහණෙනි, යමෙක් තථාගතයන් හැර හෝ තථාගත ශ්‍රාවකයකු හැර හෝ මෙ සස්නෙන් අසා දතුවකු හෝ හැර මෙ ප්‍රශ්නයන් විසඳීමෙන් සිත් ගන්නෝ ද, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොව්හි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වාබ්‍ය ප්‍රජාවෙහි එබන්දකු මම නො දක්මි.

1. එක් පැනයෙක, එක් උදෙසුමෙක, එක් විමසුමෙකැයි, මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලදය යත්: මහණෙනි, එකම ධර්මයෙක්හි මහණ මොනොවට උකටලී වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පිරිසිඳ දක්නා සුලු වූයේ සම සභාගත්‍වය නුවණින් අවබොධ කොට ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර එක් ධර්මයෙක යත්: හැම සත්හු ආහාර සථිතිකය හ. මහණෙනි, මේ එක්ම දහම්හි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පිරිසිඳ දක්නා සුලු වූයේ සම සභාගත්‍වය නුවණින් දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. එක් පැනෙක, එක් උදෙසුමක, එක් විසඳුමෙකැයි මෙසේ යමක් කියන ලද නම් මෙය තෙල සඳහා කියන ලද.

2. ද්වෙ පඤ්හා, ද්වෙ උද්දෙසා, ද්වෙ වෙය්‍යාකරණානීති ඉති බො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: ද්වීසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මාවිමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච[1] දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, කතමෙසු ද්වීසු: නාමෙ ච රූපෙ ච. ඉමෙසු බො භික්ඛවෙ ද්වීසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මාවිමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. ද්වෙ පඤ්හා, ද්වෙ උද්දෙසා. ද්වෙ වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

3. තයො පඤ්හා, තයො උද්දෙසා, තයො වෙය්‍යාකරණානීති, ඉති බො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්චවුත්තං: තීසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති කතමෙසු තීසු: තීසු වෙදනාසු. ඉමෙසු බො භික්ඛවෙ තීසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. තයො පඤ්හා තයො උද්දෙසා තීණි වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

4. චත්තාරො පඤ්හා, චත්තාරො උද්දෙසා චත්තාරි වෙය්‍යාකරණානීති, ඉති බො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චතූසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු චතූසු. චතූසු ආහාරෙසු. ඉමෙසු බො භික්ඛවෙ චතූසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, චත්තාරො පඤ්හා චත්තාරො උද්දෙසා චත්තාරි වෙය්‍යාකරණානීති, ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

---

1. සමදත්ථං අභිසමෙච්ච මජසං:

2. පැන දෙකෙක, උදෙසුම් දෙකෙක, විමසුම් දෙකෙකැයි. මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ය යත්: මහණෙනි, ධර්ම දෙකෙක මහණ මොනොවට උකටලී වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පිරිසිඳ දක්නා සුලුයේ සම සභාගත්‍වය දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර දෙකෙක යත්: නාමයෙහි ද රූපයෙහි දැයි. මහණෙනි, මේ දහම් දෙක්හි මහණ මොනොවට උකටලී වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍ය්‍යන්තය දක්නා සුල්ලේ සමසභාගත්‍වය මොනොවට දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරන්නෝ වෙයි. පැන දෙකෙක, උදෙසුම් දෙකෙක, විමසුම් දෙකෙකැයි මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලද.

3. පැන තුනෙක, උදෙසුම් තුනෙක, විමසුම් තුනෙකැයි. මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් කියන ලද ය යත්: මහණෙනි, ධර්ම තුනෙක, මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පිරිසිඳ දක්නා සුලුයේ සමසභාගත්‍වය දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයෙ වෙයි. කවර තුනෙක යත්: තුන් වෙදනායෙහිය. මහණෙනි, මේ තුන් දහම්හි මහණ මොනොවට උකටලී වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පිරිසිඳ දක්නා සුල්ලේ සම සභාගත්‍වය දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. තුන් පැනයෙක, තුන් උදෙසුමෙක, තුන් විමසුමෙකැයි මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලද.

4. සතර පැනයෙක, සතර උදෙසුමෙක, සතර විමසුමෙකැයි. මෙසේ තෙල බසක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ය යත්: මහණෙනි, සතර දහමෙක. මහණ මොනොවට උකටලි වනුයේ මොනො-වට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍ය්‍යන්තය දක්නා සුලු වූයේ සම සභාගත්‍වය දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර සතරෙක ය යත්: සතර ආහාරයෙහි ය. මහණෙනි, මෙ සිවුදහම්හි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍ය්‍යන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වය දැන දිටුදැමියෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. සතර පැනෙක, සතර උදෙසුමෙක, සතර විමසුමෙකැයි. මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලද.

5. පඤ්ච පඤ්හා, පඤ්චුද්දෙසා, පඤ්ච වෙය්‍යාකරණානීති. ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: පඤ්චසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු පඤ්චසු: පඤ්චසු උපාදානක්ඛන්ධෙසු. ඉමෙසු ඛො භික්ඛවෙ පඤ්චසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති පඤ්ච පඤ්හා, පඤ්චුද්දෙසා, පඤ්චවෙය්‍යාකරණානීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

6. ඡ පඤ්හා ඡ උද්දෙසා ඡ වෙය්‍යාකරණානීති ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං: ඡසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු ඡසු: ඡසු අජ්ඣත්තිකෙසු ආයතනෙසු. ඉමෙසු ඛො භික්ඛවෙ ඡසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. ඡ පඤ්හා, ඡ උද්දෙසා, ඡ වෙය්‍යාකරණානීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

7. සත්ත පඤ්හා සත්ත උද්දෙසා සත්ත වෙය්‍යාකරණානීති. ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං. සත්තසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු සත්තසු: සත්තසු විඤ්ඤාණට්ඨිතීසු. ඉමෙසු ඛො භික්ඛවෙ සත්තසු ධම්මෙසු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. සත්තපඤ්හා, සත්ත උද්දෙසා, සත්ත වෙය්‍යාකරණානීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

5. පස් පැනෙක, පස් උදෙසුමෙක පස් විමසුමෙකැයි. මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ද යත්: මහණෙනි, දහම් පසෙක මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්ත දක්නා සුල්ලේ සම සභාගත්‍වය දන දිටුදැම්යෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර පසෙක ය යත්: පඤ්ච උපාදනස්කන්‍ධයෙහිය. මහණෙනි, මෙ දහම් පසෙහි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වය දන දිටුදැම්යෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. පස් පැනෙක. පස් උදෙසුමෙක, පස් විසඳුමෙකැයි. මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලද.

6. ස පැනයෙක, ස උදෙසුමෙක, ස විසඳුමෙකැයි මෙසේ තෙල යමක් කියන ලද නම්, තෙල කුමක් පිණිස කියන ලද ය යත්: මහණෙනි, දහම් සයෙක, මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුලු වූයේ සම සභාගත්‍වය දන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. කවර සයෙක යත්: ෂට් ආධ්‍යාත්මික ආයතනයන්හි ය. මහණෙනි, ස දහම්හි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්ත දක්නා සුල්ලේ සම සභාගත්‍වය දන. දිටුදැම්යෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. ස පැනයෙක. ස උදෙසුමෙක ස විසඳුමෙකැයි. මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලද.

7. සත් පැණයෙක, සත් උදෙසුමෙක, සත් විසඳුමෙකැයි මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද යත්: මහණෙනි, දහම් සතෙක මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුලු වූයේ සම සභාගත්‍වය දනැ ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. කවර සතෙක යත්: සප්ත විඥානස්ථිතියෙහි ය. මහණෙනි, මෙ දහම් සතෙහි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්ත දක්නා සුලු වූයේ සම සභාගත්‍වය දනැ දිටුදැම්යෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. සත් පැනයෙක. සත් උදෙසුමෙක. සත් විසඳුමෙකැයි. මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලද.

8. අට්ඨ පඤ්හා, අට්ඨුද්දෙසා, අට්ඨ වෙය්‍යාකරණානීති. ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: අට්ඨසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති කතමෙසු අට්ඨසු: අට්ඨසු ලොකධම්මෙසු. ඉමෙසු ඛො භික්ඛවෙ අට්ඨසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. අට්ඨ පඤ්හා අට්ඨුද්දෙසා අට්ඨ වෙය්‍යාකරණානීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

9. නව පඤ්හා, නව උද්දෙසා, නව වෙය්‍යාකරණානීති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං. නවසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු නවසු: නවසු සත්තාවාසෙසු. ඉමෙසු ඛො භික්ඛවෙ නවසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. නව පඤ්හා නව උද්දෙසා නව වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

10. දස පඤ්හා, දසුද්දෙසා, දස වෙය්‍යාකරණානීති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං. දසසු භික්ඛවෙ ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු දසසු: දසසු අකුසලෙසු ධම්මෙසු,[1] ඉමෙසු ඛො භික්ඛවෙ දසසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. දස පඤ්හා දසුද්දෙසා දස වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

1. අකුසලෙසු කම්මපථෙසු, මජසං.

8. අට පැනෙක, අට උදෙසුමෙක, අට විමසුමෙකැයි මෙසේ යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ය යත්: මහණෙනි, දහම් අටෙක මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වය දැනැ ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර අටෙක යත්: අටලෝදහම්හි ය. මහණෙනි, මෙ අට දහම්හි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුලු වූයේ සම සභාගත්‍වය දැනැ ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. අට පැනෙක. අට උදෙසුමෙක, අට විසඳුමෙකැයි මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලද.

9. නව පැනෙක, නව උදෙසුමෙක, නව විසඳුමෙකැයි. මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ද යත්: මහණෙනි, නව දහමෙක මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුලු වූයේ සම සභාගත්‍වය දැනැ ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. කවර නවයෙක යත්: නව සත්‍තාවාසයන්හි ය. මහණෙනි, මේ නව දහම්හි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වය දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. නව පැණයෙකි, නව උදෙසුමෙක, නව විසඳුමෙකි යි මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලද.

10. දස පැනයෙක, දස උදෙසුමෙක, දස විසඳුමෙකි යි, මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියනලද ය යත්: මහණෙනි, දස දහමෙක මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වය දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. කවර දසයක යත්: දස අකුසල්දහම්හි ය. මහණෙනි, මේ දස දහම්හි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වය දැන දිටුදැහැමියෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. දස පැනයෙක, දස උදෙසුමෙක, දස විසඳුමෙකැයි. මෙසේ යම් ම බසක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලදූ යි.

# 10. 1. 3. 8

## දුතිය මහාපඤ්හ සුත්තං

එකං සමයං භගවා කජඞ්ගලායං විහරති වෙළුවනෙ. අථ ඛො සම්බහුලා කජඞ්ගලා[1] උපාසකා යෙන කජඞ්ගලා[2] භික්ඛුනී තෙනුපසංකමිංසු. උපසංකමිත්වා කජඞ්ගලං භික්ඛුනිං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු එකමන්තං නිසින්නා ඛො කජඞ්ගලා උපාසකා කජඞ්ගලං භික්ඛුනිං එතදවොචුං:

වුත්තමිදං අය්‍යෙ භගවතා මහාපඤ්හෙසු: එකො පඤ්හො, එකො උද්දෙසො, එකං වෙය්‍යාකරණං. ද්වෙ පඤ්හා, ද්වෙ උද්දෙසා ද්වෙ වෙය්‍යාකරණානි, තයො පඤ්හා තයො උද්දෙසා තීණි වෙය්‍යාකරණානි, චත්තාරො පඤ්හා. චත්තාරො උද්දෙසා චත්තාරි වෙය්‍යාකරණානි. පඤ්ච පඤ්හා පඤ්චුද්දෙසා පඤ්ච වෙය්‍යාකරණානි. ඡ පඤ්හා ඡ උද්දෙසා ඡ වෙය්‍යාකරණානි. සත්ත පඤ්හා සත්ත උද්දෙසා, සත්ත වෙය්‍යාකරණානි. අට්ඨ පඤ්හා අට්ඨ උද්දෙසා අට්ඨ වෙය්‍යාකරණානි. නව පඤ්හා නව උද්දෙසා නව වෙය්‍යාකරණානි, දස පඤ්හා දස උද්දෙසා දස වෙය්‍යාකරණානීති. ඉමස්ස නු ඛො අය්‍යෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති?

න ඛො පනෙතං ආවුසො භගවතො සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහීතං. නපි මනොභාවනීයානං භික්ඛූනං සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහීතං, අපිච යථා මෙත්ථ ඛායති, තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං අය්‍යෙති ඛො කජඞ්ගලා උපාසකා කජඞ්ගලාය භික්ඛුනියා පච්චස්සොසුං. කජංගලා භික්ඛුනී එතදවොච:

එකො පඤ්හො, එකො උද්දෙසො, එකං වෙය්‍යාකරණන්ති ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං. එකධම්මෙ ආවුසො භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමස්මිං එකධම්මෙ: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ඉමස්මිං ඛො ආවුසො එකධම්මෙ භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො, සම්මා විමුච්චමානො සම්මාපරියන්තදස්සාවී සම්මත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. එකො පඤ්හො, එකො උද්දෙසො, එකං වෙය්‍යාකරණන්ති ඉති යං තං වුත්තං භගවතා ඉදමෙතං පටිච්ච වුත්තං.

---

1. කජඞ්ගලකා - මජසං
2. කජඞ්ගලිකා - මජසං

# 10. 1. 3. 8

## දෙවන මහාපඤ්හ සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කජඞ්ගලා නගරයෙහි වෙළුවනයෙහි වැඩවෙසෙන සේක. එකල්හි බොහෝ කජඞ්ගලා වැසි උවසුවෝ කජඞ්ගලා මෙහෙණ වෙත එළඹියහ. එළඹ කජඞ්ගලා මෙහෙණ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් කජඞ්ගලා වැසි උවසුවෝ කජඞ්ගලා මෙහෙණට මෙසේ කීහ:

ආයසීාවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මහා ප්‍රශ්නයන්හි ලා මෙය වදාරන ලද: "එක් පැනයෙක, එක් උදෙසුමෙක, එක් විසඳුමෙක. දෙ පැනෙක, දෙ උදෙසුමෙක, දෙ විසඳුමෙක. තුන් පැනෙක, තුන් උදෙසුමෙක, තුන් විසඳුමෙක. සිවු පැනෙක, සිවු උදෙසුමෙක, සිවු විසඳුමෙක. පස් පැනෙක, පස් උදෙසුමෙක, පස් විසඳුමෙක. ස පැනෙක, ස උදෙසුමෙක, ස විසඳුමෙක. සත් පැනෙක, සත් උදෙසුමෙක, සත් විසඳුමෙකැයි: අට පැනෙක, අට උදෙසුමෙක, අට විසඳුමෙක. නව පැනෙක, නව උදෙසුමෙක, නව විසඳුමෙක. දස පැනෙක, දස උදෙසුමෙක, දස විසඳුමෙකැ"යි. ආයසීාවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදළ මේ භාෂිතයාගේ විස්තර විසින් කෙසේ අර්ථ දතයුතු දැයි.

ඇවැත්නි, මෙල භගවතුන් හමුයෙන් නො ම අසන ලද. හමුයෙන් නො ම පිළිගන්නා ලද. මනොභාවනීය භික්ෂූන් හමුයෙන් නො ද අසන ලද. නො ද පිළිගන්නා ලද. වැලිත් මෙහි ලා මට යම් සේ වැටහේ නම් ඒ අසවු. මොනොවට මෙනෙහි කරවු. කියමි යි. ආයසීාවෙනි, එසේ ය යි කජඞ්ගලා උපාසකයෝ කජඞ්ගලා භික්ෂුණියට පිළිවදන් අස් වූ හ. කජඞ්ගලා භික්ෂුණී මෙල කිවු ය.

එක් පැනෙක, එක් උදෙසුමෙක, එක් විමසුමෙකැයි මෙසේ මෙල යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද නම් මෙල කුමක් සඳහා කියන ලදය. ඇවැත්නි, එක් ම දහමෙක මොනොවට මහණ උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පයර්‍යන්තය දක්නා සුල්ලේ සම සභාගත්වය දැන දිටු දැමියෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. කවර එක් දහමෙක යත්: සර්‍වසත්‍වයෝ ආහාරස්ථිතිකයහ. ඇවැත්නි, මේ එක් ධර්‍මයෙහි මහණ මොනොවට උකටලි වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පයර්‍යන්තය දක්නා සුල්ලේ සම සභාගත්වයට පැමිණ දිටුදැමියෙහි ම දුක් කෙළවර කරන්නේ වෙයි. එක් පැනෙක, එක් උදෙසුමෙක, එක් විසඳුමෙකැයි මෙසේ යම් ම බසක් කියන ලද නම් මෙල භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ පිණිස කියන ලද.

ද්වෙ පඤ්හා ද්වෙ උද්දෙසා, ද්වෙ වෙය්‍යාකරණානීති ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: ද්වීසු ආවුසො ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො, සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු ද්වීසු: නාමෙ ච රූපෙ ච. -පෙ- කතමෙසු තීසු: තීසු වෙදනාසු. ඉමෙසු ඛො ආවුසො තීසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො, සම්මා විරජ්ජමානො, සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, තයො පඤ්හා තයො උද්දෙසා, තීණි වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං භගවතා ඉදමෙතං පටිච්ච වුත්තං.

චත්තාරො පඤ්හා, චත්තාරො උද්දෙසා චත්තාරි වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: චතූසු ආවුසො ධම්මෙසු භික්ඛු සම්මා සුභාවිතචිත්තො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු චතූසු: චතූසු සතිපට්ඨානෙසු. ඉමෙසු ඛො ආවුසො චතූසු ධම්මෙසු භික්ඛු සම්මා සුභාවිතචිත්තො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. චත්තාරො පඤ්හා, චත්තාරො උද්දෙසා, චත්තාරි වෙය්‍යාකරණානීති ඉතියං තං වුත්තං භගවතා ඉදමෙතං පටිච්චවුත්තං.

පඤ්ච පඤ්හා, පඤ්චුද්දෙසා, පඤ්ච වෙය්‍යාකරණානීති ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: පඤ්චසු ආවුසො ධම්මෙසු භික්ඛු සම්මා සුභාවිතචිත්තො සම්මා පරියන්තදස්සාවී සම්මත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු පඤ්චසු: පඤ්චසු ඉන්ද්‍රියෙසු. -පෙ- කතමෙසු ඡසු: ඡසු නිස්සාරණියාසු ධාතූසු. -පෙ- කතමෙසු සත්තසු: සත්තසු බොජ්ඣඞ්ගෙසු. -පෙ- කතමෙසු අට්ඨසු: අරියෙ අට්ඨඞ්ගිකෙ මග්ගෙ[1] ඉමෙසු ඛො ආවුසො අට්ඨසු ධම්මෙසු භික්ඛු සම්මා සුභාවිතචිත්තො සම්මා පරියන්තදස්සාවී, සම්මදත්තාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. අට්ඨ පඤ්හා, අට්ඨ උද්දෙසා, අට්ඨ වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං භගවතා ඉදමෙතං පටිච්ච වුත්තං.

---

1. අට්ඨසු අරිය අට්ඨඞ්ගිකම්මග්ගෙසු- මජසං.

දෙ පැනෙක, දෙ උදෙසුමෙක, දෙ විසඳුමෙකැයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල යමක් කියන ලද නම්, තෙල කුමක් සඳහා දෙසන ලද ය යත්: ඇවැත්නි, දහම් දෙකෙකැ මහණ මොනොවට උකටලී වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පයඞීන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වයට පැමිණ දිටුදැමියෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර දෙකෙක යත්: නාමයෙහි හා රූපයෙහි හා යි. ... කවර තුනෙක යත්: තුන් වෙදනායෙහි ය –පෙ– ඇවැත්නි, මේ තුන් දහම්හි මහණ මොනොවට උකටලී වනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පයඞීන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වයට පැමිණ ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. තුන් පැනයෙක, තුන් උදෙසුමෙක, තුන් විසඳුමෙකැයි මෙසේ යම් ම බසක් භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද නම්, තෙල මෙ පිණිස කියන ලද.

සතර පැනෙක, සතර උදෙසුමෙක, සතර විසඳුමෙකැයි මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද නම් තෙල කුමක් පිණිස දෙසන ලද ය යත්: ඇවැත්නි, සතර දහමෙක මහණ මොනොවට වැඩූ සිතැතියේ මොනොවට පයඞීන්තය දක්නා සුලුයේ සම සභාගත්‍වයට පැමිණ ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර සතරෙක යත්: සතර සිවටන්හි ය. ඇවැත්නි, මේ සතර දහම්හි මහණ මොනොවට සුභාවිත චිත්තය ඇතියේ මොනොවට පයඞීන්තය දක්නේ සම සභාගත්‍ව-යට පැමිණ ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. සතර පැනෙක, සතර උදෙසුමෙක, සතර විමසුමෙකැයි මෙසේ යම් ම බසක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද නම් තෙල කරුණ මෙ පිණිස දෙසන ලද.

පස් පැනෙක, පස් උදෙසුමෙක, පස් විසඳුමෙකැයි මෙසේ භාග්‍ය-වතුන් වහන්සේ විසින් යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ය යත්: ඇවැත්නි, පස් දහමෙක්හි මහණ මොනොවට වැඩූ සිතැතියේ මොනොවට පයඞීයන්තය දක්නා සුල්ලේ සම සභාගත්‍වයට පැමිණ දිටුදැමියෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර පසෙක යත්: පඤ්චෙ-න්‍ද්‍රියයන්හි ය. ... කවර සයෙකයත්; ෂට් නිඃසාරණීය ධාතුයෙහි ය ... කවර සතෙක යත්: සප්ත බොධ්‍යඞ්ගයන්හි ය. ... කවර අටෙක යත්: ආයඞීඅෂ්ටාඞ්ගික මාර්ගයෙහි ය. ඇවැත්නි, මේ අට දහම්හි මහණ මොනොවට වැඩූ සිතැතියේ මොනොවට පයඞීන්තය දක්නේ මොනො-වට සවභාවාත්‍ථය දැන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. අට පැනෙක, අට උදෙසුමෙක, අට විසඳුමෙකැයි මෙසේ යම් ම බසක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද නම් තෙල මෙ පිණිස දෙසන ලද.

නව පඤ්හා, නවුද්දෙසා නව වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: නවසු ආවුසො ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මදත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු නවසු: නවසු සත්තාවාසෙසු. ඉමෙසු ඛො ආවුසො නවසු ධම්මෙසු භික්ඛු සම්මා නිබ්බින්දමානො සම්මා විරජ්ජමානො සම්මා විමුච්චමානො සම්මා පරියන්තදස්සාවී සම්මදත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. නව පඤ්හා, නවුද්දෙසා නව වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

දස පඤ්හා දස උද්දෙසා, දස වෙය්‍යාකරණානීති ඉති ඛො පනෙතං වුත්තං භගවතා, කිඤ්චෙතං පටිච්ච වුත්තං: දසසු ආවුසො ධම්මෙසු භික්ඛු සම්මා සුභාවිතචිත්තො සම්මාපරියන්තදස්සාවී සම්මදත්ථාභිසමෙච්ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. කතමෙසු දසසු: දසසු කුසලෙසු කම්මපථෙසු: ඉමෙසු ඛො ආවුසො දසසු ධම්මෙසු සම්මා සුභාවිතචිත්තො සම්මාපරියන්ත දස්සාවී සම්මදත්ථාභිසමෙච්ච දිට්ඨෙවධම්මෙ දුක්ඛස්සන්තකරො හොති. දස පඤ්හා, දසුද්දෙසා, දස වෙය්‍යාකරණානීති ඉති යං තං වුත්තං භගවතා, ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉති ඛො ආවුසො යං තං වුත්තං භගවතා මහාපඤ්හෙසු[1] එකො පඤ්හො, එකො උද්දෙසො, එකං වෙය්‍යාකරණං -පෙ- දසවෙය්‍යාකරණානීති ඉමස්ස ඛො අහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි. ආකඞ්ඛමානා ච පන තුම්හෙ ආවුසො භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාථ[2], භගවා නො භවා ව්‍යාකරොති[3], තථා නං ධාරෙය්‍යාථාති.

එවං අය්‍යොති ඛො කජඞ්ගලා උපාසකා කජඞ්ගලාය භික්ඛුනියා භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා කජඞ්ගලං භික්ඛුනිං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන භගවා තෙනුපසංකමිංසු. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො කජඞ්ගලා උපාසකා යාවතකො අහොසි කජඞ්ගලාය භික්ඛුනියා සද්ධිං- කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසුං.

1. සඞ්ඛිත්තෙන භාසීතංසු මහාපඤ්හාසු- මජසං.
2. පරිපුච්ඡෙය්‍යාථ- මජසං.
3. යථා නො තං- මජසං.

නව පැනෙක, නව උදෙසුමෙක, නව විසඳුමෙකැ යි මෙසේ යම් ම බසක් භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද නම්, තෙල කුමක් පිණිස දෙසන ලද ය යත්: ඇවැත්නි, දහම් නවයෙක මහණ මොනොවට උකටලි වනුයේ නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට සවභාවාර්ථය දුන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. කවර නවයෙක යත්: නව සත්ත්වාවාසයන්හි ය. ඇවැත්නි, මේ නව දහම්හි මහණ මොනොවට උකටලිවනුයේ මොනොවට නො ඇලෙනුයේ මොනොවට මිදෙනුයේ මොනොවට පර්‍යන්තය දක්නා සුලුයේ මොනොවට සවභාවාර්ථය දුන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. නව පැනෙක, නව උදෙසුමෙක, නව විසඳුමෙකැයි මෙසේ යම් ම බසක් භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද නම් තෙල මෙ සඳහා කියන ලද:

දස පැනෙක, දස උදෙසුමෙක දස විසඳුමෙකැයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල යමක් දෙසන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ය යත්: ඇවැත්නි, දස දහමෙක මොනොවට වැඩූ සිතැතියේ මොනොවට පර්‍යන්තය දක්නාසුලු වූයේ මොනොවට සවභාවාර්ථය දුන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි: කවර දසයෙක යත්: දශ කුසල කර්මපථයෙහි ය: ඇවැත්නි, මේ දස දහම්හි මොනොවට වැඩූ සිතැතියේ මොනොවට පර්‍යන්තය දක්නා සුලුයේ මොනොවට සවභාවාර්ථය දුන ඉහාත්මයෙහි ම දුක් කෙළවර කරනුයේ වෙයි. දස පැනෙක, දස උදෙසුමෙක, දස විසඳුමෙකැයි මෙසේ යම් ම බසක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද නම් තෙල මෙ පිණිස කියන ලද.

ඇවැත්නි, මෙසේ මහාප්‍රශ්නයන්හි එක් පැනෙක, එක් උදෙසුමෙක, එක් විමසුමෙකැයි ... දස විසඳුමෙකැයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ම බසක් කියන ලද නම්, ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දෙසන ලද මේ භාෂිතයා ගේ අර්ථය මෙසේ විස්තර විසින් මම දනිමි, ඇවැත්නි, තෙපි කැමැත්තහු නම් භාග්‍යවතුන් වහන්සේ කරා ම එළඹ තෙල අර්ථය පුළුවුස්ව. යම් පරිද්දෙකින් භාග්‍යවතුන් වහන්සේ තොපට ව්‍යාකරණ කරන සේක් නම් එය එපරිද්දෙන් දරවු යි.

ආයුෂ්මාවෙනි, එසේ යයි කජඞගලා වැසි උපාසකයෝ කජඞගලා මෙහෙණගේ භාෂිතය පිළිගෙන අනුමෝදන් කොටගෙන හුනස්නෙන් නැගී කජඞගලා භික්ෂුණිය වැඳ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹි සිටියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස් ව හුන්හ, එකත්පස් ව හුන් කජඞගලා වැසි උවසුවෝ කජඞගලා භික්ෂුණිය සමග යම්තාක් කථා සල්ලාපයෙක් වී නම් එ හැම භාග්‍යවතුන් වහන්සේට සැලකළහ:

සාධු, සාධු ගහපතයො, පණ්ඩිතා ගහපතයො කජඞ්ගලා භික්ඛුනී මහාපඤ්ඤා ගහපතයො කජඞ්ගලා භික්ඛුනී. සචෙපි[1] තුම්හෙ ගහපතයො මං උපසංකමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාථ, අහම්පි චෙතං එවමෙව බ්‍යාකරෙය්‍යං යථා තං කජඞ්ගලාය භික්ඛුනියා බ්‍යාකතං. එසො චෙව තස්සත්ථො, එවඤ්ච තං ධාරෙය්‍යාථාති.

## 10. 1. 3. 9

### පඨමකොසල සුත්තං

[සාවත්ථි]

1. යාවතා භික්ඛවෙ කාසිකොසලා, යාවතා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස විජිතෙ[2], රාජා තත්ථ පසෙනදි කොසලො රාජා අග්ගමක්ඛායති. රඤ්ඤොපි ඛො භික්ඛවෙ පසෙනදිස්ස කොසලස්ස අත්ථෙව අඤ්ඤථත්තං, අත්ථි විපරිණාමො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො තස්මිම්පි නිබ්බින්දති. තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති, පගෙව හීනස්මිං.

2. යාවතා භික්ඛවෙ චන්දිමසුරියා පරිහරන්ති, දිසා භන්ති විරොචනා, තාව සහස්සධා ලොකො. තස්මිං සහස්සධා ලොකෙ සහස්සං චන්දානං, සහස්සං සුරියානං[3], සහස්සං සිනෙරුපබ්බතරාජානං, සහස්සං ජම්බුදීපානං, සහස්සං අපරගොයානානං සහස්සං උත්තරකුරූනං, සහස්සං පුබ්බවිදෙහානං, චත්තාරි මහාසමුද්දසහස්සානි, චත්තාරි මහාරාජසහස්සානි, සහස්සංචාතුම්මහාරාජිකානං, සහස්සං තාවතිංසානං, සහස්සං යාමානං, සහස්සං තුසිතානං, සහස්සං නිම්මාණරතීනං, සහස්සං පරනිම්මිතවසවත්තීනං, සහස්සං බ්‍රහ්මලොකානං, යාවතා භික්ඛවෙ සහස්සීලොකධාතු, මහාබ්‍රහ්මා තත්ථ අග්ගමක්ඛායති. මහාබ්‍රහ්මුනොපි ඛො භික්ඛවෙ අත්ථෙව අඤ්ඤථත්තං, අත්ථිවිපරිණාමො එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො තස්මිම්පි නිබ්බින්දති. තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති, පගෙව හීනස්මිං.

---

1. මඤ්ඤෙව- මජසං.
2. විජිතං- මජසං
3. සූරියානං- මජසං

ගැහැවියෙනි, මැනැව, මැනැව, ගැහැවියෙනි, කජඞ්ගලා මෙහෙණ පණ්ඩිතය, ගැහැවියෙනි, කජඞ්ගලා මෙහෙණ මහපැනැතියක. ගැහැවි-යෙනි, ඉදින් තෙපි මා කරා එළඹ මෙ අර්ථය පුළුවුස්හු නම්, යම් පරිද්දෙකින් එය කජඞ්ගලා භික්ෂුණිය විසින් විසඳන ලද නම් එපරිද්-දෙන් ම විසඳන්නෙමි. තෙල භාෂිතයාගේ අර්ථය තෙල මැයි. එසෙයින් ම එය දරවුයි.

## 10. 1. 3. 9

## ප්‍රථම කොසල සූත්‍රය

[සැවැත්]

1. මහණෙනි, යම්තාක් කසී කොසොල් ජනපද වැසියෝ වෙත් නම්, පසෙනදී කොසල රජුගේ විජිතයෙහි යම්තාක් රජහු වෙත් නම්, ඔවුන් අතුරෙහි පසෙනදී කොසල රජ අග්‍රය යි කියනු ලැබේ. මහණෙනි, පසෙනදී කොසොල් රජහුගේ ද අන්‍යථාත්වයෙක් ඇත. විපරිණාමයෙක් (මරණය) ඇත. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු එ සැපත්හි දු උකටලී වෙයි. එහි උකටලී වනුයේ අග්‍ර කොශල රාජ්‍යයෙහි නො ඇලෙන්නේ ය. හීන (පඤ්චකාම ගුණ) යෙහි කැලමැයි.

2. මහණෙනි, යම්තාක් සඳහිරුහු වට ඇවිදිද් ද, බබළන්නාහු දිගුන් හොබවත් ද, එතෙක් සහස්‍ර ලොකධාතු වෙයි. එ සහස්‍ර ලොකධාතුයෙහි සඳ දහසෙක, හිරු දහසෙක, මහමෙර දහසෙක, දඹදිවු දහසෙක, අපර ගොයාන දහසෙක, උතුරුකුරු දහසෙක, පූර්වවිදෙහ දහසෙක, මහ මුහුදු සාරදහසෙක. වරම්රජහු සාරදහසෙක, චාතුර්මහාරාජික දහසෙක, ත්‍රයත්ත්‍රිංශත් දහසෙක, යාම දහසෙක, තුසිත දහසෙක, නිම්මාණරතී දහසෙක, පරනිර්මිතවශවර්ති දහසෙක, බ්‍රහ්මලොක දහසෙක, මහණෙනි, යම්තාක් සහස්‍ර ලොකධාතු වේ ද, එහි මහබඹු අග්‍රය යි කියනු ලැබේ. මහණෙනි, මහබඹුහු දු ගේ අන්‍යථාත්වයෙක් ඇත. ච්‍යුතියෙක් ඇත, මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්ය ශ්‍රාවක ඒ බඹසැපත්හි දු උකටලී වෙයි. එහි උකටලී වනුයේ අග්‍රබ්‍රහ්මසම්පත්හි නො ඇලෙයි යටත් සැපත්හි කැල මැයි.

3. හොති ඛො සො භික්ඛවෙ සමයො, යං අයං ලොකො සංවට්ටති, සංවට්ටමානෙ භික්ඛවෙ ලොකෙ යෙභුය්‍යෙන සත්තා ආභස්සර සංවත්තනිකා[1] භවන්ති, තෙ තත්‍ථ හොන්ති මනොමයා, පීතිභක්ඛා සයං පභා අන්තලික්ඛ-චරා සුභට්ඨායිනො චිරං දීඝමද්ධානං තිට්ඨන්ති. සංවට්ටමානෙ භික්ඛවෙ ලොකෙ ආභස්සරා දෙවා අග්ගමක්ඛායන්ති. ආභස්සරානම්පි ඛො භික්ඛවෙ දෙවානං අත්‍ථෙව අඤ්ඤථත්තං. අත්‍ථි විපරිණාමො, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො තස්මිම්පි නිබ්බින්දති, තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති, පගෙව හීනස්මිං.

4. දසයිමානි භික්ඛවෙ කසිණායතනානි. කතමානි දස: පඨවිකසිණ-මෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං. ආපොකසිණ-මෙකො සඤ්ජානාති උද්ධං අධො, තිරියං අද්වයං අප්පමාණං. තෙජොකසිණ මෙකො සඤ්ජානාති -පෙ- වායොකසිණමෙකො සඤ්ජානාති -පෙ- නීල කසිණමෙකො සඤ්ජානාති -පෙ- පීතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ලොහිතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ඔදාතකසිණමෙකො සඤ්ජානාති -පෙ- ආකාසකසිණමෙකො සඤ්ජානාති -පෙ- විඤ්ඤාණකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං ඉමානි ඛො භික්ඛවෙ දස කසිණානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං දසන්නං කසිණායතනානං යදිදං විඤ්ඤාණකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණං, එවංසඤ්ඤිනොපි ඛො භික්ඛවෙ සන්ති සත්තා. එවං සඤ්ඤීනම්පි භික්ඛවෙ සත්තානං අත්‍ථෙව අඤ්ඤථත්තං, අත්‍ථි විපරිණාමො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො තස්මිම්පි නිබ්බින්දති, තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති, පගෙව හීනස්මිං.

5. අට්ඨිමානි භික්ඛවෙ අභිභායතනානි, කතමානි. අට්ඨ: අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ දුබ්බණ්ණානි. "තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී"ති එවංසඤ්ඤී හොති ඉදං පඨමං අභිභායතනං.

අජ්ඣත්තං රූපසඤ්ඤී එකොබහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි, තානි අභිභුය්‍ය ජානාමි, පස්සාමී'ති එවං සඤ්ඤී හොති. ඉදං දුතියං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණදුබ්බණ්ණානි, "තානි අභිභුය්‍ය ජානාමි, පස්සාමී"ති එවං සඤ්ඤී හොති. ඉදං තතියං අභිභායතනං.

---

1. වත්තනිකා- සීමු.

3. මහණෙනි, යම් හෙයෙකින් මෙ ලොව නස්නේ වේ ද, එබඳු කාලයෙක් වේ මැ ය, මහණෙනි, ලොව නස්නා කල්හි බෙහෙවින් සත්හු ආභාස්වර දෙව්ලොව උපදනාහු වෙත් ඔහු ඒ බඹලොව ධ්‍යානමනසින් මනොමය වූවාහු ප්‍රීතිභක්ෂ්‍ය වූවාහු ස්වයම්ප්‍රභා ඇත්තාහු අන්තරික්ෂචර වූවාහු ශුභස්ථායී වූවාහු දීර්ඝ කාලයක් සිටින්නාහු වෙත්. මහණෙනි, ලොකය, නස්නා කල්හි ආභාස්වර දෙවියෝ අග්‍රයහ යි කියනු ලැබෙත්. මහණෙනි, ආභාස්වර දෙවියනුදු ගේ අන්‍යථාත්වයෙක් ඇත, ච්‍යුතියෙක් ඇත. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක එ බඹසැපත්හි දු උකටලී වෙයි. එහි උකටලී වනුයේ එ අග්‍ර සැපත්හි නො ඇලෙයි. යටත් සැපත්හි කැල ම ය.

4. මහණෙනි, මේ කසිණායතනයෝ දස දෙනෙකි. කවර දස දෙනෙක යත්: එකෙක් උඩ යට සරස අද්වය රහිත ප්‍රමාණ රහිත පඨවිකසිණය දන්නේය. එකෙක් ... ආපොකසිණය දන්නේය ... එකෙක් තෙජො කසිණය දන්නේය ... එකෙක් වායොකසිණය දන්නේය ... එකෙක් නීලකසිණය දන්නේය ... එකෙක් පීතකසිණය දන්නේය ... එකෙක් ලොහිතකසිණය දන්නේ ය ... එකෙක් ඔදතකසිණය දන්නේය ... එකෙක් ආකාසකසිණය දන්නේය ... එකෙක් උඩ යට සරස අද්වය රහිත ප්‍රමාණ රහිත විඤ්ඤාණකසිණය දන්නේය. මහණෙනි, මොහු දස කසිණායතනයෝ ය. මහණෙනි, එකෙක් උඩ යට සරස අද්වය රහිත ප්‍රමාණ රහිත විඤ්ඤාණකසිණය දන්නේය යන යම් මේ කරුණෙක් ඇද්ද, මේ දස කසිණයන් අතුරෙහි තෙල අග්‍ර වෙයි. මහණෙනි, මෙ බඳු සංඥා ඇති සත්ත්වයෝ වෙත් ද මහණෙනි, මෙබඳු සංඥා ඇති සත්ත්වයන් අතුරෙහි දු අන්‍යථාත්වයෙක් ඇත, ච්‍යුතියෙක් ඇත. මහණෙනි, මෙසේ දක්නා ආර්‍ය්‍යශ්‍රාවක එ සැපත්හි දු උකටලි වෙයි. එහි උකටලි වනුයේ ඒ අග්‍ර සැපත්හි නො ඇලෙයි. යටත් සැපතෙහි කැල ම ය.

5. මහණෙනි, මේ අභිභායතනයෝ අට දෙනෙක, කවර අට දෙනෙක යත්: එකෙක් තමා තුළ රූප සංඥා ඇතියේ අල්ප වූ සුවර්ණ දුර්වර්ණ වූ බැහැර රූ දක්නේය. එ රූ අභිභවා දන්මි, දක්මි යි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. මේ ප්‍රථමාභිභායතන යි.

එකෙක් තමා තුළ රූප සංඥා ඇතියේ ප්‍රමාණ රහිත සුවර්ණ දුර්වර්ණ වූ බැහැර රූ දක්නේය. එ රූ අභිභවා දන්මි, දක්මි යි මෙබඳු සංඥා ඇතියේ වෙයි. මේ ද්විතීයාභිභායතන යි.

එකෙක් තමා තුළ අරූප සංඥා ඇතියේ අල්ප වූ සුවර්ණ දුර්වර්ණ වූ බැහැර රූ දක්නේය. එ රූ අභිභවා දන්මි, දක්මියි මෙසේ සංඥා ඇතියේ වෙයි. මෙ තෘතීයාභිභායතන යි.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණදුබ්බණ්ණානි, 'තානි අභිභුය්‍ය ජානාමි පස්සාමී'ති එවං සඤ්ඤී හොති ඉදං චතුත්ථං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි සෙය්‍යථාපි නාම උමාපුප්ඵං[1] නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං, සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං. එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි. 'තානි අභිභුය්‍ය ජානාමි, පස්සාමී'ති එවං සඤ්ඤී හොති, ඉමං පඤ්චමං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි, පීතනිභාසානි. සෙය්‍යථාපි නාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං. සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං. එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි. 'තානි අභිභුය්‍ය ජානාමි, පස්සාමී'ති එවං සඤ්ඤී හොති ඉදං ඡට්ඨං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි සෙය්‍යථාපි නාම බන්ධුජීවකපුප්ඵං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං, සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාගවිමට්ඨං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං. එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි, පස්සාමී'ති එවං සඤ්ඤී හොති ඉදං සත්තමං අභිභායතනං.

අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි.

1. උමාපුප්ඵං, මජසං.

එකෙක් තමා තුළ අරූපසංඥ ඇතියේ අප්‍රමාණ වූ සුවර්ණ දුවර්ණ වූ බැහැර රූ දක්නේය. ඒ රූ අභිභවා දන්මි. දකිමි යි මෙසේ සංඥ ඇතියේ වෙයි. මේ චතුර්ථාභිභායතන යි.

එකෙක් තමා තුළ අරූපසංඥ ඇතියේ නීල වූ නීලවර්ණ වූ නීල නිදර්ශන වූ නීලනිභාස වූ බැහැර රූ දක්නේය. නීල වූ නීල වර්ණ වූ නීල නිදර්ශන වූ දිය මෙරලිය මල යම් සේ වේ ද, බරණැස වියූ දෙපස මොළොක් වූ නීල වූ නීලවර්ණ වූ නීලනිදර්ශන වූ නීලනිභාස වූ ඒ පිළී යම්සේ වේ ද එපරිදි ම එකෙක් තමා තුළ අරූපසංඥ ඇතියේ නීල වූ නීල වර්ණ වූ නීලනිදර්ශන වූ නීලනිභාස වූ බැහැර රූ දක්නේ ය. ඒ රූ අභිභවා දන්මි. දක්මි'යි මෙසේ සංඥ ඇතියේ වෙයි. මේ පඤ්චමාභිභායතනය යි.

එකෙක් තමා තුළ අරූපසංඥ ඇතියේ පීත වූ පීත වර්ණ වූ පීතනිදර්ශන වූ පීතනිභාස වූ බැහැර රූ දක්නේ ය. පීත වූ පීතවර්ණ වූ පීතනිදර්ශන වූ පීතනිභාස වූ කිණිහිරි පුප් යම්සේ වේ ද, බරණැස වියූ දෙපස මොළොක් වූ පීත වූ පීතවර්ණ වූ පීතනිදර්ශන වූ පීතනිභාස වූ ඒ පිළී යම්සේ වේ ද, එපරිදි ම එකෙක් තමා තුළ අරූපසංඥ ඇතියේ පීත වූ පීතවර්ණ වූ පීතනිදර්ශන වූ පීත නිභාස වූ බැහැර රූ දක්නේ ය. ඒ රූ අභිභවා දන්මි, දක්මි යි මෙසේ සංඥ ඇතියේ වෙයි. මේ ෂෂ්ඨාභිභායතනය යි.

එකෙක් තමා තුළ අරූපසංඥ ඇතියේ ලොහිත වූ ලොහිතවර්ණ වූ ලොහිතකනිදර්ශන වූ ලෝහිතකනිභාස වූ බැහැර රූ දක්නේ ය, ලොහිත වූ ලොහිතක වර්ණ වූ ලොහිතක නිදර්ශන වූ ලොහිතක නිභාස වූ බඳුවද පුප් යම්සේ වේ ද බරණැස වියූ දෙපස මොළොක් වූ ලොහිතක වූ ලොහිතක වර්ණ වූ ලොහිතක නිදර්ශන වූ ලොහිතක නිභාස වූ ඒ පිළී යම් සේ වේ ද, එපරිදිම එකෙක් තමා තුළ අරූපසංඥ ඇතියේ ලොහිතක වූ ලොහිතක වර්ණ වූ ලොහිතක නිදර්ශන වූ ලොහිතක නිභාස වූ බැහැර රූ දක්නේ ය. ඒ රූ අභිභවා දන්මි දක්මි යි මෙසේ සංඥ ඇතියේ වෙයි. මේ සප්තමාභිභායතනය යි,

එකෙක් තමා තුළ අරූපසංඥා ඇතියේ ඕදත වූ ඕදත වර්ණ වූ ඕදත නිදර්ශන වූ ඕදත නිභාස වූ බැහැර රූ දක්නේ ය.

සෙය්‍යථාපි නාම ඔසධීතාරකා ඔදාතා ඔදාතවණ්ණා ඔදාතනිදස්සනා ඔදාතනිභාසා. සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතො භාගවිමට්ඨං ඔදාතං ඔදාතවණ්ණං ඔදාතනිදස්සනං ඔදාතනිභාසං එවමෙවං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාත-වණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. 'තානි අභිභුය්‍ය ජානාමි, පස්සාමී'ති එවංසඤ්ඤී හොති ඉදං අට්ඨමං අභිභායතනං.

ඉමානි ඛො භික්ඛවෙ අට්ඨ අභිභායතනානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං අට්ඨන්නං අභිභායතනානං යදිදං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි. තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. එවංසඤ්ඤිනොපි ඛො භික්ඛවෙ සන්ති සත්තා. එවං සඤ්ඤී-නම්පි ඛො භික්ඛවෙ සත්තානං අත්ථෙව අඤ්ඤථත්තං, අත්ථි විපරිණාමො, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො තස්මිම්පි නිබ්බින්දති. තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති, පගෙව හීනස්මිං.

6. චතස්සො ඉමා භික්ඛවෙ පටිපදා. කතමා චතස්සො: දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා. ඉමා ඛො භික්ඛවෙ චතස්සො පටිපදා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං චතුන්නං පටිපදානං යදිදං සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා. එවං පටිපන්නාපි ඛො භික්ඛවෙ සන්ති සත්තා. එවං පටිපන්නානම්පි ඛො භික්ඛවෙ සත්තානං අත්ථෙව අඤ්ඤථත්තං, අත්ථි විපරිණාමො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරිය සාවකො තස්මිම්පි නිබ්බින්දති. තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති, පගෙව හීනස්මිං.

7. චතස්සො ඉමා භික්ඛවෙ සඤ්ඤා, කතමා චතස්සො: පරිත්තමෙකො සඤ්ජානාති, මහග්ගතමෙකො සඤ්ජානාති, අප්පමාණමෙකො සඤ්ජා-නාති නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනමෙකො සඤ්ජානාති, ඉමා ඛො භික්ඛවෙ චතස්සො සඤ්ඤා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං චතුන්නං සඤ්ඤානං යදිදං ''නත්ථි කිඤ්චී''ති ආකිඤ්චඤ්ඤායතනමෙකො සඤ්ජානාති. එවං සඤ්ඤිනොපි ඛො භික්ඛවෙ සන්ති සත්තා. එවං සඤ්ඤීනම්පි ඛො භික්ඛවෙ සත්තානං අත්ථෙව අඤ්ඤථත්තං, අත්ථි විපරිණාමො එවං පස්සං භික්ඛවෙ සුතවා, අරියසාවකො තස්මිම්පි නිබ්බින්දති. තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති, පගෙව හීනස්මිං.

අවදාත වූ අවදාත වර්ණ වූ අවදාත නිදර්ශන වූ අවදාත නිභාස වූ දවහත් තරු යම් සේ වේ ද අවදාත වූ අවදාත වර්ණ වූ අවදාත නිදර්ශන වූ අවදාත නිභාස වූ බරණැස වියූ ඒ වස්ත්‍රයක් යම් සේ වේ ද එසේ එකෙක් තමා තුළ අරූපසංඥ ඇතියේ අවදාත වූ අවදාත වර්ණ වූ අවදාත නිදර්ශන වූ අවදාත නිභාස වූ බැහැර රූ දක්නේය. එ රූ දන්මි, දක්මි යි මෙසේ සංඥා ඇත්තේ වෙයි. මේ අෂ්ටම අභිභායතන යි.

මහණෙනි, මේ අෂ්ට අභිභායතනයෝ යි. මහණෙනි, "එකෙක් තමා තුළ අරූප සංඥ ඇතියේ අවදාත වූ අවදාත වර්ණ වූ අවදාත නිදර්ශන වූ අවදාත නිභාස වූ බැහැර රූ දක්නේ ය. ඒ රූ අභිභවා දන්මි දක්මි යි මෙසේ සංඥ ඇතියේ වෙයි'' යන යම් මේ අභිභායතනයෙක් වේ ද, මේ අෂ්ට-අභිභායතනයන් අතුරෙන් තෙල අග්‍ර වෙයි. මහණෙනි, මෙසේ සංඥ ඇති වූත් සත්ත්වයෝ ඇත. මහණෙනි, මෙසේ සංඥ ඇති වූත් සත්ත්වයන්ගේ අන්‍යථාත්වයෙක් ඇත් ම ය. ච්‍යුතියෙක් ඇත් ම ය. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක ඒ සැපත්හිදු උකටලී වෙයි. එහි උකටලි වනුයේ ඒ අග්‍ර සැපත්හි නො ඇලෙයි. යටත් සැපතෙහි කැල ම ය.

6. මහණෙනි, මේ ප්‍රතිපදාවෝ සතර දෙනෙක, කවර සතර දෙනෙක යත්: දන්ධාභිඥ දුක්ඛාපටිපද ය, ක්ෂිප්‍රාභිඥ දුක්ඛාපටිපද ය, දන්ධාභිඥ සුඛාපටිපද ය, ක්ෂිප්‍රාභිඥ සුඛාපටිපද ය. මහණෙනි, මොහු සතර ප්‍රතිපදාවෝ යි. මහණෙනි, ක්ෂිප්‍රාභිඥ සුඛාපටිපද යැ යන යම් මේ ප්‍රතිපදා-යෙක් වේ ද, මේ සතර ප්‍රතිපදාවන් අතුරෙන් තෙල අග්‍ර ය. මහණෙනි, මෙසේ පිළිපන් සත්ත්වයෝ ද ඇත. මහණෙනි, මෙසේ පිළිපන් සත්ත්ව-යනුදු ගේ අන්‍යථාත්වයෙක් ඇත. ච්‍යුතියෙක් ඇත. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක එහි උකටලී වෙයි. එහි උකටලි වනුයේ එ අග්‍රප්‍රතිපත්හි නො ඇලෙයි. යටත් ප්‍රතිපත්හි කැල මය.

7. මහණෙනි, මේ සංඥාවෝ සතර දෙනෙක. කවර සතර දෙනෙක යත්; එකෙක් සූක්ෂම ය දන්නේ ය. එකෙක් මහද්ගතය දන්නේ ය. එකෙක් අප්‍රමාණය දන්නේ ය. එකෙක් කිසිදු නැති ආකිඤ්චඤ්ඤය දන්නේ ය. මහණෙනි, මේ සතර සංඥාවෝ ය. මහණෙනි එකෙක් කිසිදු නැති ආකිඤ්චඤ්ඤය දන්නේ ය යන යම් මේ සංඥායෙක් වේ ද, මේ සතර සංඥාවන් අතුරෙන් තෙල අග්‍ර ය. මහණෙනි, මෙසේ සංඥ ඇති සත්ත්වයෝ ද ඇත. මහණෙනි, මෙසේ සංඥ ඇති සත්ත්වයනුදු ගේ අන්‍ය-ථාත්වයෙක් ඇත. ච්‍යුතියෙක් ඇත. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක එහිදු උකටලි වෙයි. එහි උකටලි වනුයේ අග්‍රසංඥාවෙහි නො ඇලෙයි. යටත් සංඥායෙහි කැල මය.

8. එතදග්ගං භික්ඛවෙ බාහිරකානං දිට්ඨිගතානං යදිදං නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සාමි, න මෙ භවිස්සතීති. එවංදිට්ඨිනො භික්ඛවෙ එතං පාටිකඞ්ඛං: යා චායං භවෙ අප්පටිකුලතා, සා චස්ස න භවිස්සති, යාචායං භවනිරොධෙ පාටිකුල්‍යතා, සා චස්ස න භවිස්සතීති. එවං දිට්ඨිනොපි බො භික්ඛවෙ සන්ති සත්තා. එවං දිට්ඨිනම්පි බො භික්ඛවෙ සත්තානං අත්ථෙව අඤ්ඤථත්තං, අත්ථි විපරිණාමො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො තස්මිම්පි නිබ්බින්දති. තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති, පගෙව හීනස්මිං.

9. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහමණා පරමත්ථවිසුද්ධිං පඤ්ඤපෙන්ති. එතදග්ගං භික්ඛවෙ පරමත්ථවිසුද්ධිං පඤ්ඤපෙන්තානං යදිදං සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. තෙ තදභිඤ්ඤාය තස්ස සච්ඡිකිරියාය ධම්මං දෙසෙන්ති. එවං වාදිනොපි බො භික්ඛවෙ සන්ති සත්තා. එවං වාදිනම්පි බො භික්ඛවෙ සත්තානං අත්ථෙව අඤ්ඤථත්තං, අත්ථි විපරිණාමො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො තස්මිම්පි නිබ්බින්දති, තස්මිං නිබ්බින්දන්තො අග්ගෙ විරජ්ජති. පගෙව හීනස්මිං.

10. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහමණා පරමදිට්ඨධම්මනිබ්බානවාද. තෙ පරමදිට්ඨධම්මං නිබ්බානං පඤ්ඤපෙන්ති. එතදග්ගං භික්ඛවෙ පරමදිට්ඨ ධම්ම නිබ්බානං පඤ්ඤපෙන්තානං යදිදං ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාද විමොක්ඛො. එවං වාදිං බො මං භික්ඛවෙ එවමක්ඛායිං. එකෙ සමණබ්‍රාහමණා අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛන්ති: න සමණො ගොතමො කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙති. න රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙති, න වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙතීති. කාමානං බො අහං භික්ඛවෙ පරිඤ්ඤං පඤ්ඤපෙමි, රූපානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙමි, වෙදනානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙමි දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො අනුපාද පරිනිබ්බානං පඤ්ඤපෙමීති.

8. මහණෙනි, "අතීතයෙහි නො වීම් නම් වර්තමානයෙහි මාගේ ආත්මභාවයෙක් නැත. මතුයෙහි නොවෙම් නම් මාගේ කිසි පළිබොධයෙක් නැත" යන යම් මේ දෘෂ්ටිගතයෙක් වේද ශාසනසමයෙන් බැහැර සිටුනා දෘෂ්ටිගතයන් අතුරෙන් තෙල අග්‍ර ය. මහණෙනි, මෙසේ දෘෂ්ටි ඇතියා හට තෙල කැමැති විය යුතු ය: "භවයෙහි ලා යම් මේ අප්පටිකූල්‍යතායෙක් වේ ද එද ඔහුට නො වේ. භවනිරොධයෙහි ලා යම් මේ පටිකූල්‍යතායෙක් වේ ද එ ද නො වේ ය"යි: මහණෙනි, මෙසේ දෘෂ්ටි ඇති සත්හු ද ඇත. මහණෙනි, මෙසේ දෘෂ්ටි ඇති සතුනුදු ගේ අන්‍යථාත්‍වයෙක් ඇත. ච්‍යුතියෙක් ඇත. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක එහිදු උකටලි වෙයි. එහි උකටලි වනුයේ අග්‍රදෘෂ්ටිගතයෙහි නො ඇලෙයි. යටත් දෘෂ්ටිගතයෙහි කැල ම ය.

9. මහණෙනි, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය පනවන ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. මහණෙනි, "සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය උපයා වෙසෙයි" යන යම් මේ පරමාර්ථ විසුද්ධියෙක් වේ ද පරමාර්ථ විසුද්ධි පනවනුවන් අතුරෙන් තෙල අග්‍ර ය. ඔහු එ දැනැ එය සාක්ෂාත් කරනු පිණිස දහම් දෙසත්. මහණෙනි, මෙසේ වාද ඇති සත්හුදු ඇත. මහණෙනි, මෙසේ වාද ඇති සතුනුදු ගේ අන්‍යථාත්‍වයෙක් ඇත. ච්‍යුතියෙක් ඇත, මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක ඒ පරමාර්ථ විසුද්ධියෙහිදු උකටලි වෙයි. එහි උකටලි වනුයේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නො ඇලෙයි. යටතෙහි කැල ම ය.

10. මහණෙනි, පරමදෘෂ්ටධර්ම නිර්වාණවාද ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. ඔහු පරමදෘෂ්ටධර්මනිර්වාණය පනවත්. මහණෙනි, "ෂට්ස්පර්ශායතනයන්ගේ සමුදය හා අස්තඞ්ගමය හා ආස්වාදය හා දෙෂය හා නිස්සරණය හා තත් වූ පරිදි දැන අනුපාද විමොක්ෂයෙක් වේ" යන යම් මේ අර්හත්‍වයෙක් වේ ද, පරමදෘෂ්ටධර්මනිර්වාණය පනවන්න වුන් අතුරෙන් තෙල අග්‍ර ය. මහණෙනි, මෙසේ බණන සුලු මෙසේ කියන සුලු මා ඇතැම් මහණ බමුණෝ අසත් වූ ඒ ලසුමැෂා වූ අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කෙරෙත්: "ශ්‍රමණ ගෞතම කාමයන් ගේ සමතික්‍රමණය නො පනවයි. රූපසමතික්‍රමණය නො පනවයි. වෙදනා සමතික්‍රමණය නො පනවයි" කියා යි. මහණෙනි, මම කාමසමතික්‍රමණය පනවමි, රූපසමතික්‍රමණය ද පනවමි. වෙදනාසමතික්‍රමණය ද පනවමි. ඉහාත්මයෙහි නිෂ්තෘෂ්ණ වූයෙම් නිර්වෘත වූයෙම් ශීතිභූත වූයෙම් අනුපාදපරිනිර්වාණය පනවමි.

## 10.1.3.10

## දුතිය කොසල සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො උය්‍යොධිකාය[1] නිය්‍යාතො හොති විජිතසඞ්ගාමො ලද්ධාධිප්පායො අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන ආරාමො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි, යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව ආරාමං පාවිසි. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අබ්භොකාසෙ චඞ්කමන්ති. අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන තෙ භික්ඛූ තෙනුපසංකමි. උපසංකමිත්වා තෙ භික්ඛූ එතදවොච:

කහන්නු ඛො භන්තෙ භගවා එතරහි විහරති අරහං සම්මා සම්බුද්ධො? දස්සනකාමා හි මයං භන්තෙ තං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධන්ති.

එසො මහාරාජ විහාරො සංවුතද්වාරො, තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමානො ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගලං ආකොටෙහි, විවරිස්සති තෙ භගවා ද්වාරන්ති.

අථ ඛො රාජා පසෙනදි කොසලො යෙන සො විහාරො සංවුතද්වාරො, තෙන අප්පසද්දො උපසංකමිත්වා අතරමානො ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගලං ආකොටෙසි. විවරි භගවා ද්වාරං. අථ ඛො රාජා පසෙනදි කොසලො විහාරං පවිසිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදනි මුඛෙන ච පරිචුම්බති, පාණීහි ච පරිසම්බාහති, නාමං ච සාවෙති: 'රාජාහං භන්තෙ පසෙනදි කොසලො, රාජාහං භන්තෙ පසෙනදි කොසලො'ති.

කම්පන ත්වං මහාරාජ අත්ථවසං සම්පස්සමානො ඉමස්මිං සරීරෙ එවරූපං පරමනිපච්චාකාරං කරොසි මෙත්තූපහාරං උපදංසෙසීති?

කතඤ්ඤුතං ඛො අහං භන්තෙ කතවෙදිතං සම්පස්සමානො භගවති එවරූපං පරමනිපච්චාකාරං කරොමි, මෙත්තූපහාරං උපදංසෙමි.

1. භගවා හි භන්තෙ බහුජනහිතාය පටිපන්නො බහුජනසුඛාය, බහුනො ජනස්ස අරියෙ ඤායෙ පතිට්ඨාපිතා යදිදං කල්‍යාණධම්මතාය කුසලධම්මතාය, යම්පි භන්තෙ භගවා බහුජනහිතාය පටිපන්නො බහුජන සුඛාය බහුනො ජනස්ස අරියෙ ඤායෙ පතිට්ඨාපිතා යදිදං කල්‍යාණධම්මතාය කුසලධම්මතාය, ඉදම්පි ඛො අහං භන්තෙ අත්ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරමනිපච්චාකාරං කරොමි, මෙත්තූපහාරං උපදංසෙමි.

---

1. උය්‍යොධිකා– මජසං

## 10. 1. 3. 10

## ද්විතීය කොසල සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරන සේක. එසමයෙහි පසේනදී කොසල රජ යුධයෙන් නැවතියේ දිනූ සඞ්ග්‍රාම ඇතියේ ලැබූ අධිප්‍රාය ඇතියේ වෙයි. එසඳ ප්‍රසෙනජිත් කොසොල් රජ අරම් කරා ගියේ ය. යානභූමිය වැටෙන තාක් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමන් ඇතියේ ම අරමට පිවිසියේ ය. එසමයෙහි බොහෝ භික්ෂූහු අභ්‍යවකාශයෙහි සක්මන් කෙරෙත්. එසඳ ප්‍රසෙනජිත් කොසොල් රජ ඒ භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ඒ භික්ෂූන් අතිත් තෙල විචාළේ ය:

වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වෙසෙද්ද? වහන්ස, අපි අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ දක්නට කැමැත්තම්හ යි.

මහරජ, තෙල ගඳොළ ය: පියූ දෙර ඇත. එයින් නිශ්ශබ්ද ව නො වෙළෙවි ව එළඹ දෙර කොවුවට වැද කැසැ අගුළු පහරව. භාග්‍යවතුන් වහන්සේ තොපට දෙර විවර කරන්නාහ යි.

එසඳ ප්‍රසෙනජිත් කොසොල් රජ පියූ දෙර ඇති ඒ ගඳොළ වෙත එළඹ එහි අල්පශබ්ද ව නො වෙළෙවි ව එළඹ ප්‍රමුඛයට වැද කැසි හඬ නගා අගුළු පහළේ ය. භාග්‍යවතුන් වහන්සේ දෙර විවර කළ සේක. එසඳ ප්‍රසෙනජිත් කොසොල් රජ වෙහෙරට වැද බුදුන් පාමුල්හි හිසින් වැටී බුදුන් සිරිපා මුවිනුදු සුඹුනේ ය. දෙයතිනුදු පරිමදනේ ය. ''වහන්ස, මම ප්‍රසෙනජිත් කොසොල් රජිමි. වහන්ස, මම ප්‍රසෙනජිත් කොසොල් රජිමි''යි නම ද අස්වනුයේ වෙයි.

මහරජ, තෙපි කවර කරුණක් දක්නේ මේ ශරීරයෙහි මෙබඳු පරමනිපත්‍යාකාරයක් මෛත්‍රීසම්ප්‍රයුක්ත උපහාරයක් දක්වහු ද?

වහන්ස, මම කෘතඥතා කෘතවේදිතා දක්මින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපත්‍යාකාරයක් කෙරෙමි. මෛත්‍රී සම්ප්‍රයුක්ත උපහාරයක් දක්වමි.

1. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කල්‍යාණධර්මතායෙනුදු කුසලධර්මතායෙන් දැයි යම් ඒ මහෙකින් බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුඛ පිණිස පිළිපන් සේක් බොහෝ දෙනා විදර්ශනා සහිත මාර්ගයෙහි පිහිටුවන සේක. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කල්‍යාණධර්මතායෙනුදු කුශලධර්මතායෙන් දැයි යම් ඒ මහෙකින් බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සුඛ පිණිස පිළිපන් සේක් බොහෝ දෙනා ආර්‍ය්‍ය න්‍යායයෙහි පිහිටුවන සේක් ද වහන්ස, මම මෙ කරුණ ද දක්මින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපත්‍යාකාරයක් කෙරෙමි, මෛත්‍රීසම්ප්‍රයුක්ත උපහාර දක්වමි.

2. පුනවපරං භන්තෙ භගවා සීලවා වුද්ධසීලො අරියසීලො කුසලසීලො කුසලසීලෙන සමන්නාගතො. යම්පි භන්තෙ භගවා සීලවා වුද්ධසීලො අරියසීලො කුසලසීලො කුසලසීලෙන සමන්නාගතො, ඉමම්පි බො අහං භන්තෙ අත්‍ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරමනිපච්චාකාරං කරොමි, මෙත්තුපහාරං උපදංසෙමි.

3. පුනවපරං භන්තෙ භගවා දීඝරත්තං ආරඤ්ඤකො අරඤ්ඤවනපත්‍ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති. යම්පි භන්තෙ භගවා දීඝරත්තං ආරඤ්ඤ-කො අරඤ්ඤ වනපත්‍ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති, ඉමම්පි බො අහං භන්තෙ අත්‍ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරමනිපච්චාකාරං කරොමි, මෙත්තුපහාරං උපදංසෙමි.

4. පුනවපරං භන්තෙ භගවා සන්තුට්ඨො ඉතරීතරචීවර පිණ්ඩපාත සයනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන, යම්පි භන්තෙ භගවා සන්තුට්ඨො ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරෙන, ඉමම්පි බො අහං භන්තෙ අත්‍ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරමනිපච්චාකාරං කරොමි මෙත්තුපහාරං උපදංසෙමි.

5. පුනවපරං භන්තෙ භගවා ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. යම්පි භන්තෙ භගවා ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස, ඉමම්පි බො අහං භන්තෙ අත්‍ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරමනිපච්චාකාරං කරොමි, මෙත්තුප-හාරං උපදංසෙමි.

2. තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සිල්වත්හ. වැඩුණු සිල් ඇතියහ, ආර්‍ය්‍යශීල ඇතියහ. අනවද්‍ය ශීල ඇතියහ, කුශලශීලයෙන් සමන්වාගතයහ. වහන්ස, 'භාග්‍යවතුන් වහන්සේ සිල්වත්හ, වැඩුණු සිල් ඇතියහ. ආර්‍ය්‍ය ශීල ඇතියහ. අනවද්‍ය ශීල ඇතියහ. කුසලශීලයෙන් සමන්වාගතයහ' යන යමෙක් ඇද්ද, වහන්ස, මම මෙ කරුණ ද දක්මින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපච්චාකාර කෙරෙමි. මෛත්‍රී සම්ප්‍රයුක්ත උපහාර දක්වමි.

3. තව ද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දීර්ඝරාත්‍රයෙහි ආරණ්‍යකයහ. අරණ්‍ය සෙනසුන් ද වනපෙත් සෙනසුන් ද ඉතා දුරු වනසෙනසුන් ද සෙවුනාහ. වහන්ස, ''භාග්‍යවතුන් වහන්සේ දීර්ඝරාත්‍රයෙහි ආරණ්‍යකයහ අරණ්‍ය සෙනසුන් ද වනපෙත් සෙනසුන් ද ඉතා දුර වනපෙත් සෙනසුන් ද සෙවුනාහ'' යන යමෙක් ඇද් ද, වහන්ස, මම මෙ කරුණ ද, දක්මින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපච්චාකාර කෙරෙමි, මෛත්‍රීසම්ප්‍රයුක්ත උපහාර දක්වමි,

4. තවද වහන්ස, ''භාග්‍යවතුන් වහන්සේ ඉතරෙතර චීවර පිණ්ඩපාතශයනාසන ග්ලානප්‍රත්‍යයභෛසජ්‍යපරිෂ්කාරයෙන් සන්තුෂ්ටයහ, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඉතරෙතරචීවර පිණ්ඩපාත ශයනාසනග්ලාන ප්‍රත්‍යය භෛසජ්‍යපරිෂ්කාරයෙන් සන්තුෂ්ටයහ'' යන යමෙක් ඇද්ද, වහන්ස, මම මෙ කරුණ ද දක්මින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපච්චාකාරයක් කෙරෙමි. මෛත්‍රීසම්ප්‍රයුක්ත උපහාර දක්වමි.

5. තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආහුනෙය්‍යයහ, පාහුනෙය්‍යයහ. දක්ඛිණෙය්‍යයහ, අඤ්ජලිකරණීයයහ. ලොකයට අනුත්තර පුණ්‍යක්ෂේත්‍රයහ, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආහුනෙය්‍යයහ, පාහුනෙය්‍යයහ, දක්ඛිණෙය්‍යයහ, අඤ්ජලිකරණීයයහ, ලොකයට අනුත්තර පුණ්‍යක්ෂේත්‍රයහ යන යමක් ඇත්ද, වහන්ස, මම මෙ කරුණ ද දක්මින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපච්චාකාරයක් කෙරෙමි, මෛත්‍රී සම්ප්‍රයුක්ත උපහාර කෙරෙමි.

6. පුනචපරං භන්තෙ භගවා යායං කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා, සෙය්‍යථීදං: අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, පවිවෙකකථා, අසංසග්ගකථා, විරියාරම්භකථා, සීලකථා, සමාධිකථා, පඤ්ඤාකථා, විමුත්තිකථා, විමුත්තිඤාණදස්සනකථා එවරූපියා කථාය නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී. යම්පි භන්තෙ භගවා යායං කථා අභිසල්ලෙඛිකා චෙතොවිවරණසප්පායා සෙය්‍යථීදං: අප්පිච්ඡකථා -පෙ- විමුත්තිඤාණදස්සනකථා. එවරූපියා කථාය නිකාමලාභී, අකිච්ඡලාභී අකසිරලාභී. ඉමම්පි ඛො අහං භන්තෙ අත්ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරම නිපච්චාකාරං කරොමි, මෙත්තූපහාරං උපදංසෙමි.

7. පුනචපරං භන්තෙ භගවා චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී. යම්පි භන්තෙ භගවා චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී, ඉමම්පි ඛො අහං භන්තෙ අත්ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරම නිපච්චාකාරං කරොමි, මෙත්තූපහාරං උපදංසෙමි.

8. පුනචපරං භන්තෙ භගවා අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පිජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො, පඤ්චපි ජාතියො දසපි ජාතියො, වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. යම්පි භන්තෙ භගවා අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. ඉමම්පි ඛො අහං භන්තෙ අත්ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරමනිපච්චාකාරං කරොමි, මෙත්තූපහාරං උපදංසෙමි.

6. තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මොනොවට කෙලෙස් ලියන සුලු වූ සමථවිදර්ශනාචිත්තවිවරණයට සත්ප්‍රාය වූ යම් මේ කථායෙක් වේ නම්, එ කවර යත්: අප්පිච්ඡකථා ය, සන්තුට්ඨිකථා ය, පවිවෙකකථා ය, අසංසග්ගකථාය, විරියාරම්භකථා ය, සීලකථා ය, සමාධිකථා ය, පඤ්ඤා කථා ය, විමුත්තිකථා ය, විමුත්තිඤාණදස්සනකථා යි. මෙබඳු කථාකැමතිසේ ලබන සුල්ලභු නිදුකින් ලබන සුල්ලභු විපුල කොට ලබන සුල්ලභු වෙත්. වහන්ස, "භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් ලියන සුලු චෙතො විවරණයට සත්ප්‍රාය වන යම් ඒ කථායෙක් වේ නම් ඒ කවර යත්: අප්පිච්ඡකථා ය ... විමුත්තිඤාණදස්සනකථා යි. එබඳු කථා කැමතිසේ ලබන සුල්ලභ, නිදුකින් ලබන සුල්ලභ, විපුල කොට ලබන සුල්ලභ" යන යමෙක් වේ ද, වහන්ස, මම මෙ කරුණ ද මොනොවට දක්නෙම් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපච්චාකාරයක් කෙරෙමි, මෛත්‍රීසම්ප්‍රයුක්ත උපහාර දක්වමි.

7. තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අධිචිත්තයෙහි හටගත් ඉහාත්මයෙහි සුඛවිහරණ වූ සතර ධ්‍යානයන් කැමැතිසේ ලබන සුල්ලභ, නිදුකින් ලබන සුල්ලභ, විපුල සේ ලබන සුල්ලභ. වහන්ස, "භාග්‍යවතුන් වහන්සේ අධිචිත්තයෙහි හටගන්නා දිට්ඨධම්මසුඛවිහාර වන සතර ධ්‍යානයන් කැමැති සේ ලබන සුල්ලභ, නිදුකින් ලබන සුල්ලභ, විපුල සේ ලබන සුල්ල භ" යන යමෙක් වේ නම්, වහන්ස, මම මෙ කරුණ මොනොවට දක්නෙම් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපච්චාකාරයක් කරමි. මෛත්‍රීසම්ප්‍රයුක්ත උපහාර දක්වමි.

8. තවද, වහන්ස 'භාග්‍යවතුන් වහන්සේ අනෙකවිධ පූර්වේනිවාසය සිහි කෙරෙත්. ඒ කිසෙ ය යත්: එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දසයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතලිසක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සියදහසක් ද, නොයෙක් සංවර්තකල්පයන් ද, නොයෙක් විවර්තකල්පයන් ද, නොයෙක් සංවර්තවිවර්තකල්පයන් දැයි, මෙබඳු නම් ඇතියෙම්, මෙබඳු ගොත්‍ර ඇතියෙම්, මෙබඳු සිරුරු පැහැ ඇතියෙම්, මෙබඳු ආහාර ඇතියෙම්, මෙබඳු සුව දුක් විඳුනෙම්, මෙබඳු ආයු කෙළවර කොටැතියෙම් අසෝතන්හි වීමි, ඒ මම් එතැතින් ච්‍යුත ව මෙහි උපන්මී"යි. මෙසේ ආකාර සහිත උද්දෙශ සහිත අනෙකවිධ වූ පූර්වේනිවාසය සිහි කෙරෙත්. වහන්ස, "භාග්‍යවතුන් වහන්සේ අනෙකවිධ පූර්වේනිවාසය සිහි කෙරෙත් නම්, ඒ කෙසේ ය යත්: එක් ජාතියක් ද ජාති දෙකක් ද ... මෙසේ ආකාර සහිත උද්දෙශ සහිත අනෙකවිධ පූර්වේනිවාසය සිහි කෙරෙත් ද, වහන්ස, මම් මෙ කරුණ ද දක්මින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරම නිපච්චාකාරයක් කරමි, මෛත්‍රී සම්ප්‍රයුක්ත උපහාර දක්වමි.

9. පුනචපරං භන්තෙ භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත- මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති. "ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචී -පෙ- මනොදුච්චරිතෙන සමන්නාගතා -පෙ- අරියානං උපවාදකා මිච්ඡා- දිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදනා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කාය සුචරිතෙන සමන්නාගතා වචී -පෙ- මනො -පෙ- අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදනා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. යම්පි භන්තෙ භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත- මානුසකෙන යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉමම්පි ඛො අහං භන්තෙ අත්ථවසං සම්පස්සමානො භගවති එව රූපං පරමනිපච්චාකාරං කරොමි. මෙත්තූපහාරං උපදංසෙමි,

10. පුනචපරං භන්තෙ භගවා ආසවානං ඛයා අනාසවං චෙතො- විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. යම්පි භන්තෙ භගවා ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති ඉමම්පි ඛො අහං භන්තෙ අත්ථවසං සම්පස්සමානො භගවති එවරූපං පරමනිපච්චාකාරං කරොමි, මෙත්තූපහාරං උපදංසෙමි.

හන්දදනි මයං භන්තෙ ගච්ඡාම බහුකිච්චා මයං බහුකරණීයාති.

යස්සදනි ත්වං මහාරාජ කාලං මඤ්ඤසීති.

අථ ඛො රාජා පසෙනදී කොසලො උට්ඨායාසනා භගවන්තං අභිවා- දෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමී ති.

## මහාවග්ගො තතියො.

තත්‍රුද්දනං:-

සීහාධිවුත්තිකායෙන වුත්තෙන කසිණෙන ච
කාලී දෙව මහාපඤ්ඤ කොසලෙහි පරෙ දුවෙ.

9. තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මිනිසැස ඉක්ම පවත්නා විශුද්ධ වූ දිවැසින් ච්‍යුත වන්නා වූත් උපදනා වූත් හීන වූත් ප්‍රණීත වූත් සුවර්ණ වූත් දුර්වර්ණ වූත් සත්ත්‍වයන් දක්නාහ. කම් වූ පරිදි මියන සත්‍වයන් දක්නාහ. "මේ භවත් සත්ත්‍වයෝ කායදුශ්චරිතයෙන් සමන්වාගතයහ. වාක් ... මනොදුශ්චරිතයෙන් සමන්වාගතයහ ... අරිනට උපවාද කරන්නාහු ගත් මිසදිටු ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටික කර්මසමාදන කොට ඇත්තාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණියාහු වෙති. මේ භවත් සත්ත්‍වයෝත් කාය සුචරිතයෙන් සමන්වාගත වූවාහු වාක් ... මනො ... අරිනට උපවාද නො කරන්නාහු සම්‍යක්දෘෂ්ටික වූවාහු සම්‍යක්දෘෂ්ටික කර්මසමාදන ඇත්තාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහු වෙතියි මෙසේ මිනිසැස ඉක්ම පවත්නා විශුද්ධ වූ දිවැසින් ච්‍යුත වන්නා වූත් උපදනා වූත් හීන වූත් ප්‍රණීත වූත් සුවර්ණ වූත් දුර්වර්ණ වූත් සුගත වූත් දුර්ගති ඇත්තා වූත් සත්ත්‍වයන් දක්නාහ. යථාකර්මොපග සත්ත්‍වයන් දන්නාහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මිනිසැස ඉක්ම පවත්නා විශුද්ධ වූ දිවැසින් ... යථා කර්මොපග සත්ත්‍වයන් දන්නාහ" යන යමෙක් ඇත් ද, වහන්ස, මම් මෙ කරුණ ද මොනොවට දක්නෙම් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපත්‍යාකාරයක් කරමි, මෛත්‍රී සම්ප්‍රයුක්ත උපහාරය දක්වමි.

10. තවද වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥවිමුක්තිය ඉහාත්මයෙහි ම තුමූ විශිෂ්ට-ඥනයෙන් දැන පසක් කොට එළඹ වාසය කරත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ආස්‍රවක්ෂයෙන් ... පසක් කොට එළඹ වෙසෙත් යන යමක් ඇත් නම් වහන්ස, මම් මෙ කරුණ ද මොනොවට දක්නෙම් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙබඳු පරමනිපත්‍යාකාරයක් කරමි. මෛත්‍රී සම්ප්‍රයුක්ත උපහාරය දක්වමි.

වහන්ස, දැන් අපි යමු, අපි බොහෝ කිස ඇත්තම්හ, බොහෝ කරණී ඇත්තම්හ යි.

මහරජ, යමක් සඳහා දැන් කල් නම් එය දනුව යි. ඉක්බිති පසෙනදී කොසල රජ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියේ යි.

## තුන් වැනි මහාවර්ග යි.

**එහි උද්දනය:**

සීහනාද සූත්‍රය, අධිවුත්තිපද සූත්‍රය, කාය සූත්‍රය, මහාචුන්ද සූත්‍රය, කසිණ සූත්‍රය, කාලී සූත්‍රය, මහාපඤ්ඤ සූත්‍ර දෙකය, කොසල සූත්‍ර දෙක යැයි සූත්‍ර දශයෙකි.

# 4. උපාලිවග්ගො

## 10. 1. 4. 1
## උපාලි සුත්තං

[සාවත්ථි]

අථ ඛො ආයස්මා උපාලි යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපාලි භගවන්තං එතදවොච:

කති නු ඛො භන්තෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛා-පදං පඤ්ඤත්තං ? පාතිමොක්ඛං උද්දිට්ඨන්ති ?

දස ඛො උපාලි අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං. පාතිමොක්ඛං උද්දිට්ඨං කතමෙ දස: සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසු-තාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසු විහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං-පටිඝාතාය, අප්පසන්නානං පසාදය, පසන්නානං භියොභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය,

ඉමෙ ඛො උපාලි දස අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛා-පදං පඤ්ඤත්තං, පාතිමොක්ඛං උද්දිට්ඨන්ති.

## 10. 1. 4. 2
## පාතිමොක්ඛට්ඨපන සුත්තං

[සාවත්ථි]

කති නු ඛො භන්තෙ පාතිමොක්ඛට්ඨපනානීති ?

දස ඛො උපාලි පාතිමොක්ඛට්ඨපනා කතමෙ දස: පාරාජිකො තස්සං පරිසායං නිසින්නො හොති, පාරාජිකකථා විප්පකතා හොති, අනුප-සම්පන්නො තස්සං පරිසායං නිසින්නො හොති, අනුපසම්පන්නකථා විප්ප-කතා හොති, සික්ඛං පච්චක්ඛාතකො තස්සං පරිසායං නිසින්නො හොති, සික්ඛං පච්චක්ඛාතකථා විප්පකතා හොති, පණ්ඩකො තස්සං පරිසායං නිසින්නො හොති, පණ්ඩකකථා විප්පකතා හොති, භික්ඛුනීදූසකො තස්සං පරිසායං නිසින්නො හොති, භික්ඛුනීදූසකකථා විප්පකතා හොති. ඉමෙ ඛො උපාලි දස පාතිමොක්ඛට්ඨපනාති.

# 4. උපාලිවර්ගය

## 10. 1. 4. 1
## උපාලි සූත්‍රය

**[සැවැත්]**

එකල්හි ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙලෙ සැල කළහ:

වහන්ස, කෙතෙක් කරුණු පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයනට ශික්ෂාපද පනවන ලද ද? පාමොක් උදෙසන ලද දූ යි?

උපාලි, කරුණු දසයක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපද පනවන ලද, පාමොක් උදෙසන ලදී. කවර දසයෙක යත්: සඞ්ඝයාගේ සෞෂ්ඨවය පිණිස ය, සඞ්ඝයාගේ පහසුබව පිණිස ය, දුසිල් පුද්ගලයනට නිග්‍රහ පිණිස ය, ප්‍රියශීල භික්ෂූන්ගේ පහසුවිහරණය පිණිස ය, දෘෂ්ටධාර්මික ආස්‍රවයන්ගේ සංවරය පිණිස ය, සාම්පරායික ආස්‍රවයන් නැසීම පිණිස ය, අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස ය, ප්‍රසන්නයන්ගේ භූයොභාවය පිණිස ය, සද්ධර්මයාගේ සථිතිය පිණිස ය, විනයානුග්‍රහය පිණිය යි.

උපාලි, මෙ කරුණු දසය පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපද පනවන ලද, පාමොක් උදෙසනලද්දූ යි.

## 10. 1. 4. 2
## පාතිමොක්ඛට්ඨපන සූත්‍රය

**[සැවැත්]**

වහන්ස, පාමොක් තැබීම්හු කෙතෙකැයි?

උපාලි, පාමොක් තැබීම්හු දසයෙක. කවර දසයෙක යත්: පරිජිඅවන්නෙක් එ පිරිස්හි හුන්නේ වෙයි, පාරාජික කථාව කොට අඩහළ වෙයි, අනුපසපන්නෙක් එ පිරිස්හි හුන්නේ වෙයි, අනුපසම්පන්නකථාව කොට අඩහළ වෙයි, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කෙළේ එ පිරිස්හි හුන්නේ වෙයි, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන කළහු පිළිබඳ කථාව කොට අඩහළ වෙයි, පණ්ඩකයෙක් එ පිරිස්හි හුන්නේ වෙයි, පණ්ඩකකථාව කොට අඩහළ වෙයි, භික්ෂුණීදූෂකයෙක් එ පිරිස්හි හුන්නේ වෙයි, භික්ෂුණීදූෂක කථාව කොට අඩහළ වෙයි. උපාලි, මෙ දස පාමොක් තැබීම්හු වෙති යි.

## 10. 1. 4. 3

## උබ්බාහිකා සුත්තං

[සාවත්ථි]

කති හි නු ඛො භන්තෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො හොති?

දසහි ඛො උපාලි ධම්මෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො කතමෙහි දසහි: ඉධූපාලි භික්ඛු සීලවා හොති පාතිමොක්ඛ සංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු, බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුව්‍යඤ්ජනසො, විනයෙ ඛො පන ඨිතො හොති අසංහීරො, පටිබලො හොති උභො අත්තපච්චත්ථිකෙ සඤ්ඤාපෙතුං පඤ්ඤාපෙතුං නිජ්ඣාපෙතුං පෙක්ඛිතුං පසාදෙතුං, අධිකරණසමුප්පාද-වූපසමකුසලො හොති, අධිකරණං ජානාති අධිකරණසමුදයං ජානාති අධිකරණනිරොධං ජානාති, අධිකරණනිරොධගාමිනීපටිපදං ජානාති. ඉමෙහි ඛො උපාලි දසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බොති.

## 10. 1. 4. 4

## උපසම්පද සුත්තං

[සාවත්ථි]

කතිහි නු ඛො භන්තෙ ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පා-දෙතබ්බන්ති?

දසහි ඛො උපාලි ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙ-තබ්බං. කතමෙහි දසහි; ඉධූපාලි භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවර-සංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භය-දස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු, බහුස්සුතො හොති සුතධරො සුතසන්නි චයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා.

## 10. 1. 4. 3

## උබ්බාහිකා සූත්‍රය

**[සැවැත්]**

වහන්ස, කෙතෙක් ධර්මයෙන් සමන්වාගත මහණෙක් උබ්බාහිකායෙන් සම්මත කළයුතු වේද?

උපාලි, දශ ධර්මයෙන් සමන්වාගත මහණ උබ්බාහිකායෙන් සම්මත කටයුත්තේ ය: කවර දසයෙකින යත්: උපාලි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවෘත වූයේ වාස කරයි. ආචාරගොචර සම්පන්න වූයේ අනුමාත්‍ර වරදෙහිදු බියදක්නා සුලුයේ ශික්ෂාපදවිෂයෙහි සමාදන් කොට ගෙණ හික්මෙයි. ශ්‍රැතධර වූයේ ශ්‍රැත සන්නිචය ඇතියේ බහුශ්‍රැත වෙයි. ආදි කල්‍යාණ වූ මධ්‍යයෙහි කල්‍යාණ වූ පර්‍ය්‍යවසානයෙහි කල්‍යාණ වූ සාර්ථ සව්‍යඤ්ජන වූ යම් ඒ ධර්ම කෙනෙක් කෙවල පරිපූර්ණ, පරිශුද්ධ, බ්‍රහ්මචර්‍ය්‍ය කියත් නම්, ඔහු විසින් එබඳු ධර්මයෝ බහුශ්‍රැත වෙති, ධෘතවෙති, වචනයෙන් පරිචිත වෙති, මනසින් අනුප්‍රෙක්ෂිත වෙත්, ප්‍රඥා දෘෂ්ටියෙන් සුප්‍රතිවිද්ධ වෙති, ඔහට උභය ප්‍රාතිමොක්ෂයෝ විස්තර විසින් ස්වාගත වෙති, සූත්‍ර විසින් ද අනුව්‍යඤ්ජන විසින් ද සුවිභක්ත වූවාහු මොනොවට පවත්නාහු සුවිනිශ්චිත වෙති. අසංයතවචනමාත්‍රයෙන් ස්වලබ්ධිය නො හරනේ විනයෙහි සිටියේ වෙයි. උභය අර්ථාපෙක්ෂකයන් හඟවනට දන්වනුවට දක්වනුවට බලවනුවට පහදවනුවට ප්‍රතිබල වෙයි. චතුර්විධාධිකරණ සමුත්පාදය සන්හිඳුවීමෙහි කුශල වේ. අධිකරණය දන්නේ ය, අධිකරණ සමුදය දන්නේ ය, අධිකරණ නිරොධය දන්නේ ය, අධිකරණනිරොධගාමිනීපටිපද දන්නේ යි. උපාලියෙනි, මේ දසදහමින් සමන්වාගත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළයුත්තේ යි.

## 10. 1. 4. 4

## උපසම්පද සූත්‍රය

**[සැවැත්]**

වහන්ස, කෙතෙක් ධර්මයෙන් සමන්වාගත මහණහු විසින් උපසම්පද-කළයුතු දැයි?

උපාලි, දශ ධර්මයෙකින් සමන්වාගත වූ මහණහු විසින් උපසම්පදව කළ යුතු ය. කවර දශයෙකින යත්: උපාලි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. පාමොක් සංවරයෙන් සංවෘත වූයේ ආචාර ගොචර සම්පන්න වූයේ වාස කෙරෙයි.. අණුමාත්‍ර වූද වරදෙහි බියදක්නා සුලුයේ සමාදන් කොට ගෙන සිකපෙදෙහි හික්මෙයි. ශ්‍රැතධර වූයේ ශ්‍රැතසන්නිචය ඇතියේ බහුශ්‍රැත වෙයි. ආදියෙහි කල්‍යාණ වන, මධ්‍යයෙහි කල්‍යාණ වන පර්‍ය්‍යවසානයෙහි කල්‍යාණ වන සාර්ථ සව්‍යඤ්ජන වූ යම් ඒ ධර්මයෝ කෙවල පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පවසත් නම්, ඔහු විසින් එබඳු ධර්මයෝ ධෘත වූවාහු බහුශ්‍රැත වෙති. වචනයෙන් පරිචිත වූහු මනැසින් අනුප්‍රෙක්ෂිත වූහු දිටුහයෙන් මොනොවට පිළිවිදියාහු වෙත්.

පාතිමොක්ඛං ඛො පනස්ස විත්ථාරෙන ස්වාගතං හොති සුවිභත්තං සුප්පවත්තං සුවිනිච්ඡිතං සුත්තසො අනුබ්‍යඤ්ජනසො, පටිබලො හොති ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, පටිබලො හොති අනභිරතිං වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, පටිබලො හොති උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනොදෙතුං, පටිබලො හොති උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, පටිබලො හොති අධිසීලෙ සමාදපෙතුං, පටිබලො හොති අධිචිත්තෙ සමාදපෙතුං, පටිබලො හොති අධිපඤ්ඤාය සමාදපෙතුං. ඉමෙහි ඛො උපාලි දසහි ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බන්ති.

## 10. 1. 4. 5

## නිස්සය සුත්තං

[සාවත්ථි]

කතිහි නු ඛො භන්තෙ ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා නිස්සයො දාතබ්බොති?

දසහි ඛො උපාලි ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා නිස්සයො දාතබ්බො. කතමෙහි දසහි: ඉධූපාලි භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා, පාතිමොක්ඛං ඛො පනස්ස විත්ථාරෙන ස්වාගතං හොති සුවිභත්තං සුප්පවත්තං සුවිනිච්ඡිතං සුත්තසො අනුබ්‍යඤ්ජනසො, පටිබලො හොති ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, පටිබලො හොති අනභිරතිං වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, පටිබලො හොති උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනොදෙතුං, පටිබලො හොති උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, පටිබලො හොති අධිසීලෙ -පෙ- අධිචිත්තෙ -පෙ- අධිපඤ්ඤාය සමාදපෙතුං. ඉමෙහි ඛො උපාලි දසහි ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා නිස්සයො දාතබ්බොති.

ඔහට ප්‍රාතිමොක්ෂය විස්තර විසින් ස්වාගත වෙයි. සූත්‍ර විසිනුදු අනුව්‍යඤ්ජන විසිනුදු සුවිභක්ත වූයේ මොනොවට පැවැත්තේ සුවිනිශ්චිත වෙයි. ගිලනහු උවටනුවට හෝ උවටන් කරවනුවට ප්‍රතිබල වෙයි. උකටලිබව දුරැලීමට චේවයි දුරු කරවීමට චේවයි ප්‍රතිබල වෙයි. උපන් කුකුස් ධර්මයෙන් සන්හිඳුවීමට ප්‍රතිබල වෙයි. උපන් දෘෂ්ටිගතය ධර්මයෙන් විවෙචන කිරීමට ප්‍රතිබල වෙයි. අධිශීලයෙහි සමාදන් කරවීමට ප්‍රතිබල වෙයි. අධිචිත්තයෙහි සමාදන් කරවනුවට ප්‍රතිබල වෙයි. අධිප්‍රඥයෙහි සමාදන් කරවනුවට ප්‍රතිබල වේ. උපාලි, මේ දසදහමින් සමන්වාගත මහණහු විසින් උපසම්පද කළයුතු වේ.

## 10. 1. 4. 5
## නිස්සය සූත්‍රය

[සැවැත්]

වහන්ස, කෙතෙක් කරුණින් සමන්වාගත මහණහු විසින් නිඃශ්‍රය දියයුතු දැයි?

උපාලි, දස කරුණෙකින් සමන්වාගත මහණහු විසින් නිඃශ්‍රය දිය යුත්තේය. කවර දසයෙකින යත්: උපාලි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි ... සමාදන් කොට ගෙන සිකපෙදෙහි හික්මෙයි ... බහුශ්‍රැත වෙයි. ... දෘෂ්ටියෙන් මොනොවට පිළිවිදින ලදහ. ඔහට ප්‍රාතිමොක්ෂය විතර විසින් ස්වාගත වෙයි. සූත්‍ර විසින් අනුව්‍යඤ්ජන විසින් සුවිභක්ත වූයේ මොනොවට පවත්වන ලදුයේ සුවිනිශ්චිත වෙයි. ගිලන් උවටනුවට චේවයි උවටවනුවට චේවයි සමර්ථ වෙයි. උකටලි බව සන්හිඳු-වනට හෝ සන්හිඳුවීම් කරවනුවට සමර්ථ වෙයි. උපන් කුකුස් දහැමින් දුරලනුවට සමර්ථ වෙයි. උපන් දෘෂ්ටිගතය ධර්මයෙන් දුරැලීමට ප්‍රතිබල වෙයි. අධිශීලයෙහි ... අධිචිත්තයෙහි ... අධිප්‍රඥයෙහි සමාදන් කරනුවට සමර්ථ වෙයි. උපාලි, මේ දසදහමින් සමන්වාගත වූ භික්ෂුහු විසින් නිඃශ්‍රය දියයුතු වේ.

## 10. 1. 4. 6

### සාමණෙර සුත්තං

[සාවත්ථි]

කතීහි නු ඛො භන්තෙ ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා සාම-ණෙරො උපට්ඨාපෙතබ්බොති?

දසහි ඛො උපාලි ධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා සාමණෙරො උපට්ඨාපෙතබ්බො. කතමෙහි දසහි: ඉධූපාලි භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා, පාතිමොක්ඛං ඛො පනස්ස විත්ථාරෙන ස්වාගතං හොති සුවිභත්තං සුප්පවත්තං සුවිනිච්ඡිතං සුත්තසො අනුබ්‍යඤ්ජනසො, පටිබලො හොති ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, පටිබලො හොති අනභිරතිං වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, පටිබලො හොති උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනොදෙතුං, පටිබලො හොති උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, පටිබලො හොති අධිසීලෙ සමාදපෙතුං. පටිබලො හොති අධිචිත්තෙ සමාදෙතුං. පටිබලො හොති අධිපඤ්ඤාය සමාදපෙතුං. ඉමෙහි ඛො උපාලි දසහිධම්මෙහි සමන්නාගතෙන භික්ඛුනා සාමණෙරො උපට්ඨාපෙතබ්බොති.

## 10. 1. 4. 7

### සඞ්ඝභෙද සුත්තං

[සාවත්ථි]

සඞ්ඝභෙදෙ සඞ්ඝභෙදොති භන්තෙ වුච්චති. කිත්තාවතා නුඛො භන්තෙ සඞ්ඝො භින්නො හොතීති?

ඉධූපාලි භික්ඛු අධම්මං "ධම්මො' ති දීපෙන්ති, ධම්මං 'අධම්මො'ති දීපෙන්ති, අවිනයං 'විනයො'ති දීපෙන්ති, විනයං 'අවිනයො' ති දීපෙන්ති, අභාසිතං අලපිතං තථාගතෙන'භාසිතං ලපිතං තථාගතෙනා'ති දීපෙන්ති, භාසිතං ලපිතං තථාගතෙන 'අභාසිතං අලපිතං තථාගතෙනා'ති දීපෙන්ති, අනාචිණ්ණං තථාගතෙන 'ආචිණ්ණං තථාගතෙනා'ති දීපෙන්ති, ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනා'ති දීපෙන්ති, අප්පඤ්ඤත්තං තථාගතෙන 'පඤ්ඤත්තං තථාගතෙනා'ති දීපෙන්ති, පඤ්ඤත්තං තථාගතෙන, අප්පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති. තෙ ඉමෙහි දසහි වත්ථූහි අවකස්සන්ති, විවකස්සන්ති, ආවෙනි කම්මානි කරොන්ති, ආවෙනි පාති-මොක්ඛං උද්දිසන්ති. එත්තාවතා ඛො උපාලි සඞ්ඝො භින්නො හොතී ති.

## 10. 1. 4. 6
## සාමණේර සූත්‍රය

[සැවැත්]

වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් සමන්වාගත මහණහු විසින් හෙරණ එළඹවාගත යුත්තේ දැයි?

උපාලියෙනි, දශාඞ්ගයෙකින් සමන්වාගත මහණහු විසින් හෙරණ එළවාගත යුත්තේය: කවර දශයෙකින යත්: උපාලියෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි .. සමාදන් කොට ගෙන සිකපෙදෙහි හික්මෙයි. ... බහුශ්‍රැත වෙයි ... ප්‍රඥදෘෂ්ටියෙන් මොනොවට පිළිවිදුනා ලදහ. ඔහට ප්‍රාතිමොක්ෂය විස්තර විසින් ස්වාගත වෙයි. සූත්‍ර විසිනුදු අනුව්‍යඤ්ජන විසිනුදු සුවිභක්ත වූයේ මොනොවට පවත්වන ලදුයේ සුවිනිශ්චිත වූයේ වෙයි. ගිලන්හු උවටනුවට හෝ උවටන්කරවන්නට ප්‍රතිබල වෙයි. උපන් අනභිරතිය සංහිඳුනට හෝ සංහිඳුවන්නට ප්‍රතිබල වෙයි. උපන් කුකුස ධර්මයෙන් දුරලීමට ප්‍රතිබල වෙයි. උපන් දෘෂ්ටිගතය ධර්මයෙන් දුරලීමට සමර්ථ වෙයි. අධිශීලයෙහි සමාදන් කරවනට සමර්ථ වෙයි. අධිචිත්තයෙහි සමාදන් කරවනට සමර්ථ වෙයි. අධිප්‍රඥයෙහි සමාදන් කරවනට සමර්ථ වෙයි. උපාලියෙනි, මේ දශාඞ්ගයෙන් සමන්වාගත මහණහු විසින් සාමණේරයෙක් එළවිය යුත්තේයි.

## 10. 1. 4. 7
## සඞ්ඝභෙද සූත්‍රය

[සැවැත්]

වහන්ස, සඞ්ඝභෙදය, සඞ්ඝභෙදයයි කියනු ලැබෙ. වහන්ස, කෙතෙක් කරුණින් සඞ්ඝභෙද වේ දැයි

උපාලියෙනි, මෙ සස්නෙහි මහණහු අධර්මය ධර්මයයි දක්වත්, ධර්මය 'අධර්ම'යයි දක්වත්, අවිනය විනයයි දක්වත්, විනය අවිනයයි දක්වත්, තථාගතයන් විසින් අභාසිත අලපිතය තථාගත විසින් භාෂිතය ලපිතයයි දක්වත්, තථාගත විසින් භාෂිතය ලපිතය තථාගත විසින් අභාෂිතය අලපිතයයි දක්වත්. තථාගත විසින් අනාචීර්ණය තථාගත විසින් ආචීර්ණයයි දක්වත්. තථාගත විසින් ආචීර්ණය තථාගත විසින් අනාචීර්ණ යයි දක්වත්, තථාගතයන් විසින් නො පනවන ලද්ද තථාගතයන් විසින් පනවන ලදැයි දක්වත්, තථාගතයන් විසින් පනවන ලද්ද තථාගතයන් විසින් නො පනවන ලදැයි දක්වත්, ඔහු මේ දශ වස්තුයෙන් (පිරිස) ඇද ගනිත්, අත්‍යර්ථයෙන් ඇද ගනිත්, වෙන් ව කර්ම කෙරෙත්, වෙන් ව පාමොක් උදෙසත්, උපාලියෙනි, මෙතෙකින් සඞ්ඝ භෙද වෙයි.

## 10. 1. 4. 8

## සඞ්ඝසාමග්ගි සුත්තං

[සාවත්ථි]

සඞ්ඝසාමග්ගී සඞ්ඝසාමග්ගීති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සඞ්ඝො සමග්ගො හොතී ති:

ඉධූපාලි භික්ඛූ අධම්මං අධම්මොති දීපෙන්ති, ධම්මං ධම්මො ති දීපෙන්ති, අවිනයං අවිනයොති දීපෙන්ති. විනයං විනයොති දීපෙන්ති, අභාසිතං අලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති, භාසිතං ලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති; අනාචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති, ආචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති, අපඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනා ති දීපෙන්ති, පඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති. තෙ ඉමෙහි දසහි වත්ථූහි න අවකස්සන්ති, න වවකස්සන්ති, න ආවෙනිකම්මානි කරොන්ති, න ආවෙනිපාතිමොක්ඛං උද්දිසන්ති. එත්තාවතා ඛො උපාලි සඞ්ඝො සමග්ගො හොතී ති.

## 10. 1. 4. 8
## සඞ්ඝ සාමග්ගි සූත්‍රය

[සැවැත්]

වහන්ස, සඞ්ඝ සාමග්ගිය, සඞ්ඝ සාමග්ගි යයි කියනු ලැබේ. වහන්ස, කෙතෙක් කරුණින් සඞ්ඝ සාමග්ගිය වේ දැයි?

උපාලියෙනි, මෙ සස්නෙහි මහණහු අධර්මය අධර්ම යයි දක්වත්. ධර්මය ධර්මයයි දක්වත්, අවිනය අවිනයයි දක්වත්, තථාගතයන් විසින් අභාෂිත අලපිතය තථාගතයන් විසින් අභාෂිත අලපිතයයි දක්වත්, තථාගතයන් විසින් භාෂිත ලපිතය තථාගතයන් විසින් භාෂිත ලපිතයයි දක්වත් තථාගතයන් විසින් අනාචීර්ණය තථාගතයන් විසින් අනාචීර්ණයයි දක්වත්, තථාගතයන් විසින් ආචීර්ණය තථාගතයන් විසින් ආචීර්ණයයි දක්වත්, තථාගතයන් විසින් නො පනවන ලද්ද තථාගතයන් විසින් නො පනවන ලදයි දක්වත්, තථාගතයන් විසින් පනවන ලද්ද තථාගතයන් විසින් පනවන ලදයි දක්වත්, ඔහු මේ දශ වස්තුයෙන් පිරිස නො ඇද ගනිත්, අත්‍යන්තීයෙන් නො ඇද ගනිත්, වෙන්ව කර්ම නො කෙරෙත්, වෙන්ව ප්‍රාතිමොක්ෂය නො උදෙසත්, උපාලියෙනි, මෙතෙක් කරුණින් සඞ්ඝ සාමග්ගිය වේ.

# 10. 1. 4. 9

## පඨම-ආනන්ද සුත්තං

**[සාවත්ථි]**

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසංකමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

සඞ්ඝභෙදො සඞ්ඝභෙදො'ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ සඞ්ඝො භින්නො හොතී ති.

ඉධානන්ද භික්ඛූ අධම්මං ධම්මොති දීපෙන්ති, ධම්මං අධම්මොති දීපෙන්ති, අවිනයං විනයොති දීපෙන්ති, විනයං අවිනයොති දීපෙන්ති, අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති, භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති, අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනා ති දීපෙන්ති ආචිණ්ණං, තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනා'ති දීපෙන්ති. අප්පඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති, පඤ්ඤත්තං තථාගතෙන අප්පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති. තෙ ඉමෙහි දසහි වත්ථූහි අවකස්සන්ති, වවකස්සන්ති, ආවෙනිකම්මානි කරොන්ති, ආවෙනි පාතිමොක්ඛං උද්දිසන්ති. එත්තාවතා ඛො ආනන්ද සඞ්ඝො භින්නො හොති ති.

සමග්ගං පන භන්තෙ සඞ්ඝං භින්දිත්වා[1] කිං සො පසවතී ති?
කප්පට්ඨියං[2] ආනන්ද කිබ්බිසං පසවතීති.
කිං පන භන්තෙ කප්පට්ඨියං කිබ්බිසන්ති?
කප්පං ආනන්ද නිරයම්හි පච්චතීති.

1. ආපායිකො නෙරයිකො කප්පට්ඨො සඞ්ඝභෙදකො
වග්ගරතො අධම්මට්ඨො - යොගක්ඛෙමා[3]පධංසති
සඞ්ඝං සමග්ගං භෙත්වාන - කප්පං නිරයම්හි පච්චතීති.

---

1. භෙත්වා-සිමු
2. කප්පට්ඨිකං-මජසං
3. යොගක්ඛෙමතො-සිමු

## 10. 1. 4. 9

## ප්‍රථම-ආනන්ද සූත්‍රය

**[සැවැත්]**

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ මොනොවට වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල කරුණ සැල කළහ:

වහන්ස, සඞ්ඝ භේදය සඞ්ඝ භේදය යි කියනු ලැබෙයි. වහන්ස, කෙතෙක් කරුණින් සඞ්ඝ භේදය වේදැයි?

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණහු අධර්මය ධර්මය යි දක්වත්, ධර්මය අධර්මය යි දක්වත්, අවිනය විනය යි දක්වත්, විනය අවිනය යි දක්වත්, තථාගතයන් විසින් අභාෂිත අලපිතය තථාගතයන් විසින් භාෂිතය ලපිත යයි දක්වත්, තථාගතයන් විසින් භාෂිත ලපිතය තථාගතයන් විසින් අභාෂිතය අලපිතයයි දක්වත්, තථාගතයන් විසින් අනාචීර්ණය තථාගතයන් විසින් ආචීර්ණයයි දක්වත්, තථාගතයන් විසින් ආචීර්ණය තථාගතයන් විසින් අනාචීර්ණ යයි දක්වත්, තථාගතයන් විසින් අප්‍රඥප්තය තථාගතයන් විසින් ප්‍රඥප්තයයි දක්වත්, තථාගතයන් විසින් ප්‍රඥප්තය තථාගතයන් විසින් අප්‍රඥප්තයයි දක්වත්, ඔහු මේ දශ වස්තුයෙන් පිරිස ඇද ගනිත්, අත්‍යර්ථයෙන් ඇද ගනිත්, ආවෙනි කර්ම කෙරෙත්, ආවෙනි ප්‍රාතිමොක්ෂය උදෙසත්, ආනන්දයෙනි, මෙතෙක් කරුණින් සඞ්ඝ භේදය වේ.

වහන්ස, සමග සඞ්ඝයා බිඳුවා හේ කුමක් ප්‍රසව කෙරේ දැයි?

ආනන්දයෙනි, සමග සඞ්ඝයා බිඳුවා හේ කල්පස්ථායී පාපවිපාකය ප්‍රසව කෙරෙයි.

වහන්ස කල්පස්ථායී කිල්විෂය නම් කවර?

ආනන්දයෙනි, ආයුෂ්කල්පයක් නිරැහි පැසේ යයි.

1. 'අධර්මයෙහි සිටුනා භේදයෙහි ඇලුණු අපායට යන සුලු නිරයෙහි උපදනා කල්පස්ථායී සඞ්ඝ භේදකයා යොගක්ෂෙම සංඛ්‍යාත අර්හත්වයෙන් පිරිහෙයි. සමග සඟුන් බිඳ කපක් නිරැහි පැසේ යයි.

## 10. 1. 4. 10

## දුතිය-ආනන්ද සුත්තං

[සාවත්ථි]

සඞ්ඝසාමග්ගී සඞ්ඝසාමග්ගීති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සඞ්ඝො සමග්ගො හොතීති?

ඉධානන්ද භික්ඛූ අධම්මං අධම්මොති දීපෙන්ති. ධම්මං ධම්මොති දීපෙන්ති. අවිනයං අවිනයොති දීපෙන්ති, විනයං විනයොති දීපෙන්ති. අභාසිතං අලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති. භාසිතං ලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති. අනාචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති. ආචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති. අපඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති. පඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති. තෙ ඉමෙහි දසහි වත්ථූහි න අවකස්සන්ති, න වවකස්සන්ති න ආවෙනිකකම්මානි කරොන්ති. න ආවෙනිපාතිමොක්ඛං උද්දිසන්ති. එත්තාවතා ඛො ආනන්ද සඞ්ඝො සමග්ගො හොතීති.

භින්නං පන භන්තෙ සඞ්ඝං සමග්ගං කත්වා කිං සො පසවතී ති?

බ්‍රහ්මං ආනන්ද පුඤ්ඤං පසවතීති.
කිං පන භන්තෙ බ්‍රහ්මං පුඤ්ඤන්ති?
කප්පං ආනන්ද සග්ගම්හි මොදතීති.

1 සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානඤ්ච අනුග්ගහො
සමග්ගරතො ධම්මට්ඨො යොගක්ඛෙමා න ධංසති
සඞ්ඝං සමග්ගං කත්වාන කප්පං සග්ගම්හි මොදතීති.

### උපාලිවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

උපාලිඨපන උබ්බාහො - උපසම්පද නිස්සයෙන ච
සාමණෙරො ච ද්වෙ භෙද ආනන්දෙහි පරෙ දුවෙති.

## 10. 1. 4. 10
## ද්විතීය–ආනන්ද සූත්‍රය

[සැවැත්]

වහන්ස, සඞ්ඝ සාමග්‍රිය, සඞ්ඝ සාමග්‍රිය යි කියනු ලැබේ. වහන්ස, කෙතෙක් කරුණින් සඞ්ඝයා සමග වේ දැයි?

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණහු අධර්මය අධර්මයයි දක්වති, ධර්මය ධර්මයයි දක්වති, අවිනය අවිනයයි දක්වති, විනය විනයයි දක්වති, තථාගතයන් විසින් අභාෂිත අලපිතය තථාගතයන් විසින් අභාෂිතය අලපිතය යි දක්වති, තථාගතයන් විසින් භාෂිත ලපිතය තථාගතයන් විසින් භාෂිත ලපිතය යි දක්වති. තථාගතයන් විසින් අනාචීර්ණය තථාගතයන් විසින් අනාචීර්ණය යි දක්වති, තථාගතයන් විසින් ආචීර්ණය තථාගතයන් විසින් ආචීර්ණය යි දක්වති. තථාගතයන් විසින් අප්‍රඥප්තය තථාගතයන් විසින් අප්‍රඥප්තය යි දක්වති, තථාගතයන් විසින් ප්‍රඥප්තය තථාගතයන් විසින් ප්‍රඥප්තය යි දක්වත්. ඔහු මේ දශ වස්තුයෙන් පිරිස නො ඇද ගනිති, අත්‍යර්ථයෙන් නො ඇද ගනිති, ආවෙනි කර්ම නො කෙරෙති, ආවෙනි ප්‍රාතිමොක්ෂය නො උදෙසත් යි. ආනන්දයෙනි, මෙතෙක් කරුණින් සඞ්ඝයා සමග වේ යයි.

වහන්ස, බුන් සඟහු සමග කොට හේ කුමක් ප්‍රසව කෙරේ දැයි?

ආනන්දයෙනි, බ්‍රහ්ම පුණ්‍යය ප්‍රසව කෙරේ යයි.

වහන්ස, බ්‍රහ්ම පුණ්‍යය කවර?

ආනන්දයෙනි, ආයුෂ්කල්පයක් ස්වර්ගයෙහි සතුටු වේ යයි.

1. සඟුන්ගේ සමගිය සුවැතියේ වෙයි. සමග සඟුන්ගේ අනුග්‍රහය ද සුවැතියේ ය. සමගියෙහි ඇලුනේ ධර්මස්ථ වූයේ යොග ක්ෂෙමයෙන් නො පිරිහෙයි. සඟුන් සමග කොට කපක් සගෙහි ප්‍රමොදිතවේ යයි.

## සතර වැනි උපාලි වර්ග යි.

**එහි උද්දානය:**

උපාලි සූත්‍රය, පාතිමොක්ඛට්ඨපන සූත්‍රය, උබ්බාහිකා සූත්‍රය, උපසම්පදා සූත්‍රය, නිස්සය සූත්‍රය, සාමණේර සූත්‍රය, සඞ්ඝ භෙද සූත්‍රය, සඞ්ඝ සාමග්‍රී සූත්‍රය, ආනන්ද සූත්‍ර දෙක දැයි මේ වර්ගයෙහි සූත්‍ර දශයෙකි.

# 5. අක්කොසවග්ගො

## 10. 1. 5. 1

### විවාද සුත්තං

**[සාවත්ථි]**

අථ ඛො ආයස්මා උපාලි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපාලි භගවන්තං එතදවොච:

“කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො යෙන සඞ්ඝෙ භණ්ඩන–කලහවිග්ගහවිවාද උප්පජ්ජන්ති භික්ඛු ච න ඵාසු විහරන්ති” ති?

ඉධූපාලි භික්ඛූ අධම්මං ධම්මොති දීපෙන්ති, ධම්මං අධම්මොති දීපෙන්ති, අවිනයං විනයොති දීපෙන්ති, විනයං අවිනයොති දීපෙන්ති, අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති; භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති, අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති, ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති, අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති, පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති. අයං ඛො උපාලි හෙතු අයං පච්චයො යෙන සඞ්ඝෙ භණ්ඩන කලහ විග්ගහ විවාද උප්පජ්ජන්ති, භික්ඛූ ච න ඵාසු විහරන්ති ති.

# 5. අකොක්‍රාසවර්ගය

## 10. 1. 5. 1
## විවාද සූත්‍රය

**[සැවැත්නිදාන යි]**

එකල්හි ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකස්‍රා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ:

වහන්ස, යම් හෙයෙකින් සඞ්ඝයාගේ භණ්ඩන කලහ විග්‍රහ විවාදයෝ උපදනාහු නම් භික්ෂූහු ද පහසු සේ නො වෙසෙත් නම් ඒ හේතු කවර, ඒ ප්‍රත්‍යය කවරැ?යි.

උපාලියෙනි, මෙ සස්නෙහි මහණහු අධර්මය ධර්මයයි දක්වත්, ධර්මය අධර්මයයි දක්වත්, අවිනය විනයයි දක්වත්, විනය අවිනයයි දක්වත්, තථාගතයන් විසින් අභාෂිතය අලපිතය තථාගතයන් විසින් භාෂිත ය ලපිත යයි දක්වත්, භාග්‍යවතුන් වහන්සේ විසින් භාෂිතය ලපිතය තථාගතයන් විසින් අභාෂිත ය අලපිත යයි දක්වත්, තථාගතයන් විසින් අනාචීර්ණය තථාගතයන් විසින් ආචීර්ණ යයි දක්වත්, තථාගතයන් විසින් ආචීර්ණය තථාගතයන් විසින් අනාචීර්ණයයි දක්වත්, තථාගත-යන් විසින් අප්‍රඥප්තය තථාගතයන් විසින් ප්‍රඥප්ත යයි දක්වත්, තථාගතයන් විසින් ප්‍රඥප්තය තථාගතයන් විසින් අප්‍රඥප්ත යයි දක්වත්, උපාලියෙනි, යම් හෙයෙකින් සඞ්ඝයා කෙරෙහි භණ්ඩන කලහ විග්‍රහ විවාදයෝ උපදනාහු නම්, භික්ෂූහු ද පහසු සේ නො වෙසෙත් නම් මේ ඒ හේතු ය, මේ ඒ ප්‍රත්‍යය යි.

## 10. 1. 5. 2

## පඨම විවාදමූල සුත්තං

[සාවත්ථිනිදානං]

කති නු ඛො භන්තෙ විවාදමූලානීති?

දස ඛො උපාලි විවාදමූලානි. කතමානි දස: ඉධූපාලි භික්ඛූ අධම්මං ධම්මොති දීපෙන්ති. ධම්මං අධම්මොති දීපෙන්ති. අවිනයං විනයොති දීපෙන්ති. විනයං අවිනයොති දීපෙන්ති. අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති, භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති. අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති, ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති. අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති. පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති. ඉමානි ඛො උපාලි දස විවාදමූලානීති.

## 10. 1. 5. 3

## දුතිය විවාදමූල සුත්තං

[සාවත්ථිනිදානං]

කති නු ඛො භන්තෙ විවාදමූලානීති?

දස ඛො උපාලි විවාද මූලානි. කතමානි දස? ඉධූපාලි භික්ඛූ අනාපත්තිං ආපත්තීති දීපෙන්ති. ආපත්තිං අනාපත්තීති දීපෙන්ති. ලහුකං ආපත්තිං ගරුකං ආපත්තීති දීපෙන්ති. ගරුකං ආපත්තිං ලහුකං ආපත්තීති දීපෙන්ති. දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති. අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලාපත්තීති දීපෙන්ති. සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්ති. අනවසෙසං ආපත්තිං සාවසෙසාපත්තීති දීපෙන්ති. සප්පටිකම්මං ආපත්තිං අප්පටිකම්මා ආපත්තීති දීපෙන්ති. අප්පටිකම්මං ආපත්තිං සප්පටිකම්මා ආපත්තීති දීපෙන්ති. ඉමානි ඛො උපාලි දස විවාදමූලානීති:

## 10. 1. 5. 2
## ප්‍රථම විවාදමූල සූත්‍රය

**[සැවැත්නිදාන යි]**

වහන්ස, විවාදමූලයෝ කෙතෙක් දැයි?

උපාලියෙනි, විවාදමූලයෝ දසයෙක. කවර දසයෙක යත්: උපාලි මෙ සස්නෙහි මහණහු අධර්මය ධර්ම යයි දක්වත්, ධර්මය අධර්ම යයි දක්වත්, අවිනය විනය යි දක්වත්, විනය අවිනය යි දක්වත්, තථාගතයන් විසින් අභාෂිතය අලපිතය තථාගතයන් විසින් භාෂිතය ලපිත යයි දක්වත්, තථාගතයන් විසින් භාෂිතය ලපිතය අභාෂිත ය අලපිත යයි දක්වත්, තථාගතයන් විසින් අනාචීර්ණය තථාගතයන් විසින් ආචීර්ණ යයි දක්වත්, තථාගතයන් විසින් ආචීර්ණය තථාගතයන් විසින් අනාචීර්ණ යයි දක්වත්, තථාගතයන් විසින් අප්‍රඥප්තය තථාගතයන් විසින් ප්‍රඥප්ත යයි දක්වත්, තථාගතයන් විසින් අප්‍රඥප්තය තථාගතයන් විසින් ප්‍රඥප්ත යයි දක්වත්, තථාගතයන් විසින් ප්‍රඥප්තය තථාගතයන් විසින් අප්‍රඥප්ත යයි දක්වත්, උපාලියෙනි, මේ දස විවාදමූලයෝ යි.

## 10. 1. 5. 3
## ද්‍රිතිය විවාදමූල සූත්‍රය

**[සැවැත්නිදාන යි]**

වහන්ස, විවාදමූල කෙතෙක් දැයි?

උපාලියෙනි, විවාදමූල දසයෙකි. කවර දසයෙක යත්: උපාලියෙනි, මෙසස්නෙහි භික්ෂුහු අනාපත්තිය ආපත්ති යයි දක්වත්, ආපත්තිය අනාපත්ති යයි දක්වත්, ලහුකාපත්තිය ගරුකාපත්ති යයි දක්වත්, ගරුකාපත්තිය ලහුකාපත්ති යයි දක්වත්, දුට්ඨුල්ලාපත්තිය අදුට්ඨුල්ලාපත්ති යයි දක්වත්, අදුට්ඨුල්ලාපත්තිය දුට්ඨුල්ලාපත්ති යයි දක්වත්, සාවසෙසාපත්තිය අනවසෙසාපත්ති යයි දක්වත්, අනවසෙසාපත්තිය සාවසෙසාපත්ති යයි දක්වත්, සප්පටිකම්මාපත්තිය අප්පටිකම්මාපත්ති යයි දක්වත්, අප්පටිකම්මාපත්තිය සප්පටිකම්මාපත්ති යයි දක්වත්, උපාලියෙනි, මේ දසවිවාදමූල යි.

## 10. 1. 5. 4

## කුසිනාරා සුත්තං

එකං සමයං භගවා කුසිනාරායං විහරති බලිහරණෙ වනසණ්ඩෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

චොදකෙන භික්ඛවෙ භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං පච්චවෙක්ඛිත්වා පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බො කතමෙ පඤ්ච ධම්මා අජ්ඣත්තං පච්චවෙක්ඛිතබ්බා:

චොදකෙන භික්ඛවෙ භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්ච-වෙක්ඛිතබ්බං: පරිසුද්ධකායසමාචාරො නු ඛොම්හි, පරිසුද්ධෙනම්හි කාය-සමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන. සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො ති. නො චෙ භික්ඛු පරිසුද්ධකායසමා-චාරො හොති පරිසුද්ධෙන කායසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන, තස්ස භවන්ති වත්තාරො "ඉඞ්ඝ තාව ආයස්මා කායිකං සික්ඛස්සූ"ති ඉතිස්ස භවන්ති වත්තාරො.

පුනචපරං භික්ඛවෙ චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: "පරිසුද්ධවචීසමාචාරො නු ඛොම්හි" පරිසුද්ධෙනම්හි වචීසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නොති නො චෙ භික්ඛවෙ භික්ඛු පරිසුද්ධ වචීසමාචාරො හොති, පරිසුද්ධෙන වචීසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන, තස්ස භවන්ති වත්තාරො, "ඉඞ්ඝ තාව ආයස්මා වාචසිකං සික්ඛස්සූ"ති. ඉතිස්ස භවන්ති වත්තාරො.

පුනචපරං භික්ඛවෙ චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: "මෙත්තං නු ඛො මෙ චිත්තං පච්චුපට්ඨිතං සබ්‍රහ්ම-චාරීසු අනාඝාතං, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො"ති. නො චෙ භික්ඛවෙ භික්ඛුනො මෙත්තං චිත්තං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්ම චාරීසු අනාඝාතං, තස්ස භවන්ති වත්තාරො, "ඉඞ්ඝ තාව ආයස්මා සබ්‍රහ්ම-චාරීසු මෙත්තං චිත්තං පච්චුපට්ඨපෙහී"ති. ඉතිස්ස භවන්ති වත්තාරො.

## 10. 1. 5. 4

## කුසිනාරා සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුසිනාරායෙහි බලිහරණ නම් වන ලැහැබ්හි වාසය කරනසේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

මහණෙනි, මෙරමාහට චෝදනා කරනු කැමැති චෝදක මහණහු විසින් කරුණු පසක් තමා කෙරෙහි ප්‍රත්‍යවේක්‍ෂා කොට තමා කෙරෙහි කරුණු පසක් එළවා මෙරමා චෝදනා කළයුතු. කවර කරුණු පසෙක් තමා කෙරෙහි ප්‍රත්‍යවෙක්ෂා කළයුතු වේ යැ යත්:

මහණෙනි, පරහට චෝදනා කරනු කැමැති චෝදක භික්ෂූහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු: අච්ඡිද්‍ර වූ ප්‍රත්‍යාමශී නො කට හැකි වූ පරිශුද්ධ කායසමාචාරයෙන් සමන්වාගත වූයෙම් පරිශුද්ධ කායසමාචාර ඇතියෙම් දැයි, මෙල දහම මට විද්‍යමාන වේද නො හොත් අවිද්‍යමානවේදැයි. ඉදින් මහණ අච්ඡිද්‍රවූ ප්‍රත්‍යාමශී නො කට හැකි පරිශුද්ධ කායසමාචාරයෙන් සමන්-වාගත වූයේ පරිශුද්ධ කායසමාචාරය ඇතියේ නො වේද ඔහට "එසේ නම් ආයුෂ්මත් පළමු ම කායිකසමාචාරයෙහි හික්මෙව"යි කියන්නාහු වෙත්. මෙසේ ඔහට කියන්නාහු වෙත් මැයි.

තවද මහණෙනි, පරහට චෝදනා කරනු කැමැති චෝදක මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු: "අච්ඡිද්‍ර වූ ප්‍රත්‍යාමශී නො කට හැකි පරිශුද්ධ වාක්සමාචාරයෙන් සමන්වාගතයෙම් පරිශුද්ධ වාක්සමාචාර ඇති-යෙම් ද, මට මෙල දහම විද්‍යමාන වේද නැතහොත් අවිද්‍යමාන වේදැ"යි. ඉදින් මහණ අච්ඡිද්‍ර වූ ප්‍රත්‍යාමශී නො කට හැකි පරිශුද්ධ වාක්සමාචාරයෙන් සමන්වාගත වූයේ පරිශුද්ධ වාක්සමාචාර ඇතියේ නො වේ නම් ඔහට "එසේ නම් ආයුෂ්මත් පළමුව වාක්සමාචාරයෙහි හික්මෙව"යි කියන්නාහු වෙති. ඔහට මෙසේ කියන්නාහු ම වෙති.

තව ද මහණෙනි, පරහට චෝදනා කරනු කැමැති චෝදක මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු: "සබ්‍රම්සරුන් කෙරෙහි ආඝාත රහිත මාගේ මෙත් සිත එළඹ සිටියේ ද මට මෙල දහම විද්‍යමාන වේද නො හොත් අවිද්‍යමාන වේදැ"යි. ඉදින් මහණහුගේ ආඝාත විරහිත මෙත් සිත සබ්‍රම්සරුන් කෙරෙහි එළඹ නො සිටියේ නම් ඔහට "ඇයුෂ්මත් එසේ නම් පළමු ව සබ්‍රම්සරුන් කෙරෙහි මෙත්සිත පිහිටුව"යි කියන්නැහු වෙති. ඔහට මෙසේ කියන්නාහු වෙත්ම ය.

පුනචපරං භික්ඛවෙ චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: “බහුස්සුතො නු ඛොම්හි සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා, මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපා මෙ ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදහු නො”ති. නො චෙ භික්ඛවෙ භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. තස්ස භවන්ති වත්තාරො: “ඉඞ්ඝ තාව ආයස්මා ආගමං පරියාපුණස්සූ”ති. ඉතිස්ස භවන්ති වත්තාරො,

පුනචපරං භික්ඛවෙ චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං. “උභයානි නු ඛො මෙ පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති, සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො. උදහු නො”ති. නො චෙ භික්ඛවෙ භික්ඛුනො උභයානි පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. ඉදං පනායස්මා “කත්ථ වුත්තං භගවතා”ති ඉති පුට්ඨො න සම්පායති, තස්ස භවන්ති වත්තාරො: “ඉඞ්ඝ තාව ආයස්මා විනයං සික්ඛස්සූ”ති ඉතිස්ස භවන්ති වත්තාරො. ඉමෙ පඤ්ච ධම්මා අජ්ඣත්තං පච්චවෙක්ඛිතබ්බා.

කතමෙ පඤ්චධම්මා අජ්ඣත්තං උපට්ඨපෙතබ්බා: කාලෙන වක්ඛාමි නො අකාලෙන, භූතෙන වක්ඛාමි නො අභූතෙන, සණ්හෙන වක්ඛාමි නො ඵරුසෙන, අත්ථසංහිතෙන වක්ඛාමි නො අනත්ථසංහිතෙන. මෙත්තචිත්තො වක්ඛාමි නො දොසන්තරොති. ඉමෙ පඤ්ච ධම්මා අජ්ඣත්තං උපට්ඨපෙතබ්බා.

චොදකෙන භික්ඛවෙ භික්ඛුනා ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං පච්චවෙක්ඛිත්වා, ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බොති.

තව ද මහණෙනි, අන්හට චෝදනා කරනු කැමැති චෝදක මහණහු විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු: “ශ්‍රුතධර වූයෙම් ශ්‍රුතසන්නිචය ඇතියෙම් බහුශ්‍රුතයෙම් ද සාත්ථ සව්‍යඤ්ජන වූ ආදි කල්‍යාණ වූ මධ්‍ය කල්‍යාණ වූ පර්‍යවසාන කල්‍යාණ වූ යම් ඒ ධර්ම කෙනෙක් කෙවල පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කරත් නම් මා විසින් එබඳු දහම්හු ධෘත වූවාහු බහුශ්‍රුත වෙත් ද, වචනයෙන් පරිචිත වෙත් ද, මනසින් අනුප්‍රෙක්ෂිත වෙත් ද ප්‍රඥාදෘෂ්ටියෙන් සුප්‍රතිවිද්ධ වෙත් ද මට තෙල දහම විද්‍යමාන ද නැත හොත් අවිද්‍යමාන දැ”යි. ඉදින් මහණ ශ්‍රුතධර වූයේ, ශ්‍රුතසන්නිචය ඇතියේ බහුශ්‍රුත නො වේ නම් සාත්ථ සව්‍යඤ්ජන වූ ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ පර්‍යවසානකල්‍යාණ වූ යම් ඒ ධර්ම කෙනෙක් කෙවල පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍යය පවසත් නම් ඔහු විසින් එබඳු ධර්මයෝ ධෘත–බහුශ්‍රුත නො වෙත් නම් වචනයෙන් පරිචිත නො වෙත් නම් මනසින් අනුප්‍රෙක්ෂිත නො වෙත් නම් දෘෂ්ටියෙන් සුප්‍රතිවිද්ධ නො වෙත් නම් ඔහට “එසේ නම් ආයුෂ්මත් පළමු ව ආගමය පිරිවහව”යි කියන්නාහු වෙති. ඔහට මෙසේ කියන්නාහු ම වෙත්.

තව ද මහණෙනි, අනිකකුට චෝදනා කරනු කැමැති චෝදක මහණ විසින් මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කටයුතු: “මට උභය ප්‍රාතිමොක්ෂයෝ සුවිභක්ත වූවාහු මොනොවට පවත්නාහු සූත්‍ර විසින් අනුව්‍යඤ්ජන විසින් සුවිනිශ්චිත වූවාහු විස්තර විසින් ස්වාගත වෙත් ද මට තෙල දහම විද්‍යමාන ද නැත හොත් අවිද්‍යමාන දැ”යි. ඉදින් මහණහට උභය ප්‍රාතිමොක්ෂයෝ සුවිභක්ත වූවාහු මොනොවට පවත්නාහු සූත්‍ර විසින් අනුව්‍යඤ්ජන විසින් සුවිනිශ්චිත වූවාහු විස්තර විසින් ස්වාගත නො වෙත් නම් “ආයුෂ්මත්නි, මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් කොහි දෙසන ලද දැ”යි. මෙසේ පුළුවුස්නා ලදුයේ නො සපයා නම් ඔහට “ආයුෂ්මත් එසේ නම් පළමු ව විනයෙහි හික්මෙව”යි කියන්නාහු වෙති. ඔහට මෙසේ කියන්නාහු ම වෙති. මේ පඤ්ච ධර්මයෝ අධ්‍යාත්මයෙහි ප්‍රත්‍යවෙක්ෂා කටයුතුවහ.

කවර පඤ්ච ධර්ම කෙනෙක් අධ්‍යාත්මයෙහි එළවිය යුතුවහ යත්: නො කල්හි නොව කල්හි ම කියනෙමි අභූතයෙන් නොව භූතයෙන් කියනෙමි පරුෂයෙන් නොව මොළොකින් කියනෙමි අනර්ථසංහිත ව නොව අර්ථසංහිත ව කියනෙමි ද්වේෂ චිත්තයෙන් නොව මෙත්සිත් ඇතියෙම් කියනෙමි මේ පඤ්ච ධර්මයෝ අධ්‍යාත්මයෙහි එළවිය යුතු වෙත්.

මහණෙනි, චෝදක මහණහු විසින් මේ පස් දහම් තමා තුළ ප්‍රත්‍යවෙක්ෂා කොට මේ පස් දහම් තමා තුළ එළවා පරා චෝදනා කටයුත්තේ යි.

# 10. 1. 5. 5

## රාජනෙතපුරපපවෙසන සුත්තං

**[සාවත්ථි]**

දසඉමෙ භික්ඛවෙ ආදීනවා රාජන්තෙපුරප්පවෙසනෙ. කතමෙ දස:

1. ඉධ භික්ඛවෙ රාජා මහෙසියා සද්ධිං නිසින්නො හොති, තත්‍ර භික්ඛු පවිසති, මහෙසී වා භික්ඛුං දිස්වා සිතං පාතු කරොති, භික්ඛු වා මහෙසිං දිස්වා සිතං පාතු කරොති, තත්ථ රඤ්ඤො එවං හොති: ''අද්ධා ඉමෙසං කතං වා කරිස්සන්ති වා''ති. අයං භික්ඛවෙ පඨමො ආදීනවො රාජන්තෙපුරප්ප– වෙසනෙ.

2. පුනචපරං භික්ඛවෙ රාජා බහුකිච්චො බහුකරණීයො අඤ්ඤතරං ඉත්ථිං ගන්ත්වා න සරති, සා තෙන ගබ්භං ගණ්හාති, තත්ථ රඤ්ඤො එවං හොති: ''න ඛො ඉධ අඤ්ඤො කොචි පවිසති. අඤ්ඤත්‍ර පබ්බජිතෙන, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්ති. අයං භික්ඛවෙ දුතියො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

3. පුනචපරං භික්ඛවෙ රඤ්ඤො අන්තෙපුරෙ අඤ්ඤතරං රතනං නස්සති තත්ථ රඤ්ඤො එවං හොති: ''න ඛො ඉධ අඤ්ඤො කොචි පවිසති අඤ්ඤත්‍ර පබ්බජිතෙන, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්ති''. අයං භික්ඛවෙ තතියො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

4. පුනචපරං භික්ඛවෙ රඤ්ඤො අන්තෙපුරෙ අබ්භන්තරා ගුය්හමන්තා බහිද්ධා සම්භෙදං ගච්ඡන්ති. තත්ථ රඤ්ඤො එවං හොති: ''න ඛො ඉධ අඤ්ඤො කොචි පවිසති අඤ්ඤත්‍ර පබ්බජිතෙන, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්ති. අයං භික්ඛවෙ චතුත්ථො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

5. පුනචපරං භික්ඛවෙ රඤ්ඤො අන්තෙපුරෙ පිතා වා පුත්තං පත්ථෙති, පුත්තො, වා, පිතරං, පත්ථෙති, තෙසං එවං හොති: ''න ඛො ඉධ අඤ්ඤො කොචි පවිසති අඤ්ඤත්‍ර පබ්බජිතෙන, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්ති, අයං භික්ඛවෙ පඤ්චමො ආදීනවො රාජනෙතපුරප්පවෙසනෙ.

6. පුනචපරං භික්ඛවෙ රාජා නීචට්ඨානීයං උච්චෙ ඨානෙ ඨපෙති. යෙසං තං අමනාපං තෙසං එවං හොති: ''රාජා ඛො පබ්බජිතෙන සංසට්ඨො, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්ති.'' අයං භික්ඛවෙ ඡට්ඨො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

## 10. 1. 5. 5

## රාජන්තෙපුරප්පවෙසන සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, රාජාන්තඃපුරප්‍රවෙශයෙහි මේ ආදීනවයෝ දස දෙනෙකි. කවර දස දෙනෙක යත්:

1. මහණෙනි, රජ තෙම මෙහෙසිය හා සමග හුන්නේ වෙයි, මහණ එහි පිවිසෙයි. මෙහෙසිය හෝ මහණහු දැක සිනහ පහළ කෙරෙයි. මහණ හෝ මෙහෙසිය දැක සිනහ පාළ කෙරෙයි. එහි ලා රජහට මෙබඳු සිතෙක් වෙයි: ''එකැතින් මොවුන් විසින් අසද්ධර්ම කෙළේ දෝ හෝ කරත් දෝ හෝ''යි. මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි පළමුවන ආදීනව යි.

2. තව ද මහණෙනි, රජ බහුකෘත්‍ය ව බහුකරණීය ව සිට අන්‍යතර ස්ත්‍රියක කරා ගොස් සඳහන් නො කෙරෙයි. ඕ එයින් ගබ් ගනියි. එහි ලා රජුට මෙසේ සිත් වෙයි: ''මෙ ඇතොරට පැවිද්දකු විනා අන් කිසිවෙක් නො වදනේ ය. පැවිද්දහුගේ කමෙක දෝ හෝ''යි. මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි මේ දෙවෙනි ආදීනව යි.

3. තව ද මහණෙනි, රජුගේ ඇතොරෙහි අන්‍යතර රත්නයෙක් නස්නේ ය. එහි ලා රජුට මෙසේ සිත් වෙයි: ''මෙහි පැවිද්දහු මිස අන් කිසිවෙක් නො වදනේ ය. පැවිද්දහුගේ කමෙක දෝ හෝ''යි. මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි තෙවන ආදීනවය යි.

4. තව ද මහණෙනි, රජුගේ ඇතොරෙහි වූ අභ්‍යන්තර ගුහ්‍යමන්ත්‍රණයෝ බැහැර පළට බවට යෙත්. එහි ලා රජුට මෙසේ සිත් වෙයි: ''මෙහි පැවිද්දකු මිස අන් කිසිවෙක් නො වදනේ ය, පැවිද්දහුගේ කමෙක දෝ හෝ''යි. මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි සතරවන ආදීනව යි.

5. තව ද මහණෙනි, රජුගේ ඇතොරෙහි පියා හෝ පුතු නස්නා පතයි. පුතා හෝ පියා නස්නා පතයි. ඔවුනට මෙසේ සිත් වෙයි: ''මෙහි පැවිද්දහු මිස අන් කිසිවෙක් නො වදනේ ය. පැවිද්දහුගේ කමෙක් දෝ හෝ''යි. මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි පස්වන ආදීනව යි.

6. තව ද මහණෙනි, රජ යටතට නිසියකු උස්තැන තබයි. යම් කෙනකුට ඒ අමනාප වේ ද, ඔවුනට මෙසේ සිත් වෙයි: ''රජ පැවිද්දහු හා සමග සසඟ වෙයි, පැවිද්දහුගේ කමෙක් දෝ හෝ''යි, මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි සවන ආදීනව යි.

7. පුනචපරං භික්ඛවෙ රාජා උච්චට්ඨානීයං නීචෙ ඨානෙ ඨපෙති යෙසං තං අමනාපං තෙසං එවං හොති: "රාජා ඛො පබ්බජිතෙන සංසට්ඨො, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්ති". අයං ඛො භික්ඛවෙ සත්තමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

8. පුනචපරං භික්ඛවෙ රාජා අකාලෙ සෙනං උය්‍යොජෙති, යෙසං තං අමනාපං, තෙසං එවං හොති: "රාජා ඛො පබ්බජිතෙන සංසට්ඨො, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්ති." අයං භික්ඛවෙ අට්ඨමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

9. පුනචපරං භික්ඛවෙ රාජා කාලෙ සෙනං උය්‍යොජෙත්වා අන්තරාමග්ගතො නිවත්තාපෙති, යෙසං තං අමනාපං තෙසං එවං හොති. " රාජා ඛො පබ්බජිතෙන සංසට්ඨො, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්ති." අයං භික්ඛවෙ නවමො ආදීනවො. රාජන්තෙපුරප්පවෙසනෙ.

10. පුනචපරං භික්ඛවෙ රඤ්ඤො අන්තෙපුරං හත්ථිසම්මද්දං අස්සසම්මද්දං රථසම්මද්දං[1] රජනීයානි රූප සද්ද ගන්ධරසඵොට්ඨබ්බානි යානි න පබ්බජිත සාරුප්පානි. අයං භික්ඛවෙ දසමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

ඉමෙ ඛො භික්ඛවෙ දස ආදීනවා රාජන්තෙපුරප්පවෙසනෙති.

## 10. 1. 5. 6

### සක්‍ය සුත්තං

එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ අථ ඛො සම්බහුලා සක්‍යා[2] උපාසකා තදහුපොසථෙ යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො සක්‍යෙ උපාසකෙ භගවා එතදවොච: "අපි නු ඛො තුම්හෙ සක්‍යා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසථා"ති?

"අප්පෙකදා මයං භන්තෙ අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසාම, අප්පෙකදා න උපවසාමා"ති. තෙසං වො සක්‍යා අලාභා තෙසං දුල්ලද්ධං යෙ තුම්හෙ එවං සොකසභයෙ ජීවිතෙ මරණසභයෙ ජීවිතෙ අප්පෙකදා අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසථ, අප්පෙකදා න උපවසථ, තං කිං මඤ්ඤථ සක්‍යා, ඉධ පුරිසො යෙන කෙනචි කම්මට්ඨානෙන අනාපජ්ජ[3] අකුසලං දිවසං අඩ්ඪකහාපණං නිබ්බිසෙය්‍ය, දක්ඛො පුරිසො උට්ඨානසම්පන්නොති අලං වචනායාති? එවං භන්තෙ,

1. හත්ථිසම්මද්දං, අස්සසම්මද්ද, රථසම්මද්දං, - සීමු 2. සක්කයා, මජසං
3. අනාපජ්ජං, - සීමු.

7. තවද මහණෙනි, රජ උස්තැනට නිසිය හු යටත් තැන තබන්නේ ය. යම් කෙනකුන්ට එය අමනාප වේ ද, ඔවුනට මෙසේ සිත් වෙයි: ''රජ පැවිද්දහු හා සමග සසට වෙයි. පැවිද්දහුගේ කමෙක් වේ දෝ හෝ''යි. මහණෙනි, ඇතොරට වැදීමෙහි මේ සත්වන ආදීනව යි.

8. තවද මහණෙනි, රජ අකාලයෙහි සෙන් මෙහෙයයි. යම් කෙනකුට ඒ අමනාප වේ ද, ඔවුනට මෙසේ සිත් වෙයි: ''රජ පැවිද්දහු හා සමග සසට වෙයි. පැවිද්දහුගේ කමෙක් දෝ හෝ''යි. මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි අටවන ආදීනව යි.

9. තවද මහණෙනි, රජ නිසිකල සෙන් මෙහෙයා අතරමඟින් නවත්වා ලයි. යම් කෙනකුට ඒ අමනාප වේද ඔවුනට මෙසේ සිත් වෙයි: 'රජ පැවිද්දහු හා සමග සසට වෙයි. පැවිද්දහුගේ කමෙක් දෝ හෝ''යි. මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි නවවන ආදීනව යි.

10. තවද මහණෙනි, රජුගේ ඇතොර හස්තිසම්මර්දය අශ්වසම්මර්දය රථ සම්මර්දය වෙයි. පැවිද්දනට නොසරුප් යම් රූපාදීහු ඇද්ද රජනීය වූ ඒ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයෝ ඇත. මහණෙනි, මේ ඇතොරට වැදීමෙහි දසවන ආදීනව යි.

මහණෙනි, ඇතොරට වැදීමෙහි මේ දස ආදීනවයෝ යි.

## 10. 1. 5. 6

## සක්ක සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කපිලවාස්තුයෙහි නිග්‍රෝධාරාමයෙහි වැඩවසන සේක. එකල බොහෝ සැහැ උවසුවෝ පොහෝ ලත් එදින භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ ඇදුරු කොට වැඳ එකත්පස් ව හුන්හ. භාග්‍යවතුන් වහන්සේ එකත්පස් ව හුන් සැහැ උවසුවනට මෙල වදළ සේක: ''ශාක්‍යයෙනි, තෙපි අටඟින් යුතු පෙහෙවස් වසවුද''යි.

වහන්ස, අපි කිසි දිනෙක අටඟින් යුත් පෙහෙවස් වසම්හ. කිසි දිනෙක නො වසම්හ යි. ශාක්‍යයෙනි, යම් බඳු තෙපි මෙසේ ශෝකයෙන් බිය ඇති දිවි වැටෙත් ම මරණයෙන් බිය ඇති දිවිවැටෙත් ම කිසි දිනක අෂ්ටාඞ්ග සමන්වාගත පෙහෙවස් වසව් නම් කිසි දිනක නො වසව් නම් ඒ තොපට අලාභයෙක. ඒ තොපට නපුරු කොට ලැබීමෙක. ශාක්‍යයෙනි, ඒ කෙසේ හඟිව් ද? මෙලොව පුරුෂයෙක් යම් ම කර්මාන්තයෙකින් අකුශලයට නො වදනේ දවසට අඩකහවණුවක් උපදවන්නේ ය. දක්ෂ පුරුෂයෙක. උත්ථාන වීර්‍යසම්පන්නයෙකැයි කියනට නිසි වේද? වහන්ස එසේය.

තං කිං මඤ්ඤථ සක්‍යා, ඉධ පුරිසො යෙන කෙනචි කම්මට්ඨානෙන අනාපජ්ජ අකුසලං දිවසං කහාපණං නිබ්බිසෙය්‍ය, දක්ඛො පුරිසො උට්ඨානසම්පන්නොති අලං වචනායාති? එවං භන්තෙ,

තං කිං මඤ්ඤථ සක්‍යා, ඉධ පුරිසො යෙන කෙනචි කම්මට්ඨානෙන අනාපජ්ජ අකුසලං දිවසං ද්වෙ කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- තයො කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- චත්තාරො කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- පඤ්ච කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- ඡ කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- සත්ත කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- අට්ඨ කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- නව කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- දස කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- වීසති කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- තිංස කහාපණෙ නිබ්බිසෙය්‍ය -පෙ- චත්තාරීසං කහාපණෙ නිබ්බිසෙය්‍ය, පඤ්ඤාසං කහාපණෙ නිබ්බිසෙය්‍ය, "දක්ඛො පුරිසො උට්ඨානසම්පන්නො"ති අලං වචනායාති? එවං භන්තෙ,

තං කිම්මඤ්ඤථ සක්‍යා, අපි නු සො පුරිසො දිවසෙ දිවසෙ කහාපණසතං කහාපණසහස්සං නිබ්බිසමානො ලද්ධං ලද්ධං නික්ඛිපන්තො වස්සසතායුකො වස්සසතජීවී මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡෙය්‍යාති? එවං භන්තෙ,

තං කිං මඤ්ඤථ සක්‍යා, අපි නු සො පුරිසො භොගහෙතු භොගනිදානං භොගාධිකරණං එකං වා රත්තිං එකං වා දිවසං උපඩ්ඪං වා රත්තිං උපඩ්ඪං වා දිවසං එකන්තසුඛපටිසංවෙදී විහරෙය්‍යාති? නො හෙතං භන්තෙ,

තං කිස්ස හෙතු?

කාමා හි භන්තෙ අනිච්චා තුච්ඡා මුසා මොසධම්මාති.

ඉධ ඛො පන වො සක්‍යා මම සාවකො දස වස්සානි අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො යථා මයානුසිට්ඨං තථා පටිපජ්ජමානො සතම්පි වස්සානි සතම්පි වස්සසතානි සතම්පි වස්සසහස්සානි සතම්පි වස්සසතසහස්සානි එකන්තසුඛපටිසංවෙදී විහරෙය්‍ය, සො ච ඛ්වස්ස සකදාගාමී වා අනාගාමී වා අපණ්ණකං වා සොතාපන්නො, තිට්ඨන්තු සක්‍යා දස වස්සානි.

ශාක්‍යයෙනි, එ කෙසේ හඟිවුද? මෙහි මෙලොව පුරුෂයෙක් යම් ම කර්මාන්තයෙකින් අකුශලයට නො වදනේ දවසට කහවණුවක් උපයනේ ය. දක්ෂ පුරුෂයෙක, උත්ථානවීය්‍ය්‍යසම්පන්නයෙකැයි කියනට නිසි වේ ද? වහන්ස, එසේ ය.

ශාක්‍යයෙනි, ඒ කිමැයි හඟිවු ද? මෙ ලොව පුරුෂයෙක් යම් ම කර්මාන්තයෙකින් අකුසලට නො වදනේ දවසට දෙකහවණුවක් උපයනේය... තුන් කහවණුවක් උපයනේ ය... සතර කහවණුවක් උපයනේ ය... පස් කහවණුවක් උපයනේ ය... ස කහවණුවක් උපයනේ ය... සත් කහවණුවක් උපයනේ ය... අට කහවණුවක් උපයනේ ය... නව කහවණුවක් උප-යනේ ය... දස කහවණුවක් උපයනේ ය... විසි කහවණුවක් උපයනේ ය... තිස් කහවණුවක් උපයනේ ය... සතලිස් කහවණුවක් උපයනේ ය... පනස් කහවණුවක් උපයනේ ය. "දක්ෂ පුරුෂයෙක, උත්ථාන වීය්‍ය්‍ය සම්පන්නයෙකැයි කියන්නට නිසි වේ ද? වහන්ස, එසේය.

ශාක්‍යයෙනි, ඒ කිමැයි හඟිවු ද? ඒ පුරිස් දවස දවස කහවණු සියක් කහවණු දහසක් උපයනේ ලද ලද කහවණු නික්ෂෙප කරනුයේ ශතවර්ෂා යුෂ්ක වූයේ සියක් වස් දිවි වටනුයේ මහත් භොගස්කන්ධයක් ලබන්නේ දැයි? වහන්ස, එසේය.

ශාක්‍යයෙනි, එ කුමැයි හඟිව ද? එ පුරිස් භොගහෙතුවෙන් භොග-නිදානයෙන් භොගාධිකරණයෙන් එක් රැයක් වේව යි එක් දවසක් වේවයි අඩ රැයක් වේවයි. අඩ දවසක් වේවයි එකාන්තසුඛ විඳින සුලුයේ වාසය කෙරේ දැයි? වහන්ස, තෙල නො වේ ම ය.

එ කවර හෙයින යත්: වහන්ස, කාමයෝ වනාහි අනිත්‍යයහ, තුච්ඡයහ, මෘෂාය. නස්නා සුල්ලහයි.

ශාක්‍යයෙනි, මෙ සස්නෙහි මාගේ සව්වෙක් දස වසක් අප්‍රමත්ත වූයේ කෙලෙස් තවන වැර ඇතියේ ප්‍රහිතාත්ම වූයේ වාසය කරනුයේ මා විසින් යම්සේ අනුසස්නා ලද නම් එසේ පිළිපදනේ සියවසකුදු සියවස් සියයකුදු සියවස් දහසකුදු සියවස් සියදහසකුදු එකාන්තසුඛ විඳිනුයේ වාසය කෙරෙයි. හෙද වනාහි සකෘදගාමී හෝ අනාගාමී හෝ අවිරුද්ධ කොට සෝවන් හෝ වෙයි. ශාක්‍යයෙනි, දසවසක් තිබේවා,

ඉධ මම සාවකො නව වස්සානි අට්ඨ වස්සානි-පෙ- සත්ත වස්සානි- ඡ වස්සානි - පඤ්ච වස්සානි - චත්තාරි වස්සානි - තීණි වස්සානි - ද්වෙ වස්සානි - එකං වස්සං අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො යථා මයානුසිට්ඨං තථා පටිපජ්ජමානො සතම්පි වස්සානි- සතම්පි වස්ස සතානි සතම්පි වස්සසහස්සානි- සතම්පි වස්සසතසහස්සානි එකන්ත සුඛ පටිසංවෙදී විහරෙය්‍ය: සො ච ඛ්වස්ස සකදාගාමී වා අනාගාමී වා අපණ්ණකං වා සොතාපන්නො.

තිට්ඨතු සක්‍යා එකං වස්සං. ඉධ පන සාවකො දස මාසෙ අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො යථා මයානුසිට්ඨං තථා පටිපජ්ජමානො සතම්පි වස්සානිසතම්පි වස්සසතානි-සතම්පි වස්සසහස්සානි- සතම්පි වස්සසතසහස්සානි එකන්තසුඛපටිසංවෙදී විහරෙය්‍ය සො ච ඛ්වස්ස සකදාගාමී වා අනාගාමී වා අපණ්ණකං වා සොතාපන්නො.

තිට්ඨන්තු සක්‍යා දස මාසා ඉධ මම සාවකො නව මාසෙ - අට්ඨ මාසෙ - සත්ත මාසෙ - ඡ මාසෙ - පඤ්ච මාසෙ - චත්තාරො මාසෙ - තයො මාසෙ - ද්වෙ මාසෙ - එකං මාසං - අඩ්ඪමාසං - අප්පමත්තො ආතාපී පහිතත්තො යථා මයානුසිට්ඨං තථා පටිපජ්ජමානො සතම්පි වස්සානි - සතම්පි වස්සසතානි - සතම්පි වස්ස සහස්සානි - සතම්පි. වස්සසතසහස්සානි එකන්තසුඛපටිසංවෙදී විහරෙය්‍ය, සො ච ඛ්වස්ස සකදාගාමී වා අනාගාමී වා අපණ්ණකං වා සොතාපන්නො

තිට්ඨතු සක්‍යා අඩ්ඪමාසො ඉධ මම සාවකො දස රත්තින්දිවෙ අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො යථා මයානුසිට්ඨං තථා පටිපජ්ජමානො සතම්පි වස්සානි - සතම්පි වස්සසතානි - සතම්පි වස්සසහස්සානි - සතම්පි වස්සසතසහස්සානි එකන්ත සුඛපටිසංවෙදී විහරෙය්‍ය, සො ච ඛ්වස්ස සකදාගාමී වා අනාගාමී වා අපණ්ණකං වා සොතාපන්නො.

තිට්ඨතු සක්‍යා දස රත්තින්දිවා. ඉධ මම සාවකො නව රත්තින්දිවෙ-අට්ඨ රත්තින්දිවෙ - සත්ත රත්තින්දිවෙ - ඡ රත්තින්දිවෙ - පඤ්ච රත්තින්දිවෙ - චත්තාරො රත්තින්දිවෙ - තයො රත්තින්දිවෙ - ද්වෙ රත්තින්දිවෙ - එකං රත්තින්දිවං අප්පමත්තොආතාපී පහිතත්තො විහරන්තො යථා මයානුසිට්ඨං තථා පටිපජ්ජමානො සතම්පි වස්සානි - සතම්පි වස්සසතානි - සතම්පි වස්ස සහස්සානි - සතම්පි වස්සසතසහස්සානි එකන්තසුඛපටිසංවෙදී විහරෙය්‍ය,

මෙසස්නෙහි මගේ සවු නව වසක්... අට වසක්... සත් වසක්... සවසක් .. පස් වසක්... සිවු වසක්... තුන් වසක්... දෙවසක්... එක් වසක් අප්‍රමත්ත වූයේ ආතාප ඇතියේ ප්‍රහිතාත්ම වූයේ වසනුයේ මවිසින් යම්සේ අනුසස්නා ලද නම් එසේ පිළිපදනෝ සියවසකුදු සියවස්සියයකුදු සියවස් දහසකුදු සියවස් සියදහසකුදු එකාන්තසුඛ විඳිනුයේ වාසය කෙරෙයි. හෙද වනාහි සෙදගැමි හෝ අනගැමි හෝ අවිරාධ කොට සෝවන් හෝ වෙයි.

ශාක්‍යයෙනි, එක් වසෙක් තිබේවා, මෙ සස්නෙහි මාගේ සවු දසමසක් අප්‍රමත්ත වූයේ ආතාප ඇතියේ ප්‍රහිතාත්ම වූයේ වසනුයේ ම විසින් යම් පරිදි අනුසස්නා ලද නම් එ පරිදි පිළිපදනෝ සියක් වසකුදු සියවස් සියයකුදු සහස්වස් සියයකුදු සුවහස්වස් සියයකුදු එකාන්තසුඛ විඳිනුයේ වෙසෙයි. හෙද සෙදගැමි හෝ අනගැමි හෝ අවිරාධ කොට සෝවන් හෝ වෙයි.

ශාක්‍යයෙනි, දසමසෙක් තිබේවා, මෙ සස්නෙහි මාගේ සවු නව මසක්......අට මසක්......සත් මසක්.......සමසක්...... පස්මසක්...... සිවුමසක්...තෙමසක්...දෙමසක්...එක්මසක්...... අඩමසක් අප්‍රමත්ත වූයේ ආතාප ඇතියේ ප්‍රහිතාත්ම ව වසනුයේ ම විසින් යම් පරිදි අනුසස්නා ලද නම් එ පරිදි පිළිපදනෝ සියවසකුදු සියවස් සියයකුදු සහස්වස් සියයකුදු සුවහස්වස් සියයකුදු එකාන්ත සුඛවිඳිනුයේ වාසය කෙරෙයි. හෙද වනාහි සෙදගැමි හෝ අනගැමි හෝ අවිරාධ කොට සෝවාන් හෝ වෙයි.

ශාක්‍යයෙනි, අඩමසෙක් තිබේවා, මෙ සස්නෙහි ම සවු දස රෑදවලක් අප්‍රමත්ත වූයේ ආතාප ඇතියේ ප්‍රහිතාතම ව වසනුයේ ම විසින් යම් පරිදි අනුසස්නා ලද නම් එ පරිදි පිළිපදනෝ සියවසකුදු සියවස් සියයකුදු සහස්වස් සියයකුදු සුවහස් වස් සියයකුදු එකානතසුඛ විඳිනුයේ වාසය කෙරෙයි. හෙද වනාහි සෙදගැමි හෝ අනගැමි හෝ අවිරාධ කොට සෝවන් හෝ වෙයි.

ශාක්‍යයෙනි, දස රෑදවලෙක් තිබේවා, මෙ සස්නෙහි ම සවු නව රෑදවලක් ......අට රෑදවලක්......සත් රෑදවලක්...... ස රෑදවලක්......පස් රෑදවලක්...... සිවු රෑ දවලක්......තුන් රෑ දවලක්......දෙ රෑදවලක්......එක් රෑදවලක් අප්‍රමත්ත වූයේ ආතාප ඇතියේ ප්‍රහිතාතම ව වසනුයේ ම විසින් යම් පරිදි අනුසස්නා ලද නම් එ පරිදි පිළිපදනෝ සියවසකුදු සියවස් සියයකුදු දහස්වස් සියයකුදු සුවහස් වස් සියයකුදු එකානතසුඛ විඳිනුයේ වෙසෙයි.

සො ච බවස්සසකදාගාමී වා අනාගාමී වා අපණ්ණකං වා සොතාපන්නො.

තෙසං වො සක්‍යා අලාභා, තෙසං දුල්ලද්ධං, යෙ තුම්හෙ එවං සොකසභයෙ ජීවිතෙ මරණසභයෙ ජීවිතෙ අප්පෙකද්‍ අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසථ, අප්පෙකද්‍ න උපවසථාති.

එතෙ මයං භන්තෙ අජ්ජතග්ගෙ අට්ඨඞ්ගසමන්නාගතං උපොසථං උපවසිස්සාමාති.

## 10. 1. 5. 7

## මහාලි සුත්තං

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං අථ ඛො මහාලි ලිච්ඡවි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහාලි ලිච්ඡවි භගවන්තං එතදවොච:

"කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, පාපස්ස කම්මස්ස කිරියාය, පාපස්ස කම්මස්ස පවත්තියාති?"

ලොභො ඛො මහාලි හෙතු, ලොභො පච්චයො පාපස්ස කම්මස්ස කිරියාය, පාපස්ස කම්මස්ස පවත්තියා. දොසො ඛො මහාලි හෙතු, දොසො පච්චයො, පාපස්ස කම්මස්ස කිරියාය, පාපස්ස කම්මස්ස පවත්තියා, මොහො ඛො මහාලි හෙතු, මොහො පච්චයො පාපස්ස කම්මස්ස කිරියාය, පාපස්ස කම්මස්ස පවත්තියා. අයොනිසො මනසිකාරො ඛො මහාලි හෙතු, අයොනිසො මනසිකාරො පච්චයො පාපස්ස කම්මස්ස කිරියාය, පාපස්ස කම්මස්ස පවත්තියා, මිච්ඡා පණිහිතං ඛො මහාලි චිත්තං හෙතු, මිච්ඡා පණිහිතං චිත්තං පච්චයො පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා, අයං ඛො මහාලි හෙතු, අයං පච්චයො පාපස්ස කම්මස්ස කිරියාය, පාපස්ස කම්මස්ස පවත්තියා ති.

හෙ ද වනාහි සෙදගැමි හෝ අනාගැමි හෝ අවිරාධ කොට සෝවන් හෝ වෙයි.

ශාක්‍යයෙනි, ඒ තෙපි මෙසේ ශෝකයෙන් සභය වූ ජීවිතයෙහි මෙසේ මරණින් සභය වූ ජීවිතයෙහි කිසි දිනෙක අටඟින් යුත් පෙහෙවස් වසවු නම්, කිසි දිනක නො වසවු නම් ඒ තොපට අලාභයෙක, ඒ තොපට නපුරු කොට ලැබීමෙක.

වහන්ස, තෙල අපි අද පටන් කොට අටඟින් යුත් පෙහෙවස් වසම්හ යි.

## 10. 1. 5. 7
## මහාලි සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර සමීපයෙහි වූ මහා වන කූලාරහල්හි වැඩ වෙසෙති. එසඳ මහාලි ලිච්ඡවී රජ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ අදුරු කොට වැද එකත්පස් ව හින. එකත්පස් ව හුන් මහාලි ලිච්ඡවී රජ භාග්‍යවතුන් වහන් සේට තෙල සැලකෙළේ ය.

වහන්ස, පාපක්‍රියා කරන්නට වෙවයි පාපක්‍රියා පවත්නට වෙවයි හෙතු කවරේ ය? ප්‍රත්‍යය කවරේ ය?

මහාලිය පාපක්‍රියා කරන්නට වෙවයි පාපක්‍රියා පවත්නට වෙවයි ලොභය හෙතු වන්නේ ය. ලොභය ප්‍රත්‍යය වන්නේ ය. මහාලිය පාපක්‍රියා කරන්නට වෙවයි පාපක්‍රියා පවත්නට වෙවයි ද්වෙෂය හේතු වන්නෝ ය. ද්වෙෂය ප්‍රත්‍යය වන්නේ ය. මහාලිය පාපක්‍රියා කරන්නට වෙවයි පාපක්‍රියා පවත්නට වෙවයි මොහය හෙතු වන්නේය, මොහය ප්‍රත්‍යය වනනේ ය. මහාලිය, පාපක්‍රියා කරන්නට වෙවයි පාපක්‍රියා පවත්නට වෙවයි අයොනිසොමනසිකාරය හෙතු වන්නේ ය. අයොනිසොමනසිකාරය ප්‍රත්‍යය වන්නේ ය. මහාලිය, පාපක්‍රියා කරන්නට වෙවයි පාපක්‍රියා පවත්නට වෙවයි නො සෙ පිහිටුවා ලූ සිත හෙතු වන්නෝ ය. නො සෙ පිහිටුවා ලූ සිත ප්‍රත්‍යය වන්නේ ය. මහාලිය, පාපක්‍රියා කරන්නට වෙවයි පාපක්‍රියා පවත්නට වෙවයි මෙ හෙතු වන්නේ ය. මෙ ප්‍රත්‍යය වන්නේ යයි.

කො පන භන්තෙ හෙතු, කො පච්චයො කල්‍යාණස්ස කම්මස්ස කිරියාය, කල්‍යාණස්ස කම්මස්ස පවත්තියාති?

අලොභො ඛො මහාලි හෙතු, අලොභො පච්චයො කල්‍යාණස්ස කම්මස්ස කිරියාය, කල්‍යාණස්ස කම්මස්ස පවත්තියා. අදොසො ඛො මහාලි–පෙ– අමොහො ඛො මහාලි හෙතු, අමොහො පච්චයො කල්‍යාණස්ස කම්මස්ස කිරියාය, කල්‍යාණස්ස කම්මස්ස පවත්තියා. යොනිසො මනසිකාරො ඛො මහාලි හෙතු, යොනිසො මනසිකාරො පච්චයො කල්‍යාණස්ස කම්මස්ස කිරියාය, කල්‍යාණස්ස කම්මස්ස පවත්තියා. සම්මාපණිහිතං ඛො මහාලි චිත්තං හෙතු, සම්මාපණිහිතං චිත්තං පච්චයො, කල්‍යාණස්ස කම්මස්ස කිරියාය, කල්‍යාණස්ස කම්මස්ස පවත්තියා. අයං ඛො මහාලි හෙතු අයං පච්චයො, කල්‍යාණස්ස කම්මස්ස කිරියාය, කල්‍යාණස්ස කම්මස්ස පවත්තියා.

ඉමෙ ච ඛො මහාලි දස ධම්මා ලොකෙ න සංවිජ්ජෙය්‍යුං, නයිදං පඤ්ඤායෙථ අධම්මචරියා විසමචරියාති වා, ධම්මචරියා සමචරියාති වා, යස්මා ච ඛො මහාලි ඉමෙ දස ධම්මා ලොකෙ සංවිජ්ජන්ති, තස්මා පඤ්ඤායති අධම්මචරියා විසමචරියාති වා ධම්මචරියා සමචරියාති වාති.

## 10. 1. 5. 8

## දසධම්ම සුත්තං

[සාවත්ථිනිදානං]

දසයිමෙ භික්ඛවෙ ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා. කතමෙ දස:

1. "වෙවණ්ණියම්හි අජ්ඣුපගතො"ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං,

2. "පරපටිබද්ධා මෙ ජීවිකා"ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

3. "අඤ්ඤො මෙ ආකප්පො කරණීයො"ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

වහන්ස, කල්‍යාණකම් කිරීමට වේවයි කල්‍යාණ කම් පවත්නට වේව යි හෙතු කවරෙ ය? ප්‍රත්‍යය කවරෙය?

මහාලිය, කල්‍යාණකම් කිරීමට වේවයි, කල්‍යාණ කම් පවත්නට වේවයි අලොභය හෙතු වන්නේ ය. අලොභය ප්‍රත්‍යය වන්නේ ය: මහාලිය, කල්‍යාණකම් කිරීමට වේවයි, කල්‍යාණකම් පවත්නට වේවයි, අදෙෂය......අමොහය හෙතු වන්නේ ය, අමොහය ප්‍රත්‍යය වන්නේ ය. මහාලිය, කල්‍යාණකම් කිරීමට වේවයි කල්‍යාණකම් පවත්නට වේවයි යොනිසොමනසිකාරය හෙතු වන්නේ ය, යොනිසොමනසිකාරය ප්‍රත්‍යය වන්නේ ය, මහාලිය, කල්‍යාණකම් කිරීමට වේවයි කල්‍යාණකම් පවත්නට වේවයි මනාසේ පිහිටුවා ලූ සිත හෙතු වන්නේ ය, මනාසේ පිහිටුවා ලූ සිත ප්‍රත්‍යය වන්නේ ය. මහාලිය, කල්‍යාණකම් කිරීමට වේවයි, කල්‍යාණකම් පවත්නට වේවයි මේ හෙතු වන්නේ ය, මේ ප්‍රත්‍යය වන්නේ ය.

මහාලිය, ලොව්හි මේ දශධර්මයෝ නො වැටෙන්නාහු නම් (අකුශලකම්පථාඛ්‍ය) අධර්මචය්‍යා සඞ්ඛ්‍යාත විෂමචය්‍යා යි හෝ (දශකුශලකම්පථාඛ්‍ය) ධම්චය්‍යා සඞ්ඛ්‍යාත සමචය්‍යා යි හෝ යන මෙය නො පැනෙන්නේ ය. මහාලිය, යම් හෙයෙකින් ලොව්හි මේ දසදහම්හු වැටෙත් ද එහෙයින් අධම්චය්‍යා සඞ්ඛ්‍යාත විෂමචය්‍යා යි හෝ ධම්චය්‍යා සඞ්ඛ්‍යාත සමචය්‍යා යි හෝ පැනෙන්නේ යි.

## 10. 1. 5. 8

## දසධම්ම සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, මේ දහම් දස දෙනෙක් පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතුවහ. කවර දස දෙනෙක යත්:

1. 'විවණීභාවයට පැමිණියෙම් වෙමි'යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

2. 'මාගේ දිවි වැටුම් පරා අයත්ය'යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු යි.

3. 'මා විසින් අන්‍ය වූ ආකල්පයෙක් කටයුතුය'යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

4. "කච්චිනු ඛො මෙ අත්තා සීලතො න උපවදතී"ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

5. "කච්චිනු ඛො මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතො න උපවදන්තී"ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං,

6. "සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො"ති" පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

7. "කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්ම-පටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමී"ති" පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

8. "කථං භූතස්ස මෙ රත්තින්දිවා වීතිපතන්තී"ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

9. "කච්චිනුඛොහං සුඤ්ඤාගාරෙ අභිරමාමී"ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

10. "අත්ථිනු ඛො මෙ උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සන-විසෙසො අධිගතො සොහං පච්ඡිමෙ කාලෙ සබ්‍රහ්මචාරීහි පුට්ඨො න මඞ්කුභවිස්සාමී"ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

ඉමෙ ඛො භික්ඛවෙ දස ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛි-තබ්බා ති.

## 10. 1. 5. 9

## සරීරට්ඨධම්ම සුත්තං

[සාවත්ථි]

දස ඉමෙ භික්ඛවෙ ධම්මා සරීරට්ඨා, කතමෙ දස: සීතං, උණ්හං ජිඝච්ඡා, පිපාසා, උච්චාරො, පස්සාවො, කායසංවරො, වචීසංවරො, ආජීවසංවරො, පොනොභවිකො[1] භවසඞ්ඛාරො. ඉමෙ ඛො භික්ඛවෙ දස ධම්මා සරීරට්ඨා ති.

1. පොනොබ්භවිකො, මජසං

4. 'කිමෙක මාගේ සිත සීලහෙතුයෙන් උපවාද නො කෙරේද'යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

5. ''කිමෙක විඥ සබ්‍රම්සරහු කරුණු දැන සීලහෙතුවෙන් මට උපවාද නො කෙරෙත් දැ'යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

6. 'ප්‍රිය වූ මනාප වූ හැමයෙන් මාගේ නානාභාවය, විනාභාවය වේ'යයි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

7. ''කර්මය සවකීය කොට ඇතියෙමි කර්මය දායාද කොට ඇතියෙමි කර්මය යොනි කොට ඇතියෙමි කර්මය බන්ධු කොට ඇතියෙමි වෙමි. කල්‍යාණ වූ හෝ පාපක වූ හෝ යම් ම කර්මයක් කෙරෙම් නම් එයට දායාද වෙමි'යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

8. ''කෙබඳු වූ මට රෑ දවල් හු ඉක්ම යෙත් දැ''යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

9. ''කිමෙක මම ශූන්‍යාගාරයෙහි සිත් අලවා වෙසෙම් දැ''යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

10. ''උතුරුමිනිස්දමින් වැඩි ආර්යභාව කරණයට සමත් ඥානදර්ශන විශෙෂයෙක් ම විසින් අධිගත වූයේ ඇද්දැයි ඒ මම පැසුළු කල්හි සබ්‍රම්-සරුන් විසින් පුළුවුස්නා ලදුයෙම් නිතෙද නො වෙමැ''යි පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු.

මහණෙනි, පැවිද්දහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතු මේ ධර්ම දසදෙනා යි.

## 10. 1. 5. 9
## ශරීරට්ඨධම්ම සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, මේ ශරීරස්ථ ධර්ම දසදෙනෙකි. කවර දසදෙනෙක යත්; ශීත හා උෂ්ණ හා ක්ෂුධා හා පිපාසා හා උච්චාර හා ප්‍රස්‍රාව හා කායසංවර හා වාක්සංවර හා ආජීවසංවර හා පුනර්භව කරන භවසංස්කාර හා යි. මහණෙනි, මේ දස දහම්හු ශරීරස්ථ යි.

## 10. 1. 5. 10

## භණ්ඩන සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා උපට්ඨානසාලායං සන්නිසින්නා සන්නිපතිතා භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනුපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. "කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා, කා ච පන වො අන්තරා කථා විප්පකතා"ති?

"ඉධ මයං භන්තෙ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා උපට්ඨාන සාලායං සන්නිසින්නා සන්නිපතිතා භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරාමා"ති.

"න ඛො පන ඉදං භික්ඛවෙ තුම්හාකං පතිරූපං, කුලපුත්තානං සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතානං යං තුම්හෙ භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා, අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරෙය්‍යාථ"

දස ඉමෙ භික්ඛවෙ ධම්මා සාරාණීයා[1] පියකරණා ගරුකරණා සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තන්ති. කතමෙ දස:

1. ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. යම්පි භික්ඛවෙ භික්ඛු සීලවා හොති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

---

1. සාරණීයා (මජසං)

## 10. 1. 5. 10

## භණ්ඩන සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත අසල අනේපිඩු සිටුහුගේ ජෙතවන නම් වූ අරම්හි වැඩවසන සේක. එකල්හි බොහෝ මහණහු පසුබත පිඩුවායෙන් වැළකියාහු උවටන් හල්හි රැස්ව හුන්නාහු සන්නි-පතිත වූවාහු හටගත් පූර්වභාග කලහ ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විරුද්ධවාදයට පැමිණියාහු උනුන් මුවසැතින් පෙළන්නාහු වෙසෙත්.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කල පිළිසලනින් නැගී සේක් උවටන්හල් කරා වැඩි සේක. වැඩ ප්‍රඥප්තාසනයෙහි හුන් සේක. හිඳ භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඇමතූ සේක. "මහණෙනි, දැන් කවර කථායෙකින් හුන්නාව? තොප විසින් කවර අතුරු කථායෙක් අඩාල කරන ලද දෑ යි?

"වහන්ස, අපි මෙ සැවත පසුබත පිඩුවායෙන් පෙරලා පැමිණියමෝ උවටන් හල්හි හුන්නමෝ රැස්වූවමෝ හටගත් පූර්වභාග කළහ ඇතියමෝ හටගත් කලහ ඇතියමෝ විරුද්ධවාදයට පැමිණියමෝ උනුන් මුවසැතින් පෙළමින් වසම්හ"යි.

මහණෙනි, යම් හෙයෙකින් තෙපි හටගත් පූර්වභාග කළහ ඇතියහු, හටගත් කළහ ඇතියහු විවාදපන්න වූවහු උනුන් මුවසැතින් පෙළමින් වසහු නම් මෙය සැදැහැයෙන් ගිහිගෙන් නික්ම අනගාර්‍ය්‍ය ශාසනයෙහි පැවිදි වූ කුලපුත් තොපට නුසුදුසු මැ යි.

මහණෙනි, මේ දස ධර්ම කෙනෙක් සාරාණීය වූවහු ප්‍රියභාවය කරන්නාහු ගුරුභාවය කරන්නාහු සඞ්ග්‍රහ පිණිස අවිවාදය පිණිස සමගිය පිණිස එක් බව පිණිස වටනාහ. කවර දස දෙනෙක යත්:

1. මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. ආචාරගොචර සම්පන්න වූයේ පාමොක් සංවරසිලින් සංවෘත ව වෙසෙයි. අනුමාත්‍ර වරදෙහිදු බිය දක්නාසුලු වැ සිකපෙදෙහි සමාදන් කොට ගෙන හික්මෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ සිල්වත් වේ ද......සමාදන් කොට ගෙන සිකපෙදෙහි හික්මේ ද. මෙ දහමද සාරාණීය යී. ප්‍රිය කරණ යි. ගරුකරණ යි. සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමගි පිණිස එක් බව පිණිස වැටෙයි.

2. පුනචපරං භික්ඛවෙ භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුත සන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙ කල්‍යාණා පරියොසාන කල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණ සහායො කල්‍යාණසම්පවඞ්කො. යම්පි භික්ඛවෙ භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො -පෙ- එකීභාවාය සංවත්තති.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො, ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං යම්පි භික්ඛවෙ භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො, ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං, අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිඞ්කරණීයානි තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං. යම්පි භික්ඛවෙ භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිඞ්කරණීයානි, තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං. යම්පි භික්ඛවෙ භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිං කරණීයානි තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං අයම්පි ධම්මො සාරාණීයො පියකරණො-පෙ- එකීභාවාය සංවත්තති.

6. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො, යම්පි භික්ඛවෙ භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො. අයම්පි ධම්මො සාරාණීයො, පියකරණො -පෙ- එකීභාවාය සංවත්තති.

2. තවද මහණෙනි, මහණ ශ්‍රුතධර වූයේ රැස්කොට ගත් ශ්‍රැත ඇතියේ බහුශ්‍රැත වෙයි' යම් මේ දහම් කෙනෙක් ආදිකල්‍යාණ ද මධ්‍යකල්‍යාණ ද පර්‍ය්‍යවසාන කල්‍යාණ ද සාර්ථසව්‍යඤ්ජන වූවාහු කෙවල පරිපූර්ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍ය පවසත් නම් එබඳු ධර්මයෝ ඔහු විසින් ධෘත වූවාහු බහුශ්‍රැත වෙත් වචනයෙන් පරිචිත වෙත්. මනසින් අනුප්‍රෙක්ෂිත වෙත්. ප්‍රඥයෙන් සුප්‍රතිවිද්ධ වෙත්. මෙ දහමුදු සාරාණීය යි. ප්‍රියකරණ යි. ගරු කරණ යි. සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමගි පිණිස එක්බව පිණිස වැටෙයි.

3. තවද, මහණෙනි, මහණ කලණ යහළුවන් ඇතියේ කලණයනට නැඹුරු වූයේ කල්‍යාණ මිත්‍ර වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ කලණ යහළුවන් ඇතියේ කලණයනට නැඹුරු වූයේ කල්‍යාණමිත්‍ර වේද මෙ දහමුදු සාරාණීය යි. ප්‍රියකරණ යි......එක් බව පිණිස වැටෙයි.

4. තවද මහණ සුවචභාවය කරන ධර්මයෙන් සමන්වාගත වූයේ අවවාදක්ෂම වූයේ අනුශාසනය ප්‍රදක්ෂිණායෙන් ගන්නා සුලු සුවච වෙයි. මහණෙනි, යම්හෙයෙකින් මහණ සුවචභාවය කරන දහමින් සමන්වාගත වූයේ අවවාදක්ෂම වූයේ අනුශාසනය ප්‍රදක්ෂිණායෙන් ගන්නා සුලු සුවච වේ නම් මෙ දහම ද සාරාණීය යි. ප්‍රියකරණ යි. ගරුකරණ යි. සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමගි පිණිස එක්බව පිණිස වැටෙයි.

5. තවද මහණෙනි, මහණ සබ්‍රම්සරුන් පිළිබඳ කුම් කෙරෙම් දැයි පිළිවිස කටයුතු කුදුමහත් යම් ඒ කටයුතු වේ නම් එහි දක්ෂ වෙයි. අනලස් වූයේ තත්‍රොපායවීමංසායෙන් සමන්වාගත වූයේ කරනට හා සංවිධානයට සමත් වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ සබ්‍රම්සරුන් පිළිබඳ යම් ඒ කුදු මහත් කිංකර්තව්‍ය වේ නම් එහිත් දක්ෂ වූයේ වේද අනලස් වූයේ තත්‍රොපායවීමංසායෙන් සමන්වාගත වූයේ කරනට හා සංවිධානයට සමර්ථ වෙද මෙ දහම ද සාරාණීය යි. ප්‍රියකරණ යි......එක් බව පිණිස වටනේ ය.

6. තවද මහණෙනි, මහණ ප්‍රිය සමුදහාර ඇත්තේ අභිධර්මයෙහි අභිවිනයෙහි මහත් ප්‍රාමොද්‍ය ඇත්තේ ධර්මකාම වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ පිය සමුදහාර ඇතියේ අභිධර්මයෙහි අභිවිනයෙහි මහත් ප්‍රාමොද්‍ය ඇතියේ ධර්මකාම වේද මෙ දහම ද සාරාණීය යි ප්‍රියකරණයි........එකී භාවයට වැටෙයි.

7. පුනචපරං භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. යම්පි භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති:

8. පුනචපරං භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරචීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙන. යම්පි භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතර චීවරපිණ්ඩපාතසෙනාසන ගිලාන-පච්චයභෙසජ්ජපරික්ඛාරෙන. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො -පෙ- එකීභාවාය සංවත්තති.

9. පුනචපරං භික්ඛවෙ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. යම්පි භික්ඛවෙ භික්ඛු සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. අයම්පි ධම්මො සාරාණීයො -පෙ- එකී-භාවාය සංවත්තති.

10. පුනචපරං භික්ඛවෙ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. යම්පි භික්ඛවෙ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නා-ගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

ඉමෙ ඛො භික්ඛවෙ දසධම්මා සාරාණීයා පියකරණා ගරුකරණා සඞ්ගහාය අවිවාදාය එකීභාවාය සංවත්තන්තී ති.

## අක්කොසවග්ගො පඤ්චමො.

තත්‍රුද්දානං:

විවාද ද්වෙ ච මූලානි කුසිනාරා පවෙසනෙ,
සක්කා මඞ්ගලි ධම්මා ච සරීරට්ඨා ච භණ්ඩනාති.

## පඨමො පණ්ණාසකො සමත්තො.

7. තවද මහණෙනි, මහණ අකුසල දහමුන්ගේ ප්‍රහාණය පිණිස කුසල් දහමුන්ගේ උපසම්පත් පිණිස ස්ථාමවත් වූයේ දළපැරකුම් ඇතියේ කුසලධර්මයන්හි නො බහා තැබූ වීර්‍ය්‍යධුර ඇතියේ රුකුළු වැර ඇතියේ වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ අකුසල් දහමුන්ගේ ප්‍රහාණය පිණිස කුසල් දහමුන්ගේ උපසම්පත් පිණිස ස්ථාමවත් වූයේ දළපැරකුම් ඇතියේ කුසල් දහම්හි නො බහා තැබූ වීර්‍ය්‍යධුර ඇතියේ රුකුළු වැර ඇතියේ වෙසේ ද, මේ දහම ද සාරාණීය යි. පිය කරණ යි. ගරුකරණ යි. සඞ්ග්‍රහ පිණිස අවිවාද පිණිස සමගි පිණිස එකී භාව පිණිස වැටෙයි.

8. තවද මහණෙනි, මහණ ඉතරෙතරචීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් සතුටු වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ ඉතෙරතරචීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරයෙන් සතුටු වේ ද, මෙ දහම ද සාරාණීය යි. පියකරණයි......එකී භාව පිණිස වැටෙයි.

9. තවද මහණෙනි, මහණ පරම ස්මෘතිනිපකභාවයෙන් සමන්වාගත වූයේ චිරකෘතයත් චිරභාෂිතයත් සමරනුයේ පුන-පුනා සමරනුයේ ස්මෘතිමත් වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ පරම ස්මෘතිනිපක-භාවයෙන් සමන්වාගත වූයේ චිරකෘතයත් චිරභාෂිතයත් සමරනුයේ පුන-පුනා සමරනුයේ ස්මෘතිමත් වේ ද, මෙ දහම ද සාරාණීය යි......එකී භාවයට වැටෙයි.

10. තවද මහණෙනි, මහණ උද—විය අනුව යන ආර්‍ය්‍ය වූ නිර්වේදය ඇසුරු කළ මොනොවට දුඃඛක්ෂයට යන ප්‍රඥයෙන් සමන්වාගත වූයේ ප්‍රඥවත් වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ උද—විය අනුව යන ආර්‍ය්‍ය වූ නිර්වේදය ඇසුරු කළ මොනොවට දුඃඛක්ෂයට යන සුලු ප්‍රඥයෙන් සමන්වාගත වූයේ ප්‍රඥවත් වෙ ද මෙ දහම ද සාරාණීය යි. ප්‍රිය කරණ යි. ගරුකරණ යි සඞ්ග්‍රහය පිණිස අවිවාද පිණිස සමගි පිණිස එකී භාව පිණිස වැටෙයි.

මහණෙනි, මේ දස දහම්හු සාරාණීයහ. පිය කරණහ. ගරුකරණහ. සඞ්ග්‍රහයට ප්‍රිය භාවයට අවිවාදයට එකී භාවයට වැටෙත් ය යි.

## පස්වැනි අක්කොසවර්ග යි.

**එහි උද්දනය:**

විවාද සූත්‍රය, විවාදමූලසූත්‍ර දෙකය, කුසිනාරා සූත්‍රය, අන්තඃපුරප්‍ර-වෙසනසූත්‍රය, සක්කසූත්‍රය, මහාලි සූත්‍රය, දසධම්ම සූත්‍රය, සරීරට්ඨ සූත්‍රය, භණ්ඩන සූත්‍රය දැයි දසයෙක.

**පඨමපණ්ණාසකය සමාප්ත යි.**

## 2. දුතියො පණ්ණාසකො

# 1. සචිත්තවග්ගො

### 10. 2. 1. 1.

### සචිත්ත සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

නො චෙ[1] ඛො භික්ඛවෙ භික්ඛු පරචිත්තපරියාය කුසලො හොති, අථ 'සචිත්තපරියාය කුසලො භවිස්සා[2]මී'ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සචිත්තපරියාය කුසලො හොති: සෙය්‍යථාපි භික්ඛවෙ ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො ආදසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සචෙ තත්ථ පස්සති රජං වා අඞ්ගණං වා, තස්සෙව රජස්ස වා අඞ්ගණස්ස වා, පහානාය වායමති. නො චෙ තත්ථ පස්සති රජං වා අඞ්ගණං වා තෙනෙවත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො "ලාභා වත මෙ පරිසුද්ධං වත මෙ"ති. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො පච්චවෙක්ඛණා බහුකාරා හොති කුසලෙසු ධම්මෙසු. අභිජ්ඣාලු නු ඛො බහුලං විහරාමි, අනභිජ්ඣාලූ නු ඛො බහුලං විහරාමි, ව්‍යාපන්නචිත්තො නු ඛො බහුලං විහරාමි, අව්‍යාපන්නචිත්තො නු ඛො බහුලං විහරාමි, ථීනමිද්ධපරියුට්ඨිතො නු ඛො බහුලං විහරාමි, විගතථීනමිද්ධො නු ඛො බහුලං විහරාමි, උද්ධතො නු ඛො බහුලං විහරාමි, අනුද්ධතො නු ඛො බහුලං විහරාමි, විචිකිච්ඡො නු ඛො බහුලං විහරාමි, තිණ්ණවිචිකිච්ඡො නු ඛො බහුලං විහරාමි, කොධනො නු ඛො බහුලං විහරාමි. අක්කොධනො නු ඛො බහුලං විහරාමි, සඞ්කිලිට්ඨචිත්තො නු ඛො බහුලං විහරාමි, අසඞ්කිලිට්ඨචිත්තො නු ඛො බහුලං විහරාමි, සාරද්ධකායො නු ඛො බහුලං විහරාමි, අසාරද්ධකායො නු ඛො බහුලං විහරාමි, කුසීතො නු ඛො බහුලං විහරාමි, ආරද්ධවිරියො නු ඛො බහුලං විහරාමි, අසමාහිතො නු ඛො බහුලං විහරාමි, සමාහිතො නු ඛො බහුලං විහරාමී ති.

---

1. නො ච, - සිමු
2. භවිස්සාමාති - ස්‍යා

## 2. දෙවැනි පනස

# 1. සචිත්තවර්ගය

### 10. 2. 1. 1

### සචිත්ත සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු සිටුහුගේ ජේතවන නම් වූ අරමෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනියි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ, භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

මහණෙනි, ඉදින් මහණ පරචිත්ත පරියාය කුසල නො වේ නම් එකල සචිත්තපරියායකුසල වෙමැයි මහණෙනි, මෙසේ ම තොප විසින් හික්මිය යුතු ය.

මහණෙනි, කෙසේ මහණ සචිත්තපරියායකුසලවේ ය යත්: මහණෙනි, දහර වූ තරුණ වූ සැරසීම් සැහැවි කොට ඇති ස්ත්‍රියක් හෝවයි පුරුෂයෙක් හෝ වේ වයි පරිශුද්ධ වූ පයඹීවදත වූ කැටපතෙක හෝවයි පහන් දියබඳුනෙක හෝවයි තම මුවනිමිති පිරික්සා බලනුයේ ඉදින් එහි රජසක් හෝ තල කැලලක් හෝ දක්නේ ද ඒ රජස හෝ තලකැලල දුරලීමට ව්‍යායාම කෙරෙයි. ඉදින් එහි රජසක් හෝවයි තලකැලලක් හෝවයි නො දක්නේ නම් "එකැතින් මට ලාභයෙක, එකැතින් මාගේ මුව පරිපූර්ණ ය"යි එයින් තුටු සිත් ඇත්තේ පිරිපුන් සඞ්කල්ප ඇත්තේ වෙයි. මහණෙනි එපරිදි ම මහණහට කුසල්දහම්හි ප්‍රත්‍යවෙක්ෂණ,ව බහූපකාර වෙයි: අභිධ්‍යා බහුල කොට ඇතියෙම් බෙහෙවින් වෙසෙම් දෝ අභිධ්‍යා බහුල කොට නැතියෙම් බෙහෙවින් වෙසෙම් දෝ යි; ව්‍යාපාදයෙන් යුත් සිතැතියෙම් බෙහෙවින් වෙසෙම් දෝ ව්‍යාපාදයෙන් වියුත් සිතැතියෙම් බෙහෙවින් වෙසෙම් දෝ යි; ථිනමිද්ධයෙන් වැඩුනෙම් බෙහෙවින් වෙසෙම් දෝ පහවූ ථිනමිද්ධ ඇතියෙම් බෙහෙවින් වෙසෙම් දෝ යි, උද්ධතයෙම් බෙහෙවින් වෙසෙම් දෝ අනුද්ධතයෙම් බෙහෙවින් වෙසෙම්දෝ යි විචිකිච්ඡා ඇතියෙම් බෙහෙවින් වෙසෙම් දෝ තරණය කළ විචිකිච්ඡා ඇතියෙම් බෙහෙවින් වෙසෙම් දෝයි කිපෙන සුල්ලෙම් බෙහෙවින් වෙසෙම් දෝ නො කිපෙන සුල්ලෙම් බෙහෙවින් වෙසෙම් දෝ යි; සකිලිටි සිතැත්තෙම් බෙහෙවින් වෙසෙම් දෝ යි; නො කිලිටි සිතැත්තෙම් බෙහෙවින් වෙසෙම් දෝ යි; ගිලන් කය ඇතියෙම් බෙහෙවින් වෙසෙම් දෝ නො ගිලන් කය ඇතියෙම බෙහෙවින් වෙසෙම් දෝ යි; කුසීතයෙම් බෙහෙවින් වෙසෙම් දෝ ඇරඹිවැර ඇතියෙම් බෙහෙවින් වෙසෙම් දෝ යි; අසමාහිතයෙම් බෙහෙවින් වෙසෙම් දෝ සමාහිතයෙම් බෙහෙවින් වෙසෙම් දෝ"යි.

සචෙ භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "අභිජ්ඣාලු බහුලං විහරාමි, බ්‍යාපන්නචිත්තො බහුලං විහරාමි, ථීනමිද්ධපරියුට්ඨිතො බහුලං විහරාමි, උද්ධතො බහුලං විහරාමි, විචිකිච්ඡො බහුලං විහරාමි, කොධනො බහුලං විහරාමි, සංකිලිට්ඨචිත්තො බහුලං විහරාමි, සාරද්ධකායො බහුලං විහරාමි, කුසීතො බහුලං විහරාමි, අසමාහිතො බහුලං විහරාමී"ති. තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං. සෙය්‍යථාපි භික්ඛවෙ ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව, ඛො තෙන භික්ඛුනා තෙසං යෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

සචෙ පන භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති; "අනභිජ්ඣාලු බහුලං විහරාමි, අබ්‍යාපන්නචිත්තො බහුලං විහරාමි, විගතථීනමිද්ධො බහුලං විහරාමි, අනුද්ධතො බහුලං විහරාමි, තිණ්ණවිචිකිච්ඡො බහුලං විහරාමි, අක්කොධනො බහුලං විහරාමි, අසඞ්කිලිට්ඨචිත්තො බහුලං විහරාමි, අසාරද්ධකායො බහුලං විහරාමි, ආරද්ධවිරියො බහුලං විහරාමි. සමාහිතො බහුලං විහරාමී"ති. තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසුයෙව කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය උත්තරිං ආසවානං ඛයාය යොගො කරණීයො ති.

## 10. 2. 1. 2

## සාරිපුත්ත සුත්තං

[සාවත්ථි]

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි "ආවුසො භික්ඛවො"ති. "ආවුසො"ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

නො චෙ ආවුසො භික්ඛු පරචිත්තපරියාය කුසලො හොති, අථ "සචිත්තපරියාය කුසලො භවිස්සාමී"ති. එවං හි වො ආවුසො සික්ඛිතබ්බං.

මහණෙනි, ඉදින් මහණ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ නම්: "අභිධ්‍යා බහුලයෙම් බොහෝ කොට වෙසෙම්, ව්‍යාපාද යුත් සිතැතියෙම් බොහෝ කොට වෙසෙම්, ථීනමිද්ධයෙන් වැඩුණෙම් බොහෝ කොට වෙසෙම්, උද්ධතයෙම් බොහෝ කොට වෙසෙම්, සකිලිටි සිතැතියෙම් බොහෝ කොට වෙසෙම්, ගිලන්කය ඇතියෙම් බොහෝ කොට වෙසෙම්, කුසීතයෙම් බොහෝ කොට වෙසෙම්, අසමාහිතයෙම් බොහෝ කොට වෙසෙමැ''යි මහණෙනි, එ මහණහු විසින් ඒ ලමු අකුසල් දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා උසොළහියක් හා නො පසු බැස්මෙක් හා සමෘතියෙක් හා සම්ප්‍රජන්‍යයෙක් හා කටයුතු. මහණෙනි යම් සේ ඇවිළගත් පිළි ඇත්තේ වේව යි ඇවිළගත් හිස් ඇත්තේ වේවයි එ ම පිළිය හෝ හිස හෝ නිවීමට අධිමාත්‍රඡන්දයක් ද ව්‍යායාමයක් ද උත්සාහයක් ද උසොළහියක් ද නො පසුබැස්මක් ද සමෘතියක් ද සම්ප්‍රජන්‍යයක් ද කෙරේ නම් එසෙයින් ම එ මහණහු විසින් එ ලමු අකුසල් දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයෙක් හා උත්සාහයෙක් හා උසොළ්හියක් හා නොපසුබැස්මෙක් හා සමෘතියෙක් හා සම්ප්‍රජන්‍යයෙක් හා කටයුතු.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ නම්: "අභිධ්‍යා බහුල කොට නැතියෙම් බොහෝ කොට වෙසෙම්, ව්‍යාපාද වියුත් සිතැතියෙම් බොහෝ කොට වෙසෙම්, පහවූ ථීනමිද්ධ ඇතියෙම් බොහෝ කොට වෙසෙම්, අනුද්ධතයෙම් බොහෝ කොට වෙසෙම්, තරණය කළ විචිකිච්ඡා ඇතියෙම් බොහෝ කොට වෙසෙම්, නො කිලිටි සිතැතියෙම් බොහෝ කොට වෙසෙම්, නො ගිලන් කය ඇතියෙම් බොහෝ කොට වෙසෙම්, නො කුසීතයෙම් බොහෝ කොට වෙසෙම්, සමාහිතයෙම් බොහෝ කොට වෙසෙමැ''යි. මහණෙනි, එහෙයින් මහණහු විසින් ඒ කුසල් දහමහි ම පිහිටා මතු ආස්‍රවක්ෂය පිණිස යොග කටයුතු''යි.

## 10. 2. 1. 2

## සාරිපුත්ත සූත්‍රය

**[සැවැත්]**

එකල ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ 'ඇවැත් මහණෙනි'යි භික්ෂූන් ඇමතූහ. 'ඇවැත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට පිළි වදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල කීහ:

"ඇවැත්නි, ඉදින් මහණ පරචිත්තපරියාය කුසල නො වේ නම් එකල සචිත්තපරියාය (තම සිතට අවවාද කිරීමෙහි) කුසල වෙමි''යි ඇවැත්නි මෙසෙයින් තොප විසින් හික්මිය යුතු.

කථඤ්ච ආවුසො භික්ඛු සචිත්තපරියාය කුසලො හොති, සෙය්‍යථාපි ආවුසො ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනක ජාතිකො ආදසෙ වා පරිසුද්ධෙ පරියොදතෙ අච්ඡෙ වා උදපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො, සචෙ තත්ථ පස්සති රජං වා අඞ්ගණං වා, තස්සෙව රජස්ස වා අඞ්ගණස්ස වා පහානාය වායමති. නො චෙ තත්ථ පස්සති රජං වා අඞ්ගණං වා, තෙනෙවත්තමනො හොති, පරිපුණ්ණසඞ්කප්පො, "ලාභා වත මෙ පරිසුද්ධං වත මෙ"ති. එවමෙව ඛො ආවුසො භික්ඛුනො පච්චවෙක්ඛනා බහුකාරා හොති කුසලෙසු ධම්මෙසු: "අභිජ්ඣාලු නු ඛො බහුලං විහරාමි, අනභිජ්ඣාලු නු ඛො බහුලං විහරාමි, බ්‍යාපන්නචිත්තො නු ඛො බහුලං විහරාමි, අබ්‍යාපන්නචිත්තො නු ඛො බහුලං විහරාමි, ථීනමිද්ධපරියුට්ඨිතො නු ඛො බහුලං විහරාමි, විගතථීනමිද්ධො නු ඛො බහුලං විහරාමි, උද්ධතො නු ඛො බහුලං විහරාමි, අනුද්ධතො නු ඛො බහුලං විහරාමි, විචිකිච්ඡී නු ඛො බහුලං විහරාමි, තිණ්ණවිචිකිච්ඡො නු ඛො බහුලං විහරාමි. කොධනො නු ඛො බහුලං විහරාමි, අක්කොධනො නු ඛො බහුලං විහරාමි, සඞ්කිලිට්ඨචිත්තො නු ඛො බහුලං විහරාමි, අසංකිලිට්ඨචිත්තො නු ඛො බහුලං විහරාමි, සාරද්ධකායො නු ඛො බහුලං විහරාමි, අසාරද්ධකායො නු ඛො බහුලං විහරාමි, කුසීතො නු ඛො බහුලං විහරාමි, ආරද්ධවිරියො නු ඛො බහුලං විහරාමි, සමාහිතො නු ඛො බහුලං විහරාමි. අසමාහිතො නු ඛො බහුලං විහරාමී"ති.

සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අභිජ්ඣාලු බහුලං විහරාමි–පෙ–අසමාහිතො බහුලං විහරාමී"ති. තෙනාවුසො භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං. සෙය්‍යථාපි ආවුසො ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො ආවුසො තෙන භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: "අනභිජ්ඣාලු බහුලං විහරාමි–පෙ–සමාහිතො බහුලං විහරාමී"ති. තෙනාවුසො භික්ඛුනා තෙසුයෙව කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය උත්තරිං ආසවානං ඛයාය යොගො කරණීයො"ති.

ඇවැත්නි, මහණ කෙසේ සචිත්තපරියාය කුසල වේ ය යත්: ඇවැත්නි, යම් පරිදි අහර වූ තරුණ වූ සැරසුම් සැහැවි ඇති ස්ත්‍රියක් වේව යි, පුරුෂයෙක් වේව යි පරිශුද්ධ පයඞවදත කැටපතෙක හෝ පහන් දිය-බඳුනෙක හෝ සිය මුවනිමිති පිරික්සා බලනුයේ ඉදින් එහි රජසක් වේවයි අඞගණයක් වේවයි දන්නේ නම් එම රජස හෝ අඞගණය හෝ දුරලීමට ව්‍යායාම කෙරෙයි. ඉදින් එහි රජසක් හෝ අඞගණයක් හෝ නො දක්නේ නම් එකැතින් මට ලාභයෙක. එකැතින් මාගේ මුව පිරිසිදුය යි පිරිපුන් සංකල්ප ඇතියේ එයින් ම තුටු සිතැත්තේ වෙයි. ඇවැත්නි, එ පරිදි ම මහණහට කුසල් දහම්හි ප්‍රත්‍යවෙක්ෂණාව බහුප-කාර වෙයි: ''අභිජ්ඣා බහුල කොට ඇතියෙම් බෙහෙවින් වෙසෙම් ද, අභිජ්ඣා බහුල කොට නැතියෙම් බොහෝ කොට වෙසෙම් දෝ අව්‍යා-පාදයෙන් යුත් සිතැත්තෙම් බොහෝ කොට වෙසෙම් ද ව්‍යාපාදයෙන් වියුත් සිතැත්තෙම් බහුල කොට වෙසෙම් ද, ථීනමිද්ධයෙන් මැඩුණු සිතැතියෙම් බහුල කොට වෙසෙම් ද, පහවූ ථීනමිද්ධ ඇතියෙම් බහුල කොට වෙසෙම් ද, උද්ධතයෙම් බහුල කොට වෙසෙම් ද, අනුද්ධතයෙම් බහුල කොට වෙසෙම් ද, විචිකිච්ඡා ඇතියෙම් බහුල කොට වෙසෙම් ද, තරණය කළ විචිකිච්ඡා ඇතියෙම් බහුල කොට වෙසෙම් ද. කිපෙන සුල්ලෙම් බහුල කොට වෙසෙම් ද, නො කිපෙන සුල්ලෙම් බහුල කොට වෙසෙම් ද, සකිලිටි සිතැතියෙම් බහුල කොට වෙසෙම් ද, නො කිලිටි සිතැතියෙම් බහුල කොට වෙසෙම් ද, ගිලන් කය ඇතියෙම් බහුල කොට වෙසෙම් ද, නො ගිලන් කය ඇතියෙම් බහුල කොට වෙසෙම් ද, කුසීතයෙම් බහුල කොට වෙසෙම් ද, ඇරඹිවැර ඇතියෙම් බහුල කොට වෙසෙම් ද, සමාහිතයෙම් බහුල කොට වෙසෙම් ද, අසමාහිතයෙම් බහුල කොට වෙසෙම්ද''යි.

ඇවැත්නි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ නම්: ''අභිජ්ඣා බහුල කොට ඇත්තෙම් බොහෝ කොට වෙසෙම් දෝ...,.... අසමාහිතයෙම් බොහෝ කොට වෙසෙම් දෝ''යි. ඇවැත්නි, එ මහණහු විසින් එ ම ලමු අකුසල් දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්ද-යෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා මහාවීය‍ර්‍යයෙක් හා නොපසු-බැස්මෙක් හා ස්මෘතියෙක් හා සම්ප්‍රජන්‍යයෙක් හා කටයුතු. ඇවැත්නි, යම් පරිදි ඇවිළි පිළි ඇතියේ වේව යි ඇවිළි හිස ඇතියේ වේව යි එ පිළිය හෝ හිස නිවීම පිණිස අධිමාත්‍ර ඡන්දයක් හා ව්‍යායාමයක් හා උත්සාහයක් හා මහ වැරක් හා නො පසුබැස්මක් හා සතියක් හා සම්ප-ජඤ්ඤයක් හා කෙරේ නම් ඇවැත්නි, එ පරිදි ම එ මහණහු එ ම ලමු අකුසල් දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා මහවැරෙක් හා නො පසු බැස්මෙක් හා ස්මෘතියෙක් හා සම්ප්‍රජන්‍යයක් හා කටයුතු:

ඇවැත්නි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ වේ නම් අනභිජ්ඣා බහුල කොට ඇතියෙම් බොහෝ කොට වෙසෙම්...... සමාහිතයෙම් බොහෝ කොට වෙසෙම්''යි. ඇවැත්නි, එ මහණ විසින් එ ම කුසල් දහම්හි පිහිටා මතුයෙහි ආස්‍රවක්ෂය පිණිස යොග කටයුතු යි,

## 10. 2. 1. 3

## ඨිති සුත්තං

[සාවත්ථි]

ඨිතිම්පාහං[1] භික්ඛවෙ න වණ්ණයාමි කුසලෙසු ධම්මෙසු පගෙව පරිහානිං, වුද්ධිං ච ඛො අහං භික්ඛවෙ වණ්ණයාමි කුසලෙසු ධම්මෙසු නො ඨිතිං නො හානිං.

කථඤ්ච භික්ඛවෙ හානි හොති කුසලෙසු ධම්මෙසු, නො ඨිති නො වුද්ධි. ඉධ භික්ඛවෙ භික්ඛු යත්තකො හොති සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙන. තස්ස තෙ ධම්මා නෙව තිට්ඨන්ති, නො වඩ්ඪන්ති. හානිමෙතං භික්ඛවෙ වදාමි, කුසලෙසු ධම්මෙසු. නො ඨිති, නො වුද්ධි.

කථඤ්ච භික්ඛවෙ ඨිති හොති කුසලෙසු ධම්මෙසු, නො හානි නො වුද්ධි. ඉධ භික්ඛවෙ භික්ඛු යත්තකො හොති සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙන, තස්ස තෙ ධම්මා නෙ ව හායන්ති, නො වඩ්ඪන්ති. ඨිතිමෙතං භික්ඛවෙ වදාමි කුසලෙසු ධම්මෙසු, නො හානිං නො වුද්ධිං. එවං ඛො භික්ඛවෙ ඨිති හොති කුසලෙසු ධම්මෙසු නො වුද්ධි නො හානි.

කථඤ්ච භික්ඛවෙ වුද්ධි හොති කුසලෙසු ධම්මෙසු, නො ඨිති, නො හානි, ඉධ භික්ඛවෙ භික්ඛු යත්තකො හොති සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය පටිභානෙන, තස්ස තෙ ධම්මා නෙව තිට්ඨන්ති නො හායන්ති. වුද්ධිමෙතං භික්ඛවෙ වදාමි කුසලෙසු ධම්මෙසු නො ඨිතිං නො හානිං, එවං ඛො භික්ඛවෙ වුද්ධි හොති කුසලෙසු ධම්මෙසු, නො ඨිති, නො හානි.

නො චෙ භික්ඛවෙ භික්ඛු පරචිත්තපරියායකුසලො හොති, අථ "සචිත්තපරියායකුසලො භවිස්සාමී"ති, එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

1. ඨිතිමපහං, සිමු.

## 10. 2. 1. 3

## ඨිති සූත්‍රය

මහණෙනි, මම කුසල් දහම්හි ස්ථිතිය ද නොවනම්. පරිහානිය කැලැ මැ යි. මහණෙනි, මම කුසල් දහම්හි වෘද්ධිය ද වනම්. ස්ථිතිය නො වනම් පරිහානිය නො වනම්.

මහණෙනි, කෙසේ නම් කුසල් දහම්හි හානි වේ ද, ස්ථිති නො වේ ද, වෘද්ධි නො වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රද්ධායෙන් ශීලයෙන් ශ්‍රැතයෙන් ත්‍යාගයෙන් ප්‍රඥයෙන් ප්‍රතිභානයෙන් යම් පමණ වේ ද, ඔහට එ දහම්හු නොම සිටුනා හ. නො වඩනා හ. මහණෙනි, තෙල කුසල් දහම්හි හානි යයි කියමි. ස්ථිතිය නො වෙයි. වෘද්ධි නො වෙයි.

මහණෙනි, කෙසේ නම කුසල් දහම්හි ස්ථිතිය වේ ද, හානි නො වේ ද, වෘද්ධි නො වේ ය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රද්ධා-යෙන්, ශීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥයෙන්, ප්‍රතිභානයෙන් යම් පමණ වේ නම් ඔහට එ දහම්හු නො ම පිරිහෙත්. නො වැඩෙත්. මහණෙනි, තෙල කුසල් දහම් හි ස්ථිතිය යි කියමි. හානිය යි නො කියමි. වෘද්ධිය යි නො කියමි. මහණෙනි මෙසේ කුසල් දහම්හි ස්ථිතිය වෙයි. වෘද්ධි නො වේ. හානි නො වේ.

මහණෙනි, කෙසේ නම් කුසල් දහම් වෘද්ධි වේ ද, ස්ථිති නො වේ ද, හානි නොවේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ශ්‍රද්ධායෙන් ශීලයෙන් ශ්‍රැතයෙන් ත්‍යාගයෙන් ප්‍රඥයෙන් ප්‍රතිභානයෙන් යම් පමණ වේ ද ඔහට එ දහම්හු නො ම සිටුනාහ. නො ම පිරිහෙන්නාහ.

මහණෙනි, තෙල කුසල් දහම්හි වෘද්ධියයි කියමි. ස්ථිති යයි නො කියමි. හානිය යි නො කියමි. මහණෙනි, මෙසේ වනාහි කුසල් දහම්හි වෘද්ධි වේ. ස්ථිති නොවේ. හානි නො වේ.

මහණෙනි, ඉදින් මහණ පරචිත්තපරියාය කුසල නො වේ නම් එකල ස්වචිත්තපරියාය කුසල වෙමියි මහණෙනි මෙසේ ම තොප විසින් හික්මිය යුතු.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සචිත්තපරියායකුසලො හොති, සෙය්‍යථාපි භික්ඛවෙ ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදපත්තෙ සකං මුඛනිමිත්තං පච්ච-වෙක්ඛමානො සචෙ තත්‍ථ පස්සති රජං වා අඞ්ගණං වා, තස්සෙව රජස්ස වා අඞ්ගණස්ස වා පහානාය වායමති, නො චෙ තත්‍ථ පස්සති රජං වා අඞ්ගණං වා තෙනෙවත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො "ලාභා වත මෙ පරිසුද්ධං වත මෙ"ති.

එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො පච්චවෙක්ඛනා බහුකාරා හොති කුසලෙසු ධම්මෙසු "අභිජ්ඣාලු නු ඛො බහුලං විහරාමි අනභිජ්ඣාලු නු ඛො බහුලං විහරාමි' බ්‍යාපන්නචිත්තො නු ඛො බහුලං විහරාමි, අබ්‍යා-පන්නචිත්තො නු ඛො බහුලං විහරාමි, ථීනමිද්ධපරියුට්ඨිතො නු ඛො බහුලං විහරාමි, විගත ථීනමිද්ධො නු ඛො බහුලං විහරාමි, උද්ධතො නු ඛො බහුලං විහරාමි, අනුද්ධතො නු ඛො බහුලං විහරාමි, විචිකිච්ඡො නු ඛො බහුලං විහරාමි, තිණ්ණවිචිකිච්ඡො නු ඛො බහුලං විහරාමි, කොධනො නු ඛො බහුලං විහරාමි, අක්කොධනො නු ඛො බහුලං විහරාමි, සංකිලිට්ඨචිත්තො නු ඛො බහුලං විහරාමි, අසංකිලිට්ඨචිත්තො නු ඛො බහුලං විහරාමි, සාරද්ධකායො නු ඛො බහුලං විහරාමි, අසාරද්ධ කායො නු ඛො බහුලං විහරාමි, කුසීතො නු ඛො බහුලං විහරාමි, ආරද්ධ විරියො නු ඛො බහුලං විහරාමි, සමාහිතො නු ඛො බහුලං විහරාමි, අසමාහිතො නු ඛො බහුලං විහරාමී''ති.

සචෙ භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අභිජ්ඣාලු බහුලං විහරාමි, බ්‍යාපන්නචිත්තො බහුලං විහරාමි, ථීනමිද්ධපරියුට්ඨිතො බහුලං විහරාමි, උද්ධතො බහුලං විහරාමි, විචිකිච්ඡො බහුලං විහරාමි, කොධනො බහුලං විහරාමි, සංකිලිට්ඨචිත්තො බහුලං විහරාමි, සාරද්ධ-කායො බහුලං විහරාමි, කුසීතො බහුලං විහරාමි, අසමාහිතො බහුලං විහරාමී''ති. තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

මහණෙනි, කෙසේ නම් මහණ සචිත්තපරියාය කුසල වේ ය යත්: මහණෙනි, යම් පරිදි දහර වූ තරුණවූ සරහන සැහැවි ඇති, ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි පිරිසිදු පයඞ්වදන ආදර්ශයෙක හෝ පහන් දිය බඳුනෙක හෝ තම මුවනිමිති පිරික්සා බලනුයේ ඉදින් එහි රජසක් හෝ (තල කැලැල් ආදී) අඩගණයක් හෝ දක්නේ හෝ එම රජස් හෝ අඩගණය දුරලීමට ව්‍යායාම කෙරෙයි. ඉදින් එහි රජසක් හෝ අඩගණයක් නො දක්නේ නම් එ කැතින් මට ලාභය, එ කැතින් මා මුව පිරිසිදුය යි පිරිපුන් මනදෙළ ඇතියේ එයින් ම තුටු සිතැතියේ වෙ යි.

මහණෙනි, එපරිදි ම භික්ෂුහට කුසල් දහම්හි ප්‍රත්‍යවෙක්ෂණාව බහුපකාර වේ. අභිධ්‍යාලුයෙම් බොහෝ කොට වෙසෙම් දෝ අනභිධ්‍යාලු-යෙම් බොහෝ කොට වෙසෙම් දෝ යි. ව්‍යාපන්නචිත්තයෙම් බොහෝ කොට වෙසෙම් දෝ අව්‍යාපන්නචිත්තයෙම් බොහෝ කොට වෙසෙම් දෝ යි. ථීනමිද්ධයෙන් මැඩුණෙම් බොහෝ කොට වෙසෙම් දෝ පහවූ ථීනමිද්ධ ඇතියෙම් බොහෝ කොට වෙසෙම් දෝ යි. උද්ධතයෙම් බොහෝ කොට වෙසෙම් දෝ අනුද්ධතයෙම් බොහෝ කොට වෙසෙම් දෝ යි. විචිකිච්ඡා ඇතියෙම් බොහෝ කොට වෙසෙම් දෝ තරණය කළ විචිකිච්ඡා ඇතියෙම් බොහෝ කොට වෙසෙම් දෝ යි. කිපෙන සුල්ලෙම් බොහෝ කොට වෙසෙම් දෝ නො කිපෙන සුල්ලෙම් බොහෝ කොට වෙසෙම් දෝ සකිලිටි සිතැතියෙම් බොහෝ කොට වෙසෙම් දෝ යි, ගිලන් කය ඇති යෙම් බොහෝ කොට වෙසෙම් දෝ නො ගිලන් කය ඇතියෙම් බොහෝ කොට වෙසෙම් දෝ යි. කුසීතයෙම් බොහෝ කොට වෙසෙම් දෝ, ඇරඹූ වැර ඇතියෙම් බොහෝ කොට වෙසෙම් දෝ යි. අසමාහිතයෙම් බොහෝ කොට වෙසෙම් දෝ සමාහිතයෙම් බොහෝ කොට වෙසෙම් දෝ''යි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ නම්: ''අභිධ්‍යාලුයෙම් බොහෝ කොට වෙසෙමි. බ්‍යාපන්නචිත්තයෙම් බොහෝ කොට වෙසෙමි. ථීනමිද්ධපරියුට්ඨිතයෙම් බොහෝ කොට වෙසෙමි. උද්ධතයෙම් බොහෝ කොට වෙසෙමි. විචිකිච්ඡා ඇතියෙම් බොහෝ කොට වෙසෙමි. කිපෙන සුල්ලෙම් බොහෝ කොට වෙසෙමි. සකිලිටි සිතැතියෙම් බොහෝ කොට වෙසෙමි. ගිලන් කය ඇතියෙම් බොහෝ කොට වෙසෙමි. කුසීතයෙම් බොහෝ කොට වෙසෙමි. අසමාහිතයෙම් බොහෝ කොට වෙසෙමි''යි. මහණෙනි, එ මහණහු විසින් එම ලමු අකුසල දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා මහවැරෙක් හා නො පසුබැස්මෙක් හා සතියෙක් හා සම්පජඤ්ඤයෙක් හා කටයුතු යි.

සෙය්‍යථාපි භික්ඛවෙ ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච, උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය එවමෙව ඛො භික්ඛවෙ තෙන භික්ඛුනා තෙසංයෙව පාපකානං අකුසලානං ධම්මානං පහානාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානි ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

සචෙ පන භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'අනභිජ්ඣාලු බහුලං විහරාමි, අබ්‍යාපන්නචිත්තො බහුලං විහරාමි, විගතථීනමිද්ධො බහුලං විහරාමි, තිණ්ණවිචිකිච්ඡො බහුලං විහරාමි, අක්කොධනො බහුලං විහරාමි, අසංකිලිට්ඨචිත්තො බහුලං විහරාමි, අසාරද්ධකායො බහුලං විහරාමි, ආරද්ධවිරියො බහුලං විහරාමි, සමාහිතො බහුලං විහරාමී''ති. තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසුයෙව කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය උත්තරිං ආසවානං ඛයාය යොගො කරණීයො ති.

## 10. 2. 1. 4

## සමථ සුත්තං

[සාවත්ථි]

නො චෙ භික්ඛවෙ භික්ඛු පරචිත්තපරියායකුසලො හොති, අථ ''සචිත්තපරියායකුසලො භවිස්සාමී''ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සචිත්තපරියාය කුසලො හොති, සෙය්‍යථාපි භික්ඛවෙ ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සචෙ තත්‍ථ පස්සති රජං වා අඞ්ගණං වා, තස්සෙව රජස්ස වා අඞ්ගණස්ස වා පහාණාය වායමති, නො චෙ තත්‍ථ පස්සති රජං වා අඞ්ගණං වා, තෙනෙවත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො ''ලාභා වත මෙ පරිසුද්ධං වත මෙ''ති. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො පච්චවෙක්ඛණා බහුකාරා හොති කුසලෙසු ධම්මෙසු. ''ලාභී නු ඛොම්හි අජ්ඣත්තං චෙතොසමථස්ස, න නු ඛොමයි ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී නු ඛොම්හි අධිපඤ්ඤාධම්මවිපස්සනාය. න නු ඛොම්හි ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනායා''ති.

මහණෙනි, යම් පරිදි ඇවිළි පිළි ඇතියේ හෝ ඇවිළි හිස ඇතියේ හෝ එම පිළිය හෝ හිස නිවීම පිණිස අධිමාත්‍ර ඡන්දයක් හා ව්‍යායාමයක් හා උත්සාහයක් හා උස්සොළ්හියක් හා නො පසුබැස්මක් හා සතියක් හා සම්පජඤ්ඤයක් හා කෙරේ ද, මහණෙනි, එ පරිදි ම එ මහණහු විසින් එ ලමු අකුසල් දහමුන්ගේ ප්‍රහාණය පිණිස අධිමාත්‍ර ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා උස්සොළ්හියෙක් හා නො පසු බැස්මෙක් හා සතියෙක් හා සම්පජඤ්ඤයෙක් කටයුතු යි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ නම්, "අනභිධ්‍යාලුයෙම් බොහෝ කොට වෙසෙමි. අව්‍යාපන්නචිත්ත යෙම් බොහෝ කොට වෙසෙමි. විගතථීනමිද්ධයෙම බොහෝ කොට වෙසෙමි. තිණ්ණවිචිකිච්ඡයෙම් බොහෝ කොට වෙසෙමි. නො කිපෙන සුල්ලෙම් බොහෝ කොට වෙසෙමි. නො කිලිටි සිතැතියෙම් බොහෝ කොට වෙසෙමි. ඇරඹූ වැර ඇතියෙම් බොහෝ කොට වෙසෙමි. සමාහිත-යෙම් බොහෝ කොට වෙසෙමි''යි. මහණෙනි, එ මහණහු විසින් එ කුසල් දහම්හි ම පිහිටා මත්තෙහි ආස්‍රවක්ෂය පිණිස යොග කටයුතුයි.

## 10. 2. 1. 4
## සමථ සූත්‍රය

[සැවැත්]

මහණෙනි, ඉදින් මහණ පරචිත්තපරියායකුසල නො වේ නම් එකල සචිත්තපරියායකුසල වෙමි යි මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

මහණෙනි, මහණ කෙසේ නම් සචිත්තපරියායකුසල වේ ය යත්: ''මහණෙනි, යම් සේ දහර වූ තරුණ වූ සැදෙන සැහැවි ඇති ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි පරිශුද්ධ පයඹවදත ආදර්ශයක වේව යි පහන් දියබඳුනක වේවයි සිය මුව නිමිති පිරික්සා දක්නේ ඉදින් එහි රජසක් වේව යි තලකැලලක් වේවයි දක්නේ නම් එම රජස හෝ තල කැලල දුරලීමට ව්‍යායාම කෙරෙයි. ඉදින් එහි රජසක් වේවයි තල කැලලක් වේවයි නොදක්නේ නම් පිරිපුන් මනදෙළ ඇතියේ එකැතින් මට ලාභ-යෙක, එකැතින් මා මුව පිරිසිදු යයි එයින් ම තුටු සිත් ඇතියේ වෙයි. මහණෙනි, එ පරිදි ම මහණහට කුසල් දහම්හි ප්‍රත්‍යවෙක්ෂණාව බහුපකාර වෙයි. ''අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුලු වෙම් දෝ යි අධ්‍යාත්ම යෙහි චිත්තසමථය නො ලබන සුලුයෙම්දෝයි අධිප්‍රඥධර්මවිදර්ශනාව ලබන සුල්ලෙම් දෝයි අධිප්‍රඥධර්ම විදර්ශනාව නො ලබන සුල්ලෙම් දෝ''යි.

සචෙ භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: ''ලාභීම්හි අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනායා''ති. තෙන භික්ඛවෙ භික්ඛුනා අජ්ඣත්තං චෙතොසමථෙ පතිට්ඨාය අධිපඤ්ඤාධම්මවිපස්සනාය යොගො කරණීයො. සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

සචෙ පන භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: ''ලාභීම්හි අධිපඤ්ඤාධම්මවිපස්සනාය න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්සා''ති. තෙන භික්ඛවෙ භික්ඛුනා අධිපඤ්ඤාධම්මවිපස්සනාය පතිට්ඨාය අජ්ඣත්තං චෙතොසමථෙ යොගො කරණීයො. සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය ලාභී ච අජ්ඣත්තං චෙතොසමථස්ස.

සචෙ පන භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: ''න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනායා''ති. තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසංයෙව කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

සෙය්‍යථාපි භික්ඛවෙ ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ තෙන භික්ඛුනා තෙසංයෙව කුසලානං ධම්මානං, පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං. සො අපරෙන සමයෙන ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස ලාභී ච අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

සචෙ පන භික්ඛවෙ භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: ''ලාභිම්හි අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනායා''ති තෙන භික්ඛවෙ භික්ඛුනා තෙසුයෙව කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය උත්තරිං ආසවානං ඛයාය යොගො කරණීයො.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ නම් ''අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුල්ලෙමි, අධිප්‍රඥ ධර්මවිදර්ශනාව නො ලබන සුල්ලෙමි''යි. මහණෙනි, එ මහණහු විසින් අධ්‍යාත්මයෙහි චිත්තසමථයෙහි පිහිටා අධිප්‍රඥධර්මවිදර්ශනාව පිණිස යොග කටයුතු යි.

හේ පසු කල්හි අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබනසුල්ලේත් අධිප්‍රඥ-ධර්මවිදර්ශනාව ලබන සුල්ලේත් වෙයි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ නම් අධිප්‍රඥාධර්මවිදර්ශනාව ලබන සුල්ලෙම් වෙමි. අධ්‍යාත්මයෙහි චිත්ත-සමථය නො ලබන සුල්ලෙම් වෙමි''යි. මහණෙනි, එ මහණහු විසින් අධිප්‍රඥාධර්මවිදර්ශනාවෙහි පිහිටා අධ්‍යාත්මයෙහි චිත්තසමථය පිණිස යොග කටයුතු යි. හේ පසු කල්හි අධිප්‍රඥාධර්මවිදර්ශනා ලබන සුල්ලේත් අධ්‍යාත්මයෙහි චිත්ත සමථය ලබන සුල්ලේත් වෙයි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙසේ දන්නේ නම් අධ්‍යාත්මයෙහි චිත්තසමථය නො ලබන සුල්ලෙම්, අධිප්‍රඥාධර්ම-විදර්ශනාව නොලබන සුල්ලෙමි''යි, මහණෙනි, එ මහණහු විසින් එ කුසල් දහම් ලබනු පිණිස අධිමාත්‍ර ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා මහාවීර්‍ය්‍යයෙක් හා නො පසුබැස්මෙක් හා සතියෙක් හා සම්ප්‍රජන්‍යයෙක් හා කටයුතු.

මහණෙනි, යම් පරිදි ඇවිළගත් පිළි ඇතියේ වේවයි ඇවිළගත් හිස් ඇතියේ වේවයි එම පිළිය හෝ හිස නිවීමට අධිමාත්‍ර ඡන්දය හා ව්‍යායාමය හා උත්සාහය හා උස්සොළ්හිය හා අප්පටිවානිය හා සතිය හා සම්පජඤ්ඤය හා කෙරෙයි. මහණෙනි, එපරිදි ම එ මහණහු විසින් එම කුසල් දහම් ලබනු වස් අධිමාත්‍ර ඡන්දය හා ව්‍යායාමය හා උත්සාහය හා උස්සොළ්හිය හා හා අප්පටිවානිය හා සතිය හා සම්පජඤ්ඤය හා කටයුතු. හේ පසුකල්හි අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුල්ලේත් අධිප්‍රඥාධර්මවිදර්ශනාව ලබන සුල්ලේත් වෙයි.

මහණෙනි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ මෙසේ දන්නේ නම්: ''අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුල්ලෙම් වෙමි: ,අධිප්‍රඥධර්ම විදර්ශනාව ලබන සුල්ලෙම වෙමි''යි. මහණෙනි, එ මහණහු විසින් එම කුසල් දහම්හි පිහිටා මත්තෙහි ආස්‍රවක්ෂයට යොග කටයුතු යි.

චීවරම්පහං භික්ඛවෙ, දුවිධෙන වදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. පිණ්ඩපාතම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි. සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. සෙනාසනම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. ගාමනිගමම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. ජනපදපදෙසම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. පුග්ගලම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි.

"චීවරම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී"ති ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං. තත්‍ථ යං ජඤ්ඤා චීවරං "ඉදං ඛො මෙ චීවරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති. කුසලාධම්මා පරිහායන්තී"ති. එවරූපං චීවරං න සෙවිතබ්බං, තත්‍ථ යං ජඤ්ඤා චීවරං ඉදං ඛො මෙ චීවරං සෙවතො අකුසලා, ධම්මා පරිහායන්ති. කුසලා ධම්මා අභිවඩ්ඪන්තී"ති. එව රූපං චීවරං සෙවිතබ්බං, චීවරම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

"පිණ්ඩපාතම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පී"ති ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ථ යං ජඤ්ඤා පිණ්ඩපාතං ඉමං ඛො මෙ පිණ්ඩපාතං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො පිණ්ඩපාතො න සෙවිතබ්බො. තත්‍ථ යං ජඤ්ඤා පිණ්ඩපාතං ඉමං ඛො මෙ පිණ්ඩපාතං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී ති. එවරූපො පිණ්ඩපාතො සෙවිතබ්බො. පිණ්ඩපාතම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

සෙනාසනම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ථ යං ජඤ්ඤා සෙනාසනං ඉදං ඛො මෙ සෙනාසනං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්තී" ති. එවරූපං සෙනාසනං න සෙවිතබ්බං. තත්‍ථ යං ජඤ්ඤා සෙනාසනං ඉදං ඛො මෙ සෙනාසනං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී ති. එවරූපං සෙනාසනං සෙවිතබ්බං. සෙනාසනම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි ති. ඉති යං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

මහණෙනි, මම සිවුරු ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මහණෙනි, මම පිඩුවා ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මහණෙනි, මම සෙනසුන් ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මහණෙනි, මම ගම්-නියම්ගම් ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මහණෙනි, මම දනව් පියෙස් ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍යදැයි. මහණෙනි, මම පුඟුල් ද දෙපරිදි විසින් කියමි; සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි.

මහණෙනි, මම සිවුරුද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක්පිණිස කියන ලද යත්: "එහි මේ සිවුර සෙවුනා මට අකුසල් දහම් වැඩෙත්, කුසල් දහම් පිරිහෙත්"යි යම් ම සිවුරක් දන්නේ නම් එබඳු සිවුර නො සෙවිය යුතු. එහි මේ සිවුර සෙවුනා මට අකුසල් දහම් පිරිහෙත් කුසල් දහම් වැඩෙතියි යම් ම සිවුරක් දන්නේ නම් එබඳු සිවුරු සෙවිය යුතු. "මහණෙනි, මම සිවුරද දෙපරිදි විසින් කියමි. සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය-දැයි. මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලද.

මහණෙනි, පිඩුවා ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියනලද ය යත්: එහි මෙ පිඩුවා සෙවනා මට අකුසල් දහම්හු වැඩෙත්. කුසල් දහම්හු පිරිහෙති යි යම් ම පිඩුවාවක් දන්නේ නම් එබඳු පිඩුවා නො සෙවිය යුතු. එහි මේ පිඩුවා සෙවුනා මට අකුසල් දහම්හු පිරිහෙත්, කුසල් දහම්හු වැඩෙති යම් පිඩුවාවක් දන්නේ නම් එබඳු පිඩුවා සෙවිය යුතු. මහණෙනි, මම පිඩුවා ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මෙසෙ යමක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලද.

මහණෙනි, මම සෙනසුන් ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලදය යත්: එහි මෙ සෙනසුන් සෙවුනා මට අකුසල් දහම්හු වැඩෙත්, කුසල් දහම්හු පිරිහෙතියි යම් සෙනසුනක් දන්නේ නම් එබඳු සෙනසුන නො සෙවිය යුතු. එහි මෙ සෙනසුන් සෙවුනා මට අකුසල් දහම්හු පිරිහෙත්, කුසල් දහම්හු වැඩෙති යි යම් ම සෙනසුනක් දන්නේ නම් මෙ බඳු සෙනසුනක් සෙවිය යුතු; මහණෙනි, මම සෙනසුන් දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මෙසේ එ යමක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලද.

"ගාමනිගමම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති" ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: "තත්‍ථ යං ජඤ්ඤා ගාමනිගමං ඉදං ඛො මෙ ගාමනිගමං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො ගාමනිගමො න සෙවිතබ්බො, තත්‍ථ යං ජඤ්ඤා ගාමනිගමං ඉමං ඛො මෙ ගාමනිගමං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති. එවරූපො ගාමනිගමො සෙවිතබ්බො. ගාමනිගමම්පාහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති, ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

"ජනපදපදෙසම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති" ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ථ යං ජඤ්ඤා ජනපද පදෙසං ඉමං ඛො මෙ ජනපදපදෙසං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්තීති. එවරූපො ජනපද පදෙසො න සෙවිතබ්බො. තත්‍ථ යං ජඤ්ඤා ජනපදපදෙසං ඉමං ඛො මෙ ජනපදපදෙසං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති. එවරූපො ජනපදපදෙසො සෙවිතබ්බො. ජනපදපදෙසම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

"පුග්ගලම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති" ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං: තත්‍ථ යං ජඤ්ඤා පුග්ගලං ඉමං ඛො මෙ පුග්ගලං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තීති. එවරූපො පුග්ගලො න සෙවිතබ්බො. තත්‍ථ යං ජඤ්ඤා පුග්ගලං ඉමං ඛො මෙ පුග්ගලං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති. එවරූපො පුග්ගලො සෙවිතබ්බො. පුග්ගලම්පහං භික්ඛවෙ දුවිධෙන වදාමි, සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

"මහණෙනි, මම ගම් නියම්ගම් ද දෙපරිදි විසින් කියමි: සෙවිතව්‍ය ද අසෙවිතව්‍යදැයි මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද ය යත්: එහි ගම් නියම්ගම් සෙවුනා මට අකුසල් දහම්හු වැඩෙත්, කුසල් දහම්හු පිරිහෙති යි යම් ම ගම් නියම්ගමක් දන්නේ නම් එ බඳු ගම් නියම් ගම් නො සෙවිය යුතු. එහි මේ ගම් නියම්ගම් සෙවුනා මට අකුසල් දහම්හු පිරිහෙත්, කුසල් දහම්හු වැඩෙති යි යම් ම ගම් නියම්ගම් දන්නේ නම් එබඳු ගම්-නියම්ගම් සෙවිය යුතු. මහණෙනි, ගම් නියම්ගම් ද මම දෙපරිදි විසින් කියමි, සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මෙසේ ඒ යමක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලද.

"මහණෙනි, මම දනව් පියසුදු දෙපරිදි විසින් කියමි, සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලදය යත් නම් එහි මේ දනව් පියස සෙවුනා මට අකුසල් දහම්හු වැඩෙත්, කුසල් දහම්හු පිරිහෙතියි යම් දනව් පියසෙක් දන්නේ නම් එ බඳු දනව් පියෙස් නො සෙවිය යුතු. එහි මේ දනව් පියෙස සෙවුනා මට අකුසල් දහම්හු පිරිහෙත් කුසල් දහම්හු වැඩෙති යි යම් ම දනව් පියෙසක් දන්නේ නම් මෙ බඳු දනව් පියෙස සෙවිය යුතු. මහණෙනි, දනව් පියෙසුදු මම දෙපරිදි විසින් කියමි. සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මෙසේ ඒ යමක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලද.

"මහණෙනි, මම පුහුල් ද දෙපරිදි විසින් කියමි. සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි මෙසේ තෙල යමක් කියන ලද නම් තෙල කුමක් පිණිස කියන ලද යත්: එහි මේ පුහුල් සෙවනා මට අකුසල් දහම්හු වැඩෙත්, කුසල් දහම්හු පිරිහෙති යි යම් ම පුහුලකු දන්නේ නම් මෙ බඳු පුද්ගල නො සෙවිය යුත්තේ ය. එහි මේ පුහුල් සෙවනා මට අකුසල් දහම්හු පිරිහෙත්, කුසල් දහම්හු වැඩෙති යි යම් පුහුලකු දන්නේ නම් මෙ බඳු පුද්ගල සෙවිය යුත්තේ යි. මහණෙනි, මම පුහුල් ද දෙපරිදි විසින් කියමි. සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය දැයි. මෙසේ ඒ යමක් කියන ලද නම් තෙල මෙ පිණිස කියන ලද යි.

## 10. 2. 1. 5
## පරිහාන සුත්තං

[සාවත්ථි]

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවෙති, ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

පරිහානධම්මො පුග්ගලො පරිහානධම්මො පුග්ගලොති ආවුසො වුච්චති කිත්තාවතා නු ඛො ආවුසො පරිහානධම්මො පුග්ගලො වුත්තො භගවතා, කිත්තාවතා ච පන අපරිහානධම්මො පුග්ගලො වුත්තො භගවතාති?

දූරතොපි ඛො මයං ආවුසො ආගච්ඡෙය්‍යාම ආයස්මතො සාරිපුත්තස්ස සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථමඤ්ඤාතුං, සාධුවතායස්මන්තං යෙව සාරිපුත්තං පටිභාතු, එතස්ස භාසිතස්ස අත්ථො. ආයස්මතො සාරිපුත්තස්ස සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙනහාවුසො සුණාථ, සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

කිත්තාවතා නු ඛො ආවුසො පරිහානධම්මො පුග්ගලො වුත්තො භගවතා: ඉධාවුසො භික්ඛු අස්සුතඤ්චෙව ධම්මං න සුණාති, සුතා චස්ස ධම්මා සම්මොසං ගච්ඡන්ති. යෙ චස්ස ධම්මා පුබ්බෙ චෙතසො සම්ඵුට්ඨපුබ්බා, තෙ ච න සමුදාචරන්ති. අවිඤ්ඤාතඤ්ච න විජානාති. එත්තාවතා ඛො ආවුසො පරිහානධම්මො පුග්ගලො වුත්තො භගවතා.

කිත්තාවතා ච පනාවුසො අපරිහානධම්මො පුග්ගලො වුත්තො භගවතා: ඉධාවුසො භික්ඛු අස්සුතඤ්චෙව ධම්මං සුණාති. සුතා චස්ස ධම්මා න සම්මොසං ගච්ඡන්ති, යෙ චස්ස ධම්මා පුබ්බෙ චෙතසො සම්ඵුට්ඨපුබ්බා, තෙ ච සමුදාචරන්ති, අවිඤ්ඤාතඤ්ච විජානාති එත්තාවතා ඛො ආවුසො අපරිහානධම්මො පුග්ගලො වුත්තො භගවතා.

# 10. 2. 1. 5
## පරිහාන සූත්‍රය

[සැවැත්]

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ඇවැත් මහණෙනි යි භික්ෂූන් ඇමතූහ, එ භික්ෂූහු ඇවැත්නි යි ආයුෂ්මත් සැරියුත් තෙරුනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල කීහ:

ඇවැත්නි, පිරිහෙන සැහැවි ඇති පුහුලා ය, පිරිහෙන සැහැවි ඇති පුහුලා යි කියනු ලැබේ. ඇවැත්නි, කෙතෙකින් පුහුල් පිරිහෙන සැහැවි ඇත්තේ ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ද? 'කෙතෙක් කරුණින් පුහුල් නො පිරිහෙන සැහැවි ඇත්තේ ය'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ද?

''ඇවැත්නි, අපි ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් හමුයෙහි තෙල භාෂිතයාගේ අර්‍ථය දැනගන්නට දුර සිට වුවත් පැමිණෙම්හ. එකැතින් තෙල භාෂිතයාගේ අර්‍ථය ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට ම වැටහේ නම් මැනැව. ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ භාෂිතය අසා භික්ෂූහු ධරන්නාහ''යි.

ඇවැත්නි, එසේ නම් අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි යි. ඇවැත්නි, එසේයයි ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට පිළිවදන් ඇස්වූ හ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල කීහ.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් කෙතෙක් කරුණින් පුහුල් පිරිහෙන සැහැවි ඇතියේ ය යි වදරණ ලද්දේය යත්: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ ශ්‍රැත ධර්‍මයත් නො අසන්නේ ය. ඔහු විසින් අශ්‍රැත ධර්මයෝත් සම්මෝහයට යෙත්. යම් දහම් කෙනෙකුත් පෙර ඔහු විසින් සිතින් පහස්නාලැවිරු නම් ඔහුත් උද නො වෙත්. අවිඥතයත් නො දන්නේ ය. ඇවැත්නි, මෙතෙකින් පුහුල් පිරිහෙන සැහැවි ඇත්තේ ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද්දේ ය.

ඇවැත්නි, කෙතෙකින් පුහුල් නො පිරිහෙන සැහැවි ඇතැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ ද යත්: ඇවැත්නි, මෙ සස්නෙහි මහණ අශ්‍රැත ධර්මය ද අසන්නේ ය. ඔහු විසින් ශ්‍රැත ධර්මයෝ ද සම්මෝහයට නො යෙත්. යම් ධර්‍ම කෙනෙකුත් ඔහු විසින් පෙර සිතින් නො පහස්නා ලද විරු නම් ඔහු ද උද වෙත්. අවිඥතය ද දැනගන්නේය. ඇවැත්නි, මෙතෙකින් පුද්ගල අපරිහානධර්‍ම ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද්දේ ය.

නො චෙ ආවුසො භික්ඛු පරචිත්තපරියාය කුසලො හොති, අථ සචිත්තපරියාය කුසලො භවිස්සාමී ති එවං හි වො ආවුසො සික්ඛිතබ්බං.

කථඤ්චාවුසො භික්ඛු සචිත්තපරියාය කුසලො හොති: සෙය්‍යථාපි ආවුසො ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනක ජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ, අච්ඡෙ වා උදපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සචෙ තත්ථ පස්සති රජං වා අඞ්ගණං වා, තස්ස රජස්ස වා අඞ්ගණස්ස වා පහානාය වායමති. නො චෙ තත්ථ පස්සති රජං වා අඞ්ගණං වා, තෙනෙවත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො, ලාභා වත මෙ, පරිසුද්ධං වත මෙති. එවමෙව ඛො ආවුසො භික්ඛුනො පච්චවෙක්ඛනා බහුකාරා හොති කුසලෙසු ධම්මෙසු.

අනභිජ්ඣාලූ නු ඛො බහුලං විහරාමි, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. අබ්‍යාපන්නචිත්තො නු ඛො බහුලං විහරාමි, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. විගතථීනමිද්ධො බහුලං විහරාමි. සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. අනුද්ධතො නු ඛො බහුලං විහරාමි, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. තිණ්ණවිචිකිච්ඡො නු ඛො බහුලං විහරාමි, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. අක්කොධනො නු ඛො බහුලං විහරාමි, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. අසංකිලිට්ඨචිත්තො නු ඛො බහුලං විහරාමි, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. ලාභී නු ඛොම්හි අජ්ඣත්තං ධම්මපාමුජ්ජස්ස, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. ලාභී නු ඛොම්හි අජ්ඣත්තං චෙතො සමථස්ස, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නො. ලාභී නු ඛොම්හි අධිපඤ්ඤා ධම්මවිපස්සනාය, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො, උදාහු නොති.

සචෙ ආවුසො භික්ඛු පච්චවෙක්ඛමානො සබ්බෙපි මෙ කුසලෙ ධම්මෙ අත්තනි න සමනුපස්සති, තෙනාවුසො භික්ඛුනා සබ්බෙසඤ්ඤෙව ඉමෙසං කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං. සෙය්‍යථාපි ආවුසො ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො ආවුසො තෙන භික්ඛුනා සබ්බෙසඤ්ඤෙව ඉමෙසං කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

ඇවැත්නි, ඉදින් මහණ පරචිත්තපරියාය කුසල නො වේ නම් එකල සචිත්තපරියාය කුසල වෙමි යි ඇවැත්නි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු.

ඇවැත්නි, කෙසේ නම් මහණ සචිත්තපරියාය කුසල වේ ය යත්: ඇවැත්නි, යම්සේ දහර වූ තරුණ වූ සරහන සැහැවි ඇති ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි පිරිසිදු පයඃීවදත ආදශීයෙක හෝ පහන් දිය බඳුනෙක හෝ තම මුව නිමිති පිරික්සනුයේ ඉදින් එහි රජසක් වේව යි තලකැලලෙක් වේව යි දක්නේ නම් ඒ රජස හෝ තලකැලල හෝ දුරලීමට ව්‍යායාම කෙරෙයි. ඉදින් එහි රජසක් හෝ තලකැලලක් නො දක්නේ නම් පිරිපුන් මනදෙළ ඇතියේ එකැතින් මට ලාභයෙක, එකැතින් මා මුව පිරිසිදු ය යි එයින් ම තුටු සිත් ඇත්තේ වෙයි. ඇවැත්නි, එසෙයින් ම භික්ෂුහට කුශලධර්මයන්හි ප්‍රත්‍යවෙක්ෂණාව බහූපකාර වෙයි.

අනභිජ්ඣාලුයෙම් බොහෝ කොට වෙසෙම් ද මට තෙල දහම විද්‍යමාන ද, නොහොත් අවිද්‍යමාන ද යි. අව්‍යාපන්න චිත්තයෙම් බොහෝ කොට වෙසෙම්ද. මට තෙල දහම විද්‍යමාන වේ ද නොහොත් අවිද්‍යමාන වේ ද යි. විගතථීනමිද්ධයෙම් බහුලකොට වෙසෙම් ද. මට තෙල දහම ඇත්තේ ද, නැතහොත් නැත්තේ දයි. අනුද්ධතයෙම් බොහෝ කොට වෙසෙම් ද, මට තෙල ධර්මය ඇත්තේද යි, නැතහොත් නැත්තේද යි. තිණ්ණවිචිකිච්ඡයෙම් බොහෝ කොට වෙසෙම් මට තෙල දහම ඇත්තේ ද නැතහොත් නැත්තේ දයි, නොකිපෙන සුල්ලෙම් බොහෝ කොට වෙසෙම් ද, මට තෙල දහම ඇත්තේ ද, නොහොත් නැත්තේ ද යි. නොකිළිටි සිතැතියෙම් බොහෝ කොට වෙසෙම් ද, මට තෙල දහම් ඇත්තේ ද, නොහොත් නැත්තේද යි. අධ්‍යාත්මයෙහි ධර්මප්‍රාමොද්‍යය ලබන සුලු වෙම් ද, මට තෙල දහම ඇත්තේ ද නොහොත් නැත්තේ ද, අධ්‍යාත්මයෙහි චිත්තසමථය ලබන සුලු වෙම් ද. මට තෙල දහම ඇත්තේ ද නොහොත් නැත්තේ ද, අධිප්‍රඥධර්මවිදර්ශනාව ලබන සුලු වෙම් ද. මට තෙල දහම ඇත්තේ ද නොහොත් නැත්තේ දයි.

ඇවැත්නි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙ හැම කුසල් දහම් තමා කෙරෙහි ලා නො දක්නේ ද ඇවැත්නි, එ මහණහු විසින් මෙ හැම කුසල් දහම් ලබනු වස් අධිමාත්‍ර ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා මහාවීර්‍ය්‍යයෙක් හා නො පසුබැස්මෙක් හා ස්මෘතියෙක් හා සම්ප්‍රජන්‍යයෙක් කටයුතු. ඇවැත්නි, යම් සේ ඇවිළගත් පිළී ඇතියේ වේව යි, ඇවිළගත් හිස ඇතියේ වේව යි එම පිළිය හෝ හිස හෝ නිවීමට අධිමාත්‍ර ඡන්දයක් හා ව්‍යායාමයක් හා උත්සාහයක් හා වීර්‍ය්‍යයක් හා නො පසුබැස්මක් ස්මෘතියක් හා සම්ප්‍රජන්‍යයක් හා කරන්නේ ය. ඇවැත්නි, එ පරිදිම එ මහණහු විසින් මෙ හැම කුසල් දහම් ලබනු වස් අධිමාත්‍ර ඡන්දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා වීර්‍ය්‍යයෙක් හා නො පසුබැස්මක් හා සිහියක් හා මනා නුවණක් හා කටයුතු.

සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො එකච්චෙ කුසලෙ ධම්මෙ අත්තනි සමනුපස්සති, එකච්චෙ කුසලෙ ධම්මෙ අත්තනි න සමනුපස්සති, තෙනාවුසො භික්ඛුනා යෙ කුසලෙ ධම්මෙ අත්තනි සමනුපස්සති, තෙසු කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය, යෙ කුසලෙ ධම්මෙ අත්තනි න සමනුපස්සති, තෙසං කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

සෙය්‍යථාපි ආවුසො ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො ආවුසො තෙන භික්ඛුනා යෙ කුසලෙ ධම්මෙ අත්තනි සමනුපස්සති, තෙසු කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය යෙ කුසලෙ ධම්මෙ අත්තනි න සමනුපස්සති, තෙසං කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.

සචෙ පනාවුසො භික්ඛු පච්චවෙක්ඛමානො සබ්බෙපි මෙ කුසලෙ ධම්මෙ අත්තනි සමනුපස්සති, තෙනාවුසො භික්ඛුනා සබ්බෙසුයෙව ඉමෙසු කුසලෙසු ධම්මෙසු පතිට්ඨාය උත්තරිං ආසවානං ඛයාය යොගො කරණීයොති.

## 10. 2. 1. 6

### පඨමසඤ්ඤා සුත්තං

**[සාවත්ථි]**

දසයිමා භික්ඛවෙ සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා කතමා දස:

අසුභසඤ්ඤා, මරණසඤ්ඤා, ආහාරෙපටිකූලසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, අනිච්චසඤ්ඤා, අනිච්චෙ දුක්ඛසඤ්ඤා, දුක්ඛෙ අනත්තසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා. ඉමා ඛො භික්ඛවෙ දසසඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති.

ඇවැත්නි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ ඇතැම් කුසල් දහම් තමා කෙරෙහි ලා දක්නේ ද, සමහර කුසල් දහම් තමා කෙරෙහි ලා නො දක්නේ ද, ඇවැත්නි, එ මහණහු විසින් යම් කුසල් දහම් තමා කෙරෙහි ලා දක්නේ නම් එ කුසල් දහම්හි පිහිටා යම් කුසල් දහම් තමා කෙරෙහි ලා නො දක්නේ නම් එ කුසල් දහම් ලබනුවට අධිමාත්‍ර ඡන්‍දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා වීර්‍ය්‍යයෙක් හා නො පසුබැස්මෙක් හා සිහියක් හා මනා නුවණක් හා කටයුතු.

ඇවැත්නි, යම් පරිදි ඇවිළගත් පිළී ඇතියේ වේවයි, ඇවිළගත් හිස ඇතියේ වේව යි එම පිළිය හෝ හිස නිවනට අධිමාත්‍ර ඡන්‍දයක් හා ව්‍යායාමයක් හා උත්සාහයක් හා වීර්‍ය්‍යයක් හා නො පසුබැස්මක් හා සිහියක් හා මනා නුවණක් හා කරන්නේ ද ඇවැත්නි, එ පරිදි ම එ මහණහු විසින් යම් කුසල් දහම් තමා කෙරෙහි දක්නේ නම් එ කුසල් දහම් හි පිහිටා, යම් කුසල් දහම් තමා කෙරෙහි ලා නො දක්නේ නම් එ කුසල් දහම් ලබනු වස් අධිමාත්‍ර ඡන්‍දයෙක් හා ව්‍යායාමයෙක් හා උත්සාහයෙක් හා වීර්‍ය්‍යයෙක් හා නො පසුබැස්මෙක් හා සිහියක් හා මනා නුවණක් හා කටයුතු.

ඇවැත්නි, ඉදින් මහණ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ මෙ හැම කුසල් දහම් තමා කෙරෙහි දක්නේ නම්, ඇවැත්නි, එ මහණහු විසින් මෙ හැම කුසල් දහම් හි පිහිටා මත්තෙහි ආස්‍රවක්ෂය පිණිස යොග කටයුතු යි.

## 10. 2. 1. 6

## ප්‍රථම සංඥා සූත්‍රය

[සැවැත්]

මහණෙනි, මෙ දසසංඥාවෝ භාවිත බහුලීකෘත වූවාහු මහත්ඵල මහානෘශංස වූවාහු නිවනට වදනාහු නිවන් අවසන් කොට ඇත්තාහු වෙත්. කවර දසයෙක යත්:

අශුභසංඥා යැ මරණසංඥා යැ ආහාරයෙහි ප්‍රතිකූලසංඥා යැ සර්වලොකයෙහි අනභිරතසංඥා යැ අනිත්‍යසංඥා යැ අනිත්‍යයෙහි දුඃඛ සංඥා යැ දුඃඛයෙහි අනාත්මසංඥා යැ ප්‍රහාණසංඥා යැ විරාගසංඥා යැ නිරොධසංඥා යි. මහණෙනි, මේ දස සංඥාවෝ භාවිත බහුලීකෘත වූවාහු නිවනට වදනාහු නිවන අවසන් කොට ඇත්තාහු වෙත් යී.

## 10. 2. 1. 7

## දුතිය සඤ්ඤා සුත්තං

[සාවත්ථි]

දස ඉමා භික්ඛවෙ සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානා කතමා දස:

අනිච්චසඤ්ඤා අනත්තසඤ්ඤා මරණසඤ්ඤා ආහාරෙ පටික්කූලසඤ්ඤා සබ්බලොකෙ අනභිරතසඤ්ඤා අට්ඨිකසඤ්ඤා, පුලවකසඤ්ඤා විනීලකසඤ්ඤා විච්ඡිද්දකසඤ්ඤා උද්ධුමාතකසඤ්ඤා.

ඉමා ඛො භික්ඛවෙ දස සඤ්ඤා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා අමතොගධා අමතපරියොසානාති.

## 10. 2. 1. 8

## මූලක සුත්තං

[සාවත්ථි]

සචෙ භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "කිම්මූලකා ආවුසො සබ්බෙ ධම්මා, කිංසම්භවා සබ්බෙ ධම්මා, කිංසමුදයා සබ්බෙ ධම්මා කිංසමොසරණා සබ්බෙ ධම්මා, කිංපමුඛා සබ්බෙ ධම්මා, කිමාධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, කිංඋත්තරා සබ්බෙ ධම්මා, කිංසාරා සබ්බෙ ධම්මා, කිංඔගධා සබ්බෙ ධම්මා, කිංපරියොසානා සබ්බෙ ධම්මාති?" එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං කින්ති බ්‍යාකරෙය්‍යාථාති?

භගවම්මූලකා නො භන්තෙ ධම්මා, භගවන්නෙත්තිකා, භගවංපටිසරණා සාධු වත භන්තෙ භගවන්තං යෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමී ති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

## 10. 2. 1. 7
## දුතිය සඤ්ඤා සූත්‍රය

මහණෙනි, මේ දසසංඥවෝ භාවිත බහුලීකෘත වූවාහු මහත්ඵල මහානෘශංස වූවාහු නිවනට වදනාහු නිවන අවසන් කොට ඇත්තාහු වෙත්. කවර දසයෙක යත්:

අනිත්‍ය සංඥ යැ අනාත්මසංඥ යැ මරණසංඥ යැ ආහාරයෙහි ප්‍රතිකූලසංඥ යැ සර්වලොකයෙහි අනභිරතසංඥ යැ අස්ථිකසංඥ යැ පුලවකසංඥ යැ විනීලකසංඥ යැ විච්ඡිද්දකසංඥ යැ උද්ධුමාතකසංඥයි.

මහණෙනි, මේ දසසංඥාවෝ භාවිත බහුලීකෘත වූවාහු මහත් ඵල මහානෘශංස වූවාහු නිවනට වදනාහු නිවන අවසන් කොට ඇත්තාහු වෙත් යී.

## 10. 2. 1. 8
## මූලක සූත්‍රය

ඉදින් මහණෙනි, අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ පුළුවුස්නාහු නම්: "ඇවැත්නි හැම දහම්හු කුමක් මුල්කොට ඇද්ද? හැම දහම්හු කුමක් සම්භව කොට ඇද්ද? හැම දහම්හු කුමක් සමුදය කොට ඇද්ද? හැම දහම්හු කුමක් සමවසරණ කොට ඇද්ද? හැම දහම්හු කුමක් පාමොක් කොට ඇද්ද? හැම දහම්හු කුමක් අධිපති කොට ඇද්ද? හැම දහම්හු කුමක් උතුරු කොට ඇද්ද? හැම දහම්හු කුමක් සාර කොට ඇද්ද? හැම දහම්හු කුමකට වදනාහු ද? හැම දහම්හු කුමක් අවසන් කොට ඇද්ද"යි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට කුමැයි පවසවු ද?

වහන්ස, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ නෙතෘ කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇතියහ. වහන්ස, එකැතින් තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන්වහන්සේට ම වැටහේ නම් මැනව. භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අසා භික්ෂුහු ධරන්නාහ යි.

මහණෙනි, එසේ වී නම් අසව, මැනැවින් මෙනෙහි කරව, කියන්නෙමියි 'වහන්ස, එසේය'යි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළහ:

සචෙ භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කිම්මූලකා ආවුසො සබ්බෙ ධම්මා, කිංසම්භවා සබ්බෙ ධම්මා, කිංසමුදයා සබ්බෙ ධම්මා, කිංසමොසරණා සබ්බෙ ධම්මා, කිංපමුඛා සබ්බෙ ධම්මා, කිංආධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, කිංඋත්තරා සබ්බෙ ධම්මා, කිංසාරා සබ්බෙ ධම්මා, කිංඔගධා සබ්බෙ ධම්මා, කිංපරියොසානා සබ්බෙ ධම්මාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ:

ඡන්දමූලකා ආවුසො සබ්බෙ ධම්මා, මනසිකාරසම්භවා සබ්බෙ ධම්මා, ඵස්සසමුදයා සබ්බෙ ධම්මා වෙදනා සමොසරණා සබ්බෙ ධම්මා, සමාධිපමුඛා සබ්බෙ ධම්මා, සතාධිපතෙය්‍යා සබ්බෙ ධම්මා, පඤ්ඤුත්තරා සබ්බෙ ධම්මා, විමුත්තිසාරා සබ්බෙ ධම්මා, අමතොගධා සබ්බෙ ධම්මා, නිබ්බානපරියොසානා සබ්බෙ ධම්මාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 10. 2. 1. 9

## පබ්බජ්ජා සුත්තං

**[සාවත්ථි]**

තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: යථා පබ්බජ්ජාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති. න චුප්පන්නා පාපකා අකුසලා ධම්මා චිත්තං පරියාදය ඨස්සන්ති. අනිච්චසඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති අනත්තසඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති. අසුභසඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති ආදීනවසඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති. ලොකස්ස සමඤ්ච විසමඤ්ච ඤත්වා තං සඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති. ලොකස්ස සම්භවඤ්ච විභවඤ්ච ඤත්වා තං සඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති. ලොකස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච ඤත්වා තං සඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති. පහානසඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති. විරාගසඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සති. නිරොධසඤ්ඤාපරිචිතඤ්ච නො චිත්තං භවිස්සතීති. එවං හි වො සික්ඛිතබ්බං.

මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ මෙසේ පුළුවුස්නාහු නම්: "ඇවැත්නි, හැම දහම්හු කුමක් මුල් කොට ඇතියහු ද? හැම දහම්හු කුමක් සම්භව කොට ඇතියහු ද? හැම දහම්හු කුමක් සමුදය කොට ඇතියහු ද? හැම දහම්හු කුමක් සමවසරණ කොට ඇතියහු ද? හැම දහම්හු කුමක් පාමොක් කොට ඇතියහු ද? හැම දහම්හු කුමක් අධිපති කොට ඇතියහු ද? හැම දහම්හු කුමක් උතුරු කොට ඇතියහු ද? හැම දහම්හු කුමක් සාර කොට ඇතියහු ද? හැම දහම්හු කුමකට වදනාහු ද? හැම දහම්හු කුමක් අවසන් කොට ඇතියහු දැ?'' යි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජනට මෙසේ කියව:

ඇවැත්නි, හැම දහම්හු ඡන්දය මුල්කොට ඇතියහ. හැම දහම්හු මනසිකාරය සම්භව කොට ඇතියහ. හැම දහම්හු ස්පර්ශය සමුදය කොට ඇතියහ. හැම දහම්හු වෙදනාව සමවසරණ කොට ඇතියහ. හැම දහම්හු සමාධිය පාමොක් කොට ඇතියහ. හැම දහම්හු ස්මෘතිය අධිපති කොට ඇතියහ, හැම දහම්හු ප්‍රඥාව උතුරු කොට ඇතියහ. හැම දහම්හු නිවනට වදනාහ. හැම දහම්හු නිවන අවසන් කොට ඇතියහ යි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජනට මෙසේ කියවු යි.

## 10. 2. 1. 9
## පබ්බජ්ජා සූත්‍රය

[සැවැත්]

මහණෙනි, මෙහිලා මෙසේ හික්මිය යුතු: අපට පැවිද්දට නිසි සේ පුරුදු කළ සිතෙක් වන්නේ ය, උපන් ලමු අකුසල් දහම්හු සිත මැඩගෙන නො සිටුනාහ, අනිත්‍යසංඥාවට පුරුදු කළ සිත අපට වන්නේ ය, අනාත්මසංඥාවෙහි පුරුදු කළ සිත අපට වන්නේ ය, අශුභසංඥාවෙහි පුරුදු කළ සිත අපට වන්නේ ය, ආදීනවසංඥායෙහි පුරුදු කළ සිත අපට වන්නේ ය, ලොකයාගේ සමය හා විසමය ද දැන ඒ සංඥාවෙහි පුරුදු කළ සිත අපට වන්නේ ය. ලොකයාගේ සම්භවය හා විභවය හා දැන එ සංඥාවෙහි පුරුදුකළ සිත අපට වන්නේ ය, පඤ්චස්කන්ධ ලොකයාගේ සමුදය ද අස්තගමය ද දැන එ සංඥායෙහි පරිචිත වූ සිත අපට වන්නේ ය, ප්‍රහාණසංඥායෙහි පරිචිත චිත්තය අපට වන්නේ ය, විරාගසංඥායෙහි පරිචිත සිත අපට වන්නේ ය, නිරොධසංඥායෙහි පරිචිත සිත අපට වන්නේ ය යි තොප විසින් මෙසේ ම හික්මිය යුතු.

යතො ඛො භික්ඛවෙ භික්ඛුනො යථා පබ්බජ්ජාපරිචිතඤ්ච චිත්තං හොති. න චුප්පන්නා පාපකා අකුසලා ධම්මා චිත්තං පරියාදාය තිට්ඨන්ති. අනිච්චසඤ්ඤා පරිචිතඤ්ච චිත්තං හොති. අනත්තසඤ්ඤා පරිචිතඤ්ච චිත්තං හොති. අසුභසඤ්ඤා පරිචිතඤ්ච චිත්තං හොති, ආදීනවසඤ්ඤාපරිචිතඤ්ච චිත්තං හොති. ලොකස්ස සමඤ්ච විසමඤ්ච ඤත්වා තංසඤ්ඤාපරිචිතඤ්ච චිත්තං හොති. ලොකස්ස සම්භවඤ්ච විභවඤ්ච ඤත්වා තංසඤ්ඤාපරිචිතඤ්ච චිත්තං හොති. ලොකස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච ඤත්වා තං සඤ්ඤා පරිචිතඤ්ච චිත්තං හොති. පහානසඤ්ඤා පරිචිතඤ්ච චිත්තං හොති. විරාගසඤ්ඤා පරිචිතඤ්ච චිත්තං හොති. නිරොධසඤ්ඤාපරිචිතඤ්ච චිත්තං හොති, තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතාති.

## 10. 2. 1. 10

## ගිරිමානන්ද සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ගිරිමානන්දො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසංකමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

ආයස්මා භන්තෙ ගිරිමානන්දො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො, සාධු භන්තෙ භගවා යෙනායස්මා ගිරිමානන්දො තෙනුපසංකමතු අනුකම්පං උපාදායාති.

සචෙ ඛො ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනො උපසංකමිත්වා දසසඤ්ඤා භාසෙය්‍යාසි, ඨානං ඛො පනෙතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනො දසසඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භෙය්‍ය.

කතමා දස:

අනිච්චසඤ්ඤා, අනත්තසඤ්ඤා, අසුභසඤ්ඤා, ආදීනවසඤ්ඤා, පහානසඤ්ඤා, විරාගසඤ්ඤා, නිරොධසඤ්ඤා, සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා, ආනාපානසති.

මහණෙනි, යම් කලෙක සිට මහණහට පැවිද්දට නිසි කොට පුරුදු කළ සිත වේ ද, උපන් ලමු අකුසල් දහම්හු සිත මැඩගෙන නො සිටුනාහු ද, අනිත්‍යසංඥයෙහි පරිචිත සිතත් වේ ද, අනාත්මසංඥයෙහි පරිචිත සිතත් වේ ද, අශුභසංඥයෙහි පරිචිත සිතත් වේ ද, ආදීනවසංඥයෙහි පරිචිත සිතත් වේ ද, සත්ත්වලොකයාගේ සම විසමත් දැන එ සංඥයෙහි පරිචිත සිතත් වේ ද, ලොකයාගේ සම්භව විභව දෙකත් දැන එ සංඥයෙහි පරිචිත සිතත් වේ ද, ලොකයාගේ සමුදය අස්තගමයත් දැන එ සංඥයෙහි පරිචිත සිතත් වේ ද, ප්‍රහාණසංඥයෙහි පරිචිත සිතත් වේ ද, විරාගසංඥයෙහි පරිචිත සිතත් වේ ද, නිරොධසංඥයෙහි පරිචිත සිතත් වේ ද, ඔහට ඉහාත්මයෙහි අර්හත්ත්වය හෝ උපාදිශෙෂය ඇති වත් ම අනාගාමිත්වය හෝ යි උභය ඵලයන්ගෙන් අන්‍යතර ඵලයක් කැමැති වියයුතු යි.

## 10. 2. 1. 10
## ගිරිමානන්ද සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත සමීපයෙහි අනේපිඩුහුගේ ජෙතවන නම් අරම්හි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ගිරිමානන්ද තෙරණුවෝ හටගත් ආබාධ ඇතියාහු දුකට පැමිණියාහු දැඩි ගිලන් බැව් ඇතියාහු වෙත්. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැද එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ:

වහන්ස, ආයුෂ්මත් ගිරිමානන්ද තෙරණුවෝ උපන් ආබාධ ඇතියාහු පැමිණි දුක් ඇතියාහු දැඩි ගිලන්බව ඇතියාහු වෙත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් කරා වඩනා සේක් නම් මැනැවැ යි.

ආනන්දයෙනි, ඉදින් තෙපි ගිරිමානන්ද මහණහු වෙත එළැඹ දශ සංඥ කියහු නම්, යම් හෙයෙකින් දශසංඥ අසා ගිරිමානන්ද මහණහුගේ ඒ ආබාධය හෙතු විසින් සන්හිඳෙන්නේ ය යන තෙල කරුණ ඇත.

කවර දශයෙක යත්:

අනිත්‍යසංඥ යැ, අනාත්මසංඥ යැ, අශුභසංඥා යැ, ආදීනවසංඥා යැ, ප්‍රහාණසංඥ යැ, විරාගසංඥ යැ, නිරොධසංඥ යැ, හැමලෝහි අනභිරතසංඥ යැ, සවුසකරන්හි අනිත්‍යසංඥා යැ, ආනාපාන සති යැ යි.

1. කතමාචානන්ද අනිච්චසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසංචික්ඛති: "රූපං අනිච්චං වෙදනා අනිච්චා සඤ්ඤා අනිච්චා සඞ්ඛාරා අනිච්චා විඤ්ඤාණං අනිච්චන්ති". ඉති ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු අනිච්චානුපස්සී විහරති. අයං වුච්චතානන්ද අනිච්චසඤ්ඤා.

2. කතමාචානන්ද අනත්තසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා -පෙ- ඉතිපටිසඤ්චික්ඛති: "චක්ඛුං[1] අනත්තා, රූපා[2] අනත්තා සොතං අනත්තා, සද්ද අනත්තා, ඝානං අනත්තා, ගන්ධා අනත්තා, ජිව්හා අනත්තා, රසා අනත්තා, කායො අනත්තා, ඵොට්ඨබ්බා අනත්තා, මනො අනත්තා, ධම්මා අනත්තා"ති. ඉති ඉමෙසු ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු අනත්තානුපස්සී විහරති. අයං වුච්චතානන්ද අනත්තසඤ්ඤා.

3. කතමාචානන්ද අසුභසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති: "අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදෙ මෙදෙ, අස්සු වසා ඛෙළො සිඞ්ඝාතිකා ලසිකා මුත්තන්ති" ඉති ඉමස්මිං කායෙ අසුභානුපස්සී විහරති, අයං වුච්චතානන්ද අසුභසඤ්ඤා.

4. කතමාචානන්ද ආදීනවසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉතිපටිසඤ්චික්ඛති: "බහු දුක්ඛො ඛො අයං කායො බහු ආදීනවො, ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති, සෙය්‍යථීදං: චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො

1. චක්ඛු අනත්තා - මජසං. 2. රූපං - සිමු.

1. ආනන්දයෙනි, අනිච්චසංඥා කවර:

ආනන්දයෙනි, මෙසස්නෙහි මහණ වලට ගියේ වේවයි රුක්මුලට ගියේ වේව යි ශූන්‍යාගාරයට ගියේ වේවයි මෙසේ නුවණින් සලකන්නේ ය: ''රූපය අනිත්‍ය ය, වේදනා අනිත්‍ය ය, සංඥා අනිත්‍ය ය, සංස්කාරයෝ අනිත්‍යයහ, විඥානය අනිත්‍ය ය''යි. මෙසේ මේ පඤ්චෝපාදානස්කන්ධයන්හි අනිත්‍යානුදර්ශී ව වසයි. ආනන්දයෙනි, මේ අනිත්‍යසංඥා යයි කියනු ලැබේ.

2. ආනන්දයෙනි, අනාත්මසංඥා කවර:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ වලට ගියේ වේවයි ... මෙසේ නුවණින් සලකන්නේ ය: චක්ෂුස අනාත්ම ය, රූප අනාත්ම ය, ශ්‍රොතස අනාත්ම ය, ශබ්ද අනාත්ම ය, ඝ්‍රාණය අනාත්ම ය, ගන්ධ අනාත්ම ය ජිහ්වා අනාත්ම ය රස අනාත්ම ය, කය අනාත්ම ය ධර්ම අනාත්ම ය''යි මෙසේ මේ ස වැදෑරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි අනාත්මානුදර්ශී ව වාසය කරයි. ආනන්දයෙනි, මේ අනාත්මසංඥා යි කියනු ලැබේ.

3. ආනන්දයෙනි, අශුභසංඥා කවර:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ පා තලින් උඩ, කෙස්මතුයෙන් යට සම හිම් කොට ඇති නානාප්‍රකාර අශුචියෙන් පිරි මෙම කය ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය: මේ කායයෙහි කෙශයෝ ය, රොමයෝ ය, නිය ය, දත් ය, සම් ය, මාංස ය, නහර ය, ඇට ය, ඇටමිදුලු ය, වකුගඩු ය; හෘදය ය, අක්මා ය, දලබු ය, බඩදිව ය, පපුකැණ ය, අතුනු ය, අතුනුබහන ය, ඖදය්‍යී ය, පුරීෂ ය, පිත් ය, ශ්ලෙස්මා ය, පූයා ය, ලේ ය, සෝදිය ය, මේදස් ය, කඳුළු ය, වුරුණුතෙල් ය, කෙල ය, මුකුනු ය, සඳ මිදුලු ය, මූ ය යන මොහු ඇතැයි මෙසේ මෙ කයෙහි අශුභානුදර්ශී ව වාසය කරයි. ආනන්දයෙනි, මේ අශුභසංඥා යි කියනු ලැබේ.

4. ආනන්දයෙනි, ආදීනවසංඥා කවර:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ වලට ගියේ වේවයි රුක්මුලට ගියේ වේවයි ශූන්‍යාගාරයට ගියේ වේවයි මෙසේ සලකන්නේ ය: බොහෝ දුක් ඇති මේ කය බොහෝ ආදීනව ඇත්තේ ය. මෙසේ මේ කයෙහි විවිධ ආබාධයෝ උපදනාහ. ඔහු කවරහයත්: චක්ඛුරොග ය, සොතරොග ය, ඝානරොග ය, ජිව්හාරොග ය, කායරොග ය, සීසරොග ය, කණ්ණරොග ය, මුඛරොග ය,

දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා[1] විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා, වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො''ති. ඉති ඉමස්මිං කායෙ ආදීනවානුපස්සී විහරති. අයං වුච්චතානන්ද ආදීනවසඤ්ඤා.

5. කතමා චානන්ද පහානසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නං ව්‍යාපාද විතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නං විහිංසා විතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනාභාවං ගමෙති. අයං වුච්චතානන්ද පහානසඤ්ඤා.

6. කතමා චානන්ද විරාගසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: ''එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො, තණ්හක්ඛයො විරාගො නිබ්බානන්ති. අයං වුච්චතානන්ද විරාගසඤ්ඤා.

7. කතමා චානන්ද නිරොධසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසංචික්ඛති: ''එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො නිරොධො නිබ්බානන්ති''. අයං වුච්චතානන්ද නිරොධසඤ්ඤා.

---

1. නඛසා – මජසං

දන්තරොග ය, කාස ය, ශ්වාස ය, පිනාස ය, දහ ය, ජ්වර ය, කුච්ඡිරොග ය, මූර්ඡා ය, පක්ඛන්දිකා ය, ශූලා ය, විශූචිකා ය, කුෂ්ට ය, ගණ්ඩ ය, කිලාස ය, ස්වාස ය, අපස්මාර ය, දද්දු ය, කණ්ඩු ය, කච්ඡු ය, රඛසා ය, විතච්ඡිකා ය, ලොහිතපිත්ත ය, මධුමෙහ ය, අංස ය, පිළකා ය, භගන්දරා ය, පිතින් උපදනා ආබාධ ය, සෙමෙන් උපදනා ආබාධ ය, වාතයෙන් උපදනා ආබාධ ය, සන්නිපාතික ආබාධ ය, ඍතුපරිණාමයෙන් වන ආබාධ ය, විෂමපරිහාරයෙන් උපදනා ආබාධ ය, උපක්‍රමයෙන් උපදනා ආබාධ ය, කර්මවිපාකයෙන් උපදනා ආබාධ ය, ශීත ය, උෂ්ණ ය, සා ය, පවසය, උච්චාර ය, පස්සාව ය යි. මෙසේ මෙ කාහි ආදීනවානුදර්ශී ව වෙසෙයි. ආනන්දයෙනි, මේ ආදීනවානුසංඥ යි කියනු ලැබේ.

5. ආනන්දයෙනි, ප්‍රහාණසංඥ කවර:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ උපන් කාමවිතර්ක නො ඉවසයි. දුරලයි, විනොදනා කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට යවයි. උපන් ව්‍යාපාදවිතර්ක නො ඉවසයි, දුරලයි, විනොදනා කරයි, විගතාන්ත කරයි, අනභාවයට යවයි. උපන් විහිංසාවිතර්කය නො ඉවසයි දුරලයි, විනොදනා කරයි, විගතාන්ත කරයි, අනභාවයට යවයි, උපනුපන් ලමු අකුසල් දහම් නො ඉවසයි, දුරලයි, විනොදනා කරයි, විගතාන්ත කරයි, අනභාවයට යවයි. ආනන්දයෙනි, මේ ප්‍රහාණසංඥ යි කියනු ලැබේ.

6. ආනන්දයෙනි, විරාගසංඥ කවර:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ වලට ගියේ වේවයි රුක්මුලට ගියේ වේවයි ශූන්‍යාගාරයට ගියේ වේවයි මෙසේ සලකන්නේ ය; සර්ව සංස්කාරයන්ගේ යම්බඳු ශමථයෙක් සර්වෝපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණා ක්ෂයයෙක් විරාගයෙක් නිර්වාණයෙක් වේ නම් තෙල ශාන්ත ය, තෙල ප්‍රණීත ය, ආනන්දයෙනි, මේ විරාගසංඥා යි කියනු ලැබේ.

7. ආනන්දයෙනි, නිරොධසංඥ කවර:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ වලට ගියේ වේවයි, රුක්මුලට ගියේ වේවයි, ශූන්‍යාගාරයට ගියේ වේවයි මෙසේ සලකන්නේ ය: සර්ව සංස්කාරයන්ගේ යම්බඳු ශමථයෙක් සර්වෝපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණා ක්ෂයයෙක්, විරාගයෙක්, නිරොධයෙක්, නිර්වාණයෙක් වේ නම් තෙල ශාන්ත ය, තෙල ප්‍රණීත යි. ආනන්දයෙනි, මේ නිරොධසංඥ යි කියනු ලැබේ.

8. කතමා චානන්ද සබ්බලොකෙ අනභිරතසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු යෙ ලොකෙ උපයූපාදනා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ පජහන්තො විරමති න උපාදියන්තො. අයං වුච්චතානන්ද සබ්බලොකෙ අනභිරතසඤ්ඤා.

9. කතමා චානන්ද සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා:

ඉධානන්ද භික්ඛු සබ්බසඞ්ඛාරෙහි අට්ටීයති හරායති ජිගුච්ඡති. අයං වුච්චතානන්ද සබ්බසඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා.

10. කතමා චානන්ද ආනාපානසති:

ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො සතො ව අස්සසති, සතො පස්සසති.

දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති. රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති. රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති. සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති.

පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති.

8. ආනන්දයෙනි, සර්වලෝකයෙහි අනභිරතසංඥා කවර:

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ ලොව්හි යම් උපය සඞ්ඛ්‍යාත තෘෂ්ණා – මාන – දෘෂ්ටීහු වෙත් ද කාමුපාදනාදි උපාදනයෝ වෙත් ද චිත්තාධිට්ඨාන සඞ්ඛ්‍යාත ශාශ්වත උච්ඡේද කෙනෙක් වෙත් ද අභිනිවේස සඞ්ඛ්‍යාත අත්තානුදිට්ඨියෙක් වේ ද අනුසය සඞ්ඛ්‍යාත ථාමගත ක්ලේශ යෝ වෙත් ද, ඔවුන් දුරලමින් දැඩි ව නො ගනිමින් නො ඇලෙයි. ආනන්දයෙනි, මේ සර්වලෝකයෙහි අනභිරතසංඥා යි කියනු ලැබේ.

9. ආනන්දයෙනි, සර්වසංස්කාරයන්හි අනිත්‍යසංඥා කවර:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ හැම ප්‍රත්‍යුත්පන්නධර්මයන්ගෙන් පෙළෙයි. හිරි කෙරෙයි, පිළිකුල් කෙරෙයි. ආනන්දයෙනි, මේ සර්ව සංස්කාරයන්හි අනිත්‍යසංඥා යි කියනු ලැබේ.

10. ආනන්දයෙනි, ආනාපානසති කවර:

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ වලට ගියේ වේවයි රුක්මුලට ගියේ වේව යි ශුන්‍යාගාරයට ගියේ වේවයි කය සෘජු කොට තබා සිහි පෙරට කොට එළවා පලක් බැඳ හිඳියි. හේ සිහි ඇතියේ ම ආශ්වාස කෙරෙයි, සිහි ඇතියේ ම ප්‍රශ්වාස කෙරෙයි:

දීඝ කොට ආශ්වාස කරනුයේ හෝ දීඝ කොට ආශ්වාස කෙරෙමි යි දනී, දීඝ කොට ප්‍රශ්වාස කරනුයේ හෝ දීඝ කොට ප්‍රශ්වාස කෙරෙමි යි දනී, ලඝු කොට ආශ්වාස කරනුයේ හෝ ලඝු කොට ආශ්වාස කෙරෙමි යි දනී. ලඝු කොට ප්‍රශ්වාස කරනුයේ හෝ ලඝු කොට ප්‍රශ්වාස කෙරෙමි යි දනී. සකල අශ්වාසකායය මුල මැද–අග පාළ කරනුයේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සකල ප්‍රශ්වාසකායය මුල–මැද–අග පාළ කරනුයේ ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. ඖදරික ආශ්වාසකායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. ඖදරික ප්‍රශ්වාසකාය-සංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි.

ප්‍රීතිය මොනොවට දන්නේ ආශ්වාස කෙරෙමියි හික්මෙයි. ප්‍රීතිය මොනොවට දන්නේ ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. තුන් දහැන් විසින් සුඛය මොනොවට දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙ යි. තුන් දහැන් විසින් සුඛය මොනොවට දන්නේ ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. සිවුදහැන් විසින් චිත්තසංස්කාරය දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිවු දහැන් විසින් චිත්තසංස්කාර දන්නේ ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. ඖදරික චිත්තසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. ඖදරික චිත්තසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි,

චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.

අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. අයං වුච්චතානන්ද ආනාපානසති.

සචෙ බො ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනො උපසංකමිත්වා ඉමා දස සඤ්ඤා භාසෙය්‍යාසි, ඨානං බො පනෙතං විජ්ජති යං ගිරිමා-නන්දස්ස භික්ඛුනො ඉමා දස සඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භෙය්‍යා'ති.

අථ බො ආයස්මා ආනන්දො භගවතො සන්තිකෙ ඉමා දස සඤ්ඤා උග්ගහෙත්වා යෙනායස්මා ගිරිමානන්දො තෙනුපසංකමි. උපසංකමිත්වා ආයස්මතො ගිරිමානන්දස්ස ඉමා දස සඤ්ඤා අභාසි. අථ බො ආයස්මතො ගිරිමානන්දස්ස ඉමා දස සඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භි, වුට්ඨාහි චායස්මා ගිරිමානන්දො තම්හා ආබාධා තථා පහීනො ච පනා යස්මතො ගිරිමානන්දස්ස සො ආබාධො අහොසීති.

## සචිත්තවග්ගො පඨමො.

තස්සුද්දානං:

සචිත්ත සාරිපුත්තා ච ඨිති සමථෙන ච
පරිහානා ච ද්වෙ සඤ්ඤා මූලා පබ්බජිතා ගිරිති,

සිවු දැහැන් විසින් චිත්තය දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිවුදැහැන් විසින් චිත්තය දන්නේ ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. සමථ–විපස්සනා විසින් සිත පහන් කරවමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සමථ–විපස්සනා විසින් සිත පහන් කරවමින් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. ධ්‍යාන විසින් සිත අරමුණෙහි සමව තබමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. ධ්‍යාන විසින් සිත අරමුණෙහි සමව තබමින් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. නීවරණයෙන් සිත මුදමින් ආශ්වාස කෙරෙමී හික්මෙයි. නීවරණයෙන් සිත මුදමින් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි.

අනිත්‍යානුදර්ශී වූයෙම් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. අනිත්‍යානුදර්ශී වූයෙම් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. විරාගානුදර්ශී වූයෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. විරාගානුදර්ශී වූයෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. නිරොධානුදර්ශී වූයෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. නිරොධානුදර්ශී වූයෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. ප්‍රතිනිඃසර්‍ගානුදර්ශී වූයෙම් ආශ්වාස කෙරෙමියි හික්මෙයි. ප්‍රතිනිඃසර්‍ගානුදර්ශී වූයෙම් ප්‍රශ්වාස කෙරෙමියි හික්මෙයි. ආනන්දයෙනි, මේ ආනාපානසති යි කියනු ලැබේ.

ආනන්දයෙනි, ඉදින් තෙපි ගිරිමානන්ද මහණහු වෙත ගොස් මේ දස සංඥ කියවු නම් යම් හෙයෙකින් මේ දශසංඥ අසා ගිරිමානන්ද මහණහු ගේ ඒ ආබාධය හේතු විසින් සන්හිඳෙන්නේ ය යන තෙල කරුණ ඇත.

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් හමුයෙහි මේ දශසංඥා උගෙන ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් කරා එළැඹියහ. එළඹ ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්ට මේ දශසංඥා කීහ. ඉක්බිති මේ දශසංඥා අසා ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්ගේ ඒ ආබාධය හේතු විසින් සන්හින. ආයුෂ්මත් ගිරිමානන්ද තෙරණුවෝත් ඒ ආබාධයෙන් නැගියහ. ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්ගේ ඒ ආබාධය එසේ ප්‍රහීණ ම වී.

## පළමුවැනි සචිත්තවග්ග යි.

**එහි උද්දානය:**

සචිත්ත සූත්‍රය, සාරිපුත්ත සූත්‍රය, ඨිති සූත්‍රය, සමථ සූත්‍රය, පරිහාන සූත්‍රය, සඤ්ඤා සූත්‍ර දෙකය, මූල සූත්‍රය, පබ්බජිත සූත්‍රය, ගිරිමානන්ද සූත්‍රය දැයි දසයෙකි.

# 2. යමකවග්ගො

## 10. 2. 2. 1

## අවිජ්ජා සුත්තං

**[සාවත්ථි]**

පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජාය 'ඉතො පුබ්බෙ අවිජ්ජා නාහොසි, අථ පච්ඡා සම්භවී'ති. එවමෙතං භික්ඛවෙ වුච්චති, අථ ච පන පඤ්ඤායති 'ඉදප්පච්චයා අවිජ්ජා'ති.

අවිජ්ජම්පහං[1] භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං, කො චාහාරො අවිජ්ජාය: පඤ්ච නීවරණාතිස්ස වචනීයං. පඤ්චපහං[2] භික්ඛවෙ නීවරණෙ සාහාරෙ වදාමි නො අනාහාරෙ. කො චාහාරො පඤ්චන්නං නීවරණානං: තීණි දුච්චරිතානීතිස්ස වචනීයං. තීණිපහං[3] භික්ඛවෙ දුච්චරිතානි සාහාරානි වදාමි නො අනාහාරානි කො චාහාරො තිණ්ණන්නං දුච්චරිතානං: ඉන්ද්‍රියාසංවරො[4] තිස්ස වචනීයං. ඉන්ද්‍රියාසංවරම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං, කො චාහාරො ඉන්ද්‍රියාසංවරස්ස: අසතාසම්පජඤ්ඤන්තිස්ස වචනීයං. අසතාසම්පජඤ්ඤම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං, කො චාහාරො අසතාසම්පජඤ්ඤස්ස: අයොනිසො මනසිකාරොතිස්ස වචනීයං. අයොනිසො මනසිකාරම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං, කො චාහාරො අයොනිසො මනසිකාරස්ස: අස්සද්ධියන්තිස්ස වචනීයං. අස්සද්ධියම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං, කො චාහාරො අස්සද්ධියස්ස: අසද්ධම්මසවණන්තිස්ස වචනීයං. අසද්ධම්ම සවණම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං, කො චාහාරො අසද්ධම්මසවණස්ස: අසප්පුරිසසංසෙවොතිස්ස වචනීයං.

ඉති ඛො භික්ඛවෙ අසප්පුරිසසංසෙවො පරිපූරො අසද්ධම්මසවණං පරිපූරෙති. අසද්ධම්මසවණං පරිපූරං අස්සද්ධියං පරිපූරෙති. අස්සද්ධියං පරිපූරං අයොනිසොමනසිකාරං පරිපූරෙති. අයොනිසො මනසිකාරො පරිපූරො අසතාසම්පජඤ්ඤං පරිපූරෙති. අසතාසම්පජඤ්ඤං පරිපූරං ඉන්ද්‍රියාසංවරං පරිපූරෙති. ඉන්ද්‍රියාසංවරො පරිපූරො තීණි දුච්චරිතානි පරිපූරෙති. තීණි දුච්චරිතානි පරිපූරානි පඤ්ච නීවරණෙ පරිපූරෙන්ති. පඤ්ච නීවරණා පරිපූරා අවිජ්ජං පරිපූරෙන්ති. එවමෙතිස්සා අවිජ්ජාය ආහාරො හොති. එවඤ්ච පාරිපූරි.

---

1. අවිජ්ජාහං – මජසං; අවිජ්ජාපහං – සීමු
2. පඤ්චපාහං – මජසං
3. තීණිපාහං – මජසං
4. ඉනද්‍රිය අසංවරො – මජසං

# 2. යමකවර්ගය

## 10. 2. 2. 1

## අවිද්‍යා සූත්‍රය

[සැවැත්]

"මහණෙනි, මෙයින් පෙර අවිද්‍යා නො වී ය, එයින් පසු පහළ වී යැ"යි අවිද්‍යාවගේ පුරිම කෙළවරෙක් නො පැනේ. මෙසේ තෙල කියනු ලැබේ වැලිදු අවිද්‍යාව ඉදම්ප්‍රත්‍යයෙනැ යි පැනේ.

මහණෙනි, මම අවිද්‍යාව ද සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. අවිද්‍යාවගේ අහර කවරේ ය: පඤ්චනීවරණයහ යි කියයුතු වෙයි. මහණෙනි, මම පඤ්චනීවරණයනුදු සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. පඤ්චනීවරණයන්ගේ ආහාර කවරේ ය. ත්‍රිවිධ දුශ්චරිතයහයි කියයුතු වෙයි. මහණෙනි, මම ත්‍රිවිධ දුශ්චරිතයන් ද සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. ත්‍රිවිධ දුශ්චරිතයන්ගේ ආහාරය කවරේ ය: ඉන්‍ද්‍රිය අසංවරය යි කියයුතු වෙයි. මහණෙනි, මම ඉන්‍ද්‍රිය අසංවරය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍ය කොට නො කියමි. ඉන්‍ද්‍රිය අසංවරයාගේ ආහාර කවරේ ය: අස්මෘති අසම්ප්‍රජන්‍යය යි කිය යුතු වෙයි. මහණෙනි, මම අස්මෘති අසම්ප්‍රජන්‍යය ද සප්‍රත්‍ය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. අස්මෘතිය හා අසම්ප්‍රජන්‍යයයාගේ ආහාර කවරේ ය: අයොනිසොමනසිකාරය යි කියයුතු වෙයි. මහණෙනි, මම අයොනිසොමනසිකාරය ද සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. අයොනිසොමනසිකාරයාගේ ආහාර කවරේ ය: නො ඇදහිලි බව ය යි කිය යුතු වෙයි. මහණෙනි, මම නො ඇදහිලි බව ද සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි, නො ඇදහිලිබවහුගේ ආහාර කවරේ ය: අසද්ධර්මශ්‍රවණ ය යි කිය යුතු වෙයි. මහණෙනි, මම අසද්ධර්මශ්‍රවණය ද සප්‍රත්‍ය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. අසද්ධර්මශ්‍රවණයාගේ ආහාර කවරේ ය: අසත්පුරුෂ සංසෙවා ය යි කිය යුතු වෙයි.

මහණෙනි, මෙසේ අසත්පුරුෂසංසෙවා පරිපූර්ණ වූයේ අසද්ධර්මශ්‍රවණය පුරයි. අසද්ධර්මශ්‍රවණය පරිපූර්ණ වූයේ නො ඇදහිලිබව පුරයි. නො ඇදහිලිබව පරිපූර්ණ වූයේ අයොනිසොමනසිකාරය පුරයි. අයොනිසො-මනසිකාරය පරිපූර්ණ වූයේ අස්මෘති අසම්ප්‍රජන්‍යය පුරයි. අස්මෘති අසම්ප්‍රජන්‍යය පරිපූර්ණ වූයේ ඉන්‍ද්‍රිය අසංවරය පුරයි. ඉන්‍ද්‍රිය අසංවරය පරිපූර්ණ වූයේ ත්‍රිවිධ දුශ්චරිතයන් පුරයි. ත්‍රිවිධ දුශ්චරිත පරිපූර්ණ වූවාහු පඤ්චනීවරණයන් පුරත්. පඤ්චනීවරණයෝ පරිපූර්ණ වූවාහු අවිද්‍යාව පුරත්. මෙසේ තෙල අවිද්‍යාවගේ ප්‍රත්‍යය වෙයි මෙසේ පරිපූර්ණ භාවය ද වෙ.

සෙය්‍යථාපි භික්ඛවෙ උපරි පබ්බතෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ[1] තං උදකං යථානින්නං පවත්තමානං පබ්බතකන්දරපදරසාඛා පරිපූරෙති, පබ්බතකන්දරපදරසාඛා පරිපූරා කුස්සුබ්භෙ[2] පරිපූරෙන්ති, කුස්සුබ්භා[2] පරිපූරා මහාසොබ්භෙ පරිපූරෙන්ති, මහාසොබ්භා පරිපූරා කුන්නදියො පරිපූරෙන්ති, කුන්නදියො පරිපූරා මහානදියො පරිපූරෙන්ති, මහානදියො පරිපූරා මහාසමුද්දං සාගරං පරිපූරෙන්ති. එවමෙතස්ස මහාසමුද්දස්ස සාගරස්ස ආහාරො හොති, එවඤ්ච පාරිපූරි.

එවමෙව ඛො භික්ඛවෙ අසප්පුරිසසංසෙවො පරිපූරො අසද්ධම්මසවනං පරිපූරෙති අසද්ධම්මසවනං පරිපූරං අස්සද්ධියං පරිපූරෙති, අස්සද්ධියං පරිපූරං අයොනිසොමනසිකාරං පරිපූරෙති, අයොනිසො මනසිකාරො පරිපූරො අසතා'සම්පජඤ්ඤං පරිපූරෙති, අසතා' සම්පජඤ්ඤං පරිපූරං ඉන්ද්‍රියා'සංවරං පරිපූරෙති, ඉන්ද්‍රියා'සංවරො පරිපූරො තීණි දුච්චරිතානි පරිපූරෙති. තීණි දුච්චරිතානි පරිපූරානි පඤ්චනීවරණෙ පරිපූරෙන්ති, පඤ්චනීවරණා පරිපූරා අවිජ්ජං පරිපූරෙන්ති. එවමෙතිස්සා අවිජ්ජාය ආහාරො හොති. එවඤ්ච පාරිපූරි.

විජ්ජාවිමුත්තිම්පහං[3] භික්ඛවෙ සාහාරං වදමි නො අනාහාරං. කො චාහාරො විජ්ජාවිමුත්තියා: "සත්තබොජ්ඣඞ්ගා"තිස්ස වචනීයං. සත්තපහං[4] භික්ඛවෙ බොජ්ඣඞ්ගෙ සාහාරෙ වදමි නො අනාහාරෙ. කො චාහාරො සත්තන්නං බොජ්ඣඞ්ගානං: "චත්තාරො සතිපට්ඨානා"තිස්ස වචනීයං. චත්තාරොපහං භික්ඛවෙ සතිපට්ඨානෙ සාහාරෙ වදමි නො අනාහාරෙ. කොචාහාරො චතුන්නං සතිපට්ඨානානං: "තීණි සුචරිතානි" තිස්ස වචනීයං. තීණිපහං භික්ඛවෙ සුචරිතානි සාහාරානි වදමි නො අනාහාරානි. කො චාහාරො තිණ්ණන්නං සුචරිතානං: "ඉන්ද්‍රියසංවරො"–තිස්ස වචනීයං. ඉන්ද්‍රියසංවරම්පහං භික්ඛවෙ සාහාරං වදමි නො අනාහාරං කො චාහාරො ඉන්ද්‍රියසංවරස්ස: "සතිසම්පජඤ්ඤන්තිස්ස" වචනීයං. සතිසම්පජඤ්ඤම්පහං භික්ඛවෙ සාහාරං වදමි නො අනාහාරං.

1. මජසං – නත්ථි
2. කුසොබ්භෙ – මජසං.
3. විජ්ජාවිමුත්තිම්පාහං – මජසං.
4. සත්තපාහං – මජසං.

මහණෙනි, යම් පරිදි ගල් මතුයෙහි දළපොද ඇති වැසි වස්නා කල්හි වැසිදිය ගලා යත්ම එ දිය නිම්න තැන් තුබූ සේ වැටෙමින් පර්වත කන්‍දර ප්‍රදර ශාඛා පුරාලන්නේ වේ ද, පර්වත කන්‍දර ප්‍රදරශාඛාවෝ පරිපූර්ණ වූවාහු කුඩා හෙබ් පුරා ලත් ද, කුඩා හෙබ්හු පරිපූර්ණ වූවාහු මහහෙබ් පුරා ලත් ද, මහහෙබ්හු පරිපූර්ණ වූවාහු කුඩා නදීන් පුරා ලත් ද, කුඩා නදීහු පරිපූර්ණ වූවාහු මහානදීන් පුරා ලත් ද, මහා නදීහු පරිපූර්ණ වූවාහු මහාසමුද්‍රය පුරා ලත් ද, මෙසේ තෙල මහාසමුද්‍රයාගේ ප්‍රත්‍යය වෙයි. මෙසේත් පරිපූර්ණභාවය වේ.

මහණෙනි, එ පරිදි ම අසත්පුරුෂ සංසෙවය පරිපූර්ණ වූයේ අසද්ධර්ම ශ්‍රවණය පුරයි. අසද්ධර්මශ්‍රවණය පරිපූර්ණ වූයේ නො හැදහිලි බව පුරයි. නො හැදහිලි බව පරිපූර්ණ වූයේ අයොනිසොමනසිකාරය පුරයි. අයොනිසොමනසිකාරය පරිපූර්ණ වූයේ අස්මෘති අසම්ප්‍රජන්‍යය පුරයි. අස්මෘති අසම්ප්‍රජන්‍යය පරිපූර්ණ වූයේ ඉන්‍ද්‍රිය අසංවරය පුරයි. ඉන්‍ද්‍රිය අසංවරය පරිපූර්ණ වූයේ ත්‍රිවිධ දුශ්චරිතයන් පුරයි. ත්‍රිවිධ දුශ්චරිතයෝ පරිපූර්ණ වූවාහු පඤ්චනීවරණයන් පුරත්. පඤ්චනීවරණයෝ පරිපූර්ණ වූවාහු අවිද්‍යාව පුරත්. මෙසේ තෙල අවිද්‍යාවගේ ප්‍රත්‍යය වෙයි. මෙසේත් පරිපූර්ණ භාවය වේ.

මහණෙනි, මම විද්‍යාවිමුක්තිය ද සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. විද්‍යාවිමුත්තියට ප්‍රත්‍යය කවරේ ය: සත් වැදෑරුම් මාර්ගබොධ්‍යඞ්ගයහ යි කියයුතු වෙයි. මහණෙනි, මම සප්තබොධ්‍යඞ්ග-යන් සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. සප්ත බොධ්‍යඞ්ගයන්ගේ ප්‍රත්‍යය කවරේ ය: සතර සිව්ටනයහ යි කියයුතු වෙයි. මහණෙනි, මම සතර සිව්ටනුදු සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. සතර සිව්ටන්හුගේ ප්‍රත්‍යය කවරේ ය: ත්‍රිවිධ සුචරිතය යි කියයුතු වෙයි. මහණෙනි, මම ත්‍රිවිධ සුචරිතයනුදු සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. ත්‍රිවිධ සුචරිතයන්ගේ ප්‍රත්‍යයෝ කවර හ: ඉන්‍ද්‍රියසංවරය යි කියයුතු වෙයි. මහණෙනි, මම ඉන්‍ද්‍රියසංවරය සප්‍රත්‍යය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි, ඉන්‍ද්‍රියසංවරයාගේ ප්‍රත්‍යය කවරේ ය: ස්මෘති සම්ප්‍රජන්‍ය ය යි කියයුතු ය. මහණෙනි, මම ස්මෘති සම්ප්‍රජන්‍යය සප්‍රත්‍ය කොට කියමි, නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි.

කො චාහාරො සතිසම්පජඤ්ඤස්ස: ''යොනිසොමනසිකාරො'' තිස්ස වචනීයං, යොනිසොමනසිකාරම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං. කො චාහාරො යොනිසොමනසිකාරස්ස: ''සද්ධා'' තිස්ස වචනීයං. සද්ධම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං. කො චාහාරො සද්ධාය: ''සද්ධම්මසවනන්ති'ස්ස'' වචනීයං. සද්ධම්මසවනම්පහං භික්ඛවෙ සාහාරං වදාමි, නො අනාහාරං. කො චාහාරො සද්ධම්මසවනස්ස: ''සප්පුරිසසංසෙවො''තිස්ස වචනීයං.

ඉති ඛො භික්ඛවෙ සප්පුරිසසංසෙවො පරිපූරො සද්ධම්මසවනං පරිපූරෙති, සද්ධම්මසවනං පරිපූරං සද්ධං පරිපූරෙති, සද්ධා පරිපූරා යොනිසොමනසිකාරං පරිපූරෙති, යොනිසොමනසිකාරො පරිපූරො සතිසම්පජඤ්ඤං පරිපූරෙති, සතිසම්පජඤ්ඤං පරිපූරං ඉන්‍ද්‍රියසංවරං පරිපූරෙති, ඉන්‍ද්‍රියසංවරො පරිපූරො තීණි සුචරිතානි පරිපූරෙති, තීණි සුචරිතානි පරිපූරානි චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්ති, චත්තාරො සතිපට්ඨානා පරිපූරා සත්තබොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති, සත්තබොජ්ඣඞ්ගා පරිපූරා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. එවමෙතිස්සා විජ්ජාවිමුත්තියා ආහාරො හොති. එවඤ්ච පාරිපූරි.

සෙය්‍යථාපි භික්ඛවෙ උපරි පබ්බතෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ තං උදකං යථා නින්නං පවත්තමානං පබ්බත කන්දරපදරසාඛා පරිපූරෙති, පබ්බතකන්දරපදරසාඛා පරිපූරා කුසුබ්භෙ පරිපූරෙන්ති. කුසුබ්භා පරිපූරා මහාසොබ්භෙ පරිපූරෙන්ති, මහාසොබ්භා පරිපූරා කුන්නදියො පරිපූරෙන්ති, කුන්නදියො පරිපූරා මහානදියො පරිපූරෙන්ති, මහානදියො පරිපූරා මහාසමුද්දං සාගරං පරිපූරෙන්ති. එවමෙතස්ස මහාසමුද්දස්ස සාගරස්ස ආහාරො හොති, එවඤ්ච පාරිපූරි.

එවමෙව ඛො භික්ඛවෙ සප්පුරිසසංසෙවො පරිපූරො සද්ධම්මසවනං පරිපූරෙති, සද්ධම්මසවනං පරිපූරං සද්ධං පරිපූරෙති, සද්ධා පරිපූරා යොනිසොමනසිකාරං පරිපූරෙති, යොනිසොමනසිකාරො පරිපූරො සතිසම්පජඤ්ඤං පරිපූරෙති, සතිසම්පජඤ්ඤං පරිපූරං ඉන්‍ද්‍රියසංවරං පරිපූරෙති, ඉන්‍ද්‍රියසංවරො පරිපූරො තීණි සුචරිතානි පරිපූරෙති, තීණි සුචරිතානි පරිපූරානි චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්ති, චත්තාරො සතිපට්ඨානා පරිපූරා සත්තබොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති, සත්තබොජ්ඣඞ්ගා පරිපූරා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. එවමෙතිස්සා විජ්ජාවිමුත්තියා ආහාරො හොති, එවඤ්ච පාරිපූරීති.

ස්මෘති සම්ප්‍රජන්‍යයාගේ ප්‍රත්‍යය කවරේ ය: යොනිසොමනසිකාරය යි කිය යුතු ය. මහණෙනි, මම යොනිසොමනසිකාරය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. යොනිසොමනසිකාරයාගේ ප්‍රත්‍යය කවරේ ය: ශ්‍රද්ධා ය යි කියයුතු වේ. මහණෙනි, මම ශ්‍රද්ධාව ද සප්‍රත්‍ය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. ශ්‍රද්ධාවගේ ප්‍රත්‍යය කවරේ ය; සද්ධර්‍මශ්‍රවණය යි කියයුතු වෙයි. මහණෙනි, මම සද්ධර්‍මශ්‍රවණය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. සද්ධර්‍මශ්‍රවණයාගේ ප්‍රත්‍යය කවරේ ය: සත්පුරුෂසංසේවය යි කියයුතු වෙයි.

මහණෙනි, මෙසේ සත්පුරුෂසංසේවය පරිපූර්ණ වූයේ සද්ධර්‍මශ්‍රවණය පුරයි. සද්ධර්‍මශ්‍රවණය පරිපූර්ණ වූයේ ශ්‍රද්ධාව පුරයි. ශ්‍රද්ධාව පරිපූර්ණ වූවා යොනිසොමනසිකාරය පුරයි. යොනිසොමනසිකාරය පරිපූර්ණ වූයේ ස්මෘති සම්ප්‍රජන්‍යය පුරයි. ස්මෘතිසම්ප්‍රජන්‍යය පරිපූර්ණ වූයේ ඉන්ද්‍රියසංවරය පුරයි. ඉන්ද්‍රියසංවරය පරිපූර්ණ වූයේ ත්‍රිවිධ සුචරිතයන් පුරයි. ත්‍රිවිධ සුචරිතයෝ පරිපූර්ණ වූවාහු සතරසිවටන් පුරත්. සතර සිවටන්හු පරිපූර්ණ වූවාහු සප්ත බොධ්‍යඞ්ගයන් පුරත්. සප්ත බොධ්‍යඞ්ග යෝ පරිපූර්ණ වූවාහු විද්‍යාවිමුක්තිය පුරත්. මෙසේ මෙතල විද්‍යාවිමුක්තිය ගේ ප්‍රත්‍යය වෙයි. මෙසේත් පරිපූර්ණභාවය වෙයි.

මහණෙනි, යම් පරිදි ගල්මුදුනෙහි දළ පොද ඇති වැසි වස්නා කල්හි වැසිදිය ගලායන කල්හි ඒ දිය නිම්න තුබූ සේ වැටෙමින් පර්‍වත කන්‍දර ප්‍රදර ශාඛා පුරා ලන්නේ වේ ද. පර්‍වතකන්‍දර ප්‍රදරශාඛාවෝ පරිපූර්ණ වූවාහු කුඩා හෙබ් පුරා ලත් ද, කුඩා හෙබ්හු පරිපූර්ණ වූවාහු මහහෙබ් පුරා ලත් ද, මහහෙබ්හු පරිපූර්ණ වූවාහු කුඩා නදීන් පුරා ලත් ද, කුඩා නදීහු පරිපූර්ණ වූවාහු මහානදීන් පුරා ලත් ද, මහානදීහු පරිපූර්ණ වූවාහු මහමුහුද පුරා ලත් ද මෙසේ මෙතල මහාසාගරයාගේ ප්‍රත්‍යය වෙයි. මෙසේත් පරිපූර්ණභාවය වෙයි.

මහණෙනි, එ පරිදි ම සත්පුරුෂසංසෙවය පරිපූර්ණ වූයේ සද්ධර්‍ම ශ්‍රවණය පුරයි. සද්ධර්‍මශ්‍රවණය පරිපූර්ණ වූයේ සැදැහැ පුරයි ශ්‍රද්ධාව පරිපූර්ණ වූවා යොනිසොමනසිකාරය පුරයි. යොනිසොමනසිකාරය පරිපූර්ණ වූයේ ස්මෘති සම්ප්‍රජන්‍යය පුරයි. ස්මෘතිසම්ප්‍රජන්‍යය පරිපූර්ණ වූයේ ඉන්ද්‍රියසංවරය පුරයි, ඉන්ද්‍රියසංවරය පරිපූර්ණ වූයේ ත්‍රිවිධ සුචරිතයන් පුරයි. ත්‍රිවිධ සුචරිතයෝ පරිපූර්ණ වූවාහු සතර සිවටන් පුරත්. සතර සිවටන්හු පරිපූර්ණ වූවාහු සප්ත බොධ්‍යඞ්ගයන් පුරත්. සප්ත බොධ්‍යඞ්ග යෝ පරිපූර්ණ වූවාහු විද්‍යාවිමුක්තිය පුරත්. මෙසේ මෙතල විද්‍යාවිමුක්තිය ගේ ප්‍රත්‍යය වෙයි. මෙසේත් පරිපූර්ණභාවය වේ ය යි.

## 10. 2. 2. 2

### තණ්හා සුත්තං

[සාවත්ථි]

“පුරිමා භික්ඛවෙ කොටි න පඤ්ඤායති භවතණ්හාය, ඉතො පුබ්බෙ භවතණ්හා නාහොසි, අථ පච්ඡා සමභවී[1]” ති. එවඤ්චෙතං භික්ඛවෙ වුච්චති, අථ ච පන පඤ්ඤායති “ඉදප්පච්චයා භවතණ්හා”ති.

භවතණ්හම්පහං[2] භික්ඛවෙ සාහාරං වදමි, නො අනාහාරං, කො චාහාරො භවතණ්හාය: ‘අවිජ්ජා’තිස්ස වචනීයං. අවිජ්ජම්පහං භික්ඛවෙ සාහාරං වදමි, නො අනාහාරං. කො චාහාරො අවිජ්ජාය: “පඤ්ච නීවරණා” තිස්ස වචනීයං. පඤ්චපහං භික්ඛවෙ නීවරණෙ සාහාරෙ වදමි, නො අනාහාරෙ. කො චාහාරො පඤ්චන්නං නීවරණානං: “තීණි දුච්චරිතානී”තිස්ස වචනීයං. තීණිපහං භික්ඛවෙ දුච්චරිතානි සාහාරානි වදමි, නො අනාහාරානි. කො චාහාරො තිණ්ණන්නං දුච්චරිතානං: “ඉන්ද්‍රියාසංවරො” තිස්ස වචනීයං. ඉන්ද්‍රියාසංවරම්පහං භික්ඛවෙ සාහාරං වදමි. නො අනාහාරං. කො චාහාරො ඉන්ද්‍රියාසංවරස්ස: අසතාසම්පජඤ්ඤන්ති”තිස්ස වචනීයං. අසතාසම්පජඤ්ඤම්පහං භික්ඛවෙ සාහාරං වදමි, නො අනාහාරං කො චාහාරො අසතා සම්පජඤ්ඤස්ස: “අයොනිසොමනසිකාරො”තිස්ස වචනීයං. අයොනිසොමනසිකාරම්පහං භික්ඛවෙ සාහාරං වදමි. නො අනාහාරං කො චාහාරො අයොනිසොමනසිකාරස්ස: “අස්සද්ධිය”න්තිස්ස වචනීයං. අස්සද්ධියම්පහං භික්ඛවෙ සාහාරං වදමි, නො අනාහාරං කො චාහාරො අස්සද්ධියස්ස: “අසද්ධම්මසවන”න්තිස්ස වචනීයං. අසද්ධම්මසවනම්පහං භික්ඛවෙ සාහාරං වදමි, නො අනාහාරං. කො චාහාරො අසද්ධම්මසවනස්ස: අසප්පුරිසසංසෙවොතිස්ස වචනීයං,

ඉති ඛො භික්ඛවෙ අසප්පුරිසසංසෙවො පරිපූරො අසද්ධම්මසවනං පරිපූරෙති. අසද්ධම්මසවනං පරිපූරං අස්සද්ධියං පරිපූරෙති, අස්සද්ධියං පරිපූරං අයොනිසොමනසිකාරං පරිපූරෙති, අයොනිසොමනසිකාරො පරිපූරො අසතාසම්පජඤ්ඤං පරිපූරෙති, අසතාසම්පජඤ්ඤං පරිපූරං ඉන්ද්‍රියාසංවරං පරිපූරෙති, ඉන්ද්‍රියාසංවරො පරිපූරො තීණි දුච්චරිතානි පරිපූරෙති, තීණි දුච්චරිතානි පරිපූරානි පඤ්චනීවරණෙ පරිපූරෙන්ති. පඤ්චනීවරණා පරිපූරා අවිජ්ජං පරිපූරෙන්ති. අවිජ්ජා පරිපූරා භවතණ්හං පරිපූරෙති. එවමෙතිස්සා භවතණ්හාය ආහාරො හොති, එවඤ්ච පාරිපූරි.

1. සමභවීති – මජසං
2. භවතණ්හාම්පාහං – මජසං

## 10. 2 .2. 2

## තෘෂ්ණා සූත්‍රය

**[සැවැත්]**

"මහණෙනි, මෙයින් පෙර භවතෘෂ්ණාව නො විය. යළි පසුව ඇතිවී යැ"යි භවතෘෂ්ණාවගේ පූර්ව කෙළවරක් නො පැනෙයි. මහණෙනි, මෙසේ කියනු ලැබේ. එතෙකුදුවත් භවතෘෂ්ණාව මේ ප්‍රත්‍යයෙනැයි" පැනේ.

මහණෙනි, භවතෘෂ්ණාව ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. භවතෘෂ්ණාවගේ ප්‍රත්‍යය කවරේ ය: අවිද්‍යා ය යි කිවයුතු වෙයි. මහණෙනි, මම අවිද්‍යාව ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. අවිද්‍යාවගේ ප්‍රත්‍යය කවරේ යැ: පඤ්චනීවරණයන යි කිවයුතු වෙයි. මහණෙනි, මම පඤ්චනීවරණයනුදු සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. පඤ්චනීවරණයන්ගේ ප්‍රත්‍යය කවරේ ය: ත්‍රිවිධ දුශ්චරිතයෝ ය යි කිය යුතුය මහණෙනි, මම ත්‍රිවිධ දුශ්චරිතයන් ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. ත්‍රිවිධ දුශ්චරිතයන්ගේ ප්‍රත්‍යය කවරේ ය: ඉන්ද්‍රිය අසංවරය යි කියයුතු වෙයි. මහණෙනි, මම ඉන්ද්‍රිය අසංවරය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. ඉන්ද්‍රිය අසංවරයාගේ ප්‍රත්‍යය කවරේ ය අස්මෘති-අසම්ප්‍රජන්‍යය යි කිය යුතු ය. මහණෙනි, මම අස්මෘති - අසම්ප්‍රජන්‍යය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. අස්මෘති අසම්ප්‍රජන්‍යයාගේ ප්‍රත්‍යය කවරේ ය: අයොනිසොමනසිකාරය යි කියයුතු වෙයි. මහණෙනි, මම අයොනිසොමනසිකාරය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. අයොනිසොමනසිකාරයාගේ ප්‍රත්‍යය කවරේ ය: නො ඇදහිලිබව ය යි කියයුතු වෙයි. මහණෙනි, මම නොඇදහිලිබව ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. නොඇදහිලිබවහුගේ ප්‍රත්‍යය කවරේ ය: අසද්ධර්මශ්‍රවණය යි කියමි. මහණෙනි, මම අසද්ධර්මශ්‍රවණය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. අසද්ධර්මශ්‍රවණයාගේ ප්‍රත්‍යය කවරේ ය: අසත්පුරුෂසංසෙවය යි කියයුතු වෙයි.

මහණෙනි, මෙසේ අසත්පුරුෂසංසෙවය පරිපූර්ණ වූයේ අසද්ධර්මශ්‍රවණය පුරයි. අසද්ධර්මශ්‍රවණය පරිපූර්ණවූයේ නොඇදහිලිබව පුරයි. නොඇදහිලි බව පරිපූර්ණ වූයේ අයොනිසොමනසිකාරය පුරයි. අයොනිසොමනසිකාරය පරිපූර්ණ වූයේ අස්මෘති අසම්ප්‍රජන්‍යය පුරයි, අස්මෘති අසම්ප්‍රජන්‍යය පරිපූර්ණ වූයේ ඉන්ද්‍රියඅසංවරය පුරයි. ඉන්ද්‍රිය අසංවරය පරිපූර්ණ වූයේ ත්‍රිවිධ දුශ්චරිත පුරයි. ත්‍රිවිධ දුශ්චරිතයෝ පරිපූර්ණ වූවාහු පඤ්චනීවරණයන් පුරත්. පඤ්චනීවරණයෝ පරිපූර්ණ වූවාහු අවිද්‍යාව පුරත්. අවිද්‍යාව පරිපූර්ණ වූවා භවතෘෂ්ණාව පුරයි. මෙසේ මෙල භවතෘෂ්ණාවගේ ප්‍රත්‍යය වෙයි මෙසේත් පරිපූර්ණභාවය වෙයි.

සෙය්‍යථාපි භික්ඛවෙ උපරිපබ්බතෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ තං උදකං යථානින්නං පවත්තමානං පබ්බතකන්දර-පදරසාඛා පරිපූරෙති. පබ්බතකන්දරපදරසාඛා පරිපූරා කුසොබ්භෙ පරිපූරෙන්ති. කුසොබ්භා පරිපූරා මහාසොබ්භෙ පරිපූරෙන්ති. මහාසොබ්භා පරිපූරා කුන්නදියො පරිපූරෙන්ති. කුන්නදියො පරිපූරා මහානදියො පරිපූරෙන්ති. මහානදියො පරිපූරා මහාසමුද්දං සාගරං පරිපූරෙන්ති. එවමෙතස්ස මහාසමුද්දස්ස සාගරස්ස ආහාරො හොති, එවඤ්ච පාරිපූරි.

එවමෙව ඛො භික්ඛවෙ අසප්පුරිසසංසෙවො පරිපූරො අසද්ධම්ම සවනං පරිපූරෙති, අසද්ධම්මසවනං[1] පරිපූරං අස්සද්ධියං පරිපූරෙති, අස්සද්ධියං පරිපූරං අයොනිසොමනසිකාරං පරිපූරෙති. අයොනිසො මනසිකාරො පරිපූරො අසතාසම්පජඤ්ඤං පරිපූරෙති, අසතාසම්පජඤ්ඤං පරිපූරං ඉන්ද්‍රියාසංවරං පරිපූරෙති, ඉන්ද්‍රියාසංවරො පරිපූරො තීණි දුච්චරිතානි පරිපූරෙති, තීණි දුච්චරිතානි පරිපූරානි පඤ්චනීවරණෙ පරිපූරෙන්ති-පඤ්ච නීවරණා පරිපූරා අවිජ්ජං පරිපූරෙන්ති. අවිජ්ජා පරිපූරා භවතණ්හං පරිපූරෙති. එවමෙතිස්සා භවතණ්හාය ආහාරො හොති එවං ච පාරිපූරි.

විජ්ජාවිමුත්තිම්පහං භික්ඛවෙ සාහාරං වදාමි, නො අනාහාරං, කො චාහාරො විජ්ජාවිමුත්තියා: සත්තබොජ්ඣඞ්ගාතිස්ස වචනීයං. සත්තපහං භික්ඛවෙ බොජ්ඣඞ්ගෙ සාහාරෙ වදාමි, නො අනාහාරෙ කොචාහාරො සත්තන්නං බොජ්ඣඞ්ගානං: චත්තාරො සතිපට්ඨානාතිස්ස වචනීයං. චත්තාරොපහං භික්ඛවෙ සතිපට්ඨානෙ සාහාරෙ වදාමි, නො අනාහාරෙ. කො චාහාරො චතුන්නං සතිපට්ඨානානං: තීණි සුචරිතානී'තිස්ස වචනීයං. තීණිපහං භික්ඛවෙ සුචරිතානි සාහාරානි වදාමි, නො අනාහාරානි. කො චාහාරො තිණ්ණන්නං සුචරිතානං: ඉන්ද්‍රියසංවරොතිස්ස වචනීයං. ඉන්ද්‍රියසංවරම්පහං භික්ඛවෙ සාහාරං වදාමි නො අනාහාරං. කො චාහාරො ඉන්ද්‍රියසංවරස්ස: සතිස-ම්පජඤ්ඤන්තිස්ස වචනීයං. සතිසම්පජඤ්ඤම්පහං භික්ඛවෙ සාහාරං වදාමි. නො අනාහාරං. කො චාහාරො සතිසම්පජඤ්ඤස්ස: යොනිසොමනසි-කාරොතිස්ස වචනීයං. යොනිසොමනසිකාරම්පහං භික්ඛවෙ සාහාරං වදාමි, නො අනාහාරං. කො චාහාරො යොනිසො මනසිකාරස්ස: සද්ධාතිස්ස වචනීයං: සද්ධම්පහං භික්ඛවෙ සාහාරං වදාමි, නො අනාහාරං. කො චාහාරො සද්ධාය.: සද්ධම්මසවනන්තිස්ස වචනීයං. සද්ධම්ම-සවනම්පහං භික්ඛවෙ සාහාරං වදාමි, නො අනාහාරං. කො චාහාරො සද්ධම්මසවනස්ස: සප්පුරිසසංසෙවොතිස්ස වචනීයං.

1. අසද්ධම්මසවනා - මජසං

මහණෙනි, යම් පරිදි ගල්මතුයෙහි මහත් පොද ඇති වැසි වස්නා කල්හි වැසි දිය ගලා යන කල්හි එ දිය නිම්න තුබූ සේ වැටෙමින් පර්වතකන්දර ප්‍රදරශාඛා පුරාලන්නේ වේ ද පර්වතකන්දර ප්‍රදරශාඛා පිරුණාහු කුඩා හෙබ් පුරා ලත් ද, කුඩාහෙබ්හු පිරුණාහු මහ හෙබ් පුරා ලත් ද, මහහෙබ්හු පිරුණාහු කුඩා නදීන් පුරා ලත් ද, කුඩා නදීහු පිරුණාහු මහානදීන් පුරාලත් ද, මහා නදීහු පිරුණාහු සයුර පුරා ලත් ද මෙසේ තෙල සමුද්‍රයාගේ ආහාරය වෙයි. මෙසේත් පරිපූර්ණභාවය වෙයි.

මහණෙනි, එපරිදි ම අසත්පුරුෂ සංසෙවය පරිපූර්ණ වූයේ අසද්ධර්මශ්‍රවණ පුරයි. අසද්ධර්මශ්‍රවණය පරිපූර්ණ වූයේ නොහැදහිලිබව පුරයි. නොහැදහිලිබව පරිපූර්ණ වූයේ අයොනිසොමනසිකාරය පුරයි. අයොනිසොමනසිකාරය පරිපූර්ණ වූයේ අස්මෘති අසම්ප්‍රජන්‍යය පුරයි. අස්මෘති අසම්ප්‍රජන්‍යය පරිපූර්ණ වූයේ ඉන්ද්‍රිය අසංවරය පුරයි. ඉන්ද්‍රිය අසංවරය පරිපූර්ණ වූයේ ත්‍රිවිධ දුශ්චරිතයන් පුරයි. ත්‍රිවිධ දුශ්චරිතයෝ පරිපූර්ණ වූවාහු පඤ්චනිවරණයන් පුරත්. පඤ්චනිවරණයෝ පරිපූර්ණ වූවාහු අවිද්‍යාව පුරත්. අවිද්‍යාව පරිපූර්ණ වූවා භවතෘෂ්ණාව පුරයි. මෙසේ තෙල භවතෘෂ්ණාවගේ ප්‍රත්‍යය වෙයි. මෙසේත් පරිපූර්ණ භාවය වේ.

මහණෙනි, මම විද්‍යාවිමුක්තිය ද සප්‍රත්‍යය කොට කියමි. අප්‍රත්‍යය කොට නො කියමි. විද්‍යාවිමුක්තියගේ ප්‍රත්‍යය කවරේ ය: සප්තබොධ්‍යඞ්ගය හයි කිය යුතු වෙයි. මහණෙනි, මම සප්තබොධ්‍යඞ්ගයන් ද සප්‍රත්‍යය කොට කියමි. අප්‍රත්‍යය කොට නො කියමි. සප්තබොධ්‍යයන්ගේ ප්‍රත්‍යය කවරේ ය; සතර සතිපට්ඨානයහ යි කියයුතු වෙයි. මහණෙනි, මම සතර සතිපට්ඨානයන්ද සප්‍රත්‍යය කොට කියමි. අප්‍රත්‍යය කොට නො කියමි. සතර සතිපට්ඨානයන්ගේ ප්‍රත්‍යය කවරේ ය: ත්‍රිවිධ සුචරිතයහ යි කියයුතු වෙයි. මහණෙනි, මම ත්‍රිවිධ සුචරිතයන් ද සප්‍රත්‍යය කොට කියමි. අප්‍රත්‍යය කොට නො කියමි. ත්‍රිවිධ සුචරිතයන්ගේ ප්‍රත්‍යය කවරේ ය: ඉන්ද්‍රියසංවර යයි කියයුතු වෙයි. මහණෙනි, මම ඉන්ද්‍රිය සංවරය ද සප්‍රත්‍යය කොට කියමි. අප්‍රත්‍යය කොට නො කියමි. ඉන්ද්‍රියසංවරයාගේ ප්‍රත්‍යය කවරේ ය; ස්මෘතිසම්ප්‍රජන්‍ය යයි කිය යුතු වෙයි. මහණෙනි, මම ස්මෘතිසම්ප්‍රජන්‍යය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නොකියමි. ස්මෘතිසම්ප්‍රජන්‍යයාගේ ප්‍රත්‍යය කවරේ ය; යොනිසොමනසිකාර යයි කිය යුතු වෙයි. මහණෙනි, මම යොනිසොමනසිකාරය ද සප්‍රත්‍යය කොට කියමි. අප්‍රත්‍යය කොට නො කියමි. යොනිසොමනසිකාරයාගේ ප්‍රත්‍යය කවරේ ය: ශ්‍රද්ධා යයි කියයුතු වෙයි. මහණෙනි, මම ශ්‍රද්ධාව ද සප්‍රත්‍යය කොට කියමි. අප්‍රත්‍යය කොට නො කියමි. ශ්‍රද්ධාවගේ ප්‍රත්‍යය කවරේ ය: සද්ධර්මශ්‍රවණ යයි කිව යුතු වෙයි. මහණෙනි, මම සද්ධර්මශ්‍රවණය ද සප්‍රත්‍යය කොට කියමි. නිෂ්ප්‍රත්‍යය කොට නො කියමි. සද්ධර්මශ්‍රවණයාගේ ප්‍රත්‍යය කවරේ ය. සත්පුරුෂසංසෙව යයි කිය යුතු වෙයි.

ඉති ඛො භික්ඛවෙ සප්පුරිසසංසෙවො පරිපූරො සද්ධම්මසවනං පරිපූරෙති සද්ධම්මසවනං පරිපූරං, සද්ධං පරිපූරෙති, සද්ධා පරිපූරා යොනිසොමනසිකාරං පරිපූරෙති, යොනිසොමනසිකාරො පරිපූරො සතිසම්පජඤ්ඤං පරිපූරෙති, සතිසම්පජඤ්ඤං පරිපූරං ඉන්ද්‍රියසංවරං පරිපූරෙති, ඉන්ද්‍රියසංවරො පරිපූරො, තීණි සුචරිතානි පරිපූරෙති තීණි සුචරිතානි පරිපූරානි, චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්ති, චත්තාරො සතිපට්ඨානා පරිපූරා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති, සත්ත බොජ්ඣඞ්ගා පරිපූරා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. එවමෙතිස්සා විජ්ජාවිමුත්තියා ආහාරො හොති. එවඤ්ච පාරිපූරි.

සෙය්‍යථාපි භික්ඛවෙ උපරිපබ්බතෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ දෙවෙ ගලගලායන්තෙ තං උදකං යථානින්නං පවත්තමානං පබ්බතකන්දරපදරසාඛා පරිපූරෙති, පබ්බතකන්දරපදරසාඛා පරිපූරා කුසුබ්භෙ පරිපූරෙන්ති. කුසුබ්භා පරිපූරා මහාසොබ්භෙ පරිපූරෙන්ති, මහාසොබ්භා පරිපූරා කුන්නදියො පරිපූරෙන්ති. කුන්නදියො පරිපූරා මහානදියො පරිපූරෙන්ති. මහානදියො පරිපූරා මහාසමුද්දං සාගරං පරිපූරෙන්ති එවමෙතස්ස මහාසමුද්දස්ස සාගරස්ස ආහාරො හොති. එවඤ්ච පාරිපූරි.

එවමෙව ඛො භික්ඛවෙ සප්පුරිසසංසෙවො පරිපූරො සද්ධම්මසවනං පරිපූරෙති. සද්ධම්මසවනං පරිපූරං සද්ධං පරිපූරෙති, සද්ධා පරිපූරා යොනිසොමනසිකාරං පරිපූරෙති, යොනිසොමනසිකාරො පරිපූරො සතිසම්පජඤ්ඤං පරිපූරෙති. සතිසම්පජඤ්ඤං පරිපූරං ඉන්ද්‍රියසංවරං පරිපූරෙති, ඉන්ද්‍රියසංවරො පරිපූරො තීණි සුචරිතානි පරිපූරෙති. තීණි සුචරිතානි පරිපූරානි චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්ති. චත්තාරො සතිපට්ඨානා පරිපූරා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති, සත්ත බොජ්ඣඞ්ගා පරිපූරා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති. එවමෙතිස්සා විජ්ජාවිමුත්තියා ආහාරොහොති. එවඤ්ච පාරිපූරීති.

මහණෙනි, මෙසේ සත්පුරුෂසංසෙවය පරිපූර්ණ වූයේ සද්ධර්මශ්‍රවණය පුරයි. සද්ධර්මශ්‍රවණය පරිපූර්ණ වූයේ ශ්‍රද්ධාව පරිපූර්ණ වෙයි. ශ්‍රද්ධාව පරිපූර්ණ වූවා යොනිසොමනසිකාරය පුරයි. යොනිසොමනසිකාරය පරිපූර්ණ වූයේ ස්මෘතිසම්ප්‍රජන්‍යය පුරයි. ස්මෘතිසම්ප්‍රජන්‍යය පරිපූර්ණ වූයේ ඉන්ද්‍රිය සංවරය පුරයි. ඉන්ද්‍රියසංවරය පරිපූර්ණ වූයේ ත්‍රිවිධ සුචරිතයන් පුරයි. ත්‍රිවිධ සුචරිතයෝ පරිපූර්ණ වූවාහු සතර සතිපට්ඨානයන් පුරත්. සතර සතිපට්ඨානයෝ පරිපූර්ණ වූවාහු සප්තබොධ්‍යඞ්ගයන් පුරත්. සප්ත බොධ්‍යඞ්ගයෝ පරිපූර්ණ වූවාහු විද්‍යාවිමුක්තිය පුරත්. මෙසේ තෙල විද්‍යාවිමුක්තියට ආහාරය වෙයි. මෙසේ පාරිපූරිය ද වේ.

මහණෙනි, යම් පරිදි ගල්මතුයෙහි මහත් පොද ඇති වැසි වස්නා කල්හි වැසි දිය ගලායත්ම එදිය නිම්න තුබූ සේ වැටෙමින් පර්වතකන්දර ප්‍රදරශාඛා පුරාලන්නේ වේ ද, පර්වතකන්දර ප්‍රදරශාඛා පිරුණාහු කුඩාහෙබ් පුරාලත් ද, කුඩාහෙබ්හු පිරුණාහු මහහෙබ් පුරාලත් ද, මහහෙබ්හු පිරුණාහු කුඩානදීන් පුරාලත් ද, කුඩානදීහු පිරුණාහු මහානදීන් පුරාලත් ද, මහානදීහු පිරුණාහු සයුර පුරාලත් ද, මෙසේ තෙල සමුද්‍රයාගේ ආහාරය වෙයි. මෙසේත් පරිපූර්ණභාවය වෙයි.

මහණෙනි, එපරිදි ම සත්පුරුෂසංසෙවය පරිපූර්ණ වූයේ සද්ධර්මශ්‍රවණය පුරයි. සද්ධර්මශ්‍රවණය පරිපූර්ණ වූයේ ශ්‍රද්ධාව පුරයි. ශ්‍රද්ධාව පරිපූර්ණ වූවා යොනිසොමනසිකාරය පුරයි. යොනිසොමනසිකාරය පරිපූර්ණ වූයේ ස්මෘති සම්ප්‍රජන්‍යය පුරයි. ස්මෘතිසම්ප්‍රජන්‍යය පරිපූර්ණ වූයේ ඉන්ද්‍රියසංවරය පුරයි. ඉන්ද්‍රියසංවරය පරිපූර්ණ වූයේ ත්‍රිවිධ සුචරිතයන් පුරයි. ත්‍රිවිධ සුචරිතයෝ පරිපූර්ණ වූවාහු සතර සතිපට්ඨානයන් පුරත්. සතර සතිපට්ඨානයෝ පරිපූර්ණ වූවාහු සප්ත බොධ්‍යඞ්ගයන් පුරත්. සප්ත බොධ්‍යඞ්ගයෝ පරිපූර්ණ වූවාහු විද්‍යාවිමුක්තිය පුරත්. මෙසේ තෙල විද්‍යාවිමුක්තියට ආහාරය වෙයි. මෙසේත් පරිපූර්ණභාවය වේ යි.

## 10. 2. 2. 3

## නිට්ඨඞ්ගත සුත්තං

[සාවත්ථි]

යෙ කෙචි භික්ඛවෙ මයි නිට්ඨං ගතා, සබ්බෙ තෙ දිට්ඨිසම්පන්නා, තෙසං දිට්ඨිසම්පන්නානං පඤ්චන්නං ඉධ නිට්ඨා, පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා, කතමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා: සත්තක්ඛත්තුපරමස්ස කොලංකොලස්ස එකබීජිස්ස සකදාගාමිස්ස, යො ච දිට්ඨෙව ධම්මෙ අරහා, ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා,

කතමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා: අන්තරාපරිනිබ්බායිස්ස, උපහච්චපරිනිබ්බායිස්ස, අසඞ්ඛාරපරිනිබ්බායිස්ස, සසඞ්ඛාරපරිනිබ්බායිස්ස, උද්ධං සොතස්ස අකනිට්ඨගාමිනො. ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා. යෙ කෙචි භික්ඛවෙ මයි නිට්ඨං ගතා, සබ්බෙ තෙ දිට්ඨිසම්පන්නා. තෙසං දිට්ඨිසම්පන්නානං ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨාති.

## 10. 2. 2. 4

## අවෙච්චප්පසන්න සුත්තං

[සාවත්ථි]

යෙ කෙචි භික්ඛවෙ මයි අවෙච්චප්පසන්නා, සබ්බෙ තෙ සොතාපන්නා තෙසං සොතාපන්නානං පඤ්චන්නං ඉධ නිට්ඨා, පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා. කතමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා: සත්තක්ඛත්තුපරමස්ස කොලංකොලස්ස එකබීජිස්ස සකදාගාමිස්ස, යො ච දිට්ඨෙව ධම්මෙ අරහා ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා: අන්තරාපරිනිබ්බායිස්ස උපහච්චපරිනිබ්බායිස්ස අසඞ්ඛාරපරිනිබ්බායිස්ස සසඞ්ඛාරපරිනිබ්බායිස්ස උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො. ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා. යෙ කෙචි භික්ඛවෙ මයි අවෙච්චප්පසන්නා, සබ්බෙ තෙ සොතාපන්නා. තෙසං සොතාපන්නානං ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨාති.

## 10. 2. 2. 3
## නිට්ඨඞ්ගත සූත්‍රය

[සැවැත්]

මහණෙනි, යම් කෙනෙක් මා කෙරෙහි නිෂ්ඨාගත වෙත් ද එ හැම දෘෂ්ටිසම්පන්නයහ. ඒ දෘෂ්ටිසම්පන්නයන් ගෙන් එ පස්දෙනකුන්ගේ මේ ලොකයෙහි ම නිෂ්ඨාව (පරිනිර්වාණය) වෙයි. පස් දෙනකුන්ගේ මේ ලොකය හැර (බ්‍රහ්මලොකයෙහි) නිෂ්ඨාව වෙයි. මේ ලොකයෙහි නිෂ්ඨාව කවර පස් දෙනෙකුන්ගේ ය යත්: සත්තක්ඛත්තුපරමයාගේ ය, කොලංකොලයාගේ ය, එකබීජීහුගේ ය, සකදාගාමීහුගේ ය, යමෙකුත් ඉහාත්මයෙහි ම අර්හත් වේ නම්, ඔහුගේ ය යි මේ පස්දෙනාගේ නිෂ්ඨාව මෙ ලොවහි ම වෙයි.

කවර පස්දෙනෙකුන්ගේ මෙ ලොව හැර නිෂ්ඨාව වේ ය යත්: අන්තරාපරිනිබ්බායීහුගේය, උපහච්චපරිනිබ්බායීහුගේය, අසඞ්ඛාරපරිනිබ්බායීහුගේ ය, සසඞ්ඛාරපරිනිබ්බායීහුගේ ය, අකනිට්ඨගාමී උද්ධංසොතයාගේ යයි, මේ පස් දෙනාගේ මෙ ලොව හැර නිෂ්ඨාව වෙයි. මහණෙනි, යම් කෙනෙක් මා කෙරෙහි නිෂ්ඨාගත වෙත් ද එ හැම දෘෂ්ටිසම්පන්නයහ. ඒ දෘෂ්ටිසම්පන්නයන්ගෙන් මෙ පස් දෙනාගේ මෙ ලෝහි ම නිෂ්ඨාව වෙයි. මෙ පස්දෙනාගේ මෙ ලෝ හැර නිෂ්ඨාව වේ යයි.

## 10. 2. 2. 4
## අවෙච්චප්පසන්න සූත්‍රය

[සැවැත්]

මහණෙනි, යම් කෙනෙක් මා කෙරෙහි අචලප්‍රසාදයෙන් සම්පන්න වෙත් නම් එ හැම සොතාපන්නයහ. ඒ ස්‍රොතාපන්නයන්ගෙන් පස්දෙනකුන්ගේ මෙලෝහි නිෂ්ඨාව වෙයි. පස්දෙනකුන්ගේ නිෂ්ඨාව මෙලෝ හැර වෙයි. මෙලෝහි නිෂ්ඨාව කවර පස්දෙනකුන්ගේ ය යත්: සත්තක්ඛත්තුපරමයාගේ ය, කොලංකොලයාගේ ය, එකබීජීහුගේ ය, සකදාගාමීහුගේ ය, යමෙක් ඉහාත්මයෙහි ම අර්හත් වේ නම් ඔහුගේ යයි, මේ පස්දෙනාගේ නිෂ්ඨාව මෙලෝහි ම වෙයි.

කවර පස්දෙනකුන්ගේ මෙලෝ හැර නිෂ්ඨාව වේ ය යත්: අන්තරාපරිනිබ්බායීහුගේ ය, උපහච්චපරිනිබ්බායීහුගේ ය, අසඞ්ඛාරපරිනිබ්බායීහුගේ ය, සසඞ්ඛාරපරිනිබ්බායීහුගේ ය, අකනිට්ඨගාමී උද්ධංසොතයාගේ යයි. මේ පස්දෙනාගේ නිෂ්ඨාව මෙ ලොව හැර වෙයි. මහණෙනි, යම් කෙනෙක් මා කෙරෙහි අචලප්‍රසන්න වෙත් නම් එ හැම සොතාපන්නයහ. ඒ සොතාපන්නයන් අතුරෙන් මෙ පස්දෙනාගේ නිෂ්ඨාව මෙහි ම වෙයි. මේ පස්දෙනාගේ නිෂ්ඨාව මෙ ලොව හැර වේ යයි.

## 10. 2. 2. 5

## පඨමසුඛ සුත්තං

එකං සමයං ආයස්මා සාරිපුත්තො මගධෙසු, විහරති නාලකගාමකෙ. අථ ඛො සාමණ්ඩකානි පරිබ්බාජකො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසංකමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සාමණ්ඩකානි පරිබ්බාජකො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච. කින්නු ඛො ආවුසො සාරිපුත්ත සුඛං කිං දුක්ඛන්ති.

අභිනිබ්බත්ති ඛො ආවුසො දුක්ඛා, අනභිනිබ්බත්ති සුඛා. අභිනිබ්බත්තියා ආවුසො සති ඉදං දුක්ඛං පාටිකඞ්ඛං. සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො අග්ගිසම්ඵස්සො දණ්ඩසම්ඵස්සො සත්ථසම්ඵස්සො ඤාතිපි මිත්තාපි සඞ්ගම්ම සමාගම්ම රොසෙන්ති. අභිනිබ්බත්තියා ආවුසො සති ඉදං දුක්ඛං පාටිකඞ්ඛං.

අනභිනිබ්බත්තියා ආවුසො සති ඉදං සුඛං පාටිකඞ්ඛං. න සීතං න උණ්හං න ජිඝච්ඡා න පිපාසා න උච්චාරො න පස්සාවො න අග්ගිසම්ඵස්සො න දණ්ඩසම්ඵස්සො න සත්ථසම්ඵස්සො ඤාතිපි මිත්තාපි සඞ්ගම්ම සමාගම්ම න රොසෙන්ති. අනභිනිබ්බත්තියා ආවුසො සති ඉදං සුඛං පාටිකඞ්ඛන්ති.

## 10. 2. 2. 6

## දුතියසුඛ සුත්තං

එකං සමයං ආයස්මා සාරිපුත්තො මගධෙසු විහරති නාලකගාමකෙ. අථ ඛො සාමණ්ඩකානි පරිබ්බාජකො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසංකමි. උපසංකමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සාමණ්ඩකානි පරිබ්බාජකො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච. කින්නු ඛො ආවුසො සාරිපුත්ත ඉමස්මිං ධම්මවිනයෙ සුඛං කිං දුක්ඛන්ති.

1. සාරණීයං - මජසං.

## 10. 2. 2. 5

## පඨම සුඛ සූත්‍රය

එක්කලෙක ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ මගධ ජනපදයෙහි නාලක ගාමකයෙහි වාසය කරන්නාහ. එකල්හි සාමණ්ඩකානි පිරිවැජි ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා එළඹියේ ය. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරුන් හා සතුටු විය. සතුටුවිය යුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පස් ව හින. එකත්පස ව හුන් සාමණ්ඩකානි පිරිවැජි ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට තෙල කීය: "ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, සුඛ කිමෙක, දුක්ඛ කිමෙකැ"යි

ඇවැත්නි, අභිනිර්වෘතිය (ඉපැත්ම) දුඃඛය, අනභිනිර්වෘතිය (නොඉපැත්ම) සුඛය යි ඇවැත්නි, අභිනිර්වෘතිය ඇතිවත් ම මෙ දුඃඛය කැමැති විය යුතු: ශීත ය, උෂ්ණ ය, සා ය, පවස් ය, උච්චාර ය, ප්‍රස්‍රාව ය, අග්නිස්පර්ශ ය, දණ්ඩස්පර්ශ ය, ශස්ත්‍රස්පර්ශ ය යි. ඥාතිහු ද මිත්‍රයෝ ද එක් රැස්ව කොප ගන්වත්. ඇවැත්නි, අභිනිර්වෘතිය ඇතිවත් ම මෙ දුක කැමැති විය යුතු.

ඇවැත්නි, අනභිනිර්වෘතිය ඇතිවත් ම මෙ සුඛය කැමැති විය යුතු. ශීත නැත, උෂ්ණ නැත, සා නැත, පවස් නැත, උච්චාර නැත, ප්‍රස්‍රාව නැත, අග්නිස්පර්ශ නැත, දණ්ඩස්පර්ශ නැත, ශස්ත්‍රස්පර්ශ නැත, ඥාතිහු ද මිත්‍රයෝ ද එක් රැස් ව කොප නො ගන්වත්. ඇවැත්නි අනභිනිර්වෘතිය ඇතිවත් ම මෙ සුඛය කැමැති විය යුතු යි.

## 10. 2. 2. 6

## දුතිය සුඛ සූත්‍රය

එක් කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මගධ ජනපදයෙහි නාලක ගාමකයෙහි වාසය කරන්නාහ. එකල්හි සාමණ්ඩකානි පිරිවැජි ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා එළඹියේ ය. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරුන් හා සතුටු විය. සතුටු විය යුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පස් ව හින. එකත්පස් ව හුන් සාමණ්ඩකානි පිරිවැජි ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට තෙල කීය. ඇවැත් ශාරීපුත්‍රයෙනි, මෙ ධර්මවිනයෙහි සුඛ නම් කිමෙක? දුක්ඛ නම් කිමෙකැ?යි.

අනභිරති ඛො ආවුසො ඉමස්මිං ධම්මවිනයෙ දුක්ඛා. අභිරති සුඛා, අනභිරතියා ආවුසො සති ඉදං දුක්ඛං පාටිකඞ්ඛං: ගච්ඡන්තොපි සුඛං සාතං නාධිගච්ඡති. ඨිතොපි -පෙ- නිසින්නොපි - සයානොපි ගාමගතොපි - අරඤ්ඤගතොපි - රුක්ඛමූලගතොපි - සුඤ්ඤාගාරගතොපි- අබ්භොකාසගතොපි -පෙ- භික්ඛුමජ්ඣගතොපි සුඛං සාතං නාධිගච්ඡති. අනභිරතියා ආවුසො සති ඉදං දුක්ඛං පාටිකඞ්ඛං.

අභිරතියා ආවුසො සති ඉදං සුඛං පාටිකඞ්ඛං: ගච්ඡන්තොපි සුඛං සාතං අධිගච්ඡති -පෙ- ඨිතොපි - නිසින්නොපි - සයානොපි - ගාමගතොපි - අරඤ්ඤගතොපි - රුක්ඛමූලගතොපි - සුඤ්ඤාගාරගතොපි - අබ්භොකාසගතොපි -පෙ- භික්ඛුමජ්ඣගතොපි සුඛං සාතං අධිගච්ඡති. අභිරතියා ආවුසො සති ඉදං සුඛං පාටිකඞ්ඛන්ති.

## 10. 2. 2. 7

## පඨමනළකපාන සුත්තං

එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන නළකපානං නාම කොසලානං නිගමො, තදවසරි. තත්‍ර සුදං භගවා නළකපානෙ විහරති පලාසවනෙ, තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ භික්ඛුසඞ්ඝපරිවුතො නිසින්නො හොති. අථ ඛො භගවා බහුදෙවරත්තිං භික්ඛූනං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි.

විගතථිනමිද්ධො[1] ඛො සාරිපුත්ත භික්ඛුසඞ්ඝො, පටිභාතු තං සාරිපුත්ත භික්ඛූනං ධම්මී කථා, පිට්ඨි මෙ ආගිලායති, තමහං ආයමිස්සාමීති. 'එවම්භන්තෙ'ති ඛො ආයස්මා සාරිපුත්තො භගවතො පච්චස්සොසි.

1. විගතථිනමිද්ධො - මජ්ඣං.

ඇවැත්නි, මෙ ධම්මවිනයෙහි අනභිරතිය දුක්ඛ ය, අභිරතිය සුඛ ය. ඇවැත්නි, අනභිරතිය ඇති වත් ම මෙ දුක්ඛය කැමැති විය යුතු: යනුයේ ද සුඛයක් සාතයක් නො ලබන්නේ ය, සිටියේ ද ... හුන්නේ ද ... හෝනේ ද ... ගම්බවුයේ ද ... වලට ගියේ ද ... රුක්මුලට ගියේ ද ... ශූන්‍යාගාරයට ගියේ ද ... අබවසට ගියේ ද ... මහණුන් මැදට ගියේ හෝ සුඛයක් සාතයක් නො ලබනේ ය. ඇවැත්නි, අනභිරතිය ඇතිවත් ම මෙ දුක කැමැති විය යුතු.

ඇවැත්නි, අභිරතිය ඇතිවත් ම මෙ සුඛය කැමැතිවිය යුතු: යනුයේ ද සුඛය සාතය ලබනේ ය. සිටියේ ද ... හුන්නේ ද ... හෝනේ ද ... ගම්බවුයේ ද ... වලට ගියේ ද ... රුක්මුලට ගියේ ද ... ශූන්‍යාගාරයට ගියේ ද ... අබවසට ගියේ ද ... මහණුන් මැදට ගියේ ද සුඛය සාතය ලබන්නේ ය. ඇවැත්නි, අභිරතිය ඇතිවත් ම මෙ සුඛ කැමැති විය යුතු යි.

## 10. 2. 2. 7

## පඨම නළකපාන සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසල ජනපදයෙහි චාරිකා කරනසේක් මහබික්සඟුන් සමග කොසලයන්ගේ නළකපාන නම් නියම් ගමට වැඩිසේක. එහි භාග්‍යවතුන් වහන්සේ නළකපානය අසල වූ පලාස වනයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පොහෝ ලත් එදවස්හි බික්සඟුන් විසින් පිරිවරන ලද සේක් හුන්නාහු වෙත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක් භික්ෂූන්ට දැහැමි කථායෙන් කරුණු දක්වා සමාදන් කරවා සමුත්තෙජන කොට සම්ප්‍රහර්ෂණය කොට තුෂ්ණිම්භූත වූ බික්සඟුන් අනුවිලොකනය කොට ආයුෂ්මත් සැරියුත් තෙරුන් ඇමතූ සේක.

"ශාරිපුත්‍රයෙනි, භික්ෂුසඞ්ඝයා පහවූ ථිනමිද්ධ ඇතියේ ය. ශාරීපුත්‍රයෙනි, භික්ෂූන් සඳහා ධාර්මික කථාව තොපට වැටහේ නම් මනා මැනූ. මා පිට රද නැහෙයි. ඒ මම් සන්හිඳු වන්නෙමි'යි. 'එසේ යැ වහන්සැ'යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

අථ ඛො භගවා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤපෙත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි. පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා, තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි "ආවුසො භික්ඛවො"ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

යස්ස කස්සචි ආවුසො සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු හිරි[1] නත්ථි ඔත්තප්පං නත්ථි, විරියං[2] නත්ථි, පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො වුද්ධි. සෙය්‍යථාපි ආවුසො කාළපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හායතෙව වණ්ණෙන, හායති මණ්ඩලෙන, හායති ආභාය, හායති ආරොහපරිණාහෙන. එව මෙව ඛො ආවුසො යස්ස කස්සචි සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි නත්ථි, ඔත්තප්පං නත්ථි, විරියං නත්ථි, පඤ්ඤා නත්ථි, කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි.

"අස්සද්ධො පුරිසපුග්ගලො"ති ආවුසො පරිහානමෙතං. "අහිරිකො පුරිසපුග්ගලො"ති ආවුසො පරිහානමෙතං. "අනොත්තප්පී පුරිස පුග්ගලො" ති ආවුසො පරිහානමෙතං. "කුසීතො පුරිසපුග්ගලො"ති ආවුසො පරිහාන මෙතං. "දුප්පඤ්ඤො පුරිසපුග්ගලො"ති ආවුසො පරිහානමෙතං. "කොධනො පුරිසපුග්ගලො"ති ආවුසො පරිහානමෙතං. "උපනාහී පුරිසපුග්ගලො"ති ආවුසො පරිහානමෙතං. "පාපිච්ඡොපුරිසපුග්ගලො"ති ආවුසො පරිහානමෙතං. "පාපමිත්තො පුරිසපුග්ගලො"ති ආවුසො පරිහානමෙතං. "මිච්ඡාදිට්ඨිකො පුරිසපුග්ගලො"ති ආවුසො පරිහානමෙතං.

යස්ස කස්සචි ආවුසො සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි අත්ථි, ඔත්තප්පං අත්ථි, පඤ්ඤා අත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. සෙය්‍යථාපි ආවුසො ජුණ්හපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති වඩ්ඪතෙව වණ්ණෙන, වඩ්ඪති මණ්ඩලෙන, වඩ්ඪති ආභාය, වඩ්ඪති ආරොහපරිණාහෙන. එවමෙව ඛො ආවුසො යස්ස කස්සචි සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු, හිරිඅත්ථි, ඔත්තප්පං අත්ථි. විරියං අත්ථි. පඤ්ඤා අත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි.

1. හිරි - මජසං.
2. විරිය - මජසං.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඟළ සිවුරුණ කොට පනවා දකුණත් පසින් දක්ෂිණපාදයෙහි වාමපාද මඳක් හැද තබා සමෘතිමත් වූවාහු සම්‍යක්ප්‍රඥ ඇත්තාහු උත්ථානසංඥව මෙනෙහි කොට සිංහශය්‍යා කළ සේක. එහි දී ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ 'ඇවැත් මහණෙනි'යි මහණුන් ඇමතූහ. 'ඇවැත්නි'යි ඒ භික්ෂුහු ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල කීහ.

ඇවැත්නි, යම් කිසිවක්හට කුශලධර්මයන් කෙරෙහි හිරි නැත් ද, ඔතප් නැත් ද, වීර්‍ය්‍යය නැත් ද, කුශලධර්මයන් කෙරෙහි ප්‍රඥා නැත් ද, ඔහට යම් මැ රැයක් හෝ දවලක් හෝ ඒ නම්, කුශලධර්මයන් කෙරෙහි හානියෙක් ම කැමැති විය යුතු. වැද්ධියෙක් නො වේ. ඇවැත්නි, යම් පරිදි කළුවරපක්ෂි චන්ද්‍රයාට යම් මැ රැයක් හෝ දවලක් හෝ ඒ නම්, එ වර්ණයෙනුදු පිරිහෙයි මඬුලුයෙනුදු පිරිහෙයි, ආභායෙනුදු පිරිහෙයි, ආරොහපරිණාහයෙනුදු පිරිහෙයි. ඇවැත්නි, එපරිදි ම යමකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධා නැත් ද, හිරි නැත් ද, ඔතප් නැත් ද, වීර්‍ය්‍යය නැත් ද, කුශලධර්මයන්හි ප්‍රඥා නැත් ද, ඔහට යම් මැ රැයක් හෝ දවලක් හෝ ඒ නම්, කුශලධර්මයන්හි හානියෙක් ම කැමැති විය යුතු. වෘද්ධියෙක් නො වේ,

ඇවැත්නි, 'අශ්‍රද්ධ පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක, ඇවැත්නි, 'අහ්‍රීක පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක, ඇවැත්නි, 'ඔතප් නැති පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක, ඇවැත්නි, 'කුසීත පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක, ඇවැත්නි, 'දුෂ්ප්‍රාඥ පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක, ඇවැත්නි,'ක්‍රොධන පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක. ඇවැත්නි, 'බද්ධවෛරී පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක. ඇවැත්නි, 'පාපෙච්ඡ පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක. ඇවැත්නි, 'පාපමිත්‍ර පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙක. ඇවැත්නි, 'මිථ්‍යාදෘෂ්ටික පුරුෂ පුද්ගල' යන තෙල පරිහාණියෙකි.

ඇවැත්නි, යම් කෙනකුහට කුශලධර්මයන් කෙරෙහි ශ්‍රද්ධා ඇත් ද, හිරි ඇත් ද, ඔතප් ඇත් ද, කුශලධර්මයන් කෙරෙහි ප්‍රඥා ඇත් ද, ඔහට යම් මැ රැයක් හෝ දවලක් හෝ ඒ නම්, කුශලධර්මයන් කෙරෙහි වෘද්ධියෙක් ම කැමැති වියයුතු, පරිහාණියෙක් නො වේ. ඇවැත්නි, යම් සේ ශුක්ලපක්ෂයෙහි චන්ද්‍රයා හට යම් බඳු රැයක් හෝ දවලක් හෝ ඒ නම් වර්ණනයෙනුදු වැඩේ මැ යි, මැඩිලියෙනුදු වැඩෙයි, ආභායෙනුදු වැඩෙයි, ආරොහපරිණාහයෙනුදු වැඩේ. ඇවැත්නි, එසෙයින් ම යමකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධා ඇත් ද, හිරි ඇත් ද, ඔතප් ඇත් ද, වීර්‍ය්‍යය ඇත් ද, කුශලධර්මයන්හි ප්‍රඥා ඇත් ද, කුශලධර්මයන්හි වෘද්ධියෙක් ම කැමැති විය යුතු, පරිහාණියෙක් නොවේ.

"සද්ධො පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. "හිරිමා පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. ඔත්තප්පී පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. "ආරද්ධවිරියො පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. පඤ්ඤවා පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. අක්කොධනො පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. "අනුපනාහී පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. "අප්පිච්ඡො පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. "කල්‍යාණමිත්තො පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතං. "සම්මාදිට්ඨිකො පුරිසපුග්ගලො"ති ආවුසො අපරිහානමෙතන්ති.

අථ ඛො භගවා පච්චුට්ඨාය ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි සාධු සාධු සාරිපුත්ත, යස්ස කස්සචි සාරිපුත්ත, සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි නත්ථි, ඔත්තප්පං නත්ථි, විරියං නත්ථි, පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි.

සෙය්‍යථාපි සාරිපුත්ත කාළපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හායතෙව වණ්ණෙන, හායති මණ්ඩලෙන, හායති ආභාය, හායති ආරොහපරිණාහෙන. එවමෙව ඛො සාරිපුත්ත යස්ස කස්සචි සද්ධා නත්ථි කුසලෙසු -පෙ- ධම්මෙසු, පඤ්ඤා නත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි.

"අස්සද්ධො පුරිසපුග්ගලො"ති සාරිපුත්ත පරිහානමෙතං, අහිරිකො -පෙ- අනොත්තප්පී – කුසීතො – දුප්පඤ්ඤො – කොධනො – උපනාහී – පාපිච්ඡො පාපමිත්තො – මිච්ඡාදිට්ඨිකො පුරිසපුග්ගලො"ති සාරිපුත්ත පරිහානමෙතං.

යස්ස කස්සචි සාරිපුත්ත සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි අත්ථි – ඔත්තප්පං අත්ථි – විරියං අත්ථි- පඤ්ඤා අත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. සෙය්‍යථාපි සාරිපුත්ත ජුණ්හපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වඩ්ඪතෙව වණ්ණෙන. වඩ්ඪති මණ්ඩලෙන, වඩ්ඪති ආභාය, වඩ්ඪති ආරොහපරිණාහෙන.

ඇවැත්නි, 'ශ්‍රද්ධා ඇති පුරුෂ පුද්ගල' යන තෙල අපරිහාණියෙක. ඇවැත්නි, 'හ්‍රීමත් පුරුෂ පුද්ගල' යන තෙල අපරිහාණියෙක. ඇවැත්නි, 'අපත්‍රපා ඇති පුරුෂ පුද්ගල' යන තෙල අපරිහාණියෙක. ඇවැත්නි, 'ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුරුෂ පුද්ගල' යන තෙල අපරිහාණියෙක. ඇවැත්නි, 'ප්‍රඥවත් පුරුෂ පුද්ගල'යන තෙල අපරිහාණියෙක. ඇවැත්නි, 'නොකිපෙන සැහැවි ඇති පුරුෂ පුද්ගල' යන තෙල අපරිහාණියෙක. ඇවැත්නි, 'බද්ධවෛර නැති පුරුෂ පුද්ගල' යන තෙල අපරිහාණියෙක. ඇවැත්නි, 'කල්‍යාණමිත්‍ර පුරුෂ පුද්ගල' යන තෙල අපරිහාණියෙක. ඇවැත්නි, 'සම්‍යක්දෘෂ්ටික පුරුෂ පුද්ගල' යන තෙල අපරිහාණියෙකැ යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන් ඇමතූ සේක: "ශාරීපුත්‍රයෙනි, ඉතා මැනැවි, ඉතා මැනැවි, ශාරීපුත්‍රයෙනි, යම් කෙනකුන්ට කුශලධර්‍මී කෙරෙහි ශ්‍රද්ධා නැත් ද, හ්‍රී නැත් ද, අපත්‍රපා නැත් ද, වීර්‍ය්‍යය නැත් ද, කුශලධර්‍මයන් කෙරෙහි ප්‍රඥ නැත් ද, ඔහට යම්බඳු රැයක් හෝ දවලක් හෝ ඒ නම්, කුශලධර්‍මයන් කෙරෙහි හානියෙක් ම කැමැතිවිය යුතු. වෘද්ධියෙක් නො වේ.

ශාරීපුත්‍රයෙනි, යම් සේ කෘෂ්ණපක්ෂයෙහි චන්ද්‍රයාට යම්බඳු රාත්‍රියක් හෝ දවලක් හෝ ඒ නම් වර්ණයෙනුදු පිරිහෙයි, මැඩිලියෙනුදු පිරිහෙයි, ආභායෙනුදු පිරිහෙයි, ආරොහපරිණාහයෙනුදු පිරිහෙයි. ශාරීපුත්‍රයෙනි, එපරිදි ම යම් කෙනකු හට කුශලධර්‍මයන් කෙරෙහි යම්බඳු රාත්‍රියක් හෝ දවලක් ඒ නම්, කුශලධර්‍මයන් කෙරෙහි හානියෙක් ම කැමැතිවිය යුතු. වෘද්ධියෙක් නො වේ.

ශාරීපුත්‍රයෙනි, 'අශ්‍රද්ධ පුරුෂපුද්ගල' යන තෙල පරිහාණියෙක, අහ්‍රීක... අපත්‍රපා නැති ... කුසීද ... දුස්ප්‍රාඥ – කිපෙනසුලු – බද්ධවෛර ඇති – පාපෙච්ඡ වූ – පවිටු මිතුරන් ඇති ... ශාරීපුත්‍රයෙනි, මිථ්‍යාදෘෂ්ටික පුරුෂ පුද්ගල යන තෙල පරිහාණියෙක.

ශාරීපුත්‍රයෙනි, යම් කෙනකුට කුශලධර්‍මයන් කෙරෙහි ශ්‍රද්ධා ඇත් ද, හිරි ඇත් ද, ඔතප් ඇත් ද, වීර්‍ය්‍ය ඇත් ද, කුශලධර්‍මයන් කෙරෙහි ප්‍රඥ ඇත් ද, ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ ඒ නම්, වෘධිය ම කැමැති විය යුතු. පරිහාණිය නො වේ. ශාරීපුත්‍රයෙනි, යම් සේ ශුක්ලපක්ෂයෙහි චන්ද්‍රයාගේ යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ ඒ නම්, වර්ණයෙනුදු වැඩෙයි, මැඩිලියෙනුදු වැඩෙයි. ආභායෙනුදු වැඩෙයි, ආරොහපරිණාහයෙනුදු වැඩෙයි.

එව මෙව ඛො සාරිපුත්ත යස්ස කස්සචි සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු. හිරිඅත්ථි – ඔත්තප්පං අත්ථි – විරියං අත්ථි – පඤ්ඤා අත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි.

"සද්ධො පුරිසපුග්ගලො"ති සාරිපුත්ත අපරිහානමෙතං, හිරිමා – පෙ – ඔත්තප්පී – ආරද්ධවිරියො – පඤ්ඤවා – අක්කොධනො – අනුපනාහී – අපපිඑෂා –කල්‍යාණමිත්තො – සම්මාදිට්ඨිකො පුරිසපුග්ගලො''ති සාරිපුත්ත අපරිහාන මෙතන්ති.

## 10. 2. 2. 8

### දුතිය නළකපාන සුත්තං

එකං සමයං භගවා නළකපානෙ විහරති පලාසවනෙ. තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ භික්ඛුසඞ්ඝපරිවුතො නිසින්නො හොති. අථ ඛො භගවා බහුදෙවරත්තිං භික්ඛූනං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි.

විගතථීනමිද්ධො ඛො සාරිපුත්ත භික්ඛුසඞ්ඝො, පටිභාතු තං සාරිපුත්ත භික්ඛූනං ධම්මීකථා, පිට්ඨි මෙ ආගිලායති, තමහං ආයමිස්සාමීති. "එවං භන්තෙ"ති ඛො ආයස්මා සාරිපුත්තො භගවතො පච්චස්සොසි.

අථ ඛො භගවා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤාපෙත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා, තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි "ආවුසො භික්ඛවෙ"ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච.

ශාරිපුත්‍රයෙනි, එ සෙයින් ම යම් කෙනකුට කුශලධර්මයන් කෙරෙහි ශ්‍රද්ධා ඇත් ද, හිරි ඇත් ද, ඔතප් ඇත් ද, වීර්‍ය්‍ය ඇත් ද, කුශලධර්මයන් කෙරෙහි ප්‍රඥා ඇත් ද, ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ ඒ නම්, කුශලධර්මයන් කෙරෙහි වෘද්ධිය ම කැමැති විය යුතු. පරිහාණි නො වේ.

ශාරිපුත්‍රයෙනි, 'ශ්‍රද්ධා ඇති පුරුෂ පුද්ගල' යන මෙල අපරිහාණියෙක, හ්රීමත් ... අපත්‍රපා ඇති - ආරබ්ධවීර්‍ය්‍ය ඇති - ප්‍රඥා ඇති - ක්‍රොධ සවභාව නැති - බද්ධවෛර නැති - අල්පෙච්ඡ වූ - කල්‍යාණමිත්‍රයන් ඇති - 'සම්‍යක්දෘෂ්ටික පුරුෂපුද්ගල' යන මෙල අපරිහාණි යෙකැයි.

## 10. 2. 2. 8

## දුතිය නළකපාන සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ නළකපානය අසළ වූ පලාස-වනයෙහි වාසය කරනසේක. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ පොහෝ ලත් එදවස්හි භික්සඟුන් විසින් පිරිවරනලදහු හුන්නාහු වෙත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ බොහෝ වේලාවක් භික්ෂූන්ට දහම් කථායෙන් සංදර්ශනය කොට සමාදන් කොට සමුත්තෙජන කොට සම්ප්‍රහර්ෂණ කොට තුෂ්ණීම්භූත භික්ෂුසඞ්ඝයා අනුවිලොකනය කොට ආයුෂ්මත් සැරියුත් තෙරුන් ඇමතූ සේක:

''ශාරිපුත්‍රයෙනි, භික්ෂුසඞ්ඝයා පහවූ ථීනමිද්ධ ඇතියේය. ශාරිපුත්‍රයෙනි, භික්ෂූන් සඳහා තොපට දහැමි කථාව වැටහේ නම් මනා මැ නු. මාගේ පිට රුදනැහෙයි. එය මම සන්හිඳුවමැ''යි. 'වහන්ස, එසේය' යයි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඟළ සිවුර සිවුගුණ කොට අතුරා දකුණැළයෙන් වාමපාදයෙහි දකුණුපා මැක් ඇද තබා සමෘතිමත් වූවාහු සම්ප්‍රඥාන ඇතියාහු උත්ථානසංඥා මෙනෙහි කොට සිංහශය්‍යා කළ සේක. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ 'ඇවැත් මහණෙනි'යි භික්ෂූන් ඇමතූහ. 'ඇවැත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙල කීහ:

යස්ස කස්සචි ආවුසො සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි නත්ථි-පෙ- ඔත්තප්පං නත්ථි - විරියං නත්ථි - පඤ්ඤා නත්ථි - සොතාවධානං නත්ථි- ධම්මධාරණා නත්ථි-අත්ථූපපරික්ඛා නත්ථි-ධම්මානුධම්මපටිපත්ති නත්ථි-අප්පමාදෙ නත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව කුසලෙසු ධම්මෙසු, නො වුද්ධි. සෙය්‍යථාපි ආවුසො කාළපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හායතෙව වණ්ණෙන, හායති මණ්ඩලෙන, හායති ආභාය, හායති ආරොහපරිණාහෙන. එවමෙව ඛො ආවුසො යස්ස කස්සචි සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු. හිරි නත්ථි - පෙ - ඔත්තප්පං නත්ථි - විරියං නත්ථි - පඤ්ඤා නත්ථි - සොතාවධානං නත්ථි - ධම්මධාරණා නත්ථි - අත්ථූපපරික්ඛා නත්ථි - ධම්මානුධම්මපටිපත්ති නත්ථි - අප්පමාදෙ නත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු. නො වුද්ධි.

යස්ස කස්සචි ආවුසො සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු. හිරි අත්ථි - පෙ - ඔත්තප්පං අත්ථි - විරියං අත්ථි - පඤ්ඤා අත්ථි - සොතාවධානං අත්ථි - ධම්මධාරණා අත්ථි - අත්ථූපපරික්ඛා අත්ථි - ධම්මානුධම්මපටිපත්ති අත්ථි - අප්පමාදෙ අත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානි. සෙය්‍යථාපි ආවුසො ජුණ්හපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වඩ්ඪතෙව වණ්ණෙන, වඩ්ඪති මණ්ඩලෙන වඩ්ඪති ආභාය, වඩ්ඪති ආරොහපරිණාහෙන, එවමෙව ඛො ආවුසො යස්ස කස්සචි සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු -පෙ- අප්පමාදෙ අත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු. නො පරිහානීති:

අථ ඛො භගවා පච්චුට්ඨාය ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි. සාධු සාධු සාරිපුත්ත යස්ස කස්සචි 'සාරිපුත්ත, සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු, හිරි නත්ථි - ඔත්තප්පං නත්ථි-පඤ්ඤා නත්ථි - විරියං නත්ථි - සොතාවධානං නත්ථි - ධම්මධාරණා නත්ථි - අත්ථූපපරික්ඛා නත්ථි - ධම්මානුධම්මපටිපත්ති නත්ථි - අප්පමාදෙ නත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු. නො වුද්ධි. සෙය්‍යථාපි සාරිපුත්ත කාළපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හායතෙව වණ්ණෙන, හායති මණ්ඩලෙන, හායති ආභාය, හායති ආරොහපරිණාහෙන. එවමෙව ඛො සාරිපුත්ත යස්ස කස්සචි සද්ධා නත්ථි කුසලෙසු ධම්මෙසු -පෙ- අප්පමාදෙ නත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, හානියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු. නො වුද්ධි.

ඇවැත්නි, යම් කෙනකුන්ට කුශලධර්මයන්හි ශ්‍රද්ධා නැත් ද, හිරි නැත් ද... ඔතප් නැත් ද, – වීර්‍ය්‍ය නැත් ද, – ප්‍රඥා නැත් ද, – ශ්‍රොතාවධාන නැත් ද – ධර්මධාරණා නැත් ද,–අර්ථොපපරීක්ෂා නැත් ද,–ධර්මානුධර්මප්‍රතිපත්ති නැත් ද,– කුශලධර්මයන්හි අප්‍රමාදය නැත් ද, ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ ඒ නම්, කුශලධර්මයන්හි හානිය ම කැමැති වියයුතු. වෘද්ධිය නො වේ. ඇවැත්නි, යම් සේ කෘෂ්ණපක්ෂයෙහි චන්ද්‍රයාගේ යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ ඒ නම්, වර්ණයෙනුදු පිරිහෙයි, මැඩීලියෙනුදු පිරිහෙයි, ආභායෙනුදු පිරිහෙයි, ආරොහපරිණාහයෙනුදු පිරිහෙයි. ඇවැත්නි, එසෙයින් ම යම් කෙනකුන්ට කුශලධර්මයන්හි ශ්‍රද්ධා නැත් ද, හිරි නැත් ද,... ඔතප් නැත් ද,–වීර්‍ය්‍යය නැත් ද,–ප්‍රඥා නැත් ද, – ශ්‍රොතාවධානය නැත් ද, – ධර්මධාරණා නැත් ද,–අර්ථොපපරීක්ෂා නැත් ද,–ධර්මානුධර්මප්‍රතිපත්තිය නැත් ද, කුශලධර්මයන්හි අප්‍රමාදය නැත් ද, ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ ඒ නම් කුශලධර්මයන්හි හානිය ම කැමැති වියයුතු. වෘද්ධි නො වේ.

ඇවැත්නි, යම් කෙනකුන්ට කුශලධර්මයන්හි ශ්‍රද්ධා ඇත් ද, හිරි ඇත් ද,... අපත්‍රපා ඇත් ද, – වීර්‍ය්‍යය ඇත් ද, – ප්‍රඥා ඇත් ද,–ශ්‍රොතාවධානය ඇත් ද, – ධර්මධාරණා ඇත් ද,–අර්ථොපපරීක්ෂා ඇත් ද,–ධර්මානුධර්මප්‍රතිපත්ති ඇත් ද,– කුශලධර්මයන්හි අප්‍රමාදය ඇත් ද, ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ ඒ නම්, කුශලධර්මයන්හි වෘද්ධිය ම කැමැති වියයුතු. පරිහාණි නො වේ. ඇවැත්නි, යම් සේ සුක්ලපක්ෂයෙහි චන්ද්‍රයාගේ යම්බඳු රාත්‍රියක් හෝ දවසෙක් හෝ ඒ නම්, වර්ණයෙනුදු වැඩේ මැ යි. මැඩිලියෙනුදු වැඩේ, ආභායෙනුදු වැඩේ, ආරොහපරිණාහයෙනුදු වැඩේ. ඇවැත්නි, එසෙයින් ම යම් කෙනකුහට කුශලධර්මයන්හි ශ්‍රද්ධා ඇත් ද, ... කුශලධර්මයන්හි අප්‍රමාදය ඇත් ද ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ ඒ නම් කුශලධර්මයන්හි වෘඩිය ම කැමැති විය යුතු. පරිහාණි නො වේ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යළි නැගීවදරා ආයුෂ්මත් සැරියුත් තෙරුන් ඇමතූ සේක: ශාරීපුත්‍රයෙනි, මැනැවි, ඉතා මැනැවි. ශාරීපුත්‍රයෙනි යම් කෙනකුන්ට කුශලධර්මයන්හි ශ්‍රද්ධා නැත් ද, හිරි නැත් ද,–ඔතප් නැත් ද, ප්‍රඥා නැත් ද,–වීර්‍ය්‍ය නැත් ද,–ශ්‍රොත වධාන නැත් ද,–ධර්මධාරණා නැත් ද,– අර්ථොපපරීක්ෂා නැත් ද,–ධර්මානුධර්මප්‍රතිපත්ති නැත් ද,–කුශලධර්මයන්හි අප්‍රමාද නැත් ද, ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ එයි නම් කුශලධර්මයන්හි හා නියම කැමැති වියයුතු. වෘද්ධිය නො වේ. ශාරීපුත්‍රයෙනි, කෘෂ්ණපක්ෂයෙහි චන්ද්‍රයාගේ යම්බඳු රාත්‍රියක් හෝ දවසක් හෝ එයි නම්, වර්ණයෙනුදු පිරිහෙයි, මැඩිලියෙනුදු පිරිහෙයි, ආභායෙනුදු පිරිහෙයි, ආරොපරිණාහයෙනුදු පිරිහෙයි. ශාරීපුත්‍රයෙනි, එසෙයින් ම යම්කෙනකුන්ට කුශලධර්මයන්හි ශ්‍රද්ධා නැත් ද ... කුශලධර්මයන්හි අප්‍රමාදය නැත් ද, ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසෙක් හෝ ඒ නම්, කුශලධර්මයන්හි හානියෙක් මැ කැමැති වියයුතු. වෘද්ධි නො වේ.

යස්ස කස්සචි සාරිපුත්ත සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු. හිරි අත්ථි- ඔත්තප්පං අත්ථි - විරියං අත්ථි - පඤ්ඤා අත්ථි - සොතාවධානං අත්ථි ධම්මධාරණා අත්ථි - අත්ථූපපරික්ඛා අත්ථි - ධම්මානුධම්මපටිපත්ති අත්ථි - අප්පමාදෙ අත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු. නො පරිහානි. සෙය්‍යථාපි සාරිපුත්ත ජුණ්හපක්ඛෙ චන්දස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වඩ්ඪතෙව වණ්ණෙන. වඩ්ඪති මණ්ඩලෙන, වඩ්ඪති ආභාය, වඩ්ඪති ආරොහපරිණාහෙන, එවමෙව ඛො සාරිපුත්ත යස්ස කස්සචි සද්ධා අත්ථි කුසලෙසු ධම්මෙසු -පෙ- අප්පමාදෙ අත්ථි කුසලෙසු ධම්මෙසු. තස්ස යා රත්ති වා දිවසො වා ආගච්ඡති, වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු. නො පරිහානීති.

## 10. 2. 2. 9

## පඨම කථාවත්ථු සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා උපට්ඨානසාලායං සන්නිසින්නා සන්නිපතිතා අනෙකවිහිතං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වාති.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන උපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා සන්නිපතිතා, කා සි පන වො අන්තරාකථා විප්පකතාති?

ශාරිපුත්‍රයෙනි, යම් කෙනකුන්ට කුශලධර්මයන්හි ශ්‍රද්ධා ඇද්ද, හිරි ඇද්ද, ඔතප් ඇද්ද, වීය්‍ය්‍ය ඇද්ද, ප්‍රඥ ඇද්ද, ශ්‍රොතාවධාන ඇද්ද, ධර්මධාරණ ඇද්ද, අත්‍ථොපපරික්ෂා ඇද්ද, ධර්මානුධර්මප්‍රතිපත්ති ඇද්ද, කුශලධර්මයන්හි අප්‍රමාදය ඇද්ද, ඔහට යම්බඳු රාත්‍රියක් හෝ දවසෙක් හෝ ඒ නම් කුශලධර්මයන්හි වෘද්ධිය ම කැමැති විය යුතු. පරිහානිය නො වේ. ශාරිපුත්‍රයෙනි, යම් සේ ශුක්ලපක්ෂයෙහි චන්ද්‍රයාගේ යම්බඳු රාත්‍රියක් හෝ දවසෙක් හෝ ඒ නම් වර්ණයෙන් වැඩේ මැයි. මැඩිලියෙනුදු වැඩේ මැයි. ආභායෙනුදු වැඩේ මැයි. ආරොහපරිණාහයෙනුදු මැඩේ මැයි. ශාරිපුත්‍රයෙනි එ පරිදි ම යම් කෙනකුන්ට කුශලධර්මයන්හි ශ්‍රද්ධා ඇද්ද... කුශලධර්මයන්හි අප්‍රමාද ඇද්ද ඔහට යම් රයක් හෝ දවසෙක් හෝ ඒ නම් කුශලධර්මයන්හි වෘද්ධිය ම කැමැති විය යුතු. පරිහානි නො වේ යී.

## 10. 2. 2. 9
## පඨම කථාවත්ථු සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජෙතවන නම් අනේපිඩුසිටුහුගේ ආරාමයෙහි වාසය කරන සේක. එකල්හි බොහෝ භික්ෂූහු පසුබත පිඩුවෘයෙන් වැළකියාහු වටන්හල්හි රැස්ව හුන්නාහු අනෙකවිධ තිරශ්චීන කථායෙහි යෙදුනාහු වාසය කරත්. එ කවර යත්: ''රාජකථා ය, චොරකථා ය. මහාමාත්‍යකථා ය, සෙනාකථා ය, භයකථා ය, යුද්ධකථා ය, අන්නකථා ය, පානකථා ය, වස්ත්‍රකථා ය, ශයනකථා ය, මාලාකථා ය, ගන්ධකථා ය, ඥතිකථා ය, යානකථා ය, ග්‍රාමකථා ය, නිගමකථා ය, නගරකථා ය, ජනපදකථා ය, ස්ත්‍රීකථා ය, සූර්‍ප්‍රෙතකථා ය, නානාත්මකථා ය, ලොකඛ්‍යායිකථා ය, සමුද්‍රාඛ්‍යායි-කථා ය, ඉතිභවාභවකථා ය, මෙසේ හෝ''යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස්වරුයෙහි පිළිසලණින් නැගුණාහු වටන්හල් කරා එළඹියහ. එළඹ පැනවූ අස්නෙහි හුන්හ. හිද භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, තෙපි මෙකල කවර කථායෙකින් යුක්ත ව රැස්ව හුන්නහු ද? කවර නම් කථායෙක් තොප විසින් අඩාළ කරනලද ය? වහන්ස, පසුබත පිඩුවායෙන් පෙරලා පැමිණියමෝ අපි මේ වටන්හල්හි රැස්ව හුන්නමෝ අනෙකවිධ තිරශ්චීන කථායෙහි යෙදුනමෝ වාසය කරම්හ. ඒ කවර යත්; රාජකථා ය, චොරකථා ය ... ඉතිභවාභවකථා ය, මෙසේ හෝ''යි.

ඉධ මයං භන්තෙ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා, උපට්ඨාන සාලායං සන්නිසින්නා සන්නිපතිතා අනෙකවිහිතං තිරච්ඡානකථං අනුයුත්තා විහරාම. සෙය්‍යථීදං: රාජකථං චොරකථං -පෙ- ඉති භවාභවකථං ඉති වාති. න ඛො පනෙතං භික්ඛවෙ තුම්හාකං පතිරූපං කුලපුත්තානං සද්ධාය අගාරස්මා අනගාරියං පබ්බජිතානං, යං තුම්හෙ අනෙකවිහිතං තිරච්ඡානකථං අනුයුත්තා විහරෙය්‍යාථ. සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං,, ඉතිභවාභවකථං ඉති වාති.

දස ඉමානි භික්ඛවෙ කථාවත්ථූනි. කතමානි දස: අප්පිච්ඡකථා සන්තුට්ඨිකථා පවිවෙකකථා අසංසග්ගකථා විරියාරම්භකථා සීලකථා සමාධිකථා පඤ්ඤාකථා විමුත්තිකථා විමුත්තිඤාණදස්සනකථාති. ඉමානි ඛො භික්ඛවෙ දසකථාවත්ථූනි.

ඉමෙසං චෙ තුම්හෙ භික්ඛවෙ දසන්නං කථාවත්ථූනං උපාදායුපාදාය කථං කථෙය්‍යාථ, ඉමෙසම්පි චන්දිමසූරියානං එවං මහිද්ධිකානං එවං මහානුභාවානං තෙජසා තෙජං පරියාදියෙය්‍යාථ, කො පන වාදෙ අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානන්ති.

## 10. 2. 2. 10

## දුතියකථාවත්ථු සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා උපට්ඨානසාලායං සන්නිසින්නා සන්නිපතිතා අනෙකවිහිතං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං -පෙ- ඉතිභවාභවකථං ඉති වාති,

1. දස ඉමානි භික්ඛවෙ පාසංසානි ඨානානි. කතමානි දස: ''ඉධ භික්ඛවෙ භික්ඛු අත්තනා ච අප්පිච්ඡො හොති, අප්පිච්ඡකථඤ්ච භික්ඛූනං කත්තා හොති. ''අප්පිච්ඡො භික්ඛු අප්පිච්ඡකථඤ්ච භික්ඛූනං කත්තා''ති පාසංසමෙතං ඨානං.

2. අත්තනා ච සන්තුට්ඨො හොති. සන්තුට්ඨිකථඤ්ච භික්ඛූනං කත්තා ''සන්තුට්ඨො හොති, භික්ඛු සන්තුට්ඨිකථඤ්ච භික්ඛූනං කත්තා''ති. පාසංසමෙතං ඨානං.

මහණෙනි, ගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වූ කුලපුත්‍ර තොපට තෙල ප්‍රතිරූප නො වේ ම ය. යම් හෙයෙකින් තෙපි අනෙකවිහිත වූ තිරශ්චීන කථායෙහි යෙදුනහු වාසය කරත් නම් - ඒ කවරය යත්; රාජකථා ය, චොරකථා ය, මහාමාත්‍ය කථා ය, සෙනාකථා ය, භයකථා ය, යුද්ධකථා ය, අන්නකථා ය, පානකථා ය, වස්ත්‍රකථා ය, ශයනකථා ය, මාලාකථා ය, ගන්ධකථා ය, ඥතිකථා ය, යානකථා ය, ග්‍රාමකථා ය, නිගමකථා ය, නගරකථා ය, ජනපදකථා ය, ස්ත්‍රීකථා ය, ශූරකථා ය, විසිඛාකථා ය, කුම්භස්ථානකථා ය, පූර්වප්‍රෙතකථා ය, නානාත්වකථා ය, ලොකඛ්‍යායිකා ය, සමුද්‍රාඛ්‍යායිකා ය, ඉතිභවාභවකථා ය'' යන මේ යි.

මහණෙනි, මේ කථාවස්තු දශයෙක: කවර දශයෙක යත්: අප්පිච්ඡකථා ය, සන්තුට්ඨිකථා ය, පවිවෙකකථා ය, අසංසග්ගකථා ය, විරියාරම්භකථා ය, සීලකථා ය, සමාධිකථා ය, පඤ්ඤකථා ය, විමුත්තිකථා ය, විමුත්තිඤාණදස්සනකථා යි. මහණෙනි, මේ දශකථාවස්තුහු යි.

මහණෙනි, ඉදින් තෙපි මේ දශකථාවස්තුන්ගෙන් කථාවක් ගෙන කියන්නහු නම්, මෙසේ මහර්ධි ඇති මෙසේ මහානුභාව ඇති මේ චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ද තෙද සිය තෙදින් මැඩගෙන සිටුනාහු ය. අන්තොටු පිරිවැජියන් පිළිබඳ කවර කථා යැ ?යි.

## 10. 2. 2. 10
## දුතිය කථාවත්ථු සූත්‍රය

එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඩු සිටුහුගේ ජෙතවන නම් ආරාමයෙහි වාසය කරන සේක. එ සමයෙහි බොහෝ භික්ෂුහු පසුබත පිඩුවායෙන් පෙරලා පැමිණියාහු උවටන්හල්හි රැස්ව හුන්නාහු අනෙකවිධ තිරශ්චීන කථායෙහි ඇලුණාහු වාසය කරත්. ඒ කවර යත්: රාජකථා ය, චොරකථා ය, මහාමාත්‍රකථා ය, -පෙ- ඉතිභවාභවකථාය යි.

1. මහණෙනි, මේ ප්‍රශංසාවහ කරුණු දසයෙකි. කවර දසයෙක යත්; මහණෙනි, මෙසස්නෙහි මහණ තෙමේ ද අල්පෙච්ඡ වෙයි. අල්පෙච්ඡ කථාත් භික්ෂූන්ට කරන්නේ වේ යයි තෙල කරුණ ප්‍රශංසාවහ වෙයි.

2. තෙමේත් සතුටු වූයේ වෙයි. සන්තුෂ්ටිකථාව භික්ෂූන්ට කරනුයේත් වෙයි.'' මහණ සතුටු වූයේ සන්තුෂ්ටිකථාව භික්ෂූන්ට කරන්නේ ය යන තෙල කරුණ ප්‍රශංසාවහ වේ.

3. අත්තනා ච පවිවිත්තො හොති, පවිවෙකකථඤ්ච භික්ඛූනං කත්තා හොති. "පවිවිත්තො භික්ඛු පවිවෙකකථඤ්ච භික්ඛූනං කත්තා"ති පාසංසමෙතං ඨානං.

4. අත්තනා ච අසංසට්ඨො හොති, අසංසට්ඨකථඤ්ච භික්ඛූනං කත්තා හොති., අසංසට්ඨො භික්ඛු අසංසට්ඨකථඤ්ච භික්ඛූනං කත්තා''ති පාසංසමෙතං ඨානං.

5. අත්තනා ච ආරද්ධවිරියො හොති, විරියාරම්භකථඤ්ච භික්ඛූනං කත්තා හොති. "ආරද්ධවිරියො භික්ඛු විරියාරම්භකථඤ්ච භික්ඛූනං කත්තා'' ති පාසංසමෙතං ඨානං.

6. අත්තනා ච සීලසම්පන්නො හොති, සීලසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා හොති, "සීලසම්පන්නො භික්ඛු සීලසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා''ති පාසංසමෙතං ඨානං.

7. අත්තනා ච සමාධිසම්පන්නො හොති, සමාධි සම්පදකථඤ්ච භික්ඛූනං කත්තා හොති, සමාධිසම්පන්නො භික්ඛු සමාධිසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා''ති පාසංසමෙතං ඨානං.

8. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති, පඤ්ඤාසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා හොති, "පඤ්ඤාසම්පන්නො භික්ඛු පඤ්ඤාසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා'ති පාසංසමෙතං ඨානං,

9. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති, විමුත්තිසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා හොති. "විමුත්තිසම්පන්නො භික්ඛු විමුත්තිසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා''ති පාසංසමෙතං ඨානං.

10. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති, විමුත්තිඤාණදස්සනසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා හොති. 'විමුත්තිඤාණදස්සන' සම්පන්නො භික්ඛු විමුත්තිඤාණදස්සනසම්පදකථඤ්ච භික්ඛූනං කත්තා''ති පාසංසමෙතං ඨානං. ඉමානි ඛො භික්ඛවෙ දස පාසංසානි ඨානානීති.

## යමකවග්ගො දුතියො.

**තත්‍රුද්දානං:**

අවිජ්ජා තණ්හා නිට්ඨා ච අවෙච්චදෙව සුඛානි ච

නළකපානෙ දෙව වුත්තා කථාවත්ථු අපරෙ දෙවති.

3. තෙමේත් ප්‍රවිවික්ත වෙයි, ප්‍රවිවේකකථා භික්ෂූන්ට කරන්නේත් වෙයි. "මහණ ප්‍රවිවික්ත වූයේ භික්ෂූන්ට ප්‍රවිවේකකථා කරනේ ය"යි තෙල කරුණ ප්‍රශංසාවහ වේ.

4. තෙමේත් අසංසෘෂ්ට වූයේ වෙයි. භික්ෂූන්ට අසංසෘෂ්ට කථාව කරන්නේත් වෙයි. "මහණ අසංසෘෂ්ට වූයේ භික්ෂූන්ට අසංසෘෂ්ට කථාව කරන්නෙක" යන තෙල කරුණ ප්‍රශංසාවහ වෙයි.

5. තෙමේත් ආරබ්ධවීර්‍ය්‍ය වෙයි, භික්ෂූන්ට වීර්‍ය්‍යාරම්භකථාව කරන්නේත් වෙයි,"මහණ ආරබ්ධවීර්‍ය්‍ය වූයේ භික්ෂූන්ට වීර්‍ය්‍යාරම්භකථාව කරන්නෙක" යන තෙල කරුණ ප්‍රශංසාවහ වෙයි.

6. තෙමේත් සිල්සපන් වූයේ වෙයි. සීලසම්පදකථාව භික්ෂූන්ට කරන්නේත් වෙයි. "සිල්සපන් මහණ භික්ෂූන්ට සීලසම්පදකථාව කරන්නෙක" යන තෙල කරුණ ප්‍රශංසාවහ වෙයි.

7. තෙමේත් සමාධිසම්පන්න වූයේ වෙයි. භික්ෂූන්ට සමාධිසම්පදකථාව කරන්නේත් වෙයි. "සමාධිසම්පන්න මහණ සමාධිසම්පදකථාව භික්ෂූන්ට කරන්නෙක" යන තෙල කරුණ ප්‍රශංසාවහ වෙයි.

8. තෙමේත් ප්‍රඥාසම්පන්න වෙයි, ප්‍රඥාසම්පදකථාව භික්ෂූන්ට කරන්නේත් වෙයි. "ප්‍රඥාසම්පන්න මහණ භික්ෂූන්ට ප්‍රඥාසම්පදකථාව කරන්නෙක" යන තෙල කරුණ ප්‍රශංසාවහ වෙයි.

9. තෙමේත් විමුක්තිසම්පන්න වෙයි, විමුක්තිසම්පදකථාව භික්ෂූන්ට කරන්නේත් වෙයි. "විමුක්තිසම්පන්න මහණ භික්ෂූන්ට විමුක්තිසම්පද කථාත් කරන්නෙක" යන තෙල කරුණ ප්‍රශංසාවහ වෙයි.

10. තෙමේත් විමුක්තිඥානදර්ශනසම්පන්න වෙයි. විමුක්තිඥානදර්ශන කථාව භික්ෂූන්ට කරන්නේත් වෙයි. "විමුක්තිඥානදර්ශනසම්පන්න මහණ භික්ෂූන්ට විමුක්තිඥානදර්ශනකථාව කරන්නේත් වේ" යන තෙල කරුණ ප්‍රශංසාර්හ වේ. මහණෙනි, ප්‍රශංසාවහ කරුණු දශය යි.

## දෙවන යමකවග්ග යි.

**එහි උද්දානය:**

අවිජ්ජා ය, තණ්හා ය, නිට්ඨා ය, අවෙච්චප්පසන්න ය, සුඛ සූත්‍ර දෙක ය; නළකපාන සූත්‍ර දෙක ය, කථාවත්ථු සූත්‍ර දෙක දැයි සූත්‍ර දශයෙක.

# 3. ආකඞ්ඛවග්ගො

## 10. 2. 3. 1

### ආකඞ්ඛෙය්‍ය සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති; භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච. සම්පන්නසීලා භික්ඛවෙ විහරථ සම්පන්නපාතිමොක්ඛා, පාතිමොක්ඛසංවරසංවුතා විහරථ ආචාරගොචර සම්පන්නා, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවිනො සමාදය සික්ඛථ සික්ඛාපදෙසු.

1. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු “සබ්‍රහ්මචාරීනං පියො චස්සං මනාපො ච ගරු ච භාවනීයො චා”ති. සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

2. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු “ලාභී අස්සං චීවර පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන”න්ති. සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

3. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු “යෙසාහං පරිභුඤ්ජාමි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, තෙසං තෙ කාරා මහප්ඵලා අස්සු මහානිසංසා”ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී –පෙ– බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

4. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු “යෙ මෙ පෙතා ඤාතිසාලොහිතා කාලකතා පසන්නචිත්තා අනුස්සරන්ති, තෙසං තං මහප්ඵලං අස්ස මහානිසංස”න්ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී –පෙ– බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

5. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු “සන්තුට්ඨො අස්සං ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙනා”ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී –පෙ– බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

# 3. ආකඞ්ඛවර්ගය

## 10. 2. 3. 1

### ආකඞ්ඛෙය්‍ය සූත්‍රය

එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩු සිටුහුගේ ජෙතවන නම් ආරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක; මහණෙනි, සිල්සපන්ව, ප්‍රාතිමොක්ෂ-ශීලයෙන් සමන්වාගත ව වාසය කරවු. ආචාර ගොචරසම්පන්න වූවාහු අණුමාත්‍ර වරදෙහිදු භය දක්නා සුල්ලහු ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූවාහු වාසය කරවු. සමාදන් කොට ගෙන ශික්ෂාපදයන්හි හික්මෙවු.

1. මහණෙනි, ඉදින් මහණ "සබ්‍රහ්මචාරීනට ප්‍රිය හා මනාප හා ගුරු හා භාවනීය හා වෙම්ව"යි කැමැති වේ නම් අධ්‍යාත්මචිත්තසමථයෙහි යෙදුණේ නො හළ ධ්‍යාන ඇතියේ විදර්ශනායෙන් සමන්වාගත වූයේ ශූන්‍යාගාරභාවනාව වඩනුයේ ශීලයන්හි ම පරිපූරකාරී වන්නේ ය.

2. මහණෙනි, ඉදින් මහණ චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර ලබන සුලු වෙම්ව"යි කැමැති වේ නම් අධ්‍යාත්ම-චිත්තසමථයෙහි යෙදුණේ නො හළ දැහැන් ඇතියේ සප්තානුදර්ශනයෙන් සමන්වාගත වූයේ ශූන්‍යාගාරයන් වඩනුයේ ශීලයන්හි ම පරිපූරකාරී වන්නේ ය.

3. මහණෙනි, ඉදින් මහණ "මම යම් කෙනකුන්ගේ චීවරපිණ්ඩපාත ශයනාසනග්ලානප්‍රත්‍යභෛෂජ්‍යපරිෂ්කාර වළඳ කෙරෙම් නම් ඔවුන්ගේ ඒ ප්‍රත්‍යයසත්කාරයෝ මහත්ඵල මහානෘශංස වෙත්ව"යි කැමැති වේ නම්... ශූන්‍යාගාරයන් වඩනුයේ ශීලයන්හි ම පරිපූරකාරී වන්නේ ය.

4. මහණෙනි, ඉදින් මහණ "මාගේ යම් ම ඥාතිසාලොහිත ප්‍රෙත කෙනෙක් කලුරිය කළාහු පහන් සිතැත්තාහු අනුස්මරණ කෙරෙත් නම් ඔවුන්ගේ එය මහත්ඵල මහානෘශංස වේව"යි... ශූන්‍යාගාරයන් වඩනුයේ ශීලයන්හි ම පරිපූරකාරී වන්නේ ය.

5. මහණෙනි, ඉදින් මහණ "ඉතරෙතර චීවරපිණ්ඩපාතශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරයෙන් සන්තුෂ්ට වෙම්ව"යි කැමැති වේ නම්... ශූන්‍යාගාරයන් වඩනුයේ ශීලයන්හි ම පරිපූරකාරී වන්නේ ය.

6. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "ඛමො අස්සං සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං. සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො අස්සන්ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

7. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "අරති රති සහො අස්සං, න ච මං අරති රති සහෙය්‍ය, උප්පන්නං අරති රතිං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය"න්ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

8. ආකාඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "භයභෙරව සහො අස්සං, න ච මං භයභෙරවො සහෙය්‍ය, උප්පන්නං භයභෙරවං අභිභුය්‍ය අභිභුය්‍ය විහරෙය්‍ය"න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී -පෙ- බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

9. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී අස්සං අකිච්ඡලාභී අකසිරලාභී"ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී ... බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

10. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු "ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤාසච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය"න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං.

සම්පන්නසීලා භික්ඛවෙ විහරථ සම්පන්නපාතිමොක්ඛා, පාතිමොක්ඛසංවරසංවුතා විහරථ ආචාරගොචරසම්පන්නා අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවිනො සමාදාය සික්ඛථ සික්ඛාපදෙසූ"ති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

6. මහණෙනි, ඉදින් මහණ ශීත හා උෂ්ණ හා සා හා පවස් හා මැසිමදුරු හා වා අව් හා සරීසෘපයන්ගේ ස්පර්ශය ඉවසන සුල්ලෙම් වෙම්වයි නපුරු කොට කියූ නපුරු කොට පැමිණි වචනමාර්ගයන් ද උපන් දුක් වූ තීව්‍ර වූ රලු වූ කටුක වූ අසාත වූ අමනාප වූ ප්‍රාණහර වූ ශාරීරිකවේදනාවන් ඉවසන සැහැවි ඇත්තෙම් වෙම්වයි... ශූන්‍යාගාරයන් වඩනුයේ සීලයන්හි ම පරිපූරකාරී වන්නේ ය.

7. මහණෙනි, ඉදින් මහණ (අභිනිෂ්ක්‍රමණ ප්‍රතිපත්තියෙහි) ''අරතිය හා කාමගුණයන්හි රතිය හා මැඩ ලන්නෙම වෙම්ව යි අරතිය හා රතිය ද මා නහමක් මඩීව යි උපන් අරතිය හා රතිය මැඩ - මැඩ වාස කරම්ව''යි කැමැති වේ නම් ... ශූන්‍යාගාරයන් වඩනුයේ ශීලයන්හි පරිපූරකාරී වන්නේ ය.

8. මහණෙනි, ඉදින් මහණ චිත්තොත්‍රාස හා බීහිසුනු අරමුණු සහන සුල්ලෙම් වෙම්වයි, භයභෛරව නහමක් මැඩ යේවයි උපන් භයභෛරව මැඩ - මැඩ වාසය කෙරෙම්ව''යි කැමැති වේ නම් ... ශූන්‍යාගාරයන් වඩනුයේ ශීලයන්හි ම පරිපූරකාරී වන්නේ ය.

9. මහණෙනි, ඉදින් මහණ ''ආභිචෛතසික වූ දිට්ඨධම්මසුඛවිහාර වූ සිව්දැහැන් කැමැති සේ ලබන්නෙම් නිදුක් සේ ලබන්නෙම පහසු සේ ලබන්නෙම් වෙම්ව''යි... ශූන්‍යාගාරයන් වඩනුයේ ශීලයන්හි ම පරිපූරකාරී වන්නේ ය.

10. මහණෙනි, ඉදින් මහණ ''ආස්‍රවක්ෂයයෙන් අනාශ්‍රව වූ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය දිටුදමියෙහි ම තෙමේ විශිෂ්ට ඥානයෙන් සාක්ෂාත් කොට එයට පැමිණ වෙසෙම්ව''යි ආධ්‍යාත්ම චිත්තසමථයෙහි යෙදුණේ නො හළ දැහැන් ඇතියේ විදර්ශනායෙන් සමන්වාගත වූයේ ශූන්‍යාගාරයන් වඩනුයේ ශීලයන්හි පරපූරකාරී වන්නේ ය.

මහණෙනි, ''සිල්සපන් වූවාහු පාමොක්සපන් වූවාහු වාසය කරවු. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවෘත වූවාහු ආචාරගොචර සම්පන්න වූවාහු වාසය කරවු. අණුමාත්‍රවද්‍යයන්හි භය දක්නා සුල්ලහු සමාදන් කොට ගෙන සිකපදයන්හි හික්මෙවු''යයි මෙසේ යමක් කියන ලද නම් තෙල මේ පිණිස කියනලදැ යි.

# 10. 2. 3. 2

## කණ්ටක සුත්තං

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං සම්බහුලෙහි අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහි ථෙරෙහි සාවකෙහි සද්ධිං ආයස්මතා ච චාලෙන[1] ආයස්මතා ච උපචාලෙන[2] ආසස්මතා ච කක්කටෙන[3] ආයස්මතා ච කටිම්භෙන[4] ආයස්මතා ච කටෙන[5] ආයස්මතා ච කටිස්සඞ්ඝෙන[6] අඤ්ඤෙහි ච අභිඤ්ඤාතෙහි අභිඤ්ඤාතෙහි ථෙරෙහි සාවකෙහි සද්ධිං.

තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී භද්දෙහි භද්දෙහි යානෙහි වරපුරාය[7] උච්චාසද්දා මහාසද්ද මහාවනං අජ්ඣොගාහන්ති භගවන්තං දස්සනාය. අථ ඛො තෙසං ආයස්මන්තානං එතදහොසි: "ඉමෙ ඛො සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී භද්දෙහි භද්දෙහි යානෙහි වරපුරාය උච්චාසද්ද මහාසද්දා මහාවනං අජ්ඣොගාහන්ති භගවන්තං දස්සනාය. සද්දකණ්ටකා ඛො පන ඣානා වුත්තා භගවතා, යන්නූන මයං යෙන ගොසිඞ්ගසාලවනදායො තෙනුප-සඞ්කමෙය්‍යාම, තත්ථ මයං අප්පසද්දා අප්පකිණ්ණා ඵාසුං[8] විහරෙය්‍යාමා"ති. අථ ඛො තෙ ආයස්මන්තා යෙන ගොසිඞ්ගසාලවනදායො තෙනුපසඞ්කමිංසු. තත්ථ තෙ ආයස්මන්තා අප්පසද්දා අප්පකිණ්ණා ඵාසුං විහරන්ති.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි; "කහන්නු ඛො භික්ඛවෙ චාලො? කහං උපචාලො? කහං කක්කටො? කහං කටිම්භො? කහං කටො? කහං කටිස්සඞ්ඝො? කහන්නු ඛො තෙ භික්ඛවෙ ථෙරා සාවකා ගතාති?

ඉධ භන්තෙ තෙසං ආයස්මන්තානං එතදහොසි: "ඉමෙ ඛො සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා. ලිච්ඡවී භද්දෙහි භද්දෙහි යානෙහි වරපුරාය උච්චාසද්දා මහාසද්දා මහාවනං අජ්ඣොගාහන්ති භගවන්තං දස්සනාය, සද්දකණ්ටකා ඛො පන ඣානා වුත්තා භගවතා, යන්නූන මයං යෙන ගොසිඞ්ගසාලවනදායො තෙනුපසඞ්කමෙය්‍යාම, තත්ථ මයං අප්පසද්දා අප්පකිණ්ණා ඵාසුං විහරෙය්‍යාමා"ති. අථ ඛො තෙ භන්තෙ ආයස්මන්තා යෙන ගොසිඞ්ගසාලවනදායො තෙනුපසඞ්කමිංසු. තත්ථ තෙ ආයස්මන්තා අප්පසද්දා අප්පකිණ්ණා ඵාසුං විහරන්තීති.

---

1. ආයස්මතා චාලෙන ච - මජසං.
2. උපපලෙන - ස්‍යා,
3. කුක්කුටෙන - මජසං.
4. කටිමෙහන - මජසං.
5. නිකටෙන - මජසං.
6. කටිස්සහෙන - මජසං.
7. පරපුරාය මජසං - පම්පුරරාය-ස්‍යා.
8. ඵාසු - ස්‍යා.

## 10. 2. 3. 2

## කණ්ටක සූත්‍රය

එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර සමීපයෙහි වූ මහාවන කූටාගාරශාලායෙහි ආයුෂ්මත් චාලය ආයුෂ්මත් උපචාලය ආයුෂ්මත් කක්කටය ආයුෂ්මත් කටිම්භ ය ආයුෂ්මත් කට ය ආයුෂ්මත් කටිස්සඞ්ග ය යන ඉතා ප්‍රකට ස්ථවිර ශ්‍රාවකයන් ද අන්‍ය වූත් ප්‍රකට බොහෝ ස්ථවිර ශ්‍රාවකයන් ද සමග වාසය කරන සේක.

එකල්හි ඉතා ප්‍රසිද්ධ බොහෝ ලිච්ඡවීහු උස්හඬ මහහඬ ඇත්තාහු භද්‍ර භද්‍ර යානයන්ගෙන් පෙර-පසුව යන මහ සෙනග සමග නික්ම භාග්‍යවතුන් වහන්සේගේ දර්ශනය පිණිස මහාවනයට ඇතුළු වෙති. එකල්හි ඒ ආයුෂ්මත්නට මෙසේ සිත විය: ''මේ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බොහෝ ලිච්ඡවීහු භද්‍ර භද්‍ර යානයෙන් පෙර පසුව යන මහසෙන් සමග උස්හඬ ඇත්තාහු මහහඬ ඇත්තාහු භාග්‍යවතුන් දකිනු සඳහා මහාවනයට වදනාහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ''ධ්‍යානයෝ ශබ්දකණ්ටකයහ''යි වදාරන ලදි. අපි ගොසිඞ්ගසාලවනදයට එළැඹෙමෝ නම් මැනැව, එහි අපි අල්පශබ්ද අල්පකීර්ණ වූවමෝ පහසුවෙන් වාසය කරම්හ''යි. ඉක්බිති ඒ ආයුෂ්මත්හු ගොසිඞ්ගවනදයට එළඹියහ. එහි ඒ ආයුෂ්මත්හු අල්පශබ්ද වූවාහූ අල්පකීර්ණ වූවාහු පහසුවෙන් වාසය කරත්.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, චාල කොහි ය? උපචාල කොහි ය? කක්කට කොහි ය? කටිම්භ කොහි ය? කට කොහි ය? කටිස්සඞ්ග කොහි ය? මහණෙනි, ඒ තෙරසව්මහණෝ කොහි ගියාහුද?''යි.

වහන්ස, මෙහිලා ඒ ආයුෂ්මත්නට මෙසේ සිත විය: ''මේ බොහෝ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ලිච්ඡවීහු භද්‍ර භද්‍ර යානයෙන් පෙර-පසුව යන මහසෙන් සමග උස්හඬ ඇතියාහු මහහඬ ඇතියාහු භාග්‍යවතුන් දැකුම සඳහා මහවනයට වදනාහ. භාග්‍යවතුන් වහන්සේ ධ්‍යානයෝ ශබ්දකණ්ටකයහයි කියන ලදහ. අපි ගොසිඞ්ගසාලවනදය කරා එළැඹෙමෝ නම් මැනැව. එහි අපි අල්පශබ්ද වූවමෝ අල්පකීර්ණ වූවමෝ පහසු සේ වාසය කරම්හයි''යි, වහන්ස, ඉක්බිති ඒ ආයුෂ්මත්හු ගොසිඞ්ගසාලවනදය කරා එළැඹියහ. එහි ඒ ආයුෂ්මත්හු අල්පශබ්ද වූවාහු අල්පාකීර්ණ වූවාහු සුව සේ වාසය කරත්ය''යි.

සාධු සාධු භික්ඛවෙ යථා තෙ මහාසාවකා සම්මා බ්‍යාකරමානා බ්‍යාකරෙය්‍යුං. සද්දකණ්ටකා හි භික්ඛවෙ ඣානා වුත්තා මයා.

දසයිමෙ භික්ඛවෙ කණ්ටකා, කතමෙ දස: පවිවෙකාරාමස්ස සඞ්ගණිකාරාමතා කණ්ටකා[3], අසුභනිමිත්තානුයොගමනුයුත්තස්ස සුභනිමිත්තානුයොගො කණ්ටකො, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරස්ස විසූකදස්සනං කණ්ටකො, බ්‍රහ්මචාරිස්ස[1] මාතුගාමොපවිචාරො[2] කණ්ටකො, පඨමස්ස ඣානස්ස සද්දො කණ්ටකො, දුතියස්ස ඣානස්ස විතක්කවිචාරා කණ්ටකො, තතියස්ස ඣානස්ස පීති කණ්ටකො, චතුත්ථස්ස ඣානස්ස අස්සාසපස්සාසා[4] කණ්ටකො, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා සඤ්ඤා ච වෙදනා ච කණ්ටකො, රාගො කණ්ටකො, දොසො කණ්ටකො, මොහො කණ්ටකො. අකණ්ටකා භික්ඛවෙ විහරථ, නික්කණ්ටකා භික්ඛවෙ විහරථ. අකණ්ටකා භික්ඛවෙ අරහන්තො, නික්කණ්ටකා භික්ඛවෙ අරහන්තො. අකණ්ට නික්කණ්ටකා භික්ඛවෙ අරහන්තොති.

## 10. 2. 3. 3

## ඉට්ඨධම්ම සුත්තං

**[සාවත්ථි]**

දසයිමෙ භික්ඛවෙ ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, කතමෙ දස:

භොගා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, වණ්ණො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං, ආරොග්‍යං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං, සීලං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං, බ්‍රහ්මචරියං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං, මිත්තා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, බාහුසච්චං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං, පඤ්ඤා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං, සග්ගා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.

ඉමෙ ඛො භික්ඛවෙ දසධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.

1. බ්‍රහ්මචරියස්ස-මජසං.
2. මාතුගාමූපචාරො-මජසං.
3. කණ්ටකා-මජසං.
4. අස්සාසපස්සාසො-මජසං.

මහණෙනි, මැනැවැ, මැනැවැ යම පරිදි ඒ මහසව්වෝ මොනොවට පවසන්නාහු කියත් නම් එසේ මවිසින් ධ්‍යානයෝ ශබ්දකණ්ටකයහයි කියන ලදහ.

මහණෙනි, මේ කණ්ටක දශයෙක, කවර දශයක යත්: ප්‍රවිවේකයෙහි ඇලුනහුට සඞගණිකාරාමතාව කණ්ටක යි. අශුභනිමිත්තානුයොගයෙහි යෙදුනහුට ශුභනිමිත්තානුයොගය කණ්ටක යි. ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර- ඇතියහුට විසුලුදස්න කණ්ටක යි. බඹසරනුහට මාගමක වෙත හැසිරීම කණ්ටක යි. ප්‍රථමධ්‍යානයට ශබ්දයකණ්ටක යි. ද්විතීයධ්‍යානයට විතර්ක– විචාර කණ්ටක යි. තෘතීයධ්‍යානයට ප්‍රීතිය කණ්ටක යි. චතුර්ථධ්‍යානයට ආශ්වාස ප්‍රශ්වාස කණ්ටක යි. සංඥාවෙදයිත නිරොධසමාපත්තියට සංඥාත් වෙදනාත් කණ්ටක යි. රාගය කණ්ටක යි, ද්වෙෂය කණ්ටක යි, මොහය කණ්ටක යි. මහණෙනි, කණ්ටක රහිත වූවාහු වාසය කරවූ. මහණෙනි, නිෂ්කණ්ටකව වාසය කරවූ. මහණෙනි, අකණ්ටක නිෂ්කණ්ටකව වාසය කරවූ. මහණෙනි, රහත්හු අකණ්ටකයහ. මහණෙනි, රහත්හු නිෂ්කණ්– ටකයහ. මහණෙනි, රහත්හු අකණ්ටක නිෂ්කණ්ටකයහ යි.

## 10. 2. 8. 3
## ඉට්ඨධම්ම සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ මේ ධර්ම දශදෙනෙක් ලොව්හි දුර්ලභයහ, කවර දශදෙනෙක යත්:

ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ භොගයෝ ලොව්හි දුර්ලභයහ. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ වර්ණය ලොව්හි දුර්ලභය. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ආරොග්‍යය ලොව්හි දුර්ලභය. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ශීලය ලොව්හි දුර්ලභය. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ බ්‍රහ්මචර්‍ය්‍යය ලොව්හි දුර්ලභය. ඉෂ්ට කාන්ත මනාප මිත්‍රයෝ ලොව්හි දුර්ලභයහ. ඉෂ්ට කාන්ත මනාප බාහුශ්‍රැත්‍යය ලොව්හි දුර්ලභය. ඉෂ්ට කාන්ත මනාප ප්‍රඥාව ලොව්හි දුර්ලභය. ඉෂ්ට කාන්ත මනාප ධර්මයෝ ලොව්හි දුර්ලභයහ. ඉෂ්ට කාන්ත මනාප ස්වර්ගයෝ ලොව්හි දුර්ලභයහ.

මහණෙනි, මෙ දසදහම්හු ඉෂ්ට කාන්ත මනාප වූවාහු ලොව්හි දුර්ලභයහ.

ඉමෙසං ඛො භික්ඛවෙ දසන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං, දසධම්මා පරිපන්ථා: ආලස්සං[1] අනුට්ඨානං භොගානං පරිපන්ථො, අමණ්ඩනා අභූසණා[2] වණ්ණස්ස පරිපන්ථො, අසප්පාය කිරියා ආරොග්‍යස්ස පරිපන්ථො, පාපමිත්තතා සීලානං පරිපන්ථො, ඉන්ද්‍රියාසංවරො බ්‍රහ්මචරියස්ස පරිපන්ථො, විසංවාදනා මිත්තානං පරිපන්ථො, අසජ්ඣාය කිරියා බාහුසච්චස්ස පරිපන්ථො, අසුස්සූසා අපරිපුච්ඡා පඤ්ඤාය පරිපන්ථො, අනනුයොගො අපච්චවෙක්ඛනා ධම්මානං පරිපන්ථො. මිච්ඡාපටිපත්ති සග්ගානං පරිපන්ථො.

ඉමෙසං ඛො භික්ඛවෙ දසන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං ඉමෙ දස ධම්මා පරිපන්ථා.

ඉමෙසං ඛො භික්ඛවෙ දසන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං දසධම්මා ආහාරා අනාලස්සං උට්ඨානං භොගානං ආහාරො. මණ්ඩනාවිභූසනා වණ්ණස්ස ආහාරො. සප්පායකිරියා ආරොග්‍යස්ස ආහාරො. කල්‍යාණමිත්තතා සීලානං ආහාරො. ඉන්ද්‍රියසංවරො බ්‍රහ්මචරියස්ස ආහාරො, අවිසංවාදනා මිත්තානං ආහාරො. සජ්ඣායකිරියා බාහුසච්චස්ස ආහාරො. සුස්සූසා පරිපුච්ඡා පඤ්ඤාය ආහාරො, අනුයොගො පච්චවෙක්ඛනා ධම්මානං ආහාරො. සම්මාපටිපත්ති සග්ගානං ආහාරො.

ඉමෙසං ඛො භික්ඛවෙ දසන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං ඉමෙ දසධම්මා ආහාරා ති.

## 10. 2. 3. 4
## වඩ්ඪි සුත්තං

[සාවත්ථි]

දසහි භික්ඛවෙ වඩ්ඪීහි වඩ්ඪමානො අරියසාවකො අරියාය වඩ්ඪියා වඩ්ඪති, සාරාදයී ච හොති වරාදයී කායස්ස. කතමෙහි දසහි:

ඛෙත්තවත්ථූහි වඩ්ඪති. ධනධඤ්ඤෙන වඩ්ඪති. පුත්තදාරෙහි වඩ්ඪති. දාසකම්මකර පොරිසෙහි වඩ්ඪති. චතුප්පදෙහි වඩ්ඪති. සද්ධාය වඩ්ඪති. සීලෙන වඩ්ඪති. සුතෙන වඩ්ඪති. චාගෙන වඩ්ඪති. පඤ්ඤාය වඩ්ඪති. ඉමාහි ඛො භික්ඛවෙ දසහි වඩ්ඪීහි වඩ්ඪමානො අරියසාවකො අරියාය වඩ්ඪියා වඩ්ඪති සාරාදයී ච හොති වරාදයී කායස්සා ති.

1. ආලස්‍යං – මජසං
2. අවිභූසණා – මජසං

මහණෙනි, ලොව්හි ඉෂ්ට, කාන්ත, මනාප, දුර්ලභ වූ මේ දශධර්මයනට උවදුරු දහම් දස දෙනෙකි: ආලස්‍යය හා අනුත්ථානය භොගයනට උවදුරෙක. අමණ්ඩනය හා අභූෂණය වර්ණයට උවදුරෙක. අසත්ප්‍රායක්‍රියාව ආරොග්‍යයට උවදුරෙක. පාපමිත්‍රතාව ශීලයනට උවදුරෙක. ඉන්ද්‍රිය අසංවරය බ්‍රහ්මචය්‍යීයට උවදුරෙක. විසංවාදනාව මිත්‍රයනට උවදුරෙක. අසධ්‍යාය-ක්‍රියාව බහුශ්‍රුත බවට උවදුරෙක. අශුශ්‍රෑෂාව හා අපරිපෘච්ඡාව ප්‍රඥවට උවදුරෙක. අනනුයොගය හා අප්‍රත්‍යවෙක්ෂණාව ධර්මයනට උවදුරෙක. මිථ්‍යාප්‍රතිපත්තිය ස්වර්ගයනට උවදුරෙකි.

මහණෙනි, ලොව්හි ඉෂ්ට කාන්ත මනාප දුර්ලභ වූ මේ දශ ධර්මයන්ට මේ ධර්ම දශ ධර්මයෝ උවදුරු වෙත්.

මහණෙනි, ලොව්හි ඉෂ්ට කාන්ත මනාප දුර්ලභ වූ මේ දශධර්මයනට දශධර්ම කෙනෙක් ප්‍රත්‍යය වෙත්: අනාලස්‍යය හා උත්ථානය භොගයනට ප්‍රත්‍යය යි; මණ්ඩනා හා විභූෂණාව වර්ණයට ප්‍රත්‍යය යි. සත්ප්‍රායක්‍රියාව ආරොග්‍යයට ප්‍රත්‍යය යි, කල්‍යාණමිත්‍රතාව ශීලයනට ප්‍රත්‍යය යි, ඉන්ද්‍රිය-සංවරය බ්‍රහ්මචය්‍යීයට ප්‍රත්‍යය යි, අවිසංවාදනාව මිත්‍රයනට ප්‍රත්‍යය යි, සද්ධ්‍යායක්‍රියාව බාහුශ්‍රුත්‍යයට ප්‍රත්‍යය යි, සුශ්‍රෑෂාව හා පරිපෘච්ඡාව ප්‍රඥවට ප්‍රත්‍යය යි, අනුයොගය හා ප්‍රත්‍යවෙක්ෂණාව ධර්මයනට ප්‍රත්‍යය යි, සම්‍යක් ප්‍රතිපත්තිය ස්වර්ගයනට ප්‍රත්‍යය යි.

මහණෙනි ලොව්හි ඉෂ්ට කාන්ත මනාප දුර්ලභ වූ මේ දශධර්මයනට මේ දශධර්මයෝ ප්‍රත්‍යයභ යි.

## 10. 2. 3. 4
## වඩ්ඪි සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, වෘද්ධි දශයකින් වැඩෙන අරිසවු ආයර්‍ය්‍යවෘද්ධියෙන් වැඩෙයි. ශරීරයාගේ සාරය ගන්නා සුලු වෙයි. උත්තමාර්ථය ගන්නා සුලුත් වෙයි. කවර දසයෙකින යත්:

ක්ෂෙත්‍රවාස්තුයෙන් වැඩෙයි. ධනධාන්‍යයෙන් වැඩෙයි. පුත්‍රදරයන්-ගෙන් වැඩෙයි. දස් කම්කරු පුරුෂයන්ගෙන් වැඩෙයි. චතුෂ්පදීන්ගෙන් වැඩෙයි. ශ්‍රද්ධාවෙන් වැඩෙයි. ශීලයෙන් වැඩෙයි. ශ්‍රුතයෙන් වැඩෙයි. ත්‍යාගයෙන් වැඩෙයි. ප්‍රඥයෙන් වැඩේ. මහණෙනි, මේ දශවෘද්ධියෙන් වැඩෙන අරිසවු ආයර්‍ය්‍යවෘද්ධියෙන් වැඩෙයි. ශරීරයාගේ සාරය ගන්නා සුලු වෙයි. උත්තමාර්ථය ගන්නා සුලුත් වෙයි.

1. ධනෙන ධඤ්ඤෙන ච යොධ වඩ්ඪති
පුත්තෙහි දාරෙහි චතුප්පදෙහි ච
ස භොගවා හොති යසස්සී පූජිතො
ඤාතීහි මිත්තෙහි අථොපි රාජුහි.

2. සද්ධාය සීලෙන ච යොධ වඩ්ඪති
පඤ්ඤාය චාගෙන සුතෙන චූභයං
සො තාදිසො සප්පුරිසො විචක්ඛණො
දිට්ඨෙව ධම්මෙ උභයෙන වඩ්ඪතීති.

## 10. 2. 3. 5
## මිගසාලා සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්ත-චීවරමාදාය යෙන මිගසාලාය උපාසිකාය නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො මිගසාලා උපාසිකා යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො මිගසාලා උපාසිකා ආයස්මන්තං ආනන්දං එතදවොච:

කථං කථං නාමායං භන්තෙ ආනන්ද භගවතා ධම්මො දෙසිතො අඤ්ඤෙය්‍යො, යත්‍ර හි නාම බ්‍රහ්මචාරී ච අබ්‍රහ්මචාරී ච උභො සමසමගතිකා භවිස්සන්ති අභිසම්පරායං? පිතා මෙ භන්තෙ පුරාණො බ්‍රහ්මචාරී අහොසි ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. සො කාලකතො භගවතා ව්‍යාකතො සකදාගාමී සත්තො තුසිතං කායං උපපන්නො'ති. පෙත්තා පි යො මෙ භන්තෙ ඉසිදත්තො අබ්‍රහ්මචාරී අහොසි සදාරසන්තුට්ඨො. සොපි කාලකතො භගවතා බ්‍යාකතො සකදාගාමී සත්තො තුසිතං කායං උපපන්නො'ති.

කථං කථං නාමායං භන්තෙ ආනන්ද භගවතා ධම්මො දෙසිතො අඤ්ඤෙය්‍යො, යත්‍ර හි නාම බ්‍රහ්මචාරී ච අබ්‍රහ්මචාරී ච උභොසමසමගතිකා භවිස්සන්ති අභිසම්පරායන්ති. එවං ඛො පනෙතං භගිනි භගවතා බ්‍යාකතන්ති.

1. මෙ ලොව්හි යමෙක් ධනධාන්‍යයෙනුදු පුත්‍රදරයන්ගෙනුදු චතුෂ්පදීන්ගෙනුදු වැඩේ නම් වැලිත් නෑයන් විසිනුදු මිතුරන් විසිනුදු රජුන් විසිනුදු පුදන ලද හේ භොගවත් වූයේ යශස්වී වෙයි.

2. මෙලොව්හි යමෙක් ශ්‍රද්ධායෙනුදු ශීලයෙනුදු ප්‍රඥයෙනුදු ශ්‍රැතයෙනුදු වැඩේ නම් එබඳු විචක්ෂණ ඒ සත්පුරුෂයා ඉහාත්මයෙහි ම උභයාර්ථයෙන් වැඩෙන්නේ යි.

## 10. 2. 3. 5

## මිගසාලා සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඩු සිටුහුගේ ජෙතවන නම් ආරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරව පා සිවුරු රැගෙන මිගසාලා උවැසියගේ නිවස කරා එළඹියහ. එළඹ පැනවූ අස්නෙහි හුන්හ. ඉක්බිති මිගසාලා උපාසිකා ආයුෂ්මත් අනඳ තෙරුන් කරා එළඹියා. එළඹ ආයුෂ්මත් අනඳ තෙරුන් සකසා වැඳ එකත්පස්ව හුනු, එකත්පස්ව හුන් මිගසාලා උපාසිකා ආයුෂ්මත් අනඳ තෙරුන්ට තෙල කරුණ සැළ කළා:

වහන්ස, ආනන්‍දයෙනි, යම් ම ධර්මයක බ්‍රම්සැරිත් අබ්‍රම්සැරිත් යන දෙදෙන පරලොව්හි සම සමගතික වෙත් නම් භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මය කිසෙයින් කිසෙයින් දතයුතු කොට දෙසන ලද්දේද? වහන්ස, පුරාණ නම් වූ ම පිය ග්‍රාමධර්ම වූ මෛථුනයෙන් වැළකියේ දුරුවූයේ බ්‍රහ්මචාරී විය. හේ සකෘදගාමිසත්ත්‍වූ වූයේ කලුරිය කළේ තුෂිත දෙවකායයෙහි උපනැයි භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාකෘත ය. වහන්ස, මාගේ සුළුපිය ඉසිදත්ත සවදරසන්ගෙන් තුෂ්ට වූයේ අබ්‍රහ්මචාරී විය. හේ ද සකෘදගාමී සත්ත්‍වවූයේ කලුරිය කළේ තුෂිත දෙවකායයෙහි උපනැයි භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාකෘත ය.

වහන්ස, ආනන්‍දයෙනි, යම් ධර්මයෙක්හි බ්‍රහ්මචාරීත් අබ්‍රහ්මචාරීත් යන දෙදෙන පරලොව්හි සම සමගතික වෙත් නම් මේ ධර්මය කෙසේ කෙසේ දතයුතු කොට භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද ද? බුහුණ තෙල භාග්‍යවතුන් වහන්සේ විසින් මෙපරිදි ම ව්‍යාකෘත වෙයි.

අථ ඛො ආයස්මා ආනන්දො මිගසාලාය උපාසිකාය නිවෙසනෙ පිණ්ඩපාතං ගහෙත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො ආයස්මා ආනන්දො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතද වොච:

ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදය යෙන මිගසාලාය උපාසිකාය නිවෙසනං තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිං. අථ ඛො භන්තෙ මිගසාලා උපාසිකා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො භන්තෙ මිගසාලා උපාසිකා මං එතදවොච:

කථං කථං නාමායං භන්තෙ ආනන්ද භගවතා ධම්මො දෙසිතො අඤ්ඤෙය්‍යො, යත්‍ර හි නාම බ්‍රහ්මචාරී ච අබ්‍රහ්මචාරී ච උභො සමසමගතිකා භවිස්සන්ති අභිසම්පරායං. පිතා මෙ භන්තෙ පුරාණො බ්‍රහ්මචාරී අහොසි ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. සො කාලකතො භගවතා ඛ්‍යාකතො සකදාගාමී සත්තො තුසිතං කායං උපපන්නොති. පෙත්තාපි යො මෙ භන්තෙ ඉසිදත්තො අබ්‍රහ්මචාරී අහොසි සදාරසන්තුට්ඨො, සො'පි කාලකතො භගවතා ඛ්‍යාකතො සකදාගාමී සත්තො තුසිතං කායං උපපන්නොති.

කථං කථං නාමායං භන්තෙ ආනන්ද භගවතා ධම්මො දෙසිතො අඤ්ඤෙය්‍යො, යත්‍ර හි නාම බ්‍රහ්මචාරී ච අබ්‍රහ්මචාරී ච උභො සමසමගතිකා භවිස්සන්ති අභිසම්පරායන්ති, එවං වුත්තෙ අහං භන්තෙ මිගසාලං උපාසිකං එතදවොචං: එවං ඛො පනෙතං භගිනි භගවතා ඛ්‍යාකතන්ති.

කා චානන්ද මිගසාලා උපාසිකා බාලා අබ්‍යත්තා අම්බකා අම්බකපඤ්ඤා[1]? කෙ ච පුරිසපුග්ගලපරොපරියඤාණෙ?

දසයිමෙ ආනන්ද පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ දස:

1. ඉධානන්ද එකච්චො පුග්ගලො දුස්සීලො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති, යත්ථස්ස තං දුස්සීල්‍යං අපරිසෙසං නිරුජ්ඣති, තස්ස සවණෙන පි අකතං හොති, බාහුසච්චෙන පි අකතං හොති දිට්ඨියා පි අප්පටිවිද්ධං හොති, සාමයිකම්පි[2] විමුත්තිං න ලභති, සො කායස්සභෙදා පරම්මරණා හානාය පරෙති නො විසෙසාය, හානගාමී යෙව හොති නො විසෙසගාමී.

---

1. අම්මකා අම්මකපඤ්ඤා – මජසං.
අන්ධකා අන්ධකපඤ්ඤා – ස්‍යා.
2. සාමායිකම්පි-සීමු, මජසං.

ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ මිගසාලා උවැසියගේ නිවෙස්-නෙහි පිඩුවා ගෙන හුනස්නෙන් නැගී ගියහ. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පසුබත පිඩුවායෙන් පෙරළා ආවාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්-සේට තෙල කරුණ සැලකළහ:

වහන්ස, මෙහි මම පෙරවරුයෙහි හැඳ පෙරව පාසිවුරු රැගෙන මිගසාලා උපාසිකාවගේ නිවෙස්නට ගියෙමි, පැන්වූ අස්නෙහි හුන්මි. වහන්ස, එකල්හි මිගසාලා උපාසිකාව මා කරා එළැඹියා. එළැඹ මා සකසා වැඳ එකත්පස්ව හුණු. වහන්ස, එකත්පස්ව හුන් මිගසාලා උපාසිකා මට තෙල සැල කළා;

වහන්ස, යම් ම ධර්මයෙක්හි බ්‍රහ්මචාරීත් අබ්‍රහ්මචාරීත් යන දෙදෙන පරලොව්හි සම සම ගතික වෙත් නම් මේ ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් කෙසේ කෙසේ නම් දතයුතු කොට දෙසන ලද ද? වහන්ස, පූරාණ නම් ම පිය ග්‍රාමධර්ම වූ මෛථුනයෙන් වැළකියේ, වෙන්වූයේ, බ්‍රහ්මචාරී විය. හේ සකෘදගාමී සත්ත්ව වූයේ කලුරිය කළේ තුෂිතකායයෙහි උපනැයි භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාකෘතය. වහන්ස, මා සුළුපිය ඉසිදත්ත සවදරසන්තුෂ්ට වූයේ අබ්‍රහ්මචාරී විය. හෙ ද සකෘදගාමී සත්ත්ව වූයේ කලුරිය කළේ තුෂිතකායයෙහි උපනැයි භාග්‍යවතුන් වහන්සේ විසින් ව්‍යාකෘත ය.

වහන්ස, යම් ම ධර්මයක බ්‍රහ්මචාරීත් අබ්‍රහ්මචාරීත් යන දෙදෙන පරලොව්හි සම සම ගතික වෙත් නම් මේ ධර්මය කෙසේ කෙසේ නම් අඥෙය කොට භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද ද? වහන්ස, මෙසේ කී කල්හි මම මිගසාලා උපාසිකාවට තෙල කීමි: ''බුහුන, භාග්‍යවතුන් වහන්සේ විසින් තෙල එසේම වදරන ලද යි.

ආනන්දය, බාලවූ අව්‍යක්ත වූ ස්ත්‍රීප්‍රඥ ඇති මාගමක් වන මිගසාලා උපාසිකා කවර? පුරුෂ පුද්ගලයන්ගේ පරාවරඥනයෙහි ලා (සම්මාසම්බුදු වරයෝ) කවරහ?

ආනන්දයෙනි, ලොව්හි මේ පුද්ගලයෝ දසදෙනෙක් විද්‍යාමාන වෙත්. කවර දසදෙනෙක යත්:

1. ආනන්දයෙනි, මෙලොව්හි අන්‍යතර පුද්ගලයෙක් දුස්සීල වෙයි. ඒ එළසමාධි එළප්‍රඥ ද ඇතිසැටි නොදන්නේය. යම් මාර්ගයක ඔහුගේ ඒ දෞශශීල්‍යය අනවශෙෂ කොට නිරුද්ධ වේ නම් ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු නො අසන ලද වෙයි. බාහුශ්‍රුත්‍යයෙනුදු නො හසළ වෙයි. දෘෂ්ටියෙනුදු නො පිළිවිදුනා ලද වෙයි. සාමයික වූ ද (ප්‍රීතිප්‍රාමොද්‍යසඞ්ඛ්‍යාත) විමුක්තිය නො ලබයි. හේ කාබුන් මරණින් මතු හානියට ම යෙයි. විශෙෂයට නො යෙයි. හානගාමී ම වෙයි. විශෙෂගාමී නො වේ.

2. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො දුස්සීලො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති. යත්ථස්ස තං දුස්සීල්‍යං අපරිසෙසං නිරුජ්ඣති, තස්ස සවණෙන'පි කතං හොති. බාහුසච්චෙන'පි කතං හොති, දිට්ඨියා'පි පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං ලභති, සො කායස්සභෙදා පරම්මරණා විසෙසාය පරෙති, නො හානාය, විසෙසගාමී යෙව හොති, නො හානගාමී.

තත්‍රානන්ද පමාණිකා පමිණන්ති: 'ඉමස්සාපි තෙව ධම්මා, අපරස්සාපි තෙව ධම්මා. කස්මා තෙසං එකො හීනො, එකො පණීතො'ති. තං හි තෙසං ආනන්ද හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය.

තත්‍රානන්ද ය්වායං පුග්ගලො දුස්සීලො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති. යත්ථස්ස තං දුස්සීල්‍යං අපරිසෙසං නිරුජ්ඣති. තස්ස සවණෙන'පි කතං හොති, බාහුසච්චෙනපි කතං හොති, දිට්ඨියා'පි පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං ලභති, අයං ආනන්ද පුග්ගලො අමුනා පුරිමෙන පුග්ගලෙන අභික්කන්තතරො ච පණීතතරො ච. තං කිස්ස හෙතු: ඉමං හි ආනන්ද පුග්ගලං ධම්මසොතො නිබ්බහ[1]ති, තදන්තරං[2] කො ජානෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන. තස්මාතිහානන්ද මා පුග්ගලෙසු පමාණිකා අහුවත්ථ, මා පුග්ගලෙසු පමාණං ගණ්හිත්ථ, ඛඤ්ඤතිහානන්ද පුග්ගලො පුග්ගලෙසු පමාණං ගණ්හන්තො, අහං වානන්ද[3] පුග්ගලෙසු පමාණං ගණ්හෙය්‍යං, යො වා පනස්ස මාදිසො.

3. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො සීලවා හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති, යත්ථස්ස තං සීලං අපරිසෙසං නිරුජ්ඣති, තස්ස සවණෙනපි අකතං හොති. බාහුසච්චෙන පි අකතං හොති, දිට්ඨියාපි අප්පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං න ලභති. සො කායස්සභෙදා පරම්මරණා හානාය පරෙති, නොවිසෙසං. හානගාමී යෙව හොති, නො විසෙසගාමී.

4. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො සීලවා හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති, යත්ථස්ස තං සීලං අපරිසෙසං නිරුජ්ඣති, තස්ස සවණෙනපි කතං හොති, බාහුසච්චෙනපි කතං හොති, දිට්ඨියාපි පටිවිද්ධං හොති.

---

1. නිබ්බාහති - බහුසු.
2. තදනන්තරං - ස්‍යා.
3. අහඤ්චානන්ද - සීමු. ස්‍යා.

2. ආනන්‍දයෙනි, මේ ලොව්හි අන්‍යතර පුද්ගලයෙක් දුස්සීල වෙයි. චිත්තසමාධිය හා ප්‍රඥාවිමුක්තියත් ඇති සැටි දනියි. යම් මගෙක ඔහුගේ ඒ දුස්සීල්‍යය අනවශෙෂ කොට නිරුද්ධ වේ නම් ඒ ශ්‍රවණයෙනුදු අසන ලද වෙයි, බාහුශ්‍රැත්‍යයෙනුදු හසළ වෙයි, දෘෂ්ටියෙනුදු පිළිවිදුනා ලද වෙයි, සාමයික විමුක්තිය ද ලබයි. හේ කාබුන් මරණින් මතු විශෙෂයට පැමිණෙයි, හානියට නො පැමිණෙයි. විශෙෂගාමී ම වෙයි, හානගාමී නො වේ.

ආනන්‍දයෙනි, එහිලා ප්‍රාමාණිකයෝ තුලනා කෙරෙත්: "මොහුදුගේ ඒ ධර්‍මයෝ ම වෙත්. පරාගේ ද එම ධර්‍මයෝ වෙත්. කවර හෙයින් ඔවුනතුරෙහි එකෙක් හීන වේ ද, එකෙක් ප්‍රණීත වේද "යි. ආනන්‍දයෙනි, ඒ ප්‍රමාණකරණය ඔවුනට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වෙයි.

ආනන්‍දයෙනි, එහි ලා යම් ඒ පුද්ගලයෙක් දුස්සීල වේ ද ඒ චිත්තවිමුක්තිය හා ප්‍රඥ විමුක්තිය හා ඇති සැටි නො දනී ද, යම් ම මගක ඔහුගේ ඒ දෞශ්ශීල්‍යය අනවශෙෂ කොට 'නිරුද්ධ වේද, ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු අසන ලද වෙයි, බාහුශ්‍රැත්‍යයෙනුදු හසළ වෙයි, දෘෂ්ටියෙනුදු ප්‍රතිවිද්ධ වෙයි, සාමයික විමුක්තිය ද ලබයි. ආනන්‍දයෙනි, මෙ පුහුල් අසෝ පළමු පුහුලාගෙන් වඩා සුන්දර ද වඩා උත්තම ද වෙයි. එ කවර හෙයින යැ: ආනන්‍දයෙනි, විදර්ශනා ඥාන සඞ්ඛ්‍යාත ධර්‍මශ්‍රොතස මෙ පුහුල් (අරිබීමට) පමුණුවයි. තථාගතයන් හැර එහි වෙනස කවරෙක් දන්නේද? ආනන්‍දයෙනි, එහෙයින් මෙ කරුණෙහි ලා පුහුලන් විසාහි නහමක් ප්‍රාමාණික වවූ. පුහුලන් විසාහි නහමක් පමණ ගනිවු. ආනන්‍දයෙනි, පුද්ගලයන් කෙරෙහි පමණ ගන්නා පුහුල් ගුණ විසින් ඛනනයට පැමිණේ මැ යි. ආනන්‍දයෙනි, මම් හෝ පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණය ගන්නෙමි, ම බන්දෙක් හෝ වේ නම (ප්‍රමාණ ගන්නේ) යී.

3. ආනන්‍දයෙනි, මෙහි අන්‍යතර පුද්ගලයෙක් සිල්වත් වෙයි. ඒ චිත්තවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඇති සැටි නො දන්නේය. යම් මගෙක ඔහුගේ ඒ ශීලය අනවශෙෂ කොට නිරුද්ධ වේ නම් ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු නො අසන ලද වෙයි, බාහුශ්‍රැත්‍යයෙනුදු නො හසළ වෙයි, දෘෂ්ටියෙනුදු අප්‍රතිවිද්ධ වෙයි, සාමයිකවිමුක්තියද නො ලබයි. හේ කාබුන් මරණින් මතු හානියට පැමිණෙයි, විශෙෂයට නො පැමිණෙයි. හීනගාමී ම වෙයි. විශෙෂගාමී නො වේ.

4. ආනන්‍දයෙනි, මෙහි අන්‍යතර පුද්ගලයෙක් සිල්වත් වෙයි. ඒ චෙතොවිමුත්තියත් පඤ්ඤාවිමුත්තියත් ඇති සැටි දනියි. යම් මගෙක ඔහුගේ ඒ ශීලය අනවශෙෂ කොට නිරුද්ධ වේ නම් ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු අසනලද වෙයි, බාහුශ්‍රැත්‍යයෙනුදු හසළ වෙයි, දෘෂ්ටියෙනුදු ප්‍රතිවිද්ධ වෙයි,

සාමයිකම්පි විමුත්තිං ලභති. සො කායස්ස භෙදා පරම්මරණා විසෙසාය පරෙති; නො හානාය. විසෙසගාමීයෙව හොති, නො හානගාමී.

තත්‍රානන්ද පමාණිකා පමිණන්ති -පෙ- ආහං වානන්ද පුග්ගලෙසු පමාණං ගණ්හෙය්‍යං, යො වා පනස්ස මාදිසො.

5. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො තිබ්බරාගො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති, යත්‍ථස්ස සො රාගො අපරිසෙසො නිරුජ්ඣති, තස්ස සවණෙනපි අකතං හොති, බාහුසච්චෙනපි අකතං හොති, දිට්ඨියාපි අප්පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං න ලභති. සො කායස්ස භෙදා පරම්මරණා හානාය පරෙති නො විසෙසාය, හානගාමී එව හොති නො විසෙසගාමී.

6. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො තිබ්බරාගො හොති, තඤ්ච චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති, යත්‍ථස්ස සො රාගො අපරිසෙසො නිරුජ්ඣති. තස්ස සවණෙනපි කතං හොති, බාහුසච්චෙනපි කතං හොති, දිට්ඨියාපි පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං ලභති. සො කායස්ස භෙදා පරම්මරණා විසෙසාය පරෙති නො හානාය, විසෙසගාමීයෙව හොති නො හානගාමී.

තත්‍රානන්ද පමාණිකා පමිණන්ති -පෙ- අහං වා ආනන්ද පුග්ගලෙසු පමාණං ගණ්හෙය්‍යං, යො වා පනස්ස මාදිසො.

7. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො කොධනො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති. යත්‍ථස්ස සො කොධො අපරිසෙසො නිරුජ්ඣති, තස්ස සවණෙනපි අකතං හොති, බාහුසච්චෙනපි අකතං හොති, දිට්ඨියාපි අප්පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං න ලභති. සො කායස්ස භෙදා පරම්මරණා හානාය පරෙති නො විසෙසාය, හානගාමීයෙව හොති නො විසෙසගාමී.

1. සාමායිකම්පි, - මජසං.

සාමයික විමුක්තිය ද ලබයි. හේ කාබුන් මරණින් මතු විශෙෂයට පැමිණෙයි, හානියට නොපැමිණෙයි, විශෙෂගාමී ම වෙයි. හානගාමී නො වේ.

ආනන්‍දයෙනි, එහි ලා ප්‍රාමාණිකයෝ පමණ කරත්... මම හෝ පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණ ගන්නෙමි, මා බඳු යමෙක් හෝ වේ නම් (ප්‍රමාණ ගන්නේ) යි.

5. ආනන්‍දයෙනි, මෙ ලොව්හි අන්‍යතර පුද්ගලයෙක් තිව්‍රරාග වෙයි. ඒ චිත්තවිමුක්තියත් ප්‍රඥවිමුක්තියත් ඇතිසැටි නො දන්නේ ය. යම් මාර්ගයෙක්හි ඔහුගේ ඒ රාගය අනවශෙෂ කොට නිරුද්ධ වේ නම්, ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු නො අසන ලද වෙයි, බාහුශ්‍රුත්‍යයෙනුදු නො හසළ වෙයි, දෘෂ්ටියෙනු අප්‍රතිවිද්ධ වෙයි, සාමයික විමුක්තිය ද නො ලබන්නේ ය. හේ කාබුන් මරණින් මතු හානියට පැමිණෙයි. විශෙෂයට නො පැමිණෙයි. හානගාමී ම වෙයි. විශෙෂගාමී නො වේ.

6. ආනන්‍දයෙනි මෙහි අන්‍යතර පුද්ගලයෙක් තිව්‍රරාග වෙයි. ඒ චිත්ත විමුක්තිය හා ප්‍රඥවිමුක්තිය හා ඇතිසැටි දන්නේ ය. යම් මාර්ගයෙක්හි ඔහුගේ ඒ රාගය අනවශෙෂව නිරුද්ධ වේ නම්, ඔහු විසින් එය ශ්‍රවණ යෙනුදු අසන ලද වෙයි, බාහුශ්‍රුත්‍යයෙනුදු හසළ වෙයි, දෘෂ්ටියෙනුදු ප්‍රතිවිද්ධ වෙයි, සාමයික විමුක්තිය ද ලබනේ ය. හේ කාබුන් මරණින් මතු විශෙෂයට පැමිණෙයි, හානයට නො පැමිණෙයි. විශෙෂගාමී ම වෙයි හානගාමී නො වේ.

ආනන්‍දයෙනි, එහිලා ප්‍රාමාණිකයෝ ප්‍රමාණ කරත්... ආනන්‍දයෙනි, පුද්ගලයන් කෙරෙහි මම හෝ ප්‍රමාණය ගන්නෙමි, මා බඳු යමෙක් වේ නම් හෝ (ප්‍රමාණය ගන්නේ) යි.

7. ආනන්‍දයෙනි, මෙහි අන්‍යතර පුද්ගලයෙක් කිපෙනසුලු වෙයි. ඒ චිත්තවිමුක්තිය හා ප්‍රඥ විමුක්තිය හා ඇති සැටි නො දන්නේ ය, යම් මාර්ගයෙක ඔහුගේ ඒ ක්‍රොධය අනවශෙෂව නිරුද්ධ වේ නම් ඔහු විසින් ශ්‍රවණයෙනුදු එය අකෘත වෙයි, බාහුශ්‍රුත්‍යයෙනුදු අකෘත වෙයි, දෘෂ්ටයෙනුදු අප්‍රතිවිද්ධ වෙයි, සාමයික විමුක්තිය ද නො ලබනේ ය. හේ කාබුන් මරණින් මතු හානියට යෙයි, විශෙෂයට නො යෙයි. හානගාමී ම වෙයි, විශෙෂගාමී නො වේ.

8. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො කොධනො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති. යත්ථස්ස සො කොධො අපරිසෙසො නිරුජ්ඣති. තස්ස සවණෙනපි කතං හොති, බාහුසච්චෙනපි කතං හොති, දිට්ඨියාපි පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං ලභති. සො කායස්ස භෙදා පරම්මරණා විසෙසාය පරෙති නො හානාය, විසෙසගාමීයෙව හොති නො හානගාමී.

තත්‍රානන්ද පමාණිකා පමිණන්ති -පෙ- අහං වා ආනන්ද පුග්ගලෙසු පමාණං ගණ්හෙය්‍යං, යො වා පනස්ස මාදිසො.

9. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො උද්ධතො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති, යත්ථස්ස තං උද්ධච්චං අපරිසෙසං නිරුජ්ඣති. තස්ස සවණෙනපි අකතං හොති, බාහුසච්චෙනපි අකතං හොති, දිට්ඨියාපි අප්පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං න ලභති. සො කායස්ස භෙදා පරම්මරණා හානාය පරෙති නො විසෙසාය, හානගාමී-යෙව හොති නො විසෙසගාමී.

10. ඉධ පනානන්ද එකච්චො පුග්ගලො උද්ධතො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති. යත්ථස්ස තං උද්ධච්චං අපරි-සෙසං නිරුජ්ඣති, තස්ස සවණෙනපි කතං හොති, බාහුසච්චෙනපි කතං හොති, දිට්ඨියාපි පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං ලභති. සො කායස්ස භෙදා පරම්මරණා විසෙසාය පරෙති නො හානාය. විසෙසගාමීයෙව හොති නො හානගාමී.

තත්‍රානන්ද පමාණිකා පමිණන්ති "ඉමස්සපි තෙව ධම්මා, අපරස්සපි තෙව ධම්මා. කස්මා නෙසං එකො හීනො එකො පණීතො"ති. තං හි තෙසං ආනන්ද හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය.

තත්‍රානන්ද යවායං පුග්ගලො උද්ධතො හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති. යත්ථස්ස තං උද්ධච්චං අපරිසෙසං නිරුජ්ඣති. තස්ස සවණෙනපි කතං හොති, බාහුසච්චෙනපි කතං හොති, දිට්ඨියාපි පටිවිද්ධං හොති, සාමයිකම්පි විමුත්තිං ලභති.

8. ආනන්දයෙනි, මෙහි අන්‍යතර පුද්ගලයෙක් කිපෙනසුලු වෙයි. ඒ චිත්ත විමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඇති සැටි දන්නේ ය. යම් මාර්ගයෙක්හි ඔහුගේ ඒ ක්‍රොධය අනවශෙෂව නිරුද්ධ වේ නම් ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු කරන ලද වෙයි, බාහුශ්‍රැත්‍යයෙනුදු කරනලද වෙයි, දෘෂ්ටියෙනුදු කරනලද වෙයි, සාමයික විමුක්තිය ද ලබනේය. හේ කාබුන් මරණින් මතු විශෙෂයට යෙයි, හානයට නො යෙයි. විශෙෂගාමී ම වෙයි, හානගාමී නො වෙයි,

ආනන්දයෙනි, එහිලා ප්‍රාමාණිකයෝ ප්‍රමාණ කරත්... ආනන්දයෙනි, මම හෝ පුද්ගලයන් කෙරෙහි ප්‍රමාණ ගන්නෙම්, යමෙක් මබදු හෝ වේ නම් (ගන්නේ) යි.

9. ආනන්දයෙනි, මෙහි අන්‍යතර පුද්ගලයෙක් උද්ධත වෙයි. ඒ චිත්ත විමුක්තිය හා ප්‍රඥා විමුක්තිය ඇති සැටි නො දන්නේ ය. යම් මාර්ගයෙක ඔහුගේ ඒ ඖද්ධත්‍යය අනවශෙෂව නිරුද්ධ වේ නම් ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු අකෘත වෙයි, බාහුශ්‍රැත්‍යයෙනුදු අකෘත වෙයි, දෘෂ්ටියෙනුදු අප්‍රතිවිද්ධ වෙයි, සාමයික විමුක්තිය ද නො ලබයි. හේ කාබුන් මරණින් මතු හානියට යෙයි, විශෙෂයට නො යෙයි. හානගාමී ම වෙයි, විශෙෂගාමී නො වේ.

10. ආනන්දයෙනි, මෙහි අන්‍යතර පුද්ගලයෙක් උද්ධත වෙයි. ඒ චිත්ත විමුක්තිය ද ප්‍රඥා විමුක්තිය ද ඇතිසැටි දන්නේ ය. යම් මාර්ගයෙක්හි ඔහුගේ ඒ ඖද්ධත්‍යය අනවශෙෂව නිරුද්ධ වේ නම්, ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු කරන ලද වෙයි, බාහුශ්‍රැත්‍යයෙනුදු කරන ලද වෙයි, දෘෂ්ටයෙනුදු ප්‍රතිවිද්ධ වෙයි, සාමයික විමුක්තිය ද ලබනේ ය. හේ කාබුන් මරණින් මතු විශෙෂයට පැමිණෙයි, හානියට නො පැමිණෙයි. විශෙෂගාමී ම වෙයි, හානගාමී නො වේ.

ආනන්දයෙනි, එහිලා ප්‍රාමාණිකයෝ ප්‍රමාණ කරත්: මොහුගේ ද එම ධර්මයෝය, අන්හුගේ ද එම ධර්මයෝය. කවර හෙයින් ඔවුනතුරෙන් එකෙක් හීන වේ ද? එකෙක් ප්‍රණීත වේ ද''යි, ආනන්දයෙනි එය ම ඔවුනට දීර්ඝරාත්‍රයෙහි අහිතය පිණිස දුක් පිණිස වෙයි.

ආනන්දයෙනි, එහි යම් මේ පුද්ගලයෙක් උද්ධත වේ නම් ඒ චිත්ත විමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය හා ඇති සැටි දන්නේ නම්, යම් මාර්ගයෙක්හි ඔහුගේ ඒ ඖද්ධත්‍යය අනවශෙෂව නිරුද්ධ වේ නම් ඔහු විසින් එය ශ්‍රවණයෙනුදු කෘත වෙයි, බාහුශ්‍රැත්‍යයෙනුදු කෘත වෙයි, දෘෂ්ටියෙනුදු ප්‍රතිවිද්ධ වෙයි, සාමයික විමුක්තිය ද ලබනේ ය.

අයං ආනන්ද පුග්ගලො අමුනා පුරිමෙන පුග්ගලෙන අභික්කන්තතරො ච පණීතතරො ච. තං කිස්ස හෙතු: ඉමං හෙතං ආනන්ද පුග්ගලං ධම්මසොතො නිබ්බහති. තදන්තරං[1] කො ජානෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන. තස්මා තිහානන්ද මා පුග්ගලෙසු පමාණිකා අහුවත්ථ, මා පුග්ගලෙසු පමාණං ගණ්හිත්ථ. ඛඤ්ඤතිහානන්ද පුග්ගලෙසු පමාණං ගණ්හන්තො. අහං වා ආනන්ද පුග්ගලෙසු පමාණං ගණ්හෙය්‍යං, යො වා පනස්ස මාදිසො.

ˈකා චානන්ද මිගසාලා උපාසිකා බාලා අබ්‍යත්තා අම්බකා අම්බකපඤ්ඤා, කෙ ච පුරිසපුග්ගලපරොපරියෙ ඤාණෙ. ඉමෙ ඛො ආනන්ද දසපුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

යථාරූපෙන ආනන්ද සීලෙන පුරාණො සමන්නාගතො අහොසි, තථාරූපෙන සීලෙන ඉසිදත්තො සමන්නාගතො අභවිස්ස, නයිධ පුරාණො ඉසිදත්තස්ස ගතිම්පි අඤ්ඤස්ස. යථාරූපාය ච ආනන්ද පඤ්ඤාය ඉසිදත්තො සමන්නාගතො අහොසි, යථාරූපාය පඤ්ඤාය පුරාණො සමන්නාගතො අභවිස්ස, නයිධ ඉසිදත්තො පුරාණස්ස ගතිම්පි අඤ්ඤස්ස. ඉති ඛො ආනන්ද ඉමෙ පුග්ගලා උභො එකඞ්ගහීනාති.

## 10. 2. 3. 6

### තයොධම්ම සුත්තං

[සාවත්ථි]

තයොමෙ භික්ඛවෙ ධම්මා ලොකෙ න සංවිජ්ජෙය්‍යුං, න තථාගතො ලොකෙ උප්පජ්ජෙය්‍ය අරහං සම්මාසම්බුද්ධො, න තථාගතප්පවෙදිතො ධම්මවිනයො ලොකෙ දිප්පෙය්‍ය. කතමෙ තයො:

ජාති ච ජරා ච මරණඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා ලොකෙ න සංවිජ්ජෙය්‍යුං, න තථාගතො ලොකෙ උප්පජ්ජෙය්‍ය අරහං සම්මාසම්බුද්ධො, න තථාගතප්පවෙදිතො ධම්මවිනයො ලොකෙ දිප්පෙය්‍ය. යස්මා ච ඛො භික්ඛවෙ ඉමෙ තයො ධම්මා ලොකෙ සංවිජ්ජන්ති, තස්මා තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො. තස්මා තථාගතප්පවෙදිතො ධම්මවිනයො ලොකෙ දිප්පති.

1. තයොමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං. කතමෙ තයො: රාගං අප්පහාය දොසං අප්පහාය මොහං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං.

---

1. තදනන්තරං නං, - සිමු.
2. කහං - මජසං,

ආනන්‍දයෙනි, මේ පුඟුල් තෙල පළමු පුඟුලාගෙන් සුන්‍දරතර ද ප්‍රණීතතර ද වෙයි. එ කවර හෙයින යත්: ආනන්‍දයෙනි, ධර්මස්‍රොතස මෙ පුඟුලා නිවනට පමුණුවයි. එ වෙනස තථාගතයන් හැර කවරෙක් දන්නේද? ආනන්‍දයෙනි, එහෙයින් මෙහිලා පුඟුලන් කෙරෙහි නහමක් ප්‍රාමාණික වවු, පුඟුලන් කෙරෙහි නහමක් පමණ ගනිවු. ආනන්‍දයෙනි, පුද්ගලයන් කෙරෙහි පමණ ගන්නේ ගුණ විසින් කණිනු ලබන්නේය. ආනන්‍දයෙනි, මම හෝ පුද්ගලයන් කෙරෙහි ප්‍රාමාණ ගන්නෙමි, යමෙක් මබඳු හෝ වේ නම් (ගන්නේ) යි.

ආනන්‍දයෙනි, බාල අව්‍යක්ත ස්ත්‍රියක් වන ස්ත්‍රීප්‍රඥා ඇති මිගසාලා උපාසිකා කවර? පුද්ගල පරවරඥානයෙහිලා (තථාගතවරයෝ) කවරහුය? ආනන්‍දයෙනි, මේ දසපුඟුල්හු ලොකයෙහි විද්‍යමාන වෙත්.

ආනන්‍දයෙනි, යම්බඳු ශීලයෙකින් පුරාණ සමන්වාගත වීද, එබඳු ශීලයෙන් ඉසිදත්ත ද සමන්වාගත වී නම් මෙහිලා පුරාණ ඉසිදත්තගේ ගතිදු නො දන්නේය. ආනන්‍දයෙනි, යම්බඳු ප්‍රඥයෙකින් ඉසිදත්ත සමන්වාගත වී නම්, එබඳු ප්‍රඥායෙන් පුරාණ සමන්වාගත වී නම්, මෙහිලා ඉසිදත්ත පුරාණගේ ගතිදු නො දන්නේය. ආනන්‍දයෙනි, මෙසේ මේ පුද්ගල දෙදෙන එකාඞ්ගහීන වෙති''යි.

## 10. 2. 3. 6
## තයොධම්ම සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, මේ ධර්ම තුණක් ලොව විද්‍යමාන නොවේ නම්, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයෝ ලොව නූපදනාහ. තථාගත ප්‍රවිදිත ධර්ම විනය ලොව්හි දීප්ත නො වන්නේය. කවර තුනෙකයත්:

ජාතිය හා ජරාව හා මරණය හා යි. මහණෙනි, මෙ දහම් ගුණ ලොව්හි විද්‍යමාන නොවේ නම්, අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයෝ ලොව නූපදනාහ. තථාගත ප්‍රවිදිත ධර්ම විනය ලොව දීප්ත නො වන්නේය. මහණෙනි, යම් හෙයෙකින් මේ දහම් තුන ලොව දීප්ත වේද එහෙයින් අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයෝ ලොවඋපදනාහ. එහෙයින් තථාගත ප්‍රවිදිත ධර්ම විනය ලොව්හි දීප්ත වෙයි.

1. මහණෙනි, මේ ධර්ම තුනක් නො පියා (ප්‍රහාණය නො කොට) ජාතිය පියන්නට ජරාව පියන්නට මරණය පියන්නට අභව්‍ය වෙයි. කවර තුනෙක යත්: රාගය නො පියා, ද්වේෂය නො පියා, මොහය නො පියා යි. මහණෙනි, මේ තුන් දහම් නොපියා ජාතිය පියන්නට ජරාව පියන්නට මරණය පියන්නට අභව්‍ය වෙයි.

2. තයොමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං. කතමෙ තයො: සක්කායදිට්ඨිං අප්පහාය විචිකිච්ඡං අප්පහාය සීලබ්බතපරාමාසං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං.

3. තයොමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො සක්කායදිට්ඨිං පහාතුං, විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං. කතමෙ තයො: අයොනිසොමනසිකාරං අප්පහාය කුම්මග්ගසෙවනං අප්පහාය චෙතසොලීනත්තං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං.

4. තයොමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසො ලීනත්තං පහාතුං. කතමෙ තයො: මුට්ඨස්සච්චං අප්පහාය අසම්පජඤ්ඤං අප්පහාය චෙතසො වික්ඛෙපං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසොලීනත්තං පහාතුං.

5. තයොමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං. කතමෙ තයො: අරියානමදස්සනකම්‍යතං අප්පහාය අරියධම්මස්ස අසොතුකම්‍යතං අප්පහාය උපාරම්භචිත්තතං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං.

6. තයොමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අරියානමදස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං. කතමෙ තයො: උද්ධච්චං අප්පහාය අසංවරං අප්පහාය දුස්සීල්‍යං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො අරියානමදස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං.

7. තයොමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං. කතමෙ තයො: අස්සද්ධියං අප්පහාය අවදඤ්ඤුතං අප්පහාය කොසජ්ජං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං.

2. මහණෙනි, මෙ දහම් තුන නො පියා රාගය පියන්නට ද්වෙෂය පියන්නට මොහය පියන්නට අභව්‍යයි. කවර තුනෙකයත්: සක්කාය දිට්ඨිය නො පියා විචිකිච්ඡාව නො පියා සීලබ්බත පරාමාසය නො පියායි. මහණෙනි, මෙතුන් දහම් නො පියා රාගය පියන්නට ද්වෙෂය පියන්නට මොහය පියන්නට අභව්‍ය වෙයි.

3. මහණෙනි, මෙ තුන් දහම් නො පියා සක්කායදිට්ඨිය පියන්නට විචිකිච්ඡාව පියන්නට සීලබ්බතපරාමාසය පියන්නට අභව්‍යයි. කවර තුනෙකයත්: අයොනිසොමනසිකාරය නො පියා ය, කුමග සෙවුනා නො පියාය, චිත්තයාගේ ලීනත්වය නො පියා යි, මහණෙනි, මෙ තුන් දහම් නො පියා සක්කායදිට්ඨිය පියන්නට විචිකිච්ඡාව පියන්නට සීලබ්බත-පරාමාසය පියන්නට අභව්‍යයි.

4. මහණෙනි, මෙ තුන් දහමුන් නො පියා අයොනිසොමනසිකාරය පියන්නට කුමග සෙවුනා පියන්නට චිත්තයාගේ ලීනත්වය පියන්නට අභව්‍යයි, කවර තුනෙක යත්: සිහි මුළාව නො පියා අසම්පජඤ්ඤය නො පියා චිත්තයාගේ වික්ෂෙපය නො පියා යි. මහණෙනි, මෙ දහම තුන නො පියා අයොනිසොමනසිකාරය පියන්නට කුම්මග්ගසෙවනය පියන්නට චිත්තයාගේ ලීනත්වය පියන්නට අභව්‍යයි.

5. මහණෙනි මෙ දහම් තුන නො පියා මුළා සිහිය පියන්නට අසම්පජඤ්ඤය පියන්නට චිත්තවික්ෂෙපය පියන්නට අභව්‍යයි. කවර තුනෙකයත්:ආය්‍ර්යයන්ගේ අදර්ශනකාම්‍යතාව නො පියා, ආය්‍ර්යධර්මයාගේ ආශ්‍රොතුකාම්‍යතාව නො පියා උපාරම්භ (චිත්තය පරිභවකරනු කැමැති සිත) නො පියා යි. මහණෙනි, මෙ දහම් තුන නො පියා මුළා සිහිය පියන්නට අසම්පජඤ්ඤය පියන්නට චිත්තවික්ෂෙපය පියන්නට අභව්‍ය යි.

6. මහණෙනි, මෙ දහම් තුන නො පියා ආය්‍ර්යයන්ගේ අදර්ශන-කාම්‍යතාව පියන්නට ආය්‍ර්යධර්මයාගේ අශ්‍රොතුකාම්‍යතාව පියන්නට උපාරම්භ චිත්තතාව පියන්නට අභව්‍යයි. කවර තුනෙක යත්: උද්ධච්චය නො පියා, අසංවරය නො පියා, දෞශ්ශීල්‍යය නො පියා යි. මහණෙනි, මෙ දහම් තුන නො පියා ආය්‍ර්යයන්ගේ අදර්ශනකාම්‍යතාව පියන්නට ආය්‍ර්යධර්මයාගේ ආශ්‍රොතුකාම්‍යතාව පියන්නට උපාරම්භචිත්තතාව පියන්නට අභව්‍යයි.

7. මහණෙනි, මෙ දහම් තුන නො පියා උද්ධච්චය පියන්නට අසංවරය පියන්නට දෞශ්ශීල්‍යය පියන්නට අභව්‍යයි. කවරතුනෙක යත්: අස්සද්ධිය නො පියා, අවදඤ්ඤුතාව (යාචකයන් බස් නො දන්නා බව) නො පියා, කොසජ්ජය නො පියා යි. මහණෙනි, මෙ දහම් තුන නො පියා උද්ධච්චය පියන්නට අසංවරය පියන්නට දෞශ්ශීල්‍යය පියන්නට අභව්‍යයි.

8. තයො මෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං. කතමෙ තයො: අනාදරියං අප්පහාය දොවචස්සතං අප්පහාය පාපමිත්තතං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං.

9. තයො මෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං. කතමෙ තයො: අහිරිකං අප්පහාය අනොත්තප්පං අප්පහාය පමාදං අප්පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං.

10. අහිරිකොයං භික්ඛවෙ අනොත්තප්පී[1] පමත්තො හොති, සො පමත්තො සමානො අභබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං, සො පාපමිත්තො සමානො අභබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං, සො කුසීතො සමානො අභබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං, සො දුස්සීලො සමානො අභබ්බො අරියානං අදස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං, උපාරම්භචිත්තතං පහාතුං, සො උපාරම්භචිත්තො සමානො අභබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං සො වික්ඛිත්තචිත්තො සමානො අභබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසො ලීනත්තං පහාතුං, සො ලීනචිත්තො සමානො අභබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං, සො විචිකිච්ඡො සමානො අභබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං, සො රාගං අප්පහාය දොසං අප්පහාය මොහං අප්පහාය අභබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං.

1. තයො මෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං. කතමෙ තයො: රාගං පහාය දොසං පහාය මොහං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං.

2. තයො මෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං. කතමෙ තයො: සක්කායදිට්ඨිං පහාය විචිකිච්ඡං පහාය සීලබ්බතපරාමාසං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං.

---

1. අනොත්තාපී - මජසං.

8. මහණෙනි, මෙතුන් දහම් නො පියා අස්සද්ධිය පියන්නට අවදඤ්ඤුතාව පියන්නට කොසජ්ජය පියන්නට අභව්‍යයි. කවර තුනෙක යත්: අනාදරිය නො පියා, දොවචස්සතාව නො පියා, පාපමිත්තතාව නො පියා යි. මහණෙනි, මේ තුන් දහම් නො පියා අස්සද්ධිය පියන්නට අවදඤ්ඤුතාව (දීමෙහි නො කැමැති බව) පියන්නට කොසජ්ජය පියන්නට අභව්‍යයි.

9. මහණෙනි, මෙ දහම් තුන නො පියා අනාදරය පියන්නට දොවචස්සතාව පියන්නට පාපමිත්‍රතාව පියන්නට අභව්‍යයි. කවර තුනෙක යත්: අහිරිකය නො පියා, අනොත්තප්පය නො පියා, පමාදය නො පියා යි. මහණෙනි, මේ තුන් දහම් නො පියා අනාදරිය පියන්නට දොවචස්සතාව පියන්නට පාපමිත්තතාව පියන්නට අභව්‍ය යි.

10. මහණෙනි, මේ අහිරික අනොත්තප්පී ප්‍රමත්ත වෙයි. හේ පමාවූයේම අනාදරිය පියන්නට දොවචස්සතා පියන්නට පාපමිත්‍රතා පියන්නට අභව්‍ය වෙයි, හේ පවිටු මිතුරන් ඇතියේ ම අස්සද්ධිය පියන්නට අවදඤ්ඤුතාව පියන්නට කොසජ්ජය පියන්නට අභව්‍යයි, හේ කුසීතවූයේ ම උද්ධච්චය පියන්නට අසංවරය පියන්නට දුශ්ශීල්‍යය පියන්නට අභව්‍ය වෙයි, හේ දුශ්ශීල වූයේ ම ආර්‍ය්‍යයන් නො දක්නා කැමැති බව පියන්නට අරිදහම් නො අසනු කැමැති බව පියන්නට උපාරම්භචිත්තභාවය පියන්නට අභව්‍ය වෙයි, හේ උපාරම්භ චිත්ත ඇතියේ ම මුළා සිහිය පියන්නට අසම්ප්‍රඥානය පියන්නට චිත්තවික්ෂෙපය පියන්නට අභව්‍ය වෙයි, හේ වික්ෂිප්ත සිත් ඇතියේ ම අයොනිසො මනසිකාරය පියන්නට කුමාර්ගසෙවනය පියන්නට චිත්තයාගේ ලීනත්‍වය පියන්නට අභව්‍යයි, හේ ලීන සිත් ඇතියේ ම සක්කායදිට්ඨිය පියන්නට විචිකිච්ඡාව පියන්නට සීලබ්බතපරාමාසය පියන්නට අභව්‍යයි, හේ විචිකිච්ඡා ඇතියේ ම රාගය පියන්නට ද්වෙෂය පියන්නට මොහය පියන්නට අභව්‍යයි, හේ රාගය නො පියා ද්වෙෂය නො පියා මොහය නො පියා ජාතිය පියන්නට ජරාව පියන්නට මරණය පියන්නට අභව්‍යයි.

1. මහණෙනි, මේ දහම් තුන පියා ජාතිය පියන්නට ජරාව පියන්නට මරණය පියන්නට භව්‍යයි. කවර තුනෙක යත්: රාගය පියා ය, ද්වෙෂය පියාය, මොහය පියා යි. මහණෙනි, මේ තුන්දහම් පියා ජාතිය පියන්නට ජරාව පියන්නට මරණය පියන්නට භව්‍යයි.

2. මහණෙනි, මේ තුන්දහම් පියා රාගය පියන්නට ද්වෙෂය පියන්නට මොහය පියන්නට භව්‍යයි. කවර තුනෙක යත්: සක්කායදෘෂ්ටිය පියා ය, විචිකිච්ඡාව පියා ය, සීලබ්බතපරාමාසය පියා යි. මහණෙනි, මේ තුන්දහම් පියා රාගය පියන්නට ද්වෙෂය පියන්නට මොහය පියන්නට භව්‍යයි,

3. තයොමෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං. කතමෙ තයො: අයොනිසො මනසිකාරං පහාය කුම්මග්ගසෙවනං පහාය චෙතසොලීනත්තං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො සක්කාය දිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං.

4. තයොමෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසොලීනත්තං පහාතුං. කතමෙ තයො: මුට්ඨස්සච්චං පහාය අසම්පජඤ්ඤං පහාය චෙතසො වික්ඛෙපං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො අයොනිසො මනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසො ලීනත්තං පහාතුං.

5. තයොමෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං. කතමෙ තයො: අරියානමදස්සනකම්‍යතං පහාය අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාය උපාරම්භ චිත්තතං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං.

6. තයොමෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අරියානමදස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං. කතමෙ තයො: උද්ධච්චං පහාය අසංවරං පහාය දුස්සීල්‍යං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො අරියානමදස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං.

7. තයොමෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං. කතමෙ තයො: අස්සද්ධියං පහාය අවදඤ්ඤුතං පහාය කොසජ්ජං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං.

8. තයොමෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං. කතමෙ තයො: අනාදරියං පහාය දොවචස්සතං පහාය පාපමිත්තතං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං.

3. මහණෙනි මේ තුන් දහම් පියා සක්කායදිට්ඨිය පියන්නට විචිකිච්ඡාව පියන්නට සීලබ්බතපරාමාසය පියන්නට භව්‍යයි. කවර තුනෙකයත්: අයොනිසො මනසිකාරය පියා කුමාර්ගසෙවනය පියා චිත්තයාගේ ලීනත්වය පියා යි. මහණෙනි, මේ තුන්දහම් පියා සක්කායදිට්ඨිය පියන්නට විචිකිච්ඡාව පියන්නට සීලබ්බතපරාමාසය පියන්නට භව්‍යයි.

4. මහණෙනි, මේ තුන් දහම් පියා අයොනිසොමනසිකාරය පියන්නට කුමාර්ගසෙවනය පියන්නට චිත්තයාගේ ලීනත්වය පියන්නට භව්‍යයි. කවර තුනෙකයත්: සිහිමුළාව පියා ය, අසම්ප්‍රඥානය පියා ය, චිත්ත-වික්ෂෙපය පියා යි. මහණෙනි, මෙ දහම් තුණ හැරපියා අයොනිසො මනසිකාරය පියන්නට කුමාර්ගසෙවනය පියන්නට චිත්තයාගේ ලීනත්වය පියන්නට භව්‍යයි.

5. මහණෙනි, මෙතුන් දහම් හැරපියා සිහිමුළාව පියන්නට අසම්ප්‍ර-ඥනය පියන්නට චිත්තවික්ෂෙපය පියන්නට භව්‍යයි. කවර තුනෙකයත්: ආර්‍ය්‍යයන් නො දක්නා කැමැති බව හැරපියා. ආර්‍ය්‍යධර්මය නො අසනු කැමැති බව හැර පියා උපාරම්භචිත්තය ඇති බව හැරපියා යි. මහණෙනි, මෙ තුන්දහම් හැරපියා සිහිමුළාව පියන්නට අසම්ප්‍රඥානය පියන්නට චිත්තවික්ෂෙපය පියන්නට භව්‍යයි.

6. මහණෙනි, මෙ තුන් දහම් හැරපියා ආර්‍ය්‍යයන් නො දක්නා කැමැති බව පියන්නට ආර්‍ය්‍යධර්මය නො අසනු කැමැත්ත පියන්නට උපාරම්භසිත් ඇති බව පියන්නට භව්‍යයි. කවර තුනෙකයත්: උද්ධච්චය හැරපියා ය, අසංවරය හැරපියාය, දෞශ්ශීල්‍යය හැර පියා යි. මහණෙනි, මෙ තුන් දහම් හැරපියා ආර්‍ය්‍යයන් නො දක්නා කැමැති බව පියන්නට ආර්‍ය්‍යධර්මය නො අසනු කැමැති බව පියන්නට උපාරම්භසිත් ඇති බව හැර පියන්නට භව්‍යයි.

7. මහණෙනි, මෙ තුන් දහම් හැරපියා උද්ධච්චය පියන්නට අසංවරය පියන්නට දෞශ්ශීල්‍යය පියන්නට භව්‍යයි. කවර තුනෙකයත්: අස්සද්ධිය හැරපියාය. අවදඤ්ඤුතාව හැරපියාය. කොසජ්ජය හැරපියා යි. මහණෙනි, මෙ තුන් දහම් හැරපියා උද්ධච්චය පියන්නට අසංවරය පියන්නට දෞශ්ශීල්‍යය පියන්නට භව්‍යයි.

8. මහණෙනි, මෙ තුන් දහම් හැරපියා සැදැහැ නැති බව හැර පියන්නට යදිවදන් නො දන්නා බව හැර පියන්නට කුසීත බව පියන්නට භව්‍යයි. තුනුරුවන්හි ඇදර නැති බව හැර පියායි, නො කීකරු බව හැර පියායි, පවිටු මිතුරන් ඇතිබව හැර පියායි. මහණෙනි, මේ තුන් දහම් හැරපියා සැදැහැ නැති බව පියන්නට යදි වදන් නො දන්නා බව හැර පියන්නට කුසීත බව හැරපියන්නට භව්‍යයි.

9. තයො මෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං. කතමෙ තයො: අහිරිකං පහාය අනොත්තප්පං පහාය පමාදං පහාය. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං.

10. හිරිමායං භික්ඛවෙ ඔත්තප්පී අප්පමත්තො හොති, සො අප්පමත්තො සමානො භබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං. සො කල්‍යාණමිත්තො සමානො භබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං. සො ආරද්ධවිරියො සමානො භබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං. සො සීලවා සමානො භබ්බො අරියානමදස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං. සො අනුපාරම්භචිත්තො සමානො භබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං. සො අවික්ඛිත්තචිත්තො සමානො භබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසොලීනත්තං පහාතුං. සො අලීනචිත්තො සමානො භබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං, සීලබ්බතපරාමාසං පහාතුං. සො අවිචිකිච්ඡො සමානො භබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං. සො රාගං පහාය දොසං පහාය මොහං පහාය භබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුන්ති.

## 10. 2. 3. 7

### කාක සුත්තං

**[සාවත්ථි]**

දසහි භික්ඛවෙ අසද්ධම්මෙහි සමන්නාගතො කාකො. කතමෙහි දසහි: ධංසී ච පගබ්භො ච තින්තිණො ච මහග්ඝසො ච ලුද්දො ච අකාරුණිකො ච දුබ්බලො ච ඔරවිතා ච මුට්ඨස්සති ච නෙචයිකො[1] ච. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි අසද්ධම්මෙහි සමන්නාගතො කාකො.

එවමෙව ඛො භික්ඛවෙ දසහි අසද්ධම්මෙහි සමන්නාගතො පාපභික්ඛු. කතමෙහි දසහි ධංසී ච පගබ්භො ච තින්තිණො ච මහග්ඝසො ච ලුද්දො ච අකාරුණිකො ච දුබ්බලො ච ඔරවිතා ච මුට්ඨස්සති ච නෙචයිකො ච. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි අසද්ධම්මෙහි සමන්නාගතො පාපභික්ඛූති.

---

1. නෙරයිකො – සිමු.

9. මහණෙනි, මෙ තුන් දහම් හැර පියා අනදරි බැව් පියන්නට අකීකරු බැව් පියන්නට ලමු මිතුරන් ඇති බව පියන්නට භව්‍යයි. කවර තුනෙක–යත්: අහිරිකය පියාය, අනොත්තප්පය පියාය, ප්‍රමාදය පියායි. මහණෙනි, මේ තුන් දහම් හැර පියා අනදරි බව පියන්නට අකීකරු බව පියන්නට පවිටු මිතුරන් ඇති බව පියන්නට භව්‍යයි.

10. මහණෙනි, මේ හිරි ඇතියේ ඔතප් ඇතියේ අප්පමත්ත වෙයි. අප්‍රමත්ත වූ ම හේ අනාදරිය පියන්නට දුර්වචභාවය පියන්නට පාපමිත්‍රතාව පියන්නට භව්‍යයි. හේ කල්‍යාණමිතුරන් ඇතියේ ම අස්සද්ධිය පියන්නට අවදඤ්ඤුතාව පියන්නට කොසජ්ජය පියන්නට භව්‍යයි. හේ ආරබ්ධවීර්‍ය්‍ය වූයේ ම උද්ධච්චය පියන්නට අසංවරය පියන්නට දෞශ්ශීල්‍යය පියන්නට භව්‍යයි. හේ සිල්වත් වූයේ ම ආර්‍ය්‍යයන් නො දක්නා කැමැති බව පියන්-නට ආර්‍ය්‍යධර්‍මයාගේ නො අසනු කැමැති බව පියන්නට උපාරම්භ සිත් ඇති බව පියන්නට භව්‍යයි. හේ අනුපාරම්භ චිත්ත ඇතියේ ම සිහි මුළාව පියන්නට සම්ප්‍රජනය පියන්නට චිත්ත වික්ෂෙපය පියන්නට භව්‍යයි. හේ අවික්ෂිප්ත සිත් ඇතියේ ම අයොනිසො මනසිකාරය පියන්නට කුමාර්‍ග-සෙවනය පියන්නට චිත්තයාගේ ලීනත්‍ය පියන්නට භව්‍යයි. හේ අලීන චිත්ත වූයේ ම සක්කායදිට්ඨිය පියන්නට විචිකිච්ඡාව පියන්නට සීලබ්බත-පරාමාසය පියන්නට භව්‍යයි. හේ විචිකිච්ඡා නැතියේ ම රාගය පියන්නට ද්වෙෂය පියන්නට මොහය පියන්නට භව්‍යයි. රාගය හැරපියා ද්වෙෂය හැරපියා මොහය හැරපියා ජාතිය පියන්නට ජරාව පියන්නට මරණය පියන්නට භව්‍ය වේ යයි.

## 10. 2. 3. 7

## කාක සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, කවුඩු දශඅසද්ධර්මයකින් සමන්වාගත වෙයි. කවර දස-යෙකින යත්: ධංසී (ගුණ නසන්නේ) ද වෙයි, ප්‍රගල්භ ද වෙයි, ආසඞ්කා බහුල වෙයි; මහග්ඝස (මහත්කොට බුදිනේ) ද වෙයි, දරුණු ද වෙයි, නිෂ්කාරුණික වෙයි, දුර්වල ද වෙයි, ලමුහඬ ඇතියේ ද වෙයි, මුළා සිහි ඇතියේ ද වෙයි, රැස් කරණුයේ ද වේ. මහණෙනි, කවුඩු මේ දශ අසද්ධර්මයෙන් සමන්වා-ගත වේ.

මහණෙනි, එ පරිදි ම ලමු මහණ දශඅසද්ධර්මයෙන් සමන්වාගත වෙයි: කවර දසයෙකින යත්: ධංසී ද වෙයි, ප්‍රගල්භ ද වෙයි, ආසඞ්කා බහුල ද වෙයි, මහග්ඝස (මහත් කොට බුදිනේ) ද වෙයි, දරුණු ද වෙයි, අකාරුණික ද වෙයි, ලමුහඬ ඇතියේ ද වෙයි, මුළා සිහි ඇතියේ ද වෙයි, රැස් කරණුයේ ද වේ. මහණෙනි, ලමුමහණ මේ දශඅසද්ධර්මයෙන් සමන්වාගත වේ යි.

## 10. 2. 3. 8

## නිගණ්ඨ සුත්තං

[සාවත්ථි]

දසහි භික්ඛවෙ අසද්ධම්මෙහි සමන්නාගතා නිගණ්ඨා. කතමෙහි දසහි: අස්සද්ධා භික්ඛවෙ නිගණ්ඨා, දුස්සීලා භික්ඛවෙ නිගණ්ඨා, අහිරිකා භික්ඛවෙ නිගණ්ඨා, අනොත්තප්පිනො භික්ඛවෙ නිගණ්ඨා, අසප්පුරිසභත්තිනො භික්ඛවෙ නිගණ්ඨා, අත්තුක්කංසකපරවම්භකා භික්ඛවෙ නිගණ්ඨා, සන්දිට්ඨිපරාමාසා ආධානගාහී දුප්පටිනිස්සග්ගිනො භික්ඛවෙ නිගණ්ඨා, කුහකා භික්ඛවෙ නිගණ්ඨා, පාපිච්ඡා භික්ඛවෙ නිගණ්ඨා, මිච්ඡාදිට්ඨිකා භික්ඛවෙ නිගණ්ඨා. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි අසද්ධම්මෙහි සමන්නාගතා නිගණ්ඨාති.

## 10. 2. 3. 9

## ආඝාතවත්ථු සුත්තං

[සාවත්ථි]

දස ඉමානි භික්ඛවෙ ආඝාතවත්ථූනි. කතමානි දස: අනත්ථං මෙ අචරීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරතීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතං බන්ධති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරීති -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති අට්ඨානෙ ච කුප්පති. ඉමානි ඛො භික්ඛවෙ දස ආඝාතවත්ථූනීති.

## 10. 2. 3. 10

## ආඝාතපටිවිනය සුත්තං

[සාවත්ථි]

දස ඉමෙ භික්ඛවෙ ආඝාතපටිවිනයා. කතමෙ දස: අනත්ථං මෙ අචරි, තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. අනත්ථං මෙ චරති, තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. අනත්ථං මෙ චරිස්සති, තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි -පෙ- අනත්ථං චරති -පෙ- අනත්ථං චරිස්සති, තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි -පෙ- අත්ථං චරති -පෙ- අත්ථං චරිස්සති, තං කුතෙත්ථ ලබ්භාති ආඝාතං පටිවිනෙති. අට්ඨානෙ ච න කුප්පති. ඉමෙ ඛො භික්ඛවෙ දස ආඝාතපටිවිනයාති.

### ආකඞ්ඛවග්ගො තතියො.

**තත්‍රුද්දානං**

ආකඞ්ඛො කණ්ටකො ඉට්ඨාවඩ්ඪී ච මිගසාලයා[1]

අභබ්බො චෙව කාකොච නිගණ්ඨා ද්වෙ ච වත්ථූනීති[2]

1. මිගසාලාය – මජසං   2. ආඝාතානි-මජසං

## 10. 2. 3. 8
## නිගණ්ඨ සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, නිගණ්ඨයෝ දශඅසද්ධර්මයෙන් සමන්වාගතයහ. කවර දසයෙකිනයත්: මහණෙනි, නුවටෝ අශ්‍රද්ධයහ. මහණෙනි, නුවටෝ දුසිල්හ. මහණෙනි, නුවටෝ අහිරිකයහ. මහණෙනි, නුවටහු ඔතප් නැතියහ. මහණෙනි, නුවටහු අසත්පුරුෂයන් කෙරෙහි බැති ඇතියහ. මහණෙනි, නුවටහු ආත්මොත්කර්ෂක පරවම්භකයහ. මහණෙනි, නුවටහු සවදෘෂ්ටිය පරාමර්ෂ කොට ඇත්තාහු සවදෘෂ්ටිය දෘඪ කොට ගත්තාහු ස්වදෘෂ්ටිය නො දුරලිය හැක්කාහු වෙති මහණෙනි, නුවටහු කුහකයහ. මහණෙනි, නුවටහු පාපෙච්ඡයහ. මහණෙනි, නුවටහු මිථ්‍යාදෘෂ්ටිකයහ. මහණෙනි, නුවටහු මේ දශ අසද්ධර්මයෙන් සමන්වාගතයහයි.

## 10. 2. 3. 9
## ආඝාතවස්තු සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, මේ ආඝාතවස්තු දශයෙක. කවර දශයෙකයත්: 'මට අනර්ථ කෙළේ'යි ආඝාත බඳනේ ය. 'මට අනර්ථ කෙරේ'යි ආඝාත බඳනේ ය. 'මට අනර්ථ කරන්නේ'යි ආඝාත බඳනේ යි. මාගේ ප්‍රිය-මනාපයාට අනර්ථ කෙළේයි ... අනර්ථ කෙරේයි ... අනර්ථ කරන්නේයි ... ආඝාත බඳනේය. 'මාගේ අප්‍රියඅමනාපයාට අර්ථ කෙළේ'යි ... අර්ථ කෙරේයි ... අර්ථ කරණේයි ආඝාත බඳනේය. අස්ථානයෙහිදු කිපෙයි. මහණෙනි, මේ දශ ආඝාත වස්තු යි.

## 10. 2. 3. 10
## ආඝාත පටිවිනය සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, මේ ආඝාතපටිවිනයෝ දස දෙනෙක. කවර දසදෙනෙක යත්: මට අනර්ථ කෙළේ, එය මෙහි කොයින් ලැබේ දැයි ආඝාතය දුරලයි. මට අනර්ථ කෙරේ, එය මෙහි කොයින් ලැබේදැයි ආඝාතය දුරලයි. මට අනර්ථ කරන්නේය, එය මෙහි කොයින් ලැබේදැයි ආඝාතය දුරලයි. මාගේ ප්‍රියමනාපයාට අනර්ථ කෙළේය ... අනර්ථ කරයි ... අනර්ථ කරන්නේය. එය මෙහි කොයින් ලැබේදැයි ආඝාතය දුරලයි. අස්ථාන-යෙහි ද නො කිපෙයි. මහණෙනි, මේ දස ආඝාත පටිවිනයෝ යි.

### තෙවැනි ආකඞ්ඛවර්ග යි.

**එහි උද්දානය:**

ආකඞ්ඛ සූත්‍රය කණ්ටක සූත්‍රය ඉට්ඨ සූත්‍රය වඩ්ඪි සූත්‍රය මිගසාලා සූත්‍රය අභබ්බ සූත්‍රය කාක සූත්‍රය නිගණ්ඨ සූත්‍රය වත්ථු සූත්‍ර දෙක දැයි දසයෙකි.

## 10. 2. 4. 1

## බාහුන සුත්තං

එකං සමයං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. අථ ඛො ආයස්මා බාහුනො[1] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා බාහුනො භගවන්තං එතදවොච:

කතිහි නු ඛො භන්තෙ ධම්මෙහි තථාගතො නිස්සටො විසංයුත්තො විප්පමුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති?

දසහි ඛො පන බාහුන ධම්මෙහි තථාගතො නිස්සටො විසංයුත්තො විප්පමුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. කතමෙහි දසහි: රූපෙන ඛො බාහුන තථාගතො නිස්සටො විසංයුත්තො විප්පමුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. වෙදනාය ඛො බාහුන -පෙ- සඤ්ඤාය ඛො බාහුන -පෙ- සඞ්ඛාරෙහි ඛො බාහුන -පෙ- විඤ්ඤාණෙන ඛො බාහුන -පෙ- ජාතියා ඛො බාහුන -පෙ- ජරාය ඛො බාහුන -පෙ- මරණෙන ඛො බාහුන -පෙ- දුක්ඛෙහි ඛො බාහුන -පෙ- කිලෙසෙහි ඛො බාහුන තථාගතො නිස්සටො විසංයුත්තො විප්පමුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති.

සෙය්‍යථාපි බාහුන උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා උදකෙ ජාතං උදකෙ සංවඩ්ඪං උදකා අච්චුග්ගම්ම තිට්ඨති අනුපලිත්තං උදකෙන. එවමෙව ඛො බාහුන ඉමෙහි දසහි ධම්මෙහි තථාගතො නිස්සටො විසංයුත්තො විප්පමුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති.

## 10. 2. 4. 2

## ආනන්ද සුත්තං

**[සාවත්ථි]**

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

1. වාහනො - මජසං

## 10. 2. 4. 1
## බාහුන සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ චම්පා නගරය සමීපයෙහි ගග්ගරා පොකුණුතෙර වැඩ වසන සේක. එකල අයුෂ්මත් බාහුන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස්ව හුන්හ. එකත් පස්ව හුන් ආයුෂ්මත් බාහුන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ:

වහන්ස, කෙතෙක් ධර්‍මයන්ගෙන් තථාගතයන් වහන්සේ නිස්සෘෂ්ට වූවාහු විසංයුක්ත වූවාහු විප්‍රමුක්ත වූවාහු ක්ලෙශමර්‍යාදව බිඳ ලූ සිතින් වසන සේක් දැ යි?

බාහුනයෙනි, දශ දහමකින් තථාගතයෝ නිස්සෘෂ්ට වූවාහු විසංයුක්ත වූවාහු විප්‍රමුක්ත වූවාහු කෙලෙස් මියර බිඳ ලූ සිතින් වෙසෙති. කවර දසයෙකින යත්: බාහුනය, තථාගතයෝ රූපයෙන් නිස්සෘෂ්ට වූවාහු විසංයුක්ත වූවාහු විප්‍රමුක්ත වූවාහු කෙලෙස් මියර බිඳ ලූ සිතින් වෙසෙත්. බාහුනයෙනි, වෙදනායෙන් ... බාහුනයෙනි, සංඥයෙන්... බාහුනයෙනි සංස්කාරයන්ගෙන් ... බාහුනයෙනි, විඥනයෙන් ... බාහුනයෙනි, ජාතියෙන්... බාහුනයෙනි, ජරායෙන්... බාහුනයෙනි, මරණයෙන්... බාහුනයෙනි, දුඃඛයෙන්... බාහුනයෙනි, ක්ලෙශයන්ගෙන් තථාගතයෝ නිස්සෘෂ්ට වූවාහු විසංයුක්ත වූවාහු විප්‍රමුක්ත වූවාහු කෙලෙස් මියර බිඳි සිතින් වෙසෙත්.

බාහුනයෙනි, යම් පරිද්දකින් උපුලක් වේවයි, පියුමක් වේවයි, පඬෙරක් වේවයි දියෙහි උපනෝ, දියෙහි වැඩුනෝ, දියෙන් නැගී දිය හා නො ගැවුනෝ සිටුනෝ ද, බාහුනයෙනි, එ පරිදි ම මේ දස දහමින් තථාගතයෝ නිස්සෘෂ්ට වූවාහු විසංයුක්ත වූවාහු විප්‍රමුක්ත වූවාහු බිඳ ලූ කෙලෙස් මියර ඇති සිතින් වාස කරත් හ යි.

## 10. 2. 4. 2
## ආනන්ද සූත්‍රය

[සැවැත්]

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරුන්හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

1. සො වතානන්ද භික්ඛු අස්සද්ධො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

2. සො වතානන්ද භික්ඛු දුස්සීලො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

3. සො වතානන්ද භික්ඛු අප්පස්සුතො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

4. සො වතානන්ද භික්ඛු දුබ්බචො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

5. සො වතානන්ද භික්ඛු පාපමිත්තො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

6. සො වතානන්ද භික්ඛු කුසීතො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

7. සො වතානන්ද භික්ඛු මුට්ඨස්සති සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

8. සො වතානන්ද භික්ඛු අසන්තුට්ඨො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

9. සො වතානන්ද භික්ඛු පාපිච්ඡො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

10. සො වතානන්ද භික්ඛු මිච්ඡාදිට්ඨිකො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

1. ආනන්දයෙනි, එ මහණ එකැතියෙන් ශ්‍රද්ධා නැතියේම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

2. ආනන්දයෙනි, එ මහණ එ කැතින් දුසිල් වූයේ ම මෙසස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

3. ආනන්දයෙනි, එ මහණ එ කැතියෙන් අල්පශ්‍රැත වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේය. යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

4. ආනන්දයෙනි, එ මහණ එ කැතියෙන් දුර්වච වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

5. ආනන්දයෙනි, එ මහණ එකැතියෙන් පවිටු මිතුරන් ඇතියේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

6. ආනන්දයෙනි, එ මහණ එකැතියෙන් කුසීත වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

7. ආනන්දයෙනි, එ මහණ එකැතියෙන් මුළාසිහි ඇතියේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

8. ආනන්දයෙනි, එ මහණ එකැතියෙන් අසන්තුෂ්ට වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන යනා වෙයි.

9. ආනන්දයෙනි, එ මහණ එකැතියෙන් පාපෙච්ඡ වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යාමාන නො වෙයි.

10. ආනන්දයෙනි, එ මහණ එකැතියෙන් මිථ්‍යාදෘෂ්ටික වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

සො වතානන්ද භික්ඛු ඉමෙහි දසහි ධම්මෙහි සමන්නාගතො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

1. සො වතානන්ද භික්ඛු සද්ධො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

2. සො වතානන්ද භික්ඛු සීලවා සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

3. සො වතානන්ද භික්ඛු බහුස්සුතො සුතධරො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

4. සො වතානන්ද භික්ඛු සුවචො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

5. සො වතානන්ද භික්ඛු කල්‍යාණමිත්තො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

6. සො වතානන්ද භික්ඛු ආරද්ධවිරියො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

7. සො වතානන්ද භික්ඛු උපට්ඨිතසති සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

8. සො වතානන්ද භික්ඛු සන්තුට්ඨො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

9. සො වතානන්ද භික්ඛු අප්පිච්ඡො සමානො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජති.

ආනන්දයෙනි, එ මහණ එකැත්තෙයන් මේ දශ ධර්මයෙන් සමන්වාගත වූයේ මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

1. ආනන්දයෙනි, එකැත්තෙයන් එ මහණ ශ්‍රද්ධා ඇතියේම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

2. ආනන්දයෙනි, එකැතින් එ මහණ සිල්වත් වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

3. ආනන්දයෙනි, එකැත්තෙයන් එ මහණ බහුශ්‍රුත වූයේ ශ්‍රුතධර වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

4. ආනන්දයෙනි, එකැත්තෙයන් එ මහණ සුවච වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

5. ආනන්දයෙනි, එ මහණ එකැතින් කල්‍යාණ මිත්‍ර වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ.

6. ආනන්දයෙනි, එකැතින් එ මහණ රුකුළු වැර ඇතියේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

7. ආනන්දයෙනි, එ මහණ එකැතින් එළැඹ සිටි සිහි ඇතියේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

8. ආනන්දයෙනි, එ මහණ එකැතින් සන්තුෂ්ට වූයේ ම වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

9. ආනන්දයෙනි, එ මහණ එකැතින් අල්පෙච්ඡ වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

10. සො වතානන්ද භික්ඛු සම්මාදිට්ඨිකො සමානො ඉමස්මිං ධම්ම-විනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨාන මෙතං විජ්ජති.

සො වතානන්ද භික්ඛු ඉමෙහි දසහි ධම්මෙහි සමන්නාගතො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජතීති.

## 10. 2. 4. 3

## පුණ්ණිය සුත්තං

**[සාවත්ථි]**

අථ ඛො ආයස්මා පුණ්ණියො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා පුණ්ණියො භගවන්තං එතදවොච: ''කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො, යෙන අප්පෙකදා තථාගතං ධම්මදෙසනා පටිභාති, අප්පෙකදා නප්පටිභාතී?''ති.

සද්ධො ච පුණ්ණිය භික්ඛු හොති, නො ච උපසඞ්කමිතා, නෙව තාව තථාගතං ධම්මදෙසනා පටිභාති. යතො ච ඛො පුණ්ණිය භික්ඛු සද්ධො ච හොති උපසඞ්කමිතා ච, එවං තථාගතං ධම්මදෙසනා පටිභාති.

සද්ධො ච පුණ්ණිය භික්ඛු හොති උපසඞ්කමිතා ච, නො ච පයිරුපාසිතා -පෙ- පයිරුපාසිතා ච, නො ච පරිපුච්ඡිතා. පරිපුච්ඡිතා ච, නො ච ඔහිතසොතො ධම්මං සුණාති,ඔහිතසොතො ච ධම්මං සුණාති,නො ච සුත්වා ධම්මං ධාරෙති, සුත්වා ච ධම්මං ධාරෙති, නො ච ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති. ධතානඤ්ච ධම්මානං අත්ථං උපපරික්ඛති, නො ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානු-ධම්මපටිපන්නො ච හොති, නො ච කල්‍යාණවාචො හොති කල්‍යාණ-වාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙළගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. කල්‍යාණවාචො ච හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙළගලාය අත්ථස්ස විඤ්ඤාපනියා, නො ච සන්දස්සකො හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. න ච තාව තථාගතං ධම්මදෙසනා පටිභාති.

10. ආනන්දයෙනි, එ මහණ එකැතින් සම්‍යක් දෘෂ්ටික වූයේ ම මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

ආනන්දයෙනි, එ මහණ එකැතින් මෙ දස කරුණින් සමන්වාගත වූයේ මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණෙන්නේ ය යන තෙල කරුණ විද්‍යමාන වේ ය යි.

## 10. 2. 4. 3

## පුණ්ණිය සූත්‍රය

[සැවත්]

එකල්හි ආයුෂ්මත් පුණ්ණිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත් පස්ව හුන් ආයුෂ්මත් පුණ්ණිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කීහ: "වහන්ස, යම් හෙයකින් කිසි කලෙක තථාගතයනට ධර්ම දෙශනාව වටහා නම් කිසි කලෙක නො වටහා නම් හේතු කවර ප්‍රත්‍යය කවර යැ?

පුණ්ණිය, මහණ සැදැහැතියේ ද වෙයි. නො ද වෙත එළැඹෙන සුලු වෙයි. ඒ තාක් තථාගතයනට ධර්ම දෙශනාව නො ම වටහයි. පුණ්ණිය, යම් කලෙක මහණ සැදැහැතියේ ද වෙත එළඹෙන සුලු ද වේ නම් මෙසේ තථාගතයනට ධර්ම දෙශනාව වැටහෙයි.

පුණ්ණිය, මහණ සැදැහැතියේත් වෙත එළඹෙන සුලුත් වෙයි. නො ද පර්යුපාසනා කෙරෙයි... පර්යුපාසනා කරණ සුලුත් වෙයි, නො ද පරිපෘච්ඡා කරණ සුලුත් වෙයි. පරිපෘච්ඡා කරණ සුලුත් වෙයි, නො ද අවහිත ශ්‍රොත ඇතියේ ධර්මය අසයි. අවහිත ශ්‍රොත ඇතියේ ධර්මය ද අසයි, අසා දහම් නො ද දරයි. අසා ධර්මයත් දරයි. ධෘත ධර්මයන්ගේ අර්ථය නො ද පිරික්සයි. ධෘත ධර්මයන්ගේ අර්ථයත් පිරික්සයි, අර්ථය දැන ධර්මය දැන නො ද ධර්මානුධර්ම ප්‍රතිපන්න වෙයි. අර්ථය දැන ධර්මය දැන ධර්මානුධර්මප්‍රතිපන්න ද වෙයි, නො ද කලණ තෙපුල් ඇතියේ නො ද කල්‍යාණ වාක්කරණ (මිහිරි කටහඬ) ඇතියේ පළිබොධ රහිත නිදෙස් අරුත් හඟවන පිරුණු තෙපුලින් නො ද සමන්වාගත වූයේ වෙයි. කලණවදන් ඇතියේ කල්‍යාණ වාක්කරණ ඇතියේ පළිබොධ රහිත නිදෙස් අරුත් හඟවන පිරිපුන් වදනින් සමන්වාගත වූයේ ද වෙයි, සබ්‍රම්සරුනට සමාදන් කරවන සමුත්තෙජනා කරවන සම්ප්‍රහංසනා කරවන සන්දර්ශක නො ද වෙයි. ඒ තාක් තථාගතයනට ධර්ම දෙශනාව නො ද වැටහෙයි.

යතො ච ඛො පුණ්ණිය භික්ඛු සද්ධො ච හොති උපසඞ්කමිතා ච පයිරුපාසිතා ච පරිපුච්ඡිතා ච, ඔහිතසොතො ච ධම්මං සුණාති, සුත්වා ච ධම්මං ධාරෙති. ධතානඤ්ච ධම්මානං අත්ථං උපපරික්ඛති. අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො ච හොති, කල්‍යාණවාචො ච හොති කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙළගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. සන්දස්සකො ච හොති සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො සබ්‍රහ්මචාරීනං. එවං තථාගතං ධම්මදෙසනා පටිභාති. ඉමෙහි ඛො පුණ්ණිය, දසහි ධම්මෙහි සමන්නාගතා එකන්තපටිභානං තථාගතං ධම්මදෙසනා හොතීති.

## 10. 2. 4. 4

## බ්‍යාකරණ සුත්තං

**[සාවත්ථි]**

තත්‍ර ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භික්ඛු ආමන්තෙසි 'ආවුසො භික්ඛවො[1]'ති. ආවුසො'ති ඛො තෙ භික්ඛු ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසුං. ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

ඉධාවුසො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති ''ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී''ති. තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො සමනුයුඤ්ජති, සමනුගාහති, සමනුභාසති. සො තථාගතෙන වා තථාගතසාවකෙන වා ඣායිනා සමාපත්තිකුසලෙන පරචිත්තකුසලෙන පරචිත්තපරියායකුසලෙන සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො ඉරිණං ආපජ්ජති, විපිනං[2] ආපජ්ජති, අනයං ආපජ්ජති, බ්‍යසනං ආපජ්ජති, අනයබ්‍යසනං ආපජ්ජති.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච මනසිකරොති:

---

1. ආවුසො භික්ඛවෙ – මජසං
2. විචිනං – මජසං, විජිතං – සිමු

පුණ්ණිය, යම් කලෙක මහණ සැදැහැතියේත් එළැඹෙන සුලුත් පර්යුපාසනා කරණ සුලුත් පුළුවුස්නේත් වේ ද, අවහිත ශ්‍රොත ඇතියේ දහම් අසා ද, අසාත් දහම් දරා ද, ධෘත ධර්‍මයන්ගේ අර්‍ථය පිරික්සා ද, අරුත් දැන දහම් දැන ධර්‍මානුධර්‍ම ප්‍රතිපන්න ද වෙයි. පළිබොධ රහිත නිදෙස් අරුත් හඟවන පිරිපුන් තෙපුලින් සමන්වාගත වූයේ කල්‍යාණවාක් ඇතියේ කල්‍යාණ වාක්කරණ ඇතියේත් වෙයි. සබ්‍රම්-සරුනට සමාදන් කරණුයේ සමුත්තෙජනා කරණුයේ සම්ප්‍රහර්ෂණා කරණුයේ සන්දර්ශක ද වෙයි. මෙසේ තථාගතයනට ධර්‍ම දෙශනා වටහයි. පුණ්ණිය, මේ දස කරුණින් සමන්වාගත වූ ධර්‍ම දෙශනාව තථාගතයනට එකාන්ත ප්‍රතිභාණ ඇති වේ යයි.

## 10. 2. 4. 4

## ව්‍යාකරණ සූත්‍රය

[සැවැත්]

එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ඇවැත්නි මහණෙනියි භික්ෂූන් ඇමතූ හ. "ඇවැත්නි"යි එ මහණහු ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ට පිළිවදන් ඇස්වූ හ. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙතෙල කරුණ කීහ.

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ "ජාතිය ක්ෂීණ විය, බ්‍රහමචර්‍ය්‍ය වැස නිමවන ලද, සිවුමඟ කරණ කරණ ලද, මෙ බව පිණිස අනෙකක් නැතැයි දනිමි"යි. අර්හත්‍වය පවසයි. තථාගත වේවයි සමාපත්ති කුසලවූ පරසිත් දැන්මෙහි කුසල වූ පරචිත්තපර්‍ය්‍යායයෙහි කුසල වූ තථාගත ශ්‍රාවක වේවයි ඔහු අනුයොගවතට නංවයි, සමනුගාහනා කරයි. ලබ්ධියෙහි පිහිටුවයි. සමනුභාසනා කරයි, කරුණු විචාරයි. හේ තථාගතයන් විසින් වේවයි ධ්‍යාන ඇති සමාපත්තියෙහි කුසල පරචිත්තයෙහි කුසල පරචිත්තපරියායෙහි කුසල තථාගත ශ්‍රාවකයකු විසින් වේවයි අනුයොග-වතට නංවන ලදුයේ සමනුග්‍රාහ කරනු ලබන්නේ සමනුභාසනා කරනු ලබන්නේ සිස් බවට පැමිණෙයි, නිර්ගුණභාවයට පැමිණෙයි, හානියට පැමිණෙයි, වනසට පැමිණෙයි. අනයව්‍යසනයට පැමිණේ.

තථාගත වේවයි දැහැන් ඇති සමවත්හි දක්ෂ වූ පරසිත් දැනුම්හි දක්ෂ වූ පරචිත්තපර්‍ය්‍යාය කුසල වූ තථාගතශ්‍රාවක වේවයි මෙසේ ඔහු සිතින් සිත පිරිසිඳ මෙනෙහි කරයි.

"කින්නු ඛො අයමායස්මා අඤ්ඤං බ්‍යාකරොති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති.

1. තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්ති කුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච පජානාති: කොධනො ඛො පන අයමායස්මා, කොධපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, කොධපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

2. උපනාහී ඛො පන අයමායස්මා, උපනාහපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, උපනාහපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

3. මක්ඛී ඛො පන අයමායස්මා, මක්ඛපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, මක්ඛපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

4. පලාසී ඛො පන අයමායස්මා, පලාසපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, පලාසපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

5. ඉස්සුකී ඛො පන අයමායස්මා, ඉස්සාපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, ඉස්සාපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

6. මච්ඡරී ඛො පන අයමායස්මා, මච්ඡෙරපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, මච්ඡෙරපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

7. සඨො ඛො පන අයමායස්මා, සාඨෙය්‍යපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, සාඨෙය්‍යපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

8. මායාවී ඛො පන අයමායස්මා, මායාපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, මායාපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

"කවර කරුණකින් මේ ආයුෂ්මත් "ජාතිය ක්ෂීණය, බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලද ය, කරණී කරන ලද ය, මෙ බව පිණිස අන් කටයුතු නැතැයි දන්මි"යි අර්හත්වය පවසා ද"යි.

1. තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්තියෙහි දක්ෂ පරචිත්තයෙහි දක්ෂ පරචිත්තපර්‍ය්‍යායයෙහි දක්ෂ තථාගතශ්‍රාවකයෙක් වේවයි මෙසේ ඔහු සිතින් සිත පිරිසිඳ දන්නේ ය: "මේ ආයුෂ්මත් ක්‍රොධ ඇතියේ ක්‍රොධයෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල ක්‍රොධ පර්යුත්ථානය වනාහි තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක.

2. මේ ආයුෂ්මත් බද්ධවෛර ඇතියේ බද්ධවෛරයෙන් මැඩුණුසිතින් බොහෝ සේ වෙසෙයි. තෙල උපනාහපර්යුත්ථානය වනාහි තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහිනෙක.

3. මේ ආයුෂ්මත් මකුගුණ ඇතියේ මකුගුණයෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල මකු ගුණ නැගීම වනාහි තථාගතප්‍රවිදිත ධර්ම විනයයෙහි පිරිහිනෙක.

4. මේ ආයුෂ්මත් යුගග්‍රාහ ඇතියේ යුගග්‍රාහයෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල යුගග්‍රාහයාගේ නැගීම වනාහි තථාගත-ප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහිනෙක.

5. මේ ආයුෂ්මත් ඊර්ෂ්‍යා ඇතියේ ඊර්ෂ්‍යාවෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල ඊර්ෂ්‍යා පර්යුත්ථානය වනාහි තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහිනෙක.

6. මේ ආයුෂ්මත් මසුරුබැව් ඇතියේ මාත්සර්‍ය්‍යයෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල මාත්සර්‍ය්‍යපර්යුත්ථානය වනාහි තථාගත ප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහිනෙක.

7. මේ ආයුෂ්මත් ශඨ වූයේ ම ශඨ බැවින් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල ශඨ බැව් නැගීම වනාහි තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහිනෙක.

8. මේ ආයුෂ්මත් මායා ඇතියේ මායායෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල මායා පර්යුත්ථානය වනාහි තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහිනෙක.

9. පාපිච්ඡො ඛො පන අයමායස්මා ඉච්ඡාපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, ඉච්ඡාපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

10. මුට්ඨස්සති[1] ඛො පන අයමායස්මා උත්තරිකරණීයෙ ඔරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරාවොසානං ආපන්නො, අන්තරාවොසානගමනං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

සො වතාවුසො භික්ඛු ඉමෙ දසධම්මෙ අප්පහාය ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති. සො වතාවුසො භික්ඛු ඉමෙ දසධම්මෙ පහාය ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජතීති.

## 10. 2. 4. 5
## කත්ථී සුත්තං

එකං සමයං ආයස්මා මහාචුන්දො චෙතීසු විහරති සහජාතියං. තත්‍ර ඛො ආයස්මා මහාචුන්දො භික්ඛූ ආමන්තෙසි 'ආවුසො භික්ඛවො'ති ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාචුන්දස්ස පච්චස්සොසුං. ආයස්මා මහාචුන්දො එතදවොච:

ඉධාවුසො භික්ඛු කත්ථී හොති විකත්ථී අධිගමෙසු ''අහං පඨමං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි. අහං දුතියං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි. අහං තතියං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි. අහං චතුත්ථං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි. අහං ආකාසානඤ්චායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි. අහං විඤ්ඤාණඤ්චායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි. අහං ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි. අහං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි. අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපී''ති.

1. සති - මජසං

9. මේ ආයුෂ්මත් පාපෙච්ඡා ඇතියේ ඉච්ඡායෙන් මැඬුණු සිතින් බොහෝ සේ වෙසෙයි. මෙල ඉච්ඡා පරියුට්ඨානය වනාහි තථාගතප්‍රවිදිත ධර්‍ම විනයෙහි පිරිහිනෙක.

10. මේ ආයුෂ්මත් මුළා සිහි ඇතියේ මතුයෙහි කටයුතු ඇතිවත් ම සවල්පමාත්‍ර විශෙෂ අධිගමයන් අතරෙහි නිෂ්ඨාවට පැමිණියේය. මෙල අන්තරාවොසානගමනය වනාහි තථාගත ප්‍රවිදිත ධර්‍ම විනයෙහි පිරිහිනෙක.

ඇවැත්නි, එ මහණ මේ දස දහම් නො හැර මෙ සස්නෙහි එකැති-යෙන් වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණේය යන මෙල කරුණ විද්‍යමාන නො වෙයි.

ඇවැත්නි, එ මහණ මේ දසදහම් හැර එකැතින් මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණේය යන මෙල කරුණ විද්‍යමාන වේ යි.

## 10. 2. 4. 5

## කඣි සූත්‍රය

එක් කලෙක ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ චෙතී ජනපදයෙහි වූ සහජාතියෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ 'ඇවැත්නි මහණෙනි' යි භික්ෂූන් ඇමතූහ. 'ඇවැත්නි' යි ඒ මහණහු ආයුෂ්මත් මහාචුන්ද තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ මෙල කීහ:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ අධිගමයන්හිලා කථායෙහි කුසල වූයේ විවර කොට බණනසුලු වෙයි: මම ප්‍රථමධ්‍යානයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි. මම ද්විතීයධ්‍යානයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි. මම තෘතීයධ්‍යානයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි. මම චතුර්ථධ්‍යානයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි. මම ආකාසානඤ්චායතනයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි. මම විඤ්ඤාණඤ්චායතනයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි. මම ආකිඤ්චඤ්ඤායතනයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි. මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි. මම සඤ්ඤාවෙදයිතනිරොධයට සම-වදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි''යි.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති. සො තථාගතෙන වා තථාගතසාවකෙන වා ඣායිනා සමාපත්තිකුසලෙන පරචිත්තකුසලෙන පරචිත්තපරියායකුසලෙන සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො ඉරීණං ආපජ්ජති විජිනං ආපජ්ජති අනයං ආපජ්ජති බ්‍යසනං ආපජ්ජති අනයබ්‍යසනං ආපජ්ජති.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච මනසිකරොති, කිං නු ඛො අයමායස්මා කත්‍ථි හොති වික‍ත්‍ථී අධිගමෙසු "අහං පඨමං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි -පෙ- අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපීති.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච පජානාති.

1. දීඝරත්තං ඛො පන අයමායස්මා, ඛණ්ඩකාරී ඡිද්දකාරී සබලකාරී කම්මාසකාරී න සන්තතකාරී න සන්තතවුත්තී සීලෙසු. දුස්සීලො ඛො පනායමායස්මා, දුස්සීල්‍යං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

2. අස්සද්ධො ඛො පන අයමායස්මා, අස්සද්ධියං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

3. අප්පස්සුතො ඛො පන අයමායස්මා, අනාචාරො, අප්පස්සච්චං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

4. දුබ්බචො ඛො පන අයමායස්මා, දොවචස්සතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

5. පාපමිත්තො ඛො පන අයමායස්මා, පාපමිත්තතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

6. කුසීතො ඛො පන අයමායස්මා, කොසජ්ජං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්ති කුසල වූ පරචිත්තයෙහි දක්ෂ වූ පරිචිත්තපරියායෙහි ඡේක වූ තථාගත ශ්‍රාවකයෙක් වේවයි ඔහු අනුයොගවතට නංවයි, කරුණු ගන්වා අසයි. සමනුභාසනා කරයි. හේ තථාගතයන් විසින් හෝ ධ්‍යාන ඇති සමාපත්තියෙහි දක්ෂ පරචිත්තයෙහි කුසල පරචිත්තපරියායෙහි ඡේක වූ තථාගත ශ්‍රාවකයකු විසින් හෝ අනුයොගවතට නංවනු ලබනුයේ කරුණු ගන්වනු ලබනුයේ සමනුභාසනා කරුණු ලබනුයේ සිස් බවට පැමිණෙයි. නිර්ගුණ භාවයට පැමිණෙයි. හානියට පැමිණෙයි. ව්‍යසනයට පැමිණෙයි. අනයව්‍යසනයට පැමිණේ.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්තියෙහි දක්ෂ පරසිත්හි දක්ෂ පරචිත්තපර්‍ය්‍යායෙහි ඡේක වූ තථාගත ශ්‍රාවකයෙක් වේවයි ඔහු මෙසේ සිතින් සිත පිරිසිඳ මෙනෙහි කරයි: "මේ ආයුෂ්මත් කවර හෙයින් අධිගමයන්හිලා කථායෙහි දක්ෂ වූයේ විවර කොට බණන සුලු වේ" ද "මම ප්‍රථමධ්‍යානයට සමවදනෙම් ද ඉන් නැගී සිටින්නෙම් ද වෙමි යි .. මම සඤ්ඤාවෙදයිතනිරොධයට සමවදනෙම් ද ඉන් නැගී සිටුනෙම් ද වෙමි" යි.

1. තථාගත වේවයි දහැන් ඇති සමවත් හි කුසල පරසිත්හි කුසල පරචිත්තපරියායෙහි කුසල තථාගත ශ්‍රාවකයෙක් වේවයි මෙසේ ඔහු සිතින් සිත පිරිසිඳ දන්නේ ය: මේ ආයුෂ්මත් දීඝරාත්‍රයෙහි ශීලයෙහි ඛණ්ඩකාරිය, ඡිද්‍රකාරිය, කල්මාෂකාරිය, සතතකාරී නො වෙයි. සතතප්‍රවෘත්ති ඇතියේත් නො වෙයි. මේ ආයුෂ්මත් දුශ්ශීල ය, තෙල දෞශ්ශීල්‍යය තථාගතප්‍රවිදිත විනයෙහි පිරිහීනෙක.

2. මේ ආයුෂ්මත් ශ්‍රද්ධා නැත්තේ ය. තෙල ශ්‍රද්ධා රහිත බව තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහීනෙක.

3. මේ ආයුෂ්මත් අල්පශ්‍රැත වූයේ ආචාර නැත්තේ ය. තෙල අල්පශ්‍රැත්‍යය තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහීනෙක.

4. මේ ආයුෂ්මත් දුර්වචය, තෙල දුර්වචභාවය තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහීනෙක.

5. මේ ආයුෂ්මත් පාපමිත්‍රය, තෙල පාපමිත්‍රතාව තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහීනෙක.

6. මේ ආයුෂ්මත් කුසීතයෙක, තෙල කුසීත භාවය තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහීනෙක.

7. මුට්ඨස්සති ඛො පන අයමායස්මා, මුට්ඨස්සච්චං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

8. කුහකො ඛො පන අයමායස්මා, කොහඤ්ඤං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

9. දුබ්භරො ඛො පන අයමායස්මා, දුබ්භරතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

10. දුප්පඤ්ඤො ඛො පන අයමායස්මා, දුප්පඤ්ඤතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

සෙය්‍යථාපි ආවුසො සහායකො සහායකං එවං වදෙය්‍ය: යද තෙ සම්ම ධනෙන ධනකරණීයං අස්ස, යාචිස්සසි[1] මං ධනං, දස්සාමි තෙ ධනන්ති. සො කිඤ්චිදෙව ධනකරණීයෙ සමුප්පන්නෙ සහායකො සහායකං එවං වදෙය්‍ය:

"අත්‍ථො මෙ සම්ම ධනෙන, දෙහි මෙ ධනන්ති". සො එවං වදෙය්‍ය: "තෙන හි සම්ම ඉධ ඛනාහී"ති. සො තත්‍ර ඛනන්තො නාධිගච්ඡෙය්‍ය, සො එවං වදෙය්‍ය: "අලිකං මං සම්ම අවච, තුච්ඡකං මං සම්ම අවච "ඉධ ඛනාහී"ති. සො එවං වදෙය්‍ය "නාහං තං සම්ම අලිකං අවචං, තුච්ඡකං අවචං, තෙන හි සම්ම ඉධ ඛනාහී"ති. සො තත්‍රපි ඛනන්තො නාධිගච්ඡෙය්‍ය, සො එවං වදෙය්‍ය "අලිකං මං සම්ම අවච, තුච්ඡකං මං සම්ම අවච 'ඉධ ඛනාහී'ති. සො එවං වදෙය්‍ය "නාහං තං සම්ම අලිකං අවචං, න තුච්ඡකං අවචං, තෙන හි සම්ම ඉධ ඛනාහීති. සො තත්‍රපි ඛනන්තො නාධිගච්ඡෙය්‍ය, සො එවං වදෙය්‍ය "අලිකං මං සම්ම අවච, තුච්ඡකං මං සම්ම අවච 'ඉධ ඛනාහී'ති. සො එවං වදෙය්‍ය "නාහං තං සම්ම අලිකං අවචං, තුච්ඡකං අවචං, තෙන හි සම්ම ඉධ ඛනාහී"ති. සො තත්‍රපි ඛනන්තො නාධිගච්ඡෙය්‍ය, සො එවං වදෙය්‍ය "අලිකං මං සම්ම අවච, තුච්ඡකං මං සම්ම අවච 'ඉධ ඛනාහී"ති. සො එවං වදෙය්‍ය "නාහං තං සම්ම අලිකං අවචං, තුච්ඡකං අවචං, අපි ච අහමෙව උම්මාදං පාපුණිං චෙතසො විපරියාය"න්ති.

1. සාවෙය්‍යාසි - මජසං

7. මේ ආයුෂ්මත් මුළා සිහි ඇතියෙක, තෙල මුළා සිහි ඇති බව තථාගත ප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහීනෙක.

8. මේ ආයුෂ්මත් කුහකය, තෙල කොහොන් බව තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහීනෙක.

9. මේ ආයුෂ්මත් දුර්භරයෙක, තෙල දුර්භරතාව තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහීනෙක.

10. මේ ආයුෂ්මත් දුෂ්ප්‍රාඥය, තෙල දුෂ්ප්‍රාඥතාව තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහීනෙකි.

ඇවැත්නි, යම් සේ යහළුවෙක් යහළුවකුට මෙසේ කියා නම්: ''යහළුව, යම් කලෙක තට ධනයෙන් ධනකරණී වේ නම් මා දන යදුවයි, තට ධන දෙමි'' යි. එ යහළු කිසියම් ධන කරණීයක් උපන් කල්හි යහළු හට මෙසේ කියයි; යහළුව මට ධනයෙන් අර්ථ ඇත, මට ධන දෙව''යි. හේ මෙසේ කියයි: ''එසේ නම් යහළුව මෙහි කනව''යි හේ එහි කනනුයේ කිසිවක් නො ලබන්නේ ය. ඔහු මෙසේ කියයි: ''මෙහි කනව''යි. යහළුව මට මුසවා කීයෙහි, යහළුව මට හිස් බස් කීයෙහි, හේ මෙසේ කියන්නේ ය: ''යහළුව මම තට මුසවා නො කීමි, හිස් බස් නො කීමි. එසේ නම් යහළුව මෙහි කනව''යි. හේ එහිදු කනනුයේ ධන නො ලබන්නේ ය. හේ මෙසේ. කියයි: මෙහි කනවයි ''යහළුව, මට මුසවා කීයෙහි, යහළුව, මට හිස් බස් කීයෙහි'' යි. හේ මෙසේ කියයි: ''යහළුව, මම තට මුසවා නො කීමි, හිස් බස් නො කීමි. එසේ වී නම් යහළුව, මෙහි කනවයි, හේ එහිදු කනනුයේ ධන නො ලබයි. හේ මෙසේ කියයි: ''යහළුව, මෙහි කනව'' යි මට මුසවා කීයෙහි, යහළුව, මට හිස් බස් කීයෙහි. යහළුව මම තට මුසවා නො කීමි, හිස් බස් නො කීමි. එසේ වී නම් යහළුව මෙහි කනවයි. හේ එහිදු කනනුයේ ධන නො ලබන්නේ ය. හේ මෙසේ කියයි: ''යහළුව මෙහි කනවයි මට මුසවා කීයෙහි, යහළුව, මට හිස් බස් කීයෙහි, හේ මෙසේ කියයි: ''යහළුව, මම තට මුසවා නො කීමි, හිස් බස් නො කීමි, වැලි දු මම ම උමතුවට චිත්තවිපර්‍ය්‍යාසයට පත්මි''යි.

එවමෙව ඛො ආවුසො භික්ඛු කප්පී විකප්පී අධිගමෙසු "අහං පඨමං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං දුතියං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං තතියං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං චතුත්ථං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං ආකාසානඤ්චායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං විඤ්ඤාණඤ්චායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං ආකිඤ්චඤ්ඤායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි, අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපී"ති.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො සමනුයුඤ්ජති සමනුගාහති[1] සමනුභාසති. සො තථාගතෙන වා තථාගත සාවකෙන වා ඣායිනා සමාපත්තිකුසලෙන පරචිත්තකුසලෙන පරචිත්තපරියායකුසලෙන සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො ඉරීණං ආපජ්ජති, ඛ්‍යසනං ආපජ්ජති, අනයබ්‍යසනං ආපජ්ජති.

තමෙනං තථාගතො වා තථාගත සාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච මනසිකරොති "කින්නු ඛො ආයමායස්මා කප්පී හොති විකප්පී අධිගමෙසු "අහං පඨමං ඣානං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපි -පෙ- අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමිපි වුට්ඨහාමිපී"ති.

1. තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච පජානාති: දීඝරත්තං ඛො අයමායස්මා ඛණ්ඩකාරී ඡිද්දකාරී සබලකාරී කම්මාසකාරී න සන්තතකාරී න සන්තතවුත්ති සීලෙසු. දුස්සීලො ඛො අයමායස්මා, දුස්සීල්‍යං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

2. අස්සද්ධො ඛො පන අයමායස්මා, අස්සද්ධියං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

1. සමනුගගාහති – මජසං

ඇවැත්නි, එ පරිද්දෙන් ම මහණ කථායෙහි දක්ෂ වූයේ අධිගමයන්හි විවර කොට කියන සුලු වෙයි: ''මම පළමු දැහැනට සමවදනෙම් ද, ඉන් නැගිටුනෙම් ද වෙමි, මම දෙවන දැහැනට සමවදනෙම් ද, ඉන් නැගිටුනෙම් ද වෙමි, මම තෙවන දැහැනට සමවදනෙම් ද, ඉන් නැගිටු-නෙම් ද වෙමි, මම සිවුවන දැහැනට සමවදනෙම් ද, ඉන් නැගිටුනෙම් ද වෙමි, මම ආකාසානඤ්චායතනයට සමවදනෙම් ද ඉන් නැගිටුනෙම් ද වෙමි, මම විඤ්ඤාණඤ්චායතනයට සමවදනෙම් ද, ඉන් නැගිටුනෙම් ද වෙමි, මම ආකිඤ්චඤ්ඤායතනයට සමවදනෙම් ද, ඉන් නැගිටුනෙම් ද වෙමි, මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවදනෙම් ද, ඉන් නැගිටුනෙම් ද වෙමි, මම සඤ්ඤාවෙදයිත නිරොධයට සමවදනෙම් ද, ඉන් නැගිටුනෙම් ද, වෙමි''යි.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමවත්හි දක්ෂ මෙරමා සිත්හි දක්ෂ පරචිත්තපරියායෙහි කුසල තථාගතශ්‍රාවකයෙක් වේවයි එබඳු ඔහු අනුයොගවතට නංව යි. කරුනු ගන්වා අසයි. සමනුභාසනා කරයි. හේ තථාගතයන් විසින් වේවයි දැහැන් ඇති සමාපත්ති කුසල පරචිත්ත කුසල පරචිත්තපරියාය කුසල තථාගතශ්‍රාවකයකු විසින් වේවයි අනු-යොගයට නංවනු ලබනුයේ කරුණු ගන්වා අසනු ලබනුයේ සමනුභාසනා කරනු ලබන්නේ හිස් බවට පැමිණෙයි. නිර්ගුණ භාවයට පැමිණෙයි. අනයට පැමිණෙයි. ව්‍යසනයට පැමිණෙයි, අනයව්‍යසනයට පැමිණෙයි.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්ති කුසල පරචිත්ත කුසල පරචිත්තපරියාය කුසල තථාගතශ්‍රාවකයෙක් වේව යි එබඳු ඔහු මෙසේ සිතින් සිත පිරිසිඳ මෙනෙහි කරයි: ''කවර හෙයින් මේ ආයුෂ්මත් කථායෙහි දක්ෂ වූයේ අධිගමයන්හි විකත්ථනා කරන සුළු වේ ද ''මම ප්‍රථම ධ්‍යානයට සම වදනෙම් ද ඉන් නැගිටුනෙම් ද... මම සඤ්ඤාවෙදයිත නිරොධයට සමවදනෙම් ද ඉන් නැගිටුනෙම් ද වෙමි''යි.

1. තථාගත වේව යි ධ්‍යාන ඇති සමාපත්ති කුසලපරචිත්ත කුසල පරචිත්තපරියායකුසල තථාගත ශ්‍රාවකයෙක් වේව යි එබඳු ඔහු සිතින් සිත පිරිසිඳ දන්නේ ය: ''මේ ආයුෂ්මත් දීර්‍ඝරාත්‍රයක් සීලයෙහි ඛණ්ඩකාරිය, ඡිද්‍රකාරිය, ශබලකාරිය, කල්මාෂකාරිය, සන්තතකාරී නො වෙයි, සතතවෘත්ති ද නො වෙයි, මේ ආයුෂ්මත් දුසිල්ය, තෙල දුසිල් බව වනාහි තථාගත ප්‍රවිදිත ධර්‍ම විනයෙහි පිරිහිනෙක.

2. මේ ආයුෂ්මත් අශ්‍රද්ධය, තෙල සැදැහැ නැති බව තථාගත ප්‍රවිදිත ධර්‍ම විනයෙහි පිරිහිනෙක.

3. අප්පස්සුතො ඛො පන අයමායස්මා අනාචාරො, අප්පසච්චං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

4. දුබ්බචො ඛො පන අයමායස්මා දොවචස්සතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

5. පාපමිත්තො ඛො පන අයමායස්මා, පාපමිත්තතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

6. කුසීතො ඛො පන අයමායස්මා, කොසජ්ජං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

7. මුට්ඨස්සති ඛො පන අයමායස්මා, මුට්ඨසච්චං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

8. කුහකො ඛො පන අයමායස්මා, කොහඤ්ඤං[1] ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

9. දුබ්භරො ඛො පන අයමායස්මා, දුබ්භරතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

10. දුප්පඤ්ඤො ඛො පන අයමායස්මා, දුප්පඤ්ඤතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

සො වතාවුසො භික්ඛු ඉමෙ දසධම්මෙ අප්පහාය ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති. සො වතාවුසො භික්ඛු ඉමෙ දස ධම්මෙ පහාය ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජතීති ඨානමෙතං විජ්ජතීති.

## 10. 2. 4. 6

## අධිමාන සුත්තං

එකං සමයං ආයස්මා මහාකස්සපො රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තත්‍ර ඛො ආයස්මා මහාකස්සපො භික්ඛූ ආමන්තෙසි 'ආවුසො භික්ඛවො'[2]ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාකස්සපස්ස පච්චස්සොසුං. ආයස්මා මහාකස්සපො එතදවොච:

1. කුහනා – සීමු
2. භික්ඛවෙති – මජසං.

3. මේ ආයුෂ්මත් **අල්පශ්‍රැත** ය, ආචාර නැත්තෙක, තෙල අල්පශ්‍රැතයය තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක,

4. මේ ආයුෂ්මත් දුර්වචයෙක, තෙල දුර්වචභාවය තථාගත **ප්‍රවිදිත** ධර්මවිනයෙහි පිරිහිනෙක,

5. මේ ආයුෂ්මත් පාපමිත්‍රයෙක, තෙල **පාපමිත්‍රතාව** තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක.

6. මේ ආයුෂ්මත් කුසීතයෙක, තෙල කුසීතභාවය **තථාගත** ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක,

7. මේ ආයුෂ්මත් මුළාසිහි ඇතියෙක, තෙල මුළාසිහි ඇති **බව** තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක,

8. මේ ආයුෂ්මත් කුහකයෙක, තෙල කොහොන් බව තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක.

9. මේ ආයුෂ්මත් දුර්භරයෙක, තෙල දුර්භරතාව තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි **පිරිහිනෙක**,

10. මේ ආයුෂ්මත් **දුෂ්ප්‍රාඥයෙක**, තෙල **දුෂ්ප්‍රාඥතාව** තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක,

ඇවැත්නි, **ඒ මහණ** මේ දසදහම් නො හැර මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණේ ය යන තෙල කරුණ විද්‍යමාන නො වේ. ඇවැත්නි, **එ මහණ** මෙ දස දහම් හැරපියා මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණේය යන තෙල කරුණ විද්‍යමාන වේ යයි.

## 10. 2. 4. 6
## අධිමාන සූත්‍රය

එක් කලෙක ආයුෂ්මත් **මහාකාශ්‍යප** තෙරණුවෝ **රජගහ** නුවර සමීපයෙහි **කලන්දකනිවාප** නම් වූ **වෙළුවනයෙහි** වාසය කරන සේක: එ කල්හි ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරණුවෝ 'ඇවැත්නි මහණෙනි' යි භික්ෂූන් ඇමතූහ. 'ඇවැත්නි' යි එ මහණ ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරණුවෝ තෙල කීහ:

ඉධාවුසො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො සමනුයුඤ්ජති සමනුගාහති සමනුභාසති. සො තථාගතෙන වා තථාගතසාවකෙන වා ඣායිනා සමාපත්තිකුසලෙන පරචිත්තකුසලෙන පරචිත්තපරියායකුසලෙන සමනුයුඤ්ජියමානො සමනුගාහියමානො සමනුභාසියමානො ඉරිණං ආපජ්ජති, විපිනං ආපජ්ජති, අනයං ආපජ්ජති, බ්‍යසනං ආපජ්ජති, අනයබ්‍යසනං ආපජ්ජති.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච මනසිකරොති "කිං නු ඛො අයමායස්මා අඤ්ඤං බ්‍යාකරොති 'ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච පජානාති.

අධිමානිකො ඛො අයමායස්මා අධිමානසච්චො අප්පත්තෙ පත්තසඤ්ඤී අකතෙ කතසඤ්ඤී අනධිගතෙ අධිගතසඤ්ඤී අධිමානෙන අඤ්ඤං බ්‍යාකරොති 'ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච මනසිකරොති "කිනනු ඛො අයමායස්මා නිස්සාය අධිමානිකො අධිමානසච්චො අප්පත්තෙ පත්තසඤ්ඤී අකතෙ කතසඤ්ඤී අනධිගතෙ අධිගත සඤ්ඤී අධිමානෙන අඤ්ඤං බ්‍යාකරොති "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති."

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ ''ජාතිය ක්ෂීණ ය, බඹසර වැස නිමවන ලදී, කරණී කෘතය, මේ අර්හත්බව පිණිස අනික් කිසෙක් නැතැ''යි දන්මි'යි අර්හත්‍වය ප්‍රකාශ කෙරෙයි. තථාගත වේවයි ධ්‍යාන ඇති, සමාපත්තියෙහි කුසල පරචිත්තයෙහි කුශල පරචිත්තපර්‍යායයෙහි කුසල තථාගත ශ්‍රාවකයෙක් වේවයි එබඳු ඕහු අනුයොගයට නංවයි. කරුණු ගත්වා අසයි, සමනුභාෂණා කරයි. හේ තථාගතයන් විසින් හෝ ධ්‍යාන ඇති සමාපත්ති කුශල වූ පරචිත්ත කුශල වූ පරචිත්තපර්‍යායයෙහි කුශල වූ තථාගත ශ්‍රාවකයකු විසින් හෝ අනුයෝගයට නංවනු ලබන්නේ කරුණු ගත්වනු ලබන්නේ සමනුභාෂණා කරනු ලබන්නේ තුච්ඡභාවයට පැමිණෙයි, නිර්ගුණ භාවයට පැමිණෙයි, අනයට පැමිණෙයි, ව්‍යසනයට පැමිණෙයි, අනයව්‍යසනයට පැමිණෙ යි.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්තියෙහි කුශල වූ පරචිත්තයෙහි කුශල වූ පරචිත්තපර්‍යායයෙහි කුශල වූ තථාගතශ්‍රාවකයෙක් වේවයි එබඳු ඔහු මෙසේ සිතින් සිත පිරිසිඳ මෙනෙහි කරයි: ''කවර හෙයින් මෙ ආයුෂ්මත් 'ජාතිය ක්ෂීණ ය, බඹසර වැස නිමවන ලදී, සිවුමග කරණී කරන ලදී, මේ අහර්ත්බව පිණිස අන් කිසෙක් නැතැ'' යි දන්මි' යි අර්හත්‍වය ප්‍රකාශ කෙරේ ද?'' යි.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්තියෙහි කුශල වූ පරචිත්තයෙහි කුශල වූ පරචිත්තපර්‍යාය කුශල වූ තථාගතශ්‍රාවකයෙක් වේවයි එබඳු ඔහු මෙසේ සිතින් සිත පිරිසිඳ දන්නේ ය.

මෙ ආයුෂ්මත් අධිමාන ඇතියේ අධිමානය සත්‍ය කොට ඇත්තේ අප්‍රාප්තයෙහි ප්‍රාප්තයෙමි යන සංඥ ඇතියේ අකෘතයෙහි කෘතයෙමි යන සංඥ ඇතියේ අනධිගතයෙහි අධිගතයෙමි යන සංඥ ඇතියේ අධිමානය කරණකොටගෙන 'ජාතිය ක්ෂීණ ය, මග බඹසර වැස නිමැවිණ, සිවුමග කරණී කරන ලදී. මෙ රහත් බව පිණිස අන් කිසෙක් නැතැ'යි දන්මියි අර්හත්‍වය ප්‍රකාශ කරයි.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්ති කුශල පරචිත්ත කුශල පරචිත්තපරියාය කුශල තථාගතශ්‍රාවකයෙක් වේවයි එ බඳු ඔහු මෙසේ සිතින් සිත පිරිසිඳ මෙනෙහි කරයි: ''මේ ආයුෂ්මත් කවර කරුණක් නිසා අධිමාන ඇතියේ අධිමානය සත්‍ය කොට ඇතියේ අප්‍රාප්තයෙහි ප්‍රාප්තයෙමි යන සංඥ ඇතියේ අකෘතයෙහි කෘතයෙමි යි යන සංඥ ඇතියේ අනධිගතයෙහි අධිගතයෙමි යි යන සංඥ ඇතියේ අධිමානයෙන් ''ජාතිය ක්ෂීණ ය, මග බඹසර වැස නිමවිණ, මග කරණී කරන ලද, මෙ අර්හත්-බව පිණිස අන් කිසෙක් නැතැයි දන්මී යි අර්හත්‍වය පහළ කෙරේ ද''යි.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච පජානාති.

බහුස්සුතො ඛො පන අයමායස්මා සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා, මජ්ඣෙකල්‍යාණා, පරියොසානකල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. තස්මා අයමායස්මා අධිමානිකො අධිමානසච්චා අප්පත්තෙ පත්තසඤ්ඤී අකතෙ කතසඤ්ඤී අනධිගතෙ අධිගතසඤ්ඤී අධිමානෙන අඤ්ඤං බ්‍යාකරොති 'ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතකරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති.

තමෙනං තථාගතො වා තථාගතසාවකො වා ඣායී සමාපත්තිකුසලො පරචිත්තකුසලො පරචිත්තපරියායකුසලො එවං චෙතසා චෙතො පරිච්ච පජානාති, අභිජ්ඣාලු ඛො පන අයමායස්මා අභිජ්ඣාපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, අභිජ්ඣාපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

බ්‍යාපන්නො ඛො පන අයමායස්මා බ්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, බ්‍යාපාදපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

ථිනමිද්ධො ඛො පන අයමායස්මා ථිනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, ථිනමිද්ධපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

උද්ධතො ඛො පන අයමායස්මා උද්ධච්චපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, උද්ධච්චපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

විචිකිච්ඡො ඛො පන අයමායස්මා විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා බහුලං විහරති, විචිකිච්ඡාපරියුට්ඨානං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්තිකුශල පරචිත්තකුශල පරචිත්තපරියායකුසල තථාගත ශ්‍රාවකයෙක් වේවයි එබඳු ඔහු සිතින් සිත පිරිසිඳ දන්නේ ය.

මේ ආයුෂ්මත් බහුශ්‍රුත වූයේ ශ්‍රුතධර වූයේ ශ්‍රුතසන්නිචය කොට ඇතියේ ය. ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍ය්‍යවසානකල්‍යාණ වූ යම් ඒ දහම් කෙනෙක් සාර්‍ථ වූ සව්‍යඤ්ජන වූ කෙවලපරිපූර්‍ණ වූ පරිශුද්ධ වූ බ්‍රහ්මචර්‍ය්‍යය පවසත් නම් එබඳු ධර්මයෝ ඔහු විසින් බහුශ්‍රුත වූවාහු ධෘත වූවාහු වචනයෙන් පරිචිත වූවාහු සිතින් අනුප්‍රෙක්ෂිත වූවාහු දෘෂ්ටියෙන් සුප්‍රතිවිද්ධ වූවාහු වෙත්. එහෙයින් මේ ආයුෂ්මත් අධිමාන ඇතියේ අධිමාන සත්‍ය කොට ඇතියේ අප්‍රාප්තයෙහි ප්‍රාප්තයෙමි යන සංඥ ඇතියේ අකෘතයෙහි කෘතයෙමි යන සංඥ ඇතියේ අනධිගතයෙහි 'අධිගතයෙමි' යන සංඥ ඇතියේ අධිමානයෙන් ''ජාතිය ක්ෂීණ ය, බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවිණ, කරණී කෘත ය, මෙ බව පිණිස අන් කිසෙක් නැතැයි දන්මි'' යි අර්හත්වය පහළ කෙරෙයි.

තථාගත වේවයි ධ්‍යාන ඇති සමාපත්තිකුසල පරචිත්තකුසල පරචිත්තපරියායකුසල තථාගතශ්‍රාවකයෙක් වේවයි එබඳු ඔහු මෙසේ සිතින් සිත පිරිසිඳ දන්නේ ය; ''මේ ආයුෂ්මත් අභිධ්‍යා බහුල කොට ඇතියේ අභිධ්‍යායෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල අභිධ්‍යා පර්‍ය්‍යුත්ථානය වනාහි තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක.

මේ ආයුෂ්මත් ව්‍යාපාදයට පැමිණියේ ව්‍යාපාදයෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල ව්‍යාපාද පර්‍ය්‍යුත්ථානය වනාහි තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක.

මේ ආයුෂ්මත් ථීනමිද්ධ ඇතියේ ථීනමිද්ධයෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල ථීනමිද්ධ පරියුට්ඨානය වනාහි තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක.

මේ ආයුෂ්මත් උද්ධත වූයේ ඖද්ධත්‍යයෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල ඖද්ධත්‍යපර්‍ය්‍යුත්ථානය වනාහි තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහිනෙක.

මේ ආයුෂ්මත් විචිකිච්ඡා ඇතියේ විචිකිච්ඡායෙන් මැඩුණු සිතින් බොහෝ සේ වෙසෙයි. තෙල විචිකිත්සාපර්‍ය්‍යුත්ථානය වනාහි තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහිනෙක,

කම්මාරාමො ඛො පන අයමායස්මා කම්මරතො කම්මාරාමතං අනුයුත්තො. කම්මාරාමතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

භස්සාරාමො ඛො පන අයමායස්මා භස්සරතො භස්සාරාමතං අනුයුත්තො, භස්සාරාමතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

නිද්දාරාමො ඛො පන අයමායස්මා නිද්දාරතො නිද්දාරාමතං අනුයුත්තො. නිද්දාරාමතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

සඞ්ගණිකාරාමො ඛො පන අයමායස්මා සඞ්ගණිකරතො සඞ්ගණිකාරාමතං අනුයුත්තො, සඞ්ගණිකාරාමතා ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

මුට්ඨස්සති ඛො පන අයමායස්මා උත්තරිං කරණීයෙ ඔරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරාවොසානං ආපන්නො. අන්තරාවොසානගමනං ඛො පන තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ පරිහානමෙතං.

සො වතාවුසො භික්ඛු ඉමෙ දසධම්මෙ අප්පහාය ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සො වතාවුසො භික්ඛු ඉමෙ දසධම්මෙ පහාය ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨානමෙතං විජ්ජතීති.

## 10. 2. 4. 7
## අධිකරණික සුත්තං

**[සාවත්ථි]**

තත්‍ර ඛො භගවා කලන්දකං[1] භික්ඛුං ආරබ්භ භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

1. ඉධ භික්ඛවෙ භික්ඛු අධිකරණිකො හොති, අධිකරණසමථස්ස න-වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු අධිකරණිකො හොති, අධිකරණසමථස්ස-න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය න ගරුත්තාය න භාවනාය න සාමඤ්ඤාය න එකීභාවාය සංවත්තති.

---
1. කාලධකතං මජසං, කාලක භික්ඛුං සයා.

මේ ආයුෂ්මත් කර්මාරාම වූයේ කර්මයෙහි ඇලුණේ කර්මාරාමතායෙහි අනුයුක්තයෙක. මෙතෙල කර්මාරාමතාව වනාහි තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහීමෙක.

මේ ආයුෂ්මත් දෙඩමලු වූයේ දෙඩමලු බැව්හි ඇලුණේ දෙඩමලු බැව්හි අනුයුක්ත වේ. මෙතෙල දෙඩමලු බව වනාහි තථාගතප්‍රවිදිත ධර්ම විනයෙහි පිරිහීමෙක.

මේ ආයුෂ්මත් නිද්‍රාරාම වූයේ නිද්‍රායෙහි ඇලුණේ නිද්‍රාරාමතායෙහි අනුයුක්තයෙක. මෙතෙල නිද්‍රාරාමතාව වනාහි තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහීමෙක.

මේ ආයුෂ්මත් සඞ්ගණිකාරාම වූයේ සඞ්ගණිකායෙහි ඇලුණේ සඞ්ගණිකාරාමතායෙහි අනුයුක්තයෙක. මෙතෙල සඞ්ගණිකාරාමතාව වනාහි තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහීමෙක.

මේ ආයුෂ්මත් මුළාසිහි ඇතියේ මතුයෙහි කරණී ඇතිවත් ම සවල්පමාත්‍ර විශෙෂාධිගමයෙන් අන්තරාවොසානයට පැමිණියේ ය. මෙතෙල අන්තරාවොසානගමනය වනාහි තථාගතප්‍රවිදිත ධර්මවිනයෙහි පිරිහීමෙක.

ඇවැත්නි, එ මහණ මෙ දස දහම් නො හැරපියා මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණේ ය යන මෙතෙල කරුණ විද්‍යමාන නො වේ.

ඇවැත්නි, එ මහණ මෙ දස දහම් හැරපියා මෙ සස්නෙහි වෘද්ධියට විරූඪියට වෛපුල්‍යයට පැමිණේ ය යන මෙතෙල කරුණ විද්‍යමාන වෙයි.

## 10. 2. 4. 7
## අධිකරණික සූත්‍රය

එකල්හි භාග්‍යවතුන් වහන්සේ කලන්‍දක මහණුහු අරබයා මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙතෙල වදළහ.

1. මහණෙනි, මෙ සස්නෙහි මහණ අධිකරණ ඇතියේ අධිකරණ සමථයාගේ වර්ණවාදී නො වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ අධිකරණ ඇතියේ අධිකරණ සමථයාගේ වර්ණවාදී නො වේ නම් මෙ දහම ද ප්‍රියභාවය පිණිස ගුරුභාවය පිණිස භාවනාව පිණිස ශ්‍රමණ භාවය පිණිස එකී භාවය පිණිස නො වැටේ.

2. පුනචපරං භික්ඛවෙ භික්ඛු න සික්ඛාකාමො හොති, සික්ඛාසමාදානස්ස න වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු න සික්ඛාකාමො හොති, සික්ඛාසමාදනස්ස න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය න ගරුත්තාය න භාවනාය න සාමඤ්ඤාය න එකීභාවාය සංවත්තති.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛු පාපිච්ඡො හොති, ඉච්ඡාවිනයස්ස න වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු පාපිච්ඡො හොති, ඉච්ඡාවිනයස්ස න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය න ගරුත්තාය න භාවනාය න සාමඤ්ඤාය න එකීභාවාය සංවත්තති.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛු කොධනො හොති, කොධවිනයස්ස න වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු කොධනො හොති, කොධවිනයස්ස න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය -පෙ- න එකීභාවාය සංවත්තති.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු මක්ඛී හොති, මක්ඛවිනයස්ස න වණ්ණවාදී, යම්පි භික්ඛවෙ භික්ඛු මක්ඛී හොති, මක්ඛවිනයස්ස න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය -පෙ- න එකීභාවාය සංවත්තති.

6. පුනචපරං භික්ඛවෙ භික්ඛු සඨො හොති, සාඨෙය්‍යවිනයස්ස න වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු සඨො හොති, සාඨෙය්‍යවිනයස්ස න වණ්ණවාදී අයම්පිධම්මො න පියත්තාය -පෙ- න එකීභාවාය සංවත්තති.

7. පුනචපරං භික්ඛවෙ භික්ඛු මායාවී හොති, මායාවිනයස්ස න වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු මායාවී හොති, මායාවිනයස්ස න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය -පෙ- න එකීභාවාය සංවත්තති.

8. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මානං න නිසාමකජාතියො හොති ධම්මනිසන්තියා න වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු ධම්මානං න නිසාමකජාතියො හොති, ධම්මනිසන්තියා න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය -පෙ- න එකීභාවාය සංවත්තති.

2. තවද මහණෙනි, මහණ ශික්ෂාකාම නො වූයේ ශික්ෂා සමාදානයෙහි ගුණ කියන්නේ නො වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ ශික්ෂාකාම නො වූයේ ශික්ෂාසමාදානයාගේ ගුණ නො කියන සුලු වේ නම් මෙ දහම ද ප්‍රියභාවය පිණිස ගුරුභාවය පිණිස භාවනාව පිණිස ශ්‍රමණ භාවය පිණිස එකී භාවය පිණිස නො වැටේ.

3. තවද මහණෙනි, මහණ ලමු ඉච්ඡා ඇතියේ ඉච්ඡා විනයාගේ ගුණ නො කියන සුලු වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ ලමු ඉච්ඡා ඇතියේ ඉච්ඡා විනයයාගේ ගුණ නො කියන සුලු වේ නම් මෙ දහමුදු ප්‍රිය භාවය පිණිස ගුරු භාවය පිණිස භාවනාව පිණිස ශ්‍රමණ භාවය පිණිස එකී භාවය පිණිස නො වැටේ.

4. තවද මහණෙනි, මහණ කිපෙන සුලුයේ ක්‍රොධ විනයයාගේ ගුණ නො කියන සුලුයේ වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ කිපෙන සුලුයේ ක්‍රොධවිනයයාගේ ගුණ නො කියන සුලුයේ වේ නම් මෙ දහමුදු ප්‍රිය භාවය පිණිස ... එකී භාවය පිණිස නො වැටේ.

5. තවද, මහණෙනි, මහණ මකු ගුණ ඇතියේ මක්ඛවිනයයාගේ ගුණ කියන සුලු නො වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ මකු ගුණ ඇතියේ මක්ඛවිනයාගේ ගුණ නො කියන සුලු වේ නම් මෙ දහමුදු ප්‍රිය-භාවය පිණිස ... එකී භාවය පිණිස නො වැටේ.

6. තවද, මහණෙනි, මහණ ශඨ වූයේ ශඨභාව විනයයාගේ ගුණ නො කියන සුලු වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ ශඨ වූයේ ශඨභාව විනයයාගේ ගුණ නො කියන සුලු වේ නම් මෙදහමුදු ප්‍රියභාවය පිණිස ... එකී භාවය පිණිස නො වැටේ.

7. තවද මහණෙනි, මහණ මායා ඇතියේ මායා විනයයාගේ ගුණ නො කියන සුලුයේ වෙයි, මහණෙනි, යම් හෙයෙකින් මහණ මායාවී වූයේ මායා විනයාගේ ගුණ නො කියන සුලු වේ, නම් මෙ දහමුදු ප්‍රියභාවය පිණිස... එකී භාවය පිණිස නො වැටේ.

8. තවද මහණෙනි, මහණ නව ලොව්තුරු දහම් නො දරන සැහැවි ඇතියේ ධර්මධාරණයෙහි ගුණ නො බණන සුලු වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ ධර්මොපධාරණස්වභාවය නැතියේ ධර්මොප-ධාරණයේ ගුණ නො බණන සුලු වේ නම් මෙ දහමුදු ප්‍රිය භාවය පිණිස... එකී භාවය පිණිස නො වැටේ.

9. පුනවපරං භික්ඛවෙ භික්ඛු න පටිසල්ලානො හොති, පටිසල්ලානස්ස න වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු න පටිසල්ලානො හොති, පටිසල්ලානස්ස න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය -පෙ- න එකීභාවාය සංවත්තති.

10. පුනවපරං භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීනං න පටිසන්ථාරකො හොති, පටිසන්ථාරකස්ස න වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු න පටිසන්ථාරකො හොති, පටිසන්ථාරකස්ස න වණ්ණවාදී, අයම්පි ධම්මො න පියත්තාය, න ගරුත්තාය න භාවනාය න සාමඤ්ඤාය න එකීභාවාය සංවත්තති.

එවරූපස්ස භික්ඛවෙ භික්ඛුනො කිඤ්චාපි එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: 'අහො වත මං සබ්‍රහ්මචාරී සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුන්ති'. අථ ඛො නං සබ්‍රහ්මචාරී න චෙව සක්කරොන්ති, න ගරුකරොන්ති, න මානෙන්ති, න පූජෙන්ති, තං කිස්සහෙතු:

තථා හිස්ස භික්ඛවෙ විඤ්ඤූ සබ්‍රහ්මචාරී තෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අප්පහීනෙ සමනුපස්සන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ අස්සඛලුඞ්කස්ස කිඤ්චාපි එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: අහො වත මං මනුස්සා ආජානීයට්ඨානෙ ඨපෙය්‍යුං, ආජානීයභොජනඤ්ච භොජෙය්‍යුං, ආජානීයපරිමජ්ජනඤ්ච පරිමජ්ජෙය්‍යුන්ති''. අථ ඛො නං මනුස්සා න චෙව ආජානීයට්ඨානෙ ඨපෙන්ති, න ච ආජානීයභොජනං භොජෙන්ති, න ච ආජානීයපමරිජ්ජනං පරිමජ්ජන්ති. තං කිස්ස හෙතු: තථා හිස්ස භික්ඛවෙ විඤ්ඤූ මනුස්සා තානි සාඨෙය්‍යානි, කූටෙය්‍යානි ජිම්හෙය්‍යානි වඞ්කෙය්‍යානි අප්පහීනානි සමනුපස්සන්ති. එවමෙව ඛො භික්ඛවෙ එවරූපස්ස භික්ඛුනො කිඤ්චාපි එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: ''අහො වත මං සබ්‍රහ්මචාරී සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං මානෙය්‍යුං පූජෙය්‍යුන්ති''. අථ ඛො නං සබ්‍රහ්මචාරී න චෙව සක්කරොන්ති, න ගරුකරොන්ති, න මානෙන්ති, න පූජෙන්ති. තං කිස්ස හෙතු: තථා හිස්ස භික්ඛවෙ විඤ්ඤූ සබ්‍රහ්මචාරී තෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අප්පහීනෙ සමනුපස්සන්ති.

1. ඉධ පන භික්ඛවෙ භික්ඛු න අධිකරණිකො හොති, අධිකරණසමථස්ස වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු න අධිකරණිකො හොති, අධිකරණසමථස්ස වණ්ණවාදී, අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය භාවනාය සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

9. තවද මහණෙනි, මහණ පිළිසලන නැතියේ පිළිසලනෙහි ගුණ නොකියන සුලු වෙයි. මහණෙනි යම් හෙයෙකින් මහණ පිළිසලන ඇතියේ පිළිසලනෙහි ගුණ නොකියන සුලු වේ නම් මෙ දහමුදු ප්‍රිය භාවය පිණිස ... එකී භාවය පිණිස නො වැටේ.

10. තවද මහණෙනි, මහණ සබ්‍රම්සරනට පටිසන්ථාර නැතියේ පටිසන්ථාරයෙහි ගුණ නො බණන සුලු වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මහණ පටිසන්ථාර නැතියේ පටිසන්ථාරයෙහි ගුණ නො බණන සුලු වේනම් මෙ දහමුදු ප්‍රිය භාවය පිණිස ... එකී භාවය පිණිස නො වැටේ.

මහණෙනි, මෙබඳු මහණහට මෙබඳු ඉච්ඡාවක් උපදනේ ය: ''සබ්‍රම්සරහු ඉදින් මට සත්කාර කෙරෙත් නම් ගුරුකාර කෙරෙත් නම් බුහුමන් කෙරෙත් නම් පුදත් නම් අහෝ ඉතා මැනවැ''යි. එහෙත් සබ්‍රම්සරහු නොම සත්කාර කරත්, නොම ගුරුකාර කරත්, නොම බුහුමන් කරත්, නොම පුදත්. ඒ කවර හෙයින යත්:

එසේ මැයි, මහණෙනි, පින්වත් සබ්‍රම්සරහු ඔහුගේ අප්‍රහීණවූ ඒ පාප අකුශල ධර්‍මයන් දක්නාහු ය.

මහණෙනි, යම් පරිදි අස්ගුණ්ඩයක්හට මෙබඳු ඉච්ඡායෙක් උපදනේ ය: මිනිස්හු මා ආජානෙය ස්ථානයෙහි තබත් නම් මැනැව, ආජානෙය භොජන ද වළඳවත් නම් මැනව, ආජානෙය පරිමාර්ජනද කරන්නාහු නම් මැනැවැ''යි එතෙකුදු වත් මිනිස්සු ඒ අස්ගුණ්ඩයා ආජානෙයස්ථානයෙහි නො තබන්නාහ. ආජානෙය භොජන නො ද වළඳවන්නාහ, ආජානෙය පරිමාර්ජනය නො ද කරන්නාහ. එ කවර හෙයින යත්: එසේ ම ය, මහණෙනි, නුවණැති මිනිස්හු ඔහුගේ අප්‍රහීණ ශඨබව් දූ කූඨබව්දූ ඉදූ නොවන බව් දූ වක් බව් දූ දක්නාහු ය (එහෙයිනි). මහණෙනි, එ පරිදිම මෙබඳු භික්ෂුහට ''යහ හ! සබ්‍රම්සරහු මා සත්කාර කරන්නාහු නම් ගුරු-කාර කරන්නාහු නම්, මානනා කරන්නාහු නම්, පූජනා කරන්නාහු නම් මැනවැ''යි. මෙබඳු ඉච්ඡායෙක් උපදනේ නමුදු ඔහුට සබ්‍රම්සරහු සත්කාර නො ද කරන්නාහ, ගුරුකාර නො ද කරන්නාහ, මානනා නොද කරන්-නාහ. පූජනා නො ද කරන්නාහ. එ කවර හෙයින යත්: එසේ ම ය, මහණෙනි, නුවණැති සබ්‍රම්සරහු ඔහුගේ අප්‍රහීණ පාප අකුසල ධර්‍මයන් දක්නාහුය. එ හෙයින.

1. මහණෙනි, මෙ සස්නෙහි මහණ අධිකරණ කාරක නො වෙයි. අධිකරණසමථය පිළිබඳ ගුණ බණන්නේ වෙයි: මහණෙනි, මහණ අධිකරණ කාරක නො වෙයි. අධිකරණසමථය පිළිබඳ ගුණ බණන්නේ වෙයි' යන යම් දහමෙක් ඇත් ද, මෙ දහම ද ප්‍රිය බවට ගුරුභාවයට භාවනාවට ශ්‍රමණධර්‍මයට එකී භාවයට වැටෙයි:

2. පුනචපරං භික්ඛවෙ භික්ඛු සික්ඛාකාමො හොති, සික්ඛාසමාදානස්ස වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු සික්ඛාකාමො සික්ඛාසමාදානස්ස වණ්ණවාදී, අයම්පි ධම්මො පියත්තාය -පෙ- එකීභාවාය සංවත්තති.

3. පුනචපරං භික්ඛවෙ භික්ඛු අප්පිච්ඡොහොති, ඉච්ඡාවිනයස්ස වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු අප්පිච්ඡොහොති, ඉච්ඡාවිනයස්ස වණ්ණවාදී. අයම්පි ධම්මො පියත්තාය -පෙ- එකීභාවාය සංවත්තති.

4. පුනචපරං භික්ඛවෙ භික්ඛු අක්කොධනො හොති, කොධවිනයස්ස වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු අක්කොධනො හොති, කොධවිනයස්ස වණ්ණවාදී, අයම්පි ධම්මො පියත්තාය -පෙ- එකීභාවාය සංවත්තති.

5. පුනචපරං භික්ඛවෙ භික්ඛු අමක්ඛී හොති, මක්ඛවිනයස්ස වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු අමක්ඛී හොති, මක්ඛවිනයස්ස වණ්ණවාදී, අයම්පි ධම්මො පියත්තාය -පෙ- එකීභාවාය සංවත්තති.

6. පුනචපරං භික්ඛවෙ භික්ඛු අසඨො හොති, සාඨෙය්‍යවිනයස්ස වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු අසඨො හොති, සාඨෙය්‍යවිනයස්ස වණ්ණවාදී, අයම්පි ධම්මො පියත්තාය -පෙ- එකීභාවාය සංවත්තති.

7. පුනචපරං භික්ඛවෙ භික්ඛු අමායාවී හොති, මායාවිනයස්ස වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු අමායාවී හොති, මායාවිනයස්ස වණ්ණවාදී අයම්පි ධම්මො පියත්තාය -පෙ- එකී භාවාය සංවත්තති.

8. පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මානං නිසාමකජාතියො හොති, ධම්මනිසන්තියා වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු ධම්මානං නිසාමකජාතියො හොති, ධම්මනිසන්තියා වණ්ණවාදී, අයම්පි ධම්මො පියත්තාය -පෙ- එකීභාවාය සංවත්තති.

9. පුනචපරං භික්ඛවෙ භික්ඛු පටිසල්ලීනො හොති, පටිසල්ලානස්ස වණ්ණවාදී, යම්පි භික්ඛවෙ භික්ඛු පටිසල්ලීනො හොති, පටිසල්ලානස්ස වණ්ණවාදී, අයම්පි ධම්මො පියත්තාය -පෙ- එකීභාවාය සංවත්තති.

2, තවද, මහණෙනි, අනෙකෙක්: මහණ ශික්ෂාකාම වෙයි, ශික්ෂා සමාදනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි, "මහණෙනි, මහණ ශික්ෂාකාම වෙයි, ශික්ෂාසමාදනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි" යන යම් දහමෙක් ඇත් ද, මේ දහම ද ප්‍රිය භාවයට ... එකී භාවයට වැටෙයි.

3. තවද මහණෙනි, අනිකෙක්; මහණ අල්පෙච්ඡ වෙයි, ඉච්ඡාවිනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි, "මහණෙනි, මහණ අල්පෙච්ඡ වෙයි, ඉච්ඡාවිනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි" යන යම් දහමෙක් ඇත් ද, මෙ දහම ද ප්‍රිය භාවයට ... එකී භාවයට වැටෙයි.

4. තවද මහණෙනි, අනිකෙක්; මහණ නො කිපෙන සුළු වෙයි, ක්‍රොධවිනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි, "මහණෙනි, මහණ නො කිපෙන සුලු වෙයි, ක්‍රොධවිනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි" යන යම් දහමෙක් ඇත්ද මේ දහම ද ප්‍රිය භාවයට ... එකී භාවයට වැටෙයි,

5. තවද මහණෙනි, අනෙකෙක්: මහණ ගුණමකු නො වෙයි, මකබවිනය පිළිබඳ ගුණබණන සුලු වෙයි. "මහණෙනි, මහණ ගුණමකු නො වෙයි. මකබවිනය පිළිබඳ ගුණ බණන්නේ වෙ යි" යන යම් දහමෙක් වේ ද, මෙ දහම ද ප්‍රිය භාවයට ... එකී භාවයට වැටෙයි.

6. තවද මහණෙනි, මහණ ශඨ නොවෙයි, ශඨභාවවිනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි, "මහණෙනි, මහණ, ශඨ නො වෙයි. ශඨභාවවිනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි" යන යම් දහමෙක් ඇත් ද, මෙ දහම ද ප්‍රිය භාවයට ... එකී භාවයට වැටෙයි.

7. තවද, මහණෙනි, අනිකෙක්: මහණ මායා නැතියේ වෙයි, මායා විනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි. "මහණෙනි, මහණ මායා නැතියේ වෙයි. මායාවිනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි" යන යම් දහ මෙක් ඇත් ද, මෙ දහම ද ප්‍රිය භාවයට ... එකී භාවයට වැටෙයි.

8. තවද මහණෙනි, අනෙකෙක්: මහණ නව ලොව්තුරා දහමුන් පිළිබඳ සොයන සැහැවි ඇතියේ වෙයි. ධර්මනිසාමනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි. "මහණෙනි, මහණ දහමුන් පිළිබඳ සොයන සැහැවි ඇතියේ වෙයි, ධම්මනිසාමනය පිළිබඳ ගුණ බණන්නේ වෙයි යන" යම් දහමෙක් ඇත් ද, මෙ දහම ද ප්‍රිය භාවයට ... එකී භාවයට වැටෙයි.

9. තවද මහණෙනි, අනෙකෙක්: මහණ පිළිසලන ඇතියේ වෙයි. පිළිසලන පිළිබඳ ගුණ බණන්නේ වෙයි, මහණෙනි, "මහණ පිළිසලන ඇතියේ වෙයි, පිළිසලන පිළිබඳ ගුණ බණන්නේ වෙයි" යන යම් දහමෙක් ඇත් ද, මෙ දහම ද ප්‍රිය භාවයට –පෙ– එකී භාවයට වැටෙයි.

10. පුනචපරං භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීනං පටිසන්ථාරකො හොති, පටිසන්ථාරකස්ස වණ්ණවාදී. යම්පි භික්ඛවෙ භික්ඛු පටිසන්ථාරකො හොති, පටිසන්ථාරකස්ස වණ්ණවාදී, අයම්පි ධම්මො පියත්තාය ගරුත්තාය-භාවනාය, සාමඤ්ඤාය එකීභාවාය සංවත්තති.

එවරූපස්ස භික්ඛවෙ භික්ඛුනො කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය, "අහො වත මං සබ්‍රහ්මචාරී සක්කරෙය්‍යුං ගරුකරෙය්‍යුං, මානෙය්‍යුං පූජෙය්‍යුන්ති". අථ ඛො නං සබ්‍රහ්මචාරී සක්කරොන්ති, ගරුකරොන්ති, මානෙන්ති, පූජෙන්ති, තං කිස්ස හෙතු: තථා හිස්ස භික්ඛවෙ විඤ්ඤූ සබ්‍රහ්ම-චාරී තෙ පාපකෙ අකුසලෙ ධම්මෙ පහීනෙ සමනුපස්සන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ භද්දස්ස අස්සාජානීයස්ස කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: "අහො වත මං මනුස්සා ආජානීයට්ඨානෙ ඨපෙය්‍යුං ආජානීය-භොජනඤ්ච භොජෙය්‍යුං, ආජානීයපරිමජ්ජනඤ්ච පරිමජ්ජෙය්‍යුන්ති", අථ ඛො නං මනුස්සා ආජානීයට්ඨානෙ ඨපෙන්ති, ආජානීයභොජනඤ්ච භොජෙන්ති, ආජානීයපරිමජ්ජනඤ්ච පරිමජ්ජන්ති. තං කිස්ස හෙතු: තථා හිස්ස භික්ඛවෙ විඤ්ඤූ මනුස්සා තානි සාඨෙය්‍යානි කූටෙය්‍යානි ජිම්හෙය්‍යානි වඞ්කෙය්‍යානි පහීනානි සමනුපස්සන්ති.

එවමෙව ඛො භික්ඛවෙ එවරූපස්ස භික්ඛුනො කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: "අහො වත මං සබ්‍රහ්මචාරී සක්කරෙය්‍යුං, ගරුකරෙය්‍යුං, මානෙය්‍යුං, පූජෙය්‍යුන්ති", අථ ඛො නං සබ්‍රහ්මචාරී සක්කරොන්ති, ගරු-කරොන්ති, මානෙන්ති, පූජෙන්ති තං කිස්ස හෙතු: තථා හිස්ස භික්ඛවෙ විඤ්ඤූ සබ්‍රහ්මචාරී තෙ පාපකෙ අකුසලෙ ධම්මෙ පහීනෙ සමනුපස්සන්තීති.

## 10. 2. 4. 8

## අක්කොසක සුත්තං

[සාවත්ථි]

යො සො භික්ඛවෙ භික්ඛු අක්කොසක පරිභාසකො අරියූපවාදී සබ්‍රහ්ම-චාරීනං, අට්ඨානමෙතං අනවකාසො[1] යං සො දසන්නං බ්‍යසනානං අඤ්ඤ-තරං බ්‍යසනං න නිගච්ඡෙය්‍ය. කතමෙසං දසන්නං:

1. ඨානමෙතං අවකාසො යං සො දසන්නං බ්‍යසනානං අඤ්ඤතරං බ්‍යසනං නිගච්ඡෙය්‍ය-මජ්ඣං

10. තවද මහණෙනි, අනෙකෙක්: මහණ සබ්‍රම්සරුන් පිළිබඳ පිළිසඳර ඇතියේ වෙයි. පිළිසඳර පිළිබඳ ගුණ බණන්නේ වෙයි. මහණෙනි "මහණ පිළිසඳර ඇතියේ වෙයි. පිළිසඳර පිළිබඳ ගුණ බණන්නේ වෙයි" යන යම් දහමෙක් ඇත් ද, මෙ දහම ද ප්‍රිය භාවයට ගුරුභාවයට භාවනාවට ශ්‍රමණධර්මයට එකී භාවයට වැටෙයි.

මහණෙනි, මෙවන් භික්ෂුහට "මට සබ්‍රම්සරහු සත්කාර කරන්නාහු නම්, ගුරුකාර කරන්නාහු නම් මානනා කරන්නාහු නම් පූජනා කරන්නාහු නම් මැනවැ"යි මෙවන් ඉච්ඡායෙක් නූපදනේ නමුදු ඔහට සබ්‍රම්සරහු සත්කාර කරන්නාහ, ගුරුකාර කරන්නාහ, මානනා කරන්නාහ. පූජනා කරන්නාහ, එ කවර හෙයින යත්: මහණෙනි, එසේ මැයි නුවණැති සබ්‍රම්සරහු ඔහුගේ ඒ පාප අකුශල ධර්මයන් දක්නාහ,

මහණෙනි, යම් පරිදි භද්‍ර අශ්වාජානෙයහට "මිනිස්සු මා ආජානෙයස්ථානයෙහි තබන්නාහු නම්, ආජානෙය භොජන ද වළඳවත් නම්, ආජානෙයපරිමාර්ජනා කරන්නාහු නම් ඉතා මැනවැ"යි යන මෙබඳු ඉච්ඡායෙක් නූපදනේ නමුදු මිනිස්හු ඔහු ආජානෙයස්ථානයෙහි තබන්නාහ, ආජානෙයභොජන ද වළඳවන්නාහ, ආජානෙය පරිමාර්ජනය ද කරන්නාහ. එ කවර හෙයින යත්: මහණෙනි, එ එසේ මැ යි නුවණැති මිනිස්හු ඔහුගේ ඒ ප්‍රහීණ ශඨ බව්, කුළ බව්, ඉදු නොවන බව් වක් බව් දක්නාහ. එහෙයිනි.

මහණෙනි, එපරිදි ම මෙවන් මහණහට "සබ්‍රම්සරහු මට සත්කාර කරන්නාහු නම්, ගුරුකාර කරන්නාහු නම්, මානනා කරන්නාහු නම් පූජනා කරන්නාහු නම් ඉතා මැනවැ"යි මෙබඳු ඉච්ඡායෙක් නූපදනේ ය. එ කවර හෙයින යත්: මහණෙනි, එසේමැ යි, නුවණැති සබ්‍රම්සරහු ඔහුගේ ඒ ප්‍රහීණ පාප අකුශල ධර්මයන් දක්නාහ. එහෙයිනැ"යි.

## 10. 2. 4. 8
## අක්කොසක සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, යම් මහණෙක් සබ්‍රම්සරුනට අක්කොස පරිභාස කරන්නෙන් වේද, ආර්යොපවාද කරන්නේ වේ ද, යම් හෙයෙකින් හේ දශවිධ ව්‍යශනයන් අතුරෙන් අන්‍යතර ව්‍යශනයකට නො යන්නේ ය යන තෙල නො කරුණෙක, වන්නට අවකාශ ද නැත. කවර දශ දෙනෙකුන් අතුරින යත්:

අනධිගතං නාධිගච්ඡති, අධිගතා පරිහායන්ති, සද්ධම්මස්ස න වොදායන්ති.[1] සද්ධම්මෙසු වා අධිමානිකො හොති, අනභිරතො වා බ්‍රහ්මචරියං චරති, අඤ්ඤතරං වා සඞ්කිලිට්ඨං ආපත්තිං ආපජ්ජති, ගාළ්හං වා රොගාතඞ්කං ඵුසති, උම්මාදං වා පාපුණාති චිත්තක්ඛෙපං, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

යො සො භික්ඛවෙ භික්ඛු අක්කොසකපරිභාසකො අරියූපවාදී සබ්‍රහ්මචාරීනං. ඨානමෙතං අවකාසො, යං සො ඉමෙසං දසන්නං බ්‍යසනානං අඤ්ඤතරං බ්‍යසනං නිගච්ඡෙය්‍යාති.

## 10. 2. 4. 9
## කොකාලික සුත්තං

[සාවත්ථි]

අථ ඛො කොකාලිකො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කොකාලිකො භික්ඛු භගවන්තං එතදවොච: ''පාපිච්ඡා භන්තෙ සාරිපුත්තමොග්ගල්ලානා, පාපිකානං ඉච්ඡානං වසං ගතා''ති.

මා හෙවං කොකාලික, මා හෙවං කොකාලික, පසාදෙහි කොකාලික සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං, පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.

දුතියම්පි ඛො කොකාලිකො භික්ඛු භගවන්තං එතදවොච: ''කිඤ්චාපි මෙ භන්තෙ භගවා සද්ධායිකො පච්චයිකො, අථ ඛො පාපිච්ඡාව සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතා''ති.

මා හෙවං කොකාලික මා හෙවං කොකාලික, පසාදෙහි කොකාලික සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං, පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.

1. න වොදයන්ති මජසං, න වොදනන්ති සීමු.

අනධිගත දහම් නොලබන්නේ ය, අධිගත දහමින් පිරිහෙන්නේ ය, ශාසනසද්ධර්මයෝ ඔහුගේ ව්‍යවදානයට නො යෙති. සද්ධර්මයෙහි අධිමානික හෝ වෙයි, අනභිරත වැ සසුන් බඹසර කෙරෙයි, එක්තරා සකිලිට් ඇවැතකට හෝ අවදනේ වෙයි, දැඩි රෝගාතඞ්කයක් හෝ ස්පර්ශ කරයි, චිත්තවික්ෂේප සඞ්ඛ්‍යාත උමතුවට හෝ පැමිණෙයි. සම්මූඪ ව කලුරිය කෙරෙයි. කාබුන් මරණින් මතුයෙහි අපාය දුර්ගති විනිපාත සඞ්ඛ්‍යාත නිරයට එළඹේ.

මහණෙනි, යම් ඒ මහණෙක් සබ්‍රම්සරුනට ආක්‍රොශ හා පරිභාෂ කරන්නේ වේ ද, ආර්යෝපවාද කරන්නේ වේ ද, හේ තෙල දශව්‍යශන-යන් අතුරින් අන්‍යතරව්‍යශනයකට පැමිණෙන්නේ ය යන යමෙක් ඇත් ද තෙල කරුණ ඇති.

## 10. 2. 4. 9
## කොකාලික සූත්‍රය

**[සැවැත්]**

එසඳ කොකාලික මහණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹිණ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හිත. එකත්පසෙක හුන් කෝකාලික මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය. ''වහන්ස, සැරියුත් මුගලන්හු පාපෙච්ඡයහ. පාපඉච්ඡාවන්ගේ වශයට ගියහ''යි.

කොකාලිකය, නහමක් මෙසේ කිය, කොකාලිකය, නහමක් මෙසේ කිය, කොකාලිකය, සැරියුත් මුගලනුන් කෙරෙහි සිත පහදව, සැරියුත් මුගලන්හු පෙශලයහ යි.

කොකාලික මහණ දෙවනවට ද භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය: ''වහන්ස, මා හට භාග්‍යවතුන් වහන්සේ ශ්‍රද්ධාව එළවත් නමුදු ප්‍රත්‍යයික වෙත් නමුදු සැරියුත් මුගලන්හු පාපෙච්ඡයහ. පාපඉච්ඡාවන්ගේ වශයට ගියහ'යි.

''කොකාලිකය, නහමක් මෙසේ කිය, කොකාලිකය, නහමක් මෙසේ කිය, කොකාලිකය, සැරියුත් මුගලනුන් කෙරෙහි සිත පහදව, සැරියුත් මුගලන්හු පෙශලයහ''යි.

තතියම්පි ඛො[1] කොකාලිකො භික්ඛු භගවන්තං එතදවොච: කිඤ්චාපි මෙ භන්තෙ භගවා සද්ධායිකො පච්චයිකො අථ ඛො පාපිච්ඡාව සාරිපුත්ත-මොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතා''ති.

මා හෙවං කොකාලික, මා හෙවං කොකාලික, පසාදෙහි කොකාලික සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං, පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.

අථ ඛො කොකාලිකො භික්ඛු උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අචිරපක්කන්තස්සෙව කොකාලිකස්ස භික්ඛුනො සාසපමත්තාහි පිළකාහි සබ්බො කායො ඵුටො අහොසි. සාසපමත්තියො හුත්වා මුග්ගමත්තියො අහෙසුං. මුග්ගමත්තියො හුත්වා කලායමත්තියො අහෙසුං. කලායමත්තියො හුත්වා කොලට්ඨිමත්තියො අහෙසුං. කොලට්ඨි-මත්තියො හුත්වා කොලමත්තියො අහෙසුං, කොලමත්තියො හුත්වා ආමලකමත්තියො අහෙසුං. ආමලකමත්තියො හුත්වා බෙලුවසලාටු-කමත්තියො අහෙසුං. බෙලුවසලාටුකමත්තියො හුත්වා බිල්ලමත්තියො අහෙසුං. බිල්ලමත්තියො හුත්වා පභිජ්ජිංසු. පුබ්බඤ්ච ලොහිතඤ්ච පග්ඝරිංසු. සචාසසුදං කදලිපත්තෙසු සෙති මච්ඡොව විසගිලිතො.

අථ ඛො තුදු පච්චෙක බ්‍රහ්මා[2] යෙන කොකාලිකො භික්ඛු තෙනුප-සඞ්කමි, උපසඞ්කමිත්වා වෙහාසෙ ඨත්වා කොකාලිකං භික්ඛුං එතදවොච: ''පසාදෙහි කොකාලික සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං, පෙසලා සාරි-පුත්ත මොග්ගල්ලානා''ති.

කොසි ත්වං ආවුසොති?

අහං තුදු පච්චෙකබ්‍රහ්මාති.

නනු ත්වං ආවුසො භගවතා අනාගාමී ව්‍යාකතො, අථ කිං චරහි ඉධාගතො? පස්ස යාවඤ්ච තෙ ඉදං අපරද්ධන්ති.

අථ ඛො තුදු පච්චෙකබ්‍රහ්මා කොකාලිකං භික්ඛුං ගාථාහි අජ්ඣභාසි:

1. පුරිසස්ස හි ජාතස්ස කුඨාරී ජායතෙ මුඛෙ,
   යාය ඡින්දති අත්තානං බාලො දුබ්භාසිතං භණං.

2. යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
   විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති.

---

1. තතියම්පි ඛො භික්ඛවෙ – මජසං.
2. තුරූපච්චෙක බ්‍රහ්මා – මජසං. තුදිපච්චෙකබ්‍රහ්මා – සයා.

කොකාලික මහණ තෙවනවට ද භාග්‍යවතුන්වහන්සේට මෙල සැල කෙළේය: "වහන්ස, මාහට භාග්‍යවතුන් වහන්සේ ශ්‍රද්ධාව එළවත් නමුදු ප්‍රත්‍යයික වෙත් නමුදු වැලිත් සැරියුත් මුගලන්හු පාපෙච්ඡයහ, පාපඉච්ඡා-වන්ගේ වශයට ගියහ"යි,

"කොකාලිකය, නහමක් මෙසේ කිය, කොකාලිකය, නහමක් මෙසේ කිය, කොකාලිකය සැරියුත් මුගලනුන් කෙරෙහි සිත පහදව, සැරියුත් මුගලන්හු පෙශලයහ"යි.

ඉක්බිති කොකාලික මහණ හුනස්නෙන් නැග භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියේය. බැහැර ගිය නොබෝ කල් ඇත්තා වූම කොකාලික මහණ හුගේ හැම කය සර්ෂපමාත්‍ර වූ පොළින් පැතුරුනේ විය. (ඒ පොළ) සර්ෂපමාත්‍ර ව මුද්ගමාත්‍ර විය. මුද්ගමාත්‍රික ව කඩල ඇට පමණැති විය. කඩලැට පමණැතිව ඩෙබරට පමණැති විය. ඩෙබරට පමණ ව කොල මාත්‍රික විය, කොල මාත්‍රික ව ආමලක මාත්‍රික වූහ. ආමලක මාත්‍රිකව තරුණ බිල්වඵලමාත්‍රික විය. තරුණ බිල්වඵලමාත්‍රික ව බිල්ව මාත්‍රික විය. බිල්ව මාත්‍රික ව බිඳිණ. පූයා හා ලේ වගුලේය, හේ විසගිලි මස්සකු සෙයින් කේල්පත්හි හෝනේ ය.

එකල්හි තුදු පච්චෙකබ්‍රහ්ම කොකාලික කරා එළැඹියේ ය. එළැඹ අහස්හි සිට කොකාලික මහණහට මෙල කීය; "කොකාලිකය, සැරියුත් මුගලනුන් කෙරෙහි සිත පහදව, සැරියුත් මුගලන්හු පෙශලයහ"යි.

ඇවැත්නි, තෝ කවරෙක් වෙහි යි?

"මම තුදු පච්චෙකබ්‍රහ්ම වෙමි"යි

ඇවැත්නි, තෝ භාග්‍යවතුන් වහන්සේ විසින් අනාගාමී ව්‍යාකෘත නො වෙහි ද? වැලි දූන් කවර හෙයින් මෙහි ආයෙහි දැයි. යම්තාක් මෙය තාගේ අපරාධ වේ ද ඒ තාක් දකුව"යි.

එසඳ තුදු පච්චෙකබ්‍රහ්ම කොකාලික මහණ හට ගාථායෙන් කීය:

1. බාලතෙම දුබැසිබණන්නේ යම් පරොස් බස් සඞ්ඛ්‍යාත අවියෙකින් තමා සිඳුනේ නම්, උපන් පුරුෂයාගේ මුවෙහි පරොස් බස් නමැති කුඨාරිය උපදනේ මැයි.

2. යමෙක් නින්‍දාර්හයා පසස්නේ ද යමෙක් ප්‍රශංසාර්හ වේනම් ඔහුට හෝ නින්ද කරණේ ද, හේ මුවින් අපරාධ රැස්කරණේය, ඒ අපරාධයෙන් සුව නො විඳුනේය.

3. අප්පමත්තො[1] අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො[2] කලි
යො සුගතෙසු මනං පදොසයෙ[3]

4. සතං සහස්සානං නිරබ්බුදානං, ඡත්තිංසති පඤ්ච ච අබ්බුදානි
යමරියගරහී නිරයං උපෙති, වාචං මනඤ්ච පණිධාය පාපකන්ති''.

අථ ඛො කොකාලිකො භික්ඛු තෙනෙව ආබාධෙන කාලමකාසි, කාලකතො ච කොකාලිකො භික්ඛු පදුමනිරයං උපපජ්ජි සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වා.

අථ ඛො බ්‍රහ්මා සහම්පති අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතො ඛො බ්‍රහ්මා සහම්පති භගවන්තං එතදවොච: ''කොකාලිකො භන්තෙ භික්ඛු කාලකතො, කාලකතො ච භන්තෙ කොකාලිකො භික්ඛු පදුමනිරයං උපපන්නො සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වා''ති. ඉදමවොච බ්‍රහ්මා සහම්පති, ඉදං වත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි. ඉමං භික්ඛවෙ රත්තිං බ්‍රහ්මා සහම්පති අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි.

එකමන්තං ඨිතො ඛො භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති මං එතදවොච: ''කොකාලිකො භන්තෙ භික්ඛු කාලකතො, කාලකතො ච භන්තෙ කොකාලිකො භික්ඛු පදුමනිරයං උපපන්නො, සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වා''ති. ඉදමවොච භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

ඒවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: ''කීව දීඝං නු ඛො භන්තෙ පදුමෙ නිරයෙ ආයුප්පමාණන්ති''. දීඝං ඛො භික්ඛු පදුමෙ නිරයෙ ආයුප්පමාණං, න තං සුකරං සඞ්ඛාතුං ''එත්තකානි වස්සානී''ති වා ''එත්තකානි වස්සසතානී''ති වා ''එත්තකානි වස්සසහස්සානී''ති වා ''එත්තකානි වස්ස සතසහස්සානී''ති වාති.

1. අප්පමත්තකො – මජසං.
2. මහන්තතරො – මජසං.
3. පදුසයෙ – මජසං.

3. ද්‍යූත ක්‍රීඩාවන්හි ලා තමා හා යම් සියලු ධනපරාජයෙක් වේ නම්, මේ අපරාධය අල්පමාත්‍ර වෙයි. යමෙක් සම්‍යක් ගතයන් කෙරෙහි සිත ප්‍රද්විෂ්ට කෙරේ නම්, මෙය ම මහත්තර අපරාධ වෙයි,

4. යම් හෙයෙකින් පාපක වූ වාන්මනස් පිහිටුවා ආර්‍ය්‍යයන් ගරහනුයේ වේ ද, හේ නිබ්බුද ගණනින් එක්දහස් එක්සිය සතිසෙක් ද, අබ්බුද පසෙක් ද යි මෙතෙක් කාලමානයක් නිරයට එළඹෙයි.

එක්බිති කොකාලික මහණ ඒ ආබාධයෙන් ම මෙළේය. කලුරිය කළ කොකාලික මහණ සැරියුත් මුගලනුන් කෙරෙහි සිත් සටා පදුම නිරයෙහි උපන.

එක්බිති සහම්පති බඹ මධ්‍යම රාත්‍රියෙහි විශිෂ්ට ඡවිවර්ණ ඇතියේ සකල ජේතවනය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹිණ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙකැ සිට ගත, එකත් පසෙකැ සිටි සහම්පතී බඹ භාග්‍යවතුන් වහන්සේට තෙල බස් සැළ කෙළේය: ''වහන්ස, කොකාලික මහණ මෙළේය. වහන්ස, මළ කොකාලික මහණ සැරියුත් මුගලනුන් කෙරෙහි සිත් දූෂ්‍ය කොට සටා පදුම නිරයට එළැඹිණැ''යි සහම්පතී බඹ මෙබස් කීය. මෙ බස් කියා භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට එ දෙව්රම් හි ම අතුරුදහන් කෙළේය.

එක්බිති භාග්‍යවතුන් වහන්සේ එ රැ ගෙවීමෙන් මහණුන් ඇමතූ සේක. මහණෙනි, මෙ රැ සහම්පතී බඹ මධ්‍යම රාත්‍රියෙහි විශිෂ්ට ඡවිවර්ණ ඇතියේ සකල ජේතවනය බබුළුවා මා කරා එළැඹිණ. එළැඹ මා සකසා වැඳ එකත්පස්ව සිටියේ ය.

මහණෙනි, එකත්පසෙක සිටි සහම්පතී බඹ මට තෙල බස් සැල කෙළේය: ''වහන්ස, කොකාලික මහණ මෙළේය. වහන්ස, කලුරිය කළ කොකාලික මහණ සැරියුත් මුගලනුන් කෙරෙහි සිත් ප්‍රදූෂ්‍ය කොට සටා පදුම නිරයට එළැඹිණැ''යි, මහණෙනි, සහම්පතී බඹ මෙය කීය. මෙය කියා මා සකසා වැඳ පැදකුණු කොට එ දෙව්රම්හි ම අතුදන් කෙළේ''යි.

මෙසේ වදළ කල්හි අන්‍යතර මහණෙක් භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේය: ''වහන්ස, පදුම නිරයෙහි ආයුෂ් ප්‍රමාණය කෙතෙක් කල් වේ ද?''යි. ''මහණ, පදුම නිරයෙහි ආයුස්ප්‍රාමාණය දීර්ඝය, එය ''මෙතෙක් වර්ෂයහ''යි හෝ 'මෙතෙක් වර්ෂශතයෙකැයි' හෝ ''මෙතෙක් වර්ෂ සහස්‍රයෙකැ''යි හෝ මෙතෙක් වර්ෂ ශත සහස්‍රයෙකැ''යි හෝ ගණන්නට සුකර නො වේ''යි.

සක්කා පන භන්තෙ උපමං කාතුන්ති.

"සක්කා භික්ඛූ"ති භගවා අවොච.

සෙය්‍යථාපි භික්ඛු වීසතිඛාරිකො කොසලකො තිලවාහො, තතො පුරිසො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන එකමෙකං තිලං උද්ධරෙය්‍ය, ඛිප්පතරං ඛො සො භික්ඛු වීසතිඛාරිකො කොසලකො තිලවාහො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, නත්වෙව එකො අබ්බුදො නිරයො.

සෙය්‍යථාපි භික්ඛු වීසති අබ්බුද නිරයා එවමෙකො නිරබ්බුදො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති නිරබ්බුද නිරයා එවමෙකො අබබො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසතිඅබබා නිරයා එවමෙකො අහහො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති අහහා නිරයා එවමෙකො අටටො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති අටටා නිරයා එවමෙකො කුමුදො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති කුමුද නිරයා එවමෙකො සොගන්ධිකො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසතිසොගන්ධිකා නිරයා එවමෙකො උප්පලකො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති උප්පලකා නිරයා එව මෙවකො පුණ්ඩරීකො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති පුණ්ඩරීකා නිරයා එවමෙකො පදුමො නිරයො. පදුමං ඛො පන භික්ඛු නිරයං කොකාලිකො භික්ඛු උපපන්නො සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වාති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

1. පුරිසස්ස හි ජාතස්ස කුඨාරී ජායතෙ මුඛෙ,
යාය ඡින්දති අත්තානං බාලො දුබ්භාසිතං භණං.

2. යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති.

වහන්ස, උවමක් කළ හැකි''දැ?යි,

''මහණ, හැකැ''යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

මහණ, යම් සේ කොශල දෙශයෙහි වූ විසිකිරියක් ඇති තලගැළක් වේ නම්, පුරුෂයෙක් වර්ෂශතයක්හුගේ වර්ෂ ශතයක්හුගේ ඇවෑමෙන් එයින් එක් එක් තලැටක් නංවා ගන්නේ නම් මහණ, විසිකිරියක් ඇති ඒ මාගධක තල ගැළ මේ උපක්‍රමයෙන් ක්ෂිප්‍රතර ව පරික්ෂයට පයර්‍යාදනයට යන්නේ ය. එක් අර්වුද නිරයෙක් (පරික්ෂයට) නොයේ මැ යි.

මහණ යම් සෙයින් විංශත් අර්වුද නිරයෝ වෙත් නම්, එක් නිරර්වුද නිරයෙක් මෙබඳු වෙයි: මහණ, යම් සෙයින් විංශත් නිරර්වුද නිරයෝ වෙත් නම් එක් අබබ නිරයෙක් මෙබඳු වෙයි. මහණ, යම් සෙයින් විංසති අබබ නිරයෝ වෙත් නම්, එක් අහහ නිරයෙක් මෙබඳු වෙයි. මහණ යම් සෙයින් විංසති අහහනිරයෝ වෙත් නම් එක් අටට නිරයෙක් මෙබඳු වෙයි. මහණ, යම් සෙයින් විංසති අටට නිරයෝ වෙත් නම් එක් කුමුද නිරයෙක් මෙබඳු වෙයි. මහණ, යම්සෙයින් විංසති කුමුද නිරයෝ වෙත් නම්, එක් සෞගන්ධික නිරයෙක් එබඳු වෙයි, මහණ යම් සෙයින් විංශත් සෞගන්ධික නිරයෝ වෙත් නම්, එක් උත්පලක නිරයෙක් මෙබඳු වෙයි. මහණ යම් සෙයින් විංශත් උත්පලක නිරයෝ වෙත් නම් එක් පුණ්ඩරීක නිරයෙක් මෙබඳු වෙයි. මහණ යම් සෙයින් විංසති පුණ්ඩරීක නිරයෝ වෙත් නම් එක් පදුම නිරයෙක් මෙබඳු වෙයි. මහණ සැරියුත් මුගලනුන් කෙරෙහි සිත් ප්‍රදූෂ්‍ය කොට සටා කොකාලික මහණ පදුම නිරයට එළැඹිණැ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. මෙය වදරා ශාස්තෘ වූ සුගතයන් වහන්සේ අනතුරුව තෙල ගාථා වදාළ සේක:

1. දු බැසි බණන බාල තෙම යමෙකින් තමා සිඳුනේ නම් (එබඳු) කුඨාරියෙක් උපන් පුරුෂයාගේ මුවෙහි උපදනේ ය.

2. යමෙක් නින්ද්‍යයකු පසස්නේ ද, යමෙක් හෝ ප්‍රශංසාර්හ වේ නම් ඔහට නින්‍දා හෝ කෙරේ නම්, හේ මුවින් අපරාධ කරණේය. ඒ අපරාධ හෙතුයෙන් සුඛ නො විඳුනේ ය.

3. අප්පමත්තො අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො කලි
යො සුගතෙසු මනං පදොසයෙ.

4. සතං සහස්සානං නිරබ්බුදනං, ඡත්තිංසති පඤ්ච ච අබ්බුදනි
යමරියගරහී නිරයං උපෙති, වාචං මනඤ්ච පණිධාය පාපකන්ති.

## 10. 2. 4. 10

## ඛීණාසවබල සුත්තං

**[සාවත්ථි]**

අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සාරිපුත්තං භගවා එතදවොච: "කති නු ඛො සාරිපුත්ත ඛීණාසවස්ස භික්ඛුනො බලානි, යෙහි බලෙහි සමන්නාගතො ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති 'ඛීණා මෙ ආසවා'ති".

දස භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො බලානි, යෙහි බලෙහි සමන්නාගතො ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති "ඛීණා මෙ ආසවා"ති.

කතමානි දස:

1. ඉධ භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති.

යම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති. ඉදම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති "ඛීණා මෙ ආසවා"ති.

2. පුන ච පරං භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති. යම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, ඉදම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති "ඛීණා මෙ ආසවා"ති.

3. ද්‍යුතක්‍රීඩාවන්හි ලා තමා හා යම් මුලු ධන පරාජයෙක් වේ නම්, මේ අපරාධය අල්පමාත්‍ර වෙයි.

සම්‍යක් ගතයන් කෙරෙහි යමෙක් සිත ප්‍රද්විෂ්ට කෙරේ නම් මෙය ම මහත්තර අපරාධය වෙයි. හේ

4. පාපක වාඬමනස් පිහිටුවා ආයඝියනට ගර්හා කරනුයේ යම් නිරයකට එළැඹේ නම්, හේ නිරර්වුද ගණනින් එක්දහස් එක්සිය සති-සෙක් ද අර්වුද පසෙක් ද යි මෙතෙක් කාලමානයෙක් ඔහට වේ යයි.

## 10. 2. 4. 10

## ඛීණාසවබල සූත්‍රය

**[සැවැත්]**

එසඳ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ ඇදුරු කොට වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක: ''ශාරිපුත්‍රයෙනි, යම් බලයන්ගෙන් සමන්වා-ගත ක්ෂීණාසුව මහණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවයන්ගේ ක්ෂය පිළිදන්නේ නම්, ක්ෂීණාස්‍රව මහණහුගේ එබඳු බල කෙතෙකැ?''යි.

වහන්ස, යම්බඳු බලකෙනෙකුන්ගෙන් සමන්වාගත ක්ෂීණාස්‍රව මහණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි පිළිදන්නේ නම් ක්ෂීණාස්‍රව මහණහුගේ එබඳු බල දස දෙනෙක.

කවර දස දෙනෙකයත්:

1. වහන්ස, මෙ සස්නෙහි ක්ෂීණාස්‍රව මහණහු විසින් සර්වසංස්කාරයෝ අනිත්‍ය විසින් ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥායෙන් සුදෘෂ්ට වෙත්,

වහන්ස, ක්ෂීණාස්‍රව භික්ෂුහු විසින් සර්වසංස්කාරයෝ අනිත්‍ය විසින් ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥයෙන් මොනොවට දක්නා ලදහ යන යමෙක් ඇත් ද, වහන්ස, යම් බලයකට පැමිණ ක්ෂීණාස්‍රව මහණ 'මා විසින් ආස්‍රවයෝ ක්ෂීණයහ'යි පිළිදන්නේ නම්, මෙ ද ක්ෂීණාස්‍රව භික්ෂුහුගේ බලයෙක.

2. තවද වහන්ස, අනෙකකි. ක්ෂීණාස්‍රව භික්ෂුහු විසින් කාමයෝ අඞ්ගාරකාසූපමයහ'යි ඇතිසැටියෙන් සම්‍යක් ප්‍රඥායෙන් මොනොවට දන්නා ලදහ. වහන්ස ක්ෂීණාස්‍රව මහණහු විසින් කාමයෝ ''අඞ්ගාර කාසූපමයහ''යි ඇතිසැටියෙන් සම්‍යක් ප්‍රඥයෙන් මොනොවට දන්නා ලදහ යන යමෙක් ඇත්නම් වහන්ස, යම් බලයකට පැමිණ ක්ෂීණාස්‍රව මහණ ''මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ප්‍රතිඥ කෙරේ නම්, මෙ ද ක්ෂීණාස්‍රව භික්ෂුහුගේ බලයෙක.

3. පුන ච පරං භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං වවකට්ඨං[1] නෙක්ඛම්මාභිරතං ව්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානියෙහි ධම්මෙහි. යම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං වවකට්ඨං නෙක්ඛම්මාභිරතං ව්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානියෙහි ධම්මෙහි, ඉදම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති, ''ඛීණා මෙ ආසවා''ති.

4. පුන ච පරං භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා. යම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා, ඉදම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති, ''ඛීණා මෙ ආසවා' ති.

5-10. පුනචපරං භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සම්මප්පධානා භාවිතා හොන්ති සුභාවිතා -පෙ- චත්තාරො ඉද්ධිපාද භාවිතා හොන්ති සුභාවිතා -පෙ- පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි -පෙ- පඤ්චබලානි භාවිතානි හොන්ති සුභාවිතානි. -පෙ- සත්තබොජ්ඣඞ්ගා භාවිතා හොන්ති සුභාවිතා. -පෙ- අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො. යම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො, ඉදම්පි භන්තෙ ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ''ඛීණා මෙ ආසවා''ති.

ඉමානි ඛො භන්තෙ දස ඛීණාසවස්ස භික්ඛුනො බලානි, යෙහි බලෙහි සමන්නාගතො ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ''ඛීණා මෙ ආසවා''ති.

## ථෙරවග්ගො චතුත්ථො.

**තත්‍රුද්දානං:**

බාහුනො ආනන්දො ච පුණ්ණියො ච බ්‍යාකරණං,
කත්ථී අඤ්ඤාධිකරණං කොකාලිකො ච බලානි චා[1] ති.

1. විවෙකට්ඨං, මජසං.
1. වාහනානන්දො පුණ්ණියො බ්‍යාකරං කත්ථීමානිකො, නපියකෙකා සකොකාලි ඛීණාසවබලෙනවාති - මජසං.

3. තවද වහන්ස, අනෙකෙකි; ක්ෂීණාස්‍රව භික්ෂුහුගේ සිත සර්වප්‍රකාරයෙන් ආස්‍රවස්ථානීය ධර්මයන්ගෙන් වාන්තවූයේ නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනේ කෙලෙසුන්ගෙන් දුරු වූයේ (ඵල සමාපත්තිවශයෙන්) නිර්වාණ විවෙකයට නැඹුරු වූයේ විවෙකප්‍රවණ වූයේ විවෙකප්‍රාග්භාර වූයේ වෙයි. වහන්ස, ක්ෂීණාස්‍රව භික්ෂුහුගේ චිත්තය ආස්‍රවයනට කරුණු වූ ක්ලේශ ධර්මයන් කෙරෙන් සර්වප්‍රකාරයෙන් විගතාන්තවූයේ නෛෂ්ක්‍රම්‍යාභිරත වූයේ කෙලෙසුන්ගෙන් දුරුවූයේ විවෙක නිම්න වූයේ විවෙකප්‍රවණවූයේ විවෙකප්‍රාග්භාරවූයේ වෙයි' යන යමෙක් ඇත්ද, වහන්ස, යම් බලයකට පැමිණ රහත් මහණ 'මාගේ ආශ්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවක්ෂයය ප්‍රතිඥා කෙරේ නම් වහන්ස, මෙ ද රහත් මහණහුගේ බලයෙක.

4. තවද වහන්ස, අනෙකකි. ක්ෂීණාස්‍රව මහණහු විසින් සතර සිව්වටන්හු බැවුනාහු මොනොවට බැවුනාහු වෙත්. වහන්ස, ''ක්ෂීණාස්‍රව භික්ෂුහු විසින් සතර සතිපට්ඨානයෝ වඩන ලද, මොනොවට වඩන ලදහ' යන යමෙක් ඇත් ද, යම් බලයකට පැමිණ රහත් මහණ 'මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවක්ෂයන්ගේ ක්ෂය පිළිදන්නේ නම්, වහන්ස, මෙ ද ක්ෂීණාස්‍රව භික්ෂුහුගේ බලයෙක.

5–10. තවද වහන්ස, අනෙකෙකි. ක්ෂීණාස්‍රව මහණහු විසින් සතර සම්‍යක් ප්‍රධානයෝ භාවිත සුභාවිත වෙති -පෙ- සතර ඍද්ධිපාදයෝ භාවිත සුභාවිත වෙති -පෙ- පඤ්චෙන්ද්‍රියයෝ භාවිත සුභාවිත වෙති -පෙ- පඤ්ච බලහු භාවිත සුභාවිත වෙති -පෙ- සප්ත බොධ්‍යඞ්ගයෝ භාවිත සුභාවිත වෙත්.-පෙ- ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය භාවිත සුභාවිත වේ. වහන්ස, ක්ෂීණාස්‍රව භික්ෂුහු විසින් අරිඅටඟිමඟ බැවිණ, මොනොවට බැවිණ යන යමෙක් ඇත් ද, වහන්ස, රහත් මහණ යම් බලයකට පැමිණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවයන් ගේ ක්ෂය පිළිදන්නේ නම්, මෙ ද රහත්මහණහුගේ බලයෙකි.

වහන්ස, යම් බලකෙනෙකුගෙන් සමන්වාගත රහත් මහණ මා විසින් ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවයන්ගේ ක්ෂයය ප්‍රතිඥා කෙරේ නම් ක්ෂීණාස්‍රව භික්ෂුහුගේ මේ ඒ දස බලයි.

**දස වැනි ඛීණාසවබල සූත්‍ර යි.**

## සතර වැනි ථෙර වග්ග යි.

**එහි උද්දානය:**

බාහුනය, ආනන්දය, පුණ්ණිය, ව්‍යාකරණය, කත්ථිය, අඤ්ඤය, අධිකරණය, කොකාලිකය, බලසූත්‍රයදැයි දසයෙකි.

## 10. 2. 5. 1

## කාමභොගී සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

දස ඉමෙ ගහපති කාමභොගී සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ දස.

1. ඉධ ගහපති එකච්චො කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන. අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන න අත්තානං සුඛෙති පීනෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති.

2. ඉධ පන ගහපති එකච්චො කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන. අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන අත්තානං සුඛෙති, පීනෙති, න සංවිභජති, න පුඤ්ඤානි කරොති.

3. ඉධ පන ගහපති එකච්චො කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන. අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන, අත්තානං සුඛෙති පීනෙති, සං විභජති, පුඤ්ඤානි කරොති.

4. ඉධ පන එකච්චො කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන පි අසාහසෙන පි. ධම්මාධම්මෙන භොගෙපරියෙසිත්වා සාහසෙන පි අසාහසෙන පි න අත්තානං සුඛෙති පීනෙති, න සංවිභජති, න පුඤ්ඤානි කරොති.

5. ඉධ පන ගහපති එකච්චො කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන පි. අසාහසෙන පි ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන පි අසාහසෙන පි අත්තානං සුඛෙති පීනෙති, න සං විභජති කරොති.

6. ඉධ පන ගහපති එකච්චො කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන පි අසාහසෙන පි ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන පි අසාහසෙන පි අත්තානං සුඛෙති පීනෙති, සං විභජති, පුඤ්ඤානි කරොති.

# 10. 2. 5. 1
## කාමභොගී සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඩු මහසිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි අනාථ පිණ්ඩික ගෘහපති තෙම භාග්‍යවතුන්වහන්සේ කරා එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් අනාථ පිණ්ඩික ගෘහපති හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

ගැහැවිය, මෙ ලොව්හි කාමභොගි හු දස දෙනෙක් විද්‍යමාන වෙත්. කවර දස දෙනෙකයත්:

1. ගැහැවිය, මෙලොව්හි එක් කාම භොගියෙක් අධර්මයෙන් සැහැසිකමින් භොග පර්යේෂණා කරණේය. අධර්මයෙන් සැහැසිකමින් භොග පර්යේෂණා කොට තමා නො සුවපත් කරන්නේය. නො පිනවන්නේය, සංවිභාග නො කරන්නේය, පින් නො කරන්නේ ය.

2. ගැහැවිය මෙලොව්හි එක් කාම භොගියෙක් අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග සොයනේය. අධර්මයෙන් සාහසිකකර්මයෙන් භොග සොයා තමා සුවපත් කරනේය, පිනවනුයේය, සංවිභාග නො කරනේය, පින් නො කරනේය.

3. ගැහැවිය මෙලොව්හි එක් කාමභොගියෙක් අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග සොයනේය. අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් කරනේය, පිනවන්නේය, සංවිභාග කරනේය, පින් කරනේය.

4. ගැහැවිය, මෙලොව්හි එක් කාමභොගියෙක් ධර්මාධර්මයෙන් සාහසයෙනුදු අසාහසයෙනුදු භොග සොයනේය. ධර්මාධර්මයෙන් සාහසයෙනුදු අසාහසයෙනුදු භොග සොයා තමා සුවපත් නො කරයි, නො පිනවයි, සංවිභාග නො කරයි, පින් නො කරයි.

5. ගැහැවිය, මෙ ලොව්හි එක් කාමභොගියෙක් ධර්මාධර්මයෙන් ද සාහසයෙන් ද අසාහසයෙන් ද භොග සොයා තමා සුවපත් කරයි, පිනවයි, සංවිභාග නො කරයි, පින් නො කරයි.

6. ගැහැවිය, මෙලොව්හි එක් කාමභොගියෙක් ධර්මාධර්මයෙනුදු සාහසයෙනුදු අසාහසයෙනුදු භොග සොයනේය, ධර්මාධර්මයෙනුදු සාහසයෙනුදු භොග සොයා තමා සුවපත් කරනේය, පිනවන්නේය, සංවිභාග කරනේය, පින්කරනේය.

7. ඉධ පන එකච්චො කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන. ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන න අත්තානං සුඛෙති පීනෙති, න සංවිභජති, න පුඤ්ඤානි කරොති.

8. ඉධ පන ගහපති එකච්චො කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති, අසාහසෙන. ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීනෙති, න සං විභජති, න පුඤ්ඤානි කරොති.

9. ඉධ පන ගහපති එකච්චො කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන. ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීනෙති, සංවිභජති, පුඤ්ඤානි කරොති. තෙ ච භොගෙ ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අනාදීනව දස්සාවී අනිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති.

10. ඉධ පන ගහපති එකච්චො කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන. ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීනෙති, සංවිභජති, පුඤ්ඤානි කරොති. තෙ ච භොගෙ අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති.

1. තත්‍ර ගහපති ය්වායං කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන, අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන, න අත්තානං සුඛෙති, පීනෙති, න සංවිභජති, න පුඤ්ඤානි කරොති, අයං ගහපති කාම–භොගී තිහි ඨානෙහි ගාරය්හො: 'අධම්මෙන භොගෙ පරියෙසති සාහ–සෙනා'ති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො. 'න අත්තානං සුඛෙති පීනෙතී'ති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො න සං විභජති, න පුඤ්ඤානි කරොතී'ති ඉමිනා තතියෙන ඨානෙන ගාරය්හො අයං ගහපති කාමභොගී ඉමෙහි තිහි ඨානෙහි ගාරය්හො.

7. ගැහැවිය මෙලොව්හි එක් කාමභොගියෙක් දැහැමින් නො සැහැසිකමින් භොගපර්යේෂණ කරනේය. දැමින් නො සැහැසිකමින් භොග-පර්යේෂණ කොට තමා සුවපත් නො කරනේය. නොපිනවන්නේය, සංවිභාග නො කරනේ ය, පින් නො කරනේ ය.

8. ගැහැවිය, මෙලොව්හි එක් කාමභොගියෙක් ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයනේ ය. ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් කරනේය, පිනවන්නේය, සංවිභාග නො කරනේය, පින් නො කරනේ ය.

9. ගැහැවිය, මෙලොව්හි එක් කාමභොගියෙක් ධර්මයෙන් අසාහසයෙන් භොග සොයන්නේය, ධර්මයෙන් අසාහසයෙන් භොග සොයා තමා සුවපත් කරයි, පිනවයි, සංවිභාග කරයි, පින් කරයි. (ලොභයෙන්) ග්‍රථිත වූයේ, මූර්ඡිතවූයේ, එහි බැස ගත්තේ ආදීනව නො දක්නා සුලුයේ නිඃසරණප්‍රඥ නැතියේ එ භොගයනුදු වළඳනේය.

10. ගැහැවිය, මෙලොව්හි එක් කාමභොගියෙක් ධර්මයෙන් අසාහසයෙන් භොග පර්යේෂණ කරයි. දැහැමින් නො සැහැසියෙන් භොග සොයා තමා සුවපත් කෙරෙයි, පිනවයි, සංවිභාග කෙරෙයි, පින් කරයි. ග්‍රථිත නො වූයේ මූර්ඡිත නො වූයේ, එහි නො බැස ගත්තේ ආදීනව දක්නා සුලුයේ නිඃසරණ ප්‍රඥ ඇතියේ වළඳනේ යි.

1. ගැහැවිය, එහි යම් කාම භොගියෙක් අදහමින් සැහැසිකමින් භොග සොයනේ නම්, අදහමින් සැහැසිකමින් භොග සොයා තමා සුවපත් නො කෙරේ නම්, නො පිනවා නම්, සංවිභාග නො කෙරේ නම්, පින් නො කෙරේ නම්, ගැහැවිය මෙ කාමභොගී තෙම තුන් කරුණෙකින් ගැරහිය යුත්තේ ය. 'අදහමින්, සැහැසිකමින් භොග පර්යේෂණ කරයි' යන මේ පළමු කරුණෙන් ගැරහිය යුත්තේ ය. තමා සුවපත් නො කෙරෙයි, නො පින වයි, යන මේ දෙවන කරුණෙන් ගැරහිය යුත්තේ ය. සංවිභාග නො කෙරෙයි, පින් නො කෙරෙයි යන මේ තුන්වන කරුණෙන් ගැරහිය යුත්තේ ය, ගැහැවිය, මෙ කාමභොගී පුරුෂ මෙතුන් කරුණෙන් ගැරහිය යුත්තේ ය.

2. තත්‍ර ගහපති යවායං කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන, අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන අත්තානං සුඛෙති, පීනෙති, න සං විභජති, න පුඤ්ඤානි කරොති, අයං ගහපති කාමභොගී ද්වීහි ඨානෙහි ගාරය්හො, එකෙන ඨානෙන පාසංසො. 'අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනා'ති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො. 'අත්තානං සුඛෙති පීනෙතී'ති ඉමිනා එකෙන ඨානෙන පාසංසො. 'න සං විභජති, න පුඤ්ඤානි කරොතී'ති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො. අයං ගහපති කාමභොගී ඉමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො. ඉමිනා එකෙන ඨානෙන පාසංසො.

3. තත්‍ර ගහපති යවායං කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති. සාහසෙන අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන අත්තානං සුඛෙති, පීනෙති, සං විභජති පුඤ්ඤානි කරොති. අයං ගහපති කාමභොගී එකෙන ඨානෙන ගාරය්හො, ද්වීහි ඨානෙහි පාසංසො. 'අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනා'ති ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. 'අත්තානං සුඛෙති පීනෙතී'ති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො. 'සංවිභජති පුඤ්ඤානි කරොතී'ති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. අයං ගහපති කාමභොගී ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. ඉමෙහි ද්වීහි ඨානෙහි පාසංසො.

4. තත්‍ර ගහපති යවායං කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන පි අසාහසෙන පි, ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන පි අසාහසෙන පි න අත්තානං සුඛෙති පීනෙති න සංවිභජති, න පුඤ්ඤානි කරොති, අයං ගහපති කාමභොගී එකෙන ඨානෙන පාසංසො, තීහි ඨානෙහි ගාරය්හො. 'ධම්මෙන භොගෙ භොගෙපරියෙසති අසාහසෙනා'ති ඉමිනා එකෙන ඨානෙන පාසංසො. 'අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනා'ති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො, 'න අත්තානං සුඛෙති පීනෙතී'ති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො. 'න සංවිභජති, න පුඤ්ඤානි කරොතී'ති ඉමිනා තතියෙන ඨානෙන ගාරය්හො. අයං ගහපති කාමභොගී ඉමිනා එකෙන ඨානෙන පාසංසො. ඉමෙහි තීහි ඨානෙහි ගාරය්හො.

2. ගැහැවිය, එහි යම් කාමභොගියෙක් අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග සොයා නම්, අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් කරයි නම්, පිනවා නම්, සංවිභාග නොකෙරේ නම් පින් නො කෙරේ නම්, ගැහැවිය, මෙ කාමභොගී පුරුෂයා කරුණු දෙකෙකින් ගැරැහිය යුත්තේය: එක් කරුණෙකින් ප්‍රශංසාර්හ වෙයි. ''අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග සොයන්නේය: යන මෙ පළමු කරුණෙන් ගැරැහිය යුත්තේය. තමා සුවපත් කෙරෙයි. පිනවයි යන මෙ එක් කරුණෙන් ප්‍රශංසාර්හ වෙයි. සංවිභාග නො කෙරෙයි. පින් නො කෙරෙයි යන මෙ දෙවන කරුණෙන් ගැරැහිය යුත්තේය. ගැහැවිය, මෙ කාමභොගී පුරුෂ තෙම මෙ දෙකරුණෙන් ගැරැහිය යුත්තේය. මෙ එක් කරුණින් පැසැස්ස යුතු වෙයි.

3. ගැහැවිය, එහි යම් කාම භොගියෙක් අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග සොයා නම්, අධර්මයෙන්, සාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් කෙරේ නම්, පිනවා නම්, සංවිභාග කෙරේ නම් පින් කෙරේ නම්, ගැහැවිය, මෙ කාමභොගියා එක් කරුණෙකින් ගැරැහිය යුතු වෙයි. දෙකරුණෙකින් ප්‍රශංසාර්හ වෙයි: අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග සොයයි යන මෙ එක් කරුණින් ගැරැහිය යුතු වෙයි, තමා සුවපත් කරයි. පිනවයි යන මේ පළමු කරුණින් ප්‍රශංසාර්හ වෙයි, සංවිභාග කරයි, පින් කෙරෙයි යන මේ දෙවන කරුණින් ප්‍රශංසාර්හ වෙයි. ගැහැවිය, මෙ කාම භොගියා මෙ එක් කරුණින් ගැරැහිය යුතු වෙයි. මෙ දෙකරුණින් ප්‍රශංසාර්හ වෙයි.

4. ගැහැවිය, ඔවුනතුරෙහි යම් කාමභොගියෙක් ධර්මාධර්මයෙනුදු සාහසිකාසාහසිකකර්මයෙනුදු භොග සොයා නම්, ධර්මාධර්මයෙන් හා සාහසිකාසාහසිකකර්මයෙනුදු භොග සොයා තමා සුවපත් නො කෙරේ නම්, නොපිනවා නම්, සංවිභාග නොකෙරේ නම්, පින් නො කෙරේ නම්, ගැහැවිය, මෙ කාම භොගී පුද්ගල එක් කරුණෙකින් ප්‍රශංසාර්හ වෙයි, තුන් කරුණෙකින් ගැරැහිය යුතු වෙයි. 'දැහැමින් නො සැහැසි කමින් භොග සොයන්නේය යන මෙ එක් කරුණෙන් ප්‍රශංසාර්හ වෙයි. අධර්මයෙන් සාහසික කර්මයෙන් භොග පර්යේෂණ කරයි යන මෙ පළමුවන කරුණින් ගැරැහිය යුතු වෙයි. තමා සුවපත් නො කෙරෙයි නො පිනවයි යන මේ දෙවන කරුණින් ගැරැහිය යුතු වෙයි. සංවිභාග නො කරයි, පින් නො කරයි, යන මෙ තුන්වන කරුණෙන් ගැරැහිය යුතු වෙයි. ගැහැවිය මෙ කාම භොගි තෙම මෙ එක් කරුණෙන් පැසැස්ස යුතු වෙයි. මෙ තුන් කරුණෙන් ගැරැහිය යුතු වෙයි.

5. තත්‍ර ගහපති යවායං කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන පි අසාහසෙන පි, ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන පි අසාහසෙන පි, අත්තානං සුඛෙති පීනෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති. අයං ගහපති කාමභොගී ද්වීහි ඨානෙහි පාසංසො: ද්වීහි ඨානෙහි ගාරය්හො: 'ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනා'ති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො. අධම්මේන භොගෙ පරියෙසති සාහසෙනා'ති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො, 'අත්තානං සුඛෙති පීනෙතී'ති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. න සංවිභජති, න පුඤ්ඤානි කරොතී'ති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො. අයං ගහපති කාමභොගී ඉමෙහි ද්වීහි ඨානෙහි පාසංසො, ඉමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො.

6. තත්‍ර ගහපති යවායං කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන පි අසාහසෙන පි ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන පි අසාහසෙන පි අත්තානං සුඛෙති පීනෙති, සංවිභජති, පුඤ්ඤානි කරොති, අයං ගහපති කාමභොගී තීහි ඨානෙහි පාසංසො: එකෙන ඨානෙන ගාරය්හො: ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො. අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනා'ති ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. 'අත්තානං සුඛෙති පීනෙතී'ති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. සංවිභජති, පුඤ්ඤානි කරොතීති ඉමිනා තතියෙන ඨානෙන පාසංසො. අයං ගහපති කාමභොගී ඉමෙහි තීහි ඨානෙහි පාසංසො. ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො.

7. තත්‍ර ගහපති යවායං කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන න අත්තානං සුඛෙති පීනෙති, නසංවිභජති, න පුඤ්ඤානි කරොති අයං ගහපති කාමභොගී එකෙන ඨානෙන පාසංසො: ද්වීහි ඨානෙහි ගාරය්හො: ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනා'ති ඉමිනා එකෙන ඨානෙන පාසංසො. 'න අත්තානං සුඛෙති පීනෙතී'ති, ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො. 'න සංවිභජති, න පුඤ්ඤානි කරොතී'ති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො. අයං ගහපති කාමභොගී ඉමිනා එකෙන ඨානෙන පාසංසො. ඉමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො.

5. ගැහැවිය, ඔවුනතුරෙහි යම් කාමභොගියෙක් ධර්මා ධර්මයෙනුදු සාහසිකා සාහසික කර්මයෙනුදු භොග සොයා නම් ධර්මාධර්මයෙනුදු සාහසිකා සාහසික කර්මයෙනුදු භොග සොයා තමා සුවපත් කෙරේ නම්, පිනවා නම්, සංවිභාග නො කෙරේ නම්, පින් නො කෙරේ නම්, ගැහැවිය, මේ කාමභොගී පුද්ගල දෙකරුණෙකින් ප්‍රශංසාර්හ වෙයි, දෙකරුණෙකින් ගැරැහිය යුතු වෙයි: ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයනේය යන මේ පළමු කරුණින් ප්‍රශංසාර්හ වෙයි. අධර්ම-යෙන් සාහසික කර්මයෙන් භොග සොයයි යන මෙ පළමු කරුණින් ගැරැහිය යුතු වෙයි. තමා සුවපත් කරයි, පිනවයි යන මේ දෙවන කරුණින් ප්‍රශංසාර්හ වෙයි. සංවිභාග නො කරයි, පින් නොකරයි යන මේ දෙවන කරුණින් ගැරැහිය යුතු වෙයි. ගැහැවිය, මෙ කාම භොගී පුද්ගල මෙ කරුණු දෙකින් ප්‍රශංසාර්හ වෙයි. මෙ කරුණු දෙකින් ගැරැහිය යුතු වෙයි.

6. ගැහැවිය, ඔවුනතුරෙහි යම් කාම භොගියෙක් ධර්මාධර්මයෙනුදු, සාහසිකාසාහසික කර්මයෙනුදු භොග සොයා නම් ධර්මාධර්මයෙනුදු සාහ-සිකාසාහසික කර්මයෙනුදු භොග සොයා තමා සුවපත් කෙරෙයි නම්, පිනවා නම්, සංවිභාග කෙරෙයි නම්, පින් කෙරෙයි නම්, ගැහැවිය, මෙ කාමභොගී පුද්ගල තුන් කරුණෙකින් ප්‍රසංසාර්හ වෙයි, එක් කරුණෙකින් ගැරැහිය යුතුවෙයි. ධර්මයෙනුදු අසාහසික කර්මයෙනුදු භොග පර්යේෂණ කරනුයේය යන මේ පළමු කරුණින් ප්‍රශංසාර්හ වෙයි. අධර්මයෙනුදු සාහසික කර්මයෙනුදු භොග පර්යේෂණ කරනුයේය යන මේ එක් කරුණෙන් ගැරැහිය යුතු වෙයි. තමා සුවපත් කරනුයේය, පිනවන්නේය යන මේ දෙවන කරුණින් ප්‍රශංසාර්හ වෙයි, සංවිභාග කරනුයේය, පින් කරනුයේය යන මෙ තෙවන කරුණින් ප්‍රශංසාර්හ වෙයි. ගැහැවිය, මෙ කාමභොගී පුද්ගල මෙතුන් කරුණින් ප්‍රශංසාර්හ වෙයි. මෙ එක් කරුණින් ගැරැහිය යුතු වෙයි.

7. ගැහැවිය, ඔවුනතුරෙහි යම් කාමභොගියෙක් ධර්මයෙන් අසාහ-සික කර්මයෙන් භොග සොයා නම්, ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් නො කෙරෙයි නම්, නො පිනවා නම්, සංවිභාග නො කෙරේ නම්, පින් නොකෙරේ නම්, ගැහැවිය, මෙ කාමභොගී පුද්ගල එක් කරුණෙකින් පැසැස්ස යුතු වෙයි. දෙකරුණෙකින් ගැරැහිය යුතු වෙයි: ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග පර්යේෂණ කරනුයේය යන මෙ පළමු කරුණින් පැසැස්ස යුතු වෙයි. තමා සුවපත් නොකරනුයේය, නො පිනවයි යන මෙ පළමුවන කරුණින් ගැරැහිය යුතු වෙයි. සංවිභාග නො කෙරෙයි, පින් නො කෙරෙයි යන මෙ දෙවන කරුණින් ගැරැහිය යුතු වෙයි. ගැහැවිය, මෙ කාම භොගී පුද්ගල මෙ එක් කරුණින් පැසැස්ස යුතු වෙයි. මෙ දෙකරුණින් ගැරැහිය යුතු වෙයි.

8. තත්‍ර ගහපති, යවායං කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීනෙති, න සංවිභජති, න පුඤ්ඤානි කරොති. අයං ගහපති කාමභොගී ද්වීහි ඨානෙහි පාසංසො: එකෙන ඨානෙන ගාරය්හො: 'ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනා' ති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො. අත්තානං සුඛෙති පීනෙතී' ති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. න සංවිභජති න පුඤ්ඤානි කරොතී' ති ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. අයං ගහපති කාමභොගී ඉමෙහි ද්වීහි ඨානෙහි පාසංසො. ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො.

9. තත්‍ර ගහපති, යවායං කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති, පීනෙති සංවිභජති, පුඤ්ඤානි කරොති, තෙච භොගෙ ගථිතො මුච්ඡිතො අජ්ඣොපන්නො අනාදීනව දස්සාවී අනිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. අයං ගහපති, කාමභොගී තීහි ඨානෙහි පාසංසො එකෙන ඨානෙන ගාරය්හො: 'ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනා'ති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො, 'අත්තානං සුඛෙති පීනෙතී'ති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. සංවිභජති පුඤ්ඤානි කරොතී'ති ඉමිනා තතියෙන ඨානෙන පාසංසො. 'තෙ ච භොගෙ ගථිතො මුච්ඡිතො අජ්ඣොපන්නො අනාදීනවදස්සාවී අනිස්සරණපඤ්ඤො පරිභුඤ්ජතී'ති, ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. අයං ගහපති කාමභොගී ඉමෙහි තීහි ඨානෙහි පාසංසො. ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො.

10. තත්‍ර ගහපති යවායං කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති, අසාහසෙන, ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීනෙති සංවිභජති පුඤ්ඤානි කරොති, තෙ ච භොගෙ අගථිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො, ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. අයං ගහපති, කාමභොගී චතූහි ඨානෙහි පාසංසො: ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො. අත්තානං සුඛෙති පීනෙතී'ති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. සංවිභජති, පුඤ්ඤානි කරොතී' ති ඉමිනා තතියෙන ඨානෙන පාසංසො. තෙ ච භොගෙ අගථිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජතී'ති, ඉමිනා චතුත්ථෙන ඨානෙන පාසංසො.

8. ගැහැවිය, ඔවුනතුරෙහි යම් කාමභොගියෙක් ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා නම්, ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් කෙරේ නම්, පිනවා නම්, සංවිභාග නො කෙරේ නම්, පින් නො කෙරේ නම්, ගැහැවිය, මෙ කාම භොගියා දෙකරුණෙකින් ප්‍රශංසාර්හ වෙයි: එක් කරුණෙකින් ගැරැහිය යුතු වෙයි: ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග පර්යේෂණ කරයි යන මේ පළමු වන කරුණින් ප්‍රශංසාර්හ වෙයි. තමා සුවපත් කරයි, පිනවයි යන මෙ දෙවන කරුණින් ප්‍රශංසාර්හ වෙයි. සංවිභාග නො කෙරෙයි, පින් නො කෙරෙයි යන මෙ එක් කරුණින් ගැරැහිය යුතු වෙයි. ගැහැවිය, මෙ කාම භොගී මෙ දෙකරුණින් පැසැස්ස යුතු වෙයි. මෙ එක්කරුණින් ගැරැහිය යුතු වෙයි.

9. ගැහැවිය,ඔවුනතුරෙහි යම් කාම භොගියෙක් ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා නම්, ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් කෙරෙයි නම් පිනවයි නම්, සංවිභාග කෙරෙයි නම්, පින් කෙරෙයි නම්, එ භොගයනුදු ග්‍රථිතවූයේ මූර්ඡිත වූයේ එහි බැසගත්තේ ආදීනව නොදක්නා සුළුවූයේ අනිඃසරණප්‍රඥ ඇත්තේ වළඳානම්, ගැහැවිය, මෙ කාමභොගී තෙම තුන් කරුණෙකින් පැසැසිය යුතු වෙයි: එක් කරුණින් ගැරැහිය යුතු වෙයි: ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයයි යන මෙ පළමු කරුණින් පැසැස්ස යුතු වෙයි: තමා සුවපත් කෙරෙයි, පිනවයි යන මෙ දෙවන කරුණින් පැසැස්ස යුතු වෙයි. සංවිභාග කෙරෙයි, පින් කෙරෙයි යන මෙ තෙවන කරුණින් පැසැසිය යුතු වෙයි එ භොගයනුදු ග්‍රථිත වූයේ මූර්ඡිත වූයේ එහි බැස ගත්තේ, ආදීනව නො දක්නා සුලු වූයේ නිඃසරණ ප්‍රඥ නැත්තේ වළඳ කරයි යන මෙ එක් කරුණින් ගැරැහිය යුතු වෙයි. ගැහැවිය, මෙ කාමභොගියා මෙ තුන් කරුණින් පැසැස්ස යුතු වෙයි. මෙ එක් කරුණින් ගැරැහිය යුතු වෙයි.

10. ගැහැවිය, ඔවුනතුරෙහි යම් කාමභොගියෙක් දැහැමින් නො සැහැසි කමින් භොග සොයා නම් දැහැමින් නො සැහැසි කමින් භොග සොයා තමා සුවපත් කරයි නම් පිනවයි නම් සංවිභාග කරයි නම්, පින් කරයි නම්, එ භොගයනුදු ග්‍රථිත නො වූයේ මූර්ඡිත නො වූයේ එහි බැස නොගත්තේ ආදී නව දක්නා සුලුවූයේ නිඃසරණ ප්‍රඥ ඇතියේ වළඳයි නම්, ගැහැවිය, මෙ කාමභොගී තෙම සතර කරුණෙකින් පැසැසිය යුතු වෙයි: දැහැමින් නොසැහැසි කමින් භොග සොයයි යන මෙ පළමු කරුණින් පැසැසිය යුතු වෙයි. තමා සුවපත් කරයි, පිනවයි, යන මෙ දෙවන් කරුණින් පැසැසිය යුතු වෙයි. සංවිභාග කරයි, පින් කරයි, යන මෙ තෙවන කරුණින් පැසැසිය යුතු වෙයි. එ භොගයනුදු ග්‍රථිතවූයේ අමූර්ඡිත වූයේ අධ්‍යාපන්න නො වූයේ ආදීනව දක්නා සුලුයේ නිඃසරණ ප්‍රඥ ඇතියේ වළඳයි යන මෙ සතර වන කරුණින් පැසැසිය යුතු වෙයි.

අයං ගහපති කාමභොගී ඉමෙහි චතුහි ඨානෙහි පාසංසො.

ඉමෙ ඛො ගහපති දස කාමභොගී සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. ඉමෙසං ඛො ගහපති දසන්නං කාමභොගීනං ය්වායං කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන. ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන, අත්තානං සුඛෙති පීනෙති. සංවිභජති පුඤ්ඤානි කරොති, තෙ ච භොගෙ අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, අයං ඉමෙසං දසන්නං කාමභොගීනං අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි ගහපති ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං, නවනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො තත්‍ථ අග්ගමක්ඛායති, එව මෙව ඛො ගහපති ඉමෙසං දසන්නං කාමභොගීනං ය්වායං කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීනෙති සංවිභජති, පුඤ්ඤානි කරොති, තෙ ච භොගෙ අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනව දස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, අයං ඉමෙසං දසන්නං කාමභොගීනං අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරොචාති.

## 10. 2. 5. 2
## භය සුත්තං

**[සාවත්‍ථි]**

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං භගවා එතදවොච:

යතො ඛො ගහපති අරියසාවකස්ස පඤ්චභයානි වෙරානි වූපසන්තානි හොන්ති, චතුහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති, අරියො චස්ස ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො, ආකඞ්ඛමානො අත්තනාව අත්තානං ව්‍යාකරෙය්‍ය:

ගැහැවිය, මෙ කාම භොගීතෙම මෙ සතර කරුණෙන් පැසැසිය යුතු වෙයි.

ගැහැවිය, මෙ දස කාමභොගීහු ලොව්හි විද්‍යමාන ම වෙති. ගැහැවිය, මෙ දස කාමභොගීන් අතුරෙන් යම් කාමභොගියෙක් ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා නම්, ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් කරයි නම්, පිනවා නම්, සංවිභාග කරයි නම්, පින් කරයි නම්, එ භොගයනුදු ග්‍රථිතනුවූයේ අමූර්ඡිත වූයේ, අධ්‍යාපන්න නො වූයේ ආදීනවදක්නා සුලුයේ, නිඃසරණ ප්‍රඥා ඇතියේ වළඳා නම්, මෙ තෙම මෙදස කාමභොගීන්ගෙන් අග්‍ර ද, ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වෙයි.

ගැහැවිය, යම් පරිදි දෙනගෙන් කිරිය, කිරෙන් දීහිය, දීහියෙන් වෙඬරුය, වෙඬරුයෙන් ගීය, ගියෙන් ගී මඬුය, එහි ලා අග්‍ර යයි ගිණුමට යේ ද, ගැහැවිය, එපරිදි ම මෙ දස කාම භොගීන් අතුරෙන් යම් කාම භොගියෙක් ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා නම්, ධර්මයෙන් අසාහසික කර්මයෙන් භොග සොයා තමා සුවපත් කරයි නම්, පිනවානම්, සංවිභාග කරයි නම්, පින් කරයි නම්, එ භොගයනුදු ග්‍රථිත නුවූයේ අමූර්ඡිත වූයේ අනධ්‍යාපන්නවූයේ ආදීනව දක්නා සුලුයේ, නිඃසරණ ප්‍රඥ ඇතියේ වළඳා නම්, මෙ දසකාම භොගීන් අතුරෙන් මෙ තෙම අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වෙයි.

## 10. 2. 5. 2
## භය සූත්‍රය

**[සැවැත්]**

එකල්හි අනාථපිණ්ඩික ගෘහපති භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත් පසෙක හුන් අනාථපිණ්ඩික ගෘහපතිහට භාග්‍යවතුන් වහන්සේ මෙල සැළ කළහ:

ගෘහපතිය, යම් හෙයෙකින් අරි සවුහුගේ පඤ්ච චිත්තො ත්‍රාසභයයෝ අකුශල වෛරයෝ මොනොවට සන්හුන් වෙත් ද, සතර සොවන් අඟින් සමන්වාගත වේ ද, ඔහු විසින් ආර්‍ය්‍ය (විදර්ශනා මාර්ග සඞ්ඛ්‍යාත) න්‍යායය ප්‍රඥයෙන් මොනොවට දක්නාලද්දේ, සුපිළි විදියේ වේ ද, කැමැති වනුයේ තෙමේ තමා පහළ කරන්නේය:

ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනි ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො සොතාපන්නො හමස්මි, අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති. කතමානි පඤ්ච භයානි වෙරානි වූපසන්තානි හොන්ති:

යං ගහපති, පාණාතිපාතී පාණාතිපාතපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පාණාතිපාතා පටිවිරතො නෙව දිට්ඨධම්මිකං භයං වෙරං පසවති න සම්පරායිකං භයං වෙරං පසවති න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති, පාණාතිපාතා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති.

යං ගහපති අදින්නාදායී -පෙ- කාමෙසු මිච්ඡාචාරී -පෙ- මුසාවාදී -පෙ- යං ගහපති සුරාමෙරය මජ්ජපමාදට්ඨායී සුරාමෙරය මජ්ජපමාදට්ඨානපච්චයා දිට්ඨධම්මිකම්පි භයං වෙරං පසවති, සම්පරායිකම්පි භයං වෙරං පසවති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො නෙව දිට්ඨධම්මිකං භයං වෙරං පසවති, න සම්පරායිකං භයං වෙරං පසවති, න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතස්ස එවං තං භයං වෙරං වූපසන්තං හොති. ඉමානි පඤ්චභයානි වෙරානි වූපසන්තානි හොන්ති.

කතමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති:

ඉධ ගහපති අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති.

"ක්‍ෂයවී ගිය නිරය ඇතියෙම් ක්‍ෂයවීගිය තිරිසන් යොන් ඇතියෙම් ක්‍ෂයවීගිය ප්‍රෙතවිෂය ඇතියෙම්, ක්‍ෂයවීගිය අවාදුගති විනිපා ඇතියෙම් වෙමි. විනිපාතස්වභාව නැතියෙම් නියතයෙම් සම්බොධිය පරායණ කොට ඇතියෙම් ශ්‍රොතාපන්න යෙමි"යි. කවර පඤ්චභය වෛරයෝ සන්හුන්නාහු වෙත්ය යත්:

ගෘහපතිය, පණිවා කරණ සුලුවූයේ පණිවා හෙතුකොටගෙණ දෘෂ්ට ධාර්මික වූ ද යම් භය හා වෛර හා ලබා ද, සාම්පරායික වූ ද භය හා වෛර හා ලබා ද, චෛතසික වූ ද දුක් දෙමනස් විඳිනේ ද, පණිවායෙන් විරත වූයේ එ දෘෂ්ට ධාර්මික වූ භය වෛර නො ම ලබන්නේය. සාම්පරායික භය වෛර නො ම ලබන්නේය, චෛතසික දුඃඛදෞර්මනස්‍ය නො ම විඳිනේය. මෙසේ ප්‍රාණඝාතයෙන් වෙන්වූවහුගේ එ බිය හා වෙර හා සංහිඳුනේ වෙයි.

ගෘහපතිය, නුදුන්දැගන්නා සුලුවූයේ -පෙ- කාමයන්හි මිසහසර ඇතියේ – මුසවා බණනසුලුවූයේ යම් – ගෘහපතිය, මදපමා දෙකට කරුණු වූ රහමෙර බොන සුලුයේ මදපමා දෙකට කරුණු වූ රහමෙර හෙතුයෙන් යම් දෘෂ්ටධාර්මික වූ ද භය හා වෛර හා ලබා නම් සාම්පරායික වූ ද භය හා වෛර හා ලබා නම් චෛතසික වූ ද දුක් දෙමනස් විඳිනේ නම් මදපමා දෙකට කරුණු රහමෙරින් විරත වූ යේ දෘෂ්ට ධාර්මික වූ ද භය හා වෛර හා නො ම ලබනේය, සාම්පරායික වූ ද දුක් භය හා වෛර හා නො ම ලබනේය, චෛතසික වූ ද දුක් දෙමනස් නො ම විඳුනේය, මදපමා දෙකට කරුණු වූ රහමෙරින් විරත හුගේ මෙසේ එ භය හා වෛර හා සංහිඳුනේ වෙයි. මෙ පස් භය හා වෛර හා ව්‍යුපශාන්ත වෙත්.

කවර නම් සතර සෝවාන් අඟින් සමන්වාගත වේය යත්:

ගෘහපතිය, මෙ සස්නෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම බුදුන් කෙරෙහි අචෙත්‍ය ප්‍රසාදයෙන් සමන්වාගත වෙයි: මෙ කරුණිනුදු එ භාග්‍යවත්හු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ, අනුත්තරයහ, පුරුෂදම්‍ය සාරථිහ, දෙවමනුෂ්‍යයනට ශාස්තෘහ, බුද්ධයහ, භාග්‍යවත්හ"යි. ධර්මයෙහි අචෙත්‍ය ප්‍රසාදයෙන් සමන්වාගත වෙයි: භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාතය, සාන්දෘෂ්ටිකය, අකාලිකය, එහිපස්සිකය, උපනයාර්හය, විඥයන් විසින් ප්‍රත්‍යාත්ම වශයෙන් දතයුතුය"යි.

සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවක සඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවක සඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති.

අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති, අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤූපසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති.

කතමො චස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො:

ඉධ ගහපති අරියසාවකො ඉතිපටිසංචික්ඛති: "ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති, යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාම රූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො භව-පච්චයා ජාති, ජාති පච්චයා-ජරාමරණං සොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජායත්වෙව අසෙසවිරාග නිරොධා සඞ්ඛාර නිරොධො, සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාම රූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස-නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාතිනිරොධා ජරා මරණං සොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයමස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො.

සඞ්ඝයා කෙරෙහි අචෙත්‍ය ප්‍රසාදයෙන් සමන්වාගත වෙයි: භගවත්හුගේ අර්‍ය සවු සඟ සුපිළිපන් වෙයි, භගවත්හුගේ සවු සඟ ඍජු පිළිවෙතට පිළිපන, භගවත්හුගේ සවුසඟ මාර්‍ග නියාමයට පිළිපන, භගවත්හුගේ සවුසඟ සාමීචියට පිළිපන. මේ සතර පුරුෂ යුගලයෙක් අෂ්ට පුරුෂපුද්ගල කෙනෙක් වෙත් නම් භගවත්හුගේ තෙල ශ්‍රාවක සඞ්ඝ ආහුණෙය්‍යය, පාහුණෙය්‍යය, දක්ඛිණෙය්‍යය, අඤ්ජලිකරණීයය, ලොකයට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍රය''යි.

අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාෂ වූ භුජිස්‍ය වූ විඥ ප්‍රශස්ත වූ අපරාමෘෂ්ට වූ සමාධියට හිතව වැටෙන ආර්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. මෙ සතර සොතාපත්ති අඞ්ගයෙන් සමන්වාගත වෙයි.

ඔහු විසින් කවර ආර්‍ය න්‍යායයෙක් ප්‍රඥයෙන් සුදෘෂ්ට වූයේ සුප්‍රතිවිද්ධය යත්:

ගෘහපතිය, මෙසස්නෙහි ආර්‍ය ශ්‍රාවක මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: මෙසේ මෙ අවිද්‍යාදි ප්‍රත්‍යය ඇතිවත්ම මෙ සංස්කාරාදිය වෙයි. මෙ ප්‍රත්‍යය යාගේ උත්පාදයෙන් මෙ ඵලය උපදනේය, මෙ ප්‍රත්‍යයාගේ අභාවය වත්ම මෙ ඵලය නො වේ, මෙ ප්‍රත්‍යයාගේ නිරොධයෙන් මෙ ඵලය නිරුද්ධ වෙයි, එ කිසෙය යත්: අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙත්: සංස්කාර ප්‍රත්‍යයෙන් විඥනය වෙයි, විඥන ප්‍රත්‍යයෙන් නාමරූප වෙයි, නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වෙයි, ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වෙයි, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනා වෙයි, වෙදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණා වෙයි, තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදන වෙයි, උපාදන ප්‍රත්‍යයයෙන් භව වෙයි, භව ප්‍රත්‍යයෙන් ජාතිවෙයි, ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ ශොක පරිදෙව දුඃඛදෞර්මනස්‍යොපායාසයෝ වෙත්. මෙසේ තෙල කෙවල දුඃඛස්කන්ධයාගේ සමුදය වෙයි.

අවිද්‍යා හුගේ ම අශෙෂවිරාග නිරොධයෙන් සඞ්ඛාරනිරොධය වෙයි, සංස්කාර නිරොධයෙන් විඥාන නිරොධය වේ, විඥාන නිරොධයෙන් නාමරූප නිරොධය වෙයි, නාමරූප නිරොධයෙන් ෂඩායතන නිරොධය වෙයි, ෂඩායතන නිරොධයෙන් ස්පර්ශ නිරොධය වෙයි, ස්පර්ශ නිරොධයෙන් වෙදනා නිරොධය වෙයි, වෙදනා නිරොධයෙන් තෘෂ්ණා නිරොධය වෙයි. තෘෂ්ණා නිරොධයෙන් උපාදන නිරොධය වෙයි, උපාදන නිරොධයෙන් භව නිරොධය වෙයි, භව නිරොධයෙන් ජාති නිරොධය වෙයි, ජාති නිරොධයෙන් ජරාමරණ ශොක පරිදෙව දුඃඛදෞර්මනස්‍යොපායාසයෝ නූපදිත් මෙසේ තෙල කෙවල දුඃඛ ස්කන්ධයාගේ නිරොධය වෙයි, ඔහු විසින් මෙ න්‍යාය ප්‍රඥායෙන් සුදෘෂ්ට සුප්‍රතිවිද්ධ වෙයි.

යතො ඛො ගහපති අරියසාවකස්ස ඉමානි පඤ්චභයානි වෙරානි වූපසන්තානි හොන්ති. ඉමෙහි චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො හොති. අයමස්ස අරියො ඤායො පඤ්ඤාය සුදිට්ඨො හොති සුප්පටිවිද්ධො, සො ආකඞ්ඛමානො අත්තනා ව අත්තානං ව්‍යාකරෙය්‍ය: "ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනියො ඛීණපෙත්තිවිසයො ඛීණාපාය-දුග්ගතිවිනිපාතො. සොතාපන්නො හමස්මි අවිනිපාත ධම්මො නියතො සම්බොධිපරායනොති.

## 10. 2. 5. 3
## කිංදිට්ඨික සුත්තං

එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති දිවා දිවස්ස සාවත්ථියා නික්ඛමි. භගවන්තං දස්සනාය. අථ ඛො අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස එතදහොසි: "අකාලො ඛො තාව භගවන්තං දස්සනාය, පතිසල්ලීනො භගවා, මනො භාවනීයා නම්පි භික්ඛූනං අකාලො දස්සනාය, පතිසල්ලීනා මනොභාවනීයා භික්ඛූ. යන්නූනාහං යෙනඤ්ඤතිත්ථියානං පරිබ්බාජකා නං ආරාමො තෙනුපසංකමෙය්‍යන්ති". අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසංකමි.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා සඞ්ගම්ම සමාගම්ම උන්නාදිනො උච්චාසද්ද මහාසද්ද අනෙකවිහිතං තිරච්ඡාන කථං කථෙන්තා නිසින්නා හොන්ති. අද්දසංසු ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අනාථපිණ්ඩිකං ගහපතිං දූරතොව ආගච්ඡන්තං, දිස්වා අඤ්ඤමඤ්ඤං සණ්ඨපෙසුං: "අප්පසද්ද හොන්තො හොන්තු, මා හොන්තො සද්දමකත්ථ, අයං අනාථපිණ්ඩිකො ගහපති ආගච්ඡති සමණස්ස ගොතමස්ස සාවකො, යාවතා ඛො පන සමණස්ස ගොතමස්ස සාවකා ගිහී-ඔදතවසනා සාවත්ථියං පටිවසන්ති, අයං තෙසං අඤ්ඤතරො අනාථ පිණ්ඩිකො ගහපති. අප්පසද්දකාමා ඛො පන තෙ ආයස්මන්තො අප්පසද්ද-විනීතා අප්පසද්දස්ස වණ්ණවාදිනො. අප්පෙව නාම අප්පසද්දං පරිසංවිදිත්වා උපසංකමි තබ්බං මඤ්ඤෙය්‍යා"ති. අත ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා තුණ්හී අහෙසුං.

ගෘහපතිය, යම් කලෙක ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ මේ පඤ්චභය වෛරයෝ ව්‍යුපශාන්ත වෙත් ද, මේ සතර ස්‍රොතාපත්ති-අඞ්ගයෙන් සමන්වාගත වේ ද, ඔහු විසින් මෙ ආර්‍ය්‍ය න්‍යායය ප්‍රඥායෙන් සුදෘෂ්ටද සුප්‍රතිවිද්ධද වෙයි. හේ කැමැති වන්නේ තෙමේ තමා පාළ කරන්නේය: ක්‍ෂය වූ නිරය ඇති-යෙමි, ක්‍ෂය වූ තිරිසන්යොන් ඇතියෙමි, ක්‍ෂය වූ ප්‍රෙත විෂය ඇතියෙමි ක්‍ෂය අවාදුගති විනිපා ඇතියෙමි නො පෙන සැහැවි ඇතියෙමි නියතයෙමි සම්බොධි පරායණයෙමි සෝවාන් වෙමි යි.

## 10. 2. 5. 3
## කිංදිට්ඨික සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනාථපිණ්ඩික සිටුහුගේ ජෙතවන නම් අරම්හි වැඩ වසන සේක. එකල්හි අනාථපිණ්ඩික ගෘහපති මැදි දහවල් භාග්‍යවතුන් වහන්සේ දක්නට සැවතින් නික්මින. ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපතිහට තෙල සිත විය: ''භාග්‍යවතුන් දක්නට තව ම නො කල, භාග්‍යවත්හු ප්‍රතිසං-ලීනයහ, මනො භාවනීය මහණුන් දක්නට ද, නො කල, මනොභාවනීය මහණහු ප්‍රතිසංලීනයහ. මම් අන්තොටු පිරිවැජ්ජන්ගේ අසපුව කරා යෙම් නම් මැනැවැ''යි. ඉක්බිති අනේපිඩු සිටුතෙම අන්තොටු පිරිවැජි යන්ගේ අසපුව කරා එළඹියේය.

එ සමයෙහි අන්තොටු පිරිවැජියෝ එක් රැස්ව ඔල්වරසන් කරන්නාහු උස් හඬ මහ හඬ ඇත්තාහු අනෙකවිධ තිරශ්චීන කථා කියන්නාහු හුන්නාහු වෙති. එ අන්තොටු පිරිවැජියෝ දුරින්ම එන අනේපිඩු ගැහැවි දුටුහු. දැක උනුන් (ඉරියවු-තෙපුල්) නැවැත් වූහ: ''භවත්හු අල්පශබ්ද වෙත්වා, භවත්හු නහමක් ශබ්ද කරත්වා, මේ මහණ ගොයුම් සවූ අනේපිඩු ගැහැවි එයි. මහණ ගොයුම්හුගේ සුදුවත් හඳනා ගිහි සව්වෝ යම් පමණ සැවැත්හි වෙසෙත් නම්, මේ අනාථ පිණ්ඩික ගෘහපති ඔවුනතුරෙන් අන්‍යතරයෙක, එ ආයුෂ්මත්හු වනාහි අල්පශබ්ද ඇති (මාත්‍රභාණී) යහු විසින් හික්මවන ලද්දහු අල්පශබ්දයාගේ ගුණ වණන්නාහු වෙති, අල්පශබ්ද ඇති පිරිස දැන එළඹියැ යුතු කොට හඟනේ නම් මැනැවැයි. ඉක්බිති ඒ අන්තොටු පිරිවැජියෝ තුෂ්ණීම්භූත වූහ.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති යෙන තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අනාථපිණ්ඩිකං ගහපතිං තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං: ''වදෙහි ගහපති කිංදිට්ඨිකො සමණො ගොතමො''ති. ''න ඛො අහං භන්තෙ භගවතො සබ්බං දිට්ඨිං ජානාමී''ති.

ඉති කිර ත්වං ගහපති, න සමණස්ස ගොතමස්ස සබ්බං දිට්ඨිං ජානාසි, වදෙහි ගහපති කිං දිට්ඨිකා භික්ඛූ''ති. ''භික්ඛූනම්පි ඛො අහං භන්තෙ න සබ්බං දිට්ඨිං ජානාමී''ති.

ඉති කිර ත්වං ගහපති, න සමණස්ස ගොතමස්ස සබ්බං දිට්ඨිං ජානාසි, න පි භික්ඛූනං සබ්බං දිට්ඨිං ජානාසි, වදෙහි ගහපති, කිං දිට්ඨිකොසි ත්වන්ති'' එතං ඛො භන්තෙ අම්හෙහි න දුක්කරං ව්‍යාකාතුං ''යං දිට්ඨිකා මයන්ති''. ඉඞ්ඝ තාව ආයස්මන්තො යථාසකානි දිට්ඨිගතානි බ්‍යාකරොන්තු, පච්ඡා-පෙතං අම්හෙහි න දුක්කරං භවිස්සති බ්‍යාකාතුං යංදිට්ඨිකා මයන්ති.

එවං වුත්තෙ අඤ්ඤතරො පරිබ්බාජකො අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච: ''සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති'' එවං දිට්ඨිකො අහං ගහපතී''ති, අඤ්ඤතරොපි පරිබ්බාජකො අනාථ-පිණ්ඩිකං ගහපතිං එතදවොච: ''අසස්සතො ලොකො, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති'' එවං දිට්ඨිකො අහං ගහපතී''ති. අඤ්ඤතරොපි ඛො පරිබ්බාජකො අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොච: 'අන්තවා ලොකො' -පෙ- 'අනන්තවා ලොකො' -පෙ- 'තං ජීවං තං සරීරං' -පෙ- 'අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීරං' -පෙ- 'හොති තථාගතො පරම්මරණා' -පෙ- 'න හොති තථාගතො පරම්මරණා' -පෙ- 'හොති ච න හොති ච තථාගතො පරම්මරණා' -පෙ- නෙව හොති, න න හොති තථාගතො පරම්මරණා', ඉද මෙව සච්චං මොඝමඤ්ඤන්ති'' එවං දිට්ඨිකො අහං ගහපතී''ති.

ඉක්බිති අනේපිඬු ගැහැවි තෙම එ අන්තොටු පිරිවැජියන් කරා එළඹියේය. එළඹ ඒ අන්තොටු පිරිවැජියන් හා සමග සතුටු විය. සමොමාදනයට නිසි සිහි කටයුතු කථා කොට නිමවා එකත් පසෙක හින. එකත් පසෙක හුන් අනාථපිණ්ඩික ගැහැවිහට ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ තෙල කරුණ කීහ: "ගැහැවිය, මහණ ගොයුම්හු කවර දෘෂ්ටියක් ඇතියහු දැ යි කියව"යි, "වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ හැම දිටු නො දන්මි"යි.

"ගැහැවිය, මෙසේ තෙපි මහණ ගොයුම්හුගේ හැම දිටු නො දන්හු නම්, ගැහැවිය, භික්ෂුහු කවර දෘෂ්ටි ඇතියහු දැයි කියව"යි. "වහන්ස, මම භික්ෂූන්ගේ ද හැම දිටු නො දන්මි"යි.

"ගැහැවිය, මෙසේ තෙපි මහණ ගොයුම් හුගේ හැම දිටු නො දන්හු නම්, භික්ෂූන්ගේ ද හැම දිටු නො දන්හු නම්, ගැහැවිය, තෙපි කවර දිටු ඇතියහු දැයි කියව"යි. වහන්ස, අපි කවර දිටු ඇතියමෝ ද යන තෙල කරුණ පාළ කරන්නට අප විසින් දුෂ්කර නො වෙයි. එසේ නම් ආයුෂ්මත්හු පළමු මැ යථා සවක දෘෂ්ටීන් පාළ කෙරෙත්වා, අපි යම් දෘෂ්ටියක් ඇතියමෝ නම් තෙල කරුණ අප විසින් පසු ද පාළ කරන්නට දුෂ්කරයෙක් නො වන්නේය.

මෙසේ කී කල්හි අන්‍යතර පරිව්‍රාජකයෙක් අනාථපිණ්ඩික ගෘහපති හට තෙල කරුණ කීය: "ගෘහපතිය මම ලොකය ශාශ්වතය, මෙම සත්‍යය, අනෙක අසත්‍යය යන මෙබඳු දෘෂ්ටි ඇතියෙමි යි. අන්‍යතර පරිව්‍රාජක යෙක් ද අනාථපිණ්ඩික ගැහැවිහට තෙල කරුණ කීය: "ලොකය අශාශ්වතය, මෙ ම සත්‍යය: අනෙක සිස් ය යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙමැ"යි. අන්‍යතර පරිව්‍රාජකයෙක් ද අනාථ පිණ්ඩික ගෘහපතිහට තෙල කරුණ කී: "ගැහැවිය මම ලොකය අන්තවත්ය, –පෙ– ලොකය අනන්තවත්ය –පෙ– එ ජීවය; එ සිරුරය –පෙ– ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙක –පෙ– සත්ත්වයා මරණින් පසු (පිළිසඳ විසින්) වෙයි, –පෙ– සත්ත්ව මරණින් පසු (පිළිසඳ විසින්) නොවෙයි –පෙ– සත්ත්වයා මරණින් පසු වන්නේ ද නොවන්නේ ද වෙයි –පෙ– සත්ත්වයා මරණින් පසු නො මැ වෙයි, නොවන්නේ නො වෙයි, මෙ ම සත්‍යය, අනෙක සිස් ය යන මෙ බඳු දෘෂ්ටි ඇතියෙමි"යි.

එවං වුත්තෙ අනාථපිණ්ඩිකො ගහපති තෙ පරිබ්බාජකෙ එතද වොච: යවායං භන්තෙ, ආයස්මා එවමාහ: 'සස්සතො ලොකො, ඉද මෙව සච්චං මොඝමඤ්ඤන්ති'' එවං දිට්ඨිකො අහං ගහපතී'ති, ඉමස්සායස්මතො දිට්ඨි අත්තනො වා අයොනිසො මනසිකාරහෙතු උප්පන්නා, පරතොඝොසසප්පච්චයා වා. සා ඛො පනෙසා දිට්ඨි භූතා සඞ්ඛතා චෙතයිතා පටිච්චසමුප්පන්නා, යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං චෙතයිතං පටිච්චසමුප්පන්නං තද නිච්චං, යද නිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදෙව සො[1] ආයස්මා අල්ලීනො තදෙව සො[1] ආයස්මා අජ්ඣුපගතො.

යොපායං භන්තෙ, ආයස්මා එවමාහ: අසස්සතො ලොකො, ඉද මෙව සච්චං, මොඝමඤ්ඤන්ති එවං දිට්ඨිකො අහං ගහපතී'ති, ඉමස්සපි[2] ආයස්මතො[3] දිට්ඨි අත්තනො වා අයොනිසො මනසිකාරහෙතු උප්පන්නා පරතොඝොසසප්පච්චයා[4] වා. සා ඛො පනෙසා දිට්ඨි භූතා සඞ්ඛතා චෙතයිතා පටිච්චසමුප්පන්නා, යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං චෙතයිතං පටිච්චසමුප්පන්නං, තදනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදෙවෙසො ආයස්මා අල්ලීනො, තදෙවෙසො ආයස්මා අජ්ඣුපගතො.

යො පායං භන්තෙ ආයස්මා එවමාහ: අන්තවා ලොකො -පෙ- අනන්ත වා ලොකො -පෙ- තං ජීවං තං සරීරං -පෙ- අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං -පෙ- හොති තථාගතො පරම්මරණා -පෙ- න හොති තථාගතො පරම්මරණා -පෙ- හොති ච න හොති ච තථාගතො පරම්මරණා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉද මෙව සච්චං, මොඝමඤ්ඤන්ති එවං දිට්ඨිකො අහං ගහපතී'ති. ඉමස්සපි ආයස්මතො දිට්ඨි අත්තනො වා අයොනිසො මනසිකාරහෙතු උප්පන්නා, පරතොඝොසසප්පච්චයා වා. සා ඛො පනෙසා දිට්ඨි භූතා සඞ්ඛතා චෙතයිතා පටිච්චසමුප්පන්නා.

යං ඛො පන කිඤ්චි භූතං සංඛතං චෙතයිතං පටිච්චසමුප්පන්නං, තද නිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදෙවෙසො ආයස්මා අල්ලීනො, තදෙවෙසො ආයස්මා අජ්ඣුපගතොති.

එවං වුත්තෙ තෙ පරිබ්බාජකා අනාථපිණ්ඩිකං ගහපතිං එතදවොචුං: බ්‍යාකතානි ඛො ගහපති අම්හෙහි සබ්බෙහෙව යථාසකානි දිට්ඨිගතානි, වදෙහි ගහපති, කිං දිට්ඨිකොසි ත්වන්ති'.

1. තදෙවෙසො - මජසං.
2. ඉමස්සාපි - මජසං
3. අයමායස්මතො - මජසං.
4. පරඝොසසප්පච්චයා වා - සීමු.

මෙසේ කී කල්හි අනාථපිණ්ඩික ගෘහපති එ පිරිවැජියනට තෙල කරුණ කීය: "වහන්ස, යම් ආයුෂ්මතෙක් "ගෘහපතිය මම ලොකය ශාශ්වතය, මෙ මැ සත්‍ය ය, අන්‍යය සිස් ය යන මෙබඳු දෘෂ්ටි ඇත්තෙමැ"යි මෙසේ කී නම්, මෙ ආයුෂ්මත්හුගේ දෘෂ්ටිය තමාගේ අයොනිසොමනසිකාර හෙතුයෙන් හෝ පරතොඝොෂ ප්‍රත්‍යයයෙන් උපන. තෙල දෘෂ්ටිය වනාහි භූත ය, සංස්කෘත ය, කල්පිත ය, ප්‍රතීත්‍ය සමුත්පන්න ය. යම් කිසිවක් ම භූත ද, සංස්කෘත ද කල්පිත ද, ප්‍රතීත්‍ය සමුත්පන්න ද එ අනිත්‍ය වෙයි. යමෙක් අනිත්‍ය වේ ද එ දුඃඛය. යමක් දුඃඛ වේ නම් එ ආයුෂ්මත් එයට ම ඇලුණේය. එ ආයුෂ්මත් එයට ම බැසගත්තේ ය.

වහන්ස, යම් ම ආයුෂ්මතෙක් "ගෘහපතිය, මම ලොකය අශාශ්වත ය. මෙ මැ සත්‍ය ය, අන්‍යය අසත්‍ය ය යන මෙබඳු දෘෂ්ටි ඇතියේ මැයි මෙසේ කී නම්, මෙ ආයුෂ්මත්හුගේ දෘෂ්ටිය ද තමාගේ අයොනිසොමනසිකාර හෙතුයෙන් හෝ පරතොඝොෂප්‍රත්‍යයෙන් හෝ උපන, තෙල දෘෂ්ටිය භූත ය, සංස්කෘත ය, කල්පිත ය, ප්‍රතීත්‍යසමුත්පන්න ය. යම් කිසිවක් ම භූත ද සංඛත ද කල්පිත ද ප්‍රතීත්‍යසමුත්පන්න ද එ අනිස වෙයි, යමක් අනිස වේ නම් එ දුක් ය, යමක් දුක් වේ නම් එයට ම මේ ආයුෂ්මත් ඇලුණේ ය. එයට ම මෙ ආයුෂ්මත් බැසගත්තේ ය.

වහන්ස, යම් ම ආයුෂ්මතෙක් "ගෘහපතිය, මම 'ලොකය අන්තවත් යැ, -පෙ- ලොකය අනන්තවත් යැ ... එමැ ජීවය එමැ ශරීර ය .. සත්ත්ව මරණින් මතු වෙයි .. සත්ත්ව මරණින් මතු නො වෙයි ... සත්ත්ව මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි ... සත්ත්ව මරණින් මතු නො ම වෙයි, නො ම නො වෙ යි. මෙ ම සත්‍ය ය, අන්‍යය මොඝය යන මෙ බඳු දෘෂ්ටි ඇතියෙමි" කීයේ නම්, මෙ ආයුෂ්මත්හුගේ ද දෘෂ්ටිය තමාගේ අයොනිසොමනසිකාරයෙන් හෝ පරතොඝොෂප්‍රත්‍යයෙන් හෝ උපන. තෙල දෘෂ්ටිතොමෝ භූත ය, සංස්කෘත ය, කල්පිත ය, ප්‍රතීත්‍යසමුත්පන්න ය.

මේ කිසිවක් භූත, සංස්කෘත, කල්පිත, ප්‍රතීත්‍යසමුත්පන්න වේ ද, එ අනිස. යමක් අනිස වේ ද, එ දුක. යමක් දුක් වේ ද, එයට ම මෙ ආයුෂ්මත් ඇලුණේය. එයට ම මෙ ආයුෂ්මත් බටුයේ යි.

මෙසේ කී කල්හි එ පිරිවැජියෝ අනේපිඩු ගැහැවිහට තෙල කීහ: "ගෘහපතිය, අප හැම දෙන විසින් යථාස්වක දෘෂ්ටිහු ව්‍යාකෘතයහ. ගෘහපතිය, තෝ කවර දෘෂ්ටි ඇතියෙක්හි දැයි කියව"යි.

යං ඛො භන්තෙ කිඤ්චි භූතං සඞ්ඛතං චෙතයිතං පටිච්චසමුප්පන්නං, තදනිච්චං. යදනිච්චං තං දුක්ඛං. යං දුක්ඛං තං නෙතං මම, නෙසො හමස්මි, න මෙ සො අත්තාති එවංදිට්ඨිකො අහං භන්තෙති.

යං ඛො ගහපති කිඤ්චි භූතං සඞ්ඛතං චෙතයිතං පටිච්චසමුප්පන්නං තදනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදෙව ත්වං ගහපති අල්ලීනො, තදෙව ත්වං ගහපති අජ්ඣුපගතොති.

යං ඛො භන්තෙ කිඤ්චි භූතං සංඛතං චෙතයිතං පටිච්චසමුප්පන්නං තදනිච්චං, යදනිච්චං, තං දුක්ඛං, යං දුක්ඛං තං නෙතං මම, නෙසො'හමස්මි' න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං තස්ස ච උත්තරිං නිස්සරණං යථාභූතං පජානාමීති. එවං තෙ පරිබ්බාජකා තුණ්හීභූතා මඞ්කුභූතා පත්තක්ඛන්ධා අධොමුඛා පජ්ඣායන්තා අප්පටිභානා නිසීදිංසු.

අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති තෙ පරිබ්බාජකෙ තුණ්හීභූතෙ මඞ්කුභූතෙ පත්තක්ඛන්ධෙ අධොමුඛෙ පජ්ඣායන්තෙ අප්පටිභානෙ විදිත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසංකමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවා-දෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අනාථපිණ්ඩිකො ගහපති යාවතකො අහොසි තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං භගවතො ආරොචෙසි.

සාධු සාධු ගහපති, එවං ඛො තෙ ගහපති මොඝපුරිසා කාලෙන කාලං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙතබ්බාති. අථ ඛො භගවා අනාථපිණ්ඩිකං ගහපතිං ධම්මියා කථාය සංදස්සෙසි, සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො අනාථපිණ්ඩිකො ගහපති භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො භගවා අචිරපක්කන්තෙ අනාථපිණ්ඩිකෙ ගහපතිම්හි භික්ඛූ ආමන්තෙසි. යොපි සො භික්ඛවෙ භික්ඛු වස්සසතූපසම්පන්නො ඉමස්මිං ධම්මවිනයෙ, සොපි එවමෙවං අඤ්ඤතිත්ථියෙ පරිබ්බාජකෙ සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගණ්හෙය්‍ය යථා තං අනාථපිණ්ඩිකෙන ගහපතිනා නිග්ගහීතාති.

වහන්ස, මම යම් කිසිවක් භූත ද, සංස්කෘත ද, කල්පිත ද, ප්‍රතීත්‍ය සමුත්පන්න ද, එ අනිත්‍ය වෙයි. යමක් අනිත්‍ය ද, එ දුඃඛ වෙයි. යමක් දුඃඛ වේ නම්, 'තෙල මාගේ නො වෙයි, තෙල මම් නො වෙමි, තෙල මාගේ ආත්ම නො වෙයි යන මෙ බඳු දෘෂ්ටි ඇතියෙකිමි''යි.

ගෘහපතිය, යම් කිසිවක් භූත සංස්කෘත කල්පිත ප්‍රතීත්‍යසමුත්පන්න වේ නම්, එ අනිත්‍ය වෙයි. යමක් අනිත්‍ය වේ නම් එ දුඃඛ වෙයි. යමක් දුඃඛවේ නම් ගෘහපතිය, තෝ එයට ම ඇලුනෙහි, ගෘහපතිය, තෝ එයට ම බටුයෙහියි.

වහන්ස, යම් කිසිවක් භූත සංස්කෘත කල්පිත ප්‍රතීත්‍ය සමුත්පන්න වේ නම්, එ අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම්, එ දුක් වෙයි. යමක් දුක් වේ නම්, එය 'තෙල මාගේ නො වෙයි තෙල මම් නො වෙමි, තෙල මාගේ ආත්ම නො වෙයි. මෙසේ තෙල සම්‍යක් ප්‍රඥායෙන මා විසින් මොනොවට දක්නාලදී. එයට ද මතුයෙහි යථාභූතකොට නිඃසරණය දනිමි'යි. මෙසේකී කල්හි එ පරිව්‍රාජකයෝ තුෂ්ණීභූත වූවාහු දෙම්නස් ඇතියහු යට හෙලූ කඳ ට ඇත්තාහු යටහෙලු මූව ඇත්තාහු සිතිවිලි සිතන්නාහු ප්‍රතිභාන රහිත වැ හුන්හ.

ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපති තෙම එ පිරිවැජියන් තුෂ්ණීම්භූතයහු උපන් දෙම්නස් ඇතියහු බාහාගත් කඳට ඇතියහු යටහෙලූ මූව ඇතියහු සිතිවිලි පර වූවහු ප්‍රතිභාන රහිත වූවහු දැන භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් අනාථපිණ්ඩික ගෘහපති තෙම ඒ අන්තොටු පිරිවැජියන් හා සමග යම් පමණ වූ කථාසංලාපයෙක් වී නම්, එ හැම භාග්‍යවතුන් වහන්සේට සැල කළේ ය.

ගැහැවිය, මැනැවි, මැනැවි, ගැහැවිය, මෙසේම ඒ මොඝ පුරුෂයෝ කලින් කල සකරුණෙන් සුනිගෘහීත කොට නිගැනියයුත්තාහ යි. ඉක්බිති භාග්‍යවතුන් අනාථපිණ්ඩිකගෘහපතිහු දහැම් කථායෙන් සන්‍දශීන කරවූහ, සමාදන් කරවූහ, මොනොවට ඔදගැන්වූහ, සුපහන් කරවූහ. ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපති භාග්‍යවතුන් වහන්සේ විසින් දහැම් කථායෙන් සන්‍දර්ශිත වූයේ සමාදපිත වූයේ සමුත්තෙජිත වූයේ සම්ප්‍රහර්ෂිත වූයේ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ මොනොවට වැඳ පැදකුණු කොට නැඟී ගියේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනාථපිණ්ඩික ගෘහපතියා නික්මගිය නො බෝකල් ඇති වත් ම භික්ෂූන් ඇමතු සේක. 'මහණෙනි, මෙ දහම් විනයෙහි උපසපුයෙන් සියක්වස් ගිය මහණෙක් වේ නම්, අනාථපිණ්ඩික ගෘහපතිහු විසින් ඔහු යම් පරිද්දෙකින් නිගෘහීත වෙත් නම්, හෙද මෙ පරිද්දෙන් ම සකරුණෙන් අන්තොටු පිරිවැජියන් නිගත්තේ''යි.

# 10. 2. 5. 4

## වජ්ජියමාහිත සුත්තං

එකං සමයං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ, අථ ඛො වජ්ජියමාහිතො ගහපති දිවා දිවස්ස චම්පාය නික්ඛමි භගවන්තං දස්සනාය. අථඛො වජ්ජියමාහිතස්ස[1] ගහපතිස්ස එතදහොසි: අකාලො ඛො තාව භගවන්තං දස්සනාය, පතිසල්ලීනො භගවා, මනොභාවනීයානම්පි භික්ඛූනං අකාලො දස්සනාය, පතිසල්ලීනා මනොභාවනීයා භික්ඛූ. යන්නූනාහං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසංකමෙය්‍යන්ති.

අථ ඛො වජ්ජියමාහිතො ගහපති යෙනඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා සඞ්ගම්ම සමාගම්ම උන්නාදිනො උච්චාසද්ද මහාසද්ද අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තා නිසින්නා හොන්ති.

අද්දසංසු[2] ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා වජ්ජියමාහිතං ගහපතිං දූරතොව ආගච්ඡන්තං. දිස්වා අඤ්ඤමඤ්ඤං සණ්ඨපෙසුං අප්පසද්ද හොන්තො හොන්තු, මා හොන්තො සද්දමකත්ථ, අයං වජ්ජියමාහිතො ගහපති ආගච්ඡති, සමණස්ස ගොතමස්ස සාවකො, යාවතා ඛො පන සමණස්ස ගොතමස්ස සාවකා ගිහී ඔදාතවසනා චම්පායං පටිවසන්ති, අයං තෙසං අඤ්ඤතරො. වජ්ජියමාහිතො ගහපති අප්පසද්දකාමා ඛො පන තෙ ආයස්මන්තො අප්පසද්දවිනීතා අප්පසද්දස්ස වණ්ණවාදිනො අප්පෙවනාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යාති.

අථ ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා තුණ්හී අහෙසුං. අථ ඛො වජ්ජියමාහිතො ගහපති යෙන තෙ පරිබ්බාජකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං විතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො වජ්ජියමාහිතං ගහපතිං තෙ පරිබ්බාජකා එතදවොචුං:

''සච්චං කිර ගහපති සමණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසති උපවදතී'ති?

1. වජ්ජියාමහිතස්ස – සීමු.
2, අද්දසාසුං – සීමු.

## 10. 2. 5. 4
## වජ්ජියමාහිත සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ චම්පා නුවර සමීපයෙහි 'ගග්ගරා' නම් පොකුණු තෙර වැඩ වසන සේක. එකල්හි වජ්ජියමාහිත නම් ගෘහපතියා භාග්‍යවතුන් වහන්සේ දක්නා සඳහා චම්පා නුවරින් මහ දවල්හි නික්මියේ ය. එකල්හි වජ්ජියමාහිත ගෘහපතියහට මෙසේ සිත විය: "භාග්‍යවතුන් වහන්සේ දක්නට තව ම නො කලි. භාග්‍යවතුන් වහන්සේ පිළිසලනෙහි හුන්හ. මනො භාවනීය භික්ෂූනුදු දක්නට නො කලි, මනො භාවනායෙහි ඇලුණු භික්ෂුහු පිළිසලනෙහි යෙදුණහ. ඉදින් මම අන්තොටු පිරිවැජියන්ගේ අසපුවට යෙම් නම් මැනැවැ"යි.

ඉක්බිති වජ්ජියමාහිත ගෘහපති අන්තොටු පිරිවැජ්ජන්ගේ අසපුවට එළඹියේ ය. එකල්හි අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ එක් රැස්ව ඔල්වරසන් ඇත්තාහු උස්හඬ ඇත්තාහු මහහඬ ඇත්තාහු නන් වැදැරුම් තිරිසන්ගිය කථා කියමින් හුන්නාහු වෙත්.

ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ වජ්ජියමාහිත ගෘහපතිහු එනු දුරදී ම දුටහ. දුරදී ම එන්නහු දැක උනුන් පිහිටුවූහ (නවතාලූහ) "භවත්හු නිහඬ වෙත්වා, භවත්හු නහමක් ශබ්ද කෙරෙත්වා. ශ්‍රමණභවත් ගෞතම යන්ගේ ශ්‍රාවක මේ වජ්ජියමාහිත ගෘහපති එයි. ශ්‍රමණ භවත් ගෞතම යන්ගේ ශ්‍රාවක වූ සුදුවත් හඳනා යම්පමණ ගිහිහු චම්පායෙහි වසත් ද, මේ වජ්ජියමාහිත ගෘහපති ඔවුන්ගෙන් අන්‍යතරයෙක් වෙයි. අල්පශබ්ද කැමැති ඒ භවත්හු අල්පශබ්ද ඇතියහු (මහණ ගොයුම්හු) විසින් විනීත වූවාහු අල්පශබ්දයාගේ වණී කියන්නාහු නිහඬ පිරිසැ යි දැන එළඹිය යුතු කොට හඟනේ නම් මැනැවැ"යි.

ඉක්බිති එ අන්තොටු පිරිවැජියෝ තුෂ්ණීම්භූත වූහ. එකල්හි වජ්ජියමාහිත ගැහැවී එ පිරිවැජියන් කරා එළඹියේ ය. එළඹ එ අන්තොටු පිරිවැජියන් සමග සතුටු විය. සතුටු විය යුතු සම්මොදනීය කථාව කොට නිමවා එකත්පසෙක හින. එකත්පසෙක හුන් වජ්ජියමාහිත ගෘහපතිහට එ පිරිවැජියෝ මෙසේ කරුණ කීහ:

ගෘහපතිය, මහණ ගොයුම් හැම තපසක් (දුෂ්කර ක්‍රියාවක්) ගරහන්නේ ය, රූක්ෂාජීව ඇති දුෂ්කර තවුස් දම් රක්නා හැමට එකැතින් උපක්‍රොෂ කරන්නේය, උපවාද කරන්නේය යනු සැබවෙක් දැයි?"

න ඛො භන්තෙ භගවා සබ්බං තපං ගරහති, න පි සබ්බං තපස්සිං ලූඛා-ජීවිං එකංසෙන උපක්කොසති උපවදති. ගාරය්හං ඛො පන භන්තෙ භගවා ගරහති, පාසංසියං පසංසති, ගාරය්හං ඛො පන භන්තෙ භගවා ගරහන්තො, පාසංසියං[1] පසංසන්තො විභජ්ජවාදෙ භගවා. න සො භගවා එත්ථ එකංසවාදෙති.

එවං වුත්තෙ අඤ්ඤතරො පරිබ්බාජකො වජ්ජියමාහිතං ගහපතිං එතදවොච:

''ආගමෙහි ත්වං ගහපති යස්ස ත්වං සමණස්ස ගොතමස්ස වණ්ණං භාසසි සො සමණො ගොතමො වෙනයිකො අප්පඤ්ඤත්තිකොති.

එත්ථපාහං භන්තෙ ආයස්මන්තෙ වක්ඛාමි සහධම්මෙන ඉදං කුසලන්ති භන්තෙ භගවතා පඤ්ඤත්තං, ඉදං අකුසලන්ති භන්තෙ භගවතා පඤ්ඤත්තං. ඉති කුසලාකුසලං භගවා පඤ්ඤපයමානො සපඤ්ඤත්තිකො භගවා, න සො භගවා වෙනයිකො අප්පඤ්ඤත්තිකොති.

එවං වුත්තෙ තෙ පරිබ්බාජකා තුණ්හීභූතා මඞ්කුභූතා පත්තක්ඛන්ධා අධොමුඛා පජ්ඣායන්තා අප්පටිභානා නිසීදිංසු. අථ ඛො වජ්ජියමාහිතො ගහපති තෙ පරිබ්බාජකෙ තුණ්හීභූතෙ මඞ්කුභූතෙ පත්තක්ඛන්ධෙ අධො-මුඛෙ පජ්ඣායන්තෙ අප්පටිභානෙ විදිත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසංකමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වජ්ජියමාහිතො ගහපති යාවතකො අහොසි තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං කථාසල්ලාපො තං සබ්බං භගවතො ආරොචෙසි.

සාධු සාධු ගහපති. එවං ඛො තෙ ගහපති මොඝපුරිසා කාලෙන කාලං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙතබ්බා. නාහං ගහපති සබ්බං තපං තපිතබ්බන්ති වදාමි, න පනාහං ගහපති සබ්බං තපං න තපි-තබ්බන්ති වදාමි. නාහං ගහපති සබ්බං සමාදානං සමාදතබ්බන්ති[2] වදාමි. න පනාහං ගහපති සබ්බං සමාදානං න සමාදතබ්බන්ති වදාමි. නාහං ගහපති සබ්බං පධානං පදහිතබ්බන්ති වදාමි. න පනාහං ගහපති සබ්බං පධානං න පදහිතබ්බන්ති වදාමි. නාහං ගහපති සබ්බො පටි-නිස්සග්ගො පටිනිස්සජ්ජිතබ්බොති වදාමි. න පනාහං ගහපති සබ්බො පටිනිස්සග්ගො න පටිනිස්සජ්ජිතබ්බොති වදාමි. නාහං ගහපති සබ්බා-විමුත්ති විමුච්චිතබ්බාති වදාමි, න පනාහං ගහපති සබ්බාවිමුත්ති න විමුච්චිතබ්බාති වදාමි.

---

1. පසංසිතබ්බං - මජසං. පසං. සිශං. සිමු.
2. සමාදිතබ්බන්ති-මජසං.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ හැම තපස නො මැ ගරහන්නාහ, රූක්ෂාජීව ඇති හැම තපස්වියකුට ඒකාන්තයෙන් නො ද උපක්‍රොෂ හා උපවාද හා නො කරන්නාහ. වහන්ස, භගවත්හු ගැරැහිය යුක්තහු ම ගරහන්නාහ, පැසැසියයුතුවහු ම පසස්නාහ. වහන්ස, ගැරැහියයුතුවහු ම ගරහන, පැසැසියයුතුවහු ම පසස්නා භාග්‍යවතුන් වහන්සේ විභජ්ජවාද ඇතියහ. ඒ භගවත්හු මෙ කරුණෙහිලා ඒකාංශවාද ඇතියාහු නො වෙත්.

මෙසේ කී කල්හි අන්‍යතර පරිව්‍රාජකයෙක් වජ්ජියමාහිත ගෘහපතිහට මෙතෙල කරුණ කීහ:

''ගැහැවිය, ඉවසව, තෝ යම් බඳු මහණ ගොයුමක්හුගේ ගුණ වනහි නම්, ඒ මහණ ගොයුම්හු (මෙරමා විසින්) හික්මැවියයුතුවහ, (කිසිවක්) පැනැවිය නො සමත්හ''යි.

වහන්ස, මෙ කරුණෙහිදු මම් ආයුෂ්මතුන්නට සහ ධර්මයෙන් කියනෙමි: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මෙ කුසල' යි පැනැවිණ, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් 'මෙ අකුසල' යි පැනැවිණ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ කුශලා කුශල පනවන්නාහු භගවත් සප්‍රඥප්තික වෙති. ඒ භගවත්හු වෛනයික අප්‍රඥප්තික නො වෙත් යයි.

මෙසේ කී කල්හි ඒ පිරිවැජියෝ තුෂ්ණිම්භූත වූවාහුමකු වූවාහු යට හෙලූ කඳට ඇතියහු යට අළ මුව ඇත්තාහු සිතිවිලි සිතනුවෝ ප්‍රතිභාන රහිත ව හුන්හ. ඉක්බිති වජ්ජියමාහිත ගෘහපති තුෂ්ණිම්භූත, මඞ්කුභූත, නැමූ කඳට ඇති යට හෙලූ ඇස් ඇති සිතිවිලි සිතන කිසිවක් නොවටහන ඒ පිරිවැජියන් දැන හුනස්නෙන් නැඟ භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් භාග්‍ය-වතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හිඳ. එකත්පසෙක හුන් වජ්ජියමාහිත ගැහැවි ඒ පරිව්‍රාජකයන් හා සමඟ යම් පමණ කථාසල්ලාප යෙක් වී නම් ඒ හැම භාග්‍යවතුන් වහන්සේට සැල කෙළේ ය.

ගෘහපතිය, මැනව, මැනැව, ගෘහපතිය, මෙ සෙයින් ම ඒ මොඝ පුරුෂයෝ සහධර්මයෙන් කලින් කල සුනිගෘහීතව නිගැනිය යුත්තාහ. ගෘහපතිය හැම තවුස් දමක් තැවිය යුතු කොට මම නො කියමි ගෘහපතිය, හැම තවුස් දමක් නො තැවිය යුතු කොට ද මම නො කියමි. ගෘහපතිය, හැම සමාදනයක් සමාදන් විය යුතු කොට මම නොකියමි. ගෘහපතිය, හැම සමාදනයක් සමාදන් වියයුතු යයි ද මම නො කියමි. ගෘහපතිය, හැම ප්‍රධන් වීර්‍ය්‍යයක් කළ යුතු යයි මම නො කියමි. ගෘහපතිය, හැම ප්‍රධන් වීර්‍ය්‍යයක් නො කළ යුතු යයි ද මම නො කියමි. ගෘහපතිය, හැම ප්‍රතිනිඃසර්ගයෙක් දුරලිය යුතු යයි මම නො කියමි. ගෘහපතිය, හැම ප්‍රතිනිඃසර්ගයෙක් දුර නො ලිය යුතුයයි ද මම නො කියමි. ගෘහපතිය, හැම විමුක්තියෙක් විමුක්තව්‍ය නො කියමි. ගෘහපතිය, හැම විමුක්තියෙක් විමුක්තව්‍ය නො වේ යයි ද මම නො කියමි.

යං හි ගහපති තපං තපතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපං තපං න තපිතබ්බන්ති වදමි. යඤ්ච ඛ්වාස්ස ගහපති තපං තපතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපං තපං තපිතබ්බන්ති වදමි.

යං හි ගහපති සමාදානං සමාදියතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපං සමාදානං න සමාදිතබ්බන්ති වදමි, යඤ්ච ඛ්වාස්ස ගහපති සමාදානං සමාදියතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපං සමාදානං සමාදිතබ්බන්ති වදමි.

යං හි ගහපති පධානං පදහතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපං පධානං න පදහිතබ්බන්ති වදමි. යඤ්ච ඛ්වාස්ස ගහපති පධානං පදහතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපං පධානං පදහිතබ්බන්ති වදමි.

යං ගහපති පටිනිස්සග්ගං පටිනිස්සජ්ජයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො පටිනිස්සග්ගො පටිනිස්සජිතබ්බොති වදමි. යඤ්ච ඛ්වාස්ස ගහපති පටිනිසග්ගං පටිනිස්සජයතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො පටිනිස්සග්ගො න පටිනිස්සජිතබ්බොති වදමි.

යං හි ගහපති විමුත්තිං විමුච්චයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති, කුසලා ධම්මා පරිහායන්ති, එවරූපා විමුත්ති න විමුච්චිතබ්බාති වදමි. යඤ්ච ඛ්වාස්ස ගහපති විමුත්තිං විමුච්චයතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපා විමුත්ති විමුච්චිතබ්බාති වදමීති.

අථ ඛො වජ්ජියමාහිතො ගහපති භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

ගැහැවිය, යම් ම තපසක් කරනුවහුගේ අකුසල් දහම්හු වැඩෙත් ද, කුසල් දහම් හු පිරිහෙත් ද, මෙබඳු තව නො තැවියයුතු යයි කියමි. ගැහැවිය, යම් ම තවක් තවනා ඔහුගේ අකුසල් දහම් හු පිරිහෙත් ද, කුසල් දහම්හු වැඩෙත් ද, මෙබඳු තව තැවියයුතු යයි කියමි.

ගැහැවිය, යම් ම සමාදනයක් සමාදන්වනුවහුගේ අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද මෙ බඳු සමාදනය නො සමාදන් වියයුතු යයි කියමි. ගැහැවිය, යම් ම සමාදනයක් සමාදන් වන ඔහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත් ද, කුශල ධර්මයෝ වැඩෙත් ද, මෙ බඳු සමාදනය සමාදන් වියයුතු යයි කියමි.

ගැහැවිය, යම් ම ප්‍රධන්වීය්‍ර්‍යයක් කරනුවහුගේ අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද, මෙ බඳු ප්‍රධන් වීය්‍ර්‍ය කළයුතු යයි කියමි. ගැහැවිය, යම් ම ප්‍රධන්වීය්‍ර්‍යයක් කරන ඔහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත් ද, කුශල ධර්මයෝ වැඩෙත් ද, මෙබඳු ප්‍රධන්වීය්‍ර්‍ය කළයුතු යයි කියමි.

ගැහැවිය, යම් ම ප්‍රතිනිඃසර්‍ගයක් දුරලනුවහුගේ අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු ප්‍රතිනිඃසර්‍ගය දුරලියයුතු යයි කියමි. ගැහැවිය, යම් ම ප්‍රතිනිඃසර්‍ගයක් දුරලනුවහුගේ අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙ බඳු ප්‍රතිනිඃසර්‍ගය නො දුරලිය යුතුයයි කියමි.

ගැහැවිය, යම් ම විමුක්තියක් කරනුවහුගේ අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙ බඳු විමුක්තිය නො කටයුතු යයි කියමි. ගැහැවිය, යම් ම විමුක්තියක් කරනුවහුගේ අකුශලධර්මයෝ පිරිහෙත් ද, කුශලධර්මයෝ වැඩෙත් ද, මෙ බඳු විමුක්තිය කළයුතු යයි කියමි යි.

ඉක්බිති වජ්ජියමාහිත ගැහැවි භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථායෙන් සන්‍දර්ශිත වූයේ සමාදපිත වූයේ සමුත්තෙජිත වූයේ සම්ප්‍රහර්ෂිත වූයේ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

අථ ඛො භගවා අචිරපක්කන්තෙ වජ්ජියමාහිතෙ ගහපතිම්හි භික්ඛූ ආමන්තෙසි: යො පි සො භික්ඛවෙ භික්ඛු දීඝරත්තං අප්පරජක්ඛො ඉමස්මිං ධම්මවිනයෙ, සො පි එවමෙව අඤ්ඤතිත්ථියෙ පරිබ්බාජකෙ සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගණ්හෙය්‍ය යථා තං වජ්ජියමාහිතෙන ගහපතිනා නිග්ගහීතාති.

## 10. 2. 5. 5

## උත්තිය සුත්තං

අථ ඛො උත්තියො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනියං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො උත්තියො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

කිං නු ඛො භො ගොතම සස්සතො ලොකො, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති?

අව්‍යාකතං ඛො එතං උත්තිය මයා 'සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති'.

කිං පන භො ගොතම 'අසස්සතො ලොකො, ඉද මෙව සච්චං, මොඝමඤ්ඤන්ති'?

එතම්පි ඛො උත්තිය අව්‍යාකතං මයා 'අසස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති'.

කිං නු ඛො භො ගොතම අන්තවා ලොකො -පෙ- තං ජීවං, තං සරීරං -පෙ- අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීරං -පෙ- හොති තථාගතො පරම්මරණා -පෙ- න හොති තථාගතො පරම්මරණා -පෙ- හොති ච න හොති ච තථාගතො පරම්මරණා -පෙ- නෙව හොති න නහොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති'?

එතම්පි ඛො උත්තිය අව්‍යාකතං මයා 'නෙව හොති න නහොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වජ්ජියමාහිත ගෘහපතිහු ගිය නො බෝකල් ඇතිවත් ම මහණුන් ඇමතූ සේක: මහණෙනි, යම් බඳු මහණෙක් මෙ දහම්විනයෙහි දීර්ඝරාත්‍රයෙහි නුවණැස්හි කෙලෙස් රජස් නැතියේ වී නම්, එ මහණ ද, යම් පරිද්දෙකින් වජ්ජියමාහිත ගෘහපතිහු විසින් නිගෘහීත වූහු ද එපරිදි ම සුනිගෘහීත කොට සකරුණෙන් නිගන්නේ ය.

## 10. 2. 5. 5

## උත්තිය සූත්‍රය

එකල්හි උත්තිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හින. එකත්පසෙක හුන් උත්තිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට තෙල කීය:

කිමෙක, භවත් ගෞතමයෙනි, 'ලොකය ශාශ්වතය' යන මෙම සත්‍ය ද අනෙක මොස වේ ද? යි.

උත්තිය, ''ලොකය ශාශ්වත ය යන මෙම සත්‍යය වෙයි. අනෙක මොස වේ ය''යි මෙසේ මා විසින් අව්‍යාකෘත ම වෙයි.

කිමෙක භවත් ගෞතමයෙනි, ''ලොකය අශාශ්වත ය'' යන මෙම සත්‍ය වේ ද? අනෙක මොස වේ ද? යි.

උත්තිය, ''ලොකය ශාශ්වත ය,'' යන මෙම සත්‍ය වෙයි, අනෙක මොස වෙයි යන තෙල කරුණ ද මා විසින් අව්‍යාකෘත වේ යයි,

කිමෙක, භවත්, ගෞතමයෙනි, ''ලොකය අන්තවත් ය''...'එමැ ජීව ය, එමැ ශරීර ය' ... ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි ... 'මරණින් මතු සත්ත්ව වෙයි ... සත්ත්ව මරණින් මතු නො වෙයි' ... සත්ත්ව මරණින් මතු වන්නේ ද නො වන්නේ ද වෙයි ... සත්ව මරණින් මතු නො ම වන්නේ ය. නො ම නො වන්නේ ය' යන මෙ ම සත්‍ය වෙයි. අනෙක මොස වේ දැයි?

උත්තිය, 'සත්ව මරණින් මතු නො ම වන්නේය, නොම නො වන්නේ ය' යන මෙ ම සත්‍ය වෙයි, අනෙක මොස වෙය යන තෙල කරුණ ද මා විසින් අව්‍යාකෘත වේ යයි.

කින්නු ඛො භො ගොතම සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉති පුට්ඨො සමානො 'අව්‍යාකතං ඛො එතං උත්තිය මයා සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වදෙසි.

කිම්පන භො ගොතම අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉති පුට්ඨො සමානො එතම්පි ඛො උත්තිය අව්‍යාකතං මයා 'අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති' වදෙසි.

කින්නු ඛො භො ගොතම අන්තවා ලොකො–පෙ–අනන්තවා ලොකො –පෙ–තං ජීවං තං සරීරං –පෙ– අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං –පෙ– හොති තථාගතො පරම්මරණා –පෙ– න හොති තථාගතො පරම්මරණා –පෙ– හොති ච න හොති ච තථාගතො පරම්මරණා –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉති පුට්ඨො සමානො 'එතම්පි ඛො උත්තිය අබ්‍යාකතං මයා නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වදෙසි. අථ කිඤ්චරහි භොතා ගොතමෙන ව්‍යාකතන්ති?

අභිඤ්ඤාය ඛො අහං උත්තිය සාවකානං ධම්මං දෙසෙමි සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියායාති.

යං පනෙතං භවං ගොතමො අභිඤ්ඤාය අභිඤ්ඤාය සාවකානං ධම්මං දෙසෙති සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය සබ්බො වා තෙන ලොකො නියිස්සති[1] උපඩ්ඪො වා තිභාගො වා ති? එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි.

අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: 'මාහෙවං ඛො උත්තියො පරිබ්බාජකො පාපකං දිට්ඨිගතං පටිලභි. 'සබ්බසාමුක්කංසිකං වත මෙ සමණො ගොතමො පඤ්හං පුට්ඨො සංසාදෙති, නො විස්සජ්ජෙති, න නූන විසහති' ති. තදස්ස උත්තියස්ස පරිබ්බාජකස්ස දීඝරත්තං අහිතාය දුක්ඛායා'ති.

1. නියති – මජ්සං. නීයායති–ස්‍යා.

කිමෙක, භවත් ගෞතමයෙනි, 'සත්ත්ව ශාශ්වත ය' යන මෙ ම සත්‍ය වෙයි, අනෙක මොස වේ ද'යි මෙසේ පුළුවුස්නා ලදුයේ ''උත්තිය, 'ලොකය ශාශ්වත ය, යන මෙ ම සත්‍ය වෙයි, අනෙක මොස වේ ය' යන තෙල මා විසින් අව්‍යාකෘත වේ යයි කියහි,

කිමෙක, භවත් ගෞතමයෙනි, 'ලොකය අශාශ්වත ය' යන මෙ ම සත්‍ය වෙයි, අනෙක මොස වේ දැයි? මෙසේ පුළුවුස්නා ලදුයේ 'උත්තිය, 'ලොකය අශාශ්වත ය' යන මෙ ම සත්‍ය වෙයි, අනෙක මොසය යන තෙල කරුණ ද මා විසින් අව්‍යාකෘත ය''යි කියහි,

කිමෙක, භවත් ගෞතමයෙනි, 'ලොකය අන්තවත් ය' ... 'ලොකය අනන්තවත්ය' ... ඒමැ 'ජීව ය, ඒමැ ශරීර ය, ... ජීවය අනෙකෙකි, ශරීරය අනෙකෙකැ යි ... 'සත්ත්ව මරණින් මතු වන්නේ ය' ... සත්ත්ව මරණින් මතු නො වන්නේ ය ... සත්ත්ව මරණින් මතු වන්නේ ද නො වන්නේ ද වෙයි ... සත්ත්ව මරණින් මතු නො ම වන්නේ ය, නො ම නො වන්නේ ය යන මෙ ම සත්‍ය, අනෙක මොස දැයි මෙසේ පුළුවුස්නා ලදුයේ ම ''උත්තිය සත්ත්ව මරණින් මතු නො ම වන්නේ ය, නො ම නො වන්නේ ය, යන මෙ ම සත්‍යය, අනෙක මොස වේය යන තෙල කරුණ ද මා විසින් අව්‍යාකෘත ය''යි කියහි. වැලි ඒසේ වීනම් භවත් ගෞතමයන් විසින් කවරක් ව්‍යාකෘත වේ දැ යි?

උත්තිය, මම විශිෂ්ටඥනයෙන් දැන ම සත්ත්වයන්ගේ විශුද්ධිය සඳහා ශොකපරිදෙවයන්ගේ සමතික්‍රමණය සඳහා දුක්දෙම්නසුන්ගේ අස්තඞ්ගමය සඳහා න්‍යායයාගේ අධිගමය සඳහා නිර්වාණයාගේ සාක්ෂාත් කරණය සඳහා ශ්‍රාවකයනට ධර්ම දෙශනා කරමි යි.

භවත් ගෞතමයෝ තෙල යම් ධර්මයක් සත්ත්වයන්ගේ විශුද්ධිය සඳහා ශොකපරිදෙවයන්ගේ සමතික්‍රමණය සඳහා දුක් දෙම්නසුන්ගේ අස්තඞ්ගමය සඳහා න්‍යායයාගේ අධිගමය සඳහා නිර්වාණයාගේ සාක්ෂාත් කරණය සඳහා සව්වනට ධර්ම දෙශනා කරත් නම්, එ දහමින් හැම ලොව හෝ, අඩෙක් හෝ, තුන්වන භාගයෙක් හෝ (නිවනට) පමුණුවනු ලැබේ දැ යි? මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූත වූහ.

එකල්හි ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයනට තෙල සිත විය: ''උත්තිය පරිව්‍රාජක මෙබඳු ලාමක දෘෂ්ටිගතයක් නහමක් ලබාවා. 'එකැතින් මා විසින් සර්වෝත්කර්ෂ ප්‍රශ්නය පුළුවුස්නා ලද ශ්‍රමණ භවත් ගෞතමයෝ වළහති, නො විසඳති, එකැතින් නො ඉවසත් යි. එය උත්තිය පරිව්‍රාජකහට දීර්ඝරාත්‍රයෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේ යයි.

අථ ඛො ආයස්මා ආනන්දො උත්තියං පරිබ්බාජකං එතදවොච: තෙන හාවුසො උත්තිය උපමං තෙ කරිස්සාමි. උපමාය පි ඉධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති.

සෙය්‍යථාපි ආවුසො උත්තිය රඤ්ඤො පච්චන්තිමං නගරං දළ්හුද්දාපං[1] දළ්හපාකාරතොරණං එකද්වාරං. තත්‍රස්ස දොවාරිකො පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී අඤ්ඤාතානං නිවාරෙතා, ඤාතානං පවෙසෙතා. සො තස්ස නගරස්ස සමන්තා අනුපරියායපථං අනුක්කමමානො න පස්සෙය්‍ය පාකාරසන්ධිං වා පාකාරවිවරං වා අන්තමසො බිළාරනික්කමනමත්තම්පි, නො ච ඛ්වස්ස එවං ඤාණං හොති: එත්තකා පාණා ඉමං නගරං පවිසන්ති වා නික්ඛමන්ති වාති. අථ ඛ්වස්ස එවමෙත්ථ හොති: යෙ ඛො කෙචි ඔළාරිකා පාණා ඉමං නගරං පවිසන්ති වා නික්ඛමන්ති වා සබ්බෙ තෙ ඉමිනා ද්වාරෙන පවිසන්ති වා නික්ඛමන්ති වාති.

එවමෙව ඛො ආවුසො උත්තිය න තං තථාගතස්ස එවං උස්සුක්කතං හොති 'සබ්බො වා තෙන ලොකො නීයිස්සති, උපඩ්ඪො වා තිභාගො වා'ති. අථ ඛො එවමෙත්ථ තථාගතස්ස හොති: යෙ ඛො කෙචි ලොකම්හා නීයිංසු වා නීයන්ති වා නීයිස්සන්ති වා, සබ්බෙ තෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතූසු සතිපට්ඨානෙසු සූපට්ඨිතචිත්තා සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා එවමෙතෙ ලොකම්හා නීයිංසු වා නීයන්ති වා නීයිස්සන්ති වා'ති.

යදෙව ඛො ත්වං ආවුසො උත්තිය භගවන්තං පඤ්හං අපුච්ඡි[2] තදෙවෙතං පඤ්හං භගවන්තං අඤ්ඤෙන පරියායෙන අපුච්ඡි. තස්මා තෙ තං භගවා න ව්‍යාකාසීති.

## 10. 2. 5. 6.

## කොකනද සුත්තං

එකං සමයං ආයස්මා ආනන්දො රාජගහෙ විහරති තපොදරාමෙ. අථ ඛො ආයස්මා ආනන්දො රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය යෙන තපොද තෙනුපසංකමි ගත්තානි පරිසිඤ්චිතුං, තපොදෙ[3] ගත්තානි පරිසිඤ්චිත්වා පච්චුත්තරිත්වා එකචීවරො අට්ඨාසි ගත්තානි පුබ්බාපයමානො. කොකනදොපි ඛො පරිබ්බාජකො රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය යෙන තපොද තෙනුපසඞ්කමි ගත්තානි පරිසිඤ්චිතුං. අද්දසා ඛො කොකනදො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආයස්මන්තං ආනන්දං එතදවොච:

1. දළ්හුද්ධාපං – මජසං
2. ආපුච්ඡි – සී. මු.
3. තපොදය – ස්‍යා. PTS.

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ උත්තිය පිරිවැජිහට මෙසේ කීහ: ඇවැත් උත්තිය, තට එකරුණෙන් උපමාවකුදු කරන්නෙමි. මෙ ලොව්හි ඇතැම් විඥ පුරුෂයෝ උපමායෙනුදු භාෂිතයාගේ අරුත් දැන ගණිත්.

ඇවැත් උත්තිය, රජකුගේ තරපවුරු පදනම් ඇති, තරපවුරු හා තොරන් ඇති, එක් වාසල් දොරෙකින් යුත් ප්‍රත්‍යන්ත නගරයෙක් යම් පරිදි වේ නම් එහි පණ්ඩිත ව්‍යක්ත ස්වානොවිතප්‍රඥ ඇති අඥතයන් වළහන, ඥතයන් වැද්ද දෙන ද්වාරපාලයෙක් වන්නේ ය. හේ එ නගරයාගේ අවට සිසාරා යන මංහි ඇවිදිනුයේ ප්‍රාකාරසන්ධියක් වේවයි, යටත් පිරිසෙයින් බළලකු නික්මෙන පමණ වූ ද ප්‍රාකාර විවරයක් වේවයි නො දක්නේ ය. ඔහට වනාහි මෙ බඳු නුවණෙක් නො ම පහළ වන්නේ ය: "මෙතෙක් සත්හු මෙ නුවරට පිවිසෙත් හෝ නික්මෙත් හෝ"යි. වැලිදු ඔහට එහි ලා මෙ බඳු සිතෙක් ම වන්නේය: 'යම් කිසි ඖදරික (ස්ථූල) ප්‍රාණිකෙනෙක් මෙ නුවර වදිත්නම් හෝ ඉන් නික්ම යෙත් නම් හෝ, එ හැම දෙන මෙ දෙරින් පිවිස්නාහු ද වෙති, නික්මෙන්නාහුදවෙත්"යි.

ඇවැත් උත්තිය, එපරිද්දෙන් ම "හැම ලොකය හෝ ඉන් අඩෙක් හෝ ත්‍රිභාගයෙක් හෝ එයින් පමුණුවනු ලැබෙයි යන මෙ බඳු වූ ඒ උත්සුක භාවය නො වෙයි. වැලිදු තථාගතයනට මෙ කරුණෙහි ලා මෙ බඳු සිතෙක් ම වෙයි: "යම් කිසිවෙක් ම ලොකයෙන් නික්ම ගියාහු ද, නික්ම යෙත් ද, නික්ම යන්නාහු ද, එ හැම පඤ්චනීවරණ සඞ්ඛ්‍යාත ප්‍රඥව දුර්වල කරණ, චිත්තොපක්ලෙශයන් දුරුරලා සතර සිව්වටන්හි මොනොවට එළැවූ සිත් ඇතියහු සප්ත බොධ්‍යඞ්ගයන් තත් වූ පරිදි වඩා මෙ පරිද්දෙන් ලොකයෙන් නික්ම ගියහ, නික්ම යත්, නික්මයන්නාහ"යි.

ඇවැත් උත්තිය, තෝ යම් ම ප්‍රශ්නයක් භාග්‍යවතුන් වහන්සේ විචාළෙහි නම්, තෙල ප්‍රශ්නය තෝ අන් අයුරෙකින් භාග්‍යතුන් විචාළෙහි ය. එහෙයින් තට භාග්‍යවතුන් වහන්සේ එ නොවිදළ සේකැයි.

## 10. 2. 5. 6

## කොකනද සූත්‍රය

එක් කලෙක ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ රජගහ නුවර සමීපයෙහි තපොදරාමයෙහි වාසය කරත්. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ රාත්‍රි ප්‍රත්‍යූෂ සමයෙහි නැගිට ගාත්‍ර පරිෂෙකය සඳහා තපොද නදිය කරා වැඩියහ. තපොදයෙහි ගාත්‍ර පරිෂෙක කොට පෙරළා ගොඩ නැගී සිරුරු තෙත සිඳුවමින් එකචීවරව සිටියහ. කොකනද පරිව්‍රාජක ද රාත්‍රි හුගේ ප්‍රත්‍යූෂ සමයෙහි නැගී තපොද නදිය කරා ගාත්‍ර ස්නානය පිණිස ගියේය. කොකනද පරිව්‍රාජකයා ආයුෂ්මත් ආනන්ද තෙරුන් එනු දුරදීම දිටී . දැක ආයුෂ්මත් ආනන්ද තෙරුනට තෙල කීය:

කො' ත්‍වා[1] ආවුසොති?

අහමාවුසො, භික්ඛූති.

කතමෙසං ආවුසො භික්ඛූනන්ති?

සමණානං ආවුසො සක්‍යපුත්තියානන්ති.

පුච්ඡෙය්‍යාම මයං ආයස්මන්තං කිඤ්චිදෙව දෙසං සචෙ ආයස්මා ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායාති.

පුච්ඡාවුසො, සුත්වා වෙදිස්සාමාති.

කින්නු ඛො භො 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති' එවං දිට්ඨි භවන්ති?

න ඛො අහං ආවුසො එවං දිට්ඨි 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති.

කිම්පන භො 'අසස්සතො ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති එවන්දිට්ඨි භවන්ති?

න ඛො අහං ආවුසො, එවන්දිට්ඨි 'අසස්සතො ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති.

කින්නු ඛො භො; අන්තවා ලොකො -පෙ- අනන්තවා ලොකො -පෙ- තං ජීවං තං සරීරං -පෙ- අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං -පෙ- හොති තථාගතො පරම්මරණා -පෙ- න හොති තථාගතො පරම්මරණා -පෙ- හොති ච න හොති ච තථාගතො පරම්මරණා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා. ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති එවන්දිට්ඨි භවන්ති?

න ඛො අහං ආවුසො, එවංදිට්ඨි 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති.

තෙනහි භවං න ජානාති න පස්සතීති? න ඛො අහං ආවුසො න ජානාමි, න පස්සාමි, ජානාමහං ආවුසො පස්සාමී ති.

1. කෙවත්‍වා ආවුසොති - මජසං,
කොතෙත්‍වා ආවුසොති - සිමු. කවත්‍වා - PTS.

ඇවැත්නි, තෙපි කවරහු වව

ඇවැත්නි, මම මහණෙක් මි යි.

ඇවැත්නි, කවර මහණුන් අතුරෙහි වව යි?

ඇවැත්නි, ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන් අතුරෙහි වෙමි යි.

ඉදින් ආයුෂ්මත් පැන විසඳනට අවකාශ කෙරේ නම් අපි ආයුෂ්මතුන් කිසියම් ම ලෙශයක් පුළුවුස්න මෝයි.

ඇවැත්නි, පුළුවුස, අසා දනුම්හ යි.

හවත්නි, කිමෙක, තෙපි 'ලොකය ශාශ්වතය' යන 'මෙ ම සත්‍යය අනෙක මොසය, යන මෙ බඳු දෘෂ්ටි ඇති යව් දැයි?

ඇවැත්නි, මම ලොකය ශාශ්වතය, යන මෙ ම සත්‍යය, අනෙක මොසය, යන මෙ බඳු දෘෂ්ටි නැතියෙකිමි යි.

හවත්නි, කිමෙක හවත්හු 'ලොකය අශාශ්වතය,' යන 'මෙ ම සත්‍යය, අනෙක මොසය' යන මෙ බඳු දෘෂ්ටි ඇතියව් ද? යි.

ඇවැත්නි, මම 'ලොකය අශාශ්වතය,' යන 'මෙය ම සත්‍යය, අනෙක සිස් ය' යන මෙ බඳු දෘෂ්ටි නැතියෙකි මි යි.

හවත්නි, කිමෙක තෙපි 'ලොකය අන්තවත් ය,... ලොකය අනන්තවත්ය... එ ජීවවෙයි, එ ශරීර වෙයි... ජීවය අනෙකෙක, ශරීරය අනෙකක... සත්ත්ව මරණින් මතු වන්නෝ ය... සත්ත්ව මරණින්, මතු නො වන්නෝ ය... සත්ත්ව මරණින් මතු වන්නේ ය, නො ද වන්නේ ය ... සත්ත්ව මරණින් මතු නො ම වන්නේ ය, නො ම නො වන්නේ ය'' යන මෙය ම සත්‍යය, අනෙක සිස් ය යන මෙ බඳු දෘෂ්ටි ඇතියව් ද යි?

ඇවැත්නි මම, ''සත්ත්ව මරණින් මතු නො ම වන්නේය, නො ම නොවන්නේය'' යන මෙය ම සත්‍යය, අනෙක සිස්ය, යන මෙ බඳු දෘෂ්ටි ඇති යෙකිම් නො වෙම් මැයි.

එ කරුණෙන් ම හවත් නො දන්නේ ය නො දක්නේය යි? ඇවැත්නි, මම නො ම නො දන්නෙම්, නො ම නො දක්නෙ මි. ඇවැත්නි, මම දන්මි, දක්මි යි.

කින්නු ඛො භො සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති එවංදිට්ඨී භවන්ති ඉති පුට්ඨො සමානො 'න ඛො අහං ආවුසො එවංදිට්ඨී සස්සතො ලොකො ඉද මෙව සච්චං මොඝමඤ්ඤන්ති' වදෙසි.

කින්නු ඛො භො අසස්සතො ලොකො, ඉදමෙව සච්චං: මොඝමඤ්ඤන්ති එවංදිට්ඨී භවන්ති ඉති පුට්ඨො සමානො න ඛො අහං ආවුසො එවංදිට්ඨී අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වදෙසි.

කින්නු ඛො භො අන්තවා ලොකො -පෙ- අනන්තවා ලොකො -පෙ- තං ජීවං තං ශරීරං -පෙ- අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං -පෙ- හොති තථාගතො පරම්මරණා -පෙ- න හොති තථාගතො පරම්මරණා -පෙ- හොති ච න ච හොති තථාගතො පරම්මරණා -පෙ- නෙව හොති, න න හොති තථාගතො පරම්මරණා ඉද මෙව සච්චං, මොඝමඤ්ඤන්ති එවං දිට්ඨී භවන්ති ඉති පුට්ඨො සමානො න ඛො අහං ආවුසො එවංදිට්ඨී නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉද මෙව සච්චං මොඝමඤ්ඤන්ති වදෙසි.

තෙන හි භවං න ජානාති න පස්සතී ති ඉති පුට්ඨො සමානො න ඛො අහං ආවුසො න ජානාමි න පස්සාමි, ජානාමහං ආවුසො පස්සාමී ති වදෙසි. යථා කථම්පනාවුසො ඉමස්ස භාසිතස්ස අත්ථො දට්ඨබ්බොති?

සස්සතො ලොකො, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඛො ආවුසො දිට්ඨිගතමෙතං. අසස්සතො ලොකො ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති ඛො ආවුසො දිට්ඨිගතමෙතං අන්තවා ලොකො -පෙ- අනන්තවා ලොකො -පෙ- තං ජීවං තං ශරීරං -පෙ- අඤ්ඤං ජීවං අඤ්ඤං ශරීරං -පෙ- හොති තථාගතො පරම්මරණා -පෙ- න හොති තථාගතො පරම්මරණා -පෙ- හොති ච න හොති ච තථාගතො පරම්මරණා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඛො ආවුසො දිට්ඨිගතමෙතං.

1. දිට්ඨිට්ඨාන අධිට්ඨාන පරියුට්ඨාන සමුට්ඨාන සමුග්ඝාතො - සිමු, PTS.

භවත්නි, කිමෙක, 'භවත් "ලොකය ශාශ්වතය, යන මෙය ම සත්‍යය අනෙක සිස්ය යන මෙ බඳු දෘෂ්ටි ඇතියාව'යි මෙසේ පුළුවුස්නා ලදුයේ ම 'ඇවැත්නි, මම "ලොකය ශාශ්වතය, යන මෙ ම සත්‍යය, අනෙක මොසය යන මෙ බඳු දෘෂ්ටි ඇතියෙකිම් නො වෙ මැයි කියව.

භවත්නි, කිමෙක, භවත් "ලොකය අශාශ්වතය" යන යන මෙ ම සත්‍යය, අනෙක සිස් ය යන මෙ බඳු දෘෂ්ටි ඇතිය ව ද ? යි මෙසේ පුළුවුස්නා ලදුයේ ම 'ඇවැත්නි, මම් 'ලොකය අශාශ්වතය, යන මෙ ම සත්‍යය, අනෙක මොසය යන මෙ බඳු දෘෂ්ටි ඇතියෙකිම් නො වෙ මැ' යි කියව.

භවත්නි, කිමෙක, භවත් 'ලොකය අන්තවත,' ... ලොකය අනන්තවත, ... එ ජීවය, එ ශරීරය ... ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙක ... සත්ත්ව මරණින් මතු වන්නේය ... සත්ත්ව මරණින් මතු නො වන්නේය ... සත්ත්ව මරණින් මතු වන්නේ ය නො වන්නේ ය ... සත්ත්ව මරණින් මතු නො ම වන්නේය, නො ම නො වන්නේය' යන මෙ ම සත්‍යය, අනෙක සිස්ය යන මෙබඳු දෘෂ්ටි ඇතියවූ ද'යි පුළුවුස්නා ලදුයේ ම ඇවැත්නි, මම සත්ත්ව මරණින් මතු නො ම වන්නේය, නො ම නො වන්නේය යන මෙ ම සත්‍යය, අනෙක මොසය යන මෙ බඳු දෘෂ්ටි ඇතියෙකිම් නො වෙ මැ යි කියව.

එ කරුණෙන් භවත් නො දන්නේය, නො දක්නේයයි මෙසේ පුළුවුස්නා ලදුයේ ම 'ඇවැත්නි, මම නො දන්නෙම් නොවෙමි නො දක්නෙම් නොවෙ මි. ඇවැත්නි, මම් දන්මි, දක්මියි කියව, ඇවැත්නි, මේ භාෂිතයාගේ අර්ථය කෙසේ වනාහි දතයුතු වේ දැ යි ?

ඇවැත්නි "ලොකය ශාශ්වතය' යන මෙ ම සත්‍යය; අනෙක සිස් ය" යන තෙල දෘෂ්ටිගතයෙක, ඇවැත්නි, 'ලොකය අශාශ්වතය' යන මෙ ම සත්‍යය, අනෙක මොසය, යන තෙල දෘෂ්ටිගතයෙක. "ලොකය අන්තවත්ය, ... ලොකය අනන්තවත්ය ... එ ජීවය; එ ශරීරය ... ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙක -පෙ- තථාගත මරණින් මතු වන්නේය ... තථාගත මරණින් මතු නො වන්නේය ... තථාගත මරණින් මතු වන්නේය, නො ද වන්නේය තථාගත මරණින් මතු නො ම වන්නේය, නොම නොවන්නේය" යන මෙම සත්‍යය; අනෙක සිස්ය යන තෙල දෘෂ්ටිගතයෙක.

යාවතා ආවුසො දිට්ඨිගතා යාවතා දිට්ඨිට්ඨානං දිට්ඨාධිට්ඨානං දිට්ඨිපරියුට්ඨානං දිට්ඨිසමුට්ඨානං දිට්ඨිසමුග්ඝාතො. තමහං ජානාමි, තමහං පස්සාමි තමහං ජානන්තො තමහං පස්සන්තො ක්‍යාහං වක්ඛාමි 'නජානාමි, න පස්සාමී'ති. 'ජානාමහං ආවුසො පස්සාමී'ති.

කො නාමො ආයස්මා? කථඤ්ච පනායස්මන්තං සබ්‍රහ්මචාරී ජානන්ති ති?

ආනන්දොති ඛො මෙ ආවුසො නාමං, ආනන්දොති ච පන මං සබ්‍රහ්මචාරී ජානන්ති ති.

මහාචරියෙන ,වත කිර භොතා සද්ධිං මන්තයමානා න ජානිම්හ 'ආයස්මා ආනන්දො'ති. සචෙ හි මයං සඤ්ජානෙය්‍යාම 'ආයස්මා ආනන්දො'ති එත්තකම්පි නො නප්පටිභාසෙය්‍ය. ඛමතු ච මෙ ආයස්මා ආනන්දොති.

## 10. 2. 5. 7

## ආහුනෙය්‍ය සුත්තං

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි දසහි:

ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවර සංවුතො විහරති ආචාරගොචර සම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු.

බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙ කල්‍යාණා පරියොසාන කල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා, වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා.

කල්‍යාණමිත්තො ච හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො.

සම්මාදිට්ඨිකො හොති සම්මාදස්සනෙන සමන්නාගතො.

ඇවැත්නි, යම් පමණ වූ දෘෂ්ටිගතයෝ වෙත් ද, යම් පමණ වූ දෘෂ්ටිස්ථානයෙක්, දෘෂ්ට්‍යධිෂ්ඨානයෙක්, දෘෂ්ටිපර්යුත්ථානයෙක්, දෘෂ්ටිසමුත්ථානයෙක් දෘෂ්ටිසමුද්ඝාතයෙක් ඇත් ද, එ මම් දනිමි, එ මම් දක්මි, මම එ දන්නෙම්, එ මම් දක්නෙම් කවර හෙයින් මම් නො දනිමි, නො දක්මි යි කියනෙම් ද? ඇවැත්නි, මම් දන්නෙම් දක්නෙම් වෙමි යි.

ආයුෂ්මත්හු කිනම්හුයි? කෙසේ නම් සබ්‍රම්සරහු ආයුෂ්මතුන් දන්නාහු දැයි?

ඇවැත්නි, 'ආනන්ද' යනු මාගේ නම වෙයි. සබ්‍රම්සරහු මා ආනන්ද යි ද දනිත් යි.

එකැතින් මහාචාර්‍ය්‍ය භවතුන් හා සමග ම මන්ත්‍රණය කරන අපි ''ආයුෂ්මත් ආනන්ද හ''යි නො දනුම්හ. ඉදින් අපි (මෙ) 'ආයුෂ්මත් ආනන්ද හ'යි දනුමෝ නම් අපව මෙතෙකුදු නො වටහන්නේය. ආයුෂ්මත් ආනන්දයෝ මට කමත්වා යි.

## 10. 2. 5. 7
## ආහුනෙය්‍ය සූත්‍රය

මහණෙනි, දශධර්මයෙකින් සමන්වාගත මහණ ආහුනෙය්‍ය පාහුණෙය්‍ය, දක්ඛිණෙය්‍ය, අඤ්ජලිකරණීය වෙයි. ලොකයට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වෙයි. කවර දශයෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වූයේ ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූයේ වාස කරයි. ආචාර ගොචරසම්පන්න වූයේ අණුමාත්‍ර වරදෙහි භය දක්නා සුලුයේ සමාදන් වැ සික්පදයන්හි හික්මෙයි.

ශ්‍රැතධර වූයේ ශ්‍රැතසන්නිචය ඇතියේ බහුශ්‍රැත වෙයි. ආදී කල්‍යාණ, මධ්‍ය කල්‍යාණ, පර්‍ය්‍යවසාන කල්‍යාණ වූ යම් බඳු ධර්මකෙනෙක් සාර්ථ සව්‍යඤ්ජන,කොට කෙවලපරිපූර්ණ, පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පළට කරත් නම්, එබඳු ධර්මයෝ ඔහු විසින් ධරන ලද්දහු වචනයෙන් පරිචිත වූවාහු මනසින් අනුප්‍රෙක්ෂිත වූවාහු ප්‍රඥයෙන් සුප්‍රවිදිත වූවාහු බහුශ්‍රැත වෙති.

කල්‍යාණ සගයන් ඇතියේ කල්‍යාණ පුද්ගලයනට නැඹුරුවීම් ඇතියේ කල්‍යාණමිත්‍ර ද වෙයි.

සම්‍යග් දර්ශනයෙන් සමන්වාගත වූයේ සම්‍යග්දෘෂ්ටික වෙයි.

අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පථවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පථවියං. ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ ච සන්තිකෙ ච,

පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං -පෙ- වීතදොසං වා චිත්තං -පෙ- සමොහං වා චිත්තං -පෙ- වීතමොහං වා චිත්තං -පෙ- සඞ්ඛිත්තං වා චිත්තං -පෙ-වික්ඛිත්තං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අවිමුත්තං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති.

අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො, වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො, චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො, ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාති සතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ට විවට්ට කප්පෙ අමුත්‍රාසිං, එවංනාමො එවංගොත්තො එවංවණ්ණො, එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො. එවංවණ්ණො එවමාහාරො එවං සුඛ දුක්ඛ පටිසංවෙදී, එවමායු පරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

අනෙකවිධ සෘද්ධි විශෙෂය වඳනේය. එකෙක් ම වූයේ බහු-ප්‍රකාරයෙන් වෙයි. බහුප්‍රකාරයෙන් වූයේ ම එකෙක් වෙයි. පළට බව, නො පළ බව කරනේය, බිත්තින් පරභාගයට පවුරින් පරභාගයට පවුයෙන් පරභාගයට අහසැ සෙයින් නො ලැගෙමින් යෙයි. දියෙහි මෙන් පොළොව්හිදු නැගීම් හා ගැලීම් හා කෙරෙයි. පොළොව්හි සෙයින් නො බිඳෙන දියෙහි දු ගමන් කෙරෙයි. පියාපත් ඇති ළිහිණියක සෙයින් අහස්හිදු පළඟින් යෙයි. මෙසේ මහර්ධි ඇති, මෙසේ මහානුභාව ඇති මෙ සඳහිරුනුදු අත්ලෙන් පරාමර්ෂ කෙරෙයි, පිරිමදියි, බඹ ලෝ හිම් කොට ද කයින් වශය පවත්වයි.

විශුද්ධ වූ මිනිසැස ඉක්ම ගිය දිවසෝධායෙන් දිව්‍ය වූ හා මානුෂ හා දූරෙහි හා වෙත හා උභය ශබ්දයන් අසයි.

පරසත්ත්‍ව පරපුද්ගලයන්ගේ සිත් තම සිතින් පිරිසඳ දන්නේය: සරාග වූ හෝ චිත්තය සරාග චිත්ත යයි දන්නේය වීතරාග හෝ චිත්තය වීතරාග චිත්ත යයි දන්නේය. සදෙස හෝ චිත්තය ... වීතදෙස හෝ චිත්තය ... සමොහ හෝ චිත්තය ... වීතමොහ හෝ චිත්තය ... සංක්ෂිප්ත හෝ චිත්තය ... වික්ෂිප්ත හෝ චිත්තය ... අමහද්ගත හෝ චිත්තය ... මහද්ගත හෝ චිත්තය ... සඋත්තර හෝ චිත්තය ... අනුත්තර හෝ චිත්තය ... අසමාහිත හෝ චිත්තය ... සමාහිත හෝ චිත්තය ... අවිමුක්ත හෝ චිත්තය ... විමුක්ක හෝ චිත්තය විමුක්ත චිත්තයයි දන්නේය.

අනෙකවිධ පූර්‍වෙනිවාස සිහිකරන්නේය. කෙසෙයිත යත්: එක් ජාතියකුදු – ජාති දෙකකුදු – ජාති තුනකුදු – ජාති සතරකුදු – ජාති පසකුදු ජාති දශයකුදු – ජාති විස්සකුදු – ජාති තිසකුදු – ජාති සතළිසකුදු – ජාති පනසකුදු – ජාති සියයකුදු – ජාති දහසකුදු – ජාති සුවහසකුදු – නොයෙක් සංවර්තකල්පයනුදු – අනෙක විවර්තකල්පයනුදු – අනෙක සංවර්ත විවර්ත කල්පයයන් දැයි (යන වීසිනි.) මෙබඳු නම් ඇත්තෙම්, මෙබඳු ගොත් ඇත්තෙම් මෙබඳු සිරුරු පැහැතියෙම්, මෙබඳු අහරතියෙම් මෙබඳු සුවදුක් විඳුනෙම් මෙබඳු ආයු හිම් කොට ඇතියෙම් අසෝතන්හි උපන්මි, ශෙ මම් එයින් සැවැ අසෝතන්හි උපනිමි. එහිදු මෙබඳු නමැතියෙම්, මෙබඳු ගොත් ඇතියෙම්, මෙබඳු පැහැ ඇතියෙම්. මෙබඳු අහරතියෙම් මෙබඳු සුවදුක් විඳින සුළුයෙම් මෙබඳු ආයු හිම් කොට ඇත්තෙම් වීමී. එ මම් එයින් චුතවූයෙම් මෙහි උපන්නෙම් වෙමියි මෙ ආකාර සහිත උද්දෙශ සහිත අනෙකවිධ පූර්‍වෙනිවාසය සිහි කරයි.

දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කාය දුච්චරිතෙන සමන්නාගතා වචී -පෙ- මනො -පෙ- අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨි කම්ම සමාදනා, තෙ කායස්සභෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචී -පෙ- මනො සුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්ම සමාදනා, තෙ කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති, ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

ආසවානං ඛයා අනාසවං චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

## 10. 2. 5. 8

## ථෙර සුත්තං

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු යස්සං යස්සං දිසායං විහරති. ඵාසුයෙව විහරති. කතමෙහි දසහි:

ථෙරො හොති රත්තඤ්ඤූ චිරපබ්බජිතො. සීලවා හොති -පෙ- සමාදය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො අධිකරණ සමුප්පාද වූපසමෙ කුසලො හොති. ධම්මකාමො හොති පියසමුදාහාරො, අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමුජ්ජො, සන්තුට්ඨො හොති

විශුද්ධ වූ මිනිසැස ඉක්ම ගිය දිවැසින් සැවෙන උපදනා සත්ත්වයන් දකී, හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද සුගත වූ ද දුර්ගත වූ ද කර්ම වූ පරිදි මැරියන සත්ත්වයන් දන්නේය. එකැතියෙන් මෙ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්වාගත වූහු ... වාග් ... මනස් ... ආර්‍ය්‍යී යනට උපවාද කරන්නාහු මිථ්‍යාදෘෂ්ටික වූහු මිථ්‍යාදෘෂ්ටික කර්ම සමාදන ඇත්තාහු වෙති. ඔහු කා බුන් මරණින් මතු අපාය වූ දුගති වූ විනිපාත වූ නිරයට පැමිණියාහු වෙත්. මෙ භවත් සත්ත්වයෝ කාය සුචරිතයෙන් සමන්වාගත වූවාහු...වාග්...මනො සුචරිතයෙන් සමන්වාගත වූවාහු ආර්‍ය්‍යී යනට උපවාද නො කරන්නාහු සම්‍යග්දෘෂ්ටික වූවාහු සම්‍යග්දෘෂ්ටික කර්ම සමාදනයෙන් යුක්ත වූවාහු වෙති. ඔහු කා බුන් මරණින් මතු සුගති වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහු වෙති. මෙසේ විශුද්ධ වූ මිනිස් ඇස ඉක්ම ගිය දිවැසින් ච්‍යවමාන වූ ද උපපද්‍යමාන වූ ද හීන, ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ, සුගත, දුර්ගත, කර්ම වූ පරිදි යන සත්ත්වයන් දනී.

ආස්‍රවක්ෂයයෙන් අනාස්‍රව චිත්ත විමුක්තිය ප්‍රඥා විමුක්තිය ඉහාත්මයෙහිම තෙමෙ අභිඥානයෙන් දන සාක්ෂාත් කොට එයට එළඹ වෙසෙයි.

මහණෙනි, මෙ දස ධර්මයෙන් සමන්වාගත මහණ ආහුනෙය්‍ය වෙයි. පාහුණෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලිකරණීය වෙයි, ලොකයට අනුත්තරපුණ්‍යක්ෂේත්‍ර වෙයි.

## 10. 2. 5. 8
## ථෙර සූත්‍රය

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත තෙර මහණෙක් යම් ම දිසායෙක වාසය කෙරේ නම් පහසුයෙන් ම වසන්නේය. කවර දසයෙකින යත්:

තෙර මහණ, පැවිදිව බොහෝ කල් ඇත්තේ රාත්‍රඥ වෙයි. සිල්වත් වෙයි ... සිකපදයන්හි සමාදන්ව හික්මෙයි. බහුශ්‍රැත වෙයි ... ප්‍රඥයෙන් මොනොවට පිළිවිදියාහු වෙති. උභයප්‍රාතිමොක්ෂයෝ ඔහු විසින් විස්තර වශයෙන් සුවිභක්ත වූවාහු මොනොවට වණපොත්වන්නාහු සූත්‍ර විසින් අනුව්‍යඤ්ජන විසින් මොනොවට විනිශ්චිත වූවාහු ස්වාගත වෙත්. අධිකරණ සමුත්පාදව්‍යුපශමයෙහි කුශල වෙයි. ප්‍රිය කථා ඇතියේ ධර්මකාම වූයේ අභිධර්මයෙහි අභිවිනයෙහි උදර ප්‍රාමොද්‍යය ඇත්තේ වෙයි.

ඉතරීතරචීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. පාසාදිකො හොති අභික්කන්තෙන පටික්කන්තෙන. සුසංවුතො අන්තරඝරෙපි නිසජ්ජාය, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො ථෙරො භික්ඛු යස්සං යස්සං දිසායං විහරති ඵාසුයෙව විහරතීති.

## 10. 2. 5. 9
## උපාලි සුත්තං

අථ ඛො ආයස්මා උපාලි යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපාලි භගවන්තං එතදවොච: 'ඉච්ඡාමහං භන්තෙ අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුන්ති.'

දුරභිසම්භවානි ඛො උපාලි අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි, දුක්කරං පවිවෙකං දුරභිරමං එකත්තෙ හරන්ති මඤ්ඤෙ මනො වනානි සමාධිං අලභමානස්ස භික්ඛුනො. යෙ ඛො උපාලි එවං වදෙය්‍ය: 'අහං සමාධිං අලභමානො *අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිස්සාමී'ති. තස්සෙතං පාටිකඞ්ඛං සංසීදිස්සති වා[1] උපපිලවිස්සතිවා.

* අරඤ්ඤවනපත්තානි – මජසං.
1. උපලවිස්සතිවා – මජසං.

ඉතරෙතර චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය-පරිෂ්කාරයෙන් සතුටු වෙයි. ඉදිරි ගමනෙහි දු පෙරළා යන ගමනෙහි දු ප්‍රසාද ඇතියේ වෙයි. ඇතුළුගෙහිදු නිෂද්‍යායෙන් සුසංවෘත වෙයි. අභිචිත්ත යෙහි උපන් දිටුදැමියෙහි සුඛවිහරණ වූ සතර ධ්‍යානයන් කැමැති සේ ලබන සුල්ලේ නිදුකින් ලබන සුල්ලේ පහසුවෙන් ලබන සුල්ලේ වෙයි. ආස්‍රවයන්ගේ ක්ෂයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්ති ප්‍රඥවිමුක්ති ඉහාත්-මයෙහි ම තෙමේ විශිෂ්ටඥනයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරයි.

මහණෙනි, මෙ දස කරුණෙන් සමන්වාගත තෙර මහණ යම් ම දිශායෙක්හි වෙසේ නම් පහසුවෙන් ම වාසය කෙරේ යයි.

## 10. 2. 5. 9

## උපාලි සූත්‍රය

එකල්හී ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළහ: වහන්ස, මම ආරණ්‍ය- වානප්‍රස්ථ ප්‍රාන්තශයනා-සනයන් සෙවුමට කැමතියෙම් යි.

උපාලි, ආරණ්‍ය- වානප්‍රස්ථ- ප්‍රාන්ත ශයනාසනයෝ දුඃසහ වෙත්, සිත් ඇලැවිය නො හැකි වෙත්. ප්‍රවිවෙකය දුෂ්කර වෙයි. අභිරමණය සුකර නො වෙයි, වනයෝ සමාධිය නො ලබන මහණහුගේ සිත එකී භාවය ඇතිවත්ම පැහැරගන්නාක් මෙනි, උපාලි, යම් කෙනෙක් මෙසේ කියන්නාහු ද: "මම් සමාධිය නො ලබනුයෙම් අරණ්‍යයන් හා වනපෙත් හා ප්‍රාන්ත සෙනසුන් හා ඇසුරු කෙරෙමැ"යි (කියායි). ඔහු විසින් ගිලෙන්නේය හෝ ඉල්පෙන්නේය හෝ යන තෙල කැමති විය යුතු.

සෙය්‍යථාපි උපාලි මහා උදකරහදො, අථ ආගච්ඡෙය්‍ය හත්ථිනාගො සත්තරතනො වා අඩ්ඪට්ඨරතනො වා. තස්ස එවමස්ස; 'යන්නූනාහං ඉමං උදකරහදං ඔගාහෙත්වා කණ්ණසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළෙය්‍යං, පිට්ඨිසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළෙය්‍යං. කණ්ණසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළිත්වා පිට්ඨිසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළිත්වා නහාත්වා ච පිවිත්වා ච පච්චුත්තරිත්වා යෙන කාමං පක්කමෙය්‍ය'න්ති. සො උදකරහදං ඔගාහෙත්වා කණ්ණසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළෙය්‍ය. පිට්ඨිසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළෙය්‍ය. කණ්ණසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළිත්වා පිට්ඨිසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළිත්වා නහාත්වා ච පිවිත්වා ච පච්චුත්තරිත්වා යෙන කාමං පක්කමෙය්‍ය. තං කිස්සහෙතු: මහාහුපාලි අත්තභාවො ගම්භීරෙ ගාධං වින්දති,

අථ ආගච්ඡෙය්‍ය සසො වා බිළාරො වා. තස්ස එවමස්ස: කො චාහං, කො ච හත්ථිනාගො? යන්නූනාහං ඉමං උදකරහදං ඔගාහෙත්වා කණ්ණසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළෙය්‍යං පිට්ඨිසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළෙය්‍යං කණ්ණසන්ධොපි කම්පි ඛිඩ්ඩං කීළිත්වා පිට්ඨිසන්ධොපිකම්පි ඛිඩ්ඩං කීළිත්වා නහාත්වා ච පිවිත්වා ච පච්චුත්තරිත්වා යෙන කාමං පක්කමෙය්‍යන්ති. සොතං උදකරහදං[1] සහසා අප්පටිසඞ්ඛාය පක්ඛන්දෙය්‍ය.

තස්සෙතං පාටිකඞ්ඛං සංසීදිස්සති වා උප්පිලවිස්සති වා තං කිස්සහෙතු: පරිත්තො හුපාලි අත්තභාවො ගම්භීරෙ ගාධං න වින්දති. එවමෙව ඛො උපාලි යො එවං වදෙය්‍ය: අහං සමාධිං අලභමානො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිස්සාමී ති. තස්සෙතං පාටිකඞ්ඛං, සංසීදිස්සති වා උප්පිලවිස්සති වා.

සෙය්‍යථාපි උපාලි දහරො කුමාරො මන්දො උත්තානසෙය්‍යකො සකෙන මුත්තකරීසෙන කීළති, තං කිං මඤ්ඤසි උපාලි, නන්වායං කෙවලා පරිපූරා බාලඛිඩ්ඩාති? එවං භන්තෙ.

ස ඛො සො උපාලි කුමාරො අපරෙන සමයෙන වුද්ධිමන්වාය ඉන්ද්‍රියානං පරිපාකමන්වාය යානි තානි කුමාරකානං කීළාපනකානි භවන්ති. සෙය්‍යථීදං: වඞ්කකං,[2] ඝටිකං, මොක්ඛචිකං, චිඞ්ගුලකං පත්තාළ්හකං, රථකං ධනුකං, තෙහි කීළති. තං කිං මඤ්ඤසි උපාලි. නන්වායං ඛිඩ්ඩා පුරිමාය ඛිඩ්ඩාය අභික්කන්තතරා ච පණීතතරා චාති? එවං භන්තෙ.

1. උපසංයිත්වා සහසා අප්පටිසංඛාය – සිමු.
2. වඞ්කක – සිමු PTS.

උපාලි, යම් සේ මහ දිය විලෙක් වේ නම්, එකල සත්රියන් වේ වයි, අටරියන් වෙව යි, හස්ති නාගයෙක් එයි නම්, ඔහට මෙබඳු සිතෙක් වන්නේය: මම මෙදියවිලට බැස කණ්ණසන්‍ධොපික (කන් දෙවුන් හෝළි) නම් ක්‍රීඩා ද කෙළනෙම් පිට්ඨිසන්‍ධොපික (පිටදෙවුන්) නම් ක්‍රීඩාව ද කෙළනෙම් නම් කණ්ණසන්‍ධොපික නම් ක්‍රීඩා ද කෙළැ පිට්ඨිසන්‍ධොපික නම් ක්‍රීඩා ද කොට ස්නාන ද කොට පැන්පීම ද කොට ගොඩනැඟී කැමැති තැනෙක යෙම් නම් යෙහෙකැ''යි. හේ මහදිය විලට බැස කණ්ණසන්‍ධොපික නම් ක්‍රීඩා ද කෙළනේය, පිට්ඨිසන්‍ධොපික නම් ක්‍රීඩා ද කෙළනේය. කණ්ණසන්‍ධොපික නම් ක්‍රීඩා ද කෙළැ පිට්ඨිසන්‍ධොපික නම් ක්‍රීඩා ද කොට සනහා පැන් බී ගොඩනැඟී කැමැති තැනෙක යන්නේය. එ කවර හෙයින යත්: උපාලි මහත් වූ ම ආත්මභාවයෙක් ගැඹරෙහි ප්‍රතිෂ්ඨා විඳුනේය.

ඉක්බිති ශශකයෙක් වේව යි විඩාලයෙක් වේව යි එන්නේය ඔහට මෙ සිත වන්නේය. මම් කවරෙකිම්? ඇත් නා කවරෙක? මම් මෙ මහ දිය විලට බැස කණ්ණසන්‍ධොපික නම් ක්‍රීඩා ද කෙළනෙම්, පිට්ඨිසන්‍ධොපික නම් ක්‍රීඩා ද කෙළෙනෙම්, කණ්ණසන්‍ධොපික ක්‍රීඩා ද කෙළැ පිට්ඨිසන්‍ධොපික නම් ක්‍රීඩා ද කෙළැ සනහා පැන් බී ගොඩනැඟී කැමැති තැනෙක යෙම් නම් මැනැවැ''යි. හේ එ දිය විලට වහා නොපස්විකා පනනේය.

'ගිලෙනුයේ හෝ ඉල්පෙනුයේය' යන තෙල ඔහු විසින් කැමැති විය යුතු. හෙ කවරහෙයින යත්: උපාලි, ලඝු වූ ශරීරාත්මභාවය ගැඹරෙහි ප්‍රතිෂ්ඨා නො විඳුනේ ම ය. උපාලි, එපරිද්දෙන් ම යමෙක් මෙසේ කියා නම්: ''මම සමාධි නොලබනුයෙම් අරන හා වන පෙත් හා ප්‍රාන්ත සෙනසුන් සෙවුනෙමි'' යි ඔහු විසින් ''ගිලෙයි හෝ ඉල්පෙයි හෝ'' යන තෙල කැමැති විය යුතු.

උපාලි, ළදරු. උඩුකුරුව හෝනා බොළඳ කුමරෙක් යමසේ සිය මලමූත්‍රයන් කෙළනේ නම්, උපාලි, එ කුමැයි හඟුව? මෙ හැම පිරිපුන් බාල ක්‍රීඩායෙක් නොවේ ද? වහන්ස, එසේය.

උපාලි, එ කුමර ම පසු කාලයෙහි විය පැමිණ ඉන්‍ද්‍රිය පරිපාකයට පැමිණ, වඞ්කක (කුඩා කෙළි නගුල්)ය, ඝටිකා (කෙළිදඬු)ය, මොක්ඛචිකා (පිනුම් ගැසුම්)ය, චිඞ්ගුලක (හුළංපෙති)ය, පත්තාළහක (කොළ නැලිය)ය, කෙළිරියය, කුඩා කෙළි දුනුය, යන මෙබඳු කුමරුවන් ගේ යම් ඒ කෙළි බඩු වෙත් නම් එයින් කෙළනේය. උපාලි එ කුමැයි හඟුව, මෙ කෙළි, පළමු ක්‍රීඩාවට වඩා සිත්කලු හා ප්‍රණීතතර හා නොවේ ද? වහන්ස, එසේය.

සඛො සො උපාලි කුමාරො අපරෙන සමයෙන වුද්ධිමන්වාය ඉන්ද්‍රියානං පරිපාකමන්වාය පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගිභූතො පරිචාරෙති චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පියරූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි, සොතවිඤ්ඤෙය්‍යෙහි සද්දෙහි, ඝාණවිඤ්ඤෙය්‍යෙහි ගන්ධෙහි, ජිව්හාවිඤ්ඤෙය්‍යෙහි රසෙහි, කාය විඤ්ඤෙය්‍යෙහි ඵොට්ඨබ්බෙහි ඉට්ඨෙහි කන්තෙහි මනාපෙහි පිය රූපෙහි කාමූපසංහිතෙහි රජනීයෙහි, තං කිං මඤ්ඤසි උපාලි, නන්වායං ඛිඩ්ඩා පුරිමාහි ඛිඩ්ඩාහි අභික්කන්තතරා ච පණීත තරා චාති?

එවං භන්තෙ

ඉධ කො පන වො උපාලි තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා: සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිශුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. තං ධම්මං සුණාති ගහපති පුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති, සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉතිපටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්ත පරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛා සාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිත දණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා, මුසාවාදං පහාය මුසාවාද පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස, පිසුනංවාචං පහාය පිසුණායවාචාය පටිවිරතො හොති.

උපාලි, ඒ කුමරු ම පසු කලෙක වැඩිවිය පත් ව ඉන්ද්‍රිය පරිපාකයට ගොස් පස්කම් ගුණෙන් සමර්පිත වූයේ සමග වූයේ ඉෂ්ට කාන්ත මනාප චක්ෂුර්විඥෙය වූ කාමොපසංහිත වූ රඤ්ජනීය යුතු රූපයන්ගෙන් පරිවරණ කරයි. ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයෙන් ඝ්‍රාණවිඥෙය ගන්ධයෙන්, ජිහ්වාවිඥෙය රසයෙන්, කායවිඥෙය ඉෂ්ට කාන්ත මනාප ප්‍රියරූප කාමයට හිත වූ රජනීය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් පරිවරණය කරයි. උපාලි, ඒ කුමැයි හඟුව? මෙ ක්‍රීඩා පළමු ක්‍රීඩායෙන් වඩා උතුම් වූයේ ප්‍රණීතතර වූයේත් නො වේ ද?

වහන්ස, එසේය.

උපාලි, මෙ ලොවහි අර්හත්, සම්‍යක් සම්බුද්ධ විද්‍යාචරණ සම්පන්න, සුගත, ලොකවිද්, අනුත්තර පුරුෂදම්‍යසාරථී, දෙව් මිනිස්නට ශාස්තෘ වූ බුද්ධ වූ භාග්‍යවත් වූ තථාගතයන් වහන්සේ උපදනාහුය. උහු දෙවියන් සහිත, මරුන් සහිත බඹුන් සහිත, මහණ බමුණන් සහිත සත්ත්වයන් ඇති සදෙව මානුෂ මෙ ලොව තුමු විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට දන්වන්-නාහ. උහු ඇදි කල්‍යාණ වූ මධ්‍යයෙහි කල්‍යාණ වූ පර්‍යවසාන කල්‍යාණ වූ සාර්ථ වූ සව්‍යඤ්ජන වූ කෙවල පරිපූර්ණ වූ ධර්ම දෙශනා කරත්. පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පළට කරත්. ඒ ධර්මය ගෙහෙවියෙක් වේවයි, ගෘහවි පුතෙක් වේව යි, අන්‍යතර කුලයෙක උපන්නෙ වේව යි අසන්නේය. හෙ ඒ දහම් අසා තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධා ප්‍රතිලාභයෙන් සමන්වාගත වූයේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කරයි: ගෘහවාසය සම්බාධය, කෙලෙස් මගෙක පැවිද්ද අභ්‍යවකාශය වේ. එකාන්ත පරිපූර්ණ වූ ලියූ සකක් සෙයින් එකාන්ත පරිශුද්ධ වූ මෙ බඹසර වස්නට ගිහිගෙයි වසනුවහු විසින් සුකර නො වෙයි. ඉදින් මම් කෙහෙමස් බහා කහවත් පෙරෙව ගිහිගෙන් නික්ම පැවිද්දට වදනෙම් නම් යෙහෙකැයි. හේ පසු කල්හි අල්ප වූ හෝ භොගස්කන්ධය හැරදමා මහත් වූ හෝ භොගස්කන්ධය හැරදමා අල්ප වූ හෝ ඥාතිපරිවර්තය හැරදමා මහත් වූ හෝ ඥාති පරිවර්තය හැරදමා කේමස් බහා කහවත් පෙරවැ ගිහි ගෙන් නික්ම පැවිද්දට වදනේය.

සෙ මෙසේ පැවිදි වූයේ ම භික්ෂූන්ගේ ශික්ෂා සාජීවයට පැමිණියේ පණිවා හැරැ පණිවායෙන් වැළැකියේ වෙයි. බහා තැබූ දඬු ඇතියේ බහා තැබූ සත් ඇතියේ ලජ්ජීයේ දයාපන්න වූයේ සර්වප්‍රාණිභූතයනට හිතානු කම්පා ඇතියේ වෙසෙයි. අයිනාදන් හැරදමා අයිනාදනින් වැළැකියේ වෙයි දුන් දෑ ගන්නා සුළුයේ දුන් දෑ කැමැත්තේ නො සොර පිවිතුරු ආත්මයෙන් වාසය කරයි. අබ්‍රම්සර හැරදමා බ්‍රම්සර ඇතියේ ආරාචාරී වූයේ ගැමිදම් වන මෙවුන්දමින් වැළැකියේ වෙයි. මුසවා හැරදමා මුසවායෙන් වැළැකියේ සත්‍යය කියනසුළුයේ සත්‍යසන්ධ වූයේ තථධර්ම-යෙන් යුක්ත වූයේ හැදැහිය හැකි (කථා ඇතියේ ලොකයාට අවිසංවාදක වූයේ වෙයි. පිසුනු බස් හැරදමා පිසුනු බසින් වැළැකියේ වෙයි.

න ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙළා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. ඒකභත්තිකො හොති. රත්තූපරතො විරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූක-දස්සනා පටිවිරතො හොති, මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවා පටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති, තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතොහොති. ඡෙදනවධබන්ධනවිපරාමොස-ආලොපසාහසාකාරා පටිවිරතො හොති.

සො සන්තුට්ඨො හොති කායපාරිහාරිකෙන චීවරෙන කුච්ඡිපාරි-හාරිකෙන පිණ්ඩපාතෙන යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි පක්ඛීසකුණො යෙන යෙනෙව ඩෙති, සපත්තභාරොව ඩෙති, එවමෙව භික්ඛු සන්තුට්ඨො හොති කායපාරිහාරිකෙන චීවරෙන කුච්ඡි-පාරිහාරිකෙන පිණ්ඩපාතෙන යෙන යෙනෙව පක්කමති, සමාදායෙව පක්කමති සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති:

මොවුන්ගේ භෙදය පිණිස මෙතැන්හි අසා අසෝතන්හි නො කියනුයේ අසෝ තන්හි හෝ අසා අසූකයන්ගේ බිඳුම සඳහා මොවුනට නො කියන්නේ වෙයි. මෙසේ අසමගි වූවන් සමගි කරණුයේ සමගි වූවනට අනුබල දෙන්නේ සමගියෙහි ඇලුම් ඇත්තේ සමගියෙහි රුඳුනේ සමගියෙන් සතුටුවනුයේ සමගි කරණ සුළු බස් කියන්නේ වෙයි. පරොස් බස් හැරදමා පරොස් බසින් වැළැකියේ වෙයි. නිදෙස්, කණට සුව දෙන, පෙම් දනවන, සුවසේ ලගන්නා ගුණෙන් පිරිපුන්, බහුජනකාන්ත වූ බහුජනමනාප වූ යම් බසක් වේ නම් එබඳු බස් කියන්නේ වෙයි. සම්ප්‍රලාප හැර දමා සම්ප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. කාල වාදී වූයේ සැබෑ කියනුයේ දෘෂ්ට ධාර්මික – සාම්පරායික අර්‍ථයම කියන සුලුයේ නව ලොවුතුරු දහම් ම කියන සුලුයේ සංවර, පහාන විනය පිණිස බස් කියනුයේ නිධානවත් වදන් සුදුසු කල්හි සකරුණු කොට පයර්‍යන්තවත් කොට කියනුයේ වෙයි.

භූතගාම බීජගාම විකොපනයෙන් වැළකියේ වෙයි. රාත්‍රි භොජන- යෙන් දුරු වූයේ විකල් බොජුනෙන් වැළැකියේ එකභත්තික වෙයි. නැටුම් ගැයුම් විසුලු දස්නෙන් වැළැකියේ වෙයි. මල් ගඳ විලෙවුන් දැරුම් උනුතැන් පිරවීම් සිරුරු සැරහුම් යන කරුණින් වැළැකියේ වෙයි. උසස්නෙන් හා මහ අස්නෙන් වැළැකියේ වෙයි. රන් රිදී පිළි ගැනුමෙන් වැළැකියේ වෙයි. ආමක ධාන්‍ය පිළිගැන්මෙන් වැළැකියේ වෙයි. අමු මස් පිළිගැනුමෙන් වැළැකියේ වෙයි. ස්ත්‍රීන් හා කුමාරිකාවන් පිළිගැනුමෙන් වැළැකියේ වෙයි. දැසි දස් පිළිගැනුමෙන් වැළැකියේ වෙයි. එළුතිරෙළු වන් පිළිගැනුමෙන් වැළැකියේ වෙයි. කුකුළන් හා හූරන් පිළිගැනුමෙන් වැළැකියේ වෙයි. ස්ත්‍රීන් ගෙරි අසුන් වෙළඹුන් පිළිගැ- නුමෙන් වැළකියේ වෙයි. කෙත් වත් පිළිගැනුමෙන් වැළකියේ වෙයි. දූතගමනප්‍රහෙණගමනෙහි යෙදුමෙන් වැළැකියේ වෙයි. ක්‍රය වික්‍රයයෙන් වැළැකියේ වෙයි. තුලා කූට, කංස කූට මාන කූටයෙන් වැළැකියේ වෙයි. ලස්ගෙන හිමියන් අහිමියන් කිරීමය, වඤ්චනාය, මෘයායොගය යන මෙදැයින් වැළැකියේ වෙයි. ඡෙදනය, මරණය, බන්ධනය මංපැහැරීමය ගම් පැහැරීමය, සාහසික ක්‍රියාය යන මෙයින් වැළැකියේ වෙයි.

හේ කායපාරිහාරික චීවරයෙනුදු කුච්ඡිපාරිහාරික පිඬුවායෙනුදු සතුටු වෙයි. යම් ම දිශෙක යේ නම්, රැගෙන ම යෙයි. යම් පරිදි පක්ෂි ශකුනයෙක් යම් ම දිශෙක ඉගිල යේ නම් සපත්‍රභාරව ම ඉගිල යෙයි ද එසෙයින් මහණ කායපාරිහාරික චීවරයෙනුදු කුක්ෂිපාරිහාරික පිණ්ඩපාත යෙනුදු සතුටු වෙයි. යම් ම දිශෙක යේ නම් රැගෙන ම යෙයි. හේ මෙ ආයර්‍ය ශීලස්කන්ධයෙන් සමන්වාගත වූයේ අධ්‍යාත්මයෙහි අනවද්‍ය සුඛය විඳුනේය.

සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙතං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති.

සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරීහොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාර පස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති.

සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති; අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං සො අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

හේ චක්ෂුසින් රූපයක් දැක නිමිති නොගන්නා සුලු වෙයි අනුව්‍යඤ්ජන නොගන්නා සුලු වෙයි. යම් හෙතුයෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවෘත කොට වසන තෙල මහණහු ලමු අකුසල් දම් වූ අභිධ්‍යා දෞර්මනස්‍යයෝ නුහුබඳනාහු නම් එ සංවරය සඳහා පිළිපදනේය. චක්ෂුරින්ද්‍රියය රක්නේය, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

ශ්‍රොත්‍රයෙන් ශබ්ද අසා ... ඝ්‍රාණයෙන් ගන්ධය ආඝ්‍රාණ කොට ... දිවින් රස විඳ ... කයින් ස්ප්‍රෂ්ටව්‍යය පැහැස ... මනසින් ධර්මය දැන නිමිති නොගන්නා සුලු අනුව්‍යඤ්ජන නොගන්නා සුලු වෙයි. යම් හෙයකින් මනසින්ද්‍රිය ය අසංවෘත කොට වෙසෙන තෙල මහණහු ලමු පවු දහම් වන අභිධ්‍යා දෞර්මනස්‍යයෝ නුහුබඳනාහු ද, එ සංවරය සඳහා පිළිපදනේය. මනින්ද්‍රියය රක්නේය. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හේ මෙ ආර්‍ය්‍ය ඉන්ද්‍රිය සංවරයෙන් සමන්වාගත වූයේ අධ්‍යාත්මයෙහි අව්‍යාසෙක සුඛය විඳුනේය.

හේ ඉදිරි ගමනෙහි දු පෙරළා ගමනෙහි දු සම්ප්‍රජන්‍යකාරී වෙයි. ඉදිරි බැල්මෙහි දු පසු බැල්මෙහි දු සම්ප්‍රජන්‍යකාරී වෙයි. අත් පා හැකුලුම්හි දු විහිදුම්හි දු සම්ප්‍රජන්‍යකාරී වෙයි. සඟළ පා සිවුරු ධැරුම්හි සම්ප්‍රජන්‍යකාරී වෙයි. අශිතයෙහි දු, පීතයෙහි දු, ඛායිතයෙහි දු, සායිතයෙහි දු සම්ප්‍රජන්‍යකාරී වෙයි. උච්චාර – ප්‍රස්‍රාව කර්මයෙහි සම්ප්‍රජන්‍යකාරී වෙයි. ගමනෙහි දු, සිටුම්හි දු හිඳුම්හි දු හෙවීම්හි දු නිදිවැරුම්හි දු භාෂිතයෙහි දු තුෂ්ණීම්භාවයෙහි දු සම්ප්‍රජන්‍යකාරී වෙයි.

හේ මෙ ආර්‍ය්‍යශීලස්කන්ධයෙනු දු සමන්වාගත වූයේ මේ ආර්‍ය්‍ය ඉන්ද්‍රිය සංවරයෙනුදු සමන්වාගත වූයේ මෙ ආර්‍ය්‍ය ස්මෘති සම්ප්‍රජන්‍යයෙනු දු සමන්වාගත වූයේ ජනසම්බාධ රහිත සෙනසුන් වන අරණ්‍යය, වෘක්ෂ මූලය, පර්වතය, කන්‍දරය, ගිරිගුහාය, ශමසානය, වනපෙතය, අබ්වසය, තණසෙවෙණිය බේජෙයි. හේ අරණට ගියේ වේවයි රුක්මුලට ගියේ වේවයි ජනශූන්‍යාගාරයට ගියේ වේවයි පලක් බැඳ කය ඉදු කොට තබා සිහිය පරිමුඛ කොට එළවා හිඳුනේය.

සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. ව්‍යාපාද පදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී, ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගත ථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලී කරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. තං කිං මඤ්ඤසි උපාලි, නනවායං විහාරො පුරිමෙහි විහාරෙහි අභික්කන්තතරො ච පණීතතරො චාති?

එවං භන්තෙ.

ඉමම්පි ඛො උපාලි මම සාවකා අත්තනි ධම්මං සමපස්සමානා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. නො ච ඛො තාව අනුප්පත්ත සදත්ථා විහරන්ති.

පුනචපරං උපාලි භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. තං කිං මඤ්ඤසි උපාලි, නනවායං විහාරො පුරිමෙහි විහාරෙහි අභික්කන්තතරො ච පණීතතරො වා ති?

එවං භන්තෙ.

ඉමම්පි ඛො උපාලි මම සාවකා අත්තනි ධම්මං සමපස්සමානා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. නො ච ඛො තාව අනුප්පත්තසදත්ථා විහරන්ති.

පුනචපරං උපාලි භික්ඛු පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති තං කිං මඤ්ඤසි උපාලි නනවායං විහාරො පුරිමෙහි විහාරෙහි අභික්කන්තතරො ච පණීතතරොවා ති?

එවං භන්තෙ.

හේ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත ලොව්හි අභිධ්‍යාව දුරු කොට පහව ගිය අභිධ්‍යා ඇති සිතින් වාසය කරණේය. අභිධ්‍යායෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද ප්‍රදේවෂය දුරු කොට ව්‍යාපාදයට නො අවන් සිතැතියේ සර්වප්‍රාණභූතයනට හිතානුකම්පා ඇතියේ වාසය කරයි. ව්‍යාපාද ප්‍රදොෂයෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය දුරු කොට පහව ගිය ස්ත්‍යානමිද්ධ ඇතියේ ආලොක සංඥ ඇතියේ ස්මෘතිමත් වූයේ සම්‍යක් ප්‍රඥ ඇත්තේ ස්ත්‍යානමිද්ධයෙන් සිත පිරිසිදු කෙරෙයි. ඖද්ධත්‍ය කෞකෘත්‍යය දුරු කොට උද්ධත නො වූයේ අධ්‍යාත්මයෙහි ව්‍යුපශාන්ත චිත්ත ඇතියේ වාසය කරයි. ඖද්ධත්‍ය කෞකෘත්‍යයෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිත්සාව දුරු කොට තරණ කළ විචිකිත්සා ඇතියේ කුශල ධර්මයන් විෂයයෙහි කථංකථී නොවූයේ විචිකිත්සායෙන් සිත පිරිසිදු කෙරෙයි.

හේ මේ චිත්තොපක්ලෙශ වන ප්‍රඥව දුර්වල කරණ පඤ්චනීවරණයන් දුරු කොට කාමයන්ගෙන් වෙන්ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. උපාලි, එ කුමැයි හඟිව් ද? මෙ විහාරය පළමු විහරණයට වඩා අභික්කන්තතර වූයේත් ප්‍රණීතතර වූයේත් නොවේ ද?

වහන්ස, එසේය.

උපාලි, මාගේ ශ්‍රාවකයෝ මෙ දහම ද තමා කෙරෙහි දක්මින් අරණ්‍ය ද, වනපෙත් ද දුරුසෙනසුනු ද සෙවුනාහ. එතෙකුදු වුව පිළිවෙළින් පැමිණි ස්වාර්ථ (අර්හත්ව)ය ඇත්තාහුව වාසය නො කරත් මැයි.

තවද, උපාලි, මහණ විතර්ක විචාරයන්ගේ ව්‍යපශමයෙන් –පෙ– ද්විතීය ධ්‍යානයට එළඹ වාසය කරයි. උපාලි, එ කුමැයි හඟුව? මෙ විහාරය පළමු විහරණයට වඩා අභික්කන්තතර ත් ප්‍රණීතතරත් නොවේ ද?

වහන්ස, එසේය.

උපාලි, මාගේ ශ්‍රාවකයෝ මෙ දහමු දු තමන් තුළ දක්මින් අරණ්‍ය දු, වනපෙතු දු, දුරු සෙනසුන් ද සෙවුනාහ. එතෙකුදු වුව පිළිවෙළින් පත් ස්වාර්ථ ඇත්තාහු නොම වෙසෙත්.

තවද උපාලි, මහණ ප්‍රීතියෙනුදු විරාගයෙන් –පෙ– තෘතීයධ්‍යානයට එළඹ වෙසෙයි. උපාලි, එ කුමැයි හඟුව? මෙ විහාරය පළමු විහාරයනට වඩා අභික්‍රාන්තතර හා ප්‍රණීතතර හා නො වේද?

වහන්ස එසේය.

ඉමම්පි ඛො උපාලි මම සාවකා අත්තනි ධම්මං සම්පස්සමානා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. නො ච ඛො තාව අනුප්පත්තසදත්ථා විහරන්ති.

පුනචපරං උපාලි භික්ඛු සුඛස්ස ච පහාණා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, තං කිං මඤ්ඤසි උපාලි නනායං විහාරො පුරිමෙහි විහාරෙහි අභික්කන්තතරො ච පණීතතරො චාති?

එවං භන්තෙ.

ඉමම්පි ඛො උපාලි මම සාවකා අත්තනි ධම්මං සම්පස්සමානා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. නො ච ඛො තාව අනුප්පත්තසදත්ථා විහරන්ති.

පුනචපරං උපාලි භික්ඛු සබ්බසො රූප සඤ්ඤානං සමතික්කමා පටිඝ සඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තං කිං මඤ්ඤසි උපාලි, නන්වායං විහාරො පුරිමෙහි විහාරෙහි අභික්කන්තතරො ච පණීත තරො චාති?

එවං භන්තෙ.

ඉමම්පි ඛො උපාලි, මම සාවකා අත්තනි ධම්මං සම්පස්සමානා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. නො ච ඛො තාව අනුප්පත්ත සදත්ථා විහරන්ති.

පුනචපරං උපාලි භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති: -පෙ- සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චී ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති -පෙ-

සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම 'සන්තමෙතං, පණීත-මෙත'න්ති නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, තං කිං මඤ්ඤසි උපාලි, නන්වායං විහාරො පුරිමෙහි විහාරෙහි අභික්කන්තතරො ච පණීතතරො චාති?

එවං භන්තෙ.

ඉමම්පි ඛො උපාලි මම සාවකා අත්තනි ධම්මං සම්පස්සමානා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. නො ච ඛො තාව අනුප්පත්තසදත්ථා විහරන්ති.

උපාලි, මෙ දහම ද මාගේ ශ්‍රාවකයෝ තමන් කෙරෙහි දක්නාහු අරණ්‍ය ද වනපෙතු ද දුරු සෙනසුනු ද සෙවුනාහ. එතෙකුදු වුව පිළිවෙළින් පැමිණි ස්වාර්ථ ඇත්තාහු නො ම වෙසෙත්.

තවද උපාලි, මහණ සුබප්‍රහාණයෙනුදු -පෙ- චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. උපාලි, එ කුමැයි හඟුව? මෙ විහාරය පළමු විහාරයනට වඩා අභිකාන්තතරත් ප්‍රණීතතරත් නොවේ ද?

වහන්ස, එසේය.

උපාලි, මෙ දහම ද මාගේ සව්වෝ තමන් කෙරෙහි දක්නාහු අරණ්‍ය දු, වනපෙතු දු දුරු සෙනසුනු දු සෙව්නාහ. එතෙකුදු වුව පිළිවෙළින් පත් ස්වාර්ථ ඇත්තාහු නො වෙසෙත්.

තවද උපාලි, මහණ සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන් මොනොවට ඉක්මවීමෙන් ප්‍රතිසසංඥාවන්ගේ අස්තගමයෙන් නානාත්ව සංඥාවන්ගේ අමනසිකාරයෙන් කිසුණු ඉගුලු අහස අනතැ'යි ආකාසානඤ්චායතනයට එළඹ වෙසෙයි. උපාලි, එ කුමැයි හඟුව? මෙ විහාරය පළමු විහාරයනට වඩා අභිකාන්තතර හා ප්‍රණීතතර හා නො වේ ද?

වහන්ස, එසේය.

උපාලි, මාගේ ශ්‍රාවකයෝ මෙ දහම ද තමන් කෙරෙහි දක්නා හු අරණ්‍යයනු දු වනපෙතු දු ප්‍රාන්තශයනාසනයනු දු සෙවුනා හ. එතෙකුදු වුව අනුප්‍රාප්ත ස්වාර්ථ ඇත්තාහු නො වෙසෙත්.

තවද උපාලි, මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය සමතික්‍රම කොට 'විඥනය අනන්තය' යි විඤ්ඤාණඤ්චායතනයට එළඹ වෙසෙයි. ... -පෙ-

සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්ම 'කිසිදු නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට එළඹ වෙසෙයි. ...

සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්ම "තෙල ශාන්තය, තෙල ප්‍රණීතය''යි නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට එළඹ වෙසෙයි. උපාලි, එ කුමැයි හඟුව? මෙ විහාරය පළමු විහාරයනට වඩා අභිකාන්තතර හා ප්‍රණීතතර හා නොවේ දැයි!

වහන්ස, එසේය.

උපාලි, මාගේ සව්වෝ මෙ දහම ද තමන් කෙරෙහි දක්නාහු අරණ්‍ය දු, වනපෙතු දු දුරු සෙනසුනු දු සෙවුනාහ. එතෙකුදු වුව පිළිවෙළින් පත් රහත්ඵල ඇත්තාහු නො වෙසෙත් මැයි.

පුනචපරං උපාලි භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. තං කිං මඤ්ඤසි උපාලි, නන්වායං විහාරො පුරිමෙහි විහාරෙහි අභික්කන්තතරො ච පණීත තරො චා ති?

එවං භන්තෙ.

ඉමම්පි ඛො උපාලි මම සාවකා අත්තනි ධම්මං සම්පස්සමානා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති. නො ච ඛො තාව අනුප්පත්ත සදත්ථා විහරන්ති. ඉඞ්ඝ ත්වං උපාලි, සඞ්ඝෙ විහරාහි, සඞ්ඝෙ තෙ විහරතො ඵාසු භවිස්සතී ති.

## 10. 2. 5. 10

## භබ්බාභබ්බ සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අරහත්තං සච්ඡිකාතුං කතමෙ දස:

රාගං දෙසං මොහං කොධං උපනාහං මක්ඛං පළාසං ඉස්සං මච්ඡරියං මානං.

ඉමෙ ඛො භික්ඛවෙ දස ධම්මෙ අප්පහාය අභබ්බො අරහත්තං සච්ඡිකාතුං

දසයිමෙ භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අරහත්තං සච්ඡිකාතුං කතමෙ දස;

රාගං දෙසං මොහං කොධං උපනාහං මක්ඛං පළාසං ඉස්සං මච්ඡරියං මානං.

ඉමෙ ඛො භික්ඛවෙ දස ධම්මෙ පහාය භබ්බො අරහත්තං සච්ඡිකාතුන්ති.

## උපාලිවග්ගො පඤ්චමො.

තත්‍රුද්දානං:

කාමභොගී වෙරං - දිට්ඨිවජ්ජ උත්තියා උභො
කොකනදෙ ආහුනියො - ථෙරො උපාලි අභබ්බොති.

## දුතියො පණ්ණාසකො නිට්ඨිතො.

උපාලි, තවද මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සමතික්‍රම කොට සංඥාවේදයිත නිරෝධයට එළඹ වෙසෙයි. ඔහු ප්‍රඥායෙන් දැක ඔහුගේ ආස්‍රවයෝ ද පරික්ෂීණ වෙත්. උපාලි, එ කිමැයි හඟුව? මෙ විහාරය පළමු විහාරයනට වඩා අභිකාන්තතර හා ප්‍රණීතතර හා නොවේ ද?

වහන්ස, එසේය.

උපාලි, මාගේ ශ්‍රාවකයෝ මෙ දහම ද තමන් තුළ දක්නාහු අරණ්‍යය ද වාන ප්‍රසථයන් ද ප්‍රාන්තශයනාසනයන් ද සෙවුනාහ. එතෙකුදු වුව අනුප්‍රාප්ත සවාර්ථ ඇත්තාහු නො වෙසෙත්.

උපාලි, එහෙයින් තෝ සඟුන් කෙරෙහි වසව, සඟුන් කෙරෙහි වසන තොපට පහසු වන්නේය යි.

**උපාලි සූත්‍රය නව වැනි යි.**

## 10. 2. 5. 10

## හබ්බාහබ්බ සූත්‍රය

මහණෙනි, මෙ දහම් දසය නොහැර අර්හත්වය සාක්ෂාත් කරණයට අභව්‍ය වෙයි. කවර දසයෙක යත්:

රාගය, ද්වේෂය, මෝහය, ක්‍රෝධය, උපනාහය, මක්‍ෂබවය, පලාසය, ඊර්ෂ්‍යාය, මාත්සය්‍ර්‍යය, මානය දැයි.

මහණෙනි, මෙ දස දහම් නොහැර අර්හත්වය සාක්ෂාත් කරණයට අභව්‍ය වෙයි.

මහණෙනි, මෙ දහම් දසය හැර අර්හත්වය සාක්ෂාත් කරණයට භව්‍ය වෙයි. කවර දසයෙක යත්:

රාගය, ද්වේෂය, මෝහය, ක්‍රෝධය, උපනාහය, මක්‍ෂය, පලාසය, ඊර්ෂ්‍යාය, මාත්සය්‍ර්‍ය, මානය දැයි.

මහණෙනි, මෙ දස දහම් හැර අර්හත්වය සාක්ෂාත් කරණයට භව්‍ය වෙයි.

**දසවැනි හබ්බාහබ්බ සූත්‍ර යි.**

**පස්වැනි උපාලි වර්ග යි.**

**එහි උද්දානය:**

කාම භොගී සූත්‍රය, වෙර සූත්‍රය, දිට්ඨි සූත්‍රය, වජ්ජියමාහිත සූත්‍රය, උත්තිය සූත්‍රය, කොකනද සූත්‍රය, ආහුණෙය්‍ය සූත්‍රය, ථෙර සූත්‍රය උපාලි සූත්‍රය, අභබ්බ සූත්‍රය දැයි දසයෙකි.

**දෙවන පණ්ණාසකය නිමි.**

## තතියො පණ්ණාසකො

## 10. 3. 1. 1

### සමණසඤ්ඤා සුත්තං

තිස්සො ඉමා භික්ඛවෙ සමණසඤ්ඤා භාවිතා බහුලීකතා සත්තධම්මෙ පරිපූරෙන්ති. කතමා තිස්සො:

වෙවණ්ණියම්හි අජ්ඣුපගතො, පරපටිබද්ධා මෙ ජීවිකා, අඤ්ඤො මෙ ආකප්පො කරණීයොති. ඉමා ඛො භික්ඛවෙ තිස්සො සමණසඤ්ඤා භාවිතා බහුලීකතා සත්තධම්මෙ පරිපූරෙන්ති. කතමෙ සත්ත:

නිච්චං සන්තතකාරී[1] හොති සන්තතවුත්ති[2] සීලෙසු, අනභිජ්ඣාලු හොති. අව්‍යාපජ්ජො හොති. අනතිමානී හොති සික්ඛාකාමො හොති, ඉදමත්ථන්තිස්ස හොති ජීවිතපරික්ඛාරෙසු ආරද්ධවිරියො ච විහරති. ඉමා ඛො භික්ඛවෙ තිස්සො සමණසඤ්ඤා භාවිතා බහුලීකතා ඉමෙ සත්ත ධම්මෙ පරිපූරෙන්තී ති.

## 10. 3. 1. 2

### බොජ්ඣඞ්ග සුත්තං

සත්තිමෙ භික්ඛවෙ බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා තිස්සො විජ්ජා පරිපූරෙන්ති. කතමෙ සත්ත:

සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, විරියසම්බොජ්ඣඞ්ගො, පීතිසම්බොජ්ඣඞ්ගො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, ඉමෙ ඛො භික්ඛවෙ සත්තබොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා තිස්සො විජ්ජා පරිපූරෙන්ති. කතමා තිස්සො:

ඉධ භික්ඛවෙ භික්ඛු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

---

1. සන්තතකාරී හොති. මජ්ඣං. අට්ඨකථා.
   සන්තතකාරිහොති - ස්‍යා. P.T.S.
2. සන්තතවුත්ති - ස්‍යා. -PTS
3. ආරද්ධ විරියොච - මජ්ඣං.

## තුන්වැනි පනස

## 10. 3. 1. 1

## සමණසඤ්ඤා සූත්‍රය

මහණෙනි, මෙ ත්‍රිවිධ ශ්‍රමණ සංඥා කෙනෙක් භාවිත බහුලීකෘත වූවාහු සත් කරුණක් පිරිපුන් කරත්. කවර තුන් කෙනෙක යත්:

(කාය - චීවරාදී) වෛවර්ණ්‍යයට පැමිණියෙම් වෙමියි. මා දිවිපැවැත්ම පරාපිළිබැඳි වෙයි; මා විසින් ගිහීනට අන්‍ය වූ ශ්‍රමණාකල්පයෙක් කට යුත්තේය; මහණෙනි, ශ්‍රමණයනට උපදනා මෙ ත්‍රිවිධ සංඥාහු භාවිත බහුලීකෘත වූවාහු සත් කරුණක් පිරිපුන් කරත්. කවර සත් කෙනෙක යත්:

හැම කල්හි නිරන්තරකාරී වූයේ ශීලයෙහි සතතප්‍රවෘත්ති ඇත්තේ වෙයි. අභිධ්‍යාබහුල නොවෙයි. ව්‍යාපාද නැත්තේ වෙයි. අතිමාන නැත්තේ වෙයි. ශික්ෂා කාම වෙයි. ඔහුගේ ජීවිතපරිෂ්කාරයන්හි මේ ප්‍රත්‍යය ය යන (අදහස) වෙයි. ඇරඹූ වැර ඇතියේ ද වෙයි. මහණෙනි, මේ ත්‍රිවිධ ශ්‍රමණ සංඥාවෝ භාවිත බහුලීකෘත වූවාහු මෙ සත් කරුණු සපුරත්යි.

## 10. 3. 1. 2

## බොජ්ඣඞ්ග සූත්‍රය

මහණෙනි, මේ සප්ත බොධ්‍යඞ්ගයෝ භාවිත බහුලීකෘත වූවාහු ත්‍රිවිද්‍යාවන් සපුරත්. කවර සතෙක යත්:

සතිසම්බොජ්ඣඞ්ගය, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය, විරිය සම්බොජ්ඣ-ඞ්ගය, පීති සම්බොජ්ඣඞ්ගය, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය, සමාධි සම්බොජ්ඣඞ්ගය උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය යි. මහණෙනි, මේ සප්ත බොධ්‍යඞ්ගයෝ භාවිත බහුලීකෘත වූවාහු ත්‍රිවිද්‍යාවන් සපුරත්, කවර තිදෙනෙක යත්:

මහණෙනි. මෙ සස්නෙහි මහණ අනෙකවිධ වූ පූර්වේනිවාසානුස්මෘතිය සිහි කරයි. එ කෙසේය යත්: එක් ජාතියක් ද ජාති දෙකක් ද ... මෙසේ ආකාර සහිත උද්දෙශ සහිත අනෙකවිධ පූර්වේනිවාසය අනුස්මරණ කරයි.

දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන -පෙ- යථා කම්මූපගෙ සත්තෙ පජානාති.

ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

ඉමෙ ඛො භික්ඛවෙ සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා ඉමා තිස්සො විජ්ජා පරිපූරෙන්තී ති.

## 10. 3. 1. 3
## මිච්ඡත්ත සුත්තං

මිච්ඡත්තං භික්ඛවෙ ආගම්ම විරාධනා හොති, නො ආරාධනා. කථඤ්ච භික්ඛවෙ මිච්ඡත්තං ආගම්ම විරාධනා හොති නො ආරාධනා:

මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ මිච්ඡාසංකප්පො පහොති, මිච්ඡාසඞ්කප්පස්ස මිච්ඡාවාචා පහොති, මිච්ඡාවාචස්ස මිච්ඡාකම්මන්තො පහොති, මිච්ඡාකම්මන්තස්ස මිච්ඡා ආජීවො පහොති, මිච්ඡාආජීවස්ස මිච්ඡාවායාමො පහොති, මිච්ඡාවායාමස්ස මිච්ඡාසති පහොති, මිච්ඡාසතිස්ස මිච්ඡාසමාධි පහොති, මිච්ඡාසමාධිස්ස මිච්ඡාඤාණං පහොති, මිච්ඡාඤාණිස්ස[1] මිච්ඡා විමුත්ති පහොති. එවං ඛො භික්ඛවෙ මිච්ඡත්තං ආගම්ම විරාධනා හොති නො ආරාධනා.

සම්මත්තං භික්ඛවෙ ආගම්ම ආරාධනා හොති, නො විරාධනා කථඤ්ච භික්ඛවෙ සම්මත්තං ආගම්ම ආරාධනා හොති, නො විරාධනා:

සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ සම්මාසඞ්කප්පො පහොති, සම්මාසඞ්කප්පස්ස සම්මාවාචා පහොති, සම්මාවාචස්ස සම්මාකම්මන්තො පහොති, සම්මාකම්මන්තස්ස සම්මා ආජීවො පහොති, සම්මා ආජීවස්ස සම්මාවායාමො පහොති, සම්මා වායාමස්ස සම්මාසති පහොති, සම්මාසතිස්ස සම්මා සමාධි පහොති, සම්මාසමාධිස්ස සම්මා ඤාණං පහොති, සම්මා ඤාණිස්ස[2] සම්මා විමුත්ති පහොති. එවං ඛො භික්ඛවෙ සම්මත්තං ආගම්ම ආරාධනා හොති නො විරාධනා ති.

---

1. මිච්ඡාඤාණස්ස. P.T.S.
2. සම්මාඤාණස්ස P.T.S.

මිනිසැස ඉක්ම ගිය, විශුද්ධ වූ දිවැසින් ... කම් වූ පරිදි ප්‍රතිසන්ධියට එළඹෙන සත්ත්වයන් දනිත්.

ආශ්‍රවක්ෂයයෙන් ... සාක්ෂාත් කොට එයට එළඹ වෙසෙයි.

මෙසප්ත බොධ්‍යඞ්ගයෝ භාවිත බහුලීකෘත වූවාහු මෙ ත්‍රිවිද්‍යාවන් සපුරත්.

## 10. 3. 1. 3
## මිච්ඡත්ත සූත්‍රය

මහණෙනි, මිථ්‍යාත්වයට පැමිණීමෙන් විරාධනා වෙයි. ආරාධනායෙක් නොවෙයි. මහණෙනි, කෙසේ නම් මිථ්‍යාත්වයට පැමිණීමෙන් විරාධන වේයැ ආරාධනා නො වේය යත්:

මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිකහට මිථ්‍යාසංකල්පය පොහොනේය, මිථ්‍යාසංකල්ප ඇතියහට මිථ්‍යාවාක් පොහොනේය. මිථ්‍යාවාක් ඇතිය හට මිථ්‍යා කර්මාන්ත පොහොනේය. මිථ්‍යා කර්මාන්ත ඇතිය හට මිථ්‍යා ආජීවය පොහොනේය. මිථ්‍යා ආජීව ඇත්තාහට මිථ්‍යා ව්‍යායාමය පොහොනේය. මිථ්‍යා ව්‍යායාමය ඇත්තාහට මිථ්‍යා ස්මෘතිය පොහොනේය, මිථ්‍යා ස්මෘති ඇත්තාහට මිථ්‍යා සමාධිය පොහොනේය. මිථ්‍යා සමාධි ඇත්තා හට මිථ්‍යා ඥනය පොහොනේය. මිථ්‍යා ඥනය ඇත්තා හට මිථ්‍යා විමුක්ති පොහොනේය. මහණෙනි, මෙ සෙයින් ම මිථ්‍යාත්වයට පැමිණීමෙන් විරාධනා වෙයි. ආරාධනා නො වෙයි.

මහණෙනි, සම්‍යක්ත්වයට පැමිණීමෙන් ස්වර්ග – මාර්ගාරාධනා වෙයි. විරාධනා නො වෙයි. මහණෙනි, කෙසේ නම් සම්‍යක්ත්වයට පැමිණීමෙන් ආරාධනා වේයැ, විරාධනා නොවේය යත්:

මහණෙනි, සම්‍යක්දෘෂ්ටිකයාහට සම්‍යක් සංකල්පය පොහොනේය. සම්‍යක් සංකල්ප ඇතියහට සම්‍යග් වචනය පොහොනේය. සම්‍යග් වචනය ඇතියහට සම්‍යක්කර්මාන්තය පොහොනේය. සම්‍යක් කර්මාන්ත ඇතිය හට සම්‍යගාජීවය පොහොනේය. සම්‍යගාජීවය ඇතියහට සම්‍යග් ව්‍යායාමය පොහොනේය. සම්‍යග් ව්‍යායාම ඇත්තහුට සම්‍යක් ස්මෘතිය පොහොනේය. සම්‍යක් ස්මෘති ඇත්තහුට සම්‍යක් සමාධිය පොහොනේය. සම්‍යක් සමාධිය ඇත්තහුට සම්‍යග් ඥනය පොහොනේය. සම්‍යග් ඥන ඇත්තහුට සම්‍යග් විමුක්තිය පොහොනේයි. මහණෙනි, මෙ සෙයින් ම සම්‍යක්ත්වයට පැමිණීමෙන් ආරාධනා වේ. විරාධනා නො වෙයි.

## 10. 3. 1. 4

## බීජ සුත්තං

මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිස පුග්ගලස්ස මිච්ඡා සංකප්පස්ස– මිච්ඡා වාචස්ස – මිච්ඡා කම්මන්තස්ස – මිච්ඡා ආජීවස්ස – මිච්ඡා වායාමස්ස – මිච්ඡා සතිස්ස – මිච්ඡා සමාධිස්ස – මිච්ඡා ඤාණිස්ස – මිච්ඡා විමුත්තිස්ස යඤ්චෙව[1] කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං[2], යඤ්ච වචීකම්මං –පෙ– යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා, යො ච පණිධි, යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා, අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හි[3] භික්ඛවෙ පාපිකා.

සෙය්‍යථාපි භික්ඛවෙ නිම්බබීජං වා කොසාතකීබීජං වා තිත්තකාලාබු බීජං වා අල්ලාය පඨවියා නික්ඛිත්තං යඤ්චෙව[1] පඨවිරසං උපාදියති. යඤ්ච ආපොරසං උපාදියති. සබ්බං තං තිත්තකත්තාය කටුකත්තාය අසාතත්තාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: බීජං හි භික්ඛවෙ පාපකං.

එවමෙව ඛො භික්ඛවෙ මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස – මිච්ඡා සංකප්පස්ස – මිච්ඡාවාචස්ස– මිච්ඡා කම්මන්තස්ස – මිච්ඡා ආජීවස්ස – මිච්ඡා වායාමස්ස – මිච්ඡා සතිස්ස – මිච්ඡා සමාධිස්ස – මිච්ඡා ඤාණිස්ස – මිච්ඡා විමුත්තිස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං–පෙ–යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යා ච චෙතනා යාච පත්ථනා, යො ච පණිධි, යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හි භික්ඛවෙ පාපිකා.

සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස සම්මා සංකප්පස්ස – සම්මා වාචස්ස – සම්මා කම්මන්තස්ස – සම්මා ආජීවස්ස– සම්මා වායාමස්ස – සම්මා සතිස්ස – සම්මා සමාධිස්ස – සම්මා ඤාණිස්ස – සම්මා විමුත්තිස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා, යා ච පත්ථනා යො ච පණිධි, යෙ ච සඞ්ඛාරා සබ්බෙ තෙ ධම්මා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හි[4] භික්ඛවෙ භද්දිකා.

---

1. යඤ්ච, මජසං.
2. සමාදින්නං. P.T.S.
3. දිට්ඨි හිස්ස – මජසං
4. දිට්ඨිහිස්ස - මජසං.

# 10. 3. 1. 4
## බීජ සූත්‍රය

මහණෙනි, මිථ්‍යාදෘෂ්ටික පුරුෂ පුද්ගලයා විසින් – මිථ්‍යා සංකල්ප ඇති – මිථ්‍යා වාක් ඇති – මිථ්‍යා කර්මාන්ත ඇති – මිථ්‍යා ආජීව ඇති – මිථ්‍යා ව්‍යායාම ඇති – මිථ්‍යා සමෘති ඇති – මිථ්‍යා සමාධි ඇති – මිථ්‍යා ඥාන ඇති – මිථ්‍යා විමුක්ති ඇති පුරුෂ පුද්ගලයා විසින් දෘෂ්ටි පරිදි ගන්නා ලද සමාදන් වන ලද යම් කාය කර්මයක් හා – යම් වාග් කර්මයක් හා දෘෂ්ටි පරිදි ගන්නා ලද සමාදන් වන ලද යම් මනඃ කර්මයක් හා යම් චෙතනාවක් හා යම් ප්‍රාර්ථනාවක් හා යම් ප්‍රණිධියක් හා යම් සංස්කාර හා වෙත් නම්, එ හැම ධර්මයෝ අනිටු වූ අකාන්ත වූ අමනාප වූ අහිත වූ දුක් පිණිස වැටෙත්. එ කවර හෙයින යත්: මහණෙනි දෘෂ්ටිය ලමු වේ මැයි.

මහණෙනි, යම් සේ කොසඹ බිජුවටෙක් වේවයි වැටකොලු බිජුවටෙක් වේවයි තිත්ත ලබු බිජුවටෙක් වේවයි තෙත් පොළොවෙහි නික්ෂිප්ත වූයේ යම් ම පොළෝරසයක් හා අල්වාගනී නම්, යම් ම ආපොරසයක් හා අල්වාගනී නම්, එ හැම තික්තකභාවය පිණිස, කුළුබව පිණිස, අශාත-භාවය පිණිස වැටෙයි. එ කවරහෙයින යත්: මහණෙනි, බිජුවට ලමුමැයි. (එහෙයිනි)

මහණෙනි, එපරිද්දෙන් ම මිථ්‍යාදෘෂ්ටික පුරුෂ පුද්ගලයා විසින් - මිථ්‍යාසංකල්ප ඇති - මිථ්‍යාවාක් ඇති - මිථ්‍යාකර්මාන්ත ඇති - මිථ්‍යාආජීව ඇති - මිථ්‍යාව්‍යායාම ඇති - මිථ්‍යාසමෘති ඇති - මිථ්‍යාසමාධි ඇති - මිථ්‍යා ඥාන ඇති - මිථ්‍යාවිමුක්ති ඇති පුරුෂපුද්ගලයා විසින් දෘෂ්ටි වූ පරිද්දෙන් ගන්නා ලද සමාදන්වන ලද යම් ම කායකර්මයක් හා-යම් ම වාක්කර්මයක් හා දෘෂ්ටි වූ පරිදි ගන්නා ලද සමාදන් වන ලද යම් ම මනඃකර්මයක් හා යම් ම චෙතනාවක් හා යම් ම ප්‍රාර්ථනාවක් හා යම් ම ප්‍රණිධියක් හා යම් ම සංස්කාර කෙනෙක් හා වෙත් ද එ හැම දහම්හු අනිටු බව පිණිස, අකාන්තය පිණිස, අමනාපය පිණිස අහිත පිණිස දුක් පිණිස වැටෙත්. කවර හෙයින යත්: මහණෙනි, දෘෂ්ටිය ලමු මැයි (එහෙයිනි)

මහණෙනි, සම්‍යක්දෘෂ්ටික පුරුෂපුද්ගලයා විසින් – සම්‍යක්සංකල්ප ඇති - සම්‍යක් වාක් ඇති – සම්‍යක් කර්මාන්ත ඇති - සම්‍යක් ආජීව ඇති – සම්‍යක් ව්‍යායාම ඇති - සම්‍යක් සමෘති ඇති - සම්‍යක් සමාධි ඇති-සම්‍යග් ඥාන ඇති - සම්‍යග් විමුක්ති ඇති පුරුෂ පුද්ගලයා විසින් දෘෂ්ටි වූ පරිදි ගන්නා ලද සමාදන් වනලද යම් ම කායකර්මයක් වේවයි, දෘෂ්ටි වූ පරිදි ගන්නාලද සමාදන් වනලද යම් ම වාක්කර්මයක් වේවයි, දෘෂ්ටි පරිදි ගන්නා ලද සමාදන් වනලද යම් ම මනඃකර්මයක් වේවයි යම් ම චෙතනාවක් වේවයි, යම් ම ප්‍රාර්ථනාවක් වේවයි, යම් ම ප්‍රණිධියක් වේවයි යම් ම සංස්කාර වෙත්වයි එ හැම ධර්මයෝ ඉටු වූ කාන්ත වූ මනාප වූ හිත වූ සැප පිණිස වැටෙත්. එ කවරහෙයින යත්: මහණෙනි, දෘෂ්ටිය භද්‍ර මැයි. (එහෙයිනි)

සෙය්‍යථාපි භික්ඛවෙ, උච්ඡුබීජං වා සාලි බීජං වා මුද්දිකා බීජං වා අල්ලාය පඨවියා නික්ඛිත්තං යඤ්චෙව පඨවිරසං උපාදියති, යඤ්ච ආපොරසං උපාදියති, සබ්බං තං සාතත්තාය මධුරත්තාය අසෙචනකත්තාය සංවත්තති. තං කිස්ස හෙතු; බීජං හි භික්ඛවෙ භද්දකං.

එවමෙව ඛො භික්ඛවෙ සම්මාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස සම්මා සංකප්පස්ස සම්මාවාචස්ස - සම්මාකම්මන්තස්ස – සම්මා ආජීවස්ස – සම්මා වායාමස්ස – සම්මා සතිස්ස – සම්මා සමාධිස්ස – සම්මා ඤාණස්ස – සම්මා විමුත්තිස්ස යඤ්චෙව කාය කම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචී කම්මං –පෙ– යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යාච පත්ථනා යො ච පණිධි යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු; දිට්ඨි හි භික්ඛවෙ භද්දිකාති.

## 10. 3. 1. 5
## විජ්ජා සුත්තං

අවිජ්ජා භික්ඛවෙ පුබ්බඞ්ගමා අකුසලානං ධම්මානං සමාපත්තියා. අන්වදෙව අහිරිකං අනොත්තප්පං. අවිජ්ජාගතස්ස භික්ඛවෙ අවිද්දසුනො මිච්ඡාදිට්ඨි පහොති. මිච්ඡාදිට්ඨිකස්ස මිච්ඡාසඞ්කප්පො පහොති. මිච්ඡා සඞ්කප්පස්ස මිච්ඡාවාචා පහොති. මිච්ඡාවාචස්ස මිච්ඡාකම්මන්තො පහොති. මිච්ඡා කම්මන්තස්ස මිච්ඡා ආජීවො පහොති. මිච්ඡා ආජීවස්ස මිච්ඡාවායාමො පහොති. මිච්ඡා වායාමස්ස මිච්ඡාසති පහොති. මිච්ඡා සතිස්ස මිච්ඡාසමාධි පහොති. මිච්ඡාසමාධිස්ස මිච්ඡාඤාණං පහොති. මිච්ඡාඤාණිස්ස මිච්ඡාවිමුත්ති පහොති,

මහණෙනි, යම්පරිදි උක් බිජුවටෙක් වේවයි හැල් බිජුවටෙක් වේවයි මිදි බිජුවටෙක් වේවයි තෙත් පොළොවෙහි නික්ෂිප්ත වූයේ යම්බඳු පොළෝ රසයක් ගන්නේ ද ආපොරසයක් ගන්නේ ද එ හැම ශාකභාවයට මියුරු බවට අසෙචනක භාවයට වැටෙයි. එ කවර හෙයින යත්: මහණෙනි, බිජුවට භද්‍ර ය, එහෙයිනි.

එපරිදි ම මහණෙනි, සම්‍යග්දෘෂ්ටික පුරුෂපුද්ගලයා විසින් - සම්‍යක් සංකල්ප ඇති - සම්‍යග්වචන ඇති - සම්‍යක්කර්මාන්ත ඇති - සම්‍යගාජීව ඇති - සම්‍යග්ව්‍යායාම ඇති - සම්‍යක්ස්මෘති ඇති - සම්‍යක් සමාධි ඇති – සම්‍යග්ඥාන ඇති - සම්‍යග්විමුක්ති ඇති පුරුෂපුද්ගලයා විසින් දෘෂ්ටියට අනුව ගන්නාලද සමාදන් වනලද යම් ම කායකර්මයක් වේවයි, යම් ම වාක්කර්මයක් වේවයි – දෘෂ්ටියට අනුව ගන්නාලද සමාදන් වන ලද යම් ම මනඃකර්මයක් වේවයි යම් ම චෙතනාවක් වේවයි යම් ම ප්‍රාර්ථනාවක් වේවයි යම් ම ප්‍රණිධියක් වේවයි යම් ම සංස්කාරකෙනෙක් වෙත්වයි එ හැම ඉටුවූ කාන්ත වූ මනාප වූ හිත වූ සුඛය පිණිස වැටෙත්. එ කවර හෙයින යත්: මහණෙනි, දෘෂ්ටිය භද්‍ර මැයි. (එහෙයිනි)

## 10. 3. 1. 5
## විජ්ජා සූත්‍රය

මහණෙනි, අකුශලධර්ම සමාපත්තියට අවිද්‍යා පූර්වඞ්ගම වෙයි. අහ්‍රීකය, අනපත්‍රපාය යන දෙක නුහුබදනේ මය. මහණෙනි, අවිද්‍යාගත අඥබාලයාට මිථ්‍යාදෘෂ්ටිය පොහොනේය. මිථ්‍යාදෘෂ්ටිකහට මිථ්‍යා සංකල්පය පොහොනේයි. මිථ්‍යාසංකල්ප ඇතියහුට මිථ්‍යාවාක් පොහොනේය – මිථ්‍යාවාක් ඇතියහුට මිථ්‍යාකර්මාන්ත පොහොනේය - මිථ්‍යාකර්මාන්ත ඇතියහට මිථ්‍යා ආජීවය පොහොනේය. මිථ්‍යාආජීව ඇතියහට මිථ්‍යාව්‍යායාම පොහොනේය - මිථ්‍යාව්‍යායාම ඇතියහට මිථ්‍යා ස්මෘතිය පොහොනේය– මිථ්‍යාස්මෘති ඇතියහට මිථ්‍යාසමාධි පොහොනේය මිථ්‍යාසමාධි ඇතියහට මිථ්‍යාඥානය පොහොනේය - මිථ්‍යාඥානය ඇතියහට මිථ්‍යාවිමුක්ති පොහොනේය.

විජ්ජා ච ඛො භික්ඛවෙ පුබ්බඞ්ගමා කුසලානං ධම්මානං සමාපත්තියා. අන්වදෙව හිරොත්තප්පං. විජ්ජාගතස්ස භික්ඛවෙ විද්දසුනො සම්මාදිට්ඨි පහොති. සම්මාදිට්ඨිකස්ස සම්මා සඞ්කප්පො පහොති, සම්මාසඞ්කප්පස්ස සම්මාවාචා පහොති. සම්මා වාචස්ස සම්මා කම්මන්තො පහොති. සම්මා කම්මන්තස්ස සම්මා ආජීවො පහොති. සම්මාආජීවස්ස සම්මාවායාමො පහොති. සම්මාවායාමස්ස සම්මාසති පහොති. සම්මාසතිස්ස සම්මා සමාධි පහොති. සම්මාසමාධිස්ස සම්මා ඤාණං පහොති. සම්මාඤාණස්ස සම්මා විමුත්ති පහොතී ති.

## 10. 3. 1. 6
## නිජ්ජර සුත්තං

**[සාවත්ථි]**

දස ඉමානි භික්ඛවෙ නිජ්ජරවත්ථූනි. කතමානි දස:

1. සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ මිච්ඡාදිට්ඨි නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාදිට්ඨිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

2. සම්මාසංකප්පස්ස භික්ඛවෙ මිච්ඡාසඞ්කප්පො නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡාසඞ්කප්පපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මා සඞ්කප්පපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

3. සම්මාවාචස්ස භික්ඛවෙ මිච්ඡාවාචා නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාවාචාපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාවාචාපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

4. සම්මාකම්මන්තස්ස භික්ඛවෙ මිච්ඡාකම්මන්තො නිජ්ජිණ්ණො හොති, යෙ ච මිච්ඡාකම්මන්තපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාකම්මන්තපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

5. සම්මා ආජීවස්ස භික්ඛවෙ මිච්ඡාආජීවො නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡාආජීවපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාආජීවපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

තවද මහණෙනි, කුශලධර්මසමාපත්තියට විද්‍යාව පූර්වඞ්ගම වෙයි. එ අනුව හිරිඔතප් නුහුබදනේය. මහණෙනි, විද්‍යාගත විදර්ශිහට සම්‍යග්දෘෂ්ටිය පොහොනේය. සම්‍යග්දෘෂ්ටිකයාහට සම්‍යක්සංකල්පය පොහොනේය. සම්‍යග්සංකල්ප ඇත්තාහට සම්‍යග්වාක් පොහොනේය. සම්‍යක්වචන ඇත්තාහට සම්‍යක්කර්මාන්තය පොහොනේය. සම්‍යක්කර්මාන්තය ඇත්තාහට සම්‍යගාජීවය පොහොනේය. සම්‍යගාජීව ඇත්තාහට සම්‍යග් ව්‍යායාමය පොහොනේය. සම්‍යග්ව්‍යායාමය ඇත්තාහට සම්‍යක්ස්මෘතිය පොහොනේය. සම්‍යක්ස්මෘති ඇත්තාහට සම්‍යග් ඥානය පොහොනේය. සම්‍යග් ඥානය ඇත්තාහට සම්‍යග්විමුක්තිය පොහොනේ යයි.

## 10. 3. 1. 6
## නිජ්ජර සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, මෙ නිර්ජරවස්තූහු දශදෙනෙක. කවර දශදෙනෙක යත්:

1. මහණෙනි, සම්‍යග්දෘෂ්ටිකයාගේ මිථ්‍යාදෘෂ්ටිය (මාර්ගභාවනායෙන්) නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලමු අකුශල ධර්මයෝ උපදනාහු නම් ඔහුගේ එ අකුශල ධර්මයෝ නිර්ජීර්ණ වෙත්. සම්‍යග්දෘෂ්ටි ප්‍රත්‍යයෙනුදු නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත්.

2. මහණෙනි, සම්‍යක්සංකල්ප ඇතියහුගේ මිථ්‍යාසංකල්පය නිර්ජීර්ණ වෙයි, මිථ්‍යාසංකල්පප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලමු අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහට ඔහුදු නිර්ජීර්ණ වෙත්. සම්‍යක් සංකල්ප ප්‍රත්‍යයෙනුදු නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත්.

3. මහණෙනි, සම්‍යක් වචන ඇතියහුගේ මිථ්‍යාවචනය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාවාක් ප්‍රත්‍යයෙන් නොයෙක් ලාමක අකුශලධර්මයෝ වෙත් නම් ඔහට ඔහු ද නිර්ජීර්ණ වෙත්. සම්‍යග්වාක්ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත්.

4. මහණෙනි, සම්‍යක්කර්මාන්ත ඇතියහුගේ මිථ්‍යාකර්මාන්තය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාකර්මාන්ත ප්‍රත්‍යයෙන් නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහට එ අකුශලධර්මයෝ ද නිර්ජීර්ණ වෙත්. සම්‍යක්-කර්මාන්තප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්.

5. මහණෙනි, සම්‍යගාජීව ඇතියහුගේ මිථ්‍යාජීවය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාජීවප්‍රත්‍යයෙන් යම්බඳු ලාමක අකුශලධර්මයෝ වෙත් නම් ඔහුගේ එ අකුශලධර්මයෝ නිර්ජීර්ණ වෙත්. සම්‍යගාජීවප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්.

6. සම්මාවායාමස්ස භික්ඛවෙ මිච්ඡාවායාමො නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡාවායාමපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාවායාම පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

7. සම්මා සතිස්ස භික්ඛවෙ මිච්ඡා සති නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාසතිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාසති පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

8. සම්මා සමාධිස්ස භික්ඛවෙ මිච්ඡා සමාධි නිජ්ජිණ්ණො හොති. යෙ ච මිච්ඡා සමාධි පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාසමාධිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

9. සම්මාඤාණස්ස භික්ඛවෙ මිච්ඡාඤාණං නිජ්ජිණ්ණං හොති. යෙ ච මිච්ඡාඤාණපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාඤාණපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

10. සම්මාවිමුත්තිස්ස භික්ඛවෙ මිච්ඡාවිමුත්ති නිජ්ජිණ්ණා හොති. යෙ ච මිච්ඡාවිමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මාවිමුත්ති පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. ඉමානි ඛො භික්ඛවෙ දසනිජ්ජරවත්ථූනී ති.

## 10. 3. 1. 7

## ධොවන සුත්තං

**[සාවත්ථි]**

අත්ථි භික්ඛවෙ දක්ඛිණෙසු ජනපදෙසු ධොවනං නාම තත්ථ හොති අන්නම්පි පානම්පි ඛජ්ජම්පි භොජ්ජම්පි ලෙය්‍යම්පි පෙය්‍යම්පි නච්චම්පි ගීතම්පි වාදිතම්පි. අත්ථෙතං භික්ඛවෙ ධොවනං, නෙතං නත්ථීති වදාමි. තඤ්ච ඛො එතං භික්ඛවෙ ධොවනං හීනං ගම්මං පොථුජ්ජනිකං අනරියං අනත්ථසංහිතං, න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තතී ති.

6. මහණෙනි, සම්‍යග්ව්‍යායාම ඇතියහුගේ මිථ්‍යාව්‍යායාමය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාව්‍යායාම ප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශල-ධර්මයෝ උපදනාහු නම්, ඔහට එ අකුසල්හු ද නිර්ජීර්ණ වෙත්. සම්‍යග් ව්‍යායාම ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත්.

7. මහණෙනි, සම්‍යක්ස්මෘති ඇතියහුගේ මිථ්‍යාස්මෘතිය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාස්මෘතිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහුගේ එ අකුශලධර්මයෝ ද නිර්ජීර්ණ වෙත්. සම්‍යක්ස්මෘති-ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්.

8. මහණෙනි, සම්‍යක්සමාධි ඇතියහුගේ මිථ්‍යාසමාධිය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාසමාධිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහට එ අකුශලධර්මයෝ ද නිර්ජීර්ණ වෙත්. සම්‍යක්-සමාධිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ ද භාවනායෙන් පිරීමට යෙත්.

9. මහණෙනි, සම්‍යග්ඥාන ඇතියහුගේ මිථ්‍යාඥානය නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාඥාන ප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහට එ අකුශලධර්මයෝ ද නිර්ජීර්ණ වෙත්. සම්‍යග්ඥාන ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත්.

10. මහණෙනි, සම්‍යග් විමුක්ති ඇතියහුගේ මිථ්‍යාවිමුක්ති නිර්ජීර්ණ වෙයි. මිථ්‍යාවිමුක්තිප්‍රත්‍යයෙන් නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහුට එ අකුශලධර්මයෝ ද නිර්ජීර්ණ වෙත්.සම්‍යග් විමුක්ති ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්. මහණෙනි, මෙ දසදෙන නිර්ජරවස්තුහු වෙත් යි.

## 10. 3. 1. 7
## ධොවන සූත්‍රය

මහණෙනි, දක්ෂිණජනපදයෙහි ධොවන නම් නැකැත් කෙළියෙක් ඇත. මහණෙනි, එ නකත් කෙළියෙහි අන්න හා පාන හා ඛාද්‍ය හා භොජ්‍ය හා ලෙහ්‍ය හා පෙය හා නෘත්‍ය හා ගීත හා වාදිත්‍ර හා වෙයි. මහණෙනි, නෙල ධොවනය ඇත් මැයි. නෙල නැතැයි නො ම කියමි. මහණෙනි, නෙල ධොවනය හීනය, ග්‍රාම්‍යය, පුහුදුනන් අයත්ය, අනාර්‍ය්‍යය, අනර්ථ ඇසුරු කෙළේය. නිර්වේදය සඳහා නො වෙයි විරාගය සඳහා නො වෙයි, නිරොධය සඳහා නො වෙයි, ක්ලෙශව්‍යුපශමය සඳහා නො වෙයි. අභිඥා සඳහා නො වෙයි, සම්බොධිය සඳහා නො වෙයි, නිර්වාණය පිණිස නො වැටෙයි.

අහඤ්ච ඛො භික්ඛවෙ අරියං ධොවනං දෙසිස්සාමි. යං ධොවනං එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. යං ධොවනං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති, මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්ති. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

කතමඤ්ච තං භික්ඛවෙ අරියං ධොවනං යං ධොවනං එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යං ධොවනං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති, මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්ති.

සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ මිච්ඡාදිට්ඨි නිද්ධොතා හොති, යෙ ච මිච්ඡාදිට්ඨිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිද්ධොතා හොන්ති. සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාසඞ්කප්පස්ස භික්ඛවෙ මිච්ඡාසඞ්කප්පො නිද්ධොතො හොති -පෙ- සම්මාවාචස්ස භික්ඛවෙ මිච්ඡාවාචා නිද්ධොතා හොති -පෙ- සම්මාකම්මන්තස්ස භික්ඛවෙ මිච්ඡාකම්මන්තො නිද්ධොතො හොති -පෙ- සම්මා ආජීවස්ස භික්ඛවෙ මිච්ඡාආජීවො නිද්ධොතො හොති -පෙ- සම්මා වායාමස්ස භික්ඛවෙ මිච්ඡාවායාමො නිද්ධොතො හොති-පෙ- සම්මාසතිස්ස භික්ඛවෙ මිච්ඡාසති නිද්ධොතා හොති -පෙ- සම්මාසමාධිස්ස භික්ඛවෙ මිච්ඡාසමාධි නිද්ධොතො හොති -පෙ- සම්මාඤාණස්ස භික්ඛවෙ මිච්ඡාඤාණං නිද්ධොතං හොති -පෙ-සම්මා විමුත්තිස්ස භික්ඛවෙ මිච්ඡාවිමුත්ති නිද්ධොතා හොති. යෙ ච මිච්ඡාවිමුත්ති පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිද්ධොතා හොන්ති. සම්මාවිමුත්තිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

මහණෙනි, මම ද යම් ධොවනයෙක් ඒකාන්ත නිර්වේදය පිණිස,- විරාගය පිණිස, නිරොධය පිණිස, ව්‍යුපශමය පිණිස අභිඥා පිණිස සම්බොධිය පිණිස, නිර්වාණය පිණිස වැටේ නම්, යම් ධොවනයකට පැමිණ ජාතිස්වභාව ඇති සත්හු ජාතියෙන් මිදෙත් නම් ජරාස්වභාව ඇති සත්හු ජරායෙන් මිදෙත් නම්, මරණස්වභාව ඇති සත්හු මරණයෙන් මිදෙත් නම් ශොක, පරිදෙව, දුඃඛ, දෞර්මනස්‍ය උපායාස සැහැවි කොට ඇති සත්හු ශොක, පරිදෙව, දුක් දොම්නස් දැඩි ආයාසයෙන් මිදෙත් නම්, එබඳු ආර්‍ය්‍ය ධොවනයක් දෙසන්නෙමි. එ අසව, මොනොවට මෙනෙහිකරව, කියනෙමි යි. 'එසේය වහන්සැ'යි එ මහණහු භාග්‍යවත්හට පිළිවදන් ඇස්වූහ. භගවත්හු මෙතල වදළහ:

මහණෙනි, යම් ධොවනයෙක් ඒකාන්ත නිර්වේදයට විරාගයට, නිරොධයට ව්‍යුපශමයට අභිඥාවට සම්බොධියට නිර්වාණයට වැටෙ නම්, යම් ධොවනයකට පැමිණ ජාතිධර්ම සත්ත්‍වයෝ ජාතියෙන් මිදෙත් නම් - ජරාධර්මසත්ත්‍වයෝ ජරායෙන් මිදෙත් නම්, මරණධර්මසත්ත්‍වයෝ මරණින් මිදෙත් නම් ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාස ධර්ම සත්ත්‍වයෝ සොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෙන් මිදෙත් නම් ඒ ආර්‍ය්‍යධොවනය කවර යත්:

මහණෙනි, සම්‍යක්දෘෂ්ටිකයා විසින් මිථ්‍යාදෘෂ්ටිය නිරවශෙෂයෙන් දෝනාලදු වෙයි. මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහු විසින් ඔහුදු නිරවසෙස්නෙත් දෝනාලදහ. සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්.

මහණෙනි, සම්‍යක්සංකල්ප ඇත්තහු විසින් මිථ්‍යාසංකල්පය නිර්ධෞත වෙයි. ... මහණෙනි, සම්‍යග්වාක් ඇතියහු විසින් මිථ්‍යා වචනය නිර්ධෞත වෙයි ... මහණෙනි, සම්‍යක්කර්මාන්ත ඇතියහු විසින් මිථ්‍යාකර්මාන්තය නිර්ධෞත වෙයි ... මහණෙනි, සම්‍යගාජීව ඇත්තහු විසින් මිථ්‍යා ආජීවය නිර්ධෞත වෙයි ... මහණෙනි, සම්‍යග් ව්‍යායාම ඇත්තහු විසින් මිථ්‍යාව්‍යායාම නිර්ධෞත වෙයි ... මහණෙනි, සම්‍යක්ස්මෘති ඇතියහු විසින් මිථ්‍යාස්මෘතිය නිර්ධෞත වෙයි ... මහණෙනි, සම්‍යක්සමාධි ඇත්තහු විසින් මිථ්‍යාසමාධිය නිර්ධෞත වෙයි ... මහණෙනි, සම්‍යග් ඥානය ඇතියහු විසින් මිථ්‍යා ඥානය නිර්ධෞත වෙයි ... මහණෙනි, සම්‍යග්විමුක්ති ඇත්තහු විසින් මිථ්‍යාවිමුක්තිය නිර්ධෞත වෙයි. මිථ්‍යාවිමුක්ති ප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලමු අකුසල් දහම්හු උපදනාහු නම් ඔහු විසින් ඔහුදු නිර්ධෞත වෙත්. සම්‍යග්විමුක්ති ප්‍රත්‍යයෙන් නොයෙක් කුසල් දහම්හු ද භාවනායෙන් පරිපූර්තියට යෙත්.

ඉදං ඛො තං භික්ඛවෙ අරියං ධොවනං, යං ධොවනං ඒකන්ත නිබ්බිදය විරාගාය, නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, යං ධොවනං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති, මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොක-පරිදෙව දුක්ඛදොමනස්සු පායාසෙහි පරිමුච්චන්ති ති.

## 10. 3. 1. 8
## තිකිච්ඡක සුත්තං

තිකිච්ඡකා භික්ඛවෙ විරෙචනං දෙන්ති පිත්තසමුට්ඨානානම්පි ආබාධානං පටිඝාතාය, සෙම්හසමුට්ඨානානම්පි ආබාධානං පටිඝාතාය, වාතසමුට්ඨානානම්පි ආබාධානං පටිඝාතාය, අත්ථෙතං භික්ඛවෙ විරෙචනං නෙතං නත්ථී ති වදාමි. තඤ්ච ඛො එතං භික්ඛවෙ විරෙචනං සම්පජ්ජතිපි, විපජ්ජතිපි

අහඤ්ච ඛො භික්ඛවෙ අරියං විරෙචනං දෙසිස්සාමි, යං විරෙචනං සම්පජ්ජතියෙව නො විපජ්ජති, යං විරෙචනං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොක පරිදෙව දුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්ති. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමඤ්ච තං භික්ඛවෙ අරියං විරෙචනං, යං විරෙචනං ආගම්ම ජාති ධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති, මරණ ධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති, සොකපරිදෙව දුක්ඛදොමනස්සු පායාසධම්මා සත්තා සොකපරිදෙව දුක්ඛදොමනස්සු පායාසෙහි පරිමුච්චන්ති:

සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ මිච්ඡාදිට්ඨි විරිත්තා හොති, යෙ ච මිච්ඡාදිට්ඨි පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස විරිත්තා හොන්ති. සම්මාදිට්ඨි පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

මහණෙනි, යම් ධොවනයෙක් එකාන්තනිර්වේදයට – විරාගයට නිරොධයට – ව්‍යුපශමයට – අභිඥාවට – සම්බොධියට නිර්වාණයට වැටේ නම්, යම් ධොවනයකට පැමිණ ජාතිස්වභාව ඇති සත්ත්වයෝ ජාතියෙන් මිදෙත් නම්, ජරාස්වභාව ඇති සත්ත්වයෝ ජරායෙන් මිදෙත් නම්, මරණස්වභාව ඇති සත්ත්වයෝ මරණයෙන් මිදෙත් නම් ශොක, පරිදෙව, දුක්, දොම්නස්, දැඩි ආයාස සැභැවි කොට ඇති සත්ත්වයෝ ශොක පරිදෙව දුක් දොම්නස් දැඩි ආයාසයන්ගෙන් මිදෙත් නම් එ යයි.

## 10. 3. 1. 8

## තිකිච්ඡක සූත්‍රය

මහණෙනි, චිකිත්සකයෝ පිතින් උපදනා ආබාධයන් නසනුවට ද සෙමෙන් උපදනා ආබාධයන් නසනුවට ද වාතයෙන් උපදනා ආබාධයන් නසනුවට ද විරෙචන දෙත්. මහණෙනි, තෙල විරෙචනය ඇත, 'තෙල නැතැ'යි නො කියමි. මහණෙනි, තෙල විරෙචනය සම්පද්‍යමාන හෝ විපද්‍යමාන හෝ වෙයි.

මහණෙනි, මම ද යම් විරෙචනයෙක් සම්පද්‍යමාන ම වේ නම් විපද්‍යමාන නො වේ නම්, යම් විරෙචනයකට පැමිණ ජාතිස්වභාව කොට ඇති සත්ත්වයෝ ජාතියෙන් මිදෙන්නාහු ද, ජරාස්වභාව කොට ඇති සත්ත්වයෝ ජරායෙන් මිදෙන්නාහු ද, මරණස්වභාව කොට ඇති සත්ත්වයෝ මරණින් මිදෙන්නාහු ද, ශොක පරිදෙව දුක් දොම්නස් දැඩි ආයාස ස්වභාව කොට ඇති සත්ත්වයෝ ශොක පරිදෙව දුක් දොම්නස් දැඩි ආයාසයෙන් මිදෙන්නාහු ද, එබඳු ආර්‍ය්‍ය විරෙචනයක් දෙසමි. එ අසව, මොනොවට මෙනෙහි කරව, කියනෙමැයි. 'එසේය වහන්සැ'යි එ මහණහු භගවත්හට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ දෙසූහ:

මහණෙනි, යම් විරෙචනයකට පැමිණ ජාතිධර්මසත්ත්වයෝ ජාතියෙන් මිදෙන්නාහු නම්, ජරාධර්මසත්ත්වයෝ ජරායෙන් මිදෙන්නාහු නම්, මරණධර්මසත්ත්වයෝ මරණින් මිදෙන්නාහු නම්, ශොකපරිදෙව දුඃඛ දෞර්මනස්‍යොපායාසධර්ම සත්ත්වයෝ ශොක පරිදෙව දුක් දොම්නස් දැඩි ආයාසයෙන් මිදෙන්නාහු නම් එ ආර්‍ය්‍ය විරෙචනය කවර:

මහණෙනි, සම්‍යග්දෘෂ්ටිකයා විසින් මිථ්‍යාදෘෂ්ටිය විරික්ත වෙයි. මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ වෙත් නම් ඔහු විසින් ඔහු ද විරික්ත වෙත්. සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙන් අනෙක කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත්:

සම්මාසඞ්කප්පස්ස භික්ඛවෙ මිච්ඡාසංකප්පො විරිත්තො හොති -පෙ- සම්මාවාචස්ස භික්ඛවෙ මිච්ඡාවාචා විරිත්තා හොති -පෙ- සම්මා-කම්මන්තස්ස භික්ඛවෙ මිච්ඡාකම්මන්තො විරිත්තො හොති -පෙ- සම්මාආජීවස්ස භික්ඛවෙ මිච්ඡාආජීවො විරිත්තො හොති-පෙ- සම්මා වායාමස්ස භික්ඛවෙ මිච්ඡාවායාමො විරිත්තො හොති -පෙ-සම්මා සතිස්ස භික්ඛවෙ මිච්ඡාසති විරිත්තා හොති -පෙ-සම්මාසමාධිස්ස භික්ඛවෙ මිච්ඡා සමාධි විරිත්තො හොති -පෙ- සම්මා ඤාණිස්ස භික්ඛවෙ මිච්ඡාඤාණං විරිත්තං හොති -පෙ- සම්මා විමුත්තිස්ස භික්ඛවෙ මිච්ඡාවිමුත්ති විරිත්තා හොති. යෙ ච මිච්ඡාවිමුත්ති පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස විරිත්තා හොන්ති. සම්මා විමුත්ති පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

ඉදං ඛො තං භික්ඛවෙ අරියං විරෙචනං, යං විරෙචනං සම්පජ්ජති-යෙව නො විපජ්ජති, යං විරෙචනං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති. ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති, මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්තී ති.

## 10. 3. 1. 9

## වමන සුත්තං

තිකිච්ඡකා භික්ඛවෙ වමනං දෙන්ති, පිත්තසමුට්ඨානානම්පි ආබාධානං පටිඝාතාය, සෙම්හසමුට්ඨානානම්පි ආබාධානං පටිඝාතාය, වාතසමුට්ඨානානම්පි ආබාධානං පටිඝාතාය. අත්ථෙතං භික්ඛවෙ වමනං, නෙතං නත්ථීති වදමි, තඤ්ච ඛො එතං භික්ඛවෙ වමනං සම්පජ්ජතිපි විපජ්ජතිපි.

අහඤ්ච ඛො භික්ඛවෙ අරියං වමනං දෙසිස්සාමි යං වමනං සම්පජ්ජති යෙව නො විපජ්ජති, යං වමනං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති. ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති, මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්ති. තං සුණාථ -පෙ- භගවා එතදවොච:

මහණෙනි, සම්‍යක්සංකල්ප ඇත්තහුට මිථ්‍යාසංකල්පය විරික්ත වෙයි. ... සම්‍යග්වචන ඇතියහු විසින් මිථ්‍යාවචනය විරික්ත වෙයි ... සම්‍යක්කර්මාන්තයාට මිථ්‍යාකර්මාන්තය විරික්ත වෙයි ... සම්‍යගාජීව ඇත්තහු විසින් මිථ්‍යාජීවය විරික්ත වෙයි ... සම්‍යග්ව්‍යායාම ඇත්තහු විසින් මිථ්‍යාව්‍යායාමය විරික්ත වෙයි ... සම්‍යක්ස්මෘති ඇත්තහු විසින් මිථ්‍යාස්මෘතිය විරික්ත වෙයි ... සම්‍යක්සමාධි ඇත්තහු විසින් මිථ්‍යා සමාධිය විරික්ත වෙයි ... සම්‍යග්ඥාන ඇතියහු විසින් මිථ්‍යාඥානය විරික්ත වෙයි ... සම්‍යග්විමුක්ති ඇතියහු විසින් මිථ්‍යාවිමුක්තිය විරික්ත වෙයි. මිථ්‍යාවිමුක්ති ප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහු විසින් ඔහුද විරික්ත වෙත්, සම්‍යග්විමුක්ති ප්‍රත්‍යයෙන් අනෙක කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්.

මහණෙනි, යම් විරෙචනයෙක් සම්පද්‍යමාන ම වේ නම් විපද්‍යමාන නො වේ නම් යම් විරෙචනයකට පැමිණ ජාතිධර්ම සත්ත්වයෝ ජාතියෙන් මිදෙන්නාහු නම්, ජරාධර්ම සත්ත්වයෝ ජරායෙන් මිදෙන්නාහු නම්, මරණධර්මසත්ත්වයෝ මරණින් මිදෙන්නාහු නම් ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍යෝපායාසධර්ම සත්ත්වයෝ සෝ වැලපීම් දුක් දෙම්නස් දැඩි වෙහෙසින් මිදෙන්නාහු නම්, මෙ එ ආර්‍ය්‍ය විරෙචනයයි.

## 10. 3. 1. 9

## වමන සූත්‍රය

මහණෙනි, චිකිත්සකයෝ පිතින් උපදනා ආබාධයන් නසනුවට ද සෙමින් උපදනා ආබාධයන් නසනුවට ද වාතයෙන් උපදනා ආබාධයන් නසනුවට ද වමන බෙහෙත් දෙත්. මහණෙනි, තෙල වමන ඇත. තෙල නැතැයි නො කියමි. මහණෙනි, තෙල වමන බෙහෙත් සම්පද්‍යමාන ද වෙයි, විපද්‍යමාන ද වෙයි.

මහණෙනි, යම් වමනයෙක් සම්පද්‍යමාන ම වේ නම් විපද්‍යමාන නොවේ නම් යම් වමන බෙහෙතකට පැමිණ ජාතිධර්ම සත්හු ජාතියෙන් මිදෙත් නම්, ජරාධර්ම සත්හු ජරායෙන් මිදෙත් නම්, මරණධර්ම සත්හු මරණින් මිදෙත් නම්, ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාසධර්ම සත්හු සෝ වැලපීම් දුක් දෙම්නස් දැඩි උපායාසයෙන් මිදෙත් නම්, එබඳු ආර්‍ය්‍යවමනයක් දෙසන්නෙමි. එ අසව, -පෙ- භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක:

කතමඤ්ච තං භික්ඛවෙ අරියං වමනං: යං වමනං සම්පජ්ජතියෙව නො විපජ්ජති, යං වමනං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්ති:

සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ මිච්ඡාදිට්ඨි වන්තා හොති යෙ ච මිච්ඡාදිට්ඨි-පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති තෙ චස්ස වන්තා හොන්ති. සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

සම්මාසඞ්කප්පස්ස භික්ඛවෙ මිච්ඡාසඞ්කප්පො වන්තො හොති-පෙ-සම්මා වාචස්ස, භික්ඛවෙ මිච්ඡාවාචා වන්තා හොති-පෙ-සම්මාකම්මන්තස්ස භික්ඛවෙ මිච්ඡාකම්මන්තො වන්තො හොති -පෙ- සම්මා ආජීවස්ස භික්ඛවෙ මිච්ඡා ආජීවො වන්තො හොති -පෙ- සම්මාවායාමස්ස භික්ඛවෙ මිච්ඡාවායාමො වන්තො හොති-පෙ-සම්මාසතිස්ස භික්ඛවෙ මිච්ඡාසති වන්තා හොති-පෙ-සම්මා සමාධිස්ස භික්ඛවෙ මිච්ඡාසමාධි වන්තො හොති-පෙ-සම්මාඤාණිස්ස භික්ඛවෙ මිච්ඡාඤාණං වන්තං හොති-පෙ- සම්මා විමුත්තිස්ස භික්ඛවෙ මිච්ඡා විමුත්ති වන්තා හොති. යෙ ච මිච්ඡාවිමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස වන්තා හොන්ති. සම්මා විමුත්තිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. ඉදං ඛො තං භික්ඛවෙ අරියං වමනං, යං වමනං සම්පජ්ජතියෙව නො විපජ්ජති, යං වමනං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති-පෙ-සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්තී ති.

## 10. 3. 1. 10

## නිද්ධමනිය සුත්තං

දස ඉමෙ භික්ඛවෙ නිද්ධමනියා ධම්මා. කතමෙ දස:

සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ මිච්ඡාදිට්ඨි නිද්ධන්තා හොති. යෙ ච මිච්ඡා දිට්ඨි පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිද්ධන්තා හොන්ති, සම්මාදිට්ඨි පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

මහණෙනි, යම් ආර්‍ය්‍යවමනයෙක් සම්පද්‍යමාන ම වේ නම් විපද්‍යමාන නො වේ නම්, යම් වමනයකට පැමිණ ජාතිධර්මසත්ත්වයෝ ජාතියෙන් මිදෙත් නම්, ... ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෙන් මිදෙත් නම්, ඒ ආර්‍ය්‍ය වමනය කවර:

මහණෙනි, සම්‍යග්දෘෂ්ටිකයා විසින් මිථ්‍යාදෘෂ්ටිය වාන්ත වෙයි. මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහු විසින් ඔහුදු වාන්තයහ. සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙන් අනෙක කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්.

මහණෙනි, සම්‍යක්සංකල්ප ඇතියහු විසින් මිථ්‍යාසංකල්පය වාන්ත වෙයි ... සම්‍යග්වචන ඇතියහු විසින් මිථ්‍යාවාක් වාන්ත වෙයි ... සම්‍යක්කර්මාන්ත ඇතියහු විසින් මිථ්‍යාකර්මාන්තය වාන්ත ය ... මහණෙනි, සම්‍යගාජීවය ඇතියහු විසින් මිථ්‍යා ආජීවය වාන්ත වෙයි ... මහණෙනි, සම්‍යග් ව්‍යායාම ඇතියහු විසින් මිථ්‍යාව්‍යායාමය වාන්ත වෙයි ... මහණෙනි, සම්‍යක්ස්මෘති ඇතියහු විසින් මිථ්‍යාස්මෘතිය වාන්ත වෙයි ... මහණෙනි, සම්‍යක්සමාධිය ඇතියහු විසින් මිථ්‍යාසමාධිය වාන්ත වෙයි ... මහණෙනි, සම්‍යග්ඥාන ඇතියහු විසින් මිථ්‍යාඥානය වාන්ත වෙයි ... මහණෙනි, සම්‍යග්විමුක්ති ඇතියහු විසින් මිථ්‍යා විමුක්තිය වාන්ත වෙයි. මිථ්‍යාවිමුක්ති ප්‍රත්‍යයෙන් යම්බඳු අනෙක ලාමක අකුශලධර්මයෝ ද උපදනාහු නම් ඔහු විසින් ඔහුදු වාන්ත වෙත්. සම්‍යග්විමුක්ති ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්. මහණෙනි, යම් වමන සම්පද්‍යමාන ම වේ නම්, විපද්‍යමාන නොවේ නම්, යම් වමනකට පැමිණ ජාතිධර්ම සත්ත්වයෝ ජාතියෙන් මිදෙත් නම් ... ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්‍යොපායාසධර්ම සත්ත්වයෝ සෝ වැලපුම් දුක් දොම්නස් දැඩි වෙහෙසින් මිදෙත් නම් මේ ඒ ආර්‍ය්‍යවමනය යි.

## 10. 3. 1. 10
## නිද්ධමනිය සූත්‍රය

මහණෙනි, මේ නිර්ධමනිය ධර්ම දස දෙනෙකි. කවර දස දෙනෙක යත්:

මහණෙනි, සම්‍යග්දෘෂ්ටිකයා විසින් මිථ්‍යාදෘෂ්ටිය පහ කෙළේ වෙයි. මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහු විසින් උහුදු පහ කරන ලදහ. සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත්.

සම්මාසඞ්කප්පස්ස භික්ඛවෙ මිච්ඡාසඞ්කප්පො නිජ්ජිණ්ණො හොති -පෙ- සම්මාවාචස්ස භික්ඛවෙ මිච්ඡාවාචා නිජ්ජිණ්ණා හොති -පෙ- සම්මා කම්මන්තස්ස භික්ඛවෙ මිච්ඡාකම්මන්තො නිජ්ජිණ්ණො හොති -පෙ- සම්මාආජීවස්ස භික්ඛවෙ මිච්ඡාආජීවො නිජ්ජිණ්ණො හොති -පෙ-සම්මා වායාමස්ස භික්ඛවෙ මිච්ඡා වායාමො නිජ්ජිණ්ණො හොති-පෙ-සම්මාසතිස්ස භික්ඛවෙ මිච්ඡාසති නිජ්ජිණ්ණා හොති-පෙ-සම්මා සමාධිස්ස භික්ඛවෙ මිච්ඡා සමාධි නිජ්ජිණ්ණො හොති-පෙ-සම්මා ඤාණිස්ස භික්ඛවෙ මිච්ඡාඤාණං නිජ්ජිණ්ණං හොති -පෙ- සම්මා විමුත්තිස්ස භික්ඛවෙ මිච්ඡා විමුත්ති නිජ්ජිණ්ණා හොති, යෙ ච මිච්ඡාවිමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මා විමුත්ති පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. ඉමෙ ඛො භික්ඛවෙ දස නිජ්ජරවත්ථූනී ති.

## 10. 3. 1. 11

### අසෙඛ සුත්තං

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච.

අසෙඛො අසෙඛො ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛු අසෙඛො හොතී ති?

ඉධ භික්ඛු, භික්ඛු අසෙඛාය සම්මාදිට්ඨියා සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාසඞ්කප්පෙන සමන්නාගතො හොති, අසෙඛාය සම්මා වාචාය සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාකම්මන්තෙන සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාආජීවෙන සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාවායාමෙන සමන්නාගතො හොති, අසෙඛාය සම්මාසතියා සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාසමාධිනා සමන්නාගතො හොති, අසෙඛෙන සම්මාඤාණෙන සමන්නාගතො හොති, අසෙඛාය සම්මා විමුත්තියා සමන්නාගතො හොති. එවං ඛො භික්ඛු, භික්ඛු අසෙඛො හොතී ති.

මහණෙනි, සම්‍යක්සංකල්ප ඇතියහු විසින් මිථ්‍යාසංකල්පය පහ කෙළේ වෙයි ... මහණෙනි, සම්‍යග්වාක් ඇතියහු විසින් මිථ්‍යාවාක් පහ කෙළේ වෙයි ... මහණෙනි, සම්‍යක්කර්මාන්ත ඇතියහු විසින් මිථ්‍යාකර්මාන්ත පහ කෙළේ වෙයි ... මහණෙනි, සම්‍යගාජීව ඇතියහු විසින් මිථ්‍යාජීවය පහ කෙළේ වෙයි ... මහණෙනි, සම්‍යග්ව්‍යායාම ඇතියහු විසින් මිථ්‍යාව්‍යායාමය පහ කෙළේ වෙයි ... මහණෙනි, සම්‍යක්ස්මෘති ඇතියහු විසින් මිථ්‍යාස්මෘතිය පහ කෙළේ වෙයි ... මහණෙනි, සම්‍යක්සමාධිය ඇතියහු විසින් මිථ්‍යාසමාධිය පහ කෙළේ වෙයි ... මහණෙනි, සම්‍යග්ඥානය ඇතියහු විසින් මිථ්‍යාඥානය පහ කෙළේ වෙයි ... මහණෙනි, සම්‍යග් විමුක්ති ඇතියහු විසින් මිථ්‍යා විමුක්තිය පහ කෙළේ වෙයි. මිථ්‍යාවිමුක්ති ප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම්, උහුදු ඔහු විසින් පහ කරන ලදහු වෙත්. සම්‍යග්විමුක්ති ප්‍රත්‍යයෙන් කුශලධර්මයෝ ද භාවනායෙන් පරිපූර්තියට යෙත්. මහණෙනි, මොහු දසදෙන නිද්ධමනිය ධර්ම වෙත්.

## 10. 3. 1. 11

## අසෙඛ සූත්‍රය

එකල්හි අන්‍යතර මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් එ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණු කීය:

වහන්ස, අසෙඛයා, අසෙඛයා යි කියනු ලැබේ. වහන්ස, මහණ කෙතෙක් කරුණින් අසෙඛ වේ දැ යි?

මහණ, මෙ සස්නෙහි මහණ අශෛක්ෂ්‍ය සම්‍යග්දෘෂ්ටියෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සම්‍යක්සංකල්පයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සම්‍යග් වචනයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සම්‍යක්කර්මාන්තයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සම්‍යගාජීවයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සම්‍යග්ව්‍යායාමයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සම්‍යක්ස්මෘතියෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සම්‍යග්ඥානයෙන් සමන්වාගත වෙයි. අශෛක්ෂ්‍ය සම්‍යග් විමුක්තියෙන් සමන්වාගත වෙයි. මහණෙනි, මහණ මෙසේ අසෙඛ වේ යයි.

## 10. 3. 1. 12

## අසෙඛියධම්ම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ අසෙඛියා ධම්මා. කතමෙ දස:

අසෙඛා සම්මාදිට්ඨි, අසෙඛො සම්මාසඞ්කප්පො, අසෙඛා සම්මාවාචා, අසෙඛො සම්මාකම්මන්තො, අසෙඛො සම්මාආජීවො, අසෙඛො සම්මාවායාමො, අසෙඛො සම්මාසති, අසෙඛො සම්මාසමාධි, අසෙඛා සම්මාඤාණං, අසෙඛා සම්මාවිමුත්ති. ඉමෙ ඛො භික්ඛවෙ දස අසෙඛියා ධම්මාති.

**සමණසඤ්ඤාවග්ගො පඨමො.**

තස්සුද්දානං:

සඤ්ඤා බොජ්ඣඞ්ගා මිච්ඡත්තං
බීජං විජ්ජාය නිජ්ජරා,
ධොවනඤ්ච තිකිච්ඡා ච
නිද්ධමනං ද්වෙ අසෙඛාති.

## 10. 3. 1. 12
## අසෙඛියධම්ම සූත්‍රය

මහණෙනි, මෙ අසෙඛියධර්ම දස දෙනෙකි. කවර දස දෙනෙක යත්:

අසෙඛ සම්මාදිට්ඨි ය, අසෙඛ සම්මාසඞ්කප්ප ය, අසෙඛ සම්මාවාචා ය, අසෙඛ සම්මාකම්මන්ත ය, අසෙඛ සම්මාආජීව ය, අසෙඛ සම්මාවායාම ය, අසෙඛසම්මාසති ය, අසෙඛසම්මාසමාධි ය, අසෙඛ සම්මාඤාණ ය, අසෙඛ සම්මාවිමුත්ති යයි.

මහණෙනි, මොහු දස අසෙඛිය ධර්මයෝ යි.

**පළමුවැනි සමණසඤ්ඤා වර්ග යි.**

**එහි උද්දානය:**

සඤ්ඤා ය, බොජ්ඣඞ්ග ය, මිච්ඡත්ත ය, බීජය, විජ්ජා ය, නිජ්ජරා ය, ධොවන ය, තිකිච්ඡා දෙක ය, නිද්ධමන ය, අසෙඛසූත්‍ර දෙකදැයි දෙළොසෙකි.

තතියො පණ්ණාසකො

# 2. පච්චාරොහණිවග්ගො

## 10. 3. 2. 1

### පඨම අධම්ම සුත්තං

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො අනත්ථො ච, ධම්මො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා අනත්ථඤ්ච ධම්මඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බං.

කතමො ච භික්ඛවෙ අධම්මො ච අනත්ථො ච: මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධි මිච්ඡාඤාණං මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අධම්මො ච අනත්ථො ච.

කතමො ච භික්ඛවෙ ධම්මො ච අත්ථො ච: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සම්මාඤාණං සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ ධම්මො ච අත්ථො ච.

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො අනත්ථො ච, ධම්මො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මඤ්ච විදිත්වා අනත්ථඤ්ච, ධම්මඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

## 10. 3. 2. 2

### දුතිය අධම්ම සුත්තං

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බං:

කතමො ච භික්ඛවෙ අධම්මො, කතමො ච ධම්මො, කතමො ච අනත්ථො කතමො ච අත්ථො.

1. මිච්ඡාදිට්ඨි භික්ඛවෙ අධම්මො, සම්මාදිට්ඨි ධම්මො. යෙ ච මිච්ඡාදිට්ඨි පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති අයං අනත්ථො. සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති අයං අත්ථො.

තෙවැනි පණ්ණාසකය

# 2. පච්චොරොහණී වර්ගය

## 10. 3. 2. 1

## පඨම අධම්ම සූත්‍රය

මහණෙනි, අධර්ම හා අනර්ථ හා දතයුතු, ධර්ම හා අර්ථ හා දතයුතු. අධර්ම හා අනර්ථ හා දැන ධර්ම හා අර්ථ හා දැන ධර්ම යම් පරිදි වේ නම් අර්ථ යම් පරිදි වේ නම් ඵ පරිදි පිළිපැදිය යුතු.

මහණෙනි, අධර්මය හා අනර්ථය හා කවර: මිච්ඡාදිට්ඨි ය, මිච්ඡාසඞ්කප්ප ය, මිච්ඡාවාචා ය, මිච්ඡාකම්මන්ත ය, මිච්ඡාආජීව ය, මිච්ඡාවායාම ය, මිච්ඡාසති ය, මිච්ඡාසමාධි ය, මිච්ඡාඤාණ ය, මිච්ඡාවිමුත්ති ය යි. මහණෙනි, මෙ අධර්මය හා අනර්ථය හා යි කියනු ලැබේ.

මහණෙනි, ධර්ම හා අර්ථ හා කවරේය යත්: සම්මාදිට්ඨි ය, සම්මාසඞ්කප්ප ය, සම්මාවාචා ය, සම්මාකම්මන්ත ය, සම්මාආජීව ය, සම්මාවායාම ය, සම්මාසති ය, සම්මා සමාධිය, සම්මාඤාණ ය, සම්මාවිමුත්ති ය යි. මහණෙනි, මෙ ධර්ම හා අර්ථ යයි කියනු ලැබේ.

මහණෙනි, අධර්මය හා අනර්ථය හා දතයුතු ය, ධර්මය හා අර්ථය හා දතයුතුය. අධර්ම හා අනර්ථ හා දැන ධර්ම හා අර්ථ හා දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එපරිදි පිළිපැදිය යුතු යයි මෙසේ යමක් කියනලද නම්, තෙල මෙ පිණිස කියනලදැ යි.

## 10. 3. 2. 2

## දුතිය අධම්ම සූත්‍රය

මහණෙනි, අධර්ම හා ධර්ම හා දතයුතු: අනර්ථ හා අර්ථ හා දතයුතු. අධර්ම හා ධර්ම හා දැන අනර්ථ හා අර්ථ හා දැන ධර්මය යම් පරිදි වේ නම්, අර්ථය යම් පරිදි වේ නම් එසේ පිළිපැදිය යුතුයි.

මහණෙනි, අධර්මය කවරේය, ධර්මය කවරේය, අනර්ථය කවරේය, අර්ථය කවරේය යත්:

1. මහණෙනි, මිච්ඡාදිට්ඨිය අධර්ම යි, සම්මාදිට්ඨිය ධර්ම යි. මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම්, මේ අනර්ථ වෙයි. සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මේ අර්ථ වෙයි.

2. මිච්ඡාසඞ්කප්පො භික්ඛවෙ අධම්මො, සම්මාසඞ්කප්පො ධම්මො. යෙ ච මිච්ඡාසඞ්කප්පපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මාසඞ්කප්පපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

3. මිච්ඡාවාචා භික්ඛවෙ අධම්මො, සම්මාවාචා ධම්මො. යෙ ච මිච්ඡාවාචා පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මාවාචාපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

4. මිච්ඡාකම්මන්තො භික්ඛවෙ අධම්මො, සම්මාකම්මන්තො ධම්මො. යෙ ච මිච්ඡාකම්මන්තපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මාකම්මන්තපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

5. මිච්ඡාආජීවො භික්ඛවෙ අධම්මො, සම්මාආජීවො ධම්මො. යෙ ච මිච්ඡාආජීවපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මාආජීවපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

6. මිච්ඡාවායාමො භික්ඛවෙ අධම්මො, සම්මාවායාමො ධම්මො. යෙ ච මිච්ඡාවායාමපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති. අයං අනත්ථො. සම්මාවායාමපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

7. මිච්ඡාසති භික්ඛවෙ අධම්මො, සම්මාසති ධම්මො. යෙ ච මිච්ඡාසති පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, සම්මාසතිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

8. මිච්ඡාසමාධි භික්ඛවෙ අධම්මො, සම්මාසමාධි ධම්මො. යෙ ච මිච්ඡා සමාධිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මාසමාධිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. අයං අත්ථො.

9. මිච්ඡාඤාණං භික්ඛවෙ අධම්මො, සම්මාඤාණං ධම්මො. යෙ ච මිච්ඡා ඤාණපච්චයා ච අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මාඤාණපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො,

2. මහණෙනි, මිථ්‍යාසංකල්පය අධර්ම යි, සම්‍යක්සංකල්පය ධර්ම යි. මිථ්‍යාසංකල්පප්‍රත්‍යයෙන් යම් ම නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් මේ අනර්ථ යි. සම්‍යක්සංකල්ප ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත්. මෙ අර්ථ යි.

3. මහණෙනි, මිථ්‍යාවාක් අධර්ම යි, සම්‍යග්වාක් ධර්ම යි. මිථ්‍යාවාක් ප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් මේ අනර්ථ යි. සම්‍යග්වාක්ප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මෙ අර්ථ යි.

4. මහණෙනි, මිථ්‍යාකර්මාන්තය අධර්ම යි, සම්‍යක්කර්මාන්තය ධර්ම යි. මිථ්‍යාකර්මාන්තප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශල-ධර්මයෝ උපදනාහු නම් මෙ අනර්ථ යි. සම්‍යක්කර්මාන්තප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මෙ අර්ථ යි.

5. මහණෙනි, මිථ්‍යාආජීවය අධර්ම යි, සම්‍යගාජීවය ධර්ම යි. මිථ්‍යාජීව ප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් මෙ අනර්ථ යි. සම්‍යගාජීවප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මෙ අර්ථ යි.

6. මහණෙනි, මිථ්‍යාව්‍යායාමය අධර්ම යි, සම්‍යග්ව්‍යායාමය ධර්ම යි. මිථ්‍යාව්‍යායාමප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් මෙ අනර්ථ යි. සම්‍යග්ව්‍යායාමප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මෙ අර්ථ යි.

7. මහණෙනි, මිථ්‍යාස්මෘතිය අධර්ම යි, සම්‍යක්ස්මෘතිය ධර්ම යි. මිථ්‍යාස්මෘතිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම්, මෙ අනර්ථ යි. සම්‍යක්ස්මෘතිප්‍රත්‍යයෙන් නොයෙක් කුශල-ධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මෙ අර්ථ යි.

8. මහණෙනි, මිථ්‍යාසමාධිය අධර්ම යි, සම්‍යක්සමාධිය ධර්ම යි. මිථ්‍යාසමාධිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම්, මෙ අනර්ථ යි. සම්‍යක්සමාධිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මේ අර්ථ යි.

9. මහණෙනි, මිථ්‍යාඥනය අධර්ම යි, සම්‍යග්ඥානය ධර්ම යි. මිථ්‍යාඥන ප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් මෙ අනර්ථ වෙයි. සම්‍යග්ඥනප්‍රත්‍යයෙන් නොයෙක් කුසල්දහම්හු භාවනාමයෙන් පිරිපුන්බවට යෙත් නම් මෙ අර්ථ යි.

10. මිච්ඡාවිමුත්ති භික්ඛවෙ අධම්මො, සම්මාවිමුත්ති ධම්මො. යෙ ච මිච්ඡාවිමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මාවිමුත්ති පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති. ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

## 10. 3. 2. 3
## තතිය අධම්ම සුත්තං

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො, ධම්මො ච. අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො තෙසං භික්ඛූනං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: ''ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො ''අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බ''න්ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.

අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: ''අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං.

10. මහණෙනි, මිථ්‍යාවිමුක්තිය අධර්ම යි, සම්‍යග්විමුක්තිය ධර්ම යි. මිථ්‍යාවිමුක්තිප්‍රත්‍යයෙන් යම්බඳු ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම්, මෙ අනර්‍ථ යි. සම්‍යග්විමුක්තිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මෙ අර්‍ථ යි.

මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුත්තේ ය, අනර්‍ථය ද අර්‍ථය ද දතයුත්තේ ය, අධර්මය ද දැන, ධර්මය ද දැන අනර්‍ථය දැන අර්‍ථය ද දැන දහම් යම් පරිදි නම් අර්‍ථය යම් පරිදි නම් එසේ පිළිපැදිය යුතු යයි මෙසේ යමක් කියන ලද නම් තෙල කරුණු මෙ නිසා කියනලදැ යි.

## 10. 3. 2. 3

## තතිය අධම්ම සූත්‍රය

මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුතු, අනර්‍ථය ද අර්ථය ද දතයුතු, අධර්මය ද ධර්මය ද දැන අනර්ථය ද අර්ථය ද දැන ධර්මය යම් පරිදි නම්, අර්ථය යම් පරිදි නම්, එ පරිද්දෙන් පිළිපැදිය යුතු යයි භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ. සුගතයන් වහන්සේ මෙය වදරා හුනස්නෙන් නැඟී විහාරයට වැඩී සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ බැහැර වැඩී නො බෝ කල් වත් ම එ මහණුන්ට තෙල සිත විය: ඇවැත්නි, අපහට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුතු, අනර්ථය ද අර්ථය ද දතයුතු, අධර්මය ද ධර්මය ද දැන, අනර්ථය ද අර්ථය ද දැන, ධර්මය යම් පරිදි වේ නම්, අර්ථය යම් පරිදි වේ නම්, එසෙයින් පිළිපැදිය යුතු යි" යන මෙ උද්දෙශය සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙද හුනස්නෙන් නැඟී විහාරයට වැඩියහ. කවරෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දෙශයාගේ අර්ථය විභාග කරන්නේ දැ"යි.

එකල්හි එ මහණුන්හට තෙල සිත විය: "මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ශාස්තෲන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ. විඥ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ අර්ථය විතර විසින් බෙද දක්වන්නට ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පොහොසත් ද වන්නාහ.

යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍යාම. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පුච්ඡෙය්‍යාම, යථා නො ආයස්මා ආනන්දො ව්‍යාකරිස්සති, තථා නං ධාරෙස්සාමා'' ති.

අථ ඛො තෙ භික්ඛූ යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං ආනන්දං එතදවොචුං:

''ඉදං ඛො නො ආවුසො ආනන්ද භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, 'අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො, තථා පටිපජ්ජිතබ්බන්ති'. තෙසං නො ආවුසො අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි; 'ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති. තෙසං නො ආවුසො අම්හාකං එතදහොසි: ''අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පුච්ඡෙය්‍යාම, යථා නො ආයස්මා ආනන්දො ව්‍යාකරිස්සති තථා නං ධාරෙය්‍යාමා''ති. විභජතු ආයස්මා ආනන්දොති.

''ඉදින් අපි ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා එළඹමෝ නම්, එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් තෙල අරුත් පුළුවුස්නමෝ නම්, ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ යම් පරිද්දෙකින් අපට ව්‍යාකරණ කරත් ද එ පරිද්දෙන් එය දරන්නමෝ නම් යෙහෙකැ'යි.

ඉක්බිති එ භික්ෂුහු ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් සමග සතුටු වූහ. සතුටු විය යුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් එ මහණහු ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තෙල කීහ:

ඇවැත් ආනන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේ අපට 'මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුතු, අනර්ථය ද අර්ථය ද දතයුතු, අධර්මය ද ධර්මය ද දැන අනර්ථය අර්ථය ද දැන, ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එසේ පිළිපැදිය යුතුය''යි යන මෙ උද්දෙශය සැකෙවින් උදෙසා විතර විසින් අර්ථය නො බෙද හුනස්නෙන් නැඟ විහාරයට වන්හ. ඇවැත්නි, එ අපට භාග්‍යවතුන් වහන්සේ බැහැර වැඩි නොබෝ කල්වත් ම තෙල සිත විය: 'ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුතු ය, අනර්ථය ද අර්ථය ද දතයුතු ය. අධර්මය ද ධර්මය ද දැන, අනර්ථය ද අර්ථය ද දැන, ධර්මය යම් පරිදි වේ නම්, අර්ථය යම් පරිදි වේ නම්, එ පරිදි පිළිපැදිය යුතු ය' යන මෙ උද්දෙශය සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙද හුනස්නෙන් නැඟ විහාරයට වන්හ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසනලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දෙශයාගේ අර්ථය කවරෙක් විතර විසින් අර්ථය බෙද දක්වන්නේ ද'යි. ඇවැත්නි, එ අපට තෙල සිත විය: ''මෙ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ වනාහි ශාස්තෲන් වහන්සේ විසින් ද සංවර්ණිතයහ. විඥ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත් නො බෙදූ මේ උද්දෙශයාගේ අර්ථය විස්තර විසින් අරුත් බෙදනට පොහොසත් ද වෙත්. අපි ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා එළඹමෝ නම්, එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් තෙල කරුණ පුළුවුස්නමෝ නම්, ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ යම් පරිදි ව්‍යාකරණ කරන්නාහු ද එ පරිදි දරන්නමෝ නම් යෙහෙකැ'යි. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බෙද දක්වත්වා යි.

සෙය්‍යථාපි ආවුසො පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව මූලං අතික්කම්ම ඛන්ධං සාඛාපලාසෙ සාරං පරියෙසිතබ්බං මඤ්ඤෙය්‍ය, එවං සම්පදමිදං ආයස්මන්තානං සත්ථරි සම්මුඛීභූතෙ තං භගවන්තං අතියිත්වා[1] අම්හෙ එතමත්ථං පටිපුච්ඡිතබ්බං මඤ්ඤථ. සොහාවුසො භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි, යං තුම්හෙ භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාථ, යථා වො භගවා ව්‍යාකරෙය්‍ය තථා නං ධාරෙය්‍යාථා ති.

අද්ධාවුසො ආනන්ද භගවා ජානං ජානාති, පස්සං පස්සති. චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි යං මයං භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාම, යථා නො භගවා ව්‍යාකරෙය්‍ය තථා නං ධාරෙය්‍යාම. අපි ච ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. විභජතායස්මා ආනන්දො අගරු කරිත්වාති.

තෙන හාවුසො සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමී ති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං. ආයස්මා ආනන්දො එතදවොච:

යං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො "අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බ''න්ති.

1. අතිසිත්වා – මජසං.

ඇවැත්නි, හර කැමැති පුරුෂයෙක් හර සොයනුයේ සාරපයෙර්ෂණ කරනුයේ සිටුනා හර ඇති මහරුක්හුගේ මුල ඉක්ම කඳ ඉක්ම අතු කොළෙහි හර සෙවිය යුතු කොට හඟනේ යම් සේ නම්, මෙ එබඳු උපමා සම්පත් ඇත්තෙකි. ආයුෂ්මත්හට ශාස්තෘන් සම්මුඛ වත් ම එ භාග්‍යවත්හු ඉක්ම තෙල කරුණ අප පිළිවිසිය යුතු කොට හඟනාහු ය. ඇවැත්නි, දන්නා වූ එ භාග්‍යවතුන් වහන්සේ දනිත් ම ය, දක්නාහු දක්නාහු ම ය. තථාගතයන් වහන්සේචක්ෂුර්භූතයහ, ඥානස්වභාව ඇතියහ, ධර්මස්වභාව ඇතියහ, ශ්‍රෙෂ්ඨ ස්වභාව ඇතියහ, වක්තෘහ, ප්‍රවර්තිතයෙහි සමර්ථයහ, අර්ථයාගේ නිර්නෙතෘහ, අමෘතයාගේ දතෘහ, ධර්මස්වාමීහ. තෙල කරුණ සඳහා එම කල් විය. එහෙයින් තෙපි එ භාග්‍යවතුන් වහන්සේ කරා ම එළඹ තෙල කරුණ පුළුවුස්ව. භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දෙකින් තොපට ව්‍යාකරණ කෙරෙත්නම් එ පරිද්දෙන් එය දරව යි.

ඇවැත් ආනන්‍දයෙනි, එකැතින් දන්නාහු ම භාග්‍යවත්හු දනිති, දක්නාහු දකිත්, චක්ෂුර්භූතයහ, ඥානභූතයහ, ධර්මභූතයහ, බ්‍රහ්මභූතයහ, වක්තෘහ, ප්‍රවර්තෘහ, අර්ථයාගේ නිර්නෙතෘහ, අමෘතයාගේ දාතෘහ, තථාගතයෝ ධර්මස්වාමීහ. යම් හෙයෙකින් අපි භාග්‍යවතුන් වහන්සේ කරා ම එළැඹ පුළුවුස්නමෝ නම්, යම් පරිද්දෙකින් අපට භාග්‍යවතුන් වහන්සේ ව්‍යාකරණ කරන සේක් නම් එසෙයින් දරනමෝ නම්, තෙල කරුණ සඳහා එ ම කල් විය. වැලිත් ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ, විඥ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දෙශයාගේ අර්ථය විතර විසින් විභජනයට සමත්හ. ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ නො බර කොට විභජනය කරත්ව යි.

ඇවැත්නි, එ කරුණෙන් අසව, මොනොවට මෙනෙහි කරව. දෙසන්නෙමැ යි. 'ඇවැත්නි එසේ' යයි එ මහණහු ආයුෂ්මත් ආනන්‍ද තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ තෙල කරුණ වදළහ:

ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුතු ය, අනර්ථය ද අර්ථය ද දතයුතු ය. අධර්මය ද ධර්මය ද දැන අනර්ථය ද අර්ථය ද දැන ධර්මය යම් පරිදි වේ නම් එ පරිදි පිළිපැදිය යුතුය''යි යම් ම උද්දෙශයක් උදෙසා විස්තර විසින් අවිභජනය නො කොට හුනස්නෙන් නැඟ විහාරයට වන්හු නම්:

කතමො චාවුසො අධම්මො, කතමො ච ධම්මො, කතමො ච අනත්‍ථො, කතමො ච අත්‍ථො:

"මිච්ඡාදිට්ඨි ආවුසො අධම්මො සම්මාදිට්ඨි ධම්මො. යෙ ච මිච්ඡාදිට්ඨිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්‍ථො. සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්‍ථො.

මිච්ඡාසඞ්කප්පො ආවුසො අධම්මො, සම්මාසඞ්කප්පො ධම්මො -පෙ- මිච්ඡාවාචා ආවුසො අධම්මො, සම්මාවාචා ධම්මො -පෙ- මිච්ඡාකම්මන්තො ආවුසො අධම්මො, සම්මාකම්මන්තො ධම්මො -පෙ- මිච්ඡාආජීවො ආවුසො අධම්මො, සම්මා ආජීවො ධම්මො -පෙ- මිච්ඡාවායාමො ආවුසො අධම්මො, සම්මාවායාමො ධම්මො -පෙ- මිච්ඡාසති ආවුසො අධම්මො, සම්මා සති ධම්මො -පෙ- මිච්ඡාසමාධි ආවුසො අධම්මො, සම්මා සමාධි ධම්මො -පෙ- මිච්ඡාඤාණං ආවුසො අධම්මො, සම්මා ඤාණං ධම්මො -පෙ- මිච්ඡාවිමුත්ති ආවුසො අධම්මො, සම්මාවිමුත්තිධම්මො, යෙ ච මිච්ඡා විමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්‍ථො. සම්මාවිමුත්තිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්‍ථො.

යං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්‍ථාරෙන අත්‍ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො". අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්‍ථො ච වෙදිතබ්බො අත්‍ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච අනත්‍ථඤ්ච විදිත්වා අත්‍ථඤ්ච යථා ධම්මො යථා අත්‍ථො තථා පටිපජ්ජිතබ්බ"න්ති ඉමස්ස ඛො අහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්‍ථාරෙන අත්‍ථං අවිභත්තස්ස එවං විත්‍ථාරෙන අත්‍ථං ආජානාමි. ආකඞ්ඛමානා ච පන තුම්හෙ ආවුසො භගවන්තංයෙව උපසංකමිත්වා එතමත්‍ථං පුච්ඡෙය්‍යාථ. යථා වො භගවා ව්‍යාකරොති. තථා නං ධාරෙය්‍යාථාති.

'එවමාවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසංකමිංසු. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

ඇවැත්නි, අධර්ම කවරේ ය, ධර්මය ද කවරේ ය, අනර්ථය ද කවරේ ය, අර්ථය කවරේ ය යත්:

ඇවැත්නි, මිථ්‍යාදෘෂ්ටිය අධර්ම වෙයි, සම්‍යග්දෘෂ්ටිය ධර්මය වෙයි. මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම්, මෙ අනර්ථ යි, සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම්, මෙ අර්ථ වේ.

ඇවැත්නි, මිථ්‍යාසංකල්පය අධර්ම යි. සම්‍යක්සංකල්පය ධර්ම යි ... ඇවැත්නි, මිථ්‍යාවාක් අධර්ම යි, සම්‍යග්වාක් ධර්ම යි ... ඇවැත්නි, මිථ්‍යාකර්මාන්තය අධර්ම යි, සම්‍යක්කර්මාන්තය ධර්ම යි ... ඇවැත්නි, මිථ්‍යාආජීවය අධර්ම යි, සම්‍යගාජීවය ධර්ම යි ... ඇවැත්නි, මිථ්‍යා-ව්‍යායාමය අධර්ම යි, සම්‍යග්ව්‍යායාමය ධර්ම යි ... ඇවැත්නි, මිථ්‍යා-ස්මෘතිය අධර්ම යි සම්‍යක්ස්මෘතිය ධර්ම යි ... ඇවැත්නි, මිථ්‍යාසමාධිය අධර්ම යි, සම්‍යක්සමාධිය ධර්ම යි ... ඇවැත්නි, මිථ්‍යාඥානය අධර්ම යි, සම්‍යග්ඥානය ධර්ම යි ... ඇවැත්නි, මිථ්‍යාවිමුක්තිය අධර්ම යි, සම්‍යග් විමුක්තිය ධර්ම යි ... මිථ්‍යාවිමුක්තිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම්, මෙ අනර්ථ යි. සම්‍යග්විමුක්තිප්‍රත්‍යයෙනුදු නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මෙ අර්ථ යි.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට 'මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුතු ය. අනර්ථය ද අර්ථය ද දතයුතුය. අධර්මය ද ධර්මය ද දැන අනර්ථය ද අර්ථය ද දැන ධර්මය යම් පරිදි වේ නම්, අර්ථය යම් පරිදි වේ නම් එ පරිද්දෙන් පිළිපැදිය යුතු ය''යි යන යම් උද්දෙශයක් සැකෙවින් උදෙසා විතර විසින් අරුත් නොබෙද හුනස්නෙන් නැඟී විහාරයට වන්හු නම්, ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත් නොබෙදූ මේ උද්දෙශයාගේ අර්ථය මෙසේ විතර විසින් දනිමි. ඇවැත්නි, තෙපි කැමැතිවන්නාහු නම්, භාග්‍යවතුන් වහන්සේ කරා ම එළඹ තෙල කරුණ පුළුවුස්ව. භාග්‍යවත්හු තොපට යම් ලෙසෙකින් ව්‍යාකරණ කරත් නම්, එලෙසින් එ දරව යි.

''ඇවැත්නි, එසේය''යි එ මහණහු ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගේ භාෂිතය සතුටින් පිළිගෙන, අනුමෝදන් ව හුනස්නෙන් නැග භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් එ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ:

‘‘යං ඛො නො භන්තෙ භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො ‘‘අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බ’න්ති. තෙසං නො භන්තෙ අම්හාකං අචිර-පක්කන්තස්ස භගවතො එතදහොසි: ‘‘ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො ‘අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බ’න්ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යා’’ති. තෙසං නො භන්තෙ අම්හාකං එතදහොසි: ‘‘අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූනමයං යෙනායස්මා ආනන්දො තෙනුපසංකමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පුච්ඡෙය්‍යාම, යථා නො ආයස්මා ආනන්දො ව්‍යාකරිස්සති, තථා නං ධාරෙස්සාමාති.

අථ ඛො මයං භන්තෙ යෙනායස්මා ආනන්දො තෙනුපසංකමිම්හ, උපසංකමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං අපුච්ඡිම්හ. තෙසං නො භන්තෙ ආයස්මතා ආනන්දෙන ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි ව්‍යඤ්ජනෙහි අත්ථො සුවිභත්තො’’ති.

සාධු සාධු භික්ඛවෙ පණ්ඩිතො භික්ඛවෙ ආනන්දො, මහාපඤ්ඤො භික්ඛවෙ ආනන්දො. මමඤ්චෙපි තුම්හෙ භික්ඛවෙ උපසංකමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාථ, අහම්පි චෙතං අත්ථං එවමෙව ව්‍යාකරෙය්‍යං, යථා තං ආනන්දෙන ව්‍යාකතං. එසො චෙතස්ස අත්ථො, එවඤ්ච නං ධාරෙය්‍යාථාති.

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අපට 'මහණෙනි අධර්මය ද ධර්මය ද දතයුතු ය. අනර්ථය ද අර්ථය ද දතයුතු ය. අධර්මයත් ධර්මයත් දැන අනර්ථය ද අර්ථය ද දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එසේ පිළිපැදිය යුතු ය'යි යම් උද්දෙසයක් සැකෙවින් උදෙසා විතර විසින් අරුත් නො බෙද හුනස්නෙන් නැඟී විහාරයට වන් සේක් ද වහන්ස, ඒ අපට භාග්‍යවතුන් වහන්සේ බැහැර වැඩි නො බෝ කල් වත් ම මෙලෙ සිත විය. 'ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුතු ය. අනර්ථය ද අර්ථය ද දතයුතු ය. අධර්මය ද ධර්මය ද දැන අනර්ථය ද අර්ථය ද දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එ පරිදි පිළිපැදිය යුතු ය'යි යන මේ උද්දෙසය සැකෙවින් උදෙසා විස්තර විසින් අරුත් නො බෙද හුනස්නෙන් නැඟී විහාරයට වන්හ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විස්තර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දෙසයාගේ අර්ථය කවරෙක් නම් විතර විසින් බෙදන්නේ දැ''යි. වහන්ස, ඒ අපට මෙලෙ සිත විය: ''මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ශාස්තෲන් වහන්සේ විසිනුදු සංවර්ණිතයහ. විඥ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දෙසයාගේ අර්ථය විතර විසින් බෙදනට පොහොසත් ද වෙති. ඉදින් අපි ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා එළඹමෝ නම්, එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් මෙලෙ අරුත් පුළුවුස්නමෝ නම් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ යම් පරිදි අපට ව්‍යාකරණ කෙරෙත් නම් එසෙයින් එම දරන්නමෝ නම් මැනැවැ''යි.

වහන්ස, ඉක්බිති අපි ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා එළඹියම්හ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් මෙලෙ අරුත් පුළුවුසුම්හ. වහන්ස, එ අපට ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් මේ අයුරින් මෙ පෙදෙන් මෙ ව්‍යඤ්ජනයෙන් අර්ථය සුවිභක්තය යි.

මහණෙනි, මැනව මැනව. මහණෙනි, ආනන්දයෝ පණ්ඩිතයහ. මහණෙනි, ආනන්දයෝ මහාප්‍රාඥයහ. මහණෙනි, ඉදින් තෙපි මා කරා එළඹ මෙලෙ අරුත් පුළුවුස්නාහු නම් මම ද මෙලෙ කරුණ ආනන්දයන් විසින් එය යම් පරිදි ව්‍යාකෘත නම් එපරිදි ම විවරණ කරමි. මෙලෙ භාෂිතයාගේ මෙලෙ අරුත් ම ය. එසෙයින් ම එය දරව යි.

## 10. 3. 2. 4

## අජිත සුත්තං

අථ ඛො අජිතො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මෝදි. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අජිතො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

අම්හාකං භො ගොතම පණ්ඩිතො නාම සබ්‍රහ්මචාරී. තෙන පඤ්චමත්තානි චිත්තට්ඨානසතානි චින්තිතානි, යෙහි අඤ්ඤතිත්ථියා උපාරද්ධා[1] පජානන්ති උපාරද්ධම්හාති.[2]

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ධාරෙථ නො තුම්හෙ භික්ඛවෙ පණ්ඩිතවත්ථූනීති?

එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා භාසෙය්‍ය, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති.

එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං.

භගවා එතදවොච:

ඉධ භික්ඛවෙ එකච්චො අධම්මිකෙන වාදෙන අධම්මිකං වාදං අභිනිග්ගණ්හාති, අභිනිප්පීළෙති. තෙන ච අධම්මිකං පරිසං රඤ්ජෙති. තෙන සා අධම්මිකා පරිසා උච්චාසද්ද මහාසද්ද හොති. පණ්ඩිතො වත භො, පණ්ඩිතො වත භොති.

ඉධ පන භික්ඛවෙ එකච්චො අධම්මිකෙන වාදෙන ධම්මිකං වාදං අභිනිග්ගණ්හාති, අභිනිප්පීළෙති. තෙන ච අධම්මිකං පරිසං රඤ්ජෙති. තෙන සා අධම්මිකා පරිසා උච්චා සද්දා මහාසද්දා 'පණ්ඩිතො වත භො, පණ්ඩිතො වත භො'ති.

1. උපාරද්ධාවිජානන්ති- මජසං
2. උපරද්ධස්මාති – මජසං

## 10. 3. 2. 4
## අජිත සූත්‍රය

එකල්හි අජිත පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පසෙක හින. එකත්පසෙක හුන් අජිත පරිව්‍රාජක භගවත්හට මෙල කීය.

භවත් ගෞතමයෙනි, අපගේ පණ්ඩිත නම් සබ්‍රම්සරෙක් ඇත. ඔහු විසින් යම් චිත්තොත්පාද කෙනකුන් කරණ කොට ගෙන අන්‍යතීර්ථකයෝ නිගන්නාලදහු නිගන්නා ලදුම්හයි දනිත් නම් එබඳු පන්සියක් පමණ චිත්තොත්පාදයෝ සිත නලදහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණුන් ඇමතූ සේක: ''මහණෙනි, තෙපි පණ්ඩිත වස්තූන් දරවුද්ද''යි.

භාග්‍යවතුන් වහන්සේ යමක් වදරන සේක් නම් භාග්‍යවත්නි, තෙල සඳහා මෙ කලි, සුගතයෙනි, තෙල සඳහා මෙ කලි, භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අසා භික්ෂූහු දරත්හ යි.

මහණෙනි, එහෙයින් ම අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි යි.

වහන්ස, එසේ ය යි එ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

භාග්‍යවතුන් වහන්සේ තෙල වදළහ:

මහණෙනි, මෙ ලොව්හි එකෙක් අධාර්මිකවාදයෙන් අධාර්මිකවාදය නිගන්නේ ය, වෙසෙසින් පෙළන්නේ ය. එයිනුදු අධාර්මික පෂිද්‍රඤ්ජිත කරනේ ය. එයින් ඒ අධාර්මික පෂිද් ''භවත්නි, එකැතින් පණ්ඩිත ය. භවත්නි, එකැතින් පණ්ඩිත ය''යි උස්හඬ මහහඬ ඇති වෙයි.

මහණෙනි මෙ ලොව්හි එකෙක් අධාර්මික වාදයෙන් ධාර්මිකවාදය දැඩි කොට නිගන්නේ ය, දැඩි කොට පෙළන්නේ ය. එයිනුදු අධාර්මික පෂිද් රඳන්නේ ය. එයින් ඒ අධාර්මික පෂිද් ''භවත්නි, එකැතින් පණ්ඩිත ය, භවත්නි, එකැතින් පණ්ඩිත යැ''යි උස්හඬ ඇති මහ හඬ ඇති වෙයි.

ඉධ පන භික්ඛවෙ එකච්චො අධම්මිකෙන වාදෙන ධම්මිකං ච වාදං අධම්මිකඤ්ච වාදං අභිනිග්ගණ්හාති, අභිනිප්පීළෙති. තෙන ච අධම්මිකං පරිසං රඤ්ජෙති. තෙන සා අධම්මිකා පරිසා උච්චාසද්දා මහාසද්දා හොති පණ්ඩිතො වත භො, පණ්ඩිතො වත භො'ති.

ඉධ පන භික්ඛවෙ එකච්චො ධම්මිකෙන වාදෙන ධම්මිකං ච වාදං අධම්මිකඤ්ච වාදං අභිනිග්ගණ්හාති. අභිනිප්පීළෙති. තෙන ච අධම්මිකං පරිසං රඤ්ජෙති, තෙන සා අධම්මිකා පරිසා උච්චාසද්දා මහාසද්දා හොති, 'පණ්ඩිතො වත භො, පණ්ඩිතො වත භො''ති.*

ඉධ පන භික්ඛවෙ එකච්චො ධම්මිකෙන වාදෙන ධම්මිකං වාදං අභිනිග්ගණ්හාති, අභිනිප්පීළෙති. තෙන ච ධම්මිකං පරිසං රඤ්ජෙති. තෙන ච සා ධම්මිකා පරිසා උච්චාසද්දා මහාසද්දා හොති පණ්ඩිතො වත භො, පණ්ඩිතො වත භො'ති.*

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථං ච විදිත්වා අත්ථඤ්ච, යථාධම්මො යථා අත්ථො පටිපජ්ජිතබ්බං.

කතමො ච භික්ඛවෙ අධම්මො, කතමො ච ධම්මො: කතමො ච අනත්ථො, කතමො ච අත්ථො:

මිච්ඡාදිට්ඨි භික්ඛවෙ අධම්මො, සම්මාදිට්ඨි ධම්මො, යෙ ච මිච්ඡාදිට්ඨි පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති අයං අත්ථො.

මිච්ඡාසංකප්පො භික්ඛවෙ අධම්මො, සම්මාසඞ්කප්පො ධම්මො -පෙ- මිච්ඡාවාචා භික්ඛවෙ අධම්මො, සම්මාවාචා ධම්මො -පෙ- මිච්ඡාකම්මන්තො භික්ඛවෙ අධම්මො, සම්මාකම්මන්තො ධම්මො. -පෙ-

* මරම්මපොත්ථකෙසු එතානි දෙව ඛණ්ඩානි න දිස්සන්තෙ

මහණෙනි, මෙ ලොව්හි එකෙක් අධාර්මික වාදයෙන් ධාර්මිකවාදය ද අධාර්මිකවාදය ද දඬි ව නිගනී. දඬි ව පෙළ යි. එයින් ම අධාර්මික පෂීද් රඳනේ ය. එ කරුණින් ඒ අධාර්මික පෂීද් “භවත්නි, එකැතින් පණ්ඩිත ය. භවත්නි, එකැතින් පණ්ඩිතය යි උස්හඬ මහහඬ ඇති වෙයි.

මහණෙනි, මෙ ලොව්හි එකෙක් ධාර්මිකවාදයෙන් ධාර්මිකවාදය ද අධාර්මිකවාදය ද දඬි ව නිගන්නේ ය. දඬි ව පෙළන්නේ ය. එයිනුදු අධාර්මික පෂීද් කැඳවන්නේ ය. එයින් ඒ අධාර්මික පෂීද් ‘භවත්නි, එකැතින් පණ්ඩිත ය, භවත්නි, එකැතින් පණ්ඩිත ය’යි උස්හඬ මහහඬ ඇති වෙයි.

මහණෙනි, මෙ ලොව්හි එකෙක් ධාර්මික වාදයෙන් ධාර්මිකවාදය තදින් නිගනී. තදින් පෙළයි. එයිනුදු ධාර්මික පෂීද් රඳවයි. එයින් ධාර්මික පෂීද් භවත්නි, එකැතින් පණ්ඩිත ය, භවත්නි, එකැතින් පණ්ඩිත ය යි උස්හඬ මහහඬ ඇති වෙයි.

මහණෙනි, අධර්මය ද ධර්මය ද දතයුතු. අනර්ථය ද අර්ථය ද දතයුතු. අධර්මය ද ධර්මය ද දැන අනර්ථය ද අර්ථය ද දැන දහම් යම් පරිදි වේ නම් අරුත් යම් පරිදි වේ නම් එ පරිදි පිළිපැදිය යුතු.

මහණෙනි, අධර්මය කවර? ධර්මය ද කවර? අනර්ථය කවර? අර්ථය ද කවර?

මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය අධර්ම යි. සම්‍යක්දෘෂ්ටිය ධර්ම යි. මිථ්‍යා දෘෂ්ටිප්‍රත්‍යයෙන් යම් බඳු නොයෙක් ලමු අකුශල ධර්මයෝ උපදනාහු නම් මේ අනර්ථ යි. සම්‍යක්දෘෂ්ටිප්‍රත්‍යයෙනුදු නොයෙක් කුශල ධර්මයෝ භාවනායෙන් පරිපූර්ත්තියට යෙත් නම් මේ අර්ථ යි.

මහණෙනි, මිථ්‍යාසඞ්කල්පය අධර්ම යි, සම්‍යක්සඞ්කල්පය ධර්ම යි.... මහණෙනි, මිථ්‍යාවාග් අධර්මයි, සම්‍යක්වාග් ධර්මයි... මහණෙනි, මිථ්‍යා කර්මාන්තය අධර්මයි, සම්‍යක් කර්මාන්තය ධර්මයි...

මිච්ඡාආජීවො භික්ඛවෙ අධම්මො, සම්මාආජීවො ධම්මො -පෙ- මිච්ඡා වායාමො භික්ඛවෙ අධම්මො සම්මාවායාමො ධම්මො -පෙ- මිච්ඡා සති භික්ඛවෙ අධම්මො, සම්මාසති ධම්මො -පෙ- මිච්ඡාසමාධි භික්ඛවෙ අධම්මො සම්මාසමාධි ධම්මො- පෙ- මිච්ඡාඤාණං භික්ඛවෙ අධම්මො -පෙ- සම්මාඤාණං ධම්මො -පෙ- මිච්ඡාවිමුත්ති භික්ඛවෙ අධම්මො, සම්මාවිමුත්ති ධම්මො. යෙ ච මිච්ඡාවිමුත්තිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්මා විමුත්තිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො, යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

## 10. 3. 2. 5

### සඞ්ගාරව සුත්තං

අථ ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

“කිං නු ඛො භො ගොතම ඔරිමං තීරං, කිං පාරිමං තීර”න්ති?

මිච්ඡාදිට්ඨි ඛො බ්‍රාහ්මණ ඔරිමං තීරං, සම්මාදිට්ඨි පාරිමං තීරං. මිච්ඡාසඞ්කප්පො ඔරිමං තීරං, සම්මාසඞ්කප්පො පාරිමං තීරං. මිච්ඡාවාචා ඔරිමං තීරං, සම්මාවාචා පාරිමං තීරං. මිච්ඡාකම්මන්තො ඔරිමං තීරං, සම්මාකම්මන්තො පාරිමං තීරං. මිච්ඡා ආජීවො ඔරිමං තීරං, සම්මා ආජීවො පාරිමං තීරං. මිච්ඡාවායාමො ඔරිමං තීරං, සම්මාවායාමො පාරිමං තීරං. මිච්ඡාසති ඔරිමං තීරං, සම්මාසති පාරිමං තීරං. මිච්ඡාසමාධි ඔරිමං තීරං, සම්මාසමාධි පාරිමං තීරං. මිච්ඡාඤාණං ඔරිමං තීරං, සම්මාඤාණං පාරිමං තීරං. මිච්ඡාවිමුත්ති ඔරිමං තීරං, සම්මාවිමුත්ති පාරිමං තීරං. ඉදං ඛො බ්‍රාහ්මණ ඔරිමං තීරං, ඉදං පාරිමං තීරන්ති.

මහණෙනි, මිථ්‍යාආජීවය අධර්‍ම යි. සම්‍යක්ආජීවය ධර්‍ම යි... මහණෙනි, මිථ්‍යාව්‍යායාමය අධර්‍ම යි. සම්‍යක්ව්‍යායාමය ධර්‍ම යි... මහණෙනි, මිථ්‍යා ස්මෘතිය අධර්‍ම යි. සම්‍යක්ස්මෘතිය ධර්‍ම යි... මහණෙනි, මිථ්‍යාසමාධිය අධර්‍ම යි. සම්‍යක්සමාධිය ධර්‍ම යි... මහණෙනි, මිථ්‍යාඥානය අධර්‍ම යි. මහණෙනි, සම්‍යක්ඥානය ධර්‍ම යි... මහණෙනි, මිථ්‍යාවිමුක්තිය අධර්‍ම යි. මහණෙනි, සම්‍යක්විමුක්තිය ධර්‍ම යි. මිථ්‍යාවිමුක්තිප්‍රත්‍යයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශල ධර්‍මයෝ උපදනාහු නම් මේ අනර්‍ථ යි. සම්‍යක් විමුක්ති ප්‍රත්‍යයෙනුදු මේ කුශල ධර්‍මයෝ භාවනාවෙන් පරිපූර්‍ණතියට යෙත් නම් මේ අර්‍ථ යි.

මහණෙනි, අධර්‍මය ද ධර්‍මය ද දතයුතු. අනර්‍ථය ද අර්‍ථය ද දතයුතු. අධර්‍මයත් ධර්‍මයත් දැන අනර්‍ථයත් අර්‍ථයත් දැන දහම් යම් පරිදි වේ නම් අනර්‍ථ යම් පරිදි වේ නම් එසේ පිළිපැදිය යුතු ය යි මෙසේ යමක් කියන ලද නම් මෙය තෙල කරුණු පිණිස කියන ලද යි.

## 10. 3. 2. 5

## සඞ්ගාරව සූත්‍රය

එකල්හි සඞ්ගාරව බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හින. එකත්පස් ව හුන් සඞ්ගාරව බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට තෙල කීය.

භවත් ගෞතමයෙනි, මෙතෙර කවර, එතෙර කවර?

බ්‍රාහ්මණය, මිථ්‍යාදෘෂ්ටිය මෙ තෙර යි. සම්‍යක්දෘෂ්ටිය එතෙර යි. මිථ්‍යාසඞ්කල්පය මෙතෙර යි, සම්‍යක්සඞ්කල්පය එතෙර යි. මිථ්‍යා වචනය මෙතෙර යි, සම්‍යක්වචනය එතෙර යි. මිථ්‍යාකර්‍මාන්තය මෙතෙර යි, සම්‍යක්කර්‍මාන්තය එතෙර යි. මිථ්‍යාආජීවය මෙතෙර යි, සම්‍යක්ආජීවය එතෙර යි. මිථ්‍යාව්‍යායාමය මෙතෙර යි, සම්‍යක්ව්‍යායාමය එතෙර යි. මිථ්‍යාසතිය මෙතෙර යි, සම්‍යක්සතිය එතෙර යි. මිථ්‍යා සමාධිය මෙතෙර යි, සම්‍යක්සමාධිය එතෙර යි. මිථ්‍යාඥානය මෙතෙර යි, සම්‍යක්ඥානය එතෙර යි. මිථ්‍යාවිමුක්තිය මෙතෙරයි, සම්‍යක්විමුක්තිය එතෙර යි. බමුණ, මෙ වනාහි මෙතෙරය' මෙ එතෙරය යි.

1. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා – තීරමෙවානුධාවති.

2. යෙ ච ඛො සම්මදක්ඛාතෙ – ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති – මච්චුධෙය්‍යං සුදුත්තරං.

3. කණ්හං ධම්මං විප්පහාය – සුක්කං භාවෙථ පණ්ඩිතො,
ඔකා අනොකං ආගම්ම – විවෙකෙ යත්‍ථ දූරමං.

4. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය – හිත්‍වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං – චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

5. යෙසං සම්බොධි අඞ්ගෙසු – සම්මා චිත්තං සුභාවිතං,
ආදානපටිනිස්සග්ගෙ – අනුපාදය යෙ රතා,
ඛීණාසවා ජුතිමන්තො – තෙ ලොකෙ පරිනිබ්බුතා ති.

## 10. 3. 2. 6
## ඔරිමතීර සුත්තං

ඔරිමඤ්ච වො භික්ඛවෙ තීරං දෙසිස්සාමි, පාරිමඤ්ච තීරං. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමඤ්ච භික්ඛවෙ ඔරිමං තීරං, කතමඤ්ච පාරිමං තීරං:

මිච්ඡාදිට්ඨි භික්ඛවෙ ඔරිමං තීරං, සම්මාදිට්ඨි පාරිමං තීරං -පෙ- මිච්ඡා විමුත්ති ඔරිමං තීරං, සම්මා විමුත්ති පාරිමං තීරං. ඉදං ඛො භික්ඛවෙ ඔරිමං තීරං, ඉදං පාරිමං තීරන්ති.

1. මිනිසුන් අතුරෙන් යම් ජන කෙනෙක් නිවන් යනුවෝ ද එ ජනයෝ මඳහ. වැලි මෙ (නිවන් යන සත්ත්වයන් කෙරෙන්) අන් ප්‍රජාව සත්කාය තීරයට ම දිවෙයි.

2. යම් කෙනෙකුන් මොනොවට දෙසූ (දෙශනා) නව ලොකොත්තර ධර්මයෙහි ධර්මානුරූප ව වටනාහුද, එ ජනයෝ සුදුස්තර තෙබුමු වට නැමැති මෘත්‍යුධෙයය තරණය කොට පරතෙර (නිවන)ට යෙත්.

3. පණ්ඩිත තෙමේ කෘෂ්ණ ධර්ම හැරදමා වර්ත සඞ්ඛ්‍යාත ගෙන් යම් කාය චිත්ත උපධි විවෙකයෙක්හි අභිරමණය කිරීමට දුෂ්කර වූ විවර්ත සඞ්ඛ්‍යාත අනොකයට පැමිණ ශුක්ලධර්මය වඩනේ ය.

4. පලිබොධ රහිත වූයේ පණ්ඩිත තෙම ද්විවිධ කාමයන් දුරු කොට එ නිවන්හි අභිරතිය කැමැති වන්නේ ය. චිත්තක්ලෙශයන්ගෙන් සිත පර්‍ය්‍යවදත කරන්නේ ය.

5. යමකුන් විසින් සම්බොධ්‍යඞ්ගයන්හි මොනොවට සිත වඩන ලද ද ග්‍රහණප්‍රතිනිඃසර්ග සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි චතුරොපාදන විසින් නො ගෙන යම් කෙනෙක් ඇලුණාහු ද ද්‍යුතිමත් එ ක්ෂීණාස්‍රවයෝ පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත උපාදන ලොකයෙහි (කෙලෙස් පිරිනිවුමෙන්) නිවියහයි.

## 10. 3. 2. 6

## ඔරිමතීර සූත්‍රය

මහණෙනි, තොපට ඔරිමතීරය හා පාරිම තීරය හා දෙසන්නෙමි. එ අසව, මොනොවට මෙනෙහි කරව දෙසන්නෙමි යි. 'වහන්ස, එසේ යි එ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල වදළහ:

මහණෙනි, ඔරිමතීරය හා කවරː පාරිමතීරය හා කවරː

මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය ඔරිමතීරය යි, සම්‍යග්දෘෂ්ටිය පාරිමතීරය යි... මිථ්‍යාවිමුක්තිය ඔරිමතීරය යි, සම්‍යක්විමුක්තිය පාරිමතීරය යි. මහණෙනි, මෙ ඔරිමතීරය යි මෙ පාරිමතීරය යි.

1. අප්පකා තෙ මනුස්සෙසු – යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා – තීරමෙවානුධාවති.

2. යෙ ච ඛො සම්මදක්ඛාතෙ – ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති – මච්චුධෙය්‍යං සුදුත්තරං.

3. කණ්හං ධම්මං විප්පහාය – සුක්කං භාවෙථ පණ්ඩිතො,
ඔකා අනොකං ආගම්ම – විවෙකෙ යත්ථ දූරමං.

4. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය – හිත්වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං – චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

5. යෙසං සම්බොධි අඞ්ගෙසු – සම්මාචිත්තං සුභාවිතං,
ආදානපටිනිස්සග්ගෙ – අනුපාදාය යෙ රතා,
ඛීණාසවා ජුතිමන්තො – තෙ ලොකෙ පරිනිබ්බුතා ති.

## 10. 3. 2. 7

## පඨම පච්චොරොහණි සුත්තං

තෙන ඛො පන සමයෙන ජාණුස්සොණි[1] බ්‍රාහ්මණො තදහුපොසථෙ සීසං[2] නහාතො නවං ඛොමයුගං නිවත්ථො අල්ලකුසමුට්ඨිං ආදාය භගවතො අවිදූරෙ එකමන්තං ඨිතො හොති.

අද්දසා ඛො භගවා ජාණුස්සොණිං බ්‍රාහ්මණං තදහුපොසථෙ සීසං නහාතං නවං ඛොම යුගං නිවත්ථං අල්ලං කුසමුට්ඨිං ආදාය අවිදූරෙ එකමන්තං ඨිතං. දිස්වා ජාණුස්සොණිං බ්‍රාහ්මණං එතදවොච:

කිං නු ඛො ත්වං බ්‍රාහ්මණ, තදහුපොසථෙ සීසං නහාතො නවං ඛොමයුගං නිවත්ථො අල්ලං කුසමුට්ඨිං ආදාය එකමන්තං ඨිතො? කිං නවජ්ජ බ්‍රාහ්මණකුලස්සාති?

පච්චොරොහණී භො ගොතම, අජ්ජ බ්‍රාහ්මණකුලස්සාති.

යථාකථං පන බ්‍රාහ්මණ, බ්‍රාහ්මණානං පච්චොරොහණී හොති ති?

---

1. ජානුස්සොණි – මජසං
2. සීසං – නහාතො – මජ්ඣංසීසනහාතො – සයා.

1. මිනිසුන් අතුරෙන් යම් ජන කෙනෙක් නිවන් යනුවෝද, එ ජනයෝ මදහ. වැලි මෙ සෙසු ලොවී සත්ත්වාඛ්‍ය ප්‍රජාව සත්කාය තීරයට ම දිවෙයි.

2. යම් කෙනෙකුන් මොනොවට දෙසූ නව ලෝවුතුරු දහම්හි ධර්මානුරූප ව වටනාහු ද, එ ජනයෝ සුදුස්තර වූ තෙබුමු වට නැමැති මෘත්‍යු-ධෙයය තරණය කොට පරතෙර (නිවන) ට යෙත්.

3. පණ්ඩිත තෙම කෘෂ්ණධර්ම හැරපියා වර්ත සඞ්ඛ්‍යාත ගිහිගෙන් ත්‍රිවිධ විවේකයෙහි අභිරමණයට දුෂ්කර වූ විවර්ත සඞ්ඛ්‍යාත අනොකයට පැමිණ ශුක්ල ධර්ම වඩන්නේ ය.

4. පරිරොධ නැතියේ කාමයන් හැරපියා එ නිවන්හි අභිරතිය පතන්නේ ය. පණ්ඩිත තෙමෙ චිත්තක්ලෙශයන් ගෙන් සිත පර්‍ය්‍යවදත කරන්නේ ය.

5. යමකුන් විසින් සම්බොධ්‍යඞ්ගයන්හි චිත්තය මොනොවට වඩන ලද ද, ආදන ප්‍රතිනිඃසර්ගයෙහි උපාදන විසින් නො ගෙන යමෙක් ඇලුණාහු ද ද්‍යුතිමත් එ ක්ෂීණාස්‍රව පණ්ඩිතයෝ ලොවහි පිරිනිවියහ යි.

## 10. 3. 2. 7

## පඨම පච්චොරොහණී සූත්‍රය

එ සමයෙහි ජානුසොණී බ්‍රාහමණ එ පොහෝ දවස්හි හිස නහවාලූයේ නව ක්ෂෞමවස්ත්‍ර යුග්මයක් හැඳියේ අමු කුසතණ මිටක් ගෙන භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි එකත්පස්හි සිටියේ වෙයි.

භාග්‍යවතුන් වහන්සේ එපොහෝ දවස්හි හිස නහවාලූ නව ක්ෂෞම යුග්මයක් හැඳි අමු හීතණ මිටක් ගෙන නුදුරෙහි එකත්පස්හි හුන් ජාණුසොණී බ්‍රාහමණයා දුටුහු, දැක ජාණුසොණී බ්‍රාහමණහට මෙල කරුණ වදළ සේක:

බ්‍රාහමණය, එ පොහෝ දවස්හි හිස සෝද නහා නව කොමුපිළි යුවළක් හැඳියේ අමු හීතණ මිටක් ගෙන තෙපි කවර හෙයින් එකත් පසක සිටියහු ද? අද බ්‍රාහමණ කුලයට කවරක් ඇද්දැයි?

භවත් ගෞතමයෙනි, අද බ්‍රාහමණ කුලයට ප්‍රත්‍යවරොහණය (පව සෝදහැරීම) යි.

බ්‍රාහමණය, බමුණන්ගේ ප්‍රත්‍යවරොහණය කෙසෙයින් වේ ද?

ඉධ භො ගොතම, බ්‍රාහ්මණා තදහුපොසථෙ සීසං නහාතා නවං ඛොමයුගං නිවත්‍ථා අල්ලෙන ගොමයෙන පඨවිං ඔපුඤ්ජිත්‍වා හරිතෙහි කුසෙහි පත්‍ථරිත්‍වා අන්‍තරා ච වෙලං අන්‍තරා ච අග්‍ගාගාරං සෙය්‍යං කප්පෙන්‍ති. තෙ තං රත්‍තිං තික්‍ඛත්‍තුං පච්චුට්ඨාය පඤ්ජලිකා අග්ගිං නමස්සන්‍ති "පච්චොරොහාම භවන්‍තං, පච්චොරොහාම භවන්‍ත"න්‍ති. පහූතෙන ච සප්පිතෙලෙන නවනීතෙන අග්ගිං සන්‍තප්පෙන්‍ති. තස්සා ච රත්‍තියා අච්චයෙන පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන බ්‍රාහ්මණෙ සන්‍තප්පෙන්‍ති. එවං ඛො භො ගොතම, බ්‍රාහ්මණානං පච්චොරොහණී හොතීති.

අඤ්ඤථා ඛො බ්‍රාහ්මණ, බ්‍රාහ්මණානං පච්චොරොහණී අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති.

යථාකථං පන භො ගොතම, අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති? සධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු, යථා අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති.

තෙන හි බ්‍රාහ්මණ, සුණාහි, සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති.

එවං භොති ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි, භගවා එතදවොච:

ඉධ බ්‍රාහ්මණ, අරියසාවකො ඉති පටිසඤ්චික්‍ඛති: "මිච්ඡාදිට්ඨියා ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ, අභිසම්පරායඤ්චා"ති, සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාදිට්ඨිං පජහති, මිච්ඡාදිට්ඨියා පච්චොරොහති.

මිච්ඡාසඞ්කප්පස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාසඞ්කප්පං පජහති, මිච්ඡාසඞ්කප්පා පච්චොරොහති.

මිච්ඡාවාචාය ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ, අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාවාචං පජහති, මිච්ඡාවාචාය පච්චොරොහති.

මිච්ඡාකම්මන්‍තස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ, අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාකම්මන්‍තං පජහති, මිච්ඡාකම්මන්‍තා පච්චොරොහති.

භවත් ගෞතමයෙනි, මෙලොවහි බමුණෝ එ පොහෝ දවස්හි හිස් සෝද නැවාහු නව කොමුපිළී යුවළක් හැදියාහු අමුගොමින් පොළෝ අලෙවුදී නිල් හීතණින් අතුරා වැලිරැසට හා ගිනිහල් ගෙට අතර ශයාා කරත්. ඔහු එරැ තෙවිටක් නැඟී බඳදිලි ව ගිනි නමදිත්. ‘‘භවතුන්ට ප්‍රත්‍යවරොහණ (පාපශොධන) කරම්හ’’යි. බොහෝ ගිතෙලිනුදු වෙඬරු-යෙනුදු අග්නි සන්තර්පණ කරත්. එරැ ඉක්ම යාමෙනුදු කෑ යුතු බුදිය යුතු පිණී අහරින් බමුණන් සන්තර්පිත කරත්. භවත් ගෞතමයෙනි, මෙසෙයින් බ්‍රාහමණයන්ගේ ප්‍රත්‍යවරොහණය වේ යයි.

බ්‍රාහමණය, බ්‍රාහමණයන්ගේ ප්‍රත්‍යවරොහණය අන් පරිද්දෙකින් වෙයි. ආයඨවිනයෙහි ප්‍රත්‍යවරොහණය අන් පරිද්දෙකින් වේ යයි.

භවත් ගෞතමයෙනි, ආයඨවිනයෙහි ප්‍රත්‍යවරොහණය කෙසේ වේ දැයි? ආයඨවිනයෙහි ප්‍රත්‍යවරොහණය යම් පරිද්දෙකින් වේ නම් භවත් ගෞතමයන් වහන්සේ මට එලෙසින් දහම් දෙසන සේක්වා යි.

බ්‍රාහමණය, එ කරුණෙන් අසව, මොනොවට මෙනෙහි කරව දෙසන්නෙමියි.

භවත්නි, එසේය යි ජාණුසොණි බ්‍රාහමණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී ය.

බමුණ, මෙයස්නෙහි අරිසවු මෙසේ නුවණින් සලකයි. මිථ්‍යා දෘෂ්ටිහුගේ ලාමක විපාක දිටුදැමියෙහි ම හා සම්පරායෙහි වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිසදිටු හැරපියයි. මිථ්‍යාදෘෂ්ටියෙන් ප්‍රත්‍යව-රොහණ කෙරෙයි.

මිථ්‍යාසඞකල්පයාගේ ලාමක විපාක වනාහි දිටුදැහැමියෙහි ම හා සම්පරායෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාසඞකල්ප හැරපියයි, මිථ්‍යාසඞකල්පයෙන් ප්‍රත්‍යවරෝහණ කෙරෙයි.

මිථ්‍යාවාක්හුගේ ලාමකවිපාක වනාහි දිටුදැහැමියෙහි හා සම්පරායෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාවචනය හැර පියයි, මිථ්‍යා-වචනයෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි.

මිථ්‍යාකර්මාන්තයාගේ වනාහි ලාමකවිපාක දිටුදැහැමියෙහි ම හා සම්පරායෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාකර්මාන්තය හැර පියයි, මිථ්‍යාකර්මාන්තයෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි.

මිච්ඡාආජීවස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙව චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාආජීවං පජහති. මිච්ඡාආජීවා පච්චොරොහති.

මිච්ඡාවායාමස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙව චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාවායාමං පජහති මිච්ඡාවායාමා පච්චොරොහති.

මිච්ඡාසතියා ඛො පාපකො විපාකො දිට්ඨෙව චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාසතිං පජහති. මිච්ඡාසතියා පච්චොරොහති.

මිච්ඡාසමාධිස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙව චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාසමාධිං පජහති. මිච්ඡාසමාධිම්හා පච්චොරොහති.

මිච්ඡාඤාණස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙව චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාඤාණං පජහති. මිච්ඡාඤාණා පච්චොරොහති.

මිච්ඡාවිමුත්තියා ඛො පාපකො විපාකො දිට්ඨෙව චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාවිමුත්තිං පජහති. මිච්ඡාවිමුත්තියා පච්චොරොහති.

එවං ඛො බ්‍රාහ්මණ, අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති.

අඤ්ඤථා හො ගොතම, බ්‍රාහ්මණානං පච්චොරොහණී, අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති. ඉමිස්සා ච ඛො හො ගොතම, අරියස්ස විනයෙ පච්චොරොහණියා බ්‍රාහ්මණානං පච්චොරොහණී කලං නාගඝති සොළසිං.

අභික්කන්තං හො ගොතම, -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

මිථ්‍යාආජීවයාගේ වනාහි ලාමකවිපාක දිටුදම්යෙහි ම හා සම්පරායෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාආජීවය හැර පිය යි. මිථ්‍යා ආජීවයෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි.

මිථ්‍යාව්‍යායාමයාගේ වනාහි ලාමකවිපාක දිටුදම්යෙහි ම හා සම්පරා-යෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාව්‍යායාමය හැර පිය යි. මිථ්‍යාව්‍යායාමයෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි.

මිථ්‍යාස්මෘතිහුගේ වනාහි ලාමකවිපාක දිටුදම්යෙහි ම හා සම්පරායෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාස්මෘතිය හැර පිය යි. මිථ්‍යා ස්මෘතියෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි.

මිථ්‍යාසමාධිහුගේ වනාහි ලාමකවිපාක දිටුදම්යෙහි ම හා අභිසම්පරා-යෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාසමාධිය හැර පිය යි. මිථ්‍යාසමාධියෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි.

මිථ්‍යාඥනයාගේ වනාහි ලාමකවිපාක දිටුදම්යෙහි ම හා අභිසම්පරා-යෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාඥනය හැර පිය යි. මිථ්‍යාඥනයෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි.

මිථ්‍යාවිමුක්තිහුගේ වනාහි ලාමකවිපාක දිටුදම්යෙහි ම හා සම්පරා-යෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාවිමුක්තිය හැරපියා මිථ්‍යාවිමුක්තියෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි.

බ්‍රාහ්මණය, මෙසේ වනාහි ආයඞ්විනයෙහි ප්‍රත්‍යවරොහණය වේ යයි.

භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයන්ගේ ප්‍රත්‍යවරොහණය අන් පරිද්දෙ-කින් වෙයි. ආයඞ්විනයෙහි ප්‍රත්‍යවරොහණය ද අන් පරිද්දෙකින් වේ යයි. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණයන්ගේ ප්‍රත්‍යවරොහණය මේ ආයඞ්විනයෙහි ප්‍රත්‍යවරොහණයාගේ සොළොස්වන කලා ද නො අගනේ යයි.

භවත් ගෞතමයෙනි, ඉතා කාන්ත ය... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට දරන සේක්වා යි.

## 10. 3. 2. 8

## දුතිය පච්චොරොහණී සුත්තං

අරියං වො භික්ඛවෙ පච්චොරොහණිං දෙසිස්සාමි. තං සුණාථ -පෙ- කතමා ච භික්ඛවෙ අරියා පච්චොරොහණී:

ඉධ භික්ඛවෙ අරියසාවකො ඉති පටිසංචික්ඛති: මිච්ඡාදිට්ඨියා ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාදිට්ඨිං පජහති. මිච්ඡාදිට්ඨියා පච්චොරොහති. මිච්ඡාසඞ්කප්පස්ස ඛො පාපකො විපාකො -පෙ- මිච්ඡාවාචාය ඛො පාපකො විපාකො -පෙ- මිච්ඡාකම්මන්තස්ස ඛො පාපකො විපාකො -පෙ- මිච්ඡාආජීවස්ස ඛො පාපකො විපාකො -පෙ- මිච්ඡාවායාමස්ස ඛො පාපකො විපාකො -පෙ- මිච්ඡාසතියා ඛො පාපකො විපාකො -පෙ- මිච්ඡාසමාධිස්ස ඛො පාපකො විපාකො -පෙ- මිච්ඡාඤාණස්ස ඛො පාපකො විපාකො -පෙ- මිච්ඡාවිමුත්තියා ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාවිමුත්තිං පජහති. මිච්ඡාවිමුත්තියා පච්චොරොහති. අයං වුච්චති භික්ඛවෙ අරියා පච්චොරොහණීති.

## 10. 3. 2. 9

## පුබ්බඞ්ගම සුත්තං

සුරියස්ස භික්ඛවෙ උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ කුසලානං ධම්මානං එතං පුබ්බඞ්ගමං, එතං පුබ්බනිමිත්තං, යදිදං සම්මාදිට්ඨි. සම්මාදිට්ඨිස්ස[1] භික්ඛවෙ සම්මාසඞ්කප්පො පහොති. සම්මාසඞ්කප්පස්ස සම්මාවාචා පහොති. සම්මාවාචස්ස සම්මාකම්මන්තො පහොති. සම්මාකම්මන්තස්ස සම්මාආජීවො පහොති. සම්මාආජීවස්ස සම්මාවායාමො පහොති. සම්මාවායාමස්ස සම්මාසති පහොති. සම්මාසතිස්ස සම්මාසමාධි පහොති. සම්මාසමාධිස්ස සම්මාඤාණං පහොති. සම්මාඤාණිස්ස සම්මාවිමුත්ති පහොතීති.

---

1. සම්මාදිට්ඨිකස්ස - මජසං

## 10. 3. 2. 8

## දුතිය පච්චොරොහණ සූත්‍රය

මහණෙනි, තොපට ආර්‍යප්‍රත්‍යවරොහණය දෙසන්නෙමි. එය අසවු...

මහණෙනි, ආර්‍යප්‍රත්‍යවරොහණය කවර යත්:

මහණෙනි, මෙ සස්නෙහි අරිසවු මෙසේ නුවණින් සලකයි: මිථ්‍යාදෘෂ්ටියගේ වනාහි ලාමක විපාක දිටුදැමියෙහි ම හා සම්පරායෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිසදිටු දුරු කෙරෙයි. මිථ්‍යාදෘෂ්ටියෙන් ප්‍රත්‍යවරොහණය කෙරෙයි. මිථ්‍යාසඞ්කල්පයාගේ වනාහි ලාමක විපාක... මිථ්‍යාවාක්හුගේ වනාහි ලාමක විපාක... මිථ්‍යාකර්මාන්තයාගේ වනාහි ලාමකවිපාක... මිථ්‍යාආජීවයාගේ වනාහි ලාමකවිපාක... මිථ්‍යාව්‍යායාමයාගේ වනාහි ලාමකවිපාක... මිථ්‍යාස්මෘතියගේ වනාහි ලාමක විපාක...මිථ්‍යාසමාධිහුගේ වනාහි ලාමකවිපාක... මිථ්‍යාඥාණයාගේ වනාහි ලාමකවිපාක... මිථ්‍යාවිමුක්තිහුගේ වනාහි ලාමකවිපාක දිටුදැමියෙහි හා සම්පරායෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාවිමුක්තිය හැරපියයි. මිථ්‍යාවිමුක්තියෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි. මහණෙනි, මෙ ආර්‍යවිනයෙහි ප්‍රත්‍යවරොහණය යි.

## 10. 3. 2. 9

## පුබ්බඞ්ගම සූත්‍රය

මහණෙනි, උදවන හිරුහට තෙල පූර්වඞ්ගම වෙයි, තෙල පූර්වනිමිත්ත වෙයි, එනම් අරුණු නැඟීම යි. මහණෙනි, එ පරිදිම කුශලධර්මයනට තෙල පූර්වඞ්ගම වෙයි, තෙල පූර්වනිමිත්ත වෙයි, එනම් සම්දිට්ඨ යි. මහණෙනි, සම්‍යක්දෘෂ්ටි ඇත්තහුට සම්‍යක් සඞ්කල්පය පොහොනේ වෙයි. සම්‍යක් සඞ්කල්ප ඇත්තහුට සම්‍යක් වාක් පොහොනේ වෙයි. සම්‍යක් වාක් ඇත්තහුට සම්‍යක් කර්මාන්තය පොහොනේ වෙයි. සම්‍යක් කර්මාන්ත ඇත්තහුට සම්‍යක් ආජීවය පොහොනේ වෙයි. සම්‍යක්ආජීවීහට සම්‍යක් ව්‍යායාමය පොහොනේ වෙයි. සම්‍යක් ව්‍යායාම ඇත්තහුට සම්‍යක්ස්මෘතිය පොහොනේ වෙයි. සම්‍යක් ස්මෘති ඇත්තහුට සම්‍යක් සමාධිය පොහොනේ වෙයි. සම්‍යක්සමාධි ඇත්තහුට සම්‍යක්ඥානය පොහොනේ වෙයි. සම්‍යක් ඥානීහට සම්‍යක්විමුක්තිය පොහොනේ වේ යී.

## 10. 3. 2. 10

## ආසවක්ඛය සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තන්ති. කතමෙ දස:

සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මා ආජීවො, සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි, සම්මාඤාණං, සම්මා විමුත්ති.

ඉමෙ ඛො භික්ඛවෙ දස ධම්මා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තන්තීති.

### පච්චොරොහණිවග්ගො දුතියො.

**තස්සුද්දානං:**

තයො අධම්මා අජිතො සඞ්ගාරවොච ඔරිමං
ද්වෙ චෙව පච්චොරොහණී – පුබ්බඞ්ගමං ආසවො චාති.

## 10. 3. 2. 10

## ආසවක්ඛය සූත්‍රය

මහණෙනි, මේ දශධර්ම කෙනෙක් භාවිත බහුලීකෘත වූහු ආශ්‍රවක්ෂය සඳහා වැටෙත්. කවර දශ කෙනෙක යත්:

සම්මාදිට්ඨි ය, සම්මාසඞ්කප්ප ය, සම්මාවාචා ය, සම්මාකම්මන්ත ය, සම්මාආජීවය, සම්මාවායාම ය, සම්මාසතිය, සම්මා සමාධිය, සම්මාඤාණය, සම්මාවිමුත්ති යි.

මහණෙනි, මේ දසදහම් භාවිත බහුලීකෘත වූහු ආශ්‍රවක්ෂය පිණිස වැටෙතැයි.

දෙවන පච්චොරොහණ වර්ග යි.

එහි උද්දානය:

අධර්ම සූත්‍ර තුනෙක, අජිත සූත්‍රය, සඞ්ගාරව සූත්‍රය, ඕරිම සූත්‍රය, පච්චොරොහිණි සූත්‍ර දෙකය, පුබ්බඞ්ගම සූත්‍රය ආසව සූත්‍රයද්යි යන දසයයි.

# 3. පරිසුද්ධවග්ගො

## 10. 3. 3. 1
### පඨම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා පරිසුද්ධා පරියොදතා නාඤ්ඤත්‍ර සුගතවිනයා කතමෙ දස:

සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා-ආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සම්මාඤාණං සම්මා විමුත්ති. ඉමෙ ඛො භික්ඛවෙ දසධම්මා පරිසුද්ධා පරියොදතා නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 10. 3. 3. 2
### දුතිය සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා අනුප්පන්නා උප්පජ්ජන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමෙ දස: සම්මාදිට්ඨි –පෙ– සම්මාවිමුත්ති. ඉමෙ ඛො භික්ඛවෙ දසධම්මා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 10. 3. 3. 3
### තතිය සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා මහප්ඵලා මහානිසංසා නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමෙ දස: සම්මාදිට්ඨි –පෙ– සම්මා විමුත්ති. ඉමෙ ඛො භික්ඛවෙ දස ධම්මා මහප්ඵලා මහානිසංසා නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 10. 3. 3. 4
### චතුත්ථ සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා රාගවිනයපරියොසානා හොන්ති, දොසවිනය පරියොසානා හොන්ති, මොහවිනයපරියොසානා හොන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමෙ දස: සම්මාදිට්ඨි –පෙ– සම්මාවිමුත්ති. ඉමෙ ඛො භික්ඛවෙ දසධම්මා රාගවිනයපරියොසානා හොන්ති, දොසවිනයපරියොසානා හොන්ති, මොහවිනයපරියොසානා හොන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

# 3. පරිශුද්ධවර්ගය

## 10. 3. 3. 1
## ප්‍රථම සූත්‍රය

මහණෙනි, සුගත් විනය හැර අන් තන්හි මෙ දස දහම්හු පරිශුද්ධ පර්‍ය්‍යවදාත නො වෙත්. කවර දස කෙනෙක යත්:

සම්මාදිට්ඨි ය, සම්මාසඞ්කප්ප ය, සම්මාවාචා ය, සම්මාකම්මන්ත ය, සම්මා ආජීව ය, සම්මාවායාම ය, සම්මාසති ය, සම්මා සමාධි ය, සම්මාඤාණ ය, සම්මා විමුත්ති යි. මහණෙනි, සුගත් විනය හැර අන් තන්හි මෙ දස දහම්හු පරිශුද්ධ පර්‍ය්‍යවදාත නො වෙතැයි.

## 10. 3. 3. 2
## ද්විතීය සූත්‍රය

මහණෙනි, නූපන් මෙ දස දහම්හු සුගත් විනය හැර අන් තැනක නො උපදනාහ. කවර දස දහමෙක යත්: සම්මාදිට්ඨි... සම්මාවිමුත්තිය. මහණෙනි, නූපන් මෙ දසදහම්හු සුගත් විනය හැර අන් තන්හි නූපදනාහ යි.

## 10. 3. 3. 3
## තෘතීය සූත්‍රය

මහණෙනි, සුගත් විනය හැර අන් තැනක මෙ දසදහම්හු මහත්ඵල මහා නෘශංස නො වෙත්. කවර දස දහමෙක යත්: සම්මාදිට්ඨි ය... සම්මා-විමුත්ති යි. මහණෙනි, සුගත් විනය හැර අන් තන්හි මෙ දසදහම්හු මහත්ඵල මහා නෘශංස නො වෙත් යී.

## 10. 3. 3. 4
## චතුර්ථ සූත්‍රය

මහණෙනි, සුගත් විනය හැර අන් තැනැක මෙ දසදහම්හු රාගවිනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්. ද්වෙෂ විනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්. මොහවිනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්. කවර දස දහමෙක යත්: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, සුගත් විනය හැර අන් තන්හි මෙ දසදහම්හු රාගවිනය පර්‍ය්‍යවසාන කොට, ඇති නො වෙත්. ද්වෙෂ විනය පර්‍ය්‍යවසාන කොට, ඇති නො වෙත්. මොහවිනය පර්‍ය්‍යවසාන කොට, ඇති නො වෙත් යී.

## 10. 3. 3. 5

### පඤ්චම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමෙ දස: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති, ඉමෙ බො භික්ඛවෙ දසධම්මා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 10. 3. 3. 6

### ඡට්ඨම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයා, කතමෙ දස: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. ඉමෙ බො භික්ඛවෙ දසධම්මා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 10. 3. 3. 7

### සත්තම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමෙ දස: සම්මාදිට්ඨි -පෙ- සම්මා විමුත්ති. ඉමෙ බො භික්ඛවෙ දසධම්මා භාවිතා බහුලීකතා මහප්ඵලා හොන්ති මහානිසංසා, නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 10. 3. 3. 8

### අට්ඨම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා රාගවිනයපරියොසානා හොන්ති, දොසවිනයපරියොසානා හොන්ති මොහවිනයපරියොසානා හොන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයා කතමෙ දස: සම්මාදිට්ඨි -පෙ- සම්මා විමුත්ති. ඉමෙ බො භික්ඛවෙ දසධම්මා භාවිතා බහුලීකතා රාගවිනය පරියොසානා හොන්ති, දොසවිනයපරියොසානා හොන්ති, මොහවිනය පරියොසානා හොන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 10. 3. 3. 5

## පඤ්චම සූත්‍රය

මහණෙනි, සුගත් විනය හැර අන් තන්හි මෙ දසදහම්හු එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස ව්‍යුපසමය පිණිස අභිඥ පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස නො වැටෙත්. කවර දස දහමෙක-යත්: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, සුගත් විනය හැර අන් තැනෙක මෙ දසදහම්හු එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස ව්‍යුපශමය පිණිස අභිඥ පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස නො වැටෙති යි.

## 10. 3. 3. 6

## ෂෂ්ඨ සූත්‍රය

මහණෙනි, සුගත් විනය හැර අන් තැනෙක නූපන් මෙ දසදහම්හු භාවිත බහුලීකෘත ව නො උපදනාහ. කවර දස දහමෙක යත්: සම්මාදිට්ඨිය... සම්මාවිමුත්ති යි. මහණෙනි, සුගත් විනය හැර අන් තන්හි නූපන් මෙ දසදහම්හු භාවිත ව බහුලීකෘත ව නූපදනාහ යි.

## 10. 3. 3. 7

## සප්තම සූත්‍රය

මහණෙනි, සුගත් විනය හැර අන් තැනෙක මෙ දසදහම්හු භාවිත ව බහුලීකෘත ව මහත්ඵල මහානෘශංස නො වෙත්. කවර දසදහමෙක යත්: සම්මා දිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, සුගත් විනය හැර අන් තැනෙක මෙ දසදහම්හු භාවිත ව බහුලීකෘත ව මහත්ඵල මහානෘශංස නො වෙති යි.

## 10. 3. 3. 8

## අෂ්ටම සූත්‍රය

මහණෙනි, සුගත් විනය හැර අන් තැනෙක භාවිත බහුලීකෘත මෙ දසදහම්හු රාගවිනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්. දොෂවිනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්. මොහවිනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්. කවර දසදහමෙක යත්: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, සුගත් විනය හැර අන් තැනක භාවිත බහුලීකෘත මෙ දසදහම්හු රාගවිනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්. දොෂවිනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්. මොහවිනය පර්‍ය්‍යවසාන කොට ඇති නො වෙත්.

## 10. 3. 3. 9

### නවම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමෙ දස: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. ඉමෙ ඛො භික්ඛවෙ දසධම්මා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති, නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 10. 3. 3. 10

### දසම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ මිච්ඡත්තා. කතමෙ දස: මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධි මිච්ඡාඤාණං මිච්ඡාවිමුත්ති. ඉමෙ ඛො භික්ඛවෙ දස මිච්ඡත්තාති.

## 10. 3. 3. 11

### එකාදසම සුත්තං

දස ඉමෙ භික්ඛවෙ සම්මත්තා. කතමෙ දස: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සම්මාඤාණං සම්මාවිමුත්ති. ඉමෙ ඛො භික්ඛවෙ දස සම්මත්තාති.

පරිසුද්ධවග්ගො තතියො.

## 10. 3. 3. 9

## නවම සූත්‍රය

මහණෙනි, සුගත් විනය හැර අන් තැනෙක භාවිත බහුලීකෘත මෙ දසදහම්හු එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස ව්‍යුපශමය පිණිස අභිඥ පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස නො වැටෙත්. කවර දසදහමෙක යත්: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, සුගත් විනය හැර අන් තැනෙක භාවිත බහුලීකෘත මෙ දසදහම්හු එකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස ව්‍යුපශමය පිණිස අභිඥ පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස නො වැටෙති යි.

## 10. 3. 3. 10

## දශම සූත්‍රය

මහණෙනි, මේ මිථ්‍යාත්ව දසයෙක. කවර දසයෙක යත්: මිච්ඡාදිට්ඨි ය, මිච්ඡාසඞ්කප්ප ය, මිච්ඡාවාචා ය, මිච්ඡාකම්මන්ත ය, මිච්ඡාආජීව ය, මිච්ඡා වායාම ය, මිච්ඡාසති ය, මිච්ඡාසමාධි ය, මිච්ඡාඤාණ ය, මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ දස මිථ්‍යාත්ව යි.

## 10. 3. 3. 11

## එකාදශ සූත්‍රය

මහණෙනි, මේ සම්‍යක්ත්ව දසයෙක. කවර දසයෙක යත්: සම්මා දිට්ඨි ය, සම්මාසඞ්කප්ප ය සම්මාවාචා ය සම්මාකම්මන්ත ය සම්මාආජීව ය සම්මාවායාම ය සම්මාසති ය සම්මාසමාධි ය සම්මාඤාණ ය සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ දස සම්‍යක්ත්ව යි.

**තෙවැනි පරිසුද්ධවර්ග යි.**

# 4. සාධුවග්ගො

## 10. 3. 4. 1

### සාධු සුත්තං

සාධුඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අසාධුඤ්ච. තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමඤ්ච භික්ඛවෙ අසාධු[1]: මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධි මිච්ඡාඤාණං මිච්ඡාවිමුත්ති. ඉදං වුච්චති භික්ඛවෙ අසාධු[1].

කතමඤ්ච භික්ඛවෙ සාධු:[1] සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සම්මාඤාණං සම්මාවිමුත්ති. ඉදං වුච්චති භික්ඛවෙ සාධූති.

## 10. 3. 4. 2

### අරියධම්ම සුත්තං

අරියධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි[2] අනරියධම්මඤ්ච. තං සුණාථ සාධුකං මනසිකරොථ -පෙ- කතමො ච භික්ඛවෙ අනරියො ධම්මො. මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අනරියො ධම්මො. කතමො ච භික්ඛවෙ අරියො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අරියො ධම්මොති.

## 10. 3. 4. 3

### කුසල සුත්තං

කුසලඤ්ච[3] වො භික්ඛවෙ දෙසිස්සාමි[2] අකුසලඤ්ච.[4] තං සුණාථ -පෙ- කතමඤ්ච භික්ඛවෙ අකුසලං: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. ඉදං වුච්චති භික්ඛවෙ අකුසලං. කතමඤ්ච භික්ඛවෙ කුසලං: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. ඉදං වුච්චති භික්ඛවෙ කුසලන්ති.

---

1. අසාධු-මජසං
2. දෙසෙස්සාමි-මජසං
3. අකුසලඤ්ච-මජසං
4. කුසලඤ්ච-මජසං

# 4. සාධු වර්ගය

## 10. 3. 4. 1

### සාධු සූත්‍රය

මහණෙනි, තොපට සාධුධර්මය හා අසාධු ධර්මය හා දෙසන්නෙමි. එ අසවු, මොනොවට මෙනෙහි කරවු කියන්නෙමි යි. එසේය වහන්සැයි එ මහණහු භාග්‍යවත්නට පිළිවදන් ඇස් වූහ. භාග්‍යවත්හු තෙල වදළ හ. මහණෙනි, අසාධු ධර්මය කවර: මිච්ඡාදිට්ඨි ය, මිච්ඡාසඞ්කප්ප ය, මිච්ඡාවාචා ය, මිච්ඡාකම්මන්ත ය, මිච්ඡාආජීව ය, මිච්ඡාවායාම ය, මිච්ඡාසති ය, මිච්ඡාසමාධි ය, මිච්ඡාඤාණ ය, මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ අසාධු ධර්ම යි කියනු ලැබේ.

මහණෙනි, සාධුධර්ම කවර: සම්මාදිට්ඨි ය සම්මාසඞ්කප්පය සම්මාවාචා ය සම්මාකම්මන්ත ය සම්මාආජීව ය සම්මාවායාමය සම්මාසති ය සම්මාසමාධි ය සම්මාඤාණ ය සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ සාධුධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 4. 2

### අරියධම්ම සූත්‍රය

මහණෙනි, තොපට ආර්‍ය්‍ය ධර්මය හා අනාර්‍ය්‍ය ධර්මය හා දෙසන්නෙමි. එ අසවු මොනොවට මෙනෙහි කරවු... මහණෙනි, අනාර්‍ය්‍යධර්මය කවර: මිච්ඡාදිට්ඨි ය... මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ අනාර්‍ය්‍යධර්ම යි කියනු ලැබේ. මහණෙනි, ආර්‍ය්‍යධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ ආර්‍ය්‍යධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 4. 3

### කුශල සූත්‍රය

මහණෙනි, තොපට කුශල හා අකුශල හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, අකුශල කවර යත්: මිච්ඡාදිට්ඨි ය .. මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ අකුශල යි කියනු ලැබේ. මහණෙනි, කුශල කවර යත්: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ කුශල යි කියනු ලැබේ.

## 10. 3. 4. 4

### අත්ථ සුත්තං

අත්ථඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අනත්ථඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ අනත්ථො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අනත්ථො. කතමො ච භික්ඛවෙ අත්ථො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අත්ථොති.

## 10. 3. 4. 5

### ධම්ම සුත්තං

ධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අධම්මඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ අධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අධම්මො. කතමො ච භික්ඛවෙ ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ ධම්මොති.

## 10. 3. 4. 6

### සාසව සුත්තං

සාසවඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, අනාසවඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ සාසවො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ සාසවො ධම්මො. කතමො ච භික්ඛවෙ අනාසවො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අනාසවො ධම්මොති.

## 10. 3. 4. 7

### සාවජ්ජ සුත්තං

සාවජ්ජඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, අනවජ්ජඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ සාවජ්ජො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ සාවජ්ජො ධම්මො. කතමො ච භික්ඛවෙ අනවජ්ජො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අනවජ්ජො ධම්මොති.

## 10. 3. 4. 4
## අත්ථ සූත්‍රය

මහණෙනි, තොපට අර්ථය හා අනර්ථය හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, අනර්ථය කවර: මිථ්‍යාදිට්ඨි ය... මිථ්‍යාවිමුත්ති යි. මහණෙනි, අනර්ථයි කියනු ලැබේ. මහණෙනි, අර්ථය කවර: සම්මාදිට්ඨි ය... සම්මා විමුත්තිය යි. මහණෙනි, මේ අර්ථය යි කියනු ලැබේ.

## 10. 3. 4. 5
## ධම්ම සූත්‍රය

මහණෙනි, තොපට ධර්මය හා අධර්මය හා දෙසමි. එ අසවු... මහණෙනි, අධර්මය කවර: මිථ්‍යාදිට්ඨි ය... මිථ්‍යාවිමුත්ති යි. මහණෙනි, මේ අධර්ම යි කියනු ලැබේ. මහණෙනි, ධර්මය කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ ධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 4. 6
## සාසව සූත්‍රය

මහණෙනි, තොපට සාස්‍රව ධර්ම හා අනාස්‍රවධර්ම හා දෙසමි. එ අසවු... මහණෙනි, සාස්‍රවධර්ම කවර යත්: මිථ්‍යාදිට්ඨිය... මිථ්‍යාවිමුත්ති යි. මහණෙනි, මේ සාස්‍රවධර්ම යි කියනු ලැබේ. මහණෙනි, අනාස්‍රවධර්ම කවර යත්: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ අනාස්‍රව ධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 4. 7
## සාවජ්ජ සූත්‍රය

මහණෙනි, සාවද්‍යධර්ම හා අනවද්‍යධර්ම හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, සාවද්‍යධර්ම කවර: මිථ්‍යාදිට්ඨි ය... මිථ්‍යාවිමුත්ති යි. මහණෙනි, මේ සාවද්‍යධර්ම යි කියනු ලැබේ. මහණෙනි, අනවද්‍යධර්ම කවර: සම්මා දිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ අනවද්‍යධර්මය යි කියනු ලැබේ.

## 10. 3. 4. 8

## තපනීය සුත්තං

තපනීයඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, අතපනීයඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ තපනීයො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ තපනීයො තපනීයො ධම්මො. කතමො ච භික්ඛවෙ අතපනීයො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අතපනීයො ධම්මොති.

## 10. 3. 4. 9

## ආචයගාමී සුත්තං

ආචයගාමිඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අපචයගාමිඤ්ච. තං සුණාථ -පෙ-කතමො ච භික්ඛවෙ ආචයගාමී ධම්මො: මිච්ඡාදිට්ඨි-පෙ-මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ ආචයගාමී ධම්මො. කතමො ච භික්ඛවෙ අපචයගාමී ධම්මො සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අපචයගාමී ධම්මොති.

## 10. 3. 4. 10

## දුක්ඛුද්‍රය සුත්තං

දුක්ඛුද්‍රයඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, සුඛුද්‍රයඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ දුක්ඛුද්‍රයො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛුද්‍රයො ධම්මො. කතමො ච භික්ඛවෙ සුඛුද්‍රයො ධම්මො. සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ සුඛුද්‍රයො ධම්මොති.

## 10. 3. 4. 11

## දුක්ඛවිපාක සුත්තං

දුක්ඛවිපාකඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, සුඛවිපාකඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ දුක්ඛවිපාකො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛවිපාකො ධම්මො කතමො ච භික්ඛවෙ සුඛ විපාකො ධම්මො: සම්මාදිට්ඨි -පෙ-සම්මාවිමුත්ති අයං වුච්චති භික්ඛවෙ සුඛවිපාකො ධම්මොති.

**සාධුවග්ගො චතුත්ථො.**

## 10. 3. 4. 8
## තපනීය සූත්‍රය

මහණෙනි, තොපට තපනීයධර්ම හා අතපනීයධර්ම හා දෙසමි. එ අසවු... මහණෙනි, තපනීයධර්ම කවර: මිච්ඡාදිට්ඨි ය... මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ තපනීයධර්ම යි කියනු ලැබේ. මහණෙනි, අතපනීයධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ අතපනීයධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 4. 9
## ආචයගාමී සූත්‍රය

මහණෙනි, තොපට ආචයගාමීධර්ම හා අපචයගාමීධර්ම හා දෙසමි. එ අසවු... මහණෙනි, ආචයගාමීධර්ම කවර: මිච්ඡාදිට්ඨිය...මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ ආචයගාමීධර්ම යි කියනු ලැබේ. මහණෙනි, අපචයගාමී ධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ අපචයගාමී ධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 4. 10
## දුක්ඛුද්‍රය සූත්‍රය

මහණෙනි, තොපට දුක් උදකරන ධර්ම හා සුව උදකරන ධර්ම හා දෙසමි. එ අසවු... මහණෙනි, දුක් උදකරන ධර්ම කවර: මිච්ඡාදිට්ඨි ය... මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ දුක් උදකරන ධර්මයි කියනු ලැබේ. මහණෙනි, සුව උදකරන ධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ සුව උදකරන ධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 4. 11
## දුක්ඛවිපාක සූත්‍රය

මහණෙනි, දුක්ඛවිපාකධර්මය හා සුඛවිපාක ධර්මය හා දෙසමි. එ අසවු... මහණෙනි, දුක්ඛවිපාකධර්ම කවර: මිච්ඡාදිට්ඨි ය... මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ දුක්ඛවිපාකධර්ම යි කියනු ලැබේ. මහණෙනි, සුඛ විපාකධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ සුඛ විපාකධර්ම යි කියනු ලැබේ.

**සතරවැනි සාධුවර්ග යි.**

# 5. අරියවග්ගො

## 10. 3. 5. 1

### අරියමග්ග සුත්තං

අරියමග්ගඤ්ච වො භික්ඛවෙ[1] දෙසිස්සාමි, අනරියමග්ගඤ්ච. තං සුණාථ –පෙ– කතමො ච භික්ඛවෙ අනරියමග්ගො: මිච්ඡාදිට්ඨි –පෙ– මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අනරියො මග්ගො. කතමො ච භික්ඛවෙ අරියො මග්ගො: සම්මාදිට්ඨි –පෙ– සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අරියො මග්ගොති.

## 10. 3. 5. 2

### සුක්කමග්ග සුත්තං

සුක්කමග්ගඤ්ච[2] වො භික්ඛවෙ[1] දෙසිස්සාමි කණ්හමග්ගඤ්ච[3]. කතමො ච භික්ඛවෙ කණ්හමග්ගො: මිච්ඡාදිට්ඨි –පෙ– මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ කණ්හමග්ගො. කතමො ච භික්ඛවෙ සුක්කමග්ගො: සම්මාදිට්ඨි –පෙ– සම්මා විමුත්ති. අයං වුච්චති භික්ඛවෙ සුක්කමග්ගොති.

## 10. 3. 5. 3

### සද්ධම්ම සුත්තං

සද්ධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අසද්ධම්මඤ්ච. තං සුණාථ –පෙ– කතමො ච භික්ඛවෙ අසද්ධම්මො: මිච්ඡාදිට්ඨි –පෙ– මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අසද්ධම්මො, කතමො ච භික්ඛවෙ සද්ධම්මො: සම්මාදිට්ඨි –පෙ– සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ සද්ධම්මොති.

---

1. භික්ඛවෙ ධම්මං–මජසං
2. සුක්කමග්ගඤ්ච–මජසං
3. කණ්හමග්ගඤ්ච–මජසං

# 5. අරියවග්ගය

## 10. 3. 5. 1

## අරියමග්ග සූත්‍රය

මහණෙනි, තොපට ආර්‍ය්‍යමාර්ගය හා අනාර්‍ය්‍යමාර්ගය හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, අනාර්‍ය්‍යමාර්ග කවර: මිථ්‍යාදිට්ඨි ය... මිථ්‍යාවිමුත්ති යි. මහණෙනි, මේ අනාර්‍ය්‍යමාර්ග යි කියනු ලැබේ. මහණෙනි, ආර්‍ය්‍යමාර්ග කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ ආර්‍ය්‍යමාර්ග යි කියනු ලැබේ.

## 10. 3. 5. 2

## සුක්කමග්ග සූත්‍රය

මහණෙනි, තොපට ශුක්ලමාර්ගය හා කෘෂ්ණමාර්ගය හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, කෘෂ්ණමාර්ගය කවර: මිථ්‍යාදිට්ඨිය... මිථ්‍යාවිමුත්ති යි. මහණෙනි, මේ කෘෂ්ණමාර්ග යි කියනු ලැබේ. මහණෙනි, ශුක්ලමාර්ග කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ ශුක්ලමාර්ග යි කියනු ලැබේ.

## 10. 3. 5. 3

## සද්ධම්ම සූත්‍රය

මහණෙනි, තොපට සද්ධර්මය හා අසද්ධර්මය හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, අසද්ධර්ම කවර: මිථ්‍යාදිට්ඨි ය... මිථ්‍යාවිමුත්ති යි. මහණෙනි, මේ අසද්ධර්ම යි කියනු ලැබේ. මහණෙනි, සද්ධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ සද්ධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 5. 4

### සප්පුරිසධම්ම සුත්තං

සප්පුරිසධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අසප්පුරිසධම්මඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ අසප්පුරිසධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. කතමො ච භික්ඛවෙ සප්පුරිසධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසධම්මොති.

## 10. 3. 5. 5

### උප්පාදෙතබ්බ සුත්තං

උප්පාදෙතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, න උප්පාදෙතබ්බඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ න උප්පාදෙතබ්බො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ න උප්පාදෙතබ්බො ධම්මො. කතමො ච භික්ඛවෙ උප්පාදෙතබ්බො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ උප්පාදෙතබ්බො ධම්මොති.

## 10. 3. 5. 6

### ආසෙවිතබ්බ සුත්තං

ආසෙවිතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, න සෙවිතබ්බඤ්ච. තං සුණාථ. -පෙ- කතමො ච භික්ඛවෙ න සෙවිතබ්බො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ න සෙවිතබ්බො ධම්මො. කතමො ච භික්ඛවෙ ආසෙවිතබ්බො ධම්මො; සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ ආසෙවිතබ්බො ධම්මොති.

## 10. 3. 5. 7

### භාවෙතබ්බ සුත්තං

භාවෙතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි න භාවෙතබ්බඤ්ච: තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ න භාවෙතබ්බො ධම්මො. මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ න භාවෙතබ්බො ධම්මො. කතමො ච භික්ඛවෙ භාවෙතබ්බො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ භාවෙතබ්බො ධම්මොති.

## 10. 3. 5. 4

## සප්පුරිසධම්ම සූත්‍රය

මහණෙනි, තොපට සත්පුරුෂධර්මය හා අසත්පුරුෂධර්මය හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, අසත්පුරුෂධර්ම කවර: මිථ්‍යාදිට්ඨි ය... මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ අසත්පුරුෂධර්ම යි කියනු ලැබේ. මහණෙනි, සත්පුරුෂධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ සත්පුරුෂධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 5. 5

## උප්පාදෙතබ්බ සූත්‍රය

මහණෙනි, තොපට ඉපදවියයුතු දහම් හා නො ඉපදවිය යුතු දහම් හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, නො ඉපැදවියයුතු දහම් කවර: මිච්ඡාදිට්ඨි ය... මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ නො ඉපිදවිය යුතු දහමැයි කියනු ලැබේ. මහණෙනි, ඉපදවියයුතු දහම් කවර: සම්මාදිට්ඨි ය... සම්මා විමුත්ති යි. මහණෙනි, මේ ඉපදවිය යුතු දහමැ යි. කියනු ලැබේ.

## 10. 3. 5. 6

## ආසෙවිතබ්බ සූත්‍රය

මහණෙනි, තොපට සෙවිය යුතු දහම් හා නො සෙවිය යුතු දහම් හා දෙසන්නෙමි. එ අසවු... මහණෙනි, නො සෙවිය යුතු දහම් කවර: මිච්ඡා දිට්ඨි ය... මිච්ඡාවිමුත්ති යි. මහණෙනි, මේ නො සෙවිය යුතු දහමැ යි කියනු ලැබේ. මහණෙනි, සෙවිය යුතු දහම් කවර: සම්මාදිට්ඨි ය... සම්මා විමුත්ති යි. මහණෙනි, මේ සෙවිය යුතු දහමැ යි කියනු ලැබේ.

## 10. 3. 5. 7

## භාවෙතබ්බ සූත්‍රය

මහණෙනි, තොපට භාවයිතව්‍යධර්ම හා න භාවයිතව්‍යධර්ම හා දෙසමි. එ අසවු... මහණෙනි, න භාවයිතව්‍යධර්ම කවර: මිච්ඡාදිට්ඨි ය... මිච්ඡා-විමුත්ති යි. මහණෙනි, මේ න භාවයිතව්‍යධර්මයි කියනු ලැබේ. මහණෙනි, භාවයිතව්‍යධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මේ භාවයිතව්‍යධර්ම යි කියනු ලැබේ.

## 10. 3. 5. 8

## බහුලීකත්තබ්බ සුත්තං

බහුලීකත්තබ්බඤ්ච[1] වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, න බහුලීකත්තබ්බඤ්ච[1] තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ න බහුලීකත්තබ්බො ධම්මො මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ න බහුලීකත්තබ්බො ධම්මො. කතමො ච භික්ඛවෙ බහුලීකත්තබ්බො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ බහුලීකත්තබ්බො ධම්මොති.

## 10. 3. 5. 9

## අනුස්සරිතබ්බ සුත්තං

අනුස්සරිතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, නානුස්සරිතබ්බඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ නානුස්සරිතබ්බො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ නානුස්සරිතබ්බො ධම්මො. කතමො ච භික්ඛවෙ අනුස්සරිතබ්බො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ අනුස්සරිතබ්බො ධම්මොති.

## 10. 3. 5. 10

## සච්ඡිකාතබ්බ සුත්තං

සච්ඡිකාතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, න සච්ඡිකාතබ්බඤ්ච. තං සුණාථ -පෙ- කතමො ච භික්ඛවෙ න සච්ඡිකාතබ්බො ධම්මො: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ න සච්ඡිකාතබ්බො ධම්මො. කතමො ච භික්ඛවෙ සච්ඡිකාතබ්බො ධම්මො: සම්මාදිට්ඨි -පෙ- සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ සච්ඡිකාතබ්බො ධම්මොති.

**අරියවග්ගො පඤ්චමො.**

**තතියො පණ්ණාසකො.**

1. කාතබ්බඤ්ච-මජසං

## 10. 3. 5. 8
## බහුලීකත්තබ්බ සූත්‍රය

මහණෙනි, තොපට බහුලීකර්තව්‍යධර්ම හා අබහුලීකර්තව්‍යධර්ම හා දෙසමි. එ අසවු... මහණෙනි, අබහුලීකර්තව්‍ය ධර්ම කවර: මිථ්‍යාදිට්ඨි ය... මිථ්‍යා විමුත්ති යි. මහණෙනි, මෙ අබහුලීකර්තව්‍යධර්ම යි කියනු ලැබෙ. මහණෙනි, බහුලීකර්තව්‍යධර්ම කවර: සම්‍යග්දිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මෙ බහුලීකර්තව්‍යධර්ම යි කියනු ලැබෙ.

## 10. 3. 5. 9
## අනුස්සරිතබ්බ සූත්‍රය

මහණෙනි, තොපට අනුස්මර්තව්‍යධර්ම හා නානුස්මර්තව්‍යධර්ම හා දෙසමි. එ අසවු... මහණෙනි, නානුස්මර්තව්‍යධර්ම කවර: මිථ්‍යාදිට්ඨි ය... මිථ්‍යා විමුත්ති යි. මහණෙනි, මෙ නානුස්මර්තව්‍යධර්ම යි කියනු ලැබෙ. මහණෙනි, අනුස්මර්තව්‍යධර්ම කවර: සම්‍යග්දිට්ඨි ය... සම්මාවිමුත්ති යි. මහණෙනි, මෙ අනුස්මර්තව්‍යධර්ම යි කියනු ලැබෙ.

## 10. 3. 5. 10
## සච්ඡිකාතබ්බ සූත්‍රය

මහණෙනි, තොපට සාක්ෂාත්කර්තව්‍යධර්ම හා න සාක්ෂාත්කර්තව්‍යධර්ම හා දෙසමි. එ අසවු... මහණෙනි, න සාක්ෂාත්කර්තව්‍යධර්ම කවර: මිථ්‍යා දිට්ඨි ය... මිථ්‍යාවිමුත්ති යි. මහණෙනි, මෙ න සාක්ෂාත්කර්තව්‍යධර්ම යි කියනු ලැබෙ. මහණෙනි, සාක්ෂාත් කර්තව්‍යධර්ම කවර: සම්මාදිට්ඨි ය... සම්මා විමුත්ති යි. මහණෙනි, මෙ සාක්ෂාත් කර්තව්‍යධර්ම යි.

පස්වැනි ආයර්‍ය්‍යවර්ග යි.

**තෙවන පණ්ණාසක යි.**

## චතුත්ථ පණ්ණාසකො

# පුග්ගලවග්ගො

### 10. 4. 1. 1

### සෙවිතබ්බ සුත්තං

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පුග්ගලො න සෙවිතබ්බො. කතමෙහි දසහි: මිච්ඡාදිට්ඨිකො හොති, මිච්ඡාසඞ්කප්පො හොති, මිච්ඡා වාචො හොති, මිච්ඡාකම්මන්තො හොති, මිච්ඡාආජීවො හොති, මිච්ඡා-වායාමො හොති, මිච්ඡාසති හොති, මිච්ඡාසමාධි හොති, මිච්ඡාඤාණී හොති, මිච්ඡාවිමුත්ති හොති. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො න සෙවිතබ්බො.

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පුග්ගලො සෙවිතබ්බො, කතමෙහි දසහි: සම්මාදිට්ඨිකො හොති, සම්මාසඞ්කප්පො හොති, සම්මා වාචො හොති, සම්මාකම්මන්තො හොති, සම්මාආජීවො හොති, සම්මා වායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සම්මාඤාණී හොති, සම්මාවිමුත්ති හොති. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො සෙවිතබ්බොති.

### 10. 4. 1. 2- 12

### භජිතබ්බාදි සුත්තානි

2. දසහි භික්ඛවෙ සමන්නාගතො පුග්ගලො න භජිතබ්බො -පෙ- භජිතබ්බොති.

3. න පයිරුපාසිතබ්බො -පෙ- පයිරුපාසිතබ්බොති.

4. න පුජ්ජො හොති -පෙ- පුජ්ජො හොතීති.

5. න පාසංසො හොති -පෙ- පාසංසො හොතීති.

6. අගාරවො හොති -පෙ- සගාරවො හොතීති.

# සතරවැනි පණ්ණාසකය

# පුග්ගල වර්ගය

## 10. 4. 1. 1

### සෙවිතබ්බ සූත්‍රය

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත පුද්ගල නො සෙවිය යුතු වෙයි. කවර දස කරුණෙකින යත්: මිථ්‍යාදෘෂ්ටික වෙයි, මිථ්‍යා සඞ්කල්ප ඇතියේ වෙයි, මිථ්‍යාවචන ඇතියේ වෙයි, මිථ්‍යා කර්මාන්ත ඇතියේ වෙයි, මිථ්‍යාආජීව ඇතියේ වෙයි, මිථ්‍යාව්‍යායාම ඇතියේ වෙයි, මිථ්‍යා ස්මෘති ඇතියේ වෙයි, මිථ්‍යාසමාධි ඇතියේ වෙයි, මිථ්‍යා ඥාන ඇතියේ වෙයි මිථ්‍යාවිමුක්ති ඇතියේ වෙයි. මහණෙනි, මෙ දසකරුණින් සමන්වාගත පුද්ගල නො සෙවිය යුතු වේ යයි.

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත පුද්ගල සෙවියයුත්තේ වෙයි, කවර දස කරුණෙකින යත්: සම්‍යග්දෘෂ්ටි ඇතියේ වෙයි, සම්‍යග් සඞ්කල්ප ඇතියේ වෙයි, සම්‍යග්වචන ඇතියේ වෙයි, සම්‍යග්කර්මාන්ත ඇතියේ වෙයි, සම්‍යග්ආජීව ඇතියේ වෙයි, සම්‍යග්ව්‍යායාම ඇතියේ වෙයි, සම්‍යග්ස්මෘති ඇතියේ වෙයි. සම්‍යග්සමාධි ඇතියේ වෙයි, සම්‍යග්ඥාන ඇතියේ වෙයි, සම්‍යග්විමුක්ති ඇතියේ වෙයි. මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත පුද්ගල සෙවිය යුතු වේ යයි.

## 10. 4. 1. 2–12

### භජිතබ්බාදි එකොළොස් සූත්‍රයෝ

2. මහණෙනි, දසකරුණෙකින් සමන්වාගත පුද්ගල භජිතව්‍ය නො වෙයි ... භජිතව්‍ය වෙයි.

3. පර්යුපාසිතව්‍ය නොවෙයි ... පර්යුපාසිතව්‍ය වේ.

4. පූජ්‍ය නො වෙයි...පූජ්‍ය වේ.

5. ප්‍රශංසාර්හ නො වෙයි...ප්‍රශංසාර්හ වේ.

6. ගෞරව නැතියේ වෙයි...ගෞරව සහිත වේ.

7. අප්පතිස්සො[1] හොති -පෙ- සප්පතිස්සො[2] හොතීති.

8. නාරාධකො හොති -පෙ- ආරාධකො හොතීති.

9. න විසුජ්ඣති -පෙ- විසුජ්ඣතීති.

10. මානං නාධිහොති -පෙ- මානං අධිහොතීති.

11. පඤ්ඤාය න වඩ්ඪති -පෙ- පඤ්ඤාය වඩ්ඪතීති.

12. බහුං අපුඤ්ඤං පසවති -පෙ- බහුං පුඤ්ඤං පසවති. කතමෙහි දසහි: සම්මාදිට්ඨිකො හොති, සම්මාසඞ්කප්පො හොති, සම්මාවාචො හොති, සම්මා කම්මන්තො හොති, සම්මා ආජීවො හොති, සම්මා වායාමො හොති, සම්මාසති හොති, සම්මාසමාධි හොති, සම්මාඤාණී හොති, සම්මාවිමුත්ති හොති, ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො බහුං පුඤ්ඤං පසවතීති.

**පුග්ගලවග්ගො පඨමො.**

1. අප්පතිකෙඛා - සිමු. 2. සප්පතිකෙඛා - සිමු.

7. ප්‍රතිශ්‍රය නැතියේ වෙයි...ප්‍රතිශ්‍රය සහිත වේ.

8. අනාරාධකවෙයි...ආරාධක වේ.

9. විශුද්ධ නො වෙයි...විශුද්ධ වේ.

10. මානස මඩනේය...මානස නො මඩනේයි.

11. ප්‍රඥ නො වඩනේය...ප්‍රඥ වඩනේයි.

12. බොහෝපව් රැස් කෙරෙයි...බොහෝ පින් රැස් කෙරේ ... කවර දසයෙකින යත්: සම්‍යග්දෘෂ්ටික වෙයි, සම්‍යග්සංකල්ප ඇතියේ වෙයි, සම්‍යග්වචන ඇතියේ වෙයි, සම්‍යග්කර්මාන්ත ඇතියේ වෙයි, සම්‍යග්ආජීව ඇතියේ වෙයි, සම්‍යග්ව්‍යායාම ඇතියේ වෙයි, සම්‍යග්ස්මෘති ඇතියේ වෙයි, සම්‍යග්සමාධි ඇතියේ වෙයි, සම්‍යග්ඥාන ඇතියේ වෙයි, සම්‍යග්විමුක්ති ඇතියේ වෙයි. මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත පුද්ගල බොහෝ පින් රැස් කෙරේ යයි.

## පළමුවැනි පුද්ගල වර්ග යි.

# ජාණුස්සොණි වග්ගො

## 10. 4. 2. 1

## බ්‍රාහ්මණ පච්චොරොහණී සුත්තං

තෙන ඛො පන සමයෙන ජාණුස්සොණි බ්‍රාහ්මණො තදහුපොසථෙ සීසං නහාතො[1] නවං ඛොමයුගං නිවත්ථො අල්ලං කුසමුට්ඨිං ආදාය භගවතො අවිදූරෙ එකමන්තං ඨිතො හොති.

අද්දසා ඛො භගවා ජාණුස්සොණිං බ්‍රාහ්මණං තදහුපොසථෙ සීසං නහාතං[2] නවං ඛොමයුගං නිවත්ථං අල්ලං කුසමුට්ඨිං ආදාය එකමන්තං ඨිතං දිස්වා ජාණුස්සොණිං බ්‍රාහ්මණං එතදවොච:

කිං නු ඛො ත්වං බ්‍රාහ්මණ තදහුපොසථෙ සීසං නහාතො නවං ඛොමයුගං නිවත්ථො අල්ලං කුසමුට්ඨිං ආදාය එකමන්තං ඨිතො, කින්වජ්ජ[3] බ්‍රාහ්මණ බ්‍රාහ්මණ කුලස්සාති.[4]

පච්චොරොහණී භො ගොතම අජ්ජ බ්‍රාහ්මණ කුලස්සා’ති.

යථා කථං පන බ්‍රාහ්මණ බ්‍රාහ්මණානං පච්චොරොහණී හොතීති?

ඉධ භො ගොතම බ්‍රාහ්මණා තදහුපොසථෙ සීසං නහාතා නවං ඛොමයුගං නිවත්ථා අල්ලෙන ගොමයෙන පඨවිං ඔපුඤ්ජිත්වා[5] හරිතෙහි කුසෙහි පත්ථරිත්වා අන්තරා ච වෙලං අන්තරා ච අග්‍යාගාරං සෙය්‍යං කප්පෙන්ති, තෙ තං රත්තිං තික්ඛත්තුං පච්චුට්ඨාය පඤ්ජලිකා අග්ගිං නමස්සන්ති “පච්චොරොහාම භවන්තං පච්චොරොහාම භවන්ත”න්ති. පහූතෙන ච සප්පිතෙලෙන නවනීතෙන අග්ගිං සන්තප්පෙන්ති. තස්සා ච රත්තියා තෙන පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන බ්‍රාහ්මණෙ සන්තප්පෙන්ති. එවං ඛො භො ගොතම බ්‍රාහ්මණානං පච්චොරොහණී හොතීති.

අඤ්ඤථා ඛො බ්‍රාහ්මණ බ්‍රාහ්මණානං පච්චොරොහණී, අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති.

යථා කථං පන භො ගොතම අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති, සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථා අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති.

---

1. නහාතො– මජසං.
2. නහාතං– මජසං.
3. කිනවජජබ්‍රාහ්මණකුලසසාති– මජසං.
4. කුලස්සාති පුච්ඡි– සීමු.
5. ඔපුඤ්ජිත්වා– මජසං.

# ජාණුසෝණි වර්ගය

## 10. 4. 2. 1

### බ්‍රාහමණ පච්චාරෝහණී සූත්‍රය

එ සමයෙහි ජාණුසොණි බ්‍රාහමණ එ පොහෝ දවස්හි ශීර්ෂස්නාන කෙළේ නවකොමුපිළී යුවලක් හැඳ අමු හීතණ මිටක් රැගෙන භාග්‍යවතුන්වහන්සේගේ නුදුරෙහි එකත්පස් ව සිටියේ වෙයි.

භාග්‍යවතුන්වහන්සේ එ පොහෝ දවස්හි ශීර්ෂ ස්නාන කළ නවකොමු පිළී සහලක් හැඳි අමු හීතණ මිටක් ගෙන එකත්පසෙක සිටි ජාණුසොණි බමුණු දුටු සේක. දැක ජාණුසොණි බමුණුහට මෙසේ වදාළ සේක:

බ්‍රාහමණය, තෝ එපොහෝ දවස්හි ශීර්ෂස්නාන කෙළේ, නවකොමු පිළී සහලක් හැඳ අමු හීතණ මිටක් ගෙන කවර හෙයින් එකත්පස්හි සිටියෙහිද'යි? බ්‍රාහමණය, අද බ්‍රාහමණ කුලයට කුමක් වේ දැයි?

භවත් ගෞතමයන්වහන්ස, අද බ්‍රාහමණ කුලයට පාපයන්ගේ ප්‍රත්‍යවරෝහණීය (ශොධනය) වේ යයි.

බ්‍රාහමණය, බ්‍රාහමණයන්ගේ ප්‍රත්‍යවරෝහණීය කවර පරිද්දෙකින් වේ දැයි?

භවත් ගෞතමයන් වහන්ස, මෙ ලොව්හි බමුණෝ ඒ පොහෝ දවස්හි හිස් සෝද නහා නවකොමුපිළී සහල හැඳියාහු අමු ගොමින් බිම පිරිබඩ කොට නිල් කුසතණින් අතුරා වැලි ඉවුරු හා ගිනිහල් ගෙය හා අතර ශය්‍යා කෙරෙත්. ඔහු ඒ රෑ තෙවරක් නැඟී සිට බැඳැදිලි ව ගිනිදෙවි වඳනාහ. ''භවත්හට ප්‍රත්‍යවරෝහණය (පාපශොධන) කරම්හ, භවත්හට ප්‍රත්‍යවරෝහණය කරම්හ''යි. බොහෝ ගිතෙලිනුදු වෙඬරුයෙනුදු ගිනිදෙවියා සතප්වති. එ රෑ ඇවෑමෙන් ඒ පිණී කෑ යුතු දැයින් හා ඛාදිය යුතු දැයින් බමුණනුදු සතප්වති. භවත් ගෞතමයන්වහන්ස, මෙසෙයින් බමුණන්ගේ ප්‍රත්‍යවරෝහණය වේ යයි.

බ්‍රාහමණය බමුණන්ගේ ප්‍රත්‍යවරෝහණය අන්පරිදි වෙයි. ආර්‍ය්‍ය-යන්ගේ විනයෙහි ප්‍රත්‍යවරෝහණය අන් පරිදි වේ යයි.

භවත් ගෞතමයන් වහන්ස, ආර්‍ය්‍යයන්ගේ විනයෙහි ප්‍රත්‍යවරෝහණය කිසෙයින් වේ දැයි? භවත් ගෞතමයන්වහන්සේ ආර්‍ය්‍යයන්ගේ විනයෙහි යම් පරිදි ප්‍රත්‍යවරෝහණය වේ නම් එ පරිදි මට දහම් දෙසන සේක් නම් මැනැවැ යි.

තෙන හි බ්‍රාහමණ සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවම්හොති බො ජාණුස්සොණි බ්‍රාහමණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

ඉධ බ්‍රාහමණ අරියසාවකො ඉති පටිසංචික්ඛති: පාණාතිපාතස්ස බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉතිපටිසඞ්ඛාය පාණාතිපාතං පජහති, පාණාතිපාතා පච්චොරොහති, අදින්නාදානස්ස බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය අදින්නාදානං පජහති, අදින්නාදානා පච්චොරොහති, කාමෙසු මිච්ඡාචාරස්ස බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය කාමෙසු මිච්ඡාචාරං පජහති, කාමෙසු මිච්ඡාචාරා පච්චොරොහති. මුසාවාදස්ස බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති, සො ඉති පටිසඞ්ඛාය මුසාවාදං පජහති, මුසාවාද පච්චොරොහති, පිසුනාය වාචාය බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය පිසුනං වාචං පජහති. පිසුනාය වාචාය පච්චොරොහති. ඵරුසාය වාචාය බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය ඵරුසං වාචං පජහති, ඵරුසාය වාචාය පච්චොරොහති, සම්ඵප්පලාපස්ස බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය සම්ඵප්පලාපං පජහති, සම්ඵප්පලාපා පච්චොරොහති, අභිජ්ඣාය බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය අභිජ්ඣං පජහති, අභිජ්ඣාය පච්චොරොහති. ව්‍යාපාදස්ස බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති, සො ඉති පටිසඞ්ඛාය ව්‍යාපාදං පජහති, ව්‍යාපාද පච්චොරොහති, මිච්ඡාදිට්ඨියා බො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති, සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාදිට්ඨිං පජහති, මිච්ඡාදිට්ඨියා පච්චොරොහති, එවං බො බ්‍රාහමණ අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති.

අඤ්ඤථා හො ගොතම බ්‍රාහමණානං පච්චොරොහණී, අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ පච්චොරොහණී හොතීති. ඉමිස්සා ච හො ගොතම අරියස්ස විනයෙ පච්චොරොහණියා බ්‍රාහමණානං පච්චොරොහණී කලං නාගඝති සොළසිං.

අභික්කන්තං හො ගොතම –පෙ– උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

බමුණ, එසේ නම් අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමියි පින්වතුන් වහන්ස, එසේයැ යි ජාණුසොණි බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස් වී ය. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක.

බමුණ, මෙ සස්නෙහි අරිසවු මෙසේ නුවණින් සලකන්නේ ය. පණිවායෙහි ලාමක විපාක ඉහාත්මයෙහිත් අභිසම්පරාහිත් වේ මැ යි, හේ මෙසේ නුවණින් සලකා පණිවා හැරලයි. පණිවායෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙ යි. අයිනාදන්හුගේ ලාමක විපාක ඉහාත්මයෙහි හා අභිසම්පරාහි හා වෙයි, හේ මෙසේ නුවණින් සලකා අයිනාදන් හැර ල යි. අයිනාදනින් ප්‍රත්‍යවරොහණ කෙරෙයි. කාමයෙහි මිසහසරෙහි ලාමක විපාක දිටුදැමියෙහි හා සම්පරාහි හා වෙයි, හේ මෙසේ නුවණින් සලකා කාමයෙහි මිසහසර හැරලයි. කාමයෙහි මිසහසරින් ප්‍රත්‍යවරොහණ කෙරෙ යි. මුසවායෙහි ලාමක විපාක දිටුදැමියෙහි හා අභිසම්පරාහි හා වෙයි, හේ මෙසේ නුවණින් සලකා මුසවා හැරලයි. මුසවායෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි. පිසුණු බස් හි ලාමක විපාක දිටුදැමියෙහි හා සම්පරාහි හා වෙයි, හේ මෙසේ නුවණින් සලකා පිසුනු බස් හැර ලයි. පිසුනු බසින් ප්‍රත්‍යවරොහණ කරයි. පරොස්බස්හි ලාමක විපාක දිටුදැමියෙහි හා සම්පර හි හා වෙයි, හේ මෙසේ නුවණින් සලකා පරොස්බස් හැරලයි. පරොස්බසින් ප්‍රත්‍යවරොහණ කෙරෙයි. සම්ඵප්‍රලාපයාගේ ලාමක විපාක දිටුදැමියෙහි හා සම්පරාහි හා වෙයි, හේ මෙසේ නුවණින් සලකා සම්ඵප්‍රලාපය හැරලයි. සම්ඵප්‍රලාපයෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙ යි. අභිධ්‍යාවගේ ලාමක විපාක දිටුදැමියෙහි හා සම්පරාහි හා වෙයි, හේ මෙසේ නුවණින් සලකා අභිධ්‍යා හැරලයි. අභිධ්‍යායෙන් ප්‍රත්‍යාවරොහණය කෙරෙයි. ව්‍යාපාදයාගේ ලාමක විපාක ඉහාත්මයෙහි හා සම්පරාහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා ව්‍යාපාදය හැරලයි. ව්‍යාපාදයෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි. මිථ්‍යාදෘෂ්ටිහුගේ ලාමක විපාක ඉහාත්මයෙහි හා සම්පරාහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාදෘෂ්ටිය හැරලයි. මිථ්‍යාදෘෂ්ටියෙන් ප්‍රත්‍යවරොහණ කෙරෙයි. බමුණ මෙසේ ආර්‍ය්‍යයන්ගේ විනයෙහි ප්‍රත්‍යවරොහණ වේ යයි.

පින්වත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයන්ගේ ප්‍රත්‍යවරොහණය අන්පරිදි වෙයි. ආර්‍ය්‍යවිනයෙහි ප්‍රත්‍යවරොහණය අන් පරිදි ම වෙයි. ආර්‍ය්‍යවිනයෙහි එන මේ ප්‍රත්‍යවරොහණයේ සොළොස්වන කලාවට ද බ්‍රාහ්මණයන්ගේ ප්‍රත්‍යවරොහණය නො අගනේ යි.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව ... භවත් ගෞතමයන් වහන්සේ අද සිට මා දිවිහිමියෙන් (තෙරුවන්) සරණ ගිය උවසු කොට දරන සේක්වා යි.

## 10. 4. 2. 2

## අරියපච්චොරොහණී සුත්තං

අරියං වො භික්ඛවෙ පච්චොරොහණිං දෙසිස්සාමි, තං සුණාථ -පෙ- භගවා එතදවොච.

ඉධ භික්ඛවෙ අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: පාණාතිපාතස්ස ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය පාණාතිපාතං පජහති. පාණාතිපාතා පච්චොරොහති -පෙ- මිච්ඡාදිට්ඨියා ඛො පාපකො විපාකො දිට්ඨෙ චෙව ධම්මෙ අභිසම්පරායඤ්චාති. සො ඉති පටිසඞ්ඛාය මිච්ඡාදිට්ඨිං පජහති, මිච්ඡාදිට්ඨියා පච්චොරොහති. අයං වුච්චති භික්ඛවෙ අරියා පච්චොරොහණීති.

## 10. 4. 2. 3

## සඞ්ගාරව සුත්තං

අථ ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි -පෙ- එකමන්තං නිසින්නො ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. කින්නු ඛො භො ගොතම ඕරිමං තීරං? කිං පාරිමං තීරන්ති?

පාණාතිපාතො ඛො බ්‍රාහ්මණ ඕරිමං තීරං, පාණාතිපාතා වෙරමණී පාරිමං තීරං. අදින්නාදානං ඛො බ්‍රාහ්මණ ඕරිමං තීරං, අදින්නාදානා වෙරමණී පාරිමං තීරං. කාමෙසු මිච්ඡාචාරො ඛො බ්‍රාහ්මණ ඕරිමං තීරං, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී පාරිමං තීරං. මුසාවාදො ඕරිමං තීරං, මුසාවාදා වෙරමණී පාරිමං තීරං. පිසුනාවාචා ඕරිමං තීරං පිසුනාය වාචාය වෙරමණී පාරිමං තීරං. ඵරුසා වාචා ඕරිමං තීරං, ඵරුසාය වාචාය වෙරමණී පාරිමං තීරං. සම්ඵප්පලාපො ඕරිමං තීරං, සම්ඵප්පලාපා වෙරමණී පාරිමං තීරං. අභිජ්ඣා ඕරිමං තීරං. අනභිජ්ඣා පාරිමං තීරං. ව්‍යාපාදො ඕරිමං තීරං, අව්‍යාපාදො පාරිමං තීරං. මිච්ඡාදිට්ඨි ඕරිමං තීරං, සම්මාදිට්ඨි පාරිමං තීරං, ඉදං ඛො බ්‍රාහ්මණ ඕරිමං තීරං, ඉදං පාරිමං තීරන්ති.

## 10. 4. 2. 2
## අරිය පච්චෝරෝහණී සූත්‍රය

මහණෙනි, තොපට ආර්‍ය්‍යප්‍රත්‍යවරෝහණය දෙසන්නෙමි. එය අසවු... භාග්‍යවතුන්වහන්සේ තෙල වදළ සේක:

මහණෙනි, මෙ සස්නෙහි අරීයවු මෙසේ නුවණින් සලකයි. ප්‍රාණඝාතයාගේ ලාමක විපාක දිටුදැමියෙහි හා සම්පරායෙහි හා වෙයි, හේ මෙසේ නුවණින් සලකා පණිවා හැර ලයි. ප්‍රාණඝාතයෙන් ප්‍රත්‍යවරෝහණ කරයි....මිථ්‍යාදෘෂ්ටියගේ ලාමක විපාක දිටුදැමියෙහි හා සම්පරායෙහි හා වෙයි. හේ මෙසේ නුවණින් සලකා මිථ්‍යාදෘෂ්ටිය හැර ලයි. මිසදිටුයෙන් ප්‍රත්‍යවරෝහණ කරයි. මහණෙනි, මේ ආර්‍ය්‍යප්‍රත්‍යවරෝහණය යි කියනු ලැබෙ.

## 10. 4. 2. 3
## සංගාරව සූත්‍රය

එකල්හි සඞ්ගාරව බ්‍රාහ්මණ භාග්‍යවතුන්වහන්සේ කරා එළඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය ... එකත්පස් ව හුන් සඞ්ගාරව බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැළ කෙළේ ය. පින්වත් ගෞතමයන් වහන්ස, ඔරිමතීරය කවරේය, පාරිමතීරය කවරේය යි?

බ්‍රාහ්මණය, ප්‍රාණඝාතය ඔරිමතීරය යි. ප්‍රාණඝාතයෙන් විරමණය පාරිමතීරය යි. බ්‍රාහ්මණය, අයිනාදන් ඔරිමතීරය යි. අයිනාදනින් විරමණය පාරිමතීරය යි. බ්‍රාහ්මණය, කාමමිථ්‍යාචාරය ඔරිමතීරය යි. කාමමිථ්‍යාචාරයෙන් විරමණය පාරිමතීරය යි. බ්‍රාහ්මණය, මුසාවාදය ඔරිමතීරය යි. මුසාවාදයෙන් විරමණය පාරිමතීරය යි. පිසුනුබස ඔරිමතීරය යි. පිසුනුබසින් විරමණය පාරිමතීරය යි. පරොස්බස ඔරිමතීරය යි. පරොස්බසින් විරමණය පාරිමතීරය යි. සම්ඵප්‍රලාපය ඔරිමතීරය යි. සම්ඵප්‍රලාපයෙන් විරමණය පාරිමතීරය යි. අභිධ්‍යාව ඔරිමතීරය යි. අනභිධ්‍යාව පාරිමතීරය යි. ව්‍යාපාදය ඔරිමතීරය යි: අව්‍යාපාදය පාරිමතීරය යි. මිථ්‍යාදෘෂ්ටිය ඔරිමතීරය යි. සම්‍යග්දෘෂ්ටිය පාරිමතීරය යි. බ්‍රාහ්මණය, මේ ඔරිමතීරය වෙයි. මේ පාරිමතීරය වේ යයි.

1. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා තීරමෙවානු ධාවති,

2. යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං.

3. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං.

4. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

5. යෙසං සම්බොධි අඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං
ආදානපටිනිස්සග්ගෙ අනුපාදය යෙ රතා
ඛීණාසවා ජුතිමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතා ති.

සඞ්ගාරව සුත්තං තතියං.

## 10. 4. 2. 4

## ඔරිමතීර සුත්තං

ඔරිමඤ්ච වො භික්ඛවෙ තීරං දෙසිස්සාමි, පාරිමඤ්ච තීරං, තං සුණාථ –පෙ– කතමඤ්ච භික්ඛවෙ ඔරිමං තීරං? කතමඤ්ච පාරිමං තීරං?

පාණාතිපාතො ඛො භික්ඛවෙ ඔරිමං තීරං, පාණාතිපාතා වෙරමණී පාරිමං තීරං. අදින්නාදානං ඔරිමං තීරං, අදින්නාදානා වෙරමණී පාරිමං තීරං. කාමෙසු මිච්ඡාචාරො ඔරිමං තීරං, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී පාරිමං තීරං. මුසාවාදො ඔරිමං තීරං, මුසාවාද වෙරමණී පාරිමං තීරං. පිසුණා වාචා ඔරිමං තීරං, පිසුණාය වාචාය වෙරමණී පාරිමං තීරං. ඵරුසා වාචා ඔරිමං තීරං, ඵරුසාය වාචාය වෙරමණී පාරිමං තීරං. සම්ඵප්පලාපො ඔරිමං තීරං, සම්ඵප්පලාපා වෙරමණී පාරිමං තීරං. අභිජ්ඣා ඔරිමං තීරං, අනභිජ්ඣා පාරිමං තීරං. ව්‍යාපාදො ඔරිමං තීරං, අව්‍යාපාදො පාරිමං තීරං. මිච්ඡාදිට්ඨි ඔරිමං තීරං, සම්මා දිට්ඨි පාරිමං තීරං. ඉදං ඛො භික්ඛවෙ ඔරිමං තීරං, ඉදං පාරිමං තීරන්ති.

1. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො
අථායං ඉතරා පජා තීර මෙවානුධාවති

1. මනුෂ්‍යයන් අතුරෙහි යම් ජන කෙනෙක් පාරසඞ්ඛ්‍යාත නිර්වාණයට යන සුලු වෙත් ද ඔහු ස්වල්ප වෙත්. වැලිත් මේ අන්‍යප්‍රජා තොමෝ තෙර අනුව දුවන්නේ මැයි.

2. යම් කෙනෙක් මොනොවට දෙසන ලද ධර්මයෙහි ධාර්මනුවර්තී වෙත් ද එ ජනයෝ තරණයෙහි අති දුෂ්කර වූ මෘත්‍යුධෙය ය ඉක්මවා පාරයට යෙත්.

3. පණ්ඩිත තෙමේ ඔක සඞ්ඛ්‍යාත ගිහිගෙන් නික්ම අනොක සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණ යම් විවෙකයෙක් හි දූකසේ අභිරමණය කෙරේද, කෘෂ්ණධර්ම හැරපියා ශුක්ලධර්ම වඩනේය.

4. රාගාදි කිඤ්චන නැතියේ කාමයන් හැරපියා එහි අභිරතිය කැමැති වන්නේ ය. ඒ පණ්ඩිත තෙමේ චිත්තක්ලේශයන්ගෙන් සිත පර්‍ය්‍යවදත කරන්නේ ය.

5. යම් කෙනෙකුන් විසින් සම්බොධ්‍යඞ්ගධර්මයන් හි සිත මොනොවට සුභාවිත ද උපාදනයන්ගේ දුරලීම වූ නිර්වාණයෙහි යම් කෙනෙකුන් තෘෂ්ණාදෘෂ්ටි ඈ විසින් නො ගෙන ඇලුනාහු වෙත් ද ද්‍යුතිමත් වූ ඒ ක්ෂීණාස්‍රවයෝ ලොව්හි පිරිනිවුනාහු වෙති.

## 10. 4. 2. 4
## ඔරිමතීර සූත්‍රය

මහණෙනි තොපට ඔරිමතීරය හා පාරිමතීරය හා දෙසමි, ඒ අසවු... මහණෙනි, ඔරිමතීරය හා කවරේය යත්? පාරිමතීරය හා කවරේය යත්?

මහණෙනි, ප්‍රාණඝාතය ඔරිමතීරයි, ප්‍රාණඝාතයෙන් විරමණය පාරිම තීරයි. අදින්නාදානය ඔරිම තීරයි, අදින්නාදනයෙන් විරමණය පාරිමතීරයි. කාමමිථ්‍යාචාරය ඔරිම තීරයි, කාමමිථ්‍යාචාරයෙන් විරමණය පාරිමතීරයි. මුසාවාදය ඔරිමතීරයි, මුසාවාදයෙන් විරමණය පාරිමතීරයි. පිසුනුබස් ඔරිමතීරයි, පිසුනුබසින් විරමණය පාරිමතීරයි. පරොස්බස් ඔරිමතීරයි, පරොස්බසින් විරමණය පාරිමතීරයි. සම්ප්‍රලාපය ඔරිමතීරයි, සම්ප්‍රලාප යෙන් විරමණය පාරිමතීරයි. අභිධ්‍යාව ඔරිමතීරයි, අනභිධ්‍යාව පාරිම තීරයි. ව්‍යාපාදය ඔරිමතීරයි, අව්‍යාපාදය පාරිමතීරයි. මිථ්‍යාදෘෂ්ටිය ඔරිම තීරයි, සම්‍යග්දෘෂ්ටිය පාරිමතීරයි. මහණෙනි, මේ ඔරිමතීරයි, මේ පාරිම තීරයි.

1. මනුෂ්‍යයන් අතරෙහි යම් ජන කෙනෙක් නිවන්පරතෙර යනසුලු වෙත් නම් ඔහු අල්ප වෙත්. වැලිත් (මේ) සෙසු ප්‍රජා මෙ තෙර අනුවම දිවෙයි.

2. යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං.

3. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං.

4. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

4. යෙසං සම්බොධි අඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා
ඛීණාසවා ජුතිමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතා ති.

## 10. 4. 2. 5

## පඨම අධම්ම සුත්තං

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො අනත්ථො ච, ධම්මො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මඤ්ච විදිත්වා අනත්ථඤ්ච, ධම්මඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බං.

කතමො ච භික්ඛවෙ අධම්මො ච අනත්ථො ච:

පාණාතිපාතො, අදින්නාදානං කාමෙසු මිච්ඡාචාරො, මුසාවාදො පිසුනා වාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාපො, අභිජ්ඣා, ව්‍යාපාදො, මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ අධම්මො ච අනත්ථො ච.

කතමො ච භික්ඛවෙ ධම්මො ච අත්ථො ච:

පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, මුසාවාදා වෙරමණී, පිසුනාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අනභිජ්ඣා, අව්‍යාපාදො, සම්මාදිට්ඨි, අයං වුච්චති භික්ඛවෙ ධම්මො ච අත්ථො ච.

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො අනත්ථො ච, ධම්මො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා අනත්ථඤ්ච. ධම්මඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

2. යම් ම කෙනෙක් මොනොවට දෙසන ලද ධර්මයෙහි ධර්මානුවර්ති වෙත් ද ඒ ජනයෝ සුදුස්තරමෘත්‍යුධෙය ය තරණය කොට පරතීරයට යෙත්.

3. ඔකසඞ්ඛ්‍යාත ගිහිගෙන් නික්ම අනොක සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණ යම් විවෙකයෙක් හි දුකසේ සිත් අලවා වෙසේද, ඒ පණ්ඩිත තෙම කෘෂ්ණ ධර්ම හැරපියා ශුක්ලධර්ම වඩනේ ය.

4. රාගාදි කිඤ්චන රහිත වූයේ කාමයන් හැරපියා අභිරතිය රුස්නේ ය. පණ්ඩිත තෙම චිත්තක්ලේශයන්ගෙන් සිත පර්‍ය්‍යවදත කෙරෙ යි.

5. යමකුන් විසින් සම්බොධ්‍යඞ්ගයන්හි මොනොවට සිත සුභාවිත ද යම් කෙනෙකුන් උපාදන විසින් නො ගෙන ආදනප්‍රතිනිසර්ගයෙහි ඇලුනාහු ද ද්‍යුතිමත් වූ එ ක්ෂීණාශ්‍රවයෝ පස්කඳලොව් හි පිරිනිවුණහ යි.

## 10. 4. 2. 5
## පඨම අධම්ම සූත්‍රය

මහණෙනි, අධර්මය හා අනර්ථය හා දතයුත්තේ ය. ධර්මය හා අර්ථය හා දතයුත්තේ ය. අධර්මය හා අනර්ථය හා දැන ධර්මය හා අර්ථය හා දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එ පරිදි පිළිපැදිය යුතු.

මහණෙනි, අධර්මය හා අනර්ථය හා කවරේය යත්:

ප්‍රාණඝාතය අදින්නාදනය කාමමිථ්‍යාචාරය මුසාවාදය පිසුනවාචාය ඵරුසවාචා ය සම්පප්‍රලාපය අභිධ්‍යාය ව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ටිය යි. මහණෙනි, මේ අධර්මය හා අනර්ථය හා යි කියනු ලැබේ.

මහණෙනි, ධර්මය හා අර්ථය හා කවරේය යත්?

ප්‍රාණඝාතයෙන් විරමණය, අදත්තාදනයෙන් විරමණය, කාමමිථ්‍යා-චාරයෙන් විරමණය, මුසාවාදයෙන් විරමණය, පිසුනුබසින් විරමණය, පරොස්බසින් විරමණය, සම්පප්‍රලාපයෙන් විරමණය, අනභිධ්‍යාය, අව්‍යාපාදය, සම්‍යක්දෘෂ්ටිය යි. මහණෙනි, මේ ධර්ම හා අර්ථ හා යි කියනු ලැබේ.

මහණෙනි, අධර්මය හා අනර්ථය හා දතයුත්තේ ය. ධර්මය හා අර්ථය දතයුත්තේ ය. අධර්මය ද දැන අනර්ථය ද දැන ධර්මය හා අර්ථය හා දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එ සේ පිළිපැදිය යුතු ය යි මෙසේ යමක් කියන ලද නම් තෙල මේ පිණිස කියන ලදැ යි.

## 10. 4. 2. 6

## දුතිය අධම්ම සුත්තං

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො, ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො තෙසං භික්ඛූනං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, ''අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මං ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති.

කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති?

අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි:

අයං ඛො ආයස්මා මහා කච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොතිචායස්මා මහා කච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහා කච්චානො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහා කච්චානං එතමත්ථං පුච්ඡෙය්‍යාම. යථා නො ආයස්මා මහාකච්චානො ව්‍යාකරිස්සති, තථා නං ධාරෙස්සාමාති.

අථ ඛො තෙ භික්ඛූ යෙනායස්මා මහාකච්චානො තෙනුපසංකමිංසු. උපසංකමිත්වා ආයස්මතා මහා කච්චානෙන සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං මහා කච්චානං එතදවොචුං:

## 10. 4. 2. 6

## දුතිය අධම්ම සූත්‍රය

මහණෙනි, අධර්ම හා ධර්ම හා දතයුත්තේ ය. අනර්ථ හා අර්ථ දතයුත්තේ ය. අධර්ම හා ධර්ම හා දැන අනර්ථ හා අර්ථ හා දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එසේ පිළිපැදිය යුතු ය යි. භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක. සුගතයන්වහන්සේ මෙය වදරා හුනස්නෙන් නැගී විහාරයට පිවිසි සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ කල් ඇතිවත් ම එ මහණුනට මෙල සිත විය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ අපට සැකෙවින් මේ උද්දේසය උදෙසා විතර විසින් අරුත් නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක, "මහණෙනි, අධර්ම හා ධර්ම හා දතයුත්තේ ය. අනර්ථ හා අර්ථ දතයුත්තේය. අධර්ම හා ධර්ම හා දැන අනර්ථ හා අර්ථ හා දැන ධර්ම යම් පරිදි වේ නම් අර්ථ යම් පරිදි වේ නම් එපරිදි පිළිපැදිය යුතුය"යි.

භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දෙසන ලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දේසයාගේ අර්ථය කවරෙක් නම් විතර විසින් බෙදන්නේද යි?

ඉක්බිති එ මහණුනට මෙල සිත විය.

"මේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ ශාස්තෘන් විසිනුදු සංවර්ණිතයහ. විඥසබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතය හ. ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දෙසන ලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දේශයාගේ අර්ථය විස්තර විසින් විභජනය කිරීමට පොහොනේත් වෙයි. අපි ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් කරා එළඹමෝ නම්, එළඹ, ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් මෙල අරුත් පුළුවුස්නමෝ නම්, යම් සෙයකින් ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ අපට ව්‍යාකරණ කෙරෙත් නම් එ සෙයින් එය ධරන්නමෝ නම් යෙහෙකැ"යි.

එ කල්හි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් කරා එළඹිය හ. එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන් හ. එකත්පසෙක හුන් එ මහණහු ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන්ට මෙල සැළකලහ:

''ඉදං ඛො නො ආවුසො කච්චාන භගවා සංඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, ''අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො, තථා පටිපජ්ජිතබ්බන්ති''. තෙසං නො ආවුසො අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි; ''ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො. ''අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො, යථා අත්ථො, තථා පටිපජ්ජිතබ්බන්ති''.

කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යා''ති තෙසං නො ආවුසො අම්හාකං එතදහොසි:

''අයං ඛො ආයස්මා මහා කච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චා යස්මා මහා කච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යං නූන මයං යෙනායස්මා මහා කච්චානො තෙනුපසංකමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහා කච්චානං එතමත්ථං පුච්ඡෙය්‍යාම. යථා නො ආයස්මා මහා කච්චානො ව්‍යාකරිස්සති, තථා නං ධාරෙස්සාමා''ති විභජතායස්මා මහාකච්චානො ති.

සෙය්‍යථාපි ආවුසො පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව මූලං, අතික්කම්ම ඛන්ධං, සාඛාපලාසෙ සාරං පරියෙසිතබ්බං මඤ්ඤෙය්‍ය, එවං සම්පදමිදං. ආයස්මන්තං සත්ථරි සම්මුඛීභූතෙ තං භගවන්තං අතිසිත්වා අම්හෙ එතමත්ථං පටිපුච්ඡිතබ්බං මඤ්ඤථ. සොහාවුසො භගවා ජානං ජානාති, පස්සං පස්සති. චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි යං තුම්හෙ භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාථ. යථා ඛො[1] භගවා ව්‍යාකරෙය්‍ය, තථා නං ධාරෙය්‍යාථා ති.

1. යථා නො, සිමු.

"ඇවැත් කාත්‍යායනයෙනි, අපට භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් මේ උද්දෙසය උදෙසා විතර විසින් අරුත් විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට පිවිසිය හ, මහණෙනි, අධර්ම හා ධර්ම හා දතයුත්තේ ය. අනර්ථ හා අර්ථ හා දතයුත්තේ ය. අධර්ම හා ධර්ම හා දැන අනර්ථ හා අර්ථ හා දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එසේ පිළිපැදිය යුතුය'යි. ඇවැත්නි, එ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩී නො බෝ කල් වත් ම මෙබඳු අදහස විය: 'ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් මේ උද්දෙස උදෙසා විතර විසින් අරුත් විභාග නො කොට හුනස්නෙන් නැඟී විහාරයට වන් හ, මහණෙනි, අධර්මය හා ධර්මය හා දතයුත්තේ ය. අනර්ථය හා අර්ථය හා දතයුත්තේ ය. අධර්මය හා ධර්මය හා දැන අනර්ථය හා අර්ථය හා දැන ධර්මය යම් පරිදි වේ ද අර්ථය යම් පරිදි වේ ද එසේ පිළිපැදිය යුතුය' යි.

භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දේසයාගේ අර්ථය කවරෙක් විතර විසින් විභාග කෙරේද''යි. ඇවැත්නි, එ අපට මෙබඳු සිත විය:

"මේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ ශාස්තෘන්වහන්සේ විසිනුදු සංවර්ණිතය හ. විඥ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතය හ. ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත් නො බෙදන ලද මේ උද්දේසයාගේ අර්ථය විතර විසින් විභාග කරන්නට පොහොනාහු වෙති. අපි ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් වෙත එළඹමෝ නම්, එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් මෙබඳු අරුත් පුළුවුස්නමෝ නම්, ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ අපට යම් පරිදි ව්‍යාකරණ කෙරෙත් නම් එ පරිදි එය දරමෝ නම් ඉතා යෙහෙකැ''යි. ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ විභජනය කෙරෙත්වා යි.

"ඇවැත්නි, යම් පරිදි හරයෙන් අර්ථ ඇති සාරය සොයන සාරපයෝෂණය කරන පුරුෂයෙක් හර ඇති සිටුනා මහරුකක්හුගේ මුල ඉක්ම කඳ ඉක්ම අතුපතරෙහි සාරය සෙවිය යුතු කොට හඟනේ නම් මෙ එබඳු උපමායෙකි. ආයුෂ්මත්නට ශාස්තෘන් වහන්සේ සම්මුඛීභූත වත් ම එ භගවත්හු ඉක්ම අප මෙබඳු අරුත් පිළිවිසිය යුතු කොට හඟනාහුය. ඇවැත්නි, දන්නා වූ ම ඒ භාග්‍යවත්හු දන්නා හ. දක්නාහු ම දක්නා හ. චක්ෂුර්භූත වූ ඥාණභූත වූ ධර්මභූත වූ බ්‍රහ්මභූත වූ තථාගතයෝ වක්තෘ හ. ප්‍රවර්තෘ හ. අර්ථයාගේ නිර්නෙතෘ හ. අමෘතයගේ දතෘ හ. ධර්මස්වාමීහ . යම් හෙයකින් තෙපි භාග්‍යවතුන් වහන්සේ ම කරා එළඹ මෙබඳු අරුත් පුළුවුස්නහු නම් මෙබඳු කරුණ පිණිස එම කල් විය. භාග්‍යවතුන් වහන්සේ යම් පරිදි තොපට ව්‍යාකරණ කරන සේක් නම් එ පරිදි එය දරව'' යි.

අද්ධා ආවුසො කච්චාන භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛු භූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නිනෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි යං මයං භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාම, යථා නො භගවා ව්‍යාකරෙය්‍ය, තථා නං ධාරෙය්‍යාම, අපිචායස්මා මහා කච්චානො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොතිචායස්මා මහා කච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. විභජතායස්මා මහා කච්චානො අගරුං කරිත්වා[1] ති.

තෙනහාවුසො සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. 'එවමාවුසො'ති බො තෙ භික්ඛූ ආයස්මතො මහාකච්චානස්ස පච්චස්සොසුං. ආයස්මා මහා කච්චානො එතදවොච:

යං බො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, "අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථං ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො, යථා අත්ථො, තථා පටිපජ්ජිතබ්බන්ති".

කතමො චාවුසො අධම්මො, කතමො ච ධම්මො, කතමො ච අනත්ථො, කතමො ච අත්ථො:

පාණාතිපාතො ආවුසො අධම්මො, පාණාතිපාතා වෙරමණී ධම්මො, යෙ ච පාණාතිපාත පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. පාණාතිපාතා වෙරමණී පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

අදින්නාදානං ආවුසො අධම්මො, අදින්නාදානා වෙරමණී ධම්මො, යෙච අදින්නාදානපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, අදින්නාදානා වෙරමණී පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

1. අගරු කරිත්වාති- සිමු.

ඇවැත් කාත්‍යායනයෙනි, එකැතින් දන්නා වූ ම ඒ භාග්‍යවත්හු දනිත් මැ යි. දක්නාහු දකිත් මැ යි. චක්ෂූර්භූත වූ ඥානභූත වූ ධර්මභූත වූ බ්‍රහ්ම-භූත වූ තථාගතයන් වහන්සේ වක්තෲ හ. ප්‍රවර්තෲ හ. අර්ථයාගේ නිර්නෙතෲ හ. අමෘතයාගේ දාතෲ හ. ධර්මස්වාමී හ. යම් හෙයකින් අපි භාග්‍යවතුන් වහන්සේ ම කරා එළඹ තෙල අරුත් පුලුවුස්නමෝ නම් තෙල කරුණ සඳහා එම කල් විය. යම් පරිදි භාග්‍යවතුන් වහන්සේ අපට ව්‍යාකරණ කරන සේක් නම් එ පරිදි එය දරම් හ. වැලිත් ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ ශාස්තෲන් වහන්සේ විසිනුදු සංවර්ණිතය හ. විඥ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතයහ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත් නො බෙදන ලද තෙල උද්දෙසයාගේ අර්ථය විතර විසින් විභාග කිරීමට ආයුෂ්මත් මහාකාත්‍යායනයෝ පොහොසත් හ. ආයුෂ්මත් මහාකාත්‍යා-යනයෝ නො ගුරු කොට විභාග කෙරෙත්ව යි.

"ඇවැත්නි, එසේ වී නම් අසවු, මැනැවින් මෙනෙහි කරවු, දෙසන්නෙමි"යි. 'ඇවැත්නි, එසේය' යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා කාත්‍යායනයන් හට පිළිවදන් ඇස්වූ හ. ආයුෂ්මත් මහාකාත්‍යායන තෙමේ තෙල කීහ:

ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, අධර්මය හා ධර්මය හා දත යුතුය. අනර්ථය හා අර්ථය හා දතයුතුය. අධර්මය හා ධර්මය හා දැන අනර්ථය හා අර්ථය හා දැන ධර්මය යම් සේ නම්, අර්ථය යම් සේ නම් එසේ පිළිපැදිය යුතු ය" යන යමක් සංක්ෂිප්තව උදෙසුම් කොට විතර විසින් අරුත් නො බෙදු හුනස්නෙන් නැගී විහාරයට පිවිසි සේක් ද,

ඇවැත්නි, අධර්මය හා කවර, ධර්මය හා කවර, අනර්ථය හා කවර, අර්ථය හා කවර:

ඇවැත්නි, ප්‍රාණඝාතය අධර්මයි. ප්‍රාණඝාතයෙන් විරමණය ධර්මයි. ප්‍රාණඝාතප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්ම කෙනෙක් සම්භව වෙත් නම් මෙ අනර්ථ යි. ප්‍රාණඝාතවිරමණප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්ණ බවට යෙත් නම් මෙ අර්ථ යි.

ඇවැත්නි, අදත්තාදනය අධර්මයි. අදත්තාදන විරමණය ධර්මයි. අදත්තා-දන ප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ සම්භව වෙත් නම් මෙ අනර්ථයි. අදත්තාදනවිරමණප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්ණබවට යෙත් නම මෙ අර්ථයි.

කාමෙසු මිච්ඡාචාරො ආවුසො අධම්මො, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී ධම්මො, යෙ ච කාමෙසු මිච්ඡාචාරපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

මුසාවාදො ආවුසො අධම්මො, මුසාවාද වෙරමණී ධම්මො. යෙච මුසාවාද පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, මුසාවාද වෙරමණී පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති අයං අත්ථො.

පිසුනා වාචා ආවුසො අධම්මො, පිසුනාය වාචාය වෙරමණී ධම්මො, යෙ ච පිසුනා වාචා පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. පිසුනාය වාචාය වෙරමණී පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

ඵරුසා වාචා ආවුසො අධම්මො, ඵරුසාය වාචාය වෙරමණී ධම්මො, යෙ ච ඵරුසවාචා පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, ඵරුසාය වාචාය වෙරමණී පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

සම්ඵප්පලාපො ආවුසො අධම්මො, සම්ඵප්පලාපා වෙරමණී ධම්මො, යෙ ච සම්ඵප්පලාප පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. සම්ඵප්පලාපා වෙරමණී පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

අභිජ්ඣා ආවුසො අධම්මො, අනභිජ්ඣා ධම්මො, යෙ ච අභිජ්ඣා පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, අනභිජ්ඣා පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

ව්‍යාපාදො ආවුසො අධම්මො, අව්‍යාපාදො ධම්මො, යෙ ච ව්‍යාපාද පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, අව්‍යාපාද පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

මිච්ඡාදිට්ඨි ආවුසො අධම්මො සම්මාදිට්ඨි ධම්මො, යෙ ච මිච්ඡාදිට්ඨි පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති අයං අනත්ථො, සම්මා-දිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො,

ඇවැත්නි, කාමමිථ්‍යාචාරය අධර්ම යි. කාමමිථ්‍යාචාරයෙන් විරමණය ධර්මයි. කාමමිථ්‍යාචාරප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ සම්භව වෙත් නම් මේ අනර්ථයි. කාමමිථ්‍යාචාරයෙන් විරමණප්‍රත්‍යයෙන් නොයෙක් කුශල ධර්මයෝ භාවනායෙන් පරිපූර්ණබවට යෙත් නම් මේ අර්ථ යි.

ඇවැත්නි, මුසාවාදය අධර්ම යි. මුසාවාදයෙන් විරමණය ධර්මයි. මුසාවාද ප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ සම්භව වෙත් නම් මේ අනර්ථ යි. මුසාවාදයෙන් විරමණප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්ණබවට යෙත් නම් මේ අර්ථ යි.

ඇවැත්නි, පිසුනුවචනය අධර්ම යි. පිසුනුවචනයෙන් විරමණය ධර්ම යි. පිසුනවාචාප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ සම්භව වෙත් නම් මේ අනර්ථ යි. පිසුනුවචනයෙන් විරමණප්‍රත්‍යයෙන් නොයෙක් අකුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්ණබවට යෙත් නම් මේ අර්ථ යි.

ඇවැත්නි, පරොස්බස අධර්ම යි. පරොස්බසින් විරමණය ධර්ම යි. පරුෂවචන ප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ සම්භව වෙත් නම් මේ අනර්ථ යි. පරොස්බසින් විරමණප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්ණ බවට යෙත් නම් මේ අර්ථ යි.

ඇවැත්නි, සම්ප්‍රලාපය අධර්ම යි. සම්ප්‍රලාපයෙන් විරමණය ධර්ම යි. සම්ප්‍රලාපප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ සම්භවවෙත් නම් මේ අනර්ථ යි. සම්ප්‍රලාපයෙන් විරමණප්‍රත්‍යයෙන් නොයෙක් කුශල ධර්මයෝ භාවනායෙන් පරිපූර්ණබවට යෙත්. මේ අර්ථ යි.

ඇවැත්නි, අභිධ්‍යාව අධර්ම යි. අනභිධ්‍යාව ධර්ම යි. අභිධ්‍යාප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ සම්භව වෙත් නම් මේ අනර්ථයි. අනභිධ්‍යාප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්ණ බවට යෙත් නම් මේ අර්ථ යි.

ඇවැත්නි, ව්‍යාපාදය අධර්ම යි. අව්‍යාපාදය ධර්ම යි. ව්‍යාපාදප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ සම්භව වෙත් නම් මේ අනර්ථ යි. අව්‍යාපාදප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්ණබවට යෙත් නම් මේ අර්ථ යි.

ඇවැත්නි, මිථ්‍යාදෘෂ්ටිය අධර්ම යි. සම්‍යග්දෘෂ්ටිය ධර්ම යි. මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ සම්භව වෙත් නම් මේ අනර්ථ යි. සම්‍යක්දෘෂ්ටිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනායෙන් පරිපූර්ණබවට යෙත් නම් මේ අර්ථ යි.

යං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො "අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො, තථා පටිපජ්ජිතබ්බන්ති". ඉමස්ස ඛො අහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි, ආකඞ්ඛමානා ච පන තුම්හෙ ආවුසො භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාථ, යථා නො[1] භගවා ව්‍යාකරොති තථා නං ධාරෙය්‍යාථාති.

එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාකච්චානස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

යං ඛො නො භන්තෙ භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, "අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති". තෙසං නො භන්තෙ අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: "ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො "අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බන්ති".

කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යා"ති. තෙසං නො භන්තෙ අම්හාකං එතදහොසි:

"අයං ඛො ආයස්මා මහාකච්චානො සත්ථුචෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා මහාකච්චානො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පුච්ඡෙය්‍යාම යථා නො ආයස්මා මහාකච්චානො ව්‍යාකරිස්සති තථා නං ධාරෙය්‍යාමාති. අථ ඛො මයං භන්තෙ යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමිම්හා. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං එතමත්ථං පුච්ඡිම්හා: තෙසං නො භන්තෙ ආයස්මතා මහාකච්චානෙන ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ව්‍යඤ්ජනෙහි අත්ථො සුවිභත්තොති.

1. වො මජ්ඣසං.

"ඇවැත්නි, අපට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, අධර්මය හා ධර්මය හා දතයුතු ය. අනර්ථය හා අර්ථය හා දතයුතුය. ධර්මය හා අධර්මය හා දැන අනර්ථය හා අර්ථය හා දැන ධර්මය යම් සේ නම් අර්ථය යම් සේ නම් එසේ පිළිපැදිය යුතු ය" යන යමක් සංක්ෂිප්තව උදෙසුම් කොට විතර විසින් අරුත් නො බෙදා හුනස්නෙන් නැගී විහාරයට පිවිසි සේක් ද, ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසුම් කළ විතර විසින් අරුත් නො බෙදූ මේ ධර්මයා ගේ අර්ථය විතර විසින් මෙසේ දනිමි. ඇවැත්නි, තෙපි කැමැති වන්නාහු නම් භාග්‍යවතුන් වහන්සේ වෙතම එළඹ මේ අර්ථය විචාරවූ. යම් පරිදි භාග්‍යවතුන් වහන්සේ අපට ප්‍රකාශකරන සේක් නම් එපරිදි එය දරවූ යි.

ඇවැත්නි, එසේය යි ඒ මහණහු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේගේ භාෂිතය අභිනන්දනය කොට අනුමෝදනා කොට හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹිය හ. එළඹ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන් හ. එකත් පසෙක හුන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ:

"වහන්ස, අපට භාග්‍යවතුන් වහන්සේ අධර්මය හා ධර්මය හා දතයුත්තේ ය. අනර්ථය හා අර්ථය හා දතයුත්තේ ය. අධර්මය හා ධර්මය හා දැන අනර්ථය හා අර්ථය හා දැන ධර්මය යම් පරිදි වේ න අර්ථය යම් පරිදි වේ නම් එසේ පිළිපැදිය යුතුය"යි, මේ උද්දේසයක් සැකෙවින් උදෙසා විතර විසින් අරුත් විභාග නො කොට හුනස්නෙන් නැඟී වෙහෙරට වන් සේක් ද වහන්ස, ඒ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩි නො බෝ කල් වත් ම තෙල සිත විය; "ඇවැත්නී, අපට භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, අධර්මය හා ධර්මය හා දතයුතුය. අනර්ථය හා අර්ථය හා දත යුතුය. ධර්මය හා අධර්මය හා දැන අනර්ථය හා අර්ථය හා දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එපරිදි පිළිපැදිය යුතුය'යී. යමක් සංක්ෂිප්තව උදෙසුම් කොට විතර විසින් අරුත් නො බෙදා හුනස්නෙන් නැගී විහාරයට වන් සේක.

කවරෙක් භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් උදෙසූ විතර විසින් අරුත් නො බෙදූ මේ උද්දේසයාගේ අර්ථය විභජනය කෙරෙන්නේදැ"යී. වහන්ස, එ අපට තෙල සිත විය: "මේ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසිනුදු සංවර්ණිතය හ. විඥ සබ්‍රම්සරුන් විසිනුදු සම්භාවිතය හ. ආයුෂ්මත් මහා කාත්‍යායන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසූ විතර විසින් අරුත් නො බෙදූ මේ උද්දේසයාගේ අර්ථය විතර විසින් බෙදනට සමත් හ. අපි ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවන් කරා එළඹමෝ නම් එළඹ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් තෙල අරුත් පුළුවුස්නමෝ නම් ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරණුවෝ අපට යම් පරිදි ව්‍යාකරණ කෙරෙත් නම් එය එ පරිදි දරම්හ"යී. වහන්ස, ඉක්බිති අපි ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් කරා එළඹියම් හ. එළැඹ ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් පුළුවුසුම් හ. "වහන්ස, ඒ අපට ආයුෂ්මත් මහාකාත්‍යායන තෙරුන් විසින් මේ අයුරින් මේ පදයෙන් ඉම් ව්‍යඤ්ජනයෙන් අර්ථය සුවිභක්තයහ"යී.

සාධු සාධු භික්ඛවෙ, පණ්ඩිතො භික්ඛවෙ මහාකච්චානො, මහාපඤ්ඤො භික්ඛවෙ මහාකච්චානො, මං චෙපි තුම්හෙ භික්ඛවෙ උපසඞ්කමිත්වා එතමත්ථං පුච්ඡෙය්‍යාථ අහම්පි චෙතං එවමෙවං ව්‍යාකරෙය්‍යං යථා තං මහාකච්චානෙන ව්‍යාකතං. එසො චෙවෙතස්ස අත්ථො, එවං ච නං ධාරෙය්‍යාථාති.

## 10. 4. 2. 7

## තතිය අධම්ම සුත්තං

අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච, අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච, යථා ධම්මො, යථා අත්ථො තථා පටිපජ්ජිතබ්බං.

කතමො ච භික්ඛවෙ අධම්මො, කතමො ච ධම්මො, කතමො ච අනත්ථො, කතමො ච අත්ථො, පාණාතිපාතො භික්ඛවෙ අධම්මො, පාණාතිපාතා වෙරමණී ධම්මො, යෙ ච පාණාතිපාතපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො. පාණාතිපාතා වෙරමණී පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

අදින්නාදානං භික්ඛවෙ අධම්මො, අදින්නාදානා වෙරමණී ධම්මො -පෙ- කාමෙසු මිච්ඡාචාරො භික්ඛවෙ අධම්මො, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී ධම්මො -පෙ- මුසාවාදො භික්ඛවෙ අධම්මො, මුසාවාද වෙරමණී ධම්මො -පෙ- පිසුනා වාචා භික්ඛවෙ අධම්මො, පිසුනාය වාචාය වෙරමණී ධම්මො -පෙ- ඵරුසා වාචා භික්ඛවෙ අධම්මො, ඵරුසාය වාචාය වෙරමණී ධම්මො සම්ඵප්පලාපො භික්ඛවෙ අධම්මො සම්ඵප්පලාපා වෙරමණී ධම්මො -පෙ- අභිජ්ඣා භික්ඛවෙ අධම්මො, අනභිජ්ඣා ධම්මො -පෙ- ව්‍යාපාදො භික්ඛවෙ අධම්මො, අව්‍යාපාදො ධම්මො -පෙ- මිච්ඡාදිට්ඨි භික්ඛවෙ අධම්මො, සම්මාදිට්ඨි ධම්මො යෙ' ච මිච්ඡාදිට්ඨිපච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති, අයං අනත්ථො, සම්මාදිට්ඨිපච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනාපාරිපූරිං ගච්ඡන්ති, අයං අත්ථො.

"අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච, අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මඤ්ච විදිත්වා ධම්මඤ්ච, අනත්ථඤ්ච විදිත්වා අත්ථඤ්ච යථා ධම්මො යථා අත්ථො, තථා පටිපජ්ජිතබ්බන්ති". ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්චවුත්තන්ති.

මහණෙනි, මැනැවි, මැනැවි, මහණෙනි, මහාකාත්‍යායන පණ්ඩිත වෙයි. මහණෙනි, මහාකාත්‍යායන මහාප්‍රාඥ වෙයි. මහණෙනි, තෙපි මා කරා ද අවුත් තෙල අරුත් පුලුවුස්නාහු නම් මම ද තෙල අර්ථය මහාකාත්‍යායනයන් විසින් යම් පරිදි ව්‍යාකෘත නම් එ පරිදි ම ව්‍යාකරණ කරනෙමි. තෙල කාරණයාගේ අර්ථය එ මැ යි. එසේ ම එය දරව'යි.

## 10. 4. 2. 7
## තතිය අධම්ම සූත්‍රය

මහණෙනි, අධර්මය හා ධර්මය හා දතයුත්තේ ය. අනර්ථය හා අර්ථය හා දතයුත්තේ ය. අධර්මය හා ධර්මය හා දැන අනර්ථය හා අර්ථය හා දැන යම් පරිදි ධර්මය වේ නම් යම් පරිදි අර්ථය වේ නම් එ පරිදි පිළිපැදිය යුතු.

මහණෙනි, අධර්මය කවර, ධර්මය කවර: අනර්ථය කවර, අර්ථය කවර: මහණෙනි, ප්‍රාණඝාතය අධර්ම යි. ප්‍රාණඝාතයෙන් විරමණය ධර්ම යි. ප්‍රාණඝාතප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් මේ අනර්ථ යි. ප්‍රාණඝාතයෙන් විරමණප්‍රත්‍යයෙන් නොයෙක් කුශල-ධර්මයෝ භාවනායෙන් පරිපූර්තියට යෙත් නම් මේ අර්ථ යි.

මහණෙනි, අදින්නාදානය අධර්ම යි. අදින්නාදානයෙන් විරමණය ධර්මයි... මහණෙනි, කාමමිථ්‍යාචාරය අධර්ම යි. කාමමිථ්‍යාචාරයෙන් විරමණය ධර්ම යි... මහණෙනි, මුසාවාදය අධර්ම යි. මුසාවාදයෙන් විරමණය ධර්ම යි... මහණෙනි, පිසුනුබස් අධර්ම යි. පිසුනු බසින් වෙන්වීම ධර්මයි ... මහණෙනි, පරුෂවචන අධර්මයි...පරුෂවචනයෙන් වෙන්වීම ධර්මයි... මහණෙනි, සම්ප-ප්‍රලාපය අධර්ම යි. සම්පප්‍රලාපයෙන් විරමණය ධර්ම යි.... මහණෙනි, අභිධ්‍යා අධර්ම යි. අනභිධ්‍යා ධර්ම යි... මහණෙනි, ව්‍යාපාදය අධර්ම යි. අව්‍යාපාදය ධර්ම යි...මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය අධර්ම යි. සම්‍යග්දෘෂ්ටිය ධර්ම යි. මිථ්‍යා-දෘෂ්ටිප්‍රත්‍යයෙන් යම් නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් මේ අනර්ථ යි. සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙන් නොයෙක් කුශලධර්මයෝ භාවනා-යෙන් පරිපූර්තියට යෙත්. මේ අර්ථ යි.

"මහණෙනි, අධර්මය හා ධර්මය හා දතයුතු ය, අනර්ථය හා අර්ථය හා දතයුතු ය. අධර්මය හා ධර්මය හා දැන අනර්ථය හා අර්ථය හා දැන ධර්මය යම් පරිදි වේ නම් අර්ථය යම් පරිදි වේ නම් එසේ පිළිපැදිය යුතුය" යි මෙසේ යමක් කියන ලද නම් තෙල මේ සඳහා කියන ලද්දේ යි.

## 10. 4. 2. 8

## කම්මනිදාන සුත්තං

පාණාතිපාතම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොස හෙතුකම්පි මොහහෙතුකම්පි. අදින්නාදානම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි මොහහෙතුකම්පි. කාමෙසු මිච්ඡාචාරම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි මොහහෙතුකම්පි. මුසාවාදම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි මොහහෙතුකම්පි. පිසුණං වාචම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි මොහහෙතුකම්පි. ඵරුසං වාචම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි. මොහහෙතුකම්පි සම්ඵප්පලාපම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි මොහහෙතුකම්පි. අභිජ්ඣම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි මොහහෙතුකම්පි. ව්‍යාපාදම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි මොහහෙතුකම්පි. මිච්ඡාදිට්ඨිම්පහං භික්ඛවෙ තිවිධං වදාමි ලොභහෙතුකම්පි දොසහෙතුකම්පි මොහහෙතුකම්පි.

ඉති ඛො භික්ඛවෙ ලොභො කම්මනිදානසම්භවො, දොසො කම්මනිදානසම්භවො, මොහො කම්මනිදානසම්භවො. ලොභක්ඛයා කම්මනිදානසඞ්ඛයො, දොසක්ඛයා කම්මනිදානසඞ්ඛයො, මොහක්ඛයා කම්මනිදානසඞ්ඛයොති.

## 10. 4. 2. 9

## සපරික්කමන සුත්තං

සපරික්කමනො අයං භික්ඛවෙ ධම්මො, නායං ධම්මො අපරික්කමනො. කථඤ්ච භික්ඛවෙ සපරික්කමනො අයං ධම්මො, නායං ධම්මො අපරික්කමනො:

පාණාතිපාතිස්ස භික්ඛවෙ පාණාතිපාතා වෙරමණී පරික්කමනං හොති. අදින්නාදායිස්ස භික්ඛවෙ අදින්නාදානා වෙරමණී පරික්කමනං හොති. කාමෙසුමිච්ඡාචාරිස්ස[1] භික්ඛවෙ කාමෙසු මිච්ඡාචාරා වෙරමණී පරික්කමනං හොති. මුසාවාදිස්ස[2] භික්ඛවෙ මුසාවාදා වෙරමණී පරික්කමනං හොති.

1. කාමෙසු මිච්ඡාචාරස්ස, සී.මු.
2. මුසාවාදස්ස, සී.මු.

## 10. 4. 2. 8

## කම්මනිදාන සූත්‍රය

මහණෙනි, මම ප්‍රාණඝාතය ත්‍රිවිධ කොට කියමි: ලොභහෙතුක ය, දෙසහෙතුක ය, මොහහෙතුක ය යි. මහණෙනි, මම අදින්නාදානය ද ත්‍රිවිධ කොට කියමි: ලොභහෙතුක ය, දෙසහෙතුක ය, මොහහෙතුකය යි. මහණෙනි, මම කාමමිථ්‍යාචාරය ද ත්‍රිවිධ කොට කියමි: ලොභහෙතුක ය දෙසහෙතුක ය, මොහහෙතුක ය යි. මහණෙනි, මම මුසාවාදය ද ත්‍රිවිධ කොට කියමි: ලොභහෙතුක ය, දෙස හෙතුක ය, මොහහෙතුක යයි. මහණෙනි, මම පිසුණුබස ද ත්‍රිවිධ කොට කියමි: ලොභහෙතුක ය, දෙස හෙතුක ය, මොහහෙතුක ය යි. මහණෙනි, මම පරොස්බස ද ත්‍රිවිධ කොට කියමි: ලොභහෙතුක ය, දෙසහෙතුක ය, මොහහෙතුක ය යි. මහණෙනි, මම සම්ඵප්‍රලාපය ද ත්‍රිවිධ කොට කියමි: ලොභ හෙතුක ය, දෙසහෙතුක ය, මොහ හෙතුක යයි. මහණෙනි, මම අභිධ්‍යාව ද ත්‍රිවිධ කොට කියමි: ලොභ-හෙතුක ය, දෙසහෙතුක ය, මොහහෙතුක ය යි. මහණෙනි, මම ව්‍යාපාදය ද ත්‍රිවිධ කොට කියමි: ලොභහෙතුක ය, දෙසහෙතුක ය, මොහහෙතුක ය යි. මහණෙනි, මම මිථ්‍යාදෘෂ්ටි ය ද ත්‍රිවිධ කොට කියමි: ලොභහෙතුක ය, දෙස-හෙතුකය, මොහහෙතුකය යි.

මහණෙනි, මෙසේ වනාහි ලොභය කම්මනිදානසම්භව වෙයි. දෙසය කම්මනිදාන සම්භව වෙයි. මොහය කම්මනිදානසම්භව වෙයි. ලොභක්ෂය හෙතුවෙන් කර්මනිදානක්ෂයය වෙයි. දෙෂක්ෂය පෙතුවෙන් කර්මනිදානක්ෂයය වෙයි, මොහක්ෂය හෙතුවෙන් කර්මනිදානක්ෂයය වේ යයි.

## 10. 4. 2. 9

## සපරික්කමන සූත්‍රය

මහණෙනි, මේ ධර්මය පරිවර්ජන සහිත වෙයි, මේ ධර්මය පරිවර්ජන රහිත නො වෙයි. මහණෙනි, මේ ධර්මය කෙසේ පරිවර්ජන සහිත වේය යත්: මේ ධර්මය කෙසේ පරිවර්ජන රහිත නොවේය යත්:

මහණෙනි, ප්‍රාණඝාතී හට ප්‍රාණඝාතවිරමණය පරිවර්ජනය වෙයි. මහණෙනි, අදින්නාදායී හට අදින්නාදානවිරමණය පරිවර්ජනය වෙයි. මහණෙනි, කාමමිථ්‍යාචාරීහට කාමමිථ්‍යාචාරවිරමණය පරිවර්ජනය වෙයි. මහණෙනි, මුසාවාදී හට මුසාවාදවිරමණය පරිවර්ජනය වෙයි.

පිසුනාවාචස්ස භික්ඛවෙ පිසුනාවාචා වෙරමණී පරික්කමනං හොති. ඵරුසාවාචස්ස භික්ඛවෙ ඵරුසාය වාචාය වෙරමණී පරික්කමනං හොති. සම්ඵප්පලාපිස්ස[1] භික්ඛවෙ සම්ඵප්පලාපා වෙරමණී පරික්කමනං හොති. අභිජ්ඣාලුස්ස භික්ඛවෙ අනභිජ්ඣා පරික්කමනං හොති. ව්‍යාපන්නස්ස[2] භික්ඛවෙ අව්‍යාපාදො පරික්කමනං හොති. මිච්ඡාදිට්ඨිකස්ස[3] භික්ඛවෙ සම්මා දිට්ඨි පරික්කමනං හොති.

එවං ඛො භික්ඛවෙ, සපරික්කමනො අයං ධම්මො නායං ධම්මො අපරික්කමනොති.

## 10. 4. 2. 10

## චුන්ද සුත්තං

එවං මෙ සුතං, එකං සමයං භගවා පාවායං[4] විහරති චුන්දස්ස කම්මාරපුත්තස්ස අම්බවනෙ. අථ ඛො චුන්දො කම්මාරපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චුන්දං කම්මාරපුත්තං භගවා එතදවොච: කස්ස නො ත්වං චුන්ද සොචෙය්‍යානි රොචෙය්‍යාසීති[5]?

බ්‍රාහ්මණා භන්තෙ පච්ඡාභූමකා කමණ්ඩලුකා සෙවාලමාලිකා අග්ගිපරිචාරකා[6] උදකොරොහකා සොචෙය්‍යානි පඤ්ඤපෙන්ති. තෙසාහං සොචෙය්‍යානි රොචෙමීති.

යථා කථං පන චුන්ද, බ්‍රාහ්මණා පච්ඡාභූමකා කමණ්ඩලුකා සෙවාලමාලිකා අග්ගිපරිචාරිකා උදකොරොහකා සොචෙය්‍යානි පඤ්ඤපෙන්තීති?

ඉධ භන්තෙ බ්‍රාහ්මණා පච්ඡාභූමකා කමණ්ඩලුකා සෙවාලමාලකා අග්ගිපරිචාරිකා උදකොරොහකා තෙ සාවකෙ[7] එවං සමාදපෙන්ති: "එහි ත්වං අම්භො පුරිස, කාලස්සෙව[8] උට්ඨහන්තොව[9] සයනම්හා පඨවිං ආමසෙය්‍යාසි, නො චෙ පඨවිං ආමසෙය්‍යාසි අල්ලානි ගොමයානි ආමසෙය්‍යාසි, නො චෙ අල්ලානි ගොමයානි ආමසෙය්‍යාසි හරිතානි තිණානි ආමසෙය්‍යාසි.

1. සම්ඵප්පලාපස්ස-සීමු.
2. ව්‍යාපන්න චිත්තස්ස -මජසං
3. මිච්ඡාදිට්ඨිස්ස-මජසං.
4. වාපායං-මජසං.
5. රොචෙසීති-මජසං.
6. අග්ගිපරිචාරිකා-මජසං.
7. සාවකං-මජසං, සීමු.
8. සකාලස්සෙව-සයා.
9. උට්ඨහන්තො-සයා.

මහණෙනි, පිසුනුබස් ඇත්තහුට පිසුනු බසින් විරමණය පරික්‍රමණය වෙයි. මහණෙනි, පරොස් බස් ඇත්තහුට පරොස් බසින් විරමණය පරික්‍රමණය වෙයි. මහණෙනි, සම්ඵප්‍රලාප ඇත්තහුට සම්ඵප්‍රලාපයෙන් විරමණය පරික්‍රමණය වෙයි. මහණෙනි, අභිධ්‍යා ඇත්තහුට අනභිධ්‍යාව පරික්‍රමණය වෙයි. මහණෙනි, ව්‍යාපාද ඇත්තහුට අව්‍යාපාදය පරික්‍රමණය වෙයි. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුට සම්‍යග්දෘෂ්ටිය පරික්‍රමණය වෙයි.

මහණෙනි, මෙසේ මේ ධර්මය සපරික්‍රමණ වෙයි. මේ ධර්මය අපරික්‍රමණ නො වේ යි.

## 10. 4. 2. 10
## චුන්ද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පාවා හි චුන්දකර්මාර පුත්‍රයාගේ අඹවෙනෙහි වැඩ වසන සේක. එකල චුන්ද කර්මාරපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හින. එකත්පස් ව හුන් ආයුෂ්මත් චුන්ද කර්මාරපුත්‍රහට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක: චුන්දය, තෝ කවරකුගේ සුචිභාවයන් රුස්නෙහි ද යි.

වහන්ස, පශ්චාද්භූමි වැසි කමඩලා දරන සෙවෙල්දම් පළඳින ගිනි පුදන උදකාවරොහණය කරන බ්‍රාහ්මණයෝ සුචිභාවයන් පනවත්. වහන්ස, මම ඔවුන්ගේ සුචිභාවයන් රුස්නෙමි යි.

චුන්දය, කෙසේනම් පශ්චාද්භූමිවාසී කමඩලා දරන සෙවෙල්දම් පළඳින ගිනිපුදන උදකාවරොහණය කරන බ්‍රාහ්මණයෝ සුචිභාවයන් පණවත්දැයි. ?

වහන්ස, මෙහි පශ්චාද්භූමක වූ කමඩලා දරන සෙවෙල්දම් පළඳින ගිනි පුදන උදකාවරොහණය කරන බමුණෝ මෙසේ සව්වන් සමාදන් කරවත්: “එම්බා පුරුෂය, එව තෝ කල් ඇතිව ම යහනින් නැගිටුනේ පොළොව පිරිමදනෙහි, ඉදින් පොළොව නො පිරිමදනෙහි නම් අමුගොම පිරිමදනෙහි, ඉදින් අමුගොම නො පිරිමදනෙහි නම් නිල් තණ පිරිමදනෙහි.

නො චෙ හරිතානි තිණානි ආමසෙය්‍යාසි අග්ගිං පරිචරෙය්‍යාසි, නො චෙ අග්ගිං පරිචරෙය්‍යාසි පඤ්ජලිකො ආදිච්චං නමස්සෙය්‍යාසි, නො චෙ පඤ්ජලිකො ආදිච්චං නමස්සෙය්‍යාසි සායතතියකං උදකං ඔරොහෙය්‍යාසීති. එවං ඛො භන්තෙ බ්‍රාහ්මණා පච්ඡාභූමකා කමණ්ඩලුකා සෙවාලමාලිකා අග්ගිපරිචාරකා උදකොරොහකා සොචෙය්‍යානි පඤ්ඤපෙන්ති. තෙසාහං සොචෙය්‍යානි රොචෙමීති.

අඤ්ඤථා ඛො චුන්ද බ්‍රාහ්මණා පච්ඡාභූමකා කමණ්ඩලුකා සෙවාලමාලිකා අග්ගිපරිචාරකා උදකොරොහකා සොචෙය්‍යානි පඤ්ඤපෙන්ති. අඤ්ඤථා ච පන අරියස්ස විනයෙ සොචෙය්‍යං හොතීති.

යථා කථං පන භන්තෙ අරියස්ස විනයෙ සොචෙය්‍යං හොති? සාධු මෙ භන්තෙ භගවා තථා ධම්මං දෙසෙතු යථා අරියස්ස විනයෙ සොචෙය්‍යං හොතීති.

තෙන හි චුන්ද සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො චුන්දො කම්මාරපුත්තො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

තිවිධං ඛො චුන්ද කායෙන අසොචෙය්‍යං හොති, චතුබ්බිධං වාචාය අසොචෙය්‍යං හොති, තිවිධං මනසා අසොචෙය්‍යං හොති.

කථඤ්ච චුන්ද තිවිධං කායෙන අසොචෙය්‍යං හොති:

1. ඉධ චුන්ද එකච්චො පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ[1] නිවිට්ඨො අදයාපන්නො සබ්බපාණභූතෙසු.

2. අදින්නාදායී හොති යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා, තං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතා හොති,

3. කාමෙසු මිච්ඡාචාරී හොති යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුලපරික්ඛිත්තාපි. තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති,

එවං ඛො චුන්ද කායෙන අසොචෙය්‍යං හොති.

---

1. හතපහතෙ, - මජසං.

ඉදින් නිල්තණ නො පිරිමදනෙහි නම් අග්නිපරිචරණය කරනෙහි. ඉදින් අග්නිපරිචරණය නො කරනෙහි නම් බද්දිලි ව හිරු නමදනෙහි. ඉදින් බද්දිලි ව හිරු නො නමදනෙහි නම් සවස තෙවැනි කොට උදකාවරොහණ කරනෙහි''යි. වහන්ස, මෙසේ පශ්චාද්භූමක, කමඩලා දරන සෙවෙල්මල්දම් පළඳින, අග්නිපරිචරණය කරණ උදකාවරොහණය කරණ බ්‍රාහ්මණයෝ සුචිභාවයන් පණවත් යි. ඔවුන්ගේ ඒ සුචිභාවයන් කැමැත්තෙමි යි.

චුන්දය, පච්ඡාභූමි වැසි කමඩලා දරණ සෙවෙල් දම් පළඳින අග්නිපරිචරණය කරන උදකාවරොහණයෙහි යෙදෙන බ්‍රාහ්මණයෝ අන් පරිද්දෙකින් සුචිභාවයන් පනවත්. ආයඝීවිනයෙහි වනාහි සුචිබව අන්පරිද්දෙකින් වේ ය යි.

වහන්ස, ආයඝීවිනයෙහි සුචිබව කෙසේ වේද? වහන්ස, යම් පරිදි ආයඝීවිනයෙහි සුචිබව වේ නම් භාග්‍යවතුන් වහන්සේ මට එපරිදි දහම් දෙසනාසෙක් නම් මැනවැයි.

චුන්දය, එසේ නම් අසව, මොනොවට මෙනෙහි කරව, දෙසන්නෙමියි. එසේය වහන්සැයි චුන්දකම්රපුත්‍ර භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්විය. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළහ:

චුන්දය, කයින් ත්‍රිවිධඅශුචිභාවයෙක් වෙයි, වචනයෙන් චතුර්විධ අශුචිභාවයෙක් වෙයි, මනසින් ත්‍රිවිධඅශුචිභාවයෙක් වේ.

චුන්දය, කයින් ත්‍රිවිධ අශුචිභාවය කිසේය යත්:

1. චුන්දය, මෙ ලොව්හි ඇතැමෙක් රුදුරුකම් ඇතියේ ලෙහෙවැකි අත් ඇතියේ නැසුම් හා පැහැරුම්හි නිවිෂ්ට වූයේ සච්සතුන් කෙරෙහි දයාරහිත වූයේ ප්‍රාණඝාතී වෙයි.

2. අයිනාදන් කරන සැහැවි ඇතියේ වෙයි: ග්‍රාමගත වේවයි අරණ්‍යගත වේවයි යම් මෙරමා සතු වස්තූපකරණයෙක් වේ නම් සොය සඬ්ඛ්‍යාත වූ නොදුන් දැ ගන්නෝ වෙයි.

3. කාමයන්හි මිස හසර ඇතියේ වෙයි: මාතෘරක්ෂිතාය, පිතෘරක්ෂිතාය, මාතෘපිතෘරක්ෂිතාය, භ්‍රාතෘරක්ෂිතාය, භගිනීරක්ෂිතාය, ඥතිරක්ෂිතාය, ධර්මරක්ෂිතාය, සස්වාමිකාය, සපරිදණ්ඩාය, යටත් පිරිසෙයින් මාලාගුලායෙන් පරික්ෂිප්ත වුවා දැයි යම් ඒ මාගම්හු වෙත් නම් එබඳු මාගමුන් කෙරෙහි හැසිරෙන බවට පැමිණෙන්නෝ වෙයි.

චුන්දය, මෙසේවනාහි කයින් අශුචිභාවය වේ.

කථඤ්ච චුන්ද චතුබ්බිධං වාචාය අසොචෙය්‍යං හොති:

4. ඉධ චුන්ද එකච්චො මුසාවාදී හොති සභාගතො[1] වා පරිසගතො[2] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො "එහම්භො පුරිස යං ජානාසි තං වදෙහී'ති'. සො අජානං වා ආහ 'ජානාමී'ති, ජානං වා ආහ 'න ජානාමී'ති අපස්සං'වා ආහ 'පස්සාමී'ති.* පස්සං වා ආහ 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති,

5. පිසුනවාචො හොති ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තා භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති.

6. ඵරුසවාචො හොති යා සා වාචා අණ්ඩකා කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා, තථාරූපිං වාචං භාසිතා හොති.

7. සම්ඵප්පලාපී හොති අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචං භාසිතා හොති අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං.

එවං ඛො චුන්ද චතුබ්බිධං වාචාය අසොචෙය්‍යං හොති.

කථඤ්ච චුන්ද තිවිධං මනසා අසොචෙය්‍යං හොති:

8. ඉධ චුන්ද එකච්චො අභිජ්ඣාලු හොති යං තං පරස්ස පරවිත්තූපකරණං තං අභිජ්ඣිතා හොති, "අහො වත යං පරස්ස තං මම අස්සා'ති.[3]

9. ව්‍යාපන්නචිත්තො හොති පදුට්ඨමනසඞ්කප්පො "ඉමෙ සත්තා හඤ්ඤන්තු වා බජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුං ඉති වා"ති.[4]

10. මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො, "නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථි අයං ලොකො නත්ථි පරො ලොකො නත්ථි මාතා නත්ථි පිතා නත්ථි සත්තා ඔපපාතිකා නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී"ති.

එවං ඛො චුන්ද තිවිධං මනසා අසොචෙය්‍යං හොතීති.

1. සභග්ගතො - මජසං.
2. පරිසග්ගතො - මජසං.
3. අහො වතායං පරස්ස තං මම අස්සාති. - සීමු.
* සො අජානං වා අහං ජානාමීති, ජානං වා අහං න ජානාමීති, අපස්සං වා අහං පස්සාමීති, පස්සං වා අහං න පස්සාමීති. PTS.
4. මා වා අහෙසුන්ති, - මජසං.

4. චුන්දය, කෙසේ නම් වචනයෙන් සිවුවැදෑරුම් අශුචිභාවය වේය යත්: චුන්දය මෙ ලොව්හි ඇතැමෙක් සභාවකට ගියේ වේවයි පිරිසකට ගියේ වේවයි නෑයන් මැදට ගියේ වේවයි ජනසමූහ මැදට ගියේ වේවයි රජකුලය මැදට ගියේ වේවයි ඉදිරියට කැඳවා ලදුයේ එම්බා පුරුෂය, මෙහි එව, යමක් දනිහි නම් එ කියවයි සාක්ෂි අසන ලදුයේ මුසවා බණන සුලු වෙයි. හේ නො දන්නේ ම 'දනිමි'යි කියයි, දන්නේ හෝ 'නො දනිමි'යි කියයි, නො දක්නේ හෝ 'දක්මි'යි කියයි, දක්නේ හෝ 'නො දක්මි'යි කියයි. මෙසේ ආත්මහෙතුයෙන් වේවයි පරහෙතුයෙන් වේවයි අල්පවූ ආමිස හෙතුයෙන් වේවයි සම්පජානමුසා බණන්නේ වෙයි.

5. මොවුන්ගේ භෙදය පිණිස මෙතැනින් අසා අසෝතන්හි කියනුයේ හෝ අසෝතන්හි අසා ඔවුන්ගේ භෙදය පිණිස මොවුනට කියනුයේ හෝ පිසුනුබස් ඇතියේ වෙයි: මෙසේ සමග වූවන් බිඳිනුයේ හෝ බිඳුනවුනට අනුබල දෙනුයේ හෝ වර්ගකරණයෙහි ඇලුනේ වර්ගකරණයෙහි නියුක්තවූයේ වර්ගකරණයෙන් තුස්නේ වර්ගකරණබස් බණනනේ වෙයි.

6. පරොෂ්බස් ඇතියේ වෙයි: යම් ඒ බසක් රළු වේ ද කැකුළු වේ ද පරහට කටුක වේද මෙරමා ගටනා සුලු වේද ක්‍රොධය වටා ඇතියේ වේද සමාධියට හිත නො වේ ද එබඳු බස් කියන්නේ වෙයි.

7. සම්ඵප්‍රලාප වෙයි: අකාලවාදී ව අභූතවාදී ව අනර්ථවාදී ව අධර්මවාදී ව අවිනයවාදී ව ළෙහි නො තැබිය යුතු නො කල්හි හෙතු රහිත පිරිසිඳුම් නැති අනර්ථය ඇසුරු කළ බස් බණනේ වෙයි.

චුන්දය, මෙසේ වචනයෙන් සිවුවැදෑරුම් අශුචිභාවය වේ.

චුන්දය, කෙසේ නම් සිතින් ත්‍රිවිධ අශුචිභාවය වේය යත්:

8. චුන්දය, මෙලොව්හි ඇතැමෙක් අභිධ්‍යා බහුල කොට ඇතියේ වෙයි. යම් ඒ මෙරමාගේ පරවිත්තොපකරණ වේ නම් එයට ගිජු වෙයි "අහෝ මෙරමා අයත් යමක් වේ නම් එය මට වේවා"යි.

9. ප්‍රද්විෂ්ට මනඃ සඞ්කල්ප ඇතියේ මෙ සත්හු නැසෙත්වා හෝ යි බැඳෙත්වා හෝයි මුල් සිඳී යෙත්වා හෝයි වැනසෙත්වා හෝයි නො ම, වෙත්වා හෝයි ව්‍යාපාදයට පත් සිත් ඇතියේ වෙයි.

10. "දෙන ලද්දෙහි ඵල නැත, පුදන ලද්දෙහි ඵල නැත, හෝමයෙහි ඵල නැත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක නැත, මෙලෝ නැත, පරලෝ නැත, මව් නැත, පියා නැත, ඕපපාතික සත්වයෝ නැත, ලොකයෙහි සම්‍යග්ගත ව සම්‍යක් ප්‍රතිපනන ව මෙලෝ පරලෝ තුමූ විශිෂ්ටඥනයෙන් දැන සාක්ෂාත් කොට යමෙක් පවසත් නම් එබඳු මහණ-බමුණෝ නැතැයි.

චුන්දය, මෙසේ සිතින් ත්‍රිවිධ අශුචිභාව වේ.

ඉමෙ ඛො චුන්ද දස අකුසලකම්මපථා. ඉමෙහි ඛො චුන්ද දසහි අකුසලෙහි කම්මපථෙහි සමන්නාගතො කාලස්සෙව වුට්ඨහන්තොව සයනම්හා පථවිඤ්චෙපි ආමසති අසුචියෙව හොති. නො චෙපි පථවිං ආමසති අසුචියෙව හොති, අල්ලානි චෙපි ගොමයානි ආමසති අසුචියෙව හොති, නො චෙපි අල්ලානි ගොමයානි ආමසති අසුචියෙව හොති, හරිතානි චෙපි තිණානි ආමසති අසුචියෙව හොති, නො චෙපි හරිතානි තිණානි ආමසති අසුචියෙව හොති, අග්ගිඤ්චෙපි පරිචරති අසුචියෙව හොති, නො චෙපි අග්ගිං පරිචරති අසුචියෙව හොති, පඤ්ජලිකො චෙපි ආදිච්චං නමස්සති අසුචියෙව හොති, නො චෙපි පඤ්ජලිකො ආදිච්චං නමස්සති අසුචියෙව හොති, සායතතියකඤ්චෙපි උදකං ඔරොහති අසුචියෙව හොති, නො චෙපි සායතතියකං උදකං ඔරොහති අසුචියෙව හොති.

තං කිස්ස හෙතු?

ඉමෙ චුන්ද දස අකුසලකම්මපථා අසුචියෙව[1] හොන්ති, අසුචිකරණා ච. ඉමෙසං පන චුන්ද දසන්නං අකුසලානං කම්මපථානං සමන්නාගමනහෙතු නිරයො පඤ්ඤායති, තිරච්ඡානයොනි පඤ්ඤායති, පෙත්තිවිසයො පඤ්ඤායති, යා වා පන අඤ්ඤාපි[2] කාචි දුග්ගතියො.[3]

තිවිධං ඛො චුන්ද කායෙන සොචෙය්‍යං හොති, චතුබ්බිධං වාචාය සොචෙය්‍යං හොති, තිවිධං මනසා සොචෙය්‍යං හොති.

කථං චුන්ද තිවිධං කායෙන සොචෙය්‍යං හොති:

1. ඉධ චුන්ද එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති.

2. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා, න තං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතා හොති.

3. කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා[4] ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුලපරික්ඛිත්තාපි, තථාරූපාසු න චාරිත්තං ආපජ්ජිතා හොති.

එවං ඛො චුන්ද තිවිධං කායෙන සොචෙය්‍යං හොති.

---

1. අසුචි චෙව - සයා.
2. යා වා පනඤ්ඤාපි - මජසං.
3. දුග්ගති හොති - සයා.
4. ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා - මජසං.

චුන්දය මේ දශඅකුශලකර්මපථයි. චුන්දය, මේ දශඅකුශලකර්මපථයෙන් සමන්වාගත වූයේ කල් ඇතිව ම යහනින් නැගී සිටුනේ පොළොව පිරිමදනේ නමුදු අශුචි ම වෙයි, පොළොව නො පිරිමදනේ නමුදු අශුචි ම වෙයි, අමුගොම පිරිමදනේ නමුදු අශුචි ම වෙයි, අමුගොම නො පිරිමදනේ නමුදු අශුචි ම වෙයි, නිල්තණ පිරිමදනේ නමුදු අශුචි ම වෙයි, නිල්තණ නො පිරිමදනේ නමුදු අශුචි ම වෙයි, අග්නිපරිචර්‍ය්‍යා කරන්නේ නමුදු අශුචි ම වෙයි අග්නිපරිචර්‍ය්‍යා නො කරන්නේ නමුදු අශුචි ම වෙයි, බද්දිලිව හිරු නමදනේ නමුදු අශුචි ම වෙයි. බද්දිලි ව හිරු නො නමදනේ නමුදු අශුචි ම වෙයි, සවස තුන්වනු කොට දියට බස්නේ නමුදු අශුචි ම වෙයි, සවස තුන්වනු කොට දියට නො බස්නේ නමුදු අශුචි ම වෙයි.

එ කවර හෙයිනැ යත්:

චුන්දය, මේ දශඅකුශලකර්මයෝ අශුචි ම වෙති, අශුචිකරණ ම වෙත්. චුන්දය, මේ දශඅකුශල කර්මපථයන්ගේ සමන්වාගමහෙතුයෙන් නිරය පැනෙයි, තිරිසන්යොන් පැනෙයි, ප්‍රෙතවිෂය පැනෙයි. එබඳු අන් කිසි දුර්ගතිහු ද පැනෙත්.

චුන්දය, කායසෞචෙය්‍යය ත්‍රිවිධ වෙයි, වචීසොචෙය්‍යය චතුර්විධ වෙයි, මනොසොචෙය්‍යය ත්‍රිවිධ වෙයි.

චුන්දය, කෙසේ කයින් ත්‍රිවිධ සුචිභාවය වේයැ යත්:

1. මෙලොව්හි ඇතැමෙක් පණිවා හැර පණිවායෙන් වැළැක්කේ වෙයි, බහා තැබූ දඬු ඇත්තේ බහා තැබූ අවි ඇත්තේ ලජ්ජා ඇත්තේ සව්සතුන් කෙරෙහි දයා ඇත්තේ හිතානුකම්පා ඇත්තේ වෙසෙයි.

2. අයිනාදන් හැර අයිනාදනින් වෙන් වූයේ වෙයි, ගම්හි වූ හෝ අරන්හි වූ හෝ මෙරමා අයත් යම් ඒ පරවිත්තූපකරණ වේ නම් ථෙය්‍යසඞ්ඛ්‍යාත ඒ නො දුන් දැ නො ගන්නේ වෙයි.

3. කාමයන්හි මිස හසර හැර දමා මිසහසරින් වැළැක්කේ වෙයි, මාතෘරක්ෂිතාය, පිතෘරක්ෂිතාය, මාතාපිතෘරක්ෂිතාය, භ්‍රාතෘරක්ෂිතාය, භගිනිරක්ෂිතාය, ඥාතිරක්ෂිතාය, ධර්මරක්ෂිතාය, සස්වාමිකාය, සපරිදණ්ඩාය, යටත් පිරිසෙයින් මල්ගුලායෙන් පිරිකෙව්ලද්දැයි යම් ඒ මාගම්හු වෙත් නම් උන් කෙරෙහි නො හැසිරෙන බවට නො පැමිණෙන්නේ වෙයි.

චුන්දය මෙසේ කයින් ත්‍රිවිධ ශුචිභාවය වේ.

කථඤ්ච චුන්ද චතුබ්බිධං වාචාය සොචෙය්‍යං හොති:

4. ඉධ චුන්ද එකච්චො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, සභාගතො වා පරිසගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො, "එහම්භො පුරිස යං ජානාසි, තං වදෙහී"ති සො අජානං වා ආහ 'න ජානාමී'ති, 'ජානං වා ආහ ජානාමී'ති, අපස්සං වා ආහ 'න පස්සාමී'ති, පස්සං වා ආහ 'පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජානමුසා භාසිතා හොති.

5. පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති. න ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. න අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති.

6. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජන මනාපා, තථාරූපිං වාචං භාසිතා හොති.

7. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

එවං ඛො චුන්ද චතුබ්බිධං වාචාය සොචෙය්‍යං හොති.

කථඤ්ච චුන්ද තිවිධං මනසා සොචෙය්‍යං හොති:

8. ඉධ චුන්ද එකච්චො අනභිජ්ඣාලු හොති, යං තං පරස්ස පරවිත්තූපකරණං, තං නාභිජ්ඣිතා හොති අහො වත යං පරස්ස තං මම අස්සාති.

9. අබ්‍යාපන්නචිත්තො හොති අප්පදුට්ඨමනසංකප්පො, "ඉමෙ සත්තා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූ"ති.[2]

1. තං අනභිජ්ඣිතා හොති – මජසං.
2. ඉමෙ සත්තා අවෙරා හොන්තු අබ්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු – මජසං.

චුන්දය කෙසේ නම් වචනයෙන් සිවුවැදැරු සුචිභාව වේය යත්:

4. චුන්දය, මෙලොව්හි ඇතැමෙක් මුසවා හැර පියා සභාවට ගියේ වේවයි, පිරිසට ගියේ වේවයි, නෑයන් මැදට ගියේ වේවයි, ජනසමූහ මැදට ගියේ වේවයි රජකුලන් මැදට ගියේ වේවයි අබිමුවට කැඳවන ලදුයේ "එම්බා පුරුෂය, එව, යමක් දන්නෙහි නම් එ කියව"යි සාක්ෂි විසින් පිළිවුස්නා ලදුයේ මුසවායෙන් වැළැක්කේ වෙයි. හේ නොදන්නේ හෝ නොදන්මි'යි කියයි, දන්නේ හෝ 'දන්මි'යි කියයි, නො දක්නේ හෝ නො දක්මි'යි කියයි, දක්නේ හෝ 'දක්මි'යි කියයි. මෙසේ ආත්මහෙතුයෙන් වේවයි පරහෙතුයෙන් වේවයි කිසියම් ආමිෂහෙතුවකින් වේවයි සම්පජානමුසා නො කියන්නේ වෙයි.

5. පිසුනු බස් හැරපියා පිසුනුබසින් වැළැක්කේ වෙයි: මෙතන්හි අසා මුන්ගේ හෙදය පිණිස එතන්හි නො කියන්නේ වෙයි, එ තන්හි අසා උන්ගේ හෙදය පිණිස මොවුනට නො කියන්නේ වෙයි. මෙසේ බිඳුනවුන් හෝ ගටනුයේ වෙයි, සමග වූවනට අනුප්‍රදතෘ වෙයි. සමගයෙහි ඇලුනේ සමගයන් කෙරෙහි රඳුනේ සමගයන් හා තුටු වනුයේ සමග කරන බස් කියනුයේ වෙයි.

6. පරොස්බස් හැරපියා පරොස් බසින් වැළැක්කේ වෙයි: යම් ඒ බසක් නිදෙස් වූ, කනට සුව දෙන ප්‍රෙමණීය හෘදයඞ්ගම විනීත බොහෝ දෙන හට සිත්කලු බොහෝ දෙන හට මන වඩන බසෙක් වේ නම් එබඳු බස් තෙපලන්නේ වෙයි.

7. පලප් බස් හැරපියා පලප්බසින් වැළැක්කේ වෙයි: කාලවාදී ව භූතවාදී ව අර්ථවාදී ව ධර්මවාදී ව විනයවාදී ව ළෙහි නිදන් කටයුතු සහෙතුක වූ පිරිවැටුම් ඇති අර්ථනිඃශ්‍රිත බස් කල්හි බණන්නේ වෙයි.

චුන්දය, මෙසේ වචනයෙන් චතුර්විධ ශුචිභාවය වේ.

චුන්දය, මනසින් ත්‍රිවිධ ශුචිභාවය කෙසේ වේය යත්:

8. චුන්දය, මෙ ලොව්හි ඇතැමෙක් අභිජ්ඣා බහුල නො වෙයි. මෙරමාගේ යම් ඒ පරවිත්තොපකරණයෙක් වේ නම් 'අහෝ, එකැතින් ඒ පරා අයත් යමක් වේ නම් එ මට වේව'යි එයට ගිජු නො වෙත්.

9. "මේ සත්ත්වයෝ වෛර නැතියාහු ව්‍යාපාද නැතියාහු දුක් නැතියාහු සුවපත් වූවාහු ආත්මපරිහරණ කෙරෙත්වා"යි අප්‍රද්විෂ්ටමනඃ සංකල්ප ඇතියේ අව්‍යාපාදයට නො වන් සිත් ඇතියේ වෙයි.

10. සම්මාදිට්ඨිකො හොති අවිපරීතදස්සනො, "අත්ථි දින්නං. අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමං ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී''ති.

එවං ඛො චුන්ද තිවිධං මනසා සොචෙය්‍යං හොති.

ඉමෙ ඛො චුන්ද දස කුසලකම්මපථා.

ඉමෙහි ඛො දසහි කුසලකම්මපථෙහි සමන්නාගතො කාලස්සෙව උට්ඨහන්තොව සයනම්හා පඨවිං චෙපි ආමසති, සුචියෙව හොති. නො චෙපි පඨවිං ආමසති, සුචි යෙව හොති. අල්ලානි චෙපි ගොමයානි ආමසති සුචියෙව හොති. නො චෙපි අල්ලානි ගොමයානි ආමසති, සුචියෙව හොති. හරිතානි චෙපි තිණානි ආසමති, සුචියෙව හොති නො චෙපි හරිතානි තිණානි ආමසති, සුචියෙව හොති අග්ගිඤ්චෙපි පරිචරති, සුචියෙව හොති. නො චෙපි අග්ගිං පරිචරති, සුචියෙව හොති පඤ්ජලිකො චෙපි ආදිච්චං නමස්සති, සුචියෙව හොති. නො චෙපි පඤ්ජලිකො ආදිච්චං නමස්සති, සුචියෙව හොති. සායතතියකඤ්චෙපි උදකං ඔරොහති, සුචියෙව හොති. නො චෙපි සායතතියකං උදකං ඔරොහති, සුචියෙව හොති.

තං කිස්ස හෙතු.

ඉමෙ චුන්ද දස කුසලකම්මපථා සුචියෙව හොන්ති, සුචිකරණා ච ඉමෙසඤ්ච පන චුන්ද දසන්නං කුසලානං කම්මපථානං සමන්නාගමනහෙතු දෙවා පඤ්ඤායන්ති, මනුස්සා පඤ්ඤායන්ති, යා වා පනඤ්ඤාපි කාචි සුගතියොති.

එවං වුත්තෙ චුන්දො කම්මාරපුත්තො භගවන්තං එතදවොච:

අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 10. 4. 2. 11
## ජාණුස්සොණි සුත්තං

අථ ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ජාණුස්සොණි බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

10. දුන් දෑහි ඵල ඇත, පූජායෙහි ඵල ඇත, හොමයෙහි ඵල ඇත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක ඇත, මෙලෝ ඇත, පරලෝ ඇත, මවු ඇත, පියා ඇත, ඖපපාතික සත්ත්වයෝ ඇත, යමෙක් මෙලෝ හා පරලෝ තුමූ ම විශිෂ්ටඥනයෙන් දැන සාක්ෂාත් කොට ප්‍රකාශ කෙරෙත් නම් එබඳු සම්‍යක්ගත සම්‍යක් ප්‍රතිපන්න මහණ බමුණෝ ලොව්හි ඇතැයි අවිපරීත දර්ශන ඇතියේ සම්‍යග්දෘෂ්ටික වෙයි.

චුන්දය, මෙසේ මනසින් ත්‍රිවිධ ශුචිභාවය වේ.

චුන්දය, මේ දශ කුශල කර්මපථයෝයි.

මේ දශ කුශල කර්මපථයන් ගෙන් සමන්වාගත වූයේ කල් ඇතිව ම යහනින් නැගෙනුයේ ම පොළෝ පිරිමදනේ නමුදු ශුචියෙක්ම වෙයි. පොළෝ නො පිරිමදනේ නමුදු ශුචියෙක් ම වෙයි. අමුගොම පිරිමදනේ නමුදු ශුචියෙක් ම වෙයි. අමුගොම නො පිරිමදනේ නමුදු ශුචියෙක් ම වෙයි. නිල් තණ පිරිමදනේ නමුදු ශුචියෙක් ම වෙයි. නිල් තණ නො පිරිමදනේ නමුදු ශුචියෙක් ම වෙයි. අග්නිපරිචර්‍ය්‍යා කරනේ නමුදු ශුචියෙක් ම වෙයි. අග්නිපරිචර්‍ය්‍යා නො කරනුයේ නමුදු ශුචියෙක් ම වෙයි. බද්දිලිව හිරු නමදනේ නමුදු ශුචියෙක් ම වෙයි. බද්දිලිව හිරු නො නමදනේ නමුදු ශුචියෙක් ම වෙයි. සවස තෙවෙනි කොට දියට බස්නේ නමුදු ශුචියෙක් වෙයි. සවස තෙවෙනි කොට දියට නො බස්නේ නමුදු ශුචියෙක් වෙයි.

එ කවර හෙයිනැ

චුන්දය, මේ දශ කුශල කර්ම පථයෝ ශුචි ම වෙති. ශුචිකරණ ද වෙත්. චුන්දය, මේ දශ කුශල කර්මපථයන්ගේ සමන්වාගමන හෙතුයෙන් දෙවියෝ පැනෙත්. මනුෂ්‍යයෝ පැනෙත්. යම් බඳු අන් කිසි සුගතිහු ද පැනෙත්යයි.

මෙසේ වදරත්ම චුන්ද කර්මාරපුත්‍ර භාග්‍යවතුන් වහන්සේට තෙල කීය:

වහන්ස, ඉතා මැනැව ... වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණගත උපාසකයකු කොට මා ධරන සේක්වායි.

## 10. 4. 2. 11

## ජාණුස්සොණි සූත්‍රය

ඉක්බිති ජාණුස්සොණි බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටුවිය. සතුටුවියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පස්හි හින, එකත්පස්හි හුන් ජාණුස්සොණි බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

මයමස්සු භො ගොතම බ්‍රාහ්මණා නාම දනානි දෙම සද්ධානි කරොම: "ඉදං දන පෙතානං ඤාතිසාලොහිතානං උපකප්පතු, ඉදං දනං පෙතා ඤාතිසාලොහිතා පරිභුඤ්ජන්තු' ති. කච්චි තං භො ගොතම දනං පෙතානං ඤාතිසාලොහිතානං උපකප්පති? කච්චි තෙ පෙතා ඤාතිසාලොහිතා තං දනං පරිභුඤ්ජන්ති ති?

ඨානෙ ඛො බ්‍රාහ්මණ උපකප්පති, නො අට්ඨානෙති.

කතමඤ්ච[1] භො ගොතම ඨානං? කතමං අට්ඨානන්ති?

ඉධ බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතී හොති, අදින්නාදයී හොති කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුනවාචො හොති, ඵරුස වාචො හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨිකො හොති, සො කායස්සභෙද පරං මරණා නිරයං උපපජ්ජති. යො නෙරයිකානං සත්තානං ආහාරො තෙන සො තත්ථ යාපෙති, තෙන සො තත්ථ තිට්ඨති. ඉදම්පි ඛො බ්‍රාහ්මණ අට්ඨානං යත්ථ ඨිතස්ස තං දනං න උපකප්පති.

ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතී හොති -පෙ- මිච්ඡාදිට්ඨිකො හොති. සො කායස්ස භෙද පරම්මරණා තිරච්ඡානයොනිං උපපජ්ජති යො තිරච්ඡානයොනිකානං සත්තානං ආහාරො තෙන සො තත්ථ යාපෙති, තෙන සො තත්ථ තිට්ඨති. ඉදම්පි ඛො බ්‍රාහ්මණ අට්ඨානං, යත්ථ ඨිතස්ස තං දනං න උපකප්පති.

ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදනා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාද පටිවිරතො හොති, පිසුනාය වාචාය පටිවිරතො හොති, ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨිකො හොති. සො කායස්ස භෙද පරම්මරණා මනුස්සානං සහව්‍යතං උපපජ්ජති. යො මනුස්සානං ආහාරො තෙන සො තත්ථ යාපෙති, තෙන සො තත්ථ තිට්ඨති. ඉදම්පි ඛො බ්‍රාහ්මණ අට්ඨානං, යත්ථ ඨිතස්ස තං දනං න උපකප්පති.

1. කතමඤ්ච පන - මජ්ඣං.

පින්වත් ගෞතමයන් වහන්ස බ්‍රාහ්මණ නම් වූ අපි "මේ දනය පරලොව ගිය ඥාතිසාලොහිතයනට පැමිණේවා, මෙ දනය පරලොව ගිය ඥාතිසාලොහිතයෝ පරිභොග කරත්වා"යි දන්දෙම්හ, ශ්‍රාද්ධ කරම්හ. කිමෙක භවත් ගෞතමයන් වහන්ස, එ දනය ප්‍රෙතඥාතිසාලොහිතයනට පැමිණේද? කිමෙක, ඒ ප්‍රෙතඥාතිසාලොහිතයෝ එ දන් පරිභොග කරත් දැයි?

බ්‍රාහ්මණය, ස්ථානයෙහි පැමිණෙයි, අස්ථානයෙහි නො පැමිණේයයි.

භවත් ගෞතමයන් වහන්ස, ස්ථානය කවරේය? අස්ථානය කවරේය?

බ්‍රාහ්මණය, මෙ ලොව්හි ඇතැමෙක් ප්‍රාණඝාතී වෙයි, අයිනාදන් කරනේ වෙයි. කාමයන්හි මිථ්‍යාචාර ඇතියේ වෙයි. මුසවා කියන සැහැවි-යේ වෙයි, පිසුනු බස් ඇතියේ වෙයි, පරොස් බස් ඇතියේ වෙයි, පලප් තෙපලන්නේ වෙයි, අභිධ්‍යා බහුල වෙයි, ව්‍යාපාදයට වන් සිතැත්තේ වෙයි, මිථ්‍යාදෘෂ්ටික වෙයි. හේ කාබුන් මරණින් පසු නිරයට එළඹෙයි. නිරිසතුන්ගේ යම් ආහාරයෙක් වේ නම් එයින් හේ එහි යැපෙයි. එයින් හේ එහි සිටුනේය. බ්‍රාහ්මණය, යම් තැනෙක සිටියහුට එ දනය නො පැමිණේ නම්, මෙද (එබඳු) අස්ථානයෙකි.

බ්‍රාහ්මණය, මෙ ලොව්හි ඇතැමෙක් ප්‍රාණඝාතී වෙයි -පෙ- මිථ්‍යා-දෘෂ්ටික වෙයි. හේ කාබුන් මරණින් මතු තිරශ්චීන යොනියට එළඹෙයි. තිරිසන් යොන් සත්නට යම් ආහාරයෙක් වේ නම් හේ, එහි එයින් යැපෙයි එයින් හේ එහි සිටුනේය. බ්‍රාහ්මණය, යම් තැනෙක සිටුන-හට එ දනය නොපැමිණේ නම්, මෙද අස්ථානයෙකි.

බ්‍රාහ්මණය, මෙ ලොව්හි ඇතැමෙක් පණිවායෙන් වැළැකියේ වෙයි. අයිනාදනින් වැළැකියේ වෙයි. කාමයන්හි මිථ්‍යාචාරින් වැළැකියේ වෙයි. මුසවායෙන් වැළැකියේ වෙයි. පිසුනුබසින් වැළැකියේ වෙයි. පරොස්-බසින් වැළැකියේ වෙයි. සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. අභිධ්‍යා බහුලකොට නැතියේ වෙයි. ව්‍යාපාද නැතියේ වෙයි. සම්දිටු ඇතියේ වෙයි. හෙ කාබුන් මරණින් මතු මනුෂ්‍යයන්ගේ සභාවයට එළැඹෙයි. මිනිසුන්ගේ යම් අහරෙක් වේ නම්, හෙ එහි එයින් යැපෙන්නේය. ඉන් හෙ එහි සිටුනේය. බ්‍රාහ්මණය, යම් තැනෙක සිටියහුට එ දනය නොලැබේ නම්, මෙ ද එබඳු අස්ථානයෙකි.

ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සම්මාදිට්ඨිකො හොති. සො කායස්ස භෙදා පරං මරණා දෙවානං සහව්‍යතං උපපජ්ජති. යො දෙවානං ආහාරො තෙන සො තත්ථ යාපෙති, තෙන සො තත්ථ තිට්ඨති. ඉදම්පි බ්‍රාහ්මණ අට්ඨානං. යත්ථ ඨිතස්ස[1] තං දානං න උපකප්පති.

ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතී හොති -පෙ- මිච්ඡාදිට්ඨිකො හොති. සො කායස්ස භෙදා පරං මරණා පෙත්තිවිසයං උපපජ්ජති. යො පෙත්තිවෙසයිකානං සත්තානං ආහාරො, තෙන සො තත්ථ යාපෙති. තෙන සො තත්ථ තිට්ඨති. යං වා පනස්ස අනුප්පවෙච්ඡන්ති[2] මිත්තා වා අමච්චා වා ඤාති වා සාලොහිතා වා, තෙන සො තත්ථ යාපෙති. තෙන සො තත්ථ තිට්ඨති. ඉදං ඛො බ්‍රාහ්මණ ඨානං, යත්ථ ඨිතස්ස තං දානං උපකප්පතී ති.

සචෙ පන භො ගොතම සො පෙතො ඤාතිසාලොහිතො තං ඨානං අනුපපන්නො හොති, කො තං දානං පරිභුඤ්ජතීති?

අඤ්ඤෙපිස්ස බ්‍රාහ්මණ පෙතා ඤාති සාලොහිතා තං ඨානං අනුපපන්නා හොන්ති. තෙ තං දානං පරිභුඤ්ජන්තී ති.

සචෙ පන භො ගොතම සො චෙව පෙතො ඤාතිසාලොහිතො තං ඨානං අනුපපන්නො හොති, අඤ්ඤෙපිස්ස පෙතා ඤාතිසාලොහිතා තං ඨාන අනුපපන්නා හොන්ති. කො තං දානං පරිභුඤ්ජතී ති?

අට්ඨානං ඛො එතං බ්‍රාහ්මණ, අනවකාසො යං තං ඨානං විවිත්තං අස්ස ඉමිනා දීඝෙන අද්ධුනා යදිදං පෙතෙහි ඤාති සාලොහිතෙහි. අපි ච බ්‍රාහ්මණ දායකොපි අනිප්ඵලො හොති.

අට්ඨානෙපි භවං ගොතමො පරිකප්පං වදතීති? අට්ඨානෙපි ඛො අහං බ්‍රාහ්මණ පරිකප්පං වදාමි.

1. යත්ථ ඨිතස්ස තංදානං උපකප්පති - මජසං.
2. මිත්තාමච්චා වා ඤාතිසාලොහිතා වා - මජසං

බ්‍රාහ්මණය, මෙ ලොව්හි ඇතැමෙක් පණිවායෙන් වැළැකියේ වෙයි. -පෙ- සම්දිටු ඇතියේ වෙයි. හෙ කාබුත් මරණින් මතු දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. දෙවියන්ගේ යම් අහරෙක් වේ නම් එයින් හෙ එහි යැපෙන්නේය. හෙ එයින් එහි සිටුනේය. බ්‍රාහ්මණය, යම් තැනෙක සිටියහට එ දනය නො එළැඹේ නම් මෙ ද අස්ථානයෙකි.

බ්‍රාහ්මණය, මෙලොව්හි ඇතැමෙක් පණිවාකරනසුලු වෙයි. -පෙ- මිසදිටු ඇතියේ වෙයි. හෙ කාබුන් මරණින් මතු ප්‍රෙතවිෂයට එළඹෙයි. ප්‍රෙතවිෂයට අයත් සත්ත්වයන්ගේ යම් අහරෙක් වේ නම්, එයින්, හෙ එහි යැපෙයි. එයින් හෙ එහි සිටුනේය. ඔහට මිත්‍රයෝ වෙත්වයි, සගයෝ වෙත්වයි, ඥාතිහු වෙත්වයි, සහ ලේ නෑයෝ වෙත්වයි යමක් හෝ දෙත් නම්, හෙ ඉන් එහි යැපෙයි. හෙ එයින් එහි සිටුනේය. බ්‍රාහ්මණය, යම් තැනෙක සිටියහුට එ දනය එළැඹේ නම්, එ ස්ථානය වෙයි.

පින්වත් ගෞතමයන් වහන්ස, ඉන් පරලොව ගිය ඒ ඥාති සාලොහිතයා එතැනට නො පැමිණියේ නම් කවරෙක් එ දන පරිභොග කෙරේ දැයි?

බ්‍රාහ්මණය, පරලොව ගිය අන්‍යඥාතිසාලොහිතයෝද එතැනට පැමිණියාහු වෙත්, ඔහු එ දන් වළඳත් යයි.

භවත් ගෞතමයන් වහන්ස, පරලොව ගිය ඒ ඥාති සාලොහිත ද එහි නො පැමිණියේ වෙයි, පරලොව ගිය ඔහුගේ අන්‍ය ඥාතිසාලොහිතයෝ ද එතැනට නොපැමිණියාහු වෙත්නම්, කවරෙක් ඒ දන් වළඳනාහුදැයි?

බ්‍රාහ්මණය යම් කරුණෙකින් මෙ දීර්ඝකාලයෙහි පරලොවගිය ඥාතිසාලොහිතයන්ගෙන් එ ස්ථානය විවික්ත වන්නේය, යන මෙල කරුණ අස්ථාන වෙයි, අනවකාශ වෙයි, බ්‍රාහ්මණය, නැවැත දයක තෙමේ ද අනිෂ්ඵල වෙයි.

භවත් ගෞතමයන් වහන්සේ අස්ථානයෙහිදු (දනඵලයාගේ) පරිකල්පය වදරත්හු දැයි?

ඉධ බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතී හොති. අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුනාවාචො හොති, ඵරුසවාචො හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨිකො හොති, සො දතා හොති, සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං, සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො කායස්ස භෙදා පරං මරණා හත්ථීනං සහව්‍යතං උපපජ්ජති. සො තත්ථ ලාභී හොති අන්නස්ස පානස්ස මාලා නානාලඞ්කාරස්ස.

යං ඛො බ්‍රාහ්මණ ඉධ පාණාතිපාතී, අදින්නාදායී, කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී, පිසුනවාචො, ඵරුසවාචො, සම්ඵප්පලාපී, අභිජ්ඣාලු, ව්‍යාපන්නචිත්තො, මිච්ඡාදිට්ඨිකො, තෙන සො කායස්සභෙදා පරම්මරණා හත්ථීනං සහව්‍යතං උපපජ්ජති. යං ච ඛො සො දතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං, සෙය්‍යාවසථපදීපෙය්‍යං, තෙන සො තත්ථ ලාභී හොති අන්නස්ස පානස්ස මාලා නානාලංකාරස්ස.

ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුන වාචො හොති, ඵරුසවාචො හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨිකො හොති. සො දතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, සො කායස්ස භෙදා පරං මරණා අස්සානං සහව්‍යතං උපපජ්ජති. -පෙ- ගුන්නං සහව්‍යතං උපපජ්ජති -පෙ- කුක්කුරානං සහව්‍යතං උපපජ්ජති -පෙ- සො තත්ථ ලාභී හොති අන්නස්ස පානස්ස මාලා නානාලඞ්කාරස්ස.

යං ඛො බ්‍රාහ්මණ ඉධ පාණාතිපාතී -පෙ- මිච්ඡාදිට්ඨිකො, සො තෙන කායස්ස භෙදා පරං මරණා කුක්කුරානං සහව්‍යතං උපපජ්ජති. යඤ්ච ඛො සො දතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, තෙන සො තත්ථ ලාභී අන්නස්ස පානස්ස මාලා නානාලඞ්කාරස්ස.

බ්‍රාහ්මණය, මම අස්ථානයෙහිද්‍ දනඵල පරිකල්පය වදරමි. බ්‍රාහ්මණය, මෙලොව්හි ඇතැමෙක් පණිවාකරනසුලු වෙයි. අයිනාදන් ගන්නාසුලු වෙයි. කාමයන්හි මිසහසර ඇතියේ වෙයි. මුසවා බණනසුලු වෙයි. පිසුනුබස් ඇතියේ වෙයි. පරොස් බස් ඇතියේ වෙයි. සම්ඵප්‍රලාප ඇතියේ වෙයි. අභිධ්‍යා බහුල කොට ඇතියේ වෙයි. ව්‍යාපාදයට පැමිණි සිතැත්තේ වෙයි. මිසදිටු ඇතියේ වෙයි. හේ ශ්‍රමණයකුහට වේවයි, බ්‍රාහ්මණයකුහට වේවයි අන්න, පාන, වස්ත්‍ර, යාන, මාලාගන්ධ විලෙපන, ශය්‍යා ආවසථ, ප්‍රදීපොපකරණ දෙන්නේ වෙයි, හෙ කාබුන් මරණින්මතු ඇතුන්ගේ සහභාවයට එළඹෙයි. හෙ එහි අන්න, පාන, මාලා නානාලඞ්කාර ලබන සුලු වෙයි.

බ්‍රාහ්මණය, මෙ ලොව්හි යම්හෙයකින් පණිවා කරනසුලුද අයිනා දන් ගන්නා සුලු ද කාමයන්හි මිසහසර ඇතියේ ද පිසුනුබස් ඇතියේ ද පරොස්බස් ඇතියේ වේද සම්ඵප්‍රලාප ඇතියේද අභිධ්‍යා බහුලකොට ඇතියේ ද ව්‍යාපාදයටපත් සිතැතියේ;, මිථ්‍යාදෘෂ්ටික වේද, එහෙයින් හේ කාබුන් මරණින් මතු හස්තීන්ගේ සහභාවයට එළඹෙයි. යම් කරුණෙකින් හෙ මහණකුට වේවයි බමුණකුට වේවයි අන්නපාන වස්ත්‍ර යාන මාලා ගන්ධ විලෙපන ශය්‍යා ආවසථ ප්‍රදීපොපකරණ දෙන්නේ වේද එකරුණින් හෙ එහි අන්නපාන මාලා නානාලඞ්කාර ලබන සුල්ලේ වෙයි.

බමුණ, මෙ ලොව්හි ඇතැමෙක් පණිවා කරනසුලු වෙයි. අයිනාදන් ගන්නා සුලු වෙයි. කාමයෙහි මිසහසර ඇතියේ වෙයි. මුසාවාදී වෙයි. පිසුනු බස් ඇති වෙයි. පරොස්බස් ඇති වෙයි. සම්ඵප්‍රලාප ඇති වෙයි. අභිජ්ඣා බහුල වෙයි. ව්‍යාපාදයට පත් සිත් ඇති වෙයි. මිථ්‍යාදෘෂ්ටික වෙයි. හෙ මහණකුට වේවයි බමුණකුට වේවයි අන්නපාන වස්ත්‍රයාන මාලාගන්ධවිලෙපන ශය්‍යා ආවසථ ප්‍රදීපොපකරණ දෙන්නේ වෙයි. හේ කාබුන් මරණින් මතු අශ්වයන්ගේ සහභාවයට යෙයි. ගෙරින්ගේ සහභාවයට එළඹෙයි. ... සුනඛයන්ගේ සහභාවයට එළඹෙයි. ... හෙ එහි අන්න පාන මාලා හා නානාලඞ්කාර ලබන සුල්ලේ වෙයි.

බමුණ යම් කරුණකින් මෙලොව පණිවා කරන්නේ වේද, මිසදිටු ඇති වේද, හෙ එ කරුණින් කාබුන් මරණින් මතු සුනඛයන්ගේ සහභාවයට එළඹෙයි. යම් කරුණකින් හෙ මහණකුට වේවයි, බමුණෙකුට වේවයි, අන්නපානවස්ත්‍ර යාන මාලාගන්ධවිලෙපන ශය්‍යාවසථ ප්‍රදීපොපකරණ දෙනුයේ වෙයි. හෙ එකරුණින් එහි අන්නපානමාලා නානාලඞ්කාර ලබනසුලු වෙයි.

ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුණාවාචා පටිවිරතො හොති, ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨිකො හොති. සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ-විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං. සො කායස්ස භෙදා පරං මරණා මනුස්සානං සහව්‍යතං උපපජ්ජති. සො තත්ථ ලාභී හොති මානුසකානං පඤ්චන්නං කාමගුණානං.

යං ඛො බ්‍රාහ්මණ ඉධ පාණාතිපාතාපටිවිරතො හොති -පෙ- සම්මා-දිට්ඨිකො, තෙන සො කායස්ස භෙදා පරම්මරණා මනුස්සානං සහව්‍යතං උපපජ්ජති, යඤ්ච ඛො සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, තෙන සො තත්ථ ලාභී හොති මානුසකානං පඤ්චන්නං කාමගුණානං.

ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සම්මාදිට්ඨිකො හොති, සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධ විලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, සො කායස්ස භෙදා පරං මරණා දෙවානං සහව්‍යතං උපපජ්ජති. සො තත්ථ ලාභී හොති දිබ්බානං පඤ්චන්නං කාමගුණානං.

යං ඛො බ්‍රාහ්මණ ඉධ පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- සම්මා-දිට්ඨිකො. තෙන සො කායස්ස භෙදා පරං මරණා දෙවානං සහව්‍යතං උපපජ්ජති. යඤ්ච ඛො සො දාතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානං මාලාගන්ධවිලෙපනං සෙය්‍යාවසථපදීපෙය්‍යං, තෙන සො තත්ථ ලාභී හොති දිබ්බානං පඤ්චන්නං කාමගුණානං. අපි ච බ්‍රාහ්මණ, දායකො පි අනිප්ඵලො ති.

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යාවඤ්චිදං භො ගොතම අලමෙව දානානි දාතුං, අලං සද්ධානි කාතුං, යත්‍රහි නාම දායකො පි අනිප්ඵලො හොති.

එවමෙතං බ්‍රාහ්මණ, එවමෙතං බ්‍රාහ්මණ,[1] දායකොපි හි බ්‍රාහ්මණ අනිප්ඵලො[2] හොති.

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## ජාණුස්සොණිවග්ගො දුතියො.

1. එවමෙතං බ්‍රාහ්මණ - මජසං.
2. අනිප්ඵලොති - මජසං.

බමුණ, මෙ ලොව්හි ඇතැමෙක් පණිවායෙන් වැළැක්කේ වෙයි. අයිනාදනින් වැළැක්කේ වෙයි, කාමයෙහි මිසහසරින් වැළැක්කේ වෙයි. මුසවායෙන් වැළැක්කේ වෙයි. පිසුනු බසින් වැළැක්කේ වෙයි. පරොස් බසින් වැළැක්කේ වෙයි. සම්ඵප්‍රලාපයෙන් වැළැක්කේ වෙයි. අනභිජ්ඣාලු වෙයි. අව්‍යාපන්නචිත්ත වෙයි. සම්‍යග් දෘෂ්ටික වෙයි. හෙ මහණකුට වේවයි, බමුණකුට වේවයි, අන්නපානවස්ත්‍ර යාන මාලාගන්ධවිලෙපන ශය්‍යාවසථප්‍රදීපොපකරණ දෙනුයේ වෙයි. හෙ කාබුන් මරණින් මතු මිනිසුන්ගේ සහභාවයට යෙයි. හෙ එහි මිනිස්නට අයත් පස්කම් ගුණ ලබනසුල්ලේ වෙයි.

බ්‍රාහ්මණය, යම් හෙයකින් මෙ ලොව්හි පණිවායෙන් වැළැක්කේ වේද, සම්‍යක් දෘෂ්ටික වේද, එහෙයින් හෙ කාබුන් මරණින් මතු මිනිසුන්ගේ සහභාවයට එයි. යම් හෙයකින් හෙතෙම මහණකුට වේවයි බමුණකුට වේවයි අන්න පාන වස්ත්‍ර යාන මාලා ගන්ධ විලෙපන ශය්‍යාආවසථ ප්‍රදීපොපකරණ දෙන්නේ වේද, එහෙයින් හෙ එහි මිනිස්නට අයත් පස්කම් ගුණ ලබන සුලු වෙයි.

බමුණ මෙ ලොව්හි ඇතැමෙක් පණිවායෙන් වැළැක්කේ වෙයි ...... සම්‍යග් දෘෂ්ටික වෙයි. හෙ මහණකුට වේවයි, බමුණකුට වේවයි, අන්න-පාන වස්ත්‍ර යාන මාලා ගන්ධ විලෙපන ශය්‍යා- ආවසථ ප්‍රදීපෙය දෙන්නේ වෙයි. හෙ කාබුන් මරණින් මතු දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි. හෙ එහි දෙවියන් සතු පස්කම් ගුණ ලබන්නේ වෙයි.

බ්‍රාහ්මණය, යම් හෙයකින් මෙ ලොව්හි ඇතැමෙක් පණිවායෙන් වැළක්කේ වේද ... සම්‍යග් දෘෂ්ටික වේද, එහෙයින් ,හෙ කාබුන් මරණින් මතු දෙවියන්ගේ සහභාවයට පැමිණේ. යම් හෙයෙකින් හේ මහණකුහට වේවයි බමුණකුහට වේවයි අන්න පාන වස්ත්‍ර යාන මාලාගන්ධ විලෙපන ශය්‍යාවසථ ප්‍රදීපෙය දෙන්නේ වේද, එහෙයින් හේ එහි දෙවි-යනට හිමි පස්කම් ගුණ ලබන්නේ වෙයි. වැලිදු බ්‍රාහ්මණය දයක ද අනිෂ්ඵල වේ යයි.

භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්‍ය්‍යයි. පින්වත් ගෞතමයන් වහන්ස, අද්භූතයි. භවත් ගෞතමයන් වහන්ස, යම් යම් දනයෙක්හි ලා දයක ද අනිෂඵල වේ. දන්දීම නිසිමැයි ශ්‍රාද්ධ කිරීම නිසි මැයි.

බ්‍රාහ්මණය, තෙල කරුණ එසේ මැයි. බ්‍රාහ්මණය තෙල කරුණ එසේමැයි. බ්‍රාහ්මණය දයකයා ද අනිෂ්ඵල ම වෙයි.

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැවි -පෙ- භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට ධරන සේක්වා යි.

දෙවැනි ජාණුස්සොණි වර්ග යි.

# 3. සාධුවග්ගො

## 10. 4. 3. 1

### සාධු සුත්තං

සාධුඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අසාධුඤ්ච, තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමී'ති. එවං භන්තෙති බො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

කතමඤ්ච භික්ඛවෙ අසාධු[1]:

පාණාතිපාතො, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරො, මුසාවාදො, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාපො, අභිජ්ඣා, ව්‍යාපාදො, මිච්ඡාදිට්ඨි. ඉදං වුච්චති භික්ඛවෙ අසාධු[2]

කතමඤ්ච භික්ඛවෙ සාධු[3]:

පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, මුසාවාද වෙරමණී, පිසුණාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අනභිජ්ඣා, අව්‍යාපාදො, සම්මාදිට්ඨි.

ඉදං වුච්චති භික්ඛවෙ සාධූති.

## 10. 4. 3. 2

### අරියධම්ම සුත්තං

අරියධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අනරියධම්මඤ්ච තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අනරියො ධම්මො:

පාණාතිපාතො මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ අනරියො ධම්මො.

කතමො ච භික්ඛවෙ අරියො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ අරියො ධම්මොති.

---

1. අසාධුං – සීමු.
2. අසාධුං – සීමු.
3. සාධුං – සීමු.

## 10. 4. 3. 1
## සාධු සූත්‍රය

මහණෙනි, තොපට සාධුත්‍වය හා අසාධුත්‍වය හා දෙශනා කරන්නෙමි. එ අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමි යි. වහන්ස, එසේ යයි එ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක:

මහණෙනි, අසාධුත්‍වය කවර යත්:

ප්‍රාණඝාතය, අදින්නාදානය, කාමයන්හි මිථ්‍යාචාරය, මුසාවාදය, පිශුනාවාචාය, පරුෂවාග්ය, සම්ඵප්‍රලාපය. අභිධ්‍යාය, ව්‍යාපාදය, මිථ්‍යා–දෘෂ්ටියයි. මහණෙනි, මෙ අසාධුයයි කියනු ලැබේ.

මහණෙනි, සාධුත්‍වය කවර යත්:

පණිවායෙන් විරමණය, අයිනාදනින් විරමණය, කාමයන්හි මිථ්‍යාචාර–යෙන් විරමණය, මුසවායෙන් විරමණය, පිසුනුබසින් විරමණය, පරොස් බසින් විරමණය, සම්ඵප්‍රලාපයෙන් විරමණය, අනභිධ්‍යාය, අව්‍යාපාදය, සම්‍යග්දෘෂ්ටියි.

මහණෙනි,මේ සාධුත්‍වයයි කියනු ලැබේ.

## 10. 4. 3. 2
## අරියධම්ම සූත්‍රය

මහණෙනි, තොපට ආර්‍යධර්මය ද අනාර්‍යධර්මය ද දෙසන්නෙමි. එ අසව ...

මහණෙනි, අනාර්‍යධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ අනාර්‍යධර්මයයි කියනු ලැබේ.

මහණෙනි, ආර්‍ය ධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතයෙන් විරමණය ... සම්‍යග්දෘෂ්ටියයි.

මහණෙනි, මේ ආර්‍යධර්මයයි කියනු ලැබේ.

## 10. 4. 3. 3

## කුසල සුත්තං

කුසලඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අකුසලඤ්ච. තං සුණාථ -පෙ-

කතමඤ්ච භික්ඛවෙ අකුසලං:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. ඉදං වුච්චති භික්ඛවෙ අකුසලං

කතමඤ්ච භික්ඛවෙ කුසලං:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

ඉදං වුච්චති භික්ඛවෙ කුසලන්ති.

## 10. 4. 3. 4

## අත්ථ සුත්තං

අත්ථඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අනත්ථඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අනත්ථො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ අනත්ථො.

කතමො ච භික්ඛවෙ අත්ථො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨීති.

අයං වුච්චති භික්ඛවෙ අත්ථො ති.

## 10. 4. 3. 5

## ධම්ම සුත්තං

ධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අධම්මඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ අධම්මො.

කතමො ච භික්ඛවෙ ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ ධම්මොති.

## 10. 4. 3. 3

## කුසල සූත්‍රය

මහණෙනි, තොපට කුසල් ද අකුසල් ද දෙසමි. එ අසවු ...

මහණෙනි, අකුසල කවරේය යත්:
ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ අකුසලයි කියනු ලැබේ.

මහණෙනි, කුසල කවරේය යත්:
ප්‍රාණඝාතයෙන් විරමණය ... සම්‍යක් දෘෂ්ටියි.
මහණෙනි, මේ කුසලයි කියනු ලැබේ.

## 10. 4. 3. 4

## අර්ථ සූත්‍රය

මහණෙනි, තොපට අර්ථ හා අනර්ථ හා දෙසමි. එ අසවු ...

මහණෙනි, අනර්ථ කවරේය යත්:
ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි මේ අනර්ථයි කියනු ලැබේ.

මහණෙනි, අර්ථ කවරේය යත්:
පණිවායෙන් විරමණය ... සම්‍යක් දෘෂ්ටියි.
මහණෙනි මේ අර්ථයි කියනු ලැබේ.

## 10. 4. 3. 5

## ධර්ම සූත්‍රය

මහණෙනි, තොපට ධර්ම හා අධර්ම හා දෙසමි. එ අසවු ...

මහණෙනි, අධර්ම කවරේය යත්:
ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ අධර්මයි කියනු ලැබේ.

මහණෙනි, ධර්ම කවරේය යත්:
ප්‍රාණඝාතයෙන් විරමණය ... සම්‍යක් දෘෂ්ටියයි.
මහණෙනි මේ ධර්මයි කියනු ලැබේ.

## 10. 4. 3. 6
## සාසවධම්ම සුත්තං

සාසවඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, අනාසවඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ සාසවො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ සාසවො ධම්මො.

කතමො ච භික්ඛවෙ අනාසවො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ අනාසවො ධම්මොති.

## 10. 4. 3. 7
## සාවජ්ජ සුත්තං

සාවජ්ජඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, අනවජ්ජඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ සාවජ්ජො ධම්මො:

පාණාතිපාතො-මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ සාවජ්ජො ධම්මො.

කතමො ච භික්ඛවෙ අනවජ්ජො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති අනවජ්ජො ධම්මො ති.

## 10. 4. 3. 8
## තපනීය සුත්තං

තපනීයඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, අතපනීයං ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ තපනීයො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ තපනීයො ධම්මො.

කතමො ච භික්ඛවෙ අතපනීයො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ අතපනීයො ධම්මො ති.

## 10. 4. 3. 6

## සාසවධම්ම සූත්‍රය

මහණෙනි, සාස්‍රවධර්ම හා අනාස්‍රවධර්ම හා දෙසමි. එ අසවු ...

මහණෙනි, සාස්‍රවධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ සාස්‍රවධර්මයි කියනු ලැබේ.

මහණෙනි, අනාස්‍රවධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතයෙන් විරමණය ... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ අනාස්‍රව ධර්ම යි කියනු ලැබේ.

## 10. 4. 3. 7

## සාවද්‍ය සූත්‍රය

මහණෙනි, තොපට සාවද්‍යධර්ම හා අනවද්‍යධර්ම හා දෙසමි. එ අසවු ...

මහණෙනි, සාවද්‍යධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ සාවද්‍යධර්මයි කියනු ලැබේ.

මහණෙනි, අනවද්‍යධර්ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම ... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ අනවද්‍යධර්මයි කියනු ලැබේ.

## 10. 4. 3. 8

## තපනීය සූත්‍රය

මහණෙනි, තොපට තපනීය ධර්ම හා අතපනීයධර්ම හා දෙසමි. එ අසවු ...

මහණෙනි, තපනීයධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි.

මහණෙනි, අතපනීයධර්ම කවරේය යත්:

පණිවායෙන් වෙන්වීම ... සම්‍යක්දෘෂ්ටියි.

මහණෙනි, මේ අතපනීයධර්ම යි කියනු ලැබේ.

## 10. 4. 3. 9

## ආචයගාමී සුත්තං

ආචයගාමිඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, අපචයගාමිඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ ආචයගාමී ධම්මො:

පාණාතිපාතො-මිච්ඡාදිට්ඨි අයං වුච්චති භික්ඛවෙ ආචයගාමී ධම්මො.

කතමො ච භික්ඛවෙ අපචයගාමී ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ අපචයගාමී ධම්මො ති.

## 10. 4. 3. 10

## දුක්ඛුද්‍රය සුත්තං

දුක්ඛුද්‍රයඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, සුඛුද්‍රයඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ දුක්ඛුද්‍රයො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛුද්‍රයො ධම්මො.

කතමො ච භික්ඛවෙ සුඛුද්‍රයො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ සුඛුද්‍රයො ධම්මො ති.

## 10. 4. 3. 11

## දුක්ඛවිපාක සුත්තං

දුක්ඛ විපාකඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, සුඛවිපාකඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ දුක්ඛවිපාකො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ දුක්ඛ විපාකො ධම්මො.

කතමො ච භික්ඛවෙ සුඛ විපාකො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ සුඛ විපාකො ධම්මො ති.

**සාධුවග්ගො තතියො.**

## 10. 4. 3. 9

## ආචයගාමී සූත්‍රය

මහණෙනි, තොපට ආචයගාමීධර්‍ම හා අපචයගාමීධර්‍ම හා දෙසමි. එ අසවු:

මහණෙනි, ආචයගාමීධර්‍ම කවරේය යත්:

ප්‍රාණඝාතය... මිථ්‍යාදෘෂ්ටි යි. මහණෙනි, මේ ආචයගාමීධර්‍ම යි කියනු ලැබේ.

මහණෙනි, අපචයගාමී ධර්‍ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම ... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි මේ අපචයගාමීධර්‍ම යි කියනු ලැබේ.

## 10. 4. 3. 10

## දුක්ඛුද්‍රය සූත්‍රය

මහණෙනි, තොපට දුක්ඛුද්‍රයධර්‍ම හා සුඛුද්‍රයධර්‍ම හා දෙසමි. එ අසවු ...

මහණෙනි, දුක්ඛුද්‍රයධර්‍ම කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ දුක්ඛුද්‍රයධර්‍මයි කියනු ලැබේ.

මහණෙනි, සුඛුද්‍රයධර්‍ම කවරේයයත්:

පණිවායෙන් දුරුවීම ... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ සුඛුද්‍රයධර්‍මයි කියනු ලැබේ.

## 10. 4. 3. 11

## දුක්ඛවිපාක සූත්‍රය

මහණෙනි, තොපට දුක්ඛවිපාකධර්‍ම හා සුඛවිපාකධර්‍ම හා දෙසමි. එ අසවු ...

මහණෙනි, දුක්ඛවිපාකධර්‍ම කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ දුක්ඛවිපාකධර්‍මයි කියනු ලැබේ.

මහණෙනි, සුඛවිපාකධර්‍ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම ... සම්‍යක්දෘෂ්ටියි.

මහණෙනි, මේ සුඛවිපාකධර්‍මයි කියනු ලැබේ.

**තුන්වැනි සාධුවර්‍ග යි.**

# 4. අරියමග්ගවග්ගො

## 10. 4. 4. 1

### අරියමග්ග සුත්තං

අරියමග්ගඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අනරියමග්ගං ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අනරියො මග්ගො:

පාණාතිපාතො-මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ අනරියො මග්ගො.

කතමො ච භික්ඛවෙ අරියො මග්ගො:

පාණාතිපාතා වෙරමණී-සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ අරියො මග්ගො ති.

## 10. 4. 4. 2

### කණ්හමග්ග සුත්තං

කණ්හමග්ගඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, සුක්කමග්ගඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ කණ්හො මග්ගො:

පාණාතිපාතො-මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ කණ්හො මග්ගො.

කතමො ච භික්ඛවෙ සුක්කො මග්ගො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ සුක්කො මග්ගො ති.

## 10. 4. 4. 3

### සද්ධම්ම සුත්තං

සද්ධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අසද්ධම්මඤ්ච. තං සුණාථ-පෙ-

කතමො ච භික්ඛවෙ අසද්ධම්මො:

පාණාතිපාතො-මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ අසද්ධම්මො.

කතමො ච භික්ඛවෙ සද්ධම්මො:

පාණාතිපාතා වෙරමණී-සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ සද්ධම්මොති.

# 4. අරියමග්ග වර්ගය

## 10. 4. 4. 1

## අරියමග්ග සූත්‍රය

මහණෙනි, තොපට ආර්‍ය්‍යමාර්ගය හා අනාර්‍ය්‍යමාර්ගය හා දෙසමි. එ අසවු ...

මහණෙනි, අනාර්‍ය්‍යමාර්ගය කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යා–දෘෂ්ටියි. මහණෙනි, මේ අනාර්‍ය්‍යමාර්ගයයි කියනු ලැබේ.

මහණෙනි, ආර්‍ය්‍යමාර්ගය කවරේය යත්:

ප්‍රාණඝාතයෙන් විරමණය ... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ ආර්‍ය්‍යමාර්ගයි කියනු ලැබේ.

## 10. 4. 4. 2

## කණ්හමග්ග සූත්‍රය

මහණෙනි, තොපට කෘෂ්ණමාර්ගය හා ශුක්ලමාර්ගය හා දෙසමි. එ අසවු ...

මහණෙනි, කෘෂ්ණමාර්ගය කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යා–දෘෂ්ටියි. මහණෙනි මේ කෘෂ්ණමාර්ගයයි කියනු ලැබේ.

මහණෙනි, ශුක්ලමාර්ග කවරේය යත්:

ප්‍රාණඝාතයෙන් විරමණය ...සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ ශුක්ලමාර්ගයි කියනු ලැබේ.

## 10. 4. 4. 3

## සද්ධම්ම සූත්‍රය

මහණෙනි, තොපට සද්ධර්මය හා අසද්ධර්මය හා දෙසමි. එ අසවු ...

මහණෙනි, අසද්ධර්මය කවරේය යත්:

ප්‍රාණඝාතය... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ අසද්ධර්මයි කියනු ලැබේ.

මහණෙනි, සද්ධර්මය කවරේය යත්:

ප්‍රාණිවධයෙන් දුරුවීම ... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ සද්ධර්මයි කියනු ලැබේ.

## 10. 4. 4. 4

### සප්පුරිසධම්ම සුත්තං

සප්පුරිසධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අසප්පුරිසධම්මඤ්ච තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ අසප්පුරිසධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ අසප්පුරිස ධම්මො.

කතමො ච භික්ඛවෙ සප්පුරිසධම්මො:

පාණාතිපාතා වෙරමණී-පෙ-සම්මාදිට්ඨි,

අයං වුච්චති භික්ඛවෙ සප්පුරිස ධම්මොති.

## 10. 4. 4. 5

### උප්පාදෙතබ්බධම්ම සුත්තං

උප්පාදෙතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, න උප්පාදෙතබ්බඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ න උප්පාදෙතබ්බො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි, අයං වුච්චති භික්ඛවෙ න උප්පාදෙතබ්බො ධම්මො.

කතමො ච භික්ඛවෙ උප්පාදෙතබ්බො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි,

අයං වුච්චති භික්ඛවෙ උප්පාදෙතබ්බො ධම්මො:

## 10. 4. 4. 6

### ආසෙවිතබ්බධම්ම සුත්තං

ආසෙවිතබ්බඤ්ච බො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, නාසෙවිතබ්බඤ්ච, තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ නාසෙවිතබ්බො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි, අයං වුච්චති භික්ඛවෙ නාසෙවිතබ්බො ධම්මො

කතමො ච භික්ඛවෙ ආසෙවිතබ්බො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ ආසෙවිතබ්බො ධම්මොති.

## 10. 4. 4. 4
## සප්පුරිසධම්ම සූත්‍රය

මහණෙනි, තොපට සත්පුරුෂධර්ම හා අසත්පුරුෂධර්ම හා දෙසමි, එ අසවු...

මහණෙනි, අසත්පුරුෂධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ අසත්පුරුෂ ධර්මයි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂධර්ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ සත්පුරුෂ ධර්මයයි කියනු ලැබේ.

## 10. 4. 4. 5
## උප්පාදෙතබ්බධම්ම සූත්‍රය

මහණෙනි, තොපට උත්පාදයිතව්‍යධර්ම හා අනුත්පාදයිතව්‍යධර්ම හා දෙසමි, එ අසවු...

මහණෙනි, අනුත්පාදයිතව්‍ය ධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය... මිථ්‍යාදෘෂ්ටියි, මහණෙනි, මේ අනුත්පාදයිතව්‍ය ධර්මයි කියනු ලැබේ.

මහණෙනි, උත්පාදයිතව්‍ය ධර්ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ උත්පාදයිතව්‍ය ධර්ම යි කියනු ලැබේ.

## 10. 4. 4. 6
## ආසෙවිතබ්බධම්ම සූත්‍රය

මහණෙනි, තොපට ආසෙවිතව්‍ය ධර්ම හා අනාසෙවිතව්‍ය ධර්ම හා දෙසමි. එ අසවු...

මහණෙනි, අනාසෙවිතව්‍ය ධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය ... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ අනාසෙවිතව්‍ය ධර්ම යි කියනු ලැබේ.

මහණෙනි, ආසෙවිතව්‍ය ධර්ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම...සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ ආසෙවිතව්‍ය ධර්ම යි කියනු ලැබේ.

## 10. 4. 4. 7

## භාවෙතබ්බධම්ම

භාවෙතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි. නභාවෙතබ්බං ච තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ න භාවෙතබ්බො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡා දිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ නභාවෙතබ්බො ධම්මො.

කතමො ච භික්ඛවෙ භාවෙතබ්බො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ භාවෙතබ්බො ධම්මොති.

## 10. 4. 4. 8

## බහුලීකාතබ්බධම්ම

බහුලීකාතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, නබහුලීකාතබ්බඤ්ච. තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ න බහුලීකාතබ්බො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි, අයං වුච්චති භික්ඛවෙ න බහුලීකාතබ්බො ධම්මො.

කතමො ච භික්ඛවෙ බහුලීකාතබ්බො ධම්මො:

පාණාතිපාතා වෙරමණී – සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ බහුලීකාතබ්බො ධම්මොති.

## 10. 4. 4. 9

## අනුස්සරිතබ්බධම්ම

අනුස්සරිතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, නානුස්සරිතබ්බඤ්ච තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ නානුස්සරිතබ්බො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ නානුස්සරිතබ්බො ධම්මො.

කතමො ච භික්ඛවෙ අනුස්සරිතබ්බො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මාදිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ අනුස්සරිතබ්බො ධම්මොති.

## 10. 4. 4. 7
## භාවෙතබ්බධම්ම සූත්‍රය

මහණෙනි, තොපට භාවයිතව්‍ය ධර්ම හා නභාවයිතව්‍ය ධර්ම හා දෙසමි. එ අසවු...

මහණෙනි, න භාවයිතව්‍ය ධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ නභාවයිතව්‍ය ධර්මයි කියනු ලැබේ.

මහණෙනි, භාවයිතව්‍ය ධර්ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම...සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ භාවයිතව්‍ය ධර්මයි කියනු ලැබේ.

## 10. 4. 4. 8
## බහුලීකාතබ්බධම්ම සූත්‍රය

මහණෙනි, තොපට බහුලී කර්තව්‍ය ධර්ම හා නබහුලීකර්තව්‍ය ධර්ම හා දෙසමි. එ අසවු...

මහණෙනි, න බහුලීකර්තව්‍ය ධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය...මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ න බහුලීකර්තව්‍ය ධර්මයි කියනු ලැබේ.

මහණෙනි, බහුලීකර්තව්‍ය ධර්ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම ... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ බහුලීකර්තව්‍ය ධර්මයි කියනු ලැබේ.

## 10. 4. 4. 9
## අනුස්සරිතබ්බධමම සූත්‍රය

මහණෙනි, තොපට අනුස්මර්තව්‍ය ධර්ම හා නානුස්මර්තව්‍ය ධර්ම හා දෙසමි. එ අසවු...

මහණෙනි, නානුස්මර්තව්‍ය ධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ නානුස්මර්තව්‍ය ධර්මයි කියනු ලැබේ.

මහණෙනි, අනුස්මර්තව්‍ය ධර්ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම... සම්‍යක්දෘෂ්ටියි.

මහණෙනි, මේ අනුස්මර්තව්‍ය ධර්මයි කියනු ලැබේ.

## 10. 4. 4. 10

## සච්ඡිකාතබ්බධම්ම සුත්තං

සච්ඡිකාතබ්බඤ්ච වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, න සච්ඡිකාතබ්බඤ්ච, තං සුණාථ -පෙ-

කතමො ච භික්ඛවෙ න සච්ඡිකාතබ්බො ධම්මො:

පාණාතිපාතො -පෙ- මිච්ඡාදිට්ඨි. අයං වුච්චති භික්ඛවෙ න සච්ඡිකාතබ්බො ධම්මො,

කතමො ච භික්ඛවෙ සච්ඡිකාතබ්බො ධම්මො:

පාණාතිපාතා වෙරමණී -පෙ- සම්මා දිට්ඨි.

අයං වුච්චති භික්ඛවෙ සච්ඡිකාතබ්බො ධම්මොති.

### අරියමග්ග වග්ගො චතුත්ථො.

## 10. 4. 4. 10

## සච්ඡිකාතබ්බධම්ම සූත්‍රය

මහණෙනි, තොපට සාක්ෂාත්කර්වාය ධර්ම හා න සාක්ෂාත්කතීවාය ධර්මය හා දෙසමි. එ අසවු...

මහණෙනි, න සාක්ෂාත්කතීවාය ධර්ම කවරේය යත්:

ප්‍රාණඝාතය... මිථ්‍යාදෘෂ්ටියි. මහණෙනි, මේ න සාක්ෂාත්කතීවාය ධර්ම යි කියනු ලැබේ.

මහණෙනි, සාක්ෂාත්කතීවාය ධර්ම කවරේය යත්:

පණිවායෙන් දුරුවීම... සම්‍යක් දෘෂ්ටියි.

මහණෙනි, මේ සාක්ෂාත්කතීවාය ධර්ම යි කියනු ලැබේ.

**සිවුවැනි අරියමග්ගවග්ග යි.**

# 5. අපරපුග්ගල වග්ගො

## 10. 4. 5. 1- 12

### සෙවිතබ්බාදි ද්වාදස සුත්තානි

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පුග්ගලො න සෙවිතබ්බො, කතමෙහි දසහි:

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුනවාචො[1] හොති, ඵරුසවාචො හොති සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨිකො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො න සෙවිතබ්බො,

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පුග්ගලො සෙවිතබ්බො. කතමෙහි දසහි:

පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, පිසුනාය වාචාය පටිවිරතො හොති, ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති, සම්මා දිට්ඨිකො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො සෙවිතබ්බොති.

2. දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පුග්ගලො න භජිතබ්බො -පෙ- භජිතබ්බොති.

3. න පයිරුපාසිතබ්බො -පෙ- පයිරුපාසිතබ්බොති,
4. න පුජ්ජො හොති -පෙ- පුජ්ජො හොතීති,
5. න පාසංසො හොති -පෙ- පාසංසො හොතීති,
6. අගාරවො හොති -පෙ- සගාරවො හොතීති,
7. අප්පතිස්සො හොති -පෙ- සප්පතිස්සො[2] හොතීති,
8. නාරාධකො හොති -පෙ- ආරාධකො හොතීති,
9. න විසුජ්ඣති -පෙ- විසුජ්ඣතීති.
10. මානං නාභිභොති -පෙ- මානං අභිභොතීති.
11. පඤ්ඤාය න වඩ්ඪති -පෙ- පඤ්ඤාය වඩ්ඪතීති.

---

1. පිසුණවාචො - මජසං.
2. අප්පතිස්සොහොති -පෙ- සප්පතිස්සො, සිමු.

# 5. අපරපුග්ගල වර්ගය

## 10. 4. 5. 1. 12

## සෙවිතබ්බාදි ද්වාදශ සූත්‍රයෝ

1. මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත පුද්ගලයා නො සෙවිය යුත්තේය. කවර දසයෙකින යත්:

පණිවා කරණුයේ වෙයි, නුදුන් දෑ ගන්නා සුළුයේ වෙයි, කාමයන්හි මිස හසර ඇතියේ වෙයි. මුසවා කියන සුලුයේ වෙයි. පිසුනු බස් ඇතියේ වෙයි. පරොස් බස් ඇතියේ වෙයි. සම්ප්‍රලාප ඇතියේ වෙයි, අභිධ්‍යාලු වෙයි, ව්‍යාපාදයට වන් සිතැතියේ වෙයි. මිථ්‍යාදෘෂ්ටික වෙයි. මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත පුද්ගලයා නො සෙවිය යුත්තේය.

මහණෙනි, දස කරුණකින් සමන්වාගත පුද්ගල සෙවිය යුත්තේය, කවර දසයෙකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි, අයිනාදනින් වැළැකියේ වෙයි. කාමයන්හි මිසහසරින් වැළැකියේ වෙයි. මුසවායෙන් වැළැකියේ වෙයි. පිසුනුබසින් වැළැකියේ වෙයි. පරොස් බසින් වැළැකියේ වෙයි. සම්ප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. අනභිධ්‍යාලු වෙයි, ව්‍යාපාදයට නො වන් සිතැත්තේ වෙයි. සම්‍යග්දෘෂ්ටික වෙයි. මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත පුද්ගල සෙවිය යුත්තේය යි.

2. මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත පුද්ගල නො බිජිය යුත්තේය ... බිජිය යුත්තේ ය යි.

3. පර්යුපාසනා නො කට යුත්තේය -පෙ- පර්යුපාසනා කටයුත්තේය යි.
4. පූජ්‍ය නො වේ -පෙ- පූජ්‍ය වේ යයි.
5. ප්‍රශංසාර්හ නො වේ -පෙ- ප්‍රශංසාහ වේ යයි.
6. ගෞරව නැතියේ වෙයි -පෙ- ගෞරව සහිත වේ යයි.
7. ප්‍රතිශ්‍රය නැතියේ වෙයි -පෙ- ප්‍රතිශ්‍රය සහිත වේ යයි.
8. ආරාධක නො වේ -පෙ- ආරාධක වේ යයි.
9. විශුද්ධ නො වේ -පෙ- විශුද්ධ වේ යයි.
10. මානය නො මඩනේය -පෙ- මානය මඩනේ සයි.
11. ප්‍රඥයෙන් නො වඩනේය -පෙ- ප්‍රඥයෙන් වැඩෙන්නේ ය.

12. බහුං අපුඤ්ඤං පසවති -පෙ- බහුං පුඤ්ඤං පසවති, කතමෙහි දසහි:

පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදනා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාද පටිවිරතො හොති, පිසුනාය වාචාය පටිවිරතො හොති, ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨිකො හොති,

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො බහුං පුඤ්ඤං පසවතීති.

පුග්ගලවග්ගො පඤ්චමො.

චතුත්ථො පණ්ණාසකො.

12. බොහෝ අපුණ්‍යය රැස් කෙරෙයි ... බොහෝ පින් රැස්කෙරෙයි. කවර දසකරුණකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි, අයිනාදනින් වැළැකියේ වෙයි, කාමයන්හි මිසහසරින් වැළකියේ වෙයි, මුසවායෙන් වැළකියේ වෙයි, පිසුනු බසින් වැළැකියේ වෙයි, පරොස් බසින් වැළැකියේ වෙයි, සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි, අභිධ්‍යා බහුල කොට නැතියේ වෙයි, ව්‍යාපාදයට වන් සිත් නැතියේ වෙයි. සම්දිටු ඇතියේ වෙයි.

මහණෙනි, මේ දස කරුණින් සමන්වාගත පුද්ගල බොහෝ පින් රැස් කරන්නේය යි.

## පස්වැනි පුද්ගල වග් යි.

### සතරවන පණ්ණාසකය යි.

පණ්ණාසාතිරෙක සුත්තානි

# 1. කරජකායවග්ගො

## 10. 5. 1. 1

## පඨමනිරය සුත්තං

**[සාවත්ථි]**

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි දසහි:

1. ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො සබ්බපාණභූතෙසු.

2. අදින්නාදායී හොති. යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා, තං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදාතා හොති.

3. කාමෙසු මිච්ඡාචාරී හොති. යා තා මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භාතුරක්ඛිතා භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලා ගුලපරික්ඛිත්තාපි, තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති.

4. මුසාවාදී හොති සභාගතො[1] වා පරිසගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො 'එහම්භො පුරිස, යං ජානාහි, තං වදෙහී'ති. සො අජානං වා ආහ 'ජානාමී'ති. ජානං වා ආහ 'න ජානාමී'ති අපස්සං වා ආහ, 'පස්සාමී'ති පස්සං වා ආහ, න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති.

5. පිසුනාවාචො හොති, ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදය. ඉති සමග්ගානං වා භෙත්තා, භින්නානං වා අනුප්පදාතා, වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති

6. ඵරුසාවාචො හොති, යා සා වාචා අණ්ඩකා කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා තථාරූපිං වාචං භාසිතා හොති.

1. සභාගතො වා හොති පරිසගගතො වා – මජසං,

# 1. කරජකාය වර්ගය

## 10. 5. 1. 1

## පඨමනිරය සූත්‍රය

**[සැවැත්]**

මහණෙනි, දස කරුණකින් සමන්වාගත වූයේ ගෙනවුත් බහා තැබූයේ යම් සේ නම් එසේ නිරයෙහි නික්ෂිප්ත වෙයි. කවර දස කරුණකින යත්:

1. මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් රුදුරු කම් ඇතියේ ලෙහෙ වැකුණු අත් ඇතියේ නැසුම් වොලොගැණුම්හි බටුයේ සර්වප්‍රාණභූතගණයා කෙරෙහි දයාවට නො පතුයේ ප්‍රාණඝාතී වෙයි.

2. නුදුන්දෑ ගන්නා සුලු වෙයි. ග්‍රාමගත වේවයි අරණ්‍යගත වේවයි මෙරමාගේ යම් ඒ පරවිත්තොපකරණයෙක් වේ නම් සොරය සඞ්ඛ්‍යාත වූ එ නුදුන් දෑ ගන්නේ වෙයි.

3. කාමයෙහි මිසහසර ඇත්තේ වෙයි. මාතෘරක්ෂිතාය, පිතෘරක්ෂිතාය, මාතෘපිතෘරක්ෂිතාය, භ්‍රාතෘරක්ෂිතාය, භගිනිරක්ෂිතාය, ඥාතිරක්ෂිතාය, ගොත්‍රරක්ෂිතාය, ධර්මරක්ෂිතාය, සස්වාමිකාය, සපරිදණ්ඩාය යටත් පිරිසෙයින් මල්ගුලායෙන් පරික්ෂිප්ත වූවා දැයි යම් ඒ මාගම්හු වෙත් නම් එබන්දන් කෙරෙහි හැසිරෙන බවට පැමිණියේ වෙයි.

4. සභාගත වේවයි පර්ෂද්ගත වේවයි, ඥාතිමධ්‍යගත වේවයි, පූගමධ්‍යගත වේවයි, රාජකුලමධ්‍යගත වේවයි ඉදිරියට කැඳවන ලදුයේ ''එම්බා පුරුෂය, එව යමක් දනිහි නම් එ කියව''යි, සාක්ෂ්‍ය පුළුවුස්නා ලදුයේ මුසාවාදී වෙයි. හේ නො දන්නේ හෝ ''දන්මි''යි කියයි. දන්නේ හෝ 'නො දන්මි'යි කියයි. නො දක්නේ හෝ 'දක්මි'යි කියයි, දක්නේ හෝ 'නො දක්මි'යි කියයි, මෙසේ තමා හෙතු කොට වේව යි මෙරමා හෙතු කොට වේවයි කිසියම් ආමිසයක් හෙතුකොට වේවයි, දැන දැන මුසවා බණන්නේ වෙයි.

5. පිසුනුබස් ඇතියේ වෙයි. මොවුන්ගේ භෙදයට මෙ තැනින් අසා කියන්නේ වෙයි. එහි හෝ අසා ඔවුන්ගේ භෙදයට මොවුනට කියන්නේ ය. මෙසේ සමගයන් හෝ බිඳින සුලුවූයේ භින්නයනට හෝ අනුබල දෙන්නේ වර්ගයෙහි රැඳියේ වර්ගරත වූයේ වර්ගයෙහි සතුටු වන්නේ වර්ග කරණ වදන් කියන්නේ වෙයි.

6. පරොස්බස් ඇතියේ වෙයි. නො සබැඳි කැකුළු මෙරමා කටුක පරාගටනා ක්‍රොධය වටා ඇති සමාධියට අහිත යම් ඒ තෙපුලක් වේ නම් එබඳු තෙපුල් කියන්නේ වෙයි.

7. සම්ඵප්පලාපී හොති අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචං භාසිතා හොති අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං.

8. අභිජ්ඣාලු හොති යං තං පරස්ස පරවිත්තූපකරණං, තං අභිජ්ඣිතා හොති, 'අහොවත[1] යං පරස්ස තං මම අස්සා'ති.

9. බ්‍යාපන්නචිත්තො හොති පදුට්ඨමනසඞ්කප්පො, 'ඉමෙ සත්තා හඤ්ඤන්තු වා බජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුන්ති''.

10. මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො, 'නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා. නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි ලොකෙ සමණ බ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි දසහි:

1. ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො, ලජ්ජී දයාපන්නො සබ්බපාණ-භූතහිතානුකම්පී විහරති.

2. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා, න තං අදින්නං ථෙය්‍ය-සඞ්ඛාතං ආදාතා හොති.

3. කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. යා තා මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, මාතා පිතුරක්ඛිතා, භාතු රක්ඛිතා, භගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා, සස්සාමිකා සපරිදණ්ඩා අන්තමසො මාලාගුළ පරික්ඛිත්තා පි, තථාරූපාසු න චාරිත්තං ආපජ්ජිතා හොති.

1. වතාය. - සීමු.

7. අකාලවාදී ව අභූතවාදී ව අනර්ථවාදී ව අධර්මවාදී ව අවිනයවාදී ව සම්ප්‍රලාප කියන සුලු වෙයි. සිත්හිලා නො දැරිය යුතු නො කල්හි කරුණු රහිත පරිච්ඡේද රහිත අනර්ථය ඇසුරු කළ බස් කියන්නේ වෙයි.

8. අභිධ්‍යා බහුල කොට ඇත්තේ වෙයි, මෙරමාගේ යම් ඒ පරවිත්තෝපකරණයෙක් වේ නම්, ''අහෝ, එ කැතින් යමක් මෙරමාගේ වේ නම් එ මට වේව'යි. එය ගිජුසිතින් පතනේ වෙයි,

9. ප්‍රදුෂ්ටමනඃ සඞ්කල්ප ඇතියේ ''මෙ සත්හු නැසෙත් වායි හෝ බැඳෙත්වයි හෝ මුලුසුන් වෙත්වයි හෝ වැනැසෙත්වයි හෝ නහමක් වෙත්වයි හෝ'' ව්‍යාපාදයට පත් සිතැතියේ වෙයි.

10. දන්දූයෙහි පල නැත, යාගයෙහි පල නැත, හෝමයෙහි පල නැත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක නැත, මෙලෝ නැත, පරලෝ නැත, මවක් නැත, පියෙක් නැත, ඖපපාදුක සත්ත්වයෝ නැත, ලොව්හි යහමගට ගිය මනා පිළිවෙත් සපන් යමෙක් තුමූ මෙලෝ හා පරලෝ හා තුමූ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට සකසා දනිත් නම් එ බඳු මහණබමුණෝ නැත.

මහණෙනි, මෙ දසකරුණින් සමන්වාගත වූයේ ගෙනවුත් බහා තැබුයේ යම් සේ නම් එසේ නිරාහි නික්ෂිප්ත වෙයි.

මහණෙනි, දසකරුණෙකින් සමන්වාගත වූයේ ගෙණවුත් තැබුයේ යම් සේ නම් එසේ ස්වර්ගයෙහි නික්ෂිප්ත වෙයි. කවර දසයකින යත්:

1. මහණෙනි, මෙ ලොව්හි ප්‍රාණඝාතය දුරු කොට බහා තැබූ දඬු ඇතියේ බහා තැබූ අවි ඇතියේ ලජ්ජා ඇතියේ දයාපත් වූයේ ප්‍රාණඝාතයෙන් වැළැක්කේ වෙයි. සර්වප්‍රාණභූතගණයා කෙරෙහි හිතානුකම්පීව වෙසෙයි.

2. අයිනාදන් හැර පියා අයිනාදනින් වැළැක්කේ වෙයි. ග්‍රාමගත වේවයි අරණ්‍යගත වේවයි මෙරමාගේ විත්තෝපකරණයෙක් වේ නම් සොය සඞ්ඛ්‍යාත ඒ නුදුන් දෑ ගන්නේ වෙයි.

3. කාමමිථ්‍යාචාරය හැර පියා කාමමිථ්‍යාචාරයෙන් වැළැක්කේ වෙයි. මාතෘරක්ෂිතාය, පිතෘරක්ෂිතාය, මාතාපිතෘ රක්ෂිතාය, භ්‍රාතෘරක්ෂිතාය, භගිනිරක්ෂිතාය, ඥාතිරක්ෂිතාය, ගොත්‍රරක්ෂිතාය, ධර්මරක්ෂිතාය, සස්වාමිකාය, සපරිදණ්ඩාය යටත් පිරිසෙයින් මල්ගුලායෙන් පරික්ෂිප්ත වූ දූයි යම් ඒ මාගම්හු වෙත් නම් එ බන්දන් කෙරෙහි නො හැසිරෙන බවට පැමිණෙන්නේ වෙයි.

4. මුසාවාදං පහාය මුසාවාද පටිවිරතො හොති. සභාගතො වා පරිසගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුල මජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො, "එහම්භො පුරිස, යං ජනාසි, තං වදෙහී"ති. සො අජානං වා ආහ: 'න ජානාමී'ති. ජානං වා ආහ, 'ජානාමී'ති, අපස්සං වා ආහ 'න පස්සාමී'ති, පස්සං වා ආහ, 'පස්සාමී'ති ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජාන මුසා භාසිතා හොති.

5. පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති. න ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ග නන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති.

6. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණ සුඛා පෙමණීයා හදයඞ්ගමා පොරී බහුජන කන්තා බහුජන මනාපා තථාරූපිං වාචං භාසිතා හොති.

7. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති, කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

8. අනභිජ්ඣාලු හොති, යං තං පරස්ස පරවිත්තූපකරණං, තං අනභිජ්ඣිතා හොති, "අහො වත යං පරස්ස තං මම අස්සා"ති.

9. අබ්‍යාපන්නචිත්තො හොති අප්පදුට්ඨමනසඞ්කප්පො, 'ඉමෙ සත්තා අවෙරා හොන්තු අව්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු''ති.

4. මුසාවාදය හැරපියා මුසවායෙන් වැළැක්කේ වෙයි. සභාගත වේවයි, පර්ෂද්ගත වේවයි ඥතිමධ්‍යගත වේවයි, පූගමධ්‍යගත වේවයි, රාජකුලමධ්‍යගත වේවයි, කැඳවනු ලදුයේ 'එම්බා පුරුෂය, එව යමක් දනිහි නම් එ කියව'යි සාක්ෂ්‍ය පුළුවුස්නා ලදුයේ වෙයි. හේ නො දන්නේ හෝ 'නොදන්මි'යි කියයි. දන්නේ හෝ 'දන්මි'යි කියයි, නො දක්නේ හෝ 'නො දක්මි'යි කියයි. දක්නේ හෝ 'දක්මි'යි කියයි. මෙසේ තමා හෙතු කොට හෝ මෙරමා හෙතු කොට හෝ කිසි ආමිෂයක් හෙතු කොට හෝ දැන දැන මුසවා නො කියන්නේ වෙයි.

5. පිසුනුබස් හැරපියා පිසුනු බසින් වැළැකියේ වෙයි. මෙයින් අසා මොවුන්ගේ හෙදය සඳහා එහි නො කියනේය, එ තන්හි හෝ අසා මොවුන්ගේ හෙදය සඳහා මොවුනට නො කියන්නේය. මෙසේ බිඳුනවුන් හෝ සන්ධාන කරණුයේ සමගයනට හෝ අනුබල දෙනුයේ සමගියෙහි ඇලුමැතියේ සමගයන් කෙරෙහි රැදියේ සමග වූවන් දැක තුස්නේ සමග කරන බස් කියන්නේ වෙයි.

6. පරොස්බස් හැරපියා පරොස් බසින් වැළැකියේ වෙයි, යම් ඒ බසෙක් නිදෙස් වේ ද, කනට සුව එළවා ද, ප්‍රේම දනවා ද හෘදයඞ්ගම වේ ද ගුණෙන් පිරිපුන් වේ ද, බොහෝ දෙනාට කාන්ත වේ ද, බොහෝ දෙනාට මනවඩා ද එ බඳු බස් කියන්නේ වෙයි.

7. සම්ඵප්‍රලාප හැරපියා සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. කාල වාදී ව භූතවාදී ව අර්ථවාදී ව ධර්මවාදී ව විනයවාදී ව ලෙහි රඳවා ගතයුතු බස් කල්හි සකරුණු කොට පයර්‍යන්තවත් කොට සහිත කොට කියන්නේ වෙයි.

8. අභිධ්‍යා බහුල කොට නැත්තේ වෙයි. මෙරමාගේ යම් ඒ පරවිත්තොපකරණයෙක් වේ නම්, එය "අහෝ, යමක් මෙරමාගේ වේ නම්, එය මට වේව'යි ගිජු සිතින් නො පතන්නේ වෙයි.

9. "මෙ සත්ත්වයෝ වෛර නැත්තාහු ව්‍යාපාද නැත්තාහු දුක් නැත්-තාහු සැප ආත්තාහු ආත්මපරිහරණ කෙරෙත්වා" අප්‍රදුෂ්ට මනසඞ්කල්ප ඇතියේ ව්‍යාපාදයට නො පත් සිත් ඇත්තේ වෙයි.

10. සම්මා දිට්ඨිකො හොති අවිපරීතදස්සනො, 'අත්‍ථි දින්නං අත්‍ථි යිට්ඨං, අත්‍ථි හුතං, අත්‍ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්‍ථි අයං ලොකො, අත්‍ථි පරො ලොකො, අත්‍ථි මාතා, අත්‍ථි පිතා, අත්‍ථි සත්‍තා ඔපපාතිකා, අත්‍ථි ලොකෙ සමණබ්‍රාහමණා සම්මග්ගතා, සම්මා පටිපන්නා, යො ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්‍වා පවෙදෙන්‍තී'ති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්‍නාගතො යථාභතං නික්ඛිත්‍තො එවං සග්ගෙති.

## 10. 5. 1. 2

## දුතියනිරය සුත්‍තං

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්‍නාගතො යථාභතං නික්ඛිත්‍තො එවං නිරයෙ. කතමෙහි දසහි:

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී, හතපහතෙ නිවිට්ඨො අදයාපන්‍නො සබ්බපාණභූතෙසු. අදින්‍නාදායී හොති -පෙ- කාමෙසු මිච්ඡාචාරී හොති -පෙ- මුසාවාදී හොති -පෙ- පිසුනාවාචො හොති -පෙ- ඵරුසා වාචො හොති -පෙ- සම්ඵප්පලාපී හොති -පෙ- අභිජ්ඣාලූ හොති -පෙ- ව්‍යාපන්‍නචිත්‍තො හොති -පෙ- මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො, "නත්‍ථි දින්නං, නත්‍ථි යිට්ඨං, නත්‍ථි හුතං, නත්‍ථිසුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්‍ථි අයං ලොකො, නත්‍ථි පරො ලොකො, නත්‍ථි මාතා, නත්‍ථි පිතා, නත්‍ථි සත්‍තා ඔපපාතිකා, නත්‍ථි ලොකෙ සමණබ්‍රාහමණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්‍වා පවෙදෙන්‍තීති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්‍නාගතො යථාභතං නික්ඛිත්‍තො එවං නිරයෙති.

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්‍නාගතො යථාභතං නික්ඛිත්‍තො එවං සග්ගෙ: කතමෙහි දසහි:

10. 'දුන් දෑ පල ඇත, යාගයෙහි පල ඇත, හෝමයෙහි පල ඇත, සුකෘතදුෂ්කෘතයන්ගේ ඵල විපාක ඇත. මෙ ලෝ ඇත, පරලෝ ඇත, මවු ඇත, පියා ඇත, ඖපපාදුකසත්ත්වයෝ ඇත, ලොව්හි සම්‍යග්ගතව සම්‍යක්ප්‍රතිපත්තියට පත්ව යමෙක් මෙලෝ හා පරලෝ හා තුමූ විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට දන්නාහු නම් එබඳු මහණ බමුණෝ ඇතැ''යි අවිපරීතදර්ශන ඇති සම්‍යග් දෘෂ්ටික වෙයි.

මහණෙනි, මෙ දසකරුණෙන් සමන්වාගත වූයේ (හිසින්) ගෙනා දැයක් යම්සේ බහා තැබුයේ වේ නම් එසේ ස්වර්ගයෙහි නික්ෂිප්ත වෙයි.

## 10. 5. 1. 2
## දුතියනිරය සූත්‍රය

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත වූයේ ගෙන එන ලද්ද බහාතැබුයේ යම්සේ වේ නම් එසේ නිරයෙහි නික්ෂිප්ත වෙයි. කවර දසයෙකින යත්:

මහණෙනි, මෙලොව්හි ඇතැමෙක් රුදුරු කම් ඇතියේ ලෙහෙයින් වැකුණු අත් ඇතියේ නැසුම් වොලො ග,නුම්හි බටුයේ හැම සතුන් කෙරෙහි දයාවට නො පැමිණියේ ප්‍රාණඝාතී වෙයි. නුදුන්දෑ ගන්නා සුළු වෙයි. .... කාමයන්හි මිසහසර ඇතියේ වෙයි .... මුසවා කියන්නේ වෙයි .... පිසුනුබස් ඇතියේ වෙයි .... පරොස්බස් ඇතියේ වෙයි .... සම්ඵප්‍රලාප ඇතියේ වෙයි .... අභිධ්‍යා බහුල කොටැතියේ වෙයි .... ව්‍යාපාදයට පත් සිතැතියේ වෙයි .... ''දුන් දෑ පල නැත, යාගයෙහි පල නැත, හෝමයෙහි පල නැත, සුකෘතදුෂ්කෘතයෙහි ඵල විපාක නැත, මෙලෝ නැත, පරලෝ නැත, මවු නැත, පියා නැත, ඖපපාදුක සත්ත්වයෝ නැත, ලොකයෙහි යමෙක් තුමූ ම මෙලෝ හා පරලෝ හා විශිෂ්ටඥානයෙන් දැන පසක්කොට ප්‍රකට කොට දනිත් නම් එ බඳු මහණ බමුණෝ නැතැ''යි විපරීතදර්ශන ඇති මිථ්‍යාදෘෂ්ටික වෙයි.

මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත වූයේ ගෙන එන ලද්දක් බහා තැබූයේ යම්සේ නම් එසේ නිරයෙහි නික්ෂිප්ත වෙයි.

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත වූයේ ගෙන එන ලද්දක් බහා තැබුයේ යම්සේ වේ නම් එසේ ස්වර්ගයෙහි නික්ෂිප්ත වෙයි. කවර දසයෙක යත්:

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිත දණ්ඩො නිහිත සත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණ භූත හිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති –පෙ– කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති –පෙ– මුසාවාදං පහාය මුසාවාද පටිවිරතො –පෙ– පිසුනං වාචං පහාය පිසුනා වාචා පටිවිරතො හොති–පෙ–ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති –පෙ– සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති –පෙ– අනභිජ්ඣාලු හොති –පෙ– අබ්‍යාපන්නචිත්තො හොති –පෙ– සම්මා දිට්ඨිකො හොති අවිපරීතදස්සනො: ''අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඕපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ.

## 10. 5. 1. 3

## මාතුගාම සුත්තං

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි දසහි:

පාණාතිපාතී හොති අදින්නාදායී හොති, . මෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුනා වාචො හොති, ඵරුස වාචො හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්න චිත්තො හොති, මිච්ඡා දිට්ඨිකො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් බහා තැබූ දඬු ඇතියේ බහා තැබූ අවි ඇතියේ ලජ්ජා ඇතියේ ප්‍රාණඝාතය හැරපියා ප්‍රාණඝාතයෙන් වැළැකියේ වෙයි. දයාවට පැමිණියේ සවුසතුන් කෙරෙහි හිතානුකම්පා ඇතියේ වාසය කරයි. අයිනාදන් හැර පියා අයිනාදනින් වැළැකියේ වෙයි ... කාමයන්හි මිසහසර හැරපියා කාමයන්හි මිසහසරින් වැළැකියේ වෙයි. ... මුසවා හැරපියා මුසවායෙන් වැළැකියේ වෙයි ... පිසුනු බස් හැර පියා පිසුනු බසින් වැළැකියේ වෙයි ... පරොස් බස් හැර පියා පරොස් බසින් වැළැකියේ වෙයි ... සම්ඵප්‍රලාපය හැරපියා සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි ... අභිධ්‍යා බහුල කොටැතියේ නො වෙයි ... ව්‍යාපාදයට නො පත් සිතැතියේ වෙයි ... "දන්දීයෙහි පල ඇත, යාගයෙහි පල ඇත, හෝමයෙහි පල ඇත, සුකෘත දුෂ්කෘතයන්ගේ ඵල විපාක ඇත, මෙලෝ ඇත, පරලෝ ඇත, මවු ඇත, පියා ඇත, ඖපපාදුක සත්ත්වයෝ ඇත, යමෙක් තුමූ මෙලෝ හා පරලෝ හා විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට මොනොවට දක්නාහු නම්, එ බඳු සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න මහණ බමුණෝ ඇතැ"යි අවිපරීත දර්ශන ඇතියේ සම්‍යග් දෘෂ්ටික වෙයි.

මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත වූයේ ගෙන එනලද දියක් බහා තැබුයේ යම්සේ නම් එසේ සවර්ගයෙහි නික්ෂිප්ත වෙයි.

## 10. 5. 1. 3
## මාතුගාම සූත්‍රය

මහණෙනි, දසකරුණෙකින් සමන්වාගත මාගම් ගෙන එන ලද දියක් බහා තැබුයේ යම් සේ වේ නම් එසේ නිරයෙහි නික්ෂිප්ත වෙයි. කවර දසයෙකින යත්:

ප්‍රාණඝාතී වෙයි, නුදුන් දෑ ගන්නේ වෙයි, කාමයන්හි මිසහසර ඇතියේ වෙයි, මුසවා කියන්නේ වෙයි, පිසුනු බස් ඇතියේ වෙයි, පරොස් බස් ඇතියේ වෙයි, සම්ඵප්‍රලාප ඇතියේ වෙයි, අභිධ්‍යා බහුලකොට ඇත්තේ වෙයි, ව්‍යාපාදයට වන් සිතැත්තේ වෙයි, මිථ්‍යාදෘෂ්ටික වෙයි.

මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත මාගම ගෙන එන ලද දියක් බහා තැබුයේ යම් සේ නම්, එසේ නිරයෙහි නික්ෂිප්ත වෙයි.

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි දසහි:

පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදනා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාද පටිවිරතො හොති, පිසුනාය වාචාය පටිවිරතො හොති, ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අබ්‍යාපන්න-චිත්තො හොති, සම්මාදිට්ඨිකො හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො යථා භතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 10. 5. 1. 4

## උපාසිකා සුත්තං

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා උපාසිකා යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ. කතමෙහි දසහි:

පාණාතිපාතිනී හොති, අදින්නාදයිනී හොති, කාමෙසු මිච්ඡාචාරිණී හොති, මුසාවාදිනී හොති, පිසුනාවාචා හොති, ඵරුසාවාචා හොති, සම්ඵප්පලාපිනී හොති, අභිජ්ඣාලුනී හොති, බ්‍යාපන්න චිත්තා හොති, මිච්ඡාදිට්ඨිකා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතා උපාසිකා යථාභතං නික්ඛිත්තා එවං නිරයෙ.

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා උපාසිකා යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙ. කතමෙහි දසහි:

පාණාතිපාතා පටිවිරතා හොති -පෙ- සම්මාදිට්ඨිකා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතා උපාසිකා යථාභතං නික්ඛිත්තා එවං සග්ගෙති.

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත මාගම ගෙන එන ලද දූයක් බහා තැබුයේ යම්සේ නම්, එසේ ස්වර්ගයෙහි නික්ෂිප්ත වෙයි. කවර දශයෙකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි. අයිනාදනින් වැළැකියේ වෙයි. කාමයෙහි මිසහසරින් වැළැකියේ වෙයි. මුසවායෙන් වැළැකියේ වෙයි. පිසුනු බසින් වැළැකියේ වෙයි. පරොස්බසින් වැළැකියේ වෙයි. සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. අභිධ්‍යා බහුල කොට නැතියේ වෙයි. ව්‍යාපාදයට පත් සිත් නැතියේ වෙයි. සම්‍යග් දෘෂ්ටික වෙයි.

මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත මාගම ගෙන එන ලද දූයක් බහා තැබුයේ යම්සේ නම්, එසේ ස්වර්ගයෙහි නික්ෂිප්ත වෙයි.

## 10. 5. 1. 4
## උපාසිකා සූත්‍රය

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත උවැසි ගෙන එන ලද දූයක් බහා තැබුයේ යම් සේ නම් එසේ නිරයෙහි නික්ෂිප්ත වෙයි. කවර දසයෙකින යත්:

පණිවා කරන්නී වෙයි. නුදුන් දූ ගන්නී වෙයි. කාමයන්හි මිස හසර ඇත්තී වෙයි. මුසවා කියන්නී වෙයි. පිසුනු බස් ඇත්තී වෙයි. පරොස් බස් ඇත්තී වෙයි. සම්ඵප්‍රලාප ඇත්තී වෙයි. අභිධ්‍යා බහුල කොට ඇත්තී වෙයි, ව්‍යාපාදයට අවන් සිත් ඇත්තී වෙයි. මිසදිටු ඇත්තී වෙයි. මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත උවැසි ගෙන එන ලද දූයක් බහා තැබුයේ යම්සේ ද, එසේ නිරයෙහි නික්ෂිප්ත වෙයි.

මහණෙනි, දසකරුණෙකින් සමන්වාගත උවැසි ගෙන එන ලද දූයක් බහා තැබුයේ යම්සේ වේ ද එසේ ස්වර්ගයෙහි නික්ෂිප්ත වෙයි. කවර දසයෙකින යත්:

පණිවායෙන් වැළැකියා වෙයි ... සම්දිටු ඇත්තී වෙයි.

මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත උවැසි ගෙන එන ලද දෙයක් බහාතැබුයේ යම්සේ වේද, එසේ ස්වර්ගයෙහි නික්ෂිප්ත වේ යයි.

## 10. 5. 1. 5

### විසාරද සුත්තං

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා උපාසිකා අවිසාරද අගාරං අජ්ඣාවසති. කතමෙහි දසහි:

පාණාතිපාතිනී හොති, අදින්නාදායිනී හොති, කාමෙසු මිච්ඡාචාරිනී හොති, මුසාවාදිනී හොති, පිසුනාවාචා හොති, ඵරුසවාචා හොති, සම්ඵප්පලාපිනී හොති, අභිජ්ඣාලුනී හොති, බ්‍යාපන්නචිත්තා හොති, මිච්ඡාදිට්ඨිකා හොති.

ඉමෙහි බො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතා උපාසිකා අවිසාරද අගාරං අජ්ඣාවසති.

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතා උපාසිකා විසාරද අගාරං අජ්ඣාවසති. කතමෙහි දසහි:

පාණාතිපාතා පටිවිරතා හොති, අදින්නාදනා පටිවිරතා හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා හොති, මුසාවාද පටිවිරතා හොති, පිසුනාය වාචාය පටිවිරතා හොති, ඵරුසාය වාචාය පටිවිරතා හොති, සම්ඵප්පලාපා පටිවිරතා හොති, අනභිජ්ඣාලුනී හොති, අබ්‍යාපන්න-චිත්තා හොති, සම්මාදිට්ඨිකා හොති.

ඉමෙහි බො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතා උපාසිකා විසාරද අගාරං අජ්ඣාවසතීති.

## 10. 5. 1. 6

### සංසප්පනිය පරියාය සුත්තං

සංසප්පනියපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති බො තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

කතමො ච සො භික්ඛවෙ සංසප්පනීයපරියායො ධම්මපරියායො:

කම්මස්සකා භික්ඛවෙ සත්තා කම්මදායාද කම්මයොනි කම්මබන්ධූ කම්මපටිසරණා, යං කම්මං කරොන්ති කල්‍යාණං වා පාපකං වා තස්ස දායාද භවන්ති.

## 10. 5. 1. 5
## විසාරද සූත්‍රය

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත අවිශාරද උපාසිකා තොමෝ ගිහිගෙයි වසයි. කවර දසයෙකින යත්:

පණිවා කරන්නී වෙයි. නුදුන් දෑ ගන්නී වෙයි. කාමයන්හි මිසහසර ඇත්තී වෙයි. මුසවා කියන්නී වෙයි, පිසුනුබස් ඇත්තී වෙයි, පරොස්බස් ඇත්තී වෙයි. සම්ඵප්‍රලාප ඇත්තී වෙයි. අභිධ්‍යා බහුල කොට ඇත්තී වෙයි. ව්‍යාපාදයට අවත් සිතැත්තී වෙයි. මිසදිටු ඇත්තී වෙයි. මහණෙනි, මෙ දස කරුණින් සමන්වාගත උපාසිකා තොමෝ අවිශාරද වූවා ගිහිගෙයි වසයි.

මහණෙනි, දසකරුණෙකින් සමන්වාගත විශාරද උපාසිකා තොමෝ ගිහිගෙයි වසයි. කවර දසයෙකින යත්:

පණිවායෙන් වැළකියා වෙයි, අයිනාදනින් වැළකියා වෙයි. කාමයන්හි මිස හසරින් වැළැකියා වෙයි. මුසවායෙන් වැළැකියා වෙයි. පිසුනුබසින් වැළැකියා වෙයි. පරොස් බසින් වැළැකියා වෙයි. සම්ඵප්‍රලාපයෙන් වැළකියා වෙයි. අභිධ්‍යා බහුල කොට නැත්තී වෙයි. ව්‍යාපාදයට පත් සිත් නැත්තී වෙයි. සම්‍යග්දෘෂ්ටි ඇත්තී වෙයි.

මහණෙනි, මෙ දස කරුණින් යුත් උපාසිකා තොමෝ විශාරද වූවා ගිහිගෙයි වසයි.

## 10. 5. 1. 6
## සංසප්පනිය පරියාය සූත්‍රය

මහණෙනි, තොපට සංසර්‍පණීය පර්‍යාය දෙසන්නෙමි. එ අසවු, මොනොවට මෙනෙහි කරවු. කියන්නෙමි යි. එසේය, වහන්සැයි එ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක:

මහණෙනි, සංසර්‍පණීය පර්‍යාව නම් වූ එ ධර්‍මපර්‍යාය කවරේය යත්:

මහණෙනි, සත්හු කර්‍මය දයාදා කොට ඇත්තාහු කර්‍මය කරණ කොට ඇත්තාහු කර්‍මය බන්‍ධු කොට ඇත්තාහු කර්‍මය පිළිසරණ කොට ඇත්තාහු කර්‍මස්වකයහ. කලණ වේවයි ලමු වේවයි යම් ම කර්‍මයක් කෙරෙත් නම් එයට දායාද වෙත්.

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො සබ්බපාණභූතෙසු, සො සංසප්පති කායෙන, සංසප්පති වාචාය, සංසප්පති මනසා, තස්ස ජිම්හං කායකම්මං හොති, ජිම්හං වචීකම්මං, ජිම්හං මනොකම්මං, ජිම්හා ගති, ජිම්හුපපත්ති. ජිම්හගතිකස්ස ඛො පනාහං භික්ඛවෙ ජිම්හුපපත්තිකස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි, යෙ වා එකන්තදුක්ඛා නිරයා, යා වා සංසප්පජාතිකා තිරච්ඡානයොනි.

කතමා ච සා භික්ඛවෙ සංසප්පජාතිකා තිරච්ඡානයොනි: අහී විච්ඡිකා, සතපදී, නකුලා, බිළාරා, මූසිකා, උලූකා, යෙ වා පනඤ්ඤෙපි කෙචි තිරච්ඡාන යොනිකා සත්තා මනුස්සෙ දිස්වා සංසප්පන්ති. ඉති ඛො භික්ඛවෙ භූතා භූතස්ස උපපත්ති හොති, යං කරොති, තෙන උපපජ්ජති, උපපන්නමෙතං ඵස්සා ඵුසන්ති. එවංපහං භික්ඛවෙ 'කම්මදායාද සත්තා'ති වදාමි.

ඉධ පන භික්ඛවෙ එකච්චො අදින්නාදායී හොති -පෙ- කාමෙසු මිච්ඡාචාරී හොති -පෙ- මුසාවාදී හොති -පෙ- පිසුනවාචො හොති -පෙ- ඵරුසවාචො හොති -පෙ- සම්ඵප්පලාපී හොති -පෙ- අභිජ්ඣාලු හොති -පෙ- බ්‍යාපන්නචිත්තො හොති -පෙ- මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො:

"නත්ථි දින්නං -පෙ- නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී"ති. සො සංසප්පති කායෙන, සංසප්පති වාචාය, සංසප්පති මනසා, තස්ස ජිම්හං කායකම්මං හොති, ජිම්හං වචීකම්මං, ජිම්හං මනොකම්මං, ජිම්හා ගති, ජිම්හුපපත්ති.

ජිම්හගතිකස්ස ඛො පනාහං භික්ඛවෙ ජිම්හුපපත්තිකස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි, යෙ වා එකන්තදුක්ඛා නිරයා, යා වා සංසප්පජාතිකා තිරච්ඡානයොනි.

1. සංසප්පති පරියායං - අට්ඨකථා.

මහණෙනි, මේ ලොව්හි ඇතැමෙක් රුදුරුකම් ඇතියේ ලෙහෙවැකි අත් ඇතියේ නැසුම්හි හා වොලො ගැණුම් හි බටුයේ සර්වප්‍රාණභූත ගණයා කෙරෙහි දයාරහිත වූයේ ප්‍රාණඝාතී වෙයි. හෙ කයින් සංසර්පණ (කර්ම) කෙරෙයි, වචනයෙන් සංසර්පණ කෙරෙයි. මනසින් සංසර්පණ කෙරෙයි, ඔහුගේ වක්‍රකාය කර්මය වෙයි, වක්‍රවාක්කර්මය වෙයි, වක්‍ර මනඃ කර්මය වෙයි, වක්‍රගති වෙයි, වක්‍ර උපපත්ති වෙයි, මහණෙනි, මම වක්‍රගති ඇති වක්‍ර උපපත්ති ඇතියහුට යම් බඳු එකැතින් දුක් ඇති නිරයෝ වෙත් නම් යම් බඳු සංසර්පණ සවභාව ඇති තිරිසන් යොන්හු වෙත් නම් එ දෙගතියෙන් එක්තරා ගතියක් කියමි.

මහණෙනි, සංසර්පණසවභාව ඇති ඒ තිරශ්චීනයොනිය කවර: සර්පයහ වෘශ්චිකා යහ, ශතපදීහුය, නකුල යහ, විඩාල යහ, මූෂිකා යහ, උලූකය හයි. යම් බඳු කිසියම් තිරශ්චීන යොනියෙහි උපන් සත්ත්වකෙනෙක් මිනිසුන් දැක හැකිලෙත් නම් ඔහු හෝ යි. මහණෙනි, මෙසේම විද්‍යමාන කර්මයෙන් සත්ත්වයාගේ උපපත්තිය වෙයි, යමක් කෙරේ නම් එයින් උපදනේය. උපන් ඔහු විපාක සපර්ශයෝ පහසිත්, මහණෙනි, මෙසේ ද මම සත්ත්වයෝ කර්ම දායාදය හ යි කියමි.

මහණෙනි, මේ ලොව්හි ඇතැමෙක් නුදුන් ද ගන්නා සුලු වෙයි... කාමයන්හි මිසහසර ඇතිවෙයි... මුසවා බණන සුලු වෙයි... පිසුනු බස් ඇතියේ වෙයි... පරොස් බස් ඇතියේ වෙයි... සම්ඵප්‍රලාප කියන සුලු වෙයි... අභිධ්‍යා බහුල කොට ඇතියේ වෙයි... ව්‍යාපාදයට වන් සිතැතියේ වෙ... විපරීතදර්ශන ඇති මිථ්‍යා දෘෂ්ටික වෙයි:

"දුන් දැහි ඵල නැත... ලොව්හි සම්‍යක්ගත සම්‍යක්ප්‍රතිපන්න වූ යම් කෙනෙක් මෙ ලොව හා පරලොව හා තුමූ විශිෂ්ට ඥනයෙන් දැන සාක්ෂාත් කොට ප්‍රකර්ෂයෙන් දන්නාහු නම් එබඳු මහණ බමුණෝ නැතැ''යි. හෙ කයින් කර්ම කෙරෙයි වචනයෙන් කර්ම කෙරෙයි. මනසින් කර්ම කෙරෙයි. ඔහුගේ කායකර්ම වක්‍ර වෙයි, වාක්කර්ම වක්‍ර වෙයි, මනඃ කර්ම වක්‍ර වෙයි, වක්‍රගති වෙයි, වක්‍ර උපපත්ති වෙයි.

මහණෙනි, වක්‍රගති ඇතියහුට වක්‍ර උපපත්ති ඇතිය හුට මම යම් බඳු වූ හෝ එකැතියෙන් දුක් ඇති නිරයෝ වෙත් නම් යම් බඳු වූ හෝ හැකිලෙන සැහැවි ඇති තිරිසන් යොන් වේ නම් එ බඳු දෙගතියෙන් එක්තරා ගතියක් කියමි.

කතමා ච සා භික්ඛවෙ සං සප්පජාතිකා තිරච්ඡාන යොනි: අහී, විච්ඡිකා, සතපදී, නකුලා, බිළාරා මූසිකා උලූකා, යෙ වා පනඤ්ඤෙපි කෙචි තිරච්ඡානයොනිකා සත්තා මනුස්සෙ දිස්වා සංසප්පන්ති. ඉති ඛො භික්ඛවෙ භූතා භූතස්ස උපපත්ති හොති. යං කරොති, තෙන උපපජ්ජති, උපපන්නමෙතං ඵස්සා ඵුසන්ති, එවංපහං භික්ඛවෙ 'කම්ම දායාද සත්තාති වදාමි.

කම්මස්සකා භික්ඛවෙ සත්තා කම්මදායාද කම්මයොනි කම්ම බන්ධු කම්ම පටිසරණා, යං කම්මං කරොන්ති කල්‍යාණං වා පාපකං වා තස්ස දායාද භවන්ති.

ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිත දණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහරති. සො න සංසප්පති කායෙන, න සංසප්පති වාචාය න සංසප්පති මනසා. තස්ස උජුං කාය කම්මං හොති, උජුං වචීකම්මං, උජුං මනො කම්මං, උජු ගති, උජූපපත්ති. උජුගතිකස්ස ඛො පනාහං භික්ඛවෙ උජූපපත්තිකස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි, යෙ වා එකන්ත සුඛා සග්ගා, යානි වා පන තානි උච්චාකුලානි ඛත්තිය මහාසාළ කුලානි වා බ්‍රාහ්මණමහාසාළකුලානි වා ගහපති මහාසාළකුලානි වා අඩ්ඪානි මහද්ධනානි මහාභොගානි පහූතජාතරූපරජතානි පහූත විත්තූපකරණානි පහූතධනධඤ්ඤානි.

ඉති ඛො භික්ඛවෙ භූතා භූතස්ස උපපත්ති හොති යං කරොති, තෙන උපපජ්ජති, උපපන්නමෙනං ඵස්සා ඵුසන්ති. එවංපහං භික්ඛවෙ කම්මදායාද සත්තාති වදාමි.

ඉධ පන භික්ඛවෙ එකච්චො අදින්නාදානං පහාය අදින්නාදානා පටි-විරතො හොති -පෙ- කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති -පෙ- මුසාවාදං පහාය මුසාවාද පටිවිරතො හොති -පෙ- පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති -පෙ- ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති -පෙ- සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති -පෙ- අනභිජ්ඣාලු හොති -පෙ- අබ්‍යාපන්න චිත්තො හොති -පෙ- සම්මාදිට්ඨිකො හොති අවිපරීත දස්සනො:

1. උජුං – මජසං.

මහණෙනි, ඒ හැකිලෙන සැහැවි ඇති තිරිසන් යොන් කවර: සජ්පය නුහුදුය පත්වෘය නකුල්ය බළල්ය මීය මහමුහුණුයි, යම් බඳු වූ හෝ අන්කිසි තිරිසන් යොන් ඇති සත්ත්‍වකෙනෙක් මිනිසුන් දක හැකිලෙත් නම් ඔහු යි. මහණෙනි, මෙසේ (ස්වභාවයෙන්) විද්‍යමාන කර්මයෙන් සත්ත්‍වයාගේ උපත වෙයි, යමක් කෙරේ නම් එයින් උපදනේය. උපන් තෙල පුහුලා විපාකස්පර්ශයෝ පහසිත්. මහණෙනි, මෙසේ ද මම සත්හු කර්මදයාදය යි කියමි.

මහණෙනි, සත්වයෝ කර්ම දයාදයා කොට ඇති කර්මයොනි කොට ඇති කර්මබන්‍ධු කොට ඇති කර්ම පිළිසරණ කොට ඇති කර්මස්වක වෙති. කලණ වේවයි ලමු වේවයි යම් කර්මයක් කෙරෙත් නම් එයට දයාද වෙත්.

මහණෙනි, මෙ ලොවිහි ඇතැමෙක් පණිවා හැරපියා බහා තැබූ දඬු ඇතියේ බහා තැබූ සැත් ඇතියේ පණිවායෙන් වැළැක්කේ වෙයි. පවට ලජ්ජා ඇතියේ දයාවට පැමිණියේ සර්වප්‍රාණභූතයන් කෙරෙහි හිතානුකම්පා ඇතියේ වෙසෙයි. හෙ කයින් සංසර්ජණ නො කෙරෙයි, වචනයෙන් සංසර්ජණ නො කෙරෙයි. මනසින් සංසර්ජණ නො කෙරෙයි. ඔහුගේ කාය කර්මය ඍජු වෙයි, වාක් කර්ම ඍජු වෙයි, මනඃ කර්ම ඍජු වෙයි, ඍජුගති වෙයි, ඍජු උපපත්ති වෙයි. මහණෙනි, ඍජුගති ඇතියහුට ඍජු උපපත්ති ඇතියහුට මම යම් ඒ ඒකාන්තසුව ස්වර්ගයෝ හෝ වෙත් නම් යම් බඳු වූ හෝ ක්ෂත්‍රිය මහා සාරකුල වෙත්වයි බ්‍රාහමණ මහාසාර කුල වෙත්වයි ගෘහපති මහාසාර කුල වෙත්වයි ආඪ්‍ය වූ මහත් ධන ඇති මහා භොග ඇති බොහෝ රන් රිදී ඇති බොහෝ විත්තොපකරණ ඇති බොහෝ ධන ධාන්‍ය ඇති උසස් කුල වෙත් නම් එ බඳු දෙගතියෙන් එක්තරා ගතියක් කියමි.

මහණෙනි, මෙසේ විද්‍යමාන කර්මයෙන් සත්ත්‍වයාගේ උපපත්තිය වෙයි. යම් කර්මයක් කෙරේ නම් එයින් උපදනේය. උපන් තෙල පුහුල්හු විපාකස්පර්ශයෝ පහසිත්. මහණෙනි, මෙසේ ද මම සත්ත්‍වයෝ කර්මදයාදයයි කියමි.

මහණෙනි, මෙලොවිහි ඇතැමෙක් අයිනාදන් හැරපියා අයිනාදනින් වැළැක්කේ වෙයි... කාමයන්හි මිසහසර හැරපියා කාමයන්හි මිසහසරින් වැළැක්කේ වෙයි... මුසවා හැරපියා මුසවායෙන් වැළැක්කේ වෙයි... පිසුනු බස් හැරපියා පිසුනු බසින් වැළැක්කේ වෙයි... පරොස්බස් හැරපියා පරොස් බසින් වැළැක්කේ වෙයි... සම්ඵප්‍රලාප හැරපියා සම්ඵප්‍රලාපයෙන් වැළැක්කේ වෙයි .. අනභිධ්‍යාලු වෙයි... ව්‍යාපාද රහිත සිතැත්තේ වෙයි..., අවිපරීතදර්ශන ඇති සම්‍යක්දෘෂ්ටික වෙයි:

අත්‍ථි දින්නං, අත්‍ථි යිට්ඨං, අත්‍ථි හුතං, අත්‍ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්‍ථි අයං ලොකො, අත්‍ථි පරො ලොකො, අත්‍ථි මාතා, අත්‍ථි පිතා, අත්‍ථි සත්තා ඔපපාතිකා, අත්‍ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී ති. සො න සංසප්පති කායෙන, න සංසප්පති වාචාය, න සංසප්පති මනසා, තස්ස උජුං කාය කම්මං හොති, උජුං වචීකම්මං, උජුං මනො කම්මං, උජුගති, උජුපපත්ති.

උජුගතිකස්ස ඛො පනාහං භික්ඛවෙ උජුපපත්තිකස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි. යෙ වා එකන්තසුඛා සග්ගා, යානි වා පන තානි උච්චාකුලානි ඛත්තියමහාසාල කුලානි වා, බ්‍රාහ්මණ මහාසාලකුලානි වා ගහපති මහාසාල කුලානි වා, අඩ්ඪානි මහද්ධනානි මහා භොගානි පහූත–ජාතරූපරජතානි පහූතවිත්තූපකරණානි, පහූතධනධඤ්ඤානි, ඉති ඛො භික්ඛවෙ භූතා භූතස්ස උපපත්ති, හොති යං කරොති, තෙන උපපජ්ජති උපපන්නමෙනං ඵස්සා ඵුසන්ති. එවංපහං භික්ඛවෙ කම්මදායාද සත්තාති වදාමි.

කම්මස්සකා භික්ඛවෙ සත්තා කම්මදායාද කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණා යං කම්මං කරොන්ති කල්‍යාණං වා පාපකං වා තස්ස දායාද භවන්ති.

අයං ඛො සො භික්ඛවෙ සංසප්පනියපරියායො ධම්ම පරියායොති.

## 10. 5. 1. 7

## පඨමසඤ්චෙතනික සුත්තං

නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා ව්‍යන්තීභාවං වදාමි. තඤ්ච ඛො දිට්ඨෙ වා ධම්මෙ උපපජ්ජෙ[1] වා අපරෙ වා පරියායෙ. න ත්වෙ වාහං භික්ඛවෙ සඤ්චෙතන–නිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා දුක්ඛස්සන්ත කිරියං වදාමි.

1. උපපජ්ජං වා–සී. මු.–ම ජ සං

"දුන් දූයෙහි ඵල ඇත, යාගයෙහි ඵල ඇත, හෝමයෙහි ඵල ඇත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක ඇත, මෙ ලෝ ඇත, පරලෝ ඇත, ඖපපාදූක සත්ත්වයෝ ඇත. යම් කෙනෙක් මෙලෝ හා පරලෝ හා තුමූ විශිෂ්ට ඥනයෙන් දූන පසක් කොට දනිත් නම් එ බඳු සම්‍යක්ගත සම්‍යක්ප්‍රතිපන්න මහණ බමුණෝ ඇතැ''යි. හෙ කයින් නො හැකිලෙයි, වචනයෙන් නො හැකිලෙයි. මනසින් නො හැකිලෙයි, ඔහට සෘජුකාය කර්ම වෙයි, සෘජුවාක්කර්ම වෙයි, සෘජු මනඃ කර්ම වෙයි, සෘජුගති වෙයි, සෘජු උපපත්ති වෙයි.

මහණෙනි, මම සෘජුගති ඇතියහුට සෘජු උපපත්ති ඇතියහුට යම් බඳු එකාන්ත සුඛ ස්වර්ගයෝ හෝ වෙත් නම් යම් බඳු ක්ෂත්‍රිය මහාසාරකුල වෙත්වයි, බ්‍රාහ්මණ මහාසාරකුල වෙත්වයි, ගෘහපති මහාසාරකුල වෙත්වයි, ආඪ්‍ය වූ මහත් ධන ඇති, මහාභොග ඇති, බොහෝ රන් රිදී ඇති බොහෝ විත්තොපකරණ ඇති බොහෝ ධනධාන්‍ය ඇති උසස් කුලයෝ හෝ වෙත් නම් එ බඳු දෙගතියෙන් එක්තරා ගතියක් කියමි. මහණෙනි, විද්‍යමාන කර්මයෙන් සත්හුගේ උපත වෙයි. යමක් කෙරේ නම් එයින් උපදනේය. උපන් තෙල පුහුලා විපාකස්පර්ශයෝ පහසිත්. මහණෙනි, මෙසේ ද මම සත්ත්වයෝ කර්මදායාදහයි කියමි.

මහණෙනි, සත්ත්වයෝ කර්ම දයාද කොට ඇති කර්මයොනි කොට ඇති කර්මබන්ධු කොට ඇති කර්ම ප්‍රතිශරණ කොට ඇති කර්මස්වක වෙත්. කලණ වේවයි ලමු වේවයි යම් කර්මයක් කෙරෙත් නම් එයට දයාද වෙත්, මහණෙනි, මෙ සංසප්පනීය පර්‍යාය නම් වූ ධර්ම පර්‍යාය වේය යි.

## 10. 5. 1. 7

## පඨම සඤ්චෙතනික සූත්‍රය

මහණෙනි, මම දූන දූන කළ වැඩූ කර්මයන්ගේ විපාක නො විඳ විගතාන්ත භාවයක් නොකියමි. හෙ ද වනාහි දිටුදැමියෙහි ම හෝ උපපද්‍යයෙහි හෝ අපරපරියායෙහි හෝ වෙයි. මහණෙනි, මම දූන දූන කළ වැඩූ කර්මයන්ගේ විපාක නො විඳ දුඃඛයාගේ කෙළවර කිරීමක් නො කියම් මැයි.

තත්‍ර භික්ඛවෙ තිවිධා කායකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසල සඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති. චතුබ්බිධා වචීකම්මන්ත සන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති. තිවිධා මනො කම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසල සඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛ විපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ තිවිධා කායකම්මන්ත සන්දොසබ්‍යාපත්ති අකුසල සඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති:

1. ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති ලුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො සබ්බපාණභූතෙසු.

2. අදින්නාදායී හොති. යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා අදින්නං ථෙය්‍ය සඞ්ඛාතං ආදාතා හොති.

3. කාමෙසු මිච්ඡාචාරී හොති, යා තා මාතුරක්ඛිතා -පෙ- අන්තමසො මාලාගුලපරික්ඛිත්තා පි, තථාරූපාසු චාරිත්තං ආපජ්ජිතා හොති.

එවං ඛො භික්ඛවෙ තිවිධා කාය කම්මන්ත සන්දොසබ්‍යාපත්ති අකුසල සඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ චතුබ්බිධා වචී කම්මන්ත සන්දොසබ්‍යාපත්ති අකුසල සඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛ විපාකා හොති.

4. ඉධ භික්ඛවෙ එකච්චො මුසාවාදී හොති, සභාගතො වා[1] පරිසගතො වා[1] ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුල මජ්ඣගතො වා අභිනීතො සක්ඛි පුට්ඨො, ''එහම්භො පුරිස යං ජානාසි තං වදෙහී''ති. සො අජානං වා ආහ 'ජානාමී' ති. ජානං වා ආහ 'න ජානාමි' ති. අපස්සං වා ආහ, 'පස්සාමී'ති, පස්සං වා ආහ, 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිස කිඤ්චික්ඛහෙතු වා සම්පජාන මුසාභාසිතා හොති.

1. සභග්ගතො වා පරිසග්ගතො වා – මජසං

මහණෙනි, එහි අකුශලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛවිපාක ඇති කායකර්ම සඞ්ඛ්‍යාත සවකිය විපත් ත්‍රිවිධ වේ. අකුශලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛවිපාක ඇති වාක්කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් චතුර්විධ වෙයි. අකුශලසඤ්චෙතනා ඇති දුඃඛ විපාක ඇති දුක් උපදවන මනඃ කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් ත්‍රිවිධ වෙයි.

මහණෙනි, කෙසේ නම් අකුශලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛවිපාක ඇති කාය කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් ත්‍රිවිධ වෙය යත්:

1. මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් රුදුරු කම් ඇත්තේ ලෙහෙ වැකි අත් ඇත්තේ නැසුම්– වොලො ගැණුම්හි බටුයේ සර්වප්‍රාණි භූතයන් කෙරෙහි දයාරහිත වූයේ ප්‍රාණඝාතී වෙයි.

2. නුදුන් දෑ ගන්නා සුලු වෙයි, ග්‍රාමගත වේවයි අරණ්‍යගත වේවයි මෙරමාගේ යම් ඒ පරවිත්තොපකරණයෙක් වේ නම් සොරය සඞ්ඛ්‍යාතය ඒ නුදුන් දෑ ගන්නේ වෙයි.

3. කාමයන්හි මිසහසර ඇතියේ වෙයි, මාතෘරක්ෂිතාය... යටත් පිරිසෙයින් මල්ගුලායෙනුදු පරික්ෂිප්ත වූ, යම් ඒ මාගම්හු වෙත් නම් එබඳු මාගමුන් කෙරෙහි හැසිරීමට පැමිණියේ වෙයි.

මහණෙනි, මෙසේ අකුශලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුක් විපාක ඇති කායකර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් ත්‍රිවිධ වෙයි.

මහණෙනි, කෙසේ නම් අකුසල සඤ්චෙතනා ඇති දුක් උපදවන දුක් විපාක ඇති වාක්කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් චතුර්විධ වෙය යත්:

4. මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් මුසවා කියන්නේ වෙයි: සභාවට ගියේ වේවයි පිරිසකට ගියේ වේවයි නෑයන් මැදට ගියේ වේවයි ගණමැදට ගියේ වේවයි රාජකුල මධ්‍යයට ගියේ වේවයි ඉදිරියට කැඳවන ලදුයේ එම්බා පුරුෂය, එව, යමක් දන්හි නම එ කියවයි සාක්ෂි පුළුවුස්නා ලදුයේ හෙ නො දන්නේ හෝ දන්මියි කියයි. දන්නේ හෝ නො දන්මි යි කියයි. නො දක්නේ හෝ දක්මියි කියයි. දක්නේ හෝ නො දක්මියි කියයි. මෙසේ තමා හෙතුකොට වේවයි, මෙරමා හෙතුකොට වේවයි කිසි ආමිසයක් හෙතුකොට වේවයි දැන දැන මුසවා කියන්නේ වෙයි.

5. පිසුනවාචො හොති. ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තා, භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති.

6. ඵරුසවාචො හොති, යා සා වාචා අණ්ඩකා කක්කසා පරකටුකා පරාභිසජ්ජනී කොධසාමන්තා අසමාධිසංවත්තනිකා, තථාරූපිං වාචං භාසිතා හොති.

7. සම්ඵප්පලාපී හොති, අකාලවාදී අභූතවාදී අනත්ථවාදී අධම්මවාදී අවිනයවාදී අනිධානවතිං වාචං භාසිතා හොති අකාලෙන අනපදෙසං අපරියන්තවතිං අනත්ථසංහිතං.

එවං ඛො භික්ඛවෙ චතුබ්බිධා වචීකම්මන්ත සන්දොස බ්‍යාපත්ති අකුසල සඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ තිවිධාමනො කම්මන්ත සන්දො සබ්‍යාපත්ති අකුසල සඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති.

8. ඉධ භික්ඛවෙ එකච්චො අභිජ්ඣාලු හොති, යං තං පරස්ස පරවිත්තූප කරණං තං අභිජ්ඣිතා හොති: අහො වත යං[1] පරස්ස තං මමස්සා''ති.

9. ව්‍යාපන්නචිත්තො හොති පදුට්ඨමනසංකප්පො 'ඉමෙ සත්තා හඤ්ඤන්තු වා බජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුන්ති.

10. මිච්ඡාදිට්ඨිකො හොති විපරීතදස්සනො, 'නත්ථි දින්නං නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා-පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡි-කත්වා පවෙදෙන්තීති.

එවං ඛො භික්ඛවෙ තිවිධා මනො කම්මන්ත සන්දොසබ්‍යාපත්ති අකුසල සඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති.

---

1. වතායං - සිමු.

5. පිසුණුබස් ඇතියේ වෙයි: මෙතැනින් අසා මොවුන්ගේ භෙදය පිණිස එතැන කියන්නේ වෙයි, එතැනින් හෝ අසා ඔවුන්ගේ භෙදය පිණිස මොවුන්ට කියන්නේ වෙයි. මෙසේ සමගවූවන් හෝ බිඳුවන්නේ භින්නයනට හෝ අනුබල දෙන්නේ වර්ගයෙහි සිත් ඇලවූයේ වර්ගයෙහි රුඳුනේ වර්ගයෙන් තුටුවන්නේ වර්ගකරනබස් කියන්නේ වෙයි.

6. පරොස්බස් ඇත්තේ වෙයි. හටගත් අණ්ඩක (නියර්‍ථාස හෝ පිළිල) ඇති කර්කශ වූ පරාහට කටුක වූ පරා ලග්න කරන කොධයට සමීප වූ සමාධිය පිණිස නො පවත්නා වූ යම් වචනයක් වේ ද එබඳු වචන කියන්නේ වෙයි.

7. අකාලවාදී අභූතවාදී අනර්ථවාදී අධර්මවාදී අවිනයවාදී සම්ඵප්‍රලාප බණන්නේ වෙයි. නො කල්හි කරුණු රහිතව පර්‍යන්ත විරහිත අනර්‍ථ සංහිත සිත්හි ලා දරනට නො නිසි බස් බණන්නේ වෙයි.

මහණෙනි, මෙසේ අකුසලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛවිපාක ඇති වාකකර්මසඞ්ඛ්‍යාත සවදෙෂවිපත් චතුර්විධ වෙයි.

මහණෙනි, කෙසේ අකුසලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛවිපාක ඇති මනඃකර්මසඞ්ඛ්‍යාත සවදෙෂවිපත් ත්‍රිවිධ වෙය යත්:

8. මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් අභිධ්‍යා බහුල වෙයි. පරා අයත් යම් වස්තූපකරණ ඇද්ද එය තමන් නතු කොට ගැන්මට සිතන්නේ වෙයි. ‘‘පරාසතු යම් දෑයෙක් ඇද්ද එය මා සතු වන්නේ නම් මැනැවැ’’යි.

9. ව්‍යාපාදයට පත් සිතැත්තේ වෙයි. ප්‍රදුෂ්‍යමනඃසංකල්ප ඇත්තේ වෙයි: ‘‘මේ සත්හු නැසෙන්නාහු හෝ වෙත්වා! බැඳෙන්නාහු හෝ වෙත්වා! සිඳෙන්නාහු හෝ වෙත්වා! නැසෙන්නාහු හෝ වෙත්වා! නොහොත් නොවෙත්වා හෝ’’යි.

10. මිසදිටුගත්තේ විපරීතදර්ශන ඇතියේ වෙයි. ‘‘දනවිපාක නැත, මඞගලදන නැත, හෝම නැත, සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵලයෙක් විපාකයෙක් නැත, මෙලෝ නැත, පරලෝ නැත, මවු නැත, පියා නැත ඖපපාතිකසත්ත්‍වයෝ නැත, යම් කෙනෙක් මෙලෝ හා පරලෝ හා තමන් විසින් වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් ද එබඳු සම්‍යග් ගත සම්‍යක්ප්‍රතිපන්න මහණ බමුණු කෙනෙක් ලෙව්හි නැති.

මහණෙනි, මෙසේ අකුශලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛවිපාක ඇති මනඃකර්මසඞ්ඛ්‍යාත සවදෙෂවිපත් ත්‍රිවිධ වෙයි.

තිවිධ කායකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසල සංචෙතනිකා හෙතු වා භික්ඛවෙ, සත්තා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

චතුබ්බිධවචීකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසල සංචෙතනිකා හෙතු වා භික්ඛවෙ, සත්තා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

තිවිධමනො කම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසංචෙතනිකා හෙතු වා භික්ඛවෙ, සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ අපණ්ණකො මණි උද්ධං ඛිත්තො යෙන යෙනෙව පතිට්ඨාති, සුප්පතිට්ඨිතායෙව පතිට්ඨාති, එවමෙව ඛො භික්ඛවෙ තිවිධ කායකම්මන්ත සන්දොසබ්‍යාපත්ති අකුසල සංචෙතනිකා හෙතු වා සත්තා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. චතුබ්බිධ වචීකම්මන්ත සන්දො සබ්‍යාපත්ති අකුසල සංචෙතනිකාහෙතු වා සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. තිවිධ මනො කම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසල සංචෙතනිකාහෙතු වා සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං නිරයං උපපජ්ජන්ති.

නාහං භික්ඛවෙ සංචෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා ව්‍යන්තීභාවං වදාමි. තඤ්ච ඛො දිට්ඨෙව ධම්මෙ උපපජ්ජෙ වා අපරෙ වා පරියායෙ.

න ත්වෙවාහං භික්ඛවෙ සංචෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා දුක්ඛස්සන්තකිරියං වදාමි.

තත්‍ර භික්ඛවෙ තිවිධා කායකම්මන්ත සම්පත්ති කුසල සංචෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති, චතුබ්බිධා වචීකම්මන්ත සම්පත්ති කුසල සංචෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති, තිවිධා මනොකම්මන්තසම්පත්ති-කුසලසංචෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාක හොති.

මහණෙනි, ත්‍රිවිධකාය කර්ම සවදෙෂ විපත් සඞ්ඛ්‍යාත අකුසල සඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු දුගීති විනිපාත නිරය සඞ්ඛ්‍යාත අපායෙහි උපදිති.

මහණෙනි, චතුර්විධවාක්කර්ම සවදෙෂ විපත් සඞ්ඛ්‍යාත අකුසල සඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු දුගීති විනිපාත නිරය සඞ්ඛ්‍යාත අපායෙහි උපදිති.

මහණෙනි, ත්‍රිවිධමනඃකර්ම සවදෙෂ විපත් සඞ්ඛ්‍යාත අකුසල සඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු දුගීති විනිපාත නිරය සඞ්ඛ්‍යාත අපායෙහි උපදිත්.

මහණෙනි, යම් සේ සිවුරැස් පසැටක් උඩලූයේ යම් යම් අතකින් පිහිටා ද සුප්‍රතිට්ඨිතව ම පිහිට යි. මහණෙනි, එ පරිදි ම ත්‍රිවිධකාය කර්ම සවදෙෂ විපත් සඞ්ඛ්‍යාත අකුසල සඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු දුගීති විනිපාත නිරය සඞ්ඛ්‍යාත අපායෙහි උපදිති. චතුර්විධවාක්කර්ම සවදෙෂ විපත් සඞ්ඛ්‍යාත අකුසල සඤ්චෙතනා හෙතු-වෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු දුගීති විනිපාත නිරය සඞ්ඛ්‍යාත අපායෙහි උපදිති. ත්‍රිවිධ මනඃකර්ම සවදෙෂ විපත් සඞ්ඛ්‍යාත අකුසල සඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු දුගීති විනිපාත නිරය සඞ්ඛ්‍යාත අපායෙහි උපදිත්.

මහණෙනි, මම දැන දැන කළ, රැස් කළ කර්මයන්ගේ නො විඳ විගතාභාවයෙක් නො කියමි. හෙ ද වනාහි දිටුදැමියෙහි හෝ වෙයි, දෙවන අත් බැව් හි හෝ වෙයි, අපර භවයක හෝ වේ.

මහණෙනි, මම දැන දැන කළ, රැස් කළ කර්මයන්ගේ නො විඳ දුක් කෙළවර කිරීමක් නො කියමි.

මහණෙනි, එහි ලා කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති කායකර්ම සම්පත් ත්‍රිවිධ වෙයි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති වාක්කර්ම සම්පත් චතුර්විධ වෙයි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති මනඃ කර්ම සම්පත් ත්‍රිවිධ වේ.

කථඤ්ච භික්ඛවෙ තිවිධා කායකම්මන්ත සම්පත්ති කුසලසඤ්චෙ-තනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති.

1. ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටි-විරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බ-පාණභූත හිතානුකම්පී විහරති.

2. අදින්නාදනං පහාය අදින්නාදනා පටිවිරතො හොති: යං තං පරස්ස පරවිත්තූපකරණං ගාමගතං වා අරඤ්ඤගතං වා න තං අදින්නං ථෙය්‍ය සඞ්ඛාතං ආදතා හොති.

3. කාමෙසුමිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. යා තා මාතුරක්ඛිතා -පෙ- අන්තමසො මාලාගුල පරික්ඛිත්තාපි තථාරූපාසු න චාරිත්තං ආපජ්ජිතා හොති.

එවං ඛො භික්ඛවෙ තිවිධා කායකම්මන්ත සම්පත්ති කුසලසඤ්චෙත-නිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ චතුබ්බිධා වචීකම්මන්ත සම්පත්ති කුසලසඤ්චෙත-නිකා සුඛුද්‍රයා සුඛ විපාකා හොති:

4. ඉධ භික්ඛවෙ එකච්චො මුසාවාදං පහාය මුසාවාද පටිවිරතො හොති, සභාගතො වා පරිසගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣ-ගතොවා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො 'එහම්භො පුරිස යං ජානාසි, තං වදෙහී'ති. සො අජානං වා ආහ: 'න ජානාමී'ති. ජානං වා ආහ: 'ජානාමී'ති. අපස්සං වා ආහ: 'න පස්සාමී'ති. පස්සං වා ආහ: 'පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජාන මුසා භාසිතා හොති.

5. පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති. න ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති.

මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛ විපාක ඇති ත්‍රිවිධකාය කර්ම සම්පත් කෙසේ වේය යත්:

1. මහණෙනි, මෙලොව්හි ඇතැමෙක් පණිවායෙන් දුරුව පණිවා-යෙන් වැළැක්කේ වෙයි. බහාතැබූ දඬු ඇත්තේ බහාතැබූ අවි ඇත්තේ ලජ්ජා ඇත්තේ දයාපන්න වූයේ සර්වප්‍රාණභූතයන් කෙරෙහි හිතානුකම්පී ව වෙසෙයි.

2. අයිනාදන් හැර අයිනාදනින් වැළැක්කේ වෙයි: ග්‍රාමගතවේවයි අරණ්‍යගත වේවයි පරා අයත් යම් පරවස්තූපකරණයෙක් වේ නම් සොර සඞ්ඛ්‍යාත නො දුන් එය නො ගන්නේ වෙයි.

3. කාමයන්හි මිස හසර හැර කාම මිථ්‍යාචාරයෙන් වැළැක්කේ වෙයි: මාතුරක්ඛිතාය ... යටත් පිරිසෙයින් මාලා ගුණ පරික්ෂිප්තව හෝ කිසිවකු අයත්කර ගත් යම් ඒ ස්ත්‍රීහු වෙත් නම් එබඳු ස්ත්‍රීන් කෙරෙහි මිථ්‍යාචාරයට නො යන්නේ වේයි.

මහණෙනි, මෙසේ කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛ විපාක ඇති ත්‍රිවිධකායකර්ම සම්පත් වෙයි.

මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති චතුර්විධ වාකකර්ම සම්පත් කිසේය යත්:

4. මහණෙනි, මෙලොව්හි ඇතැමෙක් මුසවා හැර මුසාවාදයෙන් වැළැක්කේ වෙයි. සභාවටගියේ වේවයි, පිරිසට ගියේ වේවයි, ඥාති-මධ්‍යයට ගියේ වේවයි, සමූහමධ්‍යයට ගියේ වේවයි, රාජකුලමධ්‍යයට ගියේ වේවයි, හමුවට කැඳවන ලදුයේ ''එම්බා පුරුෂය, මෙහි එව, යමක් දනිහි නම් එ කියව'' යි සාක්ෂ්‍ය පුළුවුස්නා ලද හේ නො දත් දය හෝ නො දන්මි යි කියායි, දත් දය හෝ දන්මි යි කියායි, නො දුටු දය හෝ නො දක්මි යි කියායි දුටු දය හෝ දක්මි යි කිය යි. මෙසේ තමා හෙතු කොට ගෙන වේව යි, පරා හෙතු කොට ගෙන වේව යි කිසි ආමිසයක් හේතු කොට ගෙන වේවයි දැන දැන මුසවා නො බණන්නේ වෙයි.

5. පිසුනු බස් හැර පිසුනු බසින් වැළැක්කේ වෙයි, මෙ තැනින් අසා මොවුන්ගේ භෙදය පිණිස එ තැන නො කියන්නේ වෙයි. එ තන්හි අසා ඔවුන්ගේ භෙදය පිණිස මොවුනට නො කියන්නේ වෙයි. මෙසේ අසමග්‍රයන් සමග්‍ර කරන්නේ සමග්‍රයන්හට අනුබල දෙන්නේ සමග්‍රාරාම වූයේ සමග්‍රරත වූයේ සමග්‍රනන්දී වූයේ සමග්‍රකරණී බස් බණන්නේ වෙයි.

6. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, යා සා වාචා නෙළා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපං වාචං භාසිතා හොති.

7. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. එවං ඛො භික්ඛවෙ චතුබ්බිධා වචීකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛ විපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ තිවිධා මනොකම්මන්තසම්පත්ති කුසල සඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති:

8. ඉධ භික්ඛවෙ එකච්චො අනභිජ්ඣාලු හොති. යං තං පරස්ස පර- චිත්තූපකරණං තං අනභිජ්ඣිතා හොති, 'අහො වත යං පරස්ස තං මමස්සා'ති.

9. අව්‍යාපන්නචිත්තො හොති අප්පදුට්ඨමනසඞ්කප්පො 'ඉමෙ සත්තා අවෙරා අබ්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූ'ති.

10. සම්මාදිට්ඨිකො හොති අවිපරීතදස්සනො, 'අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, -පෙ- යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති.

එවං ඛො භික්ඛවෙ තිවිධා මනොකම්මන්තසම්පත්ති කුසල සඤ්චෙත- නිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති.

තිවිධකායකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා හෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. චතුබ්බිධ වචීකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා හෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තිවිධ මනො කම්මන්ත සම්පත්ති කුසලසඤ්චෙතනිකා හෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

පරොස් බස් හැර පරුෂ වචනයෙන් වැළැක්කේ වෙයි: නිදෙස් වූ කණ්සුව වූ ප්‍රෙමණීය වූ හෘදයඞ්ගම වූ බහුජන කාන්ත වූ බහුජනමනාප වූ යම් බසෙක් වේ නම් එබඳු බස් බණන්නේ වෙයි.

නිසරු (ප්‍රලාප) බස් හැරපියා නිසරු බසින් වැළැක්කේ වෙයි: කල් බලා කියනුයේ සැබැවක් ම කියනුයේ වැඩ දයක තෙපුල් කියනුයේ ධර්මවාදී වූයේ විනයවාදී වූයේ සුදුසු කල කරුණු සහිත වූ පිරිසිඳීම් ඇති වැඩ සහිත වූ ළෙහි තැබිය යුතු වූ තෙපුලක් ම කියන්නේ වෙයි. මහණෙනි,, කුසලසඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති චතුර්විධවාක්කර්මසම්පත් මෙසේ වෙයි.

මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛ විපාක ඇති ත්‍රිවිධ මනඃ කර්මසම්පත් කිසේය යත්:

මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් අභිධ්‍යා බහුල නො වෙයි: පරා අයත් යම් වස්තූපකරණ ඇද්ද එය තමන් නතු කොට ගැන්ම නො සිතන්නේ වෙයි: ''පරාසතු යම් දයෙක් ඇද්ද එය මා සතු වන්නේ නම් මැනැවැ''යි.

ව්‍යාපාදයට පත් සිත් නැත්තේ වෙයි, ප්‍රදුෂ්‍යමනඃසඞ්කල්ප නැත්තේ වෙයි: ''මෙ සත්හු වෛර නැත්තාහු ව්‍යාපාද රහිත වූවාහු උවදුරු රහිත වූවාහු සුව ඇත්තාහු ආත්ම පරිහරණය කෙරෙත්ව''යි.

සම්‍යග් දෘෂ්ටික වූයේ විපරීත දර්ශන නැත්තේ වෙයි: ''දන විපාක ඇත, මඞ්ගල දන ඇත...මෙලො පරලෝ තුමූම විශිෂ්ට ඥනයෙන් දන සාක්ෂාත් කොට පවසත් නම් එබඳු මහණ බමුණු කෙනෙක් ලෙව්හි ඇතැ''යි.

මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛ විපාක ඇති ත්‍රිවිධ මනඃකර්මසම්පත් මෙසේ වෙයි.

මහණෙනි, ත්‍රිවිධ කායකර්ම සඞ්ඛ්‍යාත කුසලසඤ්චෙතනා හෙතුයෙන් හෝ සත්ත්වයෝ කාබුත් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ග ලොකයෙහි උපදිති. මහණෙනි, චතුර්විධ වාක්කර්මසඞ්ඛ්‍යාත කුසලසඤ්චෙතනා හෙතුයෙන් හෝ සත්හු කාබුත් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොක-යෙහි උපදිති. මහණෙනි, ත්‍රිවිධ මනඃකර්ම සම්පත් සඞ්ඛ්‍යාත කුසල සඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුත් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයෙහි උපදිත්.

සෙය්‍යථාපි භික්ඛවෙ අපණ්ණකො මණි උද්ධං ඛිත්තො යෙන යෙනෙව පතිට්ඨාති සුප්පතිට්ඨිතං යෙව පතිට්ඨාති. එවමෙව ඛො භික්ඛවෙ තිවිධ කායකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා හෙතු වා සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

චතුබ්බිධ වචීකම්මන්ත සම්පත්ති කුසලසඤ්චෙතනිකා හෙතු වා සත්තාකායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

තිවිධ මනොකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා හෙතු වා සත්තා කායස්ස භෙදා පරංමරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං ව්‍යන්තීභාවං වදාමි. තඤ්ච ඛො දිට්ඨෙව ධම්මෙ, උපපජ්ජෙ වා ,අපරෙ වා පරියායෙ. න ත්වෙවාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා දුක්ඛස්ස අන්තකිරියං වදාමීති.

## 10. 5. 1. 8
## දුතිය සඤ්චෙතනික සුත්තං

නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා ව්‍යන්තීභාවං වදාමි. තඤ්ච ඛො දිට්ඨෙව ධම්මෙ උපපජ්ජෙ වා අපරෙ වා පරියායෙ. න ත්වෙවාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා දුක්ඛස්සන්තකිරියං වදාමි.

තත්‍ර භික්ඛවෙ තිවිධා කායකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති. චතුබ්බිධා වාචාකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති. තිවිධා මනොකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ තිවිධා කායකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති -පෙ- එවං ඛො භික්ඛවෙ තිවිධා කායකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛ විපාකා හොති.

මහණෙනි, යම් සේ සිවුරැස් පසැටක් උඩ ලූයේ යම් යම් අතකින් පිහිටා ද සුප්‍රතිෂ්ඨිත ව ම පිහිටයි. මහණෙනි, එ පරිදි ම ත්‍රිවිධකායකර්ම සම්පත් සඞ්ඛ්‍යාත කුශල සඤ්චෙතනා හෙතුයෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු ස්වර්ග ලොක සඞ්ඛ්‍යාත සුගතියෙහි උපදිත්.

චතුර්විධ වාක්කර්මසම්පත් කුසලසඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු ස්වර්ගලොක සඞ්ඛ්‍යාත සුගතියෙහි උපදිත්.

ත්‍රිවිධ මනඃකර්මසම්පත් සඞ්ඛ්‍යාත කුසලසඤ්චෙතනා හෙතුයෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු ස්වර්ගලොක සඞ්ඛ්‍යාත සුගතියෙහි උපදිත්.

මහණෙනි, මම දැන දැන කළ රැස්කළ කර්මයන්ගේ නො විඳ විගතාන්තභාවයෙක් නො කියමි. හෙ ද මේ අත් බැව්හි හෝ වෙයි, දෙවෙනි අත් බැව්හි හෝ වෙයි, අපරජන්මයෙහි හෝ වෙයි. මහණෙනි, මම දැන දැන කළ රැස්කළ කර්මයන්ගේ විපාක නො විඳ දුක් කෙළවර කිරීමක් නො කියමී යි.

## 10. 5. 1. 8

## දුතිය සඤ්චෙතනික සූත්‍රය

මහණෙනි, මම කරන ලද රැස් කරන ලද සඤ්චෙතනික කර්ම-යන්ගේ විපාක නො විඳ විගතාන්ත භාවයක් නො කියමි. හෙ ද වනාහි ඉහාත්මයෙහි ම හෝ අනතුරු ආත්මභාවයෙහි හෝ අපරජන්මයෙහි හෝ වේ. මහණෙනි, මම කරන ලද රැස් කරන ලද සඤ්චෙතනික කර්මයන්ගේ විපාක නො විඳ දුක් කෙළවර කිරීමක් නො ම කියමි.

මහණෙනි, එහිලා අකුසලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛ විපාක ඇති කායකර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් ත්‍රිවිධ වෙයි. අකුසල සඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛවිපාක ඇති වාක්කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් චතුර්විධ වෙයි. අකුසලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛ විපාක ඇති මනඃ කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් ත්‍රිවිධ වේ.

මහණෙනි, අකුසලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛ විපාක ඇති ත්‍රිවිධ කායකර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් කිසේය යත්.....මහණෙනි, අකුසලසඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛ විපාක ඇති ත්‍රිවිධ කාය කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් මෙසේ වෙයි.

කථඤ්ච භික්ඛවෙ චතුබ්බිධා වචීකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති -පෙ- එවං ඛො භික්ඛවෙ චතුබ්බිධා වචීකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ තිවිධා මනොකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති -පෙ- එවං ඛො භික්ඛවෙ තිවිධා මනොකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා දුක්ඛුද්‍රයා දුක්ඛවිපාකා හොති.

තිවිධ කායකම්මන්තසන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකාහෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. චතුබ්බිධවචීකම්මන්ත -පෙ- තිවිධමනොකම්මන්ත සන්දොසබ්‍යාපත්ති අකුසලසඤ්චෙතනිකා හෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා බ්‍යන්තීභාවං වදාමි. තඤ්ච ඛො දිට්ඨෙව ධම්මෙ උපපජ්ජෙ වා අපරෙ වා පරියායෙ. න ත්වෙවාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා දුක්ඛස්සන්තකිරියං වදාමි.

තත්‍ර භික්ඛවෙ තිවිධා කායකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති. චතුබ්බිධා වචීකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති. තිවිධා මනොකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ තිවිධා කායකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා -පෙ- එවං ඛො භික්ඛවෙ තිවිධා කායකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති.

කථඤ්ච භික්ඛවෙ චතුබ්බිධා වචීකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති -පෙ- එවං ඛො භික්ඛවෙ චතුබ්බිධා වචීකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති.

මහණෙනි, අකුසල සඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛ විපාක ඇති චතුර්විධ වාක්කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් කිසේය යත්:.... මහණෙනි, අකුසල සඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛ විපාක ඇති චතුර්විධ වාක්-කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් මෙසේ වෙයි.

මහණෙනි, අකුසල සඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛ විපාක ඇති ත්‍රිවිධ මනඃ කර්ම සඞ්ඛ්‍යාත සවදෙෂ විපත් කිසේය යත්:... මහණෙනි, අකුසල සඤ්චෙතනා ඇති දුක් උපදවන දුඃඛ විපාක ඇති ත්‍රිවිධ මනඃ කර්ම සංඛ්‍යාත සවදෙෂ විපත් මෙසේ වෙයි.

මහණෙනි, ත්‍රිවිධ කායකර්ම සවදෙෂ විපත් සංඛ්‍යාත අකුසල සඤ්චෙතනා හෙතුයෙන් හෝ සත්ත්වයෝ කාබුන් මරණින් මතු අපාය, දුර්ගති විනිපාත සඞ්ඛ්‍යාත නිරයෙහි උපදනාහ. චතුර්විධ වාක්කර්ම... මහණෙනි, ත්‍රිවිධ මනඃ කර්ම සවදෙෂ විපත් සඞ්ඛ්‍යාත අකුසල සඤ්චෙ-තනා හෙතුයෙන් හෝ සත්ත්වයෝ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත සඞ්ඛ්‍යාත නිරයෙහි උපදනාහ.

මහණෙනි, කරනලද රැස් කරන ලද සඤ්චෙතනික කර්මයන්ගේ විපාක නො විඳ විගතාන්ත භාවයක් මම නො කියමි. හෙ ද වනාහි ඉහාත්මයෙහි හෝ අනතුරු අත් බැව්හි හෝ අපර ජන්මයෙහි හෝ වෙයි. මහණෙනි, මම කරන ලද රැස් කරන ලද සඤ්චෙතනික කර්මයන් නො විඳ දුක් කෙළවර කිරීමක් නො ම කියමි.

මහණෙනි, එහි ලා කුසල සඤ්චෙතනා ඇති සුව එළවන සුඛ විපාක ඇති කාය කර්ම සඞ්ඛ්‍යාත සම්පත් ත්‍රිවිධ වෙයි. කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති වාක්කර්ම සඞ්ඛ්‍යාත සම්පත් චතුර්විධ වෙයි. කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති මනඃ කර්ම සඞ්ඛ්‍යාත සම්පත් ත්‍රිවිධ වෙයි.

මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛ විපාක ඇති ත්‍රිවිධකාය කර්ම සඞ්ඛ්‍යාත සම්පත් කිසේය යත්... මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති ත්‍රිවිධකායකර්ම සඞ්ඛ්‍යාත සම්පත් මෙසේ වෙයි.

මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛ විපාක ඇති චතුර්විධ වාක්කර්ම සඞ්ඛ්‍යාත සම්පත් කියේ වෙය යත්... මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛ විපාක ඇති චතුර්විධ වාක්-කර්ම සඞ්ඛ්‍යාත සම්පත් මෙසේ වෙයි.

කථඤ්ච භික්ඛවෙ තිවිධා මනොකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති -පෙ- එවං ඛො භික්ඛවෙ තිවිධා මනොකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා සුඛුද්‍රයා සුඛවිපාකා හොති.

තිවිධකාය කම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා හෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. චතුබ්බිධවචීකම්මන්ත -පෙ- තිවිධමනොකම්මන්තසම්පත්ති කුසලසඤ්චෙතනිකා හෙතු වා භික්ඛවෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. -පෙ-

## 10. 5. 1. 9
## කරජකාය සුත්තං

නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා[1] ව්‍යන්තීභාවං වදාමි. තඤ්ච ඛො දිට්ඨෙව ධම්මෙ උප්පජ්ජෙ[2] වා අපරෙ වා පරියායෙ. න ත්වෙවාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා දුක්ඛස්සන්තකිරියං වදාමි.

ස ඛො සො භික්ඛවෙ අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං -පෙ- තථා තතියං -පෙ- තථා චතුත්ථං[3] ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[4] සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති.

සො එවං පජානාති: "පුබ්බෙ ඛො මෙ ඉදං චිත්තං පරිත්තං අහොසි අභාවිතං. එතරහි පන මෙ ඉදං චිත්තං අප්පමාණං සුභාවිතං. යං ඛො පන කිඤ්චි පමාණකතං කම්මං, න තං තත්‍රාවසිස්සති. න තං තත්‍රාවතිට්ඨතී'ති

තං කිං මඤ්ඤථ භික්ඛවෙ දහරතග්ගෙ ච්චෙ සො අයං[5] කුමාරො මෙත්තං චෙතො විමුත්තිං භාවෙය්‍ය, අපි නු ඛො පාපකම්මං කරෙය්‍යාති? නො හෙතං භන්තෙ.

1. අප්පටිසංවෙදිත්වා – මජසං
2. උප්පජ්ජං වා-සීමු. මජසං,
3. තථා චතුත්ථිං – මජසං
4. සබ්බත්තතාය – සී.මු
5. ච අයං – ස්‍යා.

මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛ විපාක ඇති ත්‍රිවිධ මනඃකර්ම සංඛ්‍යාත සම්පත් කිසේ වේය යත්... මහණෙනි, කුසල සඤ්චෙතනා ඇති සුව උපදවන සුඛවිපාක ඇති ත්‍රිවිධ මනඃකර්ම සංඛ්‍යාත සම්පත් මෙසේ වෙයි.

මහණෙනි, ත්‍රිවිධකාය කර්ම සංඛ්‍යාත් කුසල සඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත සවර්ග ලොකයෙහි උපදිත්. චතුර්විධ වාක්කර්ම... ත්‍රිවිධ මනඃකර්ම සම්පත් සංඛ්‍යාත කුසල සඤ්චෙතනා හෙතුවෙන් හෝ සත්හු කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත සවර්ග ලොකයෙහි උපදනාහ...

## 10. 5. 1. 9

## කරජකාය සූත්‍රය

මහණෙනි, මම දැන දැන කළ, රැස් කළ කර්මයන්ගේ ඵනා විඳ විගතාන්තභාවයක් නො කියමි. හෙ ද වනාහි ඉහාත්මයෙහි හෝ වෙයි. දෙවන ජන්මයෙහි හෝ වෙයි. ජන්මාන්තරයෙහි හෝ වෙයි. මහණෙනි, මම දැන දැන කළ, රැස් කළ කර්මයන්ගේ විපාක නො විඳ දුක කෙළවර කිරීමක් නො ම කියමි.

මහණෙනි, ඒ මේ අරිසවු මෙසේ පහ වූ අභිධ්‍යා ඇතියේ පහ වූ ව්‍යාපාද ඇතියේ අසම්මූඪ වූයේ සම්‍යක් ප්‍රඥ ඇතියේ එළඹ සිටි සිහි ඇතියේ මෙත්සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි. දෙවන දිග ද එසේ ය. තෙවන දිග ද එසේ ය. සිවුවන දිග ද එසේ ය. මෙසේ උඩ යට සරස හැමතන්හි සර්වාත්මභාවයෙන් හැමතාක් ලොව විපුල මහද්ගත අප්‍රමාණ අවෛර අව්‍යපාද මෙත්සහගිය සිතින් පතුරුවා වෙසෙයි.

හෙ මෙසේ දනියි: "පෙර වනාහි මාගේ මෙ සිත අභාවිත වූයේ පරිත්ත විය දැන් වනාහි මාගේ මේ සිත සුභාවිත වූයේ අප්‍රමාණ වෙයි. යම් කිසි ප්‍රමාණ කෘත කර්මයක් වේ නම් ඒ එහි අවශිෂ්ට නො වෙයි. ඒ එහි නො සිටුනේ" යි.

මහණෙනි, ඒ කුමැයි හඟිවු ද? ළදරු කල් පටන් ඉදින් ඒ මෙ කුමර මෛත්‍රීචිත්ත විමුක්තිය වඩතෝ නම් පව් කමක් නම් කෙරේ ද යි. වහන්ස, නෙල නො වේ මැයි.

අකරොන්තං ඛො පන පාපකම්මං අපි නු ඛො දුක්ඛං ඵුසෙය්‍යාති?

නො හෙතං භන්තෙ. අකරොන්තං හි භන්තෙ පාපකම්මං කුතො දුක්ඛං ඵුසිස්සතී ති.

භාවෙතබ්බා ඛො පනායං භික්ඛවෙ මෙත්තාචෙතොවිමුත්ති ඉත්ථියා වා භික්ඛවෙ පුරිසෙන වා. ඉත්ථියා වා භික්ඛවෙ පුරිසස්ස වා නායං කායො ආදය ගමනීයො. චිත්තන්තරො භික්ඛවෙ මච්චො. සො එවං පජානාති: "යං ඛො මෙ [1]ඉධ කිඤ්චි පුබ්බෙ ඉමිනා කරජකායෙන පාපකම්මං කතං, සබ්බං තං ඉධ වෙදනියං, න තං අනුගං භවිස්සතී"ති.

එවං භාවිතා ඛො භික්ඛවෙ මෙත්තාචෙතොවිමුත්ති අනාගාමිතාය සංවත්තති, ඉධ පඤ්ඤස්ස භික්ඛුනො උත්තරිං විමුත්තිං අප්පටිවිජ්ඣතො.

කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතා සහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං - තථා-තතියං - තථාචතුත්ථං - ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ග-තෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති.

සො එවං පජානාති, "පුබ්බෙ ඛො මෙ ඉදං චිත්තං අප්පමාණං පරිත්තං අහොසි අභාවිතං, එතරහි පන මෙ ඉදං චිත්තං සුභාවිතං. යං ඛො පන මෙ කිඤ්චි පමාණකතං කම්මං, න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨතී"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ දහරතග්ගෙ චෙ සො අයං කුමාරො උපෙක්ඛා චෙතො විමුත්තිං භාවෙය්‍ය, අපි නු ඛො පාපකම්මං කරෙය්‍යාති?

නො හෙතං භන්තෙ.

අකරොන්තං ඛො පන පාපකම්මං අපි නු ඛො දුක්ඛං ඵුසෙය්‍යාති?

නො හෙතං භන්තෙ.

අකරොන්තං හි භන්තෙ පාපකම්මං කුතො දුක්ඛං ඵුසිස්සතී ති.

1. ඉදං - මජසං

දූක පාපකර්ම නො කරන්නහු පහස්නේ ද යි.

වහන්ස, තෙල නො වේ මැයි. වහන්ස, දූක පව් නො කරන්නහු කෙසේ නම් පහස්නේ ද?

මහණෙනි, ස්ත්‍රියක විසින් වේවයි පුරුෂයකු විසින් වේවයි මේ මෛත්‍රීචිත්තවිමුක්තිය වැඩිය යුතු මැයි. ස්ත්‍රියගේ වේවයි, පුරුෂයාගේ වේවයි මේ කරජකායය පරලෝ ගෙන යා හැකි නො වේ මැයි. මහණෙනි, මේ මිනිස් තෙම චිත්තක්ෂණාන්තරයක් ඇත්තෙකි. හෙ මෙසේ දනී: ''මෙ ලොව්හි ම විසින් පෙර මෙ කරජකයින් යම් කිසි පව්කමක් කරන ලද නම් එ හැම මෙ ලොව්හි ම වින්ද යුතු වෙයි (උපපද්‍ය වෙදනිය විසින්) එය අනුව යන්නක් නො වන්නේ ය''යි.

මහණෙනි, මෙසේ වඩනා ලද මෛත්‍රී චිත්තවිමුක්තිය මතුයෙහි අර්හත්ත්ව විමුක්තිය නො පිළි විදුනා ප්‍රඥ ඇති මහණහට මෙලොව්හිදී ම අනාගාමී බව පිණිස වැටෙයි.

කරුණා සහගිය සිතින්...මුදිතා සහගිය සිතින්... උපෙක්ෂා සහගත සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි. දෙවන දිග ද එසේ ය– තෙවන දිග ද එසේ ය– සිවුවන දිග ද එසේ ය– මෙසේ උඩ යට සරස හැමතන්හි සර්‍වාත්මභාවයෙන් හැම තාක් ලොව විපුල මහද්ගත අප්‍රමාණ අවෛර ව්‍යාපාද රහිත උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වෙසෙයි.

හෙ මෙසේ දනී: ''පෙර වනාහි මාගේ මෙ සිත අභාවිත වූයේ පරිත්ත විය. දැන් වනාහි මාගේ මෙ සිත සුභාවිත වූයේ අප්‍රමාණ වෙයි, ම විසින් යම් ම කර්මයක් ප්‍රමාණ කරන ලද ද ඒ කර්මය මෙහි අවශිෂ්ට නො වෙයි. එ එහි නො සිටුනේ ය''යි.

මහණෙනි, එ කුමැයි හඟිවු ද? ළදරු කල් පටන් ඉදින් ඒ මේ කුමර උපෙක්ෂා චිත්ත විමුක්තිය වඩනේ නම් පව්කම් කරන්නේ ද යි.

වහන්ස, තෙල නො වේ ම ය. දූක පව්කම් නො කරන්නහු පහස්නේ ද යි.

වහන්ස, තෙල නො වේ මැයි.

වහන්ස, දූක පාපකර්ම නො කරන්නහු කිසේ නම් පහස්නේ ද යි.

භාවෙතබ්බා බො පනායං භික්ඛවෙ උපෙක්ඛා චෙතො විමුත්ති ඉත්ථියා වා පුරිසෙන වා. ඉත්ථියා වා භික්ඛවෙ පුරිසස්ස වා නායං කායො ආදාය ගමනීයො. චිත්තන්තරො අයං භික්ඛවෙ මච්චො. සො එවං පජානාති: "යං ඛො මෙ ඉධ කිඤ්චි පුබ්බෙ ඉමිනා කරජකායෙන පාපකම්මං කතං, සබ්බං තං ඉධ වෙදනියං. න තං අනුගං භවිස්සති ති. එවං භාවිතා ඛො භික්ඛවෙ උපෙක්ඛා චෙතොවිමුත්ති අනාගාමිතාය සංවත්තති ති. ඉධ පඤ්ඤස්ස භික්ඛුනො උත්තරිං විමුත්තිං අප්පටිවිජ්ඣතො ති

## 10. 5. 1. 10

## අධම්මචරියා සුත්තං

අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

කො නු ඛො භො ගොතම හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති ති?

අධම්මචරියා විසමචරියා හෙතු ඛො බ්‍රාහ්මණ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති.

කො පන භො ගොතම හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති?

ධම්මචරියා සමචරියා හෙතු ඛො බ්‍රාහ්මණ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

---

1. සාරණීයං, - මජසං

මහණෙනි, ස්ත්‍රියක විසින් වේවයි, පුරුෂයකු විසින් වේවයි මේ උපෙක්ෂාචෙතො විමුක්තිය වැඩිය යුතුය. මහණෙනි, ස්ත්‍රියගේ හෝ පුරුෂයාගේ හෝ මේ කය පරලොව ගෙන යා හැකි නො වේ. මහණෙනි, මෙ මිනිස් තෙම චිත්ත ක්ෂණාන්තරයක් ඇත්තෙකි. හෙ මෙසේ දනී: "ම විසින් මෙ ලොව්හි පෙර මෙ කරජකයින් යම් පවකමක් කරණ ලද නම් එ හැම මෙලොව වින්ද යුතු වෙයි. එය අනුගතයෙක් නො වන්නේ ය''යි මහණෙනි, මෙසේ වඩනා ලද උපෙක්ෂාචිත්ත විමුක්තිය මතුයෙහි අර්හත්‍ව චිත්තවිමුක්තිය නො පිළි විදුනා ප්‍රාඥභික්ෂුහුගේ මෙලොව්හිදී අනගැමි බව පිණිස වැටේ යි.

## 10. 5. 1. 10
## අධම්මචරියා සූත්‍රය

එ සඳ එක්තරා බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත් පසෙක හින. එකත් පසෙක හුන් එ බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයෙකින් මෙ ලොව්හි ඇතැම් සත්ත්‍ව කෙනෙක් කාබුන් මරණින් මතු අපාය සඞ්ඛ්‍යාත දුර්ගති සඞ්ඛ්‍යාත විනිපාත නම් වූ නිරයෙහි උපදනාහු නම් එ හෙතු කවර? එ ප්‍රත්‍යය කවර? යි.

බ්‍රාහ්මණය, අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යාව හෙතු කොට ගෙන මෙසේ මෙලොව් හි ඇතැම් සත්ත්‍ව කෙනෙක් කාබුන් මරණින් මතු අපාය සංඛ්‍යාත, දුර්ගති සංඛ්‍යාත, විනිපාත නම් වූ නිරයෙහි උපදනා හු ය යි.

භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයෙකින් මෙ ලොව්හි ඇතැම් සත්ත්‍ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ග ලොකයෙහි උපදනාහු නම්, ඒ හෙතු කවර? එ ප්‍රත්‍යය කවර?යි

බ්‍රාහ්මණය, මෙ ලොව්හි ඇතැම් සත්ත්‍ව කෙනෙක් මෙසේ ධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත සමචර්‍ය්‍යාව හෙතු කොට ගෙන කාබුන් මරණින් පසු සුගති නම් ස්වර්ග ලොකයෙහි උපදනාහයි.

න ඛො අහං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි. සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථාහං ඉමස්ස භොතො ගොතමස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානෙය්‍යන්ති.

තෙන හි බ්‍රාහ්මණ, සුණාහි, සාධුකං මනසි කරොහි භාසිස්සාමීති.

එවං භොති ඛො සො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

තිවිධා[1] ඛො බ්‍රාහ්මණ, කායෙන අධම්මචරියා විසමචරියා හොති. චතුබ්බිධා[2] වාචාය අධම්මචරියා විසමචරියා හොති. තිවිධා මනසා අධම්මචරියා විසමචරියා හොති.

කථඤ්ච බ්‍රාහ්මණ, තිවිධා[1] කායෙන අධම්මචරියා විසමචරියා හොති: -පෙ- එවං ඛො[3] බ්‍රාහ්මණ, තිවිධා කායෙන අධම්මචරියා විසමචරියා හොති.

කථඤ්ච බ්‍රාහ්මණ චතුබ්බිධා[2] වාචාය අධම්මචරියා විසමචරියා හොති: -පෙ- එවං ඛො[3] බ්‍රාහ්මණ, චතුබ්බිධා වාචාය අධම්මචරියා විසමචරියා හොති.

කථඤ්ච බ්‍රාහ්මණ තිවිධා[1] මනසා අධම්මචරියා විසමචරියා හොති: -පෙ- එවං ඛො[3] බ්‍රාහ්මණ, තිවිධා මනසා අධම්මචරියා විසමචරියා හොති.

එවං අධම්මචරියා විසමචරියා හෙතු ඛො බ්‍රාහ්මණ, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති.

තිවිධා[1] ඛො බ්‍රාහ්මණ, කායෙන ධම්මචරියා සමචරියා හොති. චතුබ්බිධා[2] වාචාය ධම්මචරියා සමචරියා හොති. තිවිධා මනසා ධම්මචරියා සමචරියා හොති.

1. තිවිධං. සීමු.
2. චතුබ්බිධං. සීමු.
3. එවං බ්‍රාහ්මණ, මජසං

භවත් ගෞතමයන් වහන්සේ විසින් සැකෙවින් දෙසූ මේ භාෂිත-යාගේ අර්ථය මම විස්තර විසින් නො දනිම් මැයි. භවත් ගෞතමයන් වහන්සේ විසින් සැකෙවින් දෙසන ලද මේ භාෂිතයාගේ අර්ථය යම් පරිද්දෙකින් මම විස්තර විසින් දැන ගනිම් නම්, භවත් ගෞතමයන් වහන්සේ මට එපරිද්දෙන් ධර්මය දෙසන සේක් නම් මැනැවි.

බ්‍රාහ්මණය, එසේ නම්, අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමි යි.

පින්වතුන් වහන්ස, එසේ ය යි බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී. භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළ සේක.

බ්‍රාහ්මණය, කායද්වාරයෙන් ත්‍රිවිධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යා-යෙක් වෙයි. වාග්ද්වාරයෙන් චතුර්විධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යා-යෙක් වෙයි. මනොද්වාරයෙන් ත්‍රිවිධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂම-චර්‍ය්‍යායෙක් වෙයි.

බ්‍රාහ්මණය, කායද්වාරයෙන් ත්‍රිවිධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යාව කෙසේ වේය යත්: –පෙ– බ්‍රාහ්මණය, මෙසේ කායද්වාරයෙන් ත්‍රිවිධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යාව වෙයි.

බ්‍රාහ්මණය, වාග්ද්වාරයෙන් චතුර්විධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂම-චර්‍ය්‍යාව කෙසේ වේය යත්: –පෙ– බ්‍රාහ්මණය, මෙසේ වනාහි වාග්ද්වාර-යෙන් චතුර්විධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යාව වෙයි.

බ්‍රාහ්මණය, මනොද්වාරයෙන් ත්‍රිවිධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යාව කෙසේ වේය යත්: –පෙ– බ්‍රාහ්මණය, මෙසේ වනාහි මනොද්වාරයෙන් ත්‍රිවිධ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යාව වෙයි.

බ්‍රාහ්මණය, මෙසේ අධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත විෂමචර්‍ය්‍යාව හෙතු කොට මෙලොවහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගති නම් වූ විනිපාත නම් වූ නිරයෙහි උපදනා හ.

බ්‍රාහ්මණය, කායද්වාරයෙන් ත්‍රිවිධ ධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත සමචර්‍ය්‍යා-යෙක් වෙයි. වාක්ද්වාරයෙන් චතුර්විධ ධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත සමචර්‍ය්‍යා-යෙක් වෙයි. මනොද්වාරයෙන් ත්‍රිවිධ ධර්මචර්‍ය්‍යා සංඛ්‍යාත සමචර්‍ය්‍යායෙක් වෙයි.

කථඤ්ච බ්‍රාහ්මණ, තිවිධා කායෙන ධම්මචරියා සමචරියා හොති: -පෙ- එවං ඛො බ්‍රාහ්මණ, තිවිධා කායෙන ධම්මචරියා සමචරියා හොති.

කථඤ්ච බ්‍රාහ්මණ චතුබ්බිධා වාචාය ධම්මචරියා සමචරියා හොති: -පෙ- එවං ඛො බ්‍රාහ්මණ, චතුබ්බිධා වාචාය ධම්මචරියා සම-චරියා හොති.

කථඤ්ච බ්‍රාහ්මණ තිවිධා මනසා ධම්මචරියා සමචරියා හොති: -පෙ- එවං ඛො බ්‍රාහ්මණ, තිවිධා මනසා ධම්මචරියා සමචරියා හොති.

එවං ධම්මචරියා සමචරියා හෙතු ඛො බ්‍රාහ්මණ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති ති.

අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

**කරජකායවග්ගො පඨමො.**

බ්‍රාහ්මණය, කායද්වාරයෙන් ත්‍රිවිධ ධර්මචර්‍යා සංඛ්‍යාත සමචර්‍යාව කෙසේ වේය යත්: ... බ්‍රාහ්මණය, කායද්වාරයෙන් ත්‍රිවිධ ධර්මචර්‍යා සංඛ්‍යාත සමචර්‍යාව වෙයි.

බ්‍රාහ්මණය, වාග්ද්වාරයෙන් චතුර්විධ ධර්මචර්‍යා සංඛ්‍යාත සමචර්‍යාව කෙසේ වේය යත්: ... බ්‍රාහ්මණය, වාග්ද්වාරයෙන් චතුර්විධ ධර්මචර්‍යා සංඛ්‍යාත සමචර්‍යාව මෙසේ වෙයි.

බ්‍රාහ්මණය, මනොද්වාරයෙන් ත්‍රිවිධ ධර්මචර්‍යා සංඛ්‍යාත සමචර්‍යාව කෙසේ වේය යත්: ... බ්‍රාහ්මණය, මනොද්වාරයෙන් ත්‍රිවිධ ධර්මචර්‍යා සංඛ්‍යාත සමචර්‍යාව මෙසේ වෙයි.

බ්‍රාහ්මණය, මෙසේ ධර්මචර්‍යා සංඛ්‍යාත සමචර්‍යාව හෙතු කොට ගෙන මෙසේ මෙ ලොව්හි ඇතැම් සත්ත්වයෝ කාබුන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ග ලොකයෙහි උපදනාහ යි.

පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්තය ... භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවිහිමියෙන් තෙරුවන් සරණ ගිය උවසුවකු කොට දරණසේක්වා යි.

## ප්‍රථම කරජකාය වර්‍ගය යි.

# 10. සාමඤ්ඤවග්ගො

## 10. 5. 2. 1

### පඨම සුත්තං

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි දසහි:

පාණාතිපාතී හොති, අදින්නාදායී හොති. කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුණාවාචො හොති, ඵරුසාවාචො හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති. මිච්ඡාදිට්ඨිකො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථා භතං නික්ඛිත්තො එවං සග්ගෙ කතමෙහි දසහි:

පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදනා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාද පටිවිරතො හොති, පිසුනාය වාචාය පටිවිරතො හොති, ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති. අනභිජ්ඣාලු හොති, අබ්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨිකො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ දසහි ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 10. 5. 2. 2

### දුතිය සුත්තං

වීසතියා භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි වීසතියා:

අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති. අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදනෙ සමාදපෙති.

# 10. සාමඤ්ඤවර්ගය

## 10. 5. 2. 1

## පළමුවැනි සූත්‍රය

මහණෙනි, දස ධර්මයෙකින් සමන්වාගත වූයේ ගෙනෙන ලදුවක් බහා තැබූයේ යම් සේ ද එසේ නිරයෙහි වෙයි. කවර දසයෙකින යත්:

පණිවා කරනුයේ වෙයි. නුදුන්දෑ ගන්නා සුලුයේ වෙයි, කාමයන්හි මිස හසර ඇතියේ වෙයි. මුසවා බණන සුලුයේ වෙයි. පිසුනු බස් ඇතියේ වෙයි. පරොස් බස් ඇතියේ වෙයි. සම්ඵප්‍රලාප ඇතියේ වෙයි. අභිධ්‍යාලු වෙයි. ව්‍යාපාදයට පත් සිතැතියේ වෙයි. මිසදිටු ඇතියේ වෙයි. මහණෙනි, මේ දස ධර්මයෙන් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබූයේ යම් සේ වේ නම් එසේ නිරයෙහි වෙයි.

මහණෙනි, දස ධර්මයෙකින් සමන්වාගත වූයේ ගෙන එන ලද්දක් බහා තැබූයේ යම් සේ වේ නම්, එසේ සවර්ගයෙහි වෙයි. කවර දස-යෙකින යත්:

පණිවායෙන් වැළැකියේ වෙයි. අයිනාදනින් වැළැකියේ වෙයි. කාමයන්හි මිසහසරින් වැළැකියේ වෙයි. මුසවායෙන් වැළැකියේ වෙයි. පිසුනු බසින් වැළැකියේ වෙයි. පරොස් බසින් වැළැකියේ වෙයි. සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. අනභිධ්‍යාලු වෙයි. අව්‍යාපාදයට පත් සිතැතියේ වෙයි. සම්දිටු ඇතියේ වෙයි. මහණෙනි, මෙ දස ධර්මයෙන් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබූයේ යම් සේ වේ නම් එසේ සවර්ගයෙහි වෙයි.

## 10. 5. 2. 2

## දෙවැනි සූත්‍රය

මහණෙනි, විසි කරුණෙකින් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබූයේ යම් සේ වෙ නම්, එසේ නිරයෙහි වෙයි. කවර විස්සෙකින යත්:

තෙමේ ද ප්‍රාණඝාතී වෙයි මෙරමා ද ප්‍රාණඝාතයෙහි සමාදන් කරවයි. තෙමේ ද නුදුන්දෑ ගන්නා සුලුයේ වෙයි. මෙරමා ද අයිනාදන්හි සමාදන් කරවයි.

අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති. අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති. අත්තනා ච පිසුනවාචො හොති, පරඤ්ච පිසුනාය වාචාය සමාදපෙති. අත්තනා ච ඵරුසාවාචො හොති, පරඤ්ච ඵරුසාය වාචාය සමාදපෙති. අත්තනා ච සම්ඵප්පලාපී හොති, පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති. අත්තනා ච අභිජ්ඣාලූ හොති, පරඤ්ච අභිජ්ඣාය සමාදපෙති. අත්තනා ච ව්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච ව්‍යාපාදෙ සමාදපෙති. අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති. ඉමෙහි ඛො භික්ඛවෙ වීසතියා ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

වීසතියා භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ, කතමෙහි වීසතියා,

අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති. අත්තනා ච මුසාවාද පටිවිරතො හොති, පරඤ්ච මුසාවාද වෙරමණියා සමාදපෙති. අත්තනා ච පිසුනාය වාචාය පටිවිරතො හොති, පරඤ්ච පිසුනාය වාචාය වෙරමණියා සමාදපෙති. අත්තනා ච ඵරුසාය වාචාය පටිවිරතො හොති, පරඤ්ච ඵරුසාය වාචාය වෙරමණියා සමාදපෙති. අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති. අත්තනා ච අනභිජ්ඣාලූ හොති, පරඤ්ච අනභිජ්ඣාය සමාදපෙති. අත්තනා ච අබ්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච අබ්‍යාපාදෙ සමාදපෙති. අත්තනා ච සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති.

ඉමෙහි ඛො භික්ඛවෙ වීසතියා ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

තෙමේ ද කාමයන්හි මිසහසර ඇතියේ වෙයි. මෙරමා ද කාම-යන්හි මිස හසරයෙහි සමාදන් කරවයි. තෙමේ ද මුසවා ඇතියේ වෙයි. මෙරමා ද මුසවායෙහි සමාදන් කරවයි. තෙමේ ද පිසුනු බස් ඇතියේ වෙයි. මෙරමා ද පිසුනු බස්හි සමාදන් කරවයි. තෙමේ ද පරොස් බස් ඇතියේ වෙයි. මෙරමා ද පරොස් බස්හි සමාදන් කරවයි. තෙමේ ද සම්ඵප්‍රලාප ඇතියේ වෙයි. මෙරමා ද සම්ඵප්‍රලාපයෙහි සමාදන් කරවයි. තෙමේ ද අභිධ්‍යාලු වෙයි. මෙරමා ද අභිධ්‍යායෙහි සමාදන් කරවයි. තෙමේ ද ව්‍යාපාදයට පත් සිතැතියේ වෙයි. මෙරමා ද ව්‍යාපාදයෙහි සමාදන් කරවයි. තෙමේ ද මිථ්‍යා දෘෂ්ටික වෙයි. මෙරමා ද මිථ්‍යාදෘෂ්ටි-යෙහි සමාදන් කරවයි. මහණෙනි, මෙ විසි කරුණින් සමන්වාගත වූයේ ගෙන එන ලද්දක් බහා තැබුයේ යම් සේ නම්, එසේ නිරයෙහි වෙයි.

මහණෙනි, විසි කරුණෙකින් සමන්වාගත වූයේ ගෙන එන ලද්දක් බහා තැබුයේ යම් සේ වේ නම්, එසේ සවර්ගයෙහි වෙයි. කවර විස්සෙකින යත්:

තෙමේ ද පණිවායෙන් වැළැකියේ වෙයි. මෙරමා ද පණිවායෙන් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ද අයිනාදනින් වැළැකියේ වෙයි. මෙරමා ද අයිනාදනින් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ද කාම-යන්හි මිස හසරින් වැළැකියේ වෙයි. මෙරමා ද කාමයන්හි මිස හසරින් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ද මුසවායෙන් වැළකියේ වෙයි. මෙරමා ද මුසවායෙන් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ද පිසුනු බසින් වැළැකියේ වෙයි. මෙරමා ද පිසුනු බසින් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ද පරොස් බසින් වැළැකියේ වෙයි. මෙරමා ද පරොස් බසින් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ද සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. මෙරමා ද සම්ඵප්‍රලාපයෙන් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ද අනභිධ්‍යාලු වෙයි. මෙරමා ද අනභිධ්‍යායෙහි සමාදන් කරවයි. තෙමේ ද අව්‍යාපාදයට පත් සිතැතියේ වෙයි. මෙරමා ද අව්‍යා-පාදයෙහි සමාදන් කරවයි. තෙමේ ද සම්‍යක්දෘෂ්ටික වෙයි. මෙරමා ද සම්‍යක්දෘෂ්ටියෙහි සමාදන් කරවයි.

මහණෙනි, මේ විසි කරුණින් සමන්වාගත වූයේ ගෙන එන ලද්දක් බහා තැබුයේ යම් සේ නම් එසේ සවර්ගයෙහි වෙයි.

## 10. 5. 2. 3

## තතිය සුත්තං

තිංසාය භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි තිංසාය:

අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති, පාණාතිපාතෙ ච සමනුඤ්ඤො හොති. අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති, අදින්නාදානෙ ච සමනුඤ්ඤො හොති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති, කාමෙසු මිච්ඡාචාරෙ ච සමනුඤ්ඤො හොති. අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති, මුසාවාදෙ ච සමනුඤ්ඤො හොති. අත්තනා ච පිසුනවාචො හොති පරඤ්ච පිසුනාය වාචාය සමාදපෙති. පිසුනාය වාචාය ච සමනුඤ්ඤො හොති, අත්තනා ච ඵරුසවාචො හොති, පරඤ්ච ඵරුසාය වාචාය සමාදපෙති, ඵරුසාය වාචාය ච සමනුඤ්ඤො හොති, අත්තනා ච සම්ඵප්පලාපී හොති, පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති, සම්ඵප්පලාපෙ ච සමනුඤ්ඤො හොති. අත්තනා ච අභිජ්ඣාලූ හොති, පරඤ්ච අභිජ්ඣාය සමාදපෙති, අභිජ්ඣාය ච සමනුඤ්ඤා හොති. අත්තනා ච ව්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච ව්‍යාපාදෙ සමාදපෙති, ව්‍යාපාදෙ ච සමනුඤ්ඤා හොති. අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති, මිච්ඡාදිට්ඨියා ච සමනුඤ්ඤා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තිංසාය ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති.

තිංසාය භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි තිංසාය:

අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. පාණාතිපාතා වෙරමණියා ච සමනුඤ්ඤො හොති. අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති, අදින්නාදානා වෙරමණියා ච සමනුඤ්ඤා හොති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ච සමනුඤ්ඤො හොති.

## 10. 5. 2. 3

## තුන්වැනි සූත්‍රය

මහණෙනි, තිස් කරුණෙකින් සමන්වාගත වූයේ ගෙන එන ලද්දක් බහා තැබුයේ යම් සේ නම් එසේ නිරයෙහි වෙයි: කවර තිසෙකින යත්:

තෙමේ ද ප්‍රාණඝාති වෙයි. මෙරමා ද ප්‍රාණඝාතයෙහි සමාදන් කරවයි. ප්‍රාණඝාතයෙහි සමසිතැතියේ වෙයි. තෙමේ ද අදින්නාදායී වෙයි. මෙරමා ද අයිනාදන්හි සමාදන් කරවයි. අයිනාදන්හි සම සිතැතියේ ද වෙයි. තෙමේ ද කාමයන්හි මිථ්‍යාචාරී වෙයි. මෙරමා ද කාමයන්හි මිස හසරෙහි සමාදන් කරවයි. කාමමිථ්‍යාචාරයෙහි සමසිතැතියේ වෙයි. තෙමේ ද මුසවා කියන සුලු වෙයි. මෙරමා ද මුසවායෙහි සමාදන් කරවයි. මුසවා යෙහි සම සිතැතියේ ද වෙයි. තෙමේ පිසුනු බසැතියේ ද වෙයි. මෙරමාද පිසුනුයෙහි සමාදන් කරවයි. පිසුනු බස්හි සමනුඥ වෙයි. තෙමේ පරොස් බසැතියේ ද වෙයි. මෙරමා ද පරොස්බස්හි සමාදන් කරවයි. පරොස් බස්හි තෙමේ සමනුඥ ද වෙයි. තෙමේ සම්ඵප්‍රලාප කියනුයේ ද වෙයි. මෙරමා ද සම්ඵප්‍රලාපයෙහි සමාදන් කරවයි. සම්ඵප්‍රලාපයෙහි සමනුඥ ද වෙයි. තෙමේ අභිධ්‍යාලු ද වෙයි. මෙරමා ද අභිධ්‍යායෙහි සමාදන් කරවයි. අභිධ්‍යායෙහි සමනුඥ ද වෙයි. තෙමේ ව්‍යාපාදයට පත් සිතැතියේ ද වෙයි. මෙරමා ද ව්‍යාපාදයෙහි සමාදන් කරවයි. ව්‍යාපාදයෙහි සමනුඥ ද වෙයි. තෙමේ මිථ්‍යාදෘෂ්ටික ද වෙයි. මෙරමා ද මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයි. මිථ්‍යාදෘෂ්ටියෙහි සමනුඥ ද වෙයි. මහණෙනි, මෙ තිස් දහමින් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබුයේ යම් පරිදි වේ නම්, එසේ නිරයෙහි වෙයි.

මහණෙනි, තිස් කරුණෙකින් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබූයේ යම් පරිදි වේ නම් එ පරිදි ස්වර්ගයෙහි වෙයි. කවර තිස් කරුණෙකින යත්:

තෙමේ ද ප්‍රාණඝාතයෙන් වැළැකියේ වෙයි. මෙරමා ද ප්‍රාණඝාත-යෙන් වැළකීමෙහි සමාදන් කරවයි. ප්‍රාණඝාත විරතියෙහි සමනුඥ ද වෙයි. තෙමේ අයිනාදනින් වැළකියේ ද වෙයි. මෙරමා ද අයිනාදනින් වැළකීමෙහි සමාදන් කරවයි. අයිනාදනින් වැළකීමෙහි සමනුඥ ද වෙයි. තෙමේ කාමමිථ්‍යාචාරයෙන් වැළකියේ වෙයි. මෙරමා ද කාමමිථ්‍යා-චාරයෙන් වැළැකීමෙහි සමාදන් කරවයි. කාමමිථ්‍යාචාර විරතියෙහි සමනුඥ ද වෙයි.

අත්තනා ච මුසාවාදා පටිවිරතො හොති, පරඤ්ච මුසාවාද වෙරමණියා සමාදපෙති, මුසාවාද වෙරමණියා ච සමනුඤ්ඤො හොති. අත්තනා ච පිසුනාය වාචාය පටිවිරතො හොති, පරඤ්ච පිසුනාය වාචාය වෙරමණියා සමාදපෙති, පිසුනාය වාචාය වෙරමණියා ච සමනුඤ්ඤො හොති. අත්තනා ච ඵරුසාය වාචාය පටිවිරතො හොති, පරඤ්ච ඵරුසාය වාචාය වෙරමණියා සමාදපෙති, ඵරුසාය වාචාය වෙරමණියා ච සමනුඤ්ඤො හොති. අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති. පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති. සම්ඵප්පලාපා වෙරමණියා ච සමනුඤ්ඤො හොති. අත්තනා ච අනභිජ්ඣාලු හොති, පරඤ්ච අනභිජ්ඣාය සමාදපෙති, අනභිජ්ඣාය ච සමනුඤ්ඤො හොති. අත්තනා ච අබ්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච අව්‍යාපාදෙ සමාදපෙති, අව්‍යාපාදෙ ච සමනුඤ්ඤො හොති. අත්තනා ච සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති, සම්මාදිට්ඨියා ච සමනුඤ්ඤො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ තිංසාය ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 10. 5. 2. 4

## චතුත්ථ සුත්තං

චත්තාරීසාය භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි චත්තාරීසාය:

අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති. පාණාතිපාතෙ ච සමනුඤ්ඤො හොති, පාණාතිපාතස්ස ච වණ්ණං භාසති. අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති, අදින්නාදානෙ ච සමනුඤ්ඤො හොති, අදින්නාදානස්ස ච වණ්ණං භාසති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති. පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති. කාමෙසු මිච්ඡාචාරෙ ච සමනුඤ්ඤො හොති, කාමෙසු මිච්ඡාචාරස්ස ච වණ්ණං භාසති.

අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති, මුසාවාදෙ ච සමනුඤ්ඤො හොති. මුසාවාදස්ස ච වණ්ණං භාසති. අත්තනා ච පිසුනවාචො හොති, පරඤ්ච පිසුනාය වාචාය සමාදපෙති, පිසුනාය වාචාය සමනුඤ්ඤො හොති, පිසුනාය ච වාචාය වණ්ණං භාසති,

තෙමේ ද මුසවායෙන් වැළකියේ වෙයි. මෙරමා ද මෘෂාවාද විරතියෙහි සමාදන් කරවයි. මෘෂාවාද විරතියෙහි සමනුඥ ද වෙයි. තෙමේ ද පිසුනු බසින් වැළැකියේ වෙයි. මෙරමා ද පිසුනු බසින් වැළැකීමෙහි සමාදන් කරවයි. පිසුන වචන විරතියෙහි සමනුඥ ද වෙයි. තෙමේ ද පරුෂ වචනයෙන් වැළකියේ වෙයි. මෙරමා ද පරුෂවචනවිරතියෙහි සමාදන් කරවයි. පරුෂ වචන විරතියෙහි සමනුඥ ද වෙයි. තෙමේ ද සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. මෙරමා ද සම්ඵප්‍රලාපවිරතියෙහි සමාදන් කරවයි. සම්ඵප්‍රලාපවිරතියෙහි සමනුඥ ද වෙයි. තෙමේ ද අනභිධ්‍යාලු වෙයි. මෙරමා ද අනභිධ්‍යායෙහි සමාදන් කරවයි. අනභිධ්‍යායෙහි සමනුඥ ද වෙයි. තෙමේ ද අව්‍යාපන්නචිත්ත වෙයි. මෙරමා ද අව්‍යාපාදයෙහි සමාදන් කරවයි. අව්‍යාපාදයෙහි සමනුඥ ද වෙයි. තෙමේ ද සම්‍යග්දෘෂ්ටික වෙයි. මෙරමා ද සම්‍යග්දෘෂ්ටියෙහි සමාදන් කරවයි. සම්‍යග්දෘෂ්ටියෙහි සමනුඥ ද වෙයි. මහණෙනි, මේ තිස් කරුණින් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබුයේ යම් සේ ද එ පරිදි ස්වර්ගයෙහි වෙයි.

## 10. 5. 2. 4

## සතරවැනි සූත්‍රය

මහණෙනි, ධර්ම සතළිසෙකින් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබූයේ යම් සේ නම් එසේ නිරයෙහි වෙයි. කවර සතළිසෙකින යත්:

තෙමේ ද ප්‍රාණඝාතී වෙයි. මෙරමා ද ප්‍රාණඝාතයෙහි සමාදන් කරවයි. ප්‍රාණඝාතයෙහි සමනුඥ ද වෙයි. ප්‍රාණඝාතයාගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද අයිනාදන් ගන්නාසුලු වෙයි. මෙරමා ද අයිනාදන්හි සමාදන් කරවයි. අයිනාදන්හි සමනුඥ ද වෙයි. අයිනාදන්හි ගුණ ද බෙණෙයි. තෙමේ ද කාමමිථ්‍යාචාරී වෙයි. මෙරමා ද කාමමිථ්‍යා-චාරයෙහි සමාදන් කරවයි. කාමමිථ්‍යාචාරයෙහි සමනුඥ ද වෙයි. කාමමිථ්‍යාචාරයාගේ ගුණ ද බෙණෙයි.

තෙමේ ද මුසවා කියනසුලු වෙයි. මෙරමා ද මුසවායෙහි සමාදන් කරවයි. මුසවායෙහි සමනුඥ ද වෙයි. මුසවාහි ගුණ ද බෙණෙයි. තෙමේ ද පිසුනුබසැතියේ වෙයි, මෙරමා ද පිසුනුබස්හි සමාදන් කරවයි. පිසුනුබස්හි සමනුඥ ද වෙයි. පිසුනුබස්හුගේ ගුණ ද බෙණෙයි,

අත්තනා ච ඵරුසවාචො හොති, පරඤ්ච ඵරුසාය වාචාය සමාදපෙති, ඵරුසාය වාචාය ච සමනුඤ්ඤො හොති. ඵරුසාය ච වාචාය වණ්ණං භාසති. අත්තනා ච සම්ඵප්පලාපී හොති, පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති, සම්ඵප්පලාපෙ ච සමනුඤ්ඤො හොති, සම්ඵප්පලාපස්ස ච වණ්ණං භාසති. අත්තනා ච අභිජ්ඣාලු හොති, පරඤ්ච අභිජ්ඣාය සමාදපෙති, අභිජ්ඣාය ච සමනුඤ්ඤො හොති, අභිජ්ඣාය ච වණ්ණං භාසති. අත්තනා ච ව්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච ව්‍යාපාදෙ සමාදපෙති, ව්‍යාපාදෙ සමනුඤ්ඤො හොති, ව්‍යාපාදස්ස ච වණ්ණං භාසති. අත්තනා ච මිච්ඡාදිට්ඨිකො හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති. මිච්ඡාදිට්ඨියා ච සමනුඤ්ඤො හොති, මිච්ඡාදිට්ඨියා ච වණ්ණං භාසති. ඉමෙහි ඛො භික්ඛවෙ චත්තාරීසාය ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

චත්තාරීසාය භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ, කතමෙහි චත්තාරීසාය:

අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති, පාණාතිපාතා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, පාණාතිපාතා වෙරමණියා ච වණ්ණං භාසති. අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති, අදින්නාදානා වෙරමණියා ච සමනුඤ්ඤො හොති, අදින්නාදානා වෙරමණියා ච වණ්ණං භාසති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති. කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ච සමනුඤ්ඤො හොති. කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ච වණ්ණං භාසති.

අත්තනා ච මුසාවාද පටිවිරතො හොති, පරඤ්ච මුසාවාද වෙරමණියා සමාදපෙති, මුසාවාද වෙරමණියා ච සමනුඤ්ඤො හොති, මුසාවාදවෙරමණියා ච වණ්ණං භාසති. අත්තනා ච පිසුනාය වාචාය පටිවිරතො හොති, පරඤ්ච පිසුනාය වාචාය වෙරමණියා සමාදපෙති, පිසුනාය වාචාය වෙරමණියා ච සමනුඤ්ඤො හොති, පිසුනාය වාචාය වෙරමණියා ච වණ්ණං භාසති. අත්තනා ච ඵරුසාය වාචාය පටිවිරතො හොති, පරඤ්ච ඵරුසාය වාචාය වෙරමණියා සමාදපෙති, ඵරුසාය වාචාය වෙරමණියා ච සමනුඤ්ඤො හොති. ඵරුසාය වාචාය වෙරමණියා ච වණ්ණං භාසති,

තෙමේ ද පරොස් බස් ඇතියේ වෙයි. මෙරමා ද පරොස්බස්හි සමාදන් කරවයි, පරොස්බස්හි සමනුඥ ද වෙයි. පරොස්බස්හු ගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද සම්ඵප්‍රලාප ඇතියේ වෙයි, මෙරමා ද සම්ඵප්‍රලාපයෙහි සමාදන් කරවයි, සම්ඵප්‍රලාපයෙහි සමනුඥ ද වෙයි. සම්ඵප්‍රලාපයාගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද අභිධ්‍යාලු වෙයි, මෙරමා ද අභිධ්‍යායෙහි සමාදන් කරවයි. අභිධ්‍යායෙහි සමනුඥ ද වෙයි. අභිධ්‍යාව ගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද ව්‍යාපන්නචිත්ත වෙයි. මෙරමා ද ව්‍යාපාදයෙහි සමාදන් කරවයි, ව්‍යාපාදයෙහි සමනුඥ ද වෙයි. ව්‍යාපාදයාගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද මිථ්‍යාදෘෂ්ටික වෙයි. මෙරමා ද මිථ්‍යාදෘෂ්ටියෙහි සමාදන් කරවයි. මිථ්‍යාදෘෂ්ටියෙහි සමනුඥ ද වෙයි, මිථ්‍යාදෘෂ්ටිහුගේ ගුණ ද බෙණෙයි. මහණෙනි, මෙ සතළිස් කරුණින් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබූයේ යම් සේ නම්, එසේ නිරයෙහි වෙයි.

මහණෙනි, සතළිස් කරුණෙකින් සමන්වාගත වූයේ ගෙනෙන ලද්දක් බහා තැබූයේ යම් සේ වේ නම් එසේ සවර්ගයෙහි වෙයි. කවර සතළිසෙකින යත්;

තෙමේ ද ප්‍රාණඝාතයෙන් වැළැකියේ වෙයි. මෙරමා ද ප්‍රාණඝාතවිරමණයෙහි සමාදන් කරවයි. ප්‍රාණඝාතවිරමණයෙහි සමනුඥ ද වෙයි. ප්‍රාණඝාතවිරමණයාගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද අයිනාදනින් වැළැකියේ වෙයි. මෙරමා ද අයිනාදනින් විරමණයෙහි සමාදන් කරවයි, අදින්නාදන විරමණයෙහි සමනුඥ ද වෙයි. තෙමේ ද කාමමිථ්‍යාචාරයෙන් වැළකියේ වෙයි. මෙරමා ද කාමමිථ්‍යාචාර විරමණයෙහි සමාදන් කරවයි. කාමමිථ්‍යාචාරවිරමණයෙහි සමනුඥ ද වෙයි. කාමමිථ්‍යාචාර විරමණයාගේ ගුණ ද බෙණෙයි.

තෙමේ ද මුසවායෙන් වැළැකියේ වෙයි. මෙරමා ද මුසවායෙන් විරමණයෙහි සමාදන් කරවයි, මුසාවාදවිරමණයෙහි සමනුඥ ද වෙයි. මෘෂාවාදවිරමණයාගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද පිසුනු බසින් වැළැකියේ වෙයි, මෙරමා ද පිසුනු බසින් වැළකීමෙහි සමාදන් කරවයි. පිසුනු බසින් විරමණයෙහි සමනුඥ ද වෙයි. පිසුනු බසින් විරමණයාගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද පරුෂවචනයෙන් වැළැකියේ වෙයි, මෙරමා ද පරොස්බසින් වැළැකීමෙහි සමාදන් කරවයි. පරුෂවචනවිරමණයෙහි සමනුඥ ද වෙයි. පරුෂවචනවිරතිහුගේ ගුණ ද බෙණෙයි.

අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති, පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති. සම්ඵප්පලාපා වෙරමණියා ච සමනුඤ්ඤො හොති. සම්ඵප්පලාපා ච වෙරමණියා වණ්ණං භාසති. අත්තනා ච අනභිජ්ඣාලු හොති, පරඤ්ච අනභිජ්ඣාය සමාදපෙති. අනභිජ්ඣාය ච සමනුඤ්ඤො හොති, අනභිජ්ඣාය ච වණ්ණං භාසති. අත්තනා ච අව්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච අව්‍යාපාදෙ සමාදපෙති, අව්‍යාපාදෙ ච සමනුඤ්ඤො හොති, අව්‍යාපාදස්ස ච වණ්ණං භාසති. අත්තනා ච සම්මාදිට්ඨිකො හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති, සම්මාදිට්ඨියා ච සමනුඤ්ඤො හොති, සම්මාදිට්ඨියා ච වණ්ණං භාසති, ඉමෙහි ඛො භික්ඛවෙ චත්තාරීසාය ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

## 10. 5. 2. 5

### පඤ්චමාදි සුත්තානි

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඛතං උපහතං අත්තානං පරිහරති -පෙ- අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති -පෙ-

## 10. 5. 2. 6

වීසතියා භික්ඛවෙ -පෙ-

## 10. 5. 2. 7

තිංසාය භික්ඛවෙ -පෙ-

## 10. 5. 2. 8

චත්තාරීසාය භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඛතං උපහතං අත්තානං පරිහරති -පෙ- අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති.

තෙමේ ද සම්ඵප්‍රලාපයෙන් වැළැකියේ වෙයි. මෙරමා ද සම්ඵප්‍රලාප විරමණයෙහි සමාදන් කරවයි. සම්ඵප්‍රලාපවිරමණයෙහි සමනුඥ ද වෙයි. සම්ඵප්‍රලාපවිරමණයාගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද අනභිධ්‍යාලු වෙයි, මෙරමා ද අනභිධ්‍යායෙහි සමාදන් කරවයි. අනභිධ්‍යායෙහි සමනුඥ ද වෙයි. අනභිධ්‍යාවගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද අව්‍යාපන්න චිත්ත වෙයි, මෙරමා ද, අව්‍යාපාදයෙහි සමාදන් කරවයි, අව්‍යාපාදයෙහි සමනුඥ ද වෙයි. අව්‍යාපාදයාගේ ගුණ ද බෙණෙයි. තෙමේ ද සම්‍යග්දෘෂ්ටික වෙයි. මෙරමා ද සම්‍යග්දෘෂ්ටියෙහි සමාදන් කරවයි. සම්‍යග්දෘෂ්ටියෙහි සමනුඥ ද වෙයි. සම්‍යග්දෘෂ්ටියගේ ගුණ ද බෙණෙයි. මහණෙනි, මෙ සතළිස් කරුණින් සමන්වාගත වූයේ ගෙනෙන ලද්ද බහා තැබුයේ යම් සේ ද එසේ ස්වර්ගයෙහි වෙයි.

## 10. 5. 2. 5

### පඤ්චමාදි සූත්‍රය

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත වූයේ සාරාලූ ගුණ ඇති නටගුණ ඇති ආත්ම පරිහරණය කරයි. ... ගුණ විසින් සාරා නො දමූ නොනට ගුණ ඇති ආත්ම පරිහරණ කරයි. ...

## 10. 5. 2. 6

මහණෙනි, විසි කරුණෙකින් ...

## 10. 5. 2. 7

මහණෙනි, තිස් කරුණෙකින් ...

## 10. 5. 2. 8

මහණෙනි; සතළිස් කරුණෙකින් සමන්වාගත වූයේ සාරාලූ ගුණ ඇති නටගුණ ඇති ආත්ම පරිහරණය කරයි. ... නොදමුණු ගුණ ඇති නොනට ගුණ ඇති ආත්ම පරිහරණය කරයි.

### 10. 5. 2. 9

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඉධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. -පෙ- ඉධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

### 10. 5. 2. 10

වීසතියා භික්ඛවෙ -පෙ-

### 10. 5. 2. 11

තිංසාය භික්ඛවෙ -පෙ-

### 10. 5. 2. 12

චත්තාරීසාය භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඉධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති - පෙ - ඉධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

### 10. 5. 2. 13

දසහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො -පෙ- පණ්ඩිතො වෙදිතබ්බො -පෙ-

### 10. 5. 2. 14

වීසතියා භික්ඛවෙ -පෙ-

### 10. 5. 2. 15

තිංසාය භික්ඛවෙ -පෙ-

### 10. 5. 2. 16

චත්තාරීසාය භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො -පෙ- පණ්ඩිතො වෙදිතබ්බො. -පෙ- ඉමෙහි ඛො භික්ඛවෙ චත්තාරීසාය ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බොති.

සාමඤ්ඤ වග්ගො දුතියො.

## 10. 5. 2. 9

මහණෙනි, මෙලොව්හි දස කරුණෙකින් සමන්වාගත වූ ඇතැමෙක් කාබුන් මරණින් මතු අපාය නම් වූ දුගීති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණේ. ... මෙලොව්හි ඇතැමෙක් කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ගලොකයට එළඹෙයි.

## 10. 5. 2. 10

මහණෙනි, විසි කරුණෙකින් ...

## 10. 5. 2. 11

මහණෙනි, තිස් කරුණෙකින් ...

## 10. 5. 2. 12

මහණෙනි, මෙලොව්හි සතළිස් කරුණෙකින් සමන්වාගත වූ ඇතැමෙක් කාබුන් මරණින් මතු අපාය සඞ්ඛ්‍යාත, දුගීති සඞ්ඛ්‍යාත, විනිපාත සඞ්ඛ්‍යාත නිරයට පැමිණේ. ... මෙලොව්හි ඇතැමෙක් කාබුන් මරණින් මතු සුගති සඞ්ඛ්‍යාත ස්වර්ගලොකයට පැමිණේ.

## 10. 5. 2. 13

මහණෙනි, දස කරුණෙකින් සමන්වාගත බාල තෙමේ දත යුත්තේය: ... පණ්ඩිත තෙම දතයුත්තේ ...

## 10. 5. 2. 14

මහණෙනි, විසිකරුණෙකින් ...

## 10. 5. 2. 15

මහණෙනි, තිස් කරුණෙකින් ...

## 10. 5. 2. 16

මහණෙනි, සතළිස් කරුණෙකින් සමන්වාගත වූ බාලතෙමෙ දත යුත්තේය -පෙ- පණ්ඩිත තෙම දත යුත්තේය. මහණෙනි, මෙ සතළිස් කරුණෙන් සමන්වාගත වූ පණ්ඩිත දතයුත්තේ ය යි.

**දෙවැනි සාමඤ්ඤ වර්ග යි.**

# රාගාදිපෙය්‍යාලං

## 10. 5. 3. 1

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය දසධම්මා භාවෙතබ්බා. කතමෙ දස: අසුභසඤ්ඤා මරණසඤ්ඤා ආහාරෙ පටික්කූලසඤ්ඤා සබ්බලොකෙ අනභිරතසඤ්ඤා අනිච්චසඤ්ඤා අනිච්චෙ දුක්ඛසඤ්ඤා දුක්ඛෙ අනත්තසඤ්ඤා පහානසඤ්ඤා විරාගසඤ්ඤා නිරොධසඤ්ඤා, රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ දසධම්මා භාවෙතබ්බා.

## 10. 5. 3. 2

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය දසධම්මා භාවෙතබ්බා: කතමෙ දස: අනිච්චසඤ්ඤා අනත්තසඤ්ඤා ආහාරෙ පටික්කූලසඤ්ඤා සබ්බලොකෙ අනභිරතසඤ්ඤා අට්ඨිකසඤ්ඤා පුළවකසඤ්ඤා[1] විනීලකසඤ්ඤා විපුබ්බකසඤ්ඤා විච්ඡිද්දකසඤ්ඤා උද්ධුමාතකසඤ්ඤා. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ දසධම්මා භාවෙතබ්බාති.

## 10. 5. 3. 3

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය දසධම්මා භාවෙතබ්බා. කතමෙ දස: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි සම්මාඤාණං සම්මාවිමුත්ති. රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ දසධම්මා භාවෙතබ්බාති.

## 10. 5. 3. 4 – 6

රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය -පෙ-

## 10. 5. 3. 7 – 9

රාගස්ස භික්ඛවෙ පරික්ඛයාය -පෙ-

## 10. 5. 3. 10 – 12

රාගස්ස භික්ඛවෙ පහානාය -පෙ-

1. පුළුවකසඤ්ඤා – මජ්සං.

# රාගාදිපෙය්‍යාලය

## 10. 5. 3. 1

මහණෙනි, රාගයාගේ අභිඥාව පිණිස දසදහම් කෙනෙක් වැඩිය යුතුවහ. කවර දස කෙනෙක යත්: අසුභසඤ්ඤා ය, මරණසඤ්ඤා ය, ආහාරයෙහි පටික්කූලසඤ්ඤා ය, සර්වලොකයෙහි අනභිරත සඤ්ඤාය, අනිච්ච සඤ්ඤා ය, අනිච්චෙ දුක්ඛ සඤ්ඤා ය, දුක්ඛෙඅනත්තසඤ්ඤා ය, පහාන සඤ්ඤා ය, විරාගසඤ්ඤා ය, නිරොධසඤ්ඤා යි. මහණෙනි, රාගයාගේ අභිඥව පිණිස මෙ දස දහම්හු වැඩිය යුතුවහ.

## 10. 5. 3. 2

මහණෙනි, රාගයාගේ අභිඥව පිණිස, දශධර්ම කෙනෙක් වැඩිය යුතුවහ, කවර දශ කෙනෙක යත්: අනිච්චසඤ්ඤා ය, අනත්තසඤ්ඤා ය, ආහාරෙ පටික්කූලසඤ්ඤා ය, සබ්බලොකෙ අනභිරත සංඥා ය, අට්ඨික සඤ්ඤා ය පුළවක සඤ්ඤාය, විනීලකසඤ්ඤා ය, විපුබ්බකසඤ්ඤාය විච්ඡිද්දකසඤ්ඤාය උද්ධුමාතකසඤ්ඤා යි, මහණෙනි, රාගයාගේ අභිඥව සඳහා මෙ දස දහම්හු වැඩිය යුතුවහ යි.

## 10. 5. 3. 3

මහණෙනි, රාගයාගේ අභිඥව සඳහා දශධර්ම කෙනෙක් වැඩිය යුතුවහ, කවර දශ කෙනෙක යත්: සම්මාදිට්ඨි ය, සම්මාසඞ්කප්ප ය, සම්මාවාචා ය, සම්මාකම්මන්ත ය, සම්මාආජීව ය, සම්මාවායාම ය, සම්මා සතිය, සම්මාසමාධි ය, සම්මාඤාණ ය, සම්මාවිමුත්ති යි, මහණෙනි, රාගයාගේ අභිඥව සඳහා මෙ දස දහම්හු වැඩිය යුතුවහයි.

## 10. 5. 3. 4 – 6

මහණෙනි, රාගයාගේ පරිඥව පිණිස, ...

## 10. 5. 3. 7 – 9

මහණෙනි, රාගයාගේ පරික්ෂය ය පිණිස ...

## 10. 5. 3. 10 – 12

මහණෙනි, රාගයාගේ ප්‍රහාණය පිණිස ...

## 10. 5. 3. 13 – 15

රාගස්ස භික්ඛවෙ ඛයාය -පෙ-

## 10. 5. 3. 16 – 18

රාගස්ස භික්ඛවෙ වයාය -පෙ-

## 10. 5. 3. 19 – 21

රාගස්ස භික්ඛවෙ විරාගාය -පෙ-

## 10. 5. 3. 22 – 24

රාගස්ස භික්ඛවෙ නිරොධාය -පෙ-

උපසමාය -පෙ- *

## 10. 5. 3. 25 – 27

රාගස්ස භික්ඛවෙ චාගාය -පෙ-

## 10. 5. 3. 28 – 30

රාගස්ස භික්ඛවෙ පටිනිස්සග්ගාය -පෙ- ඉමෙ දසධම්මා භාවෙතබ්බාති.

## 10. 5. 3. 31 – 60

දොසස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 90

මොහස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 120

කොධස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 150

උපනාහස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 180

මක්ඛස්ස භික්ඛවෙ -පෙ-

---

* ‘උපසමායා’ති පදය දසකනිපාතාදිසු රාගපෙය්‍යාලෙ අදිස්සමානත්තා අට්ඨාන පතිතන්ති මඤ්ඤෙ.

**10. 5. 3. 7**

මහණෙනි, රාගයාගේ ක්ෂය පිණිස ...

**10. 5. 3. 8**

මහණෙනි, රාගයාගේ ව්‍යය පිණිස ...

**10. 5. 3. 9**

මහණෙනි, රාගයාගේ විරාගය පිණිස ...

**10. 5. 3. 10**

මහණෙනි, රාගයාගේ නිරොධය පිණිස ...

**10. 5. 3. 12**

මහණෙනි, රාගයාගේ ත්‍යාගය පිණිස ...

**10. 5. 3. 13**

මහණෙනි, රාගයාගේ ප්‍රතිනිඃසර්ජනය පිණිස මෙ දස දහම්හු වැඩිය යුත්තාහ යි.

**10. 5. 3. 14**

මහණෙනි, ද්වෙෂයාගේ ...

**10. 5. 3. 15**

මහණෙනි, මොහයාගේ ...

**10. 5. 3. 16**

මහණෙනි, ක්‍රොධයාගේ ...

**10. 5. 3. 17**

මහණෙනි, උපනාහයාගේ ...

**10. 5. 3. 18**

මහණෙනි, මක්‍ෂයාගේ ...

## 10. 5. 3. 210

පලාසස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 240

ඉස්සාය භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 270

මච්ඡරියස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 300

මායාය භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 330

සාඨෙය්‍යස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 360

ථම්භස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 390

සාරම්භස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 420

මානස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5 3. 450

අතිමානස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 480

මදස්ස භික්ඛවෙ -පෙ-

## 10. 5. 3. 510

පමාදස්ස භික්ඛවෙ අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- උපසමාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ දසධම්මා භාවෙතබ්බාති.

රාගාදිපෙය්‍යාලං නිට්ඨිතං.

**දසකනිපාතො නිට්ඨිතො.**

## 10. 5. 3. 19

මහණෙනි, පලාසයාගේ ...

## 10. 5. 3. 20

මහණෙනි, ඊර්ෂ්‍යාවගේ ...

## 10. 5. 3. 21

මහණෙනි, මාත්සර්යයාගේ ...

## 10. 5. 3. 22

මහණෙනි, මායාවගේ ...

## 10. 5. 3. 23

මහණෙනි, සාඨෙය්‍යයාගේ ...

## 10. 5. 3. 24

මහණෙනි, ථම්භයාගේ ...

## 10. 5. 3. 25

මහණෙනි, සාරම්භයාගේ ...

## 10. 5. 3. 26

මහණෙනි, මානයාගේ ...

## 10. 5. 3. 27

මහණෙනි, අතිමානයාගේ ...

## 10. 5. 3. 28

මහණෙනි, මදයාගේ ...

## 10. 5. 3. 29

මහණෙනි, ප්‍රමාදයාගේ අභිඥනය පිණිස ... පරිඥනය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස... ව්‍යය පිණිස ... විරාගය පිණිස... නිරොධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිස්සර්ජනය පිණිස ... දස දහම්හු වැඩිය යුත්තාහ යි.

**රාගාදිපෙය්‍යාලය නිමි.**

**දසක නිපාතය නිමියේ ය.**

# එකාදසකො නිපාතො

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## 1. නිස්සයවග්ගො

### 11. 1. 1.

### කිමත්ථිය සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

කිමත්ථියානි භන්තෙ කුසලානි සීලානි කිමානිසංසානීති. අවිප්පටි-සාරත්ථානි ඛො ආනන්ද කුසලානි සීලානි අවිප්පටිසාරානිසංසානීති.

අවිප්පටිසාරො පන භන්තෙ කිමත්ථියො කිමානිසංසොති? අවිප්පටි-සාරො ඛො ආනන්ද පාමොජ්ජත්ථො[1] පාමොජ්ජානිසංසො.

පාමොජ්ජං[1] පන භන්තෙ කිමත්ථියං කිමානිසංසන්ති: පාමොජ්ජං ඛො ආනන්ද පීතත්ථං පීතානිසංසං.

පීති පන භන්තෙ කිමත්ථියා කිමානිසංසාති. පීති ඛො ආනන්ද පස්සද්ධත්ථා පස්සද්ධානිසංසා.

පස්සද්ධි පන භන්තෙ කිමත්ථියා කිමානිසංසාති? පස්සද්ධි ඛො ආනන්ද සුඛත්ථා සුඛානිසංසා.

සුඛං පන භන්තෙ කිමත්ථියං කිමානිසංසන්ති? සුඛං ඛො ආනන්ද සමාධත්ථං සමාධානිසංසං.

---

1. පාමුජ්ජත්ථො පාමුජ්ජානිසංසො-සී.මු

# ඒකාදශ නිපාතය

## ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා

## 1. නිස්සයවග්ගීය

### 11. 1. 1

### කිමත්ථිය සූත්‍රය

මා විසින් මෙසේ අසනලදී: එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජෙතවන නම් වූ අනේපිඩු මහසිටුහුගේ අරමහි වැඩවසන සේක.

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි හුන්හ. එකත්පස්හි හුන් ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකළහ:

වහන්ස, කුශලශීලයෝ කවරක් අර්ථ කොට කවරක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, කුශලශීලයෝ අවිප්‍රතිසාරය අර්ථ කොට අවිප්‍රතිසාරය අනුසස් කොට ඇති.

වහන්ස, අවිප්‍රතිසාරය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, අවිප්‍රතිසාරය ප්‍රමොදය අර්ථ කොට ප්‍රමොදය අනුසස් කොට ඇත.

වහන්ස, ප්‍රමොදය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, ප්‍රමොදය ප්‍රීතිය අර්ථ කොට ප්‍රීතිය අනුසස් කොට ඇත.

වහන්ස, ප්‍රීතිය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිය අර්ථ කොට ප්‍රශ්‍රබ්ධිය අනුසස් කොට ඇත.

වහන්ස, ප්‍රශ්‍රබ්ධිය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත්දැයි? ආනන්දයෙනි, ප්‍රශ්‍රබ්ධිය සුඛය අර්ථ කොට සුඛය අනුසස් කොට ඇත.

වහන්ස, සුඛය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, සුඛය සමාධිය අර්ථ කොට සමාධිය අනුසස් කොට ඇත.

සමාධි පන භන්තෙ කිමත්ථො කිමානිසංසොති? සමාධි බො ආනන්ද යථාභූතඤාණදස්සනත්ථො යථාභූතඤාණදස්සනානිසංසො.

යථාභූතඤාණදස්සනං පන භන්තෙ කිමත්ථියං කිමානිසංසන්ති? යථාභූතඤාණදස්සනං බො ආනන්ද නිබ්බිදත්ථං නිබ්බිදානිසංසං.

නිබ්බිදා පන භන්තෙ කිමත්ථා කිමානිසංසාති? නිබ්බිදා බො ආනන්ද විරාගත්ථා විරාගානිසංසා.

විරාගො පන භන්තෙ කිමත්ථො කිමානිසංසොති? විරාගො බො ආනන්ද විමුත්තිඤාණදස්සනත්ථො විමුත්තිඤාණදස්සනානිසංසොති.

ඉති බො ආනන්ද කුසලානි සීලානි අවිප්පටිසාරත්ථානි, අවිප්පටිසාරානිසංසානි. අවිප්පටිසාරො පාමොජ්ජත්ථො පාමොජ්ජානිසංසො. පාමොජ්ජං පීතත්ථං පීතානිසංසං. පීති පස්සද්ධත්ථා පස්සද්ධානිසංසා. පස්සද්ධි සුඛත්ථා සුඛානිසංසා. සුඛං සමාධත්ථං සමාධානිසංසං. සමාධි යථාභූතඤාණදස්සනත්ථො යථාභූතඤාණදස්සනානිසංසො. යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථං නිබ්බිදානිසංසං, නිබ්බිදා විරාගත්ථා විරාගානිසංසා, විරාගො විමුත්තිඤාණදස්සනත්ථො විමුත්තිඤාණදස්සනානිසංසො. ඉති බො ආනන්ද කුසලානි සීලානි අනුපුබ්බෙන අග්ගාය පරෙන්තීති.

## 11. 1. 2.

## න චෙතනාකරණීය සුත්තං

සීලවතො භික්ඛවෙ, සීලසම්පන්නස්ස න චෙතනාය කරණීයං 'අවිප්පටිසාරො මෙ උප්පජ්ජතූ'ති. ධම්මතා බො එසා භික්ඛවෙ යං සීලවතො සීලසම්පන්නස්ස අවිප්පටිසාරො උප්පජ්ජති.

අවිප්පටිසාරිස්ස[1] භික්ඛවෙ න චෙතනාය කරණීයං 'පාමොජ්ජං මෙ උප්පජ්ජතූ'ති. ධම්මතා එසා භික්ඛවෙ යං අවිප්පටිසාරිස්ස[1] පාමොජ්ජං උප්පජ්ජති.

1. අවිප්පටිසාරස්ස-මජ්ඣං.

වහන්ස, සමාධිය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, සමාධිය යථාභූතඥානදර්ශනය අර්ථ කොට යථාභූතඥාන. දර්ශනය අනුසස් කොට ඇත.

වහන්ස, යථාභූතඥානදර්ශනය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, යථාභූතඥානදර්ශනය නිර්වේදය අර්ථ කොට නිර්වේදය අනුසස් කොට ඇත.

වහන්ස, නිර්වේදය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, නිර්වේදය විරාගය අර්ථ කොට විරාගය අනුසස් කොට ඇතැයි.

වහන්ස, විරාගය කුමක් අර්ථ කොට කුමක් අනුසස් කොට ඇත් දැයි? ආනන්දයෙනි, විරාගය විමුක්තිඥානදර්ශනය අර්ථ කොට විමුක්ති-ඥානදර්ශනය අනුසස් කොට ඇතැයි.

ආනන්දයෙනි, මෙසේ කුශලශීලයෝ අවිප්‍රතිසාරය අර්ථ කොට අවිප්‍රතිසාරය අනුසස් කොට ඇත. අවිප්‍රතිසාරය ප්‍රමොදය අර්ථ කොට ප්‍රමොදය අනුසස් කොට ඇත. ප්‍රමොදය ප්‍රීතිය අර්ථ කොට ප්‍රීතිය අනුසස් කොට ඇත. ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිය අර්ථ කොට ප්‍රශ්‍රබ්ධිය අනුසස් කොට ඇත. ප්‍රශ්‍රබ්ධිය සුඛය අර්ථ කොට සුඛය අනුසස් කොට ඇත. සුඛය සමාධිය අර්ථ කොට සමාධිය අනුසස් කොට ඇත. සමාධිය යථාභූතඥානදර්ශනය අර්ථ කොට යථාභූතඥානදර්ශනය අනුසස් කොට ඇත. යථාභූතඥාන-දර්ශනය නිර්වේදය අර්ථ කොට නිර්වේදය අනුසස් කොට ඇත. නිර්වේදය විරාගය අර්ථ කොට විරාගය අනුසස් කොට ඇත. විරාගය විමුක්තිඥාන-දර්ශනය අර්ථ කොට විමුක්තිඥානදර්ශනය අනුසස් කොට ඇත. ආනන්දයෙනි, මෙසේ කුශලශීලයෝ අනුක්‍රමයෙන් අර්හත්ත්වය සඳහා පිරිනැමෙත් යි.

## 11. 1. 2

## න චේතනාය කරණීය සූත්‍රය

මහණෙනි, සිල්සපන් සිල්වත්හට 'මට අවිප්‍රතිසාරය උපදීවා'යි චෙතනායෙන් කර්තව්‍යයෙක් නැත. මහණෙනි, සිල්සපන් සිල්වත්හට අවිප්‍රතිසාරය උපදනේය යන, තෙල ධර්මතාහෙයිනි.

මහණෙනි, අවිප්‍රතිසාරය ඇතියහුට 'මට ප්‍රමොදය උපදීවා'යි චෙතනායෙන් කර්තව්‍යයෙක් නැත. මහණෙනි, අවිප්‍රතිසාරය ඇතියහුට ප්‍රමොදය උපදනේය යන තෙල ධර්මතා හෙයිනි.

පමුදිතස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං. 'පීති මෙ උප්පජ්ජතූ'ති ධම්මතා එසා භික්ඛවෙ යං පමුදිතස්ස පීති උප්පජ්ජති.

පීතිමනස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං 'කායො මෙ පස්සම්භතූති. ධම්මතා එසා භික්ඛවෙ පීතිමනස්ස කායො පස්සම්භති.

පස්සද්ධකායස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං 'සුඛං වෙදියාමී'ති. ධම්මතා එසා භික්ඛවෙ යං පස්සද්ධකායස්ස සුඛං උප්පජ්ජති.

සුඛිනො භික්ඛවෙ න චෙතනාය කරණීයං 'චිත්තං මෙ සමාධියතූ'ති. ධම්මතා එසා භික්ඛවෙ යං සුඛිනො චිත්තං සමාධියති.

සමාහිතස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං 'යථාභූතං[1] පජානාමි, පස්සාමී'ති. ධම්මතා එසා භික්ඛවෙ යං සමාහිතො යථාභූතං පජානාති පස්සති[1].

යථාභූතං භික්ඛවෙ ජානතො පස්සතො න චෙතනාය කරණීයං 'නිබ්බින්දාමී'ති. ධම්මතා එසා භික්ඛවෙ යං යථාභූතං ජානං පස්සං නිබ්බින්දති.

නිබ්බින්නස්ස[2] භික්ඛවෙ න චෙතනාය කරණීයං 'විරජ්ජාමී'ති ධම්මතා එසා භික්ඛවෙ යං නිබ්බින්නො[3] විරජ්ජති.

විරත්තස්ස භික්ඛවෙ න චෙතනාය කරණීයං 'විමුත්තිඤාණදස්සනං සච්ඡිකරොමී'ති. ධම්මතා එසා භික්ඛවෙ යං විරත්තො විමුත්තිඤාණදස්සනං සච්ඡිකරොති.

ඉති ඛො භික්ඛවෙ විරාගො විමුත්තිඤාණදස්සනත්ථො විමුත්තිඤාණදස්සනානිසංසො. නිබ්බිදා විරාගත්ථා විරාගානිසංසා. යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථං නිබ්බිදානිසංසං. සමාධි යථාභූතඤාණදස්සනත්ථො යථාභූතඤාණදස්සනානිසංසො. සුඛං සමාධත්ථං සමාධානිසංසං. පස්සද්ධි සුඛත්ථා සුඛානිසංසා. පීති පස්සද්ධත්ථා පස්සද්ධානිසංසා.

1. ජානාමි. ජානාති-මජසං
2. නිබ්බින්දස්ස-සීමු
3. නිබ්බින්දො-සීමු

මහණෙනි, ප්‍රමුදිතයාහට 'මට ප්‍රීතිය උපදීවා'යි චෙතනායෙන් කතිව්‍යයෙක් නැත. මහණෙනි, ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදීය යන තෙල ධර්මතා හෙයිනි.

මහණෙනි, ප්‍රීතමනස් ඇත්තාහට 'මාගේ නාමකාය සන්හිඳේවා'යි චෙතනායෙන් කටයුතු නැති. මහණෙනි, ප්‍රීතමනස්කයාගේ කය සන්-හිඳෙන්නේ ය යන තෙල ධර්මතා හෙයිනි.

මහණෙනි, සන්හුන් කය ඇතියහට 'සුඛවෙදනා විඳිනෙම්ව'යි චෙතනායෙන් කරණී නැත. මහණෙනි, සන්හුන් කය ඇතියහුට සුඛය උපදනේ ය යන තෙල ධර්මතා හෙයිනි.

මහණෙනි, සුඛ ඇතියහුට'මාගේ සිත සමාහිත වේවා යි චෙතනායෙන් කරණී නැති. මහණෙනි, සුඛ ඇතියහුගේ සිත සමාහිත වේ ය යන තෙල ධර්මතායෙක.

මහණෙනි, සමාධිගත සිත් ඇත්තාහට 'යථාභූත ව දන්මි දක්මි'යි චෙතනායෙන් කරණී නැති. මහණෙනි, සමාධිගත සිතැතියේ යථාභූත ව දන්නේ දක්නේ ය යන තෙල ධර්මතායෙක.

මහණෙනි, යථාභූත ව දන්නා දක්නාහට 'සසරට කලකිරෙමි'යි චෙතනායෙන් කරණී නැති. මහණෙනි, යථාභූත ව දන්නේ දක්නේ සසර කලකිරෙයි යන, තෙල ධර්මතායෙක.

මහණෙනි, නිර්වේදයට පැමිණියහුට 'විරාගයට පැමිණෙමි'යි චෙතනායෙන් කරණී නැති. මහණෙනි, නිර්විග්න වූයේ නො ඇලේ යන තෙල ධර්මතායෙකි.

මහණෙනි, විරක්තයාහට 'විමුක්තිඥානදර්ශනය පසක් කෙරෙමි'යි චෙතනායෙන් කරණී නැති. මහණෙනි, විරක්ත වූයේ විමුක්තිඥාන-දර්ශනය පසක් කෙරේ යන, තෙල ධර්මතායෙකි.

මහණෙනි, මෙසේ විරාගය විමුක්තිඥානදර්ශනය අර්ථ කොට ඇත. විමුක්තිඥානදර්ශනය අනුසස් කොට ඇත. නිර්වේදය විරාගය අර්ථ කොට විරාගය අනුසස් කොට ඇත. යථාභූතඥානදර්ශනය නිර්වේදය අර්ථ කොට නිර්වේදය අනුසස් කොට ඇත. සමාධිය යථාභූතඥානදර්ශනය අර්ථ කොට යථාභූතඥානදර්ශනය අනුසස් කොට ඇත. සුඛය සමාධිය අර්ථ කොට සමාධිය අනුසස් කොට ඇත. ප්‍රශ්‍රබ්ධිය සුඛය අර්ථ කොට සුඛය අනුසස් කොට ඇත. ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිය අර්ථ කොට ප්‍රශ්‍රබ්ධිය අනුසස් කොට ඇත.

පාමොජ්ජං පීතත්ථං පීතානිසංසං. අවිප්පටිසාරො පාමොජ්ජත්ථො පාමොජ්ජානිසංසො. කුසලානි සීලානි අවිප්පටිසාරත්ථානි අවිප්පටිසාරානිසංසානි.

ඉති ඛො භික්ඛවෙ ධම්මා ච ධම්මෙ[1] අභිසන්දෙන්ති. ධම්මා ච ධම්මෙ පරිපූරෙන්ති අපාරා පාරඞ්ගමනායාති.[2]

## 11. 1. 3
## පඨම උපනිස සුත්තං

දුස්සීලස්ස භික්ඛවෙ සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො, අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ අසති පාමොජ්ජවිපන්නස්ස හතූපනිසා හොති පීති. පීතියා අසති පීතිවිපන්නස්ස හතූපනිසා හොති පස්සද්ධි. පස්සද්ධියා අසති පස්සද්ධිවිපන්නස්ස හතූපනිසං හොති සුඛං. සුඛෙ අසති සුඛවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසා හොති නිබ්බිදා. නිබ්බිදාය අසති නිබ්බිදාවිපන්නස්ස හතූපනිසො හොති විරාගො. විරාගෙ අසති විරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ රුක්ඛො සාඛාපලාසවිපන්නො තස්ස පපටිකාපි න පාරිපූරිං[3] ගච්ඡති, තචොපි -පෙ- ඵෙග්ගුපි -පෙ- සාරොපි න පාරිපූරිං ගච්ඡති.

එවමෙව ඛො භික්ඛවෙ දුස්සීලස්ස සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති පාමොජ්ජං -පෙ- හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං

1. ධම්මා ධම්මෙ-මජසං.
2. අපාරාපාරංගමනායති-සීමු
3. පරිපූරිං-මජසං

ප්‍රමෝදය ප්‍රීතිය අත් කොට ප්‍රීතිය අනුසස් කොට ඇත. අවිප්‍රතිසාරය ප්‍රමෝදය අත් කොට ප්‍රමෝදය අනුසස් කොට ඇත. කුශලශීලයෝ අවිප්‍රතිසාරය අත් කොට අවිප්‍රතිසාරය අනුසස් කොට ඇත.

මහණෙනි, මෙසේ ධර්මයෝ ම ධර්මයන් පවත්වන්නාහ. ධර්මයෝ ම මෙ ත්‍රෛභූමක වර්තතීරයෙන් නිර්වාණ සඞ්ඛ්‍යාත පාරිමතීරයට යනු සඳහා ධර්මයන් ම පුරන්නාහයි.

## 11. 1. 3
## පඨම උපනිස සූත්‍රය

මහණෙනි, විපන්සිල් ඇති දුසිල්හුගේ අවිප්‍රතිසාරය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම නට අවිප්‍රතිසාර ඇත්තහුගේ ප්‍රමෝදය නට කරුණු ඇතියේ වෙයි. ප්‍රමෝදය නැතිවත් ම නට ප්‍රමෝද ඇතියහුගේ ප්‍රීති තොමෝ නට උපනිඃශ්‍රය ඇත්තී වෙයි. ප්‍රීතිය නැතිවත් ම විපන් ප්‍රීතිඇතියහුගේ ප්‍රශ්‍රබ්ධි තොමෝ නට උපනිඃශ්‍රය ඇත්තී වෙයි. ප්‍රශ්‍රබ්ධිය නැතිවත් ම විපන් ප්‍රශ්‍රබ්ධි ඇතියහුගේ සුඛය නටමුල් වෙයි. සුඛ නැතිවත් ම සුඛවිපන්නයාගේ සම්‍යක්සමාධිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සම්‍යක්සමාධිය නැතිවත් ම සම්‍යක්සමාධිවිපන්නයාගේ යථාභූතඥාන-දර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි. යථාභූතඥානදර්ශනය නැතිවත් ම විපන් යථාභූතඥානදර්ශනය ඇතියහුගේ නිර්වේදය නට උපනිඃශ්‍රය ඇති වෙයි. නිර්වේදය නැතිවත් ම විපන් නිර්වේද ඇත්තහුගේ විරාගය නට උපනිඃශ්‍රය ඇති වෙයි. විරාගය නැතිවත් ම විපන් විරාග ඇතියහුගේ විමුක්තිඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි.

මහණෙනි, යම් පරිද්දෙකින් විපන් අතුපත් ඇති වෘක්ෂයෙක් වේ නම් එ රුක්හුගේ පතුරුදු පරිපූර්ණභාවයට නො යෙයි. සිවිදු ... බොරුදු ... හර ද පරිපූර්ණභාවයට නො යෙයි.

මහණෙනි, එ පරිද්දෙන් ම විපන්සිල් ඇති දුසිල්හුගේ අවිප්‍රතිසාරය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම විපන් අවිප්‍රතිසාර ඇතියහුගේ ප්‍රමෝදය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. –පෙ– විමුක්තිඥාන-දර්ශනය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි.

සීලවතො, භික්ඛවෙ සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ සති පාමොජ්ජසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති පීති. පීතියා සති පීතිසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති පස්සද්ධි, පස්සද්ධියා සති පස්සද්ධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති සුඛං. සුඛෙ සති සුඛසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති නිබ්බිද. නිබ්බිදය සති නිබ්බිදසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති විරාගො. විරාගෙ සති විරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි භික්ඛවෙ රුක්ඛො සාඛාපලාසසම්පන්නො තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති, තචොපි -පෙ- ඵෙග්ගුපි -පෙ- සාරොපි පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ සීලවතො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො, අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති පාමොජ්ජං -පෙ- විමුත්තිඤාණදස්සනන්ති.

## 11. 1. 4

## දුතිය උපනිස සුත්තං

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි 'ආවුසො භික්ඛවො'ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

දුස්සීලස්ස ආවුසො සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ අසති පාමොජ්ජවිපන්නස්ස හතූපනිසා හොති පීති. පීතියා අසති පීතිවිපන්නස්ස හතූපනිසා හොති පස්සද්ධි. පස්සද්ධියා අසති පස්සද්ධිවිපන්නස්ස හතූපනිසං හොති සුඛං. සුඛෙ අසති සුඛවිපන්නස්ස හතූපනිසො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසා හොති නිබ්බිද, නිබ්බිදය අසති නිබ්බිදවිපන්නස්ස හතූපනිසො හොති විරාගො. විරාගෙ අසති විරාගවිපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

මහණෙනි, සිල්සපන් සිල්වත්හුගේ අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නයාගේ ප්‍රමොදය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රමොදය ඇතිවත් ම ප්‍රමොදසම්පන්නයාගේ ප්‍රීතිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රීතිය ඇතිවත් ම ප්‍රීතිසම්පන්නයාගේ ප්‍රශ්‍රබ්ධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රශ්‍රබ්ධිය ඇතිවත් ම සුඛය උපනිඃශ්‍රය සම්පන්න වෙයි. සුඛය ඇතිවත් ම සුඛසම්පන්නයාගේ සම්‍යක්සමාධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සම්‍යක්සමාධිය ඇතිවත් ම සම්‍යක්සමාධි, සම්පන්නයාගේ යථාභූත ඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. යථාභූත-ඥානදර්ශනය ඇතිවත් ම යථාභූතඥානදර්ශනසම්පන්නයාගේ නිර්වේදය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිර්වේදය ඇතිවත් ම නිර්වේදසම්පන්නයාගේ විරාගය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. විරාගය ඇතිවත් ම විරාගසම්පන්නයාගේ විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

මහණෙනි, යම් සෙයෙකින් අතුපත් සපන් වෘක්ෂයෙක් වේ නම්, එ රුක්හුගේ පතුරුදු පිරිපුන්බවට යෙයි. සිව්දු... බොරුදු ... හරදු පිරිපුන්බවට යෙයි. මහණෙනි, එසෙයින් ම සිල්සපන් සිල්වත්හුගේ අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්න-යාගේ ප්‍රමොදය ... විමුක්ති ඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

## 11. 1. 4

## දුතිය උපනිස සූත්‍රය

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ "ඇවැත්නි මහණෙනි"යි භික්ෂූන් ඇමතූහ. "ඇවැත්නි"යි එ මහණහු ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදාළහ.

ඇවැත්නි, සිල්විපන් දුසිල්හුගේ අවිප්‍රතිසාරය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම නට අවිප්‍රතිසාරය ඇතියහුගේ ප්‍රමොදය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. ප්‍රමොදය නැතිවත් ම ප්‍රමොදවිපන්නයාගේ ප්‍රීතිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. ප්‍රීතිය නැතිවත් ම ප්‍රීතිවිපන්නයාගේ ප්‍රශ්‍රබ්ධිය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. ප්‍රශ්‍රබ්ධිය නැතිවත් ම ප්‍රශ්‍රබ්ධි-විපන්නයාගේ සුඛය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සුඛ නැතිවත් ම සුඛවිපන්නයාගේ සම්‍යක්සමාධිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සම්‍යක්-සමාධිය නැතිවත් ම සම්‍යක්සමාධිවිපන්නයාගේ යථාභූත ඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි. යථාභූත ඥානදර්ශනය නැතිවත් ම යථාභූත ඥාන-දර්ශනවිපන්නයාගේ නිර්වේදය නට උපනිඃශ්‍රය ඇති වෙයි. නිර්වේදය නැතිවත් ම නිර්වේදවිපන්නයාගේ විරාගය නට උපනිඃශ්‍රය ඇති වෙයි. විරාගය නැතිවත් ම විරාගවිපන්නයාගේ විමුක්තිඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි.

සෙය්‍යථාපි ආවුසො රුක්ඛො සාඛාපලාසවිපන්නො, තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති, තචොපි -පෙ- ඵෙග්ගුපි -පෙ- සාරොපි න පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො ආවුසො දුස්සීලස්ස සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති පාමොජ්ජං -පෙ- විමුත්තිඤාණදස්සනං.

සීලවතො ආවුසො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිස-සම්පන්නං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ සති පාමොජ්ජසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති පීති. පීතියා සති පීතිසම්පන්නස්ස උපනිස-සම්පන්නා හොති පස්සද්ධි. පස්සද්ධියා සති පස්සද්ධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති සුඛං. සුඛෙ සති සුඛසම්පන්නස්ස උපනිස-සම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධි-සම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූත-ඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති නිබ්බිදා. නිබ්බිදාය සති නිබ්බිදාසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති විරාගො. විරාගෙ සති විරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි ආවුසො රුක්ඛො සාඛාපලාසසම්පන්නො තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති. තචොපි -පෙ- ඵෙග්ගුපි -පෙ- සාරොපි පාරිපූරිං ගච්ඡති එවමෙව ඛො ආවුසො සීලවතො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො, අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති පාමොජ්ජං -පෙ- විමුත්තිඤාණදස්සනන්ති.

## 11. 1. 5

## තතිය උපනිසසුත්තං

තත්‍ර ඛො ආයස්මා ආනන්දො භික්ඛූ ආමන්තෙසි -පෙ- දුස්සීලස්ස ආවුසො සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ අසති පාමොජ්ජවිපන්නස්ස හතූපනිසා හොති පීති. පීතියා අසති පීතිවිපන්නස්ස හතූපනිසා හොති පස්සද්ධි. පස්සද්ධියා අසති පස්සද්ධි-විපන්නස්ස හතූපනිසං හොති සුඛං. සුඛෙ අසති සුඛවිපන්නස්ස හතූපනිසා හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි අසති සම්මාසමාධිවිපන්නස්ස හතූපනිසං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ අසති යථාභූතඤාණදස්සනවිපන්නස්ස හතූපනිසා හොති නිබ්බිදා. නිබ්බිදාය අසති නිබ්බිදාවිපන්නස්ස හතූපනිසො හොති විරාගො. විරාගෙ අසති විරාග-විපන්නස්ස හතූපනිසං හොති විමුත්තිඤාණදස්සනං.

ඇවැත්නි, යම් පරිද්දෙකින් අතු-පත් විපන් රුකෙක් වේ නම් එහි පතුරුදු පිරිපුන්බවට නො යෙයි. සිවිදු ... බොරුදු ... හරදු පිරිපුන්බවට නො යෙයි. ඇවැත්නි, එ පරිදි ම සිල්විපන් දුසිල්හුගේ අවිප්‍රතිසාරය නට උපනිඃශ්‍රය ඇතිවෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම අවිප්‍රතිසාරවිපන්නයාගේ ප්‍රමොදය නට උපනිඃශ්‍රය ඇති වෙයි -පෙ- විමුක්තිඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි.

ඇවැත්නි, සිල්සපන් සිල්වත්හුගේ අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නයාගේ ප්‍රමොදය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රමොදය ඇතිවත් ම ප්‍රමොදසම්පන්නයාගේ ප්‍රීතිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රීතිය ඇතිවත් ම ප්‍රීතිසම්පන්නයාගේ ප්‍රශ්‍රබ්ධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රශ්‍රබ්ධිය ඇතිවත් ම ප්‍රශ්‍රබ්ධිසම්පන්නයාගේ සුඛය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සුඛ ඇතිවත් ම සුඛසම්පන්නයාගේ සම්‍යක්සමාධිය උපනිඃශ්‍රය සම්පන්න වෙයි. සම්‍යක්සමාධිය ඇතිවත් ම සම්‍යක්සමාධිසම්පන්නයාගේ යථාභූතඥානදර්ශනය උපනිඃශ්‍රය සම්පන්න වෙයි. යථාභූතඥානදර්ශනය ඇතිවත් ම යථාභූතඥානදර්ශනසම්පන්නයාගේ නිර්වෙදය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිර්වෙදය ඇතිවත් ම නිර්වෙදසම්පන්නයාගේ විරාගය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. විරාගය ඇතිවත් ම විරාගසම්පන්නයාගේ විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

ඇවැත්නි, යම්සේ අතු - පත් සපන් රුකෙක් වේ නම් එහි පතුරුදු පිරිපුන්බවට යෙයි. සිවිදු ... බොරුදු... හරදු පිරිපුන් බවට යෙයි. ඇවැත්නි, එසෙයින් ම සිල්සපන් සිල්වත්හුගේ අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නයාගේ ප්‍රමොදය උපනිඃශ්‍රයසම්පන්න වෙයි ... විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

## 11. 1. 5
## තතිය උපනිස සූත්‍රය

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ... ඇවැත්නි, සිල්විපන් දුසිල්හුගේ අවිප්‍රතිසාරය නට උපනිඃශ්‍රය ඇති වෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම අවිප්‍රතිසාරවිපන්නයාගේ ප්‍රමොදය නට උපනිශ්‍රය ඇති වෙයි. ප්‍රමොදය නැතිවත් ම ප්‍රමොදවිපන්නයාගේ ප්‍රීතිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. ප්‍රීතිය නැතිවත් ම ප්‍රීතිවිපන්නයාගේ ප්‍රශ්‍රබ්ධිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. ප්‍රශ්‍රබ්ධිය නැතිවත් ම ප්‍රශ්‍රබ්ධිවිපන්නයාගේ සුඛය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සුඛය නැතිවත් ම සුඛවිපන්නයාගේ සම්‍යක්සමාධිය නට උපනිඃශ්‍රය ඇති වෙයි. සම්‍යක්සමාධිය නැතිවත් ම සම්‍යක්සමාධිවිපන්නයාගේ යථාභූතඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි. යථාභූතඥානදර්ශනය නැතිවත් ම යථාභූතඥානදර්ශනවිපන්නයාගේ නිර්වෙදය නට උපනිඃශ්‍රය ඇති වෙයි. නිර්වෙදය නැතිවත් ම නිර්වෙදවිපන්නයාගේ විරාගය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි. විරාගය නැතිවත් ම විරාගවිපන්නයාගේ විමුක්තිඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇතියේ වෙයි.

සෙය්‍යථාපි ආවුසො රුක්ඛො සාඛාපලාසවිපන්නො තස්ස පපටිකාපි න පාරිපූරිං ගච්ඡති. තචොපි -පෙ- ඵෙග්ගුපි -පෙ- සාරොපි න පාරිපූරිං ගච්ඡති එවමෙව ඛො ආවුසො දුස්සීලස්ස සීලවිපන්නස්ස හතූපනිසො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ අසති අවිප්පටිසාරවිපන්නස්ස හතූපනිසං හොති පාමොජ්ජං -පෙ- විමුත්තිඤාණදස්සනං.

සීලවතො ආවුසො සීලසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාරසම්පන්නස්ස උපනිස-සම්පන්නං හොති පාමොජ්ජං. පාමොජ්ජෙ සති පාමොජ්ජසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති පීති. පීතියා සති පීතිසම්පන්නස්ස උපනිස-සම්පන්නො හොති පස්සද්ධි. පස්සද්ධියා සති පස්සද්ධිසම්පන්නස්ස උපනිස-සම්පන්නං හොති සුඛං. සුඛෙ සති සුඛසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති සම්මාසමාධි. සම්මාසමාධිම්හි සති සම්මාසමාධිසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති යථාභූතඤාණදස්සනං. යථාභූතඤාණදස්සනෙ සති යථාභූතඤාණදස්සනසම්පන්නස්ස උපනිසසම්පන්නා හොති නිබ්බිදා. නිබ්බිදාය සති නිබ්බිදාසම්පන්නස්ස උපනිසසම්පන්නො හොති විරාගො. විරාගෙ සති විරාගසම්පන්නස්ස උපනිසසම්පන්නං හොති විමුත්තිඤාණදස්සනං.

සෙය්‍යථාපි ආවුසො රුක්ඛො සාඛාපලාසසම්පන්නො. තස්ස පපටිකාපි පාරිපූරිං ගච්ඡති. තචොපි -පෙ- ඵෙග්ගුපි -පෙ- සාරොපි පාරිපූරිං ගච්ඡති. එවමෙව ඛො ආවුසො සීලවතො සීලසම්පන්නස්ස උපනිස-සම්පන්නො හොති අවිප්පටිසාරො. අවිප්පටිසාරෙ සති අවිප්පටිසාර-සම්පන්නස්ස උපනිසසම්පන්නං හොති පාමොජ්ජං -පෙ- විමුත්තිඤාණ-දස්සනන්ති.

## 11. 1. 6

## ව්‍යසන සුත්තං

යො සො භික්ඛවෙ භික්ඛු අක්කොසකපරිභාසකො[1] අරියූපවාදී[2] සබ්‍රහ්මචාරීනං අට්ඨානමෙතං අනවකාසො යං සො එකාදසන්නං ව්‍යසනානං අඤ්ඤතරං ව්‍යසනං න නිගච්ඡෙය්‍ය. කතමෙසං එකාදසන්නං:

1. අක්කොසකො පරිභාසකො-මජසං.
2. අරියූපවාදෙ-මජසං

ඇවැත්නි, යම්පරිදි අතුපත් විපන් රුකෙක් වේ නම් එහි පතුරුදු පිරිපුන් බවට නො යෙයි. සිව්දු... බොරුදු...හරදු පිරිපුන් බවට නො යෙයි. ඇවැත්නි, එ පරිදි ම සිල්විපන් දුසිල්හුගේ අවිප්‍රතිසාරය නට උපනිඃශ්‍රය ඇති වෙයි. අවිප්‍රතිසාරය නැතිවත් ම අවිප්‍රතිසාරවිපන්නයාගේ ප්‍රමොදය නට උපනිඃශ්‍රය ඇති වෙයි ... විමුක්තිඥානදර්ශනය නට උපනිඃශ්‍රය ඇති වෙයි.

ඇවැත්නි, සිල්සපන් සිල්වත්හුගේ අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නයාගේ ප්‍රමොදය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රමොදය ඇතිවත් ම ප්‍රමොදසම්පන්නයාගේ ප්‍රීතිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රීතිය ඇතිවත් ම ප්‍රීතිසම්පන්නයාගේ ප්‍රශ්‍රබ්ධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. ප්‍රශ්‍රබ්ධිය ඇතිවත් ම ප්‍රශ්‍රබ්ධිසම්පන්නයාගේ සුඛය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සුඛය ඇතිවත් ම සුඛසම්පන්නයාගේ සම්‍යක්සමාධිය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. සම්‍යක්සමාධිය ඇතිවත් ම සම්‍යක්සමාධිසම්පන්නයාගේ යථාභූතඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. යථාභූතඥානදර්ශනය ඇතිවත් ම යථාභූතඥානදර්ශනසම්පන්නයාගේ නිර්වෙදය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. නිර්වෙදය ඇතිවත් ම නිර්වෙදසම්පන්නයාගේ විරාගය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. විරාගය ඇතිවත් ම විරාගසම්පන්නයාගේ විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

ඇවැත්නි, යම්සේ අතුපත් සපන් රුකෙක් වේ නම් එහි පතුරුදු පිරිපුන් බවට යෙයි. ඇවැත්නි, එසෙයින් ම සිල්සපන් සිල්වත්හුගේ අවිප්‍රතිසාරය උපනිඃශ්‍රයසම්පන්න වෙයි. අවිප්‍රතිසාරය ඇතිවත් ම අවිප්‍රතිසාරසම්පන්නයාගේ ප්‍රමොදය උපනිඃශ්‍රයසම්පන්න වෙයි ... විමුක්තිඥානදර්ශනය උපනිඃශ්‍රයසම්පන්න වෙයි.

## 11. 1. 6

## ව්‍යසන සූත්‍රය

මහණෙනි, යම් මහණෙක් සබ්‍රම්සරුනට ආක්‍රොශ පරිභව කරනුයේ ආර්‍ය්‍යයනට උපවාද බණනසුලු වේද, හේ යම් හෙයෙකින් එකොළොස් ව්‍යසනයන්ගෙන් එක්තරා ව්‍යසනයකට නො යන්නේ ය යන යමක් වේ නම් තෙල කරුණ අස්ථාන වෙයි. අනවකාශ වෙයි. කවර එකොළොස් කරුණින යත්:

අනධිගතං නාධිගච්ඡති, අධිගතා[1] පරිහායති, සද්ධම්මස්ස න වොදයති, සද්ධම්මේසු වා අධිමානිකො හොති. අනභිරතො වා බ්‍රහ්මචරියං චරති, අඤ්ඤතරං වා සංකිලිට්ඨං ආපත්තිං ආපජ්ජති. සික්ඛං වා පච්චක්ඛාය හීනායාවත්තති, ගාළ්හං වා රොගාතඞ්කං ඵුසති, උම්මාදං වා පාපුණාති චිත්තක්ඛෙපං, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

යො සො භික්ඛවෙ භික්ඛු අරියූපවාදී සබ්‍රහ්මචාරීනං, අට්ඨානමෙතං අනවකාසො යං සො ඉමෙසං ඒකාදසන්නං ව්‍යසනානං අඤ්ඤතරං ව්‍යසනං න නිගච්ඡෙය්‍යාති.

## 11. 1. 7

### පඨම සඤ්ඤා සුත්තං

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

සියා නු ඛො භන්තෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස.

න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස. යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

1. අධිගතා–සීමු
* සිංහල පොතේ නැති කොටසක් මේ සූත්‍රයෙහි මුල එයි.

අනධිගත අධිගතයෙන් නො ලබන්නේ ය. විශෙෂය පිරිහෙන්නේ ය. ඔහුගේ ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත ශාසනධර්මය ව්‍යවදනයට නො යෙයි. සද්ධර්මයෙහි හෝ අධිමාන ඇතියේ වෙයි. නො ඇලුණේ හෝ බඹසර හැසිරෙයි. එක්තරා සකිලිට් ඇවතකට හෝ අවදනේ ය. ශික්ෂා හෝ ප්‍රත්‍යාඛ්‍යානය කොට හීනභාවයට වැටෙයි. දැඩි රොගාබාධයක් හෝ පහස්නේ ය. චිත්තක්ෂෙප සඞ්ඛ්‍යාත උන්මාදයට හෝ පැමිණෙයි නට සිහි ඇතියේ කලුරිය කෙරෙයි. කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත සඞ්ඛ්‍යාත නිරයට පැමිණෙයි.

මහණෙනි, යම් මහණෙක් සබ්‍රම්සරුනට ආක්‍රොශ පරිභව කරනුයේ ආර්‍යොපවාද බණනසුලු වේ නම් හේ මේ එකොළොස් ව්‍යසනයන්ගෙන් එක්තරා ව්‍යසනයකට නො පැමිණෙන්නේ ය යන තෙල කරුණ අස්ථාන වෙයි. අනවකාශ වේ.

## 11. 1. 7

## පඨම සඤ්ඤා සූත්‍රය

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ:

වහන්ස, යම් පරිද්දෙකින් පෘථිවි (කෘත්ස්න) යෙහි පෘථිවිසංඥා ඇති නොවන්නේ නම්, ආපොකසිණයෙහි අප්සංඥා ඇති නොවන්නේ නම් තෙජස්හි තෙජසංඥා ඇති නො වන්නේ නම්, වායුයෙහි වායු සංඥා ඇති නොවන්නේ නම් ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥා ඇති නො වේ නම් විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා ඇති නො වේ නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා ඇති නො වේ නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා ඇති නොවේ නම් ඉහලොකයෙහි ඉහලොකසංඥා ඇති නොවේ නම්, පරලොකයෙහි පරලොකසංඥා ඇති නො වේ නම්, යම් මේ ප්‍රාප්ත වූ පර්‍යෙෂණ කළා වූ සිතින් අනුවිචරණය කරන ලද දිට්ඨ සඞ්ඛ්‍යාත රූපායතනයක් හෝ ශ්‍රැතසඞ්ඛ්‍යාත ශබ්දයතනයක් හෝ මුතසඞ්ඛ්‍යාත ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ආයතනයක් හෝ සුඛ-දුඃඛාදි ධර්මාරම්මණයෙක් හෝ වේ නම් එහිදු සංඥා ඇති නො වේ නම් සංඥා ඇතියේත් වේ නම් භික්ෂුහට එබඳු සංඥා ප්‍රතිලාභයෙක් වේ දැයි.

සියා ආනන්ද භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

යථාකථං පන භන්තෙ සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

ඉධානන්ද භික්ඛු එවං සඤ්ඤී හොති: "එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන"න්ති. එවං ඛො ආනන්ද සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

ආනන්දයෙනි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා ඇති නො වේ නම්, ආපයෙහි අප්සංඥා ඇති නො වේ නම්, තෙජස්හි තෙජස්සංඥා ඇති නො වේ නම්, වායුවෙහි වායුසංඥා ඇති නො වේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥා ඇති නො වේ නම්, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා ඇති නො වේ නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා ඇති නො වේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා ඇති නො වේ නම්, ඉහලොකයෙහි ඉහලොකසංඥා ඇති නො වේ නම්, පරලොකයෙහි පරලොකසංඥා ඇති නො වේ නම්, යම් මේ සිතින් ප්‍රාප්ත වූ පයෙෂිත වූ සිතින් අනුවිචරණය කරන ලද දිට්ඨසඞ්ඛ්‍යාත රූපායතනයක් හෝ ශ්‍රුතසඞ්ඛ්‍යාත ශබ්දයතනයක් හෝ මුතසංඛ්‍යාත ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යආයතනයක් හෝ සුඛ–දුඃඛාදි ධර්මායතනයක් හෝ වේ නම්, එහිදු සංඥා ඇති නො වේ ද, සංඥා ඇතියේත් වේ ද, එබඳු සමාධිප්‍රතිලාභයෙක් මහණහට වන්නේ ය.

වහන්ස, යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥා නැති වේ නම්, අප්හි අප්සංඥා නැති වේ නම්, තෙජස්හි තෙජස්සංඥා නැති වේ නම් වායුවෙහි වායුසංඥා නැති වේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතන සංඥා නැති වේ නම්, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා නැති වේ නම්, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා නැති වේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන–සංඥා නොමැති වේ නම් ඉධලොකයෙහි ඉධලොකසංඥා නැති වේ නම්, පරලොකයෙහි පරලොක සංඥා නැති වේ නම්, යම්බඳු මේ සිතින් ප්‍රාප්ත පයෙෂිත අනුවිචරිත, දිට්ඨ සුත මුත විඤ්ඤාතයකුත් වේ නම් එහිදු සංඥා ඇති නො වේ නම් සංඥා ඇතියේත් වේ නම් මහණහට එබඳු සමාධි–ප්‍රතිලාභයෙක් කෙසේ වන්නේ දැයි.

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ ''යම්බඳු සර්වසංස්කාරසමථයෙක් සර්වොපධිප්‍රතිනිස්සග්ගියෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ නම් තෙල ශාන්ත ය, තෙල ප්‍රණීතය''යි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. ආනන්දයෙනි, මෙසේ යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥා නැති වේ නම් අප්හි අප්සංඥා නැති වේ නම් තෙජස්හි තෙජස් සංඥා නැති වේ නම් වායුවෙහි වායුසංඥා නැති වේ නම් ආකාසානඤ්චා–යතනයෙහි ආකාසානඤ්චායතනසංඥා නැති වේ නම්, විඤ්ඤාණඤ්චායතන–යෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා නැති වේ නම් ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා නැති වේ නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා නැති වේ නම්, ඉහලොකයෙහි ඉහලොකසංඥා නැති වේ නම්, පරලොකයෙහි පරලොකසංඥා නැති වේ නම්, ප්‍රාප්ත වූ ද පයෙෂිත වූ ද සිතින් අනුවිචරිත වූ ද යම් දිට්ඨ, සුත, මුත, විඤ්ඤාතයෙක් වේ නම්, එහිදු සංඥා නැත්තේ නම්, එහෙත් සංඥා ඇතියේත් වේ නම්, භික්ෂුහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වෙයි.

අථ ඛො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

සියා නු ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනො තථාරූපො සමාධි-පටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

සියා ආවුසො ආනන්ද භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

යථාකථං පනාවුසො සාරිපුත්ත සියා භික්ඛුනො තථාරූපො සමාධි පටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

ඉධාවුසො ආනන්ද, භික්ඛු එවංසඤ්ඤී හොති: 'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන''න්ති, එවං ඛො ආවුසො ආනන්ද, සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යත්‍ර හි නාම සත්ථු ච සාවකස්ස ච අත්ථෙන අත්ථො බ්‍යඤ්ජනෙන බ්‍යඤ්ජනං සංසන්දිස්සති සමෙස්සති න විගහිස්සති, යදිදං අග්ගපදස්මිං.

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් සකසා වැඳ පැදකුණු කොට ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා ගියහ. ගොස් ආයුෂ්මත් සැරියුත් තෙරුන් හා සතුටුවූහ. සම්මෝදනයට නිසි සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මෙසේ කීහ:

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥා නොමැති වේ නම් –පෙ– යම් බඳු ප්‍රාප්ත වූ ද පර්යෙෂිත වූ ද සිතින් අනුවිචරිත වූ ද දිට්ඨ, සුත, මුත, විඤ්ඤාතයෙක් වේ නම්, එහිදු සංඥා නැති වේ නම්, එතෙකුදු වත් සංඥා ඇතියේත් වේ නම් මහණහට එබඳු සමාධිප්‍රති-ලාභයෙක් වේ දැයි ?

ඇවැත්නි, ආනන්දයෙනි, යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥා නොමැති වේ නම් ... ප්‍රාප්ත වූ ද පර්යෙෂිත වූ ද සිතින් අනුවිචරිත වූ ද යම් දිට්ඨ, සුත, මුත, විඤ්ඤාතයෙක් වේ නම්, එහිදු සංඥා නැති වේ නම්, එහෙත් සංඥා ඇතියේත් වේ නම්, මහණහට එබඳු සමාධිප්‍රතිඵලයෙක් වේ යයි.

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥා නැති වේ නම් ... ප්‍රාප්ත වූ ද පර්යෙෂිත වූ ද මනසින් අනුවිචරිත වූ ද යම් දිට්ඨ, සුත මුත, විඤ්ඤාතයෙක් වේ නම් එහිදු සංඥා නැති වේ නම් මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් කෙසේ නම් වේ දැයි.

ඇවැත්නි ආනන්දයෙනි, මෙසස්නෙහි මහණ "යම් මේ සර්වසංස්කාර ශමථයෙක් සර්වෝපධිප්‍රතිනිසර්ගයෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ නම්, මෙය ශාන්ත ය මෙය ප්‍රණීත ය"යි යන මෙබඳු සංඥා ඇතියේ වෙයි. ඇවැත්නි ආනන්දයෙනි, මහණහට යම් පරිදි පෘථිවියෙහි පෘථිවිසංඥා නොමැති වේ නම්... ප්‍රාප්තවූ ද, පර්යෙෂිත වූ ද මනසින් අනුවිචරිත වූ ද යම් දිට්ඨ, සුත මුත විඤ්ඤාතයෙක් වේ නම්, එහිදු සංඥා නැතියේ වේ නම්, එතෙකුදුවත් සංඥා ඇතියේත් වේ නම් එබඳු සමාධිප්‍රතිලාභයෙක් වේ යයි.

ඇවැත්නි, යම් කරුණෙක්හි ලා ශාස්තෲන් වහන්සේගේ ද ශ්‍රාවකයා-ගේ ද අග්‍රපදයෙහි ලා අර්ථය හා අර්ථය ද ව්‍යඤ්ජනය හා ව්‍යඤ්ජනය ද සැසැඳේ නම්, සමාන වේ නම්, නො වැරදේ නම්, මෙය ආශ්චර්ය යි. ඇවැත්නි, මෙය අද්භූත යි.

ඉදනාහං ආවුසො භගවන්තං උපසඞ්කමිත්වා එතමත්ථං අපුච්ඡිං. භගවාපි මෙ එතෙහෙව පදෙහි එතෙහි බ්‍යඤ්ජනෙහි එතමත්ථං ව්‍යාකාසි, සෙය්‍යථාපි ආයස්මා සාරිපුත්තො. අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යත්‍ර හි නාම සත්ථු ච සාවකස්ස ච අත්ථෙන අත්ථො බ්‍යඤ්ජනෙන බ්‍යඤ්ජනං සංසන්දිස්සති, සමෙස්සති, න විග්ගහිස්සති, යදිදං අග්ගපදස්මින්ති.

## 11. 1. 8

## මනසිකාර සුත්තං

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

සියා නු ඛො භන්තෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා න චක්ඛුං මනසි කරෙය්‍ය, න රූපං මනසි කරෙය්‍ය, න සොතං මනසි කරෙය්‍ය, න සද්දං මනසි කරෙය්‍ය, න ඝානං මනසි කරෙය්‍ය, න ගන්ධං මනසි කරෙය්‍ය, න ජිව්හං මනසි කරෙය්‍ය, න කායං මනසි කරෙය්‍ය, න ඵොට්ඨබ්බං මනසි කරෙය්‍ය, න පඨවිං මනසි කරෙය්‍ය න, ආපං මනසි කරෙය්‍ය, න තෙජං මනසි කරෙය්‍ය, න වායං මනසි කරෙය්‍ය, න ආකාසානඤ්චායතනං මනසි කරෙය්‍ය, න විඤ්ඤාණඤ්චායතනං මනසි කරෙය්‍ය, න ආකිඤ්චඤ්ඤායතනං මනසි කරෙය්‍ය, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං මනසි කරෙය්‍ය, න ඉධ ලොකං මනසි කරෙය්‍ය, න පරලොකං මනසි කරෙය්‍ය, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි න මනසි කරෙය්‍ය, මනසි ච පන කරෙය්‍යාති.

ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, මම මෙ දැන් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ තෙල අර්‍ථය පිළිවිසියෙමි, භාග්‍යවතුන් වහන්සේ ද තෙල පදයෙන් තෙල ව්‍යඤ්ජනයෙන් තෙල අර්‍ථය ආයුෂ්මත් ශාරීපුත්‍රයන් (විසඳූ) පරිද්දෙන් විසඳූ සේක. ඇවැත්නි යම් කරුණෙක් ශාස්තෲන්වහන්සේගේ හා ශ්‍රාවකයාගේ හා අර්‍ථයෙන් අර්‍ථයත් ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනයත් අග්‍රපද සඞ්ඛ්‍යාත නිර්‍වාණයෙහි ලා සැසැඳේ නම් සමාන වේ නම් නොවැරදේ නම්, ඇවැත්නි, තෙල ආශ්චර්‍ය්‍ය යි. ඇවැත්නි, අද්භූත යි.

## 11. 1. 8
## මනසිකාර සූත්‍රය

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළහ:

වහන්ස, යම් පරිද්දෙකින් චක්ෂුස මෙනෙහි නො කෙරේ නම්, රූපය මෙනෙහි නො කෙරේ නම්, ශ්‍රොතස මෙනෙහි නො කෙරේ නම්, ශබ්දය මෙනෙහි නොකෙරේ නම්, ඝ්‍රාණය මෙනෙහි නො කෙරේ නම්, ගන්‍ධය මෙනෙහි නො කෙරේ නම්, ජිහ්වාව මෙනෙහි නො කෙරේ නම් රස මෙනෙහි නො කෙරේ නම්, කය මෙනෙහි නො කෙරේ නම්, ස්ප්‍රෂ්ටව්‍යය මෙනෙහි නො කෙරේ නම්, පෘථිවිය මෙනෙහි නො කෙරේ නම්, ආපය මෙනෙහි නො කෙරේ නම්, තේජස් මෙනෙහි නොකෙරේ නම්, වායු මෙනෙහි නො කෙරේ නම්, ආකාසානඤ්චායතනය මෙනෙහි නො කෙරේ නම්, විඤ්ඤාණඤ්චායතනය මෙනෙහි නො කෙරේ නම්, ආකිඤ්චඤ්ඤායතනය මෙනෙහි නො කෙරේ නම්, නෙවසඤ්ඤානා සඤ්ඤායතනය මෙනෙහි නො කෙරේ නම්, ඉහලොකය මෙනෙහි නො කෙරේ නම්, පරලොකය මෙනෙහි නො කෙරේ නම්, යම්බඳු මේ ප්‍රාප්ත වූ පර්යේෂිත වූ සිතින් අනුවිචරිත වූ දිට්ඨ, සුත මුත, විඤ්ඤාතයක් ඇත් නම්, එ ද මෙනෙහි නො කෙරේ නම් මෙනෙහි කරනෙක් වේ නම් මහණහට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වන්නේ දැ යි. ?

සියා ආනන්ද, භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා න චක්ඛුං මනසි කරෙය්‍ය, න රූපං මනසි කරෙය්‍ය, න සොතං මනසි කරෙය්‍ය, න සද්දං මනසි කරෙය්‍ය, න ඝානං මනසි කරෙය්‍ය, න ගන්ධං මනසි කරෙය්‍ය, න ජිව්හං මනසි කරෙය්‍ය, න රසං මනසි කරෙය්‍ය, න කායං මනසි කරෙය්‍ය, න ඵොට්ඨබ්බං මනසි කරෙය්‍ය, න පඨවිං මනසි කරෙය්‍ය, න ආපං මනසි කරෙය්‍ය, න තෙජං මනසි කරෙය්‍ය, න වායං මනසිකරෙය්‍ය, න ආකාසානඤ්චායතනං මනසි කරෙය්‍ය, න විඤ්ඤාණඤ්චායතනං මනසි කරෙය්‍ය, න ආකිඤ්චඤ්ඤායතනං මනසි කරෙය්‍ය, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං මනසි කරෙය්‍ය, න ඉධලොකං මනසිකරෙය්‍ය, න පරලොකං මනසි කරෙය්‍ය, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි න මනසි කරෙය්‍ය, මනසි ච පන කරෙය්‍යාති.

යථා කථං පන භන්තෙ සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා න චක්ඛුං මනසි කරෙය්‍ය -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තම්පි න මනසි කරෙය්‍ය, මනසි ච පන කරෙය්‍යාති.

ඉධානන්ද භික්ඛු එවං මනසි කරොති: ''එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන''න්ති. එවං ඛො ආනන්ද, සියා භික්ඛුනො තථා රූපො සමාධිපටිලාභො යථා න චක්ඛුං මනසි කරෙය්‍ය, න රූපං මනසි කරෙය්‍ය, න සොතං මනසි කරෙය්‍ය, න සද්දං මනසි කරෙය්‍ය, න ඝානං මනසි කරෙය්‍ය, න ගන්ධං මනසි කරෙය්‍ය, න ජිව්හං මනසිකරෙය්‍ය, න රසං මනසි කරෙය්‍ය න කායං මනසිකරෙය්‍ය, න ඵොට්ඨබ්බං මනසි කරෙය්‍ය, න පඨවිං මනසි කරෙය්‍ය, න ආපං මනසිකරෙය්‍ය, න තෙජං මනසි කරෙය්‍ය, න වායං මනසි කරෙය්‍ය, න ආකාසානඤ්චායතනං මනසි කරෙය්‍ය, න විඤ්ඤාණඤ්චායතනං මනසිකරෙය්‍ය, න ආකිඤ්චඤ්ඤායතනං මනසි කරෙය්‍ය, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං මනසි කරෙය්‍ය, න ඉධ ලොකං මනසිකරෙය්‍ය, න පරලොකං මනසි කරෙය්‍ය, න පරලොකං මනසි කරෙය්‍ය, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරිසෙසිතං අනුවිචරිතං මනසා, තම්පි න මනසි කරෙය්‍ය. මනසි ච පන කරෙය්‍යා ති.

ආනන්දයෙනි, යම් පරිද්දෙකින් චක්ෂුස මෙනෙහි නො කෙරේ නම්, රූපය මෙනෙහි නො කෙරේ නම් ශ්‍රොතස මෙනෙහි නො කෙරේ නම්, ශබ්දය මෙනෙහි නො කෙරේ නම්, ඝ්‍රාණය මෙනෙහි නො කෙරේ නම්, ගන්ධය මෙනෙහි නො කෙරේ නම්, ජිහ්වා මෙනෙහි නො කෙරේ නම් රසය මෙනෙහි නො කෙරේ නම්, කායය මෙනෙහි නො කෙරේ නම්, ස්ප්‍රෂ්ටව්‍යය මෙනෙහි නො කෙරේ නම්, පෘථුවිය මෙනෙහි නො කෙරේ නම්, ආපය මෙනෙහි නො කෙරේ නම්, තෙජස මෙනෙහි නො කෙරේ නම්, වායුව මෙනෙහි නො කෙරේ නම්, ආකාසානඤ්චායතනය මෙනෙහි නො කෙරේ නම්, විඤ්ඤාණඤ්චායතනය මෙනෙහි නො කෙරේ නම්, ආකිඤ්චඤ්ඤායතනය මෙනෙහි නො කෙරේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය මෙනෙහි නො කෙරේ නම්, ඉහ ලොකය මෙනෙහි නො කෙරේ නම්, පරලොකය මෙනෙහි නො කෙරේ නම්, යම්බඳු ප්‍රාප්ත වූ පර්යේෂිත වූ මනසින් අනුවිචරිත වූ මේ දිට්ඨ, සුත, මුත, විඤ්ඤාතයෙකුත් ඇත්නම් එ ද මෙනෙහි නො කෙරේ නම්, මෙනෙහි කරනුයේ ද වේ නම්, මහණහට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වේ යයි.

වහන්ස, යම් පරිද්දෙකින් චක්ෂුස මෙනෙහි නො කෙරේ නම් .... යම් බඳු ප්‍රාප්ත, පර්යේෂිත මනසින් අනුවිචරිත වූ දිට්ඨ, සුත, මුත, විඤ්ඤාතයෙක් වේ නම් එ ද මෙනෙහි නො කෙරේ නම්, මෙනෙහි කරනු යේත් වේ නම්, කෙසේ නම් මහණ හට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වේ දැයි?

ආනන්දයෙනි, මෙ සස්නෙහි මහණ මෙසේ මෙනෙහි කරන්නේ ය: "යම් බඳු මේ සර්වසංස්කාරයන්ගේ ශමථයෙක් සර්වොපධීන්ගේ ප්‍රතිනිඃසර්ගයෙක්, තෘෂ්ණාක්ෂයයෙක්, විරාගයෙක්, නිරොධයෙක් නිර්වාණයෙක් වේ නම්, තෙල ශාන්ත ය, තෙල ප්‍රණීත ය" (කියා) යි. ආනන්දයෙනි, මෙසේ වනාහි යම් පරිද්දෙකින් චක්ෂුස මෙනෙහි නො කෙරේ නම්, රූපය මෙනෙහි නො කෙරේ නම්, ශ්‍රොතස මෙනෙහි නො කෙරේ නම්, ශබ්දය මෙනෙහි නො කෙරේ නම්, ඝ්‍රාණය මෙනෙහි නො කෙරේ නම්, ගන්ධය මෙනෙහි නො කෙරේ නම්, ජිහ්වාව මෙනෙහි නො කෙරේ නම්, රසය මෙනෙහි නො කෙරේ නම්, කායය මෙනෙහි නො කෙරේ නම්, ස්ප්‍රෂ්ටව්‍යය මෙනෙහි නො කෙරේ නම්, පෘථිවිය මෙනෙහි නො කෙරේ නම්, ආපය මෙනෙහි නො කෙරේ නම්, තෙජස මෙනෙහි නො කෙරේ නම්, වායුව මෙනෙහි නො කෙරේ නම්, ආකාසානඤ්චායතනය මෙනෙහි නො කෙරේ නම්, විඤ්ඤාණඤ්චායතනය මෙනෙහි නො කෙරේ නම්, ආකිඤ්චඤ්ඤායතනය මෙනෙහි නො කෙරේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤා යතනය මෙනෙහි නො කෙරේ නම්, ඉහ ලොකය මෙනෙහි නො කෙරේ නම්, පරලොකය මෙනෙහි නො කෙරේ නම්, යම් බඳු ප්‍රාප්ත පර්යෙෂිත, මනසින් අනුවිචරිත වූ මේ දිට්ඨ, සුත, මුත, විඤ්ඤාතයෙක් ද වේ නම් එය ද මෙනෙහි නො කෙරේ නම්, මෙනෙහි කරනුයේ ද වේ නම්, භික්ෂුහට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වේ යයි,

## 11. 1. 9

## සන්ධ සුත්තං

එකං සමයං භගවා නාදිකෙ විහරති ගිඤ්ජකාවසථෙ. අථ ඛො ආයස්මා සන්ධො[1] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං සන්ධං භගවා එතදවොච:

ආජානීයජ්ඣායිතං සන්ධ ඣාය[2], මා ඛලුඞ්කජ්ඣායිතං. කථඤ්ච ඛලුඞ්කජ්ඣායිතං හොති:

අස්සඛලුඞ්කො හි සන්ධ දොණියා[3] බද්ධො 'යවසං යවසන්ති' ඣායති, තං කිස්ස හෙතු: න හි සන්ධ අස්සඛලුඞ්කස්ස දොණියා, බද්ධස්ස එවං හොති, කිං නු ඛො මං අජ්ජ අස්සදම්මසාරථී කාරණං කාරෙස්සති? කිමස්සාහං පතිකරොමී'ති? සො දොණියා බද්ධො 'යවසං යවසන්ති, ඣායති.

එවමෙව ඛො සන්ධ ඉධෙකච්චො පුරිසඛලුඞ්කො අරඤ්ඤගතොපි රුක්ඛමූලගතොපි සුඤ්ඤාගාරගතොපි කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන. උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. සො කාමරාගං යෙව අන්තරං කරිත්වා ඣායති පජ්ඣායති නිජ්ඣායති, අපජ්ඣායති. ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති– ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති– උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති– විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති විචිකිච්ඡාපරෙතෙන. උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාති. සො විචිකිච්ඡං යෙව අන්තරං කරිත්වා ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති. සො පඨවිම්පි නිස්සාය ඣායති ආපම්පි නිස්සාය ඣායති, තෙජම්පි නිස්සාය ඣායති, වායම්පි නිස්සාය ඣායති, ආකාසානඤ්චායතනම්පි නිස්සාය ඣායති, විඤ්ඤාණඤ්චායතනම්පි නිස්සාය ඣායති, ආකිඤ්චඤ්ඤායතනම්පි නිස්සාය ඣායති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනම්පි නිස්සාය ඣායති, ඉධ ලොකම්පි නිස්සාය පරලොකම්පි නිස්සාය ඣායති, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිස්සාය ඣායති. එවං ඛො සන්ධ පුරිසඛලුඞ්කජ්ඣායිතං හොති.

---

1. සද්ධො – මජසං.
2. ඣායථ – සිමු.
3. බන්ධො – සයා,

## 11. 1. 9
# සන්ධ සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නාදික නගර සමීපයෙහි වූ ගිඤ්ජකාවසථයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් සන්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් සන්ධ තෙරුන්හට භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළ සේක:

සන්ධයෙනි, ආජානෙයධ්‍යායිතය සිතව, අස්ගුණ්ඩයාගේ ධ්‍යායිතය නහමක් සිතව, සන්ධයෙනි, අස්ගුණ්ඩයාගේ ධ්‍යායිතය කිසෙයින් වේ ය යත්:

සන්ධයෙනි, සත්ත්වාහාර බහනා දෙණ සමීපයෙහි බඳනා ලද අස්ගුණ්ඩයා වනාහි 'යවස, යවස'යි සිතනේ ය. එ කවර හෙයින යත්: සන්ධයෙනි, යවස බහන දෙණ හමුයෙහි බැඳුණු අස්ගුණ්ඩහට මෙබඳු සිතෙක් නො වෙ යි: 'අස්දම්සැරි අද මා ලවා කිනම් කරුණක් කරවන්නේ ද? මම අද ඔහට කුමක් පෙරළා කරනෙම් දැ''යි (කියායි). හේ දෙණ වෙත බැඳුණේ 'යවස, යවසැ''යි සිතනේ ය,

සන්ධයෙනි, එ පරිද්දෙන් ම මෙ සස්නෙහි ඇතැම් පුරුෂගුණ්ඩයෙක් වලට ගියේ වේව යි, රුක්මුලට ගියේ වේව යි, ශූන්‍යාගාරයට ගියේ වේව යි, කාමරාගයෙන් ගන්නා ලද කම්රාඅනුගිය සිතින් වාසය කරයි. උපන්නා වූ ද කාමරාගයාගේ නිඃසරණය ඇතිසැටියෙන් නො දන්නේ ය හේ කාමරාගය අභ්‍යන්තරයෙහි කොට ධ්‍යාන කෙරෙයි. ප්‍රධ්‍යාන කෙරෙයි නිබඳ කොට ධ්‍යාන කොරෙයි, බැස ගෙන සිතයි, ව්‍යාපාදයෙන් ගත් සිතින් වාසය කරයි — ස්ත්‍යානමිද්ධයෙන් ගත් සිතින් වාසය කරයි — ඖද්ධත්‍යකෞකෘත්‍යයෙන් ගත් සිතින් වාසය කරයි — විචිකිත්සායෙන් ගත් විචිකිත්සායෙන් මැඩුණු සිතින් වාසය කරයි. උපන්නා වූ ද විචිකිත්සාහුගේ නිඃසරණය ඇතිසැටියෙන් නො දන්නේ ය, හේ විචිකිත්සාව ම අභ්‍යන්තරයෙහි කොට (ලා) සිතන්නේ ය, නානාප්‍රකාරයෙන් සිතන්නේ ය, නිබඳකොට සිතන්නේ ය, බැස සිතන්නේය, හේ පෘථිවීකෘත්ස්නධ්‍යානය ද නිසා ධ්‍යාන කරන්නේය — අප්කෘත්ස්නධ්‍යානය ද නිසා සිතන්නේ ය —තෙජස්කෘත්ස්නධ්‍යානය ද නිසා සිතන්නේ ය. වායුකාත්ස්නධ්‍යානය ද නිසා සිතන්නේ ය — ආකාසානඤ්චායතනධ්‍යානය ද සිතන්නේ ය— විඤ්ඤානඤ්චායතනධ්‍යානය ද නිසා සිතන්නේ ය — ආකිඤ්චඤ්ඤායතනධ්‍යානය ද නිසා සිතන්නේ ය — නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ද නිසා ලොකය ද නිසා සිතන්නේය, පරලොකය ද නිසා සිතන්නේ ය. යම් බඳු සිතන්නේ ය ඉහප්‍රාප්ත, පයෝෂිත මනසින් අනුවිචරිත මේ දිට්ඨ, සුත, මුත, විඤ්ඤානයෙක් වේ නම්, එය ද නිසා සිතන්නේ ය. සන්ධයෙනි, මෙසෙසින් පුරුෂ බලුඞ්කධ්‍යාධිතය වෙයි.

කථඤ්ච සන්ධ ආජානීයජ්ඣායිතං හොති: භද්‍රො හි සන්ධ අස්සාජානීයො දොණියා බද්ධො න යවසං යවසන්ති ඣායති. තං කිස්ස හෙතු: භද්‍රස්ස හි සන්ධ අස්සාජානීයස්ස දොණියා බද්ධස්ස එවං හොති: කිං නු ඛො මං අජ්ජ අස්සදම්මසාරථී කාරණං කාරෙස්සති? කිමස්සාහං පතිකරොමී' ති? සො දොණියා බද්ධො න යවසං යවසන්ති ඣායති. භද්‍රො හි සන්ධ අස්සාජානීයො යථා ඉණං යථා බන්ධං[1] යථා ජානිං යථා කලිං, එවං පතොදස්ස අජ්ඣොහරණං සමනුපස්සති.

එවමෙව ඛො සන්ධ භද්‍රො පුරිසාජානීයො අරඤ්ඤගතොපි රුක්ඛමූලගතොපි සුඤ්ඤාගාරගතොපි න කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති න කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං පජානාති.

න ව්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති -පෙ- න ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති -පෙ- න උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති -පෙ- න විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති න විචිකිච්ඡාපරෙතෙන, උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං පජානාති. සො නෙව පඨවිං නිස්සාය ඣායති, න ආපං නිස්සාය ඣායති, න තෙජං නිස්සාය ඣායති න වායං නිස්සාය ඣායති, න ආකාසානඤ්චායතනං නිස්සාය ඣායති, න විඤ්ඤාණඤ්චායතනං නිස්සාය ඣායති, න ආකිඤ්චඤ්ඤායතනං නිස්සාය ඣායති, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නිස්සාය ඣායති, න ඉධ ලොකං නිස්සාය ඣායති, න පරලොකං නිස්සාය ඣායති. යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා. තම්පි නිස්සාය න ඣායති, ඣායති ච පන එවං ඣායිඤ්ච පන සන්ධ භද්‍රං පුරිසාජානීයං සඉන්ද දෙවා සබ්‍රහ්මකා සපජාපතිකා ආරකාව නමස්සන්ති:

න මො තෙ පුරිසාජඤ්ඤ - න මො තෙ පුරිසුත්තම
යස්ස තෙ නාභිජානාම - යම්පි නිස්සාය ඣායසී ති.

එවං වුත්තෙ ආයස්මා සන්ධො භගවන්තං එතදවොච:

1. බන්ධං - මජ්සං.

සන්ධයෙනි, භද්‍ර වූ ආජානෙයධ්‍යායිතය කෙසේ වේ ය යත්: සන්ධයෙනි, අශ්වාජානෙයයා සත්ත්වාහාර බහන දෙණ සමීපයෙහි බඳනාලද්දුයේ 'යවස, යවසැ'යි නො සිතන්නේ ය. එ කවර හෙයින යත්: සන්ධයෙනි, දෙණ සමීපයෙහි බඳනා ලද භද්‍ර වූ ආශ්වාජානෙයයාට මෙබඳු සිතෙක් වෙයි: අද මා ලවා අස්දම්සැරි කුමක් කරවන්නේ ද? ඕහට මම් අද කුමක් පෙරළා කරනෙම් ද?''යි (කියායි), හේ දෙණ හමුයෙහි බඳනා ලදුයේ 'යවස, යවසැ'යි නො සිතන්නේ ය. සන්ධයෙනි, භද්‍ර වූ අශ්වාජානෙයයා වනාහි ප්‍රතොදයාගේ අධ්‍යවහරණ සඞ්ඛ්‍යාත පතනය සාණ සදෘශ කොට බන්ධන සදෘශ කොට හානි සදෘශ කොට මහාපරාධ සදෘශ කොට මෙසේ මොනවට දක්නේ ය.

සන්ධයෙනි, එ පරිද්දෙන් ම භද්‍ර වූ පුරුෂාජානෙයයා වලට ගියේ වේවයි රුක්මුලට ගියේ වේව යි ශූන්‍යාගාරයට ගියේ වේවයි කාමරාග-යෙන් ගත් කාමරාගයෙන් මඩනා ලද සිතින් වාසය නො කරයි. උපන්නා වූ ද කාමරාගයාගේ නිඃසරණය ඇතිසැටියෙන් දන්නේ ය. ව්‍යාපාදයෙන් මඩනා ලද, සිතින් වාසය නො කෙරෙයි — ස්ත්‍යානමිද්ධයෙන් මඩනා ලද සිතින් වාසය නො කෙරෙයි — ඖද්ධත්‍යකෞකෘත්‍යයෙන් මඩනා ලද සිතින් වාසය නො කෙරෙයි— විචිකිත්සායෙන් මඩනා ලද විචිකිත්සායෙන් යටකළ සිතින් වාසය නො කරයි උපන්නා වූ ද විචිකිත්සාවගේ නිඃසරණය තතු සේ දන්නේ ය. හේ පෘථිවිය නිසා නො ම ධ්‍යාන කෙරෙයි, ආපය නිසා නොම ධ්‍යාන කෙරෙයි. තේජස් නිසා නොම ධ්‍යාන කෙරෙයි, වායු නිසා නොම ධ්‍යාන කෙරෙයි, ආකාසානඤ්චායතනය නිසා නො ම ධ්‍යාන කෙරෙයි, විඤ්ඤාණඤ්චායතනය නිසා නො ම ධ්‍යාන කෙරෙයි, ආකිඤ්චඤ්ඤායතනය නිසා නො ම ධ්‍යාන කෙරෙයි. නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය නිසා නොම ධ්‍යාන කෙරෙයි, ඉහලොකය නිසා නොම ධ්‍යාන කෙරෙයි, පරලොකය නිසා නො ම ධ්‍යාන කෙරෙයි. යම් ප්‍රාප්ත පර්යේෂිත මනසින් අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤානයෙක් වේ නම් එ ද නිසා නො ම ධ්‍යාන කෙරෙයි. එතෙකුදුවත් ධ්‍යාන කෙරෙයි. සන්ධයෙනි, භද්‍ර වූ පුරුෂාජානෙයයා ඉන්ද්‍රයා සහිත බ්‍රහමයා සහිත ප්‍රජාපති සහිත දෙවියෝ දුරදී ම නමදනාහ:

''යම් ම අරමුණක් නිසා ධ්‍යානය කරහු නම් තොපගේ එ අරමුණ නො දනුමෝ නම්, පුරුෂජානෙයයෙනි. තොපට නමස්කාර වේවා, පුරුෂොත්තමයෙනි තොපට නමස්කාර වේවා''යි.

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් සන්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්-සේට තෙල කරුණ සැලකළහ.

කථං ඣායී පන භන්තෙ භද්‍රො[1] පුරිසාජානීයො ඣායති, සො නෙව පඨවිං නිස්සාය ඣායති, න ආපං නිස්සාය ඣායති, න වායං නිස්සාය ඣායති, න ආකාසානඤ්චායතනං නිස්සාය ඣායති න විඤ්ඤාණඤ්චායතනං නිස්සාය ඣායති. න ආකිඤ්චඤ්ඤායතනං නිස්සාය ඣායති, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නිස්සාය ඣායති න ඉධලොකං නිස්සාය ඣායති, න පරලොකං නිස්සාය ඣායති. යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිස්සාය ඣායති, න ඣායති ච පන කථං ඣායිඤ්ච පන භන්තෙ භද්‍රං පුරිසාජානීයං සඉන්ද දෙව සබ්‍රහ්මකා සපජාපතිකා ආරකාව නමස්සන්ති?

නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම
යස්ස තෙ නාභිජානාම - යම්පි නිස්සාය ඣායසී ති.

ඉධ සන්ධ භද්‍රස්ස පුරිසාජානීයස්ස පඨවියා[1] පඨවිසඤ්ඤා විභූතා හොති, අපස්මිං ආපොසඤ්ඤා විභූතා හොති, තෙජස්මිං තෙජොසඤ්ඤා විභූතා හොති වායස්මිං වායොසඤ්ඤා විභූතා හොති ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤා විභූතා හොති විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා විභූතා හොති, ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා විභූතා හොති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤා විභූතා හොති, ඉධ ලොකෙ ඉධලොකසඤ්ඤා විභූතා හොති, පරලොකෙ පරලොකසඤ්ඤා විභූතා හොති. යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තත්‍රාපි සඤ්ඤා විභූතා හොති එවං ඣායී ඛො සන්ධ භද්‍රො පුරිසාජානීයො නෙව පඨවිං නිස්සාය ඣායති, න ආපං, නිස්සාය ඣායති, න තෙජං නිස්සාය ඣායති න වායං නිස්සාය ඣායති න ආකාසානඤ්චායතනං නිස්සාය ඣායති. න විඤ්ඤාණඤ්චායතනං නිස්සාය ඣායති, න ආකිඤ්චඤ්ඤායතනං නිස්සාය ඣායති, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නිස්සාය ඣායති, න ඉධලොකං නිස්සාය ඣායති, න පරලොකං නිස්සාය ඣායති, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිස්සාය න ඣායති, ඣායති ච පන එවං ඣායිඤ්ච පන සන්ධ භද්‍රං පුරිසාජානීයං සඉන්ද දෙවා සබ්‍රහ්මකා සපජාපතිකා ආරකාව නමස්සන්ති:

නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම
යස්ස තෙ නාභිජානාම - යම්පි නිස්සාය ඣායසීති.

1. පඨවියං - මජසං.

වහන්ස, ධ්‍යාන කරන සුලු භද්‍ර වූ ඒ පුරුෂාජානෙයයා පෘථිවිකෘත්ස්නය නිසා ධ්‍යාන නො කරන්නේ නම් ආපය නිසා ධ්‍යාන නොකරන්නෝ නම් තෙජස් නිසා ධ්‍යාන නො කරන්නේ නම්, වායු නිසා ධ්‍යාන නො කරන්නේ නම් ආකාසානඤ්චායතනය නිසා ධ්‍යාන නො කරන්නේ නම්, විඤ්ඤාණඤ්චායතනය නිසා ධ්‍යාන නො කරන්නේ නම්, ආකිඤ්චඤ්ඤායතනය නිසා ධ්‍යාන නො කරන්නේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නිසා ධ්‍යාන නො කරන්නේ නම් ඉහ ලොකය නිසා ධ්‍යාන නො කරන්නේ නම්, පරලොකය නිසා ධ්‍යාන නො කරන්නේ නම්. යම් ප්‍රාප්ත වූ පර්යේෂිත වූ මනසින් අනුවිචරිත වූ දිට්ඨ සුත, මුත, විඤ්ඤාතයෙක් වේ නම් එද නිසා ධ්‍යාන නො කෙරේ නම් වැලි ධ්‍යාන කරන්නේත් වේ නම්, කෙසේ නම් ධ්‍යාන කරන්නේ ද, වහන්ස, කෙසේ ධ්‍යාන කරන සුලු පුරුෂාජානෙයයා ඉන්ද්‍රයා සහිත බ්‍රහමයා සහිත ප්‍රජාපති සහිත දෙවියෝ දුරදී ම නමස්කාර කරන්නාහු ද?

'යම් ම අරමුණක් නිසා ධ්‍යාන කරන්නහු නම්, තොපගේ අරමුණ නො දනුමෝ නම්, පුරුෂාජානෙයයෙනි, තොපට නමස්කාර වේවා, පුරුෂොත්තමය, තොපට නමස්කාර වේවා''යි.

සන්ධයෙනි, මෙ සස්නෙහි භද්‍ර වූ පුරුෂාජානෙයයාහට ප්‍රෘථිවිකෘත්ස්න යෙහි (චතුෂ්ක, පඤ්චක) පෘථිවිධ්‍යානසංඥව ප්‍රකට වෙයි. ආපයෙහි ආප්-සංඥාව ප්‍රකට වෙයි. තෙජස්හි තෙජස්සංඥාව ප්‍රකට වෙයි. වායුයෙහි වායු සංඥාව ප්‍රකට වෙයි. ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතන සංඥාව ප්‍රකට වෙයි. විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතන සංඥව ප්‍රකට වෙයි. ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතන සංඥාව ප්‍රකට වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන-සංඥාව ප්‍රකට වෙයි. ඉහලොකයෙහි ඉහලොකසංඥාව ප්‍රකට වෙයි, පර-ලොකයෙහි පරලොක සංඥාව ප්‍රකට වෙයි. යම් මේ ප්‍රාප්ත පර්යේෂිත මනසින් අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් වේ නම් එහි දූ සංඥාව ප්‍රකට වෙයි. සන්ධයෙනි, මෙසේ සිතන සුලු භද්‍ර වූ පුරුෂාජානෙය තෙම පෘථිවිය නිසා ම ධ්‍යාන නො කරන්නේය, ආපය නිසා නොම ධ්‍යාන කරන්නේ ය. තේජස් නිසා නොම කරන්නේ ය: වායු නිසා නොම ධ්‍යාන කරන්නේය, ආකාසානඤ්චායතනය නිසා නොම ධ්‍යාන කරන්නේය, විඤ්ඤාණඤ්චායතනය නිසා නො ම ධ්‍යාන කරන්නේය, ආකිඤ්චඤ්ඤා-යතනය නිසා නොම ධ්‍යාන කරන්නේය, නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනය නිසා නො ම ධ්‍යාන කරන්නේය, ඉහ ලොකය නිසා නොම ධ්‍යාන කරන්නේය, පරලොකය නිසා නො ම ධ්‍යාන කරන්නේය. යම් මේ ප්‍රාප්ත පර්යේෂිත මනසින් අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් වේ නම් එ ද නිසා ධ්‍යාන කරන්නේය. ධ්‍යාන නො කරනුයේ ද වේ. සන්ධයෙනි මෙසේ ධ්‍යාන කරන සුලු භද්‍ර වූ පුරුෂාජානෙයයා ඉන්ද්‍රයා සහිත බ්‍රහමයා සහිත, ප්‍රජාපති සහිත දෙවියෝ දුරදීම

''යම් අරමුණක් නිසා ධ්‍යාන කරනෙහි නම් තොපගේ ඒ ධ්‍යානා-රම්මණය නොදන්මෝ නම්, පුරුෂාජානෙයයෙනි, එ තොපට නමස්කාර වේවා, පුරුෂොත්තමය, එ තොපට නමස්කාර වේවා''යි නමස්කාර කරන්නාහ.

## 11. 1. 10

## මොරනිවාප සුත්තං

එකං සමයං භගවා රාජගහෙ විහරති මොරනිවාපෙ පරිබ්බාජකාරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං. කතමෙහි තීහි: අසෙඛෙන සීලක්ඛන්ධෙන අසෙඛෙන සමාධික්ඛන්ධෙන අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං.

අපරෙහිපි භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං. කතමෙහි තීහි: ඉද්ධිපාටිහාරියෙන, ආදෙසනාපාටිහාරියෙන අනුසාසනීපාටිහාරියෙන. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං.

අපරෙහිපි භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං, කතමෙහි තීහි: සම්මාදිට්ඨියා, සම්මාඤාණෙන, සම්මා විමුත්තියා ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති, අච්චන්තයොගක්ඛෙමී, අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං.

# 2. අනුස්සති වර්ගය

## 11. 1. 10

## මොරනිවාප සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි වූ මොර නිවාප නම් වූ පරිව්‍රාජකාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍ය වතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:

මහණෙනි, කරුණු තුනෙකින් සමන්වාගත මහණ අතික්‍රාන්ත (ක්ෂයවය සඞ්ඛ්‍යාත) අන්තවත් නිෂ්ඨා (නිර්වාණ) ඇතියේ අත්‍යන්ත යොග ක්ෂේම ඇතියේ අත්‍යන්තයෙන් බ්‍රහ්මචාරීවූයේ අත්‍යන්තපර්‍ය්‍යවසාන ඇතියේ දෙව් මිනිස්නට ශ්‍රේෂ්ඨ වූයේ වෙයි. කවර තුනෙකින යත්: අශෛක්ෂශීලස්කන්ධයෙන, අශෛක්ෂ සමාධි ස්කන්ධයෙන, අශෛක්ෂ ප්‍රඥාස්කන්ධයෙනැයි. මහණෙනි, මේ තුන් කරුණෙන් සමන්වාගත මහණ අත්‍යන්ත නිෂ්ඨ වූයේ අත්‍යන්ත යොගක්ෂේම ඇතියේ අත්‍යන්ත බ්‍රහ්මචාරී වූයේ අත්‍යන්තපර්‍ය්‍යවසාන ඇතියේ දෙව් මිනිස්නට ශ්‍රේෂ්ඨ වෙයි.

මහණෙනි, අනෙකුදු තුන් කරුණෙකින් සමන්වාගත මහණ අත්‍යන්ත නිෂ්ඨා ඇතියේ අත්‍යන්තයොගක්ෂේම ඇතියේ අත්‍යන්ත බ්‍රහ්මචාරී වූයේ අත්‍යන්තපර්‍ය්‍යවසාන ඇතියේ දෙව් මිනිස්නට ශ්‍රේෂ්ඨ වෙයි. කවර තුනෙකින යත්: ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන, ආදෙශනා ප්‍රාතිහාර්‍ය්‍යයෙන, අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍යයෙනැයි. මහණෙනි, මෙ තුන් කරුණෙන් සමන්වාගත මහණ අත්‍යන්තනිෂ්ඨා ඇතියේ අත්‍යන්ත යොග ක්ෂේම ඇතියේ අත්‍යන්ත බ්‍රහ්මචාරී වූයේ අත්‍යන්ත පර්‍ය්‍යවසාන ඇතියේ දෙව් මිනිස්නට ශ්‍රේෂ්ඨ වෙයි.

මහණෙනි, අනෙකුදු තුන් කරුණෙකින් සමන්වාගත මහණ අත්‍යන්ත නිෂ්ඨා ඇතියේ අත්‍යන්තයොගක්ෂේම ඇතියේ අත්‍යන්ත බ්‍රහ්මචාරී වූයේ අත්‍යන්තපර්‍ය්‍යවසාන ඇතියේ දෙව්මිනිස්නට ශ්‍රේෂ්ඨ වෙයි. කවර තුනෙකින යත්: සම්‍යග්දෘෂ්ටියෙන, සම්‍යග් ඥානයෙන, සම්‍යග්විමුක්තියෙනැයි. මහණෙනි, මෙ කරුණු තුනින් සමන්වාගත මහණ අත්‍යන්තනිෂ්ඨා ඇතියේ අත්‍යන්තයොගක්ෂේම ඇතියේ අත්‍යන්තබ්‍රහ්මචාරී වූයේ අත්‍යන්ත පර්‍ය්‍යවසාන ඇතියේ දෙව් මිනිස්නට ශ්‍රේෂ්ඨ වෙයි.

ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං. කතමෙහි ද්වීහි; විජ්ජාය ච චරණෙන ච. ඉමෙහි ඛො භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අච්චන්තනිට්ඨො හොති අච්චන්තයොගක්ඛෙමී අච්චන්තබ්‍රහ්මචාරී අච්චන්තපරියොසානො සෙට්ඨො දෙවමනුස්සානං.

බ්‍රහ්මුනා පෙසා භික්ඛවෙ සනංකුමාරෙන ගාථා භාසිතා:

ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං – යෙ ගොත්තපටිසාරිනො
විජ්ජාචරණසම්පන්නො – සො සෙට්ඨො දෙවමානුසෙති.

සා ඛො පනෙසා භික්ඛවෙ බ්‍රහ්මුනා සනංකුමාරෙන ගාථා සුගීතා, නො දුග්ගීතා සුභාසිතා නො දුබ්භාසිතා, අත්ථසංහිතා නො අනත්ථසංහිතා අනුමතා මයා. අහම්පි භික්ඛවෙ එවං වදාමි.

ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං – යෙ ගොත්තපටිසාරිනො
විජ්ජාචරණසම්පන්නො – සො සෙට්ඨො දෙවමානුසෙති.

නිස්සයවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

කිමත්ථියා චෙතනා තයො – උපනිසා ව්‍යසනෙන ච
දෙව සඤ්ඤා මනසිකාරො සද්ධා මොරනිවාපකන්ති.

මහණෙනි, කරුණු දෙකෙකින් සමන්වාගත මහණ අත්‍යන්ත නිෂ්ඨා ඇතියේ අත්‍යන්ත යොගක්ෂේම ඇතියේ අත්‍යන්තබ්‍රහ්මචාරී වූයේ අත්‍යන්ත පය්‍යීවසාන ඇතියේ දෙව් මිනිස්නට ශ්‍රේෂ්ඨ වෙයි. කවර දෙකෙකින යත්: විද්‍යායෙන, චරණයෙනැයි. මහණෙනි, මෙ දෙකරුණෙන් සමන්වාගත මහණ අත්‍යන්ත නිෂ්ඨා ඇතියේ අත්‍යන්තයොගක්ෂේම ඇතියේ අත්‍යන්ත බ්‍රහ්මචාරී වූයේ අත්‍යන්තපය්‍යීාවසාන ඇතියේ දෙව් මිනිස්නට ශ්‍රේෂ්ඨ වෙ යි.

මහණෙනි, සනංකුමාර බ්‍රහ්ම විසිනුදු තෙල ගාථා භාෂිත වෙයි:

''යමෙක් තූමූ ගොත්‍රප්‍රතිසාරී වෙත් නම්, එ මහාජනයා අතුරෙහි ක්ෂත්‍රිය තෙමේ ශ්‍රේෂ්ඨ වෙයි. විද්‍යායෙන් හා චරණධම්යෙන් සම්පන්න ඒ ක්ෂීණාස්‍රව බුදුහු දෙව් මිනිසුන් අතුරෙහි ශ්‍රේෂ්ඨ වෙති''යි.

මහණෙනි, සනංකුමාර බ්‍රහ්මයා විසින් තෙල ගාථා තොමෝ දූර්ගීත නොව සුගීත වෙයි. දූර්භාෂිත නොව සුභාෂිත ය. අනර්ථ සංහිත නොව අර්ථ සංහිත ය, මා විසින් අනුමත ද වෙයි. මහණෙනි, මම්දු මෙසේ කියමි:

යම් කෙනෙක් ගොත්‍රප්‍රතිසාරී වෙත් නම්, එ බදු ජනයා අතුරෙහි ක්ෂත්‍රිය තෙමෙ ශ්‍රේෂ්ඨ ය, විද්‍යායෙන් හා චරණ ධම්යෙන් සම්පන්න එ ක්ෂීණාස්‍රව මුනිහු දෙව්මිසුන් අතුරෙහි ශ්‍රේෂ්ඨ වෙතැ''යි.

## ප්‍රථම නිසසය වග්ගය යි.

**එහි උද්දානය:**

කිමත්ථිය, චෙතනා යන සූත්‍ර දෙක ය උපනිසා සූත්‍ර තුනෙක, බ්‍යසන සූත්‍ර ය, සඤ්ඤා සූත්‍ර දෙක ය, මනසිකාර සූත්‍ර ය, සන්ධ සූත්‍ර ය, මොරනිවාප සූත්‍ර ය දැ යි දසයෙකි.

# 2. අනුස්සතිවග්ගො

## 11. 2. 1

### මහානාම සුත්තං

එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති, 'නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති. අස්සොසි ඛො මහානාමො සක්කො සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති 'නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච:

සුතං මෙ තං භන්තෙ 'සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති. තෙසං නො භන්තෙ නානාවිහාරෙහි විහරතං කෙනස්ස[1] විහාරෙන විහාතබ්බන්ති?

සාධු සාධු මහානාම, එතං ඛො මහානාම තුම්හාකං පතිරූපං කුලපුත්තානං යං තුම්හෙ තථාගතං උපසංකමිත්වා පුච්ඡෙය්‍යාථ, 'තෙසං නො භන්තෙ නානා විහාරෙහි විහරතං කෙනස්ස විහාරෙන විහාතබ්බ''න්ති.

සද්ධො ඛො මහානාම ආරාධකො හොති නො අස්සද්ධො, ආරද්ධ-විරියො ආරාධකො හොති, නො කුසීතො; උපට්ඨිතසති ආරාධකො හොති, නො මුට්ඨස්සති; සමාහිතො ආරාධකො හොති, නො අසමාහිතො පඤ්ඤවා ආරාධකො හොති නො දුප්පඤ්ඤො. ඉමෙසු ඛො ත්වං මහානාම පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය ඡධම්මෙ උත්තරිං භාවෙය්‍යාසි.

ඉධ ත්වං මහානාම තථාගතං අනුස්සරෙය්‍යාසි, 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති.

---

1. කෙන –ස්‍යා

# 11. 2. 1

## මහානාම සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි **කපිලවත්** සමීපයෙහිවූ **නිග්‍රොධාරාමයේ** වසන සේක. එකල්හි **බොහෝ** වහන් දැ "භාග්‍යවතුන් වහන්සේ නිමහම් කළ සිවුරු ඇතිසේක් තෙමස් ඇවෑමෙන් චාරිකාවට වඩනාහ"යි භාග්‍යවතුන් වහන්සේට සිවුරුකම් කරන්නාහ. මහානාම ශාක්‍ය තෙමේ "භාග්‍යවතුන් වහන්සේ නිමහම් කළ සිවුරු ඇති සේක් තෙමස් ඇවෑමෙන් චාරිකාවට බැහැර වඩනාහ"යි බොහෝ වහන්දැ භාග්‍යවතුන් වහන්සේට සිවුරුකම් කරන්නාහයි ඇසුයේ ය. ඉක්බිති මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍ය–වතුන්වහන්සේ සකසා වැඳ එකත්පස් ව හින. එකත්පස් ව හුන් මහානාම ශාක්‍ය තෙම භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ කීය:

වහන්ස, "භාග්‍යවතුන් වහන්සේ නිමහම් කළ සිවුරු ඇතිසේක් තෙමස් ඇවෑමෙන් චාරිකාවට බැහැර වඩනාහ"යි බොහෝ වහන්දැ භාග්‍යවතුන් වහන්සේට සිවුරුකම් කරන්නාහයි මෙල පුවත මා විසින් අසන ලදී, වහන්ස, නානා විහරණයෙන් වසන එ අප විසින් කවර විහරණයෙකින් විසිය යුතු වේ දැ යි.

මහානාමයෙනි, මැනැව, මැනැව යම් හෙයෙකින්, තෙපි තථාගතයන් කරා එළඹ 'වහන්ස, නානාවිහරණයෙන් වසන අප විසින් කවර නම් විහරණයෙකින් විසියයුතු වේදැ"යි පුළුවුස්නවූ නම්, මහානාමයෙනි, මෙල කරුණ කුලපුත් වන තොපට නිසි වේ මැ ය.

මහානාමයෙනි, සැදැහැතියේ ම ආරාධක වෙයි, සැදැහැ නැතියේ නො වෙයි, ආරද්ධවීය්‍ය්‍ය වූයේ ම ආරාධක වෙයි, කුසීතයා නො වේ. එළඹ සිටි සිහි ඇතියේ ම ආරාධක වෙයි, නට සිහි ඇතියේ නො වේ. (උපචාරාර්පණ විසින්) එකඟ සිත් ඇතියේ ම ආරාධක වෙයි, අසමාහිතයා නො වේ. (විදර්ශනා මාර්ග ප්‍රඥායෙන්) පැණැතියේ ම ආරාධක වෙයි, දුෂ්ප්‍රාඥ නො වේ. මහානාමයෙනි, තෝ මෙ පඤ්චධර්මයන්හි පිහිටා මතුයෙහි ෂඩ් ධර්ම කෙනෙකුන් වඩන්නෙහි.

මහානාමයෙනි. තෝ මෙ විසාහි 'මෙ කරුණිනිදු' ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිද්හ, අනුත්තරපුරුෂදම්‍යසාරථීහ. දෙව්මිනිස්නට ශාස්තෘවහ, බුද්ධහ, භගවත්හ'යි තථාගතයන් (ගුණ විසින්) සිහිකරන්නෙහි.

යස්මිං මහානාම සමයෙ අරියසාවකො තථාගතං අනුස්සරති නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති. තථාගතං ආරබ්භ උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං පමුදිතස්ස පිති ජායති, පිතමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතසමාපන්නො බුද්ධානුස්සතිං භාවෙති.

පුනචපරං ත්වං මහානාම ධම්මං අනුස්සරෙය්‍යාසි, 'ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති යස්මිං මහානාම සමයෙ අරියසාවකො ධම්මං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති ධම්මං ආරබ්භ, උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං, පමුදිතස්ස පීති ජායති, පීතමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති, අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතසමාපන්නො ධම්මානුස්සතිං භාවෙති.

පුනචපරං ත්වං මහානාම සඞ්ඝං අනුස්සරෙය්‍යාසි, 'සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා. එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති.

මහානාමයෙනි, යම් කලෙක අරිසවු තථාගතයන් සිහි කෙරේද, එ සමයෙහි ඔහට රාගයෙන් මඩනා ලද සිත් නො වෙයි. දොෂයෙන් මඩනා ලද සිත් නො වෙයි. මොහයෙන් මඩනාලද සිත් නො වෙයි. එ සමයෙහි ඔහුගේ සිත තථාගතයන් ඇරැබ ඍජුගත ම වෙයි. මහානාමයෙනි, ඍජු ව ගිය සිත් ඇති අරිසවු අර්ථකථා නිඃශ්‍රිත ප්‍රීති ප්‍රමොදය ලබයි (පෙළදම් නිසා උපදනා) ධර්ම වෙදය ලබයි. ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබයි. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදී. පිනාගිය සිතැත්තහුගේ නාමකාය හා කරජකායය සංහිදෙයි. සන්හුන් කය ඇතියේ කායික චෛතසික සුවය විඳී. සුව ඇතියහුගේ සිත එකඟ වෙයි, මහානාමයෙනි, මෙ අරිසවූ (රාගදොෂ මොහයෙන්) විෂමගත සත්ත්වයන් අතුරෙහි ව්‍යුපශමයට පැමිණියේ වාසය කෙරේ යි ද දුක් සහිත සත්ත්වයන් අතුරෙහි නිදුක් ව වාසය කෙරේ යි ද විදර්ශනා සඞ්ඛ්‍යාත ධර්මස්‍රොතසට පැමිණියේ බුද්ධානුස්මෘතිය වඩනේ යි ද කියනු ලැබේ.

තවද, මහානාමයෙනි, තෙපි ''භාග්‍යවතුන් වහන්සේ විසින් (සපර්‍යාප්තික නව ලොකොත්තර) ධර්මය ස්වාඛ්‍යාත ය, සාන්දෘෂ්ටික ය, අකාලික ය, එහිපස්සික ය, ඖපනයික ය, විඥයන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුත්තේ ය''යි ධර්මය සිහි කරවු, මහානාමයෙනි, යම් කලෙක අරිසවු ධර්මය සිහි කෙරේ ද, එ සමයෙහි ඔහට රාගයෙන් මඩනා ලද සිත් නො වෙයි, දොෂයෙන් මඩනා ලද සිත් නො වෙයි, මොහයෙන් මඩනා ලද සිත් නො වෙයි, එසමයෙහි ඔහුගේ සිත ධර්මය ඇරැබැ ඉදුරා ගියේ ම වෙයි,මහානාමයෙනි, ඍජු ව ගිය සිතැති අරිසවු අර්ථවෙදය ලබයි,ධර්මවෙද ලබයි, ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබයි, ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදයි, ප්‍රීතියුක්ත සිත් ඇතියහුගේ (ද්විවිධ) කය සන්හිදෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳුනේය. සුව ඇතියහුගේ සිත එකඟ වෙයි. මහානාමයෙනි, මේ අරිසවු විෂමගත ප්‍රජාසඞ්ඛ්‍ය සත්ත්වයන් අතුරෙහි ව්‍යුපශමයට පැමිණියේ වාසය කෙරේ යයි ද දුක්සහිත සත්ත්වයන් අතුරෙහි නිදුක් ව වාසය කෙරේ යයි ද ධර්ම ස්‍රොතසට පැමිණියේ ධර්මානුස්මෘතිය වඩනෝ යයි ද කියනු ලැබේ.

තවද මහානාමයෙනි, තෙපි භාග්‍යවත්හුගේ (අෂ්ටාර්‍ය්‍ය පුද්ගලසඞ්ඛ්‍යාත) ශ්‍රාවක සඞ්ඝ තෙම සුප්‍රතිපන්න ය, භාග්‍යවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ තෙම ඍජු ප්‍රතිපන්න ය, භාග්‍යවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ තෙම න්‍යාය ප්‍රතිපන්න ය, භාග්‍යවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ තෙම සාමීචිප්‍රතිපන්න ය, යම්බඳු සතර පුරුෂයුග කෙනෙක්. අෂ්ටපුරුෂපුද්ගල කෙනෙක් වෙත් නම් භාග්‍යවත්හුගේ තෙල ශ්‍රාවකසඞ්ඝයා ආහුනාර්හ වෙයි, ප්‍රාඝුණාර්හ වෙයි, දක්ෂිණාර්හ වෙයි, අඤ්ජලිකරණාර්හ වෙයි, ලොකයාහට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර වේ''යයි සඞ්ඝයා සිහි කරවු.

යස්මිං මහානාම සමයෙ අරියසාවකො සඞ්ඝං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොස -පෙ- න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති සඞ්ඝං ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති. ධම්මසොතසමාපන්නො සඞ්ඝානුස්සතිං භාවෙති.

පුනචපරං ත්වං මහානාම අත්තනො සීලානි අනුස්සරෙය්‍යාසි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි. යස්මිං මහානාම සමයෙ අරියසාවකො සීලං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොස පරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති සීලං ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති,සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතසමාපන්නො සීලානුස්සතිං භාවෙති.

පුනචපරං ත්වං මහානාම අත්තනො චාගං අනුස්සරෙය්‍යාසි, ‘ලාභා වත මෙ, සුලද්ධං වත මෙ, යොහං මච්ඡෙරමලපරියුට්ඨිතාය පජාය විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසාමි මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො’ති.

මහානාමයෙනි, යම් කලෙක්හි අරිසවු සඞ්ඝයා සිහි කෙරේ නම්, ඔහට එකල්හි රාගයෙන් මඩනාලද සිත් නො වෙයි. ද්වෙෂයෙන් මඩනා ලද සිත් නො වෙයි. මොහයෙන් මඩනා ලද නො වෙයි. එසමයෙහි ඔහුගේ සිත සඞ්ඝයා ඇරබැ සෘජු ව ගියේ ම වෙයි. මහානාමයෙනි, සෘජු ව ගිය සිතැති අරිසවු අර්ථවෙද ලබයි, ධර්මවෙද ලබයි, ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබයි, ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදී ප්‍රීත සිතැත්තහුගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ය. සුව ඇතියහුගේ සිත සමාධිගත වෙයි. මහානාමයෙනි. මෙ ආර්‍යශ්‍රාවක විෂමගත ප්‍රජායෙහි සමප්‍රාප්ත වූයේ වාසය කෙරේ යයි ද දුක් සහිත ප්‍රජායෙහි නිදුක්ව වාසය කෙරේ යයි ද ධර්මස්‍රොතයට පැමිණියේ සඞ්ඝානුස්මෘතිය වඩනේ යයි ද කියනු ලැබෙ.

තවද මහානාමයෙනි, තෙපි නො කඩ වූ සිකපද ඇති , (මැද නො බුන් සිකපද ඇති හෙයින් නොසිදුරු ඇති, (අනුපිළිවෙළින් නො බුන් සිකපද ඇති හෙයින්) අගබල වූ (තන්හි තන්හි බුන් සිකපද නැති හෙයින්) අකල්මාෂ වූ (තෘෂ්ණාදසව්‍යයෙන් මුදන හෙයින්) භුජිස්‍ය වූ (බුද්ධාදි) විඥයන් විසින් පසස්නාලද (තෘෂ්ණාදෘෂ්ටි, ආදියෙන්) අපරාමෘෂ්ට වූ සමාධිය පිණිස පවත්නා තමාගේ සිල් සිහි කරව. මහානාමයෙනි, යම් කලෙක් හි අරිසවු සිල් සිහි කෙරේ ද, එකල්හි ඔහට රාගයෙන් මඩනාලද සිත් නො වේ, ද්වෙෂයෙන් මඩනාලද සිත් නො වේ, මොහයෙන් මඩනාලද සිත් නො වේ. එසමයෙහි ඔහුගේ සිත ශීලය ඇරබ සෘජු ව ගියේ ම වෙයි. මහානාමයෙනි, සෘජු ව ගිය සිතැති අරිසවු තෙමෙ අර්ථවෙදය ලබයි. ධර්මවෙදය ලබයි, ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබයි. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදියි, ප්‍රීතියෙන් යුත් සිතැත්තාහුගේ කය සන්හිඳෙයි, සන්හුන් කය ඇතියේ සුඛ විඳුනේය, සුව ඇතියහුගේ සිත එකඟ වෙයි. මහානාමයෙනි, මේ අරිසවු විෂමගත ප්‍රජායෙහි සමප්‍රාප්ත වූයේ වාසය කරනේ යයි ද දුක් සහිත ප්‍රජායෙහි නිදුක් වූයේ වාසය කරනේ යයි ද ධර්මස්‍රොතසට පැමිණියේ ශීලානුස්මෘතිය වඩනේ යයි ද කියනු ලැබේ.

තවද මහානාමයෙනි, තෙපි "මම මසුරු මලින් මඩනාලද ප්‍රජායෙහි විගතමලමාත්සර්‍ය ඇති සිතින් මුක්තත්‍යාග ඇතියෙම් දෙවූ අත් ඇතියෙම් දීමෙහි ඇලුණෙම් යාචනාවට නිසියෙම් දනසංවිභාගයෙහි ඇලුණෙම් වෙම් ද (එය) එකැතින් මට ලාභයෙකි. එකැතින් මට මනා-ලාභයෙකි" යි. තමාගේ ත්‍යාගය සිහි කරව.

යස්මිං මහානාම සමයෙ අරියසාවකො චාගං අනුස්සරති. නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොස පරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති චාගං ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති, සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති, ධම්මසොතසමාපන්නො චාගානුස්සතිං භාවෙති.

පුනචපරං ත්වං මහානාම දෙවතා අනුස්සරෙය්‍යාසි, 'සන්ති දෙවා චාතුම්මහාරාජිකා, සන්ති දෙවා තාවතිංසා, සන්ති දෙවා යාමා, සන්ති දෙවා තුසිතා සන්ති දෙවා නිම්මාණරතිනො, සන්ති දෙවා පරනිම්මිත-වසවත්තිනො, සන්ති දෙවා බ්‍රහ්මකායිකා, සන්ති දෙවා තතුත්තරිං යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති. යථාරූපෙන සීලෙන සමන්නාගතා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපං සීලං සංවිජ්ජති. යථාරූපෙන සුතෙන සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපං සුතං සංවිජ්ජති. යථාරූපෙන චාගෙන සමන්නාගතා, තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපො චාගො සංවිජ්ජති. යථාරූපාය පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජතී''ති.

යස්මිං මහානාම සමයෙ අරියසාවකො අත්තනො ච තාසඤ්ච දෙවතානං සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති දෙවතා ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං. පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදියති., සුඛිනො චිත්තං සමාධියති. අයං වුච්චති මහානාම අරියසාවකො විසමගතාය පජාය සමප්පත්තො විහරති. සබ්‍යාපජ්ඣාය පජාය අබ්‍යාපජ්ඣො විහරති ධම්මසොතසමාපන්නො දෙවතානුස්සතිං භාවෙති'ති.

මහානාමයෙනි, යම් කලෙක්හි අරිසවු ත්‍යාගය සිහි කෙරේ ද, එසමයෙහි ඔහට රාගයෙන් මැඩුණු සිත් නො වේ. ද්වෙෂයෙන් මැඩුණු සිත් නො වේ. මොහයෙන් මැඩුණු සිත් නො වේ. එසමයෙහි ඔහුගේ සිත ත්‍යාගය ඇරබ ඍජුගත වෙයි. මහානාමයෙනි, ඍජුගත සිත් ඇති අරිසවු තෙම අර්ථවෙදය ලබනේ ය. ධර්මවෙදය ලබනේ ය. ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබනනේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදනේ ය, ප්‍රීතියෙන් යුත් සිතැත්තහුගේ කය සන්හිඳෙයි, සන්හුන් කය ඇතියේ සුබ විඳුනේ යැ. සුබ ඇතියහුගේ සිත එකඟ වෙයි. මහානාමයෙනි, මේ අරිසවු විෂමගත ප්‍රජායෙහි සමප්‍රාප්ත වූයේ වාස කෙරේ යයි ද දුක් සහිත ප්‍රජායෙහි නිදුක් ව වාස කෙරේ යයි ද ධර්මස්‍රොතසට පැමිණියේ ත්‍යාගානුස්මෘති වඩනේ යයි ද කියනු ලැබේ.

තවද මහානාමයෙනි, තෙපි "චාතුර්මහාරාජික දෙවියෝ ඇත තාවතිංස දෙවියෝ ඇත, යාමදෙවියෝ ඇත. නිර්මාණරති දෙවියෝ ඇත, පරනිර්මිත-වශවර්ති දෙවියෝ ඇත, බ්‍රහ්මකායික දෙවියෝ ඇත, ඉන් මතුයෙහිදු දෙවියෝ ඇත. යම්බඳු ශ්‍රද්ධායෙකින් සමන්වාගත එ දෙවතාවෝ මෙයින් ච්‍යුත ව එහි උපන්නාහු නම් මට ද එබඳු ශ්‍රද්ධායෙක් විද්‍යමාන ය. යම්බඳු ශීලයෙකින් සමන්වාගත එ දෙවතාවෝ මින් ච්‍යුත වූවාහු එහි උපන්නාහු නම් මට ද එබඳු සිල් විද්‍යමාන ය. යම්බඳු ශ්‍රැතයෙකින් සමන්වාගත ඒ දෙවතාවෝ මෙයින් ච්‍යුත ව එහි උපන්නාහු නම් මට ද එබඳු ශ්‍රැතයෙක් විද්‍යමාන ය. යම්බඳු ත්‍යාගයෙකින් සමන්වාගත ඒ දෙවතාවෝ මෙයින් ච්‍යුත වූවාහු එහි උපන්නාහු නම් මට ද එබඳු ත්‍යාගයෙක් විද්‍යමාන ය. යම්බඳු ප්‍රඥයෙකින් සමන්වාගත ඒ දෙවතාවෝ මෙයින් ච්‍යුත වූවාහු එහි උපන්නාහු නම් මට ද එබඳු ප්‍රඥයෙක් විද්‍යමාන ය"යි දෙවතාවන් අනුස්මරණය කරන්නාව යි.

මහානාමයෙනි, යම් කලෙක අරිසවු තමන්ගේ ඒ දේවතාවන්ගේ ද ශ්‍රද්ධා හා ශීල හා ශ්‍රැත හා ත්‍යාග හා ප්‍රඥ හා සිහි කෙරේ නම් එකල්හි ඔහට රාගයෙන් මැඩුණු සිත් නො මැ වේ. ද්වෙෂයෙන් මැඩුණු සිත් නො මැ වේ. මොහයෙන් මැඩුණු සිත් නො මැ වේ. එ සමයෙහි ඔහුගේ සිත දෙවියන් ඇරබ ඍජුගත ම වෙයි. මහානාමයෙනි, ඍජු සිත් ඇති අරිසවු අර්ථවෙදය ලබනේ ය. ධර්මවෙදය ලබනේ ය. ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබනේ ය. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදී. ප්‍රීතමනස් ඇතියහුගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ය. සුබ ඇතියහුගේ සිත සමාධිගත වෙයි. මහානාමයෙනි, මේ අරිසවු විෂමගත ප්‍රජායෙහි සමප්‍රාප්ත ව වෙසේ යයි ද දුක් සහිත ප්‍රජායෙහි නිදුක් ව වෙසේ යයි ද ධර්මස්‍රොතසට පැමිණියේ දෙවතානුස්මෘතිය වඩනේ යයි ද කියනු ලැබෙ යි.

## 11. 2. 2

## දුතිය මහානාම සුත්තං

එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ, තෙන ඛො පන සමයෙන මහානාමො සක්කො ගිලානා වුට්ඨිතො හොති අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති 'නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති.

අස්සොසි ඛො මහානාමො සක්කො 'සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති, නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච:

සුතං මෙතං භන්තෙ, 'සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති 'නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති. තෙසං නො භන්තෙ නානාවිහාරෙහි විහරතං කෙනස්ස විහාරෙන විහාතබ්බන්ති?

සාධු සාධු මහානාම, එතං ඛො මහානාම තුම්හාකං පතිරූපං කුලපුත්තානං යං තුම්හෙ තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡෙය්‍යාථ, 'තෙසං නො භන්තෙ නානාවිහාරෙහි විහරතං කෙනස්ස විහාරෙන විහාතබ්බ'න්ති.

සද්ධො ඛො මහානාම ආරාධකො හොති නො අස්සද්ධො, ආරද්ධවිරියො ආරාධකො හොති නො කුසීතො, උපට්ඨිතසති ආරාධකො හොති නො මුට්ඨස්සති. සමාහිතො ආරාධකො හොති නො අසමාහිතො, පඤ්ඤවා ආරාධකො හොති නො දුප්පඤ්ඤො. ඉමෙසු ඛො ත්වං මහානාම පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය ඡ ධම්මෙ උත්තරිං භාවෙය්‍යාසි.

# 11. 2. 2

## දුතිය මහානාම සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයේ කපිලවස්තුසමීප-යෙහි වූ න්‍යග්‍රෝධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි මහානාම ශාක්‍ය තෙම ගිලන් බැවින් නැඟියේ ගිලන් බැවින් නැගී නොබෝකල් ඇතියේ වෙයි. එකල්හි බොහෝ වහන්දැ "භාග්‍යවතුන් වහන්සේ නිමහම් කළ සිවුරු ඇති සේක් තෙමස ඇවෑමෙන් චාරිකාවට පිටත්-වන්නාහ"යි භාග්‍යවතුන් වහන්සේට සිවුරුකම් කරන්නාහ.

මහානාම සැහැරජ "බොහෝ වහන්දැ භාග්‍යවතුන් වහන්සේ නිමහම් කළ සිවුරු ඇතිසේක් තෙමස් ඇවෑමෙන් චාරිකාවට වඩනාහ"යි භාග්‍යවතුන් වහන්සේට චීවරකම් කරන්නාහ'යි ඇසී ය. ඉක්බිති මහානාම සැහැරජ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පස් ව හින. එකත්පස් ව හුන් මහානාම සැහැ රජ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය:

වහන්ස, "බොහෝ වහන්දැ 'භාග්‍යවතුන් වහන්සේ නිමහම් කළ සිවුරු ඇති සේක් තෙමස් ඇවෑමෙන් චාරිකාවට වඩනාහ'යි භාග්‍යවතුන් වහන්සේට සිවුරුකම් කරති"යි යන තෙල කරුණ ම විසින් අසන ලද, වහන්ස, නානාවිධ විහාරයෙන් වාසය කරන එ අප විසින් කිනම් විහාරයෙකින් වාසය කටයුතු වෙ දැයි?

මහානාමයෙනි, මැනැවි, මැනැවි, මහානාමයෙනි, යම් හෙයෙකින් තෙපි තථාගතයන් කරා එළඹ "වහන්ස, නානාවිහාරයෙන් වාසය කරන අප විසින් කිනම් විහාරයෙකින් වාසය කටයුතු දැ"යි යන තෙල කරුණ කුලපුත්‍ර වූ තොපට නිසිමැ යි.

මහානාමයෙනි, සැදැහැතියේ ආරාධක වෙයි, සැදැහැ නැතියේ ආරාධක නො වෙයි. රුකුළුවැර ඇතියේ ආරාධක වෙයි, කුසීත නො වෙයි, එළඹ සිටි සිහි ඇතියේ ආරාධක වෙයි. සිහි ඇතියේ නො වෙයි. එකඟ සිතැතියේ ආරාධක වෙයි, අසමාහිතයා නො වෙයි. ප්‍රඥ ඇතියේ ආරාධක වෙයි, දුෂ්ප්‍රාඥ වූයේ නො වෙයි. මහානාමයෙනි, තෙපි මේ පඤ්චධර්මයෙහි පිහිටා මතුයෙහි සදහමුන් වඩව.

ඉධ ත්වං මහානාම තථාගතං අනුස්සරෙය්‍යාසි 'ඉතිපි සො භගවා -පෙ- බුද්ධො භගවා'ති. යස්මිං සමයෙ මහානාම අරියසාවකො තථාගතං අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති. උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති තථාගතං ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං. පමුදිතස්ස පීති ජායති, පීතමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. ඉමං ඛො ත්වං මහානාම බුද්ධානුස්සතිං ගච්ඡන්තොපි භාවෙය්‍යාසි, ඨිතොපි භාවෙය්‍යාසි, නිසින්නොපි භාවෙය්‍යාසි, සයානොපි භාවෙය්‍යාසි, කම්මන්තං අදිට්ඨහන්තොපි භාවෙය්‍යාසි, පුත්තසම්බාධසයනං අජ්ඣාවසන්තොපි භාවෙය්‍යාසි.

පුනචපරං ත්වං මහානාම ධම්මං අනුස්සරෙය්‍යාසි -පෙ- සඞ්ඝං අනුස්සරෙය්‍යාසි -පෙ- අත්තනො සීලානි අනුස්සරෙය්‍යාසි. -පෙ- අත්තනො චාගං අනුස්සරෙය්‍යාසි -පෙ- දෙවතා අනුස්සරෙය්‍යාසි සන්ති'' දෙවා චාතුම්මහාරාජිකා -පෙ- සන්ති දෙවා තතුත්තරිං.

යථාරූපාය සද්ධාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා මය්හම්පි තථාරූපා සද්ධා සංවිජ්ජති. යථාරූපෙන සීලෙන -පෙ- සුතෙන -පෙ- චාගෙන -පෙ- පඤ්ඤාය සමන්නාගතා තා දෙවතා ඉතො චුතා තත්ථ උපපන්නා, මය්හම්පි තථාරූපා පඤ්ඤා සංවිජ්ජතීති.

යස්මිං මහානාම සමයෙ අරියසාවකො අත්තනො ච තාසඤ්ච දෙවතානං සද්ධඤ්ච සීලඤ්ච සුතඤ්ච චාගඤ්ච පඤ්ඤඤ්ච අනුස්සරති, නෙවස්ස තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති, න දොසපරියුට්ඨිතං චිත්තං හොති, න මොහපරියුට්ඨිතං චිත්තං හොති, උජුගතමෙවස්ස තස්මිං සමයෙ චිත්තං හොති දෙවතා ආරබ්භ. උජුගතචිත්තො ඛො පන මහානාම අරියසාවකො ලභති අත්ථවෙදං, ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති, ඉමං ඛො ත්වං මහානාම දෙවතානුස්සතිං ගච්ඡන්තොපි භාවෙය්‍යාසි, ඨිතොපි භාවෙය්‍යාසි, නිසින්නොපි භාවෙය්‍යාසි, සයානොපි භාවෙය්‍යාසි, කම්මන්තං අධිට්ඨහන්තොපි භාවෙය්‍යාසි, පුත්තසම්බාධසයනං අජ්ඣාවසන්තොපි භාවෙය්‍යාසීති.

මහානාමයෙනි, මෙ විෂයෙහි ලා තෙපි ''මෙ කරුණෙනුදු එ භගවත්හු බුද්ධයහ, භාග්‍යවත්හ''යි තථාගතයන් (ගුණ විසින්) සිහි කරව. මහානාමයෙනි, යම් සමයෙක්හි ආර්‍ය්‍යශ්‍රාවක තථාගතයන් සිහි කෙරේ නම් එ සමයෙහි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තය නො වෙයි, ද්වෙෂපර්‍ය්‍යුත්ථිත චිත්තය නො වෙයි මොහපර්‍ය්‍යුත්ථිත චිත්තය නො වෙයි. එ සමයෙහි ඔහුගේ සිත තථාගතයන් ඇරබ ඍජුගත ම වෙයි. මහානාමයෙනි, ඍජුගතචිත්ත ඇති ආර්‍ය්‍යශ්‍රාවක අර්ථවෙදය ලබන්නේ ය. ධර්මවෙදය ලබන්නේ ය, ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබන්නේ ය. ප්‍රමුදිතයාට ප්‍රීතිය උපදී. ප්‍රීතමනස්කයා ගේ නාමකය සන්හිඳෙයි. සන්හුන් කය ඇතියේ සුව විඳිනේ ය. සුව ඇතියහුගේ සිත එකඟ වෙයි. මහානාමයෙනි, තෙපි මේ බුද්ධානුස්මෘතිය ම යනුයේන් වඩව, සිටියේන් වඩව, හුන්නේත් වඩව, හෝනේත් වඩව, කමත්හි සිටිනුයේත් වඩව, පුත්‍රසම්බාධශයනයෙහි වසනුයේත් වඩව.

තවද මහානාමයෙනි, තෙපි ධර්මය සිහිකරව ... සඞ්ඝයා සිහිකරව ... තමන් සිල් සිහිකරව ... තමන්ගේ ත්‍යාග සිහිකරව... ''චාතුර්මහාරාජික දෙවියෝ ඇත ... ඉන් මතුයෙහි දෙවියෝ ඇතැ''යි... දෙවතාවන් සිහි කරව.

එ දෙවියෝ යම්බඳු ශ්‍රද්ධායෙකින් සමන්වාගත වූවාහු මෙයින් ච්‍යුත ව එහි උපන්නාහු නම් මට ද එබඳු ශ්‍රද්ධා ඇත. යම් බඳු ශීලයෙකින්...ශ්‍රැත-යෙකින්...ත්‍යාගයෙකින්... ප්‍රඥයෙකින් එ දෙවියෝ සමන්වාගත වූවාහු මෙයින් ච්‍යුත ව එහි උපන්නාහු නම් මට ද එබඳු ප්‍රඥා ඇතැයි.

මහානාමයෙනි, යම් කලෙක්හි ආර්‍ය්‍යශ්‍රාවක තෙම තමන්ගේ ද එ දෙවියන්ගේ ද ශ්‍රද්ධා හා ශීල හා ශ්‍රැත හා ත්‍යාග හා ප්‍රඥා හා සිහි කෙරේ ද, එසමයෙහි ඔහට රාගපර්‍ය්‍යුත්ථිත චිත්තය නො වෙයි, ද්වෙෂපර්‍ය්‍යුත්ථිත චිත්තය නො වෙයි. මොහපර්‍ය්‍යුත්ථිත චිත්තය නො වෙයි. එසමයෙහි ඔහුගේ සිත දෙවතාවන් ඇරබ ඍජුගත ම වෙයි. මහානාමයෙනි, ඍජුගත චිත්ත ඇති ආර්‍ය්‍යශ්‍රාවක අර්ථවෙදය ලබන්නේ ය. ධර්මවෙදය ලබන්නේ ය. ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබන්නේ ය. ප්‍රමුදිතයාට ප්‍රීතිය උපදනේ ය. ප්‍රීතමනස්කයාගේ නාමකය සන්සිඳෙයි, සන්හුන්කය ඇතියේ සුව විඳිනේ ය. සුව ඇතියහුගේ සිත එකඟ වෙයි. මහානාමයෙනි, තෙපි මේ දෙවතානුස්මෘතිය යනුයේන් වඩව, සිටියේන් වඩව, හුන්නේත් වඩව, හෝනේත් වඩව, කර්මාන්තයෙහි යෙදෙනුයේන් වඩව, පුත්‍රසම්බා-ධශයනයෙහි වසනුයේත් වඩවයි.

# 11. 2. 3

## නන්දිය සුත්තං

එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ තෙන ඛො පන සමයෙන භගවා සාවත්ථියං වස්සාවාසං උපගන්තුකාමො හොති. අස්සොසි ඛො නන්දියො සක්කො "භගවා කිර සාවත්ථියං වස්සාවාසං උපගන්තුකාමො"ති. අථ ඛො නන්දියස්ස සක්කස්ස එතදහොසි: යන්නූනාහම්පි සාවත්ථියං වස්සාවාසං උපගච්ඡෙය්‍යං, තත්ථ කම්මන්තඤ්චෙව අධිට්ඨහිස්සාමි, භගවන්තඤ්ච ලච්ඡාමි කාලෙන කාලං දස්සනායාති.

අථ ඛො භගවා සාවත්ථියං වස්සාවාසං උපගඤ්ඡි. නන්දියොපි ඛො සක්කො සාවත්ථියං වස්සාවාසං උපගඤ්ඡි. තත්ථ කම්මන්තඤ්චෙව අධිට්ඨාසි. භගවන්තඤ්ච ලභි කාලෙන කාලං දස්සනාය.

තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති "නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී"ති. අස්සොසි ඛො නන්දියො සක්කො "සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී"ති. අථ ඛො නන්දියො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො නන්දියො සක්කො භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ 'සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති. තෙසං නො භන්තෙ නානාවිහාරෙහි විහරතං කෙනස්ස විහාරෙන විහාතබ්බන්ති.?

සාධු සාධු නන්දිය, එතං ඛො නන්දිය තුම්හාදිසානං[1] පතිරූපං කුලපුත්තානං යං තුම්හෙ තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡෙය්‍යාථ 'තෙසං නො භන්තෙ නානාවිහාරෙහි විහරතං කෙනස්ස විහාරෙන විහාතබ්බ"න්ති.

1. තුම්හාකං-සිමු.

# 11. 2. 3

## නන්දිය සූත්‍රය

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කපිලවත්ථු සමීපයෙහි නිග්‍රොධාරාමයෙහි වසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි වර්ෂාවාසයට එළඹෙනු කැමැතිසේක් වෙති. නන්දිය ශාක්‍යයා ''භාග්‍යවතුන් වහන්සේ වූ කලී සැවැත්හි වර්ෂාවාසයට එළඹෙනු කැමති සේක්''යි ඇසුයේ ම ය. ඉක්බිති නන්දිය ශාක්‍යහට මෙසේ අදහස විය: ''මම ද සැවැත්හි වර්ෂාවාසයට එළඹෙම් නම් එහි කර්මාන්තයෙහි යෙදෙම් නම් භාග්‍යවතුන් වහන්සේ ද කලින් කල දක්නට ලබන්නෙම් නම් ඉතා මැනවැ''යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි වර්ෂාවාසයට එළඹි සේක. නන්දියශාක්‍ය ද සැවැත්හි වර්ෂාවාසයට එළඹියේ ය. එහි කර්මාන්ත ද ඇරඹී ය. කලින් කල භාග්‍යවතුන් වහන්සේ දැක්මට ද ලදුයේ ය.

එසමයෙහි බොහෝ වහන්දෑ ''භාග්‍යවතුන් වහන්සේ නිමහම් කළ සිවුරු ඇති සේක් තෙමස් ඇවෑමෙන් චාරිකාවට නික්ම යන්නාහ''යි භාග්‍යවතුන් උදෙසා සිවුරුකම් කෙරෙත්. නන්දියශාක්‍ය ''භාග්‍යවතුන් වහන්සේ තෙමස් ඇවෑමෙන් චාරිකාවට නික්ම යන්නාහ''යි බොහෝ වහන්දෑ භාග්‍යවතුන් උදෙසා සිවුරුකම් කරත්හයි ඇසුයේ ම ය. එකල්හි නන්දියශාක්‍ය භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හින. එකත්පස් ව හුන් නන්දියශාක්‍ය භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළේ ය: වහන්ස, බොහෝ භික්ෂූහු ''භාග්‍යවතුන් වහන්සේ නිමහම් කළ සිවුරු ඇති සේක්, තෙමස් ඇවෑමෙන් චාරිකාවට නික්මෙන්නාහ''යි භාග්‍යවතුන් වහන්සේ උදෙසා සිවුරුකම් කෙරෙතී යන මෙසේ කරුණ ම විසින් අසන ලදැයි. වහන්ස, නානාවිහාරයෙන් වසන අප විසින් කිනම් විහාරයෙකින් විසිය යුතුදැ යි?

නන්දියෙනි, මැනැව, මැනැව, නන්දියෙනි, තෙපි තථාගතයන් කරා එළඹ යම් හෙයෙකින් ''වහන්ස, නානාවිහාරයෙන් වසන අප විසින් කිනම් විහාරයෙකින් වාස කටයුතු දැයි පුළුවුස්හු. මෙසේ කරුණ කුලපුත්‍ර වූ තොපට අනුරූප මැ යි.

සද්ධො බො නන්දිය ආරාධකො හොති නො අස්සද්ධො සීලවා ආරාධකො හොති නො දුස්සීලො. ආරද්ධවිරියො ආරාධකො හොති නො කුසීතො, උපට්ඨිතසති ආරාධකො හොති නො මුට්ඨස්සති. සමාහිතො ආරාධකො හොති නො අසමාහිතො, පඤ්ඤවා ආරාධකො හොති නො දුප්පඤ්ඤො. ඉමෙසු බො තෙ නන්දිය ඡසු ධම්මෙසු පතිට්ඨාය පඤ්චසු ධම්මෙසු අජ්ඣත්තං සති උපට්ඨාපෙතබ්බා.

ඉධ ත්වං නන්දිය තථාගතං අනුස්සරෙය්‍යාසි: ''ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්‍ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. ඉති බො තෙ නන්දිය තථාගතං ආරබ්භ අජ්ඣත්තං සති උපට්ඨාපෙතබ්බා.

පුනචපරං ත්වං නන්දිය ධම්මං අනුස්සරෙය්‍යාසි, 'ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති. ඉති බො තෙ නන්දිය ධම්මං ආරබ්භ අජ්ඣත්තං සති උපට්ඨාපෙතබ්බා.

පුනච පරං ත්වං නන්දිය කල්‍යාණමිත්තෙ අනුස්සරෙය්‍යාසි, 'ලාභා වත මෙ සුලද්ධං වත මෙ, යස්ස මෙ කල්‍යාණමිත්තා අනුකම්පකා අත්‍ථකාමා ඔවාදකා අනුසාසකා''ති. ඉති බො තෙ නන්දිය කල්‍යාණමිත්තෙ ආරබ්භ අජ්ඣත්තං සති උපට්ඨාපෙතබ්බා.

පුනචපරං ත්වං නන්දිය අත්තනො චාගං අනුස්සරෙය්‍යාසි, 'ලාභා වත මෙ, සුලද්ධං වත මෙ යොහං මච්ඡෙරමලපරියුට්ඨිතාය පජාය විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසාමි මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො'ති. ඉති බො තෙ නන්දිය චාගං ආරබ්භ අජ්ඣත්තං සති උපට්ඨාපෙතබ්බා.

පුනච පරං ත්වං නන්දිය දෙවතා අනුස්සරෙය්‍යාසි 'යා දෙවතා අතික්කම්මෙව කබලිඞ්කාරාහාරභක්ඛානං[1] දෙවානං සහව්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නා, තා කරණීයං අත්තනො න සමනුපස්සන්ති, කතස්ස වා පතිචයං.'

1. කබලිඞ්කාරභක්ඛානං-සීමු. ස්‍යා PTS

නන්දියෙනි, ශ්‍රද්ධා ඇතියේ ම ආරාධක වෙයි. ශ්‍රද්ධානැතියේ නො වෙයි. සිල්වත් වූයේ ආරාධක වෙයි. දුස්සීල වූයේ නො වෙයි. ප්‍රාරබ්ධවීර්‍ය්‍ය ඇතියේ ම ආරාධක වෙයි. කුසීත වූයේ නො වෙයි. එළඹ සිටි සිහි ඇතියේ ම ආරාධක වෙයි. නට සිහි ඇතිවූයේ නො වෙයි. සමාහිත වූයේම ආරාධක වෙයි. අසමාහිත වූයේ නොවෙයි. ප්‍රඥා ඇතියේම ආරාධක වෙයි. දුෂ්ප්‍රාඥ වූයේ නො වෙයි. නන්දියෙනි, මේ සදහම් හි පිහිටා පඤ්චධර්මයන්හි තා විසින් ආධ්‍යාත්මික වශයෙන් ස්මෘතිය එළවියයුතු වෙයි.

නන්දියෙනි, මෙ විසාහි ලා තෙපි "මෙ කරුණෙනුදු ඒ භගවත්හු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධය හ, විද්‍යාචරණසම්පන්නය හ, ලොකවිද්හ, අනුත්තර පුරුෂදම්‍යසාරථී හ, දෙව්මිනිස්නට ශාස්තෘ හ, බුද්ධය හ, භගවත් හ, යි තථාගතයන් සිහි කරව, නන්දියෙනි, මෙසේ ම තොප විසින් තථාගතයන් ඇරබ අධ්‍යාත්මයෙහි ස්මෘති එළැවිය යුතු.

තවද නන්දියෙනි, තෙපි "භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාත ය, සාන්දෘෂ්ටික ය, අකාලික ය, එහිපස්සික ය, උපනයනාර්හ ය, විඥයන් විසින් තමන් තමන් සිත්හි ලා දතයුතුය"යි ධර්මය සිහි කරව. නන්දියෙනි, මෙසේ ම තොප විසින් දහම් ඇරබ අධ්‍යාත්මයෙහි සිහි එළැවිය යුතු.

තවද නන්දියෙනි, තෙපි "යම් බඳු මාගේ කල්‍යාණ මිත්‍රයෝ අනුකම්පා ඇතිය හ, අර්ථකාමය හ, ඔවා දෙන්නා හ, අනුසස්නා හ, එකැතියෙන් මට එ ලාභය. එකැතියෙන් මනා ලැබීමෙකි"යි කල්‍යාණ මිත්‍රයන් සිහි කරව, නන්දියෙනි, මෙසේ ම තොප විසින් කල්‍යාණ මිත්‍රයන් ඇරබ අධ්‍යාත්මයෙහි සිහි එළැවිය යුතු.

තවද නන්දියෙනි, තෙපි "යම් බඳු මට මාත්සර්‍ය්‍යබලයෙන් පර්‍ය්‍යුත්‍ථිත ප්‍රජායෙහි විගතමලමාත්සර්‍ය්‍යයෙන් යුත් සිතින් මිදූ ත්‍යාග ඇතියෙම් දෙනුවට දෙවී අත් ඇතියෙම් හැරමමෙහි ඇලුනෙම් යදනට නිසි වූයෙම් දනසංවිභාගයෙහි ඇලුණෙම් ගිහිගෙයි වෙසෙම් නම් එකැතියෙන් මට ලාභය, එකැතියෙන් සුලබ්ධිය"යි තමන් ගේ ත්‍යාග සිහි කරව. නන්දියෙනි, මෙසේ ම තොප විසින් ත්‍යාගය ඇරබ අධ්‍යාත්මයෙහි සිහි එළැවිය යුතු.

තවද නන්දියෙනි, තෙපි යම් ඒ දෙවතා කෙනෙක් කබලිඞ්කාරාහාර-භක්ෂක දෙවියන් ගේ සහවාසය ඉක්ම අන්‍යතර මනොමය කයකට එළඹියාහු නම් ඔවුහු තමන් කරණී නො ම දක්නා හ. කෘතයාගේ හෝ නැවත කිරීමක් නො දක්නාහයි දෙවතාවන් සිහි කරව.

සෙය්‍යථාපි නන්දිය භික්ඛු අසමයවිමුත්තො කරණීයං අත්තනො න සමනුපස්සති, කතස්ස වා පතිචයං, එවමෙව ඛො නන්දිය යා තා දෙවතා අතික්කම්මෙව කබලිඞ්කාරාහාරභක්ඛානං දෙවානං සහව්‍යතං අඤ්ඤතරං මනොමයං කායං උපපන්නා, තා කරණීයං අත්තනො න සමනුපස්සන්ති කතස්ස වා පතිචයං. ඉති ඛො තෙ නන්දිය දෙවතා ආරබ්භ අජ්ඣත්තං සති උපට්ඨාපෙතබ්බා. ඉමෙහි ඛො නන්දිය එකාදසහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො පජහතෙව පාපකෙ අකුසලෙ ධම්මෙ, න උපාදියති.

සෙය්‍යථාපි නන්දිය කුම්භො නික්කුජ්ජො[1] වමතෙව උදකං, නො වන්තං පච්චා වමති. සෙය්‍යථා වා[2] පන නන්දිය සුක්ඛෙ තිණුදයෙ අග්ගිමුක්කො[3] ඩහංයෙව ගච්ඡති, නො දඩ්ඪං පච්චුදාවත්තති.

එව මෙව ඛො නන්දිය ඉමෙහි එකාදසහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො පජහතෙ ව පාපකෙ අකුසලෙ ධම්මෙ, න උපාදියතීති.

## 11. 2. 4

## සුභූති සුත්තං

අථ ඛො ආයස්මා සුභූති සද්ධෙන භික්ඛුනා සද්ධිං යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො ආයස්මන්තං සුභූතිං භගවා එතදවොච:

කොනාමො අයං[4] සුභූති භික්ඛූති?

"සද්ධො නාමායං භන්තෙ භික්ඛු සද්ධස්ස[2] උපාසකස්ස පුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො''ති.

කච්චි පනායං සුභූති සද්ධො භික්ඛු සද්ධස්ස[5] උපාසකස්ස පුත්තො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො සන්දිස්සති සද්ධාපදනෙසූති?

1. නිකුජ්ජා– මජසං,
2. සෙය්‍යථාපි වා–මජසං
3. අගගිමුත්තො–සීමු
4. කො නාමායං – මජසං. – කො නාමො අයං – සීමු.
   කො නාම අයං – ස්‍යා.
5. සුදත්තස්ස – මජසං

නන්දියෙනි, යම් පරිදි අසමයවිමුක්ත (=ඛීණාසව) මහණෙක් තමන් කරණී වෙවයි කෘතයාගේ නැවත කිරීමක් වෙවයි නො දක්නේ ද නන්දියෙනි, එපරිද්දෙන් ම යම් ඒ දෙවතා කෙනෙක් කබලිඞ්කාරාහාර-භක්ෂක දෙවියන්ගේ සහවාසය ඉක්ම පියා අන්‍යතරමනොමයකායකට එළඹියාහු නම් එ දෙවතාවෝ තමන් කරණී හෝ කෘතයාගේ නැවත කිරීමක් හෝ නො දක්නා හ. නන්දියෙනි, මෙසේ ම තොප විසින් දෙවතාවන් ඇරැබ අධ්‍යාත්මයෙහි සිහි එළැවිය යුතු. නන්දියෙනි, මෙ එකොළොස් දහමින් සමන්වාගත අරිසවු ලමු අකුසල් දහම් හරණේ ම ය. උපාදන විසින් නො ගන්නේ ම ය.

නන්දියෙනි, යම් පරිද්දෙකින් යටිකුරු කළ සටයෙක් දිය වමාරන්නේ ම වේ ද වමාළ දිය පෙරළා නො වමාරන්නේ වේ ද නන්දියෙනි, යම් සේ වනාහි වියළි තණ ලැහැබ්හි ඇවිලගත් ගිනි දවමින් ම යේ ද දවූ දෑ පෙරළා නො දවන්නේ වේ ද

නන්දියෙනි, එපරිද්දෙන් ම මේ එකොළොස් දහමින් සමන්වාගත අරිසවු ලමු අකුසල් දහම් හරනේ ම ය. උපාදන විසින් නො ගන්නේ ම ය යි.

## 11. 2. 4
## සුභූති සූත්‍රය

එකල්හි ආයුෂ්මත් සුභූති තෙරණුවෝ සද්ධ නම් භික්ෂුහු සමග භාග්‍යවතුන් වහන්සේ කරා එළඹිය හ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස්ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් සුභූති තෙරුණු වනට භගවත්හු තෙල වදළහ.

සුභූතියෙනි, මෙ මහණ කිනමැ යි?

වහන්ස, සද්ධ (=අනේපිඬු) නම් උවසුහුගේ පුත් මෙතෙම සද්ධ නම් වූයේ සැදැහැයෙන් ගිහිගෙන් නික්ම අනගාර්‍ය්‍ය සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණියේ වෙයි.

සුභූතියෙනි, කිමෙක, සද්ධ උවසුහුගේ පුත් සැදැහැයෙන් ගිහිගෙන් නික්ම අනගාර්‍ය්‍ය සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණියේ සද්ධ මහණ ශ්‍රද්ධාප-දනයන් හි ලා පැණේ දු යී?

එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා සද්ධස්ස සද්ධාපදනානි භාසෙය්‍ය. ඉදනාහං ජානිස්සාමි යදි වායං භික්ඛු සන්දිස්සති සද්ධාපදනෙසු යදි වා නො'ති.

තෙන හි සුභූති සුණාහි, සාධුකං මනසිකරොහි භාසිස්සාමීති.

එවං භන්තෙ ති බො ආයස්මා සුභූති භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

1. ඉධ සුභූති, භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛ සංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු. යම්පි සුභූති භික්ඛු සීලවා හොති -පෙ- සමාදය සික්ඛති සික්ඛාපදෙසු, ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදනං හොති.

2. පුනචපරං සුභූති භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථා රූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා, වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා. යම්පි සුභූති භික්ඛු -පෙ- බහුස්සුතො හොති -පෙ- දිට්ඨියා සුප්පටිවිද්ධා, ඉදම්පි සද්ධස්ස සද්ධාපදනං හොති.

3. පුනචපරං සුභූති, භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණ සහායො කල්‍යාණ සම්පවඞ්කො. යම්පි සුභූති භික්ඛු කල්‍යාණමිත්තො හොති කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො, ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදනං හොති.

4. පුනචපරං සුභූති, භික්ඛු සුවචො හොති සොවචස්ස කරණෙහි ධම්මෙහි සමන්නාගතො, ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං, යම්පි සුභූති භික්ඛු සුවචො හොති සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං. ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදනං හොති.

භාග්‍යවතුන් වහන්ස, තෙල සඳහා මෙ කලි. සුගතයන් වහන්ස, යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ සැදැහැතියහු ගේ ශ්‍රද්ධාපදනයන් වදරණ සේක් නම් තෙල සඳහා මෙ කලි. දැන් මම මෙ මහණ ශ්‍රද්ධාපදනයන් හි ලා ඉදින් පැණේ ද හෝ නොපැනේ ද හෝ යි දැනගන්නෙමි යි.

සුභූතියෙනි, එසේ නම් අසවු, මොනොවට මෙනෙහි කරවු. කියමි යි.

වහන්ස, එසේය යි ආයුෂ්මත් සුභූති තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස් වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක.

1. සුභූතියෙනි, මෙ සස්නෙහි මහණ සිල්වත් වෙයි. පාමොක් සංවර සිලින් ස වර වූයේ ආචාරගොචර සම්පන්නව වෙසෙයි. අණුමාත්‍ර වරදෙහිදු බිය දක්නා සුලු වූයේ සිකපදයන්හි සමාදන් කොටැ ගෙන හික්මෙයි. සුභූතියෙනි, යම් හෙයෙකින් මහණ සිල්වත් වේ ද, සමාදන්ව ගෙන සිකපදයන් හි හික්මේ ද සුභූතියෙනි, සැදැහැත්තහු ගේ මෙ ද ශ්‍රද්ධාපදනය වෙයි.

2. සුභූතියෙනි, තවද මහණ ශ්‍රැතධර වූයේ රැස්කොට ගත් ශ්‍රැත ඇතියේ බහුශ්‍රැත වෙයි. යම් ඒ ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍ය්‍යවසාන කල්‍යාණ සාර්‍ථ සව්‍යඤ්ජන ධර්‍ම කෙනෙක් කෙවල පරිපූර්‍ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පවසත් නම් එබඳු දහම්හු ඔහු විසින් බෙහෙවින් අසන ලද්දහු දරණ ලද්දහු වෙත්. වචනයෙන් පරිචිත වෙත්, මනසින් අනුප්‍රෙක්ෂිත වෙත්, ප්‍රඥයෙන් සුප්‍රතිවිද්ධ වෙත්, සුභූතියෙනි, යම් හෙයකින් මහණ බහුශ්‍රැත වේ නම්... ප්‍රඥයෙන් සුප්‍රතිවිද්ධ වෙත් නම් මෙ ද ශ්‍රද්ධයාගේ ශ්‍රද්ධාපදන වෙයි.

3. තවද සුභූතියෙනි, මහණ කලණ මිතුරන් ඇතියේ කලණ යහළුවන් ඇතියේ, කලණ මිතුරන් කෙරෙහි නැඹුරුවූයේ වෙයි, සුභූතියෙනි, යම් හෙයකින් මහණ කලණ මිතුරන් ඇතියේ කලණ යහළුවන් ඇතියේ කලණ මිතුරන් කෙරෙහි නැඹුරුවූයේ වේ ද සුභූතියෙනි, මෙද ශ්‍රද්ධයාගේ ශ්‍රද්ධාපදනය වෙයි.

4. තවද සුභූතියෙනි, මහණ සුවචභාවය ඇති කරන ධර්‍මයෙන් සමන්වාගතවූයේ ක්ෂමා ඇතියේ අනුශාසනය ප්‍රදක්ෂිණායෙන් ගන්නා සුලු සුවච වෙයි. සුභූතියෙනි, යම් හෙයකින් මහණ සුවච භාවය කරන ධර්‍මයන්-ගෙන් සමන්වාගතවූයේ ක්ෂමා ඇතියේ අනුශාසනය ප්‍රදක්ෂිණායෙන් ගන්නා සුලු සුවචයෙක් වේ නම්, සුභූතියෙනි, මෙ ද ශ්‍රද්ධයාගේ ශ්‍රද්ධාපදන වෙයි.

5. පුනචපරං සුභූති, භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි, කිංකරණීයානි තත්‍ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං. යම්පි සුභූති භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්‍ථදක්ඛො හොති අනලසො තත්‍රූපායාය සමන්නාගතො අලංකාතුං අලංසංවිධාතුං. ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදනං හොති.

6. පුනචපරං සුභූති, භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො. යම්පි සුභූති භික්ඛු ධම්මකාමො හොති පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො. ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදනං හොති.

7. පුනච පරං සුභූති භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහාණාය කුසලානං ධම්මානං උපසම්පදය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. යම්පි සුභූති භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහාණාය කුසලානං ධම්මානං උපසම්පදය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදනං හොති.

8. පුනච පරං සුභූති භික්ඛු චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛ විහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී යම්පි සුභූති භික්ඛු චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්ම සුඛ විහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී. ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදනං හොති.

9. පුනච පරං සුභූති, භික්ඛු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්ච පි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාති සහස්සම්පි ජාති සතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙ පි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං

5. තවද සුභූතියෙනි, මහණ සබ්‍රම්සරුන්ගේ යම් බඳු කුදු මහත් කිංකතීව්‍යයෝ වෙත් නම්, එහි දක්ෂ වූයේ අනලස් වූයේ තත්‍රොපාය මීමාංසායෙන් සමන්වාගත වූයේ කිරීමට නිසිවෙයි, සංවිධානයට නිසි වෙයි. සුභූතියෙනි, යම් හෙයකින් මහණ සබ්‍රම්සරුන්ගේ යම් බඳු කුදු මහත් කිංකතීව්‍යයෝ වෙත් නම්, එහි දක්ෂ වූයේ අනලස් වූයේ තත්‍රොපායයෙන් සමන්වාගතවූයේ කිරීමට නිසි වේ නම්, සංවිධානයට නිසි වේ නම්, සුභූතියෙනි, මෙ ද ශ්‍රාද්ධයාගේ ශ්‍රද්ධාපදනය වෙයි.

6. තවද සුභූතියෙනි, මහණ තෙවළා දහම් කැමැතියේ ප්‍රිය සමුදහාර ඇතියේ අභිධර්මයෙහි ද අභිවිනයෙහි ද උදර ප්‍රාමොද්‍යය ඇතියේ වෙයි. සුභූතියෙනි, යම් හෙයකින් මහණ ධර්මකාම ඇතියේ ප්‍රියසමුදහාර ඇතියේ අභිධර්මයෙහි අභිවිනයෙහි උදර ප්‍රාමොද්‍යය ඇතියේ වේ නම්, සුභූතියෙනි, මෙ ද ශ්‍රාද්ධයාගේ ශ්‍රද්ධාපදන වෙයි.

7. තවද සුභූතියෙනි, මහණ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය සඳහා කුශල ධර්මයන්ගේ උපසම්පත්තිය සඳහා රැකුළු වැර ඇතියේ ස්ථාම ඇතියේ දළ පැරකුම් ඇතියේ කුශල ධර්මයන් කෙරෙහි බහා නොතැබූ වීර්‍ය්‍ය ධුර ඇතියේ වාස කෙරේ. සුභූතියෙනි, යම් හෙයෙකින් මහණ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය සඳහා කුශල ධර්මයන්ගේ උපසම්පත්තිය සඳහා රැකුළු වැර ඇතියේ ස්ථාම ඇතියේ දළ පැරකුම් ඇතියේ කුශල ධර්මයන් කෙරෙහි බහා නො තැබූ වීර්‍ය්‍ය ධුර ඇතියේ වේ නම්, සුභූතියෙනි, මෙ ද ශ්‍රාද්ධයාගේ ශ්‍රද්ධාපදනය වෙයි.

8. තවද සුභූතියෙනි, මහණ අධිචිත්තයෙහි උපන් ඉහාත්මයෙහි සුඛවිහාර වූ සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන සුලුයේ, නිදුකින් ලබන සුලුයේ විපුල සේ ලබන සුලුයේ වෙයි. සුභූතියෙනි, යම් කරුණෙකින් මහණ අධිචිත්තයෙහි උපදනා ඉහාත්මයෙහි සුඛවිහරණ වූ සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන සුලුයේ නිදුකින් ලබන සුලුයේ විපුල සේ ලබන සුලුයේ වේ නම්, සුභූතියෙනි, මෙ ද ශ්‍රාද්ධයාගේ ශ්‍රද්ධාපදනය වේ.

9. තවද සුභූතියෙනි, මහණ අනෙකවිධ පූර්වේ නිවාසය සිහි කෙරෙයි. එ නම්: එක් දයක් ද ජාති දෙකක් ද ජාති තුණක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පණසක් ද ජාති සියයක් ද ජාති සහස්‍රයක් ද ජාති ශතසහස්‍රයක් ද නොයෙක් නස්නා කල්පයන් ද නොයෙක් වැඩෙනා කල්පයන් ද නොයෙක් සංවර්ත විවර්ත කල්පයන් ද 'අසෝතන්හි මෙබඳු නමැතියෙම්,

එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛ දුක්ඛ පටිසංවෙදී එවමායු පරියන්තො, සො තතො චුතො අමුත්‍ර උදපාදිං, තත්‍රාපාසිං එවංනාමො එවං ගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූප-පන්නොති. ඉති සාකාරං ස උද්දෙසං අනෙක විහිතං පුබ්බෙ නිවාසං අනුස්සරති. යම්පි සුභූති භික්ඛු අනෙක විහිතං පුබ්බෙ නිවාසං අනුස්සරති, සෙය්‍යථීදං එකම්පි ජාතිං ද්වෙ පි ජාතියො -පෙ- ඉති සාකාරං ස උද්දෙසං අනෙක විහිතං පුබ්බෙ නිවාසං අනුස්සරති. ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධා-පදානං හොති.

10. පුන ච පරං සුභූති, භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති, “ඉමෙ වත භොන්තො සත්තා කාය දුච්චරිතෙන සමන්නාගතා වචී දුච්චරිතෙන සමන්නාගතා මනො දුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචී සුචරිතෙන සමන්නාගතා මනො සුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨි කම්මසමාදානා, තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා”ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ. හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති. යම්පි සුභූති, භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන -පෙ- යථා කම්මූපගෙ සත්තෙ පජානාති. ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදානං හොති.

11. පුන ච පරං සුභූති, භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. යම්පි සුභූති, භික්ඛු ආසවානං ඛයා -පෙ- සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. ඉදම්පි සුභූති සද්ධස්ස සද්ධාපදානං හොතී ති.

මෙබඳු ගොත් ඇතියෙම්, මෙබඳු පැහැ ඇතියෙම්, මෙබඳු ආහාර ඇතියෙම්, මෙබඳු සුව දුක් විඳුනෙම්, මෙබඳු ආයුස කෙළවර කොට ඇතියෙම් වීමි. ඒ මම එයින් ච්‍යුත වූයෙම් අසෝ තන්හි උපන්මි. එහිදු මෙබඳු නැමැතියෙම්, මෙබඳු ගොත් ඇතියෙම්, මෙබඳු ආහාර ඇතියෙම්, මෙබඳු සුව දුක් විඳියෙම්, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇතියෙම් වීමි. ඒ මම එයින් ච්‍යුත වූ යෙම් මෙහි උපන්මි.'' මෙසේ ආකාර සහිත උද්දෙශ සහිත අනෙකවිධ පූර්වේනිවාසය සිහි කරයි. සුභූතියෙනි, යම් කරුණෙකින් මහණ අනෙකවිධ පූර්වේනිවාසය සිහි කෙරේ ද එනම් – එක් ජාතියක් ද – ජාති දෙකක් ද –පෙ– මෙසේ ආකාර සහිත, උද්දෙශ සහිත අනෙකවිධ පූර්වේ නිවාසය සිහි කරයි ද, සුභූතියෙනි, මෙ ද ශ්‍රාද්ධයා ගේ ශ්‍රද්ධාපදනය වේ.

10. තවද සුභූතියෙනි, මහණ විශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි දිවැසින් ච්‍යුතවන උපපද්‍යමාන, හීන, ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ සත්ත්වයන් දක්නේය. කම් වූ පරිදි මියැ යන සත්ත්වයන් දන්නේය; මෙ භවත් සත්ත්වයෝ එ කැතින් කායදුශ්චරිතයෙන් සමන්වාගත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද කරන්නාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකම් සමාදන් කොට ගන්නාහු වෙති. ඔහු කාබුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණියාහු වෙති. මෙ පින්වත් සත්ත්වයෝ කායසුචරිත යෙන් සමන්වාගත වූවාහු වාක් සුචරිතයෙන් සමන්වාගත වූවාහු මනස්-සුචරිතයෙන් සමන්වාගත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද නො කරන්නාහු සම්දිටු ඇත්තාහු සම්දිටු කම් සමාදන් කොට ඇත්තාහු වෙති, ඔහු කාබුන් මරණින් මතු සුගති නම් වූ ස්වර්ග ලොකයට පැමිණියාහුය''යි. මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්ම පවත්නා වූ දිවැසින් ච්‍යුතවන උපදනා හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දක්නේය, යථාකර්මෝපග සත්ත්වයන් දන්නේය. සුභූතියෙනි, මහණ යම් කරුණෙකින් විශුද්ධ වූ –පෙ– දිවැසින් යථා කර්මෝපග සත්ත්වයන් දන්නේ නම්, සුභූතියෙනි, මෙ ද ශ්‍රාද්ධයාගේ ශ්‍රද්ධාපදනය වේ.

11. තවද සුභූතියෙනි, මහණ ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව චෙතොවිමුක්තිය ප්‍රඥ විමුක්තිය ඉහාත්මයෙහි ම තමා විසින් මැ විශිෂ්ට ඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාස කරයි. සුභූතියෙනි, යම් කරුණෙකින් මහණ ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් –පෙ- සාක්ෂාත් කොට පැමිණ වාස කෙරේ නම්, සුභූතියෙනි, මෙ ද ශ්‍රාද්ධයාගේ ශ්‍රද්ධාපදනය වෙයි.

එවං වුත්තෙ ආයස්මා සුභූති භගවන්තං එතදවොච: යානිමානි භන්තෙ භගවතා සද්ධස්ස සද්ධාපදානානි භාසිතානි සංවිජ්ජන්ති තානි ඉමස්ස භික්ඛුනො, අයඤ්ච භික්ඛු එතෙසු සන්දිස්සති. අයං භන්තෙ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු.

අයං භන්තෙ භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො. යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා.

අයං භන්තෙ භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො.

අයං භන්තෙ භික්ඛු සුවචො හොති, සොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො ඛමො පදක්ඛිණග්ගාහී අනුසාසනිං.

අයං භන්තෙ භික්ඛු යානි තානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිංකරණීයානි, තත්ථ දක්ඛො හොති අනලසො තත්‍රූපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං, අලං සංවිධාතුං.

අයං භන්තෙ භික්ඛු ධම්මකාමො හොති, පියසමුදාහාරො අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො.

අයං භන්තෙ භික්ඛු ආරද්ධවිරියො විහරති ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු.

අයං භන්තෙ භික්ඛු චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී.

අයං භන්තෙ භික්ඛු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං. එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් සුභූති තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකළහ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රද්ධා ඇති පුද්ගලයාගේ යම් මේ ශ්‍රද්ධාපදන කෙනෙක් වදරන ලදහු නම්, ඔහු මෙ මහණහට විද්‍යමාන වෙත්, මෙ මහණ ද ඔවුනතර පැමෙන්. වහන්ස, මෙ මහණ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත ව වෙසේ, ආචාර ගොචර සම්පන්න වූයේ අණුමාත්‍ර වද්‍යයෙහිදු භය විසින් දක්නා සුලුයේ සිකපෙදෙහි සමාදන් කොට ගෙන හික්මෙයි.

වහන්ස, මෙ මහණ ශ්‍රුතධර වූයේ රැස්කොටගත් ශ්‍රුත ඇතියේ බහුශ්‍රුත වෙයි. යම් ඒ ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍ය්‍යවසාන කල්‍යාණ සාර්‍ථ සව්‍යඤ්ජන ධර්‍මයෝ කෙවලපරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකට කොට කියත් නම් එ බදු ධර්‍මයෝ ඔහු විසින් අසන ලද්දහු ධරන ලද්දහු වචනයෙන් පරිචිත වූවාහු සිතින් අනුප්‍රෙක්ෂිත වූවාහු ප්‍රඥාවෙන් මොනොවට පිළිවිදියාහු වෙත්.

වහන්ස, මෙ මහණ කලණ මිතුරන් ඇතියේ කලණ යහළුවන් ඇතියේ කලණයන් කෙරෙහි නැඹුරු වීම් ඇතියේ වෙයි.

වහන්ස, මෙ මහණ සුවචභාවය කරන ධර්‍මයන්ගෙන් සමන්වාගත වූයේ ක්ෂමා ඇතියේ අනුශාසනාව ප්‍රදක්ෂිණාමයෙන් ගන්නාසුලුයේ සුවච වෙයි.

වහන්ස, මෙ මහණ සබ්‍රම්සරුන්ගේ යම් ඒ කුදු මහත් කිං කරණීයයෝ වෙත් නම් එහි දක්ෂ වූයේ අනලස් වූයේ තත්‍රොපායමීමාංසායෙන් සමන්වාගත වූයේ කරනුවට නිසි වෙයි, සංවිධානයට නිසි වෙයි.

වහන්ස, මෙ මහණ ප්‍රියසමුදාහාර ඇතියේ අභිධර්‍මයෙහි අභිවිනයෙහි මහත් ප්‍රමොද ඇතියේ ධර්‍මකාම වෙයි.

වහන්ස, මෙ මහණ දළ වැර ඇතියේ සථාම ඇතියේ දළ පැරකුම් ඇතියේ කුශලධර්‍මයන්හි නො බැහූ වීර්‍ය්‍යධුර ඇතියේ වාස කරයි.

වහන්ස, මෙ මහණ අධිචිත්තයෙහි උපදනා දිටු දැමියෙහි සුඛවිහරණ වූ සතරධ්‍යානයන් කැමැති සේ ලබනුයේ නිදුකින් ලබනුයේ විපුල කොට ලබනුයේ වෙයි.

වහන්ස, මෙ මහණ අනෙකවිධ පූර්‍වනිවාසය සිහිකෙරෙයි, එ නම්: එක් ජාතියකුදු ජාති දෙකකුදු –පෙ– මෙසේ ආකාර සහිතව උද්දෙස සහිතව අනෙකවිධ පූර්‍වනිවාසය සිහි කෙරෙයි.

අයං භන්තෙ භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන-පෙ- යථා කම්මූපගෙ සත්තෙ පජානාති.

අයං භන්තෙ භික්ඛු ආසවානං ඛයා -පෙ-සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

යානිමානි භන්තෙ භගවතා සද්ධස්ස සද්ධාපදානානි භාසිතානි සංවිජ්ජන්ති, තානි ඉමස්ස භික්ඛුනො. අයඤ්ච භික්ඛු එතෙසු සන්දිස්සතී ති.

සාධු සාධු සුභූති, තෙන හි ත්වං සුභූති ඉමිනා සද්ධෙන භික්ඛුනා සද්ධිං විහරෙය්‍යාසි. යද ච ත්වං සුභූති ආකඞ්ඛෙය්‍යාසි තථාගතං දස්සනාය ඉමිනාව සද්ධෙන භික්ඛුනා සද්ධිං උපසඞ්කමෙය්‍යාසි තථාගතං දස්සනායා ති.

## 11. 2. 5

## මෙත්තානිසංස සුත්තං

මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය-එකාදසානිසංසා පාටිකඞ්ඛා. කතමෙ එකාදස:

සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති. මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණො විප්පසීදති, අසම්මූළ්හො කාලං කරොති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති.

මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය ඉමෙ එකාදසානිසංසා පාටිකඞ්ඛාති.

වහන්ස, මෙ මහණ මිනිසැස ඉක්ම පවත්නා විසුද්ධ වූ දිවැසින්... කම් වූ පරිදි යන සත්ත්වයන් දන්නේය.

වහන්ස, මෙ මහණ ආස්‍රවක්ෂය යෙන්... පසක් කොට එයට පැමිණ වාස කරයි.

වහන්ස, සැදැහැතිය හුගේ යම් ඒ ශ්‍රද්ධාපදන කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දහු නම් ඔහු මෙ මහණ හට විද්‍යමාන වෙත්. මෙ මහණ ද ඔවුන් තුළ පැනේ යි.

සුභූතියෙනි, මැනැව, මැනැවැ, සුභූතියෙනි, එ කරුණෙන් තෙපි මෙ සද්ධභික්ෂුහු සමග වාස කරව. සුභූතියෙනි, යම් කලෙක තෙපි තථාගතයන් දර්‍ශනය කරනු කැමැත්තහු නම් තථාගතයන් දක්නා පිණිස මේ සද්ධ භික්ෂුහු සමග ම එළඹෙවයි.

## 11. 2. 5

## මෙත්තානිසංස සූත්‍රය

මහණෙනි, ආසෙවිත වූ භාවිත වූ බහුලීකෘත වූ යානීකෘත වූ වස්තුකෘත වූ අනුෂ්ඨිත වූ පරිචිත වූ සුසමාරබ්ධ වූ මෛත්‍රී චිත්තවිමුක්ති පිළිබඳ එකොළොස් අනුසස් කෙනෙක් කැමැති විය යුතුවහ: කවර එකොළොස් දෙනෙක යත්:

සුවසේ හෝනේ ය. සුවසේ පුබුදනේ ය. ලාමක ස්වප්න නො දක්නේ ය. මිනිස්නට ප්‍රිය වන්නේ ය. නො මිනිස්නට ප්‍රිය වන්නේ ය. දෙවියෝ රක්නා හ. ගිනි වේවයි විෂ වේවයි ශස්ත්‍ර වේවයි ඔහට නො වදනේ ය. වහා සිත සමාධියට යෙයි. මුවපැහැ වෙසෙසින් පහදනේ ය. නො මුළා සිහි ඇතියේ කලුරිය කරනේ ය. මතුයෙහි මග පල නො පිළිවිදුනේ බඹලෝ යනුයේ වෙයි.

මහණෙනි, ආසෙවිත වූ භාවිත වූ බහුලීකෘත වූ යානීකෘත වූ වස්තුකෘත වූ අනුෂ්ඨිත වූ පරිචිත වූ සුසමාරබ්ධ වූ මෛත්‍රීචිත්තවිමුක්තිහුගේ මේ එකොළොස් අනුසස් කැමැති විය යුත්තාහු යි.

## 11. 2. 6

## අට්ඨකනාගර සුත්තං

එකං සමයං ආයස්මා ආනන්දො වෙසාලියං විහරති බෙලුව ගාමකෙ. තෙන ඛො පන සමයෙන දසමො ගහපති අට්ඨකනාගරො පාටලිපුත්තං අනුප්පත්තො හොති කෙනචි දෙව කරණීයෙන. අථ ඛො දසමො ගහපති අට්ඨකනාගරො යෙන කුක්කුටාරාමො යෙන අඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: කහං නු ඛො භන්තෙ ආයස්මා ආනන්දො එතරහි විහරති? දස්සනකාමා හි මයං භන්තෙ ආයස්මන්තං ආනන්දන්ති. එසො ගහපති ආයස්මා ආනන්දො වෙසාලියං විහරති බෙලුවගාමකෙ ති.

අථ ඛො දසමො ගහපති අට්ඨකනාගරො පාටලිපුත්තෙ තං කරණීයං තීරෙත්වා යෙන වෙසාලි බෙලුවගාමකො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො දසමො ගහපති අට්ඨකනාගරො ආයස්මන්තං ආනන්දං එතදවොච:

"අත්ථි නු ඛො භන්තෙ ආනන්ද තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති. අපරික්ඛීණා වා ආසවා පරික්ඛීණං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාතී" ති.

අත්ථි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා-සම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති. අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති ති.

# 11. 2. 6

## අට්ඨකනාගර සූත්‍රය

එක්සමයෙක්හි ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ විසාලා නුවර බෙලුව ගම්හි වාස කරත්. එකල්හි අට්ඨකනගර වැසි දසම ගැහැවි කිසියම් කරණී හෙතුයෙන් පාටලීපුත්‍රයට අනුප්‍රාප්ත වෙයි. ඉක්බිති අට්ඨක නගර වැසි දසම ගැහැවි කුක්කුටාරාමයෙහි අන්‍යතර මහණකු කරා එළඹියේ ය. එළඹ එ මහණහට මෙල සැලකළේය: වහන්ස, මෙ කල්හි ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ කොහි වාස කෙරෙත් ද, වහන්ස, අපි ආයුෂ්මත් ආනන්‍ද තෙරුන් දක්නා කැමැතියම්හ''යි. ගැහැවියෙනි, මෙල ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ වෙසාලියෙහි බේලුව ගම්හි වාස කෙරෙති යි.

ඉක්බිති අට්ඨක නගර වැසි දසම ගැහැවි පාටලී පුත්‍රයෙහි එ කරණී නිමවා වෙසාලියෙහි බෙලුව ගම්හි ආයුෂ්මත් ආනන්‍ද තෙරුන් කරා එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ආනන්‍ද තෙරුන් සකසා වැඳ එකත් පසෙක හින. එකත්පස්ව හුන් අට්ඨකනගර වැසි දසම ගහපති ආයුෂ්මත් ආනන්‍ද තෙරුන්ට මෙල කීය:

වහන්ස, ආනන්‍දයෙනි, ආසයානුසය දන්නා ඥෙය ධර්මය දක්නා අර්හත්වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ධර්මයෙක්හි අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති ප්‍රහිතාත්ම ව වාසය කරන භික්ෂුහුගේ අවිමුක්ත වූ හෝ චිත්තය මිදේ නම් අපරික්ෂීණ වූ හෝ ආශ්‍රවයෝ පරික්ෂීණයට යෙත් නම් නො පැමිණියා වූ හෝ අනුත්තර-යොගක්ෂෙමයට පැමිණේ නම් මොනොවට ප්‍රකාශ කරන ලද එ බඳු එක් ධර්මයෙක් ඇත්තේ දැයි?

ගැහැවියනි, යම් ධර්මයෙක්හි අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති නිර්වාණය කෙරෙහි මෙහෙයූ සිත් ඇතිව වසන භික්ෂුහුගේ අවිමුක්ත වූ හෝ චිත්තය මිදේ නම් පරික්ෂීණ නො වූ ආශ්‍රවයෝ හෝ පරික්ෂයට යෙත් නම් නො පැමිණියා වූ හෝ අනුත්තරයොගක්ෂෙමයට පිළිවෙළින් පැමිණේ නම් ආසයානුසය දන්නා ඥෙයධර්මය දක්නා අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට දෙසන ලද එ බඳු එක ධර්මයෙක් ඇත් මැයි.

කතමො ච පන භන්තෙ ආනන්ද තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං මුච්චති අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාතී ති.

ඉධ ගහපති භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසංචික්ඛති: "ඉදම්පි ඛො පඨමං ඣානං අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති, තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඕරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති. තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

අයම්පි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො, යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුනචපරං ගහපති භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීති සුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති–පෙ–තතියං ඣානං–පෙ– චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: ඉදම්පි ඛො චතුත්ථං ඣානං අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං, යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං, තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුනාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති. තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඕරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

අයම්පි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති. අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

වහන්ස, ආනන්දයෙනි, යම් ධර්මයෙක්හි අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති නිවන් කෙරෙහි මෙහෙයූ සිත් ඇතිව වාස කරන භික්ෂුහුගේ නො මිදුනා වූ හෝ සිත මිදේ නම් අපරික්ෂීණ වූ හෝ ආශ්‍රවයෝ පරික්ෂයට යෙත් නම් අනනුප්‍රාප්ත අනුත්තරයොගක්ෂෙමයට හෝ පැමිණේ නම් දන්නා වූ දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට දෙසන ලද ඒ එක ම ධර්මය කවරේ දැයි.

ගැහැවිය, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ම සවිතර්ක වූ සවිචාර වූ විවෙකයෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාස කරයි. හේ මෙසේ නුවණින් සිතයි, මේ ප්‍රථමධ්‍යානය ද උපදවන ලදුයේ කල්පිත වේ. යම් කිසිවක් උපදවන ලද නම් කල්පිත නම් එය අනිත්‍යය නිරුද්ධ වන සැහැවි ඇතියේ යයි දන්නේ ය. හේ ඒ ශමථ විදර්ශනාධර්මයෙහි පිහිටියේ ආශ්‍රවයන්ගේ ක්ෂයට පැමිණෙයි ඉදින් ආශ්‍රවක්ෂයට නො පැමිණේ නම් එම (ශමථ විදර්ශනා) ධර්මරාගයෙන් එම ධර්මනන්දියෙන් පඤ්චවිධඔරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයෙන් ඖපපාතික වූයේ එහි පිරිනිවෙන සුලුයේ එලොවින් පෙරළා නො එන සැහැවි ඇතියේ වෙයි.

ගැහැවියෙනි, යම් ධර්මයෙක්හි අප්‍රමත්ත වූ කෙලෙස් තවන වැර ඇති නිවනට මෙහෙයූ සිත් ඇතිව වසන භික්ෂුහුගේ නො මිදුණු හෝ සිත මිදේ නම් අපරික්ෂීණ වූ හෝ ආශ්‍රවයෝ පරික්ෂයට යෙත් නම් අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තරයොගක්ෂෙමයට පැමිණේ නම් එබඳු මේ එක ම ධර්මය ද දන්නා වූ දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනොවට දෙසන ලද්දේය.

ගැහැවියෙනි, තවද මහණ විතර්ක විචාරයන්ගේ ව්‍යුපශමයෙන් අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදනය ඇති චිත්තයාගේ එකඟ බව ඇති අවිතර්ක අවිචාර වූ සමාධියෙන් උපන්-ප්‍රීතිසුඛ ඇති ද්විතියධ්‍යානයට පැමිණ වාස කරයි... තෘතියධ්‍යානයට... චතුර්ථධ්‍යානයට පැමිණ වාස කරයි. හේ මෙසේ නුවණින් සලකන්නේය. මේ චතුර්ථධ්‍යානය ද අභිසංස්කෘතය. අභිසඞ්චෙතයිතය. යම්කිසිවක් අභිසංස්කෘත නම් අභිසඞ්චෙතයිත නම් එය අනිත්‍යය, නිරොධස්වභාව ඇතිය යී දන්නේ ය. හේ ඒ සමථවිදර්ශනා ධර්මයෙහි සිටියේ ආශ්‍රවක්ෂයට පැමිණෙයි. ඉදින් ආශ්‍රවක්ෂයට නො පැමිණියේ නම් එම ධර්මරාගයෙන් එම ධර්මනන්දියෙන් පඤ්චවිධඔරම්භාගිය සඤ්ඤොජනයන්ගේ පරික්ෂයෙන් ඖපපාතික වූයේ එහි පිරිනිවනසුලු වූයේ එලොවින් පෙරළා නො එන සැහැවි ඇතියේ වෙයි.

ගැහැවියෙනි, යම් ධර්මයෙක්හි අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාස කරන භික්ෂුහුගේ නො මිදුණු සිත හෝ මිදේ නම් අපරික්ෂීණ වූ ආශ්‍රවයෝ පරික්ෂයට යෙත්නම් අනනුප්‍රාප්තවූහෝ අනුත්තරයොගක්ෂෙමයට පැමිණේ නම් දන්නා වූ දක්නා වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ එකම ධර්මය ද මොනොවට දෙසන ලදී.

පුනචපරං ගහපති භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති – තථා දුතියං – තථා තතියං – තථා චතුත්ථං–ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: "අයම්පි ඛො මෙත්තා චෙතො විමුත්ති අභිසඞ්ඛතා අභිසඞ්චෙතයිතා. යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං, තදනිච්චං නිරොධධම්මන්ති" පජානාති. සො තත්‍ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති, නො චෙ ආසවානං ඛයං පාපුණාති, තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්‍ථ පරිනිබ්බායී අනාවත්ති-ධම්මො තස්මා ලොකා.

අයම්පි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො යත්‍ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති. අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති. අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුනචපරං ගහපති භික්ඛු කරුණාසහගතෙන චෙතසා –පෙ– මුදිතා සහගතෙන චෙතසා –පෙ–උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං – තථා තතියං – තථා චතුත්ථං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: අයම්පි ඛො උපෙක්ඛා චෙතො-විමුත්ති අභිසඞ්ඛතා අභිසඞ්චෙතයිතා. යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඞ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්‍ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති. තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්‍ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

අයම්පි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො යත්‍ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති. අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

ගැහැවියෙනි, තවද මහණ මෙත්සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි. එසේ ම දෙවන – එසේ ම තෙවන – එසේ ම සතරවන – මෙසේ උඩ යට සරස හැමතන්හි සර්‍වාත්මතාවෙන් හැම ලොව විපුල වූ මහත්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාබාධ රහිත වූ මෙත්සහගිය සිතින් පතුරුවා වෙසෙයි. හේ මෙසේ නුවණින් සලකයි මේ මෛත්‍රා චෛතොවිමුක්තිය ද අභිසඞ්ඛත වෙයි. අභිසඞ්ඛතයිත වෙයි. යම් කිසිවක් අභිසඞ්ඛත අභිසඞ්ඛතයිත නම් එය අනිත්‍යය නිරොධධර්‍ම යයි. දන්නේ ය. හේ එහි සිටියේ ආස්‍රවක්ෂයට පැමිණේ. ඉදින් ආස්‍රවක්ෂයට නො පැමිණේ නම් එම ධර්‍මරාගයෙන් එම ධර්‍මනන්දියෙන් පඤ්චවිධ ඔරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයෙන් ඖපපාතික වූයේ එහි පිරිනිවෙන සුලු වූයේ එලොවින් පෙරළා නො එන සැහැවි ඇතියේ වෙයි.

ගැහැවියෙනි, යම් ධර්‍මයෙක්හි අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාසය කරන භික්ෂුහුගේ නො මිදුණු සිත හෝ මිදේ නම් අපරික්ෂීණ වූ හෝ ආස්‍රවයෝ පරික්ෂයට යෙත් නම් අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තර යොගක්ෂෙමයට පැමිණේ නම් දන්නා වූ දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ එක ධර්‍මය ද මොනොවට දෙසන ලදි.

තවද ගැහැවියෙනි, මහණ කුළුණු සහගිය සිතින් ... මුදිතා සහගිය සිතින්... උපෙක්ෂා සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි. එසේ දෙවන – එසේ තෙවන – එසේ සිවුවන – මෙසේ උඩ යට සරස හැම තන්හි සර්‍වාත්මභාවයෙන් හැම ලොව විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාබාධ රහිත උපෙක්ෂා සහගිය සිතින් පතුරුවා වෙසෙයි. හේ මෙසේ නුවණින් සිතයි: මේ උපෙක්ෂාචිත්තවිමුක්තිය ද අභිසඞ්ඛත ය අභිසඞ්ඛතයිත ය. යම් කිසිවක් වනාහි අභිසඞ්ඛත අභිසඞ්ඛතයිත නම් එ අනිත්‍ය වෙයි නිරොධ ධර්‍ම වේයයි දන්නේ ය. හේ එහි සිටියේ ආස්‍රවක්ෂයට පැමිණෙයි. ඉදින් ආස්‍රවක්ෂයට නො පැමිණේ නම්, එම ධර්‍මරාගයෙන් එම ධර්‍මනන්දියෙන් පඤ්චවිධ ඔරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයයෙන් ඖපපාතික වූයේ එහි පිරිනිවෙන සුලුයේ එ ලොවින් පෙරළා නො එන සුලුයේ වෙයි.

ගැහැවියෙනි, යම් ධර්‍මයෙක්හි අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාසය කරන භික්ෂුහුගේ අවිමුක්ත වූ හෝ චිත්තය මිදේ නම්, අපරික්ෂීණ වූ හෝ ආස්‍රවයෝ පරික්ෂයට යෙත් නම් අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තර යොගක්ෂෙමයට පැමිණේ නම්, දන්නා වූ දක්නා වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ එ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ එක ධර්‍මය ද මොනොවට දෙසන ලද්දේය.

පුනචපරං ගහපති භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: අයම්පි ඛො ආකාසානඤ්චායතනසමාපත්ති අභිසඞ්ඛතා අභිසඤ්චෙතයිතා. යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති. නො චෙ ආසවානං ඛයං පාපුණාති, තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

අයම්පි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති, අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුණාති.

පුනචපරං ගහපති භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති-පෙ-සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. සො ඉති පටිසඤ්චික්ඛති: අයම්පි ඛො ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති අභිසඞ්ඛතා අභිසඤ්චෙතයිතා. යං ඛො පන කිඤ්චි අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං තදනිච්චං නිරොධධම්මන්ති පජානාති. සො තත්ථ ඨිතො ආසවානං ඛයං පාපුණාති, නො චෙ ආසවානං ඛයං පාපුණාති, තෙනෙව ධම්මරාගෙන තාය ධම්මනන්දියා පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා.

අයම්පි ඛො ගහපති තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එකධම්මො සම්මදක්ඛාතො යත්ථ භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො අවිමුත්තං වා චිත්තං විමුච්චති, අපරික්ඛීණා වා ආසවා පරික්ඛයං ගච්ඡන්ති අනනුප්පත්තං වා අනුත්තරං යොගක්ඛෙමං අනුපාපුනාතීති.

තවද ගැහැවියෙනි, මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ සමතික්‍රමණයෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තංගමයෙන් නානාත්වසංඥාවන්ගේ අමනසිකාරයෙන් 'ආකාශය අනන්තය'යි ආකාසානඤ්චායතනයට එළඹ වාස කරයි. හේ මෙසේ නුවණින් සලකයි: ''මේ ආකාසානඤ්චායතනසමාපත්තිය ද අභිසංස්කෘත ය, අභිසඞ්ඛතයිත ය, යම් කිසිවක් අභිසඞ්ඛත වේ නම්, අභිසඞ්ඛතයිත වේ නම්, එ අනිත්‍ය ය, නිරොධ ධර්මය'යි දන්නේ ය. හේ එහි සිටියේ ආස්‍රවයන්ගේ ක්ෂයට පැමිණේ. ඉදින් ආස්‍රවක්ෂයට නො පැමිණේ නම් එම ධර්මරාගයෙන් එම ධර්ම නන්දියෙන් පඤ්චවිධ ඔරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයයෙන් ඖපපාදුක වූයේ එහි පිරිනිවෙන්සුලුයේ එලොවින් පෙරළා නො එන සුලුයේ වෙයි.

ගැහැවියෙනි, යම් ධර්මයෙක්හි අප්‍රමත්ත ව ආතාපී ව ප්‍රහිතාත්ම ව වාසය කරන මහණහුගේ අවිමුක්ත හෝ සිත මිදේ නම්, අපරික්ෂීණ ආස්‍රවයෝ හෝ පරික්ෂයට යෙත් නම්, අනනුප්‍රාප්ත වූ හෝ අනුත්තරයොගක්ෂෙමයට පැමිණේ නම් ආසයානුසය දන්නා සකලඥෙයමණ්ඩලය දක්නා අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ එ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ එක ධර්මය ද මොනොවට දෙසන ලදී.

තවද ගැහැවියෙනි, මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය සමතික්‍රම කොට 'විඥානය අනන්තය'යි විඤ්ඤාණඤ්චායතනයට එළඹ වාසය කරයි සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය සමතික්‍රම කොට 'කිසිදු නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට එළඹ වෙසෙයි. හේ මෙසේ නුවණින් සලකන්නේ ය: ''මෙ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ද අභිසඞ්ඛත ය, අභිසඞ්ඛතයිත ය, යම් කිසිවක් අභිසඞ්ඛත ද අභිසඞ්ඛතයිත ද, එ අනිත්‍ය ය නිරොධ ධර්මය''යි දන්නේ ය. හේ එහි සිටියේ ආස්‍රවක්ෂයයට පැමිණේ. ඉදින් ආස්‍රවක්ෂයට නො පැමිණේ නම් එම ධර්මරාගයෙන් එම ධර්මනන්දියෙන් පඤ්චවිධ ඔරම්භාගිය සංයොජනයන්ගේ පරික්ෂයෙන් ඔපාපාතික වූයේ එහි පිරිනිවෙන සුලුයේ එ ලොවින් පෙරළා නො එන සැහැවි ඇතියේ වෙයි.

ගැහැවියෙනි, යම් තැනෙක අප්‍රමත්ත ආතාපී, ප්‍රහිතාත්ම ව වසන භික්ෂුහුගේ අවිමුක්ත හෝ චිත්තය මිදේ නම්, අපරික්ෂීණ හෝ ආස්‍රවයෝ පරික්ෂයට යෙත් නම්, අනනුප්‍රාප්ත හෝ අනුත්තරයොගක්ෂෙමයට පැමිණේ නම් දන්නා, දක්නා, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ එක ධර්මය ද මොනොවට දෙසන ලදැයි.

එවං වුත්තෙ දසමො ගහපති අට්ඨකනාගරො ආයස්මන්තං ආනන්දං එතදවොච; සෙය්‍යථාපි භන්තෙ ආනන්ද පුරිසො එකං නිධිමුඛං ගවෙසන්තො සකිදෙව එකාදස නිධිමුඛානි අධිගච්ඡෙය්‍ය. එවමෙව බො අහං භන්තෙ එකං අමතද්වාරං ගවෙසන්තො සකිදෙව එකාදසන්නං[1] අමතද්වාරානං අලත්ථං සවණාය. සෙය්‍යථාපි භන්තෙ පුරිසස්ස අගාරං එකාදසද්වාරං, සො තස්මිං අගාරෙ ආදිත්තෙ එකමෙකෙනපි ද්වාරෙන සක්කුණෙය්‍ය අත්තානං සොත්ථිං කාතුං.

එවමෙව බො අහං භන්තෙ ඉමෙසං එකාදසන්නං අමතද්වාරානං එකමෙකෙනපි අමතද්වාරෙන සක්කුණිස්සාමි අත්තානං සොත්ථිං කාතුං. ඉමෙ හි නාම භන්තෙ අඤ්ඤතිත්ථියා ආචරියස්ස ආචරියධනං පරියෙසිස්සන්ති. කිං පනාහං ආයස්මතො ආනන්දස්ස පූජං න කරිස්සාමීති.

අථ බො දසමො ගහපති අට්ඨකනාගරො වෙසාලිකඤ්ච පාටලිපුත්තකඤ්ච භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. එකමෙකඤ්ච භික්ඛුං පච්චෙක දුස්සයුගෙන අච්ඡාදෙසි ආයස්මන්තඤ්ච ආනන්දං තිචීවරෙන. ආයස්මතො ච ආනන්දස්ස පඤ්චසතං විහාරං කාරාපෙසීති.

## 11. 2. 7

## ගොපාලක සුත්තං

එකාදසහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො අභබ්බො ගොගණං පරිහරිතුං ඵාතිකත්තුං.[2] කතමෙහි එකාදසහි. ඉධ භික්ඛවෙ ගොපාලකො න රූපඤ්ඤූ හොති, න ලක්ඛණකුසලො හොති, න ආසාටිකං සාටෙතා[3] හොති, න වණං පටිච්ඡාදෙතා හොති, න ධූමං කත්තා හොති. න තිත්ථං ජානාති, න පීතං ජානාති, න වීථිං ජානාති, න ගොචරකුසලො හොති, අනවසෙසදොහී ච හොති. යෙ තෙ උසභා ගොපිතරො ගොපරිනායකා තෙ න අතිරෙක පූජාය පූජෙතා හොති. ඉමෙහි බො භික්ඛවෙ එකාදසහි අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො අභබ්බො ගොගණං පරිහරිතුං, ඵාතිකත්තුං.[2]

---

1. එකාදස අමතද්වාරානි — මජසං. 2. ඵාතිංකාතුං, මජසං. ඵාතිකාතුං සත්‍යා. P.T.S.
3. සාරෙථා. -මජසං

මෙසේ වදාළ කල්හි අට්ඨක නගර වාසි දසම ගෘහපති තෙම ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තෙල කාරුණ කීය: වහන්ස, ආනන්දයෙනි, යම් පරිදි එක් ම නිධිමුඛයක් සොයන පුරුෂයෙක් එක්වර ම එකොළොස් නිධිමුඛයන් ලබන්නේ ද, වහන්ස, එපරිදි ම මම එක් ම අමෘතද්වාරයක් සොයනෙම් එක්වර ම එකොළොස් අමෘතද්වාර කෙනකුන් සෙවුනට ලදිමි. වහන්ස, යම් පරිදි පුරුෂයකුහට එකොළොස් දෙරටු ඇති ගෘහයෙක් වේ නම්, හේ එ ගින්නෙන් ඇවිළැ ගත් එ ගෙහි එක් එක් දෙරකිනුදු තමහට සවස්තිය කරනට හැකිවන්නේ ද,

වහන්ස, එ පරිද්දෙන් ම මම මේ එකොළොස් අමෘතද්වාරයන් අතුරෙන් එක් එක් අමෘතද්වාරයෙකිනුදු තමාහට සවස්තිය කරනට හැකි වන්නෙමි. වහන්ස, මේ අන්තොවුවෝ ඇදුරුහට ආචාර්‍ය්‍යධනය සොයා දෙන්නාහ. මම ආයුෂ්මත් ආනන්ද තෙරුන්හට කවර හෙයින් පූජා නො කරන්නෙම් දැයි.

ඉක්බිති අට්ඨක නගර වාසී දසම ගෘහපති තෙම විසල් පුර වැසි වූ ද පාටලීපුත්‍ර නිවාසී වූ ද භික්ෂු සඞ්ඝයා රැස් කරවා සියතින් ප්‍රණීතඛාද්‍යයෙන් හා භොජ්‍යයෙන් සන්තර්පණ කෙළේ ය, සම්ප්‍රවාරණය කෙළේ ය. එක් එක් මහණහට ප්‍රත්‍යෙක වස්ත්‍ර යුග්මයක් දින. ආයුෂ්මත් ආනන්ද තෙරුන් තුන් සිවුරෙන් පිදී ය. ආයුෂ්මත් ආනන්ද තෙරුන් සඳහා පන්සියක් අගනා විහාර ද කරවී ය යි.

## 11. 2. 7

## ගොපාලක සූත්‍රය

මහණෙනි, එකොළොස් කරුණෙකින් සමන්වාගත ගොපලු තෙම ගොමණ්ඩලය පරිහරණය කරනු පිණිස වඩනු පිණිස අභව්‍ය වෙයි. කවර එකොළොසෙකින යත්: මහණෙනි, මෙ ලොව්හි ගොපලු තෙම (ගණන් විසින් හෝ පැහැ විසින්) රූපඥ නො වෙයි, ලක්ෂණ කුශල නො වේ. මැසි බිජු (ඉහඳ) ඉවත් නො කෙරෙයි. වණ පිළිසන් නොකරන්නේ වෙයි. (ගොවුදය වටා) ධූම නො කරනුයේ වෙයි. (සම හෝ විෂම) තීර්ථය නො දන්නේය, පැන්පිවනු නො දන්නේ ය, මං නො දන්නේය, (පඤ්චාහික චාර සත්තාහික චාර වශයෙන්) ගොචර කුසල නො වේ. නිරවශෙෂ කොට දෝනා සුලුයේ ද වෙයි, ගොපිතෘ ගොපරිනෙතෘ වූ යම් ඒ වෘෂභයෝ වෙත් නම් උන් අතිරෙක පූජායෙන් නො පුදනේ වෙයි. මහණෙනි, මෙ එකොළොස් කරුණෙන් සමන්වාගත ගොපලු තෙම ගොමණ්ඩල පරිහරණයට හෝ වඩන්නට නො නිසි වෙයි.

එවමෙව ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං. කතමෙහි එකාදසහි:

ඉධ භික්ඛවෙ භික්ඛු න රූපඤ්ඤූ හොති. න ලක්ඛණකුසලො හොති, න ආසාටිකං සාටෙතා[1] හොති, න වණං පටිච්ඡාදෙතා හොති, න ධූමං කත්තා හොති, න තිත්ථං ජානාති, න පීතං ජානාති, න ගොචර කුසලො හොති. අනවසෙසදොහී ච හොති. යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා තෙ න අතිරෙක-පූජාය පූජෙතා හොති.

1. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න රූපඤ්ඤූ හොති: ඉධ භික්ඛවෙ භික්ඛු යං කිඤ්චි රූපං සබ්බං තං රූපං චත්තාරි මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපන්ති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න රූපඤ්ඤූ හොති.

2. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ලක්ඛණකුසලො හොති; ඉධ භික්ඛවෙ භික්ඛු, කම්ම ලක්ඛණො බාලො, කම්මලක්ඛණො පණ්ඩිතො'ති යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ලක්ඛණකුසලොහොති.

3. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ආසාටිකං සාටෙතා හොති; ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති න අනභාවං ගමෙති. උප්පන්නං බ්‍යාපාදවිතක්කං අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති න අනභාවං ගමෙති. උප්පන්නං විහිංසාවිතක්කං අධිවාසෙති නප්පජහති න විනොදෙති න බ්‍යන්තීකරොති, න අනභාවං ගමෙති. උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අධිවාසෙති නප්පජහති න විනොදෙති බ්‍යන්තීකරොති න අනභාවං ගමෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ආසාටිකං සාටෙතා හොති.

1. සාරෙතා – ම ජ සං

මහණෙනි, එපරිද්දෙන් ම එකොළොස් කරුණෙකින් සමන්වාගත මහණ මෙ ධර්‍ම විනයෙහි වෘද්ධියට, විරූඪියට වෛපුල්‍යයට පැමිණීමට අභව්‍ය වෙයි. කවර එකොළොසෙකින යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ (මහාභූතරූප, උපාදයරූප විසින්) රූපඥ නො වෙයි. (බාලලක්ෂණ පණ්ඩිත ලක්ෂණ විසින්) ලක්ෂණ කුශල නොවෙයි. (කාමවිතර්කාදී) මක්ෂිකාණ්ඩ නො හරනෝ වෙයි. (ඉන්ද්‍රිය සංවර සංඛ්‍යාත) ව්‍රණ ප්‍රතිච්ඡාදන නො කරනුයේ වෙයි. (ධර්‍මදෙශනා සඞ්ඛ්‍යාත) ධූම නො කරන්නෝ වෙයි. (බහුශ්‍රැත ස්ථවිර සඞ්ඛ්‍යාත) තීර්ත්‍ථ නො දන්නෝ වෙයි, (ධර්‍මොපසංහිත ප්‍රමොද සඞ්ඛ්‍යාත) පීතය නො දන්නේය. (අරීඅටඟිමග නැමැති) වීථිය නො දන්නේය. (සතිපට්ඨාන සඞ්ඛ්‍යාත) ගොචර කුශල නො වේ. (ප්‍රතිග්‍රහණයෙහි මාත්‍රඥතා සඞ්ඛ්‍යාත) මාත්‍ර නොදන්නා හෙයින් අනවසෙස දෙහී ද වෙයි. චිරරාත්‍රඥ චිරප්‍රව්‍රජිත, සඞ්ඝපිතෘ, සඞ්ඝපරිණෙතෘ වූ යම් ඒ ස්ථවිර භික්ෂුහු වෙත් නම් ඔවුන් අතිරෙක පූජායෙන් නො පුදනුයේ වෙයි.

1. මහණෙනි, මහණ කෙසේ රූපඥ නො වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ යම්කිසි රූප වේ නම් එ හැම රූප සතරමහා භූතය, සතරමහා භූතයන්ගේ උපාදය රූපයයි යථාභූතය නො දන්නේ ය. මහණෙනි, මෙසේ මහණ රූපඥ නො වේ.

2. මහණෙනි, මහණ කෙසේ ලක්ෂණයන්හි කුසල නො වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ "බාල තෙමේ කර්‍ම ලක්ෂණ කොට ඇත්තේය, පණ්ඩිත තෙමේ කර්‍මලක්ෂණ කොට ඇත්තේය"යි යථාභූතය නො දන්නේය. මහණෙනි, මෙසේ මහණ ලක්ෂණ කුශල නො වේ.

3. මහණෙනි, කෙසේ මහණ (කාමවිතර්ක සඞ්ඛ්‍යාත) මක්ෂිකාණ්ඩය පහ නො කරන්නෝ වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ උපන් කාමවිතර්ක ඉවසනෝ ය. දුරු නො කරන්නේය. පහ නො කරන්නේය. වීගතාන්ත නො කරන්නෝ ය. අභාවයට නො යවන්නෝ ය. උපන් ව්‍යාපාද විතර්කය ඉවසනෝ ය. දුරු නො කරන්නෝ ය, පහ නො කරන්නේය, විගතාන්ත නො කරන්නේය, අභාවයට නො යවන්නෝ ය, උපන් විහිංසා විතර්කය ඉවසනේය, දුරු නොකරන්නේය, පහ නො කරන්නේය, විගතාන්ත නො කරන්නේය, අභාවයට නො යවන්නේය, උපනුපන් ලමු අකුසල් දහම් ඉවසනේය, දුරු නො කරන්නේය, පහ නො කරන්නේය විගතාන්ත නො කරන්නේය අභාවයට නො යවන්නේය මහණෙනි, මෙසේ මහණ මක්ෂිකාණ්ඩය පහ නො කරන්නෝ වේ.

4. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න වණං පටිච්ඡාදෙතා හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී, 'යත්වාධිකරණමෙනං[1] චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති.[2] සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසාධම්මං විඤ්ඤාය නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලාධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති, මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං නාපජ්ජති. එවං භික්ඛවෙ භික්ඛු න වණං පටිච්ඡාදෙතා හොති.

5. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ධූමං කත්තා හොති: ඉධ භික්ඛවෙ භික්ඛු න යථාසුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙතා හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ධූමං කත්තා හොති.

6. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න තිත්ථං ජානාති: ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තෙ කාලෙන කාලං උපසංකමිත්වා න පරිපුච්ඡති, න පරිපඤ්හති, 'ඉදං භන්තෙ කථං, ඉමස්ස කො අත්ථො'ති? තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව න විවරන්ති, අනුත්තානීකතඤ්ච න උත්තානීකරොන්ති. අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානීයෙසු ධම්මෙසු කඞ්ඛං න පටිවිනොදෙන්ති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න තිත්ථං ජානාති.

7. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න පීතං ජානාති: ඉධ භික්ඛවෙ භික්ඛු තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ දෙසියමානෙ න ලභති අත්ථවෙදං, න ලභති ධම්මවෙදං, න ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. එවං ඛො භික්ඛවෙ භික්ඛු න පීතං ජානාති.

8. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න වීථිං ජානාති; ඉධ භික්ඛවෙ භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න වීථිං ජානාති.

1. යත්වාධිකරණමෙතං-සීමු
2. චක්ඛුන්ද්‍රියෙ සංවරං නාපජ්ජති-මජසං.

4. මහණෙනි, කෙසේ මහණ ව්‍රණය නො පිළිසන් කරනුයේ වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ඇසින් රූ දැක නිමිති ගන්නා සුලුයේ අනුව්‍යඤ්ජන ගන්නා සුලුයේ වෙයි. යම් හෙයෙකින් චක්ෂුරින්ද්‍රියය අසංවෘත කොට වාස කරන තෙල පුහුල් කරා අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලමු අකුසල් දහම්හු ලුහුබඳනාහු නම් ඔහුගේ සංවරය පිණිස නො පිළිපදනේය, චක්ෂුරින්ද්‍රිය නො රක්නේ ය. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණේ. ශ්‍රොත්‍රයෙන් ශබ්ද අසා... ඝ්‍රාණයෙන් ගඳ අසා... ජිහ්වායෙන් රස විඳ... කයින් ස්ප්‍රෂ්ටව්‍යය පැහැස... මනසින් ධර්මාරම්මණය දැන නිමිති ගන්නා සුලුයේ අනුව්‍යඤ්ජන ගන්නා සුලුයේ වෙයි. යම් හෙයෙකින් මනින්ද්‍රියය අසංවෘත කොට වාස කරන තෙල පුහුල් කරා අභිධ්‍යා–දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලමු අකුසල් දහම්හු ලුහුබඳනාහු නම් එ සංවරය පිණිස නො පිළිපදනේ ය, මනින්ද්‍රියය නො රක්නේ ය, මනින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණේය. මහණෙනි, මෙසේ මහණ ව්‍රණ ප්‍රතිච්ඡාදන නො කරන්නේ වේ.

5. මහණෙනි, කෙසේ නම් මහණ (ධර්මදෙශනා සඞ්ඛ්‍යාත) ධූම නො කරන්නේ වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ඇසූ පරිදි පිරිවැහූ පරිදි ධර්මය විතර විසින් පරහට නො දෙසනුයේ වෙයි. මහණෙනි, මෙසේ මහණ ධූම නො කරනුයේ වෙයි.

6. මහණෙනි, කෙසේ මහණ (බහුශ්‍රැත සඞ්ඛ්‍යාත) තීර්ථය නො දන්නේ වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ආගතාගම ඇති ධර්මධර විනයධර මාතිකාධර යම් ඒ තෙර මහණහු වෙත් ද ඔවුන් කරා කලින් කල එළඹ පරිපෘච්ඡා නො කෙරෙයි. පරිප්‍රශ්න නො කෙරෙයි: ''වහන්ස, මේ කෙසේ ද මේ භාෂිතයාගේ අර්ථ කවරේ ද''යි, ඔහට ඒ ආයුෂ්මත්හු අවිවෘත අර්ථය ද විවෘත නො කෙරෙත්. අප්‍රකට අර්ථය ද ප්‍රකට නො කෙරෙත්, අනෙකවිධ සැක කටයුතු දහම් විසාහි සැක දුරු නො කෙරෙත් මහණෙනි, මෙසේ මහණ තීර්ථ නො දන්නේය.

7. මහණෙනි, කෙසේ මහණ පීතය නො දන්නේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ තථාගත ප්‍රවිදිත ධර්ම විනය දෙසනු ලබත් ම අර්ථවෙද නො ලබනේ ය. ධර්මවෙද නො ලබනේ ය. ධර්මෝපසංහිත ප්‍රමොදය නො ලබනේය. මහණෙනි, මෙසේ මහණ පීතය නො දන්නේය.

8. මහණෙනි, කෙසේ නම්, මහණ වීථිය නො දන්නේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ අරිඅටඟිමග යථාභූත කොට නො දන්නේය. මහණෙනි, මෙසේ මහණ වීථිය නො දන්නේය.

9. කථඤ්ච භික්ඛවෙ භික්ඛු න ගොචරකුසලො හොති; ඉධ භික්ඛවෙ භික්ඛු චත්තාරො සතිපට්ඨානෙ යථාභූතං නප්පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු න ගොචරකුසලො හොති.

10. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අනවසෙසදෙහී හොති; ඉධ භික්ඛවෙ භික්ඛුං සද්ධා ගහපතිකා අභිහට්ඨුං පවාරෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසන-ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන. තත්‍ර භික්ඛු මත්තං න ජානාති පටිග්ගහනාය, එවං ඛො භික්ඛවෙ භික්ඛු අනවසෙසදෙහී හොති.

11. කථඤ්ච භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා, තෙ න අතිරෙක පූජාය පූජෙතා හොති. ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා, තෙසු න මෙත්තං කායකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච න මෙත්තං වචීකම්මං - න මෙත්තං මනොකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච. එවං ඛො භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා, තෙ න අතිරෙකපූජාය පූජෙතා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං.

එකාදසහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො භබ්බො ගොගණං පරිහරිතුං, ඵාතිකත්තුං, කතමෙහි එකාදසහි: ඉධ භික්ඛවෙ ගොපාලකො රූපඤ්ඤූ හොති. ලක්ඛණකුසලො හොති, ආසාටිකං සාටෙතා හොති, වණං පටිච්ඡාදෙතා හොති, ධූමං කත්තා හොති, තිත්ථං ජානාති, පීතං ජානාති, වීථිං ජානාති, ගොචරකුසලො හොති, සාවසෙසදෙහී හොති, යෙ තෙ උසභා ගොපිතරො ගොපරිනායකා, තෙ අතිරෙක පූජාය පූජෙතා හොති. ඉමෙහි ඛො භික්ඛවෙ එකාදසහි අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො භබ්බො ගොගණං පරිහරිතුං, ඵාතිකත්තුං.

එවමෙව ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො ඉමස්මිං ධම්ම විනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුං කතමෙහි එකාදසහි:

9. මහණෙනි, කෙසේ නම් මහණ ගොචර කුසල නො වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ සිවුසිවටන් යථාභූත කොට නො දන්නේය. මහණෙනි, මෙසේ මහණ ගොචර කුශල නො වේ.

10. මහණෙනි, කෙසේ නම් මහණ අනවසෙස දෙහී වේය යත්: මහණෙනි, සැදැහැති ගිහියෝ මෙ සස්නෙහි මහණහු ඉදිරියට එළවා චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරයෙන් පවරත්. මහණෙනි, එහිලා මහණ පිළිගැනුමට මාත්‍ර නො දන්නේය. මහණෙනි, මෙසේ මහණ අනවශෙෂ දෙහී වෙයි.

11. මහණෙනි, කෙසේ නම් මහණ යම් ඒ චිරරාත්‍රඥ චිරප්‍රව්‍රජිත සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිනායක වූ ස්ථවිර භික්ෂූහු වෙත් නම් ඔවුන් අතිරෙකපූජායෙන් නො පුදනේ වේය යත් මහණෙනි, මෙ සස්නෙහි මහණ යම් ඒ චිරරාත්‍රඥ චිරප්‍රව්‍රජිත සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිනායක වූ ස්ථවිර භික්ෂූහු වෙත් නම් ඔවුන් කෙරෙහි මෛත්‍රීකායකර්මය හමුයෙහි හා නො හමුයෙහිත් නො එළවනේ ය. මෛත්‍රීවාක්කර්මය නො ම එළවනේ ය ... මෛත්‍රීමනඃකර්මය හමුයෙහි හා නො හමුයෙහි නො එළවනේ ය. මහණෙනි, මෙසේ වනාහි මහණ යම් ඒ චිරරාත්‍රඥ චිරප්‍රව්‍රජිත සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිනායක වූ ස්ථවිර භික්ෂූහු වෙත් නම් ඔවුන් අතිරෙක පූජායෙන් නො පුදන්නේ වෙයි. මහණෙනි, මේ එකොළොස් කරුණින් සමන්වාගත මහණ මෙ ධර්මවිනයෙහි වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙන්නට අභව්‍ය වේ.

මහණෙනි, එකොළොස් කරුණෙකින් සමන්වාගත ගොපලු ගොමණ්ඩල පරිහරණයට හා වඩනට භව්‍ය වෙයි. කවර එකොළොසකින යත්: මහණෙනි, මෙලොව්හි ගොපලු රූපඥ වෙයි. ලක්ෂණ කුශල වෙයි. මක්ෂිකාණ්ඩ දුරු කරනුයේ වෙයි. වණ පිළිසන් කරනුයේ වෙයි. දුම් කරනුයේ වෙයි. තීතය දන්නේය. වීථිය දන්නේය. ගොචරකුශල වෙයි. සාවශෙෂදෙහී වෙයි. ගොපිතෘ වූ ගොපරිනෙතෘ වූ යම් ඒ වෘෂභයෝ වෙත් නම් උන් අතිරෙකපූජායෙන් පුදනුයේ වෙයි. මහණෙනි, මේ එකොළොස් කරුණින් සමන්වාගත ගොපලු ගොමණ්ඩල පරිහරණයට හා වර්ධනයට භව්‍ය වෙයි.

මහණෙනි, එ පරිදි ම එකොළොස් කරුණින් සමන්වාගත මහණ මෙ ධර්මවිනයෙහි වෘද්ධියට විරූඪියට විපුලභාවයට පැමිණීමට භව්‍ය වෙයි. කවර එකොළොස් කරුණින යත්:

ඉධ භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤූ හොති ලක්ඛණකුසලො හොති, ආසාටිකං සාටෙතා හොති, වණං පටිච්ඡාදෙතා හොති, ධූමං කත්තා හොති, තිත්ථං ජානාති, පීතං ජානාති, ගොචරකුසලො හොති, සාවසෙසදොහී හොති, යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා, තෙ අතිරෙකපූජාය පූජෙතා හොති.

1. කථඤ්ච භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤූ හොති: ඉධ භික්ඛවෙ භික්ඛු යං කිඤ්චි රූපං සබ්බං තං රූපං චත්තාරි මහාභූතානි, චතුන්නඤ්ච මහාභූතානං උපාදය රූපන්ති යථාභූතං පජානාති, එවං ඛො භික්ඛවෙ භික්ඛු රූපඤ්ඤූ හොති.

2. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ලක්ඛණකුසලො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු 'කම්මලක්ඛණො බාලො, කම්මලක්ඛණො පණ්ඩිතො'ති යථාභූතං පජානාති, එවං ඛො භික්ඛවෙ භික්ඛු ලක්ඛණකුසලො හොති.

3. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ආසාටිකං සාටෙතා හොති: ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්ති කරොති, අනභාවං ගමෙති, උප්පන්නං ව්‍යාපාද විතක්කං -පෙ- උප්පන්නං විහිංසා විතක්කං -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ආසාටිකං සාටෙතා හොති.

4. කථඤ්ච භික්ඛවෙ භික්ඛු වණං පටිච්ඡාදෙතා හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය ආපජ්ජති. එවං ඛො භික්ඛවෙ භික්ඛු වණං පටිච්ඡාදෙතා හොති.

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපඥ වෙයි, ලක්ෂණ කුශල වෙයි, මක්ෂිකාණ්ඩ දුරලනුයේ වෙයි, ව්‍රණප්‍රතිච්ඡාදනය කරනුයේ වෙයි, දුම් කරනුයේ වෙයි, තීර්ථය දන්නේය, පීතය දන්නේය, ගොචරකුශල වෙයි, සාවශෙෂදෙහී වෙයි, චිරරාත්‍රඥ – චිරප්‍රව්‍රජිත–සඞ්ඝපිතෘ – සඞ්ඝපරිනායක යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙත් නම් ඔවුන් අතිරෙක පූජායෙන් පුදන්නේ වෙයි.

1. මහණෙනි, කෙසේ මහණ රූපඥ වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ යම්කිසි රූප වේ නම් එ හැම රූප සතරමහාභූතය, සතරමහාභූතයන්ගේ උපාදය රූපය යි යථාභූතව දන්නේය. මහණෙනි, මෙසේ මහණ රූපඥ වෙයි.

2. මහණෙනි, කෙසේ මහණ ලක්ඛණකුසල වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ "බාලයා කර්මලක්ෂණ කොට ඇත්තේ ය, පණ්ඩිතයා කර්මලක්ෂණ කොට ඇත්තේ ය''යි යථාභූතය දනී. මහණෙනි, මෙසේ මහණ ලක්ෂණ කුශල වෙයි.

3. මහණෙනි, කෙසේ මහණ මක්ෂිකාණ්ඩ දුරලනුයේ වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ උපන් කාමවිතර්කය නො ඉවසයි. පහකෙරෙයි, දුරලයි, විගතාන්ත කරයි, අභාවය ට යවයි. උපන් ව්‍යාපාදවිතර්කය ... උපන් විහිංසාවිතර්කය ... උපනුපන් ලමු අකුසල් දහම් නො ඉවසයි, හැරලයි, පහ කෙරෙයි, විගතාන්ත කරයි, අභාවයට යවයි. මහණෙනි, මෙසේ මහණ මක්ෂිකාණ්ඩ දුරලන්නේ වෙයි.

4. මහණෙනි, කෙසේ මහණ ව්‍රණ පිළිසන් කරන්නේ වේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ඇසින් රූපයක් දැක නිමිති නොගන්නා සුලුයේ අනුව්‍යඤ්ජන නො ගන්නා සුලුයේ වෙයි. යමක් හෙතුකොට ගෙන චක්ෂුරින්ද්‍රියය අසංවෘත කොට වාසය කරන තෙල පුහුල් කරා අභිධ්‍යාදෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු නම් එ අවුරනු සඳහා පිළිපදනේය. චක්ෂුරින්ද්‍රියය රක්නේය. චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණේ, ශ්‍රොතයෙන් ශබ්ද අසා ... ඝ්‍රාණයෙන් ගන්ධ අසා ... ජිහ්වායෙන් රස විඳ ... කයින් ස්ප්‍රෂ්ටව්‍යය පැහැස ... මනසින් ධර්මාලම්බනය දැන නිමිති නොගන්නා සුලුයේ වෙයි, යමක් හෙතුකොට ගෙන මනින්ද්‍රියය අසංවෘත කොට වාසය කරන තෙල පුහුල් කරා අවිද්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු නම් එ අවුරනු සඳහා පිළිපදනේය. මහණෙනි, මෙසේ මහණ ව්‍රණ පිළිසන් කරනුයේ වෙයි.

5. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධූමං කත්තා හොති: ඉධ භික්ඛවෙ භික්ඛු යථා සුතං යථාපරියත්තං ධම්මං විත්ථාරෙන පරෙසං දෙසෙතා හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ධූමං කත්තා හොති.

6. කථඤ්ච භික්ඛවෙ භික්ඛු තිත්ථං ජානාති: ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා, තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා පරිපුච්ඡති, පරිපඤ්හති, 'ඉදං භන්තෙ කථං ඉමස්ස කො අත්ථො'ති, තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව විවරන්ති, අනුත්තානීකතඤ්ච උත්තානී කරොන්ති, අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති, එවං ඛො භික්ඛවෙ භික්ඛු තිත්ථං ජානාති.

7. කථඤ්ච භික්ඛවෙ භික්ඛු පීතං ජානාති: ඉධ භික්ඛවෙ භික්ඛු තථාගතප්පවෙදිතෙ ධම්ම විනයෙ දෙසියමානෙ ලභති අත්ථවෙදං ලභති ධම්මවෙදං, ලභති ධම්මූපසංහිතං පාමොජ්ජං. එවං ඛො භික්ඛවෙ භික්ඛු පීතං ජානාති.

8. කථඤ්ච භික්ඛවෙ භික්ඛු වීථිං ජානාති: ඉධ භික්ඛවෙ භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු වීථිං ජානාති.

9. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ගොචරකුසලො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චත්තාරො සතිපට්ඨානෙ යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ගොචරකුසලො හොති.

10. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සාවසෙසදොහී හොති: ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධා ගහපතිකා අභිහට්ඨුං පවාරෙන්ති චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්පච්චය භෙසජ්ජ පරික්ඛාරෙන. තත්‍ර භික්ඛු මත්තං ජානාති පටිග්ගහනාය. එවං ඛො භික්ඛවෙ භික්ඛු සාවසෙසදොහී හොති.

11. කථඤ්ච භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා තෙ අතිරෙකපූජාය පූජෙතා හොති,

5. මහණෙනි, කෙසේ මහණ ධූම කරන්නේ වේය යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඇසූ පරිදි පිරිවැහු පරිදි ධර්මය විස්තර විසින් පරහට දෙසන්නේ වෙයි. මහණෙනි, මෙසේ මහණ ධූම කරන්නේ වෙයි.

6. මහණෙනි, කෙසේ මහණ තීර්ථ දන්නේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ආගතාගම ඇති ධර්මධර විනයධර මාතෘකාධර යම් ඒ බහුශ්‍රැත භික්ෂුහු වෙත් ද, ඔවුන් කරා එළඹ කලින් කල පරිපෘච්ඡා කරයි. පරිප්‍රශ්න කරයි, 'වහන්ස, මෙ කෙසේ ද? මෙ භාෂිතයාගේ අර්ථ කවරේ ද''යි. ඒ ආයුෂ්මත්හු ඔහට අවිවෘත වූ අර්ථය විවෘත කරත්, අප්‍රකටාර්ථය ප්‍රකට කරත්. නානාවිධ සැකකටයුතු ධර්මයන් කෙරෙහි සැක දුරලත්. මහණෙනි, මෙසේ මහණ තීර්ථය දන්නේය.

7. මහණෙනි, කෙසේ මහණ පීතය දන්නේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ තථාගතප්‍රවිදිත ධර්මවිනය දෙසන ලබන කල්හි අර්ථවෙදය ලබනේය, ධර්මවෙදය ලබනේය, ධර්මොපනිඃශ්‍රිත ප්‍රමොදය ලබනේය. මහණෙනි, මෙසේ මහණ පීතය දන්නේය.

8. මහණෙනි, කෙසේ මහණ වීථිය දන්නේය යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ අරිඅටඟිමග යථාභූත කොට දන්නේය. මහණෙනි, මෙසේ මහණ වීථිය දන්නේය.

9. මහණෙනි, කෙසේ මහණ ගොචරකුශල වේය යත්; මහණෙනි, මෙ සස්නෙහි මහණ සිවු සිව්ටන් යථාභූත කොට දන්නේය. මහණෙනි, මෙසේ මහණ ගොචරකුශල වෙයි.

10. මහණෙනි, කෙසේ මහණ, සාවසෙසදෙහී වේය යත්; මහණෙනි, මෙ සස්නෙහි මහණහු සැදැහැති ගෙහෙවියෝ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් එළවා පවරත්. එහිලා මහණ පිළිගැනීමට මාත්‍ර දන්නේය. මහණෙනි, මෙසේ මහණ සාවසෙසදෙහී වෙයි.

11. මහණෙනි, කෙසේ මහණ චිරරාත්‍රඥ චිරප්‍රව්‍රජිත සඞ්ඝපිතෘ සඞ්ඝපරිනායක යම් ඒ තෙරමහණහු වෙත් නම්, ඔවුන් අතිරෙක පූජායෙන් පුදන්නේය යත්;

ඉධ භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤු චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච මෙත්තං වචීකම්මං -පෙ- මෙත්තං මනොකම්මං පච්චුපට්ඨාපෙති ආවී චෙව රහො ච. එවං ඛො භික්ඛවෙ භික්ඛු යෙ තෙ භික්ඛු ථෙරා රත්තඤ්ඤු චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිනායකා තෙ අතිරෙක පූජාය පූජෙතා හොති.

ඉමෙහි ඛො භික්ඛවෙ ඒකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිතුන්ති.

## 11. 2. 8

## පඨම සමාධි සුත්තං

**[සාවත්ථි]**

අථ ඛො සම්බහුලා භික්ඛු යෙන භගවා තෙනුපසංකමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛු භගවන්තං එතදවොචුං:

සියා නු ඛො භන්තෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධ ලොකෙ ඉධලොක සඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති?

සියා භික්ඛවෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

මහණෙනි, මෙ සස්නෙහි මහණ චිරරාත්‍රඥ වූ චිරප්‍රව්‍රජිත වූ සඞ්ඝපිතෘ වූ සඞ්ඝපරිනායක වූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙත් නම් ඔවුන් කෙරෙහි මෛත්‍රීකායකර්මය හමුයෙහි ද නොහමුයෙහි ද එළවයි. මෛත්‍රීවාක්කර්ම ... මෛත්‍රීමනඃකර්ම හමුයෙහි ද නො හමුයෙහි ද එළවයි. මහණෙනි, මෙසේ මහණ චිරරාත්‍රඥ චිරප්‍රව්‍රජිත සඞ්ඝපිතෘ සඞ්ඝපරිනායක යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙත් නම්, ඔවුන් අතිරෙකපූජායෙන් පුදන්නේ වෙයි.

මහණෙනි, මෙ එකොළොස් කරුණින් සමන්වාගත මහණ මෙ ධර්මවිනයෙහි වෘද්ධියට, විරූඪියට විපුලභාවයට පැමිණෙන්නට භව්‍ය වෙයි.

## 11. 2. 8

## පඨම සමාධි සූත්‍රය

එකල්හි බොහෝ මහණහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකළහ;

වහන්ස, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා ඇති නො වේ නම් අප්හි අප්සංඥා ඇති නොවේ නම්, තෙජස්හි තෙජස්සංඥා ඇති නො වේ නම්, වායුයෙහි වායුසංඥා ඇති නොවේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥා ඇති නොවේ නම්, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා ඇති නොවේ නම්, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා ඇති නො වේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා ඇති නොවේ නම්, ඉහලොකයෙහි ඉහලොකසංඥා ඇති නොවේ නම්, පරලොකයෙහි පරලොකසංඥා ඇති නොවේ නම්, යම් මේ ප්‍රාප්ත වූ පයෙෂිත වූ මනසින් අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් ඇත්ද, එහිදු සංඥා ඇති නො වේ නම්, සංඥා ඇතියේත් වේ නම්, මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ දැයි?

මහණෙනි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා ඇති නොවේ නම් .. යම් මේ ප්‍රාප්ත පයෙෂිත මනසින් අනුවිචරිත දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් ඇත් ද එහිදු සංඥා නැතියේ වේ නම්, සංඥා ඇතියේත් වේ නම් මහණහට ඒ බඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේය යි.

යථා කථං පන භන්තෙ සියා භික්ඛුනො තථා රූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති?

ඉධ භික්ඛවෙ භික්ඛු එවංසඤ්ඤී හොති: "එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති". එවං බො භික්ඛවෙ සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජො සඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතන සඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානා සඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

## 11. 2. 9
## දුතිය සමාධි-සුත්තං

**[සාවත්ථි]**

තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සියා නු බො භික්ඛවෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති?

වහන්ස, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා නොමැති වේ නම් ... යම් මේ ප්‍රාප්ත, පර්යේෂිත, සිතින් අනුවිචරිත දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් ඇත් ද, එහිදු සංඥා නැතියේ වේ නම්, සංඥා ඇතියේත් වේ නම් මහණහට කෙසේ නම් එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ දැයි?

මහණෙනි,මෙ සස්නෙහි මහණ මෙබඳු සංඥා ඇතියේ වෙයි;''යම්බඳු මේ සර්වසංස්කාරයන්ගේ ශමථයෙක්, සර්වොපධීන්ගේ ප්‍රතිනිඃසර්ගයෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ නම්, තෙල ශාන්ත ය, තෙල ප්‍රණීත ය''යි. මහණෙනි, මෙසේ යම්පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා නැතියේ වේ නම්, අප්හි අප්සංඥා නැතියේ වේ නම්, තෙජස්හි තෙජස්සංඥා නැතියේ වේ නම්, වායුයෙහි වායුසංඥා නැතියේ වේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥා නැතියේ වේ නම්, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා නැතියේ වේ නම්, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා නැතියේ වේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා නැතියේ වේ නම්, ඉහලොකයෙහි ඉහලොකසංඥා නැතියේ වේ නම්, පරලොකයෙහි පරලොකසංඥා නැතියේ වේ නම්, යම් මේ ප්‍රාප්ත, පර්යේෂිත, සිතින් අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් ද ඇත් නම් එහිදු සංඥා නැතියේ වේ නම්, සංඥා ඇතියේත් වේ නම් මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේය යි.

## 11. 2. 9

## දුතිය සමාධි සූත්‍රය

**[සැවැත්]**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණ වදාළසේක;

මහණෙනි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා නැතියේ වේ නම්, අප්හි අප්සංඥා නැතියේ වේ නම්, තෙජස්හි තෙජස්සංඥා නැතියේ වේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥා නැතියේ වේ නම්, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතනසංඥා නැතියේ වේ නම්, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥා නැතියේ වේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා නැතියේ වේ නම්, ඉහලොකයෙහි ඉහලොකසංඥා නැතියේ වේ නම්, පරලොකයෙහි පරලොකසංඥා නැතියේ වේ නම්, යම් මේ ප්‍රාප්ත, පර්යේෂිත, මනසින් අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් ඇත්නම් එහිදු සංඥා නැතියේ වේ නම් සංඥා ඇතියේත් වේ නම් මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ දැයි?

භගවම්මූලකා නො භන්තෙ ධම්මා, භගවන්නෙත්තිකා, භගවම්පටිසරණා, සාධු වත භන්තෙ භගවන්තඤ්ඤෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හි භික්ඛවෙ සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

සියා භික්ඛවෙ භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා නෙව පථවියං පථවිසඤ්ඤී අස්ස, -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස සඤ්ඤී ච පන අස්සාති.

යථා කථං පන භන්තෙ සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො, යථා නෙව පථවියං පථවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස සඤ්ඤී ච පන අස්සාති?

ඉධ භික්ඛවෙ භික්ඛු එවං සඤ්ඤී හොති: "එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති". එවං ඛො භික්ඛවෙ සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පථවියං පථවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

## 11. 2. 10

## තතිය සමාධි සුත්තං

[සාවත්ථී]

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං සාරිපුත්තං එතදවොචුං.

වහන්ස, අපගේ ධර්මයෝ භගවද්මූලකයහ, භගවද්නෙතෘකයහ, භගවත්ප්‍රතිසරණයහ. වහන්ස, තෙල භාෂිතයාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේ නම්, ඒකාන්තයෙන් මැනැ මය. භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි අසා භික්ෂූහු ධරන්නාහයි.

මහණෙනි, එ කරුණින් අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමියි. 'වහන්ස, එසේය'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ, භාග්‍යවතුන් වහන්සේ තෙල වදළහ:

මහණෙනි, යම්පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා නොමැතියේ වේ නම් ... යම්බඳු මේ මනසින් ප්‍රාප්ත, පයෙෂිත, අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඥාතයෙක් වේ නම්, එහිදු සංඥා නැතියේ වේ නම්, සංඥා ඇතියේ ද වේ නම්, මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේය.

වහන්ස, යම්පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා නොමැතියේ වේ නම් ... යම්බඳු මේ මනසින් ප්‍රාප්ත, පයෙෂිත, අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඥාතයෙක් වේ නම්, එහිදු සංඥා නැතියේ වේ නම් සංඥා ඇතියේ ද වේ නම් කෙසේ නම් මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වේ දැයි?

මහණෙනි, මෙසස්නෙහි මහණ මෙබඳු සංඥා ඇතියේ වෙයි. ''යම්බඳු මේ සර්වසංස්කාරයන්ගේ ශමථයෙක්, සර්වොපධීන්ගේ ප්‍රතිනිඃසර්ගයෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ නම්, තෙල ශාන්තය, තෙල ප්‍රණීතය''යි. මහණෙනි, මෙසේ වනාහි යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා නැතියේ වේ නම් ... යම්බඳු මේ මනසින් ප්‍රාප්ත, පයෙෂිත, අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඥාතයෙක් වේ නම්, එහිදු සංඥා නැතියේත් සංඥා ඇතියේත් වේ නම්, එබඳු සමාධි-ප්‍රතිලාභයෙක් භික්ෂුහට වන්නේ යයි.

## 11. 2. 10

## තතිය සමාධි සූත්‍රය

එකල්හි බොහෝ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් කරා එළඹියහ, එළඹ ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරුන් හා සමග සතුටුවූහ. සම්මොදනයට නිසි සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් එ භික්ෂූහු ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන්ට තෙල කීහ:

සියා නු ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනො තථාරූපො සමාධිපටි-ලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති?

සියා ආවුසො භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

යථා කථම්පන ආවුසො සාරිපුත්ත සියා භික්ඛුනො තථාරූපො සමාධි-පටිලාභො, යථානෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති?

ඉධාවුසො භික්ඛු එවං සඤ්ඤී හොති: "එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති. එවං ඛො ආවුසො සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

## 11. 2. 11

## චතුත්ථ සමාධි සුත්තං

**[සාවත්ථි]**

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි -පෙ-

සියානු ඛො ආවුසො භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස න ආකාසානඤ්චා-යතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤා-යතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානා-සඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධ ලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සා"ති.

ඇවැත් ශාරීපුත්‍රයෙනි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා නැතියේ වේ නම් ... යම්බඳු මේ මනසින් ප්‍රාප්ත පර්‍යෙෂිත අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් වේ නම්, එහිදු සංඥා නැතියේත් සංඥා ඇතියේත් වේ නම්, මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ දැයි?

ඇවැත්නි, යම්පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥා නැති වේ නම් ... යම්බඳු මේ මනසින් ප්‍රාප්ත පර්‍යෙෂිත අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් වේ නම් එහිදු සංඥා නැතියේත් සංඥා ඇතියේත් වේ නම්, මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ යයි.

ඇවැත් ශාරීපුත්‍රයෙනි, යම්පරිද්දෙකින් පඨවියෙහි පෘථිවිසංඥා නැති වේ නම් ... යම්බඳු මේ මනසින් ප්‍රාප්ත පර්‍යෙෂිත අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් වේ නම්, එහිදු සංඥා ඇතියේත් සංඥා නැතියේත් වේ නම්, මහණ එබඳු සමාධිප්‍රතිලාභයෙක් කෙසේ වන්නේ දැයි?

ඇවැත්නි, මෙසස්නෙහි මහණ මෙබඳු සංඥ ඇතියේ වෙයි. යම්බඳු මේ සර්වසංස්කාරයන්ගේ ශමථයෙක් සර්වොපධීන්ගේ ප්‍රතිනිඃසර්ගයෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ නම් තෙල ශාන්තය, තෙල ප්‍රණීතය'යි. ඇවැත්නි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥ ඇතියේ නො වේ නම් ... යම් මේ මනසින් ප්‍රාප්ත වූ පර්‍යෙෂිත වූ අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් වේ නම් එහිදු සංඥ ඇතියේ නොවේ නම්, සංඥ ඇතියේත් වේ නම් මහණහට එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වේ යයි.

## 11. 2. 11

## චතුත්ථසමාධි සූත්‍රය

**[සැවැත්]**

එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ මහණුන් ඇමතූහ. ...

ඇවැත්නි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥ ඇතියේ නොවේ නම්, අප්හි අප්සංඥ ඇති නො වේ නම්, තෙජස්හි තෙජස්සංඥ ඇති නො වේ නම්, වායුයෙහි වායුසංඥ ඇති නො වේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥ ඇති නො වේ නම්, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතන සංඥ ඇති නො වේ නම්, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතනසංඥ ඇති නො වේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥ ඇති නො වේ නම්, ඉහලොකයෙහි ඉහලොකසංඥ ඇති නො වේ නම්, පරලොකයෙහි පරලොකසංඥ ඇති නො වේ නම්, යම්බඳු මේ 'මනසින් ප්‍රාප්ත වූ පර්‍යෙෂිත වූ අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඤ්ඤාතයෙක් වේ නම් එහිදු සංඥ නැතියේත් සංඥ ඇතියේත් වේ නම්, මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ දැයි?

දූරතොපි ඛො මයං ආවුසො ආගච්ඡෙය්‍යාම ආයස්මතො සාරිපුත්තස්ස සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථමඤ්ඤාතුං. සාධු වතායස්මන්තංයෙව සාරිපුත්තං පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො. ආයස්මතො සාරිපුත්තස්ස සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙනහාවුසො සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

සියා ආවුසො භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, -පෙ- යම්පිදං දිට්ඨං සුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

යථා කථම්පනාවුසො සාරිපුත්ත සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති?

ඉධාවුසො භික්ඛු එවං සඤ්ඤී හොති: එතං සන්තං, එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති. එවම්පි ඛො ආවුසො සියා භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී. අස්ස න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස, යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තත්‍රාපි න සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්සාති.

## අනුස්සතිවග්ගො දුතියො.

තත්‍රුද්දානං:

ද්වෙ මහානාමා ච නන්දියෙන සුභූතිනා ච මෙත්තා,
දසමො ද්වෙව ගොපාලො චත්තාරො ච සමාධිනාති.

ඇවැත් ශාරීපුත්‍රයෙනි, අපි ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරුන් හමුයෙහි තෙල භාෂිතයාගේ අර්ථය දැන ගැනුම සඳහා දුර සිට එමු. තෙල භාෂිතයාගේ අර්ථය ආයුෂ්මත් ශාරීපුත්‍රයනට ම වැටහේ නම් මැනැ මය. ආයුෂ්මත් ශාරීපුත්‍රයන්ගේ භාෂිතය අසා භික්ෂුහු ධරන්නාහයි.

ඇවැත්නි, එ කරුණින් අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමැයි. ඇවැත්නි, එසේ යයි එ භික්ෂුහු ආයුෂ්මත් ශාරීපුත්‍රයනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරණුවෝ තෙල කරුණ වදළහ.

ඇවැත්නි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥ නොමැති වේ නම්, ... යම්බඳු මේ මනසින් ප්‍රාප්ත පයෙෂිත අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඥතයෙක් වේ නම් එහිදු සංඥ නැතියේ වේ නම් සංඥ ඇතියේත් වේ නම් මහණහට එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේයයි.

ඇවැත් ශාරීපුත්‍රයෙනි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥ නොමැති වේ නම් ... යම්බඳු මේ මනසින් ප්‍රාප්ත පයෙෂිත අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඥතයෙක් වේ නම්, එහිදු සංඥ නැතියේ වේ නම්, සංඥ ඇතියේත් වේ නම් මහණහට කෙසේ නම් එබඳු සමාධිප්‍රතිලාභයෙක් වන්නේ දැ යි?

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ මෙබඳු සංඥ ඇතියේ වෙයි. යම්බඳු මේ සර්වසංස්කාරයන්ගේ ශමථයෙක්, සර්වොපධීන්ගේ ප්‍රතිනිඃසර්ගයෙක් තෘෂ්ණාක්ෂයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ නම්, තෙල ශාන්තය, තෙල ප්‍රණීතය'යි. ඇවැත්නි, යම් පරිද්දෙකින් පෘථිවියෙහි පෘථිවිසංඥ නොමැතියේ වේ නම්, අප්හි අප්සංඥ ඇති නො වේ නම්, තෙජස්හි තෙජස් සංඥ නොමැති වේ නම්, වායුයෙහි වායුසංඥ නොමැති වේ නම්, ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතනසංඥ නොමැති වේ නම්, විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතන සංඥ නොමැති වේ නම්, ආකිඤ්චඤ්ඤායතනයෙහි ආකිඤ්චඤ්ඤායතන සංඥ නොමැති වේ නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥ නොමැති වේ නම්, ඉහලොකයෙහි ඉහලොකසංඥ නොමැතියේ වේ නම්, පරලොකයෙහි පරලොකසංඥ නොමැති වේ නම්, යම්බඳු මේ මනසින් ප්‍රාප්ත පයෙෂිත අනුවිචරිත වූ දිට්ඨ සුත මුත විඥතයෙක් වේ නම් එහිදු සංඥා නොමැතියේ වේ නම්, සංඥා ඇතියේත් වේ නම්, මහණහට මෙසේ එබඳු සමාධි ප්‍රතිලාභයෙක් වන්නේ යයි.

## අනුස්සති වර්ගය දෙවැනි යි.

**එහි උද්දානය:**

මහානාම සූත්‍ර දෙකය, නන්දිය සූත්‍රය, සුභූති, සූත්‍රය, මෙත්තානිසංස සූත්‍රය, දසමගහපති සූත්‍රය, ගෝපාල සූත්‍ර දෙකය, සමාධි සූත්‍ර සතර දැයි එකොළොසෙකි.

# 3. සාමඤ්ඤ වග්ගො

## 11. 3. 1 – 8

### අනිච්චානුපස්සනා සුත්තං

එකාදසහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො අභබ්බො ගොගණං පරිහරිතුං ඵාතිකත්තුං, කතමෙහි එකාදසහි: ඉධ භික්ඛවෙ ගොපාලකො න රූපඤ්ඤු හොති, න ලක්ඛණකුසලො හොති න ආසාටිකං සාටෙතා හොති, න වණං පටිච්ඡාදෙතා හොති, න ධූමං කත්තා හොති න තිත්ථං ජානාති, න පීතං ජානාති න වීථිං ජානාති, න ගොචරකුසලො හොති, අනවසෙසදොහී ච හොති, යෙ තෙ උසභා ගොපිතරො ගොපරිනායකා තෙ න අතිරෙකපූජාය පූජෙතා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ එකාදසහි අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො අභබ්බො ගොගණං පරිහරිතුං ඵාතිකත්තුං.

එවමෙව ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො චක්ඛුස්මිං අනිච්චානුපස්සී විහරිතුං -පෙ- අභබ්බො චක්ඛුස්මිං දුක්ඛානුපස්සී විහරිතුං -පෙ- අභබ්බො චක්ඛුස්මිං අනත්තානුපස්සී විහරිතුං -පෙ- අභබ්බො චක්ඛුස්මිං ඛයානුපස්සී විහරිතුං -පෙ- අභබ්බො චක්ඛුස්මිං වයානුපස්සී විහරිතුං -පෙ- අභබ්බො චක්ඛුස්මිං විරාගානුපස්සී විහරිතුං -පෙ- අභබ්බො චක්ඛුස්මිං නිරොධානුපස්සී විහරිතුං -පෙ- අභබ්බො චක්ඛුස්මිං පටිනිස්සග්ගානුපස්සී විහරිතුං -පෙ-

## 11. 3. 9 – 48

සොතස්මිං -පෙ- ඝාණස්මිං -පෙ- ජිව්හාය -පෙ- කායස්මිං -පෙ- මනස්මිං -පෙ-

## 11. 3. 49 – 96

රූපෙසු -පෙ- සද්දෙසු -පෙ- ගන්ධෙසු -පෙ- ඵොට්ඨබ්බෙසු -පෙ- ධම්මෙසු -පෙ-

# 3. සාමඤ්ඤ වර්ගය

## 11. 3. 1 - 8

### අනිච්චානුපස්සනාදි සූත්‍රයෝ

මහණෙනි, එකොළොස් කරුණෙකින් සමන්වාගත ගොපලු ගොමණ්ඩලය පරිහරණය කරන්නට හෝ වඩන්නට අභව්‍ය වෙයි. කවර එකොළොසෙකින යත්:

මහණෙනි, මෙලොවහි ගොපලු තෙම රූපඥ නො වෙයි. ලක්ෂණ කුශල නො වේ, මක්ෂිකාණ්ඩ නො හරනේ වෙයි. ව්‍රණප්‍රතිච්ඡාදන නො කරන්නේ වෙයි. ධූම නො කරන්නේ වෙයි. තීර්ථය නො දන්නේය. පීතය නො දන්නේය. වීථිය නො දන්නේය. ගොචර කුශල නොවන්නේය. අනවශෙෂදොහී ද වෙයි. ගොපිතෘ වූ ගොපරිනායක වූ යම් ඒ වෘෂභයෝ වෙත් නම් උන් අතිරෙක පූජායෙන් නො පුදනුයේ වෙයි. මහණෙනි, මෙ එකොළොස් කරුණින් සමන්වාගත ගොපාල තෙම ගොමණ්ඩල පරිහරණයට හෝ වර්ධනයට අභව්‍ය වෙයි.

මහණෙනි, එපරිද්දෙන් ම එකොළොස් කරුණකින් සමන්වාගත මහණ චක්ෂුස්හි අනිත්‍යානුදර්ශීව වාසය කරන්නට අභව්‍ය වෙයි ... චක්ෂුස්හි දුඃඛානුදර්ශීව වාසය කරන්නට අභව්‍ය වෙයි ... චක්ෂුස්හි අනාත්මානුදර්ශීව වාසය කරන්නට අභව්‍ය වෙයි, -පෙ- චක්ෂුස්හි ක්ෂයානුදර්ශීව වාසය කරන්නට අභව්‍ය වෙයි ... චක්ෂුස්හි ව්‍යයානුදර්ශීව වාසය කරන්නට අභව්‍ය වෙයි ... චක්ෂුස්හි විරාගානුදර්ශීව වාසය කරන්නට අභව්‍ය වෙයි ... චක්ෂුස්හි නිරොධානු දර්ශීව වාසය කරන්නට අභව්‍ය වෙයි... චක්ෂුස්හි ප්‍රතිනිඃසර්ගානුදර්ශීව වාසය කරන්නට අභව්‍ය වෙයි....

## 11. 3. 9 - 48

ශ්‍රොතස්හි ... ඝ්‍රාණයෙහි ... ජිහ්වායෙහි ... කායයෙහි ... මනස්හි ...

## 11. 3. 49 - 96

රූපයන්හි... ශබ්දයන්හි... ගන්ධයන්හි... ස්ප්‍රෂ්ටව්‍යයන්හි... ධර්මයන්හි

## 11. 3. 97-144

චක්ඛුවිඤ්ඤාණෙ -පෙ- සොතවිඤ්ඤාණෙ -පෙ- ඝානවිඤ්ඤාණෙ -පෙ- ජිව්හාවිඤ්ඤාණෙ -පෙ- කායවිඤ්ඤාණෙ -පෙ- මනොවිඤ්ඤාණෙ -පෙ-

## 11. 3. 145-192

චක්ඛුසම්ඵස්සෙ -පෙ- සොතසම්ඵස්සෙ -පෙ- ඝානසම්ඵස්සෙ -පෙ- ජිව්හාසම්ඵස්සෙ -පෙ- කායසම්ඵස්සෙ -පෙ- මනොසම්ඵස්සෙ -පෙ-

## 11. 3. 193-240

චක්ඛුසම්ඵස්සජාය වෙදනාය -පෙ- සොතසම්ඵස්සජාය වෙදනාය -පෙ- ඝානසම්ඵස්සජාය වෙදනාය -පෙ- ජිව්හාසම්ඵස්සජාය වෙදනාය -පෙ- කායසම්ඵස්සජාය වෙදනාය -පෙ- මනොසම්ඵස්සජාය වෙදනාය -පෙ-

## 11. 3. 241-288

රූපසඤ්ඤාය -පෙ- සද්දසඤ්ඤාය -පෙ- ගන්ධසඤ්ඤාය -පෙ- රසසඤ්ඤාය -පෙ- ඵොට්ඨබ්බසඤ්ඤාය -පෙ- ධම්මසඤ්ඤාය -පෙ-

## 11. 3. 289-336

රූපසඤ්චෙතනාය -පෙ- සද්දසඤ්චෙතනාය -පෙ- ගන්ධසඤ්චෙතනාය -පෙ- රසසඤ්චෙතනාය -පෙ- ඵොට්ඨබ්බසඤ්චෙතනාය -පෙ- ධම්මසඤ්චෙතනාය -පෙ-

## 11. 3. 337-384

රූපතණ්හාය -පෙ- සද්දතණ්හාය -පෙ- ගන්ධතණ්හාය -පෙ- රසතණ්හාය -පෙ- ඵොට්ඨබ්බතණ්හාය -පෙ- ධම්මතණ්හාය -පෙ-

## 11. 3. 385-432

රූපවිතක්කෙ -පෙ- සද්දවිතක්කෙ -පෙ- ගන්ධවිතක්කෙ -පෙ- රසවිතක්කෙ -පෙ- ඵොට්ඨබ්බවිතක්කෙ -පෙ- ධම්මවිතක්කෙ -පෙ-

## 11. 3. 97–144

චක්ෂුර්විඥානයෙහි ... ශ්‍රොතවිඥානයෙහි ... ඝ්‍රාණවිඥානයෙහි ජිව්හාවිඥානයෙහි ... කායවිඥානයෙහි ... මනොවිඥානයෙහි ...

## 11. 3. 145–192

චක්ෂුස්සංස්පර්ශයෙහි ... ශ්‍රොතසංස්පර්ශයෙහි ... ඝ්‍රාණසංස්පර්ශයෙහි ... ජිහ්වාසංස්පර්ශයෙහි ... කායසංස්පර්ශයෙහි ... මනස්සංස්පර්ශයෙහි

## 11. 3. 193–240

චක්ෂුස් සංස්පර්ශයෙන් උපන් වෙදනායෙහි ... ශ්‍රොතසංස්පර්ශයෙන් උපන් වෙදනායෙහි ... ඝ්‍රාණසංස්පර්ශයෙන් උපන් වෙදනායෙහි ... ජිහ්වාසංස්පර්ශයෙන් උපන් වෙදනායෙහි ... කාය සංස්පර්ශයෙන් උපන් වෙදනායෙහි ... මනස් සංස්පර්ශයෙන් උපන් වෙදනායෙහි ...

## 11. 3. 241–288

රූපසඥායෙහි...ශබ්ද සඥායෙහි...ගන්ධ සඥායෙහි...රස සඥායෙහි... ස්ප්‍රෂ්ටව්‍යසඥායෙහි ... ධර්මසඥායෙහි ...

## 11. 3. 289–336

රූපසඤ්චෙතනායෙහි...ශබ්දසඤ්චෙතනායෙහි... ගන්ධසඤ්චෙතනා... යෙහි ... රසසඤ්චෙතනායෙහි ... ස්ප්‍රෂ්ටව්‍ය සඤ්චෙතනායෙහි ... ධර්මසඤ්චෙතනායෙහි ...

## 11. 3. 337–384

රූපතෘෂ්ණායෙහි ... ශබ්දතෘෂ්ණායෙහි ... ගන්ධතෘෂ්ණායෙහි ... රසතෘෂ්ණායෙහි ... ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණායෙහි ... ධර්මතෘෂ්ණායෙහි ...

## 11. 3. 385–432

රූපවිතර්කයෙහි...ශබ්දවිතර්කයෙහි...ගන්ධවිතර්කයෙහි...රසවිතර්කයෙහි ... ස්ප්‍රෂ්ටව්‍යවිතර්කයෙහි ... ධර්මවිතර්කයෙහි ...

## 11. 3. 433–480

රූපවිචාරෙ –පෙ– සද්දවිචාරෙ –පෙ– ගන්ධවිචාරෙ –පෙ– රසවිචාරෙ –පෙ– ඵොට්ඨබ්බවිචාරෙ –පෙ– ධම්මවිචාරෙ –පෙ– අනිච්චානුපස්සී විහරිතුං –පෙ– දුක්ඛානුපස්සී විහරිතුං –පෙ– අනත්තානුපස්සී විහරිතුං –පෙ– ඛයානුපස්සී විහරිතුං –පෙ– වයානුපස්සී විහරිතුං –පෙ– විරාගානුපස්සී විහරිතුං –පෙ– නිරොධානුපස්සී විහරිතුං –පෙ– පටිනිස්සග්ගානුපස්සී විහරිතුන්ති.

## 11. 3. 481-960

එකාදසහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො ගොපාලකො භබ්බො ගොගණං පරිහරිතුං, ඵාතිකත්තුං. කතමෙහි එකාදසහි: ඉධ භික්ඛවෙ ගොපාලකො රූපඤ්ඤූ හොති –පෙ–

එවමෙව ඛො භික්ඛවෙ එකාදසහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො චක්ඛුස්මිං අනිච්චානුපස්සී විහරිතුං –පෙ– පටිනිස්සග්ගානුපස්සී විහරිතුන්ති.

**සාමඤ්ඤවග්ගො තතියො.**

## 11. 3. 433-480

රූපවිචාරයෙහි...ශබ්දවිචාරයෙහි...ගන්ධවිචාරයෙහි...රසවිචාරයෙහි... ස්ප්‍රෂ්ටව්‍යවිචාරයෙහි ... ධර්මවිචාරයෙහි ... අනිත්‍යානුදර්ශීව වාසය කරනට ... දුඃඛානුදර්ශීව වාසය කරනට ... අනාත්මානුදර්ශීව වාසය කරනට ... ක්ෂයානුදර්ශීව වාසය කරනට-... ව්‍යයානුදර්ශීව වාසය කරනට ... විරාගානුදර්ශීව වාසය කරනට... නිරොධානුදර්ශීව වාසය කරනට ... ප්‍රතිනිඃසර්ගානුදර්ශීව වාසය කරනට අභව්‍ය වෙයි.

## 11. 3. 481-960

මහණෙනි එකොළොස් කරුණකින් සමන්වාගත ගොපාල තෙම ගොමණ්ඩල පරිහරණයට වර්ධනයට භව්‍ය වෙයි. කවර එකොළොසෙකින යත්: මහණෙනි, මේ ලොව්හි ගොපාලක තෙම රූපඥ වෙයි ...

මහණෙනි, එපරිද්දෙන්ම එකොළොස් කරුණෙකින් සමන්වාගත මහණ චක්ෂුස්හි අනිත්‍යානුදර්ශීව වාසය කරන්නට භව්‍ය වෙයි ... ප්‍රතිනිඃසර්ගානුදර්ශීව වාසය කරනට භව්‍ය වෙයයි.

**සාමඤ්ඤ වර්ගය තුන්වැනි යි.**

## රාගාදිපෙය්‍යාලො

### 11. 4. 1

රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය එකාදසධම්මා භාවෙතබ්බා. කතමෙ එකාදස: පඨමං ඣානං, දුතියං ඣානං, තතියං ඣානං චතුත්ථං ඣානං, මෙත්තාචෙතොවිමුත්ති, කරුණාචෙතොවිමුත්ති, මුදිතාචෙතොවිමුත්ති උපෙක්ඛාචෙතොවිමුත්ති, ආකාසානඤ්චායතනං, විඤ්ඤාණඤ්චායතනං, ආකිඤ්චඤ්ඤායතනං, රාගස්ස භික්ඛවෙ අභිඤ්ඤාය ඉමෙ එකාදසධම්මා භාවෙතබ්බාති.

### 11. 4. 2-10

රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය, -පෙ- වයාය, -පෙ- විරාගාය, -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ එකාදසධම්මා භාවෙතබ්බාති.

### 11. 4. 11-170

දොසස්ස -පෙ- මොහස්ස -පෙ- කොධස්ස -පෙ- උපනාහස්ස -පෙ- මක්ඛස්ස -පෙ- පලාසස්ස -පෙ- ඉස්සාය -පෙ- මච්ඡරියස්ස -පෙ- මායාය -පෙ- සාඨෙය්‍යස්ස -පෙ- ථම්භස්ස -පෙ- සාරම්භස්ස -පෙ- මානස්ස -පෙ- අතිමානස්ස -පෙ- මදස්ස -පෙ- පමාදස්ස අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානානාය. -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ එකාදසධම්මා භාවෙතබ්බාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

රාගාදිපෙය්‍යාලො නිට්ඨිතො.

නව සුත්තසහස්සානි භීයො පඤ්චසතානි ච,
සත්තපඤ්ඤාසසුත්තානි[1] අඞ්ගුත්තරසමායුතාති.

එකාදසකනිපාතො නිට්ඨිතො.

අඞ්ගුත්තරනිකායො සමත්තො.

---

1. සත්තපඤ්ඤාසසුත්තන්තා - මජසං.

## රාගාදිපෙය්‍යාලය

### 11. 4. 1

මහණෙනි, රාගයාගේ අභිඥනය පිණිස එකොළොස් දහම් කෙනෙක් වැඩිය යුත්තාහ. කවර එකොළොස්කෙනෙක යත්: ප්‍රථමධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය, මෛත්‍රාචෙතොවිමුත්තිය, කරුණාචෙතොවිමුත්තිය, මුදිතාචෙතොවිමුත්තිය, උපෙක්ඛාචෙතො-විමුත්තිය, ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤා-යතනය යි. මහණෙනි, රාගයාගේ අභිඥානය පිණිස මේ එකොළොස් ධර්‍මයෝ වැඩිය යුත්තාහ යි.

### 11. 4. 2-10

මහණෙනි, රාගයාගේ පරිඥානය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... නිරොධය පිණිස ... ත්‍යාගය පිණිස ... ප්‍රතිනිඃසර්‍ගය පිණිස මේ එකොළොස් දහම්හු වැඩිය යුත්තාහ යි.

### 11. 4. 10-170

ද්වෙෂයාගේ ... මොහයාගේ ... ක්‍රොධයාගේ ... උපනාහයාගේ මක්ඛයාගේ ... පළාසයාගේ ... ඊර්‍ෂ්‍යාහුගේ ... මාත්සර්‍ය්‍යයාගේ...මායාවගේ ... ශාඨ්‍යයාගේ ... ස්තම්භයාගේ ... සාරම්භයාගේ ... මානයාගේ ... අතිමානයාගේ ... මදයාගේ ... ප්‍රමාදයාගේ අභිඥානය පිණිස ... පරිඥානය පිණිස ... පරික්ෂය පිණිස ... ප්‍රහාණය පිණිස ... ක්ෂය පිණිස ... ව්‍යය පිණිස ... විරාගය පිණිස ... ත්‍යාග පිණිස ... ප්‍රතිනිඃසර්‍ගය පිණිස ... මේ එකොළොස් දහම්හු වැඩිය යුත්තාහ යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ යි.

**රාගාදිපෙය්‍යාලය නිමි.**

සූත්‍ර නවදහසක් ද නැවත පන්සියක් ද සත්පනස් සූත්‍ර කෙනෙක් ද අඞ්ගුත්තරාගමයෙහි සඞ්ගෘහීත යි.

**අඞ්ගුත්තරනිකාය සමාප්ත යි.**

# අඞ්ගුත්තර - දසක එකාදසක නිපාතෙසු

## ගාථාදිපාදනුක්කමණිකා


| | | | |
|---|---|---|---|
| අත්‍ථස්ස පත්තිං හදයස්ස සන්තිං | ... | ... | 86 |
| අප්පකා තෙ මනුස්සෙසු | ... | ... | 422, 424, 462 |
| අප්පමත්තො අයං කලි | ... | ... | 308, 312 |
| අසෙඛෙන ච සීලෙන | ... | ... | 32 |
| කණ්හං ධම්මං විප්පහාය | ... | | 422, 424, 462, 464 |
| කාමච්ඡන්දො ච ව්‍යාපාදො | ... | ... | 32 |
| ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං | ... | ... | 616 |
| තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය | ... | | 422, 424, 462, 464 |
| ධනෙන ධඤ්ඤෙන ච යොධ වඩ්ඪති | | ... | 246 |
| නමො තෙ පුරිසාජඤ්ඤ | ... | ... | 610, 612 |
| පුරිසස්ස හි ජාතස්ස | ... | ... | 306, 310 |
| යෙ ච ඛො සම්මදක්ඛාතෙ | ... | | 422, 424, 462, 464 |
| යෙසං සම්බොධි අඞ්ගානං | ... | | 422, 424, 462, 464 |
| යො නින්දියං පසංසති | ... | ... | 306,310 |
| යො සුගතෙසු මනං පදොසයෙ | ... | ... | 308, 312 |
| සද්ධාය සීලෙන ච යොධ වඩ්ඪති | ... | ... | 246 |
| ස වෙ පඤ්චඞ්ගසම්පන්නො | ... | ... | 25 |

# සඤ්ඤානාමානුක්කමණිකා


අ

අචිරවතී 42
අජිත 416
අටට 310
අට්ඨකනාගර 646
අනාථපිණ්ඩික 2, 88, 116, 160, 230, 232, 236, 246, 316, 326, 332, 584
අපරගොයාන 106
අබබ 310
අබ්බුද 310
අස්සබලුඤ්ජක 298, 608
අවන්ති 86
අහහ 310

ආ

ආනන්ද 2,14,16,134,136, 194,246,250,268,350,408, 584,594,598,604,646
ආභස්සර 108

ඉ

ඉසිදත්ත 246,256

උ

උත්තරකුරු 106
උත්තිය 346
උපවාලා 240
උපාලි 124,216,128,130,138,362
උප්පලක 310

ක

කක්කට 240
කජඞ්ගලා 100
කට 240

ක

කටිම්බ 240
කටිස්සඞ්ග 240
කපිලවත්ථු 148,618,626,630
කම්මාස්සදම්ම 56
කලන්දක 294
කලන්දකනිවාප 288
කාළී 86
කාසිකොසල 106
කුක්කුටාරාම 644
කුමුද 310
කුරරඝර 86
කුරු 56
කුසිනාරා 142
කොකනද 350
කොකාලික 304
කොසල 220,310

ග

ගග්ගරා 268,340
ගඞ්ගා 42
ගිජ්ඣකාවසථ 608
ගිරිමානන්ද 194
ගොතම 90,334,340,346, 416,424,454,492,558
ගොසිඞ්ගසාල 240

ච

චම්පා 268, 340
චාතුම්මහාරාජික 106
චාලා 240
චුන්ද 480
චෙතී 78, 280

ජ

ජම්බුදීප 106
ජාණුස්සොණි 424, 454, 490
ජෙතවන 2,88,116,160,166, 194,230,232,236,246,316, 332,584

ත

තපොදාරාම 350
තාවතිංස 106
තුදු 306
තුසිත 106

ද

දසමගහපති 646

ධ

ධොවන 388

න

නන්දිය 630
නළකපාන 220, 226
නාදික 608
නාලකගාම 218
නිග්‍රොධාරාම 618,626,630
නිම්මාණරති 106
නිරබ්බුද 310

ප

පදුම 308
පරනිම්මිතවසවත්ති 106
පලාසවන 220, 226
පසෙනදිකොසල 106, 116
පාටලිපුත්ත 646
පාවා 480
පුණ්ඩරීක 310
පුබ්බවිදෙහ 106

බ

බලිහරණ වනසණ්ඩ 142
බාහුන 268
බෙලුවගාම 646

ම

මගධ 218
මහාකච්චාන 86, 466
මහාකස්සප 288
මහාචුන්ද 78, 280
මහානාම 618, 626
මහාමොග්ගල්ලාන 276, 304
මහාලි 154
මහාවන 154,240
මහී 42
මිගසාලා 246
මොරනිවාප 614

ය

යමුනා 42
යාම 106

ර

රාජගහ 288, 350, 614

ල

ලිච්ඡවි 240

ව

වජ්ජියමාහිත 340
වෙළුවගාමක 644
වෙළුවන 288
වෙසාලි 154, 240, 646

**ස**

සක්ක 618, 626, 630

සඞ්ගාරව 460, 420

සද්ධ 634

සනඞ්කුමාර 616

සන්ධ 608

සරභූ 42

සහජාති 78, 280

සහම්පති 308

**සා**

සාමණ්ඩකානි 218

සාරිපුත්ත 16, 168, 184, 218, 220, 226, 304, 592, 670, 672

සාවත්ථි 2, 80, 116, 160, 166, 230, 232, 236, 246, 316, 332, 584, 630

සිනෙරු 106

සුභූති 634

සොගන්ධික 310

# විසෙසපදනුක්කමණිකා


අ

අකිඤ්චනො 462, 464
අකුසලෙසු ධම්මෙසු 98
අග්ගිපරිචාරකා 480
අග්ගිමුක්කො 634
අඞ්ගණං 170, 186
අච්චන්තනිට්ඨො 614
අට්ඨඞ්ගිකො මග්ගො 102
අඩ්ඪවාදං 80
අණ්ඩකා 520
අත්තුක්කංසකපරවම්භකා 266
අත්ථවෙදං 622, 658
අත්ථස්සපත්ති 86
අධම්මිකං වාදං 416
අධම්මචරියා 156,558
අධම්මො 402, 406
අධිකරණං 126
අධිකරණනිරොධ
ගාමිණී පටිපදං 126
අධිකරණිකො 294
අධිපඤ්ඤා ධම්ම
විපස්සනාය 176, 178
අධිමානිකො 290, 304
අධිවුත්තිපදනි 68
අනගාරියං 634
අනභිජ්ඣාලු 176, 186
අනභිරතසඤ්ඤා 200
අනයං 276, 282, 290
අනවසෙසදෙහී 656
අනාගාමිතා 194
අනාථො 48
අනාවත්තිධම්මො 648
අනිච්චසඤ්ඤා 192
අනිච්චානුපස්සී 676, 680

අ

අනිරාකතජ්ඣානො 286
අනුව්‍යඤ්ජනසො 126
අනුසාසනී පාටිහාරියෙන 614
අනුස්සරිතබ්බා ධම්මා 512
අනෙකධාතු නානාධාතු 64, 70
අනොකං 462, 464
අනොත්තප්පං 264
අන්තරාපරිනිබ්බායී 216
අන්තරාවොසානගමනං 280
අන්තලික්ඛචරා 108
අන්තවා ලොකො 58, 336 338, 352
අපචයගාමී 506
අපණ්ණකං 152
අපණ්ණකො මාණී 544, 550
අපරිහාන ධම්මා 184
අපරෙ වා පරියායෙ 532
අපාරාපාරං 6
අප්පටිමංසෙන 142
අප්පටිවානී 168, 176, 178, 186
අප්පමාදෙ 40
අප්පඤ්ඤාතො 270
අභිජ්ඣාලු 176
අභිධම්මෙ 46, 52, 162, 638
අභිභායතනානි 108
අභිවිනයෙ 42, 46, 52, 162, 638
අභිසඞ්ඛතං 646
අභිසඤ්චෙතයිතං 646
අභිසල්ලෙඛිකා 120
අමතද්වාරානං 654
අමතොගධා 190, 192
අම්බකා 248, 256
අම්බක පඤ්ඤා 248, 256
අයොනිසො–
මනසිකාරං 204, 258, 262

අ

අරියධම්මො 500
අරියමග්ගං 508
අරියසාවකො 620, 634
අරියසීලො 118
අරියං වමනං 394
අරියූපවාදී 302
අරියො ඤායො 330
අරියො මග්ගො 506
අරූපසඤ්ඤී 108
අවදඤ්ඤුතං 260, 262
අවිප්පටිසාරො 2, 6, 8, 10
අවෙච්චප්පසන්නා 216
අසඞ්ඛාරපරිනිබ්බායී 216
අසතාසම්පජඤ්ඤං 204
අසන්තුට්ඨො 270
අසද්ධම්මසවණං 204
අසද්ධම්මො 508
අසප්පුරිසසංසෙවො 204
අසමය විමුත්තො 634
අසම්පජඤ්ඤං 258
අසස්සතො ලොකො 334
අසංහීරො 126
අසාරද්ධකායො 168
අසෙඛියා ධම්මා 400
අසෙඛො 398, 490
අස්සඛලුඞ්ක 298, 608
අස්සද්ධියං 204, 258
අස්සද්ධො 222, 270
අහිරිකං 264

ආ

ආකාසානඤ්චායතනං 280 286,374
ආකාසානඤ්චායතන
සඤ්ඤී 14, 16
ආගිලායති 220
ආඝාතපටිවිනයා 266
ආඝාතවත්ථූනි 266
ආචයගාමී 444, 506
ආචාරගොචරසම්පන්නො 160
ආජීවසංවරො 158
ආදානපටි–
නිස්සග්ගෙ 422, 424, 462, 464
ආදාසෙ 174
ආදිත්තචෙලො 168
ආදීනවො 146, 148
ආදෙසනාපාටිහාරියෙන 614
ආධානගාහී 266
ආනාපානසති 200
ආයතනෙසු 96
ආරද්ධවිරියො 28
ආරාධනා 380
ආලොප සහභාකර 368
ආවෙණික කම්මානි 130, 132
ආවෙණික–
පාතිමොක්ඛං 130, 132, 134, 136
ආසභං ඨානං 62
ආසාටිකං සාටෙතා 656, 676
ආහාරට්ඨිතිකා 100
ආහාරෙසු 94
ආහුනෙය්‍යො 356

ඉ

ඉච්ඡා 242
ඉදප්පච්චයා අවිජ්ජා 204
ඉද්ධිපාටිහාරියෙන 614
ඉද්ධිවිධං 358
ඉධලොකසඤ්ඤී 14, 18
ඉන්ද්‍රිය සංවරො 206
ඉරිණං 276, 282, 290

උ

උච්ඡින්නමූලො 60
උදකොරොහකා 480
උදපත්තො 174, 176
උදයත්ථගාමිනියා 28, 48, 54, 164
උද්දෙසො 92, 100
උද්ධච්චකුක්කුච්චං 56
උද්ධංසොතඅකනිට්ඨගාමී 216
උද්ධම්භාගියානි 558
උපට්ඨානසාලා 160, 230, 232
උපයූපාදනා 200
උපසම්පාදෙතබ්බං 126
උපහච්චපරිනිබ්බායී 216
උපාදනක්ඛන්ධෙසු 96
උපාරම්භචිත්තං 258
උපාසිකා 530, 532
උපොසථං 148
උබ්බාහිකා 126
උභතොභාගවිමට්ඨං 110
උභතොභාගවිමුත්තො 42
උය්‍යාධිකාය 116
උස්සොළ්හී 168, 186

එ

එකබීජී 216
එකාරසක්ඛා 54, 56

ඔ

ඔකාසාධිගමො 534
ඔත්තප්පං 222
ඔරම්භාගියානි 554
ඔරවිතා 264
ඔරිමං තීරං 420, 422 460, 462
ඔසධීතාරකා 112

ක

කක්කසා 520
කණ්ටක– 242
කණ්හමග්ගො 446, 508
කණ්හං ධම්මං 422, 424, 462
කප්පී 280, 286
කපාටිසියං 134
කමණ්ඩලුකා 480
කම්මසඞ්කා 530
කම්මාරාමො 294
කයවික්කයා 368
කලායමත්තියො 306
කලිනා 306
කල්‍යාණධම්මතාය 116
කල්‍යාණමිත්තො 44, 50
කසිණසමාපත්ති 86
කසිණායතනානි 108

කා

කාමභොගී 316
කාමවිතක්කං 198
කාමෙසනා 58
කායසක්ඛී 42
කායෙන පහාතබ්බා 72
කාළානුසාරිකං 42

කි

කිබ්බිසං 134

කු

කුඩ්ඩරාජානො 42
කුත්තාදියො 206
කුම්මග්ගසෙවනං 210, 258, 264
කුසලසීලො 118

කු

කුසලානිසීලානි 2
කුසලෙසු කම්මපථෙසු 104
කුසීතො 270
කුසුබ්භා 206
කූටාගාරසාලා 240
කූටෙය්‍යානි 298

කෙ

කෙවලී 30

කො

කොලං කොලො 216
කොසාතකීබීජං 382

ඛි

ඛිඩ්ඩා 364
ඛිලජාතෙ 34

ඛී

ඛීණාසවා 76, 422, 424, 462, 464

ග

ගලගලායන්තො 206
ගාමධම්මො 40
ගොත්‍රභූ 42
ගොපනසියො 40

ච

චක්ඛුභූතො 468
චතස්සො පටිපදා 112
චතස්සො සඤ්ඤා 112
චතුරාපස්සෙනො 54, 56
චත්තාරො සතිපට්ඨානා 206
චෙතොඛිලා 34
චෙතොවිමුත්ති 22, 26, 30, 68–72, 122, 250, 360, 556
චෙතොවිවරණසප්පායා 120
චොදකෙන 142, 144

ඡ

ඡන්දමූලකා 192

ජ

ජඞ්ගමානං පාණානං 40
ජිව්හං 534
ජිම්හෙය්‍යානි 298

ඣ

ඣාන විමොක්ඛ සමාධි–සමාපත්තීනං 64

ඤා

ඤාණවාද 78

ඨ

ඨානසො 62

ත

තණ්හක්ඛයො 198
තත්‍ථපරිනිබ්බායී 646
තථාගතබලානි 62, 70
තපනීයො ධම්මො 504
තං ජීවං 346, 352
තාරකරූපානි 42
තාලාවත්ථුකතො 60
තිකිච්ඡකා 392
තිණ්ණවිචිකිච්ඡො 186
තිත්ථියො 264
තිරච්ඡාන කථං 230
තීණි දුච්චරිතානි 204
තුවටං 644

ද

දස අරියවාසා 54, 60
දස කථා 120
දස කථාවත්ථු 232

ද

දස කසිණායතනානි 84
දස කුසලකම්මපථා 488
දස ධම්මා (භාවෙතබ්බා) 578
දස ධම්මා (සාරාණීයා) 160
දස ධම්මා (සරීරට්ඨා) 158
දස නාථකරණා ධම්මා 44, 54
දස පාසංසානි 232
දස සඤ්ඤා 188, 190, 194
දහරතගෙහ 554
දළ්හුද්දපං 350
දිට්ඨං 604
දිට්ඨිගතා 356
දිට්ඨිප්පත්තො 42
දිට්ඨිසම්පන්නා 216
දිට්ඨෙව ධම්මෙ 194
දුක්ඛුද්‍රයො 444, 506, 542
දුබ්බචො 270
දුරභිරමං 362
දුස්සීලො 270
දෙවවස්සතං 260, 262

ධ

ධනවාදං 80
ධම්මකථිකො 20, 24
ධම්මචරියා 156, 558
ධම්මනන්දියා 648
ධම්මනිසන්තියා 296
ධම්මධරා 30
ධම්ම විනයෙ 30, 256, 270, 282–288, 294, 656, 660
ධම්මවෙදං 622, 658
ධම්මසොතො 256, 624
ධම්මස්සාමී 468
ධම්මානුධම්ම පටිපත්ති 228
ධම්මානුසාරී 42
ධම්මී කථා 226
ධම්මො 402, 406
ධංසි 264
ධූමං කත්තා 656, 662

න

නත්ථි දින්නං 484, 522
නාථකරණො 48
නානාධිමුත්තිකතං 64, 70
නාමෙ ච රූපෙ ච 92
නිගණ්ඨා 266
නිජ්ජරවත්ථූ 386
නිට්ඨිතචීවරො 618, 626
නිද්ධමනියා 396
නිධානවතිං වාචං 368, 486
නිධිමුඛානි 654
නිපන්නකා 468
නිප්පච්චාකාරං 116
නිබ්බානං 198
නිබ්බිදාවිරාගො 4, 8
නිසාමනජාතිකො 296
නිස්සයො 128
නිස්සාරණීයාසු ධාතුසු 102
නෙචයිකො 264
නෙළා 368, 488

ප

පගබ්භා 264
පච්චයිකො 306
පච්චෙක බුද්ධො 42
පච්චොරොහණී 424, 428, 430,–460
පඤ්ච නීවරණා 204, 372
පඤ්ච භයානි 328

**ප**

පඤ්චසතං විහාරං 654
පඤ්ඤාවිමුත්තො 42
පඤ්ඤාවිමුත්තිං 22, 26, 30, 68, 72, 120, 250, 360
පටිසන්ථාරකො 298
පටිසල්ලාන 230, 298
පඨවීසඤ්ඤී 666, 668, 672
පණ්ඩිතො 576
පතිසල්ලීනො 340
පදක්ඛිණග්ගාහී 44, 50, 162, 642
පනුණ්ණපච්චෙකසච්චො 54, 56
පපටිකා 10, 590, 592, 594, 590
පබ්බජ්ජාපරිචිතං 194
පමිණන්ති 250
පරචිත්තපරියාය-කුසලො 168, 172, 176
පරමත්ථවිසුද්ධිං 114
පරමදිට්ඨධම්මනිබ්බානවාදං 114
පරලොකසඤ්ඤී 14
පරවිත්තූපකරණං 520
පරාභිසජ්ජනී 520
පරිබ්බාජක 88, 190, 332, 342–346, 350, 416
පරිහාන ධම්මො 184, 282
පරෙති 250
පස්සද්ධකාය සඞ්ඛාරො 58
පස්සද්ධි 4

**පා**

පාතිමොක්ඛ 44, 124, 126, 160
පාතිමොක්ඛට්ඨපනා 124
පාපමිත්තං 260, 262, 270
පාපිකා ඉච්ඡා 76
පාපිච්ඡා 270
පාපිච්ඡො පුරිසපුග්ගලො 222
පාමොජ්ජං 2, 6, 8, 10
පාරගාමිනො 462, 464
පාරිමං තීරං 420, 422, 460, 462

**පි**

පියසමුදාහාරො 638
පියසාතරූපං 86

**පී**

පීතිභක්ඛා 108

**පු**

පුත්තසම්බාධසයනං 628
පුථු පච්චෙක සච්චානං 58
පුථුසමණබ්‍රාහ්මණානං 58
පුප්ඵගන්ධා 42
පුබ්බාපයමානො 350
පුබ්බෙනිවාසං 24, 120
පුරිසබලුද්ධො 608
පුරිසාජානීයො 610

**පූ**

පූගමජ්ඣගතො 484

**පෙ**

පෙසලා 306

**පො**

පොරි 276, 548

**බ**

බලානි 314
බහුස්සුතො 356
බල්ලමත්තියො 306

බ

බුද්ධානුස්සතිං 620
බෙලුව සලාටුමන්තියො 306
බොජ්ඣඞ්ගා 102, 378
බ්‍රහ්මචක්කං 62
බ්‍රහ්මචරියෙන 36
බ්‍රහ්මචරියෙසනා 58
බ්‍රහ්මචාරී 246

භ

භගවම්මූලකා 190, 670
භණ්ඩනජාතා 160
භවතණ්හා 210
භවසඞ්ඛාරො 158
භවෙසනා 58
භාවනාවාද 78
භාවෙතබ්බා ධම්මා 448
භෙත්තා 482

ම

මච්චුධෙය්‍යං 422, 462, 464
මග්ගාමග්ගඤාණදස්සනං 86
මනොභාවනීය 100, 332
මනොමයං 108
මහාචරියෙන 356
මාතුගාමො 528
මාතුරක්ඛිතා 486
මාලාගුලපරික්ඛිත්තා 520
මිච්ඡාදිට්ඨිකො 270
මුඛසත්ති 160
මුට්ඨස්සති 270
මූලගන්ධා 42
මෙත්තාචෙතොවිමුත්ති 556, 644, 682
මෙත්තූපහාරං 116
මොසධම්මං 150

ය

යථාකම්මූපගෙ 66, 122
යථාභූතඤාණදස්සනං 4, 8, 586–590, 592, 594, 596
යොගක්ඛෙමං 134, 136, 646
යොනිසො මනසිකාරො 208

ර

රූපසඤ්ඤී 108

ල

ලක්ඛණකුසලො 656, 662
ලූඛාජීවී 340
ලොකධම්ම 98
ලොහිතචන්දනං 42

ව

වඩ්ඪනකං 364
වරදයී 244
වවකට්ඨං 314
වස්සිකං 42

වා

වාචාය පහාතබ්බා ධම්මා 74

වි

විකත්තී 280, 286
විගතථීනමිද්ධො 226
විචිකිච්ඡා 56, 260, 262
විජ්ජා 386
විජ්ජාවිමුත්ති 206
විඤ්ඤාණට්ඨිතිසු 96
විනයධරො 24
විනිබද්ධා 34
විපරාමොස 368
විපිනං 276, 282, 290

**වි**

විප්පකතා 230
විමරියාදිකතෙන 268
විමුත්ති ඤාණදස්සනං 4, 6, 8, 10–12, 586
විවාදමූලානි 140
විවාද 138
විරාධනා 380
විරෙචනං 392
විවිධා ආබාධා 196
විසගිලිතො 306
විසම චරියා 156
විසෙසගාමී 248, 252
විසෙසාය 250
විහිංසාවිතක්කං 198

**වෙ**

වෙදනාසු 94
වෙය්‍යා කරණං 92, 100

**වො**

වොදනං 64

**ව්‍ය**

ව්‍යසනං 596
ව්‍යාපාදවිතක්කං 198

**ස**

සකදගාමී 246
සක්කායදිට්ඨි 262
සඞ්ඝපිතරො 664
සඞ්ඝභෙදෙ 130, 134
සඞ්ඝසාමග්ගී 132
සණ්ඨානං 62
සචිත්තපරියාය කුසලො 168, 170–172, 174, 186
සච්ඡිකාතබ්බා ධම්මා 514
සඞ්ඛොතනිකානං 538, 544
සඤ්ඤී 14
සතාරක්ඛෙන 56
සතිනෙපක්කෙන 46, 164
සතිපට්ඨානා 102,314
සතිසම්පජඤ්ඤං 206
සත්තක්ඛත්තුපරමො 216
සත්තබොජ්ඣඞ්ගා 206
සත්තසඤ්ඤා 94
සත්තාවාසා 98, 104
සද්ධා 222
සද්ධානුසාරී 42
සද්ධාවිමුත්තො 42
සද්ධො 22, 28
සද්ධො පුරිසපුග්ගලො 224
සප්පිමණ්ඩො 326
සප්පුරිස ධම්මා 510
සප්පුරිස සංසෙවො 208
සබ්බත්ථගාමිනිං පටිපදං 70
සබ්බසඞ්ඛාරසමථො 198, 606, 670
සබ්බසාමුක්කං සිකං 348
සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා 92
සබ්‍රහ්මචාරී 46, 298, 356,416
සමචරියා 156
සමණසාමඤ්ඤා 378
සමවයසට්ඨෙසනා 54, 56
සමාධි 4, 6, 8
සමාපත්තිකුසලො 276, 278
සම්පන්නසීලා 236
සම්බොධි 462, 464
සම්බොධි අඞ්ගෙසු 422, 424
සම්මාඤාණං 380, 430, 432, 438
සම්මාවිමුත්ති 380, 430, 432, 438

# විසෙසපදානුක්කමණිකා


## ස

සඞ්ඛාර පරිනිබ්බායී 216
සස්සතො ලොකො 346, 352
සහස්සධා ලොකො 106
සංදෙසබ්‍යාපත්ති 542
සංයොජනානි 30
සංවට්ටමානෙ 103
සංසප්පනියපරියායො 532

## සා

සාධෙය්‍යානි 298
සාධු 500
සාපදෙසං 546
සාමග්ගියා 160, 162, 164
සාමඤ්ඤය 296
සාමණෙරො උපට්ඨා-
පෙතබ්බො 130
සාමයිකං විමුත්තිං 248, 250
සාරගන්ධා 42
සාරදයී 244
සාරන්දිකායො 168
සාරාණීය ධම්ම 160
සාවජ්ජා ධම්මා 504
සාසවො ධම්මා 442, 504

## සි

සික්ඛාපදං 124

## සී

සීලක්ඛන්ධෙන 30, 368
සීලබ්බත පරාමාසං 258, 262
සීහනාදං 62
සීහසෙය්‍යං 226

## සු

සුක්කං ධම්මං 422
සුබුද්ධයා 506, 544
සුගතවිනයො 434, 436
සුඤ්ඤාගාරා 236
සුතධරො 44
සුත්තසො 126
සුහට්ඨායිනො 108

## සෙ

සෙනාසනානි 118
සෙවාලමාලකා 480

## සො

සොතාපත්තියඞ්ගානි 326

## හ

හතූපනිසො 560, 590, 594
හදයස්ස සන්තිං 86
හානගාමී 252
හිරි 222

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

| | | |
|---|---|---|
| 29 | ඛුද්දක නිකාය - සුත්ත නිපාත | |
| 30 | ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු | |
| 31 | ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි | |
| 32 | ඛුද්දක නිකාය - ජාතක පාලි | I |
| 33 | ඛුද්දක නිකාය - ජාතක පාලි | II |
| 34 | ඛුද්දක නිකාය - ජාතක පාලි | III |
| 35 | ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි | |
| 36 | ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාලි | |
| 37 | ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I | |
| 38 | ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II | |
| 39 | ඛුද්දක නිකාය - අපදාන පාලි 1 | |
| 40 | ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1 | |
| 41 | ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2 | |
| 42 | ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි | |
| 43 | නෙත්තිප්පකරණය | |
| 44 | පෙටකොපදේස | |
| 45 | ධමමසංගනිප්පකරණ | |
| 46 | විභංගප්පකරණ | I |
| 47 | විභංගප්පකරණ | II |
| 48 | කථාවත්ථුප්පකරණ | I |
| 49 | කථාවත්ථුප්පකරණ | II |
| 50 | කථාවත්ථුප්පකරණ | III |
| 51 | ධාතුකථාප්පකරණ - පුගගලපඤඤතතිපපකරණ | |
| 52 | යමකප්පකරණ | I |
| 53 | යමකප්පකරණ | 2 - I |
| 54 | යමකප්පකරණ | 2 - II |
| 55 | පට්ඨාප්පකරණය | I |
| 56 | පට්ඨානප්පකරණය | II |
| 57 | පට්ඨානප්පකරණය | III |

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රදැවුන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටුන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

# NAME OF SPONSOR

## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES, Volume 15～Volume 28**

**書名：斯里蘭卡巴利文大藏經，第十五冊～第二十八冊**
**Book Serial No., 書號：SR215～SR228**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,206,373：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,527,473；Print 1,000 sets**
**以上合計，新台幣 1,527,473 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛

《斯里蘭卡巴利文大藏經 第二十七冊》

財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
**This book is strictly for free distribution, it is not for sale.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**
Printed in Taiwan
1,000 copies; June 2013
SR227 - 11255